// ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

අති විශෙෂ

අංක 2053/43 - 2018 ජනවාරි මස 12 වැනි සිකුරාදා - 2018.01.12

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

### 1995 අංක 15 දරන ශ්‍රී ලංකා ගිණුම් සහ විගණන ප්‍රමිති පනත

42 (ඇ) උපවගන්තිය යටතේ කරනු ලබන පළකිරීම්

ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරි ආයතනය (මින් මතු "ආයතනය" යනුවෙන් සඳහන් කරනු ලබන) වෙත පැවරී ඇති බලතල අනුව, 1995 අංක 15 දරන ශ්‍රී ලංකා ගිණුම් සහ විගණන ප්‍රමිති පනතේ අරමුණ සඳහා 2018 මාර්තු 31 වන දින සිට හෝ ඉන් පසු අවසන්වන මූල්‍ය කාල පරිච්ඡේද සඳහා බල පැවැත්වෙන ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට වෙනස්වීම්, ආයතනය විසින් සම්මත කර මේ සමග පළකර ඇත. මෙම සංශෝධන වර්ෂ දෙදහස් දහඅටේ මාර්තු 31 දින හෝ ඊට පසු ආරම්භවන කාලපරිච්ඡේද ආවරණය කෙරෙන මූල්‍ය ප්‍රකාශන සඳහා බලාත්මක කළ යුතුය. කලින් ව්‍යවහාර කිරීමට අවසර ඇත.

ආයතනයේ පාලක සභාවේ අණ පරිදි;

අරුණ අල්විස්,
ලේකම්.

2018 ජනවාරි මස 01 වැනි දින,
කොළඹ 07,
මලලසේකර මාවත,
අංක 30A,
ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරි ආයතනයේ දී ය.


මෙම අති විශෙෂ ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.

**2018 මාර්තු 31 වන දින සිට හෝ ඉන් පසු අවසන්වන මූල්‍ය කාල පරිච්ඡේද සඳහා බල පැවැත්වන ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට වෙනස්වීම්.**

| විස්තරය | 2014 | 2017 |
|---|---|---|
| **පාරිභාෂික ශබ්ද මාලාව** | | |
| *වාර්ෂික වාර්තාව* | ~~අස්තිත්වයක මූල්‍ය ප්‍රකාශ හා ඒ මත වූ විගණන වාර්තාව සමග අස්තිත්වයක් විසින් සාමාන්‍යයෙන් වාර්ෂික පදනමක් මත නිකුත් කරන ලේඛණයකි.~~ | නීතියෙන් නියාමනවලින් හෝ චාරිත්‍රයකට (රීතියකට) අනුකූලව කළමනාකරණය හෝ පාලනය පිළිබඳ වගකිව යුතු අය විසින් හිමිකරුවන්ට (හෝ ඒ හා සමාන ඇල්මක් දක්වන පාර්ශවකරුවන්ට) අස්තිත්ත්වයේ මෙහෙයුම් සහ මූල්‍ය ප්‍රකාශවල දක්වා ඇති පරිදි අස්තිත්ත්වයේ මූල්‍ය ප්‍රතිඵල සහ මූල්‍ය තත්ත්වය පිළිබඳ තොරතුරු ලබාදීම පිණිස සාමාන්‍යයෙන් වාර්ෂිකව සකස් කරනු ලබන ලේඛනයක් හෝ ලේඛන එකතුවකි. වාර්ෂික වාර්තාවක මූල්‍ය ප්‍රකාශ සහ විගණනකගේ වාර්තාව අඩංගුවන අතර සාමාන්‍යයන් ඒ සමග ආයතනයේ වර්ධනයත්, එහි ඉදිරි දැක්ම හා අවදානම් සහ අනියතතතාවයත් අස්තිත්ත්වයෙහි පාලක මණ්ඩලයේ ප්‍රකාශයක් සහ පාලන කරුනු ආවරනයවන වාර්තා ඇතුළත් වේ. |
| *සහතික වීමේ කාර්යභාරය* | වෘත්තිකයෙකුගේ කාර්ය භාරය<br>~~නිර්ණායකයට එරෙහිව විෂය කරුණේ මේ ඇගයීම හෝ මැනිමේ ප්‍රතිඵලය පිළිබඳව වගකිව යුතු පාර්ශවය හැර අපේක්ෂා කරන පරිශීලකයන්ගේ විශ්වාසයේ මට්ටම ඉහළ නැංවීමට අදහස් කල තීරණය පරිචයේ යෙදෙන්නා ප්‍රකාශ කරන කාර්ය භාරයකි. නිර්ණායකය ව්‍යවහාර කිරීම මගින් එලෙස වන තොරතුරු වනුයේ විෂයය කරුණක් ඇගයීමෙන් හෝ මැනිමෙන් වන ප්‍රතිඵලය වේ.~~<br>~~*(විෂය කරුණු පිළිබඳ තොරතුරු බලන්න) සහතික වීමේ කාර්යභාර සඳහා වන ශ්‍රී ලංකා ආකෘතිමය රාමුව යටතේ*~~ ~~වෘත්තිකයෙකුට ඉටු කිරීමට අවසර ඇති සහතික වීමේ කාර්ය භාරයන් දෙවර්ගයක් ඇත ; එනම් සාධාරණ සහතික වීම කාර්ය භාරය සහ සීමිත සහතිකවීම කාර්ය භාරයයි.~~<br><br>*සාධාරණ සහතිකවීමේ කාර්යභාරය*<br><br>~~සාධාරණ සහතික වීමේ කාර්ය භාරයක අරමුණ වන්නේ කාර්ය භාරයේ සැලකිල්ලට ගත යුතු කරුණු තුළ පරිචයේ යෙදෙන්නාගේ තීරණය ධනාත්මක ආකාරයට ප්‍රකාශ කිරීමට පදනම ලෙස සහතික වීමේ කාර්ය භාරයේ අවදානම පිළිගත හැකි පහල මට්ටමකයට අඩු කිරීමය~~<br><br>~~*සීමිත සහතිකවීම් කාර්යභාරය*~~<br><br>~~සීමිත සහතිකවීමේ කාර්යභාරයක අරමුණ වන්නේ කාර්ය භාරයේ සැලකිල්ලට ගත~~ | වෘත්තිකයකුගේ කාර්යභාරය<br>විෂයය කරුණු තොරතුරු පිළිබඳව වගකිව යුතු පාර්ශවයට හැර අපේක්ෂිත පරිශීලකයින්ගේ විශ්වසනීය මට්ටම ඉහළ නැංවීමට සැලසුම්කර ඇති නිගමනයක් ප්‍රකාශ කිරීමට හැකිවීම පරිචයේ යෙදෙන්නෙක් සඳහා ප්‍රමාණවත් යෝග්‍ය සාක්ෂි ලබා ගැනීම අරමුණු කරගත් පරිචයේ යෙදෙන්නෙකුගේ කාර්ය භාරය (එනම් නිර්ණායකට එරෙහිව පාදක කරගත් විෂයය කරුණ මැනීමේ හෝ අගය කිරීමේ ප්‍රතිඵලය). සෑම සහතික වීමේ කාර්ය භාරයක්ම මාන දෙකකින් වර්ගීකරණය කර ඇත.<br>i. එක්කෝ සාධාරන සහතික වීමේ කාර්ය භාරයක් හෝ සීමිත සහතික වීමේ කාර්ය භාරයක්;<br>අ. සාධාරණ සහතික වීමේ කාර්යභාරය පරිචයේ යෙදෙන්නාගේ තීරණය සඳහා පදනම ලෙස කාර්ය භාරයේ පවත්නා තත්ත්වය තුළ අවදානම පිළිගත හැකි පහල මට්ටමකට පරිචයේ යෙදෙන්නා අඩු කරමින් සහතික වීමේ කාර්ය භාරය, පරිචයේ යෙදෙන්නාගේ තීරණය ප්‍රකාශ කරන්නේ මැනීමේ ප්‍රතිඵලය හෝ නිර්ණායකයට එරෙහිව පාදකවන විෂයය කරුණ ඇගයීම මත පරිචයේ යෙදෙන්නාගේ මතය දන්වන ආකාරයෙනි.<br><br>ආ. සීමිත සහතික වීමේ කාර්යභාරය<br><br>කාර්ය භාරයේ සැලකිල්ලට ගතයුතු කරුණු අනුව එය පිළිගත හැකි |

| විස්තරය | 2014 | 2017 |
| --- | --- | --- |
| | ~~යුතු කරුණු අනුව කාර්ය භාරයේ අවදානම පිළිගත හැකි මට්ටමකට අඩු කිරීම වන නමුදු, අවදානම සාධාරණ සහතිකවීමේ කාර්ය භාරයකට වඩා විශාල වන අවස්ථාවක, පරිචයේ යෙදෙන්නාගේ තීරණය ප්‍රකාශකරන්නේ සෘණාත්මක ආකාරයේ පදනම ලෙසය.~~ | මට්ටමකට කාර්යභාර අවදානම පරිචයේ යෙදෙන්නා අඩු කරන විට සහතික වීමේ කාර්ය භාරයකි. එහෙත් එම අවදානම සහතික වීමේ කාර්ය භාරයකට වඩා වැඩි වන අවස්ථාවක තීරණය ප්‍රකාශ කිරීම සඳහා පදනම ලෙස එය දක්වන ආකාරයේ පදනම ඉටුකළ ක්‍රියාපටිපාටි සහ ලබාගත් සාක්ෂි මත පදනම්ව ද යන්න විෂය කරුණු තොරතුරු ප්‍රමාණාත්මක ලෙස අව ප්‍රකාශ වී ඇති බව පරිචයේ යෙදෙන්නාට විශ්වාස කිරීමට හේතුවන කරුණු (ණ) පරිචයේ යෙදෙන්නාගේ අවධානයට යොමුව තිබේ. සීමිත සහතික වීමේ කාර්ය භාරයකදී ඉටුකරන ක්‍රියා පටිපාටිවල ස්වභාවය කාල නීර්ණය සහ ප්‍රමාණය සාධාරණ සහතික වීමේ කාර්යභාරයකදී අවශ්‍යවන ප්‍රමාණයට හා සැසඳීමේදී සීමිතවන නමුත් පරිචයේ යෙදෙන්නාගේ වෘත්තීය විනිශ්චය අනුව තේරුමක් සහිත මට්ටමකට ලබාගැනීමට සැලසුම් කර ඇත. පරිචයේ යෙදෙන්නා විසින් ලබාගන්නා ලද සහතික වීමේ මට්ටම තේරුමක් සහිත වීමට නම් විෂයය තොරතුර පිළිබඳ අපේක්ෂිත පරිශීලකයින්ගේ විශ්වාසය පැහැදිළිව නොවැදගත් ප්‍රමාණයට වඩා ඉහළ මට්ටමකට වැඩි කිරීමට ඉඩ ඇත.<br><br>(ii) එක්කෝ සහතික කිරීමේ කාර්යභාරයක් හෝ සෘජු කාර්යභාරයක්.<br>අ සහතික කිරීමේ කාර්ය භාරය පරිචයේ යෙදෙන්නා හැර වෙනත් පාර්ශවයක් නිර්නායකයට එරෙහිව පාදක වන විෂයය කරුණ මැනීම හෝ ඇගයීම කරන සහතික වීමේ කාර්ය භාරයකි. පරිචයේ යෙදෙන්නා හැර වෙනත් පාර්ශවයක් බොහෝවිට වාර්තාවක හෝ ප්‍රකාශයක් තුළ ප්‍රතිඵලයක් වන විෂයය කරුණ තොරතුරු එසේම ඉදිරිපත් කරයි. කෙසේ වෙතත් සමහර අවස්ථාවලදී, විෂයය කරුණ තොරතුරු පරිචයේ යෙදෙන්නා විසින් සහතික කිරීමේ වාර්තාව තුල ඉදිරිපත් කළ හැකිය. සහතික කිරීමේ කාර්ය භාරයකදී, පරිචයේ යෙදෙන්නාගේ තීරණය මගින් විෂයය කරුණ තොරතුරු ප්‍රමාණාත්මක අවප්‍රකාශයකින් තොරදැයි අමතයි. |

| විස්තරය | 2014 | 2017 |
|---|---|---|
| | | පරිචයේ යෙදෙන්නාගේ තීරණය පහත සඳහන් භාෂිතයේ ප්‍රකාශ කළ හැකිය.<br>i පාදක කරගත් විෂයය කරුණ සහ අදාළ නිර්නායක;<br>ii විෂය කරුණ තොරතුරු සහ අදාළ නිර්නායක ; හෝ<br>iii සුදුසු පාර්ශව(යක්) විසින් කරන ලද ප්‍රකාශයක්.<br>ආ සෘජු කාර්යභාරය<br>පරිචයේ යෙදෙන්නා අදාළ නිර්නායකයට එරෙහිව පාදක වන විෂයය කරුණ මැනීම හෝ අගය කිරීම සහ ප්‍රතිඵලයක් වන විෂයය කරුණ තොරතුරු සහතික වීමේ වාර්තාවේ කොටසක් ලෙස හෝ කැටුව ඇතිව පරිචයේ යෙදෙන්නා ඉදිරිපත් කරන සහතික වීමේ කාර්යභාරයක් සෘජු කාර්ය භාරයකදී පරිචයේ යෙදෙන්නාගේ තීරණය අමතන්නේ නිර්ණායකට එරෙහිව පාදක වූ විෂයය කරුණ තොරතරු මැනීමේ හෝ අගය කිරීමේදී වාර්තා වූ ප්‍රතිඵලය වේ. |
| සහතික වීමේ නිපුනතා සහ ශිල්පීය ක්‍රම | (අනුරූප නොමැත). | සහතික වීමේ පරිචයේ යෙදෙන්නෙක්, විසින් නිරූපනය කරනු ලබන එම සැලසුම් කිරීම, සාක්ෂි රැස්කිරීම, සාක්ෂි ඇගයීම, සන්නිවේදනය සහ වාර්තාකරන කුශලතා සහ ශිල්පීය ක්‍රම යන ඒවා කිසියම් විශේෂිත සහතික කිරීමේ කාර්යයක හෝ එහි මිනුම් හෝ ඇගයීම්වල පාදක කරගත් විෂයය කරුණ පිළිබඳ පලවන විශේෂ ඥාණයෙන් වෙනස් වේ. |
| ස්ථාපිත කර ගැනීමේ ක්‍රමය | (අනුරූප නොමැත). | උපසේවා ආයතනයක් විසින් සපයනු ලබන සේවාවන් සමග කටයුතු කරන ක්‍රමය, එමගින් සේවා ආයතනයේ පද්ධතිය පිළිබඳ විස්තරය තුළ උපසේවා ආයතනයක් විසින් සපයනු ලබන සේවාවන්හි ස්වභාවය ඇතුළත් වන නමුත් එම උපසේවා ආයතනයේ අදාළ පාලන අරමුනු සහ සම්බන්ධිත පාලනයන් සේවා ආයතනයේ පද්ධතිය පිළිබඳ විස්තරයෙන් සහ සේවා විගණකගේ කාර්ය භාර විෂයය පථයෙන් බැහැර කරනු ලැබේ. සේවා ආයතනයෙහි එහි පද්ධතිය පිළිබඳ විස්තරයට සහ සේවා විගණකගේ කාර්ය භාරයේ විෂයය පථයේ උපසේවා ආයතනයෙහි පාලනයේ සඵල දායකත්වය අධීක්ෂණය කිරීමට සේවා සංවිධානයේ පාලන ඇතුලත්වන අතර, උපසේවා ආයතනයේ පාලන මත සහතික කිරීමේ වාර්තාවක් සේවා ආයතනයේ සමාලෝචනයට ඇතුළත් විය හැකිය. |
| පාලන අරමුණු | (අනුරූප නොමැත). | පාලනයේ විශේෂිත අංගයක, අරමුණ, හෝ පරමාර්ථය, පාලන අරමුණු සම්බන්ධ වන්නේ එය පාලනය කරන අවදානම් සැහැල්ලු |

| විස්තරය | 2014 | 2017 |
|---|---|---|
| | | කිරීමට උත්සහ ගැනීමය. |
| *සේවා ආයතනයක පාලනයන්* | (අනුරූප නොමැත). | පාලන අරමුණ සාධනය වන පාලන සේවා විගණකගේ සහතික වීමේ වාර්තාවෙන් ආවරණය වේ. |
| *උපසේවා ආයතනයක පාලනයන්* | (අනුරූප නොමැත). | උපසේවා ආයතනයක ඇති පාලන වන්නේ පාලන පරමාර්ථය සාක්ෂාත් කර ගැනීම පිළිබඳ සාධාරණ සහතික වීමේ වාර්තාවක් ලබාදීමටය. |
| *නිර්නායක* | ~~විෂයය කරුණ ඇගයීමට හෝ මැනීමට භාවිතා කරන පිල්ලකණුවලට ඇතුලත් වන්නේ, අදාල වන තැන්හි ඉදිරිපත් කිරීම සහ නිර්නායකයන් විධිමත් ඒවා හෝ විධිමත් හෙළිදරව් කිරීම සඳහා වන පිල්ල කණුය. නිර්නායකයන් විධිමත් ඒවා හෝ විධිමත් බවෙන් අඩු ඒවා විය හැක. එකම විෂයය කරුණට වෙනස් නිර්නායකයන් තිබිය හැක. වෘත්තීය විනිශ්චය සම්බන්ධයක් තුල විෂයය කරුණක් සාධාරණව සංගතව ඇගයීමට හෝ මැනීමට සුදුසු නිර්නායකයන් අවශ්‍ය වේ.~~<br><br>~~*සුදුසු* නිර්නායක පහත දැක්වෙන ගති ලක්ෂණ ප්‍රදර්ශනය කරයි:~~<br>~~(අ) අදාළත්වය: අදාල නිර්නායකයන් අපේක්ෂා කරන පරිශීලකයින් විසින් ගේ ගන්නා තීරණ වලට එළඹීමට සහාය වෙමින් තීරණ ගැනීමට දායක වේ.~~<br><br>~~(ආ) සම්පූර්ණත්වය: :කාර්ය භාරයේ සැලකිල්ලට ගතයුතු කරුණු සම්බන්ධව තීරණ සඳහා බලපෑමක් විය හැකි අදාළ සාධක අත්හැර නොමැති විට නිර්ණායකය ප්‍රමාණවත් ලෙස සම්පූර්ණය. සම්පූර්ණ නිර්නායකයන්ට ඇතුළත්වන්නේ ඉදිරිපත් කිරිම සහ හෙළිදරව් කිරීම සඳහා වන පිලල්කණුවේ.~~<br><br>~~(ඇ) විශ්වසනීයත්වය : අදාළතන්හි, ඉදිරිපත් කිරීම සහ හෙළිදරව් කිරීම, එකසමාන සුදුසුකම්ලත් පරිචයේ යෙදෙන්නන් විසින් එක සමාන ලෙස සැලකිල්ලට ගත යුතු කරුණු භාවිතා කරන විට විෂයය කරුණේ සංගත අගය කිරීම හෝ මැනීම සඳහා විශ්වාසදායක නිර්ණායකය ඉඩදේ.~~<br><br>~~(ඇ) අපක්ෂපාත බව : අපක්ෂපාත නිර්නායකයන් පක්ෂග්‍රාහිත්වයෙන් තොර තීරණයන්ට එළඹීමට දායක වේ.~~<br><br>~~(ඉ) අවබෝධ කරගත හැකි බව : අවබෝධ කරගත හැකි නිර්නායක සැළකිය යුතු අන්දමින් වෙනස් අර්ථ නිරූපනයට යටත් නොවන සහ පැහැදිලි, විස්තීරණ~~ | පාදක කරගත් විෂයය කරුණ මැනීමට හෝ ඇගයීමට භාවිතා කරන පීල්ල කණු "අදාළ වන නිර්නායක" යනු විශේෂිත කාර්ය භාරයක් සඳහා භාවිතා කරන නිර්නායකය වේ. |

| විස්තරය | 2014 | 2017 |
|---|---|---|
| | ~~තීරණයනට දායක වේ.~~ | |
| *සෘජු සහාය* | (අනුරූප නොමැත) | බාහිර විගණකගේ මග පෙන්වීම, අධික්ෂණය සහ සමාලෝචනය යටතේ විගණන ක්‍රියා පටිපාටි ඉටුකිරීමට අභ්‍යන්තර විගණනවරු යොදවා ගැනීම. |
| *කාර්ය භාරයේ සැලකිල්ලට ගත යුතු කරුණු* | (අනුරූප නොමැත) | විශේෂිත කාර්ය භාරයක පුළුල් සන්දර්භයක් අර්ථ දැක්වීමට අයත්වන්නේ: කාර්ය භාරයේ නියමයන්, එය සාධාරන සහතික වීමේ කාර්ය භාරයක්ද හෝ සීමිත සහතික වීමේ කාර්ය භාරයක්ද, පාදක වූ විෂයය කරුණේ ගති ලක්ෂණ; මිනුම් කිරීමේ හෝ ඇගයීමේ නිර්නායක; අපේක්ෂිත පරිශිලකයින් ගේ තොරතුරු අවශ්‍යතා; වගකිව යුතු පාර්ශවයේ, මිනුම්කරුගේ හෝ කාර්යයේ නියුක්ත ඇගයීම් කරන්නාගේ සම්බන්ධ වන පාර්ශවයේ හා ඔවුන්ගේ පරසරය; සහ අදාළ ගති ලක්ෂණ; සහ වෙනත් කරුණු, උදාහරණයක් ලෙස කාර්ය භාරය මත සැළකිය යුතු අන්දමේ බලපෑමක් ඇතිකල හැකි සිද්ධීන්, ගනුදෙනු, තත්ත්වයන් සහ පරිචයන්. |
| *කාර්යයේ නියුක්ත හවුල්කරු* | ~~කාර්ය භාරය සහ එහි කාර්ය සාධනය සඳහා සහ සමාගම වෙනුවෙන් වාර්තා නිකුත් කිරීම සඳහා වගකිවයුතු සමාගම් හවුල්කරුවෙකු හෝ වෙනත් පුද්ගලයෙකු වන සහ අවශ්‍යකරන අවස්ථාවලදී නෛතික හෝ නියාමන ආයතනයකින් යෝග්‍ය අධිකාරියක් සතු අයෙකි.~~ | කාර්ය භාරය සහ එහි කාර්ය සාධනය සඳහා සහ සමාගම වෙනුවෙන් වාර්තා නිකුත් කිරීම සඳහා, වගකිව යුතු සමාගමේ හවුල්කරු හෝ වෙනත් පුද්ගලයෙකු වන සහ අවශ්‍ය කරන අවස්ථාවලදී වෘත්තීය, නෛතික හෝ නියාමන ආයතනයකින් යෝග්‍ය අධිකාරියක් ඇති අයෙකි, “කාර්යභාරයේ නියුක්ත හවුල්කරු” යන්න කියවිය යුත්තේ අදාළ අවස්ථාවන්හිදී එහි රාජ්‍ය අංශයේ සමානකම් ගැන සඳහන් කරමිනි. |
| *කාර්ය භාර අවදානම* | (අනුරූප නොමැත ). | විෂයය කරුණ තොරතුරු ප්‍රමානාත්මකව අවප්‍රකාශ වී ඇති විට පරිචයේ යෙදෙන්නෙක් නුසුදුසු නිගමනයකට එළඹීමේ අවදානම. |
| *කාර්ය භාරයේ නියුතු කණ්ඩායම* | කාර්යභාරය ඉටු කරනු ලබන සියලුම හවුල්කරුවන් සහ සේවක මණ්ඩලය හා කාර්ය භාරය මත හෝ ජාල සමාගම මගින් ක්‍රියා පටිපාටි ඉටුකිරීම් සඳහා සමාගම සේවයේ නිරත කරනු ලබන ඕනෑම පුද්ගලයන්ය.<br><br>~~සමාගම හෝ ජාල සමාගමක් විසින් සේවයේ නිරත කරවා ඇති බාහිර විශේෂඥයින් මෙයින් බැහැර කෙරේ. *~~<br><br>~~*ශ්‍රී.ල.වි.ප්‍ර.620 *විගණකයෙකුගේ විශේෂඥයකු ගේ වැඩ ප්‍රයෝජනයට ගැනීම.* (අ) ඡේදය “විගණකගේ විශේෂඥයා” යන ඡේදය පදය නිර්වචනය කරයි.~~ | කාර්ය භාරය ඉටුකරනු ලබන සියලුම හවුල්කරුවන් සහ සේවක මංඩලය හා කාර්ය භාරය මත ක්‍රියා පටිපාටි ඉටුකිරීම සඳහා සමාගම ජාල සමාගම මගින් සේවයේ නිරත කරනු ලබන ඕනෑම පුද්ගලයන්ය. සමාගම හෝ ජාල සමාගමක් විසින් සේවයේ යොදවා ඇති විගණකගේ බාහිර විශේෂඥයකු මෙයින් බැහැර කෙරේ. බාහිර විගණක ශ්‍රී.ල.වි.ප්‍ර. 610 (2013 සංශෝධිත) හි අවශ්‍යතාවන්ට අනුකූල වන විට විගණන කාර්යභාරයක් මත සඳහා සෘජු සහාය ලබාදෙන සේවා දායකයාගේ අභ්‍යන්තර විගණන කාර්යය තුළ සිටින පුද්ගලයින් එසේම ද “කාර්ය භාරයේ නියුතු කණ්ඩායම” යන යෙදුමෙන් බැහැර කරයි. *<br>* ශ්‍රී.ල.වි.ප්‍ර. 610 (2013 සංශෝධිත), *අභ්‍යන්තර විගණක වරුන්ගේ වැඩ ප්‍රයෝජනයට ගැනීම සෘජු සහාය යොදවා ගැනීම* පිළිබඳ සීමා ස්ථාපිත කරයි. අභ්‍යන්තර විගණකවරුන් ගෙන් සෘජු සහාය ලබාගැනීම නීතියෙන් හෝ රෙගුලාසි මගින් බාහිර විගණකට තහනම් කළහැකි එය පිළිගනී. |

| විස්තරය | 2014 | 2017 |
|---|---|---|
| | | එබැවින් සෘජු සහාය යොදවා ගැනීම් අවසර ඇති අවස්ථාවන්ට පමණක් සීමාවේ. |
| කාර්යයේ නියතු කණ්ඩායම (SLSAE 3000) (සංශෝධිත සම්බන්ධය තුළ) | (අනුරූප නොමැත). | කාර්ය භාරය ඉටු කරන සියලුම හවුල් කරුවන් සහ සේවක මණ්ඩලය සහ කාර්ය භාරය මත ක්‍රියා පටිපාටි ඉටු කිරීම සඳහා සමාගම හෝ ජාල සමාගමක් මගින් සේවයේ නිරත කර ඇති ඕනෑම පුද්ගලයකු වේ. සමාගම හෝ ජාල සමාගමක් විසින් සේවයේ නිරත කර සිටින පරිචයේ යෙදෙන්නෙකුගේ බාහිර විශේෂඥයකු මෙයින් බැහැර කෙරේ. * <br>* SLSAE 3000 (සංශෝධිත), විගණන හෝ ඓතිහාසික මූල්‍ය තොරතුරු සමාලෝචනය හැර සහතික වීමේ කාර්ය භාර. |
| *කාර්යයේ නිරත පාර්ශවය.* | (අනුරූප නොමැත). | සහතික කිරීමේ කාර්ය භාරය ඉටුකිරීම සඳහා පරිචයේ යෙදෙන්නා කාර්යයේ නිරත කර ගන්නා පාර්ශව(යන්)ය. |
| *සාක්ෂි* | (අනුරූප නොමැත). | පරිචයේ යෙදන්නා සිය තීරණයට එළඹීමේදී පරිචයේ යෙදෙන්නා විසින් භාවිතා කරන තොරතුරු, අදාළ තොරතුරු, පද්ධතිතුළ, ඇත්නම්, සහ වෙනත් තොරතුරුවල අඩංගු තොරතුරු යන දෙකම සාක්ෂිවල ඇතුළත් වේ.<br>SLSAEs හි අරමුණු සඳහා:<br>(i) සාක්ෂිවල ප්‍රමාණවත්වීම යනු සාක්ෂි ප්‍රමාණය මැනීමයි.<br>(i)i සාක්ෂිවල යෝග්‍යතාවය යනු සාක්ෂිවල ගුණාත්මක භාවය මැනීමයි. |
| මූල්‍ය ප්‍රකාශ | මූල්‍ය වාර්තාකරන ආකෘතිමය රාමුවක් සමග අනුකූලව කාලයේ කාල පරිච්ඡේදයක් සඳහා වෙනස්වීම් කාලයේ එක්තරා මොහොතක ඒ අනුව අස්තිත්ත්වයක ආර්ථික සම්පත් හෝ බැඳීම් සන්නිවේදනය කිරීමට අදහස් කරන ලද සම්බන්ධිත සටහන් ඇතුළුව, ඓතිහාසික මූල්‍ය තොරතුරු ව්‍යුහගත ආකාරයට නියෝජනය කිරීමකි. සම්බන්ධිත සටහන්, සාමන්‍යයෙන් සමන්විත වන්නේ සැළකිය යුතු ගිණුම් ප්‍රතිපත්තිවල සාරාංශයක් සහ වෙනත් විස්තරාත්මක තොරතුරු වලින්ය "මූල්‍ය ප්‍රකාශ" යන පදය, අදාළ මූල්‍ය වාර්තා කරන ආකෘතිමය රාමුවේ අවශ්‍යතාවය මගින් නිර්ණය කරන ලද සම්පූර්ණ මූල්‍ය ප්‍රකාශ කට්ටලයක් ලෙස හඳුන්වන නමුත් තනි මූල්‍ය ප්‍රකාශයක් ලෙසද දැක්විය හැකිය. | මූල්‍ය වාර්තාකරන ආකෘතිමය රාමුවක් සමග අනුකූලව කාලයේ කාල පරිච්ඡේදයක් සඳහා කාලයේ එක්තරා මොහොතක ඒ අනුව වෙනස්වේ. අස්තිත්ත්වයක ආර්ථික සම්පත් හෝ බැඳීම්, සන්නිවේදනය කිරීමට අදහස් කරන ලද හෙළිදරව් කිරීම් ඇතුළුව, ඓතිහාසික *මූල්‍ය තොරතුරු* ව්‍යුහගත ආකාරයට නියෝජනය, කිරීමකි. මූල්‍ය ප්‍රකාශ යන පදය අදාළ මූල්‍ය වාර්තාකරන ආකෘතිමය රාමුවේ අවශ්‍යතාවය මගින් නිර්ණය කරන ලද සම්පූර්ණ මූල්‍ය ප්‍රකාශ කට්ටලයක් ලෙස සාමාන්‍යයෙන් හඳුන්වනවන නමුත්, තනි මූල්‍ය ප්‍රකාශයක් ලෙසද දැක්විය හැකිය.<br>අදාළ මූල්‍ය වාර්තා කරන ආකෘතිය මගින් අවශ්‍ය කරන පරිදි නියම කර ඇති හෝ ප්‍රකාශිතව අවසර දෙන අන් අයුරකින් ඉඩදෙන මූල්‍ය ප්‍රකාශයක, මුහුණත මත හෝ සටහන් තුළ හෝ ඒ අනුව හරස් යොමුකිරීමක් මගින් අන්තර්ගත කල හෙළිදරව් කිරීම් පැහැදිලි කිරීමේ හෝ විස්තරාත්මක තොරතුරු වලින් සමන්විතය. |

| **විස්තරය** | **2014** | **2017** |
|---|---|---|
| *සමාගම* | තනි පුද්ගල පරිචයේ යෙදෙන්නෙක්, හවුල් ව්‍යාපාරයක් හෝ සංස්ථාවක් හෝ වෙනත් අස්තිත්ත්වයකි. | වෘත්තීය ගණකාධිකාරිවරුන්ගේ තනි පුද්ගල පරිචයේ යෙදෙන්නෙක්, හවුල් ව්‍යාපාරයක් හෝ සංස්ථාවක් හෝ වෙනත් අස්තිත්ත්වයකි. "සමාගම'' යන්න කියවිය යුත්තේ එහි රාජ්‍ය අංශයේ සමක අදාළවන අවස්ථාවන්හිදීය. |
| *පොදු අරමුණ සඳහා වූ ආකෘතිමය රාමුව.* | "අනුකූල වීමේ ආකෘතිමය රාමුව" යන යෙදුම මූල්‍ය වාර්තාකරන ආකෘතිමය රාමුවකට යොමු කිරීම සඳහා භාවිතා කරනු ලබන අතර, එය ආකෘතිමය රාමුවේ අවශ්‍යතාවයන්ට සමග අනුකූල විය යුතු නමුත් ~~ඉහත (අ) හෝ (ආ) හි පිළිගැනීම් අඩංගු නොවේ. *~~<br>* ~~ශ්‍රී.ල.වි.ප්‍ර. 200, 13 (අ) ඡේදය~~ | "අනුකූල වීමේ ආකෘතිමය රාමුව" යන යෙදුම මූල්‍ය වාර්තාකරන ආකෘතිමය රාමුවකට යොමු කිරීම සඳහා භාවිතා කරනු ලබන අතර, එය ආකෘතිමය රාමුවේ අවශ්‍යතාවයන් සමග අනුකූල විය යුතු නමුත් ඉහත (i) හෝ (ii) හි පිළිගැනීම් වල අඩංගු නොවේ. *<br>* ශ්‍රී.ල.වි.ප්‍ර. 200, *ස්වාධීන විගණකගේ සමස්ත අරමුණු සහ ශ්‍රී ලංකා විගණන ප්‍රමිතීන්ට අනුකූලව විගණනයක් පැවැත්වීම,* (13(අ) ඡේදය |
| *GHG ප්‍රකාශය (හරිතාගාර වායු ප්‍රකාශය)*<br>**පාද සටහන* | ~~සහතිකවීමේ ආකෘතිමය රාමුව 8 වන ඡේදය.~~ | SLSAE 3000. (සංශෝධිත) 12^u ඡේදය |
| අසංගතතාවය | විගණනය කළ මූල්‍ය ප්‍රකාශවල ඇතුළත් තොරතුරුවලට පරස්පරව ඇති වෙනත් තොරතුරුය. ප්‍රමාණාත්මක අසංගතතාවය මූල්‍ය ප්‍රකාශ මත විගණකගේ මතය සඳහා පදනම පිළිබඳ සහ කලින් ලබාගත් විගණන සාක්ෂිවලින් සහ ගොඩනගාගත් විගණන තීරණ පිළිබඳ සැකයක් හටගත හැකිය. | (ඉවත් කර ඇත.) |
| *අන්තර්ගත ක්‍රමය* | (අනුරූප නොමැත.) | උපසේවා ආයතනයක් විසින් සපයනු ලබන සේවාවන් සමග කටයුතු කිරීමේ ක්‍රමය,සේවා ආයතනයේ පද්ධතිය පිළිබඳ විස්තරයට උපසේවා ආයතනය විසින් සපයනු ලබන සේවාවන්හි ස්වභාවය සහ සේවා ආයතනයේ පද්ධතිය පිළිබඳ විස්තරයට සේවා ආයතනයේ අදාළ පාලන අරමුණු සහ අදාළ පාලන අරමුනු සහ සම්බන්ධිත පාලන සහ සේවා විගණකගේ කාර්යභාරයේ විෂයය පථය තුළ ඇතුළත්ය. |
| *විමසීම (SLSRE 2400 සන්දර්භය තුළ (සංශෝධිත))* | (අනුරූප නොමැත.) | විමසුම සමන්විත වන්නේ අස්තිත්ත්වය තුළ හෝ ඉන් පිටත සිටින දැනුමැති පුද්ගලයන් ගෙන් තොරතුරු සෙවීමෙනි. |
| *අපේක්ෂිත පරිශීලකයින්* | ~~පරිචයේ යෙදෙන්නා විසින් සහතිකවීමේ වාර්තාව පිළියල කිරීමට අදහස් කරන, පුද්ගලයෙකු පුද්ගලයන් හෝ පුද්ගලයන් කණ්ඩායමක් වේ. අපේක්ෂිත භාවිතා පරිශීලකයින්ගෙන් එක් අයෙක් වගකිව යුතු පාර්ශ්වය විය හැකි නමුත් ඒ එක් අය ඔහුම පමණක් නොවේ.~~ | සහතික වීමේ වාර්තාව භාවිතා කරනු ඇතැයි පරිචයේ යෙදෙන්නා අපේක්ෂා කරන පුද්ගලයා(යන්) හෝ සංවිධාන(ය) හෝ කණ්ඩායම(ම්) සමහර අවස්ථාවලදී, සහතික වීමේ වාර්තාව ආමන්ත්‍රණය කළ අය හැර වෙනත් අපේක්ෂිත පරිශීලකයින් සිටිය හැකිය. |
| ශ්‍රී ලංකා ගිණුම්කරන ප්‍රමිත. | ~~ජාත්‍යන්තර ගිණුම් කරන ප්‍රමිත මණ්ඩලය විසින් නිකුත් කරන ලද ශ්‍රී ලංකා ගිණුම්කරන ප්‍රමිත.~~ | (ඉවත් කර ඇත). |
| *ප්‍රධාන විගණන කරුණු.* | (අනුරූප නොමැත.) | ප්‍රවර්තන කාල පරිච්ඡේදයේ මූල්‍ය ප්‍රකාශ විගණනයේදී විගණකගේ වෘත්තීය විනිශ්චය අනුව වඩාත් වැදගත් වූ එම කරුණ ප්‍රධාන |

| විස්තරය | 2014 | 2017 |
|---|---|---|
| | | විගණන කරුණු තෝරාගනු ලබන්නේ පාලනය පිළිබඳව වගකිව යුතු අය සමග සන්නිවේදනය කල කරුණු අතරෙන්ය. |
| සීමිත සහතික වීම. (SLSRE 2400 සන්දර්භය තුළ (සංශෝධිත)) | (අනුරූප නොමැත.) | කාර්ය භාරයේ පවත්නා තත්ත්වයන් තුළ ලබාගත් සහතික වීමේ මට්ටම පිළිගත හැකි මට්ටමකට කාර්ය භාරයේ අවදානම් අඩු වන අවස්ථාවක, එහෙත් එම අවදානම සාධාරණ සහතික වීමේ කාර්ය භාරයකට වඩා වැඩි වන අවස්ථාවක තීරණයන් ප්‍රකාශ කිරීමේ පදනම ලෙසට වනුයේ SLSRE සමග අනුකූලවය. සාක්ෂි එක්රැස් කිරීමේ ක්‍රියා පටිපාටිවල ස්වභාවය, කල් නීර්ණය සහ ප්‍රමාණය සංයෝජනය කිරීම පරිචයේ යෙදෙන්නාට අවම වශයෙන් අර්ථවත් මට්ටමේ සහතිකයක් ලබා ගැනීමට ප්‍රමාණවත් වේ. මෙය අර්ථවත් වීමට නම් පරිචයේ යෙදෙන්නා විසින් ලබා ගන්නා සහතික වීමේ මට්ටම මූල්‍ය ප්‍රකාශ පිළිබඳ අපේක්ෂිත පරිශීලකයින්ගේ විශ්වාසය වැඩි කිරීමට හේතුවේ. |
| *මිණුම්කරු හෝ ඇගයුම්කරු.* | (අනුරූප නොමැත.) | නිර්නායකයට එරෙහිව පාදක කරගත් විෂයය කරුණු මනින හෝ ඇගයීමට. ලක් කරන පාර්ශ්ව(ය). මිනුම්කරුට හෝ ඇගයුම්කරුට පාදක කරගත් විෂයය කරුණු පිළිබඳ විශේෂඥ දැනුමක් සතුව ඇත. |
| * *අව ප්‍රකාශය.* | මූල්‍ය ප්‍රකාශයක, අයිතමයක වටිනාකම, වර්ගීකරණය ඉදිරිපත් කිරීම හෝ හෙළිදරව් කිරීම සහ අදාළ මූල්‍ය වාර්තාකරන ආකෘතිමය රාමුව සමග අනුකූලව_ප්‍රකාරව එම අයිතමය සඳහා අවශ්‍ය වන වටිනාකම, වර්ගීකරණය, ඉදිරිපත් කිරීම හෝ හෙළිදරව් කිරීම අතර වෙනසය. අවප්‍රකාශ දෝෂ හෝ වැරදිවලින් පැනනැගිය හැකිය. | මූල්‍ය ප්‍රකාශයක අයිතමයක වාර්තාකරන ලද වටිනාකම, වර්ගීකරනය, ඉදිරිපත් කිරීම හෝ හෙළිදරව් කිරීම හා අදාළ මූල්‍ය වාර්තාකරන ආකෘතිමය රාමුව සමග අනුකූලව එම අයිතමය සඳහා අවශ්‍යවන වටිනාකම, වර්ගීකරණය, ඉදිරිපත්කිරීම හෝ හෙළිදරව් කිරීම අතර වෙනසය. අවප්‍රකාශ දෝෂ හෝ වැරදිවලින් පැනනැගිය හැකිය.<br>SLSAE 3000 (සංශෝධිත) සන්දර්භය තුළ, අවප්‍රකාශයක් නිර්වචනය කරනු ලබන්නේ විෂයය කරුණු තොරතුරු සහ නිර්නායකය සමග අනුකූලව පාදක කරගත් විෂයය කරුණු අදාළ ලෙස මැනීම හෝ ඇගයීම අතර වෙනසක් ලෙසය. අව ප්‍රකාශ චේතාන්විත හෝ අචේතනීය, ගුණාත්මක හෝ ප්‍රමාණාත්මක විය හැකි අතර අත්හැරීම් ඇතුළත්වේ. |
| කරුණුවල අව ප්‍රකාශය | ~~විගණනය කල මූල්‍ය ප්‍රකාශවල~~ පෙන්නුම් කල කරුණුවලට සම්බන්ධයක් නොමැති වැරදි ලෙස සඳහන් කල හෝ ඉදිරිපත් කරන වෙනත් තොරතුරු, කරුණක ප්‍රමාණාත්මක අවප්‍රකාශයක් ~~විගණනය කල මූල්‍ය ප්‍රකාශයක~~ ඇතුළත් ලියවිල්ලක විශ්වාසතාව විශ්වාසවන්තකම පිළිගැනීමට හානිකර විය හැක. | *කරුණු අවප්‍රකාශය (වෙනත් තොරතුරු සම්බන්ධයෙන්) (SLSAE 3000 (සංශෝධිත)) සන්දර්භය තුළ* පෙන්නුම් කරන කරුණුවලට සම්බන්ධයක් නොමැති විෂය කරුණු තොරතුර හෝ සහතිකවීමේ වාර්තාව වැරදි ලෙස සඳහන් කල හෝ ඉදිරිපත් කල වෙනත් තොරතුරුය. කරුණක ප්‍රමාණාත්මක අව ප්‍රකාශයක් විෂයය කරුණු තොරතුරුවල අඩංගු ලියවිල්ලක විශ්වාසතාව පිළි ගැනීමට හානිවිය හැකිය. |

| විස්තරය | 2014 | 2017 |
|---|---|---|
| *වෙනත් තොරතුරු අව ප්‍රකාශය* | (අනුරූප නොමැත). | වෙනත් තොරතුරුවල අවප්‍රකාශව පවතින්නේ, වෙනත් තොරතුරු වැරදි ලෙස සඳහන් කළවිට හෝ වෙනත් ආකාරයකින් නොමග යවන සුළු වනවිටය. (වෙනත් තොරතුරුවලින් හෙළිදරව්වන කරුණක් පිළිබඳ නිසි අවබෝධයක් සඳහා අවශ්‍ය තොරතුරු මගහැරීම හෝ එය අපැහැදිලිවීම ඇතුළුව) |
| *විකරණය කළ මතයී* | කොන්දේසි සහිත මතයක්, අහිතකර මතයක් හෝ මතය වියාචනය කිරීමකි. | |
| *වෙනත් තොරතුරු* | ~~විගණනයකල මූල්‍ය ප්‍රකාශ සහ ඒ මත වූ විගණක ගේ වාර්තාව සමන්විත ලියවිල්ලක එක්කෝ නීතිය, රෙගුලාසි හෝ සිරිත් භාවිතය මගින් ඇතුළත් කර ඇති මූල්‍ය සහ මූල්‍ය නොවන තොරතුරු (මූල්‍ය ප්‍රකාශ සහ ඒ මත වූ විගණකගේ වාර්තාව හැර)~~ | මූල්‍ය ප්‍රකාශ මත වූ කොන්දේසි සහිත මතයක්, අහිතකර මතයක් හෝ මතය වියාචනය කිරීම.<br><br>අස්තිත්ත්වයක වාර්ෂික වාර්තාවේ ඇතුළත් මූල්‍ය හෝ මූල්‍ය නොවන තොරතුරු (මූල්‍ය ප්‍රකාශ සහ ඒ මත වූ විගණකගේ වාර්තාව හැර) |
| *වෙනත් තොරතුරු (SLSAE 3000 සන්දර්භය තුළ (සංශෝධිත))* | (අනුරූප නොමැත). | තොරතුරු (විෂය කරුණ තොරතුරු සහ ඒ මත සහතිකවීමේ වාර්තාව හැර) එක්කෝ නීතිය. රෙගුලාසි හෝ භාවිතය අනුව, විෂයය කරුණ සහ ඒ මත සහතික වීමේ වාර්තාව අඩංගු ලේඛනයක ඇතුළත් වේ. |
| පරිචයේ යෙදෙන්නා (SLSAE 3000 (සංශෝධිත) සන්දර්භය තුළ) | (අනුරූප නොමැත). | කාර්යභාරය මෙහෙයවන පුද්ගලයා(යන්) (සාමාන්‍යයෙන් කාර්යභාරයේ නියුක්ත හවුල්කරු හෝ කාර් කාර්යභාර කණ්ඩායමේ අනෙකුත් සාමාජිකයින් හෝ අදාළ වන පරිදි ව්‍යාපාරික සමාගම) SLSAE මගින් පැහැදිලිවම අදහස් කරන්නේ කාර්යභාරයේ නියුක්ත හවුල්කරු විසින් අවශ්‍යතාවයක් හෝ වගකීමක් ඉටුකල යුතු බවයි. මෙහිදී "පරිචයේ යෙදෙන්නා "වෙනුවට "කාර්යභාරයේ නියුක්ත හවුල්කරු" යන යෙදුම භාවිතාවේ. |
| පරිචයේ යෙදෙන්නා (SLSRE 2400 (සංශෝධිත) සන්දර්භය තුළ) | (අනුරූප නොමැත) . | පොදු පරිචයෙහි නිරත වෘත්තීය ගණකාධිකාරි වරයෙකි. මෙම යෙදුමට කාර්යභාරයේ නියුක්ත හවුල්කරු හෝ කාර්යභාරයේ නියුතු කණ්ඩායමේ අනෙකුත් සාමාජිකයින්, හෝ, අදාළ වන පරිදි සමාගම ඇතුළත් වේ. SLSRE 2400 (සංශෝධිත) මගින් පැහැදිලිවම අදහස් කරන්නේ කාර්යභාරයේ නියුක්ත හවුල්කරු විසින් අවශ්‍යතාවයක් හෝ වගකීමක් ඉටුකල යුතු බවයි. මෙහිදී "පරිචයේ යෙදෙන්නා" වෙනුවට "කාර්යභාරයේ නියුක්ත හවුල්කරු" යන යෙදුම භාවිතා වේ. "කාර්යභාරයේ නියුක්ත හවුල්කරු" සහ "සමාගම" යන්න කියවිය යුත්තේ අදාළ අවස්ථාවන්හිදී ඔවුන්ගේ රාජ්‍ය අංශයේ සමකයන් ගැන සඳහන් කරමිනි. |
| පරිචයේ යෙදෙන විශේෂඥයා | (අනුරූප නොමැත). | සහතිකවීම හැර වෙනත් ක්ෂේත්‍රයක් තුළ විශේෂඥතාවයක් සතුව පවතින පුද්ගලයෙකු හෝ ආයතනයක්, යෝග්‍ය සාක්ෂි ලබා ගැනීමේදී පරිචයේ යෙදෙන්නාට සහාය වීම සඳහා එම ක්ෂේත්‍රයේ ඔහුගේ සහාය පරිචයේ |

| විස්තරය | 2014 | 2017 |
|---|---|---|
| | | යෙදෙන්නා භාවිතා කරයි. පරිචයේ යෙදෙන්නෙකුගේ විශේෂඥයකු එක්කෝ පරිචයේ යෙදෙන්නාගේ අභ්‍යන්තර විශේෂඥයකු (පරිචයේ යෙදෙන්නාගේ සමාගම හෝ ජාල සමාගමක තාවකාලික සේවක මණ්ඩලය ඇතුළුව හවුල්කරු හෝ කාර්ය මණ්ඩලයක්) හෝ පරිචයේ යෙදෙන්නාගේ බාහිර විශේෂඥයකු විය හැකිය. |
| *වෘත්තීය ගණකාධිකාරී* | IFAC සාමාජික මණ්ඩලයේ වන පුද්ගලයෙක් | ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනයේ සාමාජිකයෙකු වන පුද්ගලයෙකු (CA ශ්‍රී ලංකා) |
| *වෘත්තීය විනිශ්චය (SLSAE 3000 (සංශෝධිත) සන්දර්භය තුළ)* | (අනුරූප නොමැත). | කාර්ය භාරයේ සැලකිල්ලට ගත යුතු කරුණු තුළ යෝග්‍ය ගත යුතු ක්‍රියා මාර්ග පිළිබඳ දැනුවත් තීරණ ගැනීමේදී සහතික වීම සහ ආචාර ධර්මීය ප්‍රමිත මගින් ලබාදෙන සම්බන්ධය ඇතුළත අදාළ පුහුණුව දැනුම සහ පලපුරුද්ද භාවිතා කිරීම. |
| *වෘත්තීය විනිශ්චය (SLSRE 2400 (සංශෝධිත) සන්දර්භය තුළ)* | (අනුරූප නොමැත). | සමාලෝචන කාර්ය භාරයේ සැලකිල්ලට ගතයුතු කරුණු තුළ යෝග්‍ය ගතයුතු ක්‍රියා මාර්ග පිළිබඳ දැනුවත් තීරණ ගැනීමේ සහතිකවීම්, ගිණුම්කරණය සහ ආචාර ධර්මය ප්‍රමිත, මගින් ලබාදෙන සම්බන්ධය ඇතුළත අදාළ පුහුණුව දැනුම සහ පලපුරුද්ද භාවිතා කිරීම. |
| *වෘත්තීය සංශය දෘෂ්ඨිය SLSAE 3000 (සංශෝධිත) සන්දර්භය තුළ)* | (අනුරූප නොමැත). | විය හැකි වැරදි ප්‍රකාශයක් සහ සාක්ෂි තීරණාත්මක තක්සේරුවක් ඇඟවිය හැකි පවත්නා තත්ත්වයකට සෝදිසියෙන් සිටින, ප්‍රශ්න කිරීමේ මනසක් ඇතුළත් වන ආකල්පයකි. |
| *වෘත්තීය ප්‍රමිති* | ~~විගණනය මත ජාත්‍යන්තර ප්‍රමිත~~ * (ශ්‍රී.ලං.වි.ප්‍ර) සහ අදාළ ආචාර ධර්ම අවශ්‍යතාවයන් | ශ්‍රී ලංකා විගණන ප්‍රමිත (ශ්‍රී.ලං.වි.ප්‍ර) සහ අදාළ ආචාර ධර්ම අවශ්‍යතාවයන්. |
| වෘත්තීය ප්‍රමිත. (SLSQC 1 සන්දර්භය තුළ) | තත්ත්ව පාලනය, විගණනය, සමාලෝචනය, වෙනත් සහතිකවීමේ සහ සම්බන්ධිත සේවා සහ අදාල ආචාර ධර්ම අවශ්‍යතාවයන් මත ශ්‍රී ලංකා ප්‍රමිතවලට වන ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනයේ (CA ශ්‍රී ලංකා) ප්‍රස්ථාවනාව තුළ නිර්වචනය කර ඇති පරිදි ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනය විසින් නිකුත්කර ඇති සහතික විමේ ප්‍රමිති. | ශ්‍රී ලංකා තත්ත්ව පාලනය, විගණනය, සමාලෝචනය, වෙනත් සහතික වීමේ සහ සම්බන්ධ සේවා ප්‍රකාශයට පත් කිරීම් හි, සහ අදාළ ආචාර ධර්ම අවශ්‍යතාවයන් හි ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනයේ (CA ශ්‍රී ලංකා) ප්‍රස්ථාවනාවේ, නිර්වචනය කර ඇති පරිදි ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනය විසින් නිකුත් කර ඇති සහතික වීමේ ප්‍රමිති. |
| *අදාල ආචාර ධර්ම අවශ්‍යතා* | කාර්යයේ භාරයේ නියුතු කණ්ඩායම සහ කාර්යයේ භාරයේ නියුක්ත තත්ත්ව පාලන සමාලෝචක යටත් වන ආචාර ධර්ම අවශ්‍යතාවයන්, සාමාන්‍යයෙන් සමන්විත වන්නේ. ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනයේ *වෘත්තීය ගණකාධිකාරීවරුන් සඳහා වන* ආචාරධර්ම සහ අ සහ ආ කොටස් (CA ශ්‍රී ලංකා සංග්‍රහයට) සමග එක්ව වඩාත් සීමාකාරී වන ජාතික අවශ්‍යතාවයන්ට වේ. ~~SLSRS 4410 (සංශෝධිත) සන්දර්භය තුළ අදාළ ආචාර ධර්ම අවශ්‍යතා නිර්වචනය කෙරෙන්නේ~~ | කාර්යභාරයේ නියුතු කණ්ඩායම සහ කාර්ය භාරයේ නියුක්ත තත්ව පාලන සමාලෝචක යටත් වන ආචාර ධර්ම අවශ්‍යතාවයන් සාමාන්‍යයෙන් සමන්විත වන්නේ ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනයේ *වෘත්තීය ගණකාධිකාරීවරුන් සඳහා වන ආචාර ධර්ම සංග්‍රහයේ* අ සහ ආ කොටස් (CA ශ්‍රී ලංකා සංග්‍රහය) සමග එක්ව වඩාත් සීමාකාරී වන ජාතික අවශ්‍යතාවයන්ට වේ. SLSRE 2400 (සංශෝධිත) සන්දර්භය තුළ අදාළ ආචාර ධර්ම අවශ්‍යතා නිර්වචනය කෙරෙන්නේ සමාලෝචනය කිරීමේ කාර්ය භාරය භාර |

| විස්තරය | 2014 | 2017 |
|---|---|---|
| | ~~සම්පාදනය කිරිමේ කාර්ය භාරය භාර ගන්නා අවස්ථාවේ කාර්ය භාරයේ නියුතු කණ්ඩායම යටත් වන ආචාර ධර්ම අවශ්‍යතාවයන් ලෙසටය. මෙම අවශ්‍යතා සාමාන්‍යයෙන් සමන්විත වන්නේ ගණකාධිකාරිවරුන් සඳහා වන ජාත්‍යන්තර ආචාර ධර්ම ප්‍රමිති මණ්ඩලයේ අ සහ ආ යන කොටස් *වෘත්තීය ගණකාධිවරුන් සඳහා ආචාර ධර්ම අඩංගු (CA ශ්‍රී ලංකා සංග්‍රහය)* ස්වාධීන විගණනයක සමාලෝචන කාර්යය භාර 290 වගන්තිය සහ - ආ කොටසෙහි ඇති වෙනත් සහතික කිරිමේ සහ ස්වාධීන වෙනත් සහතික වීමේ කාර්ය භාර ආ කොටස තුල 291 වගන්තිය හැර) වඩා සීමා කාරි ජාතික අවශ්‍යතා සමඟ එක්වය.~~ | ගන්නා අවස්ථාවේ කාර්ය භාරයේ නියුතු කණ්ඩායම යටත්වන ආචාර ධර්ම අවශ්‍යතා ලෙසටය. මෙම අවශ්‍යතා සාමාන්‍යයෙන් සමන්විත වන්නේ *වෘත්තීය ගණකාධිකාරීවරුන් සඳහා වන ආචාර ධර්ම සංග්‍රහයේ* (CA ශ්‍රී ලංකා සංග්‍රහය) අ සහ ආ යන කොටස් වඩා සීමාකාරී ජාතික අවශ්‍යතා සමග එක්වය. SLSRS 4410 (සංශෝධිත) සන්දර්භය තුළ අදාළ ආචාර ධර්ම අවශ්‍යතා නිර්වචනය කර ඇත්තේ සම්පාදනය කිරීමේ කාර්ය භාරයේ නියුතු කණ්ඩායම භාර ගන්නා අවස්ථාවේ යටත්වන ආචාර ධර්ම අවශ්‍යතාවයන් ලෙසටය. මෙම අවශ්‍යතා සාමාන්‍යයෙන් සමන්විත වන්නේ වෘත්තීය *ගණකාධිකාරීවරුන් සඳහා වන ආචාර ධර්ම සංග්‍රයේ* (CA ශ්‍රී ලංකා සංග්‍රහය) අ සහ ආ කොටස්වලින් *ස්වාධීන විගණන හා සමාලෝචන කාර්ය භාර* 290 වගන්තිය සහ ස්වාධීන වෙනත් සහතික කිරිමේ කාර්යභාර - ආ කොටස 291 වගන්තිය හැර) වඩා සීමාකාරී ජාතික අවශ්‍යතාවයන් සමග එක්වය . |
| සේවා ආයතනයක පාලන සැලසුම් කිරීම සහ විස්තර කිරීමේ වාර්තාව. (SLSAE 3402 හි "පළමු වර්ගයේ වාර්තාවක්" ලෙස හැඳින්වෙන) (SLSAE 3402 සන්දර්භය තුළ) | (අනුරූප නොමැත). | පහත දැ සමන්විත වන්නේ වාර්තාවක් ;<br>(අ) සේවා සංවිධානයේ එය පද්ධතිය පිළිබඳ විස්තරය;<br>(ආ) සියළු ප්‍රමාණාත්මක ආකාරයෙන් සියළුම සහ සුදුසු නිර්නායක මත පදනම්ව සේවා සංවිධානය විසින් නිකුත් කරන ලද ලිඛිත ප්‍රකාශයක්.<br>(i) සේවා ආයතනයේ පද්ධතිය සැලසුම් කල ලෙස සහ පැහැදිලිව සඳහන් කල දිනයේදී ක්‍රියාත්මක කරන ලද ආකාරය පිළිබඳ විස්තරය සාධාරණ ලෙස ගෙනහැර දක්වයි;<br>(ii) සේවා ආයතනය එහි පද්ධතිය පිළිබඳ විස්තරයේ සඳහන් කර ඇති පාලන අරමුණුවලට සම්බන්ධිත පාලනයන් නියම කරන දිනට සුදුසු පරිදි සැලසුම් කර ඇති බව; සහ<br>ඉහත (ආ) (i) - (ii) හි කරුණු පිළිබඳව සාධාරන සහතික වීමේ තීරණයකට එළඹෙන බව දන්වන සේවා විගණකගේ සහතික වීමේ වාර්තාව<br>* ශ්‍රී.ල.වි.ප්‍ර 402, *සේවා ආයතනයේ භාවිතා කරන අස්තිත්වකට සම්බන්ධ විගණන සළකා බැලීම.* |
| *සේවා ආයතනයක විස්තරය, සැලසුම් කිරිම සහ පාලනයන්හි මෙහෙයුම් සඵලදායිතාවය පිළිබඳ වාර්තාව.* | *(අනුරූප නොමැත.)* | පහතදැ සමන්විත වාර්තා:<br>(අ) සේවා ආයතනයේ එහි පද්ධතිය පිළිබඳ විස්තරය;<br>(ආ) ප්‍රමාණාත්මක ආකාරයෙන් සියළුම සහ සුදුසු නිර්නායක මත පදනම්ව සේවා සංවිධානය විසින් කරන ලද ලිඛිත ප්‍රකාශයක්.<br>(i) සේවා ආයතනයේ පද්ධතිය |

| විස්තරය | 2014 | 2017 |
|---|---|---|
| *(SLSAE 3402 හි "දෙවන වර්ගයේ වාර්තාවක් ලෙස හැඳින්වේ.) (SLSAE 3402 සන්දර්භය තුළ)* | | සැලසුම් කල ලෙස සහ පැහැදිලිව සඳහන් කල කාල පරිච්ඡේදය පුරාම ක්‍රියාත්මක කරන ලද ආකාරය පිළිබඳ විස්තරය සාධාරණ ලෙස ගෙන හැර දක්වයි.<br>(ii) සේවා ආයතනයේ එහි පද්ධතිය පිළිබඳ විස්තරයේ සඳහන් කර ඇති පාලන අරමුණුවලට සම්බන්ධිත පාලන පැහැදිලිව සඳහන් කාල සීමාව පුරාම සුදුසු පරිදි සැලසුම් කර ඇති බවත්; සහ<br>(iii) සේවා ආයතනයේ එහි පද්ධතිය පිළිබඳ විස්තරයේ සඳහන් කර ඇති පාලන අරමුණුවලට සම්බන්ධිත පාලන පැහැදිලිව සඳහන් කල කාල සීමාව පුරා සඵලදායී ලෙස මෙහෙයවන ලද. සහ<br>(ඇ) සේවා විගණකයේ සහතික වීමේ වාර්තාවක්.<br>(i) ඉහත (ආ) (i) - (iii) හි කරුණු පිළිබඳව සාධාරණ සහතික වීමේ තීරණයකට එලඹෙන බව;<br>(ii) පාලන පරීක්ෂණ සහ ඒ මත ප්‍රතිඵල පිළිබඳ විස්තරයක් ඇතුළත් සේවා විගණකගේ සහතික වීමේ වාර්තාව. |
| *වගකිව යුතු පාර්ශවය.* | (අ) ~~සෘජුවට වාර්තාකරණ කාර්ය භාරයකදී විෂය කරුණු පිළිබඳ වගකිව යුතු; හෝ~~<br>(අ) ~~සැඳැහුම් පදනම් කරගත් කාර්ය භාරයකදී විෂයය කරුණු තොරතුරු සඳහා වගකිව යුතු (සැඳැහුම) සහ විෂයය කරුණු සඳහා වගකිව යුතු විය හැකි පුද්ගලයා (හෝ පුද්ගලයින්) වගකිව යුතු පාර්ශවය, පරිචයේ යෙදෙන්නෙකු (කාර්ය භාරයේ නියුතු විට) කාර්ය භාරයේ යොදවන පාර්ශවය වීමට හෝ නොවීමට පුළුවන් .~~ | පාදක කරගත් විෂයය කරුණු සඳහා වගකිව යුතු පාර්ශ්ව(ය) |
| ප්‍රමාණාත්මක අව ප්‍රකාශයක දැක්වීමේ අවදානම *(SLSAE 3000 (සංශෝධිත) සන්දර්භය තුළ) (සංශෝධිත)* | (අනුරූප නොමැත). | කාර්යභාරයේ නිරත වීමට පෙර විෂයය කරුණු තොරතුර ප්‍රමාණාත්මක ලෙස අවප්‍රකාශ වී තිබීමේ අවදානම |
| *සේවා විගණක (SLSAE 3402 සන්දර්භය තුළ)* | (අනුරූප නොමැත). | සේවා ආයතනයක ඉල්ලීම පරිදි සේවා ආයතනයේ පාලන පිළිබඳ සහතික වීමේ වාර්තාවක් ලබාදෙන පරිචයේ යෙදෙන්නෙක්. |
| *සේවා ආයතනය (SLSAE 3402 සන්දර්භය තුළ)* | (අනුරූප නොමැත.) | පරිශීලක අස්තිත්වවල මූල්‍ය වාර්තා කරණයට එහි අභ්‍යන්තර පාර්ශවීය පාලනය සම්බන්ධිත ආයතනයක් (බණ්ඩයක්) බැවින් එම සේවා පරිශීලක අස්තිත්ත්වයකට ලබා දෙන තුන්වන පාර්ශවයේ ආයතනයක් (හෝ තුන්වන |

| විස්තරය | 2014 | 2017 |
|---|---|---|
| | | පාර්ශවයේ ආයතනයක ඛණ්ඩයක්) |
| *සේවා ආයතනයේ ප්‍රකාශය* | (අනුරූප නොමැත.) | සේවා ආයතනයක් තුල විස්තරය, සැලසුම් සහ පාලනයන්හි මෙහෙයුම් සඵලදායකත්වය මත වාර්තාවේ නිර්වචනය (ආ) තුළ (දෙවන වර්ගයේ වාර්තාවක) වන අවස්ථාවක හෝ සේවා ආයතනයක විස්තරය සහ පාලනයන්හි පාලන සැලසුම්කිරීම මත වාර්තාවේ නිර්වචනය (ආ) (1 වන වර්ගයේ වාර්තාවක් වන අවස්ථාවක) යොමු කල කරුණු පිළිබඳ ලිඛිත ප්‍රකාශයක් : |
| සේවා ආයතනයේ පද්ධතිය (හෝ පද්ධති) (SLSAE 3402 සන්දර්භය තුළ) | (අනුරූප නොමැත.) | සේවා විගණකගේ සහතික වීමේ වාර්තාව මගින් ආවරණය වන සේවා සමග පරිශීලක අස්තිත්ව වෙත සැපයීම සඳහා සේවා ආයතනය විසින් සැලසුම් කරන ලද, ක්‍රියාත්මක කරන ලද ප්‍රතිපත්ති සහ ක්‍රියා පටිපාටි, සේවා සංවිධානයේ පද්ධතිය පිළිබඳ විස්තරය හඳුනා ගැනීමට ඇතුලත්; ආවරණය වන සේවාවන් විස්තරය; සම්බන්ධ වන කාල පරිච්ඡේදය හෝ පළමු වර්ගයේ වාර්තාවක් වන අවස්ථාවක දිනය; පාලන අරමුණු; සහ අදාළ පාලනයන් . |
| *ශ්‍රී ලංකා ගිණුම් කරණ ප්‍රමිති* | (අනුරූප නොමැත.) | ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරි ආයතනය විසින් නිකුත් කර ඇති ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත. |
| *විෂයය කරුණ තොරතුරු* | ~~විෂයය කරුණක ඇගයීම හෝ මිනුමේ ප්‍රතිඵලය පරිචයේ යෙදෙන්නෙකු සහතිකවීමේ වාර්තාවක විෂයය කරුනු පිළිබඳ තම තීරණය ප්‍රකාශ කිරීම සඳහා යොදා ගනු ලබන සාධාරණ පදනමට අවශ්‍ය ප්‍රමාණවත් යෝග්‍ය සාක්ෂි රැස් කිරීම වේ.~~ | නිර්නායකයට එරෙහිව පාදක කරගත් විෂය කරුණ මැනීමේ හෝ ඇගයීමේ ප්‍රතිඵල, එනම්, පාදක කරගත් විෂයය කරුණට නිර්නායකය ව්‍යවහාර කිරීමෙන් ප්‍රතිඵලයක් වශයෙන් ලැබෙන තොරතුරු. |
| උප සේවා ආයතනය (SLSAE 3402 සන්දර්භය තුල) | (අනුරූප නොමැත.) | මූල්‍ය වාර්තාකරණයට එය සම්බන්ධිත වන නිසා පරිශිලක අස්තිත්ත්වයන් හි අභ්‍යන්තර පාලනයට අදාළ විය හැකි පරිශීලක අස්තිත්වයනට ලබා දෙන ඒවාවලින් සමහරක් ඉටු කිරීමට වෙනත් සේවා සංවිධානයන් විසින්, සේවා සංවිධානයක් භාවිතා කිරීම. |
| *පාලන පරික්ෂණ (SLSAE 3402 සන්දර්භය තුළ)* | (අනුරූප නොමැත.) | සේවා ආයතනය් එහි පද්ධතිය පිළිබඳ විස්තරයේ සඳහන් කර ඇති පාලන අරමුණු අත්පත් කර ගැනීමේදී පාලනයන් හි මෙහෙයුම් සඵලදායකත්ත්වය ඇගයීම සඳහා සැලසුම් කර ඇති ක්‍රියා පටිපාටිය. |
| *පාදක කරගත් විෂයය කරුණ* | (අනුරූප නොමැත.) | නිර්නායකය ව්‍යවහාර කිරීම මගින් මනින ලබන හෝ ඇගයීමට ලක්කරන සංසිද්ධිය. |
| භාවිත විගණක | (අනුරූප නොමැත.) | පරිශිලක අස්තිත්ත්වයක මූල්‍ය ප්‍රකාශ විගණනය කර වාර්තාකරණ විගණක. |
| *පරිශීලක අස්තිත්ත්වය (SLSAE 3402 සන්දර්භය තුළ)* | (අනුරූප නොමැත.) | සේවා ආයතනයක් භාවිතා කරන අස්තිත්ත්වයකි. |

| විස්තරය | 2014 | 2017 |
|---|---|---|
| **ශ්‍රී ලංකා විගණන ප්‍රමිත 200 (ශ්‍රී.ල.වි.ප්‍ර 200 - ස්වාධීන විගණකගේ සමස්ත අරමුණු සහ ශ්‍රී ලංකා විගණන ප්‍රමිතවලට අනුකූලව විගණනය සිදුකිරීම)** | | |
| 5 | .............. කෙසේ වෙතත් සාධාරණ සහතික වීම නිරපේක්ෂ මට්ටමේ සහතිකවීමක් නොවන්නේ බොහෝ විගණන සාක්ෂිවලට හේතුවන විගණනයක ආවේනික සීමාවන් ඇති බැවින් විගණක විසින් ලබාගත් තීරණයන් අතර විගණකගේ මතයේ පදනම තීරණාත්මක නොව ඒත්තු ගැන්විය හැකිය. (යොමුව : ~~අ 28 අ 52~~ ඡේද) | ........ කෙසේ වෙතත්, සාධාරන සහතික වීම නිරපේක්ෂ මට්ටමේ සහතික වීමක් නොවන්නේ බොහෝ විගණන සාක්ෂි වලට හේතුවන විගණනයක ආවේනික සීමාවන් ඇති බැවින් විගණක විසින් ලබගත් තීරණයන් අතර විගණකගේ මතයේ පදනම තීරණාත්මක නොව ඒත්තු ගැන්විය හැකිය. (යොමුව: අ 30-අ 54 ඡේද) |
| 13(ඒ) | මූල්‍ය ප්‍රකාශ.- මූල්‍ය වාර්තාකරණ ආකෘතිමය රාමුවක් සමග අනුකූලව යම් කාලයක අවස්ථාවකදී අස්තිත්වයක ආර්ථික සම්පත් හෝ බැඳීම් හෝ යම් කාල පරිච්ඡේදයක් තුළ එහි සිදුවන වෙනස්කම් සන්නිවේදනය කිරිමට අදහස් කරන සම්බන්ධිත සටහන් ඇතුළු ඓතිහාසික මූල්‍ය තොරතුරුවල ව්‍යුහාත්මක නියෝජනයකි. ~~සම්බන්ධිත සටහන් සාමාන්‍යයෙන් සැලකිය යුතු ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ වෙනත් පැහැදිලි කිරිමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත වේ.~~ "මූල්‍ය ප්‍රකාශ" යන යෙදුම සාමාන්‍යයෙන් යොමු වන්නේ අදාළ මූල්‍ය වාර්තාකරන ආකෘතිමය රාමුවේ අවශ්‍යතා මගින් තීරණය වන සම්පූර්ණ මූල්‍ය ප්‍රකාශ කට්ටලයකට වන නමුත්, තනි මූල්‍ය ප්‍රකාශයක් සඳහා ද යොමු විය හැකිය. | මූල්‍ය ප්‍රකාශ - මූල්‍ය වාර්තාකරන ආකෘතිමය රාමුවකට අනුකූලව යම් කාලයක අවස්ථාවකදී අස්තිත්වයක ආර්ථික සම්පත් හෝ බැඳීම් හෝ යම් කාල පරිච්ඡේදයක් තුළ එහි සිදුවන වෙනස්කම් සන්නිවේදනය කිරීමට අදාළ කරන හෙළිදරව් කිරීම්, ඇතුළු ඓතිහාසික මූල්‍ය තොරතුරුවල ව්‍යුහාත්මක නියෝජනයකි. "මූල්‍ය ප්‍රකාශ" යන යෙදුම සාමාන්‍යයෙන් යොමු වන්නේ අදාල මූල්‍ය වාර්තාකරන ආකෘතිමය රාමුවේ අවශ්‍යතා මගින් නිර්ණය වන සම්පූර්ණ මූල්‍ය ප්‍රකාශ කට්ටලයක වන නමුත් තනි මූල්‍ය ප්‍රකාශයක් සඳහා ද යොමුවිය හැකිය. හෙළිදරව් කිරීම් සමන්විත වන්නේ, අදාළ මූල්‍ය වාර්තාකරන ආකෘතිමය රාමුව මගින් හෝ වෙනත් ආකාරයකින් පැහැදිලිව අවසර දී ඇති අවශ්‍යකරන පරිදි, නියම කර ඇති මූල්‍ය ප්‍රකාශයේ මුහුණත මත හෝ සටහන් තුළ හෝ හරස් යොමු කිරීම් මගින් ඇතුලත් කර ඇති පැහැදිලි කිරීමක් හෝ විස්තරාත්මක තොරතුරුය. (යොමුව: අ 14 - අ 15 ඡේද) |
| 14 | මූල්‍ය ප්‍රකාශ විගණන කාර්යභාරයන්ට සම්බන්ධිතව විගණකවරයා ස්වාධීනත්වයට අදාල දේ ආචාර ධර්ම ඇතුළුව අදාල අවශ්‍යතා වලට විගණක අනුකූල විය යුතුය. (යොමුව: ~~අ14 – අ17~~ ඡේද) | මූල්‍ය ප්‍රකාශ විගණන කාර්ය භාරයන්ට සම්බන්ධිතව විගණකවරයා ස්වාධීනත්වයට අදාල දේ ඇතුළුව අදාල ආචාර ධර්ම අවශ්‍යතාවලට විගණක අනුකූල විය යුතුය. (යොමුව : අ16-අ19 ඡේද) |
| 15 | මූල්‍ය ප්‍රකාශ ප්‍රමාණාත්මකව අවප්‍රකාශ වීමට හේතුවන තත්ත්වයන් පැවතිය හැකි බව හඳුනාගෙන විගණක විසින් වෘත්තීය සංශය දෘෂ්ඨියෙන් යුක්තව විගණනයක් සැලසුම් කර ඉටු කළ යුතුය. (යොමුව: ~~18 අ 22~~ ඡේද) | මූල්‍ය ප්‍රකාශ ප්‍රමාණාත්මකව අව ප්‍රකාශ වීමට හේතුවන තත්වයන් පැවතිය හැකි බව හඳුනාගෙන විගණක විසින් වෘත්තීය සංශය දෘෂ්ඨියෙන් යුක්තව විගණනයක් සැලසුම් කර ඉටුකල යුතුය. (යොමුව: අ 20 – අ 24 ඡේද) |
| 16 | මූල්‍ය ප්‍රකාශ විගණනයක් සැලසුම් කිරිමේදී හා ඉටු කිරීමේදී විගණක විසින් වෘත්තීය විනිශ්චයක් යෙදිය යුතුය. යොමුව : ~~අ 23 – අ 27~~ ඡේද) | මූල්‍ය ප්‍රකාශ විගණනයක් සැලසුම් කිරිමේදී හා ඉටු කිරීමේදී විගණක විසින් වෘත්තීය විනිශ්චයක් යෙදිය යුතුය. (යොමුව: අ 25 - අ 29 ඡේද) |
| 17 | සාධාරණ සහතිකවීමක් ලබා ගැනීම | සාධාරණ සහතිකවීමක් ලබා ගැනීම සඳහා |

| විස්තරය | 2014 | 2017 |
|---|---|---|
| | සඳහා විගණන අවදානම පිළිගත හැකි පහත් මට්ටමකට අඩු කිරීමට ප්‍රමාණවත් සුදුසු විගණන සාක්ෂි විගණක විසින් ලබාගත යුතු අතර එමඟින් මතය පදනම් කර ගැනීම සඳහා සාධාරන තීරණ ලබාගැනීමට විගණකට හැකිවේ. (යොමුවඃ ~~අ 28 අ 52~~ ඡේද) | විගණන අවදානම පිළිගත හැකි පහත් මට්ටමකට අඩු කිරීමට ප්‍රමාණවත් සුදුසු විගණන සාක්ෂි විගණක විසින් ලබාගත යුතු අතර එමගින් මතය පදනම් කර ගැනීම සඳහා සාධාරණ තීරණ ලබාගැනීමට විගණකට හැකිවේ. (යොමුව : අ30 - අ 54 ඡේද) |
| 18 | විගණක, විගණනයට අදාළ සියළුම ශ්‍රී.ල.වි.ප්‍ර. වලට අනුකූල විය යුතුය. ශ්‍රී.ල.වි.ප්‍ර.යක් අදාල වන්නේ එම, ශ්‍රී.ල.වි.ප්‍ර.ය බල පැවැත්වෙන විට සහ ශ්‍රී.ල.වි.ප්‍ර.ය මගින් ආමන්ත්‍රණය කරන ලද පවත්නා තත්ත්වයන් පවතින විටය. (යොමුවඃ ~~අ 53 – අ.57~~ ඡේද) | විගණක, විගණනයට අදාළ සියළුම ශ්‍රී.ල.වි.ප්‍ර. වලට අනුකූල විය යුතුය. ශ්‍රී.ල.වි.ප්‍ර. යක් අදාළ වනනේ එම, ශ්‍රී.ල.වි.ප්‍ර.ය බල පැවැත්වෙන විට සහ ශ්‍රී.ල.වි.ප්‍ර.ය මගින් ආමන්ත්‍රණය කරන ලද පවත්නා තත්ත්වයන් පවතින විටය. (යොමුවඃ අ 55- අ 59 ඡේද) |
| 19 | ශ්‍රී.ල.වි.ප්‍ර. ක එහි ව්‍යවහාරකරණය සහ වෙනත් විස්තරාත්මක තොරතුරු ඇතුළුව, එහි සමස්ත අන්තර්ගතය පිළිබඳ අවබෝධයක් විගණකට තිබිය යුතු අතර, එමගින් එහි අරමුණු අවබෝධකර ගැනීමට සහ එහි අවශ්‍යතාවයන් නිසිලෙස යොදාගත හැක. (යොමුව : ~~අ 58 – අ 66~~ ඡේද) | ශ්‍රී.වි.ප්‍ර.තයක එහි ව්‍යවහාරකරණය සහ වෙනත් විස්තරාත්මක තොරතුරු ඇතුළුව එහි සමස්ත අන්තර්ගතය පිළිබඳ අවබෝධයක් විගණකට තිබිය යුතු අතර, එමගින් එහි අරමුණු අවබෝධ කර ගැනීමට හා එහි අවශ්‍යතා නිසිලෙස යොදාගත හැකිය.(යොමුව : අ 60 - අ 68 ඡේද) |
| 21 | විගණකගේ සමස්ත අරමුණ ඉෂ්ඨ කර ගැනීමට විගණනය සැලසුම් කිරීමේදී හා ඉටු කිරීමේදී විගණක අදාළ ශ්‍රී.ල.වි.ප්‍ර.තුළ සඳහන් කර ඇති අරමුණු ශ්‍රී.ල.වි.ප්‍ර. අතර පවතින අන්තර් සම්බන්ධතාවයන් සැලකිල්ලට ගෙන විගණක භාවිතා කල යුතුය. (යොමුව : ~~අ 67 – අ 69~~ ඡේද)<br>(අ) ශ්‍රී.ල.වි.ප්‍ර. මගින් අවශ්‍යකරන දේට අමතරව ශ්‍රී.ල.වි.ප්‍ර.තුළ සඳහන් කල අරමුණු ක්‍රියාවට නැංවීම තුළ යම් කිසි විගණන ක්‍රියාපටිපාටි අවශ්‍යදැයි නිර්ණය කිරීම. : සහ (යොමුවඃ ~~අ 70~~ ඡේදය)<br>(ආ)ප්‍රමාණවත් සුදුසු විගණන සාක්ෂි ලබාගෙන තිබේද යන්න ඇගයිය යුතුය. (යොමුව : ~~අ 71~~ ඡේදය) | විගණකගේ සමස්ත අරමුණ ඉෂ්ඨ කර ගැනීමට විගණනය සැලසුම් කිරීමේදී හා ඉටු කිරීමේදී විගණක අදාළ ශ්‍රී.ල.වි.ප්‍ර.යන්හි සඳහන් කර ඇති අරමුණ ශ්‍රී.ල.වි.ප්‍ර. අතර පවතින අන්තර් සම්බන්ධතාවයන් සැලකිල්ලට ගෙන විගණක භාවිතා කළ යුතුය. (යොමුවඃ අ69 - අ 71 ඡේද)<br>(අ) ශ්‍රී.ල.වි.ප්‍ර. මගින් අවශ්‍යකරන දේට අමතරව ශ්‍රී.ල.වි.ප්‍ර.තුල සඳහන් කල අරමුණු ක්‍රියාවට නැංවීම තුළ යම් කිසි විගණන ක්‍රියාපටිපාටි අවශ්‍යදැයි නිර්ණය කිරීම. : සහ (යොමුවඃ අ 72 ඡේදය)<br>(ආ) ප්‍රමාණවත් සුදුසු විගණන සාක්ෂි ලබාගෙන තිබේද යන්න ඇගයිය යුතුය. (යොමුව : අ 73 ඡේදය) |
| 22(ආ) | අවශ්‍යතාවය කොන්දේසි සහිත බැවින් සහ කොන්දේසිය නොපවතින බැවින් අවශ්‍යතාවයට අදාළ නොවේ. (යොමුව : ~~අ 72– අ 73~~ ඡේද) | අවශ්‍යතාවය කොන්දේසි සහිත බැවින් සහ කොන්දේසිය නොපවතින බැවින් අවශ්‍යතාවයට අදාළ නොවේ. (යොමුවඃ අ74-අ75) |
| 23 | විශේෂ අවස්ථාවලදී, ශ්‍රී.ල.වි.ප්‍ර. හි අදාළ අවශ්‍යතාවයකින් ඉවත්වීම අවශ්‍ය බව විගණක විසින් විනිශ්චය කළ හැකිය. එවැනි තත්ත්වයන් තුළ, විගණක විසින් එම අවශ්‍යතාවයේ අරමුණ ඉෂ්ඨ කර ගැනීම සඳහා විකල්ප විගණන ක්‍රියා පටිපාටි ඉටුකල යුතුය. විගණකට අදාළ අවශ්‍යතාවයකින් ඉවත් වීමේ අවශ්‍යතාවය පැන නගින්නේ නිශ්චිත ක්‍රියා පටිපාටියක් සිදුකිරීමේ අවශ්‍යතාවය ඇතිවිට සහ විගණනයේ නිශ්චිත තත්ත්වයන් තුළ, අවශ්‍යතාවයේ | විශේෂ අවස්ථාවලදී, ශ්‍රී.ල.වි.ප්‍ර. හි අදාළ අවශ්‍යතාවයකින් ඉවත්වීම අවශ්‍ය බව විගණක විසින් විනිශ්චය කළ හැකිය. එවැනි තත්ත්වයන් තුළ, විගණක විසින් එම අවශ්‍යතාවයේ අරමුණ ඉෂ්ඨ කර ගැනීම සඳහා විකල්ප විගණන ක්‍රියා පටිපාටි ඉටුකල යුතුය. විගණකට අදාල අවශ්‍යතාවයකින් ඉවත්වීමේ අවශ්‍යතාවය පැන නගින්නේ නිශ්චිත ක්‍රියා පටිපාටියක් සිදු කිරීමේ අවශ්‍යතාවය ඇතිවිට සහ විගණනයේ නිශ්චිත තත්ත්වයන් තුළ, අවශ්‍යතාවයේ ඉලක්කය සපුරා ගැනීමට |

| විස්තරය | 2014 | 2017 |
|---|---|---|
| | ඉලක්කය සපුරා ගැනීමට එම ක්‍රියා පටිපාටිය ඵලදායී නොවන විට දීය. (යොමුව: අ 74 ඡේදය) | එම ක්‍රියා පටිපාටිය ඵලදායී නොවන විට දීය. (යොමුව: අ 76 ඡේදය) |
| | අදාළ ශ්‍රී.ල.වි.ප්‍ර. හි පරමාර්ථයක් ඉෂ්ඨ කර ගත නොහැකි නම්, විගණකගේ සමස්ත අරමුණු සාක්ෂාත් කර ගැනීම සඳහා මෙය වළක්වන්නේද යන්න විගණක විසින් ඇගයීමට ලක්කළයුතු අතර, ඒ අනුව විගණකගේ මතය විකරණය කිරීම සඳහා ශ්‍රී.ල.වි.ප්‍ර. වලට අනුකූලව විගණක විසින් ක්‍රියා කිරිම අවශ්‍යවීම හෝ කාර්යයෙන් ඉවත්වීම (අදාල නීතිය හෝ රෙගුලාසි යටතේ ඉවත්වීම කළහැකි විට) කළ යුතුය. අරමුණක් සාක්ෂාත් කර ගැනීමට අපොහොසත් වීම සැළකිය යුතු කාරණයක් නියෝජනය වන බැවින් ශ්‍රී.ල.වි.ප්‍ර. 230 ට අනුකූලව ලේඛනගත කිරීම අවශ්‍යවේ. (යොමුව : අ 75 – අ 76 ඡේද) | අදාළ ශ්‍රී.ල.වි.ප්‍ර. හි පරමාර්ථයක් ඉෂ්ඨ කර ගත නොහැකි නම්, විගණකගේ සමස්ත අරමුණු සාක්ෂාත් කර ගැනීම සඳහා මෙය වළක්වන්නේද යන්න විගණක විසින් ඇගයීමට ලක් කල යුතු අතර, ඒ අනුව විගණකගේ මතය විකරණය කිරීම සඳහා ශ්‍රී.ල.වි.ප්‍ර. වලට අනුකූලව විගණක විසින් ක්‍රියා කිරිම අවශ්‍යවීම හෝ කාර්යයෙන් ඉවත්වීම (අදාළ නීතිය හෝ රෙගුලාසි යටතේ ඉවත්වීම කළහැකි විට) කළ යුතුය. අරමුණක් සාක්ෂාත් කර ගැනීමට අපොහොසත් වීම සැළකිය යුතු කාරණයක් නියෝජනය වන බැවින් ශ්‍රී.ල.වි.ප්‍ර. 230 ට අනුකූලව ලේඛනගත කිරීම අවශ්‍යවේ. (යොමුව: අ 77 - අ 78 ඡේද) |
| අ8 | උදාහරණයක් ලෙස ජාත්‍යන්තර රාජ්‍ය අංශයේ ගිණුම් කරන ප්‍රමිති මණ්ඩලය විසින් නිකුත් කරන ලද *ගිණුම් කරණයේ මුදල් පදනම් යටතේ මූල්‍ය වාර්තාකරනය* අනුව ජාත්‍යන්තර රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතයෙහි (IPSAS) දැක්වෙන පරිදි ප්‍රාථමික මූල්‍ය ප්‍රකාශය යනු රාජ්‍ය අංශයේ අස්තිත්වයක් IPSAS වලට අනුකූලව සිය මූල්‍ය ප්‍රකාශ මුදල් ලැබීම් හා ගෙවීම් අනුව පිළියෙල කරනු ලබන ප්‍රකාශයකි. | උදාහරණයක් ලෙස, ප්‍රාථමික මූල්‍ය ප්‍රකාශය යනු, රාජ්‍ය අංශයේ අස්තිත්වයක් මුදල් පදනම් ගිණුම්කරණය සමග අනුකූලව එහි මූල්‍ය ප්‍රකාශ සකස් කරන අවස්ථාවක මුදල් ලැබීම් සහ ගෙවීම් පිළිබඳ ප්‍රකාශයකි. |
| ශීර්ෂය | (අනුරූප නොමැත.) | නිර්වචන |
| උප ශිර්ෂය | (අනුරූප නොමැත.) | *මූල්‍ය ප්‍රකාශ* (යොමුව : 13 (ඊ) ඡේදය) |
| අ14 | (අනුරූප නොමැත.) | සමහර මූල්‍ය වාර්තාකරණ ආකෘතිමය රාමු අස්තිත්වයක ආර්ථික සම්පත් හෝ බැඳීම් වෙනත් භාෂිතයකින් යොමු කල හැකිය. උදාහරණයක් ලෙස, මේවා අස්තිත්වයේ වත්කම් සහ වගකීම් ලෙස හැඳින්විය හැකි අතර, ඒවා අතර අවශේෂ වෙනස ස්කන්ධය හෝ ස්කන්ධ හිමිකම් ලෙස හැඳින්විය හැකිය. |
| අ15 | (අනුරූප නොමැත.) | මූල්‍ය ප්‍රකාශවල ඇතුළත් කිරිමට අවශ්‍ය පැහැදිලි කිරිම් හෝ විස්තරාත්මක තොරතුරු අදාල වාර්තාකරණ ආකෘතිමය රාමුව මගින් කළමනාකරණ වාර්තාවක් හෝ අවදානම් වාර්තාවක් වැනි වෙනත් ලේඛනයක තොරතුරු වෙත හරස් යොමු කිරිමක් තුළින් සිදුකල හැකිය. “හරස් යොමු කිරිම මගින් එය ඇතුලත් කිරිම යනුවෙන් අදහස් කරන්නේ මූල්‍ය ප්‍රකාශ වල සිට අනෙක් ලේඛනයට ඇති හරස් යොමු කිරීම වන නමුත්, අනෙක් |

| විස්තරය | 2014 | 2017 |
|---|---|---|
| | | ලේඛනයේ සිට මූල්‍ය ප්‍රකාශ දක්වා නොවේ. අදාළ මූල්‍ය වාර්තාකරන ආකෘතිමය රාමුව පැහැදිලි කිරීමේ හෝ විස්තරාත්මක තොරතුරු සොයා ගතහැකි ස්ථානවවල හරස් යොමු කිරීම පැහැදිලිවම තහනම් නොකරන විට සහ තොරතුරු නිසි ලෙස හරස් යොමුකර ඇති විට එම තොරතුරු මූල්‍ය ප්‍රකාශවල කොටසක් වනු ඇත. |
| 2014 - අ 50<br>2017 - අ 52 | ~~අ 49~~ ඡේදයේ විස්තර කර ඇති ප්‍රවේශයන් සැලකිල්ලට ගෙන, ශ්‍රී.ල.වි.ප්‍ර.හි විගණනය සැලසුම් කිරීම සහ ඉටු කිරීම සඳහා වූ අවශ්‍යතා සහ විගණකට අවශ්‍යවන වෙනත් දෑ අතරටඃ | අ 51 ඡේදයේ විස්තර කර ඇති ප්‍රවේශයන් සැලකිල්ලට ගෙන, ශ්‍රී.ල.වි.ප්‍ර. හි විගණනය සැලසුම් කිරීම සහ ඉටුකිරීම සඳහා වූ අවශ්‍යතා සහ විගණකට අවශ්‍යවන වෙනත් දෑ අතරට; |
| 2014 - අ 69<br>2017 - අ 71 | අරමුණු භාවිතා කිරීමේදී, විගණක ශ්‍රී.ල.වි.ප්‍ර. අතර ඇති අන්තර් සම්බන්ධතා වලට සැළකිලිමත් වීම අවශ්‍යවේ. මෙයට හේතු වන්නේ ~~අ 53~~ ඡේදයේ සඳහන් කර ඇති පරිදි, ශ්‍රී.ල.වි.ප්‍ර. සමහර අවස්ථා වලදී සාමාන්‍ය වගකීම් සමග කටයුතු කරන අතර, තවත් සමහරක එම වගකීම් විශේෂිත මාතෘකා සමඟ ව්‍යවහාර කරන නිසාය. | අරමුණු භාවිතා කිරීමේදී, විගණක ශ්‍රී.ල.වි.ප්‍ර. අතර ඇති අන්තර් සම්බන්ධතා වලට සැළකිලිමත් වීම අවශ්‍ය වේ. මෙයට හේතු වන්නේ, අ 55 ඡේදයේ සඳහන්කර ඇති පරිදි, ශ්‍රී.ල.වි.ප්‍ර. සමහර අවස්ථා වලදී සාමාන්‍ය වගකීම් සමග කටයුතු කරන අතර, තවත් සමහරක එම වගකීම් විශේෂිත මාතෘකා සමග ව්‍යවහාර කරන නිසාය. |
| **ශ්‍රී ලංකා විගණන ප්‍රමිත 210 (ශ්‍රී.ල.වි.ප්‍ර. 210 - විගණන කාර්යභාරයන්හි නියමයන්ට එකගවීම** | | |
| 6 (ආ) | එහි වගකීම කළමණාකාරිත්වය පිළිගන්නා බවට සහ තේරුම් ගන්නා බවට කළමනාකාරිත්වයේ එකඟතාවය ලබාගැනීම. (යොමුවඃ අ 11 - අ 14, ~~අ 20~~ ඡේද) | එහි වගකීම කළමණාකාරිත්වය පිළිගන්නා බවට සහ තේරුම් ගන්නා බවට කළමනාකාරිත්වයේ එකඟතාවය ලබාගැනීම. (යොමුවඃ අ 11 - අ 14, අ 21) |
| 9 | විගණක විගණන කාර්ය භාරයේ නියමයන් පිළිබඳව අදාල වන පරිදි කළමනාකරණය සමග හෝ පාලනය පිළිබඳ වගකිව යුතු අය සමග එකඟ විය යුතුය. (යොමුව : ~~අ 21~~ ඡේදය) | විගණක විගණන කාර්යභාරයේ නියමයන් පිළිබඳව අදාළ වන පරිදි කළමනාකරණය සමඟ හෝ පාලනය පිළිබඳ වගකිව යුතු අය සමග එකඟ විය යුතුය. (යොමුවඃ අ 22 ඡේදය) |
| 10 | 11 වන ඡේදයට යටත්ව, විගණන කාර්යය සඳහා එකඟ වූ නියමයන් විගණනය භාර ගැනීමේ ලිපියෙහි සඳහන් කිරීම හෝ වෙනත් සුදුසු ලිඛිත ගිවිසුමක ඒවා ඇතුලත් කිරීම කළ යුතු අතර අඩංගු විය යුත්තේ : (යොමුව : ~~අ 22 අ 25~~ ඡේද) | 11 වන ඡේදයට යටත්ව, විගණන කාර්යය සඳහා එකඟ වූ නියමයන් විගණනය භාර ගැනීමේ ලිපියෙහි හෝ වෙනත් සුදුසු ලිඛිත ගිවිසුමක ඒවා ඇතුළත් කිරීම කළ යුතු අතර අඩංගු විය යුත්තේ : (යොමුව : අ 23 - අ 27 ඡේද) |
| 10 (ඉ) | විගණක විසින් නිකුත් කරනු ලබන කිසියම් වාර්තාවක අපේක්ෂිත ආකෘතිය සහ අන්තර්ගතය පිළිබඳ යොමුව සහ ~~වාර්තාව, එහි ආකෘතියට අපේක්ෂිත හා අන්තර්ගතයට වඩා වෙනස් විය හැකි අවස්ථා ඇති බවට ප්‍රකාශයක්.~~ | විගණක විසින් නිකුත් කරනු ලබන කිසියම් වාර්තාවක අපේක්ෂිත ආකෘතිය සහ අන්තර්ගතය පිළිබඳ යොමුව සහ (යොමුව : අ 24 ඡේදය) |
| 10 (ඊ) | අනුරූප නොමැත. | වාර්තාවක්, එහි අපේක්ෂිත ආකෘතියට හා අන්තර්ගතයට වඩා වෙනස් විය හැකි අවස්ථා ඇති බවට ප්‍රකාශයක්. |
| 11 | 10 වන ඡේදයේ සඳහන් කළ විගණන | 10 වන ඡේදය තුළ සඳහන් කළ විගණන |

| විස්තරය | 2014 | 2017 |
|---|---|---|
| | කාර්ය භාරයේ නියමයන් හි ප්‍රමාණවත් විස්තර නීතිය හෝ නියාමනයෙන් නියම කරයිනම්, 6(ආ) ඡේදය තුළ පැහැදිලි කර ඇති ලෙස එබඳු නීතිය හෝ නියාමන අදාල වන්නේ සහ එහි වගකීම් කලමනාකාරිත්වය අවබෝධ කරගෙන හා පිළිගෙන ඇත යන කරුණ සඳහා හැර, ඒවා ලිඛිත එකඟවීමක වාර්තා නොකලයුතුය. (යොමුව : ~~අ 22~~, ~~අ 26 - අ 27~~ ඡේද). | කාර්ය භාරයේ නියමයන් හි ප්‍රමාණවත් විස්තර නීතිය හෝ රෙගුලාසි එහි නියම කරයිනම්, 6 (ආ) ඡේදය තුළ පැහැදිලි කර ඇති ලෙස එබඳු නීතිය හෝ රෙගුලාසි අදාල වන්නේ සහ එහි වගකීම් කලමනාකාරිත්වය අවබෝධ කරගෙන හා පිලිගෙන ඇත යන කරුණ සඳහා හැර, ඒවා ලිඛිත එකඟවීමක වාර්තා නොකල යුතුය. (යොමුව :අ 23, අ 28 - අ 29 ඡේද). |
| 12 | 6 (ආ) ඡේදය තුළ විස්තර කල දේම කලමනාකාරිත්වයේ වගකීම් එක සමාන බව නීතියෙන් හෝ නියාමනයෙන් නියම කරන්නේ නම්, එම ඡේදය තුල පැහැදිලි කරන දේ සත්‍ය ලෙසම සමාන වන බව විගණකගේ විනිස්චය තුල එම වගකීම් නීතියේ හෝ, රෙගුලාසිවල ඇතුලත් බව විගණකට තීරණය කල හැකිය. එම වගකීම් සමාන වන විට ලිඛිත ගිවිසුමේ විස්තර කිරිම සඳහා නීතියේ හෝ නියාමන වල ඇති වචන පෙළ ගැස්ම විගණක හට භාවිතා කළ හැකිය. නීතියෙන් හෝ නියාමනයෙන් නියම කර නොමැති, ඒවායේ බලපෑම සමාන වන වගකීම් සඳහා 6 (ආ) ඡේදයේ දක්වා ඇති පරිදි ලිඛිත එකඟවීමට යොදාගත හැකිය. (යොමුව : ~~අ 26~~ ඡේදය) | 6 (ආ) ඡේදය තුළ විස්තර කල දේට කළමනාකාරිත්වයේ වගකීම් එක සමාන බව නීතියෙන් හෝ නියාමනයෙන් නියම කරන්නේ නම්, එම ඡේදය තුල පැහැදිලිකරන දේ සත්‍ය ලෙසම සමාන වන බව, විගණකගේ විනිශ්චය තුළදී එම වගකීම් නීතියේ හෝ රෙගුලාසිවල ඇතුලත් බව විගණකට තීරණය කල හැකිය. එම වගකීම් සමාන වන විට ලිඛිත ගිවිසුමේ විස්තර කිරීම සඳහා නීතියේ හෝ නියාමනවල ඇති වචන පෙලගැස්ම විගණක හට භාවිතා කළ හැකිය. නීතියෙන් හෝ නියාමනයෙන් නියම කර නොමැති, ඒවායේ බලපෑම සමාන වන වගකීම් සඳහා 6 (ආ) ඡේදයේ දක්වා ඇති පරිදි ලඛිත එකඟවීමට යොදාගත හැකිය. (යොමුව : අ 28 ඡේදය) |
| 13 | පුනරාවර්තන වන විගණනයන්හිදී, විගණන කාර්යභාරයේ කොන්දේසි සංශෝධනය කලයුතු තත්වයක් අවශ්‍ය වී ඇත්ද යන්න තක්සේරු කිරීම සහ විගණන කාර්ය භාරයේ පවත්නා කොන්දේසි අස්තිත්ත්වයට මතක් කර දීමේ අවශ්‍යතාවයක් තිබේද යන්න පිළිබඳව විගණක තක්සේරු කළ යුතුය. (යොමුව: ~~අ 28~~ ඡේදය) | පුනරාවර්තන වන විගණනයන්හිදී, විගණන කාර්යභාරයේ කොන්දේසි සංශෝධනය කලයුතු තත්වයක් අවශ්‍ය වී ඇත්ද යන්න තක්සේරු කිරීම සහ විගණන කාර්ය භාරයේ පවත්නා නියමයන් අස්තිත්ත්වයට මතක් කර දීමේ අවශ්‍යතාවයක් තිබේද යන්න පිළිබඳව විගණක තක්සේරු කළ යුතුය. (යොමුව: අ 30 ඡේදය) |
| 14 | සහේතුක යුක්ති සහගත බවක් නොමැති වන අවස්ථාවක විට විගණන කාර්යභාරයේ කොන්දේසි නියමයන් වෙනස් කිරීමට විගණක එකඟ නොවිය යුතුය. (යොමුව: ~~අ 29- අ 31~~ඡේද) | සහේතුක යුක්ති සහගත බවක් නොමැති වන අවස්ථාවක විගණන කාර්යභාරයේ කොන්දේසි වෙනස් කිරීමට විගණක එකඟ නොවිය යුතුය. (යොමුව: අ 31- අ 33 ඡේද) |
| 15 | විගණන කාර්ය භාරය සම්පූර්ණ කිරිමට පෙර, විගණන කාර්ය භාරයෙන් පහළ මට්ටමේ සහතිකවීමක් දන්වන ලබාදෙන විගණන කාර්ය භාරයකට වෙනස් කරදෙන ලෙසට විගණකගෙන් ඉල්ලා සිටියහොත් එසේ කිරීම සඳහා සහේතුක යුක්ති සහගත වීමක් සාධාරන හේතුවක් තිබේද යන්න පිළිබඳව විගණක විසින් නිර්ණය කල යුතුය. (යොමුව : ~~අ 32- අ 33~~ ඡේද) | විගණන කාර්ය භාරය සම්පූර්ණ කිරීමට පෙර, විගණන කාර්ය භාරයෙන් පහළ මට්ටමේ සහතික වීමක් දන්වන විගණන කාර්ය භාරයකට වෙනස් කරදෙන ලෙසට විගණකගෙන් ඉල්ලා සිටියහොත් එසේ කිරිම සඳහා සහේතුක යුක්ති සහගත වීමක් තිබේද යන්න පිළිබඳව විගණක විසින් නිර්ණය කල යුතුය. (යොමුව : අ 34 - අ 35 ඡේද) |
| 18 | ඉහත ක්‍රියාවන් කිසිවක් කළ නොහැකි | ඉහත ක්‍රියාවන් කිසිවක් කළ නොහැකි |

| විස්තරය | 2014 | 2017 |
|---|---|---|
| | නම් ශ්‍රී.ල.වි.ප්‍ර. 705 සමග අනුකූලව විගණකගේ මතය විකරණය කිරිම අවශ්‍ය වන්නේ දැයි විගණක විසින් තීරණය නිර්ණය කළ යුතුය. (යොමුව: ~~අ 34~~ ඡේදය) | නම් ශ්‍රී.ල.වි.ප්‍ර. 705 සමග අනුකූලව විගණකගේ මතය විකරණය කිරිම අවශ්‍ය වන්නේ දැයි විගණක විසින් නිර්ණය කළ යුතුය. (යොමුව: අ 36 ඡේදය) |
| 21 | විගණකගේ වාර්තාවේ අතිරේක පැහැදිලි කිරීමකින් සිදුවිය හැකි වරදවා වටහා ගැනීම ලිහිල් කළ නොහැකි බවට විගණක තීරණය කළහොත්, නීතියෙන් හෝ නියාමන වලින් අවශ්‍ය වන්නේ නම් මිස විගණක විසින් විගණන කාර්ය භාරය භාර නොගත යුතුය. එවැනි නීතියකට හෝ නියාමනකට අනුකූලව මෙහෙයවනු ලබන විගණනයක් ශ්‍රී.ල.වි.ප්‍ර. සමග අනුකූල නොවේ. ඒ අනුව, විගණක විසින් විගණන කාර්ය භාරය ශ්‍රී.ල.වි.ප්‍ර. වලට අනුකූලව සිදුකර ඇති බවට විගණකගේ වාර්තාවේ කිසිදු සඳහනක් නොකල යුතුය. (යොමුව: ~~අ 36 – අ 37~~ ඡේද) | විගණකගේ වාර්තාවේ අතිරේක පැහැදිලි කිරීමකින් සිදුවිය හැකි වරදවා වටහා ගැනීම ලිහිල්කල නොහැකි බවට විගණක තීරණය කළහොත්, නීතියෙන් හෝ නියාමන වලින් අවශ්‍ය වන්නේ නම් මිස විගණක විසින් විගණන කාර්ය භාරය භාර නොගත යුතුය. එවැනි නීතියකට හෝ නියාමනකට අනුකූලව මෙහෙයවනු ලබන විගණනයක් ශ්‍රී.ල.වි.ප්‍ර. සමග අනුකූල නොවේ. ඒ අනුව, විගණක විසින් විගණන කාර්ය භාරය ශ්‍රී.ල.වි.ප්‍ර. වලට අනුකූලව සිදුකර ඇති බවට විගණකගේ වාර්තාවේ කිසිදු සඳහනක් නොකල යුතුය. (යොමුව: අ 38 - අ 39 ඡේද) |
| අ11 | ශ්‍රී.ල.වි.ප්‍ර. සමග අනුකූලව විගණනයක් මෙහෙයවන විට 6 (ආ) ඡේදය තුළ නියමකර ඇති වගකීම් කලමනාකාරීත්වයට ඇති බව කළමනාකාරිත්වය පිළිගෙන සහ අවබෝධකර ගෙන ඇති බවට වන පූර්වායවය (තර්කාංගය) මතය. * සමහර අධිකරණ බල ප්‍රදේශවල එවැනි වගකීම් නීතියෙන් හෝ රෙගුලාසි මගින් නියම කළ හැකිය. එවැනි වගකීම් පිළිබඳ නෛතික හෝ නියාමන නිර්වචන අනෙක් ඒවා තුළ සුළු වශයෙන් තිබිය හැකි හෝ තිබිය නොහැකි විය හැකිය. එවැනි කරුණු වලදී ශ්‍රී.ල.වි.ප්‍ර නීතිය හෝ රෙගුලාසි මැදිහත්වී අක්‍රීය කරන්නේ නැත. කෙසේ වෙතත්, ස්වාධීන විගණනයක සංකල්පය, මූල්‍ය ප්‍රකාශ පිළියෙල කිරීම සඳහා හෝ අස්තිත්ත්වය සම්බන්ධිත අභ්‍යන්තර පාලන සඳහා වගකීම භාර ගැනීමට විගණකගේ භූමිකාව සම්බන්ධ වීම අවශ්‍ය නොකෙරෙන අතර කළමනාකාරීත්වය කිසියම් ප්‍රමාණයකට ලබාදිය හැකි හෝ ලබාගතහැකි විගණනය සඳහා අවශ්‍ය කරණ තොරතුරු ලබාගැනීමෙහි සාධාරණ අපේක්ෂාවක් විගණකට ඇත. ඒ අනුව මෙම පූර්වායවයවය ස්වාධීන විගණනයක් මෙහෙයවීම සඳහා මූලික වේ. අවබෝධ කර ගැනීමට අපොහොසත් වීම වැළැක්වීම සඳහා එවැනි වගකීම් ඇති බව පිළිගන්නා බව සහ තේරුම් ගන්නා බව නියමයන් ලෙසට එකඟව 9-12 ඡේදය තුළ විගණන කාර්ය භාරයේ කොටසක් ලෙස ලේඛනගත කර කළමනාකාරීත්වය සමඟ එකඟතාවයකට පැමිනේ. | ශ්‍රී.ල.වි.ප්‍ර. සමග අනුකූලව විගණනයක් මෙහෙයවන විට 6 (ආ) ඡේදය තුළ නියමකර ඇති වගකීම් කලමණාකාරීත්වයට ඇතිබව කළමනාකාරීත්වය පිළිගෙන සහ අවබෝධ කරගෙන ඇති බවට වන පූර්වායවය (තර්කාංගය) මතය. * සමහර අධිකරණ බල ප්‍රදේශවල එවැනි වගකීම් නීතියෙන් හෝ රෙගුලාසි මගින් නියම කළ හැකිය. එවැනි වගකීම් පිළිබඳ නෛතික හෝ නියාමන නිර්වචන අනෙක් ඒවා තුළ සුළු වශයෙන් තිබිය හැකි හෝ තිබිය නොහැකි විය හැකිය. එවැනි කරුණුවලදී ශ්‍රී.ල.වි.ප්‍ර නීතිය හෝ රෙගුලාසි මැදිහත්වී අක්‍රීය කරන්නේ නැත. කෙසේ වෙතත්, ස්වාධීන විගණනයක සංකල්පය මූල්‍ය ප්‍රකාශ පිළියෙල කිරීම සඳහා හෝ අස්තිත්ත්වය සම්බන්ධිත අභ්‍යන්තර පාලන සඳහා වගකීම භාර ගැනීම සඳහා විගණකගේ භූමිකාව සම්බන්ධ වීම අවශ්‍ය නොකෙරෙන අතර කළමනාකාරීත්වය (පොදු සහ උපයෝගි ලෙජර වලින් බාහිරව ලබාගත් තොරතුරු ඇතුලුව කිසියම් ප්‍රමාණයකට ලබා දිය හැකි හෝ ලබාගතහැකි විගණනය සඳහා අවශ්‍ය කරණ තොරතුරු ලබාගැනීමෙහි සාධාරණ අපේක්ෂාවක් විගණකට ඇත). ඒ අනුව මෙම පූර්වායවය ස්වාධීන විගණනයක් මෙහෙයවීම සඳහා මූලික වේ. අවබෝධ කර ගැනීමට අපොහොසත්වීම වැළැක්වීම සඳහා එවැනි වගකීම් ඇති බව පිළිගන්නා බව සහ තේරුම් ගන්නා බව නියමයන් |

| විස්තරය | 2014 | 2017 |
|---|---|---|
| | | ලෙසට එකඟව 9-12 ඡේදය තුළ විගණන කාර්යභාරයේ කොටසක් ලෙස ලේඛනගත කර කළමනාකාරීත්ත්වය සමඟ එකඟතාවයකට පැමිණේ. |
| පාද සටහන | * ශ්‍රී.ල.වි.ප්‍ර. 200, ~~අ 2~~ ඡේදය | ** ශ්‍රී.ල.වි.ප්‍ර. 200, අ 4 ඡේදය |
| උප ශීර්ෂය | (අනුරූප නොමැත). | අමතර තොරතුරු (යොමුව : 6 (ආ) (iii) ආ ඡේද) |
| 2014 - අනුරූප ඡේදයක් නොමැත. 2017- අ 20 | (අනුරූප නොමැත). | විගණනයේ අරමුණු සඳහා අදාල වන විට, ශ්‍රී.ල.වි.ප්‍ර. 720 (සංශෝධිත) සමඟ අනුකූලව වෙනත් තොරතුරු හා සම්බන්ධ කරුණු ඇතුලත් අතිරේක තොරතුරු විගණන කළමනාකාරිත්වයෙන් ඉල්ලා සිටිය හැකිය. විගණකගේ වාර්තාවේ දිනට පසුව වෙනත් තොරතුරු ලබා ගැනීමට විගණක අපේක්ෂා කරන විට, එසේ විගණකගේ වාර්තාවේ දිනට පසුව ලබාගත් වෙනත් තොරතුරු වල ප්‍රමාණාත්මක අව ප්‍රකාශ ඇති බවට විගණක තීරණය කරන්නේ නම්, අදාල නම් සුදුසු හෝ අවශ්‍ය විය හැකි ක්‍රියා සහ විගණන කාර්යයෙහි නියමයන් ද ඇතුළුව වෙනත් තොරතුරු වලට අදාල විගණකගේ වගකීම් ද සමගින් දැනුවත් කළ යුතුය. |
| 2014 - අනුරූප ඡේදයක් නොමැත. 2017- අ 24 | (අනුරූප නොමැත). | • ශ්‍රී.ල.වි.ප්‍ර. 701* සමඟ අනුකූලව විගණකගේ වාර්තාවේ ඇතුළත් ප්‍රධාන විගණන කරුණු විගණන සන්නිවේදනය කිරීම සඳහා අවශ්‍යතාවය<br>• හෙළිදරව් කිරීම්වලට අදාල තොරතුරු සඳහා වන ප්‍රවේශය කළමනාකාරිත්වය ලබාදෙනු ඇතැයිවන අපේක්ෂාව ද ඇතුළුව මූල්‍ය ප්‍රකාශ පිළියෙල කිරීමට අදාල වන කළමනාකාරිත්වය දැනුවත් සියළු තොරතුරු, සඳහා වන ප්‍රවේශය කළමනාකාරිත්වය විසින් ලබාදෙනු ඇතැයි අපේක්ෂා කිරීම.<br>• කෙටුම්පත් කළ මූල්‍ය ප්‍රකාශ, ඒවා සකස් කිරීමට අදාල සියළු තොරතුරු පොදු හා උපයෝගී ලෙජර වලින් හෝ පිටතින් ලබාගෙන තිබේද යන්න ඇතුළුව, (හෙළිදරව් කිරීම් සකස් කිරීමට අදාල සියළු තොරතුරු ඇතුළුව) සහ වෙනත් තොරතුරු**, ඇත්නම්, යෝජිත කාල සටහනට අනුකූලව පමානොවී විගණනය |

| විස්තරය | 2014 | 2017 |
|---|---|---|
| | | සම්පූර්ණ කිරීමට විගණකට ඉඩදීමට, විගණක වෙත ලබාදීම සඳහා කළමනාකාරිත්වයේ එකඟතාවය.<br>* ශ්‍රී.ල.වි.ප්‍ර. 701, *ස්වාධීන විගණකගේ වාර්තාවේ ප්‍රධාන විගණන කරුණු සන්නිවේදනය කිරීම.*<br>** ශ්‍රී.ල.වි.ප්‍ර. 720 (සංශෝධිත) හි නිර්වචනය කර ඇති පරිදි, *වෙනත් තොරතුරුවලට සම්බන්ධිත විගණකගේ වගකීම්.* |
| 2014 - අනුරූප ඡේදයක් නොමැත.2017- අ25 | (අනුරූප නොමැත.) | ප්‍රධාන විගණන කරුණු සන්නිවේදනය කිරීමට විගණකට අවශ්‍ය නොවන විට, විගණන කාර්යභාරයේ නියමයන් ලෙස, විගණකගේ වාර්තාවේ ප්‍රධාන විගණන කරුණු සන්නිවේදනය කිරීමේ හැකියාව සඳහන් කිරීම විගණකට ප්‍රයෝජනවත් විය හැකි අතර, සමහර අධිකරණ බල ප්‍රදේශ වල, විගණකට එසේ කිරීමේ හැකියාව රඳවා ගැනීම සඳහා ඒවැනි හැකියාවක් පිළිබඳ සඳහනක් කිරීම අවශ්‍ය විය හැකිය. |
| 2014 - අ 26<br>2017- අ 28 | ~~අ 22 සහ අ 27 ඡේදවල~~ විස්තර කර ඇති තත්ත්වයන් යටතේ විගණන කාර්යය භාරයේ සමහර කොන්දේසි විගණන කාර්යය භාර ගැනීමේ ලිපියෙහි සටහන් කිරීමට තීරණය කරන්නේ නම්, 6 (ආ) ඡේදයේ දක්වා ඇති වගකීම් ඇති බවට පිළිගෙන තේරුම් ගත් බවට 11 වන ඡේදයට අනුව තවමත් විගණක කළමනාකාරිත්වයේ ලිඛිත එකඟතාවය ලබාගැනීම අවශ්‍ය බවට දක්වා ඇත. කෙසේ වෙතත්, 12 වන ඡේදය සමඟ අනුකූලව, එවැනි ලිඛිත එකඟවීමක් නීතිය හෝ රෙගුලාසි වල වචන පෙල ගැස්මක් භාවිතා කල හැක. එවැනි නීතියක් හෝ රෙගුලාසි කළමනාකාරිත්වයේ වගකීම ස්ථාපනය කරන්නේ නම් ඒවා හෝ නියාමනයේ වචන භාවිතා කර ඇත්නම් ඇත්ත වශයෙන්ම 6 (ආ) ඡේදයේ විස්තර කර ඇති දැට සමානය. ගිණුම්කරණ වෘත්තිය විගණන ප්‍රමිති සැකසුම්කරු හෝ අධිකරණ බල ප්‍රදේශය තුල විගණන නියාමක විසින් නීතියේ හෝ රෙගුලාසිවල ඇති විස්තරයට සමාන මඟ පෙන්වීමක් ලබා දී ඇත. | අ 23 සහ අ 29 ඡේදවල විස්තර කර ඇති තත්ත්වයන් යටතේ, විගණන කාර්ය භාරයේ සමහර කොන්දේසි විගණන කාර්යය භාර ගැනීමේ ලිපියෙහි සටහන් කිරීමට තීරණය කරන්නේ නම්, 6 (ආ) ඡේදයේ දක්වා ඇති වගකීම් ඇති බවට පිළිගෙන තේරුම් ගත් බවට, 11 වන ඡේදයට අනුව තවමත් විගණක විසින් කළමනාකාරිත්වයේ ලිඛිත එකඟතාවය ලබා ගැනීම අවශ්‍ය බවට දක්වා ඇත. කෙසේ වෙතත්, 12 වන ඡේදය සමඟ අනුකූලව එවැනි ලිඛිත එකඟ වීමක් නීතිය හෝ රෙගුලාසිවල වචන පෙලගැස්මක් භාවිතා කල හැකිය. එවැනි නීතිය හෝ රෙගුලාසි කළමනාකාරිත්වයේ වගකීම ස්ථාපනය කරන්නේනම් ඒවා ඇත්ත වශයෙන්ම 6 (ආ) ඡේදයේ විස්තර කර ඇති දැට සමානය. ගිණුම්කරණ වෘත්තීය, විගණන ප්‍රමිති සැකසුම්කරු හෝ අධිකරණ බල ප්‍රදේශය තුළ විගණන නියාමක විසින් නීතියේ හෝ රෙගුලාසි ඇති විස්තරයට සමාන මඟ පෙන්වීමක් ලබාදී ඇත. |
| 2014 - අ 32<br>2017 - අ 34 | විගණන කාර්ය භාරයක් සමාලෝචනය කිරීමක් හෝ අදාල සේවාවක් ලෙස වෙනස් කිරීමට එකඟ වීමට පෙර ශ්‍රී.ලං.ගි.ප්‍ර. සමඟ අනුකූලව විගණනයක් කිරීමට නිරත වූ විගණකවරයෙකුට, ඉහත ~~අ 29 – අ 31~~ ඡේදවල සඳහන් කර ඇති | විගණන කාර්යභාරයක් සමාලෝචනය කිරීමක් හෝ අදාල සේවාවක් ලෙස වෙනස් කිරීමට එකඟ වීමට පෙර ශ්‍රී.ලං.ගි.ප්‍ර. සමඟ අනුකූලව විගණනයක් කිරීමට නිරත වූ විගණකවරයෙකුට, ඉහත |

| විස්තරය | 2014 | 2017 |
|---|---|---|
| | කරුණු වලට අමතරව, වෙනසෙහි යම් නෛතික හෝ ගිවිසුම්ගත ඇඟවීම් තක්සේරු කිරීමට අවශ්‍ය විය හැකිය. | අ 31 - අ 33 ඡේදවල සඳහන් කර ඇති කරුණු වලට අමතරව, වෙනසෙහි යම් නෛතික හෝ ගිවිසුම්ගත ඇඟවීම් තක්සේරු කිරීමට අවශ්‍ය විය හැකිය. |
| 1 වන පරිශිෂ්ඨය | ~~(යොමුව : අ 23 - අ 24 ඡේද)~~<br>විගණන කාර්යභාරයක් භාර ගැනීමේ ලිපියකට උදාහරණ<br>පහත දැක්වෙන්නේ ශ්‍රී ලංකා ගිණුම් කරණ ප්‍රමිතීන්ට අනුකූලව සකස්කරන ලද පොදු අරමුණු සඳහා වන මූල්‍ය ප්‍රකාශ විගණනය කිරීම සඳහා වූ විගණන කාර්යභාරය භාර ගැනීමේ ලිපියකට උදාහරණයකි. මෙම ලිපිය නිල ලිපියක් නොවන නමුත්, මෙම ශ්‍රී.ල.වි.ප්‍ර. හි සාරාංශ ගතකර ඇති සැලකිල්ලට ගැනීම සමඟ එකම බැඳීම භාවිතා කළ හැකි මාර්ගෝපදේශයක් පමණක් විය හැකි ලෙස අදහස් කෙරේ. එය පුද්ගල අවශ්‍යතා සහ තත්වයන් අනුව වෙනස් විය යුතුය. තනි වාර්තාකරණ කාල පරිච්ඡේදයක් සඳහා වූ මූල්‍ය ප්‍රකාශ විගණනය කිරීම සඳහා එය කෙටුම්පත් කර ඇති අතර, පුනරාවර්තන විගණනය සඳහා ව්‍යවහාර කිරීමට අපේක්ෂා කරන්නේනම් හෝ බලාපොරොත්තු වන්නේනම් සුදුසු ලෙස සකස් කරගැනීම අවශ්‍ය වේ. (~~මෙම ශ්‍රී.ලං.ගි.ප්‍ර. හි~~ 13 වන ඡේදය බලන්න) යම් යෝජිත ලිපියක් භාර ගැනීම සුදුසු දැයි නීති උපදෙස් ලබා ගැනීම යෝග්‍ය විය හැකිය. ***<br><br>ABC සමාගමේ කළමනාකාරිත්වයේ සුදුසු නියෝජිතයෙකුට හෝ එහි පාලනය පිළිබඳ වගකිව යුතු අයට *<br><br>(විගණනයේ පරමාර්ථය හා විෂය පථය)<br>~~ABC සමාගමේ මූල්‍ය ප්‍රකාශ විගණනය කරන ලෙස ඔබ අපගෙන් ඉල්ලා ඇති අතර එය 20x1 දෙසැම්බර් 31 දිනට ශේෂ පත්‍රය සහ එම දිනෙන් අවසන්වූ වර්ෂය සඳහා ආදායම් ප්‍රකාශය, ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශය සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශය සහ වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ වෙනත් විස්තරාත්මක තොරතුරු වල සාරාංශයකින් සමන්විත වේ. අපගේ පිළිගැනීම අප සතුටින් තහවුරු කරන අතර, මෙම ලිපිය මඟින් මෙකී විගණන කාර්යය පිළිබඳව අපහට අවබෝධ විය. මූල්‍ය ප්‍රකාශ පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමේ අරමුණින් අපගේ විගණනය සිදු කරනු ලැබේ.~~<br><br>~~(විගණකගේ වගකීම්)~~<br>~~අපගේ විගණනය ශ්‍රී ලංකා විගණන~~ | (යොමුව : අ 24 - අ 26 ඡේද)<br>විගණන කාර්ය භාරය භාර ගැනීමේ ලිපියකට උදාහරණ<br>පහත දැක්වෙන්නේ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතීන්ට අනුකූලව සකස් කරන ලද පොදු අරමුණු සඳහා වන මූල්‍ය ප්‍රකාශ විගණනය කිරීම සඳහා වූ විගණන කාර්ය භාරය භාර ගැනීමේ ලිපියකට උදාහරණයකි. මෙම ලිපිය නිල ලිපියක් නොවන නමුත්, මෙම ශ්‍රී.ල.වි.ප්‍ර. හි සාරාංශගතකර ඇති සලකා බැලීම් සමඟ එකම බැඳීම භාවිතා කළ හැකි මාර්ගෝපදේශයක් පමණක් ලෙස අදහස් කෙරේ. එය පුද්ගල අවශ්‍යතා සහ තත්ත්වයන් අනුව වෙනස් විය යුතුය. තනි වාර්තාකරණ කාල පරිච්ඡේදයක් සඳහා වූ මූල්‍ය ප්‍රකාශ විගණනය කිරීම සඳහා එය කෙටුම්පත් කර ඇති අතර පුනරාවර්තන විගණන සඳහා ව්‍යවහාර කර ගැනීමට අපේක්ෂා කරන්නේනම් හෝ බලාපොරොත්තු වන්නේනම් එය සුදුසුලෙස සකස් කර ගැනීම අවශ්‍ය වේ. (13 වන ඡේදය බලන්න) යම් යෝජිත ලිපියක් භාර ගැනීම සුදුසු දැයි නීති උපදෙස් ලබා ගැනීම යෝග්‍ය විය හැකිය. ***<br><br>ABC සමාගමේ කළමනාකාරිත්වයේ සුදුසු නියෝජිතයෙකුට හෝ එහි පාලනය පිළිබඳ වගකිව යුතු අයට **<br><br>(විගණනයේ පරමාර්ථය සහ විෂය පථය)<br>ABC සමාගමේ මූල්‍ය ප්‍රකාශ විගණනය කරන ලෙස ඔබ අපගෙන් ඉල්ලා ඇති අතර, එය 20x1 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශය සහ එම දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා විස්තීර්ණ ආදායම් ප්‍රකාශය, ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශය සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශය සහ වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවල සාරාංශයක් ඇතුළුව මූල්‍ය ප්‍රකාශ සඳහා සටහන් වලින් සමන්විත වේ. අපගේ පිළිගැනීම අප සතුටින් තහවුරු කරන අතර මෙම ලිපිය මඟින් මෙකී විගණන කාර්යය පිළිබඳව අප හට අවබෝධ විය.<br>අපගේ විගණනයේ පරමාර්ථ වන්නේ සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශ වංචාවක් |

| විස්තරය | 2014 | 2017 |
|---|---|---|
| | ~~ප්‍රමිතීන්ට (SLAUS) වලට අනුකූලව මෙහෙයවනු ලැබේ. එම ප්‍රමිති වලට අනුව අප ආචාර ධර්ම අවශ්‍යතාවන්ට අනුකූලව කටයුතු කළ යුතු අතර, මූල්‍ය ප්‍රකාශ ප්‍රමාණාත්මක අව ප්‍රකාශයකින් තොර දැයි සාධාරණ සහතිකවීමක් ලබා ගැනීම සඳහා විගණනය සැලසුම් කර සිදුකල යුතුය. විගණනයකට මූල්‍ය ප්‍රකාශ වල ඇති හා හෙළිදරව් කිරීම් පිළිබඳ විගණන සාක්ෂි ලබා ගැනීම සඳහා ක්‍රියා පටිපාටි ඉටු කිරීම ඇතුළත් වේ. තෝරාගත් ක්‍රියා පටිපාටි රඳා පවතින්නේ වංචා හෝ දෝෂයක් නිසා මූල්‍ය ප්‍රකාශවල ප්‍රමාණාත්මක අව ප්‍රකාශයන් වීමේ අවදානම තක්සේරු කිරීම ඇතුළුව විගණකගේ විනිශ්චය මතය. විගණනයකට එසේම ඇතුලත් වන්නේ භාවිතා කළ ගිණුම්කරණ ප්‍රතිපත්ති වල යෝග්‍යතාවය සහ කළමනාකරනය විසින් සිදු කරන ලද ගිණුම්කරණ ඇස්තමේන්තු වල සාධාරණත්වය තක්සේරු කිරීම මෙන්ම මූල්‍ය ප්‍රකාශවල සමස්ත ඉදිරිපත් කිරිම ඇගයීම වේ.~~<br>~~විගණනයක ඇති ආවේනික සීමාවන් හා එක්ව අභ්‍යන්තර පාලනයේ අවේනික සීමාවන් නිසා, විගණනය නිසි ලෙස සැලසුම් කර ශ්‍රී.ල.වි.ප්‍ර. වලට අනුකූලව සිදු කරනු ලැබුවද සමහර ප්‍රමාණාත්මක අවප්‍රකාශ අනාරවරණය නොවිය හැකිවන නොවැලැක්විය හැකි අවදානමක් ඇත.~~<br>~~අපගේ අවදානම තක්සේරු කිරීමේදී තත්ත්වයන් අනුව යෝග්‍ය විගණන ක්‍රියා පටිපාටි සැලසුම් කිරීම සඳහා අස්තිත්වය විසින් මූල්‍ය ප්‍රකාශ සැකසීමට අදාල අභ්‍යන්තර පාලනය සැලකිල්ලට ගන්නා නමුත්, අස්තිත්වයේ අභ්‍යන්තර පාලනයේ සඵලදායකත්වය පිළිබඳ අරමුණින් නොවන බවට අපි සළකමු. කෙසේ වෙතත්, විගණනය තුළදී විසින් හඳුනාගෙන ඇති අභ්‍යන්තර පාලනයේ ඌනතා පිළිබඳව අපි ඔබට ලිඛිතව සන්නිවේදනය කරන්නෙමු.~~<br>[කළමනාකරණයේ වගකීම් සහ අදාල මූල්‍ය වාර්තාකරන ආකෘතිමය රාමුව හඳුනාගැනීම (මෙම උදාහරණයේ අරමුණු සඳහා නීතිය හෝ රෙගුලාසි මඟින් එම වගකීම් සුදුසු කොන්දේසි යටතේ නියම කර ඇති බවට විගණක විසින් නිර්ණය කර නොමැති බව උපකල්පනය කෙරේ; එබැවින් මෙම ශ්‍රී.ල.වි.ප්‍ර. 6 (ආ) ඡේදයේ විස්තර භාවිතා කරනු ලැබේ.)]<br>අපගේ විගණනය මෙහෙයවනු ලබන්නේ [කළමනාකාරිත්වය සහ අදාල අවස්ථා වලදී පාලනය පිළිබඳ වගකිව යුතු අය ඔවුන්] තමන්ට වගකීමක් ඇති බව | හෝ වැරදි නිසා ප්‍රමාණාත්මක අව ප්‍රකාශයන්ගෙන් තොරදැයි සාධාරණ සහතිකවීමක් ලබා ගැනීම සහ අපගේ මතය ඇතුලත් විගණකගේ වාර්තාව නිකුත් කිරීම නිසා සාධාරණ සහතික වීම ඉහළ මට්ටමේ සහතිකයක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති සමඟ (SLAUS) අනුකූලව මෙහෙයවන ලද විගණනයකින් සෑම විටම ප්‍රමාණාත්මක අවප්‍රකාශයන් පවතින විට එය හඳුනාගනු ඇති බවට සහතිකයක් නොවේ. අව ප්‍රකාශයන් වංචාවකින් හෝ වැරැද්දකින් ඇතිවිය හැකි අතර, ඒවා තනි තනිව හෝ සමාහාරයක් වශයෙන් ගත්කල, මෙම මූල්‍ය ප්‍රකාශ පදනම් කරගෙන ගනු ලබන පරිශීලකයින්ගේ ආර්ථික තීරණ වලට බලපෑම් කරනු ඇතැයි සාධාරණ ලෙස අපේක්ෂා කළ හැකිය.<br><br>(විගණකගේ වගකීම්)<br>අපගේ විගණනය ශ්‍රී.ල.වි.ප්‍ර. වලට අනුකූලව සිදු කරනු ලැබේ. එම ප්‍රමිත වලට අනුව අප ආචාර ධර්ම අවශ්‍යතාවන්ට අනුකූලව කටයුතු කළ යුතුය. ශ්‍රී.ල.වි.ප්‍ර. වලට අනුකූලව විගණනයක කොටසක් ලෙස අප වෘත්තීය විනිශ්චය යොදවන අතර විගණනය පුරාම වෘත්තීය සංශය දෘෂ්ඨිය පවත්වා ගෙනයනු ලැබේ.<br>අප එලෙසම:<br>• වංචා හෝ වැරදි නිසා වුවද මූල්‍ය ප්‍රකාශ වල ප්‍රමාණාත්මක අවප්‍රකාශ ඇතිවීමේ අවදානම හඳුනාගන ඒවා තක්සේරු කිරීම, එම අවදානම් වලට ප්‍රතිචාර දක්වන විගණන ක්‍රියා පටිපාටි සැලසුම් කිරීම සහ ඉටු කිරීම සහ අපගේ මතයට පදනමක් ලබාදීමට ප්‍රමාණවත් සහ යෝග්‍ය විගණන සාක්ෂි ලබාගැනීම. වංචාවේ ප්‍රතිඵලයක් ලෙසට වන ප්‍රමාණාත්මක අව ප්‍රකාශයක් හඳුනා නොගැනීමේ අවදානම,වැරැද්දක ප්‍රතිඵලයක් ලෙසට වන අවදානමට වඩා වැඩි වන්නේ වංචාවට දුස්සන්ධානය, වංචා කිරීම, හිතාමතා අත් හැරීම, සාවද්‍ය ලෙස දැක්වීම හෝ අභ්‍යන්තර පාලනයට මැදිහත් වී අක්‍රිය කිරීම ඇතුළත් විය හැකි බැවිනි.<br>• විගණනයට අදාල අභ්‍යන්තර පාලනය පිළිබඳ අවබෝධයක් ලබා ගන්නේ පවතින තත්ත්වයන් තුල යෝග්‍ය විගණන ක්‍රියා පටිපාටි සැලසුම් කිරීම සඳහා වන නමුත්, අස්තිත්ත්වයේ අභ්‍යන්තර පාලනයේ සඵලදායකත්වය පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමේ අරමුණෙන් නොවේ. කෙසේ වෙතත්, |

| විස්තරය | 2014 | 2017 |
|---|---|---|
| | පිළිගෙන තේරුම්ගෙන ඇති බවට වන පදනම මතය.<br><br>(අ) මූල්‍ය ප්‍රකාශ පිළියෙල කිරීම සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සඳහා ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතීන් සමඟ අනුකූලව ක්‍රියා කිරීම;<br>(ආ) වංචාවක් හෝ දෝෂයක් නිසා වුවද වන ප්‍රමාණාත්මක අව ප්‍රකාශ වලින් තොර මූල්‍ය ප්‍රකාශ පිළියෙල කිරීමට (කළමනාකරණය) නිර්ණය කරන ලද එවැනි අභ්‍යන්තර පාලන; සහ<br>(ඇ) අප වෙත ලබා දීමට<br>(i) වාර්තා, ලේඛනගතකිරීම් වාර්තා කිරීම් සහ වෙනත් කරුණු වැනි මූල්‍ය ප්‍රකාශ පිළියෙල කිරීමට අදාල (කළමනාකරණය) දැනුමැති සියලු තොරතුරු වෙත ප්‍රවේශ වීම;<br>(ii) විගණනයේ අරමුණු සඳහා අපහට (කළමනාකාරිත්වයෙන්) ඉල්ලා සිටිය හැකි අමතර තොරතුරු; සහ<br>(iii) විගණන සාක්ෂි ලබා ගැනීමට අවශ්‍ය යැයි අප විසින් නිර්ණය කරනු ලබන අස්තිත්වය තුළ සිටින පුද්ගලයින්ට සීමා රහිතව ප්‍රවේශ වීම.<br>අපගේ විගණන ක්‍රියාවලියේ කොටසක් ලෙස, විගණනයට අදාලව අප වෙත කරන ලද ඉදිරිපත් කිරීම් පිළිබඳව ලිඛිත තහවුරු කිරීමක් [කළමනාකාරිත්වයෙන් සහ සුදුසු අවස්ථාවලදී පාලනය පිළිබඳව වගකිවයුතු අයගෙන්] අපි ඉල්ලා සිටිමු.<br>අපගේ විගණනය තුළදී ඔබගේ කාර්ය මණ්ඩලයේ පූර්ණ සහයෝගය අපේක්ෂා කරමු.<br>[වෙනත් අදාල තොරතුරු]<br>[ගාස්තු විධි විධාන, බිල්පත් සහ වෙනත් නිශ්චිත නියමයන් වැනි වෙනත් තොරතුරු සුදුසු පරිදි ඇතුලත් කරන්න.]<br>[වාර්තා කිරීම]<br>[~~විගණකගේ වාර්තාවේ අපේක්ෂිත ආකෘති පත්‍රය සහ අන්තර්ගතය පිළිබඳව සුදුසු යොමු කිරීමක් ඇතුළත් කරන්න.~~]<br>අපගේ විගණනය සොයා ගැනිම් අනුව අප වාර්තාවේ ආකෘතිය සහ අන්තර්ගතය සංශෝධනය කිරීමට අවශ්‍ය විය හැකිය.<br>අපගේ අදාල වගකීම් ඇතුළුව මූල්‍ය ප්‍රකාශ විගණනය කිරීමේ විධි විධාන කෙරෙහි ඔබගේ පිළිගැනීම හා එකඟවීම දැක්වීමට කරුණාකර මෙම ලිපියේ අමුණා ඇති පිටපත අත්සන් කර ආපසු එවන්න. | මූල්‍ය ප්‍රකාශ විගණනය තුළදී අප විසින් හඳුනාගෙන ඇති අභ්‍යන්තර පාලනයේ ඌණතා පිළිබඳව අපි ඔබට ලිඛිතව සන්නිවේදනය කරන්නෙමු.<br>• භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල යෝග්‍යතාවය සහ ගිණුම්කරණ ඇස්තමේන්තු වල සාධාරණත්වය සහ කළමනාකාරිත්වය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් ඇගයීම.<br>• ගිණුම්කරණයෙහි අඛණ්ඩ පැවැත්ම පදනම ගිණුම්කරණය භාවිතා කිරීමේ කළමනාකාරිත්වයේ යෝග්‍යතාවය සහ ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව අඛණ්ඩ පැවැත්ම ලෙස දිගටම පවත්වාගෙන යාමට අස්තිත්ත්වයේ හැකියාවන් මත සැලකියයුතු අන්දමේ සැකයක් පහල විය හැකි සිද්ධීන් හෝ පවතින්නේද යන්න මත සමාගමට අඛන්ඩ පවත්නා තත්ත්වයක් සම්බන්ධිත ප්‍රමාණාත්මක අනියතතාවයක් පවතීද යන්න තීරණය කිරීම. ප්‍රමාණාත්මක අනියතතාවයක් පවතින බවට අප නිගමනය කළහොත් මූල්‍ය ප්‍රකාශ තුළ සම්බන්ධිත හෙළිදරව් කිරීම් පිළිබඳව අපගේ විගණකගේ වාර්තාව තුළ අවධානය යොමු කිරීම අවශ්‍යවේ හෝ එවැනි හෙළිදරව් කිරීම් ප්‍රමාණවත් නොවේ නම් අපගේ මතය විකරණය කිරීමට සිදුවේ. අපගේ තීරණ පදනම් වී ඇත්තේ අපගේ විගණන වාර්තාවේ දිනය දක්වා ලබාගත් විගණන සාක්ෂි මතය. කෙසේ වෙතත්, අනාගත සිදුවීම් හෝ පවත්නා තත්ත්වයන් සමාගම නතර කිරීමට හෝ අඛණ්ඩව පැවැත්ම ලෙස දිගටම පවත්වාගෙන යාමට හේතු විය හැකිය.<br>• හෙළිදරව් කිරීම් ඇතුළුව මූල්‍ය ප්‍රකාශ වල සමස්ත ඉදිරිපත් කිරීම, ව්‍යුහය සහ අන්තර්ගතය සහ මූල්‍ය ප්‍රකාශ සාධාරණ ඉදිරිපත් කිරීමක් අත්කර ගන්නා ආකාරයෙන් පාදකවන ගණුදෙනු සහ සිද්ධි නියෝජනය කරන්නේද යන්න පිළිබඳව ඇගයීම.<br><br>අභ්‍යන්තර පාලනයේ අවේනික සීමාකිරීම් සමඟ එක්ව විගණනයක අවේනික සීමාකිරීම් නිසා,<br>ශීලවිප්‍ර සමඟ අනුකූලව විගණනය නිසි ලෙස සැලසුම් කර සහ ඉටුකළේ වුවද සමහර ප්‍රමාණාත්මක අවප්‍රකාශ අනාවරණය නොවිය හැකි, |

| විස්තරය | 2014 | 2017 |
|---|---|---|
| | XYZ සහ සමාගම.<br>ABC සමාගම වෙනුවෙන් පිළිගෙන එකඟ විය.<br>(අත්සන් කලේ)<br><br>.............................<br>නම සහ තනතුර<br>දිනය | <u>නොවැළැක්විය හැකි අවදානමක් ඇත.</u><br>[කළමනාකාරිත්වයේ වගකීම් හා අදාල මූල්‍ය වාර්තාකරණ ආකෘතිමය රාමුව හඳුනා ගැනීම (මෙම උදාහරණයේ අරමුණු සඳහා නීතිය හෝ රෙගුලාසි මගින් එම වගකීම් සුදුසු කොන්දේසි යටතේ නියම කර ඇති බව විගණක විසින් නිර්ණය කර නොමැති බව උපකල්පනය කෙරේ; එබැවින් මෙම ශ්‍රී.ල.වි.ප්‍ර හි 6 (ආ) ඡේදයේ විස්තර භාවිතා කරනු ලැබේ.)]<br>අපගේ විගණනය මෙහෙයවනු ලබන්නේ [කළමනාකාරිත්වය සහ අදාල අවස්ථා වලදී පාලනය පිළිබඳ වගකිවයුතු අය] ඔවුන්ට වගකීමක් ඇති බව පිළිගෙන තේරුම් ගන්නා පදනම මතය.<br>(අ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතීන් සමඟ අනුකූලව මූල්‍ය ප්‍රකාශ පිළියෙල කිරීම සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සඳහා;<br>(ආ) වංචාවක් හෝ වැරැද්දක් නිසා ඇතිවන ප්‍රමාණාත්මක අව ප්‍රකාශයකින් තොර මූල්‍ය ප්‍රකාශ පිළියෙල කිරීමට හැකිවීම සඳහා (කළමනාකාරිත්වයෙන්) තීරණය කරන අභ්‍යන්තර පාලනය අවශ්‍ය වේ;<br>(ඇ) අප වෙත ................................ ලබා දීමට ***<br>(i) වාර්තා, ලේඛන ගත කිරීම සහ වෙනත් කරුණු වැනි මූල්‍ය ප්‍රකාශ පිළියෙල කිරීමට අදාල (කළමනාකරණය) දැනුමැති සියලු තොරතුරු වෙත ප්‍රවේශ වීම;<br>(ii) විගණනයේ අරමුණු සඳහා අපහට (කළමනාකාරිත්වයෙන්) ඉල්ලා සිටිය හැකි අමතර තොරතුරු; සහ<br>(iii) විගණන සාක්ෂි ලබා ගැනීමට අවශ්‍ය යැයි අප විසින් නිර්ණය කරනු ලබන අස්තිත්වය තුළ සිටින පුද්ගලයින්ට සීමා රහිතව ප්‍රවේශ වීම<br><br>අපගේ විගණන ක්‍රියාවලියේ කොටසක් ලෙස, විගණනයට අදාලව අප වෙත කරන ලද ඉදිරිපත් කිරීම් පිළිබඳව ලිඛිත තහවුරු කිරීමක් [කළමනාකාරිත්වයෙන් සහ සුදුසු අවස්ථා වලදී පාලනය පිළිබඳ වගකිව යුතු අයගෙන්] අපි ඉල්ලා සිටිමු.<br>අපගේ විගණනය තුළදී ඔබගේ කාර්ය මණ්ඩලයේ පූර්ණ සහයෝගය අපේක්ෂා කරමු.<br><br>[වෙනත් අදාල තොරතුරු] |

| විස්තරය | 2014 | 2017 |
|---|---|---|
| | | [ගාස්තු විධි විධාන, බිල්පත් සහ වෙනත් නිශ්චිත නියමයන් වැනි වෙනත් තොරතුරු සුදුසු පරිදි ඇතුලත් කරන්න.]<br><br>[වාර්තා කිරීම]<br><br>(ශ්‍රී.ල.වි.ප්‍ර. 720 (සංශෝධිත) ට අනුකූලව අදාල වන්නේ නම් වෙනත් තොරතුරු පිළිබඳ වාර්තා කිරීම ඇතුළුව විගණකගේ වාර්තාවේ අපේක්ෂිත ආකෘති පත්‍රය සහ අන්තර්ගතය පිළිබඳව සුදුසු යොමු කිරීමක් ඇතුළත් කරන්න)<br><br>අපගේ විගණන සොයා ගැනීම් අනුව අප වාර්තාවේ ආකෘතිය සහ අන්තර්ගතය සංශෝධනය කිරීමට අවශ්‍ය විය හැකිය.<br><br>අපගේ අදාල වගකීම් ඇතුළුව මූල්‍ය ප්‍රකාශ විගණනය කිරීමේ විධිවිධාන කෙරෙහි ඔබගේ පිළිගැනීම හා එකඟවීම දැක්වීමට කරුණාකර මෙම ලිපියේ අමුණා ඇති පිටපත අත්සන් කර ආපසු එවන්න.<br>XYZ සමාගම<br>ABC සමාගම වෙනුවෙන් පිළිගෙන එකඟ විය.<br>(අත්සන් කලේ)<br>.........................<br>නම සහ තනතුර<br>දිනය. |
| පාද සටහන් | * ලිපියේ ලිපිනයන් සහ යොමුකිරීම් අදාල අධිකරණ බලය ඇතුළුව කාර්යභාරයේ අවස්ථාවන්ට ගැලපෙන ඒවා වේ. සුදුසු පුද්ගලයින් වෙත යොමුකිරීම වැදගත්ය. (~~අ 21~~ ඡේදය බලන්න) | ** ලිපියේ ලිපිනයන් සහ යොමුකිරීම් අදාල අධිකරණ බලය ඇතුළුව කාර්යභාරයේ අවස්ථාවන්ට ගැලපෙන ඒවා වේ. සුදුසු පුද්ගලයින් වෙත යොමුකිරීම වැදගත්ය. (අ 22 ඡේදය බලන්න)<br>***ඇතුලත් කළහැකි කළමනාකරණ වගකීම් සම්බන්ධ වෙනත් කරුණු පිළිබඳ උදාහරණ සඳහා අ 24 ඡේදය බලන්න) |
| **ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිය 220 (ශ්‍රී.ලං.වි.ප්‍ර. 220- මූල්‍ය ප්‍රකාශ විගණනය සඳහා තත්ව පාලනය** | | |
| 7 (ඇ) | කාර්යයභාර කණ්ඩායමම - කාර්යය භාරය මත විගණන ක්‍රියා පටිපාටි ඉටු කරනු ලබන කාර්යභාරයේ නියුතු සියලුම හවුල්කරුවන් සහ සේවක මණ්ඩලය සහ ආයතනය හෝ ජාල සමාගමක් මඟින් සේවයේ නිරත කරනු ලබන ඕනෑම පුද්ගලයින්ය. ~~සමාගම හෝ ජාල සමාගමක් විසින් සේවයේ නිරත කරවනු ලැබූ විගණකගේ බාහිර විශේෂඥයකු මෙය බැහැර කරයි.~~ | කාර්යය භාර කණ්ඩායමම - කාර්යය භාරය මත විගණන ක්‍රියා පටිපාටි ඉටු කරනු ලබන කාර්යභාරයේ නියුතු සියලුම හවුල්කරුවන් සහ සේවක මණ්ඩලය සහ ආයතනය හෝ ජාල සමාගමක් මඟින් සේවයේ නිරත කරනු ලබන ඕනෑම පුද්ගලයන්ය. සමාගම හෝ ජාල සමාගමක් විසින් සේවයේ නිරත කරවනු ලැබූ විගණකගේ බාහිර විශේෂඥයකු මෙය බැහැර කරයි. බාහිර විගණක විසින් |

| විස්තරය | 2014 | 2017 |
|---|---|---|
| | | ශ්‍රී.ලං.වි.ප්‍ර. 610 (2013 සංශෝධිත) හි අවශ්‍යතාවයන් සමඟ අනුකූලව විගණන කාර්ය භාරයක් සඳහා සෘජු සහාය ලබාදෙන සේවා දායකයාගේ අභ්‍යන්තර විගණන කාර්යය තුළ සිටින පුද්ගලයින් ද "කාර්යය භාර කණ්ඩායම" යන යෙදුමෙන් බැහැර කරයි. *<br>* ශ්‍රී.ලං.වි.ප්‍ර. 610 (2013 සංශෝධිත) *අභ්‍යන්තර විගණකවරුන්ගේ වැඩ ප්‍රයෝජනයට ගැනීම,* සෘජු සහාය භාවිත කිරීම මත සීමාවන් ස්ථාපනය කෙරේ. අභ්‍යන්තර විගණක වරුන්ගෙන් සෘජු සහාය බාහිර විගණක විසින් ලබා ගැනීම නීතියෙන් හෝ රෙගුලාසි මඟින් තහනම් කලහැකි බවද එය එසේම පිළිගනී. එබැවින් සෘජු සහාය භාවිතා කිරීම, ඊට අවසරදී ඇති අවස්ථාවන්ට පමණක් සීමාවේ. |
| 20(ඇ) | විගණකගේ වාර්තාව විධිමත්ව සකස් කිරීමේදී එළඹි තීරණ ඇගයීම සහ විගණකගේ යෝජිත වාර්තාව යෝග්‍ය ද යන්න සළකා බැලීම ~~(යොමුව : අ 26 - අ 27, අ 29 - අ 31 ඡේද)~~ | විගණකගේ වාර්තාව විධිමත්ව සකස් කිරීමේදී එළඹි තීරණ ඇගයීම සහ විගණකගේ යෝජිත වාර්තාව යෝග්‍ය ද යන්න සළකා බැලීම. (යොමුව අ 26 - අ 28" අ 30 - අ 32 ඡේද) |
| 21 (ඇ) | සමාලෝචනය සඳහා තෝරාගත් විගණන ලේඛන ගත කිරීමක් වැදගත් විනිශ්චයන් සම්බන්ධයෙන් ඉටු කරන ලද කාර්යයන් පිළිබිඹු කරන්නේද සහ එළඹි තීරණ වලට සහාය වන්නේද යන්න ~~(යොමුව අ 28 - අ 31 ඡේද)~~ | සමාලෝචනය සඳහා තෝරාගත් විගණන ලේඛන ගත කිරීමක් වැදගත් විනිශ්චයන් සම්බන්ධයෙන් ඉටු කරන ලද කාර්යයන් පිළිබිඹු කරන්නේද සහ එළඹි නිගමන වලට සහාය වන්නේද යන්න (යොමුව අ 29 - අ 32 ඡේද) |
| 23 | තත්ව පාලන පද්ධතියට සම්බන්ධිත එහි ප්‍රතිපත්ති සහ ක්‍රියා පටිපාටි අදාල, ප්‍රමාණවත් සහ සඵලදායක ලෙස මෙහෙයුම් වන බවට සමාගම වෙත සාධාරණ සහතික වීමක් ලබාදීමේ අදහසින් සැලසුම්කර අධීක්ෂණය කිරීමේ ක්‍රියාවලියන් සඵලදායකත්ව පාලන පද්ධතියකට ඇතුළත් වේ. සමාගම අදාල වනවිට වෙනත් ජාල සමාගම් විසින් බෙදාහරින ලද නවතම තොරතුරුවලින් පැහැදිලි විගණන සමාගමේ අධීක්ෂණ ක්‍රියාවලියේ ප්‍රතිඵල සහ එම තොරතුරු වලින් අවධානයට ලක් වූ ඌනතාවයන්හි විගණන කාර්ය භාරයන් බලපෑ හැකිද යන්න කාර්ය භාරයේ නියුතු හවුල්කරු සළකා බැලිය යුතුය. (යොමුව: ~~අ 32 අ 34 ඡේද~~) | තත්ව පාලන පද්ධතියට සම්බන්ධිත එහි ප්‍රතිපත්ති සහ ක්‍රියා පටිපාටි අදාල ප්‍රමාණවත් සහ සඵලදායක ලෙස මෙහෙයුම් වන බවට සමාගම වෙත සාධාරණ සහතික වීමක් ලබාදීමේ අදහසින් සැලසුම්කර අධීක්ෂණය කිරීමේ ක්‍රියාවලියන් සඵලදායකත්ව පාලන පද්ධතියක ඇතුළත් වේ. සමාගම අදාලවන්නේ නම් වෙනත් ජාල සමාගම් විසින් බෙදාහරින ලද නවතම තොරතුරුවලින් පැහැදිලි වන පරිදි සමාගමේ අධීක්ෂණ ක්‍රියාවලියේ ප්‍රතිඵල සහ එම තොරතුරුවලින් අවධානයට ලක්වූ ඌනතාවයන් විගණන කාර්ය භාරයට බලපෑ හැකිද යන්න කාර්යභාරයේ නියුක්ත හවුල්කරු විසින් සළකා බැලිය යුතුය. (යොමුව: අ 33 අ 35 ඡේද) |

| විස්තරය | 2014 | 2017 |
|---|---|---|
| 24 (ඈ) | විගණන කාර්යභාරයන් තුළදී භාරගත් උපදේශන වලින් වූ ප්‍රතිඵලයන් හි ස්වභාවය සහ විෂය පථය සහ තීරණ(යොමුව : ~~අ 35 ඡේදය~~) | විගණන කාර්යභාරයන් තුළදී භාරගත් උපදේශන වලින් වූ ප්‍රතිඵලයන් හි ස්වභාවය සහ විෂය පථය සහ තීරණ (යොමුව : අ 36 ඡේදය) |
| අ10 | කාර්යභාරයේ නියුතු කණ්ඩායමට ගිණුම්කරණය හෝ විගණනය පිළිබඳ විශේෂිත ක්ෂේත්‍රයක විශේෂඥ දැනුමක් ඇති පුද්ගලයකු සමාගම විසින් කාර්යයේ හෝ සේවයේ යොදවා ඇත්නම් එම අය කාර්යභාරයේ විගණන ක්‍රියා පටිපාටි සිදු කරන අයෙකු ලෙසට ඇතුළත් වේ. කෙසේ වෙතත්, එවැනි විශේෂඥතාවයක් ඇති පුද්ගලයෙකු කාර්යභාරයේ නියුතු කණ්ඩායමේ සාමාජිකයෙකු නොවේ නම් එම පුද්ගලයා කාර්යභාරය සමඟ සම්බන්ධවීම උපදේශනය වීම සඳහා පමණි. උපදේශන 18 වන ඡේදයේ සහ ~~අ 21 - අ 22 ඡේදවල~~ ආමන්ත්‍රණය කෙරේ. | කාර්යභාරයේ නියුතු කණ්ඩායමට ගිණුම්කරණය හෝ විගණනය පිළිබඳ විශේෂිත ක්ෂේත්‍රයක විශේෂඥ දැනුමක් ඇති පුද්ගලයකු සමාගම විසින් කාර්යභාරයේ හෝ සේවයේ යොදවා ඇත්නම් එම අය කාර්යභාරයේ විගණන ක්‍රියා පටිපාටි සිදු කරන අයෙකු ලෙසට ඇතුළත් වේ. කෙසේ වෙතත්, එවැනි විශේෂඥතාවයක් ඇති පුද්ගලයෙකු කාර්යභාරයේ නියුතු කණ්ඩායමේ සාමාජිකයෙකු නොවේ නම් එම පුද්ගලයා කාර්යභාරය සමඟ සම්බන්ධවීම උපදේශනය වීම සඳහා පමණි. උපදේශන 18 වන ඡේදයේ අ 21 - අ 22 ඡේදයන් හි සාකච්ඡා කෙරේ. |
| 2014- අනුරූප ඡේද නොමැත. 2017 - අ 28 | (අනුරූප නොමැත.) | ශ්‍රී.ල.වි.ප්‍ර. 701 * අදාල වනවිට, විගණකගේ වාර්තාව විධිමත්ව සකස් කිරීමේදී කාර්යභාරයේ නියුතු කණ්ඩායම විසින් එළඹි තීරණ වලට ඇතුලත් නිර්ණය කිරීම් වන්නේ :<br>• විගණකගේ වාර්තාවට ඇතුළත් කළයුතු ප්‍රධාන විගණන කරුණු :<br>• ශ්‍රී.ල.වි.ප්‍ර. 701 හි 14 වන ඡේදය සමඟ අනුකූලව විගණකගේ වාර්තාව තුළ සන්නිවේදනය නොකරන ප්‍රධාන විගණන කරුණු තිබේනම් ; සහ<br>• අදාල වන්නේ නම්, අස්තිත්වයේ සහ විගණනයේ කරුණු සහ තත්වයන් මත පදනම්ව, විගණකගේ වාර්තාවේ සන්නිවේදනය කිරීම සඳහා ප්‍රධාන විගණන කරුණු නොමැති බව.<br>• ඊට අමතරව 20 (ආ) ඡේදය සමඟ අනුකූලව, යෝජිත විගණකගේ වාර්තාව සමාලෝචනය කිරීම සඳහා ප්‍රධාන විගණන කරුණු කොටසට ඇතුළත් කිරීමට යෝජිත වචන පෙලගැස්ම සළකා බැලීම ඇතුළත් වේ.<br>* ශ්‍රී.ලං.වි.ප්‍ර. 701, විගණකගේ වාර්තාවේ ප්‍රධාන විගණන කරුණු සන්නිවේදනය |

| විස්තරය | 2014 | 2017 |
|---|---|---|
| | | කිරීම. |
| 2014 - අ 31<br>2017 - අ 32 | 21 සහ ~~අ 28~~ ඡේද වල සඳහන් පරිදි වූ ලැයිස්තුගත අස්තිත්ත්ව රාජ්‍ය අංශය තුල පොදු නොවේ. කෙසේ වෙතත්, විශාලත්වය සංකීර්ණත්වය හෝ පොදු යහපත යන අංග නිසා රාජ්‍ය අංශයේ සැළකිය යුතු වෙනත් අස්තිත්ව තිබිය හැකි අතර, ඒ නිසාවෙන් පුළුල් පරාසයක ඇල්මක් දක්වන පාර්ශවකරුවන් සිටී. උදාහරණ වලට ඇතුලත්වන්නේ රජය සතු සංස්ථා සහ පොදු උපයෝගිතා වේ. රාජ්‍ය අංශය තුළ අඛණ්ඩව සිදුවන පරිවර්තනයන් ද නව ආකාරයේ වැදගත් අස්තිත්ව බිහි කිරීමට හේතු වේ. වැදගත්කම නිර්ණය කිරීම පදනම් කරගත් ස්ථාවර අරමුණුගත නිර්නායක නොමැත. එසේ වුවද, රාජ්‍ය අංශයේ විගණකවරුන් විසින් තත්ව පාලන සමාලෝචනයේ කාර්ය සාධනය සහතික කිරීම සඳහා ප්‍රමාණවත් වැදගත්කමක් ඇති අස්තිත්ව ඇගයීමට ලක් කරයි. | 21 සහ අ 29 ඡේද වල සඳහන් පරිදි වූ ලැයිස්තුගත අස්තිත්ව රාජ්‍ය අංශය තුළ පොදු නොවේ. කෙසේ වෙතත්, විශාලත්වය සංකීර්ණත්වය හෝ පොදු යහපත යන අංග නිසා රාජ්‍ය අංශයේ සැළකිය යුතු වෙනත් අස්තිත්ව තිබිය හැකි අතර, ඒ නිසාවෙන් පුළුල් පරාසයක ඇල්මක් දක්වන පාර්ශවකරුවන් සිටී. උදාහරණ වලට ඇතුලත්වන්නේ රජය සතු සංස්ථා සහ පොදු උපයෝගිතා වේ. රාජ්‍ය අංශය තුළ අඛන්ඩව සිදුවන පරිවර්තනයන් ද නව ආකාරයේ වැදගත් අස්තිත්ව බිහි කිරීමට හේතු වේ. වැදගත්කම නිර්ණය කිරීම පදනම් කරගත් ස්ථාවර අරමුණුගත නිර්නායක නොමැත. එසේ වුවද, රාජ්‍ය අංශයේ විගණකවරුන් විසින් තත්ත්ව පාලන සමාලෝචනයේ කාර්ය සාධනය සහතික කිරීම සඳහා ප්‍රමාණවත් වැදගත්කමක් ඇති අස්තිත්ව ඇගයීමට ලක් කරයි. |
| **ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිය 230 (ශ්‍රී.ලං.වි.ප්‍ර. 230 විගණන ලේඛනගත කිරීම)** | | |
| අ10 | අනුරූප නොමැත. | • ශ්‍රී.ලං.වි.ප්‍ර. 701 ව්‍යවහාර වනවිට, විගණකගේ ප්‍රධාන විගණන කරුණු නිර්ණය කිරීම හෝ සන්නිවේදනය කිරීමට ප්‍රධාන විගණන කරුණු නොමැති බව නිර්ණය කිරීම.<br>*ශ්‍රී.ලං.වි.ප්‍ර. 701 *ස්වාධීන විගණකගේ වාර්තාවේ ප්‍රධාන විගණන කරුණු සන්නිවේදනය කිරීම.* |
| පරිශිෂ්ය 1 | ~~2014 ජනවාරි 01 දින හෝ ඊට පසුව ආරම්භ වන කාල පරිච්ඡේද සඳහා වන මූල්‍ය ප්‍රකාශ විගණනය සඳහා බල පැවැත්වෙන් පරිදි~~ මෙම පරිශිෂ්ඨය මඟින් නියමිත ලේඛනගත කිරීමේ අවශ්‍යතා අඩංගු වෙනත් ශ්‍රී.ලං.වි.ප්‍ර. වල ඡේද හඳුනා ගනී. ශ්‍රී.ලං.වි.ප්‍ර. අවශ්‍යතා සහ සම්බන්ධිත ව්‍යවහාරකගේ සහ වෙනත් පැහැදිලි කිරීමේ කරුණු සළකා බැලීම සඳහා ලැයිස්තුව ආදේශකයක් නොවේ.<br>• ~~ශ්‍රී.ලං.වි.ප්‍ර. 260~~ *පාලනයට සම්බන්ධිත අය සමඟ සන්නිවේදනය - 23 වන ඡේදය*<br>• ශ්‍රී.ලං.වි.ප්‍ර. 610 (සංශෝධිත) *අභ්‍යන්තර විගණක වරුන්ගේ වැඩ ප්‍රයේජනයට ගැනීම* ~~24 වන ඡේදය~~ | මෙම පරිශිෂ්ඨය මඟින් නිශ්චිත ලේඛනගත කිරීමේ අවශ්‍යතා අඩංගු වෙනත් ශ්‍රී.ලං.වි.ප්‍ර. වල ඡේද හඳුනා ගනී. ශ්‍රී.ලං.වි.ප්‍ර. හි අවශ්‍යතා සහ සම්බන්ධිත ව්‍යවහාරකය සහ වෙනත් පැහැදිලි කිරීමේ කරුණු සළකා බැලීම සඳහා ලැයිස්තුව ආදේශකයක් නොවේ.<br>• ශ්‍රී.ලං.වි.ප්‍ර. 260 (සංශෝධිත) පාලනයට *සම්බන්ධිත අය සමඟ සන්නිවේදනය* - 23 වන ඡේදය.<br>• ශ්‍රී.ලං.වි.ප්‍ර. 610 (සංශෝධිත) (2013, සංශෝධිත)*අභ්‍යන්තර විගණකවරුන්ගේ වැඩ ප්‍රයෝජනයට ගැනීම*. 36-37 ඡේද.<br>• ශ්‍රී.ලං.වි.ප්‍ර. 720 (සංශෝධිත) *වෙනත් තොරතුරු සම්බන්ධ විගණකගේ වගකීම්.* 25 වන ඡේදය |

| විස්තරය | 2014 | 2017 |
|---|---|---|
| **ශ්‍රී ලංකා විගණන ප්‍රමිත 240 (ශ්‍රී.ලං.වි.ප්‍ර. 240 - මූල්‍ය ප්‍රකාශ විගණනයකදී වංචාවකට සම්බන්ධ විගණකගේ වගකීම්)** | | |
| අ4 | වංචනික මූල්‍ය වාර්තාකරණයට බොහෝවිට සඵලදායී ලෙස ක්‍රියාත්මක වන බවක් පෙනෙන්නට ඇති පාලනයන් කළමනාකරණය විසින් මැදිහත් වී අක්‍රීය කිරීම සම්බන්ධව පහත දැක්වෙන ශිල්පීය ක්‍රම භාවිතා කරමින් කළමනාකරණය විසින් පාලනයට මැදිහත්වි අක්‍රීය කරමින් වංචා සිදුකල හැකිය :<br>• මූල්‍ය ප්‍රකාශවල සටහන් කර ඇති වටිනාකම්වලට බලපාන ~~කරුණු සඟවා තැබීම හෝ අනාවරණය නොකිරීම.~~ | වංචනික මූල්‍ය වාර්තාකරණයට බොහෝවිට සඵලදායී ලෙස ක්‍රියාත්මක වන බවක් පෙනෙන්නට ඇති පාලනයන් කළමනාකරණය විසින් මැදිහත් වි අක්‍රීය කිරීම සම්බන්ධයෙන් හිතාමතාම පහත දැ වැනි ශිල්පීය ක්‍රම භාවිතා කරමින් කළමනාකරණය විසින් පාලනයට මැදිහත් වී අක්‍රීය කරමින් වංචා සිදුකල හැකිය.<br>• මූල්‍ය වාර්තාකරණ ආකෘතිමය රාමුවට අවශ්‍ය හෙළිදරව් කිරීම් හෝ සාධාරණ ඉදිරිපත් කිරීමක් අත්කර ගැනීමට අවශ්‍ය හෙළිදරව් කිරීම් ඉවත් කිරීම අපැහැදිලිව කිරීම හෝ අව ප්‍රකාශ කිරීම.<br>• මූල්‍ය ප්‍රකාශ වල සටහන් කර ඇති වටිනාකම් වලට බලපාන කරුණු සැගවීම. |
| අ11 | සාකච්ඡාවට පහත සඳහන් වැනි කරුණු ඇතුලත් විය හැකිය.<br>• වංචාවක් නිසා අස්තිත්වයේ මූල්‍ය ප්‍රකාශ ප්‍රමාණවත් අව ප්‍රකාශයකට පහසුවෙන් අවනත විය හැකි ලෙසට විශ්වාස කරන්නේ කෙසේද සහ කොතැන්හිදීද යන්න පිළිබඳව සහ වංචනික මූල්‍ය වාර්තාකරණය තුලින් කළමනාකරකාරිත්වයට වරදක් කලහැක්කේ සහ වංචනික මූල්‍ය වාර්තාවක සඟවා තැබිය හැක්කේ කෙසේද සහ අස්තිත්වයේ වත්කම් සාවද්‍ය ලෙස පරිහරණය කළ හැක්කේ කෙසේද යන්න පිළිබඳව කාර්ය භාරයේ නියුතු කණ්ඩායමේ සාමාජිකයින් අතර අදහස් හුවමාරුවක් සිදුවිය හැකිය.<br>• ....... | සාකච්ඡාවට පහත සඳහන් කරුණු ඇතුලත් විය හැකිය.<br>• වංචාවක් නිසා අස්තිත්වයේ මූල්‍ය ප්‍රකාශ (තනි ප්‍රකාශ සහ හෙළිදරව් කිරීම් ඇතුළුව) ප්‍රමාණවත් අවප්‍රකාශයකට කෙසේ සහ කොතැන්හි පහසුවෙන් අවනත විය හැකි ලෙස ඔවුන් විශ්වාස කරන්නේද කළමනාකාරිත්වය වරදක් කළහැක්කේ සහ සඟවා තැබිය හැක්කේ කෙසේද වංචනික මූල්‍ය වාර්තාකරණය අස්තිත්වයේ වත්කම් සාවද්‍ය පරිහරණය කළ හැක්කේ කෙසේද යන්න පිළිබඳව කාර්යභාරයේ නියතු කණ්ඩායමේ සාමාජිකයින් අතර අදහස් හුවමාරුවක් සිදුවිය හැකිය.<br>• .......<br>• හෙළිදරව් කල කරුණු පිළිබඳ නිසි අවබෝධයක් ලැබීම අපැහැදිලි වන අයුරින් හෙළිදරව් කිරීම් ඉදිරිපත් කිරීමට කළමනාකරණයට උත්සහ කල හැකි අවදානම සළකා බැලීම. (උදාහරණ ලෙස, උවමනාවට වඩා නොවැදගත් තොරතුරු හෝ අපැහැදිලි හෝ සැකසහිත භාෂාව භාවිතා කිරීමෙන් ).<br>• ..... |
| අ18 | ශ්‍රී.ලං.වි.ප්‍ර. 315 සහ ශ්‍රී.ලං.වි.ප්‍ර. 610 (~~සංශෝධිත~~) මඟින්, අභ්‍යන්තර විගණන කාර්යය ඇති අස්තිත්ව වල විගණනයට අදාල අවශ්‍යතා ස්ථාපිත කරන අතර මඟ පෙන්වීම් ලබාදෙයි. වංචාවේ සන්දර්භය | ශ්‍රී.ලං.වි.ප්‍ර. 315 (සංශෝධිත) සහ ශ්‍රී.ලං.වි.ප්‍ර. 610 (සංශෝධිත 2013) මඟින් අභ්‍යන්තර විගණන කාර්යය ඇති අස්තිත්වවල විගණනයට අදාල අවශ්‍යතා ස්ථාපිත කරන අතර මඟ පෙන්වීම් |

| විස්තරය | 2014 | 2017 |
|---|---|---|
| | තුල එම ශ්‍රී.ලං.වි.ප්‍ර. හි අවශ්‍යතා ඉටු කිරීමේදී, විගණක හට කාර්යයෙහි විමසා බැලිය හැකි විශේෂිත ක්‍රියාකාරකම් සඳහා ඇතුලත් උදාහරණයක් :<br>• ~~අභ්‍යන්තර විගණක වරුන්~~ විසින් වංචා හඳුනා ගැනීම සඳහා වර්ෂය තුල සිදු කරන ලද ක්‍රියා පටිපාටි වේනම් ,<br>• එම ක්‍රියා පටිපාටිවල ප්‍රතිඵලයක් ලෙසට වූ යම් සොයා ගැනීම් වලට කළමනාකරණය සතුටුදායක ප්‍රතිචාර දක්වා තිබේද යන්න. | ලබාදෙයි. වංචාවේ සන්දර්භය තුල එම ශ්‍රී.ලං.වි.ප්‍ර. හි අවශ්‍යතා ඉටු කිරීමේදී, විගණකහට කාර්යයෙහි විමසා බැලිය හැකි විශේෂිත ක්‍රියාකාරකම් වලට ඇතුලත් උදාහරණයක් :<br>• අභ්‍යන්තර විගණන කාර්ය භාරය විසින් වංචා හඳුනා ගැනීම සඳහා වර්ෂය තුල සිදු කරන ලද ක්‍රියා පටිපාටි වේනම්,<br>• එම ක්‍රියා පටිපාටිවල ප්‍රතිඵලයක් ලෙසට වූ යම් සොයා ගැනීම් වලට කළමනාකරණය සතුටුදායක ප්‍රතිචාර දක්වා තිබේද යන්න. |
| **ශ්‍රී ලංකා විගණන ප්‍රමිත 250 (ශ්‍රී.ලං.වි.ප්‍ර. 250 - මූල්‍ය ප්‍රකාශ විගණනයකදී නීති හා රෙගුලාසි සැළකිල්ලට ගැනීම** | | |
| වෙනසක් නොමැත. | | |
| **ශ්‍රී ලංකා විගණන ප්‍රමිත 260 (ශ්‍රී.ලං.වි.ප්‍ර. 260 - පාලනය පිළිබඳ වගකිව යුතු අය සමඟ සන්නිවේදනය** | | |
| ශ්‍රී ලංකා විගණන ප්‍රමිත 260 (2014 ජනවාරි 01 දින හෝ ඊට පසුව ආරම්භවන කාල සීමාවන් සඳහා මූල්‍ය ප්‍රකාශ විගණනය සඳහා බල පැවැත්වේ.) ශ්‍රී ලංකා විගණන ප්‍රමිත 260 මඟින් ප්‍රතිස්ථාපනය වේ. (සංශෝධිත) (2018 ජනවාරි 01 දින හෝ ඊට පසුව ආරම්භවන කාල සීමාවන් සඳහා මූල්‍ය ප්‍රකාශ විගණනය සඳහා බල පැවැත්වේ. | | |
| **ශ්‍රී ලංකා විගණන ප්‍රමිත 265 (ශ්‍රී.ලං.වි.ප්‍ර. 265 - පාලනය පිළිබඳ වගකිව යුතු අය සහ කළමනාකරණය සමඟ අභ්‍යන්තර පාලනය තුල ඌනතාවයන් සන්නිවේදනය කිරීම** | | |
| අ15 | • ......<br>• අස්තිත්වයේ ස්වභාවය ~~උදාහරණ ලෙස~~, පොදු යහපත උදෙසා වන අස්තිත්වයකට අවශ්‍යකරණ සන්නිවේදනය පොදු යහපත සඳහා නොවන අස්තිත්වයකට වඩා වන සන්නිවේදනය වෙනස් විය හැකිය.<br>• අස්තිත්වයේ විශාලත්වය හා සංකීර්ණත්වය. ~~උදාහරණ ලෙස~~, සංකීර්ණ අස්තිත්වයක් සඳහා අවශ්‍ය සන්නිවේදනය සරල ව්‍යාපාරයක් පවත්වාගෙන යන අස්තිත්වයකට වඩා වෙනස් විය හැකිය.<br>• විගණක විසින් හඳුනාගෙන ඇති සැළකිය යුතු ඌණතා වල ස්වභාවය.<br>• අස්තිත්ත්වයේ පාලන සංයුතිය ~~උදාහරණ ලෙස~~, පාලනය පිළිබඳ වගකිව යුතු පුද්ගලයින්ට අස්තිත්වයෙහි කර්මාන්තයේ හෝ බලපෑමට ලක්වූ ක්ෂේත්‍ර වලින් සැළකිය යුතු අන්දමේ පලපුරුද්දක් නොමැති සාමාජිකයින් ඇතුළත් වන්නේ නම් වැඩි විස්තර අවශ්‍ය වේ.<br>• ........... | • ......<br>• අස්තිත්වයේ ස්වභාවය උදාහරණ ලෙස, පොදු යහපත උදෙසා වන අස්තිත්වයකට අවශ්‍යකරණ සන්නිවේදනට වඩා පොදු යහපත සඳහා නොවන අස්තිත්වයකට වන සන්නිවේදනය වෙනස් විය හැකිය.<br>• අස්තිත්වයේ විශාලත්වය හා සංකීර්ණත්වය. උදාහරණ ලෙස, සංකීර්ණ අස්තිත්වයක් සඳහා අවශ්‍ය සන්නිවේදනය සරල ව්‍යාපාරයක් පවත්වාගෙන යන අස්තිත්වයකට වඩා වෙනස් විය හැකිය.<br>• විගණක විසින් හඳුනාගෙන ඇති සැළකිය යුතු ඌණතාවල ස්වභාවය.<br>• අස්තිත්වයේ පාලන සංයුතිය උදාහරණ ලෙස, පාලනය පිළිබඳ වගකිව යුතු පුද්ගලයින්ට අස්තිත්වයෙහි කර්මාන්තයේ හෝ බලපෑමට ලක්වූ ක්ෂේත්‍ර පිළිබඳ සැළකිය යුතු අන්දමේ පලපුරුද්දක් නොමැති සාමාජිකයින් ඇතුළත් වන්නේ නම් වැඩි විස්තර අවශ්‍ය වේ. |

| විස්තරය | 2014 | 2017 |
|---|---|---|
| | • ........... | • ........... |
| **ශ්‍රී ලංකා විගණන ප්‍රමිත 300 (ශ්‍රී.ල.වි.ප්‍ර. 300 - මූල්‍ය ප්‍රකාශ විගනණයක් සැලසුම් කිරීම)** | | |
| 1 | ශ්‍රී ලංකා විගණන ප්‍රමිත (ශ්‍රී.ලං.වි.ප්‍ර.) මූල්‍ය ප්‍රකාශ විගණනයක් සැලසුම් කිරීමේ විගණකගේ වගකීම සමඟ කටයුතු කරයි. මෙම ශ්‍රී.ලං.වි.ප්‍ර. ලියා ඇත්තේ පුනරාවර්තනය වන විගණනයක සන්දර්භය තුලය. මූලික විගණන කාර්ය භාරයකදී අතිරේක සැලකිල්ලට ගැනීම් වෙන වෙනම හඳුනාගැනේ. | මෙම ශ්‍රී ලංකා විගණන ප්‍රමිත (ශ්‍රී.ලං.වි.ප්‍ර.) මූල්‍ය ප්‍රකාශ විගණනයක් සැලසුම් කිරීමේ විගණකගේ වගකීම සමඟ කටයුතු කරයි. මෙම ශ්‍රී.ලං.වි.ප්‍ර. ලියා ඇත්තේ පුනරාවර්තනය වන විගණනයක සන්දර්භය තුළය. මූලික විගණන කාර්යයේදී අතිරේක සැලකිල්ලට ගැනීම් වෙන වෙනම හඳුනාගැනේ. |
| 9 (ඇ) | ක්‍රියාවට නැංවිය යුතු වෙනත් සැලසුම් කල ක්‍රියා පටිපාටි එමඟින් කාර්යභාරය ශ්‍රී.ලං.වි.ප්‍ර. සමඟ අනුකූල වේ. (යොමුව : ~~අ 12 ඡේදය~~) | ක්‍රියාවට නැංවිය යුතු වෙනත් සැලසුම් කල ක්‍රියා පටිපාටි එමඟින් කාර්යභාරය ශ්‍රී.ලං.වි.ප්‍ර. සමඟ අනුකූල වේ. (යොමුව : අ 12 - අ 14 ඡේද) |
| 10 | විගණක විසින් විගණන කාලය තුල අවශ්‍ය පරිදි සමස්ත විගණන උපාය මාර්ගය සහ විගණන සැලැස්ම යාවත්කාලීන කිරීම සහ වෙනස් කිරීම කළ යුතුය. (යොමුව : ~~අ 13 ඡේදය~~) | විගණක විසින් විගණන කාලය තුල අවශ්‍ය පරිදි සමස්ත විගණන උපාය මාර්ගය සහ විගණන සැලැස්ම යාවත්කාලීන කිරීම සහ වෙනස් කිරීම කළ යුතුය. (යොමුව : අ 15 ඡේදය) |
| 11 | විගණක විසින් මෙහෙයවීමේ ස්වභාවය කාල නීර්ණය සහ ප්‍රමාණය කාර්යයේ නියුතු කණ්ඩායමේ සාමාජිකයන් අධීක්ෂණය ඔවුන්ගේ වැඩ සමාලෝචනය සැලසුම් කළ යුතුය. (යොමුව : ~~අ 14, අ 15 ඡේද~~) | විගණක විසින් මෙහෙයවීමේ ස්වභාවය කාල නීර්ණය කාර්යයේ නියුතු සහ කාර්යයේ නියුතු කණ්ඩායමේ සාමාජිකයින් අධීක්ෂණය සහ ඔවුන්ගේ වැඩ සමාලෝචනය සැලසුම් කළ යුතුය. (යොමුව අ 16, අ 17 ඡේද) |
| 12 (ඇ) | විගණන කාර්යභාරය තුලදී සමස්ත විගණන උපාය මාර්ගයට හෝ විගණන සැලැස්මට සිදු කරන ලද සැළකිය යුතු අන්දමේ වෙනස්කම් සහ එවැනි වෙනස්කම් සඳහා හේතු (යොමුව : ~~අ 16 - අ 19 ඡේද~~) | විගණන කාර්යභාරය තුලදී සමස්ත විගණන උපාය මාර්ගයට හෝ විගණන සැලැස්මට සිදු කරන ලද සැළකිය යුතු අන්දමේ වෙනස්කම් සහ එවැනි වෙනස්කම් සඳහා හේතු. (යොමුව : අ 18 - අ 21 ඡේද) |
| 13 | අදාල ආචාර ධර්ම අවශ්‍යතාවයන් සමඟ අනුකූලව විගණකවරුන්ගේ වෙනසක් සිදුවී ඇති අවස්ථාවක පූර්වගාමී විගණක සමඟ සන්නිවේදනය කිරීම. (යොමුව : ~~අ 20 ඡේදය~~) | අදාල අචාර ධර්ම අවශ්‍යතාවයන් සමඟ අනුකූලව විගණකවරුන්ගේ වෙනසක් සිදු වී ඇති අවස්ථාවක පූර්වගාමී විගණක සමඟ සන්නිවේදනය කිරීම. (යොමුව : අ 22 ඡේදය) |
| 2014 - අනුරූප ඡේදයක් නොමැත. 2017 - අ 13 | (අනුරූප නොමැත.) | සැලසුම් කළ අවදානම් තක්සේරු කිරීමේ ක්‍රියා පටිපාටිවල ස්වභාවය, කාල නීර්ණය සහ වැඩිදුර ක්‍රියා පටිපාටි තීරණය කිරීමේදී ඒවා හෙළිදරව් කිරීම්වලට අදාල වන බැවින් පුළුල් පරාසයක තොරතුරු සහ හෙළිදරව් කිරීම් තුල ඇතුලත් විය හැකි එම විස්තර මට්ටම යන දෙකටම අනුව තීරණය කිරීම වැදගත්ය. තවද ඇතැම් හෙළිදරව් කිරීම්වල පොදු හා |

| විස්තරය | 2014 | 2017 |
|---|---|---|
| | | උපයෝගී ලෙජර වලින් බාහිරව ලබාගත් තොරතුරු අඩංගු විය හැකි අතර, ඒවා එසේම තක්සේරු කරන ලද අවදානම් සහ ඒවාට පිළියම් යෙදිය යුතු විගණන ක්‍රියා පටිපාටිවල ස්වභාවය කාල නිර්ණය සහ ප්‍රමාණයට ද බලපායි. |
| 2014 - අනුරූප ඡේදයක් නොමැත. 2017 - අ 14 | (අනුරූප නොමැත.) | විගණනයේ මුල් අවධිය තුළ හෙළිදරව් කිරීම් සළකා බැලීම තුලින් විගණකහට ඒ සඳහා ප්‍රමාණවත් කාලයක් සැලසුම් කිරීමට සහ නිසි අවධානය යොමු කිරීමට සහායක් ලැබෙන අතර, ගනුදෙනු පන්ති, සිද්ධීන් සහ ගිණුම් ශේෂයන් ලෙස හෙළිදරව් කිරීම් සඳහා ද ආමන්ත්‍රණය කිරීමට හැකිය. විගණනය මත ඇති බලපෑම නිර්ණය කිරීමට විගණක හට කල්තබා සළකා බැලීම එසේම උපකාරි විය හැකිය. :<br>● <u>අස්තිත්වයේ පරිසරය, මූල්‍ය තත්වය හෝ ක්‍රියාකාරකම්වල වෙනස්වීම්හි ප්‍රතිඵලයක් ලෙස සැළකිය යුතු අන්දමේ නව හෝ සංශෝධිත හෙළිදරව් කිරීම් අවශ්‍ය කෙරේ. (උදාහරණ ලෙස, බණ්ඩ වල අවශ්‍යකරණ හඳුනාගැනීම් තුල, සහ සැළකිය යුතු අන්දමේ ව්‍යාපාර සංයෝජනයකින් පැන නගින බණ්ඩ තොරතුරු වාර්තා කිරීමේ වෙනස් වීමක් ;</u><br>● <u>අදාල වන මූල්‍ය වාර්තාකරණ ආකෘතිමය රාමුවේ වෙනස්වීම් හේතුවෙන් පැන නගින සැළකිය යුතු නව හෝ සංශෝධිත හෙළිදරව් කිරීම්;</u><br>● <u>විශේෂිත හෙළිදරව් කිරීම් වලට සම්බන්ධිත විගණන ක්‍රියා පටිපාටි වලට සහාය වීම සඳහා විගණක ගේ විශේෂඥයකුගේ මැදිහත්වීමේ අවශ්‍යතාවය. (උදාහරණ</u><br>● <u>ලෙස : විශ්‍රාම වැටුප් හෝ වෙනත් විශ්‍රාම ප්‍රතිලාභ බැඳීම් සම්බන්ධිත හෙළිදරව් කිරීම්); සහ</u><br>● <u>විගණක හට පාලනය පිළිබඳව වගකිව යුතු අය සමඟ සාකච්ඡා කිරීමට අවශ්‍ය විය හැකි හෙළිදරව් කිරීම් සම්බන්ධ කරුණු .*</u><br>* <u>ශ්‍රී. ලං. වි. ප්‍ර. 260 (සංශෝධිත)</u> *පාලනය පිළිබඳව වගකිව යුතු අය සමඟ සන්නිවේදනය. <u>අ 13</u> ඡේදය* |
| 2014-අ 19<br>2017 - අ 21 | අ 11 ඡේදයේ සාකච්ඡා කර ඇති පරිදි, සුදුසු, කෙටි සටහනක් කුඩා අස්තිත්වයක | අ 11 ඡේදයේ සාකච්ඡා කර ඇති පරිදි, සුදුසු, කෙටි සටහනක් කුඩා අස්තිත්වයක |

| විස්තරය | 2014 | 2017 |
|---|---|---|
| | විගණනය සඳහා ලේඛනගත කිරීමේ උපාය මාර්ගික කාර්යය කරයි. විගණන සැලැස්ම සඳහා, කුඩා අස්තිත්ත්වයක සිදුවිය හැකි පරිදි අදාල පාලන ක්‍රියාකාරකම් කිහිපයක් උපකල්පනය කිරීම මත සකස් කරන ලද සම්මත විගණන වැඩසටහන් හෝ පිරික්සුම් ලැයිස්තු (~~අ 17~~ ඡේදය බලන්න), ඒවා තත්වයන්ට ගැලපෙන පරිදි ලබා දී තිබේ නම් විගණකගේ අවදානම් තක්සේරු කිරීම් ඇතුළුව ඒවා භාවිතා කළ හැකිය. | විගණනය සඳහා ලේඛනගත කිරීමේ උපාය මාර්ගික කාර්යයන් කරයි. විගණන සැලැස්ම සඳහා, කුඩා අස්තිත්ත්වයක සිදුවිය හැකි පරිදි අදාල පාලන ක්‍රියාකාරකම් කිහිපයක් උපකල්පනය කිරීම මත සකස් කරන ලද සම්මත විගණන වැඩ සටහන් හෝ පිරික්සුම් ලැයිස්තු (අ 19 ඡේදය බලන්න), ඒවා තත්ත්වයන්ට ගැලපෙන පරිදි ලබා දී තිබේ නම් විගණකගේ අවදානම් තක්සේරු කිරීම් ඇතුළුව ඒවා භාවිතා කළ හැකිය. |
| | ......<br>• අස්තිත්වයට අභ්‍යන්තර විගණන කාර්යයක් තිබේද සහ එසේනම්, කාර්යයේ වැඩ භාවිතා කල හැක්කේ කුමන ක්ෂේත්‍රවලට ද සහ කොපමණ ප්‍රමාණයකටද යන්න<br>• .......<br>• උදාහරණයක් ලෙස ගිණුම්කරණ ප්‍රමිතීන්වල වෙනස් කිරීම නිසා වන මූල්‍ය වාර්තාකරන ආකෘතිමය රාමුවේ සැළකිය යුතු වෙනස්කම්. | ......<br>• අස්තිත්වයට අභ්‍යන්තර විගණන කාර්යයක් තිබේද සහ එසේනම්, කාර්යයේ වැඩ භාවිතා කල හැක්කේ කවර ක්ෂේත්‍රවලට ද සහ කොපමණ ප්‍රමාණයකට ද යන්න හෝ විගණනයේ අරමුණු සඳහා සෘජු සහාය ලබා ගැනීමට අභ්‍යන්තර විගණකවරුන් යොදාගත හැකිද.<br>.......<br>• සැළකිය යුතු නව හෝ සංශෝධිත හෙළිදරව් කිරීම් අවශ්‍ය විය හැකි ගිණුම්කරණ ප්‍රමිතීන්හි වෙනස්වීම් වැනි අදාල මූල්‍ය වාර්තාකරණ ආකෘතිමය රාමුවේ වෙනස්වීම්.<br>........<br>• පොදු සහ උපයෝගී ලෙජරවලින් බාහිරව ලබාගත් තොරතුරු අඩංගු හෙළිදරව් කිරීම් ඇතුළුව අදාල මූල්‍ය වාර්තාකරණ ආකෘතිමය රාමුව මඟින් අවශ්‍ය කරන හඳුනාගැනීමට සහ පිළියෙල කිරීමට භාවිතා කළ ක්‍රියාවලි (ය) කළමනාකරණය.<br>........ |
| **ශ්‍රී ලංකා විගණන ප්‍රමිත 315 (ශ්‍රී.ලං.වි.ප්‍ර. 315 - අස්තිත්වය සහ එහි පරිසරය අවබෝධ කර ගැනීම මඟින් ප්‍රමාණාත්මක අවප්‍රකාශවල අවදානම හඳුනාගැනීම සහ තක්සේරු කිරීම).** | | |
| 2 | මෙම ශ්‍රී.ලං.වි.ප්‍ර. ~~2014 ජනවාරි 01 වන දින සිට හෝ ආරම්භ වන~~ කාල සීමාවන් සඳහා වූ මූල්‍ය ප්‍රකාශ විගණනය සඳහා බල පැවැත්වේ. | මෙම ශ්‍රී.ලං.වි.ප්‍ර. 2015 ජනවාරි 01 දින හෝ ඊට පසුව අවසන් වන කාල පරිච්ඡේද සඳහා වූ මූල්‍ය ප්‍රකාශ විගණනය සඳහා බල පැවැත්වේ. |
| 6 | අවදානම් තක්සේරු කිරීමේ ක්‍රියා පටිපාටි වලට පහත සඳහන් දෑ ඇතුලත් විය යුතුය:<br>(අ) වංචා හෝ වැරදි නිසා ප්‍රමාණාත්මක අව ප්‍රකාශයක් කිරීමේ අවදානම් හඳුනා ගැනීමට උපකාරි වන තොරතුරු, විගණකගේ විනිශ්චයට | අවදානම් තක්සේරු කිරීමේ ක්‍රියා පටිපාටි වලට පහත සඳහන් දෑ ඇතුළත් විය යුතුය.:<br>(අ) වංචා හෝ වැරදි හේතුවෙන් ප්‍රමාණාත්මක අව ප්‍රකාශයක් කිරීමේ අවදානම් හඳුනා ගැනීමට උපකාරී |

| විස්තරය | 2014 | 2017 |
|---|---|---|
| | අනුව තිබිය හැකි ~~කළමනාකරණයෙන් සහ~~ අස්තිත්වය තුල සිටින වෙනත් අයගෙන් විමසීම් කිරීම. (යොමුව : අ 6 ඡේදය)<br>(ආ) විශ්ලේෂණාත්මක ක්‍රියා පටිපාටි (යොමුව : ~~අ 7 අ 10~~ ඡේද)<br>(ඇ) නිරීක්ෂණය සහ පරීක්ෂා කිරීම (යොමුව: ~~අ 11~~ ඡේදය) | වන තොරතුරු, විගණකගේ විනිශ්චයට අනුව තිබිය හැකි අභ්‍යන්තර විගණන කාර්යය තුල අදාල පුද්ගලයින්ගෙන් කළමනාකාරිත්වය (කාර්යය පවතින්නේ නම්) සහ අස්තිත්වය තුල සිටින වෙනත් අයගෙන් විමසීම් කිරීම. (යොමුව : අ 6 - අ 13 ඡේද)<br>(ආ) විශ්ලේෂණාත්මක ක්‍රියා පටිපාටි (යොමුව : අ 11 අ 13 ඡේද)<br>(ඇ) නිරීක්ෂණය සහ පරීක්ෂා කිරීම (යොමුව: අ 18 ඡේදය) |
| 9 | විගණක විසින් අස්තිත්වය සමඟ පෙර අත්දැකීම් වලින් ලබාගත් තොරතුරු සහ පෙර විගණනයේදී ඉටු කරන ලද විගණන ක්‍රියා පටිපාටි වලින් ලබාගත් තොරතුරු භාවිතා කිරීමට අදහස් කරන විට පෙර විගණනයේ සිට ප්‍රවර්තන විගණනයට අදාල වීමට බලපාන වෙනස්කම් සිදු වී ඇත්දැයි නිර්ණය කල යුතුය. (යොමුව : ~~අ 12 අ 13 ඡේද~~) | විගණක විසින් අස්තිත්වය සමඟ පෙර අත්දැකීම්වලින් ලබාගත් තොරතුරු සහ පෙර විගණනයේදී ඉටුකරන ලද විගණන ක්‍රියා පටිපාටි වලින් ලබාගත් තොරතුරු භාවිතා කිරීමට අදහස් කරන විට, පෙර විගණනයේ සිට ප්‍රවර්තන විගණනයට අදාල වීමට බලපාන වෙනස්කම් සිදු වී ඇත්දැයි නිර්ණය කළ යුතුය. (යොමුව : අ 19 - අ 20 ඡේද) |
| 10 | කාර්ය භාරයේ නියුතු හවුල්කරු සහ කාර්ය භාරයේ නියුතු කණ්ඩායමේ අනෙකුත් ප්‍රධාන සාමාජිකයින් ප්‍රමාණාත්මක අවප්‍රකාශයකට අස්තිත්වයේ මූල්‍ය ප්‍රකාශවලට පහසුවෙන් අවනත වීමට ඇති හැකියාව සහ අස්තිත්වයේ කරුණු සහ තත්ත්වයන්ට අදාල මූල්‍ය වාර්තාකරණ ආකෘතිමය රාමුව ව්‍යවහාර කිරීම පිළිබඳව සාකච්ඡා කළ යුතුය. සාකච්ඡාවට සම්බන්ධ නොවූ කුමන කරුණු කාර්ය භාරයේ නියුතු කණ්ඩායමට සන්නිවේදනය කල යුතුද යන්න කාර්ය භාරයේ නියුතු හවුල්කරු විසින් නිර්ණය කළ යුතුය. (යොමුව : ~~අ 14 - අ 16 ඡේද~~) | කාර්යභාරයේ නියුතු හවුල්කරු සහ කාර්යභාරයේ නියුතු කණ්ඩායමේ අනෙකුත් ප්‍රධාන සාමාජිකයින් ප්‍රමාණාත්මක අවප්‍රකාශයකට පහසුවෙන් අවනත වීමට අස්තිත්වයේ මූල්‍ය ප්‍රකාශ වල ඇති හැකියාව සහ අස්තිත්වයේ කරුණු සහ තත්වයන්ට අදාල මූල්‍ය වාර්තාකරණ ආකෘතිමය රාමුව ව්‍යවහාරකරණය පිළිබඳව සාකච්ඡා කළ යුතුය. සාකච්ඡාවට සම්බන්ධ නොවූ කුමන කරුණු කාර්යභාරයේ නියුතු කණ්ඩායමේ සාමාජිකයින්ට සන්නිවේදනය කළ යුතුද යන්න කාර්ය භාරයේ නියුක්ත හවුල්කරු විසින් නිර්ණය කළ යුතුය. (යොමුව : අ 21 - අ 24 ඡේද) |
| 11 | විගණක විසින් පහත සඳහන් කරුණු පිළිබඳ අවබෝධයක් ලබාගත යුතුය :<br>(අ) අදාල කර්මාන්තය, නියාමන සහ අදාල මූල්‍ය වාර්තාකරණ ආකෘතිමය රාමුව ඇතුළු වෙනත් බාහිර සාධක. (යොමුව : ~~අ 17 - අ 22~~ ඡේද)<br>(ආ) අස්තිත්වයෙහි ස්වභාවයට ඇතුලත්:<br>(i) එහි මෙහෙයුම්;<br>(ii) එහි හිමිකාරිත්වය සහ පාලන ව්‍යුහයන් ;<br>(iii) විශේෂ අරමුණු සහිත අස්තිත්ව වල ආයෝජන ඇතුළුව, අස්තිත්වය සිදුකරන සහ සැලසුම් කර ඇති ආයෝජන, ආයෝජන වර්ග; | විගණක විසින් පහත සඳහන් කරුණු පිළිබඳ අවබෝධයක් ලබාගත යුතුය. :<br>(අ) අදාල කර්මාන්තය, නියාමන සහ අදාල මූල්‍ය වාර්තාකරණ ආකෘතිමය රාමුව ඇතුළු වෙනත් බාහිර සාධක. (යොමුව: අ 25 - අ 30 ඡේද)<br>(ආ) අස්තිත්වයෙහි ස්වභාවයට, ඇතුලත්:<br>(i) එහි මෙහෙයුම්;<br>(ii) එහි හිමිකාරිත්වය සහ පාලන ව්‍යුහයන්;<br>(iii) විශේෂ අරමුණු සහිත අස්තිත්ව වල ආයෝජන ඇතුළුව අස්තිත්වය කරන සහ සැලසුම් කර ඇති ආයෝජන ඇතුලත් ආයෝජන |

| විස්තරය | 2014 | 2017 |
|---|---|---|
| | සහ<br>(iv) අස්තිත්වය ව්‍යුහගත කර ඇති ආකාරය සහ එය මූල්‍යනය කර ඇත්තේ කෙසේද<br>විගණකට ගනුදෙනුවල පන්ති මත පන්ති අපේක්ෂා කළ යුතු ගනුදෙනු, ගිණුම් ශේෂයන් සහ හෙළිදරව් කිරීම් පිළිබඳ පන්ති තේරුම් ගැනීමට විගණකවරයාට හැකිවීම (යොමුව : ~~අ 23 – අ 27~~ ඡේද)<br>(ඇ) අස්තිත්වයේ ගිණුම්කරණ ප්‍රතිපත්ති තෝරා ගැනීම සහ ව්‍යවහාර කිරීම සහ එහි වෙනස්කම් සඳහා හේතු ද ඇතුළුව. විගණක විසින් අස්තිත්වයේ ගිණුම්කරණ ප්‍රතිපත්ති එහි ව්‍යාපාරයට යෝග්‍ය ද යන්න සහ අදාල කර්මාන්තයේ භාවිතා වන මූල්‍ය වාර්තාකරණ ආකෘතිමය රාමුවට සහ ගිණුම්කරණ ප්‍රතිපත්ති වලට අනුකූල ද යන්න පිළිබඳව ඇගයීමට ලක්කල යුතුය. (යොමුව : ~~අ 28 ඡේදය~~)<br>(ඈ) අස්තිත්වයේ අරමුණු සහ උපාය මාර්ග සහ ප්‍රමාණාත්මක අව ප්‍රකාශ වීමේ අවදානමකට හේතු විය හැකි සම්බන්ධිත ව්‍යාපාර අවදානම් (යොමුව : ~~අ 29 අ 35 ඡේද~~)<br>(ඉ) අස්තිත්වයේ මූල්‍ය කාර්ය සාධනය මැනීම සහ සමාලෝචනය. (යොමුව : ~~අ 36 – අ 41~~ ඡේද) | වර්ග ; සහ<br>(iv) අස්තිත්වය ව්‍යුහගත කර ඇති ආකාරය සහ එය මූල්‍යනය කර ඇත්තේ කෙසේද,<br>මූල්‍ය ප්‍රකාශ වල ඇති බවට අපේක්ෂා කළ යුතු ගණුදෙනු, ගිණුම් ශේෂයන් සහ හෙළිදරව් කිරීම් පිළිබඳ පන්ති තේරුම් ගැනීමට විගණකවරයාට හැකිවීම (යොමුව : අ 31 - අ 35 ඡේද)<br>(ඇ) අස්තිත්වයේ ගිණුම්කරණ ප්‍රතිපත්ති තෝරා ගැනීම සහ ව්‍යවහාර කිරීම සහ එහි වෙනස්කම් සඳහා හේතු ද ඇතුළුව. අස්තිත්වයේ ගිණුම්කරණ ප්‍රතිපත්ති එහි ව්‍යාපාරයට යෝග්‍ය ද යන්න සහ අදාල කර්මාන්තයේ භාවිතා වන මූල්‍ය වාර්තාකරණ ආකෘතිමය රාමුවට සහ ගිණුම්කරණ ප්‍රතිපත්ති වලට අනුකූල ද යන්න විගණක විසින් ඇගයීමට ලක්කල යුතුය. (යොමුව : අ 36 ඡේදය)<br>(ඈ) අස්තිත්වයේ අරමුණු සහ උපාය මාර්ග සහ ප්‍රමාණාත්මක අව ප්‍රකාශ වීමේ අවදානමකට හේතු විය හැකි සම්බන්ධිත ව්‍යාපාර අවදානම් (යොමුවඃ අ 37 අ 43 ඡේද)<br>(ඉ) අස්තිත්වයේ මූල්‍ය කාර්ය සාධනය මැනීම සහ සමාලෝචනය. (යොමුව : අ 44 - අ 49 ඡේද) |
| 12 | විගණක විසින් විගණනයට අදාල අභ්‍යන්තර පාලනය පිළිබඳ අවබෝයක් ලබාගත යුතුය. විගණනයට අදාල බොහෝ පාලනයයන් මූල්‍යයේ අවබෝධයක් ලබාගත යුතුය. විගණනයට අදාල බොහෝ පාලන වාර්තාකරණයට අදාල වියහැකි නමුත්, මූල්‍ය වාර්තාකරණයට අදාල සියලු පාලනයන් විගණනයට අදාල නොවේ. පාලනයක්, තනි තනිව හෝ අනෙකුත් දෑ සමඟ සංයෝජිතව විගණනයට අදාල ද යන්න විගණකගේ වෘත්තීය විනිශ්චයට අදාල කරුණකි. (යොමුව : ~~අ 42 අ 65 ඡේද~~) | විගණක විසින් විගණනයට අදාල අභ්‍යන්තර පාලනය පිළිබඳ අවබෝධයක් ලබාගත යුතුය. විගණනයට අදාල බොහෝ පාලනයන් මූල්‍ය වාර්තාකරණයට අදාල වියහැකි නමුත් මූල්‍ය වාර්තාකරණයට අදාල සියලු පාලනයන් විගණනයට අදාල නොවේ. පාලනයක්, තනි තනිව හෝ අනෙකුත් දෑ සමඟ සංයෝජිතව විගණනයට අදාල ද යන්න විගණකගේ වෘත්තීය විනිශ්චයට අදාල කරුණකි. (යොමුව : අ 50 අ 73 ඡේද) |
| 13 | විගණනයට අදාල පාලනයන් පිළිබඳ අවබෝධයක් ලබා ගැනීමේදී, විගණක විසින් එම පාලනයන්හි සැලසුම් ඇගයීමට ලක්කිරීම සහ අස්තිත්වයෙහි කාර්යමණ්ඩලයෙන් විමසීමට අමතරව ක්‍රියා පටිපාටි ඉටු කිරීමෙන් ඒවා ක්‍රියාත්මක කර තිබේද යන්න තීරණය කල යුතුය. (යොමුවඃ ~~අ 66 – අ 68 ඡේද~~) | විගණනයට අදාල පාලනයන් පිළිබඳ අවබෝධයක් ලබා ගැනීමේදී, විගණක විසින් එම පාලනයන්හි සැලසුම් ඇගයීමට ලක්කිරීම සහ අස්තිත්ත්වයෙහි කාර්ය මණ්ඩලයෙන් විමසීමට අමතරව ක්‍රියා පටිපාටි ඉටු කිරීමෙන් ඒවා ක්‍රියාත්මක කර තිබේද යන්න තීරණය කළ යුතුය. (යොමුවඃ අ 74 - අ 76 ඡේද) |
| 14 (ආ) | පාලන පරිසරයේ මූලිකාංග වල ප්‍රබලතාවය සාමුහිකව අභ්‍යන්තර පාලනයේ අනෙකුත් සංරචක සඳහා | පාලන පරිසරයේ මූලිකාංග වල ප්‍රබලතාවය සාමුහිකව අභ්‍යන්තර පාලනයේ අනෙකුත් සංරචක සඳහා |

| විස්තරය | 2014 | 2017 |
|---|---|---|
| | යෝග්‍ය පදනමක් ලබාදෙන අතර, පාලන පරිසරය තුල ඇති ඌණතා මඟින් අනෙකුත් සංරචක වලට බලපෑමක් වන්නේද, (යොමුව : ~~අ 69 - අ 78 ඡේද~~) | යෝග්‍ය පදනමක් ලබාදෙන අතර, පාලන පරිසරයේ ඇති ඌණතා මඟින් එම අනෙකුත් සංරචක වලට බල පෑමක් වන්නේද, (යොමුව : අ 77 - අ 87 ඡේද) |
| 15 (ඈ) | එම අවදානම් වලට පිළියම් යෙදීමට ක්‍රියා මාර්ග තීරණය කිරීම (යොමුව : ~~අ 79 ඡේදය~~) | එම අවදානම් වලට පිළියම් යෙදීමට ක්‍රියා මාර්ග තීරණය කිරීම (යොමුව : අ 88 ඡේදය) |
| 17 | අස්තිත්වය එවැනි ක්‍රියාවලියක් ස්ථාපිත කර නොමැති නම් හෝ තත් කාර්ය ක්‍රියාවලියක් තිබේනම්, මූල්‍ය වාර්තාකරණ අරමුණුවලට අදාල ව්‍යාපාර අවදානම් හඳුනාගෙන තිබේද සහ ඒවා ආමන්ත්‍රණය කලේ කෙසේද යන්න විගණක විසින් කළමනාකරණය සමඟ සාකච්ඡා කළ යුතුය. ලේඛනගත අවදානම් තක්සේරු කිරීමේ ක්‍රියාවලියක් නොමැතිවීම පවත්නා තත්ත්වයන් තුල යෝග්‍ය දැයි විගණක විසින් ඇගයීමට ලක් කිරීම හෝ එය අභ්‍යන්තර පාලනයේ සැළකිය යුතු ඌනතාවයක් නිරූපණය කරන්නේ ද යන්න නිර්ණය කල යුතුය. (යොමුව : ~~අ 80 ඡේදය~~) | අස්තිත්වය එවැනි ක්‍රියාවලියක් ස්ථාපිත කර නොමැති නම් හෝ තත් කාර්ය ක්‍රියාවලියක් තිබේනම්, මූල්‍ය වාර්තාකරණ අරමුණු වලට අදාල ව්‍යාපාර අවදානම් හඳුනාගෙන තිබේද සහ ඒවා ආමන්ත්‍රණය කලේ කෙසේද යන්න විගණක විසින් කළමනාකරණය සමඟ සාකච්ඡා කළ යුතුය. ලේඛනගත අවදානම් තක්සේරු කිරීමේ ක්‍රියාවලියක් නොමැතිවීම පවත්නා තත්ත්වයන් තුල යෝග්‍ය දැයි විගණක විසින් ඇගයීමට ලක් කිරීම හෝ එය අභ්‍යන්තර පාලනයේ සැළකිය යුතු ඌනතාවයක් නිරූපනය කරන්නේ ද යන්න නිර්ණය කල යුතුය. (යොමුව : අ 89 ඡේදය) |
| 18 | විගණක විසින් පහත සඳහන් ක්ෂේත්‍ර ඇතුළුව මූල්‍ය වාර්තාකරණයට අදාල ව්‍යාපාර ක්‍රියාවලීන් ඇතුළු තොරතුරු පද්ධතිය පිළිබඳ අවබෝධයක් ලබාගත යුතුය :<br>(අ) මූල්‍ය ප්‍රකාශවලට වැදගත් වන අස්තිත්වයේ මෙහෙයුම් වල ඇති ගනුදෙනු පන්ති ;<br>(ආ) තොරතුරු තාක්ෂණය (IT) සහ අත්හුරු යන පද්ධති දෙකෙහිම ක්‍රියා පටිපාටි එම ගනුදෙනු ආරම්භ කිරීම, සටහන් කිරීම, සකස් කිරීම අවශ්‍ය පරිදි නිවැරදි කිරීම. පොදු ලේජරය වෙත මාරු කිරීම සහ මූල්‍ය ප්‍රකාශ වල වාර්තා කිරීම ;<br>(ඇ) ගනුදෙනු ආරම්භ කිරීම, සටහන් කිරීම, සකස් කිරීම සහ වාර්තා කිරීම සඳහා භාවිතා කරන මූල්‍ය ප්‍රකාශ වලට අදාල ගිණුම් වාර්තා, උපකාරක තොරතුරු සහ විශේෂිත ගිණුම්, වැරදි තොරතුරු පොදු ලෙජරයට මාරු කරන ආකාරය මෙයට ඇතුළත් වේ. වාර්තා අත්හුරු හෝ විද්‍යුත් ආකාරයෙන් විය හැකිය.<br>(ඈ) ගනුදෙනු හැරනු විට, මූල්‍ය ප්‍රකාශ වලට වැදගත් වන සිද්ධීන් සහ කොන්දේසි තොරතුරු පද්ධතිය විසින් ග්‍රහණය කර ගන්නේ කෙසේද; | විගණක විසින් පහත සඳහන් ක්ෂේත්‍ර ඇතුළුව මූල්‍ය වාර්තාකරණයට අදාල ව්‍යාපාර ක්‍රියාවලීන් ඇතුළු තොරතුරු පද්ධතිය පිළිබඳ අවබෝධයක් ලබාගත යුතුය : (යොමුව : අ 90 - අ 82 සහ අ 95 - අ 96 ඡේද)<br>(අ) මූල්‍ය ප්‍රකාශ වලට වැදගත් වන අස්තිත්වයේ මෙහෙයුම් වල ඇති ගනුදෙනු පන්ති ;<br>(ආ) තොරතුරු තාක්ෂණය (IT) සහ අත්හුරු යන පද්ධති දෙකෙහිම ක්‍රියා පටිපාටි එම ගනුදෙනු ආරම්භ කිරීම, සටහන් කිරීම, සකස් කිරිම අවශ්‍ය පරිදි නිවැරදි කිරීම. පොදු ලේජරය වෙත මාරු කිරීම සහ මූල්‍ය ප්‍රකාශ වල වාර්තා කිරීම ;<br>(ඇ) ගනුදෙනු ආරම්භ කිරීම, සටහන් කිරිම, සකස් කිරීම සහ වාර්තා කිරීම සඳහා භාවිතා කරන මූල්‍ය ප්‍රකාශ වලට අදාල ගිණුම් වාර්තා, උපකාරක තොරතුරු සහ විශේෂිත ගිණුම්, වැරදි තොරතුරු පොදු ලෙජරයට මාරු කරන ආකාරය මෙයට ඇතුළත් වේ. වාර්තා අත්හුරු හෝ විද්‍යුත් ආකාරයෙන් විය හැකිය. |

| විස්තරය | 2014 | 2017 |
|---|---|---|
| | (ඉ) සැළකිය යුතු ගිණුම්කරණ ඇස්තමේන්තු සහ හෙළිදරව් කිරීම් ඇතුළුව, අස්තිත්වයේ මූල්‍ය ප්‍රකාශ සකස් කිරීම සඳහා භාවිතා කරන මූල්‍ය වාර්තා කරණ ක්‍රියාවලිය ; සහ<br>(ඊ) පුනරාවර්තන නොවන, අසාමාන්‍ය ගනුදෙනු හෝ ගැලපීම් වාර්තා කිරීමට භාවිතා කරන සම්මත නොවන ජර්නල් පිවිසුම් ඇතුළුව<br><br>ජර්නල් පිවිසුම් ආශ්‍රිත පාලනය (යොමුව : ~~අ 81 අ 85 ඡේද~~) | (ඈ) ගනුදෙනු හැරනු විට, මූල්‍ය ප්‍රකාශ වලට වැදගත් වන සිද්ධීන් සහ කොන්දේසි තොරතුරු පද්ධතිය විසින් ග්‍රහණය කර ගන්නේ කෙසේද;<br>(ඉ) සැළකිය යුතු ගිණුම්කරණ ඇස්තමේන්තු සහ හෙළිදරව් කිරීම් ඇතුළුව, අස්තිත්වයේ මූල්‍ය ප්‍රකාශ සකස් කිරීම සඳහා භාවිතා කරන මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය ; සහ<br>(ඊ) පුනරාවර්තන නොවන, අසාමාන්‍ය ගනුදෙනු හෝ ගැලපීම් වාර්තා කිරීමට භාවිතා කරන සම්මත නොවන ජර්නල් පිවිසුම් ඇතුළුව ජර්නල් පිවිසුම් ආශ්‍රිත පාලනය ;<br>(යොමුව අ 93 - අ 94 ඡේද)<br>මූල්‍ය වාර්තාකරණයට අදාල තොරතුරු පද්ධතිය පිළිබඳ මෙම අවබෝධයට පොදු සහ උපයෝගී ලෙජර ඇතුලතින් හෝ පිටතින් ලබා ගන්නා මූල්‍ය ප්‍රකාශ වල හෙළිදරව් වන තොරතුරු වලට සම්බන්ධිත එම පද්ධතියේ අදාල අංග ඇතුලත් විය යුතුය. |
| 19 | මූල්‍ය වාර්තාකරණ භූමිකාවන් සහ වගකීම් හා මූල්‍ය වාර්තාකරණයට අදාල වැදගත් කරුණු අස්තිත්වය විසින් සන්නිවේදනය කරන්නේ කෙසේද යන්න පිළිබඳ අවබෝධයක් විගණක විසින් ලබාගත යුතුය. පහත දෑ ඇතුළුව (යොමුව: ~~අ 86 – අ 87~~ ඡේද) | මූල්‍ය වාර්තාකරණ භූමිකාවන් සහ වගකීම් හා මූල්‍ය වාර්තාකරනයට අදාල වැදගත් කරුණු අස්තිත්වය විසින් සන්නිවේදනය කරන්නේ කෙසේද යන්න පිළිබඳ අවබෝධයක් විගණක විසින් ලබාගත යුතුය. පහත දෑ ඇතුළුව (යොමුව : අ 97 - අ 98 ඡේද) |
| 20 | විගණක විසින් විගණනයට අදාල පාලන ක්‍රියාකාරකම් පිළිබඳ අවබෝධයක් ලබාගත යුත්තේ, සැදැහුම් මට්ටමේදී ප්‍රමාණාත්මක අවප්‍රකාශයක් වීමේ අවදානම තක්සේරු කිරීම සඳහා තේරුම් ගැනීම අවශ්‍ය බවට විගණක විනිශ්චය කිරීමෙන් සහ තක්සේරු කරන ලද අවදානම් වලට ප්‍රතිචාර දක්වන විගණක ක්‍රියා පටිපාටි තව දුරටත් සැලසුම් කිරීම පිණිසය. විගණනයකට එක් එක් සැළකිය යුතු ගනුදෙනු පන්ති ගිණුම් ශේෂය සහ මූල්‍ය ප්‍රකාශ වල හෙළිදරව් කිරීම් හෝ ඒවාට අදාල සෑම සැදැහුමකම සම්බන්ධ සියලු පාලන ක්‍රියාකාරකම් පිළිබඳ අවබෝධයක් අවශ්‍ය නොවේ. (යොමුව : ~~අ 88 – අ 94~~ ඡේද) | විගණක විසින් විගණනයට අදාල පාලන ක්‍රියාකාරකම් පිළිබඳ අවබෝධයක් ලබාගත යුත්තේ, සැදැහුම් මට්ටමේදී ප්‍රමාණාත්මක අවප්‍රකාශයක් වීමේ අවදානම තක්සේරු කිරීම සඳහා තේරුම් ගැනීම අවශ්‍ය බවට විගණක විනිශ්චය කිරීමෙන් සහ තක්සේරු කරන ලද අවදානම් වලට ප්‍රතිචාර දක්වන විගණක ක්‍රියා පටිපාටි තව දුරටත් සැලසුම් කිරීම පිණිසය. විගණනයකට එක් එක් සැළකිය යුතු ගණු දෙනු පන්ති ගිණුම් ශේෂය සහ මූල්‍ය ප්‍රකාශ වල හෙළිදරව් කිරීම් හෝ ඒවාට අදාල සෑම සැදැහුමකම සම්බන්ධ සියලු පාලන ක්‍රියාකාරකම් පිළිබඳ අවබෝධයක් අවශ්‍ය නොවේ. (යොමුව : අ 99 - අ 106 ඡේද) |
| 21 | අස්තිත්වයේ පාලන ක්‍රියාකාරකම් අවබෝධ කර ගැනීමේදී, තොරතුරු තාක්ෂණයෙන් පැන නගින අවදානම් වලට අස්තිත්වය ප්‍රතිචාර දක්වා ඇති ආකාරය පිළිබඳ අවබෝධයක් විගණක විසින් ලබාගත යුතුය. (යොමුව : ~~අ 95 – අ 97 ඡේද~~) | අස්තිත්වයේ පාලන ක්‍රියාකාරකම් අවබෝධ කර ගැනීමේදී, තොරතුරු තාක්ෂණයෙන් පැන නගින අවදානම් වලට අස්තිත්වය ප්‍රතිචාර දක්වා ඇති ආකාරය පිළිබඳ අවබෝධයක් විගණක විසින් ලබාගත යුතුය. (යොමුව : අ 107 - |

| විස්තරය | 2014 | 2017 |
|---|---|---|
| | | අ 109 ඡේද) |
| 22 | විගණනයට අදාල පාලන ක්‍රියාකාරකම් හා සම්බන්ධ මූල්‍ය වාර්තාකරණය පිළිබඳ අභ්‍යන්තර පාලනය අධීක්ෂණය කිරීම සඳහා අස්තිත්වය භාවිතා කරන ප්‍රධාන ක්‍රියාකාරකම් සහ එහි පාලනයේ ඌණතාවයන් සඳහා අස්තිත්වය විසින් පිළියම් යෙදීම ආරම්භ කරන ආකාරය පිළිබඳ අවබෝධයක් විගණක විසින් ලබාගත යුතුය. (යොමුව : අ 98 - අ 100 ඡේද) | විගණනයට අදාල පාලන ක්‍රියාකාරකම් හා සම්බන්ධ මූල්‍ය වාර්තා කරණයට අදාල අභ්‍යන්තර පාලනය අධීක්ෂණය කිරීම සඳහා අස්තිත්වය භාවිතා කරන ප්‍රධාන ක්‍රියාකාරකම් සහ එහි පාලනයේ ඌණතා සඳහා අස්තිත්වය විසින් පිළියම් යෙදීම ආරම්භ කරන ආකාරය පිළිබඳ අවබෝධයක් විගණක විසින් ලබාගත යුතුය. (යොමුව : අ 110 - අ 112 ඡේද) |
| 23 | අස්තිත්වයට අභ්‍යන්තර විගණන කාර්යයක් තිබේනම්[1] , අභ්‍යන්තර විගණන කාර්යය විගණනයට අදාල විය හැකිද යන්න නිර්ණය කිරීම සඳහා විගණක විසින් පහත සඳහන් කරුණු පිළිබඳ අවබෝධයක් ලබාගත යුතුය.<br>(අ) අභ්‍යන්තර විගණන කාර්යයේ වගකීම් වල ස්වභාවය සහ අභ්‍යන්තර විගණන කාර්යයේ අස්තිත්වයෙහි සංවිධාන ව්‍යුහයට ගැලපෙන ආකාරය ; සහ<br>(ආ) අභ්‍යන්තර විගණන කාර්යය මඟින් සිදු කරන ලද හෝ සිදු කළ යුතු ක්‍රියාකාරකම් (යොමුව : අ 101 - අ 103 ඡේද) | අස්තිත්වයට අභ්‍යන්තර විගනණ කාර්යයක් තිබේනම්[2], විගණක විසින් අභ්‍යන්තර විගණන කාර්යයේ වගකීම්, එහි සංවිධානමය තත්වය සහ සිදු කරන ලද හෝ ඉටු කළ යුතු ක්‍රියාකාරකම්හි ස්වභාවය ගැන අවබෝධයක් ලබාගත යුතුය. (යොමුව : අ 113 - අ 120 ඡේද) |
| පාද සටහන් | 1 "අභ්‍යන්තර විගණන කාර්යය" යන පදය ශ්‍රී.ලං.වි.ප්‍ර. 610 හි, "අභ්‍යන්තර විගණක වරුන්ගේ වැඩ ප්‍රයෝජනයට ගැනීමකි" 7 (අ) ඡේදයේ අර්ථ දක්වා ඇත්තේ "අස්තිත්වයට සේවාවක් ලබාදෙන ලෙසට හෝ තක්සේරු කරණ ක්‍රියාකාරකමක් ලෙසට ස්ථාපිත වූවක් ලෙසටය." එහි කාර්යයන් අතර, වෙනත් දේ අතර, අභ්‍යන්තර පාලනයේ ප්‍රමාණවත් බව සහ සඵලාදායීතාවය පරීක්ෂා කිරීම, ඇගයීම සහ අධීක්ෂණය ඇතුලත් වේ. | 2 ශ්‍රී.ලං.වි.ප්‍ර 610 (සංශෝධිත - 2013 සංශෝධිත) *අභ්‍යන්තර විගණකවරුන්ගේ වැඩ ප්‍රයෝජනයට ගනිමින්* , 14 (අ) ඡේදය, ශ්‍රී.ලං.වි.ප්‍ර. හි අරමුණු සඳහා "අභ්‍යන්තර විගණන කාර්යය" යන පදය අර්ථකථනය කර ඇත. |
| 24 | අස්තිත්වයේ අධික්ෂණ කටයුතු වලදී භාවිතා කරන තොරතුරු වල ප්‍රභවයන් පිළිබඳව සහ අරමුණු සඳහා එම තොරතුරු ප්‍රමාණවත් තරමට විශ්වාසදායක යැයි කළමනාකරණය සළකන පදනම මත විගණක විසින් අවබෝධයක් ලබාගත යුතුය. (යොමුව: අ 104 ඡේදය) | අස්තිත්වයේ අධික්ෂණ කටයුතු වලදී භාවිතා කරන තොරතුරු වල ප්‍රභවයන් පිළිබඳව සහ අරමුණු සඳහා එම තොරතුරු ප්‍රමාණවත් තරමට විශ්වාසදායක යැයි කළමනාකරණය සළකන පදනම මත විගණක විසින් අවබෝධයක් ලබාගත යුතුය. (යොමුව: අ 121 ඡේදය) |
| 25 | විගණක විසින් ප්‍රමාණාත්මක අව ප්‍රකාශ වීමේ අවදානම් පහත අවස්ථා වලදී හඳුනාගෙන තක්සේරු කළ යුතුය:<br>(අ) මූල්‍ය ප්‍රකාශ මට්ටම ; සහ ( යොමුව : අ 105 - අ 108 ඡේද)<br>(ආ) ගනුදෙනු, ගිණුම් ශේෂ සහ හෙළිදරව් කිරීම් පන්ති සඳහා සැදැහුම් මට්ටම (යොමුව : අ 109 - | විගණක විසින් ප්‍රමාණාත්මක අව ප්‍රකාශ වීමේ අවදානම් පහත අවස්ථා වලදී හඳුනාගෙන තක්සේරු කළ යුතුය:<br>(අ) මූල්‍ය ප්‍රකාශ මට්ටම ; සහ (යොමුව : අ 122- අ 125 ඡේද)<br>(ආ) ගනුදෙනු, ගිණුම් ශේෂ සහ හෙළිදරව් කිරීම් පන්ති සඳහා සැදැහුම් මට්ටම |

| විස්තරය | 2014 | 2017 |
|---|---|---|
| | අ 113 ඡේද) වැඩිදුර විගණන ක්‍රියා පටිපාටි සැලසුම් කිරීම හා ක්‍රියාත්මක කිරීම සඳහා පදනමක් ලබාදීමට. | (යොමුව : අ 126 - අ 131 ඡේද) සැලසුම් කිරීම හා ක්‍රියාත්මක කිරීම සඳහා පදනමක් ලබාදීමට. |
| 26 | මෙම අරමුණ සඳහා විගණක විසින්:<br>(අ) මූල්‍ය ප්‍රකාශවල ගණුදෙනු, ගිණුම් ශේෂයන් සහ හෙළිදරව් කිරීම් පන්ති පිළිබඳ සළකා බැලීම මගින්; අවදානම්වලට සම්බන්ධ අදාල පාලනයන් ඇතුළුව, අස්තිත්ත්වය සහ එහි පරිසරය පිළිබඳ අවබෝධයක් ලබා ගැනීමේ ක්‍රියාවලිය පුරාම අවදානම් හඳුනා ගැනීම (යොමුව : අ 114 - අ 115 ඡේද)<br>(ආ) හඳුනාගත් අවදානම් තක්සේරු කිරීම සහ ඒවා සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශ සමඟ වඩා පෘතුල ලෙස සම්බන්ධ වන්නේද යන්න සහ බොහෝ සැදැහුම්වලට භව්‍ය ලෙස බලපෑම් කල හැකිද යන්න තක්සේරු කරන්න;<br>(ඇ) විගණක විසින් පරික්ෂා කිරීමට අපේක්ෂා කරන අදාළ පාලනයන් සැළකිල්ලට ගනිමින්, සැදැහුම් මට්ටමින් වැරදියට සිදුවිය හැකි දේ හඳුනාගත් අවදානම් සමඟ සම්බන්ධ කිරීම; සහ (යොමුව : අ 116- අ 118 ඡේද)<br>(ඈ) බහුවිධ අවප්‍රකාශ ඇතිවීමේ හැකියාව ඇතුළුව අවප්‍රකාශ වීමේ සම්භාවිතාව සහ භව්‍ය අවප්‍රකාශ, ප්‍රමාණාත්මක අවප්‍රකාශයකට හේතුවිය හැකි තරම් විශාලත්වයකින් යුක්ත ද යන්න සළකා බලන්න. | මෙම අරමුණ සඳහා විගණක විසින්;<br>(අ) මූල්‍ය ප්‍රකාශ වල ගණුදෙනු , ගිණුම් ශේෂයන් සහ හෙළිදරව් කිරීම් (එවැනි හෙළිදරව් කිරීම් වල හෝ ගුණාත්මක අංශ ඇතුළුව) පන්ති පිළිබඳ සළකා බැලීම මගින් ; අවදානම්වලට සම්බන්ධ අදාළ පාලනයන් ඇතුළුව, අස්තිත්වය සහ එහි පරිසරය පිළිබඳ අවබෝධයක් ලබා ගැනීමේ ක්‍රියාවලිය පුරාම අවදානම් හඳුනා ගැනීම (යොමුව : අ 132 - අ 136 ඡේද)<br>(ආ) හඳුනාගත් අවදානම් තක්සේරු කිරීම සහ ඒවා සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශ සමග වඩා පෘතුල ලෙස සම්බන්ධ වන්නේද යන්න සහ බොහෝ සැදැහුම් වලට භව්‍ය ලෙස බලපෑම් කළ හැකිද යන්න තක්සේරු කරන්න;<br>(ඇ)විගණක විසින් පරීක්ෂා කිරීමට අපේක්ෂා කරන අදාළ පාලනයන් සැලකිල්ලට ගනිමින්, සැදැහුම් මට්ටමින් වැරදියට සිදුවිය හැකි දේ හඳුනාගත් අවදානම් සමඟ සම්බන්ධ කිරීම; සහ (යොමුව : අ 137 - අ 139 ඡේද)<br>(ඈ) බහුවිධ අවප්‍රකාශ ඇතිවීමේ හැකියාව ඇතුළුව අවප්‍රකාශ වීමේ සම්භාවිතාව සහ භව්‍ය අව ප්‍රකාශ, ප්‍රමාණාත්මක අව ප්‍රකාශයකට හේතුවිය හැකිද යන්න සළකා බලන්න. (යොමුව : අ 140 ඡේදය) |
| 28 (ඊ) | අස්තිත්වයෙහි සාමාන්‍ය ව්‍යාපාර කටයුතුවලින් බැහැර වූ සැළකිය යුතු අන්දමේ ගණුදෙනු අවදානමට සම්බන්ධ ද, නැතහොත් එය අසාමාන්‍ය ලෙස පෙනේද යන්න (යොමුව : අ 119- අ 123 ඡේද) | අස්තිත්වයෙහි සාමාන්‍ය ව්‍යාපාර කටයුතු වලින් බැහැර වූ සැළකිය යුතු අන්දමේ ගණුදෙනු අවදානමට සම්බන්ධ ද, නැතහොත් එය අසාමාන්‍ය ලෙස පෙනේද යන්න (යොමුව : අ 141 - අ 145 ඡේද) |
| 29 | සැළකිය යුතු අන්දමේ අවදානමක් පවතින බවට විගණක විසින් නීර්ණය කර ඇත්නම්, විගණක විසින් එම අවදානමට අදාළ පාලන ක්‍රියාකාරකම් ඇතුළුව අස්තිත්ත්වයේ පාලනයන් පිළිබඳ අවබෝධයක් ලබා ගත යුතුය. (යොමුව : අ 124 - අ 126 ඡේද) | සැළකිය යුතු අන්දමේ අවදානමක් පවතින බවට විගණක විසින් නීර්ණය කර ඇත්නම්, විගණක විසින් එම අවදානමට අදාළ පාලන ක්‍රියාකාරකම් ඇතුළුව අස්තිත්වයේ පාලනයන් පිළිබඳ අවබෝධයක් ලබා ගත යුතුය. (යොමුව : අ 146 - අ 148 ඡේද) |

| විස්තරය | 2014 | 2017 |
|---|---|---|
| 30 | සමහර අවදානම් සම්බන්ධයෙන්, ප්‍රමාණවත් යෝග්‍ය විගණක සාක්ෂි ලබා ගැනීම තහවුරු කිරීමේ ක්‍රියාපටිපාටි වලින් පමණක් ලබාගත නොහැකි හෝ ප්‍රායෝගික නොවන බව විගණක විසින් විනිශ්චය කළ හැකිය. එවැනි අවදානම් වැරදි සහිත හෝ හුරුපුරුදු විධියට අසම්පූර්ණ ලෙස සටහන් කිරීම සහ සැළකිය යුතු ගණුදෙනු පන්ති හෝ ගිණුම් ශේෂ, අත්හුරු ක්‍රමයට හෝ මැදිහත් වීමෙන් තොරව ඉහළ ස්වයංක්‍රීය සැකසුම් සඳහා බොහෝවිට ඉඩදෙන ගති ලක්ෂණ අදාළ විය හැකිය. එවැනි අවස්ථාවන්හිදී එවැනි අවදානම් පිළිබඳ අස්තිත්වයේ පාලනයන් විගණනයට අදාළ වන අතර, විගණක විසින් ඒවා පිළිබඳ අවබෝධයක් ලබාගත යුතුය. (යොමුව : ~~අ 127 – අ 129~~ ජේද) | සමහර අවදානම් සම්බන්ධයෙන්, ප්‍රමාණවත් යෝග්‍ය විගණක සාක්ෂි ලබා ගැනීම තහවුරු කිරීමේ ක්‍රියාපටිපාටිවලින් පමණක් ලබාගත නොහැකි හෝ ප්‍රායෝගික නොවන බව විගණක විසින් විනිශ්චය කළ හැකිය. එවැනි අවදානම් වැරදි සහිත හෝ හුරුපුරුදු විධියට අසම්පූර්ණ ලෙස සටහන් කිරීම සහ සැළකිය යුතු ගණුදෙනු පන්ති හෝ ගිණුම් ශේෂ, අත්හුරු ක්‍රමයට හෝ මැදිහත් වීමෙන් තොරව ඉහළ ස්වයංක්‍රීය සැකසුම් සඳහා බොහෝවිට ඉඩදෙන ගති ලක්ෂණ අදාළ විය හැකිය. එවැනි අවස්ථාවන්හිදී එවැනි අවදානම් පිළිබඳ අස්තිත්වයේ පාලනයන් විගණනයට අදාළ වන අතර, විගණක විසින් ඒවා පිළිබඳ අවබෝධයක් ලබාගත යුතුය. (යොමුව: අ 149 - අ 151 ජේද ) |
| 31 | විගණන ක්‍රියා මාර්ගය සැදැහුම් මට්ටමේදී අතිරේක විගණන සාක්ෂි ලබාගන්නා බැවින් ප්‍රමාණාත්මක අව ප්‍රකාශ වීමේ අවදානම පිළිබඳ විගණකගේ තක්සේරුව වෙනස්විය හැකිය. වැඩි දුර විගණන ක්‍රියා පටිපාටි ඉටු කිරීමෙන් විගණක විසින් විගණන සාක්ෂි ලබාගන්නා අවස්ථාවලදී හෝ නව තොරතුරු ලබා ගන්නේ නම්, විගණකගේ මුලින් තක්සේරුව පදනම් කරගත් විගණන සාක්ෂි සමඟ දෙකෙන් කුමක් වුවත් අසංගත නම්, විගණක විසින් තක්සේරුව සංශෝධනය කර ඒ අනුව තවදුරටත් සැලසුම් කළ විගණන ක්‍රියා පටිපාටි වෙනස් කළ යුතුය. (යොමුව. ~~අ 130 ජේදය~~) | විගණන ක්‍රියා මාර්ගය සැදැහුම් මට්ටමේදී අතිරේක විගණන සාක්ෂි ලබාගන්නා බැවින් ප්‍රමාණාත්මක අව ප්‍රකාශවීමේ අවදානම පිළිබඳ විගණකගේ තක්සේරුව වෙනස්විය හැකිය. වැඩි දුර විගණන ක්‍රියා පටිපාටි ඉටු කිරීමෙන් විගණක විසින් විගණන සාක්ෂි ලබාගන්නා අවස්ථාවලදී හෝ නව තොරතුරු ලබා ගන්නේ නම්, විගණකගේ මුලින් තක්සේරුව පදනම් කරගත් විගණන සාක්ෂි සමඟ දෙකෙන් එකක් වුවත් අසංගත නම්, විගණක විසින් තක්සේරුව සංශෝධනය කර ඒ අනුව තවදුරටත් සැලසුම් කළ විගණන ක්‍රියා පටිපාටි වෙනස් කළ යුතුය. (යොමුව. අ 152 ජේදය) |
| 32 (ඇ) | 27 - 30 ජේදවල ඇති අවශ්‍යතාවන්හි ප්‍රතිඵලයක් ලෙස විගණක විසින් හඳුනාගෙන අවබෝධයක් ලබාගෙන ඇති අවදානම් සහ ඒ හා සම්බන්ධිත පාලනයන් (යොමුව : ~~අ 131 – අ 134 ජේද~~) | 27 - 30 ජේදවල ඇති අවශ්‍යතාවන්හි ප්‍රතිඵලයක් ලෙස විගණක විසින් හඳුනාගෙන අවබෝධයක් ලබාගෙන ඇති අවදානම් සහ ඒ හා සම්බන්ධිත පාලනයන් (යොමුව : අ 153 - අ 156 ජේද) |
| අ1 | ......<br>• ~~විශේෂයෙන් විගණන සළකා බැලීම අවශ්‍ය වියහැකි ක්ෂේත්‍ර හඳුනා ගැනීමේ, උදාහරණ ලෙස සම්බන්ධිත පාර්ශවීය ගණු දෙනු අඛන්ඩ පැවැත්ම පිළිබඳව වූ උපකල්පන පිළිබඳව කළමනාකාරිත්වයේ භාවිතයන්හි යෝග්‍යතාවය හෝ ගණුදෙනු වල ව්‍යාපාරික අරමුණු සළකා බැලීම,~~<br>........ | ......<br>• විශේෂයෙන් විගණන සළකා බැලීම අවශ්‍ය විය හැකි මූල්‍ය ප්‍රකාශවල අගයන් හෝ හෙළිදරව් කිරීම් වලට සම්බන්ධ ක්ෂේත්‍ර හඳුනා ගැනීමේ, උදාහරණ ලෙස : සම්බන්ධිත පාර්ශවීය ගණු දෙනු හෝ අඛන්ඩ පැවැත්ම ලෙස දිගටම පවත්වාගෙන යාමේ අස්තිත්වයේ හැකියාව සම්බන්ධයෙන් ඇති කළමනාකාරිත්වයේ තක්සේරුව හෝ ගණුදෙනුවල ව්‍යාපාරික අරමුණ සළකා බැලීමේදී ;<br>...... |

| **විස්තරය** | **2014** | **2017** |
|---|---|---|
| ශීර්ෂය | *අස්තිත්වය තුළ කළමනාකරණය සහ වෙනත් අය පිළිබඳ විමසීම්*<br>(යොමුව : 6 (අ) ඡේදය) | *කළමනාකරණය, අභ්‍යන්තර විගණන කාර්යය සහ අස්තිත්වය තුළ සිටින වෙනත් අය පිළිබඳ විමසීම්* (යොමුව : 6 (අ) ඡේදය) |
| අ6 | විගණකගේ විමසීම් මගින් ලබාගත් තොරතුරුවලින් බොහොමයක් ලබාගෙන ඇත්තේ කළමනාකරණයෙන් සහ මූල්‍ය වාර්තාකරණයට වගකිව යුතු අයගෙනි. ~~කෙසේ වෙතත්, විගණකහට තොරතුරු ලබාගත හැකි හෝ ප්‍රමාණාත්මක අවප්‍රකාශ වීමේ අවදානම් හඳුනා ගැනීමේ වෙනස් ඉදිරි දර්ශනයක්, අස්තිත්වය තුළ සිටින අන් අයගෙන් විමසීම් හරහා සහ විවිධ මට්ටමේ බලතල සහිත වෙනත් සේවකයින් හෝ ලබාගත හැකිය. උදාහරණයක් ලෙස~~<br>• ~~පාලනය පිළිබඳ වගකිව යුතු අය වෙත කෙරෙන විමසීම් මගින් මූල්‍ය ප්‍රකාශ සකස් කර ඇති පරිසරය පිළිබඳව අවබෝධකර ගැනීමට විගණකට හැකිවේ.~~<br>• ~~අභ්‍යන්තර විගණන නිලධාරීන් වෙත කෙරෙන විමසීම් මගින් අස්තිත්වයේ අභ්‍යන්තර පාලන සැලසුම හා සඵලදායිතාවය සම්බන්ධව වර්ෂය තුළ සිදු කරන ලද අභ්‍යන්තර විගණන ක්‍රියා පටිපාටි සහ එම ක්‍රියා පටිපාටිවලින් ලද සොයාගැනීම් වලට කළමනාකරණය සතුටු දායක ලෙස ප්‍රතිචාර දක්වා තිබේද යන්න පිළිබඳ තොරතුරු සැපයිය හැකිය.~~<br>• ~~සංකීර්ණ හෝ අසාමාන්‍ය ගණුදෙනු ආරම්භ කිරීමට, සැකසීමට හෝ වාර්තා කිරීමට සම්බන්ධ සේවකයින්ගෙන් විමසීමෙන් විගණකට ඇතැම් ගිණුම්කරණ ප්‍රතිපත්ති තෝරා ගැනීමේ සහ යෙදවීමේ යෝග්‍යතාවය තක්සේරු කිරීමට උපකාරි වේ.~~<br>• ~~අභ්‍යන්තර නීති උපදේශකයින් වෙත යොමු කරන ලද විමසීම් මගින් නඩු පැවරීම, නීති හා රෙගුලාසිවලට අනුකූල වීම, වංචාවක් හෝ අස්තිත්වයට බලපාන සැකසහිත වංචාවන්, ප්‍රතිඥා භාර, අලෙවියෙන් පසු බැඳීම්, ව්‍යාපාර හවුල් කරුවන් (බද්ධ ව්‍යාපාර වැනි) පිළිබඳ තොරතුරු සහ ගිවිසුම් කොන්දේසි වල අදහස සැපයිය හැකිය.~~<br>• ~~අලෙවිකරන හෝ විකුණුම් පිරිස් වෙත යොමු කරන ලද විමසීම් මගින් අස්තිත්වයේ අලෙවිකරණ උපාය මාර්ග, විකුණුම් ප්‍රවනතා හෝ එහි ගණුදෙනුකරුවන් සමඟ ගිවිසුම්ගත විධිවිධානවල වෙනස්කම් පිළිබඳ~~ | විගණකගේ විමසීම් මගින් ලබාගත් තොරතුරු වලින් බොහොමයක් කළමනාකරණයෙන් සහ මූල්‍ය වාර්තාකරණයට වගකිව යුතු අයගෙන් ලබාගනී. අභ්‍යන්තර විගණන කාර්යයන්, අස්තිත්වයට එවැනි කාර්යයක් තිබේනම් සහ අස්තිත්වය තුළ සිටින වෙනත් අයගෙන් විමසීම් මගින් විගණක හට තොරතුරු ද එලෙසම ලබා ගත හැකිය. |

| විස්තරය | 2014 | 2017 |
|---|---|---|
| | ~~තොරතුරු ලබාදිය හැකිය.~~ | |
| 2014 - අනුරූප ඡේද නොමැත. 2017 - අ 7 | [අනුරූප නොමැත.] | අස්තිත්වය තුළ සිටින අන් අයගෙන් සහ විවිධ මට්ටම්වල බලතල ඇති වෙනත් සේවකයින්ගෙන් විමසීම් මගින් විගණකහට ප්‍රමාණාත්මක අව ප්‍රකාශවීමේ අවදානම් හඳුනාගැනීම පිළිබඳව තොරතුරු හෝ වෙනත් ඉදිරි දර්ශනයක් ලබාගත හැකිය. උදාහරණ ලෙස<br>• පාලනය පිළිබඳ වගකිව යුතු අය වෙත කෙරෙන විමසීම් මගින් මූල්‍ය ප්‍රකාශ සකස් කර ඇති පරිසරය පිළිබඳව අවබෝධ කර ගැනීමට විගණකට උපකාරි වේ. ශ්‍රී.ලං.වි.ප්‍ර. 260 (සංශෝධිත)* මගින් මේ සම්බන්ධයෙන් පාලනය පිළිබඳ වගකිව යුතු අයගෙන් තොරතුරු ලබා ගැනීමට විගණකට සහාය වීමට සඵලදායක ද්වි - මාර්ග සන්නිවේදනයේ වැදගත්කම හඳුනාගනී.<br>• සංකීර්ණ හෝ අසාමාන්‍ය ගණුදෙනු ආරම්භ කිරීමට, සැකසීමට හෝ වාර්තා කිරීමට සම්බන්ධ සේවකයින්ගෙන් විමසීමෙන් විගණකට ඇතැම් ගිණුම්කරණ ප්‍රතිපත්ති තෝරා ගැනීමේ සහ යෙදවීමේ යෝග්‍යතාවය තක්සේරු කිරීමට උපකාරි වේ.<br>• අභ්‍යන්තර නිතී උපදේශකයින් වෙත යොමු කරන ලද විමසීම් මගින් නඩු පැවරීම, නීති හා රෙගුලාසිවලට අනුකූලවීම, වංචාවන් හෝ අස්තිත්වයට බලපාන සැකසහිත වංචාවන්, ප්‍රතිඥා භාර, අලෙවියෙන් පසු බැඳීම්, ව්‍යාපාර හවුල්කරුවන් (බද්ධ ව්‍යාපාර වැනි) පිළිබඳ තොරතුරු සහ ගිවිසුම් කොන්දේසි වල අදහස සැපයීය හැකිය.<br>• අලෙවිකරණ හෝ විකුණුම් පිරිස් වෙත යොමු කරන ලද විමසීම් මගින් අස්තිත්වයේ අලෙවිකරණ උපාය මාර්ග, විකුණුම් ප්‍රවනතා හෝ එහි ගණුදෙනු කරුවන් සමග, ගිවිසුම්ගත විධිවිධානවල වෙනස්කම් පිළිබඳ තොරතුරු ලබාදිය හැකිය.<br>• අවදානම් කළමනාකරණ කාර්යයට (හෝ එවැනි කාර්ය භාරයක් ඉටු කරන අය) යොමු කරන ලද විමසීම් |

| විස්තරය | 2014 | 2017 |
|---|---|---|
| | | මූල්‍ය වාර්තාකරණයට බලපාන මෙහෙයුම් සහ නියාමන අවදානම් පිළිබඳ තොරතුරු ලබාදිය හැකිය.<br>• තොරතුරු පද්ධති පිරිස් වෙත යොමු කරන ලද විමසීම් මගින් පද්ධති වෙනස්වීම්, පද්ධති හෝ පාලන බිඳ වැටීම හෝ වෙනත් තොරතුරු මගින් පද්ධති සම්බන්ධිත අවදානම් පිළිබඳ තොරතුරු ලබාදිය හැකිය.<br>* ශ්‍රී.ලං.වි.ප්‍ර. 260 (සංශෝධිත), *පාලනය පිළිබඳ වගකිව යුතු අය සමග සන්නිවේදනය*, 4 (ආ) ඡේදය. |
| 2014-අනුරූප ඡේද නොමැත. 2017-අ 8 | [අනුරූප නොමැත.] | අස්තිත්වය සහ එහි පරිසරය පිළිබඳ අවබෝධයක් ලබා ගැනීම නිරන්තර සිදුවන, ගතික ක්‍රියාවලියක් බැවින්, විගණන කාර්ය භාරය පුරාවට විගණකගේ විමසීම් සිදුවිය හැකිය. |
| ශීර්ෂය | [අනුරූප නොමැත.] | අභ්‍යන්තර විගණන කාර්යය පිළිබඳ විමසීම්. |
| 2014 - අනුරූප ඡේද නොමැත. 2017 - අ 9 | [අනුරූප නොමැත.] | යම් අස්තිත්වයකට අභ්‍යන්තර විගණන කාර්යයන් තිබේ නම්, එම කාර්යය තුළ සිටින යෝග්‍ය පුද්ගලයින්ගෙන් විමසීම් කිරීම මගින් අස්තිත්වය සහ එහි පරිසරය පිළිබඳ අවබෝධයක් ලබා ගැනීමට සහ මූල්‍ය ප්‍රකාශයේ සහ සැදැහුම් මට්ටම්වල ප්‍රමාණාත්මක අව ප්‍රකාශ වීමේ අවදානම හඳුනා ගැනීමට සහ තක්සේරු කිරීමට විගණක හට ප්‍රයෝජනවත් තොරතුරු ලබාදිය හැකිය. අභ්‍යන්තර විගණන කාර්යය මගින් එහි වැඩ ඉටු කිරීමේදි අස්තිත්වයේ මෙහෙයුම් සහ ව්‍යාපාර අවදානම් පිළිබඳ අවබෝධයක් ලබාගෙන ලබාගත හැකි අතර, හඳුනාගත් පාලන ඌනතාවයක් හෝ අවදානම් වැනි එහි වැඩ මත පදනම් වූ සොයාගැනීම් තිබිය හැකි අතර, එමගින්, විගණකගේ අවදානම් තක්සේරු කිරීම් හෝ විගණනයේ වෙනත් අංග පිළිබඳව විගණකට අස්තිත්වයේ අවබෝධය සඳහා |

| විස්තරය | 2014 | 2017 |
|---|---|---|
| | | වටිනා අදහසක් ලබාදිය හැකිය. එබැවින් විගණකගේ විමසුම් සිදු කරනු ලබනුයේ විගණන ක්‍රියා පටිපාටිවල ස්වභාවය හෝ කාලය වෙනස් කිරීමට හෝ ප්‍රමාණය අඩු කිරීම සඳහා අභ්‍යන්තර විගණන කාර්යයේ වැඩ භාවිතා කිරීම විගණක අපේක්ෂා කරයිද නැද්ද යන්න සඳහාය.<br><br>* විශේෂ අදාලත්වයක විමසීම්, පාලනය පිළිබඳ වගකිවයුතු අය සමඟ අභ්‍යන්තර විගණන කාර්යය මතු කළ කරුණු සහ කාර්යයේ ස්වකීය අවදානම් තක්සේරු ක්‍රියාවලියේ ප්‍රතිඵල පිළිබඳව විය හැකිය.<br><br>* අදාළ අවශ්‍යතා ශ්‍රී.ලං.වි.ප්‍ර. 610 (2013 - සංශෝධිත) හි අඩංගු වේ. |
| 2014 - අනුරූප ඡේද නොමැත. 2017-අ 10 | [අනුරූප නොමැත.] | විගණකගේ විමසීම්වලට ලැබෙන ප්‍රතිචාර මත පදනම්ව, අස්තිත්වයේ මූල්‍ය වාර්තාකරණය සහ විගණනයට අදාළ වියහැකි සොයා ගැනීම් ඇති බව පෙනේ නම්, අභ්‍යන්තර විගණන කාර්යයට සම්බන්ධිත වාර්තා කියවීම යෝග්‍ය යැයි විගණක සලකා බැලිය හැකිය. අදාළ විය හැකි අභ්‍යන්තර විගණන කාර්යයේ වාර්තා වල උදාහරණවලට ඇතුලත් වන්නේ කාර්යයේ උපාය මාර්ග හා සැලසුම් කරන ලේඛන සහ කළමනාකරණය සඳහා හෝ පාලනය පිළිබඳ වගකිව යුතු අය සඳහා අභ්‍යන්තර විගණන කාර්යයේ පරීක්ෂාවන්ගෙන් සොයා ගැනීම් විස්තර කරමින් පිළියෙල කර ඇති වාර්තාය. |
| 2014-අනුරූප ඡේද නොමැත. 2017-අ 11 | [අනුරූප නොමැත.] | ඊට අමතරව, ශ්‍රී.ලං.වි.ප්‍ර. 240 සමඟ අනුකූලව, * අභ්‍යන්තර විගණන කාර්යය කිසියම් සත්‍ය, සැක සහිත හෝ කරන ලදැයි කියන වංචාවක් සම්බන්ධයෙන් විගණකට තොරතුරු ලබාදෙන්නේ නම්, වංචා හේතුවෙන් ප්‍රමාණාත්මක අව ප්‍රකාශවීමේ අවදානම හඳුනාගැනීමේදී විගණක විසින් මෙය සැලකිල්ලට ගනී.<br><br>* ශ්‍රී.ලං.වි.ප්‍ර. 240, 19 වන ඡේදය. |

| විස්තරය | 2014 | 2017 |
|---|---|---|
| 2014 - අනුරූප ඡේද නොමැත. 2017 - අ 12 | [අනුරූප නොමැත.] | විගණකගේ විනිශ්චය තුළ අභ්‍යන්තර විගණන කාර්යය ඇතුලත විමසීම් කරනු ලැබීමට යෝග්‍ය පුද්ගලයින් වන්නේ සුදුසු දැනුම, පළපුරුද්ද සහ අධිකාරි බලය ඇති ප්‍රධාන අභ්‍යන්තර විගණන විධායක වැනි අය හෝ පවත්නා තත්ත්වයන් අනුව එම කාර්යය තුළ සිටින අනෙකුත් පුද්ගලයින්ය. මෙම පුද්ගලයින් සමඟ වරින්වර රැස්වීම් පැවැත්වීමට යෝග්‍ය දැයි විගණන එසේම සළකා බැලිය හැකිය. |
| ශීර්ෂය | [අනුරූප නොමැත.] | රාජ්‍ය අංශයේ අස්තිත්ත්වවලට විශේෂිත වූ සැලකිල්ලට ගැනීම (යොමුව : 6 අ ඡේදය). |
| 2014 - අනුරූප ඡේද නොමැත. 2017 - අ 13 | [අනුරූප නොමැත.] | අභ්‍යන්තර පාලනය සහ අදාළ නීති හා රෙගුලාසිවලට අනුකූලවීම සම්බන්ධයෙන් රාජ්‍ය අංශයේ අස්තිත්වයන්හි විගණකවරුන්ට බොහෝවිට අමතර වගකීම් ඇත. අභ්‍යන්තර විගණන කාර්යයේ සුදුසු පුද්ගලයින්ගේ විමසීම් මගින් අදාළ නිතී හා රෙගුලාසිවලට අනුකුල නොවන ප්‍රමාණාත්මක අවදානම සහ මූල්‍ය වාර්තාකරණය මත අභ්‍යන්තර පාලනයේ ඌණතාවයන්ගේ අවදානම හඳුනා ගැනීමට විගණකවරුන්ට සහාය විය හැකිය. |
| 2014 - අනුරූප ඡේද නොමැත. 2017 - අ 19 | [අනුරූප නොමැත.] | ........<br>• <u>විගණක හට අවශ්‍ය විගණන ක්‍රියා පටිපාටි ඉටු කිරීමේ දුෂ්කරතාවලට මුහුණපෑමට සිදු වූ විට විශේෂ වර්ගවල ගණුදෙනු හා වෙනත් සිදුවීම් හෝ ගිණුම් ශේෂයන් (සහ ඒ හා සම්බන්ධ හෙළිදරව් කිරීම්), උදාහරණයක් ලෙස ඒවායෙහි සංකීර්ණත්වය හේතුවෙන්,</u> |
| 2014 - අනුරූප ඡේද නොමැත. 2017 - අ 22 | [අනුරූප නොමැත.] | 10 ඡේදයෙන් අවශ්‍ය කරන පරිදි කාර්ය භාරයේ නියුතු කණ්ඩායම අතර සාකච්ඡාවේ කොටසක් ලෙස, අදාළ මූල්‍ය වාර්තාකරණ ආකෘතිමය රාමුවේ හෙළිදරව් කිරීමේ අවශ්‍යතා සළකා බැලීමේදී, හෙළිදරව් කිරීම් වලට සම්බන්ධව ප්‍රමාණාත්මක අවප්‍රකාශ කිරීමේ අවදානමක් තිබිය හැකි තැන් ඇත්දැයි විගණනයේ මුල් අවධියේදි හඳුනා ගැනීමට උපකාරි වේ. කාර්ය භාරයේ නියුතු කණ්ඩායම සාකච්ඡා කළ හැකි කරුණු වල උදාහරණවලට ඇතුලත් විය හැක්කේ:<br>• <u>සැළකිය යුතු නව හෝ සංශෝධිත හෙළිදරව් කිරීම්වලට හේතුවිය හැකි මූල්‍ය වාර්තාකරන අවශ්‍යතාවල වෙනස් කිරීම්.</u><br>• <u>සැළකිය යුතු නව හෝ සංශෝධිත හෙළිදරව් කිරීම්වලට හේතුවිය හැකි</u> |

| විස්තරය | 2014 | 2017 |
|---|---|---|
| | | අස්තිත්වයේ පරිසරය, මූල්‍ය තත්ත්වය හෝ ක්‍රියාකාරකම්වල වෙනස්වීම්, උදාහරණ ලෙස විගණන කාල සීමාව තුළ සිදුවන සැළකිය යුතු අන්දමේ ව්‍යාපාර සංයෝජනයක්.<br>• හෙලිදරව් කිරීම් සඳහා ප්‍රමාණවත් යෝග්‍ය විගණන සාක්ෂි ලබා ගැනීම අතීතයේදී දුෂ්කර වන්නට ඇත ; සහ<br>• කුමන තොරතුරු හෙලිදරව් කළයුතු ද යන්න පිළිබඳව එම සැළකිය යුතු කළමනාකරණ විනිශ්චයන් සම්බන්ධ කර ගැනීම ඇතුළුව සංකීර්ණ කරුණු පිළිබඳ හෙලිදරව් කිරීම. |
| 2014 - අ 15<br>2017 - අ 23 | සියලුම සාමාජිකයින් එකම සාකච්ඡාවකට ඇතුලත් කොට සාකච්ඡා කිරීම සැම විටම අවශ්‍ය හෝ ප්‍රායෝගික නොවන (උදාහරණයක් ලෙස, බහු ස්ථාන විගණනයකදී) අතර, සකච්ඡාවේදී ගනු ලැබූ සියලුම තීරණ පිළිබඳව කාර්යභාරයේ නියුතු කණ්ඩායමෙහි සියලුම සාමාජිකයින්ට දැනුම් දීම අවශ්‍ය නොවේ. කාර්යභාරයේ නියුක්ත හවුල්කරු විසින් කාර්යභාරයේ නියුක්ත කණ්ඩායමේ ප්‍රධාන සාමාජිකයින්, යෝග්‍ය යැයි සළකන්නේ නම්, ~~විශේෂඥයින් සහ~~ සංරචක විගණනයට වගකිව යුතු අය, අන් අය සමග සාකච්ඡාවට පවරාදෙන අතරතුර අවශ්‍ය යැයි සැලකෙන සන්නිවේදනයේ ප්‍රමාණය සැළකිල්ලට ගනිමින් කාර්යභාරයේ නියුක්ත කණ්ඩායම සමගම සාකච්ඡා කළ හැකිය. කාර්යයේ නියුක්ත හවුල්කරු විසින් එකඟ වූ සන්නිවේදන සැලැස්මක් ප්‍රයෝජනවත් විය හැකිය. | සියලුම සාමාජිකයින් එකම සාකච්ඡාවකට ඇතුලත් කොට සාකච්ඡා කිරීම සැම විටම අවශ්‍ය හෝ ප්‍රායෝගික නොවන (උදාහරණයක් ලෙස, බහු ස්ථාන විගණනයකදී) අතර, සාකච්ඡාවේදී ගනු ලැබූ සියලුම තීරණ පිළිබඳව කාර්ය භාරයේ නියුතු කණ්ඩායමෙහි සියලුම සාමාජිකයින්ට දැනුම් දීම අවශ්‍ය නොවේ. කාර්යභාරයේ නියුක්ත හවුල්කරු විසින් කාර්යභාරයේ නියුක්ත කණ්ඩායමේ ප්‍රධාන සාමාජිකයින්, යෝග්‍ය යැයි සළකන්නේ නම්, නිශ්චිත කුසලතා හෝ දැනුම ඇති සහ සංරචක විගණනයට වගකිව යුතු අය, අන් අය සමග සාකච්ඡාවට පවරා දෙන අතරතුර අවශ්‍ය යැයි සැලෙකන සන්නිවේදනයේ ප්‍රමාණය සැළකිල්ලට ගනිමින් කාර්යභාරයේ නියුක්ත කණ්ඩායම සමග සාකච්ඡා කළ හැකිය. කාර්යයේ නියුක්ත හවුල්කරු විසින් එකඟ වූ සන්නිවේදන සැලැස්මක් ප්‍රයෝජනවත් විය හැකිය. |
| 2014- අ 19<br>2017-අ 27 | ........<br>• ~~නියාමනය කරන ලද කර්මාන්තයක් සඳහා නියාමන ආකෘතිමය රාමුව.~~<br>.............. | .............<br>• හෙලිදරව් කිරීම් සඳහාවන අවශ්‍යතා ඇතුළුව නියාමනය කරන ලද කර්මාන්තයක් සඳහා වන නියාමන ආකෘතිමය රාමුව.<br>.................. |
| 2014 - අ 23<br>2017 - අ 31 | විගණකහට අස්තිත්ත්වයෙහි ස්වභාවය පිළිබඳ අවබෝධයක් ලබා ගැනීම පහත දැක්වෙන කරුණු පිළිබඳව අවබෝධ කර ගැනීමට හැකියාව ලබාගනී:<br>• අස්තිත්වයට සංකීර්ණ ව්‍යුහයක් තිබේද යන්න, උදාහරණ ලෙස පරිපාලිත විවිධ ස්ථානවල සංරචක. සංකීර්ණ ව්‍යුහයන් බොහෝවිට ප්‍රමාණාත්මක අව ප්‍රකාශවීමේ අවදානමක් හටගැන්විය හැකි ගැටලු හඳුන්වා දෙයි. එවැනි ගැටලු වලට කීර්ති නාමය, බද්ධ ව්‍යාපාර, ආයෝජන හෝ විශේෂ - අරමුණු | විගණකහට අස්තිත්ත්වයෙහි ස්වභාවය පිළිබඳ අවබෝධයක් ලබා ගැනීම පහත දැක්වෙන කරුණු පිළිබඳව අවබෝධ කර ගැනීමට හැකියාව ලබාගනී:<br>• අස්තිත්ත්වයට සංකීර්ණ ව්‍යුහයක් තිබේද යන්න, උදාහරණ ලෙස පරිපාලිත හෝ විවිධ ස්ථානවල ඇති සංරචක. සංකීර්ණ ව්‍යුහයන් බොහෝවිට ප්‍රමාණාත්මක අව ප්‍රකාශ හටගැන්වීමේ අවදානමකට තුඩු දිය හැකි ගැටලු හඳුන්වා දෙයි. එවැනි ගැටලුවලට කීර්ති නාමය, බද්ධ |

| විස්තරය | 2014 | 2017 |
|---|---|---|
| | සහිත අස්තිත්ව නිසි පරිදි ගිණුම්ගත කර තිබේද යන්න ඇතුලත් විය හැකිය.<br>• හිමිකාරිත්වය සහ හිමිකරුවන් සහ වෙනත් පුද්ගලයින් හෝ අස්තිත්ත්ව අතර ~~සම්බන්ධය~~. සම්බන්ධිත පාර්ශව ගණුදෙනු හඳුනාගෙන ~~නිසි පරිදි~~ ගිණුම්ගත කර තිබේද යන්න තීරණය කිරීමට මෙම අවබෝධය උපකාරි වේ. ~~ශ්‍රී.ලං.වි.ප්‍ර. 550 මගින් අවශ්‍යතා ස්ථාපිත කරන අතර, සම්බන්ධිත පාර්ශවයන්ට විගණක ගේ සළකා බැලීම් සඳහා මඟ පෙන්වීම ලබාදෙයි.~~ | ව්‍යාපාර, ආයෝජන හෝ විශේෂ - අරමුණු සහිත අස්තිත්ව නිසි පරිදි ගිණුම්ගත කර තිබේද යන්න සහ මූල්‍ය ප්‍රකාශ වල එවැනි කරුණු ප්‍රමාණවත් ලෙස හෙළිදරව් කර තිබේද යන්න ඇතුලත් විය හැකිය.<br>• *හිමිකාරිත්වය, සහ හිමිකරුවන් සහ වෙනත් පුද්ගලයින් හෝ අස්තිත්ව අතර ඇති සම්බන්ධතාවයන් සම්බන්ධිත පාර්ශව ගණුදෙනු නිසි පරිදි හඳුනාගෙන ගිණුම්ගත කිරීම සහ මූල්‍ය ප්‍රකාශ වල ප්‍රමාණවත් ලෙස හෙළිදරව් කර තිබේද යන්න තීරණය කිරීමට මෙම අවබෝධය උපකාරි වේ. සම්බන්ධිත පාර්ශවවලට අදාළ විගණකගේ සැළකිල්ලට ගැනීම් මත මගපෙන්වීම් ලබාදීම සහ අවශ්‍යතාවලට ශ්‍රීලවිප්‍ර 550 න් අවශ්‍යතාවයන් ස්ථාපිත කරයි.* |
| 2014 - අ 24<br>2017 - අ 32 | ........<br>• පහත දැක්වෙන මූල්‍ය වාර්තාකරණය වැනි:<br>~~කර්මාන්තයට විශේෂිත වූ වැදගත් ප්‍රභේද ඇතුළුව~~ ගිණුම්කරණ මූලධර්ම සහ කර්මාන්ත විශේෂිත පරිචයන්. ~~(උදාහරණ ලෙස බැංකු සඳහා ණය සහ ආයෝජන හෝ ඖෂධ සම්බන්ධව පර්යේෂණ සහ සංවර්ධන.)~~<br>• අයභාරය හඳුනා ගැනීමේ ~~පරිචයන්~~<br>.......... | ........<br>• පහත දැක්වෙන මූල්‍ය වාර්තාකරණ පරිචයන් වැනි:<br>ගිණුම්කරණ මූලධර්ම සහ කර්මාන්ත විශේෂිත පරිචයන් ඇතුළුව කර්මාන්ත සඳහා විශේෂිතවූ වැදගත් පන්තිවල ගණුදෙනු, ගිණුම් ශේෂයන් සහ මූල්‍ය ප්‍රකාශවලට සම්බන්ධිත හෙළිදරව් කිරීම් සඳහා (උදාහරණ ලෙස බැංකු සඳහා ණය සහ ආයෝජන හෝ ඖෂධ සම්බන්ධයෙන් පර්යේෂණ සහ සංවර්ධන.)<br>• අයභාරය හඳුනා ගැනීම<br>.......... |
| 2014 - අ 34<br>2017 - අ 42 | සාමාන්‍යයෙන්, කළමනාකරණය ව්‍යාපාර අවදානම් හඳුනා ගන්නා අතර ඒවාට පිළියම් යෙදීම සඳහා ප්‍රවේශයන් වර්ධනය කරයි. එවැනි අවදානම් තක්සේරු කිරීමේ ක්‍රියාවලිය අභ්‍යන්තර පාලනයේ කොටසක් වන අතර, එය 15 වන ඡෙදයේ සහ ~~අ 79 - අ 80~~ ඡේදවල සාකච්ඡා කෙරේ. | සාමාන්‍යයෙන්, කළමනාකරණය ව්‍යාපාර අවදානම් හඳුනා ගන්නා අතර ඒවාට පිළියම් යෙදීම සඳහා ප්‍රවේශයන් වර්ධනය කරයි. එවැනි අවදානම් තක්සේරු කිරීමේ ක්‍රියාවලිය අභ්‍යන්තර පාලනයේ කොටසක් වන අතර, එය 15 වන ඡෙදයේ සහ අ 88- අ 89 ඡේදවල සාකච්ඡා කෙරේ. |
| 2014 - අ 37<br>2017 - අ 45 | මූල්‍ය කාර්ය සාධනය මැනීම සහ සමාලෝචනය, ඔවුන්ගේ අරමුණු අතිච්ඡාදනය,විය හැකි නමුත්, පාලනයන් අධීක්ෂණය ලෙස සමාන නොවේ. (~~අ 98 – අ 104~~ ඡේදවල අභ්‍යන්තර පාලනයේ සංරචකයන් ලෙස සාකච්ඡා කර ඇත.)<br>....... | මූල්‍ය කාර්ය සාධනය මැනීම සහ සමාලෝචනය, ඔවුන්ගේ අරමුණු අතිච්ඡාදනය,විය හැකි නමුත්, පාලනයන් අධීක්ෂණය ලෙස සමාන නොවේ. (අ 110 - අ 121 ඡේදවල අභ්‍යන්තර පාලනයේ සංරචකයන් ලෙස සාකච්ඡා කර ඇත.)<br>....... |
| 2014 - අ 52<br>2017 - අ 60 | මූල්‍ය ප්‍රකාශ විගණනයකට සම්බන්ධ වන පරිදි අභ්‍යන්තර විගණනයේ සංරචක පහට සම්බන්ධිත දෑ යෙදුම් පහත ~~අ 69-~~ | මූල්‍ය ප්‍රකාශ විගණනයකට සම්බන්ධ වන පරිදි අභ්‍යන්තර විගණනයේ සංරචක පහට සම්බන්ධිත දෑ යෙදුම් පහත අ 77- අ 121 |

| විස්තරය | 2014 | 2017 |
|---|---|---|
| | ~~අ 104~~ ඡේදවල දක්වා ඇත. අභ්‍යන්තර පාලනයේ මෙම සංරචක පිළිබඳ වැඩිදුර පැහැදිලි කිරීම 1 වන පරිශිෂ්ඨය මගින් ලබාදෙයි. | ඡේදවල දක්වා ඇත. අභ්‍යන්තර පාලනයේ මෙම සංරචක පිළිබඳ වැඩිදුර පැහැදිලි කිරීම 1 වන පරිශිෂ්ඨය මගින් ලබාදෙයි. |
| 2014 - අ 68<br>2017 - අ 76 | පාලනයන්හි දිගටම පවත්නා මෙහෙයුම් සඳහා යම් ස්වයංක්‍රීය කරණයක් ලබා දෙන්නේනම් මිස ඒවායෙහි මෙහෙයුම් සඵලදායකත්වය පරික්ෂා කිරීමට, අස්තිත්වයේ පාලන ප්‍රමාණවත් නොවනබව පිළිබඳ අවබෝධයක් ලබාගැනීම. උදාහරණ ලෙස, කාලය තුළ එක්තරා අවස්ථාවක අත්හුරු පාලනයක් ක්‍රියාත්මක කිරීම පිළිබඳ විගණන සාක්ෂි ලබා ගැනීම විගණනය යටතේ පවතින කාලපරිච්ඡේදය තුළ වෙනත් අවස්ථාවක පාලනයෙහි මෙහෙයුම් සඵලදායකත්වය පිළිබඳ විගණන සාක්ෂි ලබාදෙන්නේ නැත. කෙසේ වෙතත්, තොරතුරු තාක්ෂණ සැකසීමේ ආවේනික සංගතතාව නිසා (~~අ 55~~ ඡේදය බලන්න) ස්වයංක්‍රීය පාලන ක්‍රියාවේ යොදවා තිබේදැයි නිර්ණය කිරීමට විගණන ක්‍රියාපටිපාටි ඉටු කිරීම විගණකගේ තක්සේරුව සහ ක්‍රම ලේඛය වෙනස් කිරීම් මත ලෙස වැනි එම පාලන පරීක්ෂා කිරීම් මත රඳාපවතිමින්වල එම පාලනයේ මෙහෙයුම් සඵලදායකත්වයේ පරික්ෂාවක් ලෙස කාර්යයක් කළ හැකිය. පාලනවල මෙහෙයුම් සඵලදායීතාවය පිළිබඳ පරික්ෂාවන් ශ්‍රී.ලං.වි.ප්‍ර. 330 හි තවදුරටත් විස්තර කෙරේ. | පාලනයන්හි දිගටම පවතින මෙහෙයුම් සඳහා යම් ස්වයංක්‍රීය කාර්යය ලබාදෙන්නේ නම් මිස ඒවායේ මෙහෙයුම් සඵලදායකත්වය පරික්ෂා කිරීමට අස්තිත්වයේ පාලන ප්‍රමාණවත් නොවන බව පිළිබඳ අවබෝධයක් ලබාගැනීම. උදාහරණ ලෙස, කාලය තුළ එක්තරා අවස්ථාවක අත්හුරු පාලනයක් ක්‍රියාත්මක කිරීම පිළිබඳ විගණන සාක්ෂි ලබා ගැනීම විගණනය යටතේ පවතින කාලපරිච්ඡේදය තුළ වෙනත් අවස්ථාවක පාලනයෙහි මෙහෙයුම් සඵලදායකත්වය පිළිබඳ විගණන සාක්ෂි ලබාදෙන්නේ නැත. කෙසේ වෙතත්, තොරතුරු තාක්ෂණ සැකසීමේ ආවේනික සංගතතාව නිසා (අ 63 ඡේදය බලන්න) ස්වයංක්‍රීය පාලනයක් ක්‍රියාත්මක කර තිබේදැයි නිර්ණය කිරීමට විගණන ක්‍රියාපටිපාටි ඉටු කිරීම, විගණකගේ තක්සේරු සහ ක්‍රම ලේඛය වෙනස් කිරීම් මත ලෙස වැනි එම පාලන පරික්ෂා මත රඳාපවත්මින් එය පාලනයේ මෙහෙයුම් සඵලදායකත්වයේ පරික්ෂාවක් ලෙස කාර්යයන් කළ හැකිය. පාලනවල මෙහෙයුම් සඵලදායීතාවය පිළිබඳ පරික්ෂාවන් ශ්‍රී.ලං.වි.ප්‍ර. 330 හි තවදුරටත් විස්තර කෙරේ. |
| 2014 - අනුරූප ඡේද නොමැත.<br>2017 - අ 80 | [අනුරූප නොමැත.] | විගණනයට අදාළ අභ්‍යන්තර පාලනයේ හඳුනාගත් ඌණතාවයන් සම්බන්ධයෙන් අභ්‍යන්තර විගණන කාර්යයේ සොයා ගැනීම් සහ නිර්දේශයන්ට කළමනාකරණය ප්‍රතිචාර දක්වා ඇති ආකාරය ද, එවැනි ප්‍රතිචාර ක්‍රියාත්මක කර ඇත්තේ කෙසේද යන්න සහ අභ්‍යන්තර විගණන කාර්යය මගින් ඒවා පසුව ඇගයීමට ලක්කර තිබේද යන්න ද ඇතුළුව විගණක විසින් එලෙසම සලකා බැලිය හැකිය. |
| 2014 - අ 72<br>2017 - අ 81 | ...........<br>▪ අදාළ මූල්‍ය වාර්තාකරණ ආකෘතිමය රාමුවට අනුකූලව මූල්‍ය ප්‍රකාශ සකස් කර තිබේද යන්න පිළිබඳව ඔවුන් අගය කරන ප්‍රමාණය | ...........<br>▪ අදාල මූල්‍ය වාර්තාකරණ ආකෘතිමය රාමුවට අනුකූලව මූල්‍ය ප්‍රකාශ සකස් කර තිබේද මූල්‍ය ප්‍රකාශවල ප්‍රමාණවත් හෙළිදරව් කිරීම් ඇතුලත් ද යන්න ඇතුළුව ඔවුන් අගය කරන ප්‍රමාණය |
| 2014 - අ 76<br>2017 - අ 85 | කුඩා අස්තිත්ව තුළ ඇති පාලන පරිසරය විශාල අස්තිත්ව වලින් වෙනස්වීමට ඉඩ ඇත. උදාහරණ ලෙස කුඩා අස්තිත්ව තුළ පාලනවලට වගකිව යුතු අයට ස්වාධීන හෝ බාහිර සාමාජිකයෙකු ඇතුලත් නොවිය හැකි අතර, වෙනත් හිමිකරුවන් නොමැති විටදී පාලනයේ | කුඩා අස්තිත්ව තුළ ඇති පාලන පරිසරය විශාල අස්තිත්ව වලින් වෙනස්වීමට ඉඩ ඇත. උදාහරණ ලෙස කුඩා අස්තිත්ව තුළ පාලනවලට වගකිව යුතු අයට ස්වාධීන හෝ බාහිර සාමාජිකයෙකු ඇතුලත් නොවිය හැකි අතර, වෙනත් හිමිකරුවන් නොමැති විටදී පාලනයේ කාර්යභාරය |

| විස්තරය | 2014 | 2017 |
|---|---|---|
| | කාර්යභාරය හිමිකරු - කළමනාකරු විසින් සෘජුව භාරගත හැකිය. පාලන පරිසරයේ ස්වභාවය වෙනත් පාලනයන්හි වැදගත්කමට හෝ ඒවා නොමැතිවීමට ද බලපෑම් කළ හැකිය. උදාහරණ ලෙස, හිමිකරු - කළමනාකරුගේ ක්‍රියාකාරී මැදිහත් වීමෙන් කුඩා ~~ව්‍යාපාරයක~~ රාජකාරි වෙන් නොකිරීම හේතුවෙන් ඇතිවිය හැකි අවදානම් අවම කරගත හැකිය; සමහරවිට, කෙසේ වෙතත්, වෙනත් අවදානම් උදාහරණ ලෙස, පාලනයන් ඉක්මවා යෑමේ අවදානම වැඩි විය හැකිය. | හිමිකරු - කළමනාකරු විසින් සෘජුව භාරගත හැකිය. පාලන පරිසරයේ ස්වභාවය වෙනත් පාලනයන්හි වැදගත්කමට හෝ ඒවා නොමැතිවීමට ද බලපෑම් කළ හැකිය. උදාහරණ ලෙස, හිමිකරු - කළමනාකරුගේ ක්‍රියාකාරී මැදිහත් වීමෙන් කුඩා අස්තිත්වයක රාජකාරි වෙන් නොකිරීම හේතුවෙන් ඇතිවිය හැකි අවදානම් අවම කරගත හැකිය; සමහරවිට, කෙසේ වෙතත්, වෙනත් අවදානම් උදාහරණ ලෙස, පාලනයන් ඉක්මවා යෑමේ අවදානම වැඩි විය හැකිය. |
| 2014-අනුරූප ඡේද නොමැත. 2017 - අ91 | [අනුරූප නොමැත.] | මූල්‍ය ප්‍රකාශවල පොදු සහ උපයෝගී ලෙජර වලට පිටතින් ලබාගත් තොරතුරු අඩංගු විය හැකිය. එවැනි තොරතුරු වලට ඇතුලත් උදාහරණ විය හැක්කේ :<br>• අළුත් කිරීමේ විකල්පයන් හෝ අනාගත කල්බදු ගෙවීම් වැනි මූල්‍ය ප්‍රකාශවල හෙළිදරව් කර ඇති කල්බදු ගිවිසුම් වලින් ලබාගත් තොරතුරු<br>• අස්තිත්වයක අවදානම් කළමනාකරණ පද්ධතියක් විසින් ඉදිරිපත් කරනු ලබන මූල්‍ය ප්‍රකාශ වල හෙළිදරව් කරනු ලබන තොරතුරු.<br>• කළමනාකරණයේ ප්‍රවීණයන් විසින් ඉදිරිපත් කරනු ලබන සහ මූල්‍ය ප්‍රකාශ වල හෙළිදරව් කරනු ලබන සාධාරණ අගයන්හි තොරතුරු.<br>• ආදර්ශ වලින් ලබාගත් හෝ හඳුනාගත් ඇස්තමේන්තු සංවර්ධනය කිරීමට භාවිතා කල වෙනත් ගණනය කිරීම්, වලින් ලබාගත් මූල්‍ය ප්‍රකාශ තුල හෙළිදරව් කළ, එම ආදර්ශ වලට භාවිතා කළ උපකල්පන සහ පාදක කරගත් සම්බන්ධිත තොරතුරු ඇතුළුව මූල්‍ය ප්‍රකාශ වල හෙළිදරව් කරනු ලබන පහත තොරතුරු වැනි :<br>o වත්කමේ ප්‍රයෝජ්‍ය ජීව කාලයට බලපා හැකි අභ්‍යන්තරව සංවර්ධනය කර ඇති උපකල්පන; හෝ<br>o අස්තිත්ත්වයේ පාලනයෙන් බාහිර සාධක මඟින් බලපෑම් කරනු ලබන පොළී අනුපාතික වැනි දත්ත.<br>• විකල්ප උපකල්පන ලෙස කළමනාකරණය විසින් සළකා බැලූ බව පෙන්නුම් කරන මූල්‍ය ආකෘති වලින් හටගත් සංවේදීතා විශ්ලේෂණයන් |

| විස්තරය | 2014 | 2017 |
|---|---|---|
| | | පිළිබඳ මූල්‍ය ප්‍රකාශවල හෙළිදරව් කරන තොරතුරු<br>• අස්තිත්වයක බඳු වාර්තා සහ ලේඛණ වලින් ලබාගත් මූල්‍ය ප්‍රකාශ වල හඳුනාගන්නා හෝ හෙළිදරව් කරන ලද තොරතුරු.<br>• අස්තිත්ව අඛන්ඩ පැවැත්මත දිගටම පවත්වාගෙන යාමේ හැකියාව පිළිබඳ සැළකිය යුතු අන්දමේ සැකයක් මතුවිය හැකි හඳුනාගත් යම් සම්බන්ධිත සිදුවීම් හෝ තත්ත්වයන්ට අදාළ වූ හෙළිදරව් කිරීම් වැනි අස්තිත්ත්වයේ අඛන්ඩ පැවැත්ම දිගටම පවත්වාගෙනයාමේ හැකියාව පිළිබඳ කලමනාකරණයේ තක්සේරුවට සහාය වීම සඳහා පිළියෙල කරන ලද විශ්ලේෂණයන්ගෙන් ලබාගත් මූල්‍ය ප්‍රකාශවල හෙළිදරව් කර ඇති තොරතුරු *<br>* ශ්‍රී.ලං.වි.ප්‍ර. 570 (සංශෝධිත) හි 19- 20 ඡේද බලන්න, *අඛන්ඩ පැවැත්ම.* |
| 2014-අනුරූප ඡේද නොමැත.<br>2017 - අ 92 | [අනුරූප නොමැත.] | මෙම ශ්‍රී.ලං.වි.ප්‍ර. හි 18 වන ඡේදය මගින් කරන අවශ්‍ය මූල්‍ය වාර්තාකරණයට අදාළ තොරතුරු පද්ධතිය පිළිබඳ අවබෝධය (පොදු සහ උපයෝගි ලෙජර තුලින් හෝ පිටතින් ලබා ගන්නා මූල්‍ය ප්‍රකාශ තුල හෙළිදරව් කර ඇති තොරතුරු වලට සම්බන්ධිතව එම පද්ධතියේ අදාළ අංග පිළිබඳ අවබෝධය ඇතුළුව) විගණකගේ වෘත්තීය විනිශ්චයට අයත් කරුණකි. උදහරණයක් ලෙස, අස්තිත්වයේ මූල්‍ය ප්‍රකාශවල කිසියම් වටිනාකමක් හෝ හෙළිදරව් කිරීම් (ණය අවදානම, ද්‍රවශීලතා අවදානම සහ වෙළඳපොල අවදානම පිළිබඳ හෙළිදරව් කිරීම් වැනි) පදනම් විය හැක්කේ අස්තිත්වයේ අවදානම් කළමනාකරණ පද්ධතියෙන් ලබාගත් තොරතුරු මතය. කෙසේ වෙතත්, අවදානම් කළමණාකරණ පද්ධතියේ සියළු අංග තේරුම් ගැනීමට විගණකට අවශ්‍ය නොවන අතර, අවශ්‍ය කරණ අවබෝධය නිර්ණය කිරීමේදී වෘත්තීය විනිශ්චය භාවිතා කරයි. |
| ශීර්ෂය | ජර්නල් සටහන් | ජර්නල් සටහන් (යොමුව : 18 (ඊ) ඡේදය) |
| ශීර්ෂය | සම්බන්ධිත ව්‍යාපාර ක්‍රියාවලි | සම්බන්ධිත ව්‍යාපාර ක්‍රියාවලි (යොමුව : 18 වන ඡේදය) |
| ශීර්ෂය | කුඩා අස්තිත්ව සඳහා විශේෂිත වූ සළකා බැලීම්. | කුඩා අස්තිත්ව සඳහා විශේෂිත වූ සළකා බැලීම්. (යොමුව : 18 වන ඡේදය) |
| 2014 - අ 85<br>2017 - අ 96 | ~~කුඩා අස්තිත්ව වල මූල්‍ය වාර්තාකරණයට අදාල තොරතුරු පද්ධති සහ සම්බන්ධිත ව්‍යාපාර ක්‍රියාවලින් විශාල අස්තිත්ව වලට වඩා අසංකලිජ්ය බවින් අඩු විය හැකි නමුත් ඒවායේ භූමිකා භාරය ඒ හා සමාන~~ | පොදු සහ උපයෝගී ලෙජර තුලින් හෝ පිටතින් ලබා ගන්නා මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කළ තොරතුරු වලට සම්බන්ධව එම පද්ධතියේ අදාළ අංග ඇතුළුව, කුඩා අස්තිත්ව වල මූල්‍ය වාර්තාකරණයට අදාළ |

| විස්තරය | 2014 | 2017 |
|---|---|---|
| | ~~වැදගත්ය.~~ සක්‍රීය කළමනාකරන මැදිහත්වීමක් ඇති කුඩා අස්තිත්ව වලට ගිණුම් කරන ක්‍රියා පටිපාටි, අසංකලිෂ්ඨ ගිණුම් වාර්තා හෝ ලිඛිත ප්‍රතිපත්ති පිළිබඳ පුළුල් විස්තර අවශ්‍ය නොවනු ඇත. එබැවින් කුඩා අස්තිත්ත්වවල විගණනයකදී ~~අස්තිත්වයේ පද්ධති සහ ක්‍රියාවලින්~~ අවබෝධ කර ගැනීම පහසු විය හැකි අතර, ලේඛන ගත කිරීම් සමාලෝචනය කිරීමට වඩා එය විමසීම මත රඳා පවති. කෙසේ වෙතත්, අවබෝධයක් ලබා ගැනීමේ අවශ්‍යතාවය වැදගත් කම එසේම පවති. | තොරතුරු පද්ධති සහ සම්බන්ධිත ව්‍යාපාරික ක්‍රියාවලින් විශාල අස්තිත්ව වලට වඩා අසංකලිෂ්ඨ බවෙන් අඩු විය හැකි නමුත් එහි කාර්යභාරය ඒ හා සමානව වැදගත්ය. සක්‍රීය කළමනාකරණ මැදිහත්වීමක් ඇති කුඩා අස්තිත්ව වලට ගිණුම්කරණ ක්‍රියා පටිපාටි, අසංකලිෂ්ඨ ගිණුම් වාර්තා හෝ ලිඛිත ප්‍රතිපත්ති පිළිබඳ පුළුල් විස්තර අවශ්‍ය නොවනු ඇත. එබැවින් මූල්‍ය වාර්තාකරණයට අදාල අස්තිත්වයේ තොරතුරු පද්ධති අවබෝධ කර ගැනීම කුඩා අස්තිත්ව වල විගණනයකදී පහසු විය හැකි අතර, ලේඛනගත කිරීම සමාලෝචනය කිරිමට වඩා එය විමසීම මත රදා පවති. කෙසේ වෙතත්, අවබෝධයක් ලබා ගැනීමේ අවශ්‍යතාවයේ වැදගත්කම එසේම පවති. |
| ශීර්ෂය | *අභ්‍යන්තර පාලනයේ සංරචක - පාලන ක්‍රියාකාරකම්* (යොමුව : 20 වන ඡේදය) | *අභ්‍යන්තර පාලනයේ සංරචක -විගණනයට අදාළ පාලන ක්‍රියාකාරකම්* (යොමුව : 20 වන ඡේදය) |
| 2014 - අනුරූප ඡේද නොමැත. 2017 - අ 103 | [අනුරූප නොමැත.] | විගණනයට අදාළ පාලන ක්‍රියාකාරකම් වලට ඇතුලත් විය හැක්කේ, අදාළ මූල්‍ය වාර්තාකරණ ආකෘතිමය රාමුව සමඟ අනුකූලව පිළියෙල නොකල හෙළිදරව් කිරීම්වලට සම්බන්ධිත ප්‍රමාණවත් අවප්‍රකාශයක අවදානම ආමන්ත්‍රණය කරන කළමනාකරණය විසින් ස්ථාපිත කර ඇති පාලනයන් සහ ඊට අමතරව ගිණුම්ශේෂ සහ ගණුදෙනු වලට සම්බන්ධිත අවදානම් අමතන පාලනවේ. එවැනි පාලන ක්‍රියාකාරකම් පොදු සහ උපයෝගී ලෙජර වලට පිටතින් ලබා ගන්නා මූල්‍ය ප්‍රකාශවල අඩංගු තොරතුරු හා සම්බන්ධ විය හැකිය. |
| 2014 - අ 96<br>2017 අ 108 | ........<br>ඉහත ~~අ 56 ඡේදයේ~~ සඳහන් අවදානම් සමඟ කටයුතු කිරීම සඳහා ඒවා සාමාන්‍යයෙන් ක්‍රියාත්මක වේ. | ........<br>ඉහත අ 64 ඡේදයේ සඳහන් අවදානම් සමඟ කටයුතු කිරීම සඳහා ඒවා සාමාන්‍යයෙන් ක්‍රියාත්මක වේ. |
| ශීර්ෂය | ~~අභ්‍යන්තර විගණන කාර්යය. (යොමුව : අ 23 ඡේදය)~~ | අස්තිත්ත්වයෙහි අභ්‍යන්තර විගණන කාර්යය (යොමුව : අ 23 ඡේදය) |
| අ 101 | ~~අස්තිත්වයක අභ්‍යන්තර විගණන කාර්ය විගණනයකට අදාල විය හැක්කේ අභ්‍යන්තර විගණන කාර්යයේ ස්වභාවය වගකීම් සහ ක්‍රියාකාරකම් අස්තිත්වයේ මූල්‍ය වාර්තාකරණයට සම්බන්ධිත සහ ඉටු කල යුතු විගණන ක්‍රියා පටිපාටි වල ස්වභාවයන් කාලනිර්නයේ ප්‍රමාණය අඩු කිරීමට වෙනස් කිරීමට අභ්‍යන්තර විගණන වරුන්ගේ වැඩ භාවිතා කිරීම. විගණක අපේක්ෂා කරන්නේනම් අභ්‍යන්තර විගණන කාර්යය විගණනයට අදාල විය හැකි බවට විගණක විසින් තීරණය කරන්නේ නම්, ශ්‍රී.ලං.වි.ප්‍ර. 610 අදාලවේ.~~ | (අන්තර්ගතය ඉවත් කරන ලදී.) |
| 2014 - අනුරූප | [අනුරූප නොමැත.] | අස්තිත්වයට අභ්‍යන්තර විගණන කාර්යයන් |

| විස්තරය | 2014 | 2017 |
|---|---|---|
| ඡේදයක් නොමැත. 2017 - අ113 | | තිබේනම්, එම කාර්ය පිළිබඳ අවබෝධයක් ලබා ගැනීම අස්තිත්වය සහ එහි පරිසරය පිළිබඳව, අභ්‍යන්තර පාලනය, මූල්‍ය වාර්තාකරණය හරහා අභ්‍යන්තර පාලනය අධීක්ෂනය කිරීමේදි අස්තිත්වය විසින් ඉටු කරනු ලබන කාර්ය භාරය ඇතුළුව අවබෝධයක් ලබා ගැනීමට විගණක හට දායක වේ. මෙම අවබෝධය, මෙම ශ්‍රී.ලං.වි.ප්‍ර. හි 6 (අ) ඡේදයේ විගණකගේ විමසීම් වලින් ලබාගත් තොරතුරු සමඟ ප්‍රමාණාත්මක අවප්‍රකාශ වීම් විගණකගේ හඳුනා ගැනීම සහ තක්සේරු කිරීම සඳහා සෘජුවම අදාළ තොරතුරු ද ලබාදිය හැකිය. |
| 2014 -අ 102 2017 - අ 114 | ~~අභ්‍යන්තර විගණන කාර්යයක අරමුණු සහ එමනිසා එහි වගකීම් වල ස්වභාවය සහ සංවිධානය තුල එහි තත්වය, පුළුල් ලෙස වෙනස් වන අතර, එම අස්තිත්ත්වයේ විශාලත්වය හා ව්‍යුහය සහ කළමනාකාරිත්වයේ අවශ්‍යතා සහ අදාල වන විට පාලනය පිළිබඳ වගකිව යුතු අය මත රඳා පවතී. අභ්‍යන්තර විගණන කාර්යයක වගකීම් අතර, උදාහරණ ලෙස, අභ්‍යන්තර පාලනය අධික්ෂණය කිරීම, අවදානම් කළමනාකරණය සහ නීති හා රෙගුලාසි වලට අනුකූල වීම සමාලෝචනය කිරීම ඇතුළත් විය හැකිය. අනෙක් අතට, අභ්‍යන්තර විගණන කාර්යයේ වගකීම්, ආර්ථිකය, මෙහෙයුම් වල කාර්යක්ෂමතාවය සහ සඵලදායීතාවය සමාලෝචනය කිරීමට සීමාවිය හැකිය. උදාහරණයක් ලෙස, ඒ අනුව අස්තිත්ත්වයේ මූල්‍ය වාර්තාකරණයට සම්බන්ධ නොවිය හැකිය.~~ | අභ්‍යන්තර විගණන කාර්යයක අරමුණු සහ විෂය පථය, එහි වගකීම්වල ස්වභාවය සහ සංවිධානය තුල එහි තත්ත්වය, කාර්යයේ අධිකාරිය සහ වගවීම ඇතුළුව, පුළුල් ලෙස වෙනස් වන අතර, අස්තිත්වයේ විශාලත්වය සහ ව්‍යුහය හා කළමනාකරණයේ අවශ්‍යතා සහ, අදාළ වන විට, පාලනය පිළිබඳ වගකිව යුතු අය මත රදා පවතී. මෙම කරුණු අභ්‍යන්තර විගණන ප්‍රඥප්තියක හෝ යොමුගත කරුණු වලින් නියමකර ඇත. |
| 2014 -අ 103 2017 - අ 115 | ~~අභ්‍යන්තර විගණන කාරියන් වගකීම් ස්වභාවය මූල්‍ය වාර්තාකරණයට සම්බන්ධ නම්, බාහිර විගණක විසින් සිදු කරන ලද හෝ සිදු කරනු ලබන ක්‍රියාකාරකම් පිළිබඳව සළකා බැලීම හෝ අභ්‍යන්තර විගණන කාර්යයේ කාලසීමාව සඳහා අභ්‍යන්තර විගණන කාර්යයේ විගණන සැලැස්ම සමාලෝචනය කිරීම, යම්කිසි, සහ එම සැලැස්ම අභ්‍යන්තර විගණකවරුන් සමඟ සාකච්ඡා කිරීම ඇතුලත් විය හැකිය.~~ | අභ්‍යන්තර විගණන කාර්යයක වගකීම් අතරට අවදානම් කළමනාකරණය, අභ්‍යන්තර පාලනය සහ පාලන ක්‍රියාවලීන් හි සැලසුම හා අවදානම් කළමනාකරිත්ත්වය සඵලදායිතාවය සැලසුම් කිරීම සම්බන්ධයෙන් කළමනාකරණයට සහ පාලනය පිළිබඳ වගකිව යුතු අය සහතිකවීමක් තහවුරුවක් ලබාදීම සඳහා ක්‍රියා පටිපාටි ඉටු කිරීමේ සහ ප්‍රතිඵල ඇගයීම ඇතුලත් විය හැකිය. එසේ නම්, අස්තිත්වයේ මූල්‍ය වාර්තාකරණය හරහා අභ්‍යන්තර පාලනය අධීක්ෂණය කිරිමේදී අභ්‍යන්තර විගණන කාර්යය වැදගත් කාර්ය භාරයක් ඉටු කරයි. කෙසේ වෙතත්, අභ්‍යන්තර විගණන කාර්යයේ වගකීම් ආර්ථිකය, මෙහෙයුම් වල කාර්යක්ෂමතාවය සහ ඵලදායිතාවය අගය කිරීම කෙරෙහි අවධානය යොමු කල හැකි අතර, එසේ නම් කාර්යය අස්තිත්ත්වයේ මූල්‍ය වාර්තා කරණයට සෘජුව සම්බන්ධ නොවිය හැකිය. |
| 2014 - අනුරූප ඡේදයක් නොමැත. 2017 - අ 116 | [අනුරූප නොමැත.] | මෙම ශ්‍රී.ලං.වි.ප්‍ර. හි 6 (අ) ඡේදය සමඟ අනුකූලව අභ්‍යන්තර විගණන කාර්යය තුළ සිටින යෝග්‍ය පුද්ගලයින් ගෙන් කෙරෙන විගණකගේ විමසීම්, අභ්‍යන්තර විගණන කාර්යයේ වගකීම්වල ස්වභාවය පිළිබඳ |

| විස්තරය | 2014 | 2017 |
|---|---|---|
| | | අවබෝධයක් ලබා ගැනීමට විගණකට උපකාර කරයි. කාර්යයේ වගකීම් අස්තිත්වයේ මූල්‍ය වාර්තාකරණයට සම්බන්ධ බවට විගණක විසින් තීර්ණය කරන්නේ නම්, අභ්‍යන්තර විගණන කාර්යය විසින් ඉටු කරන ලද හෝ ඉටු කරනු ලබන ක්‍රියාකාරකම් පිළිබඳව කාලපරිච්ඡෙදය සඳහා වන අභ්‍යන්තර විගණන කාර්යයේ විගණන සැලැස්ම සමාලෝචනය කිරීමෙන් සහ එම සැලැස්ම කාර්යය තුල සිටින යෝග්‍ය පුද්ගලයින් සමඟ සාකච්ඡා කිරීමෙන් විගණක හට වැඩි දුර අවබෝධයක් ලබාගත හැකිය. |
| 2014 - අනුරූප ඡේදයක් නොමැත. 2017 - අ 117 | [අනුරූප නොමැත.] | අභ්‍යන්තර විගණන කාර්යයේ වගකීම් සහ සහතික වීමේ ක්‍රියාකාරකම් අස්තිත්ත්වයේ මූල්‍ය වාර්තාකරණයට සම්බන්ධ නම්, විගණන සාක්ෂි ලබා ගැනීමේදී විගණන විසින් සෘජුවම ඉටු කළ යුතු විගණන ක්‍රියා පටිපාටිවල ස්වභාවය හෝ කාලය වෙනස් කිරීම හෝ ප්‍රමාණය අඩු කිරීම සඳහා අභ්‍යන්තර විගණන කාර්යයේ වැඩ ප්‍රයෝජනයට ගැනීම විගණනකට එලෙසම හැකිය. අස්තිත්වයක අභ්‍යන්තර විගණන කාර්යයක් ඇති විට එය ප්‍රයෝජනයට ගැනීමට විගණකවරුන්ට වඩාත් විය හැක්කේ, උදාහරණයක් ලෙස පෙර විගණන වල අත්දැකීම් හෝ විගණකගේ අවදානම් තක්සේරු කිරීමේ ක්‍රියා පටිපාටි මත පදනම්ව, අස්තිත්වයේ ඇති අභ්‍යන්තර විගණන කාර්යයේ, අස්තිත්වයේ විශාලත්වයට හා එහි මෙහෙයුම්වල ස්වභාවයට සාපේක්ෂව ප්‍රමාණවත් ලෙස නිසි ලෙස සම්පත් ලබා දී ඇති සහ පාලනය පිළිබඳ වගකිව යුතු අය සමඟ සෘජු සම්බන්ධතාවයක් පෙනෙන විටය. |
| 2014 - අනුරූප ඡේදයක් නොමැත. 2017 - අ 118 | [අනුරූප නොමැත.] | අභ්‍යන්තර විගණන කාර්යය පිළිබඳ විගණකගේ මූලික අවබෝධය මත පදනම්ව, ඉටු කලයුතු විගණන පටිපාටිවල ස්වභාවය හෝ කාලනීර්නය හෝ ප්‍රමාණය අඩු කිරීම වෙන්ව (විකරණය) කිරීමට, අභ්‍යන්තර විගණන කාර්යයේ වැඩ ප්‍රායෝජනයට ගැනීමට විගණක අපේක්ෂා කරනවිට ශ්‍රී.ලං.වි.ප්‍ර. 610 (සංශෝධිත 2013) ව්‍යවහාර වේ. |
| 2014 - අනුරූප ඡේද නොමැත. 2017 - අ 119 | [අනුරූප නොමැත.] | ශ්‍රී.ලං.වි.ප්‍ර. 610 (2013 සංශෝධිත) හි තවදුරටත් සාකච්ඡා කර ඇති පරිදි. අභ්‍යන්තර විගණන කාර්යක ක්‍රියාකාරකම් මූල්‍ය වාර්තාකරණයට අදාළ විය හැකි වෙනත්, අධීක්ෂණ පාලනයන්ගෙන් වෙනස්වන්නේ, අස්තිත්වය විසින් අවප්‍රකාශවීම් වළක්වන හෝ අනාවරණයකර ගන්නේ කෙසේද යන්න සඳහා දායක වීමට නිර්මාණය කර ඇති කළමනාකරණ ගිණුම් තොරතුරු සමාලෝචනය කිරීම් වැනි දේවලිනි. |
| 2014-අනුරූප ඡේද නොමැත. 2017 - අ 120 | [අනුරූප නොමැත.] | කාර්යභාරයෙහි මුල් අවධියේදී අස්තිත්වයක අභ්‍යන්තර විගණන කර්යය තුළ යෝග්‍ය පුද්ගලයින් සමඟ සන්නිවේදනයන් ස්ථාපිත |

| විස්තරය | 2014 | 2017 |
|---|---|---|
| | | කිරීම, සහ එම සන්නිවේදනය කාර්යභාරය පුරාවට පවත්වාගෙන යාම ඵලදායි ලෙස තොරතුරු හුවමාරු කර ගැනීමට පහසුකම් සලසයි. අභ්‍යන්තර විගණන කාර්යය අවධානයට ලක්විය හැකි වැදගත් කරුණු විගණකගේ වැඩවලට බලපෑ හැකිවන විට, විගණකට දැනුම් දිය හැකි පරිසරයක් එමගින් නිර්මානය වේ. විගණන සාක්ෂි ලෙස භාවිතා කළයුතු ලේඛන වල විශ්වාසනීයත්වය සාකච්ඡාවට යොමුවන හා විමසීම් වලට ප්‍රතිචාර දැක්වීම පිළිබඳ තොරතුරු පිළිබඳව සෝදිසියෙන් සිටීම ඇතුළුව විගණන විසින් වෘත්තීය සංශය දෘෂ්ඨියෙන් යුතුව විගණනය සැලසුම් කිරීම සහ ඉටු කිරීමේ වැදගත්කම ශ්‍රී.ලං.වි.ප්‍ර. 200 මගින් සාකච්ඡා කෙරේ. ඒ අනුව අභ්‍යන්තර විගණන කාර්යය සමඟ සන්නිවේදනය වීම මගින් අභ්‍යන්තර විගණකවරුන්ට එවැනි තොරතුරු විගණකගේ අවධානය සඳහා යොමු කිරීමට කාර්යභාර පුරාවට අවස්ථාව ලබා ලබාදිය හැකිය. එවිට විගණක විසින් ප්‍රමාණාත්මක අවප්‍රකාශ වීමේ අවදානම් හඳුනාගැනීමේදී හා තක්සේරු කිරීමේදී විගණක හට එවැනි තොරතුරු සැළකිල්ලට ගත හැකිය. |
| 2014 - අ 106<br>2017 - අ 123 | මූල්‍ය ප්‍රකාශ මට්ටමේ අවදානම් (මෙම අවදානම් ආර්ථික තත්ත්වයන් පිරිහීම වැනි වෙනත් සාධක සමඟ සම්බන්ධ විය හැකි වුවද), විශේෂයෙන් ඌණ පාලන පරිසරයකින් පැනනැගිය හැකිය. උදාහරණ ලෙස, ~~කළමනාකරණයේ නිපුනතා නොමැතිකම වැනි~~ ඌනතාවයන් මූල්‍ය ප්‍රකාශ කෙරෙහි වඩා පෘථුල බලපෑමක් ඇතිකළ හැකි අතර, විගණකගේ සමස්ත ප්‍රතිචාරය අවශ්‍ය විය හැකිය. | මූල්‍ය ප්‍රකාශ මට්ටමේ අවදානම් (මෙම අවදානම් ආර්ථික තත්ත්වයන් පිරිහීම වැනි වෙනත් සාධක සමඟ සම්බන්ධ විය හැකි වුවද), විශේෂයෙන් ඌණ පාලන පරිසරයකින් පැනනැගිය හැකිය. උදාහරණ ලෙස, කළමනාකරණයේ නිපුනතා නොමැතිකම හෝ මූල්‍ය ප්‍රකාශ පිළියෙල කිරීම පිළිබඳ මනා අධීක්ෂනයක් නොමැතිකම. වැනි ඌනතාවයන් මූල්‍ය ප්‍රකාශ කෙරෙහි වඩා පෘථුල බලපෑමක් ඇතිකළ හැකි අතර, විගණකගේ සමස්ත ප්‍රතිචාරය අවශ්‍ය විය හැකිය. |
| 2014 - අ 110<br>2017 - අ 127 | මූල්‍ය ප්‍රකාශ, අදාළ මූල්‍ය වාර්තාකරණ ආකෘතිමය රාමුව සමඟ අනුකූලව නියෝජනය කිරීමේදී, ~~හඳුනා ගැනීම, මැනීම, ඉදිරිපත් කිරීම සහ මූල්‍ය ප්‍රකාශවල සහ සම්බන්ධ හෙළිදරව් කිරීම විවිධ මූලිකාංග හෙළිදරව් කිරීම්~~ සම්බන්ධයෙන් කළමනාකරණය විසින් ව්‍යංගව හෝ ඉතා පැහැදිලිව සැදැහුම් කරයි. | මූල්‍ය ප්‍රකාශ, අදාළ මූල්‍ය වාර්තා කරණ ආකෘතිමය රාමුව සමඟ අනුකූල වීම නියෝජනය කිරීමේදි හඳුනාගැනීම, මැනීම සහ ගනුදෙණුවල පන්තීන් ඉදිරිපත් කිරීම සහ සිද්ධීන් ගිණුම් ශේෂ සහ හෙළිදරව් කිරීම් සම්බන්ධයෙන් කළමනාකරණය ව්‍යංගව හෝ ඉතා පැහැදිලිව සැදැහුම් කරයි. |
| 2014 - අනුරූප ඡේදයක් නොමැත.<br>2017 - අ 128 | [අනුරූප නොමැත.] | අ 129 (අ) - (ආ) ඡේදයේ විස්තර කර ඇති පරිදි, විගණක විසින් පහත දැක්වෙන සැදැහුම් භාවිතා කිරීමට හෝ පහත විස්තර කර ඇති සියළුම අංග ආවරණය කර ඇත්නම් ඒවා වෙනස් ආකාරයකින් ප්‍රකාශ කිරීමට හැකිය. උදාහරණ ලෙස ගිණුම් ශේෂයන් හා ඒ හා සම්බන්ධ හෙළිදරව් කිරීම් පිළිබඳ සැදැහුම් සමඟ ගණුදෙනු හා සිද්ධීන් පන්ති සහ ඒ හා සම්බන්ධ හෙළිදරව් කිරීම් සංයෝජනය කිරීම විගණක විසින් තෝරාගත හැකිය. |
| 2014 -අ 111 | ~~සිදුවිය හැකි වෙනස් වර්ගවල විභව්‍ය~~ | සිදුවිය හැකි ~~වෙනස් වර්ගවල~~ විභව්‍ය |

| විස්තරය | 2014 | 2017 |
|---|---|---|
| 2017 -අ 129 | ~~අවප්‍රකාශ සළකා බැලීමට විගණක විසින් කරන ලද සැදෑහුම් පහත සඳහන් ප්‍රවර්ග තුනට අයත් වන අතර, පහත දැක්වෙන ස්වරූප ගත හැකිය.~~<br>(අ) ~~විගණනය යටතේ පවතින කාලපරිච්ඡේදය සඳහා ගණුදෙනු පන්ති සහ සිද්ධීන් පිළිබඳ සැදෑහුම්~~<br>(i) ~~අස්තිත්ත්වයට අයත් සිදුවී ඇති ලෙස වාර්තා වී ඇති ගනුදෙණු සහ සිද්ධීන් සිදු වේ.~~<br>(ii) ~~සම්පූර්ණත්වය - සටහන් කළයුතු සියළුම ගණුදෙනු සහ සිද්ධීන් සටහන් කර ඇත.~~<br>(iii) ~~නිරවද්‍යතාවය වාර්තාකල ගණුදෙනු හා සිද්ධීන් වලට අදාල වටිනාකම් සහ වෙනත් දත්ත නිසි පරිදි සටහන් කර ඇත.~~<br>(iv) ~~ලුහුකම් - ගණුදෙනු සහ සිද්ධීන් නිවැරදි ගිණුම්කරණ කාල පරිච්ඡේදය තුල සටහන් කර ඇත.~~<br>(v) ~~වර්ගීකරණය - ගණුදෙනු සහ සිද්ධීන් නියම ගිණුම්වල සටහන් කර ඇත.~~<br>(ආ) ~~කාල පරිච්ඡේදය අවසානයේ ගිණුම් ශේෂයන් පිළිබඳ සැදෑහුම්:~~<br>(i) ~~පැවැත්ම - වත්කම්, වගකීම් සහ ස්කන්ධ හිමිකම් පවතී.~~<br>(ii) ~~හිමිකම් සහ බැඳීම් අස්තිත්ත්වය වත්කම් සඳහා හිමිකම් දැරීම හෝ පාලනය කිරීම සිදු කරන අතර, වගකීම් යනු අස්තිත්ත්වයේ බැඳීම් වේ.~~<br>(iii) ~~සම්පූර්ණත්වය සටහන් කළයුතුව තිබූ සියළුම වත්කම්, වගකීම් සහ ස්කන්ධ හිමිකම් සටහන් කර ඇත.~~<br>(iv) ~~අගය කිරීම සහ වෙන් කිරීම - වත්කම්, වගකීම් සහ ස්කන්ධ හිමිකම් මූල්‍ය ප්‍රකාශ වල සුදුසු වටිනාකමට ඇතුලත් කර ඇති අතර, එහි ප්‍රතිඵලයක් ලෙස ලැබෙන අගය කිරීම් හෝ සැලසුම් කිරීම් නිසි පරිදි සටහන් වේ.~~<br>(ඇ) ~~ඉදිරිපත් කිරීම සහ හෙළිදරව් කිරීම පිළිබඳ සැදෑහුම්:~~<br>(i) ~~සිදුවීම සහ හිමිකම් බැඳීම් හෙළිදරව් වූ සිද්ධීන්, ගණුදෙනු සහ වෙනත් කරුණු සිදු වී ඇති සහ අස්තිත්වයට අදාලවේ.~~<br>(ii) ~~සම්පූර්ණත්වය - මූල්‍ය ප්‍රකාශවල ඇතුලත් කළ යුතුව තිබූ සියළුම හෙළිදරව් කිරීම ඇතුලත් කර ඇත.~~<br>(iii) ~~වර්ගීකරණය සහ අවබෝධකරගත යුතු බව මූල්‍ය තොරතුරු යෝග්‍ය~~ | අවප්‍රකාශ සළකා බැලීමේදී විගණක විසින් භාවිතා කරන ලද සැදෑහුම් පහත සඳහන් ප්‍රවර්ග වලට අයත් විය හැකිය.<br>අ විගණනය කරනු ලබන කාලපරිච්ඡේදය සඳහා ගණුදෙනු සිද්ධීන් පන්ති සහ ඒ හා සම්බන්ධ හෙළිදරව් කිරීම් පිළිබඳ සැදෑහුම්;<br>i සිදුවීම - වාර්තා කළ හෝ හෙළිදරව් කර ඇති ගණුදෙනු සහ සිද්ධීන් සිදුවී ඇති අතර, එවැනි ගණු දෙනු හා සිද්ධීන් සිදු වී ඇති අතර, අස්තිත්ත්වයට අයත්වේ.<br>ii සම්පූර්ණත්වය - සටහන් කළයුතු සියළුම ගණුදෙනු සහ සිද්ධීන් සටහන් කර ඇති අතර, මූල්‍ය ප්‍රකාශවල ඇතුලත් කළ යුතුව තිබූ අදාළ සියළු හෙළිදරව් කිරීම් ඇතුළත් කර ඇත.<br>iii නිරවද්‍යතාවය - වාර්තාවී ඇති ගණුදෙනු සහ සිද්ධීන් වලට සම්බන්ධ වටිනාකම් සහ වෙනත් දත්ත යෝග්‍ය පරිදි වාර්තා කර ඇති අතර, අදාළ හෙළිදරව් කිරීම් යෝග්‍ය පරිදි මැන විස්තර කර ඇත.<br>iv ලුහුකම් - ගණුදෙනු සහ සිද්ධීන් නිවැරදි ගිණුම්කරණ හා කාල පරිච්ඡේදය තුළ සටහන් කර ඇත.<br>v වර්ගීකරණය - ගණුදෙනු සහ සිද්ධීන් නියම ගිණුම්වල සටහන් කර ඇත.<br>vi ඉදිරිපත් කිරීම - ගණුදෙනු සහ සිද්ධීන් යෝග්‍ය පරිදි සමාහරණය කර හෝ කොටස් වලට විසුරුවාහැර සහ පැහැදිලිව විස්තර කර ඇති අතර, සම්බන්ධිත හෙළිදරව් කිරීම් අදාළ සහ අදාළ මූල්‍ය වාර්තාකරණ ආකෘතිමය රාමුවේ අවශ්‍යතාවන්හි සම්බන්ධය තුළ අවබෝධකර ගත හැකිව ඇත.<br>ආ කාල පරිච්ඡේදය අවසානයේ ගිණුම් ශේෂයන් සහ අදාළ හෙළිදරව් කිරීම් පිළිබඳ සැදෑහුම්:<br>i පැවැත්ම - වත්කම්, වගකීම් හා ස්කන්ධ හිමිකම් පවතී.<br>ii හිමිකම් සහ බැඳීම් අස්තිත්ත්වය වත්කම්වලට හිමිකම් දැරීම හෝ පාලනය කිරීම සිදු කරන අතර, වගකීම් යනු අස්තිත්ත්වයේ බැඳීම් වේ.<br>iii සම්පූර්ණත්වය - සටහන් කළයුතුව තිබූ සියළුම වත්කම්, වගකීම් සහ ස්කන්ධ හිමිකම් සටහන් කර ඇති අතර මූල්‍ය ප්‍රකාශවල ඇතුලත් කළ යුතුව තිබූ සියළු සම්බන්ධිත හෙළිදරව් කිරීම් ඇතුලත් කර ඇත.<br>iv නිරවද්‍යතාවය, අගය කිරීම සහ වෙන් කිරීම - වත්කම්, වගකීම් සහ ස්කන්ධ හිමිකම් මූල්‍ය ප්‍රකාශ වල යෝග්‍ය වටිනාකම්වලට ඇතුලත් කර ඇති අතර, එහි ප්‍රතිඵලයක් ලෙස අගය |

| විස්තරය | 2014 | 2017 |
|---|---|---|
| | ~~පරිදි ඉදිරිපත් කර විස්තර කර ඇති අතර හෙළිදරව් කිරීම පැහැදිලිව ප්‍රකාශ කර ඇත.~~<br>(iv) ~~නිරවද්‍යතාවය සහ අගය කිරීම - මූල්‍ය හා වෙනත් තොරතුරු සාධාරණ හා යෝග්‍ය වටිනාකම් වලින් හෙළිදරව් කෙරේ.~~ | කිරීම් හෝ වෙන්කිරීමේ ගැලපීම් නිසි පරිදි සටහන් කර ඇති අතර අදාළ හෙළිදරව් කිරීම් නිසි ලෙස මැන විස්තර කර ඇත.<br>v වර්ගීකරණය - වත්කම් වගකීම් සහ ස්කන්ධ හිමිකම් නියම ගිණුම්වල සටහන් කර ඇත.<br>vi ඉදිරිපත් කිරීම - වත්කම්, වගකීම් සහ ස්කන්ධ හිමිකම් යෝග්‍ය පරිදි සමාහරණය කර හෝ කොටස් වලට විසුරුවා පැහැදිලිව විස්තර කර ඇති අතර, සම්බන්ධිත හෙළිදරව් කිරීම් අදාල මූල්‍ය වාර්තාකරණ ආකෘතිමය රාමුවේ අවශ්‍යතාවයන්හි සම්බන්ධය තුල අදාලව සහ තේරුම්ගත හැකිව ඇත. |
| 2014 - අ 112<br>2017 - අනුරූප ඡේදයක් නොමැත. | ~~ඉහත විස්තර කර ඇති පරිදි විගණකට සැදැහුම් භාවිතා කළ හැකිය. නැතහොත් ඉහත විස්තර කර ඇති සියළුම අංග ආවරණය කර ඇත්නම් ඒවා වෙනස් ලෙස ප්‍රකාශ කළ හැකිය. උදාහරණ ලෙස, ගණුදෙනු හා සිද්ධීන් පිළිබඳ සැදැහුම්, ගිණුම් ශේෂයන් පිළිබඳ සැදැහුම් සමග සංයෝජනය කිරීමට විගණක විසින් තෝරාගත හැකිය.~~ | [අනුරූප නොමැත.] |
| ශීර්ෂය | [අනුරූප නොමැත.] | වෙනත් හෙළිදරව් කිරීම් පිළිබඳ සැදැහුම්. |
| 2014 - අනුරූප ඡේද නොමැත.<br>2017 - අ 130 | [අනුරූප නොමැත.] | ඉහත 129 (අ) - (ආ) ඡේදයේ විස්තර කර ඇති සැදැහුම් යෝග්‍ය පරිදි අනුවර්තනය කර, වාර්තාකර ඇති ගණුදෙනු පන්තීන් සිද්ධීන් හෝ ගිණුම් ශේෂයන් සමග සෘජුවම සම්බන්ධ නොවන හෙළිදරව් කිරීම් වලදී සිදුවිය හැකි වෙනස් වර්ගවල විභව්‍ය අවප්‍රකාශ සළකා බැලීමේදී විගණක විසින් එසේම භාවිතා කළ හැකිය. එවැනි හෙළිදරව් කිරීමකට උදාහරණ ලෙස, මූල්‍ය සාධන පත්‍ර වලින් ඇතිවිය හැකි අවදානම් වලට එහි නිරාවරණය වීම විස්තර කිරීමේදී, අවදානම් පැන නගින ආකාරය, අවදානම් කළමනාකරණය සඳහා අරමුණු, ප්‍රතිපත්ති හා ක්‍රියාවලි සහ අවදානම් මැනීමට භාවිතා කරන ක්‍රම ඇතුළුව විස්තර කිරීමට අස්තිත්වයට අවශ්‍ය විය හැකිය. |
| 2014 - අ 113<br>2017 - අ 131 | ~~අ 111 ඡේදය තුළ පැහැදිලිකර දෙන~~ එම සැදැහුම් වලට අමතරව, රාජ්‍ය අංශයේ අස්තිත්ව වල මූල්‍ය ප්‍රකාශ පිළිබඳව සැදැහුම් කරන විට, කළමනාකරණය, එම ගණුදෙනු සහ සිදුවීම්, නීතිය, රෙගුලාසි හෝ වෙනත් අධිකාරියකට අනුකූලව ක්‍රියාවට නංවා ඇති බව බොහෝවිට තරයේ ප්‍රකාශ කළ හැකිය. එවැනි සැදැහුම් මූල්‍ය ප්‍රකාශ විගණනයේ විෂය පථයට අයත් විය හැකිය. | අ 129 (අ) - (ආ) , ඡේදවල පැහැදිලිකර දෙන එම සැදැහුම් වලට අමතරව, රාජ්‍ය අංශයේ අස්තිත්ව වල මූල්‍ය ප්‍රකාශ පිළිබඳව සැදැහුම් කරන විට, කළමනාකරණය, එම ගණුදෙනු සහ සිද්ධීන්, නීතිය, රෙගුලාසි හෝ වෙනත් අධිකාරියකට අනුකූලව ක්‍රියාවට නංවා ඇති බව බොහෝ විට තරයේ ප්‍රකාශ කල හැකිය. එවැනි සැදැහුම් මූල්‍ය ප්‍රකාශ විගණනයේ විෂය පථයට අයත් විය හැකිය. |
| 2014 - අ 114<br>2017 - අ 132 | පාලන සැලසුම් ඇගයීමේදි සහ ඒවා ක්‍රියාත්මක කර ඇත්දැයි නිර්ණය කිරීමේදී ලබාගත් විගණන සාක්ෂි ඇතුළුව අවදානම් තක්සේරු කිරීමේ ක්‍රියා පටිපාටි ඉටු | පාලන සැලසුම් ඇගයීමේදි සහ ඒවා ක්‍රියාත්මක කර ඇත්දැයි නිර්ණය කිරීමේදී ලබාගත් විගණන සාක්ෂි ඇතුළුව අවදානම් තක්සේරු කිරීමේ ක්‍රියා පටිපාටි ඉටු කිරීමෙන් |

| විස්තරය | 2014 | 2017 |
|---|---|---|
| | කිරීමෙන් රැස්කර ගත් තොරතුරු අවදානම් තක්සේරු කිරීමට සහායවීම සඳහා වූ විගණන සාක්ෂි ලෙස භාවිතා කරයි. ~~ඉටුකල යුතු වැඩිදුර විගණන ක්‍රියා පටිපාටි වල~~ ස්වභාවය සහ කාල නිර්ණය සහ ප්‍රමාණය අවදානම් තක්සේරුව මඟින් නීර්ණය කරයි. | රැස්කර ගත් තොරතුරු අවදානම් තක්සේරු කිරීම කිරීමට සහායවීම සඳහා වූ විගණන සාක්ෂි ලෙස භාවිතා කරයි. ඉටුකල යුතු වැඩිදුර විගණන ක්‍රියා පටිපාටි වල ස්වභාවය, කාල නිර්ණය සහ ප්‍රමාණය අවදානම් තක්සේරුව මඟින් නීර්ණය කරයි. මූල්‍ය ප්‍රකාශ තුල ප්‍රමාණාත්මක අව ප්‍රකාශවීමේ අවදානම් හඳුනා ගැනීමේදී විගණක ශ්‍රීලවිප්‍ර 200 ට අනුකූලව වෘත්තීය සංශය දෘෂ්ඨිය භාවිතා කරයි. *<br>* ශ්‍රීලවිප්‍ර 200 *ස්වාධීන විගණකගේ සමස්ත අරමුණු සහ ශ්‍රී ලංකා විගණන ප්‍රමිතීන්වල* 15 *වන ඡේදය සමග අනුකූලව විගණනයක් මෙහෙයවීම.* |
| 2014 - අ 115<br>2017 - අ 133 | ~~ප්‍රමාණාත්මක අව ප්‍රකාශ~~ වීමේ අවදානම් පවතින බව ඇඟවිය හැකි තත්ත්වයන්ට සහ සිද්ධීන් පිළිබඳ උදාහරණ 2 වන පරිශිෂ්ඨය මඟින් දක්වා ඇත. | හෙළිදරව් කිරීම්වලට සම්බන්ධිත ප්‍රමාණාත්මක අවප්‍රකාශ වීමේ අවදානම් ඇතුළුව ප්‍රමාණාත්මක අවප්‍රකාශවීමේ අවදානම් පවතින බව ඇඟවිය හැකි තත්ත්වයන් සහ සිද්ධීන් පිළිබඳ උදාහරණ 2 වන පරිශිෂ්ඨය මඟින් දක්වා ඇත. |
| 2014 - අනුරූප ඡේද නොමැත.<br>2017 - අ 134 | [අනුරූප නොමැත.] | ශ්‍රී.ලං.වි.ප්‍ර. 320 හි * පැහැදිලි කර ඇති පරිදි, ගණුදෙනු, ගිණුම් ශේෂ සහ හෙළිදරව් කිරීම් යන පන්ති තුළ ප්‍රමාණාත්මක අව ප්‍රකාශ වීමේ අවදානම් හඳුනාගැනීම් සහ තක්සේරු කිරීමේදී ප්‍රමාණාත්මක බව සහ විගණන අවදානම සළකා බලනු ලැබේ. ප්‍රමාණාත්මක භාවය පිළිබඳ විගණකගේ නිර්ණය වෘත්තීයමය විනිශ්චයට අයත් කරුණක් වන අතර, මූල්‍ය ප්‍රකාශ පරිශීලකයින්ගේ මූල්‍ය වාර්තාකරණ අවශ්‍යතා පිළිබඳ විගණකගේ අවබෝධය මඟින් එයට බලපායි. **<br>* ශ්‍රී.ලං.වි.ප්‍ර. 320 හි අ 1 ඡේදය.<br>** ශ්‍රී.ලං.වි.ප්‍ර. 320 හි 4 වන ඡේදය. |
| 2014 - අනුරූප ඡේද නොමැත.<br>2017 - අ 135 | [අනුරූප නොමැත.] | අවාදනම් හඳුනා ගැනීමේදී විගණක විසින් මූල්‍ය ප්‍රකාශ වල හෙළිදරව් කිරීම් සළකා බැලීමේදී එයට ප්‍රමාණාත්මක හා ගුණාත්මක හෙළිදරව් කිරීම් ඇතුලත් වේ. ඒවා අවප්‍රකාශ වීම ප්‍රමාණාත්මක විය හැකිය. (එනම්, පොදුවේ ගත්කල, අව ප්‍රකාශ ප්‍රමාණාත්මක යැයි සළකනු ලබන්නේ ඒවා සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශ වල පදනම මත ගනු ලබන පරිශීලකයින්ගේ ආර්ථික තීරණ වලට බලපෑ හැකි බවට සාධාරණ ලෙස අපේක්ෂා කළ හැකි නම්ය.) අස්තිත්ත්වයේ තත්ත්වයන් සහ කාර්යභාරය මත පදනම්ව, ගුණාත්මක අංගයන් ඇති සහ ප්‍රමාණාත්මක අවප්‍රකාශ වීමේ අවදානම් තක්සේරු කිරීමේදී අදාල විය හැකි හෙළිදරව් කිරීම් සඳහා ඇතුලත් විය හැකි උදාහරණ වලට පහත වන හෙළිදරව් කිරීම් ඇතුලත්ය :<br>• මූල්‍ය අර්බුදයක සිටින අස්තිත්වයක ද්‍රවශීලතාවය සහ ණය ප්‍රඥප්ති.<br>• හානිකරණ අලාභ හඳුනා ගැනීමට හේතු |

| විස්තරය | 2014 | 2017 |
|---|---|---|
| | | වූ සිද්ධීන් හෝ තත්ත්වයන්.<br>• අනාගතය පිළිබඳ උපකල්පන ඇතුළුව අනියතතාවය තක්සේරු කිරීමේ ප්‍රධාන ප්‍රභවයන්.<br>• ගිණුම්කරණ ප්‍රතිපත්තියේ වෙනසක ස්වභාවය සහ අදාළ මූල්‍ය වාර්තාකරණ ආකෘතිමය රාමුව මගින් අවශ්‍යකරන වෙනත් අදාළ හෙළිදරව් කිරීම්, උදාහරණ ලෙස, නව මූල්‍ය වාර්තාකරණ අවශ්‍යතාවයන් මගින් අස්තිත්වයේ මූල්‍ය තත්වය සහ මූල්‍ය කාර්ය සාධනය කෙරෙහි සැළකිය යුතු බලපෑමක් ඇති කරණු ඇතැයි අපේක්ෂා කිරීම.<br>• හඳුනාගත් කිසියම් වටිනාකමක් නිර්ණය කළ ආකාරය පිළබඳ තොරතුරු සහ වෙනත් අදාළ හෙලිදරව් කිරීම් ඇතුළුව කොටස් පදනම් කරගත් ගෙවීම් විධි විධාන.<br>• සම්බන්ධිත පාර්ශවයන් සහ සම්බන්ධිත පාර්ශවීය ගණුදෙනු.<br>• වාර්තාකරණ ලද හෝ හෙලිදරව් කරන ලද වටිනාකමක් පාදක කරගත් මිනුම් කරන අනියතතාවය අවබෝධකර ගැනීමට පරිශීලකයින් හට හැකිවන පරිදි අපේක්ෂා කල අස්තිත්වයේ අගය කිරීමේ ශිල්ප ක්‍රම යන්හි භාවිතා කළ උපකල්පන වල වෙනස්වීම් වල බලපෑම ඇතුළුව සංවේදීතා විශ්ලේෂණය. |
| ශීර්ෂය | [අනුරූප නොමැත.] | කුඩා අස්තිත්ව වලට විශේෂිත වූ සළකා බැලීම්. |
| 2014 - අනුරූප ඡේද නොමැත. 2017 - අ 136 | [අනුරූප නොමැත.] | කුඩා අස්තිත්ව වල මූල්‍ය ප්‍රකාශයන්හි හෙළිදරව් කිරීම් විස්තරාත්මක බවෙන් අඩුවෙන් හෝ අඩු සංකීර්ණතාවයකින් යුක්ත විය හැකිය. (උදා. සමහර මූල්‍ය වාර්තාකරණ ආකෘතිමය රාමු මගින් කුඩා අස්තිත්ව වලට මූල්‍ය ප්‍රකාශවල හෙළිදරව් කිරීම් අඩුවෙන් කිරීමට ඉඩ ලබාදේ.) කෙසේ වෙතත් මේ මගින් හෙළිදරව් කිරීම් වලට අදාළව අභ්‍යන්තර පාලනය ඇතුළුව අස්තිත්වය සහ එහි පරිසරය පිළිබඳ අවබෝධයක් ලබා ගැනීමේ වගකීමෙන් විගණකවරයාව නිදහස් නොකරයි. |
| ශීර්ෂය | [අනුරූප නොමැත.] | ප්‍රමාණාත්මක අව ප්‍රකාශ. |
| 2014 - අනුරූප ඡේද නොමැත. 2017 - අ 139 | [අනුරූප නොමැත.] | තනි ප්‍රකාශ සහ හෙළිදරව් කිරීම් වල ඇති විය හැකි අවප්‍රකාශ ප්‍රමාණාත්මක යැයි විනිශ්චය කල හැක්කේ එහි විශාලත්වය, ස්වභාවය හෝ තත්ත්වයන් නිසාය. (යොමුව : 26 (ඇ) ඡේදය) |
| 1 වන පරිශිෂ්ඨය | ~~(යොමුව : 4 (ඇ), 14 -24, අ 69 - අ 104 ඡේද)~~<br>..... | (යොමුව : 4 (ඇ), 14 -24, අ 77 - අ 121 ඡේද)<br>.... |
| 1 වන පරිශිෂ්ඨය | මූල්‍ය ප්‍රකාශ විගණනයකට සම්බන්ධ වන | මූල්‍ය ප්‍රකාශ විගණනයකට සම්බන්ධ වන |

| විස්තරය | 2014 | 2017 |
|---|---|---|
| 1 වන ඡේදය | පරිදි, 4 (ඇ) 14 - 24 සහ ~~අ69 - අ 104~~ ඡේදවල පැහැදිලිකර ඇති පරිදි අභ්‍යන්තර පාලනයේ සංරචක මෙම පරිශිෂ්ඨය තව දුරටත් පැහැදිලි කරයි. | පරිදි 4 (ඇ) 14 - 24 සහ අ 77 - අ 121 ඡේදවල පැහැදිලිකර ඇති පරිදි අභ්‍යන්තර පාලනයේ සංරචක මෙම පරිශිෂ්ඨය තව දුරටත් පැහැදිලි කරයි. |
| 2 වන පරිශිෂ්ඨය | (~~යොමුව : අ 33, අ 115 ඡේද~~) ප්‍රමාණාත්මක අව ප්‍රකාශවීමේ අවදානම් ඇඟවිය හැකි තත්වයන් සහ සිද්ධීන්<br>පහත දැක්වෙන්නේ ප්‍රමාණාත්මක අව ප්‍රකාශවීමේ අවදානම්වල පැවැත්ම ඉඟි කරන තත්වයන් සහ සිදුවීම් සඳහා උදාහරණ වේ. ලබාදී ඇති උදාහරණ පුළුල් පරාසයක කොන්දේසි සහ සිද්ධීන් ආවරණය කරයි ; කෙසේ වෙතත්, සෑම විගණන කාර්ය භාරයකටම සියළු තත්වයන් සහ සිද්ධීන් අදාල නොවන අතර, උදාහරණ ලැයිස්තුව අවශ්‍යයෙන්ම සම්පූර්ණ නොවේ.<br>■ ගිණුම්කරණ ~~ඇස්තමේන්තු~~ ඇතුළුව සැළකිය යුතු අන්දමේ මිනුම්කරණ අවිනිශ්චිතතාවයකට සම්බන්ධ සිද්ධීන් හෝ ගනුදෙනු.<br>........ | (යොමුව : අ 41, අ 133 ඡේද) ප්‍රමාණාත්මක අවප්‍රකාශවීමේ අවදානම් ඇඟවිය හැකි තත්වයන් සහ සිද්ධීන්,<br>පහත දැක්වෙන්නේ මූල්‍ය ප්‍රකාශවල ඇති ප්‍රමාණාත්මක අවප්‍රකාශවීමේ අවදානම් වල පැවැත්ම ඉඟි කරන තත්වයන් සහ සිදුවීම් සඳහා උදාහරණවේ. ලබාදී ඇති උදාහරණ පුළුල් පරාසයක කොන්දේසි සහ සිද්ධීන් ආවරණය කරයි; කෙසේ වෙතත්, සෑම විගනන කාර්ය භාරයකටම සියළු තත්වයන් සහ සිද්ධීන් අදාල නොවන අතර, උදාහරණ ලැයිස්තුව අවශ්‍යයෙන්ම සම්පූර්ණ නොවේ.<br>.......<br>■ වංචනික මූල්‍ය වාර්තාකරණයේ යෙදීමට කළමනාකරණයට සහ සේවකයින්ට දිරිගැන්වීමේ දීමනා.<br>......<br>■ ගිණුම්කරණ ඇස්තමේන්තු සහ සම්බන්ධිත හෙළිදරව් කිරීම් ඇතුළුව සැළකිය යුතු මිනුම් අනියතතතාවයකට සම්බන්ධ සිද්ධීන් හෝ ගනුදෙනු.<br>■ හෙළිදරව් කිරීම්වල සැළකිය යුතු තොරතුරු අත්හැරීම හෝ අපැහැදිලි කිරීම.<br>........ |
| **ශ්‍රී ලංකා විගණන ප්‍රමිත 320 (SLAUS 320 - විගනණයක් සැලසුම් කිරීමේදී හා ඉටු කිරීමේදී වන ප්‍රමාණාත්මක භාවය)** | | |
| 6 | විගණනය සැලසුම් කිරීමේදී, ප්‍රමාණාත්මක ලෙස සලකනු ලබන අව ප්‍රකාශ ~~වල ප්‍රමාණය~~ පිළිබඳව විගණක විනිශ්චයක් ගනී. මෙම විනිශ්චයන් පහත දෑ සඳහා පදනමක් ලබාදෙයි:<br>(අ) අවදානම තක්සේරු කිරීමේ ක්‍රියා පටිපාටි වල ස්වභාවය, කාල නිර්ණය සහ ප්‍රමාණය නිර්ණය කිරීම;<br>(ආ) ප්‍රමාණාත්මක අවප්‍රකාශ වීමේ අවදානම් හඳුනාගැනීම සහ තක්සේරු කිරීම; සහ<br>(ඇ) වැඩිදුර විගණන ක්‍රියා පටිපාටිවල ස්වභාවය, කාලනිර්ණය සහ ප්‍රමාණය නිර්ණය කිරීම.<br>විගණනය සැලසුම් කිරීමේදී තීරණය කරනු ලබන ප්‍රමාණාත්මක භාවය, තනි තනිව හෝ සමාහාරයන් වශයෙන් නිවැරදි නොකළ අව ප්‍රකාශ සෑම විටම නොවැදගත් ලෙස අගය කරනු ලබන ප්‍රමාණයට වඩා අඩු වටිනාකමක් අවශ්‍යයෙන්ම සිදුවිය යුතු ලෙස ස්ථාපිත නොකරයි. සමහර අව ප්‍රකාශ වලට සම්බන්ධ තත්ත්වයන් ප්‍රමාණාත්මක භාවයෙන් අඩු වුවද, විගණකට ඒවා ප්‍රමාණාත්මක ලෙස ඇගයීමට හේතුව විය හැකිය. ඒවායේ ස්වභාවය නිසා පමණක් | විගණනය සැලසුම් කිරීමේදී, ප්‍රමාණාත්මක ලෙස සලකනු ලබන අව ප්‍රකාශ පිළිබඳව විගණක විනිශ්චයක් ගනී. මෙම විනිශ්චයන් පහත දෑ සඳහා පදනමක් ලබාදෙයි:<br>(අ) අවදානම තක්සේරු කිරීමේ ක්‍රියා පටිපාටි වල ස්වභාවය, කාල නිර්ණය සහ ප්‍රමාණය නිර්ණය කිරීම;<br>(ආ) ප්‍රමාණාත්මක අවප්‍රකාශ වීමේ අවදානම් හඳුනාගැනීම සහ තක්සේරු කිරීම; සහ<br>(ඇ) වැඩිදුර විගණන ක්‍රියා පටිපාටිවල ස්වභාවය, කාලනිර්ණය සහ ප්‍රමාණය නිර්ණය කිරීම.<br>විගණනය සැලසුම් කිරීමේදී තීරණය කරනු ලබන ප්‍රමාණාත්මක භාවය, තනි තනිව හෝ සමාහාරයන් වශයෙන් නිවැරදි නොකළ අව ප්‍රකාශ සෑම විටම නොවැදගත් ලෙස අගය කරනු ලබන ප්‍රමාණයට වඩා අඩු වටිනාකමක් අවශ්‍යයෙන්ම සිදුවිය යුතු ලෙස ස්ථාපිත නොකරයි. සමහර අව ප්‍රකාශවලට සම්බන්ධ තත්ත්වයන් ප්‍රමාණාත්මක භාවයෙන් අඩු වුවද, විගණකට ඒවා ප්‍රමාණාත්මක ලෙස ඇගයීමට හේතුව විය හැකිය. ඒවායේ ස්වභාවය නිසා පමණක් ප්‍රමාණාත්මක විය හැකි සියළු අව ප්‍රකාශ අනාවරණය කර ගැනීම සඳහා විගණන |

| විස්තරය | 2014 | 2017 |
|---|---|---|
| | ප්‍රමාණාත්මක විය හැකි අව ප්‍රකාශ අනාවරණය කර ගැනීම සඳහා විගණන ක්‍රියා පටිපාටි සැලසුම් කිරීම ප්‍රායෝගික නොවන නමුත්, ~~මූල්‍ය ප්‍රකාශ කෙරෙහි ඒවායෙහි බලපෑම අගය කිරීමේදී ඒවායෙහි ප්‍රමාණය පමණක් නොව, නිවැරදි නොකල අවප්‍රකාශ වල ස්වභාවය සහ ඒවා සිදුවීමේ විශේෂිත තත්ත්වයන් ද විගණක විසින් සළකා බලයි.~~*<br>* ශ්‍රී.ලං.වි.ප්‍ර. 450, අ 16 ඡේදය. | ක්‍රියා පටිපාටි සැලසුම් කිරීම නොවේ. කෙසේ වෙතත්, හෙළිදරව් කිරීම් තුල ඇති විය හැකි අවප්‍රකාශ වල ස්වභාවය සළකා බැලීම ප්‍රමාණාත්මක අව ප්‍රකාශයක අවදානම් ඇමතීම සඳහා විගණන ක්‍රියා පටිපාටි සැලසුම් කිරීමට අදාල වේ. ** ඊට අමතරව, සියළු නිවැරදි නොකල අව ප්‍රකාශ වලින් මූල්‍ය ප්‍රකාශ කෙරෙහි ඒවායෙහි බලපෑම අගය කිරීමේදී ඒවායෙහි ප්‍රමාණය පමණක් නොව, නිවැරදි නොකල අව ප්‍රකාශ වල ස්වභාවය සහ ඒවා සිදුවීමේ විශේෂිත තත්ත්වයන් ද එලෙසම විගණක විසින් සලකා බලයි. ***<br>(යොමුව : අ 2 ඡේදය)<br>** ශ්‍රී.ලං.වි.ප්‍ර. 315 (සංශෝධිත), *අස්තිත්ත්වය සහ එහි පරිසරය අවබෝධ කර ගැනීමෙන් ප්‍රමාණාත්මක අව ප්‍රකාශ වීම් හි අවදානම් හඳුනා ගැනීම සහ තක්සේරු කිරීම*, අ 134 - අ 135 ඡේද බලන්න.<br>*** ශ්‍රී.ලං.වි.ප්‍ර. 430 , අ 21 ඡේදය. |
| 10 | සමස්ත විගණන උපාය මාර්ගය ස්ථාපිත කිරීමේදී විගණක විසින් සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශ සඳහා ප්‍රමාණාත්මක භාවය නිර්ණය කළ යුතුය. අස්තිත්ත්වයේ නිශ්චිත තත්ත්වයන් තුල, සමස්තයක් වශයෙන් මූල්‍ය ප්‍රකාශ සඳහා ප්‍රමාණාත්මක භාවයට වඩා අඩු වටිනාකමකට අව ප්‍රකාශ සඳහා ගනුදෙනු, ගිණුම් ශේෂයන් හෝ හෙළිදරව් කිරීම් විශේෂිත පන්ති එකක් හෝ ඊට වැඩි ගණනක් තිබේනම්, මූල්‍ය ප්‍රකාශ පදනම් කරගත් පරිශිලකයින්ගේ ආර්ථික තීරණ කෙරෙහි බලපෑම් කිරීම සාධාරණ ලෙස අපේක්ෂා කළ හැකිය. එම විශේෂ පන්තිවල ගනුදෙනු, ගිණුම් ශේෂයන් හෝ හෙළිදරව් කිරීම් සඳහා ව්‍යවහාර කරගත යුතු ප්‍රමාණාත්මක මට්ටම හෝ මට්ටම් ද විගණක විසින් එලෙස නිර්ණය කළ යුතුය. (~~යොමුව : අ 2 – අ 11 ඡේද~~) | සමස්ත විගණන උපාය මාර්ගය ස්ථාපිත කිරීමේදී විගණක විසින් සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශ සඳහා ප්‍රමාණාත්මකභාවය නිර්ණය කළ යුතුය. අස්තිත්ත්වයේ නිශ්චිත තත්ත්වයන් තුල, සමස්තයක් වශයෙන් මූල්‍ය ප්‍රකාශ සඳහා ප්‍රමාණාත්මක භාවයට වඩා අඩු වටිනාකමකට අව ප්‍රකාශ සඳහා ගනුදෙනු, ගිණුම් ශේෂයන් හෝ හෙළිදරව් කිරීම් විශේෂිත පන්ති එකක් හෝ ඊට වැඩිගණනක් තිබේනම්, මූල්‍ය ප්‍රකාශ පදනම් කරගත් පරිශිලකයින්ගේ ආර්ථික තීරණ කෙරෙහි බලපෑම් කිරීම සාධාරණ ලෙස අපේක්ෂා කළ හැකිය.එම ගණුදෙනු, ගිණුම් ශේෂයන් හෝ හෙළිදරව් කිරීම් සඳහා අදාල කරගත යුතු ප්‍රමාණාත්මක මට්ටම හෝ මට්ටම් ද විගණක විසින් එලෙස නිර්ණය කළ යුතුය. (යොමුව : අ 3 - අ 12 ඡේද) |
| 11 | ප්‍රමාණාත්මක අවප්‍රකාශ වීමේ අවදානම් තක්සේරු කිරීම සහ තවදුරටත් වන විගණන ක්‍රියා පටිපාටිවල ස්වභාවය, කාලනිර්ණය සහ ප්‍රමාණය නිර්ණය කිරීමේ අරමුණු සඳහා විගණක විසින් කාර්ය සාධන ප්‍රමාණාත්මක භාවය නිර්ණය කළ යුතුය. (යොමුව : ~~අ 12~~ ඡේදය) | ප්‍රමාණාත්මක අවප්‍රකාශ වීමේ අවදානම් තක්සේරු කිරීම සහ තවදුරටත් වන විගණන ක්‍රියා පටිපාටි වල ස්වභාවය, කාලනිර්ණය සහ ප්‍රමාණය නිර්ණය කිරීමේ අරමුණු සඳහා විගණක විසින් කාර්ය සාධන ප්‍රමාණාත්මක භාවය නිර්ණය කළ යුතුය. (යොමුව : අ 13 ඡේදය) |
| 12 | විගණක විසින් සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශ සඳහා ප්‍රමාණාත්මකභාවය (සහ අදාල වන්නේ නම්, විශේෂ පන්තිවල ගනුදෙනු, ගිණුම් ශේෂ හෝ හෙළිදරව් කිරීම් සඳහා ප්‍රමාණාත්මක මට්ටම හෝ මට්ටම්) විගණනය තුලදි තොරතුරු පිළිබඳ දැනුවත් බවට පත් විමකදී මුලින් නිර්ණය වෙනස් කිරීමට හේතු වූ වෙනස් වටිනාකම් (හෝ වටිනාකම) සංශෝධනය කළ යුතුය. (යොමුව : ~~අ 13~~ ඡේදය) | විගණක විසින් සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශ සඳහා ප්‍රමාණාත්මකභාවය (සහ අදාළ වන්නේ නම්, විශේෂ පන්තිවල ගනුදෙනු, ගිණුම් ශේෂ හෝ හෙළිදරව් කිරීම් සඳහා ප්‍රමාණාත්මක මට්ටම හෝ මට්ටම්) විග විගණනය තුළදී තොරතුරු පිළිබඳ දැනුවත් බවට විමකදී මුලින් තීරණය වෙනස් කිරීමට හේතු වූ වෙනස් වටිනාකම් (හෝ වටිනාකම) සංශෝධනය කළ යුතුය. (යොමුව : අ 14 ඡේදය) |
| උප ශීර්ෂය | [අනුරූප නොමැත.] | විගණනයක සම්බන්ධය තුළ ප්‍රමාණාත්මක |

| විස්තරය | 2014 | 2017 |
|---|---|---|
| | | භාවය (යොමුව : 6 ඡේදය) |
| 2014 - අනුරූප ඡේද නොමැත.<br>2017 - අ 2 | [අනුරූප නොමැත.] | ප්‍රමාණාත්මක අවප්‍රකාශයක අවදානම් හඳුනාගැනීම සහ තක්සේරු කිරීම* එහි අවප්‍රකාශය ප්‍රමාණාත්මක විය හැකි ගුණාත්මක හෙළිදරව් කිරීම් ඇතුළුව ගනුදෙනු පන්ති ගිණුම් ශේෂයන් සහ හෙළිදරව් කිරීම්, හඳුනා ගැනීම සඳහා වෘත්තීය විනිශ්චය භාවිතා කිරීම සම්බන්ධ කරගැනේ (එනම්, පොදුවේ ගත්කල, සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශ පදනම් කරගෙන ගනු ලබන පරිශීලකයින්ගේ ආර්ථික තීරණවලට බලපෑම් කිරීමට හැකි බවට සාධාරණ ලෙස අපේක්ෂා කළ හැකි නම්, එම අව ප්‍රකාශ, ප්‍රමාණාත්මක යැයි සැළකේ.) ගුණාත්මක හෙළිදරව් කිරීම් වල ඇති අවප්‍රකාශ ප්‍රමාණාත්මක විය හැකිද යන්න සළකා බැලීමේදී විගණකට පහත වැනි අදාල සාධක හඳුනාගත හැකිය:<br>■ කාල පරිච්ඡේදය සඳහා අස්තිත්ත්වයේ තත්ත්වයන් (උදාහරණ ලෙස, එම කාල පරිච්ඡේදය තුල අස්තිත්ත්වය සැළකිය යුතු අන්දමේ ව්‍යාපාර සංයෝජනයක් භාරගෙන තිබිය හැක.)<br>■ ඒ අනුව වෙනස්කම් ඇතුළුව අදාල වන මූල්‍ය වාර්තාකරණ රාමුව (උදාහරණ ලෙස, අස්තිත්ත්වයට වැදගත් වන නව ගුණාත්මක හෙළිදරව් කිරීම් නව මූල්‍ය වාර්තාකරණ ප්‍රමිතියකට අවශ්‍ය විය හැකිය.)<br>■ අස්තිත්ත්වයක ස්වභාවය නිසා මූල්‍ය පරිශිලනය භාවිතා කරන්නන්ට වැදගත් වන ගුණාත්මක හෙළිදරව් කිරීම් (උදාහරණ ලෙස, මූල්‍ය ආයතනයක මූල්‍ය ප්‍රකාශ පරිශිලනය කරන්නන්ට ද්‍රවශීලතා අවදානම් හෙළිදරව් කිරීම් වැදගත් විය හැකිය. )<br>* ශ්‍රී.ලං.වි.ප්‍ර. 315 (සංශෝධිත ), 25 වන ඡේදය පරිදි, මූල්‍ය ප්‍රකාශයේ සහ සැදැහුම් මට්ටමෙන් ප්‍රමාණාත්මක අවප්‍රකාශ වීමේ අවදානම හඳුනා ගෙන තක්සේරු කිරීම විගණක විසින් කළයුතු වීම අවශ්‍ය වේ. |
| 2014 - අ10<br>2017- අ 11 | සමස්තයක් වශයෙන් මූල්‍ය ප්‍රකාශ සඳහා ප්‍රමාණාත්මකභාවයට වඩා අඩු වටිනාකමක අවප්‍රකාශ ලබා දෙන විශේෂ පන්තියේ එකක් හෝ ඊට වැඩි ගණු දෙනු, ගිණුම් ශේෂ හෝ හෙළිදරව් කිරීම් ඇති බව අඟවන සාධක, මූල්‍ය ප්‍රකාශ පදනම මත පරිශීලකයින් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි බලපෑම් කළ හැකි බව සාධාරණ ලෙස අපේක්ෂා කළ හැකි දේවල්වලට පහත සඳහන් දේ ඇතුළත් වේ.<br>■ නීතිය, රෙගුලාසි හෝ අදාල මූල්‍ය වාර්තාකරන ආකෘතිමය රාමුව ඇතැම් අයිතම මැනීම හෝ හෙළිදරව් කිරීම පිළිබඳ පරිශීලකයින්ගේ අපේක්ෂාවන්ට බලපාන්නේද යන්න (උදාහරණ ලෙස, | සමස්තයක් වශයෙන් මූල්‍ය ප්‍රකාශ සඳහා ප්‍රමාණාත්මක භාවයට වඩා අඩු වටිනාකමක අව ප්‍රකාශ ලබාදෙන විශේෂ පන්තියක එකක් හෝ ඊට වැඩි ගණු දෙනු, ගිණුම් ශේෂ හෝ හෙළිදරව් කිරීම් ඇති බව අඟවන සාධක, මූල්‍ය ප්‍රකාශ පදනම මත පරිශීලකයින් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි බලපෑම් කළ හැකි බවට සාධාරණ ලෙස අපේක්ෂා කළ හැකි දේවල්වලට පහත සඳහන් දේ ඇතුළත් වේ.<br>■ නීතිය, රෙගුලාසි හෝ අදාල මූල්‍ය වාර්තාකරණ ආකෘතිමය රාමුව ඇතැම් අයිතම මැනීම හෝ හෙළිදරව් කිරීම පිළිබඳ පරිශීලකයින්ගේ අපේක්ෂාවන්ට බලපාන්නේ ද යන්න (උදාහරණ ලෙස, |

| විස්තරය | 2014 | 2017 |
|---|---|---|
| | සම්බන්ධිත පාර්ශවීය ගනුදෙනු, ~~සහ~~ කළමණාකරණයේ සහ පාලනය පිළිබඳ වගකිව යුතු අයගේ පාරිශ්‍රමිකය)<br>■ අස්තිත්ත්වය ක්‍රියාත්මක වන කර්මාන්තයට සම්බන්ධ ප්‍රධාන හෙළිදරව් කිරීම (උදාහරණ ලෙස, ඖෂධ සමාගමක පර්යේෂණ හා සංවර්ධන පිරිවැය).<br>■ මූල්‍ය ප්‍රකාශවල වෙන වෙනම හෙළිදරව් වන අස්තිත්ත්වයේ ව්‍යාපාරයෙහි විශේෂ අංගයක් මත අවධානය යොමුවී තිබේද යන්න. (~~උදාහරණ ලෙස, අළුතින් අත්පත් කරගත් ව්‍යාපාරයක්~~) | සම්බන්ධිත පාර්ශවීය ගනුදෙනු සහ කළමනාකරණ සහ පාලනය පිළිබඳ වගකිව යුතු අයගේ පාරිශ්‍රමිකය සහ ඉහළ ඇස්තමේන්තු කිරීමේ අනියත තාවයකින් යුත් සාධාරණ අගය ගිණුම්කරණ ඇස්තමේන්තු සඳහා සංවේදීතා විශ්ලේෂණය)<br>■ අස්තිත්ත්වය ක්‍රියාත්මක වන කර්මාන්තයට සම්බන්ධ ප්‍රධාන හෙළිදරව් කිරීම් (උදාහරණ ලෙස, ඖෂධ සමාගමක පර්යේෂණ හා සංවර්ධන පිරිවැය)<br>■ මූල්‍ය ප්‍රකාශ වල වෙන වෙනම හෙළිදරව් වන අස්තිත්ත්වයේ ව්‍යාපාරයෙහි විශේෂ අංගයක් කෙරෙහි අවධානය යොමුවී තිබේ ද යන්න. (උදාහරණ ලෙස, බණ්ඩ හෝ සැළකිය යුතු ව්‍යාපාර සංයෝජනයක් පිළිබඳ හෙළිදරව් කිරීම්). |
| **ශ්‍රී ලංකා විගණන ප්‍රමිත 330 ( ශ්‍රීලවිප්‍ර 330 - තක්සේරු කළ අවදානම් වලට විගණකගේ ප්‍රතිචාර** | | |
| 20 (අ) | ~~මූල්‍ය ප්‍රකාශ පාදක කරගත් ගිණුම්කරණ වාර්තා සමඟ එකඟ වීම හෝ සංසන්දනය කිරීම, සහ~~ | විශේෂයෙන් හෙළිදරව් කිරීම් තුල වන තොරතුරු, එවැනි තොරතුරු පොදු සහ උපයෝගි ලෙජර වලින් හෝ ඉන් බාහිරව ලබාගත්තේ වුවද, සමාන කිරීම් හෝ සංසන්දනය කිරීම ඇතුළුව, පාදකවන ගිණුම්කරණ වාර්තා සමඟ මූල්‍ය ප්‍රකාශ තුළ වන තොරතුරු සමාන කිරීම හෝ සංසන්දනය කිරීම ; සහ |
| උප ශීර්ෂය | **ඉදිරිපත් කිරීමේ ~~සහ හෙළිදරව් කිරීමේ~~ ප්‍රමාණවත් භාවය** | **මූල්‍ය ප්‍රකාශ යන්හි ඉදිරිපත් කිරීමේ ප්‍රමාණවත්භාවය** |
| 24 | ~~සම්බන්ධිත හෙළිදරව් කිරීම් ඇතුළුව~~ මූල්‍ය ප්‍රකාශ වල සමස්ත ඉදිරිපත් කිරීම ~~අදාළ මූල්‍ය වාර්තාකරන ආකෘතිමය රාමුවට අනුකූල~~ ද යන්න අගය කිරීම සඳහා විගණක විසින් විගණන ක්‍රියා පටිපාටි ඉටුකළ යුතුය. (යොමුව : ~~අ 59 ඡේදය~~). | මූල්‍ය ප්‍රකාශ වල සමස්ත ඉදිරිපත් කිරීම අදාල මූල්‍ය වාර්තාකරණ ආකෘතිමය රාමුව සමඟ අනුකූලද යන්න අගය කිරීම සඳහා විගණක විසින් විගණන ක්‍රියා පටිපාටි ඉටුකළ යුතුය. මෙම ඇගයීම සිදු කිරීමේදී, මූල්‍ය ප්‍රකාශ ආකාරයට පරිදි පිළිබිඹු වන පරිදි ඉදිරිපත් කරන්නේද යන්න විගණක විසින් සළකා බැලිය යුතු ය.<br>■ මූල්‍ය තොරතුරු වර්ගීකරණය හා විස්තර කිරීම සහ පාදක කරගත් ගනුදෙනු සිද්ධීන් සහ තත්ත්වයන්; සහ<br>■ මූල්‍ය ප්‍රකාශවල ඉදිරිපත් කිරීම, ව්‍යුහය සහ අන්තර්ගතය (යොමුව : අ 59 ඡේදය) |
| 30 | ~~මූල්‍ය ප්‍රකාශ පාදක කරගත් ගිණුම්කරණ වාර්තා සමඟ එකඟ වන බව හෝ සැසැඳීම කරන බව~~ විගණකගේ ලිපි ලේඛන මගින් නිරූපණය කෙරේ. | මූල්‍ය ප්‍රකාශවල තොරතුරු පාදක කරගත් ගිණුම්කරණ වාර්තා සමග එකඟ වන බව හෝ සැසැදුම් කරන බව, හෙළිදරව් කිරීම සඳහා එකඟ වීම හෝ සංසන්දනය කිරීම ඇතුළුව, එවැනි තොරතුරු පොදු සහ උපයෝගී ලෙජර තුලින් හෝ පිටතින් ලබා ගත්තේ ද යන්න පිළිබඳව විගණකගේ ලිපි ලේඛන මගින් නිරූපණය කෙරේ. |
| අ1 | ......<br>■ වෘත්තීය සංශය දෘෂ්ඨිය පවත්වාගෙන යාමේ අවශ්‍යතාවය ~~විගණන~~ කණ්ඩායමට අවධාරණය කිරීම.<br>......... | ......<br>■ වෘත්තීය සංශය දෘෂ්ඨිය පවත්වාගෙන යාමේ අවශ්‍යතාවය කාර්යභාරයේ නියුතු කණ්ඩායමට අවධාරණය කිරීම.<br>....... |

| විස්තරය | 2014 | 2017 |
|---|---|---|
| අ13 | ................<br>■ ගිණුම්කරණ වාර්තාවලට මූල්‍ය ප්‍රකාශ එකඟ වීම ;<br>............. | .....<br>■ හෙළිදරව් කිරීම් තුළ වන තොරතුරු, එවැනි තොරතුරු පොදු සහ උපයෝගි ලෙජර තුළින් හෝ පිටතින් ලබා ගත්තේ වුවද, සමාන කිරීම හෝ සංසන්දනය කිරීම ඇතුළුව පාදකවන ගිණුම්කරණ වාර්තා සමඟ මූල්‍ය ප්‍රකාශ තුල වන තොරතුරු සමාන කිරීම හෝ සංසන්දනය කිරීම;<br>..... |
| 2014 - අනුරූප ඡේද නොමැත. 2017 - අ 14 | [අනුරූප නොමැත.] | .....<br>■ මූල්‍ය තත්ත්ව ප්‍රකාශය, විස්තීර්ණ ආදායම් ප්‍රකාශය, සකන්ධය වෙනස් වීමේ ප්‍රකාශය හෝ මුදල් ප්‍රවාහ ප්‍රකාශය තුල වාර්තා කර ඇති වටිනාකම පිළිබඳව විශේෂයෙන් තවදුරටත් පැහැදිලි කිරීම් ලබාදෙන එම හෙළිදරව් කිරීම් මූල්‍ය ප්‍රකාශවල පිළියෙල කිරීමේ කාල නිර්ණය.<br>..... |
| අ51 | ...........<br>මූල්‍ය ප්‍රකාශ අවසන් කිරීමේ ක්‍රියාවලියට සම්බන්ධිත තහවුරු කිරීමේ ක්‍රියා පටිපාටි (යොමුව : 20 ~~(ආ)~~ ඡේදය)<br>......... | .........<br>මූල්‍ය ප්‍රකාශ අවසන් කිරීමේ ක්‍රියාවලියට සම්බන්ධිත තහවුරු කිරීමේ ක්‍රියා පටිපාටි (යොමුව : 20 ඡේදය) |
| අ52 | ~~ජර්නල් සටහන් සහ වෙනත් ගැලපීම්~~ පිළිබඳ විගණකගේ පරීක්ෂා කිරීමේ ස්වභාවය හා එසේම ප්‍රමාණය රඳා පවතින්නේ අස්තිත්ත්වයේ මූල්‍ය වාර්තාකරන ක්‍රියාවලියේ ස්වභාවය සහ සංකීර්ණත්වය හා ප්‍රමාණාත්මක අවප්‍රකාශ වීමේ සම්බන්ධිත අවදානම මතය. | මූල්‍ය ප්‍රකාශ අවසන් කිරීමේ ක්‍රියාවලියට සම්බන්ධිත තහවුරු කිරීමේ ක්‍රියාපටිපාටි පිළිබඳ විගණකගේ ස්වභාවය හා එලෙසම ප්‍රමාණය රඳා පවතින්නේ අස්තිත්ත්වයේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලියේ ස්වභාවය සහ සංකීර්ණත්වය හා ප්‍රමාණාත්මක අවප්‍රකාශ වීමේ සම්බන්ධිත අවදානම මතය. |
| උප ශීර්ෂය | ඉදිරිපත් කිරීමේ ~~සහ හෙළිදරව්~~ කිරීමේ ප්‍රමාණවත් භාවය. (යොමුව : 24 ඡේදය) | මූල්‍ය ප්‍රකාශ ඉදිරිපත් කිරීමේ ප්‍රමාණවත් භාවය. (යොමුව : 24 ඡේදය) |
| අ59 | ~~අදාල හෙළිදරව් කිරීම් ඇතුළුව මූල්‍ය ප්‍රකාශ වල සමස්ත ඉදිරිපත් කිරීම, මූල්‍ය තොරතුරු වල යෝග්‍ය වර්ගීකරණය සහ විස්තරය පිළිබිඹු වන ආකාරය තනි මූල්‍ය ප්‍රකාශ ඉදිරිපත් කරන්නේද යන්න සම්බන්ධව සහ මූල්‍ය ප්‍රකාශවල ආකෘතිය සැකැස්ම සහ අන්තර්ගතයට සහ ඒවාට ඇඳා ඇති සටහන් ඇගයීම, උදාහරණ ලෙස, භාවිතා කරන ශබ්ද චේදයේ , ලබා දී ඇති විස්තර වල වටිනාකම, ප්‍රකාශ වල ඇති අයිතම් වර්ගීකරණය සහ දක්වා ඇති වටිනාකම් වල පදනම පැහැදිලි කරයි.~~ | මූල්‍ය ප්‍රකාශවල යෝග්‍ය ඉදිරිපත් කිරීමේ සැලසුම සහ අන්තර්ගතය ඇගයීමට ඇතුළත් වන්නේ, උදාහරණයක් ලෙස, අදාල මූල්‍ය වාර්තාකරණ ආකෘතිමය රාමුවෙන් අවශ්‍ය කරන පරිදි භාවිතා කළ ශබ්ද චේදය සැලකිල්ලට ගැනීම, ලබා දී ඇති විස්තරවල මට්ටම, වටිනාකම් සමාහරණය කිරීම සහ කොටස්වලට විසුරුවීම සහ වටිනාකම්වල පදනම් පැහැදිලි කරයි. |
| **ශ්‍රී ලංකා විගණන ප්‍රමිත 402 (ශ්‍රීලවිප්‍ර 402 සේවා සංවිධානයක් සේවයේ යොදවන අස්තිත්ත්වයක් පිළිබඳ විගණනයේදී සැලකිය යුතු කරුණු.)** | | |
| වෙනස් වීම් නොමැත. | | |
| **ශ්‍රී ලංකා විගණන ප්‍රමිත 450 (ශ්‍රීලවිප්‍ර 450 - විගණනය තුළදී හඳුනාගත් අව ප්‍රකාශ ඇගයීම.)** | | |
| 4 (අ) | අවප්‍රකාශය - ~~වාර්තා කරන ලද~~ මූල්‍ය ප්‍රකාශයක අයිතමයක වටිනාකම, | අවප්‍රකාශය -මූල්‍ය ප්‍රකාශයක වාර්තා කරන ලද අයිතමයක වටිනාකම, වර්ගීකරණය, |

| විස්තරය | 2014 | 2017 |
|---|---|---|
| | වර්ගීකරණය, ඉදිරිපත් කිරීම හෝ හෙළිදරව් කිරීම සහ අදාල මූල්‍ය වාර්තාකරණ ආකෘතිමය රාමුවට අනුකූලව එම අයිතමය සඳහා අවශ්‍යකරණ වටිනාකම් වර්ගීකරණය, ඉදිරිපත් කිරීම හෝ හෙළිදරව් කිරීම අතර ඇති වෙනසය. වැරදි හෝ වංචාවක් තුලින් අව ප්‍රකාශ ඇතිවිය හැකිය. (යොමුව : අ 1 ඡේදය.) | ඉදිරිපත් කිරීම හෝ හෙළිදරව් කිරීම සහ අදාල මූල්‍ය වාර්තාකරණ ආකෘතිමය රාමුවට අනුකූලව එම අයිතමය සඳහා අවශ්‍යකරන වටිනාකම වර්ගීකරණය, ඉදිරිපත් කිරීම හෝ හෙළිදරව් කිරීම අතර ඇති වෙනසය. වැරදි හෝ වංචාවක් තුලින් අව ප්‍රකාශ ඇතිවිය හැකිය. (යොමුව : අ 1 ඡේදය.) ............ |
| 5 | විගණනයේදී පැහැදිලි වූ ඉතා සුළු කරුණු හැරුණු විට විගණක විසින් හඳුනාගෙන ඇති අව ප්‍රකාශ රැස්කර (සමුච්චයකර) ගත යුතුය. (යොමුව : ~~අ 2 – අ 3~~ ඡේද) | විගණනයේදී පැහැදිලි වූ ඉතා සුළු කරුණු හැරුණු විට විගණක විසින් හඳුනාගෙන ඇති අව ප්‍රකාශ රැස්කර (සමුච්චයකර) ගත යුතුය. (යොමුව : අ2 - අ 6 ඡේද) |
| 6 | සමස්ත විගණන උපාය මාර්ගය සහ විගණන සැලැස්ම සංශෝධනය කළ යුතු ද යන්න විගණක විසින් නිර්ණය කල යුත්තේ :<br>(අ) හඳුනාගත් අවප්‍රකාශ වල ස්වභාවය සහ ඒවා සිදුවීමේ තත්ත්වයන් ගෙන් අඟවන්නේ විගණනයේදී සමුච්චය වී ඇති අව ප්‍රකාශ සමඟ සමාහරණය කළ විට ප්‍රමාණාත්මක විය හැකි වෙනත් අවප්‍රකාශ පැවතිය හැකි බවයි ; හෝ (යොමුව : ~~අ 4~~ ඡේදය)<br>(ආ) විගණනයේදී සමුච්චය කරන ලද අව ප්‍රකාශවල සමාහරණය ශ්‍රී.ලං.වි.ප්‍ර. 320 ට අනුකූලව නිර්ණය කරන ප්‍රමාණාත්මක භාවයට සමීප වේ. (යොමුව : ~~අ 5~~ ඡේද) | සමස්ත විගණන උපාය මාර්ගය සහ විගණන සැලැස්ම සංශෝධනය කළ යුතුද යන්න විගණක විසින් නිර්ණය කළ යුත්තේ :<br>(අ) හඳුනාගත් අවප්‍රකාශ වල ස්වභාවය සහ ඒවා සිදුවීමේ තත්ත්වයන්ගෙන් අඟවන්නේ විගණනයේදී සමුච්චය වී ඇති අව ප්‍රකාශ සමඟ සමාහරණය කළ විට ප්‍රමාණාත්මක විය හැකි වෙනත් අවප්‍රකාශ පැවතිය හැකි බවයි ; හෝ (යොමුව : අ 7 ඡේදය)<br>(ආ) විගණනයේදී සමුච්චය කරන ලද අව ප්‍රකාශවල සමාහාරය ශ්‍රී.ලං.වි.ප්‍ර. 320 ට අනුකූලව නිර්ණය කරන ප්‍රමාණාත්මක භාවයට සමීප වේ. (යොමුව : අ 8 ඡේදය) |
| 7 | විගණකගේ ඉල්ලීම පරිදි කළමනාකරණය විසින් ගණුදෙනු පන්තියක, ගිණුම් ශේෂයක හෝ හෙළිදරව් කිරීම සහ අනාවරණය කරගත් අව ප්‍රකාශ පරීක්ෂා කර ඇත්නම්, අව ප්‍රකාශ එසේම පවතීද යන්න තීරණය කිරීම සඳහා විගණක විසින් අතිරේක විගණන ක්‍රියා පටිපාටි ඉටුකළ යුතුය. (යොමුව : ~~අ 6~~ ඡේදය) | විගණකගේ ඉල්ලීම පරිදි කළමනාකරණය විසින් ගණුදෙනු පන්තියක, ගිණුම් ශේෂය හෝ හෙළිදරව් කිරීම සහ අනාවරණය කරගත් අව ප්‍රකාශ පරික්ෂා කර ඇත්නම්, අව ප්‍රකාශ එසේම පවතීද යන්න නිර්ණය කිරීම සඳහා විගණක විසින් අතිරේක විගණන ක්‍රියා පටිපාටි ඉටුකළ යුතුය. (යොමුව : අ 9 ඡේදය) |
| 8 | නීතියෙන් හෝ රෙගුලාසියකින් තහනම් කර ඇත්නම් මිස, විගණනයේදී සමුච්චය වූ සියළු අවප්‍රකාශ කළමණාකරණයේ යෝග්‍ය මට්ටමක් සමඟ කාලෝචිත පදනමක් මත විගණක විසින් සන්නිවේදනය කළ යුතුය. එම අවප්‍රකාශ නිවැරදි කිරීම සඳහා විගණක විසින් කළමණාකාරිත්වයෙන් ඉල්ලා සිටිය යුතුය. (යොමුව : ~~අ 7 – අ 9 ඡේද~~) | නීතියෙන් හෝ රෙගුලාසියකින් තහනම් කර ඇත්නම් මිස, විගණනයේදී සමුච්චය වූ සියළු අවප්‍රකාශ කළමණාකරණයේ යෝග්‍ය මට්ටමක් සමඟ කාලෝචිත පදනමක් මත විගණක විසින් සන්නිවේදනය කළ යුතුය. එම අවප්‍රකාශ නිවැරදි කිරීම සඳහා විගණක විසින් කළමණාකාරිත්වයෙන් ඉල්ලා සිටිය යුතුය. (යොමුව : අ 10 - අ 12 ඡේද) |
| 9 | විගණක විසින් සන්නිවේදනය කරන ලද අව ප්‍රකාශ සමහරක් හෝ සියල්ල නිවැරදි කිරීම කළමනාකරණය විසින් ප්‍රතික්ෂේප කරනු ලැබුවහොත්, නිවැරදි කිරීම් නොකිරීමට කළමනාකරනයේ හේතු පිළිබඳ විගණක විසින් අවබෝධයක් ලබාගත යුතු අතර, සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශ ප්‍රමාණාත්මක අව ප්‍රකාශ දැක්වීම්වලින් තොරදැයි අගය කිරීමේදී එම අවබෝධය සැළකිල්ලට ගත යුතුය. (යොමුව: ~~අ 10~~ ඡේදය) | විගණක විසින් සන්නිවේදනය කරන ලද අව ප්‍රකාශ සමහරක් හෝ සියල්ල නිවැරදි කිරීම කළමනාකරණය විසින් ප්‍රතික්ෂේප කරනු ලැබුවහොත්, නිවැරදි කිරීම් නොකිරීමට කළමනාකරණයේ හේතු පිළිබඳව විගණක විසින් අවබෝධයක් ලබාගත යුතු අතර, සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශ ප්‍රමාණාත්මක අව ප්‍රකාශ දැක්වීම් වලින් තොරදැයි අගය කිරීමේදී එම අවබෝධය සැලකිල්ලට ගත යුතුය. (යොමුව : අ 13 ඡේදය). |
| 10 Moderated | නිවැරදි නොකළ අව ප්‍රකාශ වල බලපෑම | නිවැරදි නොකළ අව ප්‍රකාශවල බලපෑම |

| විස්තරය | 2014 | 2017 |
|---|---|---|
| | තක්සේරු කිරීමට පෙර, අස්තිත්ත්වයේ තත්‍ය මූල්‍ය ප්‍රතිඵල සම්බන්ධය තුල එය එසේ පැවතීම යෝග්‍යදැයි තහවුරු කිරීමට විගණක විසින් ශ්‍රී.ලං.වි.ප්‍ර. 320 සමග අනුකූලව නිර්ණය කරන ලද ප්‍රමාණාත්මක භාවය නැවත අගය කළ යුතුය. (යොමුව : ~~අ 11 – අ 12 ඡේද~~) | තක්සේරු කිරීමට පෙර, අස්තිත්ත්වයේ තත්‍ය මූල්‍ය ප්‍රතිඵල සම්බන්ධය තුල එය එසේ පැවතීම යෝග්‍ය දැයි තහවුරු කිරීමට විගණක විසින්. ශ්‍රී.ලං.වි.ප්‍ර. 320 සමග අනුකූලව නිර්ණය කරන ලද ප්‍රමාණාත්මකභාවය නැවත අගය කළ යුතුය. (යොමුව : අ 14 - අ 15 ඡේද). |
| 11 | තනි තනිව හෝ සමාහාරයක් ලෙස ගත්කල නිවැරදි නොකල අව ප්‍රකාශ ප්‍රමාණාත්මක ද යන්න විගණක විසින් නිර්ණය කළ යුතුය. මෙම නිර්ණය කිරීමේදී විගණක විසින් සළකා බැලිය යුත්තේ:<br>(අ) විශේෂ ගණුදෙනු පන්තීන්, ගිණුම් ශේෂයන් හෝ හෙළිදරව් කිරීම් සහ සමස්තයක් වශයෙන් මූල්‍ය ප්‍රකාශ සහ ඒවා සිදු වීමේ විශේෂ තත්ත්වයන් යන දෙකම සම්බන්ධයෙන් අව ප්‍රකාශ වල ප්‍රමාණය සහ ස්වභාවය ; සහ (යොමුව : ~~අ 13 – අ 17, අ 19 – අ 20 ඡේද~~ )<br>(ආ) අදාල ගණුදෙනු කාණ්ඩ, ගිණුම් ශේෂයන් හෝ හෙළිදරව් කිරීම් සහ සමස්තයක් වශයෙන් මූල්‍ය ප්‍රකාශ වල පූර්ව කාල පරිච්ඡේදයන්ට සම්බන්ධිත නිවැරදි නොකල අව ප්‍රකාශවල බලපෑම (යොමුව : ~~අ 18~~ ඡේදය) | තනි තනිව හෝ සමාහාරයක් ලෙස ගත්කල නිවැරදි නොකල අව ප්‍රකාශ ප්‍රමාණාත්මක ද යන්න විගණක විසින් නිර්ණය කළ යුතුය. මෙම නිර්ණය කිරීමේදී විගණක විසින් සළකා බැලිය යුත්තේ:<br>(අ) විශේෂ ගණුදෙනු පන්තීන්, ගිණුම් ශේෂයන් හෝ හෙළිදරව් කිරීම් සහ සමස්තයක් වශයෙන් මූල්‍ය ප්‍රකාශ සහ ඒවා සිදු වීමේ විශේෂ තත්ත්වයන් යන දෙකම සම්බන්ධයෙන් අව ප්‍රකාශ වල ප්‍රමාණය සහ ස්වභාවය ; සහ (යොමුව : අ 16 - අ 22, අ 24 - අ 25 ඡේද )<br>(ආ) අදාල ගණුදෙනු කාණ්ඩ, ගිණුම් ශේෂයන් හෝ හෙළිදරව් කිරීම් සහ සමස්තයක් වශයෙන් මූල්‍ය ප්‍රකාශ වල පූර්ව කාල පරිච්ඡේදයන්ට සම්බන්ධිත නිවැරදි නොකල අව ප්‍රකාශවල බලපෑම (යොමුව: අ 23 ඡේදය) |
| 12 | නීතියෙන් හෝ රෙගුලාසි මඟින් තහනම් කර නැත්නම් හැර, විගණකගේ වාර්තාව තුළ මතයට විය හැකි තනි තනිව හෝ සමාහාරයක් ලෙස නිවැරදි නොකළ අවප්‍රකාශයන් ඒවායේ බලපෑම විගණක පාලනය පිළිබඳ වගකිවයුතු අය සමඟ සන්නිවේදනය කළ යුතුය. විගණකගේ සන්නිවේදනය නිවැරදි නොකරන ලද අවප්‍රකාශය තනිතනිව හඳුනාගත යුතුය. නිවැරදි නොකරන ලද ප්‍රමාණාත්මක අවප්‍රකාශ නිවැරදි කරන ලෙස විගණක ඉල්ලා සිටිය යුතුය. (යොමුව : ~~අ21 – අ 23~~ ඡේද) | නීතියෙන් හෝ රෙගුලාසි මඟින් තහනම් කර නැත්නම් හැර, විගණකගේ වාර්තාව තුල මතයට විය හැකි තනි තනිව හෝ සමාහාරයක් ලෙස නිවැරදි නොකළ අවප්‍රකාශයන් ඒවායේ බලපෑම විගණක පාලනය පිළිබඳ වගකිවයුතු අය සමඟ සන්නිවේදනය කළ යුතුය. විගණකගේ සන්නිවේදනය නිවැරදි නොකරන ලද අවප්‍රකාශය තනිතනිව හඳුනාගත යුතුය. නිවැරදි නොකරන ලද ප්‍රමාණාත්මක අවප්‍රකාශ නිවැරදි කරන ලෙස විගණක ඉල්ලා සිටිය යුතුය. (යොමුව : අ26 - අ 28 ඡේද) |
| 14 | තනි තනිව හෝ සමාහාරයක් ලෙස ගත්කල, සමස්ත මූල්‍ය ප්‍රකාශ කෙරෙහි නිවැරදි නොකළ අව ප්‍රකාශවල බලපෑම ප්‍රමාණාත්මක නොවන බවට විශ්වාස කරන්නේද යන්න පිළිබඳව කළමනාකරණයෙන් සහ සුදුසු අවස්ථා වලදී පාලනය පිළිබඳ වගකිවයුතු අයගෙන් ලිඛිත නියෝජනයක් විගණක ඉල්ලා සිටිය යුතුය. (යොමුව : ~~අ24~~ ඡේදය) | තනි තනිව හෝ සමාහාරයක් ලෙස ගත්කල, සමස්ත මූල්‍ය ප්‍රකාශ කෙරෙහි නිවැරදි නොකල අව ප්‍රකාශවල බලපෑම ප්‍රමාණාත්මක නොවන බවට විශ්වාස කරන්නේද යන්න පිළිබඳව කළමනාකරණයෙන් සහ සුදුසු අවස්ථා වලදී පාලනය පිළිබඳ වගකිවයුතු අයගෙන් ලිඛිත නියෝජනයක් විගණක ඉල්ලා සිටිය යුතුය. (යොමුව : අ29 ඡේදය) |
| 15 | විගණකවරයා විගණන ලේඛන තුළ ඇතුළත් කළ යුතුය. (යොමුව : ~~අ 25~~ ඡේදය)<br>... | විගණකවරයා විගණන ලේඛන තුළ ඇතුලත් කළ යුතුය. (යොමුව : අ 30 ඡේදය)<br>.... |
| අ1 | අව ප්‍රකාශ ප්‍රතිඵලයක් විය හැක්කේ : | අව ප්‍රකාශ ප්‍රතිඵලයක් විය හැක්කේ : |

| විස්තරය | 2014 | 2017 |
|---|---|---|
| | (අ) මූල්‍ය ප්‍රකාශ පිළියෙල කර ඇති දත්ත එක් රැස් කිරීමේ හෝ සැකසීමේ සාවද්‍යතාවය ;<br>(ආ) ~~යම් වටිනාකමක් හෝ හෙළිදරව් කිරීමක් මඟ හැරීම;~~<br>(ඇ) කරුණු නොසලකා හැරීම හෝ පැහැදිලි අව ප්‍රකාශයකින් පැන නඟින වැරදි ගිණුම් ඇස්තමේන්තුවක් සහ<br>(ඈ) ගිණුම්කරණකරණ ඇස්තමේන්තු හා සම්බන්ධ කළමනාකරණ විනිශ්චයන් විගණක විසින් අසාධාරණ යැයි සැළකීම හෝ විගණක විසින් අයෝග්‍ය යැයි සළකන ගිණුම් කරණ ප්‍රතිපත්ති තෝරා ගැනීම සහ යෙදවීම. | (අ) මූල්‍ය ප්‍රකාශ පිළියෙල කර ඇති දත්ත එක් රැස් කිරීමේ හෝ සැකසීමේ සාවද්‍යතාවය ;<br>(ආ) ප්‍රමාණවත් නොවන හෝ අසම්පූර්ණ හෙළිදරව් කිරීම ඇතුළුව යම් වටිනාකමක් හෝ හෙළිදරව් කිරීමක් සහ අදාල වන පරිදි එක්තරා මූල්‍ය වාර්තාකරණ ආකෘතිමය රාමුවල හෙළිදරව් කිරීමේ අරමුණු සපුරාලීම සඳහා අවශ්‍ය වන හෙළිදරව් කිරීම් මඟ හැරීම ; *<br>(ඇ) කරුණු නොසලකා හැරීම හෝ පැහැදිලි අව ප්‍රකාශයකින් පැන නඟින වැරදි ගිණුම්කරණ ඇස්තමේන්තුවක්.<br>(ඈ) ගිණුම්කරණ ඇස්තමේන්තු හා සම්බන්ධ කළමනාකරණ විනිශ්චයන් විගණක විසින් අසාධාරණ යැයි සැළකීම හෝ විගණක විසින් අයෝග්‍ය යැයි සළකන ගිණුම් කරණ ප්‍රතිපත්ති තෝරා ගැනීම සහ යෙදවීම.<br>(ඉ) තොරතුරු වල අයෝග්‍ය වර්ගීකරණය, සමාහරණය හෝ කොටස්වලට විසුරුවා හැරීම ; එකතු කිරීම හෝ වෙන් කිරීම ; සහ<br>(ඊ) සාධාරණ ඉදිරිපත් කිරීමේ ආකෘතිමය රාමුවකට අනුකූලව පිළියෙල කරන ලද මූල්‍ය ප්‍රකාශ සඳහා නිශ්චිතව ආකෘතිමය රාමුව මගින් අවශ්‍ය කරන හෙළිදරව් කිරීම්වලින් ඔබ්බට ගිය මූල්‍ය ප්‍රකාශ සඳහා සාධාරණ ඉදිරිපත් කිරීමක් අත්කර ගැනීම පිනිස අවශ්‍ය කරන හෙළිදරව් කිරීමක් මඟ හැරීම. **<br>වංචාවලින් පැන නඟින අව ප්‍රකාශ සඳහා උදාහරණ ශ්‍රී.ලං.වි.ප්‍ර. 240 හි ලබාදී ඇත.***<br>*උදාහරණ ලෙස, ශ්‍රී ලංකා ගිණුම්කරන ප්‍රමිතිය 7 (SLFRS), *මූල්‍ය සාධාන පත්‍ර : හෙළිදරව් කිරීම්*, 42 ඡේදයේ සඳහන් වන්නේ "යම් අස්තිත්ත්වයක් .... ඡේදයේ ඇති හෙළිදරව් කිරීමේ අරමුණු සපුරාලීම සඳහා අවශ්‍ය යයි සළකන ඕනෑම අමතර තොරතුරු හෙළිදරව් කළ යුතු බවයි. "<br><br>**උදාහරණ ලෙස, විශේෂ ගනුදෙනු සහ අස්තිත්ත්වයෙහි මූල්‍ය තත්ත්වය සහ මූල්‍ය කාර්ය සාධනය පිළිබඳ වෙනත් සිද්ධීන් සහ තත්ත්වයන්ට වල බලපෑම තේරුම් ගැනීමට පරිශීලකයින්ට හැකිවන පරිදි ශ්‍රීලගිප්‍ර හි නිශ්චිත අවශ්‍යතාවයන්ට අනුකූලවීම ප්‍රමාණවත් නොවන විට ශ්‍රීලගිප්‍ර අවශ්‍යතා අනුව අස්තිත්ත්වයට අතිරේක හෙළිදරව් කිරීම් ලබාදීමට සිදු වේ. (ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිය 1, *මූල්‍ය ප්‍රකාශ ඉදිරිපත් කිරීම* , 17 (ඇ) ඡේදය).<br><br>***ශ්‍රී.ලං.වි.ප්‍ර.240, *මූල්‍ය ප්‍රකාශ විගණනයක් කිරීමේ දී වංචාව සළකා බැලීමට අදාල* |

| විස්තරය | 2014 | 2017 |
|---|---|---|
| | | *විගණකගේ වගකීම්. අ1 - අ 6 ඡේද* |
| අ2 | ~~විගණක විසින් අව ප්‍රකාශ පැහැදිලිවම ඉතා සුළු හා සමුච්චය කිරීමට අවශ්‍ය නොවන වටිනාකමක් නියම කළ හැක්කේ, එවැනි වටිනාකමේ සමුච්චය කිරීම මූල්‍ය ප්‍රකාශ කෙරෙහි ප්‍රමාණාත්මක බලපෑමක් ඇති නොකරන බවට විගණක අපේක්ෂා කරන නිසාවෙනි. "පැහැදිලිවම ඉතා සුළු " යනු " ප්‍රමාණාත්මක නොවේ" යන්නට යෙදෙන තවත් ප්‍රකාශයක් නොවේ. පැහැදිලිවම ඉතා සුළු කාරණා ශ්‍රී.ලං.වි.ප්‍ර. 320 ට අනුකූලව තීරණය කරනු ලබන ප්‍රමාණාත්මක භාවයට වඩා සම්පූර්ණයෙන්ම වෙනස් ( ඉතා කුඩා) විශාලත්වයකින් යුක්ත වන අතර, තනි තනිව හෝ සමාහරයක් වශයෙන් ගත්කල සහ ප්‍රමාණය, ස්වභාවය හෝ තත්ත්වයන් පිළිබඳ කිසියම් නිර්නායකයකින් විනිශ්චය කරනු ලැබුවද, පැහැදිලිවම නොවැදගත් කරුණු වනු ඇත. අයිතම එකක් හෝ කීපයක් පැහැදිලිවම ඉතාසුළු කාරණාද යන්න පිළිබඳව යම් අනියතතාවයක් ඇති විට, කාරණය පැහැදිලිවම ඉතාසුළු කාරණයක් නොවන බවට සළකනු ලැබේ.~~ | " පැහැදිලව ඉතා සුළු වීම" මෙම ශ්‍රී.ලං.වි.ප්‍ර. හි 5 වන ඡේදයෙන් දක්වා ඇති පැහැදිලිවම ඉතා සුළු කරුණු හැර විගණනයේදී හඳුනාගෙන ඇති අව ප්‍රකාශ සමුච්චය කිරීම විගනක හට අවශ්‍ය වේ. " පැහැදිලිවම ඉතා සුළු" යනු " ප්‍රමාණාත්මක නොවේ" යන්නට යෙදෙන තවත් ප්‍රකාශයක් නොවේ. පැහැදිලිව ඉතා සුළු වන අවප්‍රකාශ, ප්‍රමාණාත්මක විය හැකි ලෙස තීර්ණය කරනු ලැබිය හැකි ඒවාට වඩා විශාලත්වයේ අනු පිළිවෙල අනුව සම්පූර්ණයෙන්ම වෙනස් (ඉතා කුඩා) හෝ ඒවා ස්වභාවයෙන් සම්පූර්ණයෙන්ම වෙනස් විය හැකි අතර තනි තනිව හෝ සමාහාරයක් ලෙස ගත්කල වුවද හෝ ප්‍රමාණය, ස්වභාවය අවස්ථාවන් වැනි ඕනෑම නීර්ණායකින් විනිශ්චය කලාවුවද එම අවප්‍රකාශ පැහැදිලිව නොවැදගත් වේ. අයිතම එකක් හෝ කිහිපයක් පැහැදිලිවම ඉතාසුළු කාරණාද යන්න පිළිබඳ යම් අනියතතාවයක් ඇතිවිට, අවප්‍රකාශය පැහැදිලිවම ඉතාසුළු දෙයක් නොවන බවට සළකනු ලැබේ. |
| ශීර්ෂය | [අනුරූප නොමැත] | *තනි ප්‍රකාශවල ඇති අව ප්‍රකාශ* |
| 2014 - අනුරූප ඡේද නොමැත. 2017 - අ 3 | [අනුරූප නොමැත] | තනි ප්‍රකාශවල වටිනාකම්වල අවප්‍රකාශ විගණක නියම කලහැකි වටිනාකමට පහල ඒවා පැහැදිලිව ඉතා සුළු වන අතර, එවැනි වටිනාකම් සමාහරණය කිරීමෙන් පැහැදිලිව මූල්‍ය ප්‍රකාශ මත ප්‍රමාණාත්මක බලපෑමක් තිබිය නොහැකි බව විගණක අපේක්ෂා කරණ නිසා, සමාහරණය කරනු නොලැබේ. කෙසේ වෙතත්, මෙම ශ්‍රී.ලං.වි.ප්‍ර. හි 5 වන ඡේදය මඟින් අවශ්‍ය කරන පරිදි නියම කරන ලද වටිනාකමට වඩා වැඩි වටිනාකමක් අවප්‍රකාශ වූ වටිනාකමේ සමුච්චය ලෙසට ලැබේ. ඊට අමතරව, ස්වභාවය හෝ තත්වයන්ගේ නිර්නායකයන් මත විනිශ්චය කිරීමේදී වටිනාකම්වලට සම්බන්ධ අවප්‍රකාශයන් පැහැදිලිව ඉතා සුළු නොවිය හැකි වන විට, එසේ නොවුවහොත්, මෙම ශ්‍රී.ලං.වි.ප්‍ර. හි 5 වන ඡේදය මඟින් අවශ්‍යකරන පරිදි සමුච්චය කරනු ලැබේ. |
| ශීර්ෂය | [අනුරූප නොමැත] | *හෙළිදරව් කිරීම්වල ඇති අව ප්‍රකාශ.* |
| 2014 - අනුරූප ඡේද නොමැත. 2017 - අ 4 | [අනුරූප නොමැත] | හෙළිදරව් කිරීම්වල අව ප්‍රකාශ තනිව හෝ සමාහරයක් වශයෙන් ගත්කල වුවද ප්‍රමාණය, ස්වභාවය හෝ තත්ත්වයන් පිළිබඳ යම් නිර්නායක් මඟින් විනිශ්චය කරණු ලැබුවද පැහැදිලිව එසේම ඉතා සුළු කාරණයක් විය හැකිය. පැහැදිලිව ඉතා සුළු නොවන හෙළිදරව් කිරීම් වල අවප්‍රකාශ, එසේම අදාල හෙළිදරව් කිරීම් සහ සමස්තයක් වශයෙන් මූල්‍ය ප්‍රකාශ මත ඇති එවැනි අව ප්‍රකාශ වල |

| විස්තරය | 2014 | 2017 |
|---|---|---|
| | | බලපෑම අගය කිරීමේදී සමුච්චය කිරීමට විගණකට සහායක් ලැබේ. මෙම ශ්‍රී.ලං.වි.ප්‍ර. හි අ 17 ඡේදයෙන් ගුණාත්මක හෙළිදරව් කිරීම් වල අව ප්‍රකාශ ප්‍රමාණාත්මක විය හැකි බවට වන අවස්ථාවන්හි උදාහරණ ලබාදෙයි. |
| ශීර්ෂය | [අනුරූප නොමැත] | *අව ප්‍රකාශ කිරීම් සමුච්චය කිරීම.* |
| 2014 - අනුරූප ඡේද නොමැත. 2017 - අ 5 | [අනුරූප නොමැත] | අ 3 - අ 4 ඡේදවල විස්තර කර ඇති පරිදි ස්වභාවය හෝ තත්ත්වයන් මගින් සමුච්චය වී ඇති අව ප්‍රකාශ වීම් වටිනාකම්වල අවප්‍රකාශකම් අවස්ථාවකදී එසේ කළ හැකි වුවත් එකට එකතු කළ නොහැක. එසේ වුවද, මෙම ශ්‍රී.ලං.වි. ප්‍ර. 11 වන ඡේදය මගින් අවශ්‍ය කරන පරිදි විගණක විසින් එම අව ප්‍රකාශ තනිව හා සමාහරයක් වශයෙන් (එනම් වෙනත් අව ප්‍රකාශ සමඟ සාමූහිකව) ඒවා ප්‍රමාණාත්මකදැයි නිර්ණය කිරීමට අගය කිරීමට අවශ්‍ය කෙරේ. |
| 2014- අ 3 2017- අ 6 | .... • ~~විනිශ්චයට අදාල වූ අව ප්‍රකාශ යනු විගණක විසින් අසාධාරණ යැයි සළකනු ලබන හෝ ගිණුම්කරණ ප්‍රතිපත්ති තෝරාගැනීම සම්බන්ධයෙන් කළමනාකරණයේ විනිශ්චයන් ගෙන් පැන නගින හෝ විගණක විසින් අයෝග්‍ය යැයි සළකනු ලබන ගිණුම්කරන ප්‍රතිපත්ති තෝරාගැනීමේ හෝ ව්‍යවහාර කිරීමේ වෙනස්කම් .~~ ..... | .... • විනිශ්චයට අදාල වූ අව ප්‍රකාශ යනු විගණක විසින් අසාධාරන හෝ අයෝග්‍ය යැයි සළකනු ලබන මූල්‍ය ප්‍රකාශ වල (ගිණුම්කරණ ප්‍රතිපත්ති තෝරා ගැනීම හෝ යෙදවීම ඇතුළුව) හඳුනාගැනීම, මැනීම, ඉදිරිපත් කිරීම ඒවාට සැලකිලිමත් වීමක් සහ හෙළිදරව් කිරීම ඇතුළුව කළමනාකරණයේ විනිශ්චයන් ගෙන් පැන නගින වෙනස්කම්ය. .... |
| 2014 - අ 7 2017 - අ 10 | යෝග්‍ය කළමනාකරණ මට්ටමට කාලෝචිත ලෙස අවප්‍රකාශ සන්නිවේදනය කිරීම වැදගත් වන්නේ ~~අවප්‍රකාශයන් හි අයිතම~~ යන්න අගය කිරීමට හැකිවීමට හෝ , එකඟ නොවන්නේ නම් විගණකවරයා ට දැනුම් දීමටත් අවශ්‍ය පරිදි පියවර ගැනීමටත් කළමනාකරණයට හැකියාව ඇති කරන බැවිනි. සාමාන්‍යයෙන්, යෝග්‍ය කළමනාකරණ මට්ටම යනු අව ප්‍රකාශ ඇගයීමට සහ අවශ්‍ය පියවර ගැනීමට වගකීම සහ අධිකාරිය ඇති අය වේ. | ගණුදෙනු පන්තීන්, ගිණුම් ශේෂයන් සහ හෙළිදරව් කිරීම් අව ප්‍රකාශ වී ඇත්දැයි අගය කිරීමට එය හා එකඟ නොවන්නේ නම් විගණකවරයා දැනුවත් කිරීමටත්, අවශ්‍ය පරිදි පියවර ගැනීමට එය කළමනාකරණයට හැකිවන පරිදි යෝග්‍ය කළමනාකරන මට්ටමට අවප්‍රකාශ කාලෝචිත සන්නිවේදනය වැදගත් වේ. සාමාන්‍යයෙන්, යෝග්‍ය කළමනාකරණ මට්ටම යනු අවප්‍රකාශ ඇගයීමට සහ අවශ්‍ය පියවර ගැනීමට වගකීම සහ අධිකාරි ඇති අය වේ. |
| 2014- අ 13 2017- අ 16 | එම සැළකිය යුතු තරමේ පන්තියේ ගනුදෙනු වල ගිණුම් ශේෂ හෝ හෙළිදරව් කිරීමක් සඳහා ප්‍රමාණාත්මක මට්ටමක් ඉක්මවා ඇත් ද යන්න ඇතුළුව, සෑම තනි අව ප්‍රකාශයක්ම අදාල ගනුදෙනු, ගිණුම් ශේෂ හෝ හෙළිදරව් කිරීම් පන්තීන් මත එහි බලපෑම අගය කිරීමට කරුණු සළකා බැලීමෙන් තීරණය කෙරේ. | එම සැලකිය යුතු තරමේ පන්තියේ ගනුදෙනු වල ගිණුම් ශේෂ හෝ හෙළිදරව් කිරීමක් සඳහා ප්‍රමාණාත්මක මට්ටම ඉක්මවා ඇත්ද යන්න ඇතුළුව, සෑම තනි අවප්‍රකාශයකම වටිනාකම අදාල ගණු දෙනු, ගිණුම් ශේෂ හෝ හෙළිදරව් කිරීම් පන්තීන් මත එහි බලපෑම අගය කිරීමට කරුණු සළකා බැලීමෙන් තීරණය කෙරේ. |
| 2014-අනුරූප ඡේද නොමැත. 2017 - අ 17 | [අනුරූප නොමැත] | ඊට අමතරව, ගුණාත්මක හෙළිදරව්වක සෑම තනි අව ප්‍රකාශ අදාල හෙළිදරව් කිරීම(ම්) කෙරෙහි වන එහි බලපෑම මෙන්ම සමස්තයක් වශයෙන් මූල්‍ය ප්‍රකාශ මත වන එහි සමස්ත බලපෑම තක්සේරු කිරීමට සළකා බලනු ලැබේ. අදාල මූල්‍ය වාර්තාකරණ ආකෘතිමය |

| විස්තරය | 2014 | 2017 |
|---|---|---|
| | | රාමුවේ සන්දර්භය තුළ සහ අස්තිත්ත්වයේ විශේෂිත තත්ත්වයන් තුළ ගුණාත්මක හෙළිදරව්වක අව ප්‍රකාශ(ය) ප්‍රමාණාත්මක ද යන්න තීරණය කිරීම වෘත්තීය විනිශ්චය ක්‍රියාත්මක කිරීම හා සම්බන්ධ කාරණයකි. එවැනි අව ප්‍රකාශ ප්‍රමාණාත්මක විය හැකිවන උදාහරණවලට ඇතුළත් වන්නේ :<br>• රක්ෂණ සහ බැංකු කටයුතු පිළිබඳ අස්තිත්ත්ව සඳහා ප්‍රාග්ධනය කළමනාකරණය කිරීමේ අරමුණු, ප්‍රතිපත්ති සහ ක්‍රියාවලීන් පිළිබඳ තොරතුරුවල සාවද්‍ය හෝ අසම්පූර්ණ විස්තර.<br>• පතල් කැනීම් ආශ්‍රිත අස්තිත්ත්වයක හානිකරණ අලාභ සිදුවීමට හේතු වූ සිද්ධීන් හෝ තත්ත්වයන් පිළිබඳ තොරතුරු මඟ හැරීම. (උදා : ලෝහ හෝ වෙළඳ භාණ්ඩ සඳහා ඇති ඉල්ලුමේ සැලකිය යුතු දිගු කාලීන අඩු වීමක්).<br>• මූල්‍ය තත්ත්ව ප්‍රකාශයේ විස්තීර්ණ ආදායම් ප්‍රකාශය, ස්කන්ධය වෙනස්වීම් ප්‍රකාශය හෝ මුදල් ප්‍රවාශ ප්‍රකාශ තුළ සැලකිය යුතු අන්දමේ සම්බන්ධිත ගිණුම්කරණ ප්‍රතිපත්තියක් පිළිබඳ වැරදි විස්තරයක්.<br>• ජාත්‍යන්තර වෙළඳ කටයුතු සිදු කරන අස්තිත්ත්වයක විනිමය අනුපාතිකයේ සංවේදීතාව පිළිබඳ ප්‍රමාණවත් නොවන විස්තරයක්. |
| 2014 - අනුරූප ඡේද නොමැත. 2017 - අ 18 | [අනුරූප නොමැත] | මෙම ශ්‍රීලවිප්‍ර යේ 11 වන ඡේදය මඟින් අවශ්‍යතාමත, නිවැරදි නොකළ අවප්‍රකාශ, ස්වභාවයෙන්ම ප්‍රමාණාත්මකදැයි තීර්ණය කිරීමේදි, නිවැරදි නොකල අවප්‍රකාශවල වටිනාකම් සහ හෙළිදරව් කිරීම් විශේෂ සැලකිල්ලට ගනි. එවැනි අව ප්‍රකාශ එක්කෝ තනිව හෝ වෙනත් අව ප්‍රකාශ සමඟ සංයෝජනයක් ලෙස ගත්කල ප්‍රමාණාත්මක දැයි සළකා බැලිය හැකිය. උදාහරණ වශයෙන්, හෙළිදරව් කිරීම් තුළ හඳුනාගෙන ඇති අව ප්‍රකාශ මත පදනම්ව, විගණක විසින් පහත සඳහන් කරුණු සළකා බැලිය හැකිය.<br>(අ) හඳුනාගත් දෝෂ නිරන්තරව හෝ පෘථුලව පවතීද; හෝ<br>(ආ) හඳුනාගත් අව ප්‍රකාශ ගණනාවක් එකම කාරණයකට අදාළ වන අතර, සාමූහිකව සළකා බැලීමෙන් එම කාරණය පිළිබඳ පරිශිලකයින්ගේ අවබෝධයට බලපෑ හැකිය .<br>ශ්‍රී.ලං.වි.ප්‍ර. 700 (සංශෝධිත) හි 13 (ඇ) ඡේදය සමඟ අනුකූලව මූල්‍ය ප්‍රකාශ ඇගයීමේදී සමුච්චිත අව ප්‍රකාශ සළකා බැලීමේදී අදාළ නොවන හෝ අපැහැදිලි තොරතුරු ඇතුළත් කිරීමෙන් හෙළිදරව් කළ කරුණු පිළිබඳ නිසි අවබෝධයක් ලබාගත නොහැකි ලෙස |

| විස්තරය | 2014 | 2017 |
|---|---|---|
| | | මූල්‍ය ප්‍රකාශවල සමස්ත ඉදිරිපත් කිරීම පිළිගැනීමට රහසින් හානිකර වී ඇත්දැයි විගණක විසින් සලකා බැලීමේදී එලෙසම උපකාරි වේ. |
| 2014 - අ 16<br>2017 - අ 21 | .....<br>විගණනය කරන ලද ~~මූල්‍ය ප්‍රකාශ වල අඩංගු ලේඛන වල සන්නිවේදනය කෙරෙන~~ වෙනත් තොරතුරු (උදාහරණ ලෙස, "කළමනාකරණ සාකච්ඡාව සහ විශ්ලේෂණය " හෝ " මෙහෙයුම් හා මූල්‍ය සමාලෝචනයට" ඇතුළත් කළ යුතු තොරතුරු) මූල්‍ය ප්‍රකාශ පරිශීලකයින්ගේ ආර්ථික තීරණවලට බලපෑම් කරණු ඇතැයි සාධාරණ ලෙස අපේක්ෂා කළ හැකිය. ~~විගණනය කරන ලද මූල්‍ය ප්‍රකාශ අඩංගු ලේඛන වල විගණක හට වාර්තා කිරිමට බැඳීමක් නොමැති වෙනත් තොරතුරු විගණක විසින් සළකා බැලීම සම්බන්ධයෙන් ශ්‍රී.ලං.වි.ප්‍ර. 720 * කටයුතු කරයි.~~<br>......<br>* ~~ශ්‍රී.ලං.වි.ප්‍ර. 720, විගණනය කරන ලද මූල්‍ය ප්‍රකාශ අඩංගු ලේඛන වල වෙනත් තොරතුරු සම්බන්ධ විගණක ගේ වගකීම්.~~ | ....<br>අස්තිත්ත්වයේ වාර්ෂික වාර්තාව තුළ ඇතුලත් කළයුතු ලෙසට බලපානු ලබන වෙනත් තොරතුරු (උදාහරණ ලෙස, " කළමනාකරන සාකච්ඡාව සහ විශ්ලේෂණය " හෝ " මෙහෙයුම් හා මූල්‍ය සමාලෝචනයට "ඇතුළත් කළයුතු තොරතුරු") මූල්‍ය ප්‍රකාශ පරිශිලකයින්ගේ ආර්ථික තීරණවලට බලපෑම් කරනු ඇතැයි සාධාරණ ලෙස අපේක්ෂා කළ හැකිය. ශ්‍රී.ලං.වි.ප්‍ර. 720 (සංශෝධිත) ** වෙනත් තොරතුරුවලට සම්බන්ධිත විගණකගේ වගකීම් සමඟ කටයුතු කරයි.<br>** ශ්‍රී.ලං.වි.ප්‍ර. 720 (සංශෝධිත), වෙනත් තොරතුරුවලට හා සම්බන්ධ විගණකගේ වගකීම්. |
| 2014 - අ 17<br>2017 - අ 22 | මූල්‍ය ප්‍රකාශයන්ට සාපේක්ෂව අවප්‍රකාශ වීමේ ප්‍රමාණය ප්‍රමාණාත්මක නොවූවත්, අව ප්‍රකාශයක හෝ වියහැකි, හැඟවීම් කරන්නේ කෙසේද, වංචාවේ ප්‍රතිඵලය විගණනයේ වෙනත් අංග සම්බන්ධයෙන් සළකා බැලිය යුත්තේ කෙසේද යන්න ශ්‍රී.ලං.වි.ප්‍ර. 240 මගින් පැහැදිලි කරයි. | මූල්‍ය ප්‍රකාශයන්ට සාපේක්ෂව අවප්‍රකාශවීමේ ප්‍රමානවීමේ ප්‍රමාණය ප්‍රමාණාත්මක නොවූවත්, අව ප්‍රකාශයක, හෝ වියහැකි හැඟවීම් කරන්නේ කෙසේද, වංචාවේ ප්‍රතිඵලය විගණනයේ වෙනත් අංග සම්බන්ධයෙන් සළකා බැලිය යුත්තේ කෙසේද යන්න ශ්‍රී.ලං.වි.ප්‍ර. 240 මගින් පැහැදිලි කරයි. තත්ත්වයන් මත පදනම්ව, හෙළිදරව් කිරීම් වල අව ප්‍රකාශද වංචාවන්ට හැඟවීම් කළ හැකි අතර, උදාහරණයක් ලෙස පැන නැගිය හැක්කේ :<br>• කළමනාකරණයේ විනිශ්චයන්හි පක්ෂග්‍රාහී බව හේතුවෙන් ඇතිවූ නොමග යවන හෙළිදරව් කිරීම් හෝ<br>• මූල්‍ය ප්‍රකාශවල ඇති කරුණු පිළිබඳ නිසි අවබෝධයක් නොවටහා ගැනීමට අපේක්ෂා කරන පරිදි වූ විස්තීර්ණ අනුපිටපත් හෝ වැදගත් තොරතුරු නොදැක්වෙන හෙළිදරව් කිරීම් මින් අදහස් කෙරේ.<br>ගනුදෙනු, ගිණුම් ශේෂයන් සහ හෙළිදරව් කිරීම් යන පංතිවල අව ප්‍රකාශයන් හි හැඟවීම් සළකා බැලීමේදී විගණක ශ්‍රී.ලං.වි.ප්‍ර. 200 ට අනුකූලව වෘත්තීය සංශය දෘෂ්ඨිය ක්‍රියාත්මක කරයි. *<br>* ශ්‍රී.ලං.වි.ප්‍ර. 200, 15 වන ඡේදය. |
| **ශ්‍රී ලංකා විගණන ප්‍රමිත 500 (ශ්‍රී.ලං.වි.ප්‍ර. 500 - විගණන සාක්ෂි)** | | |
| 5 (ඇ) | විගණන සාක්ෂි - විගණකගේ මතයට පදනම් වූ නිගමනවලට එළඹීමේදී විගණක විසින් භාවිතා කරන තොරතුරුය. විගණන සාක්ෂි වලට මූල්‍ය ප්‍රකාශ සහ ~~වෙනත් තොරතුරු~~ පාදක කරගත් ගිණුම් වාර්තාවල අඩංගු | විගණන සාක්ෂි - විගණකගේ මතයට පදනම් වූ නිගමනවලට එළඹීමේදී විගණක විසින් භාවිතා කරන තොරතුරුය. විගණන සාක්ෂි වලට මූල්‍ය ප්‍රකාශ පාදක කරගත් ගිණුම් වාර්තාවල අඩංගු තොරතුරු සහ වෙනත් |

<table>
<tr><th>විස්තරය</th><th>2014</th><th>2017</th></tr>
<tr><td></td><td>තොරතුරු යන දෙකම ඇතුළත් වේ.</td><td>ප්‍රභවයන්ගෙන් ලබාගත් තොරතුරු ඇතුළත් වේ.</td></tr>
<tr><td colspan="3">ශ්‍රී ලංකා විගණන ප්‍රමිත 501 (ශ්‍රීලවිප්‍ර 501 විගණන සාක්ෂි - තෝරාගත් අයිතමයන් සඳහා වූ නිශ්චිත සැළකිල්ලට ගැනීම.)</td></tr>
<tr><td>11</td><td>(අ) අස්තිත්ත්වයේ බාහිර නීති උපදේශකයින් සමඟ සන්නිවේදනය කිරීමට හෝ හමුවීමට විගණකට අවසර දීම කළමනාකරණය විසින් ප්‍රතික්ෂේප කරයි නම්, හෝ අස්තිත්ත්වයේ බාහිර නීති උපදේශක විසින් විමසීම් ලිපියට යෝග්‍ය පරිදි ප්‍රතිචාර දැක්වීමට ප්‍රතික්ෂේප කිරීම හෝ ප්‍රතිචාර දැක්වීම තහනම් කර ඇත්නම්; සහ<br>(ආ) විකල්ප විගණන ක්‍රියා පටිපාටි සිදු කිරීමෙන් විගණක හට ප්‍රමාණවත්, යෝග්‍ය විගණන සාක්ෂි ලබාගත නොහැකි වන්නේ නම්, ~~විගණක ශ්‍රී.ලං.වි.ප්‍ර. 705 ට අනුකූලව විගණකගේ වාර්තාවේ මතය විකරණය කළ යුතුය.~~</td><td>(අ) අස්තිත්ත්වයේ බාහිර නීති උපදේශකයින් සමඟ සන්නිවේදනය කිරීමට හෝ හමුවීමට විගණකට අවසර දීම කළමනාකරණය විසින් ප්‍රතික්ෂේප කරයි නම්, හෝ අස්තිත්ත්වයේ බාහිර නීති උපදේශක විසින් විමසීම් ලිපියට යෝග්‍ය පරිදි ප්‍රතිචාර දැක්වීමට ප්‍රතික්ෂේප කිරීම හෝ ප්‍රතිචාර දැක්වීම තහනම් කර ඇත්නම්; සහ<br>(ආ) විකල්ප විගණන ක්‍රියා පටිපාටි සිදු කිරීමෙන් විගණක හට ප්‍රමාණවත්, යෝග්‍ය විගණන සාක්ෂි ලබාගත නොහැකි වන්නේ නම්,<br>විගණක ශ්‍රී.ලං.වි.ප්‍ර. 705 (සංශෝධිත) සමඟ අනුකූලව විගණකගේ වාර්තාවේ මතය විකරණය කළ යුතුය.</td></tr>
<tr><td colspan="3">ශ්‍රී ලංකා විගණන ප්‍රමිත 505 (ශ්‍රී.ලං.වි.ප්‍ර. 505 - බාහිර තහවුරු කිරීම්)</td></tr>
<tr><td colspan="3">වෙනස්කම් නොමැත.</td></tr>
<tr><td colspan="3">ශ්‍රී ලංකා විගණන ප්‍රමිත 510 (ශ්‍රී.ලං.වි.ප්‍ර. 510 ආරම්භක විගණන කාර්යභාර - ආරම්භක ශේෂ)</td></tr>
<tr><td>පරිශිෂ්ඨය</td><td>(යොමුව : අ 8 ඡේදය)<br>~~විකරණය කරන ලද මතයක් සහිත විගණකවරුන්ගේ වාර්තා පිළිබඳ නිදර්ශන.~~<br><br>~~1 වන නිදර්ශනය,~~<br>~~අ 8 (අ) ඡේදයේ විස්තර කර ඇති තත්ත්වයන්ට පහත සඳහන් දේ ඇතුලත් වේ ;~~<br>▪ ~~ප්‍රවර්තන කාල පරිච්ඡේදය ආරම්භයේදී විගණක විසින් භෞතික තොග ගණන් ගැනීම නිරීක්ෂණය නොකළ අතර, තොගවල ආරම්භක ශේෂයන් පිළිබඳව ප්‍රමාණවත් යෝග්‍ය විගණන සාක්ෂි ලබා ගැනීමට නොහැකි විය.~~<br>▪ ~~තොගයේ ආරම්භක ශේෂයන් සම්බන්ධයෙන් ප්‍රමාණවත්, සුදුසු විගණන සාක්ෂි ලබා ගැනීමට නොහැකි වීමෙන් ඇති විය හැකි බලපෑම් ප්‍රමාණාත්මක යැයි සළකනු ලබන නමුත් අස්තිත්ත්වයේ මූල්‍ය කාර්ය සාධනය සහ මුදල් ප්‍රවාහයට එය පෘතුල නොවේ.~~[1]<br>▪ ~~වසර අවසානයේ මූල්‍ය තත්ත්වය සාධාරණ ලෙස ඉදිරිපත් කෙරේ.~~<br>▪ ~~මෙම විශේෂ අධිකරණ ප්‍රදේශය තුළ මූල්‍ය කාර්ය සාධනය සහ~~</td><td>(යොමුව : අ 8 ඡේදය)<br>විකරණය කරන ලද මතයක් සහිත විගණකවරුන්ගේ වාර්තා පිළිබඳ නිදර්ශන.<br>සටහන :<br>මෙම නිදර්ශනාත්මක විගණකගේ වාර්තා පුරාවටමය, මතය අංශය පළමුව ස්ථානගත කර ඇත්තේ ශ්‍රී.ලං.වි.ප්‍ර. 700 (සංශෝධිත) අනුව සහ මතය සඳහා වූ පදනම කොටස මතය අංශයට පසුව වහාම ස්ථානගත කර ඇත. එසේම විගණකගේ වගකීම් අංශයට ඇතුලත්කල දැනට පවතින පළමු හා අවසාන වාක්‍යය නව මතය සඳහා වූ පදනම කොටසේ කොටසක් ලෙස දැන් අන්තර්ගත කර ඇත.<br><br>1 වන නිදර්ශනය :<br><br>මෙම නිදර්ශනාත්මක විගණකගේ වාර්තාවේ අරමුණු සඳහා පහත දැක්වෙන තත්ත්වයන් උපකල්පනය කෙරේ.<br><br>• සාධාරණ ඉදිරිපත් කිරීමේ ආකෘතිමය රාමුවක් භාවිතා කරමින් ලැයිස්තුගත අස්තිත්ත්වයක් හැර වෙනත් අස්තිත්ත්වයක සම්පූර්ණ මූල්‍ය ප්‍රකාශ කට්ටලකය විගණනය, විගණනය සමූහ විගණනයක් නොවේ. (එනම්, ශ්‍රී.ලං.වි.ප්‍ර. 600[13] අදාළ නොවේ.)</td></tr>
</table>

| විස්තරය | 2014 | 2017 |
|---|---|---|
| | ~~මුදල් ප්‍රවාහ පිළිබඳව කොන්දේසි සහිත මතයක් සහ මූල්‍ය තත්ත්වය සම්බන්ධයෙන් විකරණය නොකරන ලද මතයක් ලබාදීම නීතිය හා රෙගුලාසි මඟින් විගණකහට තහනම්ය.~~<br><br>~~ස්වාධීන විගණකගේ වාර්තාව.~~<br>~~[යෝග්‍ය පරිදි අමතන අය]~~<br><br>~~මූල්‍ය ප්‍රකාශ මත වාර්තාව~~ [2]<br>~~ABC සමාගමෙහි 20X1 දෙසැම්බර් 31 වන දිනට මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය සහ එම දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා විස්තීර්ණ ආදායම් ප්‍රකාශය, ස්කන්ධයෙහි වෙනස්වීම් ප්‍රකාශය මුදල් ප්‍රවාහ ප්‍රකාශය, සහ සැළකිය යුතු ගිණුම්කරණ ප්‍රතිපත්ති වල සහ වෙනත් පැහැදිලි කිරීමේ තොරතුරු වල සාරාංශයක් ඇතුලත් මේ සමඟ ඇති මූල්‍ය ප්‍රකාශ අප විසින් විගණනය කරන ලදී.~~<br><br>*~~මූල්‍ය ප්‍රකාශ සඳහා කළමනාකරණයේ~~ [3] ~~වගකීම.~~*<br><br>~~ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත සමඟ~~[4] ~~අනුකූලව මෙම මූල්‍ය ප්‍රකාශ පිළියෙල කිරීම සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ, වංචා හෝ වැරදි හේතුවෙන් ප්‍රමානාත්මක අව ප්‍රකාශයන්ගෙන් තොර මූල්‍ය ප්‍රකාශ සැකසීමට හැකි වීම සඳහා කළමනාකරණය විසින් නිර්ණය කරනු ලබන අභ්‍යන්තර පාලන කළමනාකරණය වගකිව යුතුය.~~<br><br>*~~විගණකගේ වගකීම.~~*<br><br>~~අපගේ වගකීම වන්නේ අප විසින් කල විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශ පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමයි. අපගේ විගණනය ශ්‍රී ලංකා විගණන ප්‍රමිතීන්ට අනුකූලව අප මෙහෙයවන ලදී. එම ප්‍රමිතීන්ට අනුව අප ආචාර ධර්ම අවශ්‍යතාවයන්ට අනුකූලව මූල්‍ය ප්‍රකාශ ප්‍රමාණාත්මක අව ප්‍රකාශයකින් තොරද යන්න පිළිබඳව සාධාරණ සහතිකවීමක් ලබා ගැනීමට සඳහා විගණනය සැලසුම් ඉටු කිරීම අවශ්‍ය කෙරේ.~~<br>~~විගණනයකට මූල්‍ය ප්‍රකාශ තුල ඇති වටිනාකම් හා හෙළිදරව් කිරීම් පිළිබඳ විගණන සාක්ෂි ලබා ගැනීම සඳහා වූ ක්‍රියා පටිපාටි ඉටු කිරීම අවශ්‍ය කෙරේ. තෝරාගත් ක්‍රියා පටිපාටීන් රඳා පවතින්නේ වංචා හෝ වැරදි නිසා මූල්‍ය ප්‍රකාශ ප්‍රමාණාත්මක අව ප්‍රකාශ වීමේ අවදානම් තක්සේරු කිරීම ඇතුළු විගණකගේ විනිශ්චය මතය. එම අවදානම් තක්සේරු කිරීම් වලදී විගණක~~ | • මූල්‍ය ප්‍රකාශ පිළියෙල කරනු ලබන්නේ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති සමඟ (පොදු අරමුණු සඳහා වන ආකෘතිමය රාමුවකට) අනුකූලව අස්තිත්ත්වයේ කළමනාකරණය විසිනි.<br>• විගණන කාර්ය භාරයේ නියමයන් මගින් ශ්‍රී.ලං.වි.ප්‍ර. 210[14] හි මූල්‍ය ප්‍රකාශ සඳහා කළමනාකරණයේ වගකීම පිළිබඳ විස්තර පිළිබිඹු වේ.<br>• ප්‍රවර්තන කාල පරිච්ඡේදය ආරම්භයේදී විගණක විසින් භෞතික තොග ගණන් ගැනීම නිරීක්ෂනය නොකළ අතර, තොගයේ ආරම්භක ශේෂයන් පිළිබඳ ප්‍රමාණවත් යෝග්‍ය විගණන සාක්ෂි ලබා ගැනීමට නොහැකි විය.<br>• තොගයේ ආරම්භක ශේෂයන් සම්බන්ධයෙන් ප්‍රමාණවත් යෝග්‍ය විගණන සාක්ෂි ලබා ගැනීමට නොහැකි වීමෙන් ඇතිවිය හැකි බලපෑම් ප්‍රමාණාත්මක යැයි සළකනු ලබන නමුත් අස්තිත්ත්වයේ මූල්‍ය කාර්ය සාධනය සහ මුදල් ප්‍රවාහයට එය පෘථුල නොවේ[15].<br>• වසර අවසානයේ මූල්‍ය තත්ත්වය සාධාරණ ලෙස ඉදිරිපත් කර ඇත.<br>• මෙම විශේෂ අධිකරණ බල ප්‍රදේශය තුළ, මූල්‍ය කාර්ය සාධනය සහ මුදල් ප්‍රවාහයන් සම්බන්ධයෙන් කොන්දේසි සහිත මතයක් සහ මූල්‍ය තත්ත්වය සම්බන්ධයෙන් විකරණය නොකරන ලද මතයක් ලබාදීම නීතිය හා රෙගුලාසි මගින් විගණක හට තහනම්ය.<br>• විගණනයට ව්‍යවහාර මත අදාළ වන ආචාර ධර්ම අවශ්‍යතා වනුයේ අධිකරණ බල ප්‍රදේශය අයත් එම දේවල් වේ.<br>• ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව, විගණක විසින් නිගමනය කර ඇත්තේ ශ්‍රී.ලං.වි.ප්‍ර. 570 (සංශෝධිත)[16] ට අනුකූලව අඛන්ඩ පැවැත්ම ලෙස දිගටම පවත්වාගෙන යාම අස්තිත්ත්වයේ හැකියාව මත සැළකිය යුතු සැකයක් ඇතිකල හැකි අන්දමේ සිදුවීම් හෝ තත්ත්වයන් සම්බන්ධිත ප්‍රමාණාත්මක අනියත තාවයක් නොමැති බවයි.<br>• ශ්‍රී.ලං.වි.ප්‍ර. 701[17] ට අනුකූලව |

| විස්තරය | 2014 | 2017 |
|---|---|---|
| | විසින් තත්ත්වයන් තුළ යෝග්‍ය විගණන ක්‍රියා පටිපාටි සැලසුම් කිරීමට හැකිවීම. සඳහා අස්තිත්ත්ව මූල්‍ය ප්‍රකාශ පිළියෙල කිරීම සහ සාධාරණ ඉදිරිපත් කිරීම[5] ට අදාළ අභ්‍යන්තර පාලනය සළකා බලන නමුත් එය අස්තිත්ත්වයේ අභ්‍යන්තර පාලනයෙහි[6] සඵලදායිතාවය පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමේ අරමුණ සඳහා නොවේ. විගණනයකට එසේම ඇතුලත් වන්නේ ගිණුම්කරණ ප්‍රතිපත්තිවල යෝග්‍යතාවය සහ කළමනාරණය විසින් සිදු කරන ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරනත්වය ඇගයීම් මෙන්ම මූල්‍ය ප්‍රකාශවල සමස්ත ඉදිරිපත් කිරීම ඇගයීමය.<br>අපගේ කොන්දේසි සහිත විගණන මතයට පදනමක් ලබාදීම සඳහා අප ලබාගත් විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ යෝග්‍ය යැයි අප විශ්වාස කරමු.<br><br>*කොන්දේසි සහිත මතය සඳහා පදනම.*<br><br>20x1 ජූනි 30 වන දින අප සමාගමේ විගණක වරුන් ලෙස පත් කරන ලද අතර, එම නිසා වසර ආරම්භයේදී භෞතික තොග ගණන් ගැනීම නිරීක්ෂණය නොකළේය. 20x0 දෙසැම්බර් 31 වන දින පැවති තොග ප්‍රමාණ සම්බන්ධයෙන් අපට විකල්ප මාර්ගයන්ගෙන් සෑහීමට පත්වීමට නොහැකි විය. ආරම්භක තොග මූල්‍ය කාර්ය සාධනය සහ මුදල් ප්‍රවාහ නිර්ණය කිරීමට ඇතුලත් කරන හෙයින් විස්තීර්ණ ආදායම් ප්‍රකාශයෙහි වාර්තා වූ වර්ෂය සඳහා වූ ලාභය හා මුදල් ප්‍රවාශ ප්‍රකාශයේ වාර්තා වූ මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ලැබෙන ශුද්ධ මුදල් ප්‍රවාහයන් සම්බන්ධයෙන් ගැලපීම් අවශ්‍ය විය හැකිද යන්න අපට නිර්ණය කිරීමට නොහැකි විය.<br><br>*කොන්දේසි සහිත මතය*<br><br>අපගේ මතය අනුව කොන්දේසි සහිත මතය සඳහා පදනම ඡේදයෙහි විස්තර කර ඇති කරුණෙන් ඇතිවිය හැකි බලපෑම් හැර, ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති සමඟ අනුකූලව 20x1 දෙසැම්බර් 31 දිනට ABC සමාගමෙහි මූල්‍ය තත්ත්වය සහ එම දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්ය සාධනය, සහ එහි මුදල් ප්‍රවාහයන් මූල්‍ය ප්‍රකාශන සෑම ප්‍රමාණාත්මක අංගයන්ගෙන් සාධාරණ ලෙස(*හෝ සත්‍ය සහ සාධාරණ දර්ශනයක් ගෙන එන* ) ඉදිරිපත් කරයි.<br><br>*වෙනත් කරුණු :* | **ප්‍රධාන විගණන කරුණු සන්නිවේදනය කිරීම විගණක හට අවශ්‍ය නොවන අතර, වෙනත් ආකාරයකින් එය කිරීමට තීරණය කර නැත.**<br>• **විගණකගේ වාර්තාවේ දිනට පෙර විගණක විසින් වෙනත් සියළුම තොරතුරු ලබාගෙන ඇති අතර, එම වෙනත් තොරතුරු ප්‍රමාණාත්මක අවප්‍රකාශයක් හඳුනාගෙන නොමැත.**<br>• **අනුරූප සංඛ්‍යා ඉදිරිපත් කරනු ලබන අතර පූර්ව කාල පරිච්ඡේදයේ මූල්‍ය ප්‍රකාශ විගණනය කර ඇත්තේ පූර්වගාමී විගණක විසිනි. අනුරූප සංඛ්‍යා පිළිබඳ පූර්වගාමී විගණකගේ වාර්තාව වෙත යොමු කිරීම විගණක වරයාට නීතියෙන් හෝ රෙගුලාසියෙන් තහනම් කර නොමැති අතර, එසේ කිරීමට තීරණය කර ඇත.**<br>• **මූල්‍ය ප්‍රකාශ අධීක්ෂණය කිරීම සඳහා වගකිව යුතු අය මූල්‍ය ප්‍රකාශ පිළියෙල කිරීම සඳහා වගකිව යුතු අයගෙන් වෙනස් වේ.**<br>• **මූල්‍ය ප්‍රකාශ විගණනයට අමතරව, දේශීය නීතිය යටතේ අවශ්‍ය වෙනත් වාර්තාකරණ වගකීම් විගණකවරයාට ඇත.**<br><br>**ස්වාධීන විගණකගේ වාර්තාව**<br><br>ABC සමාගමේ කොටස් හිමියන් වෙත.<br>[හෝ වෙනත් යෝග්‍ය පරිදි අමතන අය]<br>මූල්‍ය ප්‍රකාශයන්හි විගණනය මත වාර්තාව[18]<br><br>කොන්දේසි සහිත මතය.<br>අප ABC සමාගමේ (සමාගම) 20x1 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය සහ එම දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා විස්තීර්ණ ආදායම් ප්‍රකාශය, ස්කන්ධයෙහි වෙනස්වීම් ප්‍රකාශය සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශය සහ වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවල සාරාංශයක් ඇතුළුව මූල්‍ය ප්‍රකාශවල සටහන්වලින් සමන්විත මූල්‍ය ප්‍රකාශ විගණනය කරන ලදී.<br>අපගේ මතය අනුව, අපගේ වාර්තාවේ කොන්දේසි සහිත මතය සඳහා පදනම මත කොටසෙහි විස්තර කර ඇති කරුණෙන් විය හැකි බලපෑම් හැර, මේ සමඟ ඇති මූල්‍ය ප්‍රකාශ 20x1 දෙසැම්බර් 31 වන දිනට සමාගමේ මූල්‍ය තත්ත්වය සහ එම දිනෙන් |

| විස්තරය | 2014 | 2017 |
|---|---|---|
| | ~~20x0 දෙසැම්බර් 31 වන දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා ABC සමාගමේ මූල්‍ය ප්‍රකාශ වෙනත් විගණකවරයෙකු විසින් විගණනය කරන ලද අතර, එම ප්‍රකාශ මත විකරණය නොකල මතයක් 20x1 මාර්තු 31 වන දින ප්‍රකාශයට පත්කරන ලදී.~~<br><br>~~වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳ වාර්තාව :~~<br>~~[විගණකගේ වාර්තාවේ මෙම කොටසේ ආකෘතිය සහ අන්තර්ගතය විගණකගේ වෙනත් වාර්තාකරන වගකීම් වල ස්වභාවය අනුව වෙනස් වේ.]~~<br><br>~~[ විගණකගේ අත්සන]~~<br>~~[විගණකගේ වාර්තාවේ දිනය]~~<br>~~[විගණකගේ ලිපිනය]~~<br><br>**2 වන නිදර්ශනයඃ**<br>~~**අ 8 (ආ) ඡේදයේ විස්තර කර ඇති තත්ත්වයන්ට පහත සඳහන් දේ ඇතුළත් වේ :**~~<br>■ ~~**ප්‍රවර්තන කාල පරිච්ඡේදය ආරම්භයේදී විගණක විසින් භෞතික තොග ගණන් ගැනීම නිරීක්ෂණය නොකළ අතර, තොගයේ ආරම්භ ශේෂය පිළිබඳව ප්‍රමාණවත්, යෝග්‍ය විගණන සාක්ෂි ලබා ගැනීමට නොහැකි විය.**~~<br>■ ~~**තොගයේ ආරම්භක ශේෂයන් පිළිබඳව ප්‍රමාණවත් යෝග්‍ය විගණන සාක්ෂි ලබා ගැනීමට නොහැකි වීමෙන් ඇතිවිය හැකි බලපෑම් ප්‍රමාණාත්මක යැයි සළකනු ලබන නමුත්, අස්තිත්ත්වයේ මූල්‍ය කාර්ය සාධනයට සහ මුදල් ප්‍රවාහයට එය පෘථුල නොවේ.**~~<br>■ ~~**වසර අවසානයේ මූල්‍ය තත්ත්වය සාධාරණ ලෙස ඉදිරිපත් කෙරේ.**~~<br>■ ~~**මූල්‍ය කාර්ය සාධනය සහ මුදල් ප්‍රවාහයන් පිළිබඳව කොන්දේසි සහිත මතයක් සහ මූල්‍ය තත්ත්වය පිළිබඳව විකරණය නොකරන ලද මතයක් තත්ත්වයන් යටතේ යෝග්‍ය යැයි සැළකේ.**~~<br><br>~~ස්වාධීන විගණකගේ වාර්තාව.~~<br>~~[යෝග්‍ය පරිදි අමතන අය]~~<br>~~මූල්‍ය ප්‍රකාශ මත වාර්තාව~~[8]<br>~~ABC සමාගමෙහි 20x1 දෙසැම්බර් 31 වන දිනට මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය සහ එම දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා~~ | අවසන් වූ වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය එහි මුදල් ප්‍රවාහයන් ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතීන්ට (ශ්‍රීලගිප්‍ර) සමඟ අනුකූලව සෑම ප්‍රමාණාත්මක අංගයන්ගෙන් *(හෝ සත්‍ය හා සාධාරණ දර්ශනයක් ගෙනෙන)* සාධාරණ ලෙස ඉදිරිපත් කර ඇත.<br><br>කොන්දේසි සහිත මතය සඳහා පදනම<br>20x1 ජූනි මස 30 වන දින අප සමාගමේ විගණකවරුන් ලෙස පත් කරන ලද අතර, එමනිසා වසර ආරම්භයේදී භෞතික තොග ගණන් ගැනීම නිරීක්ෂණය නොකළේය. 20x0 දෙසැම්බර් 31 දින පැවති තොග ප්‍රමාණ සම්බන්ධයෙන් අපහට විකල්ප ආකාරයෙන් සෑහීමට පත්වීමට නොහැකි විය. ආරම්භක තොග මූල්‍ය කාර්ය සාධනය සහ මුදල් ප්‍රවාහ නිර්ණය කිරීමට ඇතුලත් කරන හෙයින් විස්තීර්ණ ආදායම් ප්‍රකාශයෙහි වාර්තා වූ වර්ෂය සඳහා වූ ලාභය සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ වාර්තා වූ මෙහෙයුම් ක්‍රියාකාරකම් වලින් ලැබෙන ශුද්ධ මුදල් ප්‍රාවාහයන් සම්බන්ධයෙන් ගැලපීම් අවශ්‍ය විය හැකිද යන්න අපට නිර්ණය කිරීමට නොහැකි විය. අපගේ විගණනය ශ්‍රී ලංකා විගණන ප්‍රමිති සමඟ (ශ්‍රීලවිප්‍ර) අනකූලව සිදු කරන ලදී, එම ප්‍රමිතීන් යටතේ වන අපගේ වගකීම් අපගේ වාර්තාවේ *මූල්‍ය ප්‍රකාශ විගණනය සඳහා විගණකගේ වගකීම්* කොටසෙහි තවදුරටත් විස්තර කෙරේ. මූල්‍ය ප්‍රකාශ විගණනයට අදාළ වන ආචාර ධර්ම අවශ්‍යතාවයන්ට *[අධිකරණ බල ප්‍රදේශය]* අනුකූලව අප සමාගමෙන් ස්වාධීන වන අතර, මෙම අවශ්‍යතාවයන්ට අනුකූලව අපගේ අනෙකුත් ආචාර ධර්ම වගකීම් අප විසින් ඉටු කර ඇත. අප ලබාගත් විගණන සාක්ෂි අපගේ කොන්දේසි සහිත මතයට පදනමක් සැපයීමට ප්‍රමාණවත් සහ යෝග්‍ය යැයි අප විශ්වාස කරමු.<br><br>වෙනත් කරුණ<br>20x0 දෙසැම්බර් 31 වන දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා සමාගමේ මූල්‍ය ප්‍රකාශ වෙනත් විගණකවරයෙකු විසින් විගණනය කරන ලද අතර, එම ප්‍රකාශයන් පිළිබඳව විකරණය නොකළ මතයක් 20x1 මාර්තු 31 වන දින ප්‍රකාශයට පත් කරන ලදී.<br><br>වෙනත් තොරතුරු ["මූල්‍ය ප්‍රකාශ සහ ඒ මත විගණකගේ වාර්තාව හැර වෙනත් තොරතුරු වැනි හෝ යෝග්‍යවන්නේනම් වෙනස් සිරස්තලයන්]<br><br>*[ශ්‍රී.ලං.වි.ප්‍ර. 720 (සංශෝධිත) හී වාර්තාකරණ අවශ්‍යතාවයන් සමඟ අනුකූලව වාර්තා කිරීම - ශ්‍රී.ලං.වි.ප්‍ර. 720 (සංශෝධිත) හි 2 වන පරිශිෂඨයේ 1 වන නිදර්ශනය බලන්න].* |

| විස්තරය | 2014 | 2017 |
|---|---|---|
| | විස්තීර්ණ ආදායම් ප්‍රකාශය, ස්කන්ධය වෙනස් වීමේ ප්‍රකාශය සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශය සහ, වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ වෙනත් පැහැදිලි කිරීමේ තොරතුරු වල සාරාංශයක් ඇතුලත් වන මේ සමඟ ඇති මූල්‍ය ප්‍රකාශ අප විසින් විගණනය කරන ලදී.<br><br>*මූල්‍ය ප්‍රකාශ සඳහා වූ කළමනාකරණයේ[9] වගකීම*<br><br>ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත[10] සමඟ අනුකූලව මෙම මූල්‍ය ප්‍ර කාශ පිළියෙල කිරීම සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් වුවද ප්‍රමාණාත්මක අව ප්‍රකාශයන් ගෙන් තොර මූල්‍ය ප්‍රකාශ පිළියෙල කිරීමට හැකිවන පරිදි කළමනාකරණය විසින් තීරණය කරනු ලබන අභ්‍යන්තර පාලනයන් සඳහා කලමණාකාරිත්වය වගකිව යුතුය.<br><br>*විගණකගේ වගකීම*<br><br>අපගේ වගකීම වන්නේ අපගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශ පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමයි. අපගේ විගණනය ශ්‍රී ලංකා විගණන ප්‍රමිති සමඟ අනුකූලව මෙහෙයවන ලදී. එම ප්‍රමිතීන්ට අනුව අප ආචාර ධර්ම අවශ්‍යතාවයන්ට අනුකූල වන අතර, මූල්‍ය ප්‍රකාශ ප්‍රමාණාත්මක අව ප්‍රකාශ යන්ගෙන් තොරද යන්න පිළිබඳව සාධාරණ සහතික වීමක් ලබාගැනීම සඳහා විගණනය සැලසුම් කර ඉටු කළ යුතුය.<br><br>විගණනයකට මූල්‍ය ප්‍රකාශවල ඇති වටිනාකම් හා හෙළිදරව් කිරීම් පිළිබඳ විගණන සාක්ෂි ලබා ගැනීම සඳහා ක්‍රියා පටිපාටි ඉටු කිරීම අවශ්‍ය කෙරේ. තෝරාගත් ක්‍රියා පටිපාටීන් රඳා පවතින්නේ වංචා හෝ වැරදි නිසා මූල්‍ය ප්‍රකාශ වල ප්‍රමාණාත්මක අවප්‍රකාශ වීමේ අවදානම් තක්සේරු කිරීම ඇතුළුව වූ විගණකගේ විනිශ්චය මතය. එම අවදානම් තක්සේරු කිරීම්වලදී, විගණක විසින් පවත්නා තත්ත්වයකට සුදුසු පරිදි විගණන ක්‍රියා පටිපාටි සැලසුම් කිරීම සඳහා අස්තිත්ත්වයෙහි මූල්‍ය ප්‍රකාශ පිළියෙල කිරීම සහ සාධාරණ ඉදිරිපත් කිරීම[11] ට අදාළ අභ්‍යන්තර පාලනය සළකා බලන නමුත්, එසේ කරනුයේ අස්තිත්ත්වයේ අභ්‍යන්තර පාලනයේ[12] සඵලදායීතාවය පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමේ අරමුණින් නොවේ. භාවිතා කරන ලද ගිණුම්කරන ප්‍රතිපත්ති වල යෝග්‍යතාවය සහ කළමනාකරණය විසින් සිදු කරන ලද ගිණුම්කරණ ඇස්තමේන්තු වල සාධාරණත්වය අගය කිරීම මෙන්ම මූල්‍ය ප්‍රකාශ වල සමස්ත ඉදිරිපත් කිරීම ඇගයීම ද විගණයකට ඇතුළත්වේ. | මූල්‍ය ප්‍රකාශ සඳහා කළමනාකරණයේ සහ පාලනය පිළිබඳ වගකිවයුතු අයගේ වගකීම්[19]<br><br>*[ශ්‍රී.ලං.වි.ප්‍ර. 700 (සංශෝධිත)[20] සමඟ අනුකූලව වාර්තා කිරීම - ශ්‍රී.ලං.වි.ප්‍ර. 700 (සංශෝධිත) හි 1 වන නිදර්ශනය බලන්න.]*<br><br>මූල්‍ය ප්‍රකාශ විගණනය සඳහා විගණකගේ වගකීම්<br>*(ශ්‍රී.ලං.වි.ප්‍ර. 700 (සංශෝධිත) සමඟ අනුකූලව වාර්තා කිරීම - ශ්‍රී.ලං.වි.ප්‍ර. 700 (සංශෝධිත) හි 1 වන නිදර්ශනය බලන්න.)*<br><br>වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතවයන් මත වාර්තාව.<br>*[ශ්‍රී.ලං.වි.ප්‍ර. 700 (සංශෝධිත) සමඟ අනුකූලව වාර්තා කිරීම - ශ්‍රී.ලං.වි.ප්‍ර. 700 (සංශෝධිත) හි 1 වන නිදර්ශනය බලන්න.]*<br>[අදාළ විශේෂ අධිකරණ බල ප්‍රදේශයට යෝග්‍ය වන පරිදි විගණන සමාගමේ නමින් විගණකගේ පෞද්ගලික නමින් හෝ දෙකම අනුව, අත්සන් කිරීම ]<br><br>[විගණකගේ ලිපිනය]<br>[දිනය]<br><br>**2 වන නිදර්ශනය :**<br><br>**මෙම නිදර්ශනාත්මක විගණනකගේ වාර්තාවේ අරමුණු සඳහා පහත දැක්වෙන තත්ත්වයන් උපකල්පනය කෙරේ:**<br><br>• **සාධාරණ ඉදිරිපත් කිරීමේ ආකෘතිමය රාමුවක් භාවිතා කරමින් ලැයිස්තුගත අස්තිත්ත්වයක් හැර වෙනත් අස්තිත්ත්වයක සම්පූර්ණ මූල්‍ය ප්‍රකාශ කට්ටලයක් විගණනය, විගණනය සමූහ විගණනයක් නොවේ. (එනම්, ශ්‍රී.ලං.වි.ප්‍ර. 600 අදාළ නොවේ.)**<br>• **ශ්‍රීලගිප්‍ර (පොදු අරමුණු සඳහා වන ආකෘතිමය රාමුවක්) සමඟ අනුකූලව අස්තිත්ත්වයේ කළමනාකරණය විසින් මූල්‍ය ප්‍රකාශ පිළියෙල කරනු ලැබේ.**<br>• **ශ්‍රී.ලං.වි.ප්‍ර. 210 හි මූල්‍ය ප්‍රකාශ සඳහා කළමණාකාරිත්ත්වයේ වගකීම පිළිබඳ විස්තරය විගණන කාර්යයෙහි නියමයන් පිළිබිඹු වේ.**<br>• **ප්‍රවර්තන කාල පරිච්ඡේදය ආරම්භයේදී විගණක විසින් භෞතික තොග ගණන් ගැනීම** |

| විස්තරය | 2014 | 2017 |
|---|---|---|
| | ~~මූල්‍ය තත්ත්වය පිළිබඳ අපගේ විකරණය නොකරන ලද මතයට සහ මූල්‍ය කාර්ය සාධනය හා මුදල් ප්‍රවාහයන් පිළිබඳ අපගේ කොන්දේසි සහිත විගණන මතයට පදනමක් සැපයීමට අප ලබාගත් විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ යෝග්‍ය යැයි අපි විශ්වාස කරමු.~~<br><br>*~~මූල්‍ය කාර්ය සාධනය සහ මුදල් ප්‍රවාහ පිළිබඳ කොන්දේසි සහිත මතය සඳහා පදනම.~~*<br><br>~~20x1 ජූනි මස 30 වන දින අප සමාගමේ විගණකවරුන් ලෙස පත් කරන ලද අතර, එම නිසා වසර ආරම්භයේදී භෞතික තොග ගණන් ගැනීම–නිරීක්ෂණය නොකරන ලදි. 20x0 දෙසැම්බර් මස 31 වන දින පැවති තොග ප්‍රමාණ සම්බන්ධයෙන් විකල්ප විධි වලින් අපහට සෑහීමට පත්වීමට නොහැකි විය. ආරම්භ තොග මූල්‍ය කාර්ය සාධනය සහ මුදල් ප්‍රවාහයන් නිර්ණය කිරීමට ඇතුලත් කරන හෙයින්, විස්තීර්ණ ආදායම් ප්‍රකාශයේ වාර්තා වූ වර්ෂය සඳහා ලාභය සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ වාර්තා වූ මෙහෙයුම් ක්‍රියාකාරකම් වලින් ලැබෙන ශුද්ධ මුදල් ප්‍රවාහය සම්බන්ධයෙන් ගැලපීම් අවශ්‍ය විය හැකිද යන්න නිර්ණය කිරීමට අපට නොහැකි විය.~~<br><br>*~~මූල්‍ය කාර්ය සාධනය සහ මුදල් ප්‍රවාහ පිළිබඳ කොන්දේසි සහිත මතය~~*<br><br>~~අපගේ මතය අනුව, කොන්දේසි සහිත මතය සඳහා පදනම ඡේදයේ විස්තර කර ඇති කරුණෙහි ඇතිවිය හැකි බලපෑම් හැර, 20x1 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා ABC සමාගමේ මූල්‍ය කාර්ය සාධනය සහ මුදල් ප්‍රවාහය, විස්තීර්ණ ආදායම් ප්‍රකාශය සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශය ජාත්‍යන්තර මූල්‍ය වාර්තාකරණ ප්‍රමිතීන්ට අනුකූලව සියළුම ප්‍රමාණාත්මක අංගයන්ගෙන් සාධාරන ලෙස (හෝ සත්‍ය හා සාධාරණ දර්ශනය–ලබාදීමට ) ඉදිරිපත් කරයි.~~<br><br>~~*මූල්‍ය තත්ත්වය පිළිබඳ මතය.* අපගේ මතය අනුව, ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතීන්ට අනුකූලව 20x1 දෙසැම්බර් 31 දිනට ABC සමාගමේ මූල්‍ය තත්ත්වය, පිළිබඳ ප්‍රකාශය සියලු ප්‍රමාණාත්මක අංගයන්ගෙන් සාධාරණ ලෙස (හෝ සත්‍ය හා සාධාරණ දර්ශනයක් ලබා දීමට) ඉදිරිපත් කරයි.~~<br><br>*~~වෙනත් කරුණු :~~* | **නිරීක්ෂණය නොකළ අතර, තොගයේ ආරම්භක ශේෂය පිළිබඳව ප්‍රමාණවත් යෝග්‍ය විගණන සාක්ෂි ලබා ගැනීමට නොහැකි වි ඇත.**<br>• **තොගයේ ආරම්භක ශේෂයන් පිළිබඳව ප්‍රමාණවත් යෝග්‍ය විගණන සාක්ෂි ලබා ගැනීමට නොහැකි වීමෙන් ඇතිවිය හැකි බලපෑම් ප්‍රමාණාත්මක යැයි සළකනු ලබන නමුත්, අස්තිත්ත්වයේ මූල්‍ය කාර්ය සාධනයට සහ මුදල් ප්‍රවාහයට[21] එය පෘථුල නොවේ.**<br>• **වසර අවසානයේ මූල්‍ය තත්ත්වය සාධාරණ ලෙස ඉදිරිපත් කෙරේ.**<br>• **මූල්‍ය කාර්ය සාධනය සහ මුදල් ප්‍රවාහයන් සම්බන්ධයෙන් කොන්දේසි සහිත මතයක් සහ මූල්‍ය තත්ත්වය සම්බන්ධයෙන් විකරණය නොකරන ලද මතයක් තත්ත්වයන් යටතේ යෝග්‍ය යැයි සැළකේ.**<br>• **විගණනයට ව්‍යවහාර වන අදාළ ආචාරධර්ම අවශ්‍යතා වනුයේ අධිකරණ බල ප්‍රදේශයට අයත් එම දේවල් වේ.**<br>• **ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව, විගණක විසින් නිගමනය කර ඇත්තේ. ශ්‍රී.ලං.වි.ප්‍ර. 570 (සංශෝධිත) සමග අනුකූලව අඛණ්ඩ පැවැත්ම ලෙස දිගටම පවත්වාගෙනයාමේ අස්තිත්ත්වයේ හැකියාවන් මත සැළකිය යුතු සැකයක් ඇතිකළ හැකි අන්දමේ සිදුවීම් හෝ තත්ත්වයන්ට අදාළ සම්බන්ධිත ප්‍රමාණාත්මක අනියතතාවයක් නොපවතින බවයි.**<br>• **ශ්‍රී.ලං.වි.ප්‍ර. 701 ට අනුකූලව ප්‍රධාන විගණන කරුණු සන්නිවේදනය කිරීම විගණකට අවශ්‍ය නොවන අතර, වෙනත් ආකාරයකින් එය කිරීමට තීරණය කර නැත.**<br>• **විගණකගේ වාර්තාවේ දිනට පෙර විගණක විසින් වෙනත් සියළුම තොරතුරු ලබාගෙන ඇති අතර, එම වෙනත් තොරතුරු ප්‍රමාණාත්මක අව ප්‍රකාශයක් ලෙස හඳුනාගෙන නොමැත.**<br>• **අනුරූපි සංඛ්‍යා ඉදිරිපත් කරනු ලබන අතර, පූර්ව කාල පරිච්ඡේදයේ මූල්‍ය ප්‍රකාශ විගණනය කර ඇත්තේ පූර්වගාමී විගණක විසිනි. අනුරූප සංඛ්‍යා පිළිබඳ පූර්වගාමී විගණකගේ** |

<table>
<tr><th>විස්තරය</th><th>2014</th><th>2017</th></tr>
<tr>
<td></td>
<td>~~20x0 දෙසැම්බර් මස 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා ABC සමාගමේ මූල්‍ය ප්‍රකාශ වෙනත් විගණකවරයෙකු විසින් විගණනය කරන ලද අතර, ඔහු එම ප්‍රකාශයන් පිළිබඳව විකරණය නොකරණ ලද මතයක් 20x1 මාර්තු මස 31 වන දින ප්‍රකාශයට පත් කරන ලදී.~~<br><br>~~වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා මත වාර්තාව,~~<br><br>[~~විගණකගේ වාර්තාවේ මෙම කොටසේ ආකෘතිය අන්තර්ගතය විගණකගේ වෙනත් වාර්තාකරණ වගකීම් වල ස්වභාවය අනුව වෙනස්වේ.~~]<br><br>[~~විගණකගේ අත්සන~~]<br><br>[~~විගණකගේ වාර්තාවේ දිනය~~]<br><br>[~~විගණකගේ ලිපිනය~~]</td>
<td>**වාර්තාව වෙත යොමු කිරීම පිළිබඳව විගණකහට නීතියෙන් හෝ රෙගුලාසියෙන් තහනම් කර නොමැති අතර, එසේ කිරීමට තීරණය කර ඇත.**<br>• **මූල්‍ය ප්‍රකාශ අධීක්ෂණය කිරීම සඳහා වගකිව යුතු අය මූල්‍ය ප්‍රකාශ පිළියෙල කිරීම සඳහා වගකිව යුතු අයගෙන් වෙනස් වේ.**<br>• **මූල්‍ය ප්‍රකාශ විගණනයට අමතරව, දේශීය නීතිය යටතේ අවශ්‍ය වෙනත් වාර්තාකරණ වගකීම් විගණකවරයාට ඇත.**<br><br>**ස්වාධීන විගණකගේ වාර්තාව**<br><br>ABC සමාගමේ කොටස් හිමියන් වෙත.<br>[හෝ වෙනත් යෝග්‍ය පරිදි අමතන අය].<br><br>**මූල්‍ය ප්‍රකාශයන්හි විගණනය මත වාර්තාව**[22]<br><br>**මතයන්**<br><br>අප ABC සමාගමේ (සමාගම) 20x1 දෙසැම්බර් 31 වන දිනට මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය සහ එම දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා විස්තීර්ණ ආදායම් ප්‍රකාශය, ස්කන්ධයෙහි වෙනස්වීම් ප්‍රකාශය සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශය සහ මූල්‍ය ප්‍රකාශය සහ ගිණුම්කරණ ප්‍රතිපත්තිවල සාරාංශයක් ඇතුලත් මූල්‍ය ප්‍රකාශවල සටහන්වලින් යුත් මූල්‍ය ප්‍රකාශ අප විසින් විගණනය කර න ලදී.<br><br>*මූල්‍ය කාර්ය සාධනය සහ මුදල් ප්‍රවාහ මත කොන්දේසි සහිත මතය.*<br><br>අපගේ මතය අනුව, අපගේ වාර්තාවේ කොන්දේසි සහිත මතය සඳහා පදනම වන කොටසේ විස්තර කර ඇති කරුණෙහි විය හැකි බලපෑම් හැර, 20x1 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා සමාගමේ කැටුව යන මූල්‍ය කාර්ය සාධනය සහ මුදල් ප්‍රවාහය, විස්තීරණ ආදායම් ප්‍රකාශය සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශය ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතීන්ට (ශ්‍රීලගිප්‍ර) අනුකූලව සියළුම ප්‍රමාණාත්මක අංගයන්ගෙන් සාධාරණ ලෙස</td>
</tr>
</table>

| විස්තරය | 2014 | 2017 |
| --- | --- | --- |
| | | (හෝ සත්‍ය හා සාධාරණ දර්ශනයක් ලබා දේ ) ඉදිරිපත් කරයි.<br><br>*මූල්‍ය තත්ත්වය මත මතය*<br>අපගේ මතය අනුව, ශ්‍රීලගිප්‍ර සමග අනුකූලව 20X1 දෙසැම්බර් 31 දිනට සමාගමේ මූල්‍ය තත්ත්වය කැටුව ඇතුලත් මූල්‍ය තත්ත්ව ප්‍රකාශය සෑම ප්‍රමාණාත්මක ආකාරයකින්ම සාධාරණ ලෙස (හෝ සත්‍ය හා සාධාරණ දර්ශනයක් ගෙන දේ ) ඉදිරිපත් කරයි.<br><br>මූල්‍ය කාර්ය සාධනය සහ මුදල් ප්‍රවාහයන් පිළිබඳ කොන්දේසි සහිත මතය ඇතුළුව මතයන් සඳහා පදනම්<br>20X1 ජුනි මස 30 වන දින අප සමාගමේ විගණකවරුන් ලෙස පත්කරන ලද අතර, එම නිසා වසර ආරම්භයේදී භෞතික තොග ගණන් ගැනීම නිරික්ෂණය නොකරන ලදී. 20X0 දෙසැම්බර් මස 31 වන දින පැවැති තොග ප්‍රමාණ සම්බන්ධයෙන් විකල්ප ආකාරයෙන් අපහට සෑහීමට පත්වීමට නොහැකි විය. ආරම්භක තොග මූල්‍ය කාර්ය සාධනය සහ මුදල් ප්‍රවාහයන් නිර්ණය කිරීමට ඇතුලත් කරන හෙයින්, විස්තීර්ණ ආදායම් ප්‍රකාශයේ වාර්තා වූ වර්ෂය සඳහා වාර්තා වූ ලාභය සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ වාර්තා වූ මෙහෙයුම් ක්‍රියාකාරකම් වලින් ලැබෙන ශුද්ධ මුදල් ප්‍රවාහය සම්බන්ධයෙන් ගැලපීම් අවශ්‍ය විය හැකිද යන්න නිර්ණය කිරීමට අපට නොහැකි විය.<br>අපගේ විගණනය ශ්‍රී ලංකා විගණන ප්‍රමිත සමග (ශ්‍රීලවිප්‍ර) අනුකූලව සිදුකරන ලදී. එම ප්‍රමිතීන් යටතේ වන අපගේ වගකීම් අපගේ වාර්තාවේ මූල්‍ය ප්‍රකාශ විගණනය සඳහා විගණකගේ වගකීම් කොටසෙහි තව දුරටත් විස්තර කෙරේ. අපගේ මූල්‍ය ප්‍රකාශ විගණනයට අදාල වන ආචාර ධර්ම [අධිකරණ බල ප්‍රදේශය තුල ] අවශ්‍යතාවයන්ට අනුකූලව අප සමාගමෙන් ස්වාධීන වන අතර, මෙම අවශ්‍යතාවයන්ට අනුකූලව අපගේ වෙනත් ආචාර ධර්ම වගකීම් අප විසින් ඉටු කර ඇත. මූල්‍ය තත්ත්වය පිළිබඳ අපගේ විකරණය නොකරන ලද මතයට සහ මූල්‍ය කාර්ය සාධනය හා මුදල් ප්‍රවාහයන් පිළිබඳ අපගේ කොන්දේසි සහිත විගණන මතයට පදනමක් ලබා දීමට අප ලබාගත් විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ යෝග්‍ය යැයි අපි විශ්වාස කරමු.<br><br>වෙනත් කරුණු<br><br>20X0 දෙසැම්බර් මස 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා සමාගමෙහි මූල්‍ය ප්‍රකාශ වෙනත් විගණකවරයෙකු විසින් විගණනය කරන ලද අතර, එම ප්‍රකාශයන් පිළිබඳව විකරණය නොකරන ලද මතයක් 20X1 මාර්තු |

| විස්තරය | 2014 | 2017 |
|---|---|---|
| | | මස 31 වන දින ප්‍රකාශයට පත් කරන ලදී.<br><br>වෙනත් තොරතුරු ["මූල්‍ය ප්‍රකාශ සහ ඒ මත විගණකගේ වාර්තාව හැර වෙනත් තොරතුරු ලෙස වැනි හෝ යෝග්‍ය වන්නේ නම් වෙනත් සිරස්තලයක් ]<br><br>[SLAUS 720 (සංශෝධිත) හි වර්තාකරණ අවශ්‍යතාවයන් සමග අනුකූලව වාර්තා කිරීම - ශ්‍රී.ලං.වි.ප්‍ර. 720 (සංශෝධිත) හි 2 වන පරිශිෂ්ඨයේ 1 වන නිදර්ශනය බලන්න].<br><br>මූල්‍ය ප්‍රකාශ සඳහා කළමනාකරණයේ සහ පාලනය පිළිබඳ වගකිව යුතු අයගේ වගකීම් [23]<br><br>(ශ්‍රී.ලං.වි.ප්‍ර. 700 (සංශෝධිත) සමග අනුකූලව වාර්තා කිරීම - ශ්‍රී.ලං.වි.ප්‍ර. 700 (සංශෝධිත) හි 1 වන නිදර්ශනය බලන්න.)<br><br>මූල්‍ය ප්‍රකාශ විගණනය සඳහා විගණකගේ වගකීම්<br>ශ්‍රී.ලං.වි.ප්‍ර. 700 (සංශෝධිත) සමග අනුකූලව වාර්තා කිරීම - ශ්‍රී.ලං.වි.ප්‍ර. 700 (සංශෝධිත) හි 1 වන නිදර්ශනය බලන්න.<br>වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳ වාර්තාව<br><br>[ශ්‍රී.ලං.වි.ප්‍ර. 700 (සංශෝධිත) සමග අනුකූලව වාර්තා කිරීම - ශ්‍රී.ලං.වි.ප්‍ර. 700 (සංශෝධිත) හි 1වන නිදර්ශනය බලන්න.]<br><br>[විගණන සමාගම නමින්, විගණකගේ පෞද්ගලික නමින් හෝ දෙකම, යම් විශේෂ අධිකරණ බල ප්‍රදේශයකට යෝග්‍ය පරිදි අත්සන් කිරීම].<br><br>[විගණකගේ ලිපිනය].<br><br>[දිනය]. |
| පාද සටහන් | 1. ~~විගණකගේ විනිශ්චයෙන් ඇතිවිය හැකි බලපෑම්, අස්තිත්ත්වයේ මූල්‍ය කාර්ය සාධනය සහ මුදල් ප්‍රවාහයන්ට ප්‍රමාණාත්මක සහ පෘථුල ලෙස සැළකෙන්නේ නම්, විගණක විසින් මූල්‍ය කාර්ය සාධනය සහ මුදල් ප්‍රවාහයන් පිළිබඳව මතය ව්‍යාචනය කිරීම කල හැකිය.~~<br>2. ~~"වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳ වාර්තාව" යන දෙවන උප මාතෘකාව අදාල නොවන අවස්ථාවන්හිදි "මූල්‍ය ප්‍රකාශ පිළිබඳ වාර්තාව" යන උප~~ | 13. ශ්‍රී.ලං.වි.ප්‍ර. 600 - විශේෂ සළකා බැලීම් - සමූහ මූල්‍ය ප්‍රකාශ විගණනය (සංරචක විගණකවරුන්ගේ වැඩ ඇතුළුව)<br>14. ශ්‍රී.ලං.වි.ප්‍ර. 210, විගණන කාර්යය භාරය සඳහා වන නියමයන්වලට එකඟ වීම.<br><br>15. විගණකගේ විනිශ්චයෙන් ඇතිවිය හැකි බලපෑම්, අස්තිත්ත්වයේ මූල්‍ය කාර්ය සාධනය සහ මුදල් ප්‍රවාහයන්ට ප්‍රමාණාත්මකව සහ පෘතුල ලෙස |

| විස්තරය | 2014 | 2017 |
|---|---|---|
| | මාතෘකාව අනවශ්‍යය.<br>3. හෝ විශේෂ අධිකරණ බල ප්‍රදේශයක තුළ නෛතික ආකෘතිමය රාමුවේ සන්දර්භය තුළ යෝග්‍ය වෙනත් යෙදුමක්.<br>4. සත්‍ය හා සාධාරණ දර්ශනයක් ලබාදෙන මූල්‍ය ප්‍රකාශ පිළියෙල කිරීම කළමනාකරණයේ වගකීම වන විට, මෙය මෙලෙස කියවිය හැකිය ; " ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතීන් සමඟ අනුකූලව සත්‍ය හා සාධාරණ දර්ශනයක් ලබාදෙන මූල්‍ය ප්‍රකාශ පිළියෙල කිරීම කළමනාකරණයේ වගකීම වීම සහ ඒ සඳහා " .....<br>5. 9 වන පාද සටහනට අනුව මෙය මෙසේ කියවිය හැකිය : " අස්තිත්ත්වය විසින් මූල්‍ය ප්‍රකාශ පිළියෙල කිරීමේදී සත්‍ය හා සාධාරණ දර්ශනයක් ලබාදීමට අදාල අභ්‍යන්තර පාලනය, විගණක විසින් එම අවදානම් තක්සේරු කිරීමේදී තත්ත්වයන්ට ගැලපෙන විගණන ක්‍රියා පටිපාටි සැලසුම් කිරීම සඳහා සලකා බලන නමුත් එසේ කරන්නේ අස්තිත්ත්වයේ අභ්‍යන්තර පාලනයේ සඵලදායිතාවය පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමේ අරමුණින් සඳහා නොවේ. "<br>6. මූල්‍ය ප්‍රකාශවල විගණනය සමග එක්ව සමගාමීව අභ්‍යන්තර පාලනයේ ඵලදායිතාවය පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමට විගණකවරයාට එලෙසම වගකීමක් ඇති අවස්ථාවලදී මෙම වාක්‍යය පහත පරිදි වචන පෙළ ගැස්විය හැකිය. : " එම අවදානම් තක්සේරු කිරීමේදී, අස්තිත්ත්වය විසින් මූල්‍ය ප්‍රකාශ පිළියෙල කිරීමේදී සහ සාධාරණ ඉදිරිපත් කිරීමකට අදාල අභ්‍යන්තර පාලනය තත්ත්වයන්ට ගැලපෙන විගණන ක්‍රියා පටිපාටි සැලසුම් කිරීම සඳහා විගණක විසින් සළකා බලයි." 9 වන පාද සටහන සම්බන්ධයෙන් එය මෙසේ කියවිය හැකිය ; " එම අවදානම් තක්සේරු කිරීමේදී අස්තිත්ත්වය විසින් සත්‍ය හා සාධාරණ දර්ශනයක් ගෙන දෙන අස්තිත්ත්වයේ මූල්‍ය ප්‍රකාශ පිළියෙල කිරීමට අදාල අභ්‍යන්තර පාලනය තත්ත්වයන්ට ගැලපෙන විගණන ක්‍රියා පටිපාටි සැලසුම් කිරීම සඳහා විගණක විසින් සළකා බලයි. "<br>7. විගණකගේ විනිශ්චයෙන් ඇතිවිය හැකි බලපෑම්, අස්තිත්ත්වයේ මූල්‍ය කාර්ය සාධනය සහ මුදල් ප්‍රවාහයන්ට ප්‍රමාණාත්මකව සහ පෘතුල ලෙස සැළකෙන්නේ නම්, | සැළකෙන්නේ නම්, විගණක විසින් මූල්‍ය කාර්ය සාධනය සහ මුදල් ප්‍රවාහයන් පිළිබඳව මතය වියාචනය කිරීම කළ හැකිය.<br>16. ශ්‍රී.ලං.වි.ප්‍ර. 570 (සංශෝධිත) *අඛන්ඩ පැවැත්ම.*<br>17. ශ්‍රී.ලං.වි.ප්‍ර. 701 - *ස්වාධීන විගණකගේ වාර්තාවේ ප්‍රධාන විගණන කරුණු සන්නිවේදනය කිරීම.*<br>18. "වෙනත්, නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳ වාර්තාව" යන දෙවන උප මාතෘකාව අදාළ නොවන අවස්ථාවන්හි දී "මූල්‍ය ප්‍රකාශ විගණනය පිළිබඳ වාර්තාව" යන උප මාතෘකාව අනවශ්‍යය.<br>19. මෙම නිදර්ශනාත්මක විගණක වාර්තා පුරාවටම, කළමනාරණය සහ පාලනය පිළිබඳ වගකිව යුතු අය විශේෂිත අධිකරණ බල ප්‍රදේශය තුළ නෛතික ආකෘතිමය රාමුවේ සන්දර්භය තුළ යෝග්‍ය වෙනත් යෙදුමක් මඟින් ආදේශ කිරීමට අවශ්‍ය විය හැකිය.<br>20. *ශ්‍රී.ලං.වි.ප්‍ර. 700 (සංශෝධිත), මතයක් සකස් කිරීම සහ මූල්‍ය ප්‍රකාශ පිළිබඳ වාර්තා කිරීම.*<br>21. විගණකගේ විනිශ්චයයෙන් ඇතිවිය හැකි බලපෑම්, අස්තිත්ත්වයේ මූල්‍ය කාර්ය සාධනය සහ මුදල් ප්‍රවාහයන්ට ප්‍රමාණාත්මකව සහ පෘතුල ලෙස සැලකෙන්නේ නම්, විගණක විසින් මූල්‍ය කාර්ය සාධනය සහ මුදල් ප්‍රවාහයන් පිළිබඳව මතය වියාචනය කළ හැකිය.<br>22. "වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳ වාර්තාව" යන දෙවන උප මාතෘකාව අදාළ නොවන අවස්ථාවන්හිදී "මූල්‍ය ප්‍රකාශ විගණනය පිළිබඳ වාර්තාව"යන උප මාතෘකාව අනවශ්‍යය.<br>23. හෝ විශේෂ අධිකරණ බල ප්‍රදේශයක නෛතික ආකෘතිමය රාමුවේ සන්දර්භය තුළ යෝග්‍ය වෙනත් යෙදුම්. |

| විස්තරය | 2014 | 2017 |
|---|---|---|
| | ~~විගණක විසින් මූල්‍ය කාර්ය සාධනය සහ මුදල් ප්‍රවාහයන් පිළිබඳව මතය වියාචනය කිරීම සිදු කළ හැකිය.~~<br>8. ~~" වෙනත් මූල්‍ය හා නියාමන අවශ්‍යතා පිළිබඳ වාර්තාව" යන දෙවන උප මාතෘකාව අදාල නොවන අවස්ථාවන්හිදී "මූල්‍ය ප්‍රකාශ පිළිබඳ වාර්තාව"යන උප මාතෘකාව අනවශ්‍යය.~~<br>9. ~~හෝ විශේෂ අධිකරණ බල ප්‍රදේශය තුල නෛතික ආකෘතිමය රාමුවේ සන්දර්භය තුල යෝග්‍ය වෙනත් යෙදුමක්.~~<br>10. ~~සත්‍ය හා සාධාරණ දර්ශනයක් ලබාදෙන මූල්‍ය ප්‍රකාශ පිළියෙල කිරීම කළමනාකරණයේ වගකීම වනවිට, මෙලෙස කියවිය හැකිය : " ශ්‍රී ලංකා ගිනුම්කරණ ප්‍රමිතීන් සමග අනුකූලව සත්‍ය හා සාධාරණ දර්ශනයක් ලබාදෙන මූල්‍ය ප්‍රකාශ සකස් කිරීම කළමනාකරණයේ වගකීම වීම සහ එවැනි සඳහා ".......~~<br>11. ~~15 වන පාද සටහනට අනුව මෙය මෙසේ කියවිය හැකිය : " අස්තිත්ත්වය විසින් මූල්‍ය ප්‍රකාශ පිළියෙල කිරීමේදි සත්‍ය හා සාධාරණ දර්ශනයක් ලබා දීමට අදාල අභ්‍යන්තර පාලනය විගණක විසින් එම අවදානම් තක්සේරු කිරීමේදී තත්ත්වයන්ට ගැලපෙන විගණන ක්‍රියා පටිපාටි සැළසුම් කිරීම සඳහා සළකා බලන නමුත් එසේ කරන්නේ අස්තිත්ත්වයේ අභ්‍යන්තර පාලනයේ සඵලදායිතාවය පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමේ අරමුණෙන් සඳහා නොවේ."~~<br>12. ~~මූල්‍ය ප්‍රකාශ වල විගණනය සමග එක්ව අභ්‍යන්තර පාලනයේ ඵලදායිතාවය පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමට විගණකවරයාට එලෙසට වගකීමක් ඇති අවස්ථාවලදී මෙම වාක්‍යය පහත පරිදි පෙල ගැස්විය හැකිය. "එම අවදානම් තක්සේරු කිරීමේදී, අස්තිත්ත්වය විසින් මූල්‍ය ප්‍රකාශ පිළියෙල කිරීම සහ සාධාරණ ඉදිරිපත් කිරීමකට අදාල අභ්‍යන්තර පාලනය තත්ත්වයන්ට ගැලපෙන විගණන ක්‍රියා පටිපාටි සැලසුම් කිරීම සඳහා විගණක විසින් සළකා බලයි ." 15 වන පාද සටහන සම්බන්ධයෙන් එය මෙසේ කියවිය හැකිය : "එම අවදානම් තක්සේරු කිරීමේදි සත්‍ය හා සාධාරණ දර්ශනයක් ගෙන දෙන අස්තිත්ත්වයේ මූල්‍ය ප්‍රකාශ~~ | |

| විස්තරය | 2014 | 2017 |
|---|---|---|
| | ~~පිළියෙල කිරීමට අදාල අභ්‍යන්තර පාලනය තත්ත්වයන්ට ගැලපෙන විගණන ක්‍රියා පටිපාටි සැලසුම් කිරීම සඳහා විගණක විසින් සළකා බලයි.”~~ | |
| **ශ්‍රී ලංකා විගණන ප්‍රමිත 520 (ශ්‍රී. ලං. වි. ප්‍ර. 520 - විශ්ලේෂණාත්මක ක්‍රියා පටිපාටි** | | |
| වෙනස්කම් නොමැත. | | |
| **ශ්‍රී ලංකා විගණන ප්‍රමිත 530 (ශ්‍රී.ලං.වි.ප්‍ර. 530 - විගණන නියැදිකරණය.)** | | |
| 2 වන පරිශිෂ්ඨය | 5<br>....<br>විශාල සංගහණයක් සඳහා, සංගහණයේ සැබෑ ප්‍රමාණය, නියැදි ප්‍රමාණය මත තිබිය හැක්කේ අඩු බලපෑමකි. ~~මේ අනුව~~ කුඩා සංගහනයක් සඳහා විගණන නියැදිය ප්‍රමාණවත්, යෝග්‍ය විකල්ප විධි මගින් විගණන සාක්ෂි ලබාගැනීම මෙන් ~~බොහෝවිට~~ කාර්යක්ෂම ~~නොවේ.~~ | 5<br>....<br>විශාල සංගහණයක් සඳහා, සංගහණයේ සැබෑ ප්‍රමාණය, නියැදි ප්‍රමාණය මත තිබිය හැක්කේ අඩු බලපෑමකි. කෙසේ වෙතත්, කුඩා සංගහණයක් සඳහා යෝග්‍ය විකල්ප විධි මගින් ප්‍රමාණවත්, යෝග්‍ය විගණන සාක්ෂි ලබාගැනීම මෙන් විගණන නියැදිය කාර්යක්ෂම නොවිය හැකිය. |
| **ශ්‍රී ලංකා විගණන ප්‍රමිත 540 - (ශ්‍රී. ලං. වි. ප්‍ර. 540 - සාධාරණ අගයට ගිණුම්කරණ ඇස්තමේන්තු සහ සම්බන්ධිත හෙළිදරව් කිරීම් ඇතුළත්ව ගිණුම් ඇස්තමේන්තු විගණනය කිරීම.** | | |
| අ 19 | • අදාළ මූල්‍ය වාර්තාකරණ ආකෘතිමය රාමුවේ අවශ්‍යතාවයන් වෙනස් කිරීම හෝ වෙනත් ආකාරයකින් සිදුවූ වෙනස්කම්වල ප්‍රතිඵලයක් ලෙස ගිණුම්කරණ ඇස්තමේන්තු ~~වලට~~ අදාලවූ ගිණුම්කරණ ප්‍රතිපත්ති වෙනස්වී ඇත. | • අදාල මූල්‍ය වාර්තාකරණ ආකෘතිමය රාමුවේ අවශ්‍යතාවයන් තුළ හෝ වෙනත් ආකාරයකින් සිදුවූ වෙනස්කම් ඇතුළත ප්‍රතිඵලයක් ලෙස ගිණුම්කරණ ඇස්තමේන්තුවලට අදාළ ගිණුම්කරණ ප්‍රතිපත්ති වෙනස්වී ඇත. |
| අ 114 | හඳුනා නොගත් ගිණුම්කරණ ඇස්තමේන්තු සම්බන්ධයෙන්, විගණකගේ ඇගයීමෙහි අවධානය යොමුවී ඇත්තේ අදාළ මූල්‍ය වාර්තාකරණ ආකෘතිමය රාමුවේ හඳුනාගැනීමේ නිර්ණායක සැබවින්ම සපුරා ඇත්ද යන්න මතය. ගිණුම්කරණ ඇස්තමේන්තුවක් හඳුනාගෙන නොමැති අවස්ථාවක පවා වුවද මෙම සළකන ක්‍රමය යෝග්‍ය යැයි විගණක නිගමනය කරන විට, මූල්‍ය ප්‍රකාශයන්ට වන සටහන් තුළ ඇති තත්ත්වයන් හෙළි කිරීමේ අවශ්‍යතාවයක් තිබිය හැකිය.<br><br>~~විගණකගේ වාර්තාවට කරුණු අවධාරණය කිරීමේ ඡේදයක් එකතු කිරීමෙන් පාඨකයාගේ අවධානය සැළකිය යුතු අන්දමේ අනියත තාවයකට යොමු කිරීමේ අවශ්‍යතාවයක් ඇති බවට විගණක විසින් නිර්ණය කළ හැකිය. ශ්‍රී.ලං.වි.ප්‍ර. 706[1] මගින් එවැනි ඡේද පිළිබඳ අවශ්‍යතා ස්ථාපිත කරන අතර, මඟ පෙන්වීම් ලබාදෙයි.~~ | හඳුනා නොගත් ගිණුම්කරණ ඇස්තමේන්තු සම්බන්ධයෙන්, විගණකගේ ඇගයීමෙහි අවධානය යොමුවී ඇත්තේ අදාළ මූල්‍ය වාර්තාකරණ ආකෘතිමය රාමුවේ හඳුනාගැනීමේ නිර්ණායක සැබවින්ම සපුරා ඇත්ද යන්න මතය. ගිණුම්කරණ ඇස්තමේන්තුවක් හඳුනාගෙන නොමැති අවස්ථාවක පවා වුවද මෙම සළකන ක්‍රමය යෝග්‍ය යැයි විගණක නිගමනය කරන විට, මූල්‍ය ප්‍රකාශයන්ට වන සටහන් තුළ ඇති තත්ත්වයන් හෙළි කිරීමේ අවශ්‍යතාවයක් තිබිය හැකිය. අදාළ වන විට, ඉහළ ඇස්තමේන්තු කිරීමේ අනියත තාවයක් ඇති බවට හඳුනාගෙන ඇති ගිණුම්කරණ ඇස්තමේන්තුවක් ශ්‍රී.ලං.වි.ප්‍ර. 701[2] සමග අනුකූලව විගණකගේ වාර්තාවේ සන්නිවේදනය කළයුතු ප්‍රධාන විගණන කරුණක් බවට විගණක විසින් තීරණය කිරීම හෝ විගණකගේ වාර්තාවේ කරුණු අවධාරණය කිරීමේ ඡේදයක් ඇතුළත් කිරීම අවශ්‍ය යැයි සැලකිය හැකිය. (ශ්‍රී.ලං.වි.ප්‍ර. 706 (සංශෝධිත) බලන්න)[3] කරුණු ප්‍රධාන විගණන කරුණක් ලෙස නිර්ණය වුවහොත්, විගණකගේ වාර්තාවේ කරුණු අවධාරණය කිරීමේ ඡේදයක් යෙදීම ශ්‍රී.ලං.වි.ප්‍ර. 706 (සංශෝධිත) මඟින් විගණක හට තහනම් කරයි.[4] |
| | 1. ~~ශ්‍රී.ලං.වි.ප්‍ර. 706 ස්වාධීන විගණක වාර්තාවේ තුළ ඇති කරුණු අවධාරණය කිරීමේ ඡේද සහ~~ | 2. ශ්‍රී.ලං.වි.ප්‍ර. 701, ස්වාධීන විගණකගේ වාර්තාවේ ඇති ප්‍රධාන විගණන |

| විස්තරය | 2014 | 2017 |
|---|---|---|
| | ~~අනෙකුත් වැදගත් ඡේද.~~ | කරුණු සන්නිවේදනය කිරීම.<br>3. ශ්‍රී.ලං.වි.ප්‍ර. 706 (සංශෝධිත), ස්වාධීන විගණකගේ වාර්තාවේ කරුණු අවධාරණය කිරීමේ සහ වෙනත් කරුණු ඡේද.<br>4. ශ්‍රී.ලං.වි.ප්‍ර. 706 (සංශෝධිත), 8 (ආ) ඡේදය. |
| **ශ්‍රී ලංකා විගණන ප්‍රමිත 550 (ශ්‍රී.ලං.වි.ප්‍ර. 550 - සම්බන්ධිත පාර්ශව)** | | |
| වෙනස්කම් නොමැත. | | |
| **ශ්‍රී ලංකා විගණන ප්‍රමිත 560 (ශ්‍රී.ලං.වි.ප්‍ර. 560 - පසුව ඇතිවන සිදුවීම්)** | | |
| 1 | මෙම ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිය (ශ්‍රී.ලං.වි.ප්‍ර.) මූල්‍ය ප්‍රකාශ විගණනයක දී පසුව ඇතිවන සිදුවීම්වලට සම්බන්ධ විගණකගේ වගකීම් පිළිබඳව කටයුතු කරයි. (~~යොමුව : අ 1 ඡේදය~~) | මෙම ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිය (ශ්‍රීලවිප්‍ර) මූල්‍ය ප්‍රකාශ විගණනයක දී පසුව ඇතිවන සිදුවීම්වලට සම්බන්ධ විගණකගේ වගකීම් පිළිබඳව කටයුතු කරයි. ශ්‍රී.ලං.වි.ප්‍ර. 720 (සංශෝධිත) හි ආමන්ත්‍රණය කර ඇති විගණක වාර්තාවේ දිනට පසුව ලබාගත් වෙනත් තොරතුරු සඳහා වන විගණකගේ වගකීම් සම්න්ධ කරුණු සමග එය කටයුතු නොකරයි. * කෙසේ වෙතත්, එවැනි වෙනත් තොරතුරු මෙම ශ්‍රීලවිප්‍ර හි විෂය පථයට අයත් පසුව ඇතිවන සිදුවීමක් අනාවරණ කරනු ඇත. (යොමුව : අ 1 ඡේදය)<br><br>* *SLAUS 720 (සංශෝධිත), වෙනත් තොරතුරුවලට සම්බන්ධ විගණකගේ වගකීම්.* |
| 10 | විගණකගේ වාර්තාවේ දිනට පසුව මූල්‍ය ප්‍රකාශ සම්බන්ධයෙන් යම් විගණන ක්‍රියා පටිපාටි ඉටු කිරීමට විගණකවරයාට කිසිදු බැඳීමක් නොමැත. කෙසේ වෙතත්, විගණකගේ වාර්තාවේ දිනට පසුව නමුත් මූල්‍ය ප්‍රකාශ නිකුත්කළ දිනට පෙර, විගණක හට කරුණක් දැනගත හැකිවූයේ නම්, එය විගණකගේ වාර්තාවේ දිනයේ දී විගණක දැන සිටියේ නම්, විගණක හට විගණකගේ වාර්තාව සංශෝධනය කිරීමට එය හේතු වන්නට ඇත. විගණක විසින් කළ යුත්තේ : (යොමුව : ~~අ 11 ඡේදය~~)<br>....... | විගණකගේ වාර්තාවේ දිනට පසුව මූල්‍ය ප්‍රකාශ සම්බන්ධයෙන් යම් විගණන ක්‍රියා පටිපාටියක් ඉටු කිරීමට විගණකවරයාට කිසිදු බැඳීමක් නොමැත. කෙසේ වෙතත්, විගණකගේ වාර්තාවේ දිනට පසුව නමුත් මූල්‍ය ප්‍රකාශ නිකුත්කළ දිනට පෙර, විගණකහට කරුණක් දැනගත හැකිවූයේ නම්, එය විගණකගේ වාර්තාවේ දිනයේ දී විගණක දැන සිටියේ නම්, විගණක හට විගණකගේ වාර්තාව සංශෝධනය කිරීමට එය හේතු වන්නට ඇත. විගණක විසින් කළ යුත්තේ : (යොමුව : අ 11-අ 12 ඡේද)<br>....... |
| 12 (අ) | විගණකගේ වාර්තාව සංශෝධනය කිරීමට අතිරේක දිනයක් ඇතුළත් කිරීම එම සංශෝධනයට සීමාවේ, ඒ අනුව එහි ප්‍රතිඵලයක් ලෙස ඇඟවෙන්නේ පසුව ඇතිවන සිදුවීම් පිළිබඳ විගණකගේ ක්‍රියා පටිපාටීන් මූල්‍ය ප්‍රකාශයෙහි අදාළ සටහනේ විස්තර කර ඇති මූල්‍ය ප්‍රකාශ සංශෝධනය කිරීමට තනිකරම සීමාවී ඇති බව ; හෝ (යොමුව :~~අ 12 ඡේදය~~) | විගණකගේ වාර්තාව සංශෝධනය කිරීමට අතිරේක දිනයක් ඇතුළත් කිරීම එම සංශෝධනයට සීමාවන අතර, ඒ අනුව එහි ප්‍රතිඵලයක් ලෙස ඇඟවෙන්නේ පසුව ඇතිවන සිදුවීම් පිළිබඳ විගණකගේ ක්‍රියා පටිපටීන් මූල්‍ය ප්‍රකාශයෙහි අදාළ සටහනේ විස්තර කර ඇති මූල්‍ය ප්‍රකාශ සංශෝධනය කිරීමට තනිකරම සීමාවී ඇති බව ; හෝ (යොමුව : අ 13 ඡේදය) |
| 13 | සමහර අධිකරණ බල ප්‍රදේශ තුළ, සංශෝධිත මූල්‍ය ප්‍රකාශ නිකුත් කිරීම | සමහර අධිකරණ බල ප්‍රදේශ තුළ , |

| විස්තරය | 2014 | 2017 |
|---|---|---|
| | සඳහා නීතිය, රෙගුලාසි හෝ මූල්‍ය වාර්තාකරණ ආකෘතිමය රාමුව මඟින් කළමනාකරණයට අවශ්‍ය නොකරනවා විය හැකි අතර, ඒ අනුව, විගණක විසින් සංශෝධිත හෝ නව විගණකගේ වාර්තාවක් ලබාදීම අවශ්‍ය නොවේ. කෙසේ වෙතත්, ඒවා සංශෝධනය කළ යුතු යැයි විගණක විසින් විශ්වාස කරන අවස්ථාවන්හි දී කළමනාකරණය මූල්‍ය ප්‍රකාශ සංශෝධනය නොකරන්නේ නම් එවිට: (යොමුව : ~~අ 13 - අ 14 ඡේද~~)<br>(අ) විගණකගේ වාර්තාව තවමත් අස්තිත්ත්වයට ලබා දී නොමැති නම්, විගණක විසින් ~~ශ්‍රී.ලං.වි.ප්‍ර. 705~~ න් අවශ්‍යකරන පරිදි මතය විකරණය කර විගණකගේ වාර්තාව ලබාදිය යුතුය ; හෝ<br>(ආ) විගණකගේ වාර්තාව දැනටමත් අස්තිත්ත්වයට ලබා දී ඇත්නම් විගණක කළමනාකරණය සහ පාලනය පිළිබඳ වගකිව යුතු සියල්ලන්ම අස්තිත්ත්වය කළමනාකරණය කිරීමට සම්බන්ධ නොවන්නේ නම්, පාලනය පිළිබඳ වගකිව යුතු අයට අවශ්‍යකරන සංශෝධන සිදු කිරීමට පෙර තෙවන පාර්ශවයන්ට මූල්‍ය ප්‍රකාශ නිකුත් නොකළ යුතු බවට විගණක විසින් දැනුම් දිය යුතුය. එසේ වුවත් අවශ්‍ය කරන සංශෝධන නොමැතිව මූල්‍ය ප්‍රකාශ පසුව නිකුත් කරනු ලැබුවහොත්, විගණකගේ වාර්තාව මත විශ්වාසය තැබීම වැළැක්වීම සඳහා විගණක විසින් සුදුසු ක්‍රියා මාර්ග සොයා බැලිය යුතුය. (යොමුව : ~~අ 15 - අ 16 ඡේද~~). | සංශෝධිත මූල්‍ය ප්‍රකාශ නිකුත් කිරීම සඳහා නීතිය, රෙගුලාසි හෝ මූල්‍ය වාර්තාකරණ ආකෘතිමය රාමුව මඟින් කළමනාකරණයට අවශ්‍ය නොකරනා විය හැකි අතර, ඒ අනුව, විගණක විසින් සංශෝධිත හෝ නව විගණකගේ වාර්තාවක් සැපයිය යුතු නොවේ. කෙසේ වෙතත්, ඒවා සංශෝධනය කළ යුතු යැයි විගණක විසින් විශ්වාස කරන අවස්ථාවන්හි දී කළමනාකරණය මූල්‍ය ප්‍රකාශ සංශෝධනය නොකරන්නේ නම් එවිට : (යොමුව : <u>අ 14 - අ 15ඡේද</u>)<br>(අ) විගණකගේ වාර්තාව තවමත් අස්තිත්ත්වයට ලබා දී නොමැති නම්, විගණක විසින් <u>ශ්‍රී.ලං.වි.ප්‍ර. 705 (සංශෝධිත)</u> න් අවශ්‍යකරන පරිදි මතය විකරණය කර විගණකගේ වාර්තාව ලබාදිය යුතුය ; හෝ<br>(ආ) විගණකගේ වාර්තාව දැනටමත් අස්තිත්ත්වයට ලබා දී ඇත්නම් විගණක කළමනාකාරිත්වයට සහ පාලනය පිළිබඳ වගකිව යුතු සියල්ලන්ම අස්තිත්ත්වය කළමනාකරණය කිරීමට සම්බන්ධ නොවන්නේ නම්, පාලනය පිළිබඳ වගකිව යුතු අයට අවශ්‍යකරන සංශෝධන සිදුකිරීමට පෙර තෙවන පාර්ශවයන්ට මූල්‍ය ප්‍රකාශ නිකුත් නොකළ යුතු බවට විගණක විසින් දැනුම් දිය යුතුය. එසේ වුවත් අවශ්‍ය කරන සංශෝධන නොමැතිව මූල්‍ය ප්‍රකාශ පසුව නිකුත් කරනු ලැබුවහොත්, විගණකගේ වාර්තාව මත විශ්වාසය තැබීම වැළැක්වීම සඳහා විගණක විසින් සුදුසු ක්‍රියා මාර්ග සොයා බැලිය යුතුය. (<u>යොමුව : අ 16 - අ 17</u> ඡේද). |
| 14 (ඇ) | කළමනාකාරිත්වය විසින් මූල්‍ය ප්‍රකාශ තුළ ඇති මෙම කරුණ විසඳීමට අදහස් කරන්නේ කෙසේදැයි විමසන්න. | කළමනාකාරිත්වය විසින් මූල්‍ය ප්‍රකාශ තුළ ඇති මෙම කරුණ විසඳීමට අදහස් කරන්නේ කෙසේදැයි විමසන්න. (<u>යොමුව : අ 18 ඡේදය</u>) |
| 15 | කළමනාකරණය මූල්‍ය ප්‍රකාශ සංශෝධනය කරන්නේ නම් විගණක විසින්: (යොමුව : ~~අ 17 ඡේදය~~)<br>........ | කළමනාකරණය මූල්‍ය ප්‍රකාශ සංශෝධනය කරන්නේ නම් විගණක විසින් :(<u>යොමුව : අ 19 ඡේදය</u>)<br>........ |
| 17 | පෙර නිකුත් කරන ලද මූල්‍ය ප්‍රකාශ ලැබුණු ඕනෑම කෙනෙකුට තත්ත්වය පිළිබඳව දැනුම් දීම සහතිකවීමට කළමනාකරණය විසින් අවශ්‍ය පියවර නොගන්නේ නම් සහ පවත්නා තත්ත්වයන්හි දී විගණක විසින් ඒවා සංශෝධනය කිරීම අවශ්‍ය යැයි විශ්වාස කරන අවස්ථාවන්හිදී, මූල්‍ය ප්‍රකාශ සංශෝධනය නොකරනවිට | පෙර නිකුත් කරන ලද මූල්‍ය ප්‍රකාශ ලැබුණු ඕනෑම කෙනෙකුට තත්ත්වය පිළිබඳව දැනුම් දීම සහතිකවීමට කළමනාකරණය විසින් අවශ්‍ය පියවර නොගන්නේ නම් සහ පවත්නා තත්ත්වයන්හි දී විගණක විසින් ඒවා සංශෝධනය කිරීම අවශ්‍ය යැයි විශ්වාස කරන අවස්ථාවන්හිදී, මූල්‍ය ප්‍රකාශ සංශෝධනය නොකරනවිට කළමණාකරණයට සහ |

| විස්තරය | 2014 | 2017 |
|---|---|---|
| | කළමණාකරණයට සහ අස්තිත්ත්වය කළමණාකරණය කිරීම සඳහා පාලනය පිළිබඳ වගකීමට සියල්ලන්ම සම්බන්ධ වන්නේ නම් මිස පාලනය පිළිබඳ වගකිව යුතු අය විගණකගේ වාර්තාව මත අනාගත විශ්වාසය තැබීම වැළැක්වීමට විගණක විසින් සොයා බලනු ඇති බව විගණක දැනුම් දිය යුතුය. එවැනි දැනුම් දීමක් සිදුකර තිබිය දී ත්, කළමණාකරණය හෝ පාලනය පිළිබඳ වගකිව යුතු අය මෙම අවශ්‍ය පියවර නොගන්නේ නම්, විගණකගේ වාර්තාව මත විශ්වාසය තැබීම වැළැක්වීමට සුදුසු පියවර ගැනීමට විගණක සොයා බැලිය යුතුය. (යොමුව : ~~අ 18 ඡේදය~~) | අස්තිත්ත්වය කළමණාකරණය කිරීම සඳහා පාලනය පිළිබඳ වගකීමට සියල්ලන්ම සහභාගි නොවන්නේ නම් මිස පාලනය පිළිබඳ වගකිව යුතු අය විගණකගේ වාර්තාව මත අනාගත විශ්වාසය තැබීම වැළැක්වීමට විගණක විසින් සොයා බලනු ඇති බව විගණක විසින් දැනුම් දිය යුතුය. එවැනි දැනුම් දීමක් සිදුකර තිබියදීත්, කළමණාකරණය හෝ පාලනය පිළිබඳ වගකිව යුතු අය මෙම අවශ්‍ය පියවර නොගන්නේ නම්, විගණකගේ වාර්තාව මත විශ්වාසය තැබීම වැළැක්වීමට සුදුසු පියවර ගැනීමට විගණක සොයා බැලිය යුතුය. (යොමුව : අ 20 ඡේදය) |
| අ1 | මූල්‍ය ප්‍රකාශ නිකුත් කිරීමෙන් පසු විගණනය කරන ලද මූල්‍ය ප්‍රකාශවලට වෙනස් ලේඛන ඇතුළත් වනවිට පසුව සිදුවන සිදුවීම්වලට සම්බන්ධ අතිරේක වගකීම් විගණකට තිබිය හැකිය. උදාහරණ ලෙස පොදු ප්‍රජාවට සුරැකුම්පත් අර්පණය කරනු ලබන අධිකරණ බල ප්‍රදේශයක් තුළ අවශ්‍ය කරන නෛතික හෝ නියාමන අවශ්‍යතාවයන් විගණකට සැළකිල්ලට ගැනීම අවශ්‍ය විය හැකිය. උදාහරණයක් ලෙස අවසාන අර්පණ ලේඛනයේ දිනය දක්වා අතිරේක විගණන ක්‍රියා පටිපාටි ඉටුකිරීමට විගණකහට අවශ්‍ය විය හැකිය. මෙම ක්‍රියා පටිපාටි වලට, 6 සහ 7 ඡේද තුළ සඳහන් කර ඇති අවසාන අර්පන ලේඛනයේ බලාත්මක දිනය හෝ ඊට ආසන්න දිනයක් දක්වා ඉටුකිරීම සහ අර්පණ ලේඛනයේ ඇති වෙනත් තොරතුරු විගණක සම්බන්ධ වූ මූල්‍ය තොරතුරු සමඟ අර්පණ ලේඛණයේ තොරතුරු අනුකූල ද යන්න තක්සේරු කිරීමට අර්පණ ලේඛනය කියවීම ඇතුළත් විය හැකිය. | මූල්‍ය ප්‍රකාශ නිකුත් කිරීමෙන් පසු විගණනය කරන ලද මූල්‍ය ප්‍රකාශ (ශ්‍රී.ලං.වි.ප්‍ර. 720 (සංශෝධිත) විෂය පථය තුළ විය හැකි වාර්ෂික වාර්තා හැර) වලට වෙනත් ලේඛන ඇතුලත් වනවිට පසුව සිදුවන සිදුවීම්වලට සම්බන්ධ අතිරේක වගකීම් විගණකට තිබිය හැකිය. උදාහරණ ලෙස පොදු ප්‍රජාවට සුරැකුම්පත් අර්පණය කරනු ලබන අධිකරණ බල ප්‍රදේශයක් තුළ අවශ්‍ය කරන නෛතික හෝ නියාමන අවශ්‍යතාවයන් විගණකට සැලකිල්ලට ගැනීම අවශ්‍ය විය හැකිය. උදාහරණයක් ලෙස අවසාන අර්පණ ලේඛනයේ දිනය දක්වා අතිරේක විගණන ක්‍රියා පටිපාටි සිදුකිරීමට විගණකහට අවශ්‍ය විය හැකිය. මෙම ක්‍රියා පටිපාටිවලට, 6 සහ 7 ඡේද තුළ සඳහන් කර ඇති අවසාන අර්පණ ලේඛනයේ බලාත්මක දිනය හෝ ඊට ආසන්න දිනයක් දක්වා ඉටු කිරීම සහ අර්පණ ලේඛනයේ ඇති වෙනත් තොරතුරු විගණක සම්බන්ධ වූ මූල්‍ය තොරතුරු සමඟ අනුකූල ද යන්න තක්සේරු කිරීමට අර්පණ ලේඛනය කියවීම ඇතුළත් විය හැකිය. |
| ශීර්ෂය | [අනුරූප නොමැත] | *විගණකගේ වාර්තාවේ දිනට පසුව ලබාගත් වෙනත් තොරතුරුවල හැඟවීම් (යොමුව : 10 වන ඡේදය)* |
| 2014 - අනුරූප ඡේද නොමැත. 2017 - අ 11 | (අනුරූප නොමැත.) | විගණකගේ වාර්තාවේ දිනට පසුව නමුත් මූල්‍ය ප්‍රකාශ නිකුත් කළ දිනට පෙර මූල්‍ය ප්‍රකාශ සම්බන්ධයෙන් විගණන ක්‍රියා පටිපාටියක් ඉටු කිරීමට විගණකහට කිසිදු බැඳීමක් නොමැති නමුත්, විගණකගේ වාර්තාවේ දිනට පසුව එහෙත් මූල්‍ය ප්‍රකාශ නිකුත් කරන දිනට පෙර ලබාගත් වෙනත් තොරතුරු ඊට ඇතුළත් විය හැකි අතර, ශ්‍රී.ලං.වි.ප්‍ර. 720 (සංශෝධිත) හි විගණකගේ වාර්තාවේ දිනට පසුව ලබාගත් වෙනත් තොරතුරු සම්බන්ධයෙන්වන අවශ්‍යතා සහ මඟ පෙන්වීම් අඩංගු වේ. |
| ශීර්ෂය | (අනුරූප නොමැත.) | මූල්‍ය ප්‍රකාශ නිකුත් කිරීමෙන් පසුව ලැබෙන වෙනත් තොරතුරුවල හැඟවීම්. (යොමුව : 14 |

| විස්තරය | 2014 | 2017 |
|---|---|---|
| | | වන ඡේදය) |
| 2014 - අනුරූප ඡේද නොමැත. 2017 - අ 18 | (අනුරූප නොමැත.) | විගණකගේ වාර්තාවේ දිනට පසුව ලැබෙන වෙනත් තොරතුරු සම්බන්ධයෙන් විගණකගේ බැඳීම් ශ්‍රී.ලං.වි.ප්‍ර. 720 (සංශෝධිත) හි ආමන්ත්‍රණය වේ. මූල්‍ය ප්‍රකාශ නිකුත් කිරීමෙන් පසු මූල්‍ය ප්‍රකාශ සම්බන්ධයෙන් විගණන ක්‍රියා පටිපාටි කිසිවක් ඉටු කිරීමට විගණකවරයාට කිසිදු බැඳීමක් නොමැති අතර, විගණකගේ වාර්තාවේ දිනට පසුව ලබාගත් වෙනත් තොරතුරු සම්බන්ධයෙන් වන අවශ්‍යතා සහ මඟ පෙන්වීම් ශ්‍රී.ලං.වි.ප්‍ර. 720 (සංශෝධිත ) හි අඩංගු වේ. |
| **ශ්‍රී ලංකා විගණන ප්‍රමිත 570 (ශ්‍රී.ලං.වි.ප්‍ර. 570 - අඛණ්ඩ පැවැත්ම)** | | |
| ශ්‍රී ලංකා විගණන ප්‍රමිතය 570, (2014 ජනවාරි 01 වන දින හෝ ඊට පසුව ආරම්භවන කාල සීමාවන් සඳහා මූල්‍ය ප්‍රකාශ විගණනය සඳහා බල පැවැත්වේ) ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිය 570 (සංශෝධිත) මගින් ආදේශ කර ඇත. (2018 ජනවාරි 01 වන දින හෝ ඊට පසුව ආරම්භවන කාල පරිච්ඡේදයන් සඳහා මූල්‍ය ප්‍රකාශ විගණනය කිරීම සඳහා බලාත්මක වේ. ) | | |
| **ශ්‍රී ලංකා විගණන ප්‍රමිත 580 (ශ්‍රී. ලං.වි.ප්‍ර. 580 - ලිඛිත නියෝජනයන්)** | | |
| අ3 | මූල්‍ය ප්‍රකාශ පිළියෙල කිරීම සඳහා එහි වගකීම සහ අස්තිත්ත්වයේ ව්‍යාපාරික කටයුතු පවත්වා ගෙන යාමේ එහි වගකීම හේතුවෙන්, මූල්‍ය ප්‍රකාශ පිළියෙල කිරීමේ ~~සහ ඉදිරිපත් කිරීමේ~~ සහ ලිඛිත නියෝජනයන් පදනම් කරගත යුත්තේ කුමන සැදැහුම් පිළිබඳව අස්තිත්ත්වය විසින් අනුගමනය කරනු ලබන ක්‍රියාවලිය සම්බන්ධිතව ප්‍රමාණවත් දැනුමක් කළමනාකරණයට ඇතැයි අපේක්ෂා කෙරේ. | මූල්‍ය ප්‍රකාශ පිළියෙල කිරීම සඳහා එහි වගකීම සහ අස්තිත්ත්වයේ ව්‍යාපාරික කටයුතු පවත්වා ගෙන යාමේ එහි වගකීම හේතුවෙන්, මූල්‍ය ප්‍රකාශ පිළියෙල කිරීමේ සහ ලිඛිත නියෝජනයන් පදනම් කරගත යුත්තේ කුමන සැදැහුම් පිළිබඳව අස්තිත්ත්වය විසින් අනුගමනය කරනු ලබන ක්‍රියාවලිය සම්බන්ධිතව ප්‍රමාණවත් දැනුමක් කළමනාකරණයට ඇතැයි අපේක්ෂා කෙරේ. |
| 1 වන පරිශිෂ්ඨය | .....<br>මෙම පරිශිෂ්ඨය මගින් වෙනත් ශ්‍රී.ලං.වි.ප්‍ර. වල ඇති ~~2014 ජනවාරි 01 වන දින හෝ ඊට පසුව ආරම්භ වන කාල පරිච්ඡේද සඳහා වන මූල්‍ය ප්‍රකාශ විගණනයේදී බල පැවැත්වෙන~~ විෂය කරුණු සඳහා නිශ්චිත ලිඛිත නියෝජනයන් අවශ්‍ය වන ඡේද හඳුනාගනී. ශ්‍රී.ලං.වි.ප්‍ර. තුළ අවශ්‍යතාවයන් සහ සම්බන්ධිත යෙදුම් සහ වෙනත් පැහැදිලි කිරීමේ කරුණ සළකා බැලීම් සඳහා මෙම ලැයිස්තුව ආදේශකයක් නොවේ.<br>.....<br>• ~~ශ්‍රී.ලං.වි.ප්‍ර. 570~~ - *අඛන්ඩ පැවැත්ම*-16 (ඉ) ඡේදය.<br>...... | මෙම පරිශිෂ්ඨය මගින් වෙනත් ශ්‍රී.ලං.වි.ප්‍ර. වල ඇති විෂය කරුණ සඳහා නිශ්චිත ලිඛිත නියෝජනයන් අවශ්‍ය වන ඡේද හඳුනාගනී. ශ්‍රී.ලං.වි.ප්‍ර. තුළ අවශ්‍යතාවයන් සහ සම්බන්ධිත යෙදුම් සහ වෙනත් පැහැදිලි කිරීමේ කරුණ සළකා බැලීම සඳහා මෙම ලැයිස්තුව ආදේශකයක් නොවේ.<br>..............<br>• ශ්‍රී.ලං.වි.ප්‍ර. 570 (සංශෝධිත) *අඛණ්ඩ පැවැත්ම* - 16 (ඉ) ඡේදය.<br>......<br>• ශ්‍රී.ලං.වි.ප්‍ර. 720 (සංශෝධිත). *වෙනත් තොරතුරුවලට සම්බන්ධ විගණකගේ වගකීම්* - 13 (ඇ) ඡේදය<br>..... |
| 2 වන පරිශිෂ්ඨය | ....<br>පහත දැක්වෙන නිදර්ශනාත්මක ලිපිය සඳහා මෙම ~~සහ 2014 ජනවාරි 01 දින හෝ ඊට පසුව ආරම්භ වන කාල පරිච්ඡේද සඳහා මූල්‍ය ප්‍රකාශ විගණනය සඳහා බල පැවැත්වෙන වෙනත්~~ ශ්‍රී.ලං.වි.ප්‍ර. මගින් අවශ්‍යකරන ලිඛිත නියෝජනයට ඇතුළත් වේ. මෙම නිදර්ශනයේ දී අදාළ මූල්‍ය වාර්තාකරණ රාමුව වන්නේ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත බවත්, ලිඛිත | ....<br>පහත දැක්වෙන නිදර්ශනාත්මක ලිපිය සඳහා මෙම සහ වෙනත් ශ්‍රීලවිප්‍ර මගින් අවශ්‍යකරණ වන ලිඛිත නියෝජනයන් ඇතුළත්වේ. මෙම නිදර්ශනයේදී අදාළ මූල්‍ය වාර්තාකරණ රාමුව වන්නේ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත බවත්, ලිඛිත නියෝජනයක් ලබාගැනීම සඳහා ශ්‍රී.ලං.වි.ප්‍ර. 570 හි අවශ්‍යතාවය අදාළ නොවන බවත් ; ඉල්ලූ ලිඛිත නියෝජනයන්ට ව්‍යාතිරේඛයන් |

| විස්තරය | 2014 | 2017 |
|---|---|---|
| | නියෝජනයට ලබාගැනීම සඳහා ශ්‍රී.ලං.වි.ප්‍ර. 570 හි අවශ්‍යතාවය අදාළ නොවන බවත් ; ඉල්ලූ ලිඛිත නියෝජනයන්ට ව්‍යාතිරේඛයන් නොමැති බවත් උපකල්පනය කෙරේ: ව්‍යාතිරේඛ තිබේනම්, ව්‍යාතිරේඛ පිළිබිඹු කිරීම සඳහා නියෝජනයන් වෙනස් කිරීම අවශ්‍යවේ.<br>...... | නොමැති බවත් උපකල්පනය කෙරේ: ව්‍යාතිරේඛ තිබේනම්, ව්‍යාතිරේඛ පිළිබිඹු කිරීම සඳහා නියෝජනයන් වෙනස් කිරීම අවශ්‍යවේ.<br>...... |
| **ශ්‍රී ලංකා විගණන ප්‍රමිත 600 (ශ්‍රීලවිප්‍ර 600 - විශේෂ සළකා බැලීම- සමූහ මූල්‍ය ප්‍රකාශ විගණන (සංරචක විගණකවරුන්ගේ වැඩ ඇතුළත්ව))** | | |
| 1 වන පරිශිෂ්ඨය | ~~(යොමුව : අ 19 ඡේදය)~~<br>~~සමූහ කාර්යභාරයේ නියුතු කණ්ඩායමට සමූහ විගණන මතයට පදනම් කර ගැනීමට ප්‍රමාණවත් යෝග්‍ය විගණන සාක්ෂි ලබා ගැනීමට නොහැකිවූ විට වන කොන්දේසි සහිත විගණන මතයක් සඳහා වන උදාහරණය.~~<br><br>~~මෙම උදාහරණයේදී ස්කන්ධ ක්‍රමය මගින් (මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශයේ රුපියල් මිලියන 15ක් ලෙස හඳුනාගෙන ඇති අතර, එය මුළු වත්කම් වන රුපියල් මිලියන 60ක් ලෙස පිළිබිඹු කරයි) ගිණුම්ගත කරන ලද සැළකිය යුතු සංරචකයක් සම්බන්ධයෙන් ප්‍රමාණවත් යෝග්‍ය විගණන සාක්ෂි ලබා ගැනීමට සමූහ කාර්යභාරයේ නියුතු කණ්ඩායමට නොහැකි වූයේ සමූහ කාර්යභාරයේ නියුතු කණ්ඩායම ට ගිණුම්කරණ වාර්තා, කළමනාකරණය හෝ සංරචකයේ විගණක වෙත ප්‍රවේශය නොතිබු බැවිනි.~~<br><br>~~සමූහ කාර්යභාරයේ නියුතු කණ්ඩායම විසින් 20X1 දෙසැම්බර් 31 දිනට සංරචකයේ විගණනය කරන ලද මූල්‍ය ප්‍රකාශ ඒවා විගණකගේ වාර්තාවද ඇතුළුව කියවා ඇති අතර, සංරචකයට සම්බන්ධිත සමූහයේ කළමනාකරණය විසින් තබා ඇති අදාල මූල්‍ය තොරතුරු සලකා බලා ඇත.~~<br>~~සමූහ කාර්යභාරයේ නියුක්ත හවුල්කරුගේ විනිශ්චයේදී වූයේ සමූහ මූල්‍ය ප්‍රකාශ කෙරෙහි ප්‍රමාණවත් යෝග්‍ය විගණන සාක්ෂි ලබා ගැනීමට ඇති නොහැකියාවේ බලපෑම ප්‍රමාණාත්මක නමුත් පෘතුල නොවන බවයි.~~<br><br>~~ස්වාධීන විගණකගේ වාර්තාව.~~<br><br>~~[ යෝග්‍ය පරිදි අමතන අය ]~~<br><br>~~ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශ මත වාර්තාව~~[1]<br><br>~~අප විසින් ABC සමාගමේ සහ එහි පරිපාලිත සමාගම්වල 20X1 දෙසැම්බර් 31 දිනට ඒකාබද්ධ මූල්‍ය තත්ත්වය පිළිබඳ~~ | (යොමුව : අ 19 ඡේදය)<br>සමූහ කාර්යභාරයේ නියුක්ත කණ්ඩායමට සමූහ විගණන මතයට පදනම් කර ගැනීමට ප්‍රමාණවත් යෝග්‍ය විගණන සාක්ෂි ලබා ගැනීමට නොහැකි වන අවස්ථාවක ස්වාධීන විගණකගේ වාර්තාවකට නිදර්ශනය.<br><br>සටහන : මෙම නිදර්ශණාත්මක විගණකගේ වාර්තාව පුරාවටම, ශ්‍රී.ලං.වි.ප්‍ර. 700 (සංශෝධිත) සමඟ අනුකූලව මතය කොටස පළමුව ස්ථානගත කිරීම සහ මතය සඳහා පදනම කොටස, මතය කොටසට පසුව වහාම ස්ථානගත කර ඇත. එසේම විගණකගේ වගකීම් අංශයට ඇතුළත් කළ දැනට පවතින පළමු හා අවසාන වාක්‍යය නව මතය සඳහා වූ පදනම කොටස් කොටසක් ලෙස දැන් අන්තර්ගතකර ඇත.<br><br>**මෙම නිදර්ශනාත්මක විගණකගේ වාර්තාවේ අරමුණු සඳහා පහත දැක්වෙන තත්ත්වයන් උපකල්පනය කෙරේ :**<br>• **සාධාරණ ඉදිරිපත් කිරීමේ ආකෘතිමය රාමුවක් භාවිත කරමින් ලැයිස්තුගත අස්තිත්ත්වයක් නොවන වෙනත් අස්තිත්ත්වයක ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශ කට්ටලයක් විගණනය. මෙම විගණනය, සමූහ විගණනයකි. (එනම්, ශ්‍රී.ලං.වි.ප්‍ර. 600 ව්‍යවහාර වේ.)**<br>• **ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශ පිළියල කරනු ලබන්නේ ශ්‍රීලගිප්‍ර (පොදු අරමුණු සඳහා වන ආකෘතිමය රාමුවකට ) සමඟ අනුකූලව අස්තිත්ත්වයේ කළමනාකරණය විසිනි.**<br>• **විගණන කාර්ය භාරයේ නියමයන් මගින් ශ්‍රී.ලං.වි.ප්‍ර. 210 හි ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශ සඳහා කළමනාකරණයේ වගකීම පිළිබඳ විස්තරයේ පිළිබිඹු වේ.**<br>• **ස්කන්ධ ක්‍රමය ගිණුම්ගත කරන ලද ගණනය කරන ලද සැළකිය යුතු සංරචකයක් සම්බන්ධයෙන් ප්‍රමාණාවත් යෝග්‍ය විගණන සාක්ෂි ලබා ගැනීමට සමූහ කාර්ය භාරයේ නියුතු කණ්ඩායමට නොහැකි වූයේ** |

| විස්තරය | 2014 | 2017 |
|---|---|---|
| | ~~ප්‍රකාශය සහ එම දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා ඒකාබද්ධ විස්තීර්ණ ආදායම් ප්‍රකාශය සහ ඒකාබද්ධ ස්කන්ධයෙහි වෙනස්වීම් ප්‍රකාශය සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශය සහ වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ වෙනත් පැහැදිලි කිරීමේ තොරතුරු වල සාරාංශයක් සමඟ එක්ව ඇති ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශ විගණනය කර ඇත.~~<br><br>~~*ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශ සඳහා කළමනාකරණයේ*[2] *වගකීම*~~<br><br>~~ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතීන්ට[3] අනුකූලව මෙම ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශ පිළියෙල කිරීම සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම කළමණාකරනය වගකිව යුතු වන අතර, මේ සඳහා වංචා හෝ වැරදි හේතුවෙන් ප්‍රමාණාත්මක අව ප්‍රකාශයන්ගෙන් තොර ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශ පිළියෙල කිරීමට හැකිවන පරිදි කළමනාකරණය විසින් තීරණය කරනු ලබන අභ්‍යන්තර පාලනය අවශ්‍ය වේ.~~<br><br>~~*විගණකගේ වගකීම.*~~<br><br>~~අපගේ වගකීම වන්නේ අපගේ විගණනය මත පදනම්ව මෙම ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශ පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමයි. අපගේ විගණනය ශ්‍රී ලංකා විගණන ප්‍රමිතීන්ට අනුකූලව සිදු කරන ලදී. එම ප්‍රමිතීන්ට අනුව අප අචාර ධර්ම අවශ්‍යතාවන්ට අනුකූලව කටයුතු කළයුතු අතර, ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශ ප්‍රමාණාත්මක අවප්‍රකාශයන්ගෙන් තොර ද යන්න පිළිබඳව සාධාරණ සහතික වීමක් ලබාගැනීම සඳහා විගණනය සැලසුම් කර ඉටු කිරීම අවශ්‍ය කෙරේ. විගණනයකට ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශ තුල ඇති වටිනාකම් හා හෙළිදරව් කිරීම් පිළිබඳ විගණන සාක්ෂි ලබා ගැනීම සඳහා වූ ක්‍රියා පටිපාටි ඉටුකිරීම අවශ්‍යයැයි තෝරාගත් ක්‍රියා පටිපාටි රඳා පවතින්නේ වංචා හෝ වැරදි නිසා ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශ වල ප්‍රමාණාත්මක අව ප්‍රකාශ වීමේ අවදානම් තක්සේරු කිරීම ඇතුළුව විගණකගේ විනිශ්චය මතය. එම අවදානම් තක්සේරු කිරීම් වලදී, විගණක විසින් තත්ත්වයන් තුල යෝග්‍ය විගණන ක්‍රියා පටිපාටි සැලසුම් කිරීමට හැකිවීම සඳහා අස්තිත්ත්වයේ ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශ පිළියෙල කිරීම සහ සාධාරණ ඉදිරිපත් කිරීමට[4] අදාල අභ්‍යන්තර පාලනය සළකා බලන නමුත් එය අස්තිත්ත්වයේ අභ්‍යන්තර පාලනයෙහි[5] සඵලදායිත්වය පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමේ අරමුණු සඳහා නොවේ. විගණනයකට ඇතුලත් වන්නේ ගිණුම්කරණ ප්‍රතිපත්තිවල යෝග්‍යතාවය සහ කළමනාකරණය විසින් සිදු කරන ලද ගිණුම්කරණ ඇස්තමේන්තු වල සාධාරණත්වය ඇගයීම මෙන්ම ඒකාබද්ධ~~ | (මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශයේ රුපියල් මිලියන 15 ක් ලෙස හඳුනාගෙන ඇති අතර, එය මුළු වත්කම් රුපියල් මිලියන 60 ක් ලෙස පිළිබිඹු කරයි.) සමූහ කාර්යභාරයේ නියුතු කණ්ඩායමට ගිණුම්කරණ වාර්තා, කළමනාකරණය හෝ සංරචකයේ විගණක වෙත ප්‍රවේශය නොතිබූ බැවිනි.<br>• සමූහයේ කාර්යභාරයේ නියුතු කණ්ඩායම 20X1 දෙසැම්බර් වන දිනට වූ සංරචකයේ විගණනය කරන ලද මූල්‍ය ප්‍රකාශ සහ ඒ මත වූ විගණකගේ වාර්තාව ඇතුළුව කියවා ඇති අතර සංරචකයට සම්බන්ධව සමූහයේ කළමනාකාරිත්වය විසින් තබාගෙන ඇති සම්බන්ධිත මූල්‍ය තොරතුරු සැළකිල්ලට ගෙන ඇත.<br>• සමූහ කාර්යභාරයේ නියුක්ත හවුල්කරුගේ විනිශ්චය වූයේ ප්‍රමාණවත් යෝග්‍ය විගණන සාක්ෂි ලබාගැනීමට ඇති නොහැකියා මත සමූහ මූල්‍ය ප්‍රකාශ කෙරෙහි බලපෑම ප්‍රමාණාත්මක නමුත් පෘථුල නොවන බවයි.[6]<br>• වෘත්තීය ගණකාධිකාරි වරුන් සඳහා වන ආචාරධර්ම සංග්‍රහය ( ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරි ආයතනයේ සංග්‍රහය) විගණනයට ව්‍යවහාර වන සියළුම අදාල ආචාරධර්ම අවශ්‍යතා වලින් සමන්විත වේ.<br>• ලබාගත් විගණන සාක්ෂි මත පදනම් ව විගණක විසින් නිගමනය කර ඇත්තේ, ශ්‍රී.ලං.වි.ප්‍ර. 570 (සංශෝධිත)[7] ට අනුකූලව අස්තිත්ත්වයේ අඛණ්ඩ පැවැත්ම ලෙස දිගටම පවත්වාගෙන යාම පිළිබඳ සැලකිය යුතු සැකයක් ඇති කල හැකි සිදුවීම් හෝ තත්ත්වයන්ට හා සම්බන්ධ ප්‍රමාණාත්මක අනියතතාවයක් නොමැති බවයි.<br>• ශ්‍රී.ලං.වි.ප්‍ර. 701[8] ට අනුකූලව ප්‍රධාන විගණන කරුණු සන්නිවේදනය කිරීම විගණකහට අවශ්‍ය නොවන අතර, වෙනත් ආකාරයකින් එය කිරීමට තිරණය කර නොමැත.<br>• විගණකගේ වාර්තාවේ දිනට පෙර විගණක විසින් වෙනත් සියළුම තොරතුරු ලබාගෙන ඇති අතර, ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශ පිළිබඳ කොන්දේසි සහිත මතය එසේම වෙනත් තොරතුරු කෙරෙහිද බලපායි.<br>• ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශ අධීක්ෂණය කිරීම සඳහා වගකිව යුතු අය, ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශ පිළියෙල කිරීම් සඳහා වගකිව යුතු අයගෙන් වෙනස් |

| විස්තරය | 2014 | 2017 |
|---|---|---|
| | ~~මූල්‍ය ප්‍රකාශවල සමස්ත ඉදිරිපත් කිරීම ඇගයීමය.~~<br><br>~~අපගේ කොන්දේසි සහිත විගණන මතයට පදනමක් ලබාදීම සඳහා අප ලබාගත් විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ යෝග්‍ය යැයි අප විශ්වාස කරමු.~~<br><br>~~*කොන්දේසි සහිත මතය සඳහා පදනම*~~<br>~~ABC සමාගමේ වසර තුළදී අත් කරගත් විදේශීය ආශ්‍රිතයක් වන XYZ සමාගමෙහි ආයෝජනය 20x1 දෙසැම්බර් 31 දිනට ස්කන්ධ ක්‍රමයට ඒකාබද්ධ මූල්‍ය තත්ත්ව ප්‍රකාශය මත රුපියල් මිලියන 15 කට ධාරණ අගයකට ගිණුම්ගත කර ඇති අතර, XYZ හි ශුද්ධ ආදායම වන රුපියල් මිලියන 1 ක ABC හි කොටස, එම දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා වූ ඒකාබද්ධ විස්තීර්ණ ආදායම් ප්‍රකාශයට ඇතුළත් වේ. 20x1 දෙසැම්බර් 31 දිනට XYZ සඳහා ABC හි ආයෝජනය කල මුදලෙහි ධාරණ අගය සහ වර්ෂය සඳහා XYZ හි ශුද්ධ ආදායමෙන් ABC හි කොටස පිළිබඳ ප්‍රමාණවත් සුදුසු විගණන සාක්ෂි ලබා ගැනීමට අපට නොහැකි වූයේ, XYZ හි මූල්‍ය තොරතුරු, කළමනාකරණය සහ විගණක වරුන් වෙත අපහට ප්‍රවේශය අහිමි කළ බැවිනි. එහි ප්‍රතිඵලයක් වශයෙන්, මෙම වටිනාකම් සඳහා කිසියම් ගැලපුම් කිරීමට අවශ්‍යදැයි අපට නිරීක්ෂණය කිරීමට නොහැකි විය.~~<br><br>~~*කොන්දේසි සහිත මතය.*~~<br>~~අපගේ මතය අනුව, කොන්දේසි සහිත මතය සඳහා පදනම ඡේදයේ විස්තර කර ඇති කරුණෙන් ඇතිවිය හැකි බලපෑම් හැර, ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතීන් ට අනුකූලව ABC සමාගමෙහි සහ එහි පරිපාලිතයන්හි 20x1 දෙසැම්බර් 31 වැනි දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්ය සාධනය සහ මුදල් ප්‍රවාහයන්, ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශ සියලුම ප්‍රමාණාත්මක අංගයන්ගෙන් සාධාරණ ලෙස (හෝ සත්‍ය සහ සාධාරණ දර්ශණයන්ගෙන්) ඉදිරිපත් කරයි.~~<br><br>~~වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳ වාර්තාව.~~<br>~~[විගණකගේ වාර්තාවේ මෙම කොටසේ ආකෘතිය සහ අන්තර්ගතය විගණකගේ වෙනත් වාර්තාකරණ වගකීම් වල ස්වභාවය අනුව වෙනස් වේ].~~<br><br>~~[විගණකගේ අත්සන]~~ | **වේ.**<br>• **ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශ විගණනයට අමතරව, දේශීය නීතිය යටතේ අවශ්‍ය වෙනත් වාර්තාකරණ වගකීම් විගණක වරයාට ඇත.**<br><br>ස්වාධීන විගණකගේ වාර්තාව<br><br>ABC සමාගමේ කොටස් හිමියන් වෙත [හෝ යෝග්‍ය පරිදි අමතන අය]<br>ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශ විගණනය මත වාර්තාව[9]<br><br>**කොන්දේසි සහිත මතය.**<br><br>අප ABC සමාගමේ සහ එහි පරිපාලිතයන්හි (සමූහය) 20x1 දෙසැම්බර් 31 දිනට ඒකාබද්ධ මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය සහ එම දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා ඒකාබද්ධ විස්තීර්ණ ආදායම් ප්‍රකාශය , ඒකාබද්ධ ස්කන්ධයේ වෙනස්වීම් ප්‍රකාශය සහ ඒකාබද්ධ මුදල් ප්‍රවාහ ප්‍රකාශය සහ වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති වල සාරාංශයකින් ඇතුළුව ඒකාද්ධ මූල්‍ය ප්‍රකාශවල සටහන්වලින් සමන්විත ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශ විගණනය කළෙමු.<br>අපගේ මතය අනුව, අපගේ වාර්තාවේ කොන්දේසි සහිත මතය සඳහා වන කොටසෙහි පදනම විස්තර කර ඇති කරුණෙහි විය හැකි බලපෑම් හැර, මේ සමග ඇති ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශ 20x1 දෙසැම්බර් 31 වැනි දිනට සමූහයේ ඒකාබද්ධ මූල්‍ය තත්ත්වය සහ එම දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා ඒකාබද්ධ මූල්‍ය කාර්ය සාධනය සහ ඒවායේ ඒකාබද්ධ මුදල් ප්‍රවාහයන් ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතීන් (ශ්‍රීලගිප්‍ර) ට අනුකූලව සෑම ප්‍රමාණාත්මක අංගයකින්ම (හෝ සත්‍ය හා සාධාරණ දර්ශනයක් ලබා දීමට) සාධාරණ ලෙස ඉදිරිපත් කරයි.<br><br>**කොන්දේසි සහිත මතය සඳහා පදනම.**<br>ABC සමාගමේ වසර තුළදී අත් කරගත් විදේශීය ආශ්‍රිතයක් වන XYZ සමාගමෙහි ආයෝජනය 20x1 දෙසැම්බර් 31 දිනට ස්කන්ධ ක්‍රමයට ගිණුම් ගතකර ඒකාබද්ධ මූල්‍ය තත්ත්ව ප්‍රකාශ මත රුපියල් මිලියන 15 කට ධාරණ අගය ඇති අතර, XYZ හි ශුද්ධ ආදායම වන රුපියල් මිලියන 1 ක ABC හි කොටස, එම දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා වූ ඒකාබද්ධ විස්තීර්ණ ආදායම් ප්‍රකාශයට ඇතුළත් වේ. 20x1 දෙසැම්බර් 31 දිනට XYZ සඳහා ABC හි ආයෝජනයේ ධාරණ අගය පිළිබඳව සහ වර්ෂය සඳහා XYZ හි ශුද්ධ ආදායමෙන් ABC හි කොටස පිළිබඳ |

| විස්තරය | 2014 | 2017 |
|---|---|---|
| | ~~[විගණකගේ වාර්තාවේ දිනය]~~<br><br>~~[විගණකගේ ලිපිනය].~~<br><br>~~සමූහ කාර්යභාරයේ නියුක්ත හවුල්කරුගේ විනිශ්චයේදී ප්‍රමාණවත් යෝග්‍ය විගණන සාක්ෂි ලබාගැනීමට ඇති නොහැකියාව සමූහ මූල්‍ය ප්‍රකාශ කෙරෙහි වන බලපෑම ප්‍රමාණාත්මක හා පෘතුල නම්, සමූහ කාර්යභාරයේ නියුතු හවුල්කරු ශ්‍රී.ලං.වි.ප්‍ර. 705 ට අනුකූලව මතය වියාචනය කරනු ඇත.~~ | ප්‍රමාණවත් සුදුසු විගණන සාක්ෂි ලබා ගැනීමට අපට නොහැකි වූයේ XYZ හි මූල්‍ය තොරතුරු, කළමනාකරණය සහ XYZ හි විගණකවරුන් වෙත අපහට ප්‍රවේශය අහිමි කල බැවිනි. එහි ප්‍රතිඵලයක් වශයෙන් මෙම වටිනාකම් සඳහා කිසියම් ගැලපුම් කිරීමට අවශ්‍යදැයි අපට නිර්ණය කිරීමට නොහැකි විය.<br><br>අපගේ විගණනය ශ්‍රී ලංකා විගණන ප්‍රමිත (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව සිදුකරන ලදී. එම ප්‍රමිතීන් යටතේ අපගේ වගකීම් අපගේ වාර්තාවේ *ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශ විගණනය සඳහා විගණකගේ වගකීම්* කොටසෙහි තවදුරටත් විස්තර කෙරේ. *වෘත්තීය ගණකාධිකාරිවරුන් සඳහා වන ආචාර ධර්ම සංග්‍රහයට* (ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරි ආයතනයේ සංග්‍රහය ) අනුකූලව අප සමූහයෙන් ස්වාධීන වන අතර, ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරි ආයතනයේ සංග්‍රාහය සමග අනුකූලව අපගේ අනෙකුත් ආචාර ධර්ම වගකීම් අප විසින් ඉටුකර ඇත. අපගේ කොන්දේසි සහිත විගණන මතයට පදනමක් සැපයීම සඳහා අප ලබාගත් විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ යෝග්‍ය යැයි අපි විශ්වාස කරමු.<br>වෙනත් තොරතුරු [හෝ සුදුසු නම් "මූල්‍ය ප්‍රකාශ සහ ඒ මත වූ විගණකගේ වාර්තාව හැර වෙනත් තොරතුරු" වැනි යෝග්‍ය වන්නේනම් වෙනත් සිරස්තලයක්]<br><br>[*ශ්‍රී.ලං.වි.ප්‍ර. 720 (සංශෝධිත)*[10] *හි වාර්තා කිරීමේ අවශ්‍යතාවයන් සමග අනුකූලව වාර්තා කිරීම - ශ්‍රී.ලං.වි.ප්‍ර. 720 (සංශෝධිත) හි 2 වන පරිශිෂ්ඨයේ නිදර්ශන 6 බලන්න. නිදර්ශන 6 හි වෙනත් තොරතුරු කොටසේ අවසාන ඡේදය වෙනම තොරතුරු වලට ද බලපාන කොන්දේසි සහිත මතයට තුඩු දෙන නිශ්චිත කාරණය විස්තර කිරීම සඳහා අභිරුචිකරණය කරනු ලැබේ*].<br><br>ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශ සඳහා කළමනාකරණයේ සහ පාලනය පිළිබඳ වගකිව යුතු අයගේ වගකීම් [11]<br><br>*[ශ්‍රී.ලං.වි.ප්‍ර. 700 (සංශෝධික)*[12] *ට අනුකූලව වාර්තා කිරීම - ශ්‍රී.ලං.වි.ප්‍ර.700 (සංශෝධිත) හි ඇති 2 වන නිදර්ශනය බලන්න.]*<br><br>ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශ විගණනය සඳහා විගණකගේ වගකීම්<br><br>[*ශ්‍රී.ලං.වි.ප්‍ර. 700 (සංශෝධිත) සමග අනුකූලව වාර්තා කිරීම - ශ්‍රී.ලං.වි.ප්‍ර. 700 (සංශෝධිත) හි 2 වන නිදර්ශනය බලන්න. ලැයිස්තුගත අස්තිත්ත්ව වල විගණන සඳහා පමණක් අදාළ* |

| විස්තරය | 2014 | 2017 |
|---|---|---|
| | | *වන අවසාන ඡේද දෙක ඇතුළත් නොකරනු ඇත.]*<br><br>**වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා මත වාර්තාව**<br>*[ශ්‍රී.ලං.වි.ප්‍ර. 700 (සංශෝධිත) ට අනුකූලව වාර්තා කිරීම - ශ්‍රී.ලං.වි.ප්‍ර. 700 (සංශෝධිත) හි ඇති 2 වන නිදර්ශනය බලන්න]*<br><br>*[විගණන සමාගමේ නමින්, විගණකගේ පෞද්ගලික නමින් හෝ දෙකම, යම් අධිකරණ බල ප්‍රදේශයකට යෝග්‍ය පරිදි අත්සන් කිරීම]*<br>*[විගණකගේ ලිපිනය]*<br>*[දිනය]*<br><br>සමූහ කාර්යභාරයේ නියුක්ත හවුල්කරුගේ විනිශ්චය තුළදී, ප්‍රමාණවත් යෝග්‍ය විගණන සාක්ෂි ලබා ගැනීමට ඇති නොහැකියාව, සමූහ මූල්‍ය ප්‍රකාශ කෙරෙහි වන බලපෑම ප්‍රමාණාත්මක හා පෘතුල නම්, සමූහ කාර්යභාරයේ නියුක්ත හවුල්කරු ශ්‍රී.ලං.වි.ප්‍ර. 705 (සංශෝධිත) සමග අනුකූලව මතය වියාචනය කරනු ඇත. |
| | 1 ~~"වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳ වාර්තාව" යන දෙවන උප මාතෘකාව අදාළ නොවන අවස්ථාවන්හිදී "ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශ පිළිබඳ වාර්තාව" යන උප මාතෘකාව අනවශ්‍යය.~~<br>2 ~~හෝ යම් විශේෂ අධිකරණ බල ප්‍රදේශයක් තුළ නෛතික ආකෘතිමය රාමුවේ සන්දර්භය තුළ යෝග්‍ය වෙනත් යෙදුමක්.~~<br>3 ~~සත්‍ය හා සාධාරණ දර්ශණයක් ලබාදෙන ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශ පිළියෙල කිරීම කළමනාකරණයේ වගකීම වනවිට, මෙය මෙලෙස කියවිය හැකිය. "ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතීන් සමග අනුකූලව සත්‍ය හා සාධාරණ දර්ශනයක් ලබාදෙන ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශ පිළියෙල කිරීම කළමනාකරණයේ වගකීම වීම සහ ඒ සඳහා "~~<br>4 ~~27 වන පාද සටහනට අනුව මෙය මෙසේ කියවිය හැකිය : "අස්තිත්ත්වය විසින් ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශ පිළියෙල කිරීමේදී සත්‍ය හා සාධාරණ දර්ශණයන් ගෙනදෙන අදාළ කරගත් අභ්‍යන්තර පාලනය විගණක විසින් එම අවදානම් තක්සේරු කිරීමේදී තත්ත්වයන්ට ගැලපෙන විගණන ක්‍රියා පටිපාටි සැලසුම් කිරීම හැකිවීම සළකා බලන නමුත් එසේ කරන්නේ අස්තිත්ත්වයේ අභ්‍යන්තර පාලනයේ~~ | 6 සමූහ කාර්යභාරයේ නියුක්ත හවුල්කරුගේ විනිශ්චය තුළදී ප්‍රමාණවත් යෝග්‍ය විගණන සාක්ෂි ලබා ගැනීමට ඇති නොහැකියාව, සමූහ මූල්‍ය ප්‍රකාශ කෙරෙහි වන බලපෑම ප්‍රමාණාත්මක හා පෘතුල නම්, සමූහ කාර්යභාරයේ නියුක්ත හවුල්කරු ශ්‍රී.ලං.වි.ප්‍ර. 705 (සංශෝධිත) සමග අනුකූලව මතය වියාචනය කරනු ඇත<br>7 ශ්‍රී.ලං.වි.ප්‍ර. 570 (සංශෝධිත), *අඛන්ඩ පැවැත්ම.*<br>8 ශ්‍රී.ලං.වි.ප්‍ර. 701, *ස්වාධීන විගණකගේ වාර්තාවේ ඇති ප්‍රධාන විගණන කරුණු සන්නිවේදනය කිරීම.*<br>9 "වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳ වාර්තාව" යන දෙවන උප මාතෘකාව අදාළ අනවශ්‍ය වන අවස්ථාවන්හිදී "ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශ පිළිබඳ වාර්තාව" යන උප මාතෘකාව අදාළ නොවේ.<br>10 *ශ්‍රී.ලං.වි.ප්‍ර. 720 (සංශෝධිත), වෙනත් තොරතුරු සම්බන්ධ විගණකගේ වගකීම්.*<br>11 මෙම නිදර්ශනාත්මක විගණකගේ විගණන වාර්තා පුරාවටම කළමනාකරණය සහ පාලනය පිළිබඳ වගකිවයුතු අය යන යෙදුම්, විශේෂිත අධිකරණ බල සීමාව තුළ ඇති නෛතික ආකෘතිමය රාමුවේ සන්දර්භය තුළ යෝග්‍ය වෙනත් යෙදුමකින් ආදේශ කිරීම අවශ්‍ය විය හැකිය. |

| විස්තරය | 2014 | 2017 |
|---|---|---|
| | ~~සඵලදායීතාවය පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමේ අරමුණෙන් නොවේ. ”~~<br>5 ~~ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශ වල විගණනය සමග එක්ව අභ්‍යන්තර පාලනයේ සඵලදායීතාවය පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමට විගණකවරයාට වගකීමක් ඇති අවස්ථාවලදී මෙම වාක්‍යය පහත පරිදි සඳහන් වේ. “එම අවදානම් තක්සේරු කිරීමේදී, අස්තිත්වය විසින් ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශ පිළියෙල කිරීමේදී සහ සාධාරණ ඉදිරිපත් කිරීමකට අදාල අභ්‍යන්තර පාලනය තත්ත්වයන්ට ගැලපෙන විගණන ක්‍රියා පටිපාටි සැලසුම් කිරීම සඳහා විගණක විසින් සළකා බලයි. 27 වන පාද සටහන සම්බන්ධයෙන් එය මෙසේ කියවිය හැකිය. ” එම අවදානම් තක්සේරු කිරීමේදී අස්තිත්වය විසින් සත්‍ය හා සාධාරණ දර්ශණයක් ගෙනදෙන අස්තිත්වයේ ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශ පිළියෙල කිරීමට අදාළ අභ්‍යන්තර පාලනය තත්ත්වයන්ට ගැලපෙන විගණන ක්‍රියා පටිපාටි සැලසුම් කිරීම සඳහා විගණක විසින් සළකා බලයි.~~ | 12 ශ්‍රී.ලං.වි.ප්‍ර. 700 (සංශෝධිත) *මතයක් සකස් කිරීම සහ මූල්‍ය ප්‍රකාශ පිළිබඳ වාර්තා කිරීම.* |
| 4 වන පරිශිෂ්ඨය | ......<br>මෙම ලිපිය ලබාදී ඇත්තේ සමූහයේ (මව් සමාගමේ නම) වර්ෂයේ මාසයේ [දිනදී] මූල්‍ය තත්ත්වය, එම දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්ය සාධනය ~~හා~~ මුදල් ප්‍රවාහ [අදාළ මූල්‍ය වාර්තාකරණ ආකෘතිමය රාමුවේ නම සඳහන් කරන්නන් සමග අනුකූලව සෑම ප්‍රමාණාත්මක ආකාරයකින්ම සාධාරණ ලෙස (හෝ සත්‍ය හා සාධාරණ දර්ශනයක් ලබා දීමට] සමාගම එහි මූල්‍ය ප්‍රකාශ ඉදිරිපත් කර තිබේද යන්න පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීම සඳහා වූ ඔබගේ විගණනය හා සම්බන්ධවයි.<br>.... | ......<br>මෙම ලිපිය ලබාදී ඇත්තේ සමූහයේ (මව් සමාගමේ නම) වර්ෂය මාසයේ [දිනදී] මූල්‍ය තත්ත්වය, එම දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්ය සාධනය හා වර්ෂයේ මුදල් ප්‍රවාහ [අදාළ මූල්‍ය වාර්තාකරණ ආකෘතිමය රාමුවේ නම සඳහන් කරන්නන් සමග අනුකූලව සෑම ප්‍රමාණාත්මක ආකාරයකින්ම සාධාරණ ලෙස (හෝ සත්‍ය හා සාධාරණ දර්ශනයක් ලබා දීමට] සමාගමේ මූල්‍ය ප්‍රකාශ ඉදිරිපත් කර තිබේද යන්න පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීම සඳහා වූ ඔබගේ විගණනය හා සම්බන්ධවයි.<br>.... |
| 5 වන පරිශිෂ්ඨය | ~~• *සමූහයේ විගණනයට අදාළ ආචාර ධර්ම අවශ්‍යතාවයන් සහ විශේෂයෙන් (අනායත්තතාවයේ) අවශ්‍යතාවයන්,*~~ | • *සමූහයේ විගණනයට අදාළ ආචාර ධර්ම අවශ්‍යතාවයන් සහ විශේෂයෙන් ~~( අනායත්තතාවයේ )~~ අවශ්‍යතාවයන්, උදාහරණයක් ලෙස, ඍජු සහාය ලබාදීම සඳහා සමූහයේ විගණකට අභ්‍යන්තර විගණක වරුන් ප්‍රයෝජනයට ගැනීම නීතියෙන් හෝ රෙගුලාසි මගින් තහනම් කර තිබීම, සංරචක විගණකවරුන් සඳහා ද එම තහනම විහිදේද යන්න සමූහයේ විගණක විසින් සළකා බැලම අදාළ වන අතර, එසේවේනම්, සංරචක විගණකවරුන් සමග වන සන්නිවේදනයේදී මෙය ආමන්ත්‍රණය කිරීම කළ යුතුය.*<br>• .... |
| පාද සටහන | [අනුරූප නොමැත.] | • *ශ්‍රී.ලං.වි.ප්‍ර. 610 (2013 සංශෝධිත), අභ්‍යන්තර විගණකවරුන්ගේ වැඩ* |

<table>
<tr><th>විස්තරය</th><th>2014</th><th>2017</th></tr>
<tr><td></td><td></td><td><u>ප්‍රයෝජනයට ගැනීම අ 31 ඡේදය.</u></td></tr>
<tr><td colspan="3">ශ්‍රී ලංකා විගණන ප්‍රමිත 610 (ශ්‍රී.ලං.වි.ප්‍ර. 610 - අභ්‍යන්තර විගණකවරුන්ගේ වැඩ ප්‍රයෝජනයට ගැනීම.</td></tr>
<tr><td colspan="3">ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිය 610 (2014 ජනවාරි 01 වන දින හෝ ඊට පසුව ආරම්භවන කාල පරිච්ඡේදයන් සඳහා වූ මූල්‍ය ප්‍රකාශ විගණනය සඳහා බලාත්මක වේ.) ශ්‍රී ලංකා විගණන ප්‍රමිතය 610 (සංශෝධිත) මගින් අදේශ කරනු ලැබේ. (2015 ජනවාරි 01 වන දින හෝ ඊට පසුව ආරම්භ වන කාල පරිච්ඡේදයන් සඳහා වූ මූල්‍ය ප්‍රකාශ විගණනය සඳහා බලාත්මක වේ.)</td></tr>
<tr><td colspan="3">ශ්‍රී ලංකා විගණන ප්‍රමිත 620 (ශ්‍රී.ලං.වි.ප්‍ර. 620 - විගණකගේ විශේෂඥවරයෙකුගේ වැඩ ප්‍රයෝජනයට ගැනීම)</td></tr>
<tr><td colspan="3">වෙනසක් නොමැත.</td></tr>
<tr><td colspan="3">ශ්‍රී ලංකා විගණන ප්‍රමිත 700 (ශ්‍රී.ලං.වි.ප්‍ර. 700 මූල්‍ය ප්‍රකාශ මත වාර්තාකරණය සහ මතයක සකස් කිරීම</td></tr>
<tr><td colspan="3">ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිය 700 (2014 ජනවාරි 01 වැනි දින හෝ ඊට පසුව ආරම්භ වන කාල පරිච්ඡේදයන් සඳහා වූ මූල්‍ය ප්‍රකාශ විගණනය සඳහා බලාත්මක වේ.) ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිය 700 (සංශෝධිත ) මගින් ආදේශ කරනු ලැබේ. (2018 ජනවාරි 01 වැනි දින හෝ ඊට පසුව ආරම්භ වන කාල පරිච්ඡේදයන් සඳහා වූ මූල්‍ය ප්‍රකාශ විගණනය සඳහා බලාත්මක වේ.</td></tr>
<tr><td colspan="3">ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිය 701 (ශ්‍රී.ලං.වි.ප්‍ර. 701 - ස්වාධීන විගණකගේ වාර්තාවේ ඇති ප්‍රධාන විගණන කරුණු සන්නිවේදනය කිරීම.</td></tr>
<tr><td colspan="3">ශ්‍රී ලංකා විගණන ප්‍රමිත 701, 2018 ජනවාරි 01 වන දින හෝ ඊට පසුව ආරම්භ වන කාල පරිච්ඡේදයන් සඳහා වූ මූල්‍ය ප්‍රකාශ විගණනය සඳහා බලාත්මක වේ.</td></tr>
<tr><td colspan="3">ශ්‍රී ලංකා විගණන ප්‍රමිත 705 - (ශ්‍රී.ලං.වි.ප්‍ර. 705 - ස්වාධීන විගණකගේ වාර්තාවේ මතයට විකරණය කිරීම.</td></tr>
<tr><td colspan="3">ශ්‍රී ලංකා විගණන ප්‍රමිත 705 (2014 ජනවාරි 01 වැනි දින හෝ ඊට පසුව ආරම්භවන කාල පරිච්ඡේදයන් සඳහා වූ මූල්‍ය ප්‍රකාශ විගණනය සඳහා බලාත්මක වේ. ශ්‍රී ලංකා විගණන ප්‍රමිත 705 මගින් ආදේශ කරනු ලැබේ. (2018 ජනවාරි 01 වැනි දින හෝ ඊට පසුව ආරම්භ වන කාල පරිච්ඡේදයන් සඳහා වූ මූල්‍ය ප්‍රකාශ විගණනය සඳහා බලාත්මක වේ.</td></tr>
<tr><td colspan="3">ශ්‍රී ලංකා විගණන ප්‍රමිත 706 - (ශ්‍රී.ලං.වි.ප්‍ර. 706 - ස්වාධීන විගණකගේ වාර්තාවේ කරුණු අවධාරණය කිරීමේ ඡේද සහ වෙනත් කරුණු ඡේද</td></tr>
<tr><td colspan="3">ශ්‍රී ලංකා විගණන ප්‍රමිත 706 (2014 ජනවාරි 01 වැනි දින හෝ ඊට පසුව ආරම්භ වන කාල පරිච්ඡේදයන් සඳහා වූ මූල්‍ය ප්‍රකාශ විගණනය සඳහා බලාත්මක වේ.) ශ්‍රී ලංකා විගණන ප්‍රමිතය 706 (සංශෝධිත) මගින් ආදේශ කරනු ලැබේ. (2018 ජනවාරි 01 වැනි දින හෝ ඊට පසුව ආරම්භ වන කාල පරිච්ඡේදයන් සඳහා වූ මූල්‍ය ප්‍රකාශ විගණනය සඳහා බලාත්මක වේ.</td></tr>
<tr><td colspan="3">ශ්‍රී ලංකා විගණන ප්‍රමිත 710 (ශ්‍රී.ලං.වි.ප්‍ර. 710 - සංසන්දනාත්මක තොරතුරු - අනුරූපී සංඛ්‍යා සහ සංසන්දනාත්මක මූල්‍ය ප්‍රකාශ.</td></tr>
<tr><td>3</td><td>පිවිසුම් මාර්ග අතර අත්‍යවශ්‍ය විගණන වාර්තාකරණ වෙනස්කම් :<br>(අ) අනුරූපි සංඛ්‍යා සඳහා, මූල්‍ය ප්‍රකාශ මත විගණකගේ මතය යොමුවන්නේ ප්‍රවර්තන කාල පරිච්ඡේදයට පමණි ; (<del>එය ශ්‍රී ලංකාවේ අදාළ මූල්‍ය වාර්තාකරණ ආකෘතිමය රාමුවයි)</del>; <del>අනෙක් අතට;</del><br>(ආ) සංසන්දනාත්මක මූල්‍ය ප්‍රකාශ සඳහා,</td><td>පිවිසුම් මාර්ග අතර අත්‍යවශ්‍ය විගණන වාර්තාකරණ වෙනස්කම් :<br>(අ) අනුරූපි සංඛ්‍යා සඳහා, මූල්‍ය ප්‍රකාශ පිළිබඳ විගණකගේ මතය යොමුවන්නේ ප්‍රවර්තන කාල පරිච්ඡේදයට පමණි ; අනෙක් අතට;<br>(ආ) සංසන්දනාත්මක මූල්‍ය ප්‍රකාශ සඳහා, විගණකගේ මතය මගින් මූල්‍ය ප්‍රකාශ ඉදිරිපත් කරන සෑම කාල පරිච්ඡේදයක්</td></tr>
</table>

| විස්තරය | 2014 | 2017 |
|---|---|---|
| | විගණකගේ මතය මගින් මූල්‍ය ප්‍රකාශ ඉදිරිපත් කරන සෑම කාල පරිච්ඡේදයක් සඳහාම යොමුවේ. (~~එය ශ්‍රී ලංකාවේ අදාළ මූල්‍ය වාර්තාකරණ ආකෘතිමය රාමුව නොවේ.~~)<br><br>මෙම ශ්‍රී .ලං.වි.ප්‍ර. මගින් එක් එක් පිවිසුම් මාර්ග සඳහා විගණකගේ වාර්තාකරණ අවශ්‍යතා වෙන වෙනම ආමන්ත්‍රණය කරයි. | සඳහාම යොමුවේ.<br>මෙම ශ්‍රී .ලං.වි.ප්‍ර. මගින් එක් එක් පිවිසුම් මාර්ග සඳහා විගණකගේ වාර්තාකරණ අවශ්‍යතා වෙන වෙනම ආමන්ත්‍රණය කරයි. |
| 4 | මෙම ශ්‍රී.ලං.වි.ප්‍ර. ~~2012~~ ජනවාරි 01 වැනි දින හෝ ඊට පසුව ආරම්භ වන කාල පරිච්ඡේදයන් සඳහා වූ මූල්‍ය ප්‍රකාශ විගණනය සඳහා බලාත්මක වේ. | මෙම ශ්‍රී.ලං.වි.ප්‍ර. 2014 ජනවාරි 01 වැනි දින හෝ ඊට පසුව ආරම්භ වන කාල පරිච්ඡේදයන් සඳහා වූ මූල්‍ය ප්‍රකාශ විගණනය සඳහා බලාත්මක වේ. |
| 15 | සංසන්දනාත්මක මූල්‍ය ප්‍රකාශ ඉදිරිපත් කරන විට, විගණකගේ මතය මගින් මූල්‍ය ප්‍රකාශ ඉදිරිපත් කරන සෑම කාල පරිච්ඡේදයක් සඳහාම යොමුවේ සහ විගණන මතය මතය ප්‍රකාශ කල කුමන කාලපරිච්ඡේදය සඳහා යන්න යොමුවේ. (යොමුව : ~~අ 8 – අ 9~~ ඡේද) | සංසන්දනාත්මක මූල්‍ය ප්‍රකාශ ඉදිරිපත් කරන විට, විගණකගේ මතය මගින් මූල්‍ය ප්‍රකාශ ඉදිරිපත් කරන සෑම කාල පරිච්ඡේදයක් සඳහාම යොමුවේ සහ ප්‍රකාශ කල විගණන මතයක් කුමන කාලපරිච්ඡේදය සඳහාද යන්න යොමුවේ. (යොමුව : අ 9 - අ 10 ඡේද) |
| 16 | ප්‍රවර්තන කාල පරිච්ඡේදයේ විගණනයට සම්බන්ධව පූර්ව කාල මූල්‍ය ප්‍රකාශ වාර්තා කිරීමේදී, එවැනි පූර්ව කාල මූල්‍ය ප්‍රකාශ පිළිබඳ විගණකගේ මතය විගණක කලින් ප්‍රකාශ කල මතයට වඩා වෙනස් නම් විගණක වෙනස් මතය සඳහා වැදගත් හේතු ශ්‍රී.ලං.වි.ප්‍ර. 706 සමග අනුකූලව වෙනත් කරුණ සඳහා වන ඡේදයේ හෙළිදරව් කළ යුතුය. (යොමුව : ~~අ 10~~ ඡේදය) | ප්‍රවර්තන කාල පරිච්ඡේදයේ විගණනයට සම්බන්ධව පූර්ව කාල මූල්‍ය ප්‍රකාශ වාර්තා කිරීමේදී, එවැනි පූර්ව කාල මූල්‍ය ප්‍රකාශ පිළිබඳ විගණකගේ මතය විගණක කලින් ප්‍රකාශ කල මතයට වඩා වෙනස් නම් විගණක වෙනස් මතය සඳහා වැදගත් හේතු ශ්‍රී.ලං.වි.ප්‍ර. 706 ( සංශෝධිත) සමග අනුකූලව වෙනත් කරුණ සඳහා වන ඡේදයේ හෙළිදරව් කළ යුතුය. (යොමුව : අ 11 ඡේදය ) |
| 18 | පූර්වගාමී විගණක විසින් විකරණය කිරීමකින් තොරව වාර්තා කල පූර්ව කාල පරිච්ඡේදයේ මූල්‍ය ප්‍රකාශයන්ට බලපාන ප්‍රමාණාත්මක අවප්‍රකාශයක් පවතින බව විගණක විසින් නිගමනය කරන්නේ නම්, විගණක විසින් සුදුසු මට්ටමේ කළමනාකරණය සමග අවප්‍රකාශය පිළිබඳව සන්නිවේදනය කළයුතු අතර, පාලනය පිළිබඳ වගකිව යුතු සියල්ලන්ම අස්තිත්ත්වය කළමනාකරණය කිරීමට සම්බන්ධ නොවන්නේ නම්, පාලනය පිළිබඳ වගකිව යුතු අය සමග සහ පූර්වගාමී විගණක වෙත දැනුම් දෙන ලෙසට පාලනය භාරව සිටින අයගෙන් ඉල්ලා සිටිය යුතුය. පූර්ව කාල පරිච්ඡේදයේ මූල්‍ය ප්‍රකාශ සංශෝධනය කර, පූර්ව කාල පරිච්ඡේදයේ සංශෝධිත මූල්‍ය ප්‍රකාශ පිළිබඳ නව විගණන වාර්තාවක් නිකුත් කිරීමට පූර්වගාමී විගණක එකඟ වුවහොත්, විගණක විසින් වාර්තා කළයුතු වන්නේ ප්‍රවර්තන කාල පරිච්ඡේදය මත පමණි. (~~යොමුව : අ 11~~). | පූර්වගාමී විගණක විසින් විකරණය කිරීමකින් තොරව වාර්තා කල පූර්ව කාල පරිච්ඡේදයේ මූල්‍ය ප්‍රකාශයන්ට බලපාන ප්‍රමාණාත්මක අවප්‍රකාශයක් පවතින බව විගණක විසින් නිගමනය කරන්නේ නම්, විගණක විසින් සුදුසු මට්ටමේ කළමනාකරණය සමග අවප්‍රකාශය පිළිබඳව සන්නිවේදනය කළයුතු අතර, පාලනය පිළිබඳ වගකිව යුතු සියල්ලන්ම අස්තිත්ත්වය කළමනාකරණය කිරීමට සම්බන්ධ නොවන්නේ නම්, පාලනය පිළිබඳ වගකිව යුතු අය සමග සහ පූර්වගාමී විගණක වෙත දැනුම් දෙන ලෙසට පාලනය භාරව සිටින අයගෙන් ඉල්ලා සිටිය යුතුය. පූර්ව කාල පරිච්ඡේදයේ මූල්‍ය ප්‍රකාශ සංශෝධනය කර, පූර්ව කාල පරිච්ඡේදයේ සංශෝධිත මූල්‍ය ප්‍රකාශ පිළිබඳ නව විගණන වාර්තාවක් නිකුත් කිරීමට පූර්වගාමී විගණක එකඟ වුවහොත්, විගණක විසින් වාර්තා කළයුතු වන්නේ ප්‍රවර්තන කාල පරිච්ඡේදය මත පමණි. (යොමුව : අ 12). |
| ශීර්ෂය | [අනුරූප නොමැත.] | පූර්ව කාල පරිච්ඡේදයේ මූල්‍ය ප්‍රකාශ විගණනය කර නොමැත. (යොමුව : 14 ඡේදය) |
| 2014 අනුරූප ඡේදයක් නොමැත. | [අනුරූප නොමැත.] | ආරම්භක ශේෂයන් පිළිබඳව ප්‍රමාණවත්. යෝග්‍ය විගණන සාක්ෂි විගණකවරයාට ලබාගත නොහැකි නම්, ශ්‍රී.ලං.වි.ප්‍ර. 705 |

| විස්තරය | 2014 | 2017 |
|---|---|---|
| 2017 - අ 8 | | (සංශෝධිත) ට * මඟින් විගණක විසින් මූල්‍ය ප්‍රකාශ පිළිබඳව කොන්දේසි සහිත මතයක් හෝ මතය වියාචනය කිරීම අවශ්‍යවේ. ප්‍රවර්තන කාල පරිච්ඡේදයේ මූල්‍ය ප්‍රකාශ වලට ප්‍රමාණාත්මක වශයෙන් බලපාන ආරම්භක ශේෂයන්හි අව ප්‍රකාශ අඩංගු නොවන බවට ප්‍රමාණවත් යෝග්‍ය විගණන සාක්ෂි ලබා ගැනීමේදි විගණක හට සැළකිය යුතු අන්දමේ දුෂ්කරතාවයන්ට මුහුණ පෑමට සිදු වුවහොත් විගණක විසින් මෙය ශ්‍රී.ලං.වි.ප්‍ර. 701** ට අනුකූලව ප්‍රධාන විගණන කරුණක් ලෙසට නිර්ණය කළ හැකිය.<br>* ශ්‍රී.ලං.වි.ප්‍ර. 705 (සංශෝධිත), *ස්වාධීන විගණකගේ වාර්තාවේ මතය විකරණය කිරීම.*<br>** ශ්‍රී.ලං.වි.ප්‍ර. 701, *ස්වාධීන විගණක ගේ වාර්තාවේ ප්‍රධාන විගණන කරුණු සන්නිවේදනය කිරීම.* |
| ශීර්ෂය | [අනුරූප නොමැත.] | පූර්ව කාල පරිච්ඡේදයේ මූල්‍ය ප්‍රකාශ විගණනය කර නොමැත. (යොමුව : 19 ඡේදය) |
| 2014 - අනුරූප ඡේදයක් නොමැත. 2017 - අ 13 | [අනුරූප නොමැත.] | ආරම්භක ශේෂයන් පිළිබඳව ප්‍රමාණවත්, යෝග්‍ය විගණන සාක්ෂි විගණකවරයාට ලබාගත නොහැකි නම්, ශ්‍රී.ලං.වි.ප්‍ර. 705 (සංශෝධිත) ට මඟින් විගණක විසින් මූල්‍ය ප්‍රකාශ පිළිබඳව කොන්දේසි සහිත මතයක් හෝ මතය වියාචනය කිරීම අවශ්‍ය වේ. ප්‍රවර්තන කාල පරිච්ඡේදයේ මූල්‍ය ප්‍රකාශ වලට ප්‍රමාණාත්මක වශයෙන් බලපාන ආරම්භක ශේෂයන්හි අව ප්‍රකාශ අඩංගු නොවන බවට ප්‍රමාණවත් යෝග්‍ය විගණන සාක්ෂි ලබා ගැනීමේදී විගණකහට සැළකිය යුතු අන්දමේ දුෂ්කරතාවයන්ට මුහුණ පෑමට සිදු වුවහොත්, විගණක විසින් මෙය ශ්‍රී.ලං.වි.ප්‍ර. 701 ට අනුකූලව ප්‍රධාන විගණන කරුණක් ලෙසට නිර්ණය කළ හැකිය. |
| **ශ්‍රී ලංකා විගණන ප්‍රමිත 720 (ශ්‍රී.ලං.වි.ප්‍ර. 720 - විගණනය කරන ලද මූල්‍ය ප්‍රකාශ වල අඩංගු ලිපි ලේඛන වල සමන්විත වෙනත් තොරතුරු සම්බන්ධයෙන් විගණකරුන්ගේ වගකීම.** | | |
| ශ්‍රී ලංකා විගණන ප්‍රමිත 720 (2014 ජනවාරි 01වන දින හෝ ඊට පසුව ආරම්භ වන කාල පරිච්ඡේදයන් සඳහා වූ මූල්‍ය ප්‍රකාශ විගණනය සඳහා බලාත්මක වේ.) ශ්‍රී ලංකා විගණන ප්‍රමිත 720 (සංශෝධිත) මඟින් ආදේශ කර ඇත. (2018 ජනවාරි 01 වන දින හෝ ඊට පසුව ආරම්භවන කාල පරිච්ඡේදයන් සඳහා වූ මූල්‍ය ප්‍රකාශ විගණනය සඳහා බලාත්මක වේ. ) | | |
| **ශ්‍රී ලංකා විගණන ප්‍රමිත 800 - (ශ්‍රී.ලං.වි.ප්‍ර. 800 - විශේෂ සළකා බැලීම් - විශේෂ අරමුණ ආකෘතිමය රාමු ප්‍රකාරව පිළියෙල කරන ලද මූල්‍ය ප්‍රකාශ විගණනය.)** | | |
| ශ්‍රී ලංකා විගණන ප්‍රමිත 800 (2014 ජනවාරි 01 වන දින හෝ ඊට පසුව ආරම්භ වන කාල පරිච්ඡේදයන් සඳහා වූ මූල්‍ය ප්‍රකාශ විගණනය සඳහා බලාත්මක වේ.) ශ්‍රී ලංකා විගණන ප්‍රමිත 800 (සංශෝධිත) මඟින් ආදේශ කෙරේ (2018 ජනවාරි 01 වන දින හෝ ඊට පසුව ආරම්භ වන කාල පරිච්ඡේදයන් සඳහා වූ මූල්‍ය ප්‍රකාශ විගණනය සඳහා බලාත්මක වේ. | | |
| **ශ්‍රී ලංකා විගණන ප්‍රමිත 805 (ශ්‍රී.ලං.වි.ප්‍ර. 805 - විශේෂ සළකා බැලීම් - තනි මූල්‍ය ප්‍රකාශ සහ මූල්‍ය ප්‍රකාශයක නිශ්චිත මූලිකාංගයන්, ගිණුම් හෝ අයිතම් විගණනය කිරීම.)** | | |
| ශ්‍රී ලංකා විගණන ප්‍රමිත 805, 2018 ජනවාරි 01 වන දින හෝ ඊට පසුව ආරම්භ වන කාල පරිච්ඡේදයන් සඳහා වූ | | |

| විස්තරය | 2014 | 2017 |
|---|---|---|
| මූල්‍ය ප්‍රකාශ විගණනය සඳහා බලාත්මක වේ. | | |
| **ශ්‍රී ලංකා විගණන ප්‍රමිත 810 (ශ්‍රී.ලං.වි.ප්‍ර. 810 - සංක්ෂිප්ත මූල්‍ය ප්‍රකාශ මත වාර්තා කිරීම සඳහා වන කාර්ය භාරය.** | | |
| ශ්‍රී ලංකා විගණන ප්‍රමිත 810, 2018 ජනවාරි 01 වන දින හෝ ඊට පසුව ආරම්භ වන කාල පරිච්ඡේදයන් සඳහා වූ මූල්‍ය ප්‍රකාශ විගණනය සඳහා බලාත්මක වේ. | | |

## සහතිකවීමේ කාර්යභාර සඳහා වූ ශ්‍රී ලංකා ආකෘතිමය රාමුව

*විගණන හෝ ඓතිහාසික මූල්‍ය තොරතුරු සමාලෝචන සඳහාවන සහතිකවීමේ කාර්යභාරයන් හැර,* SLSAE 3000 (සංශෝධිත) බලාත්මක වන අවස්ථාවේදී *සහතිකවීමේ කාර්යභාර සඳහා වන* දැනට පවත්නා *ශ්‍රී ලංකා ආකෘතිමය රාමුව, සහතිකවීමේ කාර්යභාර සඳහා වන* මෙම සංශෝධිත ශ්‍රී ලංකා ආකෘතිමය රාමුව මගින් ආදේශනය කෙරේ.

### පටුන


| | ඡේද |
|---|---|
| හැඳින්වීම | 1-4 |
| ආචාරධර්මීය මූලධර්ම සහ තත්ත්වපාලන ප්‍රමිති | 5-9 |
| සහතිකවීමේ කාර්යභාර වල විස්තරය | 10-11 |
| වලංගුබව සහතික කිරීමේ කාර්යභාර සහ ඍජු කාර්යභාර | 12-13 |
| සාධාරණ සහතිකවීමේ කාර්යභාර සහ ඍජු සහතිකවීමේ කාර්යභාර | 14-16 |
| ආකෘතිමය රාමුවේ විෂය පථය | 17-19 |
| සහතිකවීම නොවන කාර්යභාර මත වාර්තා | 20-21 |
| සහතිකවීමේ කාර්යභාර සඳහා පූර්ව කොන්දේසි | 22-25 |
| සහතිකවීමේ කාර්යභාරයක මූලිකාංග | 26 |
| ත්‍රෛ-පාර්ශවීය සම්බන්ධතාවය | 27-38 |
| පාදකවන විෂය කරුණු | 39-41 |
| නිර්ණායක | 42-49 |
| සාක්ෂි | 50-82 |
| සහතිකවීමේ වාර්තාව | 83-92 |
| වෙනත් කරුණු | 93-95 |
| පරිචයේ යෙදෙන්නාගේ නම උචිත නොවන ලෙස භාවිත කිරීම | 96 |

1 වන පරිශිෂ්ඨය : ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනයේ පාලක මණ්ඩලය විසින් නිකුත් කළ ප්‍රකාශ කිරීම් සහ ඒවා එකිනෙකට සහ වරලත් ගණකාධිකාරී ආයතනයේ ධර්ම සංග්‍රහයට සම්බන්ධතාවය

2 වන පරිශිෂ්ඨය : වලංගු බව සහතික කිරීමේ කාර්යභාර සහ ඍජු කාර්යභාර

3 වන පරිශිෂ්ඨය : සහතිකවීමේ කාර්යභාරයක් සඳහා වන පාර්ශ්ව

4 වන පරිශිෂ්ඨය : පාදකවන විෂය කරුණු ප්‍රවර්ගීකරණය

## හැඳින්වීම

1. සහතිකවීමේ කාර්යභාරයක් සහ ශ්‍රී ලංකා විගණන ප්‍රමිත (SLAuS) සඳහා වන කාර්යභාර, සමාලෝචන කාර්යභාර මත ශ්‍රී ලංකා ප්‍රමිත (SLSRE) සහ සහතික වීමේ කාර්යභාර මත ශ්‍රී ලංකා ප්‍රමිත (SLSAE) (මින් ඉදිරියට සහතිකවීමේ ප්‍රමිත ලෙස හඳුන්වනු ලබන) වලට ව්‍යවහාර වන ඒවායේ මූලිකාංග සහ අරමුණු අවබෝධ කරගැනීම පහසුවීම සඳහා තනිකරම මෙම ආකෘතිමය රාමුව නිකුත් කෙරේ.

2. මෙම ආකෘතිමය රාමුව ප්‍රමිතයක් නොවන අතර ඒ අනුව විගණන සමලෝචන හෝ වෙනත් සහතිකවීමේ කාර්යභාරයන්හි[1] කාර්යසාධනය ඉටු කිරීම සඳහා යම් අවශ්‍යතාවයන් (හෝ මූලික මූලධර්ම හෝ අත්‍යාවශ්‍ය පටිපාටි) ස්ථාපනය නොකෙරේ. ඒ අනුව සහතිකවීමේ වාර්තාවකට කාර්යභාරයක් මෙහෙයවන ලද්දේ මෙම ආකෘතිමය රාමුව අනුව යයි හිමිකමක් පැමට නොහැකි අතර, ඒ වෙනුවට අදාළ සහතික වීමේ ප්‍රමිත පිළිබඳව සඳහනක් කළ යුතුය. විගණන, සමාලෝචන සහ වෙනත් සහතිකවීමේ කාර්යභාරයන්හිදී ව්‍යවහාර කළයුතු, මෙම ආකෘතිමය රාමුව සමග අනුකූලවන අරමුණු, අවශ්‍යතාවයන්, යෙදවුම් සහ වෙනත් පැහැදිලි කිරීමට අදාළ දෑ සහ හඳුන්වාදීමට අදාළ දෑ සහ නිර්වචන සහතිකවීමේ ප්‍රමිතවල අඩංගු වේ. ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනය විසින් (ශ්‍රීලවගආ) නිකුත් කළ ප්‍රකාශයන්හි ක්ෂේත්‍රය සහ ඒවායේ එකිනෙකට ඇති සබඳතාවය මෙන්ම ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනය විසින් නිකුත් කර ඇති *වෘත්තීය ගණකාධිකාරීන් සඳහා ආචාරධර්ම සංග්‍රහයට වන සබඳතාවය* (ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනයේ ධර්ම සංග්‍රහයට) 1 වන පරිශිෂ්ඨයෙන් නිදර්ශනය කරයි.

3. මෙම ආකෘතිමය රාමුව පහත දෑ සඳහා යොමු කිරීම් රාමුවක් ලබාදෙයි.

(අ) සහතික වීමේ පරිචයේ යෙදෙන්නන්ට;

(ආ) සහතිකවීමේ වාර්තාවක් පරිශීලනය කිරීමට අපේක්ෂා කරන්නන් හා පරිචයේ යෙදෙන්නා සේවයේ නිරත කරගන්නා අයවලුන් ("කාර්යයේ නිරත පාර්ශ්වය") ඇතුළුව සහතිකවීමේ කාර්යභාර සමග සම්බන්ධ කරගන්නා වෙනත් අය, සහ

(ඇ) ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනයේ ස්වකීය සහතිකවීමේ ප්‍රමිත පරිචය සටහන් සහ වෙනත් ලේඛන සංවර්ධනය කිරීමේ නිරත ආයතනයේ පාලක මණ්ඩලය.

4. මෙම ආකෘතිමය රාමුවේ සමස්ථ විග්‍රයක් පහත දැක්වේ:

- *හැඳින්වීම :* මෙම ආකෘතිමය රාමුව පරිචයේ යෙදෙන්නන් විසින් ඉටු කරනු ලබන සහතිකවීමේ කාර්යභාරයන් සමග කටයුතු කෙරේ.
- *සහතිකවීමේ කාර්යභාරයන්හි විස්තරය :* මෙම කොටසෙන් සහතිකවීමේ කාර්යභාරයන් විස්තර කරන අතර, ඍජු කාර්යභාරයන් වලංගුබව සහතික කිරීමේ කාර්යභාරයන්ගෙන් සහ සාධාරණ සහතිකවීමේ කාර්යභාරයන්, සීමිත සහතිකවීමේ කාර්යභාරයන්ගෙන් වෙනස්වන ආකාරය වෙන්කොට හඳුනාගනී.
- *ආකෘතිමය රාමුවේ විෂයපථය :* මෙම කොටසෙන් සහතිකවීමේ කාර්යභාරයන් උපදේශන කාර්යභාරයන් වැනි වෙනත් කාර්යභාරයන්ගෙන් වෙනස්වන ආකාරය වෙන්කොට හඳුනාගනී.
- *සහතිකවීමේ කාර්යභාරයක් සඳහා පූර්ව කොන්දේසි :* පරිචයේ යෙදෙන්නෙක් සහතිකවීමේ කාර්යභාරයක් පිළිගැනීම සඳහා වන පූර්ව කොන්දේසි මෙම කොටසෙන් පැහැදිලි කර දේ.
- *සහතිකවීමේ කාර්යභාරයක මූලිකාංග :* සහතිකවීමේ කාර්යභාරයන් පෙන්වන මූලිකාංග පහක් මෙම කොටසෙන් හඳුනාගෙන සාකච්ඡා කෙරේ. ඒවානම් ත්‍රෛ-පාර්ශ්වීය සම්බන්ධතාවයක්, පාදක වන විෂය කරුණ, නිර්ණායක, සාක්ෂි සහ සහතිකවීමේ වාර්තාව, සතුටුදායක සහතිකවීමේ කාර්යභාර සහ සීමිත සහතිකවීමේ කාර්යභාර අතර වැදගත් ප්‍රභේදන එය වැඩිදුරට පැහැදිලි කරයි. උදාහරණ ලෙස සහතික කිරීමේ කාර්යභාරයන්හි පාදකවන විෂය කරුණු වල සැලකිය යුතු අන්දමේ විචලනය, සුදුසු නිර්ණායකයන්ට අවශ්‍ය කරන ගතිලක්ෂණ, සහතිකවීමේ කාර්යභාරයන්හි අවදානමේ සහ ප්‍රමාණාත්මකභාවයේ භූමිකාව සහ සතුටුදායක සහතිකවීමේ කාර්යභාරයෙන් සහ සීමිත සහතිකවීමේ කාර්යභාරයන්හි නිගමන ප්‍රකාශ කරන්නේ කෙසේද යන්නද එලෙසම මෙම කොටස මගින් සාකච්ඡා කෙරේ.
- *වෙනත් කරුණු :* පරිචයේ යෙදෙන්නාගේ සහතිකවීමේ වාර්තාව, ලේඛනගත කිරීම සහ පාදකවන විෂය කරුණ සමග හෝ විෂය කරුණ තොරතුරු සමග පරිචයේ යෙදෙන්නාගේ සම්බන්ධතාවයේ බලපෑම් හැර සන්නිවේදන වගකීම් මෙම කොටසෙන් සාකච්ඡා කෙරේ.

1. *ශ්‍රී ලංකා වෙනත් විගණන ප්‍රකාශ සහ ශ්‍රී ලංකා සම්බන්ධිත සේවා ප්‍රකාශ වල ප්‍රස්ථාවනාව බලන්න.*

**ආචාරධර්මීය මූලධර්ම සහ තත්ත්ව පාලන ප්‍රමිත**

5. සහතික කිරීමේ කාර්යභාරයන් ඉටුකරන සමාගම් තුළ තත්ත්ව පාලනය සහ ස්වාධීන අවශ්‍යතාවයන් ඇතුළුව ආචාරධර්මීය මූලධර්ම සමග අනුකූල වීම පවත්නා පොදු යහපත සහ උසස්-තත්ත්වයේ සහතිකවීමේ කාර්යභාරයන්හි වැදගත් කොටසක් ලෙස පුළුල්ව හඳුනාගැනේ. එවැනි කාර්යභාරයන් ඉටු කරනු ලබන්නේ සහතිකවීමේ ප්‍රමිත ප්‍රකාරව වන අතර, ඒවා පූර්වායවය වන්නේ පහත සඳහන් පදනම මතය.

(අ) කාර්යභාරයේ නියුතු කණ්ඩායමේ සාමාජිකයන් සහ කාර්යභාරයේ නියුතු තත්ත්ව පාලන සමාලෝචක, (එක් තැනැත්තෙක් පත්කරනු ලැබූ කාර්යභාර සඳහා) අඩුතරමින් දක්ෂකම් සහ උත්සාහය අවශ්‍යවන ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනයේ සහතික වීමේ කාර්යභාරයන්ට සම්බන්ධිත ධර්ම සංග්‍රහයේ A සහ B කොටස්වලට, වෙනත් වෘත්තීය අවශ්‍යතාවයන්ට, හෝ නීතියේ හෝ රෙගුලාසිවල අවශ්‍යතාවයනට යටත්විය යුතුය, සහ

(ආ) කාර්යභාරය ඉටුකරන පරිචයේ යෙදෙන්නා SLSQC1[2] ට යටත්වන සමාගමේ සමාජිකයෙක් වේ නම් හෝ අඩුතරමින් SLSQC 1 මෙන් දක්ෂකම් සහ උත්සාහය අවශ්‍යවන සමාගමේ වගකීම සඳහා එහි තත්ත්ව පාලන පද්ධති සම්බන්ධයෙන් වෙනත් වෘත්තීය අවශ්‍යතාවයන් හෝ නීතිය හෝ රෙගුලාසිවල අවශ්‍යතා වලට යටත් විය යුතුය.

*ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනයේ ධර්මසංග්‍රහය*

6. ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනයේ ධර්ම සංග්‍රහයේ A කොටසින් පරිචයේ යෙදෙන්නා අනුකූල විය යුතු පහත සඳහන් මූලික මූලධර්ම ස්ථාපනය කර ඇතඃ

(අ) අවංකභාවය

(ආ) අරමුණුගත භාවය

(ඇ) වෘත්තීය හැකියාව සහ මනා සැලකිල්ල

(ඈ) රහස්‍යභාවය; සහ

(ඉ) වෘත්තීය චර්යාව

7. මූලික මූලධර්ම සමග අනුකූල වීමේදී වන තර්ජන, හඳුනාගැනීමට, හඳුනාගත් තර්ජන වල වැදගත්කම ඇගයීමට සහ අවශ්‍යවන විට ආරක්ෂාව සලස්වන්නක් ව්‍යවහාර කිරීමට, තර්ජන ඉවත් කිරීමට හෝ ඒවා පිළිගතහැකි මට්ටමකට අඩු කිරීමට ව්‍යවහාර කිරීමට වෘත්තීය ගණකාධිකාරීන් සඳහා සංකල්පනාත්මක ආකෘතිමය රාමුවක් A කොටසින් එසේම ලබාදේ.

8. සමහර තත්ත්වයන් තුළදී, ස්වාධීනත්වය ඇතුළුව පොදු පරිචයේ නියැලී වෘත්තීය ගණකාධිකාරීන්ට A කොටස තුළ වන සංකල්පනාත්මක ආකෘතිමය රාමුව අදාළ වන්නේ කෙසේද යන්න ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනයේ ධර්ම සංග්‍රහයේ B කොටස විස්තර කරයි. ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනයේ ධර්ම සංග්‍රහය ස්වාධීනත්වය නිර්වචනය කරන්නේ මනසේ නිදහස සහ පෙනීමේ නිදහස යන කරුණු දෙකෙන්ම සමන්විත ලෙසය. සහතිකවීමේ නිගමනයක්, එම නිගමනය අපකීර්තියට පත් වීමට හැකි බලපෑම්වලින් තොරව ප්‍රකාශ කිරීමට ඇති හැකියාව ස්වාධීනත්වය මගින් ආරක්ෂා කරදේ. ස්වාධීනත්වය මගින් අරමුණු ගතවීමට අවංකභාවයෙන් යුක්තව ක්‍රියාකිරීමට සහ වෘත්තීය සංසදභාවයේ ආකල්පයක් පවත්වාගෙන යෑමට ඇති හැකියාව වැඩිදියුණු කරයි.

## *SLSQC 1*

9. සහතිකවීමේ කාර්යභාර සඳහා සමාගමක එහි තත්ත්ව පාලන පද්ධතිය ස්ථාපනය කිරීමට සහ නඩත්තු කිරීමට සමාගමේ වගකීම් පිළිබඳව SLSQC 1 කටයුතු කෙරේ. SLSQC 1 සමග අනුකූලවීමේදී අනුගමනය කළ යුතු වෙනත් දේවල් අතරට පහත දැක්වෙන සෑම මූලිකාංගයක්ම ආමන්ත්‍රණය කෙරෙන ප්‍රතිපත්ති සහ ක්‍රියාපටිපාටි අඩංගු තත්ත්ව පාලන පද්ධතියක් සමාගම ස්ථාපනය කර නඩත්තු කිරීම සහ සමාගමේ ප්‍රතිපත්ති සහ ක්‍රියා පටිපාටි එය ලේඛණගත කර ඒවා සිය සේවක මණ්ඩලය වෙත සන්නිවේදනය කිරීම අවශ්‍ය කෙරේ.

(අ) සමාගම තුළ ගුණය සඳහා මගපෙන්වන්නන්ගේ වගකීම්;

(ආ) අදාළ සදාචාරමය අවශ්‍යතාවයන්;

(ඇ) සේවාදායකයාගේ සබඳතා සහ විශේෂිත කාර්යභාර පිළිගැනීම සහ පවත්වාගෙන යෑම;

(ඈ) මානව සම්පත්;

---

2. තත්ත්ව පාලනය මත ශ්‍රී ලංකා ප්‍රමිතය (SLSQC) 1, *මූල්‍ය ප්‍රකාශ විගණනය සහ සමාලෝචන සහ වෙනත් සහතිකවීමේ හා සම්බන්ධිත කාර්යභාර සේවා ඉටුකරන සමාගම් සඳහා තත්ත්ව පාලනය.*

(ඉ) කාර්යභාරය ඉටු කිරීම; සහ

(ඊ) අධීක්ෂණය.

## සහතිකවීමේ කාර්යභාරවල විස්තරය

10. නිර්ණායකවලට එරෙහිව පාදක වන විෂයය කරුණක මැනීම හෝ ඇගයීමේ ප්‍රතිඵලය පිළිබඳව වගකිව යුතු පාර්ශ්වයට හැර, අපේක්ෂිත පරිශීලකයන්ට විශ්වසනීයත්වයේ මට්ටම වැඩිදියුණු කිරීම් සැලසුම් තුළ නිගමන ප්‍රකාශ කිරීමට හැකිවනු වස් ප්‍රමාණවත් උචිත සාක්ෂි ලබාගැනීමට පරිචයේ යෙදෙන්නා උත්සාහ කරන කාර්යභාරයක් සහතිකවීමේ කාර්යභාරයක් වේ.

11. පාදක වන විෂයය කරුණකට නිර්ණායක ව්‍යවහාර කිරීමෙන් වන ඵලය පාදක වන විෂයය කරුණ මැනීමෙන් හෝ ඇගයීමෙන් වන ප්‍රතිඵලය තොරතුරුවීමය. උදාහරණ වශයෙන්;

- මූල්‍ය වාර්තාකරන ආකෘතිමය රාමුව ව්‍යවහාර කිරීම මගින් (නිර්ණායකය), අස්තිත්ත්වයක මූල්‍ය තත්ත්වය, මූල්‍ය කාර්යසාධනය සහ මුදල් ප්‍රවාහ (පාදක වන විෂයය කරුණ) මැනීම මගින් ඵලය වන්නේ මූල්‍ය ප්‍රකාශය (ප්‍රතිඵලය),

- අදාළ නිර්ණායක ව්‍යවහාර කිරීම මගින් අස්තිත්ත්වයක අභ්‍යන්තර පාලන ක්‍රියාවලියේ සඵලදායකත්වය ඇගයීමෙන් (පාදක වන විෂයය කරුණ) ඵලය වන්නේ අභ්‍යන්තර පාලනයේ සඵලදායකත්වය පිළිබඳ ප්‍රකාශයකි. (ප්‍රතිඵලය)

- අදාළ මැනීමේ ක්‍රමවේද ව්‍යවහාර කිරීම මගින් (නිර්ණායකය) කාර්ය සාධනයේ විවිධ අංගයන් මැනීමෙන් ඵලය වන්නේ (පාදක වන විෂයකරුණ) අස්තිත්ත්ව-විශේෂී කාර්යසාධන මිනුම්ය. (ප්‍රතිඵලය)

- හඳුනාගැනීම, මැනීම සහ ඉදිරිපත් කිරීමේ විධිචර්යා ව්‍යවහාර කිරීම මගින් (නිර්ණායකය) අස්තිත්ත්වයක හරිතාගාර මුදා හැරීම මැනීමෙන් ඵලය (පාදකවන විෂයය කරුණ) වන්නේ හරිතාගාර වායු ප්‍රකාශය වේ (ප්‍රතිඵලය).

- උදාහරණ ලෙස නීතිය හා රෙගුලාසි (නිර්ණායක) සමග අස්තිත්ත්වයක අනුකූලවීම ඇගයීමෙන් ප්‍රතිඵලය (පාදක වූ විෂයය කරුණ) වන්නේ අනුකූල වීම පිළිබඳ ප්‍රකාශයයි (ප්‍රතිඵලය)

"විෂයය කරුණ තොරතුරු" යන පදය භාවිත කරන්නේ නිර්ණායකට එරෙහිව පාදක වන විෂය කරුණ මැනීමේ ඇගයීමේ ප්‍රතිඵලය අදහස් කිරීමටය. පරිචයේ යෙදෙන්නාගේ නිගමන සඳහා පදනම ලෙස ප්‍රමාණවත් යෝග්‍ය සාක්ෂි පරිචයේ යෙදෙන්නා රැස්කර ගන්නේ විෂයකරුණ තොරතුර පිළිබඳවයි.

## වලංගුබව සහතික කිරීමේ කාර්යභාර සහ ඍජු කාර්යභාර

12. වලංගුබව සහතික කිරීමේ කාර්යභාරයකදී, පරිචයේ යෙදෙන්නා හැර වෙනත් පාර්ශ්වයක් නිර්ණායකයට එරෙහිව පාදකවන විෂයය කරුණ මැනීම් කර අගය කරයි. පරිචයේ යෙදෙන්නා හැර වන එම පාර්ශ්වය එසේම බොහෝවිට ඵලයක් වන විෂයය කරුණ තොරතුරු වාර්තාවක හෝ ප්‍රකාශයක ඉදිරිපත් කරයි. කෙසේවෙතත් සමහර අවස්ථාවලදී විෂය කරුණ තොරතුරු පරිචයේ යෙදෙන්නා විසින් සහතිකවීමේ වාර්තාවේ ඉදිරිපත් කළ හැකිය. විෂයය කරුණ තොරතුරු ප්‍රමාණාත්මක අවප්‍රකාශවලින් තොරද යන්න පිළිබඳ නිගමනය පරිචයේ යෙදෙන්නා ආමන්ත්‍රණය කරයි. (එසේම 85 වන ඡේදය බලන්න)

13. ඍජු කාර්යභාරයකදී නිර්ණායකයට එරෙහිව පාදකවන විෂයය කරුණ පරිචයේ යෙදෙන්නා මැණීම හෝ ඇගයීම සිදුකරයි. ඊට අමතරව නිර්ණායකට එරෙහිව පාදකවන විෂයය කරුණ මැනීමේ හෝ ඇගයීමේ ප්‍රතිඵලය පිළිබඳ ප්‍රමාණවත් උචිත සාක්ෂි ලබාගැනීමට පරිචයේ යෙදන්නා සහතිකවීමේ කුසලතා සහ ශිල්පක්‍රම ව්‍යවහාර කරයි. පාදකවන විෂයය කරුණ මැනීම හෝ ඇගයීම සමග එකවරම සාක්ෂි පරිචයේ යෙදෙන්නාට ලබාගත හැකිය. එහෙත් එසේම එවැනි මැනීමක් හෝ ඇගයීමකට පෙර හෝ පසුව ද සාක්ෂි ලබාගත හැකිය. ඍජු කාර්යභාරයකදී පරිචයේ යෙදෙන්නාගේ නිගමනය නිර්ණායකට එරෙහිව පාදක වූ විෂයය කරුණ මැනීම හෝ ඇගයීමේ වාර්තා වූ ප්‍රතිඵලය ආමන්ත්‍රණය කරන අතර එය ප්‍රකාශ කරන්නේ පාදක වූ විෂයය කරුණ සහ නිර්ණායකය භාෂිතයෙනි. සමහර ඍජු කාර්යභාරයන්හි, පරිචයේ යෙදෙන්නාගේ නිගමනය වන්නේ විෂයය කරුණ තොරතුරු හෝ ඉන් කොටසකි (එසේම 2 වන පරිශිෂ්ඨය බලන්න).

## සාධාරණ සහතිකවීමේ කාර්යභාර සහ සීමිත සහතිකවීමේ කාර්යභාර

14. සාධාරණ සහතිකවීමේ කාර්යභාරයක් තුළදී. පරිචයේ යෙදෙන්නාගේ නිගමන සඳහා පදනම ලෙස කාර්යභාරයේ අවස්ථාගත කරුණ තුළ, පරිචයේ යෙදෙන්නා කාර්යභාරයේ අවදානම පිළිගත හැකි පහළ මට්ටමකට අඩු කරයි. පරිචයේ යෙදෙන්නාගේ නිගමනය ප්‍රකාශ කරන්නේ, නිර්ණායකට එරෙහිව පාදකවන විෂයය කරුණ මැනීමේ හෝ ඇගයීමේ ප්‍රතිඵලය මත පරිචයේ යෙදෙන්නාගේ මතය දන්වන ආකාරයකටය.

15. සීමිත සහතිකවීමේ කාර්යභාරයක් තුළ දී කාර්යභාරයේ තත්ත්වය තුළදී එය පිළිගත හැකි මට්ටමකට කාර්යභාරයේ අවදානම පරිචයේ යෙදෙන්නා අඩු කරයි. එහෙත් සාධාරණ සහතිකවීමේ කාර්යභාරයක් සඳහා එම අවදානම වඩා වැඩි වන අවස්ථාවක නිගමනය ප්‍රකාශ කිරීම සඳහා පදනම ලෙස එය දන්වන ස්වරූපය, පදනම් වන්නේ ඉටු කළ ක්‍රියාපටිපාටි සහ ලබාගත් සාක්ෂි මතද යන්න විෂයය කරුණ තොරතුරු ප්‍රමාණවත් ලෙස අවප්‍රකාශ වී ඇති බව පරිචයේ යෙදෙන්නාට විශ්වාස කිරීමට හේතු වූ කරුණ(ණු) පරිචයේ යෙදෙන්නාගේ අවධානයට පැමිණ ඇත. සීමිත සහතිකවීමේ කාර්යභාරයක ඉටුකරන ක්‍රියාපටිපාටිවල ප්‍රමාණය, කල්යෙදුම සහ ස්වභාවය, සාධාරණ සහතිකවීමේ කාර්යභාරයට අවශ්‍ය කරන ඒවා සමග සන්සන්දනය කිරීමේදී සීමිත වේ; එහෙත් පරිචයේ යෙදෙන්නාගේ වෘත්තීය විනිශ්චය අනුව තේරුම් සහිත මට්ටමක සහතිකවීමක් ලබාගැනීමට සැලසුම් කෙරේ. තේරුම් සහිතවීමට, පරිචයේ යෙදෙන්නා විසින් ලබාගන්නා සහතික වීමේ මට්ටම, නොවැදගත් වලට වඩා පැහැදිලිව වැනි මට්ටමක විෂයකරුණ තොරතුරු පිළිබඳව අපේක්ෂා කරන පරිශීලකයන්ගේ විශ්වාසය වැඩිදියුණු විය හැකිය.

16. සියලුම සීමිත සහතිකවීමේ කාර්යභාර පරාසයක් හරහා, පැහැදිලිව නොවැදගත් වනවාට වඩා සිට සාධාරණ සහතික වීමට යාන්තම් පහළ මට්ටමකට විෂයය කරුණ තොරතුරු පිළිබඳව අපේක්ෂිත පරිශීලකයන්ගේ විශ්වාසය වැඩිවීමෙන්ද යන්න වෙනස් විය හැකිය. විශේෂ කාර්යභාරයක් තුළද තේරුම් සහිත වන්නේ කුමක්ද යන්න නියෝජනය වන්නේ සමූහයක් වශයෙන් අපේක්ෂිත පරිශීලකයන්ගේ තොරතුරු අවශ්‍යතාවයක්, නිර්ණායකය සහ කාර්යභාරයේ පාදකවන විෂයය කරුණු ඇතුළුව කාර්යභාරයේ තත්ත්වයන් මත රඳා පවතමින් එම පරාසය තුළවන විනිශ්චයෙනි. සමහර අවස්ථාවලදී අපේක්ෂිත පරිශීලකයනට උචිත නිගමනයක් ලැබීමේ ප්‍රතිඵල ඉතා විශාල විය හැකි අතර, එම තත්ත්වයන්හිදී තේරුම් සහිත සහතිකවීමක් පරිචයේ යෙදෙන්නෙකුට ලබා ගැනීම සඳහා සාධාරණ සහතිකවීමේ කාර්යභාරයක් අවශ්‍ය කෙරේ.

## ආකෘතිමය රාමුවේ විෂයය පථය

17. පරිචයේ යෙදෙන්නෙක් විසින් ඉටුකරනු ලබන සියලුම කාර්යභාරයන් සහතිකවීමේ කාර්යභාරයන් නොවේ. වෙනත් බහුලව ඉටු කරනු ලබන ඉහත 10 වන ඡේදයේ විස්තරය සමග සංගත නොවන (සහ එබැවින් ඒවා මෙම ආකෘතිමය රාමුවෙන් ආවරණය නොවේ).

- එකග වූ ක්‍රියාපටිපාටි සහ සම්පාදන කාර්යභාරය වැනි සම්බන්ධිත සේවා (SLSRSs) මත ශ්‍රී ලංකා ප්‍රමිත මගින් ආවරණය වන කාර්යභාර[3]
- සහතිකවීමේ නිගමනයක් ප්‍රකාශ නොකරන බදු වාර්තා පිළියෙළ කිරීම.
- උපදේශනය (හෝ උපදේශක) කාර්යභාර[4] කළමනාකරණ සහ බදු උපදේශනය වැනි

18. සහතිකවීමේ කාර්යභාරයක් විශාල කාර්යභාරයක කොටසක් විය හැකිය. උදාහරණ ලෙස ව්‍යාපාරයක් අත්කර ගැනීමේ උපදේශන කාර්යභාරයකදී ඓතිහාසික හෝ ඉදිරි කාලීන මූල්‍ය තොරතුරු පිළිබඳ සහතිකවීමක් ලබාගැනීමට අවශ්‍යතාවයක් එහි ඇතුළත්විය හැකිය. එවැනි තත්ත්වයන්හිදී, මෙම ආකෘතිමය රාමුව අදාළවන්නේ එම කාර්යභාරයේ සහතිකවීමේ කොටසට පමණි.

19. පහත සඳහන් කාර්යභාර, 10 වන ඡේදයේ විස්තර සමග සංගතවිය හැකි වුවත් මෙම ආකෘතිමය රාමුවේ කොන්දේසි අනුව සහතිකවීමේ කාර්යභාර ලෙස සලකනු නොලැබේ;

(අ) ගිණුම්කරණය, විගණනය, බදුකරණය හෝ වෙනත් කරුණු පිළිබඳව නීති කෘතියක සාක්ෂිදීමේ කාර්යභාර; සහ

(ආ) පහත සඳහන් සියල්ලම අදාළ වන්නේ නම්, පරිශීලකයා යම් සහතිකවීමක් නිගමනය කරගත හැකි, වෘත්තීය මත, හැඟීමක් අත්කරගැනීම හෝ වචන පෙළ ගැස්මක් ඇතුළත් කාර්යභාර;

(i) සමස්ථ කාර්යභාරයට හුදු නොවැදගත් එම මත හැඟීමක් ඇති කරගැනීම හෝ වචන පෙළගැස්ම;

---

3. SLSRS 4400, *මූල්‍ය තොරතුරු පිළිබඳ එකග වූ ක්‍රියාපටිපාටි ඉටු කිරීමේ කාර්යභාර* සහ SLSRS 4410 (සංශෝධිත) *සම්පාදනය සඳහා කාර්යභාර*

4 . උපදේශන කාර්යභාරයකදී, පරිචයේ යෙදෙන්නා තාක්ෂණික කුසලතා, අධ්‍යාපනය, නිරීක්ෂණ. පළපුරුද්ද සහ උපදේශන ක්‍රියාවලියේදී දනුම ව්‍යවහාර කරයි. උපදේශන කාර්යභාරයන්ට අරමුණු ස්ථාපිත කිරීම, තතු සොයාගැනීම, ගැටලු හෝ වාසිදායකත්වය නිර්වචනය. විකල්ප ඇගයීම, ක්‍රියාමාර්ග ඇතුළුව නිර්දේශ වෙත සංවර්ධනය, ප්‍රතිඵල සන්නිවේදනය සහ සමහර අවස්ථා වලදී ක්‍රියාත්මක කිරීම සහ පසුව කටයුතු කරගෙනයාම සම්බන්ධිත සමහර ක්‍රියාකාරකම්වල සංශෝධනයක් සම්බන්ධ කරගන්නා අතර එයට සංකේතමය වශයෙන් විශ්ලේෂණාත්මක ක්‍රියාවලියන් අවශ්‍ය කෙරේ. වාර්තා (නිකුත් කරන්නේ නම්) සාමාන්‍යයෙන් ලියන්නේ සිදුවීම් පෙළක (හෝ "දිගු-ස්වරූපයෙනි") ශෛලියෙනි. ඉටුකළ කාර්යය සාමාන්‍යයෙන් සේවාදායකයාගේ භාවිතය සහ ප්‍රයෝජනය සඳහා පමණි. කාර්යයේ ස්වභාවය සහ විෂය පථය නිර්ණය කරනු ලබන්නේ පරිචයේ යෙදෙන්නා සහ සේවා දායකයා අතර වන එකගවීමකින්ය. සහතිකවීමේ කාර්යභාරයක නිර්වචනය සපුරාලන යම් සේවාවක් උපදේශන කාර්යභාරයක් නොවන අතර එය සහතිකවීමේ කාර්යභාරයකි.

(ii) වාර්තාවේ නිශ්චිතව සඳහන් කළ අපේක්ෂිත පරිශීලකයන් සඳහා පමණක් භාවිත කළ යයි ප්‍රකාශිතව සීමා පනවමින් නිකුත් කළ යම් ලිඛිත වාර්තාවක්

(iii) කාර්යභාරය සහතික කිරීමේ කාර්යභාරයක් වීමට අපේක්ෂා නොකරන බව, නිශ්චිත අපේක්ෂිත පරිශීලකයන් සමග ලිඛිත අවබෝධයක් යටතේ වන කාර්යභාරයකට; සහ

(iv) පරිචයේ යෙදෙන්නාගේ වාර්තාවේ කාර්යභාරය සහතිකවීමේ කාර්යභාරයක් ලෙස නියෝජනය නොවීම.

## සහතිකවීමේ නොවන කාර්යභාර මත වාර්තා

20. මෙම ආකෘතිමය රාමුවේ විෂයය පථය තුළවන සහතික කිරීමේ කාර්යභාරයක් නොවන කාර්යභාරයක් මත වාර්තාකරන පරිචයේ යෙදෙන්නෙක් එම වාර්තාව සහතිකවීමේ වාර්තාවකින් පැහැදිලිව වෙන් කොට හඳුනා ගනී. ඒ සඳහා පරිශීලකයා ව්‍යාකූල බවට පත් නොකිරීමට එය සහතික කිරීමේ වාර්තාවක් නොවන වාර්තාවක් බවට පත්වීමට එහි පහත දෑ සඳහන් කිරීමෙන් වළකී. උදාහරණ ලෙසः

- මෙම ආකෘතිමය රාමුව සමග හෝ සහතික වීමේ ප්‍රමිත සමග අනුකූලවීමෙන් හැඟෙන (ගම්‍ය වන) දෑ,
- "සහතිකවීම", "විගණනය" හෝ "සමාලෝචනය" යන පද නුසුදුසු ලෙස භාවිත කිරීම
- නිර්ණායකට එරෙහිව පාදක වූ විෂයය කරුණ මැනීම හෝ ඇගයීමේ ප්‍රතිඵලය පිළිබඳව අපේක්ෂිත පරිශීලකයන්ගේ විශ්වසනීය මට්ටම වැඩිදියුණු කිරීමට සැළසුම්කළ ප්‍රමාණවත් උචිත සාක්ෂි පදනම මත නිගමනය සඳහා යන ලෙස සාධාරණ ලෙස වැරදි සහගත වියහැකි ප්‍රකාශයක් ඇතුළත් කිරීම.

21. වගකිව යුතු පාර්ශ්වය හැර අපේක්ෂිත පරිශීලකයෙක් නොමැති අවස්ථාවක, එහෙත් අදාළ සහතිකවීමේ ප්‍රමිතයේ සියලුම වෙනත් අවශ්‍යතා ඉටුවන අවස්ථාවක පරිචයේ යෙදෙන්නා සහ වගකිවයුතු පාර්ශ්වය කාර්යභාරයකට මෙම ආකෘතිමය රාමුවේ මූලධර්ම ව්‍යවහාර කිරීමට එකඟවිය හැකිය. එවැනි අවස්ථාවලදී පරිචයේ යෙදෙන්නාගේ වාර්තාව වගකිව යුතු පාර්ශ්වයේ භාවිතය සඳහා සීමාකරන ප්‍රකාශයක් එහි ඇතුළත් වේ.

## සහතිකවීමේ කාර්යභාරයක් සඳහා පූර්ව කොන්දේසි

22. සහතිකවීමේ කාර්යභාරයක් භාරගත යුතුද හෝ නොනවත්වා කරගෙන යා යුතුද යන්න සැලකිල්ලට ගන්නා විට සහතිකවීමේ කාර්යභාරයක් සඳහා පහත සඳහන් පූර්ව කොන්දේසි අදාළ වේ ඃ.

(අ) පවත්නා තත්ත්වයක් තුළ අදාළ පාර්ශ්වවල (උචිත වන පරිදි එනම් වගකිව යුතු පාර්ශ්වය, මිනුම්කරන්නන් හෝ ඇගයීම කරන්නන් සහ කාර්යභාරයේ යෙදෙන පාර්ශ්වය) භූමිකාව සහ වගකීම් ගැලපීම සහ

(ආ) පහත සඳහන් සියලු ගතිලක්ෂණ කාර්යභාරය පෙන්වීමः

(i) උචිත වන පරිදි පාදකවන විෂය කරුණ;

(ii) විෂයය කරුණ තොරතුරු පිළියෙළ කිරීමේදී පරිචයේ යෙදෙන්නා ව්‍යවහාර කිරීමට අපේක්ෂා කරන නිර්ණායකය, 44 වන ඡේදයේ විස්තර කර ඇති ගතිලක්ෂණ ඒවා ප්‍රදර්ශනය කිරීම ඇතුළුව, කාර්යභාරයේ තත්ත්වයනට සුදුසු වීම;

(iii) විෂයය කරුණ තොරතුරු පිළියෙළ කිරීමේදී පරිචයේ යෙදෙන්නා ව්‍යවහාර කිරීමට අපේක්ෂා කරන නිර්ණායක අපේක්ෂා කරන පරිශීලකයනට ලබාගත හැකි බව;

(iv) පරිචයේ යෙදෙන්නාගේ නිගමනයට සහායවීමට අවශ්‍ය කරන සාක්ෂි ලබාගැනීමට හැකිබව පරිචයේ යෙදෙන්නා අපේක්ෂා කිරීම;

(v) එක්කෝ සාධාරණ සහතිකවීමේ කාර්යභාරයක් හෝ සීමිත සහතිකවීමේ කාර්යභාරයට උචිත ආකාරයේ පරිචයේ යෙදෙන්නාගේ නිගමන ලිඛිත වාර්තාවක සමන්විත වීමට; සහ

(vi) සීමිත සහතිකවීමේ කාර්යභාරයක අවස්ථාවකදී තේරුමක් ඇති මට්ටමක සහතිකවීම ලබාගැනීමට හැකිබව පරිචයේ යෙදෙන්නා අපේක්ෂා කරන බව ඇතුළුව තර්කාන්විත අරමුණක්.

23. වෙනස් සහතිකවීමේ කාර්යභාරයන්හි පාදකවන විෂයය කරුණු විශාල ලෙස වෙනස්වීමට භාජනය වේ. සමහර පාදකවන විෂයය කරුණු සඳහා සාමාන්‍යයෙන් පරිචයේ යෙදෙන තනි පුද්ගලයෙක් සතුව පවතින දැනුම අභිබවා යන විශේෂඥ කුසලතා අවශ්‍ය විය හැකිය. කෙසේ වෙතත් කාර්යභාරය සාමූහිකව එම පුද්ගලයනට ඉටුකිරීමට

උචිත නිපුණත්වය සහ හැකියාවම ඇතිබවට පරිචයේ යෙදෙන්නා සෑහීමකට පත්වීම මෙහිදී වැදගත්වේ. (එසේම 31 වන ඡේදය බලන්න).

24. අනාගතයේදී වියහැකි කාර්යභාරයක්, සහතිකවීමේ කාර්යභාරයක් ලෙස භාරගැනීමට නොහැකිවිටකදී අපේක්ෂා කරන පරිශීලකයන්ගේ අවශ්‍යතා ඉටු විය හැකි වෙනස් කාර්යභාරයක් හඳුනා ගැනීමට කාර්යයේ යෙදෙන පාර්ශ්වය සමත් විය හැකිය. උදාහරණ ලෙසඃ

(අ) පරිචයේ යෙදෙන්නා ව්‍යවහාර කිරීමට අපේක්ෂා කරන නිර්ණායකය සුදුසු නොවන්නේ නම්, පහත දෑ වන්නේ නම් 22 වන ඡේදයේ වෙනත් පූර්වකොන්දේසි ඉටු වන සහතිකවීමේ කාර්යභාරයක් තවමත් ඉටු කළ හැකිය.

(i) එම නිර්ණායක සුදුසු පාදකවන විෂයය කරුණේ එකක් හෝ ඊට වැඩි අංග පරිචයේ යෙදෙන්නාට හඳුනාගත හැකිය. එවැනි අවස්ථාවන්හිදී, පාදකවන විෂයය කරුණේ එම අංගය සම්බන්ධයෙන් සහතිකවීමේ කාර්යභාරයක් එහි ස්වකීය අයිතිය තුළ පරිචයේ යෙදෙන්නාට ඉටු කළ හැකිය. එවැනි අවස්ථාවන්හිදී වාර්තාව මුල් පාදකවන විෂයය කරුණට එහි සමස්ථයටම සම්බන්ධිත නොවන බව සහතිකවීමේ වාර්තාව පැහැදිලි කිරීම අවශ්‍ය විය හැකිය; හෝ

(ii) පාදකවන විෂයය කරුණ සඳහා සුදුසු විකල්ප නිර්ණායකයක් තෝරාගැනීම හෝ සංවර්ධනය කිරීම කළ හැකිය.

(ආ) උපදේශන හෝ එකඟවීමේ ක්‍රියාපටිපාටි කාර්යභාරයක් වැනි කාර්යභාරයක් සහතිකවීමේ කාර්යභාරයක් නොවන බව කාර්යභාරයේ යෙදෙන පාර්ශ්වයට ඉල්ලීමක් කළ හැකිය.

25. පිළිගැනීමෙන් පසුව සාධාරණ යුක්ති සහගත බවක් නොමැතිව, සහතිකවීමේ කාර්යභාරයක්, සහතික නොවීමේ කාර්යභාරයකට හෝ සාධාරණ සහතිකවීමේ කාර්යභාරයක් සීමිත සහතිකවීමේ කාර්යභාරයකට වෙනස් කිරීම යෝග්‍ය නොවේ. අපේක්ෂා කරන පරිශීලකයන්ගේ අවශ්‍යතාවල බලපාන තත්ත්වයන් වෙනස් කිරීමක් කිරීම හෝ කාර්යභාරයේ ස්වභාවයට අදාළව නිවැරදිව වටහා ගැනීමට අපොහොසත්වීමක් කාර්යභාර වෙනස් කිරීම සඳහා වන ඉල්ලීම සාධාරණීය කළ හැකිය. එවැනි වෙනස් කිරීමක් සිදුකළහොත්, වෙනස කිරීමට පෙර ලබාගත් සාක්ෂි නොසලකා නොහැරිය යුතුය. සාධාරණ සහතිකවීමේ නිගමනයක් එළඹීමට ප්‍රමාණවත් උචිත සාක්ෂි ලබාගැනීමට නොහැකියාව සාධාරණ සහතිකවීමේ කාර්යභාරයක සිට සීමිත සහතිකවීමේ කාර්යභාරයකට වෙනස් කිරීමට පිළිගත හැකි හේතුවක් නොවේ.

## සහතිකවීමේ කාර්යභාරයක මූලිකාංග

26. සහතිකවීමේ කාර්යභාරයක පහත සඳහන් මූලිකාංග මෙම කොටස තුළ සාකච්ඡා කෙරේඃ

(අ) පරිචයේ යෙදෙන්නා, වගකිව යුතු පාර්ශ්වය සහ අපේක්ෂා කරන පරිශීලකයන් සම්බන්ධවන පාර්ශ්ව තුනක සම්බන්ධතාවය;

(ආ) උචිත පාදකවන විෂයය කරුණ;

(ඇ) සුදුසු නිර්ණායකය;

(ඈ) ප්‍රමාණවත් උචිත සාක්ෂි; සහ

(ඉ) සාධාරණ සහතිකවීමේ කාර්යභාරයකට හෝ සීමිත සහතිකවීමේ කාර්යභාරයකට උචිත ආකාරයේ ලිඛිත සහතිකවීමේ වාර්තාවක්.

## ත්‍රෛ-පාර්ශ්වීය සම්බන්ධතාවය

27. සියලුම සහතිකවීමේ කාර්යභාරයනට අඩුතරමින් වෙන් වෙන්වූ පාර්ශ්ව තුනක් සිටීඃ පරිචයේ යෙදෙන්නා, වගකිව යුතු පාර්ශ්වය සහ අපේක්ෂා කරන පරිශීලකයන්, කාර්යභාරයේ තත්ත්වයේ රඳා පැවැත්ම මත මිණුම් කරන්නන් හෝ ඇගයීම් කරන්නන් හෝ කාර්යභාර පාර්ශ්වයන්හි වෙන්ව වූ කාර්යභාරයක්ද තිබිය හැකිය. (එසේම 3 වන පරිශිෂ්ඨය බලන්න).

28. වගකිව යුතු පාර්ශ්වය සහ අපේක්ෂිත පරිශීලකයන් වෙනස් අස්තිත්වයන්ගෙන් හෝ එකම අස්තිත්ත්වයෙන් විය හැකිය. උදාහරණයක් ලෙස පසුව සඳහන් අවස්ථාවේදී ද්විපථ අධ්‍යක්ෂක මණ්ඩල ව්‍යුහයක් තුළ අධීක්ෂක අධ්‍යක්ෂක මණ්ඩලය එම අස්තිත්ත්වයේ විධායක අධ්‍යක්ෂක මණ්ඩලය විසින් ලබාදුන් තොරතුරු පිළිබඳව සහතිකවීමක් ඉල්ලා සිටිය හැකිය. වගකිව යුතු පාර්ශ්වය සහ අපේක්ෂිත පරිශීලකයන්ගේ අවශ්‍යතා අතර සම්බන්ධතාවය බැලිය යුත්තේ නිශ්චිත කාර්යභාරයක පද සම්බන්ධය ඇතුළත හා වඩාත් සම්ප්‍රදායක ලෙස නිර්වචිත රේඛීය වගකීමෙන් එය වෙනස්විය හැකිය. උදාහරණයක් ලෙස, එය පහළ මට්ටමේ කළමනාකරණයේ (වගකිව යුතු පාර්ශ්වය) ආසන්න වගකීමක් වන අස්තිත්ත්වයේ විශේෂ අංගයක සහතිකවීමේ කාර්යභාරයක් ඉටු

කිරීමට පරිචයේ යෙදෙන්නෙක්ව අස්තිත්ත්වයේ ජ්‍යෙෂ්ඨ කළමනාකාරිත්වය (අපේක්ෂිත පරිශීලක) සේවයේ යොදවා ගත හැකිය. එහෙත් ඒ සඳහා අවසාන වශයෙන් වගකිව යුත්තේ ජ්‍යෙෂ්ඨ කළමනාකාරිත්වයය.

*පරිචයේ යෙදෙන්නා (වෘත්තිකයා)*

29. "පරිචයේ යෙදෙන්නා" යනු විෂයය කරුණ තොරතුරු ප්‍රමාණාත්මක අවප්‍රකාශ වලින් තොරද යන්න, පිළිබඳව උචිතවන පරිදි සාධාරණ සහතිකවීමක් හෝ සීමිත සහතිකවීමක් ලබාගැනීමට, සහතිකවීමේ කුසලතා සහ ශිල්ප ක්‍රම ව්‍යවහාර කිරීම මගින් කාර්යභාරයක් මෙහෙයවන පුද්ගල(යෙකි) යන්ය.[5] (සාමාන්‍යයෙන් කාර්යභාරයේ යෙදෙන හවුල්කරු හෝ කාර්යභාර කණ්ඩායමේ වෙනත් සාමාජිකයන් හෝ අදාළ වන පරිදි, සමාගම). සෘජු කාර්යභාරයක් තුළදී පරිචයේ යෙදෙන්නා, නිරණායකට එරෙහිව පාදකවන විෂයය කරුණ යන දෙකම මැණීම හෝ ඇගයීම කර හා සහතිකවීමේ කුසලතා හා ශිල්පක්‍රම ව්‍යවහාර කරන්නේ එම මිණුම් කිරීමෙන් හෝ ඇගයීමෙන් වන ප්‍රතිඵලය ප්‍රමාණාත්මක අවප්‍රකාශවලින් තොරද යන්න පිළිබඳව උචිත වන පරිදි සාධාරණ සහතිකවීමක් හෝ සීමිත සහතිකවීමක් ලබා ගැනීමටය.

30. පොදු පරිචයේ යෙදෙන වෘත්තීය ගණකාධිකාරීවරයෙක් හැර, නිපුණ පරිචයේ යෙදෙන්නෙක් සහතිකවීමේ ප්‍රමිතයක් සමග සංගතවීම නියෝජනය කිරීමට තෝරා ගතහොත්, අඩු තරමින් දක්ෂකම් හෝ උත්සාහය අවශ්‍යවන පරිදි වන නීතිය හෝ රෙගුලාසිවල අවශ්‍යතාවයන් හෝ වෙනත් වෘත්තීය අවශ්‍යතා හෝ SLQC 1 සහ ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනයේ ධර්ම සංග්‍රහය සම්බන්ධයෙන් 5 වන ඡේදය තුළ පිළිබිඹු වන පූර්වාවයවය අවශ්‍යතා එම ප්‍රමිතිවල ඇතුළත් බව හඳුනා ගැනීම වැදගත් වේ.

31. නිපුණත්වය සම්බන්ධයෙන් ආචාරධර්ම අවශ්‍යතාවයන් සපුරා නොලබන බව කාර්යභාර තත්ත්වයේ මූලික අවබෝධයකදී ඇගවෙන්නේ නම් කාර්යභාරයක් පිළිගන්නේ නැත. සමහර අවස්ථාවලදී පරිචයේ යෙදෙන්නාගේ විශේෂඥයාගේ වැඩ, පරිචයේ යෙදෙන්නා විසින් භාවිත කිරීම මගින් මෙම අවශ්‍යතාව සපුරා ගත හැකිය.

32. ඊට අමතරව විෂයය කරුණ තොරතුරුමත සහතිකවීමේ නිගමනය සඳහා වගකීම භාරගැනීමට ප්‍රමාණවත් තරමට, පරිචයේ යෙදෙන්නාගේ විශේෂඥයාගේ සහ වෙනත් සහතිකවීමේ පරිචයේ යෙදෙන්නන්ගේ වැඩ පිළිබඳව ප්‍රමාණවත් ලෙස සහභාගීවීමට සහ විශේෂඥයාගේ හෝ වෙනත් සහතිකවීමේ පරිචයේ යෙදෙන්නාගේ වැඩ පරිචයේ යෙදෙන්නාගේ අරමුණු සඳහා ප්‍රමාණවත් වන්නේදැයි නිගමනය කිරීමට අවශ්‍ය සාක්ෂි ලබාගැනීමට පරිචයේ යෙදෙන්නාට හැකියාව තිබීම අවශ්‍ය කෙරේ.

33. ප්‍රකාශ කළ සහතිකවීමේ නිගමන සඳහා තනිකරම වගකීම ඇත්තේ පරිචයේ යෙදෙන්නාට වන අතර, පරිචයේ යෙදෙන්නා, පරිචයේ යෙදෙන්නෙකුගේ විශේෂඥයකුගේ හෝ වෙනත් සහතිකවීමේ පරිචයේ යෙදෙන්නන්ගේ වැඩ භාවිත කිරීම මගින් ඔහුගේ එම වගකීම අඩුනොවේ. එනමුත්, අදාළ සහතිකවීමේ ප්‍රමිත අනුගමනය කිරීමෙන් පසු, පරිචයේ යෙදෙන්නාගේ විශේෂඥයාගේ වැඩ භාවිත කරමින්, එම විශේෂඥයාගේ වැඩ පරිචයේ යෙදෙන්නාගේ අරමුණ සඳහා ප්‍රමාණවත් යයි නිගමනය කරයි නම්, විශේෂඥයාගේ සොයා ගැනීම් හෝ නිගමන විශේෂඥයාගේ ක්ෂේත්‍රයේ උචිත සාක්ෂි ලෙස පරිචයේ යෙදෙන්නා පිළිගත හැකිය.

*වගකිවයුතු පාර්ශ්වය*

34. වගකිවයුතු පාර්ශ්වය වනුයේ පාදකවන විෂයය කරුණ සඳහා වගකිව යුතු පාර්ශ්වයයි. වලංගුබව සහතිකවීමේ කාර්යභාරයකදී වගකිවයුතු පාර්ශ්වය බොහෝවිට එසේම මිණුම්කරන්නා හෝ අගය කරන්නා වේ. සහතිකවීමේ කාර්යභාරයක් ඉටුකිරීමට පරිචයේ යෙදෙන්නාව ඒ සඳහා නිරත කරන පාර්ශ්වය (කාර්යභාරයේ යෙදෙන පාර්ශ්වය) වගකිව යුතු පාර්ශ්වය වියහැකි හෝ විය නොහැකි පාර්ශ්වය වේ.

*අපේක්ෂිත පරිශීලකයන්*

35. අපේක්ෂිත පරිශීලකයන් වන්නේ පුද්ගල(යෙක්) යන් හෝ සංවිධාන(යක්) හෝ කණ්ඩායම(ක්) එහිඑයින් පරිචයේ යෙදෙන්නා සහතිකවීමේ වාර්තා භාවිත කරනු ඇතැයි අපේක්ෂා කෙරේ. වගකිව යුතු පාර්ශ්වය අපේක්ෂිත පරිශීලකයන්ගෙන් එක් පරිශීලකයෙක් විය හැකිය. එහෙත් එකම පරිශීලකයා නොවේ.

36. සමහර අවස්ථාවලදී සහතිකවීමේ වාර්තාව ආමන්ත්‍රණය කරන්නේ කවුරුන්හටද යන්නට වඩා වෙනත් අපේක්ෂිත පරිශීලකයන් සිටිය හැකිය. විශේෂයෙන්ම සහතිකවීමේ වාර්තාවකට විශාල සංඛ්‍යාව පුද්ගලයනට එයට ප්‍රවේශවීමට හැකි අවස්ථාවක එම වාර්තාව කියවිය හැකි සියලු දෙනා හඳුනාගැනීමට පරිචයේ යෙදෙන්නාට හැකියාවක් නැත. එවැනි අවස්ථාවලදී, විශේෂයෙන්ම පාදකවන විෂය කරුණ තුළ පුළුල් පරාසයක උනන්දුවක් තිබිය හැකි පරිශීලකයන් සිටිය හැකි අවස්ථාවක අපේක්ෂිත පරිශීලකයන් සැලකිය යුතු සහ පොදු උනන්දුවක් සහිත ප්‍රධාන පාර්ශ්වකරුවනට (පරදු දරන්නන්ට) සීමා විය හැකිය. අපේක්ෂිත පරිශීලකයන් වෙනස් ක්‍රම මගින් හඳුනාගත හැකිය. උදාහරණ ලෙස, පරිචයේ යෙදෙන්නා සහ වගකිවයුතු පාර්ශ්වය හෝ කාර්යභාරයේ යෙදෙන පාර්ශ්වය අතර එකඟතාවයකින් හෝ නීතියෙන් හෝ රෙගුලාසි මගින්.

---

5. "කාර්යභාරයේ යෙදෙන හවුල්කරු" සහ "සමාගම" කියවිය යුත්තේ අදාළ වන පරිදි ඔවුන්ගේ රාජ්‍ය අංශයේ සමකයන් හැඳින්වීමටය.

37. කාර්යභාරයේ අවශ්‍යතාවයන් නිර්ණය කිරීමේදී, පරිචයේ යෙදෙන්නා සහ වගකිවයුතු පාර්ශ්වය (සහ වෙනස් නම් කාර්යභාරයේ යෙදෙන පාර්ශ්වය) සමග අපේක්ෂා කරන පරිශීලකයන් හෝ ඔවුන්ගේ නියෝජිතයන් ඍජුව සම්බන්ධ විය හැකිය. කෙසේ වෙතත් අන් අයගෙ සම්බන්ධවීම සැළකිල්ලට නොගෙන සහ එය එකඟ වූ ක්‍රියාපටිපාටි කාර්යභාරයන් මෙන් නොවේ. (නිගමනයක් වෙනුවට කාර්යභාරයේ නියුතු පාර්ශ්වය සහ යම් යෝග්‍ය තුන්වන පාර්ශ්ව සමග එකඟ වූ ක්‍රියාපටිපාටි මත පදනම්ව තථ්‍ය සොයාගැනීම් වාර්තා කිරීම එයට සම්බන්ධ කර ගැනේ)ඃ

(අ) ක්‍රියා පටිපාටිවල ස්වභාවය, කල් යෙදුම සහ ප්‍රමාණය නිර්ණය කිරීම සඳහා පරිචයේ යෙදෙන්නා වගකිව යුතුය.

(ආ) පරිචයේ යෙදෙන්නාගේ අවධානයට ලක්වන ලැබෙන තොරතුරු සැලසුම් කළ ක්‍රියාපටිපාටි පදනම් කළ නිර්ණයන්වලින් සැලකිය යුතු අන්දමින් වෙනස් නම් පරිචයේ යෙදෙන්නාට අතිරේක ක්‍රියාපටිපාටි ඉටු කිරීම අවශ්‍ය විය හැකිය.

38. සමහර අවස්ථාවලදී, අපේක්ෂා කරන පරිශීලකයන් (උදාහරණ ලෙස බැංකුකරුවන් සහ නියාමකයන්) විශේෂිත අරමුණක් සඳහා සහතිකවීමේ කාර්යභාරයක් ඉටු කිරීමට උචිත පාර්ශ්ව(යනට) පියවර ගන්නා ලෙස අවශ්‍යතාවයන් නියම කිරීමක් හෝ ඉල්ලීමක් කළ හැකිය. විශේෂිත අරමුණක් සඳහා සැලසුම් කළ එම නිර්ණායකය කාර්යභාරය භාවිත කරනවිට මෙම කරුණ කෙරෙහි කියවන්නන් සෝදිසියෙන් සිටීමේ ප්‍රකාශයක් සහතිකවීමේ වාර්තාවේ ඇතුල් කෙරේ. එයට අමතරව එම සහතිකවීමේ වාර්තාව අපේක්ෂා කරන්නේ තනිකරම නිශ්චිත පරිශීලකයනට බව සඳහන් කිරීම උචිත බව පරිචයේ යෙදෙන්නෙක් සලකා බැලිය හැකිය. කාර්යභාරයේ තත්ත්වය මත රඳා පවතිමින් මෙය ඉෂ්ඨ කරගත හැක්කේ සහතිකවීමේ වාර්තාව බෙදාහැරීම හෝ භාවිතය සීමාකිරීම මගින්ය. සහතිකවීමේ වාර්තාවක් ඕනෑම අවස්ථාවක එය අපේක්ෂා කරන්නේ නිශ්චිත අපේක්ෂිත පරිශීලකයනට නිශ්චිත අරමුණකට පමණක් ලෙස සීමා කළ හැකි අතර, විශේෂිත පරිශීලකයෙක් හෝ අරමුණ සම්බන්ධයෙන් සීමා කිරීමක් නැතිබව එම පරිශීලකට හෝ එම අරමුණට සම්බන්ධිතව පරිචයේ යෙදෙන්නා විසින් නෛතික වගකීමක් ඇතිබව ඇඟවීමට අවධාරණ නොකෙරේ.

නෛතික වගකීමට බැඳී ඇත්ද යන්න රඳා පවත්නේ එක් එක් අවස්ථාවේ තත්ත්වයන් සහ අදාළ අධිකරණ බලය මතය.

## පාදකවන විෂයය කරුණ

39. සහතිකවීමේ කාර්යභාරයක පාදකවන විෂයය කරුණ පහත වැනි බොහෝ ස්වරූප ගත හැකියඃ

- ඓතිහාසික මූල්‍ය කාර්යසාධනය හෝ ස්වභාවය (උදාහරණ ලෙස, ඓතිහාසික මූල්‍ය තත්ත්වය, මූල්‍ය කාර්යසාධනය සහ මුදල් ප්‍රවාහ) මේ සඳහා විෂයය කරුණ තොරතුරු විය හැක්කේ හඳුනාගැනීම, මැණීම, ඉදිරිපත් කිරීම සහ මූල්‍ය ප්‍රකාශ තුළ නියෝජනය වන හෙළිදරව් කිරීම වේ.
- අනාගත මූල්‍ය කාර්යසාධනය හෝ ස්වභාවය (උදාහරණ ලෙස බලාපොරොත්තු වියහැකි මූල්‍ය තත්ත්වය මූල්‍ය කාර්යසාධනය සහ මුදල් ප්‍රවාහ) මේ සඳහා විෂය කරුණ තොරතුර විය හැක්කේ හඳුනාගැනීම, මැණීම, මූල්‍ය පුරෝකථනය හෝ ප්‍රක්ෂේපණයක නියෝජනය වන ඉදිරිපත් කිරීම සහ හෙළිදරව් කිරීම)
- මූල්‍ය නොවන කාර්ය සාධනය හෝ පවත්නා තත්ත්වයන් (උදාහරණ ලෙස අස්තිත්ත්වයක කාර්යසාධනය) මේ සඳහා විෂය කරුණ තොරතුරු විය හැක්කේ කාර්යක්ෂමතාවය සහ සඵලදායකත්වයේ ප්‍රධාන සූචකය.
- භෞතික ගතිලක්ෂණ (උදාහරණ ලෙස පහසුකමක ධාරිතාව) මේ සඳහා විෂය කරුණ විය හැක්කේ පිරිවිතර ලේඛණ ය.
- පද්ධති සහ ක්‍රියාවලි (උදාහරණ ලෙස අස්තිත්ත්වයේ අභ්‍යන්තර පාලන හෝ තොරතුරු තාක්ෂණ පද්ධති) මේ සඳහා විෂය කරුණ තොරතුර විය හැක්කේ සඵලදායකත්වය පිළිබඳ ප්‍රකාශයක්.
- චර්යාව (උදාහරණ ලෙස ආයතනික පාලනය, රෙගුලාසි සමග අනුකූල වීම, මානව සම්පත් පරිචයන්) මේ සඳහා විෂයය කරුණ තොරතුරු විය හැක්කේ අනුකූලතා ප්‍රකාශයක් හෝ සඵලදායකත්වයේ ප්‍රකාශයක්ය.

4 වන පරිශිෂ්ඨයේ සමහර උදාහරණ සහිතව වියහැකි පාදක විෂය කරුණ පරාසයක ප්‍රභේදකරණයක් පෙන්නුම් කෙරේ.

40. වෙනස් පාදකවන විෂයය කරුණුවලට වෙනස් ගතිලක්ෂණ ඇත. ඒවාට ඇතුළත් වනුයේ ගුණත්වයකට එරෙහිව ප්‍රමාණාත්මක, විෂයය නිශ්‍රිතයට එරෙහිව පුද්ගල නිශ්‍රිත ඓතිහාසික එරෙහිව අනාගත අපේක්ෂිත ඒවා සඳහා වන මට්ටම වේ, සහ කාලයේ එක්තරා අවස්ථාවකට හෝ ආවරණය වන කාල පරිච්ඡේදයකට සම්බන්ධිත වේ. එවැනි ගතිලක්ෂණ පහත දැට බලපායි.

(අ) පාදකවන විෂයය කරුණ සමග නිරවද්‍යතාවය නිර්ණායකට එරෙහිව මැණිය හෝ අගය කිරීම කළ හැකිය; සහ

(ආ) ලබාගත හැකි සාක්ෂිවල ඒත්තු ගැන්විය හැකි බව.

අපේක්ෂිත පරිශීලකයනට විශේෂයෙන් අදාළබවක් වන ගතිලක්ෂණ සහතිකවීමේ වාර්තාව සටහන් කළ හැකිය.

41. පාදකවන විෂයය කරුණක සුදුසුකම සහතිකවීමේ මට්ටම මගින් බලපෑමකට ලක්නොවේ. එනම් පාදකවන විෂය කරුණක් සාධාරණ සහතිකවීමේ කාර්යභාරයක් සඳහා යෝග්‍ය නොවේනම්, එය එසේම සීමිත සහතිකවීමේ කාර්යභාරයක් සඳහා ද යෝග්‍ය නොවේ, සහ ප්‍රතිලෝම වශයෙන් යෝග්‍ය පාදකවන විෂයය කරුණ හඳුනාගත හැකි හා හඳුනාගත් නිර්ණායකට එරෙහිව සංගත මිණුම් කිරීම හෝ ඇගයීම කළ හැකිය. එබඳු එම ප්‍රතිඵලයක් වන විෂය කරුණ තොරතුරු, යෝග්‍ය වන පරිදි. සාධාරණ සහතිකවීමකට හෝ සීමිත සහතිකවීමක නිගමනයට සහාය වීම් උචිත ප්‍රමාණවත් සාක්ෂි ලබාගැනීම සඳහා වන පටිපාටියට යටත් විය හැකිය.

## නිර්ණායක

42. නිර්ණායක යනු පාදකවන විෂයය කරුණ මැනීමට හෝ ඇගයීම සඳහා භාවිතා කරන පිල් ලකුණු වේ (මිණුම් ප්‍රමිත). නිර්ණායකය විධිමත් විය හැකිය. උදාහරණ ලෙස මූල්‍ය ප්‍රකාශ පිළියෙළ කිරීමේදී නිර්ණායකය විය හැක්කේ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති හෝ ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතයන්ය.; අභ්‍යන්තර පාලනයන්හි මෙහෙයුම් සඵලදායකත්වය මත වාර්තා කිරීමේ දී නිර්ණායකය පදනම් වියහැක්කේ, ස්ථාපිත කළ අභ්‍යන්තර පාලන ආකෘතිමය රාමුවක් මත හෝ එම අරමුණ සඳහා විශේෂිතව සැලසුම්කළ තනි පාලන අරමුණුය; සහ අනුකූලතාවය වීම මත වාර්තාකරන විට, නිර්ණායක විය හැක්කේ අදාළ නීතිය රෙගුලාසි හෝ ගිවිසුම්ය. විධිමත් බවෙන් අඩු නිර්ණායක සඳහා උදාහරණ වන්නේ අභ්‍යන්තරව සංවර්ධනය කළ ආචාර ධර්ම සංග්‍රහයන්ගේ එකඟ වූ මට්ටම කාර්ය සාධනයන් (විශේෂිත වූ කමිටුවක් වසරක්ම තුළ රැස්වීමට අපේක්ෂා කරන වාර ගණන වැනි)

43. වෘත්තීය විනිශ්චය සම්බන්ධය තුළ පාදක විෂයය කරුණක් සාධාරණ සංගත මැනීම හෝ ඇගයීම සඳහා සුදුසු නිර්ණායක අවශ්‍ය කෙරේ. සුදුසු නිර්ණායකයක් මගින් ලබා දෙන බලතල සීමාවක රාමුවක් නොමැතිව යම් නිගමනයක් තනි අර්ථ නිරූපණයකට සහ නිවැරදිව වටහා ගැනීමට අපොහොසත් වීමට විවෘත වේ. සුදුසු නිර්ණායක සංදර්භ - සංවේදීවේ, එනම් කාර්යභාර තත්ත්වයට අදාළ වේ. එකහා සමාන පාදක වන විෂය කරුණකට පවා වුවද වෙනස් නිර්ණායක තිබිය හැකිය. එයින් වෙනස් මැනීම් හෝ ඇගයීම් ඵල වශයෙන් ලැබිය හැක. උදාහරණ ලෙස නිර්ණායකවලින් එකක් මැණුම් කරන්නා හෝ ඇගයීම් කරන්නා ගණුදෙනුකරුවන් සෑහීමකට පත් වීම පාදක වන විෂය කරුණු මැනීමට ගණුදෙනුකරුවෙක් සෑහීමකට පත්වීම පිළිගැනීමට නිරාකරණය කළ ගණුදෙනුකරුවන්ගේ පැමිණිලි සංඛ්‍යාව තෝරාගත හැකි අතර වෙනත් මිණුම් කරන්නෙක් හෝ ඇගයීම් කරන්නෙක්, මුල් මිලට ගැනීමෙන් පසුව එළඹෙන මාස තුන තුළදී නැවත නැවත මිලදී ගැනීම් සංඛ්‍යාව තෝරාගත හැකිය. අතිරේකව නිර්ණායකයක් විශේෂ කාර්යභාර තත්ත්ව කට්ටලයක් සඳහා සුදුසු විය හැක; එහෙත් එය වෙනස් කාර්යභාර තත්ත්ව කට්ටලයකට සුදුසු විය නොහැක. උදාහරණයක් ලෙස රජයට හෝ නියාමකයනට වාර්තා කිරීමට විශේෂ නිර්ණායක කට්ටලයක් භාවිත කිරීම අවශ්‍ය විය හැකි, එහෙත් මෙම නිර්ණායක පුළුල් කණ්ඩායමක පරිශීලකයන් සඳහා සුදුසු නොවිය හැක.

44. සුදුසු නිර්ණායක පහත සඳහන් ගතිලක්ෂණ ප්‍රදර්ශනය කරයි;

(අ) අදාළ බව; අපේක්ෂිත පරිශීලකයන් විසින් තීරණ ගැනීමේදී විෂය කරුණ තොරතුරු අදාළ නිර්ණායකයේ ප්‍රතිඵල වේ;

(ආ) සම්පූර්ණත්වය; එම විෂය කරුණක තොරතුරු පදනම මත අපේක්ෂිත පරිශීලකයන් ගත් තීරණවලට සාධාරණ ලෙස බලපෑමට අපේක්ෂා කළ හැකි අදාළ සාධක, විෂය කරුණ සමඟ අනුකූලව පිළියෙල කළ තොරතුරු වලින් අත්හැරීම සිදු නොවන විට සම්පූර්ණ වේ. සම්පූර්ණ නිර්ණායකයට ඇතුළත්වන්නේ, අදාළ වන අවස්ථාවලදී, ඉදිරිපත් කිරීම සහ හෙළිදරව් කිරීම සඳහා පිල් ලකුණු;

(ඇ) විශ්වාසනීයත්වය; අදාළ වන අවස්ථාවලදී, ඉදිරිපත් කිරීම සහ හෙළිදරව් කිරීම සමාන තත්ත්වයන්හිදී වෙනස් පරිචයේ යෙදෙන්නන්, භාවිත කරන විට ඇතුළුව පාදකවන විෂය කරුණු සාධාරණ සංගත මැනීම් හෝ ඇගයීමට විශ්වසනීය නිර්ණායකය ඉඩ දේ;

(ඈ) මධ්‍යස්ථ බව; කාර්යභාරයේ තත්ත්වයන් තුළ උචිත වන පරිදි විෂය කරුණු තොරතුරු පක්ෂග්‍රාහිත්වයෙන් තොර බව මධ්‍යස්ථ නිර්ණායකයේ ප්‍රතිඵලයක් වේ;

(ඉ) අවබෝධකරගත හැකි බව; අපේක්ෂිත පරිශීලකයන් විසින් තේරුම් ගත හැකි විෂය කරුණ තොරතුරු අවබෝධ කර ගත හැකි නිර්ණායකයේ ප්‍රතිඵලය වේ;

45. සුදුසු නිර්ණායකයක් ස්ථාපිත නොවන තනි පුද්ගලයෙකුගේ පළපුරුදුවල අපේක්ෂා වන්නේ හෝ විනිශ්චයන්හි අපැහැදිලි විස්තර.

46. විශේෂිත කාර්යභාරයකට නිර්ණායකයේ යෝග්‍යතාවය තක්සේරු කරන විට ඉහත සෑම ගති ලක්‍ෂණයකම සාපේක්‍ෂ වැදගත්කම වෘත්තිය විනිශ්චයට සම්බන්ධ කරුණකි. නිර්ණායකයේ යෝග්‍යත්වය සහතිකවීමේ මට්ටම මගින් බලනොපායි. එනම්, නිර්ණායකය සාධාරණ සහතිකවීමේ කාර්යභාරයක් සඳහා සුදුසු නොවන්නේ නම්, ඒවා එසේම සීමිත සහතිකවීමේ කාර්යභාරයකටද සුදුසු නොවේ, සහ ප්‍රතිලෝම වශයෙන් විනිවිද භාවයෙන් යුත් නිසි ක්‍රියාවලියක් අනුගමනය කරන අනුමත හෝ පිළිගත් ප්‍රවීණ ආයතන මඟින් නිකුත් කළ නීති මගින් හෝ රෙගුලාසි මගින් නිර්ණායක නියමකළ හැකිය. (ස්ථාපනය කළ නිර්ණායකය) වෙනත් නිර්ණායක විශේෂිතව සංවර්ධනය කළ හැක්කේ, කාර්යභාරයේ විශේෂ තත්ත්වය තුළ විෂයය කරුණ පිළියෙල කිරීමේ අරමුණ සඳහා ය. නිර්ණායක ස්ථාපිත කර ඇත්ද හෝ විශේෂිතව සංවර්ධනය කළ ද විශේෂ කාර්යභාරයක් සඳහා ඒවායේ යෝග්‍යතාවය තක්සේරු කිරීමට අවශ්‍ය කරන කාර්යයට බලපායි. උදාහරණ වශයෙන් ඇගයීම්වලට පටහැනිවීමක් නොමැතිවිට, අපේක්ෂිත පරිශීලකයාගේ තොරතුරු අවශ්‍යතාවයට ඒවා අදාළ නම් ස්ථාපිත නිර්ණායකය සුදුසුවිය හැකි ලෙස අනුමාන කෙරේ.

47. පාදක වන විෂයය කරුණු මැන හෝ ආගනනය කර ඇත්තේ කෙසේ ද යන්න අපේක්ෂිත පරිශීලකයන්ට අවබෝධකර ගැනීමට ඉඩ දීමට ඔවුන් නිර්ණායක ලබාදීම අවශ්‍ය කෙරේ. පහත දැක්වෙන එකක් හෝ ඊට වැඩි ආකාරයකට නිර්ණායක අපේක්ෂිත පරිශීලකයන්ට ලබා දේ;

(අ) ප්‍රසිද්ධියේ;

(ආ) විෂයය කරුණ තොරතුරු ඉදිරිපත් කිරීම තුළ පැහැදිලිවන ආකාරයට ඇතුළත් කිරීම මගින්;

(ඇ) සහතිකවීමේ වාර්තාව තුළ පැහැදිලිවන ආකාරයට ඇතුළත් කිරීම මගින්;

(ඈ) පොදු අවබෝධකර ගැනීම මගින්. උදාහරණ ලෙස වේලාව පැය සහ මිනිත්තු වලින් මැනීම සඳහා නිර්ණායක;

48. නිර්ණායකය නිශ්චිත අපේක්ෂිත පරිශීලකයනට පමණක් එසේම ලබාදිය හැකිය. උදාහරණ ලෙස ගිවිසුමක කොන්දේසි ලෙස හෝ කර්මාන්තයක් තුළ සිටින අයට පමණක් ලබාගත හැකි කර්මාන්තයේ ආයතනයක් විසින් නිකුත් කළ නිර්ණායක එසේ හේතුවන්නේ ඒවා අදාළ වන්නේ නිශ්චිත අරමුණක් සඳහා පමණක් වීමය. (38 වන ඡේදය බලන්න)

49. කාර්යභාරයේ කොටසක් ලෙස පරිචයේ යෙදෙන්නා නිර්ණායක සුදුසුද යන්න නිර්ණය කරයි.

## සාක්ෂි

50. සහතිකවීමේ කාර්යභාරය සැලසුම්කර හා ඉටු කරන්නේ, නිර්ණායකයට එරෙහිව පාදකවන විෂයය කරුණ මැනීමේ හෝ ඇගයීමේ වාර්තාකර ඇති ප්‍රතිඵලය පිළිබඳ කාර්යභාරයේ සංදර්භය තුළ ප්‍රමාණවත් උචිත සාක්ෂි ලබාගැනීමට වෘත්තිය සංශය දෘෂ්ඨිභාවයක් සහිත ආකල්පයකිනි. කාර්යභාරය සැලසුම් කිරීමේදී සහ ඉටුකරන විට විශේෂයෙන්ම ස්වභාවය, කල් යෙදුම සහ ක්‍රියාපටිපාටිවල ප්‍රමාණය නිර්ණය කිරීමේ ප්‍රමාණාත්මකභාවය, කාර්යභාර අවදානම, සහ ලබාගත සාක්ෂිවල ප්‍රමාණය සහ ගුණය සැලකිල්ලට ගනිමින් වෘත්තිය විනිශ්චයක් භාවිත කළ යුතු වීම අවශ්‍ය වේ.

*වෘත්තිය සංශය දෘෂ්ඨිය*

51. වෘත්තිය සංශය දෘෂ්ඨිභාවය යනු සෝදිසියෙන් සිටිය යුතුය යන්න ඇතුළත් ආකල්පයකි. උදාහරණ ලෙස

(අ) ලබාගත් වෙනත් සාක්ෂි සමඟ අසංගත වන සාක්ෂි;

(ආ) ලිපි ලේඛනවල සහ විමසීම්වලට වන ප්‍රතිචාරවල විශ්වාසදායකත්වයේ වලංගුභාවය සැකකරන තොරතුරු සාක්ෂි ලෙස භාවිත කිරීම;

(ඇ) අදාළ සහතික කිරීමේ ප්‍රමිත මගින් අවශ්‍යකරනවාට වඩා අමතර ක්‍රියාපටිපාටි සඳහා අවශ්‍යතාවය ඉඟිකෙරෙන තත්ත්වයන්; සහ

(ඈ) අවප්‍රකාශයක් විය හැකි බව ඇඟවෙන තත්ත්වයන්.

52. කාර්යභාරය පුරාවටම වෘත්තිය සංශය දෘෂ්ඨිය පවත්වා ගෙනයාම උදාහරණ ලෙස පහත දැක්වෙන අවදානම් අඩු කිරීමට අවශ්‍ය කෙරේ:

- අසාමාන්‍ය තත්ත්වයන් නොසලකා හැරීම;
- නිරීක්ෂණවලින් නිගමන ලබාගැනීමේදී අධි සාධාරණීයකරණය; සහ
- ස්වභාවය, කල් යෙදුම් සහ ක්‍රියාපටිපාටිවල ප්‍රමාණය නිර්ණය කිරීමේදී උචිත නොවන උපකල්පන භාවිත කිරීමෙන් එහි එයින් ප්‍රතිඵල ඇගයීම.

53. සාක්ෂි ඉතා වැදගත් ලෙස තක්සේරු කිරීමට වෘත්තිය සංශය දෘෂ්ඨිභාවය අවශ්‍ය වේ. මෙයට අසංගත සාක්ෂි සහ ලිපිලේඛන සහ විමසීම්වලට ප්‍රතිචාරවල විශ්වසනීයත්වය ප්‍රශ්න කිරීම ඇතුළත් ය. පවත්නා තත්ත්වයන් සැලකිල්ලට ගෙන, ලබාගත් සාක්ෂිවල ප්‍රමාණවත්භාවය සහ යෝග්‍යභාවය සැලකිල්ලට ගැනීමද එයට එසේම ඇතුළත්ය.

54. ලිපිලේඛන අව්‍යාජ ද යන්න පිළිබඳව සහතික වීමත් කාර්යභාරයට අවශ්‍ය කරන්නේ නම් මිස, පරිචයේ යෙදෙන්නාට එයට පටහැනිව විශ්වාසය කිරීමට හේතු ඇතොත් මිස වාර්තා සහ ලිපි ලේඛන අව්‍යාජ ලෙස පිළිගත හැකිය. එසේ වුවද සාක්ෂි ලෙස තොරතුරු භාවිත කිරීමට පරිචයේ යෙදෙන්නා විශ්වසනීයත්වය සැලකිල්ලට ගනී.

55. සාක්ෂි ලබාදෙන අයවලුන්ගේ සත්‍යවාදී බව සහ අවංකභාවය පිළිබඳව අතීත පළපුරුද්ද නොසළකා හැරීමට පරිචයේ යෙදෙන්නාගෙන් අපේක්ෂා කළ නොහැකිය. එසේ වුවද සාක්ෂි ලබාදෙන එම අයවලුන් සත්‍යවාදී සහ අවංකභාවයක් ඇති බවට වන විශ්වාසය වෘත්තිය සංශය දෘෂ්ඨියක් පවත්වාගෙන යාමේ අවශ්‍යතාවයෙන් පරිචයේ යෙදෙන්නාට සහනයක් සැලසෙන්නේ නැත.

*වෘත්තිය විනිශ්චය*

56. සහතික කිරීමේ කාර්යභාරයක් නිරවද්‍යවම හසුරුවීමට වෘත්තිය විනිශ්චය අත්‍යාවශ්‍යවේ. මෙසේ වන්නේ කාර්යභාරයේ එකදිගටම අදාළ සදාචාරමය අවශ්‍යතාවයන් සහ අදාළ සහතිකවීමේ ප්‍රමිත සහ දැනුමැතිබව පෙන්වන තීරණ අර්ථ නිරූපණය කිරීමට අවශ්‍යකරන කරුණු සහ තත්ත්වයන්ට අදාළ පුහුණුව දැනුම සහ පළපුරුද්ද ව්‍යවහාර කිරීමකින් තොරව ඒවා සිදු කළ නොහැකි නිසාය. විශේෂයෙන්ම වෘත්තිය විනිශ්චය අවශ්‍ය වන්නේ පහත දැක්වෙන තීරණ සම්බන්ධයෙන්ය;

- ප්‍රමාණාත්මක භාවය කාර්යභාර අවදානම,
- අදාළ සහතිකවීමේ ප්‍රමිත සහ සාක්ෂි ලබාගැනීමේ අවශ්‍යතාවයන් ඉෂ්ට කර ගැනීමට භාවිත කරන ක්‍රියාපටිපාටිවල ස්වභාවය, කල් යෙදුම් සහ ප්‍රමාණය,
- ප්‍රමාණවත් උචිත සක්ෂි ලබා ගෙන තිබේද සහ අදාළ සහතිකවීමේ ප්‍රමිතිවල අරමුණු අත්කරගැනීමට තවත් අමතර අවශ්‍යතා සිදුකිරීම ද අවශ්‍ය දැයි ඇගයීම. විශේෂයෙන්ම, සීමිත සහතික වීමේ කාර්යභාර අවස්ථාවක් තුළ දී තේරුමක් ඇති මට්ටමක සහතික වීමක් ලබාගෙන ඇත්දැයි ඇගයීමේදී වෘත්තිය විනිශ්චයක් අවශ්‍ය කෙරේ;
- ඍජු කාර්යභාර අවස්ථාවකදී, පාදකවන විෂය කරුණට, සහ නිර්ණායකය පරිචයේ යෙදෙන්නා තෝරා ගැනීම හෝ සංවර්ධනය, කරයි ද, ඒවා තෝරා ගැනීමේදී හෝ සංවර්ධන කිරීමේදී නිර්ණායකය ව්‍යවහාර කිරීම. වලංගු බව සහතික කිරීමේ කාර්යභාරයක් අවස්ථාවේද, එවැනි විනිශ්චයන් ඇගයීම සිදු කරන්නේ වෙනත් අයවලුන් විසින් ය;
- උචිත නිගමනයන් ලබා ගැනීම පදනම් වන්නේ ලබාගත් සාක්ෂි මතය.

57. පරිචයේ යෙදෙන්නාගෙන් අපේක්ෂා කරන වෘත්තිය විනිශ්චයේ කැපී පෙනෙන ලක්ෂණය වන්නේ, සාධාරණ විනිශ්චයන් අත් කරගැනීමට අවශ්‍යකරන නිපුණතා සංවර්ධනය කිරීමේදී උපකාරී වූ පුහුණුව, දැනුම සහ පළපුරුද්ද ලබාගත් පරිචයේ යෙදෙන්නන් විසින් භාවිත කිරීමෙන් එය සිදුවීමෙනි.

58. ඕනෑම විශේෂ අවස්ථාවක් තුළ වෘත්තිය විනිශ්චයක් භාවිත කිරීම රඳා පවත්නේ, පරිචයේ යෙදෙන්නා විසින් දන්නා කරුණු සහ තත්ත්වයන් මතය. කාර්යභාරයේ ක්‍රියාමාර්ග තුළදී අසීරු හෝ මත භේදයට තුඩු දුන් කරුණු මත, කාර්යභාර කණ්ඩායම තුළ දී සහ කාර්යභාර කණ්ඩායම් සහ සමාගම තුළ හෝ සමාගමෙන් බාහිර උචිත මට්ටමේ වෙනත් අය අතර යන කොටස් දෙකෙන්ම තොරතුරු ලබාගැනීම දැනුමැති සහ සාධාරණ විනිශ්චයක් පරිචයේ යෙදෙන්නා ගැනීමේදී උපකාරී වේ.

59. වෘත්තිය විනිශ්චයක් අගය කළ හැක්කේ, එළඹෙන ලද විනිශ්චයෙන්, සහතික වීමේ සහ මැනීමේ හෝ ඇගයීමේ මූලධර්ම නිපුණ ව්‍යවහාර කිරීමක් පිළිබිඹු වන්නේද යන්නෙන් සහ පරිචයේ යෙදෙන්නාගේ සහතික වීමේ වාර්තාවේ දිනය තෙක් පරිචයේ යෙදෙන්නා දැනගත් කරුණු සහ තත්ත්වයන් සංගත හා උචිත බවද සැලකිල්ලට ගෙන ඇත්නම්ය.

60. වෘත්තිය විනිශ්චයක කාරයභාරයේ එක දිගට භාවිත කළ යුතු වීම අවශ්‍ය වේ. කාර්යභාරයේ කරුණු සහ තත්ත්වය හෝ ප්‍රමාණවත් යෝග්‍ය සාක්ෂි මගින් වෙනත් ලෙසකින් සාක්ෂි නොදරණ තීරණ සඳහා සාධාරණීය කරන්නක් ලෙස වෘත්තිය විනිශ්චය භාවිත නොකළ යුතුය.

*සාක්ෂිවල ප්‍රමාණවත්බව සහ යෝග්‍යතාවය*

61. සාක්ෂිවල ප්‍රමාණවත් බව සහ යෝග්‍යතාවය එකිනෙකට සම්බන්ධ වේ. ප්‍රමාණවත් භාවය යනු සාක්ෂි වල ප්‍රමාණය මැනීමයි. අවශ්‍යකරන සාක්ෂි ප්‍රමාණයේ විෂයය කරුණ තොරතුරු ප්‍රමාණවත් ලෙස අවප්‍රකාශයට පත්වීමේ අවදානම මගින් (අවදානම වැඩිවන විට වැඩිපුර සාක්ෂි අවශ්‍ය විය හැකිය) සහ එසේම එම සාක්ෂිවල

තත්ත්වය මගින් බලපෑම් සිදුවිය හැකිය. කෙසේ වෙතත් වැඩිපුර සාක්ෂි ලබාගැනීම මගින් එහි අඩුපාඩු ඇති තත්ත්වය හානිපූර්ණය විය නොහැක. (එසේම 81 - 82 ඡේද බලන්න)

62. යෝග්‍යතාවය යනු සාක්ෂිවල තත්ත්වය මැනීම වේ. එනම් කාර්යභාරයේ යෙදෙන්නාගේ නිගමන සඳහා සහාය දීමේදී එහි අදාළත්වය සහ එහි විශ්වාසනීයත්වයයි.

63. සාක්ෂියක විශ්වාසනීයත්වය එහි මූලාශ්‍රය මගින් සහ එහි ස්වභාවය මගින් බලපෑම් වලට ලක් කෙරේ. සහ එය රඳා පවත්නේ සාක්ෂි ලබාගත් එක් එක් තත්ත්වයන් මතය. විවිධ වර්ගවල සාක්ෂිවල විශ්වාසනීයත්වය පිළිබඳව සාධාරණීයකරනය කිරීමක් සිදු කළහැක; කෙසේ වෙතත්, එවැනි සාධරණීය කරන වැදගත් ව්‍යතිරේඛවලට යටත්ය. බාහිර මූලාශ්‍රයන්ගෙන් සාක්ෂි ලබාගැනීමේදී පවා වුවද, එහි විශ්වාසනීයත්වයට වන බලපෑම් විය හැකි තත්ත්වයන් පැවතිය හැකිය; උදාහරණ ලෙස, මූලාශ්‍රය පිළිබඳව දැනුමක් නොමැති හෝ විෂය නිශ්‍රීත නොවේ නම්, බාහිර මූලාශ්‍රයකින් ලබා ගන්නා සාක්ෂි විශ්වාසී විය නොහැක. එම ව්‍යතිරේඛ පැවතිය හැකිද යන්න හඳුනා ගන්නා අතර සාක්ෂිවල විශ්වාසනීයත්වය පිළිබඳ පහත වන සාධාරණීයකරණය ප්‍රයෝජනවත් විය හැකිය.

- සාක්ෂි අදාළ පාර්ශවයන් (යෙන්) බාහිර මූලාශ්‍ර වලින් ලබාගන්නා විට එය වඩා විශ්වාසනීය වේ.
- සම්බන්ධිත පාලන සඵලදායකවන විට අභ්‍යන්තරව උපදවන සාක්ෂි වඩාත් විශ්වාසනීය වේ.
- පරිචයේ යෙදෙන්නා විසින් සෘජුව ලබා ගන්නා සාක්ෂි (උදාහරණ ලෙස පාලනයක් යෙදවීමේ දී සිදුවන දෑ නිරීක්ෂණය කිරීම්) වක්‍රව හෝ අනුමාන කිරීම (උදාහරණ ලෙස පාලනයක් යෙදවීම පිළිබඳව විමසීමෙන්) මගින් ලබා ගන්නා සාක්ෂිවල වඩා විශ්වාසනීය වේ.
- සාක්ෂි කඩදාසි කොළ, විද්‍යුත් හෝ වෙනත් මාධ්‍යයකින් හෝ වේවා එය ලේඛනය ස්වරූපයෙන් පවතින විට එය වඩාත් විශ්වාසනීය වේ. (උදාහරණ ලෙස රැස්වීමක සමකාලීකව ලිඛිත වාර්තා සාමාන්‍යයෙන්, කුමක් සාකච්ඡා කළේ ද යන්න පසුව කරන වාචිකව සිදුකරන ඉදිරිපත් කිරීමකට වඩා වැඩිපුර විශ්වාසදායක වේ.

64. තනිව සළකාබලන සාක්ෂි අයිතම් වලින් වන සහතික වීමට වඩා, වැඩිපුර සහතික වීමක් වෙනත් මූලාශ්‍ර හෝ වෙනස් ස්වභාවයෙන් ලබා ගන්නා සංගත සාක්ෂිවලින් සාමාන්‍යයෙන් ලබාගැනේ. අමතරව වෙනස් මූලාශ්‍ර හෝ වෙනස් ස්වභාවයෙන් සාක්ෂි ලබා ගැනීමෙන් එක්කෝ වෙනත් සාක්ෂි තහවුරු කිරීම හෝ තනි අයිතමයක සාක්ෂි විශ්වාසනීය නොවන බව ඇඟවිය හැකිය. එක මූලාශ්‍රයකින් ලබා ගන්නා සාක්ෂිය වෙනත් අයුරකින් ලබාගත් එම සාක්ෂිය සමඟ අසංගත වන විට එම අසංගතතාවය නිරාකරණය කිරීමට කුමන අතිරේක ක්‍රියාපටිපාටි අවශ්‍ය කරන්නේ දැයි නිර්ණය කිරීම අවශ්‍ය වේ.

65. ප්‍රමාණවත් යෝග්‍ය සාක්ෂි ලබා ගන්නා කොන්දේසි විෂය කරුණක තොරතුරු පිළිබඳව සහතික වීමක් කාලයක් තුළ එක අවස්ථාවක ලබා ගැනීමට වඩා කාලපරිච්ඡේදයක් ආවරණය වන විෂය කරුණ පිළිබඳ තොරතුරු ලබා ගැනීම සාමාන්‍යයෙන් වඩා අපහසු වේ. අමතරව ක්‍රියාවලි මත ලබාදෙන නිගමන සාමාන්‍යයෙන් කාර්යභාරයෙන් ආවරණය වන කාලපරිච්ඡේදයට සීමාවේ; නිශ්චය කළ ආකාරයට අනාගතයේදී ක්‍රියාවලි අඛණ්ඩව ක්‍රියා කළ යුතු ද යන්න පිළිබඳව නිගමනයක් පරිචයේ යෙදෙන්නා ලබා නොදෙයි.

66. පරිචයේ යෙදෙන්නාගේ නිගමන පදනම් වීම සඳහා වන ප්‍රමාණවත් යෝග්‍ය සාක්ෂි ලබා ගත්තේ ද යන්න වෘත්තිමය විනිශ්චයට වන කරුණකි, එයට තොරතුරු ලබා ගැනීමේදී වන පිරිවැය සහ ලබාගත් තොරතුරුවල ප්‍රයෝජනවත් භාවය අතර සම්බන්ධතාවය සැලකිල්ලට ගැනීම සම්බන්ධ කර ගැනේ. සාක්ෂිවල ප්‍රමාණය සහ තත්ත්වය ඇගයීමේදී පරිචයේ යෙදෙන්නා වෘත්තිය විනිශ්චය භාවිත කරයි සහ වෘත්තිය සංශය දෘෂ්ඨිය හා ඒ නිසාවෙන් සහතික වීමේ වාර්තාවට සහයට ප්‍රමාණාත්මක බව සහ යෝග්‍යතාවය භාවිත කරයි.

*ප්‍රමාණාත්මකභාවය*

67. ස්වභාවය, කල් යෙදුම් සහ ක්‍රියාපටිපාටිවල ප්‍රමාණය නීර්ණය කරන විටදී හා විෂය කරුණ තොරතුරු අවප්‍රකාශයකින් තොරද යන්න ඇගයීම කිරීම ඇතුළුව, ප්‍රමාණාත්මක භාවය අදාළ වන්නේ සහතිකවීමේ කාර්යභාරය සැලසුම් කිරීම සහ ඉටුකරන විටය. ප්‍රමාණාත්මක භාවය පිළිබඳව වෘත්තිය විනිශ්චය සිදු කරන්නේ අවට පරිසර තත්ත්වයන් සැලකිල්ලට ගෙනය, එහෙත් සහතිකවීමේ මට්ටම මගින් ඒවාට බලපෑම් සිදුනොවේ; එනම්, ප්‍රමාණාත්මකභාවය පදනම් වන්නේ අපේක්ෂිත පරිශීලකයන්ගේ අවශ්‍යතා පදනම මත නිසා එකම අපේක්ෂිත පරිශීලකයින් සහ අරමුණු සඳහා සාධාරණ සහතිකවීමේ කාර්යභාරයක් සඳහාවන ප්‍රමාණාත්මකභාවය, සීමිත සහතිකවීමේ කාර්යභාරයන් සඳහා ද එසේම සමාන වේ.

68. අත්හැරීම් ඇතුළුව අවප්‍රකාශ, ප්‍රමාණාත්මක වියහැකි ලෙස සැලකිල්ලට ගන්නේ ඒවා, තනිව හෝ සාමාහාරයක් වශයෙන්, විෂය කරුණු තොරතුරු පදනම මත අපේක්ෂිත පරිශීලකයන් ගනු ලබන අදාළ තීරණවලට සාධාරණ ලෙස බලපෑම් කිරීමට අපේක්ෂා කළ හැකි නම්ය. පරිචයේ යෙදෙන්නාගේ ප්‍රමාණාත්මකභාවය සැලකිල්ලට ගැනීම වෘත්තිය විනිශ්චයට අයත් කරුණකි, සහ කණ්ඩායමක් වශයෙන් අපේක්ෂිත පරිශීලකයන්ගේ පොදු තොරතුරු අවශ්‍යතා පරිචයේ යෙදෙන්නා හඳුනා ගැනීම මගින් එයට බලපෑමක් සිදුවේ. විශේෂිත පරිශිලකයන්ගේ විශේෂ තොරතුරු අවශ්‍යතා ඉටු කිරීමට කාර්යභාරය සැළසුම්කර නැත්නම් මිස, විශේෂිත

පරිශීලකයන් මත අවප්‍රකාශවල විය හැකි බලපෑම, ඔවුන්ගේ තොරතුරු අවශ්‍යතා, පුළුල් ලෙස වෙනස් විය හැකි අතර, සාමාන්‍යයෙන් සළකා බලන්නේ නැත.

69. ප්‍රමාණාත්මකභාවය සැළකිල්ලට ගන්නේ ගුණාත්මක සාධකවලට සහ අදාළ වන විට ප්‍රමාණාත්මක සාධකවල පද සම්බන්ධය ඇතිවය. විශේෂ කාර්යභාරයකදී ප්‍රමාණාත්මකභාවය සැළකිල්ලට ගැනීමේදී ගුණාත්මක සහ ප්‍රමාණාත්මක සාධකවල සාපේක්ෂ වැදගත්කම වෘත්තිය විනිශ්චය සඳහා වන කරුණකි.

70. ප්‍රමාණාත්මකභාවයට සම්බන්ධිත තොරතුරු පරිචයේ යෙදෙන්නාගේ සහතිකවීමේ වාර්තාව මගින් ආවරණය කරයි. එබැවින් කාර්යභාරයේ සමහර තොරතුරු ආවරණය කර එහෙත් විෂය කරුණ තොරතුරු පිළිබඳ සියලු අංගයන් ආවරණය නොකරන විට කාර්යභාරය මගින් ආවරණය කළ විෂය කරුණ තොරතුරේ එම කොටස් පමණක් සම්බන්ධයෙන් ප්‍රමාණාත්මකභාවය සැලකිල්ලට ගැනේ.

*කාර්යභාර අවදානම*

71. පාදකවන විෂය කරුණ සහ නිර්ණායකයේ පද සම්බන්ධය තුළ විෂය කරුණ තොරතුර නියම විධියට ප්‍රකාශ කිරීමට අපොහොසත් විය හැකි සහ ඒ අනුව ප්‍රමාණවත් තරමකට විය හැකි ලෙස අවප්‍රකාශ විය හැකිය. මෙය සිදු වන්නේ පාදකවන විෂය කරුණ තොරතුර, මැනීමට හෝ ඇගයීමට නිර්නායකය ව්‍යවහාර කිරීම විෂය කරුණ තොරතුරු නියම විධියට පිළිබිඹු වන විටය.

72. කාර්යභාර අවදානම යනු විෂය කරුණ තොරතුර ප්‍රමාණාත්මකව අවප්‍රකාශ වී ඇති අවස්ථාවක පරිචයේ යෙදෙන්නා නුසුදුසු නිගමනයක් ප්‍රකාශ කිරීමේ අවදානමය. නඩු කීමකින් වන පාඩුව, අහිතකර ප්‍රචාරය හෝ විශේෂ විෂය කරුණ තොරතුරක් සමගවන සම්බන්ධනයෙන් පැන නගින වෙනත් සිද්ධි වැනි පරිචයේ යෙදෙන්නාගේ ව්‍යාපාරික අවදානම් කාර්යභාර අවදානම් හි යොමු කරන්නේ හෝ ඇතුළත් කරන්නේ නැත.

73. කාර්යභාර අවදානම ශුන්‍යය තෙක් අඩු කිරීම බොහොම කලාතුරකින් අත්කර ගත හැකි හෝ පිරිවැය ප්‍රතිලාභ සහ ඒ අනුව පහත දක්වෙන දෑ වැනි සාධකවල ප්‍රතිඵලයක් ලෙස "සාධාරණ සහතිකවීම" පරම සහතික වීමකට වඩා අඩුය:

- තෝරාගත් පරීක්ෂා කිරීම් භාවිත කිරීම,
- අභ්‍යන්තර පාලනයේ ආවේණික සීමා කිරීම්,
- පරිචයේ යෙදෙන්නාට ලබා ගත හැකි බොහෝ ප්‍රමාණයක සාක්ෂි තීරණාත්මක වෙනුවට වඩා ඒත්තුගන්වනසුළුවීම යන කරුණ,
- සාක්ෂි එක්රැස් කිරීම සහ ඇගයීම සහ නිගමනය සකස් කිරීම, සාක්ෂි මත පදනම් වීම සඳහා වෘත්තිය විනිශ්චය භාවිත කිරීම,
- සමහර අවස්ථාවලදී නිර්ණායකට එරෙහිව පාදකවන විෂය කරුණේ මනින හෝ ඇගයීම කරන විට පාදක වන විෂය කරුණේ ගති ලක්ෂණ.

74. පොදුවේ කාර්යභාර අවදානම පහත සඳහන් සංරචක මගින් නියෝජනය විය හැකිය. එසේ නමුත් සියලුම සහතික වීමේ කාර්යභාර සඳහා මෙම සංචරක සියල්ලම අවශ්‍යයෙන්ම ගෙන හැර දක්වීම හෝ වැදගත්වීම සිදුවන්නේ නැත:

(අ) පරිචයේ යෙදෙන්නා සෘජුවම බලපෑමක් නොකරන අවදානම් එකින් එක සමන්විත වන්නේ:

(i) යෝග්‍ය පාර්ශ්වයන්(ය) විසින් ව්‍යවහාර කරන යම් සම්බන්ධිත පාලන සැළකිල්ලට ගැනීමට පෙර ප්‍රමාණාත්මක අවප්‍රකාශයකට විෂය කරුණ තොරතුරු පහසුවෙන් අවනත විය හැකිවීම. (ආවේණික අවදානම); සහ

(ii) විෂය කරුණ තොරතුරුවල හටගත් ප්‍රමාණාත්මක අවප්‍රකාශයක් යෝග්‍ය පාර්ශ්වවල (යේ) අභ්‍යන්තර පාලන (පාලන අවදානම) මගින්, වැළැක්වීම හෝ අනාවරණය කර ගැනීම සහ නිවැරදි කිරීමට සිදු නොවනු ඇතැයි යන අවදානම; සහ

(ආ) පරිචයේ යෙදෙන්නා සෘජුව බලපෑමක් කරන අවදානම් එකින් එක සමන්විත වන්නේ:

(i) පරිචයේ යෙදෙන්නා විසින් ඉටු කරනු ලබන ක්‍රියාපටිපාටි වලින් ප්‍රමාණාත්මක අවප්‍රකාශයක් හඳුනා ගැනීම සිදු නොවනු ඇතැයි යන අවදානම (අනාවරණ අවදානම); සහ

(ii) සෘජු කාර්යභාර අවස්ථාවකදී, නිර්ණායකයට එරෙහිව පාදකවන විෂය කරුණ මැනීමේ හෝ ඇගයීමේ දී, පරිචයේ යෙදෙන්නා සමග ආශ්‍රිත අවදානම් (මැනීමේ හෝ ඇගයීමේ අවදානම)

75. මෙම සෑම සංරචක කාර්යභාරයකට අදාළවීමේ ප්‍රමාණය කාර්යභාර තත්ත්වයන් මගින් බලපෑම් කෙරේ. විශේෂයෙන්ම,

- පාදකවන විෂය කරුණ සහ විෂය කරුණ තොරතුරුවල ස්වභාවය, උදාහරණ ලෙස පාලන අවදානමේ සංකල්පය වඩාත් ප්‍රයෝජනවත් විය හැක්කේ, පාදකවන විෂය කරුණ තොරතුරු සම්බන්ධ වන්නේ අස්තිත්ත්වයේ කාර්ය සාධනය පිළිබඳව තොරතුරු පිළියෙල කිරීමට වඩා, එය පාලනයක සඵලදායකත්වය පිළිබඳ හෝ භෞතිකත්වයක පැවැත්ම පිළිබඳ තොරතුරු සම්බන්ධව වන විටය,
- සාධාරණ සහතිකවීමේ හෝ සීමිත සහතික වීමේ කාර්යභාරයන් ඉටු කරනු ලැබුවේද? උදාහරණ ලෙස, සීමිත සහතිකවීමේ කාර්යභාරයකදී පරිචයේ යෙදෙන්නා පාලන පරීක්ෂා කිරීම හැර වෙනත් උපක්‍රම මගින් සාක්ෂි ලබා ගැනීමට බොහෝ විට තීරණය කරයි. මින් කුමන අවස්ථාවකදී එකම විෂය කරුණ තොරතුරු මත පාලන අවදානම සැළකිල්ලට ගැනීම, සාධාරණ සහතිකවීමේ කාර්යභාරයකට අදාළවනවාට වඩා අඩුවේ,
- එය සෘජු කාර්යභාරයක් ද හෝ වලංගු බව සහතික කිරීමේ කාර්යක් ද; පාලන අවදානම් සංකල්පය සහතික කිරීමේ කාර්යභාරයකට අදාළවන අතර, මැනීමේ හෝ ඇගයීමේ අවදානමේ පුළුල් සංකල්පය වඩා අදාළ වන්නේ සෘජු කාර්යභාරයන්ටය.

අවදානම් සැලකිල්ලට ගැනීම නිරවද්‍ය මැනීමකට හැකි කරුණක් වෙනුවට වඩා එය වෘත්තිය විනිශ්චයට අයත් කරුණකි.

*ස්වභාවය, කල් යෙදුම සහ ක්‍රියාපටිපාටිවල ප්‍රමාණය*

76. එක්කෝ සාධාරණ සහතිකවීමක් හෝ සීමිත සහතික වීමක් ලබා ගැනීමට සංකේතමය වශයෙන් ක්‍රියාපටිපාටිවල සංයෝජනයක් භාවිත කරයි.

ක්‍රියාපටිපාටිවලට ඇතුළත්විය හැකි වන්නේ,

- පිරික්සුම;
- නිරීක්ෂණය;
- තහවුරු කිරීම;
- ප්‍රති-ගණනය කිරීම;
- ප්‍රති-ඉටු කිරීම;
- විශ්ලේෂණාත්මක පටිපාටි; සහ
- විමසීම.

නිරවද්‍ය ස්වභාවය කල් යෙදුම හා ක්‍රියාපටිපාටිවල ප්‍රමාණය එක කාර්යභාරයක සිට ඊළඟ කාර්යභාරය දක්වා වෙනස් වේ. බොහෝ සහතිකවීමේ කාර්යභාර සඳහා ක්‍රියාපටිපාටි අනන්ත විචලතා න්‍යායිකව විය හැකිය. කෙසේ වෙතත් ප්‍රායෝගිකව මේවා පැහැදිලිව සහ තේරුම නිශ්චිතව සන්නිවේදනය කිරීම අපහසුය.

77. සාධාරණ සහතිකවීමක් සහ සීමිත සහතික වීමේ කාර්යභාර යන දෙකම සඳහා, පාදකවන විෂය කරුණ සහ වෙනත් කාර්යභාර තත්ත්වයන්හි අවබෝධයක් ලබා ගැනීම ඇතුළත් වන, ක්‍රමානුකුල කාර්යභාරය ක්‍රියාවලි නැවත කිරීමේ කොටසක් ලෙස හුවමාරුවක් යෝග්‍ය සාක්ෂි රැස් කිරීම සහ සහතික වීමේ කුසලතා සහ ශිල්ප ක්‍රම ව්‍යවහාර කිරීම අවශ්‍ය කෙරේ.

78. සාධාරණ සහතිකවීමේ කාර්යභාරයට පහත දේ සම්බන්ධ කර ගැනේ:

(අ) පාදකවන විෂය කරුණ සහ වෙනත් කාර්යභාර තත්ත්වයන් අවබෝධ කර ගැනීමේ පදනම මත, විෂය කරුණ තොරතුරු තුළ ප්‍රමාණවත් අවප්‍රකාශයක අවදානම් හඳුනා ගැනිම සහ තක්සේරු කිරීම;

(ආ) තක්සේරුකළ අවදානම්වලට ප්‍රතිචාර දක්වීමට ක්‍රියා පටිපාටි සැලසුම් කිරීම සහ ඉටු කිරීම සහ පරිචයේ යෙදෙන්නාගේ නිගමනවලට සහාය වීමට සාධාරණ සහතික වීමක් ලබා ගැනීමට; සහ

(ඇ) කාර්යභාරයේ පද සම්බන්ධය තුළ ලබාගත් සාක්ෂිවල ප්‍රමාණවත්භාවය සහ යෝග්‍යත්වය ඇගයීම සහ තත්ත්වයන් තුළ අවශ්‍ය වන්නේ නම් තවදුරටත් තොරතුරු ලබා ගැනීමට උත්සාහ කිරීම.

79. සීමිත සහතික වීමේ කාර්යභාරයක් තුළ දී ප්‍රමාණවත් යෝග්‍ය සාක්ෂි රැස් කිරීම සඳහාවන ක්‍රියාපටිපාටිවල ස්වභාවය, කල්යෙදුම සහ ප්‍රමාණය, සාධාරණ සහතික වීමේ කාර්යභාරයකට සාපේක්ෂව සීමිත වේ. පාදකවන විෂය කරුණ - විශේෂී සහතික වීමේ ප්‍රමිතයන් උදාහරණයක් ලෙස, විශේෂ වර්ගයක සීමිත සහතික වීමේ

කාර්යභාරයක් සඳහා ප්‍රමාණවත් යෝග්‍ය සාක්ෂි මූලිකව ලබා ගන්නේ විශ්ලේෂණාත්මක ක්‍රියාපටිපාටි සහ විමසීම් මගින් ලෙස ස්ථාපිත කළ හැකිය. වෙනත් වර්ගවල සීමිත සහතිකවීමේ කාර්යභාර සඳහා පාදකවන විෂය කරුණ නිශ්චිත සහතිකවීමේ ප්‍රමිත නැති බව තුළ කෙසේ වෙතත් ප්‍රමාණවත් යෝග්‍ය සාක්ෂි රැස්කර ගැනීම සඳහා වන ක්‍රියාපටිපාටි ප්‍රාථමිකව විශ්ලේෂණාත්මක ක්‍රියාපටිපාටි සහ විමසීම් විය හෝ විය නොවිය හැකි සහ කාර්යභාරයේ තත්ත්වය සමඟ වෙනස්වීමට භාජනය වනු ඇත. අදාළ කාලය සහ පිරිවැය සීමා කිරීම් ඇතුළුව පාදකවන විෂය කරුණු, සහ අපේක්ෂිත පරිශීලකයන් සහ කාර්යභාරයේ යෙදෙන පාර්ශවයේ තොරතුරු අවශ්‍යතාවයන්. කාර්යභාරයක ස්වභාවය, කාල නිර්ණය සහ ක්‍රියාපටිපාටිවල ප්‍රමාණය නිර්ණය කිරීම වෘත්තිය විනිශ්චයේ කරුණක් වන අතර එය එක කාර්යභාරයක සිට ඊළඟ කාර්යභාරය දක්වා වෙනස්වීමට භාජනය වේ.

80. සීමිත සහතික වීමේ කාර්යභාරයක් පහත දෑවලට සම්බන්ධ කර ගැනේ:

(අ) පාදකවන විෂය කරුණ සහ වෙනත් කාර්යභාර තත්වයන්හි අවබෝධය මත පදනම් විෂය කරුණ තොරතුරක ප්‍රමාණාත්මක අවප්‍රකාශයක් පැන නැගීම විය හැක්කේ මොන ක්ෂේත්‍රවල ද යන්න හඳුනා ගැනීම,

(ආ) එම ක්ෂේත්‍ර ආමන්ත්‍රණය කිරීමට ක්‍රියාපටිපාටි සැළසුම්කිරීම සහ ඉටු කරමින් සහ පරිචයේ යෙදෙන්නාගේ නිගමනවලට සහාය වීමට සීමිත සහතිකවීමක් ලබා ගැනීම;

(ඇ) විෂය කරුණ තොරතුරු ප්‍රමාණාත්මකව අවප්‍රකාශ විය හැකි බවට පරිචයේ යෙදෙන්නාව විශ්වාස කිරීමට හේතුවන කරුණ (ණු) පරිචයේ යෙදෙන්නන්ගේ දැන ගැනීමට පත් වී ඇත්නම්, තවදුරටත් සාක්ෂි ලබා ගැනීමට අමතර ක්‍රියාපටිපාටි සැළසුම්කිරීම සහ ඉටු කිරීම;

*ලබාගත හැකි සාක්ෂිවල ප්‍රමාණය සහ තත්ත්වය*

81. ලබාගත හැකි සාක්ෂිවල ප්‍රමාණය සහ තත්ත්වය පහත දෑ මගින් බලපෑමට ලක්වේ:

(අ) පාදකවන විෂය කරුණ සහ විෂය කරුණ තොරතුරුවල ගති ලක්ෂණ, උදාහරණ ලෙස විෂය කරුණ තොරතුරු ඓතිහාසික වෙනුවට අනාගත දිශානත වන විට අඩු විෂය නිශ්‍රිත සාක්ෂි අපේක්ෂා කළ හැකිය. (40 වන ඡේදය බලන්න); සහ

(ආ) තිබිය හැකි යැයි සාධාරණ ලෙස අපේක්ෂා කළ හැකි සාක්ෂි ලබාගත නොහැකි වන විට වැනි වෙනත් තත්ත්වයන්, හේතු වන්නේ උදාහරණ ලෙස පරිචයේ යෙදෙන්නායේ හමුවීමේ කාලයේ කල්යෙදුම, අස්තිත්ත්වයක ලිපි ලේඛන රඳවා ගැනීමේ ප්‍රතිපත්තිය, ප්‍රමාණවත් නොවූ තොරතුරු පද්ධති වගකිව යුතු පාර්ශවය විසින් පනවනු ලබන සීමා කිරීමක් සාමාන්‍යයෙන් ලබා ගත හැකි සාක්ෂි තීරණාත්මකව වඩා වෙනුවට ඒත්තුගන්වනසුළු වනු ඇත.

82. පහත සඳහන් විට එක්කෝ සාධාරණ සහතික වීමක් වන හෝ සීමිත සහතික වීමක්වන කාර්යභාරයක් සඳහා විකරණය නොකළ නිගමනයක් යෝග්‍ය නොවේ:

(අ) යෝග්‍ය මට්ටමකට කාර්යභාරයේ අවදානම අඩු කිරීමට අවශ්‍ය කරන සාක්ෂි ලබා ගැනීමෙන් පරිචයේ යෙදෙන්නා වළක්වාලන තත්ත්වයන්; හෝ

(ආ) යෝග්‍ය මට්ටමකට කාර්යභාරයේ අවදානම අඩු කිරීමට අවශ්‍යකරන සාක්ෂි ලබා ගැනීමෙන් පරිචයේ යෙදෙන්නා වළක්වාලීමක්වන කාර්යභාරයට වන පාර්ශවයක් සීමාවක් පැනවීම.

## සහතික වීමේ වාර්තාව

83. ලබාගත් සාක්ෂි පදනම මත පරිචයේ යෙදෙන්නා නිගමනයන් සකස් කරයි සහ විෂය කරුණ තොරතුර පිළිබඳව එම සහතිකවීමේ නිගමන පැහැදිලි ප්‍රකාශයක් අඩංගු ලිඛිත වාර්තාවක් ලබාදෙයි. සහතිකවීමේ ප්‍රමිත, සහතික වීමේ වාර්තා සඳහා මූලික මූලිකාංග ස්ථාපනය කරයි.

84. සාධාරණ සහතික වීමේ කාර්යභාරයක පරිචයේ යෙදෙන්නාගේ නිගමන ප්‍රකාශ කරමින් පාදකවන විෂය කරුණේ මැනීමේ හෝ ඇගයීමේ ප්‍රතිඵල මත පරිචයේ යෙදෙන්නාගේ මතය දක්වන්නේ ධනාත්මක ආකාරයකටය.

85. සාධාරණ සහතිකවීමේ කාර්යභාරය සඳහා නිගමන ප්‍රකාශ කරන යෝග්‍ය ආකාරයේ උදාහරණවලට ඇතුළත් වන්නේ,

- පාදකවන විෂය කරුණ සහ යෝග්‍යවන නිර්ණායකවල භාෂිතය අනුව ප්‍රකාශ කරන විට "අපගේ මතය වනුයේ xyz නීතිය සමග අස්තිත්වය සියලු ප්‍රමාණාත්මක අංගයන්ට අනුකූල වී ඇත.",
- විෂය කරුණ තොරතුරු සහ අදාළ නිර්ණායකයේ භාෂිතය අනුව ප්‍රකාශ කරනවිට, "xyz ආකෘතිමය රාමුව සමග අනුකූලව [දිනය] දිනට අස්තිත්ත්වයේ මූල්‍ය තත්ත්වය සහ එම දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා එහි

මූල්‍ය කාර්යසාධනය සහ එහි මුදල් ප්‍රවාහ ප්‍රකාශවලින් යුත් මූල්‍ය ප්‍රකාශ සියලුම ප්‍රමාණාත්මක අංගයන්ගෙන් සාධාරණව ඉදිරිපත් කර ඇති බව අපගේ මතය වේ"; හෝ

- යෝග්‍ය පාර්ශ්වය විසින් කළ ප්‍රකාශයක භාෂිතය අනුව ප්‍රකාශ කරන විට "[යෝග්‍ය පාර්ශ්වයේ] ප්‍රකාශය අනුව අස්තිත්ත්වය xyz නීතිය සමග අනුකූලව සියලු ප්‍රමාණාත්මක අංගයන්ගෙන් සාධාරණව ඉදිරිපත් කර ඇති බව අපගේ මතය වේ" හෝ "[යෝග්‍ය පාර්ශ්වයේ] ප්‍රකාශය අනුව xyz නිර්ණායකය සමග අනුකූලව ඉදිරිපත් කළ ප්‍රධාන කාර්යසාධන සූචක සියලු ප්‍රමාණාත්මක අංගයන්ගෙන් සාධාරණව ඉදිරිපත් කර ඇති බව අපගේ මතය වේ."

සෘජු කාර්යභාරයකදී පරිචයේ යෙදෙන්නාගේ නිගමනයන් ප්‍රකාශකරන්නේ පාදකවන විෂය කරුණ සහ නිර්ණායකයේ නියමයන් අනුවය.

86. සීමිත සහතිකවීමේ කාර්යභාරයකදී පරිචයේ යෙදෙන්නාගේ නිගමන ප්‍රකාශ කරන්නේ, ඉටු කරන ලද කාර්යභාරය පදනම මත විෂය කරුණ තොරතුර ප්‍රමාණාත්මක ලෙස අවප්‍රකාශ වීමට පරිචයේ යෙදෙන්නාට විශ්වාස කිරීමට හේතුකාරක වන කරු(ණු)ණක් පරිචයේ යෙදෙන්නාගේ අවධානයට පැමිණ ඇත් ද යන්න දන්වන ස්වරූපයෙනි. උදාහරණ ලෙස "ඉටු කළ ක්‍රියාපටිපාටි සහ ලබාගත් සාක්ෂි පදනම මත xyz නීතිය සමග සියළු ප්‍රමාණාත්මක අංගයන්ගෙන් අස්තිත්ත්වය අනුකූලව කටයුතු නොකර ඇතැයි අපට විශ්වාස කිරීමට වූ හේතු කාරණා කිසිවක් අපගේ අවධානයට පැමිණ නැත."

87. පරිචයේ යෙදෙන්නා අපේක්ෂිත පරිශීලකයන්ට කරන සඵලදායක සන්නිවේදනය පහසු වීමට "කෙටි - ආකාරයේ" හෝ "දිගු - ආකාරයේ" වාර්තා කරන ශෛලියක් ඔහුට තෝරාගත හැකිය. "කෙටි - ආකාරයේ" වාර්තාවල සාමාන්‍යයෙන් ඇතුළත් වන්නේ මූලික මූලිකාංග පමණි. "දිගු - ආකාරයේ" වාර්තාවල ඇතුළත් වන්නේ පරිචයේ යෙදෙන්නාගේ නිගමනයට බලපෑමට අපේක්ෂා නොකරන වෙනත් තොරතුරු සහ පැහැදිලි කිරීමය. ඊට අතිරේකව මූලික මූලිකාංග, දිග - ආකාරයට වාර්තා විස්තරාත්මකව විස්තර කළ හැක්කේ කාර්යභාරයේ නියමයන් භාවිත කරනු ලැබූ නිර්ණායකය, කාර්යභාරයේ විශේෂ අංගයකට සම්බන්ධිත සොයා ගැනීම් පරිචයේ යෙදෙන්නාගේ සහ කාර්යභාර සමග සම්බන්ධ වන වෙනත් අයගේ සුදුසුකම් හා පළපුරුද්ද පිළිබඳ විස්තර, ප්‍රමාණාත්මක භාවයේ මට්ටම්වල හෙළිදරව් කිරීම සහ සමහර අවස්ථාවලදී නිර්දේශ කිරීම් ඉහත සඳහන් යම් එවැනි තොරතුරු ඇතුළත් කළ යුතු ද යන්න රඳා පවත්වන්නේ, අපේක්ෂිත පරිශීලකයන්ගේ තොරතුරු අවශ්‍යතාවයන්ගේ එහි වැදගත්කම මතය.

88. යම් කරුණ අවධාරණයක්, වෙනත් කරුණ කාර්යභාරයේ විශේෂ අංගයන් සම්බන්ධිත සොයා ගැනීම්, නිර්දේශ හෝ සහතිකවීමේ වාර්තාව තුළ ඇතුළත් කර ඇති අතිරේක තොරතුරු ඇතුළුව පරිචයේ යෙදෙන්නාගේ නිගමනයට බලපෑමක් සිදුවීමට අපේක්ෂා නොකරන, තොරතුරු හෝ පැහැදිලි කිරීම් වලින් පරිචයේ යෙදෙන්නාගේ නිගමන පැහැදිලිව වෙන් කෙරේ. කරුණු අවධාරණය, වෙනත් කරුණු, සොයා ගැනීම් නිර්දේශ හෝ අතිරේක තොරතුරු පරිචයේ යෙදෙන්නාගේ නිගමනයන් අගය අඩු කිරීමට අපේක්ෂා නොකරන අතර, භාවිත කළ වචන පෙළ ගැස්ම එය සාර්ථකව පැහැදිලි කරයි.

89. පහත සඳහන් තත්ත්වයන් තුළ පරිචයේ යෙදෙන්නා විකරණය කළ නිගමනයක් ප්‍රකාශ කරයි:

(අ) පරිචයේ යෙදෙන්නාගේ වෘත්තිය විනිශ්චය තුළ, විෂය පථයේ සීමා කිරීමක් පැවැති බව සහ කරුණේ බලපෑම ප්‍රමාණාත්මක වන විට එවැනි අවස්ථාවල පරිචයේ යෙදෙන්නා කොන්දේසි සහිත නිගමනයක් හෝ නිගමනය වියාචනය කිරීම ප්‍රකාශ කරයි. සමහර අවස්ථාවලදී, කාර්යභාරයේ යෙදෙන්නා කාර්යභාරයෙන් ඉවත්වීම ද සලකා බලයි,

(ආ) පරිචයේ යෙදෙන්නාගේ වෘත්තිය විනිශ්චය තුළ විෂය කරුණ තොරතුරු ප්‍රමාණාත්මක ලෙස අවප්‍රකාශවී ඇතිවිට එවැනි අවස්ථාවන්හිදී පරිචයේ යෙදෙන්නා කොන්දේසි සහිත නිගමනයක් හෝ අහිතකර මතයක් ප්‍රකාශ කරයි. එවැනි සෘජු කාර්යභාර තුළ විෂය කරුණ තොරතුරු පරිචයේ යෙදෙන්නාගේ නිගමනය වන අවස්ථාවක සහ සියලු හෝ සමහර පාදකවන විෂය කරුණ, සෑම ප්‍රමාණාත්මක අංගයන්ගෙන් නිර්ණායක සමග අනුකූල නොවන බව පරිචයේ යෙදෙන්නා නිගමනය කරනවිට එවැනි නිගමනයන් එසේම කොන්දේසි සහිත (හෝ යෝග්‍ය පරිදි අහිතකර) කළ ලෙස සැලකිය හැකිය.

90. කොන්දේසි සහිත නිගමනයක් ප්‍රකාශ කරන්නේ කරුණට බලපෑම් හෝ විය හැකි බලපෑම් එතරම් ප්‍රමාණාත්මක නොවන සහ අහිතකර නිගමනයන් හෝ නිගමනය වියාචනය කිරීමට අවශ්‍ය ලෙස ඒත්තුගන්වනසුලු නොවන විටය.

91. කාර්යභාරය භාරගත් පසු සහතික විමේ කාර්යභාරයක් සඳහා වූ පූර්ව කොන්දේසි එකක් හෝ ඊට වැඩි ගණනක් විද්‍යාමාන නොවන බව අනාවරණය කර ගෙන ඇති නම් එම කරුණ පරිචයේ යෙදෙන්නා, යෝග්‍ය පාර්ශව(ය)යන් සමග කරුණ සාකච්ඡා කර, සහ පහත ලෙස නිර්ණය කරයි:

(අ) පරිචයේ යෙදෙන්නා සෑහීමකට පත්වන අන්දමට කරුණ පහදා ගත හැකිවන්නේ ද?

(ආ) කාර්යභාරය සමග නොකඩවා කටයුතු කිරීම යෝග්‍ය වන්නේද?

(ඇ) එසේ වේ නම්, සහතික කිරීමේ වාර්තාවේ කරුණ කෙසේ සන්නිවේදනය කළ යුතු වන්නේ ද?

92. කාර්යභාරය භාරගත් පසු සියලු හෝ සමහර නිර්ණායක නුසුදුසු හෝ සියලු හෝ සමහර පාදකවන විෂය කරුණ සහතික වීමේ කාර්යභාරයක් සඳහා නුසුදුසු බව අනාවරණය කරගෙන ඇත්නම්, අදාළ නීතිය හෝ රෙගුලාසි යටතේ ඉවත් විය හැකිනම්, කාර්යභාරයෙන් ඉවත්වීමට පරිචයේ යෙදෙන්නා සැළකිල්ලට ගනී. කාර්යභාරය සමඟ පරිචයේ යෙදෙන්නා නොකඩවා කටයුතු කරන්නේ නම්, පරිචයේ යෙදෙන්නා ප්‍රකාශ කරන්නේ;

(අ) පරිචයේ යෙදෙන්නාගේ වෘත්තිය විනිශ්චය තුළ, නුසුදුසු නිර්ණායකයන් යෝග්‍ය නොවන පාදක වන විෂය කරුණ අපේක්ෂා කරන පරිශීලකයන්ට වැරදි අදහසක් දිය හැකි අවස්ථාවක කරුණ කොපමණ ප්‍රමාණාත්මක සහ ඒත්තුගන්වනසුලු ද යන පදනම මත කොන්දේසි සහිත, නිගමනයක් හෝ අහිතකර නිගමනයක් හෝ

(ආ) අනෙක් අවස්ථාවන්හිදී, කරුණ කොපමණ ප්‍රමාණාත්මක සහ ඒත්තු ගන්වන සුලු ද යන්න පරිචයේ යෙදෙන්නාගේ වෘත්තිය විනිශ්චය මත රඳා පවතමින් කොන්දේසි සහිත නිගමනයක් හෝ නිගමනය ව්‍යාචනය කිරීමක්ය.

## වෙනත් කරුණු

### *වෙනත් සංනිවේදන වගකීම්*

93. කාර්යභාරයේ නියමයන්ට සහ වෙනත් කාර්යභාරයේ තත්ත්වයනට අනුගාමීව, පරිචයේ යෙදෙන්නාගේ අවධානයට පැමිණි ඕනෑම කරුණක්, වගකිව යුතු පාර්ශවය, මිනුම් කරන්නන් හෝ ඇගයීම් කරන්නන් කාර්යභාරයේ නියැලී පාර්ශවය පාලනය භාරව කටයුතු කර අයවලුන් හෝ වෙනත් අය සමඟ එය සන්නිවේදනය කළ යුතු ද යන්න පරිචයේ යෙදෙන්නා සැලකිල්ලට ගනී.

*ලේඛනගත කිරීම*

94. කාර්යභාරය සමඟ මීට පෙර සම්බන්ධනයක් නොමැති පළපුරුදු පරිචයේ යෙදෙන්නෙකුට පහත දෑ පිළිබඳව අවබෝධ කර ගැනීමට; හැකියාව ලබාදීමට කාර්යභාරය ලේඛනගත කිරීම එය ප්‍රමාණවත් සහයෝගය සහ කාලානුරූපී පදනමක් මත පිළියෙල කරන විට සහතික වීමේ වාර්තාවට පදනමක් සඳහා කාර්යභාර ලේඛනගත කිරීම වාර්තාවක් ලබාදෙයි:

(අ) අදාළ සහතිකවීමේ ප්‍රමිත හා උචිත නෛතික සහ නියාමන අවශ්‍යතාවයන් සමඟ අනුකූල වීමට ඉටු කළ යුතු ක්‍රියා පටිපාටිවල ස්වභාවය, කල් යෙදුම සහ ප්‍රමාණය;

(ආ) ඉටුකළ ක්‍රියාපටිපාටිවල ප්‍රතිඵල සහ ලබාගත් සාක්ෂි; සහ

(ඇ) කාර්යභාරය තුළදී පැන නැගුන සැලකිය යුතු අන්දමේ කරුණු, එහි ප්‍රතිඵලයක් ලෙස ළඟා වූ නිගමන, එම නිගමන ළඟා කර ගැනීමේදී සිදු කළ සැලකිය යුතු වෘත්තිය විනිශ්චයන්.

95. පරිචයේ යෙදෙන්නා විසින් හඳුනාගත් තොරතුරු සහ සැලකිය යුතු අන්දමේ කරුණක් සම්බන්ධයෙන් පරිචයේ යෙදෙන්නාගේ අවසාන නිගමනය අතර යම් අසංගතතාවයක් පරිචයේ යෙදෙන්නා කෙසේ ආමන්ත්‍රණය කරන්නේ ද යන්න කාර්යභාර ලිපි ලේඛනවල ඇතුළත් වේ.

## පරිචයේ යෙදෙන්නාගේ නම උචිත නොවන ලෙස භාවිත කිරීම

96. පාදකවන විෂය කරුණක් සමග හෝ සම්බන්ධිත විෂය කරුණ තොරතුරු සමග සම්බන්ධනය වන පරිචයේ යෙදෙන්නෙක් ඔහුගේ වාර්තාවන්හි කැමති විටක හෝ පාදකවන විෂය කරුණ සමග හෝ සම්බන්ධිත විෂය කරුණ තොරතුරු සමග වෘත්තීය සම්බන්ධනය තුළ පරිචයේ යෙදෙන්නාගේ නම භාවිත කිරීමට කැමැත්ත ප්‍රකාශ කිරීම. පාදක වන විෂය කරුණක් හෝ සම්බන්ධිත විෂය කරුණ තොරතුරු සමඟ පරිචයේ යෙදෙන්නාගේ නම, පාර්ශවයක් විසින් යෝග්‍ය නොවන ආකාරයෙන් භාවිත කරන බව පරිචයේ යෙදෙන්නා දැනගත්තේ නම් එම පාර්ශවයට එසේ කිරීමෙන් වලකින ලෙස පරිචයේ යෙදෙන්නා උපදෙස් දෙයි. පරිචයේ යෙදෙන්නාගේ නම කවුරුත් දන්නා ඕනෑම තුන්වන පාර්ශවවල පරිශීලකයන්ට දැන්වීම හෝ නීති උපදෙස් පැතීම වැනි කුමන වෙනත් පියවර එලෙසම පරිචයේ යෙදෙන්නා සැලකිල්ලට ගැනීම අවශ්‍ය විය හැකිය.

## 1 වන පරිශිෂ්ඨය

ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනයේ පාලක මණ්ඩලය විසින් නිකුත් කළ ප්‍රකාශ සහ ඒවා එකිනෙකට හා ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනයේ ධර්ම සංග්‍රහයට ඒවායේ සම්බන්ධතාවය.

මෙම පරිශිෂ්ඨය නිදර්ශණය කරන්නේ ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනය විසින් නිකුත් කළ ප්‍රකාශවල ක්ෂේත්‍රය සහ එකිනෙකට සහ වෘත්තිය ගණකාධිවරුන් සඳහා වන ආචාර ධර්ම සංග්‍රහයට (ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනයේ ධර්ම සංග්‍රහය) ඒවායේ සම්බන්ධතාවය වේ.




## 2 වන පරිශිෂ්ඨය

### වලංගුබව සහතික කිරීමේ කාර්ය භාර සහ ඍජු කාර්යභාර

1. මෙම පරිශිෂ්ඨය සහතික කිරීමේ කාර්යභාරයක් සහ ඍජු කාර්යභාරයක් අතර වෙනස්කම ලුහුඬින් සටහන් කරයි.

   වලංගුබව සහතික කිරීමේ කාර්යභාරයකදී, මිනුම්කරන්නා හෝ ඇගයීම් කරන්නා පරිචයේ යෙදෙන්නෙක් නොවන අතර ප්‍රතිඵලය වන විෂය කරුණ තොරතුර නිර්ණායකයට එරෙහිව පාදකවන විෂය කරුණ තොරතුර මැනීම හෝ ඇගයීම කරයි. පාදකවන විෂය කරුණ සහ නිර්ණායකයේ පද සම්බන්ධයෙන් විෂය කරුණ තොරතුර පැහැදිලිව ප්‍රකාශ කිරීමට අපොහොසත් විය හැකිය සහ ඒ අනුව ප්‍රමාණාත්මක ප්‍රමාණයකට විය හැකි ලෙස අවප්‍රකාශ විය හැකිය. මිනුම් කරන්නෙක් හෝ ඇගයීම් කරන්නෙක් විසින් පිළියෙල කළ විෂය කරුණ තොරතුරු ප්‍රමාණාත්මක අවප්‍රකාශ වලින් තොර දැයි යන්න පිළිබඳ නිගමනයක් ප්‍රකාශ කිරීමට හැකිවනු පිණිස ප්‍රමාණවත් යෝග්‍ය සාක්ෂි ලබා ගත යුතු බව සහතික කිරීමේ කාර්යභාරයක් තුළදී පරිචයේ යෙදෙන්නාගේ භූමිකාව වේ.

2. ඍජු කාර්යභාරයකදී, පරිචයේ යෙදෙන්නන් නිර්ණායකයකට එරෙහිව පාදකවන විෂය කරුණ මැනීම සහ ඇගයීම කර ඵලයක් වන විෂය කරුණ තොරතුර, කොටසක් ලෙස හෝ සහතික වීමේ වාර්තාව හා එක්ව යන ලෙස ප්‍රකාශ කරයි. ඍජු කාර්යභාරයකදී පරිචයේ යෙදෙන්නාගේ නිගමනය නිර්ණායකට එරෙහිව පාදකවන විෂය කරුණ මැනීමේ හෝ ඇගයීම් වාර්තාව වූ ප්‍රතිඵලය ආමන්ත්‍රණය කරයි. සමහර ඍජු කාර්යභාර තුළ පරිචයේ යෙදෙන්නාගේ නිගමනය හෝ එහි කොටසක් විෂය කරුණ තොරතුරු වේ.

පාදකවන විෂය කරුණමත රඳා පවතිමින්;

(අ) ඍජු කාර්යභාරයක් තුළ මැනීමේ හෝ ඇගයීමේ ප්‍රතිඵලය සහතික වීමේ කාර්යභාරයකදී, මිණුම්කරන්නා හෝ ඇගයීම් කරන්නා විසින් පිළියෙල කරන වාර්තාවකට හෝ ප්‍රකාශයකට සමාන විය හැකිය. වෙනත් තත්ත්වයන් තුළදී, කෙසේ වෙතත් ප්‍රතිඵලය, එනම් විෂය කරුණ තොරතුරු පිළිබිඹු විය හැක්කේ, සොයා ගැනීම්වල විස්තර තුළ සහ පරිචයේ යෙදෙන්නාගේ නිගමනයට පදනම සඳහා වන දිග - ස්වරූපයේ සහතික වීමේ වාර්තාව තුළය; සහ

(ආ) පරිචයේ යෙදෙන්නා රැස් කරගත් දත්ත හෝ වෙනත් අය විසින් සම්පාදනය කළ දත්ත භාවිත කළ හැකිය. උදාහරණ ලෙස; වගකිව යුතු පාර්ශවය විසින් නඩත්තු කරනු ලබන තොරතුරු පද්ධතියකින් දත්ත ලැබිය හැකිය.

3. ඍජු කාර්යභාරයකදී පාදකවන විෂය කරුණ මැනීම හෝ ඇගයීමට අමතරව, පරිචයේ යෙදෙන්නා විෂය කරුණ තොරතුරු ප්‍රමාණාත්මක ලෙස අවප්‍රකාශ වී ඇත්දැයි පිළිබඳව නිගමනයක් ප්‍රකාශ කිරීමට හැකිවීම පිණිස ප්‍රමාණවත් යෝග්‍ය සාක්ෂි ලබා ගැනීමට එලෙසම සහතික වීමේ කුසලතා සහ ශිල්පක්‍රම ව්‍යවහාර කරයි. පරිචයේ යෙදෙන්නා එම සාක්ෂි එකවරම පාදක වන විෂය කරුණ තොරතුර මැනීමේදී හෝ ඇගයීම සමඟ ලබාගනී. එහෙත් එම සාක්ෂි එවැනි මැනීම් කිරීම හෝ ඇගයීමට පෙර වුවද ලබාගත හැකිය.

4. ඍජු කාර්යභාරයක වටිනාකම පහත (අ) සහ (ආ) හි සංයෝජනයක් තුළ පවතී:

(අ) පරිචයේ යෙදෙන්නා විසින් විෂය කරුණ තොරතුර පිළියෙල කළ නිසා පරිචයේ යෙදෙන්නා විෂය කරුණ තොරතුරෙන් ස්වාධීන නොවන බව නොතකා, කාර්යභාරයේ යෙදෙන පාර්ශවය, අපේක්ෂා කරන පරිශීලකයන් සහ වගකිව යුතු පාර්ශවය පාදකවන විෂය කරුණෙන් පරිචයේ යෙදෙන්නාගේ ස්වාධීනත්වය; සහ

(ආ) වලංගු බව සහතික වීමේ කාර්යභාරයක් සඳහා මෙන් සමාන ප්‍රමාණයේ සහ ගුණයේ සාක්ෂි සමාහරණය වීම ඵලයක් වන පාදකවන විෂය කරුණ මැනීමේදී හෝ ඇගයීමේදී ව්‍යවහාර කළ සහතික වීමේ කුසලතා සහ ශිල්ප ක්‍රම. මෙම ප්‍රමාණවත් යෝග්‍ය සාක්ෂි ලබා ගැනීමෙන්, ඍජු කාර්යභාරයකින් හුදු සම්පාදනය කිරීමකින් වෙන් කොට හඳුනා ගනී. මෙම කරුණ නිදර්ශනය කිරීමට පරිචයේ යෙදෙන්නෙක් අස්තිත්ත්වයක හරිතාගාර වායු ප්‍රකාශයක් සම්පාදනය කරන විට උදාහරණ ලෙස පරිචයේ යෙදෙන්නෙක් අධීක්ෂණ ආම්පන්නවල ක්‍රමාංකනය පරීක්ෂා කරන්නේ නැත. කෙසේ වෙතත් ඍජු කාර්යභාරයකදී අදාළවන අවස්ථාවලදී පරිචයේ යෙදෙන්නා එක්කෝ ක්‍රියාවලිය මැනීමේ කොටසක් ලෙස අධීක්ෂණ ආම්පන්න ප්‍රමාණ ශෝධනය කරයි හෝ කාර්යභාරය වන්නේ වලංගුභාවය සහතික කිරීමේ කාර්යභාරයක් විය හැකි අවස්ථාවක් නම් වෙනත් අය විසින් කළ හා සමාන ප්‍රමාණයකම අධීක්ෂණ ආම්පන්න ක්‍රමාංකනය පරීක්ෂා කරයි.

**3 වන පරිශිෂ්ඨය**

## සහතිකවීමේ කාර්යභාරයකට වන පාර්ශ්ව



1. සියලු සහතික වීමේ කාර්යභාරයන්ට අඩු තරමින් පාර්ශව තුනක් ඇත; වගකිව යුතු පාර්ශවය, පරිචයේ යෙදෙන්නා සහ අපේක්ෂා කරන පරිශීලකයන්, කාර්යභාර තත්ත්වය මත රඳා පවතමින් මැනීම කරන්නා හෝ ඇගයීම කරන්නා හෝ කාර්යභාරයේ යෙදෙන්නා හට එසේම වෙනම භූමිකාවක් තිබිය හැකිය.

2. ඉහත රූපසටහන නිදර්ශනය කරන්නේ පහත දැක්වෙන භූමිකා සහතික වීමේ කාර්යභාරයකට සම්බන්ධිත වන්නේ කෙසේ ද යන්නය:

අ. වගකිව යුතු පාර්ශවය පාදකවන විෂය කරුණ සඳහා වගකිව යුතුය.

ආ. විෂය කරුණ තොරතුර තුළ ප්‍රතිඵලයක්වන පාදක වන විෂය කරුණ මැනීමට හෝ ඇගයීමට, මැනීම කරන්නා හෝ ඇගයීම කරන්නා නිර්ණායකය භාවිත කරයි.

ඇ. කාර්යභාරයේ යෙදෙන පාර්ශවය, කාර්යභාරයේ නියමයන් පිළිබඳව පරිචයේ යෙදෙන්නා සමඟ එකඟවෙයි.

ඈ. විෂය කරුණ තොරතුරු පිළිබඳව, වගකිව යුතු පාර්ශවය හැර, අපේක්ෂිත පරිශීලකයන්ගේ විශ්වාසනීයත්වයේ මට්ටම වැඩි කිරීමට සැළසුම්කර නිගමනය ප්‍රකාශ කිරීමට හැකිවනු වස් ප්‍රමාණවත් යෝග්‍ය සාක්ෂි පරිචයේ යෙදෙන්නා ලබාගනී.

ඉ. අපේක්ෂිත පරිශීලකයන් විෂය කරුණ තොරතුරු පදනම මත තීරණ ගනී. අපේක්ෂිත පරිශිලකයන් වනුයේ, තනි පුද්ගල(යෙක්) යන් හෝ සංවිධාන(යක්) හෝ සමූහ(යක්) එහි එයින් සහතික වීමේ වාර්තාව භාවිත කරනු ඇතැයි පරිචයේ යෙදෙන්නා අපේක්ෂාකරන්නේ නම් සමහර අවස්ථාවලදී සහතික වීමේ වාර්තාව ආමන්ත්‍රණය කරන අයවලුන්ට හැර වෙනත් අපේක්ෂා කරන පරිශීලකයන් සිටිය හැකිය.

මෙම භූමිකා පිළිබඳව පහත සඳහන් නිරීක්ෂණ කළ හැකිය:

- සෑම සහතික වීමේ කාර්යභාරයකටම පරිචයේ යෙදෙන්නාට අමතරව අඩුතරමින් වගකිව යුතු පාර්ශවය සහ අපේක්ෂාකරන පරිශීලකයන් සිටී.

- පරිචයේ යෙදෙන්නාට, වගකිව යුතු පාර්ශවය, කාර්යභාරයේ යෙදෙන පාර්ශවය හෝ අපේක්ෂිත පරිශීලකයෙක් විය නොහැක.

- සෘජු කාර්යභාරයකදී, පරිචයේ යෙදෙන්නා එලෙසම මැනීම කරන්නා හෝ ඇගයීම කරන්නා ද වේ.

- වලංගු බව සහතික වීමේ කාර්යභාරයකදී, පරිචයේ යෙදෙන්නාට නොව, වගකිව යුතු පාර්ශවයට හෝ වෙනත් කෙනෙකුට මැනීම කරන්නා හෝ ඇගයීම කරන්නා විය හැක.

- නිර්ණායකට එරෙහිව පාදකවන විෂය කරුණ පරිචයේ යෙදෙන්නා මැන හෝ ඇගයීම් කර ඇති අවස්ථාවක එම කාර්යභාරය සෘජු කාර්යභාරයකි.

- වෙනත් පාර්ශවයක් විසින් මැනීමේ හෝ ඇගයීම සඳහා වන වගකීම භාර ගනිමින් එම කාර්යභාරයේ ස්වභාවය වලංගු බව සහතික වීමේ කාර්යභාරයකට වෙනස් කළ නොහැකිය. උදාහරණ ලෙස වගකිවයුතු පාර්ශවයක් විසින් ඒ සඳහා වගකීම භාර ගනිමින් විෂය කරුණ තොරතුරුට ප්‍රකාශයක් ඇතුළත් කිරීම මගින්.

- වගකිව යුතු පාර්ශවයට කාර්යභාරයේ යෙදෙන පාර්ශවයම විය හැකිය.

  බොහෝ වලංගු බව සහතික කරන කාර්යභාරවල වගකිව යුතු පාර්ශවයම එසේම මැනීම කරන්නා හෝ ඇගයීම කරන්නා සහ කාර්යභාරයේ යෙදෙන පාර්ශවය විය හැකිය. උදාහරණයක් වනුයේ අස්තිත්ත්වයක් පරිචයේ යෙදීමේදී මෙම [පුරුදු] එහි ස්වකීය දැරිය හැකි භාවය (තිරසාර භාවය) පිළිබඳව ඔවුන් විසින් පිළියෙල කළ වාර්තාවක් සම්පාදනයෙන් සහතික වීමේ කාර්යභාරයක් ඉටු කිරීම සඳහා පරිචයේ යෙදෙන්නෙක් අස්තිත්ත්වය විසින් සේවයේ යොදා ගැනීම සඳහා වන අවස්ථාවක්. එහි තවත් උදාහරණයක් ලෙස වගකිව යුතු පාර්ශවය මිනුම්කරන්නාගෙන් හෝ ඇගයීම් කරන්නාගෙන් වෙනස් වන විට රජයේ ආයතනයක් විසින් පුද්ගලික සමාගමක පරිචයේ යෙදීම [පුරුදුවල] දැරිය හැකි බව පිළිබඳව පිළියෙල කළ වාර්තාවක් සම්බන්ධයෙන් සහතික වීමේ කාර්යභාරයක් ඉටු කිරීමට පරිචයේ යෙදෙන්නෙක් සේවයේ යොදවන අවස්ථාවක්.

- වලංගු බව සහතික වීමේ කාර්යභාරයකදී මිනුම් කරන්නා හෝ ඇගයීම් කරන්නා සාමාන්‍යයෙන් විෂය කරුණ තොරතුර පිළිබඳව ලිඛිත නියෝජනය වීමක් පරිචයේ යෙදෙන්නාට ලබාදෙයි. සමහර අවස්ථාවලදී, පරිචයේ යෙදෙන්නා හට එවැනි නියෝජනය වීමක් ලබා ගැනීමට නොහැකි විය හැක. උදාහරණ ලෙස, කාර්යභාරයේ යෙදෙන පාර්ශවය මැනීම කරන්නා හෝ ඇගයීම් කරන්නා නොවන විටදී.

- වගකිව යුතු පාර්ශ්වය අපේක්ෂිත පරිශීලකයන්ගෙන් එක් අයෙක් වියහැකි අතර ඔහු එකම තැනැත්තා පමණක් නොවේ.

- වගකිව යුතු පාර්ශ්වය, මිනුම් කරන්නා හෝ ඇගයීම කරන්නා සහ අපේක්ෂිත පරිශීලකයන් වෙනස් අස්තිත්ත්වයන්ගෙන් හෝ එකම අස්තිත්ත්වයෙන් විය හැකිය. පසුව දක්වූ අවස්ථාවට උදාහරණයක් ලෙස, ද්වි-පථ අධ්‍යක්ෂ මණ්ඩල ව්‍යූහයක් තුළ අධීක්ෂණ අධ්‍යෂක මණ්ඩලය එම අස්තිත්ත්වයේ විධායක අධ්‍යක්ෂක මණ්ඩලය විසින් ලබාදුන් තොරතුරු පිළිබඳ සහතික වීමක් ඉල්ලා සිටිය හැකිය. වගකිව යුතු පාර්ශවය, මැනුම් කරන්නා, හෝ ඇගයීම් කරන්නා සහ අපේක්‍ෂා කරන පරිශීලකයන් අතර සම්බන්ධතාවය පිළිබඳ මතයන් ඇති කර ගත යුත්තේ නිශ්චිත කාර්යභාරයක පද සම්බන්ධතාවය තුළ හා වඩාත් සම්ප්‍රදායකව නිර්වචිත රේඛීය වගකීමෙන් වෙනස් විය හැකිය. උදාහරණ ලෙස, අස්තිත්ත්වයක ජ්‍යෙෂ්ඨ කළමණාකාරිත්වය (අපේක්‍ෂිත පරිශීලක) පහල මට්ටමේ කළමනාකාරිත්වයේ (වගකිව යුතු පාර්ශවය) වහාම වගකීමක් වන එහෙත් ඒ සඳහා අවසාන වශයෙන් ජ්‍යෙෂ්ඨ කළමනාකාරිත්වය වගකිව යුතු අස්තිත්ත්වයේ ක්‍රියාකාරකම්වල විශේෂ අංගයක් මත සහතිකවීමේ කාර්යභාරයක් ඉටු කිරීමට පරිචයේ යෙදෙන්නෙක් සේවයේ යොදවාගත හැකිය.
- එලෙසම වගකිව යුතු පාර්ශ්වයක් නොවන කාර්යභාරයේ යෙදෙන පාර්ශවයකට අපේක්ෂිත පරිශිලකයෙන් විය හැකිය.
- පරිචයේ යෙදෙන්නාගේ නිගමනය එක්කෝ පහත සඳහන් භාෂිතයෙන් වැකි කඩ කළ හැකිය.
- පාදකවන විෂය කරුණ සහ යෝග්‍ය නිර්ණායකය;
- විෂය කරුණ තොරතුරු සහ යෝග්‍ය නිර්ණායක; හෝ
- යෝග්‍ය පාර්ශවය විසින් කරන ලද ප්‍රකාශය

5. වගකිව යුතු පාර්ශවය හැර අපේක්ෂිත පරිශීලකයන් නොමැති වන විට සහ එහෙත් සහතික වීමේ ප්‍රමිතිවල සියලු වෙනත් අවශ්‍යතාවයන් ඉටුවන අවස්ථාවක, පරිචයේ යෙදෙන්නා සහ වගකිව යුතු පාර්ශවය කාර්යභාරයකට සහතිකවීමේ ප්‍රමිතවල මූලධර්ම ව්‍යවහාර කිරීමට එකඟ විය හැකිය; එවැනි අවස්ථාවන්හිදී වගකිව යුතු පාර්ශවයට වාර්තාව භාවිත කිරීම සීමා කරමින් ප්‍රකාශයක් පරිචයේ යෙදෙන්නාගේ වාර්තාවේ ඇතුළත් කෙරේ.

## 4 වන පරිශිෂ්ඨය

## පාදක වන විෂය කරුණු ප්‍රවර්ගීකරණය

විය හැකි පාදකවන විෂය කරුණු පරාසයක වර්ගීකරණයක් පහත දක්වෙන වගුව උදාහරණ කිහිපයක් සහිතව පෙන්වයි. සමහර වර්ගීකරණවලට උදාහරණ දී නැතත් මෙම වර්ගීකරණයන්ට සම්බන්ධ තොරතුරු සහිත සහතික වීම වන කාර්යභාරයන් භාර ගැනීම පිළිබඳව අපේක්‍ෂා තැබිය නොහැකි නිසාය. වර්ගීකරණයක් අවශ්‍යයෙන්ම සම්පූර්ණ නොවේ. වර්ගීකරණ අවශ්‍යයෙන්ම අන්‍යෝන්‍ය වශයෙන් බහිෂ්කාර නොවේ, සහ සමහර පාදකවන විෂය කරුණ හෝ විෂය කරුණ තොරතුරු එකකට වඩා වැඩි ප්‍රභේද ගණනාවකට සංරචක තිබිය හැකිය. උදාහරණ ලෙස සංකලිත වාර්තාකරණය සහ ආයතනික සාමාජීය වගකීම් වාර්තාකරණය ඓතිහාසික සහ අනාගත දිසානත තොරතුරු දෙකම සහ මූල්‍ය සහ මූල්‍ය නොවන තොරතුරු යන දෙකමද තිබිය හැකිය. එසේම සමහර අවස්ථාවලදී උදාහරණ වන්නේ විෂය කරුණ තොරතුරු වේ. වෙනත් අවස්ථාවකදී ඒවා වන්නේ පාදකවන විෂය කරුණ හෝ තත්ත්වයන් තුළ කුමක් තේරුම් සහිතද යන්න සමග උපකාරී විය හැකි එම තොරතුරු වර්ගයේ ප්‍රශ්නයේ හුදු ඇඟවීමකි;

| ......... පිළිබඳ තොරතුරු | | ඓතිහාසික තොරතුරු | අනාගත දිශානත තොරතුරු |
|---|---|---|---|
| **මූල්‍ය** | **කාර්ය සාධනය** | මූල්‍ය ප්‍රකාශ පිළියෙල කරන්නේ පිළිගත් මූල්‍ය වාර්තා කරන ආකෘතිමය රාමුවක් අනුවය. | පුරෝකථක/ ප්‍රක්ෂේපණය කළ මුදල් ප්‍රවාහ |
| | **තත්ත්වය** | | පුරෝකථක/ ප්‍රක්ෂේපණය මූල්‍ය තත්ත්වය |

| | | | |
|---|---|---|---|
| **මූල්‍ය නොවන** | **කාර්ය සාධනය සම්පත් භාවිතය මුදල් සඳහා අගය** | හරිතාගාර වායු ප්‍රකාශය තිරසර භාවයේ වාර්තාව ඍප්‍රධාන කාර්යසාධක සූචක - ණඡෂි% සම්පත් භාවිත කිරීම මත සඵලදායී ප්‍රකාශය මුදලේ අගය මත ප්‍රකාශය ආයතනික සාමාජීය වගකීම් වාර්තාකරණය. | නව තාක්‍ෂණයකට ආරෝපිත අපේක්ෂිත මුදාහැරීම් අඩු වීම හෝ ගස් වැවීම මගින් හරිතාගාර වායු අල්වා ගැනීම යෝජිත ක්‍රියාවන් මගින් ලබාදෙන මුදල් සඳහා අගය ප්‍රකාශය |
| | **තත්ත්වය** | කාලයේ එක් අවස්ථාවක පද්ධතියක්/ ක්‍රියාවලියක් ක්‍රියාත්මක කිරීමේ විස්තර භෞතික ගතිලක්‍ෂණ උදාහරණ ලෙස කල්බදු දේපලවල විශාලත්වය | |
| **පද්ධති ක්‍රියාවලි** | **විස්තරය** | අභ්‍යන්තර පාලන පද්ධතියක විස්තර | |
| | **සැලසුම** | සේවා ආයතනයක පාලනවල සැලැස්ම | ළඟදී සිදුවන නිෂ්පාදන ක්‍රියාවලියක් සඳහා යෝජිත පාලනවල සැලැස්ම. |
| | **මෙහෙයුම් / කාර්ය සාධනය** | සේවක මණ්ඩලය සඳහා බඳවා ගැනීම, පුහුණුව සහ මෙහෙයුම් සඵලදායකත්වය. | |
| **චර්යාවේ අංග** | **අනුකූලවීම** | අස්තිත්ත්වය සමඟ අනුගත වීම. උදා. ණය ප්‍රඥප්ති නිශ්චිත නෛතික හෝ නියාමන අවශ්‍යතාවයන් | |
| | **මානව චර්යාව** | විගණන කමිටුවේ සඵලදායකත්වය ඇගයීම | |
| | **වෙනත්** | මෘදුකාංග පැකේජයක අරමුණ සඳහා යෝග්‍යතාවය | |

# ශ්‍රී ලංකා විගණන ප්‍රමිත 260 (සංශෝධිත)
# පාලනය පිළිබඳව වගකිව යුතු අය සමග සන්නිවේදනය

(2018 මාර්තු 31 දින හෝ ඉන් පසු අවසන් වන
කාලපරිච්ඡේදවල මූල්‍ය ප්‍රකාශ විගණන සඳහා බලපැවැත්වේ)

පටුන


| | ඡේද |
|---|---|
| හැඳින්වීම | |
| මෙම ශ්‍රී.ල.වි.ප්‍ර. යෙහි විෂය පථය | 1-3 |
| සන්නිවේදනයේ කාර්ය භාරය | 4-7 |
| බලපැවැත්වෙන දිනය | 8 |
| අරමුණු | 9 |
| නිර්වචන | 10 |
| අවශ්‍යතාවයන් | |
| පාලනය පිළිබඳ වගකිව යුතු අය | 11-13 |
| සන්නිවේදනය කළ යුතු කරුණු | 14-17 |
| සන්නිවේදන ක්‍රියාවලිය | 18-22 |
| ලේඛන ගත කිරීම | 23 |
| භාවිත කිරීම සහ වෙනත් පැහැදිලි කිරීමේ කරුණු | |
| පාලනය පිළිබඳ වගකිව යුතු අය | අ1-අ8 |
| සන්නිවේදනය කළ යුතු කරුණු | අ9-අ36 |
| සන්නිවේදන ක්‍රියාවලිය | අ37-අ53 |
| ලේඛනගත කිරීම | අ54 |

1 වන පරිශිෂ්ඨය : පාලනය පිළිබඳ වගකිව යුතු අය සමඟ සන්නිවේදනයට යොමු කරන SLSQC1 සහ වෙනත් ශ්‍රී.ල.වි.ප්‍ර. යන්හි විශේෂිත අවශ්‍යතාවයන්

2 වන පරිශිෂ්ඨය : ගිණුම්කරණ පරිචයෙහි ගුණාත්මක අංග


ශ්‍රී ලංකා විගණන ප්‍රමිත (ශ්‍රී.ල.වි.ප්‍ර) 260 (සංශෝධිත), *පාලනය පිළිබඳ වගකිව යුතු අය සමඟ සන්නිවේදනය* කියවිය යුත්තේ ශ්‍රී.ල.වි.ප්‍ර. 200 *ස්වාධීන විගණකගේ සමස්ථ අරමුණු සහ ශ්‍රී ලංකා විගණන ප්‍රමිත ප්‍රකාර විගණනයක් මෙහෙයවීම එක් කරමින්ය.*

## හැඳින්වීම

## මෙම ශ්‍රී.ල.වි.ප්‍ර. යෙහි විෂය පථය

1. මෙම ශ්‍රී ලංකා විගණන ප්‍රමිතය (ශ්‍රී.ල.වි.ප්‍ර) මූල්‍ය ප්‍රකාශ විගණනයකදී පාලනය පිළිබඳ වගකිව යුතු අය සමඟ සන්නිවේදනය කිරීමට විගණකගේ වගකීම් පිළිබඳව කටයුතු කරයි. මෙම ශ්‍රී.ල.වි.ප්‍ර. අස්තිත්ත්වයේ පාලන ව්‍යුහය හෝ ප්‍රමාණය නොසළකා ව්‍යවහාර වන නමුත්, පාලනය පිළිබඳ වගකිව යුතු සියලු අය අස්තිත්ත්වය කළමනාකරණයේ යෙදී සිටීනම් සහ ලැයිස්තුගත අස්තිත්ත්ව සඳහා විශේෂ සැළකිල්ලට ගැනීමක් ව්‍යවහාර වේ. අස්තිත්ත්වයක කළමනාකරණය හෝ අයිතිකරුවන් හා කාර්ය භාරය සමඟ වගකිව යුතු වන්නේ නම් මිස, ඔවුන් සමඟ විගණකගේ සන්නිවේදනය සම්බන්ධයෙන් අවශ්‍යතාවයන් මෙම ශ්‍රී.ල.වි.ප්‍ර. ය මගින් ස්ථාපනය කරන්නේ නැත.

2. මෙම ශ්‍රී.ලං.වි.ප්‍ර. ය ලියා ඇත්තේ මූල්‍ය ප්‍රකාශ විගණනය කිරීම සම්බන්ධය තුළ වන නමුත් පාලනය පිළිබඳ වගකිව යුතු අයට, වෙනත් ඓතිහාසික මූල්‍ය තොරතුරු පිළියෙළ කිරීම අධීක්ෂණය කිරීමට වගකීම ඇති විටක, වෙනත් ඓතිහාසික මූල්‍ය තොරතුරු විගණනයට පවත්නා තත්ත්වයන් තුළදී අවශ්‍යවන පරිදි එලෙසම ව්‍යවහාර කරගත සහ යොදාගත හැකිය.

3. මූල්‍ය ප්‍රකාශ විගණනයකදී සඵලදායී ද්වි-මාර්ග සන්නිවේදනයේ වැදගත්කම හඳුනා ගනිමින්, පාලනය පිළිබඳ වගකිව යුතු අය සමඟ විගණකගේ සන්නිවේදනය සඳහා වඩා දුරකට ආවරණය වන ආකෘතිමය රාමුවක් මෙම ශ්‍රී.ලං.වි.ප්‍ර. යෙන් ලබාදෙයි, සහ ඔවුන් සමඟ සන්නිවේදනය කළ යුතු විශේෂිත කරුණු කිහිපයක් හඳුනාගනී. මෙම ශ්‍රී.ලං.වි.ප්‍ර. යේ අවශ්‍යතාවයනට අනුපූරක වන සන්නිවේදනය කලයුතු අතිරේක කරුණු වෙනත් ශ්‍රී.ලං.වි.ප්‍ර. හඳුනාගෙන ඇත. (1 වන පරිශිෂ්ඨය බලන්න). මෙයට අමතරව පාලනය පිළිබඳ වගකිව යුතු අයට සන්නිවේදනය කළ යුතු, විගණනය තුළදී විගණක හඳුනාගත් අභ්‍යන්තර පාලනය තුළ සැළකිය යුතු අන්දමේ ඌණතා පිළිබඳ විශේෂිත අවශ්‍යතාවයන් ශ්‍රී.ලං.වි.ප්‍ර. 265[1] හි ස්ථාපිත කර ඇත. මෙම හෝ වෙනත් ශ්‍රී.ලං.වි.ප්‍ර. මගින් අවශ්‍ය නොකරන තවත් කරුණු නීතිය හා රෙගුලාසි මගින් අස්තිත්ත්වය සමඟ ගිවිසුම් මගින් හෝ කාර්යභාරයට අදාළ අතිරේක අවශ්‍යතා මගින් සන්නිවේදනය කිරීමට අවශ්‍ය විය හැකිය. උදාහරණ ලෙස ජාතික වෘත්තිය ගිණුම්කරණ ආයතනයක ප්‍රමිති, පාලනය පිළිබඳ වගකිව යුතු අය සමඟ වෙනත් ඕනෑම කරුණු විගණක සන්නිවේදනය කිරීමෙන් වළක්වාලන කිසිවක් මෙම ශ්‍රී.ලං.වි.ප්‍ර. යේ නැත. (යොමුව; අ33- අ30 ඡේද)

## සන්නිවේදනයේ කාර්ය භාරය (භූමිකාව)

4. මෙම ශ්‍රී.ලං.වි.ප්‍ර. විගණකගෙන්, පාලනය පිළිබඳ වගකිව යුතු අය වෙතට කරන සන්නිවේදන මත ප්‍රාථමිකව අවධානය කෙරේ. එසේ වුවද, සඵලදායි ද්වි-මාර්ග සන්නිවේදනය පහත දැට සහාය වීමේදී වැදගත්වේ.

   (අ) විගණක සහ පාලනය පිළිබඳ වගකිව යුතු අය විගණනයට සම්බන්ධව, සම්බන්ධිත කරුණු අවබෝධ කර ගැනීමේදී සහ නිර්මාණාත්මක කාර්යමය සම්බන්ධතාවයක් සංවර්ධනය කිරීම තුළදී මෙම සම්බන්ධතාවය සංවර්ධනය කරන්නේ විගණකගේ ඒවායේ තත්ත්වය සහ අරමුණුගතභාවය පවත්වාගෙන යන අතරේය.

   (ආ) විගණනයට අදාළ තොරතුරු පාලනය පිළිබඳ වගකිව යුතු අයගෙන් විගණක ලබා ගන්නා විට උදාහරණ ලෙස විගණකට අස්තිත්ත්වය පිළිබඳව අවබෝධයක් ලබා ගැනීමේදී සහ එහි පරිසරය විගණන සාක්ෂිවල යෝග්‍ය මූලාශ්‍ර හඳුනා ගැනීමේදී සහ විශේෂිත ගණුදෙනු හෝ සිද්ධි සම්බන්ධයෙන් තොරතුරු ලබා ගැනීමේදී; සහ

   (ඇ) පාලනය පිළිබඳව වගකිවයුතු අය ඔවුන්ගේ වගකීම ඉටු කිරීමේදී මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය අධීක්ෂණය එහි ප්‍රතිඵලයක් වශයෙන් මූල්‍ය ප්‍රකාශවල ප්‍රමාණාත්මක අවප්‍රකාශයක අවදානම් අඩු කිරීම.

5. මෙම ශ්‍රී.ලං.වි.ප්‍ර. ය මගින් අවශ්‍ය කරන කරුණු සන්නිවේදනය කිරීම සඳහා විගණක වගකිව යුතු නමුත්, පාලනය පිළිබඳ වගකිව යුතු අයට, පාලන අයිතියෙහි කරුණු සන්නිවේදනය කිරීමට කළමනාකාරීත්වයටද වගකීමක් ඇත. විගණක විසින් සන්නිවේදනය කිරීම මගින් මෙම වගකීමෙන් කළමනාකාරීත්වයට ඒ පිළිබඳව සහනයක් සැළැස්වීමක් වන්නේ නැත. ඒ හා සමානව, විගණක විසින් සන්නිවේදනය කිරීමට අවශ්‍ය එම කරුණු පාලනය පිළිබඳව වගකිව යුතු අය සමඟ කළමනාකාරීත්වය විසින් සන්නිවේදන කිරීමට එසේම ඔවුන් සමඟ

---

[1] ශ්‍රී.ල.වි.ප්‍ර. 265, *අභ්‍යන්තර පාලනයේ ඌණතා පාලනය පිළිබඳ වගකිව යුතු අය සහ කළමනාකාරීත්වය වෙත සන්නිවේදනය.*

සන්නිවේදනය කිරීමේ වගකීමෙන් විගණකටද සහනයක් නොලැබේ. මෙම කරුණු කළමනාකාරිත්වය විසින් සන්නිවේදනය කිරීම මගින් කෙසේ වෙතත් පාලනය පිළිබඳ වගකිව යුතු අය සමග විගණකගේ සන්නිවේදනයේ ස්වරූපය හෝ කල්යෙදුමට බලපා හැකිය.

6. ශ්‍රී.ලං.වි.ප්‍ර. මගින් සන්නිවේදනය කිරීමේ අවශ්‍යතාවය ඇති විශේෂිත කරුණුවල පැහැදිලි සන්නිවේදනය සෑම විගණනයකට අවශ්‍ය කොටසකි. කෙසේ වෙතත් පාලනය පිළිබඳ වගකිව යුතු අය සමග සන්නිවේදනය කළ යුතු යම් වෙනත් කරුණු හඳුනාගැනීමට නිශ්චිත ක්‍රියා පටිපාටි ඉටු කිරීම විගණකට ශ්‍රී.ලං.වි.ප්‍ර. වලින් අවශ්‍ය වන්නේ නැත.

7. සමහර අධිකරණ බලප්‍රදේශ තුළ, පාලනය පිළිබඳ වගකිව යුතු අය සමග සමහර කරුණු විගණකගේ සන්නිවේදනයට නීතියෙන් නියෝග වලින් සීමාකර ඇත. අස්තිත්ත්වයක් සෝදිසියෙන් තැබීම ඇතුළුව, සත්‍ය හෝ සැක කටයුතු නීති විරෝධී ක්‍රියාවක් තුළට නිසි අධිකාරියක් මගින් විමර්ශනයක් කිරීම අගතියක් විය හැකි සන්නිවේදනයක් හෝ වෙනත් ක්‍රියාවක් නීතිය හෝ නියෝග මගින් නිශ්චිතව තහනම් කළ හැකිය. උදාහරණ ලෙස කළු සල්ලි ජාවාරමට එරෙහි නීති පැනවීමට අනුව කෙරෙන නිසි අධිකාරියකට හඳුනා ගත් හෝ සැක කරන නීති හෝ නියෝග සමග අනුකූල නොවීම විගණකට වාර්තා කිරීමට අවශ්‍ය කරන විට වැනි දෑ. මෙවැනි අවස්ථාවන්හිදී විගණක විසින් සැලකිල්ලට ගනු ලබන කරුණු සංකීර්ණ විය හැකි අතර හා විගණක නීති උපදෙස් ලබා ගැනීම උචිත ලෙස සැලකිය හැකිය.

## බල පැවැත්වෙන දිනය

8. මෙම ශ්‍රී.ලං.වි.ප්‍ර. 2018 මාර්තු 31 වන දින හෝ ඉන් පසු අවසන්වන කාලපරිච්ඡේද සඳහා වන මූල්‍ය ප්‍රකාශ විගණනය සඳහා බලාත්මක වේ.

## අරමුණු

9. විගණකගේ අරමුණු වනුයේ,

(අ) මූල්‍ය ප්‍රකාශ විගණනයට සම්බන්ධිතව විගණකගේ වගකීම් සහ සැළසුම්කළ විෂය පථයේ සමස්ථ විග්‍රහයක් සහ විගණනයේ කල් යෙදීම, පාලනය පිළිබඳ වගකිව යුතු අය සමඟ පැහැදිලිව සන්නිවේදනය කිරීම;

(ආ) විගණනයට අදාළ තොරතුරු පාලනය පිළිබඳ වගකිව යුතු අයගෙන් ලබාගැනීම;

(ඇ) මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය අධීක්ෂණයට පාලනය පිළිබඳව වගකිව යුතු අයගේ, වගකීමට වැදගත් හා අදාළ විගණනයෙන් පැන නගින කාලානුරූපී නිරීක්ෂණ ඔවුන්ට ලබාදීම; සහ

(ඈ) විගණක සහ පාලනය පිළිබඳ වගකිව යුතු අය අතර සඵලදායී ද්වි-මාර්ග සන්නිවේදනය ප්‍රවර්ධනය කිරීම.

## නිර්වචන

10. මෙම ශ්‍රී.ලං.වි.ප්‍ර. යේ අරමුණු සඳහා පහත සඳහන් පදවලට ආරෝපිත තේරුම් පහත දැක්වේ.

(අ) පාලනය පිළිබඳ වගකිව යුතු අය අස්තිත්ත්වයේ උපාය මාර්ගික මෙහෙයවීම් සහ අස්තිත්ත්වයේ වගකිව යුතු බවට සම්බන්ධිත බැඳීම් අධීක්ෂණයට වගකීම් සහිත පුද්ගල (යෙක්) යන් හෝ සංවිධාන(යක්) (උදා. ආයතනික භාරකාර) මෙයට මූල්‍ය වාර්තා කරන ක්‍රියාවලිය අධීක්ෂණයද ඇතුළත් ය. සමහර අධිකරණ බලප්‍රදේශ තුළ සහ සමහර අස්තිත්ත්ව සඳහා පාලනය පිළිබඳ වගකිව යුතු අයට ඇතුළත් විය හැක්කේ කළමනාකාරීත්ව සේවක පිරිස්, උදාහරණ ලෙස පුද්ගලික හෝ රාජ්‍ය අංශයේ අස්තිත්ත්වයක පාලක මණ්ඩල විධායක සාමාජිකයන් හෝ හිමිකරු - කළමනාකාර. පාලන ව්‍යුහයේ විවිධත්වය සාකච්ඡා කිරීම සඳහා අ1-අ8 ඡේද බලන්න.

(ආ) කළමනාකාරිත්වය - අස්තිත්ත්වයේ මෙහෙයුම් පවත්වා ගෙනයාම සඳහා විධායක වගකීම් සහිත පුද්ගල(යෙක්) යන්, සමහර අධිකරණ බලප්‍රදේශ තුළ හෝ සමහර අස්තිත්ව සඳහා කළමනාකාරීත්වයට පාලනය පිළිබඳ වගකිව යුතු සියළු දෙනා හෝ කිහිප දෙනෙක් ඇතුළත්ය. උදාහරණ ලෙස පාලක මණ්ඩලයේ විධායක සාමාජිකයන් සහ හිමිකරු කළමනාකරු.

## අවශ්‍යතාවයන්

## පාලනය පිළිබඳ වගකිවයුතු අය

11. අස්තිත්ත්වයේ පාලන ව්‍යුහය ඇතුළත යෝග්‍ය කුමන පුද්ගල(යා) යන් සමග සන්නිවේදනය කළ යුතුදැයි විගණක නිර්ණය කළ යුතුය. (යොමුව; අ 1 -අ 4 ඡේද)

*පාලනය පිළිබඳ වගකිව යුතු උප කණ්ඩායමක් සමග සන්නිවේදනය*

12. පාලනය පිළිබඳ වගකිව යුතු උප කණ්ඩායමක් සමග විගණක සන්නිවේදනය කරන්නේ නම්, උදාහරණ ලෙස, විගණන කමිටුව, හෝ තනි පුද්ගලයෙක්, පාලක මණ්ඩලය සමගින් එලෙස සන්නිවේදනය කිරීම අවශ්‍ය වන්නේද යන්න විගණක නිර්ණය කළ යුතුය. (යොමුව අ5 - අ7 ඡේද)

*පාලනය පිළිබඳ වගකිවයුතු සියල්ල අස්තිත්ත්වය කළමනාකරණය සඳහා සම්බන්ධවන විට*

13. සමහර අවස්ථාවලදී උදාහරණ ලෙස කුඩා ව්‍යාපාරවල තනි හිමිකරු අස්තිත්ත්වය කළමනාකරණය කරන අවස්ථාවක වෙන කිසිවකුට පාලනය පිළිබඳව කාර්ය භාරයක් නොමැත. මෙම අවස්ථාවන්හිදී මෙම ශ්‍රී.ලං.වි.ප්‍ර. යෙන් අවශ්‍යකරන කරුණු කළමනාකරණ වගකීම් සහිත පුද්ගලයෙක්(යන්) සමග සහ පාලන වගකීම් එලෙසම ඇති එම පුද්ගලයන්(යෙක්) සමග සන්නිවේදනය කරන්නේ නම් එම කරුණු ඔවුන්ගේ පාලන කාර්ය භාරය ඇති එම පුද්ගල(යා)යන් සමග කරුණු නැවත සන්නිවේදනය කිරීම අවශ්‍ය නොවේ. මෙම කරුණු 16(ඇ) ඡේදයේ සටහන් කර ඇත. ඔවුන්ගේ පාලන හැකියාව තුළ වෙනත් ලෙසකින් විගණක සන්නිවේදනය කරන එම සියලු දෙනාටම කළමනාකාරිත්ව වගකීම් සහිත පුද්ගලයන් වෙත එම සන්නිවේදනය ප්‍රමාණවත් බව දැනුම් දී ඇති බව, එනමුත් විගණක විසින් සෑහීමකට පත්විය යුතුය. (යොමුවඃ අ8 ඡේදය)

## සන්නිවේදනය කළ යුතු කරුණු

*මූල්‍ය ප්‍රකාශ විගණනයට සම්බන්ධිතව විගණකගේ වගකීම්*

14. විගණක විසින් මූල්‍ය ප්‍රකාශ විගණනය සම්බන්ධිතව පහත සඳහන් දේ ඇතුළුව විගණකගේ වගකීම් පාලනය පිළිබඳ වගකිව යුතු අය සමග සන්නිවේදනය කළ යුතුය.

(අ) පාලනය පිළිබඳ වගකිව යුතු අයගේ අධීක්‍ෂණය සහිතව කළමනාකාරීත්වය විසින් පිළියෙල කළ මූල්‍ය ප්‍රකාශමත මතයක් සකස් කිරීමේ සහ ප්‍රකාශ කිරීම සඳහා විගණක වගකිව යුතුවේ.

(ආ) මූල්‍ය ප්‍රකාශ විගණනයකින් කළමනාකාරීත්වය හෝ පාලනය පිළිබඳව වගකිවයුතු අය ඔවුන්ගේ වගකීම් වලින් නිදහස් වන්නේ නැත; (යොමුවඃ අ9 - අ10 ඡේද)

*සැලසුම් කළ විෂය පථය සහ විගණනයේ කල් යෙදුම*

15. විගණක විසින්, විගණනයේ සැලසුම් කළ විෂය පථයේ සමස්ථ විග්‍රහයක් සහ කල්යෙදුම පාලනය පිළිබඳ වගකිව යුතු අයට සන්නිවේදනය කළ යුතුය. මෙයට විගණක විසින් හඳුනාගත් සැලකිය යුතු අන්දමේ අවදානම් පිළිබඳ සන්නිවේදනය කිරීමට ඇතුළත් ය.

*විගණනය මගින් සොයාගත් සැලකිය යුතු අන්දමේ දෑ*

16. විගණක විසින් පාලනය පිළිබඳ වගකිව යුතු අය සමග සන්නිවේදනය කළයුතු දෑ; (යොමුවඃ අ17 - අ18 ඡේද)

(අ) ගිණුම්කරණ ප්‍රතිපත්ති ගිණුම්කරණ ඇස්තමේන්තු සහ මූල්‍ය ප්‍රකාශවල හෙළිදරව් කිරීම් ඇතුළුව අස්තිත්ත්වයේ ගිණුම්කරණ පරිචයන්හි සැලකිය යුතු අන්දමේ ගුණාත්මක අංග පිළිබඳ විගණකගේ අදහස්. අදාළවන මූල්‍ය වාර්තාකරණ අකෘතිමය රාමුවක් යටතේ එය පිළිගත හැකි සැලකිය යුතු අන්දමේ ගිණුම්කරණ පරිචයක් අස්තිත්ත්වයේ විශේෂ තත්ත්වයකට වඩාත් යෝග්‍ය නොවන බව විගණක සලකන්නේ මන්ද යන්න අදාළවන පරිදි විගණක පාලනය පිළිබඳ වගකිව යුතු අයට සන්නිවේදනය කළ යුතුය (යොමුවඃ අ19 - අ20 ඡේද)

(ආ) විගණනය තුළදී මුහුණදුන් සැලකිය යුතු අන්දමේ අපහසුතාවයන් ඇතොත් (යොමුව අ21 ඡේදය)

(ඇ) පාලනය පිළිබඳ වගකිව යුතු සියලු අය අස්තිත්ත්වය කළමනාකරණයට සම්බන්ධ නොවන්නේ නම්;

(i) කළමනාකරණය සමඟ සාකච්ඡා කළ විගණනයේදී පැන නැගී සැලකිය යුතු අන්දමේ කරුණු හෝ ලිඛිත අදහස් හුවමාරුවකට යටත්ව; සහ (යොමුවඃ අ22 ඡේදය)

(ii) විගණක ඉල්ලා සිටින ලිඛිත නියෝජන;

(ඈ) විගණකගේ වාර්තාවේ ස්වරූපයට හෝ අන්තර්ගතයට බලපාන තත්ත්වයන් ඇතොත්; සහ (යොමුවඃ අ23 - අ25 ඡේද)

(ඉ) මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලියේ ප්‍රමාද දෝෂයකට විගණකගේ වෘත්තිය විනිශ්චය අදාළ, විගණනය තුළදී පැන නැගුන වෙනත් යම් සැලකිය යුතු අන්දමේ කරුණු (යොමුවඃ අ26- අ28 ඡේද)

### *විගණකගේ ස්වාධීනත්වය*

17. ලැයිස්තුගත අස්තිත්ත්ව සම්බන්ධයෙන්, විගණක පාලනය පිළිබඳ වගකිව යුතු අය සමඟ සන්නිවේදනය කළ යුතුය;

(අ) කාර්ය භාරයේ යෙදී ඇති කණ්ඩායම සහ යෝග්‍යවන පරිදි සමාගමේ සිටින වෙනත් අය සමාගම සහ උචිත වන පරිදි ජාල සමාගම් ස්වාධීනත්වය සම්බන්ධයෙන් අදාළ ආචාර ධර්මීය අවශ්‍යතා සමඟ අනුකූල වී ඇති බව දක්වෙන ප්‍රකාශයක්; සහ

(i) සමාගම, ජාල සමාගම් සහ අස්තිත්ත්වය අතර සියලු සම්බන්ධතා සහ වෙනත් කරුණු විගණකගේ වෘත්තිය විනිශ්චය අනුව, සාධාරණ ලෙස ස්වාධීනත්වය මත අදාළ වීමට කල්පනා කර ඇති බව. මෙයට ඇතුළත් විය යුත්තේ, අස්තිත්ත්වය සහ අස්තිත්ත්වය විසින් පාලනය කරන ලබන සංරචකවලට මූල්‍ය ප්‍රකාශ මගින් ආවරණය වන කාලපරිච්ඡේදය තුළදී විගණනය සහ විගණන නොවන ලබාදුන් සේවා සඳහා, සමාගම සහ ජාල සමාගම් විසින් අයකළ මුළු ගාස්තුව, විගණකගේ ස්වාධීනත්වය මත සේවාවන්හි බලපෑම තක්සේරු කිරීමේදී පාලනය පිළිබඳ වගකිව යුතු අයට පහසුවීමට යෝග්‍යවන ප්‍රවර්ග වලට එම ගාස්තු බෙදා වෙන්කළ යුතුය; සහ

(ii) ස්වාධීනත්වයට බලපාන හඳුනාගත් තර්ජන ඉවත් කිරීමට හෝ ඒවා උචිත මට්ටමකට අඩු කිරීමට ව්‍යවහාර කරන ලද සම්බන්ධිත ආරක්ෂාව සලස්වන්නන් (යොමුවඃ අ29 - අ32 ඡේද)

## සන්නිවේදන ක්‍රියාවලිය

### *සන්නිවේදන ක්‍රියාවලිය ස්ථාපනය කිරීම*

18. විගණක පාලනය පිළිබඳ වගකිව යුතු අය සමඟ සන්නිවේදනයේ ස්වරූපය, කල්යෙදුම සහ සන්නිවේදනයේ අපේක්ෂිත පොදු අන්තර්ගතය සන්නිවේදනය කළ යුතුය. (යොමුවඃ අ37 - අ45 ඡේද)

### *සන්නිවේදනයේ ස්වරූප*

19. විගණකගේ වෘත්තිය විනිශ්චය අනුව විගණනයේදී සොයාගත් වැදගත් දෑ සම්බන්ධයෙන් වාචික සන්නිවේදනය ප්‍රමාණවත් නොවිය හැකි නම් විගණක එම දෑ පාලනය පිළිබඳ වගකිවයුතු අය සමඟ ලිඛිතව සන්නිවේදනය කළ යුතුය. ලිඛිත සන්නිවේදනයට විගණන ක්‍රියාමාර්ග තුළදී පැන නැගුනු සියලු කරුණු ඇතුළත් කිරීම අවශ්‍ය නොවේ. (යොමුඃ අ46 - අ48 ඡේද)

20. 17 වන ඡේදය මගින් අවශ්‍ය කරන විට විගණකගේ ස්වාධීනත්වය සම්බන්ධව විගණක පාලනය පිළිබඳ වගකිව යුතු අය සමඟ ලිඛිතව සන්නිවේදනය කළ යුතුය;

*සන්නිවේදනයේ කල්යෙදුම*

21. විගණක පාලනය පිළිබඳ වගකිව යුතු අය සමඟ කාලානුරූප පදනමක් මත සන්නිවේදනය කළ යුතුය. (යොමුව: අ 49- අ 50 ඡේද)

*සන්නිවේදන ක්‍රියාවලියේ ප්‍රමාණවත් භාවය*

22. විගණක සහ පාලනය පිළිබඳ වගකිව යුතු අය අතර ද්වි-මාර්ග සන්නිවේදනය විගණන අරමුණ සඳහා ප්‍රමාණවත් දැයි විගණක ඇගයිය යුතුය. එය ප්‍රමාණවත් නොවන්නේ නම්, විගණක බලපෑම අගය කළ යුතුය. ප්‍රමාණාත්මක අවප්‍රකාශයක අවදානම් ඇතොත් ඒවායේ විගණකගේ ඇස්තමේන්තුව මත සහ ප්‍රමාණවත් යොග්‍ය විගණන සාක්ෂි ලබා ගැනීමේ හැකියාව මත සුදුසු පියවර ගත යුතුය. (යොමුව: අ51 - අ53 ඡේද)

## ලේඛනගත කිරීම

23. මෙම ශ්‍රී.ලං.වි.ප්‍ර යෙන් සන්නිවේදනය කළ යුතු යයි අවශ්‍ය කරන අවස්ථාවලදී, වාචිකව සන්නිවේදනය කරන විට, ඒවා කුමන විට, කාහට සන්නිවේදනය කළේ දැයි යන ඒවා පිළිබඳ විස්තර විගණන ලේඛනගත කිරීම්වල විගණක ඇතුළත් කළ යුතුය. ලිඛිතව කරුණු සන්නිවේදනය කිරීමේදී සන්නිවේදනයේ පිටපතක් විගණන ලේඛනගත කිරීම් වල කොටසක් ලෙස විගණක රඳවාගත යුතුය.[2] (යොමුව: අ54 ඡේදය)

***

## භාවිත කිරීම සහ වෙනත් පැහැදිලි කිරීමේ කරුණු

**පාලනය පිළිබඳ වගකිව යුතු අය සමඟ** (යොමුව: 11 වන ඡේදය)

අ1. වෙනස් සංස්කෘතික සහ නෛතික පසුබිම් සහ විශාලත්වය සහ හිමිකමේ ගතිලක්ෂණ වැනි දේවල බලපෑම් පිළිබිඹු කරමින් පාලන ව්‍යුහ අධිකරණ බල ප්‍රදේශය අනුව සහ අස්තිත්ත්වය අනුව වෙනස්වේ. උදාහරණ ලෙස;

- සමහර අධිකරණ බල ප්‍රදේශ තුළ අධීක්‍ෂක (සම්පූර්ණයෙන් හෝ ප්‍රධාන වශයෙන් විධායක නොවන) අධ්‍යක්‍ෂක මණ්ඩලයක් පවතී එය නෛතිකව විධායක (කළමනාකාරීත්වය) අධ්‍යක්‍ෂ මණ්ඩලයකින් (දෙවන "ශ්‍රේණියේ අධ්‍යක්‍ෂ මණ්ඩල ව්‍යුහය") වෙනස් වේ. වෙනත් අධිකරණ බල ප්‍රදේශ තුළ අධීක්‍ෂක සහ විධායක යන දෙකේම කාර්යයන්හි නෛතික වගකීම වනුයේ තනි හෝ ඒකීය අධ්‍යක්‍ෂක මණ්ඩලයකිනි. ("තනි - පන්තියේ" අධ්‍යක්‍ෂක මණ්ඩල ව්‍යුහය).

- සමහර අස්තිත්ත්ව තුළ පාලනය පිළිබඳ වගකිව යුතු අය අස්තිත්ත්වයේ නෛතික ව්‍යුහයේ අවශ්‍ය අංගයක තනතුරු දරයි. උදාහරණ ලෙස සමාගමේ අධ්‍යක්‍ෂකවරුන් උදාහරණ ලෙස අනෙක් තැන්හි, සමහර රජයේ අස්තිත්ත්වයන්හි අස්තිත්ත්වයේ කොටසක් නොවන කණ්ඩායමක් පාලනය පිළිබඳ වගකීම දරයි.

- සමහර අවස්ථාවලදී පාලනය පිළිබඳ වගකිවයුතු අයගෙන් කොටසක් හෝ සියල්ලම අස්තිත්ත්වය කළමනාකරණය කිරීමේදී සම්බන්ධ වේ. අන් අවස්ථාවන්හිදී පාලනය පිළිබඳව සහ කළමනාකාරීත්වය පිළිබඳ වගකිව යුතු අය වෙනස් පුද්ගලයන්ගෙන් සමන්විත වේ.

- සමහර අවස්ථාවලදී පාලනය පිළිබඳ වගකිවයුතු අය අස්තිත්ත්වයේ මූල්‍ය ප්‍රකාශ අනුමත කිරීම[3] සඳහා වගකිව යුතු වේ. (අන් අවස්ථාවලදී මෙම වගකීම කළමනාකාරිත්වයට ඇත).

අ2. බොහෝ අස්තිත්ත්ව තුළ, පාලනය, අධ්‍යක්‍ෂ මණ්ඩලයකින්, අධීක්ෂක මණ්ඩලයකින් හවුල්කරුවන්, අයිතිකරුවන්, කළමනාකාරීත්ව කමිටුවක්, පාලක මණ්ඩලයක් භාරකරුවන් හෝ ඒ හා සමාන පුද්ගලයන් වැනි පාලක මණ්ඩලයක සාමූහිකව වගකීම වේ. සමහර කුඩා අස්තිත්ත්ව තුළ, කෙසේ වෙතත් තනි පුද්ගලයෙක් පාලනය පිළිබඳ වගකිව යුතුවිය හැකිය, උදාහරණ ලෙස හිමිකරු - කළමනාකරු වෙනත් හිමිකරුවන් නොමැති අවස්ථාවක් හෝ තනි භාරකරු පාලනය සාමූහික වගකීමක් වන විට, විගණන කමිටුව, හෝ තනි පුද්ගලයෙක් වැනි උප කණ්ඩායමකට පාලක මණ්ඩලයකට සිය වගකීම් ඉෂ්ඨ කර ගැනීමේ ලා උපකාරී වීමට නිශ්චිත කාර්යන්

---

[2] ශ්‍රී.ලං.වි.ප්‍ර 230 *විගණන ලේඛන ගත කිරීම,* 8 - 11 සහ අ6 ඡේද.

[3] ශ්‍රී.ලං.වි.ප්‍ර 700 (සංශෝධිත) හි අ68 ඡේදය තුළ විස්තර කර ඇති පරිදි අනුමත කිරීම සඳහා වගකීම සතු අය *මූල්‍ය ප්‍රකාශ මත මතයක් සකස් කිරීම හා වාර්තාකරණය* මේ සම්බන්ධයෙන් අනුමත කිරීම සඳහා වගකීම සතු යන්නෙන් අදහස් කරන්නේ මූල්‍ය ප්‍රකාශ සමන්විත වන සම්බන්ධිත සටහන් ඇතුළුව සියලු ප්‍රකාශ පිළියෙල කර ඇත්තේ අධිකාරිය සතු අය බව නිගමනය කිරීමටය.

සහිතව වගකීම පැවරිය හැකිය. විකල්පයක් ලෙස උප කණ්ඩායමට හෝ තනි පුද්ගලයෙකුට පාලක මණ්ඩලයේ සිටින අයගෙන් වෙනස් විශේෂිත, නෛතික හඳුනාගත හැකි වගකීම් තිබිය හැකිය.

අ3. එවැනි විවිධත්වයකින් අදහස් කරන්නේ, මෙම ශ්‍රී.ලං.වි. ප්‍ර යට සියලු විගණන සඳහා විශේෂ කරුණු විගණක කුමන පුද්ගල(යා)යන් සමඟ සන්නිවේදනය කළ යුතුද යන්න නිශ්චය කළ නොහැකි බවය. එසේම සමහර අවස්ථාවන්හිදී කුමන යෝග්‍ය පුද්ගල(යා) යන් සමග සන්නිවේදනය කළ යුතුද යන්න අදාළ නෛතික ආකෘතිමය රාමුව මගින් හෝ වෙනත් කාර්ය භාරයේ තත්ත්වයන් තුළ පැහැදිලිව හඳුනාගත නොහැක. උදාහරණ ලෙස පාලන ව්‍යුහය විධිමත් ලෙස නිර්වචනය නොකළ අස්තිත්ත්ව ඇති අවස්ථාවක, සමහර පවුල් - හිමිකාරීත්වය ඇති අස්තිත්ත්ව, සමහර ලාභ සඳහා නොවන සංවිධාන සහ සමහර රාජ්‍ය අස්තිත්ත්ව ඇති අවස්ථාවලදී, විගණන කාර්ය භාරයේ යෙදී ඇති පාර්ශවය සමඟ සාකච්ඡා කර කුමන අදාළ පුද්ගල(යෙක්) යන් සමඟ සන්නිවේදනය කළ යුතු දැයි එකඟ වීම අවශ්‍ය විය හැකිය. කා සමඟ සන්නිවේදනය කළ යුතු ද යන්න තීරණය කිරීමේ දී අස්තිත්ත්වයේ පාලන ව්‍යුහය, පිළිබඳ විගණකගේ අවබෝධය සහ ශ්‍රී.ලං.වි. ප්‍ර 315 (සංශෝධිත)[4] ප්‍රකාරව ලබාගත් ක්‍රියා මාර්ග අදාළ වේ. කුමන යෝග්‍ය පුද්ගල(යා)යන් හට සන්නිවේදනය කළ යුතුද යන්න සන්නිවේදනය කළ යුතු කරුණ මත වෙනස් වේ.

අ4. ශ්‍රී.ලං.වි.ප්‍ර. හි 600 හි පාලනය පිළිබඳ වගකිව යුතු අය සමඟ, සමූහ විගණකවරුන් විසින් සන්නිවේදනය කළ යුතු විශේෂ කරුණු මෙහි ඇතුළත් වේ.[5] අස්තිත්ත්වය සමූහයේ සංරචකයන්වන විට, සංරචක විගණක සන්නිවේදනය කළ යුතු යෝග්‍ය පුද්ගල(යා) යන් රඳා පවත්නේ කාර්ය භාර තත්ත්ව සහ සන්නිවේදනය කළ යුතු කරුණු මතය. සමහර අවස්ථාවන් තුළදී එකම ව්‍යාපාරය එකම අභ්‍යන්තර පාලන පද්ධතියක් තුළ සහ එකම ගිණුම්කරණ පරිචයක් භාවිත කරමින් සංරචක ගණනාවක් මෙහෙය විය හැකිය. එම සංරචකවල පාලනය පිළිබඳව වගකිව යුතු අය එකම පුද්ගලයන් (උදා: පොදු අධ්‍යක්ෂක මණ්ඩලයක්) වන අවස්ථාවක සන්නිවේදනය කිරීමේ අරමුණ සඳහා මෙම සංරචක සමඟ සමගාමීව කටයුතු කිරීම මගින් දෙවරක් සන්නිවේදනය කිරීම වළක්වා ගත හැකිය.

*පාලනය පිළිබඳ වගකිව යුතු උප කණ්ඩායමක් සමඟ සන්නිවේදනය (යොමුව: 12 වන ඡේදය)*

අ5. පාලනය පිළිබඳ වගකිව යුතු උප කණ්ඩායමක් සමඟ සන්නිවේදනය කිරීම සළකා බලනවිට විගණක පහත සඳහන් වැනි කරුණු සැළකිල්ලට ගත හැකිය.

- උප කණ්ඩායමේ සහ පාලක මණ්ඩලයේ අදාළ වගකීම්
- සන්නිවේදනය කළ යුතු කරුණේ ස්වභාවය.
- අදාළ නෛතික සහ නියාමන අවශ්‍යතාවයන්.
- සන්නිවේදනය කළ තොරතුරු සම්බන්ධයෙන් උප කණ්ඩායමට ක්‍රියා මාර්ග ගැනීමට අධිකාරිය තිබේද, විගණකට අවශ්‍ය විය හැකි අමතර තොරතුරු හා පැහැදිලි කිරීම් ලබා දිය හැකිද?.

අ6. පාලක මණ්ඩලය සමඟ තොරතුරු සම්පූර්ණ වශයෙන් හෝ සාරාංශගත ආකාරයෙන් සන්නිවේදනය කිරීමට අවශ්‍යතාවයක් එලෙසම තිබේදැයි තීරණය කිරීමේදී, අදාළ තොරතුරු පාලක මණ්ඩලය සමඟ උප කණ්ඩායම කොපමණ සඵලදායී සහ යෝග්‍ය ලෙස සන්නිවේදනය කරන්නේද යන්න පිළිබඳව විගණකගේ තක්සේරුවක් මගින් විගණකට බලපෑමක් විය හැකිය; නීතියෙන් හෝ රෙගුලාසි මගින් තහනම් කර නැත්නම් මිස, පාලක මණ්ඩලය සමඟ ඍජුව සන්නිවේදනය කිරීමේ අයිතිය කාර්යභාරයේ නියමයන් සමඟ ඍජුව සන්නිවේදනය කිරීමේ අයිතිය කාර්යභාරයේ නියමයන් සමඟ එකඟ වීමේදී එම අයිතිය ඉතා පැහැදිලිව විගණක රඳවා ගනී.

අ7. විගණන කමිටු (හෝ වෙනස් නම් සහිතව ඒ හා සමාන උප කණ්ඩයම්) බොහෝ අධිකරණ බලප්‍රදේශ තුළ පවතී. ඒවායේ නිශ්චිත අධිකාරිය සහ කාර්යයන් වෙනස් විය හැකි නමුත්, එවැනි කමිටුවක් පවතින විට, විගණන කමිටුව සමඟ සන්නිවේදනය පාලනය පිළිබඳ වගකිව යුතු අය සමඟ විගණකගේ සන්නිවේදනයේදී ප්‍රධාන මූලිකාංගයක් බවට පත්ව ඇත.

---

[4] ශ්‍රී.ලං.වි.ප්‍ර 315 (සංශෝධිත) *අස්තිත්ත්වය සහ එහි පරිසරය අවබෝධ කර ගැනීම මගින් ප්‍රමාණාත්මක අවප්‍රකාශවල අවදානම හඳුනා ගැනීම සහ තක්සේරු කිරීම.*

[5] ශ්‍රී.ලං.වි.ප්‍ර. 600 *විශේෂ සළකා බැලීම් - සමූහ මූල්‍ය ප්‍රකාශ විගණනය (සංරචක විගණකවරුන්ගේ වැඩ ඇතුළත්ව* (49 වන ඡේදය)

යහපත් පාලන මුල ධර්ම පහත දැ යෝජනා කරයි.

- විගණන කමිටු රැස්වීම් වලට නිතිපතා පැමිණීමට විගණකට ආරාධනා කරනු ලැබීම.
- විගණන කමිටුවේ සභාපති සහ අදාලවන විට විගණන කමිටුවේ වෙනත් සාමාජිකයන් විගණක සමග කාලීනව සම්බන්ධීකරණයක් පවත්වාගෙන යාම.
- අඩු තරමින් වාර්ෂිකව විගණන කමිටුව කළමනාකාරීත්වයේ සහභාගීත්වය නොමැතිව විගණක හමුවීමට කටයුතු කිරීම.

*පාලනය පිළිබඳ වගකිව යුතු සියලු දෙනාම අස්තිත්ත්වය කළමනාකරණයට සහභාගීවීම. (යොමුව : 13 වන ඡේදය)*

අ8. සමහර අවස්ථාවලදී පාලනය පිළිබඳ වගකිව යුතු සැමදෙනාම අස්තිත්ත්වය කළමනාකරණයට සහභාගී වේ, හා මෙම තත්ත්වය හඳුනාගැනීමට සන්නිවේදන ව්‍යවහාරකරණයේ වෙනසක් සිදු කෙරේ. එවැනි අවස්ථාවලදී ඔවුන්ගේ පාලන තත්ත්වය මත අන් අයුරකින් විගණක ඔවුන්ගේ පාලන හැකියාව තුළ සියලුම කුමන අන්දමේ අය සමග සන්නිවේදනය කළ යුතු ද යන්න කළමනාකරණ වගකීම් ඇති පුද්ගලයන් හට දැන්වීම ප්‍රමාණවත් නොවිය හැක. උදාහරණ ලෙස; සමාගමක් තුළ සියලු අධ්‍යක්ෂවරුන් අස්තිත්ත්වය කළමනාකරනයට සහභාගීවන අවස්ථාවක, එම අධ්‍යක්ෂවරුන්ගෙන් කිහිපදෙනෙක් (උදා: අලෙවිකරණය සඳහා වගකිව යුතු අයෙක්) වෙනත් අධ්‍යක්ෂවරයෙක් සමග සාකච්ඡා කරන වැදගත් කරුණු පිළිබඳව නොදැනුවත් විය හැකිය. (උදා: මූල්‍ය ප්‍රකාශ පිළියෙල කිරීම සඳහා වගකිව යුතු අයෙක්).

## සන්නිවේදනය කළ යුතු කරුණු

*මූල්‍ය ප්‍රකාශවලට සම්බන්ධිතව විගණකගේ වගකීම්* (යොමුව: 14 වන ඡේදය)

අ9. මූල්‍ය ප්‍රකාශ විගණනයට සම්බන්ධිත විගණකගේ වගකීම් බොහෝ විට කාර්යය භාර ගැනීමේ ලිපියේ හෝ කාර්ය භාරයේ එකග වූ නියමයන් වාර්තා කළ වෙනත් සුදුසු ආකාරයේ ලිඛිත ගිවිසුමක ඇතුළත් කෙරේ.[6] නීතියෙන් හෝ රෙගුලාසි හෝ අස්තිත්ත්වයේ පාලන ව්‍යුහය මගින් පාලනය පිළිබඳ වගකිව යුතු අයට කාර්ය භාරයේ නියමයන් විගණක සමග එකගවීම අවශ්‍ය විය හැකිය. මෙය සිද්ධිය නොවන විට පහත සඳහන් වැනි කරුණු සම්බන්ධයෙන් ඔවුන් සමග සන්නිවේදනය කිරීමට යෝග්‍ය ක්‍රමයක් විය හැක්කේ එම කාර්යයේ යෙදීමේ ලිපියේ පිටපතක් සමග හෝ වෙනත් සුදුසු ආකාරයේ ලිඛිත ගිවිසුමක් පාලනය පිළිබඳ කටයුතු කරන අයට ලබාදීමය.

- ශ්‍රී.ලං.වි.ප්‍ර. වලට අනුකූලව විගණනය ඉටු කිරීමේ විගණකගේ වගකීම, සඳහා මෙහෙයවන්නේ මූල්‍ය ප්‍රකාශ මත මතයක් ප්‍රකාශ කිරීම් දිසාවටය. ඒ අනුව ශ්‍රී.ලං.වි.ප්‍ර. වලින් සන්නිවේදනය කිරීමට අවශ්‍යකරන කරුණු වලට, ඇතුළත් වන්නේ මූල්‍ය ප්‍රකාශ පිළියෙල කිරීමේ ක්‍රියාවලිය තුළදී පාලනය පිළිබඳ වගකිව යුතු අය අධීක්ෂණය කිරීමේ අදාළ මූල්‍ය ප්‍රකාශ විගණනය තුළදී පැන නැගුන සැළකිය යුතු අන්දමේ කරුණුය.
- මෙහිදී යථාව නම් ශ්‍රී.ලං.වි.ප්‍ර. යන් අතිරේක කරුණු හඳුනා ගැනීමේ අරමුණ සඳහා පාලනය පිළිබඳ වගකිව යුතු අය සමග සන්නිවේදනය කිරීමට විගණන ක්‍රියාපටිපාටි සැළසුම් කිරීම අවශ්‍ය නොවේ.
- ශ්‍රී.ලං.වි.ප්‍ර. 701[7] ව්‍යවහාර කරන විට, විගණකගේ වාර්තාවේ ප්‍රධාන විගණන කරුණු නිර්ණය කිරීමට සහ සන්නිවේදනය කිරීමට විගණකගේ වගකීම්,
- අදාළ වන විට, නීතියෙන් හෝ රෙගුලාසි මගින් අවශ්‍යකරණ විශේෂ කරුණු සන්නිවේදනය කිරීම සඳහා විගණකගේ වගකීම, අස්තිත්ත්වය සමග ගිවිසුමක් මගින් හෝ කාර්ය භාරයට අදාළ අතිරේක අවශ්‍යතාවය මගින්, උදාහරණ ලෙස, ජාතික වෘත්තිය ගණකාධිකාරී ආයතනයක ප්‍රමිති,

අ10. නීතිය හෝ රෙගුලාසි, අස්තිත්ත්වය සමග ගිවිසුමක් හෝ කාර්ය භාරයට අදාළ අතිරේක අවශ්‍යතා පාලනය පිළිබඳ වගකිව යුතු අය සමග පුළුල් සන්නිවේදනයක් ලබාදිය හැකිය. උදහරණ ලෙස (අ) මූල්‍ය ප්‍රකාශ විගණනය කරන සමාගමක් හැර වෙනත් සමාගමක් ජාල සමාගමක් විසින් ලබා දුන් සේවාවකින් ඒවා පැන නැගුන විට සන්නිවේදනය කළ යුතු විශේෂ කරුණු සඳහා අස්තිත්ත්වය සමග වූ ගිවිසුම් ප්‍රතිපාදන කළ හැකිය.

---

6 ශ්‍රී.ලං.වි.ප්‍ර. 210 *විගණන කාර්ය භාරයේ නියමයන් සමග එකගවීම* - 10 වන ඡේදය බලන්න.

7 ශ්‍රී.ලං.වි.ප්‍ර. 701, *ස්වාධීන විගණක වාර්තාවේ ප්‍රධාන විගණන කරුණු සන්නිවේදනය.*

(ආ) රාජ්‍ය අංශයේ විගණකගේ නිල නියෝගයෙන්, කාර්ය සාධන විගණන වැනි වෙනත් වැඩවල ප්‍රතිඵලයක් ලෙස විගණකගේ අවධානයට පැමිණි සන්නිවේදනය කළ යුතු කරුණ සඳහා ප්‍රතිපාදනය කළ හැක.

*විගණනයේ සැළසුම්කළ විෂය පථය සහ කල් යෙදුම (යොමුව: 15 වන ඡේදය)*

අ11. විගණනයක සැළසුම් කළ විෂය පථය සහ කල් යෙදුම සම්බන්ධයෙන් සන්නිවේදනය විය හැක්කේ;

විගණක සමඟ අවදානමේ ප්‍රශ්න සහ ප්‍රමාණාත්මක භාවයේ සංකල්ප සාකච්ඡා කිරීමට, විගණකගේ වැඩවල ප්‍රතිඵල හොඳින් අවබෝධකර ගැනීමට සහ විගණකට අතිරේක ක්‍රියාපටිපාටි භාර ගැනීම ඔවුන් ඉල්ලා සිටීමට යම් ක්ෂේත්‍ර හඳුනා ගැනීම පාලනය පිළිබඳ වගකිව යුතු අයට උපකාරීවීම සහ අස්තිත්ත්වය සහ එහි පරිසරය විගණකට හොඳින් අවබෝධ කර ගැනීමට උපකාරී වීම

අ12. විගණක විසින් හඳුනාගත් සැළකිය යුතු අන්දමේ අවදානම් සන්නිවේදනය කිරීමෙන් විශේෂ විගණන සැළකිලිමත් වීමත් ඔවුන්ට අවශ්‍ය මන්ද සහ එම කරුණු පාලනය පිළිබඳ වගකිව යුතු අයට අවබෝධ කර ගැනීමට උපකාරීවේ. සැළකිය යුතු අන්දමේ අවදානම් පිළිබඳ සන්නිවේදනය පාලනය පිළිබඳ වගකිව යුතු අයට මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය අධීක්ෂණය කිරීමට ඔවුන්ගේ වගකීම ඉටු කර ගැනීමේහි ලා උපකාරී විය හැකිය.

අ13. සන්නිවේදනය කළ යුතු කරුණුවලට ඇතුළත්විය හැක්කේ;

- වංචා හෝ වැරදි නිසා වුවත් ප්‍රමාණාත්මක අවප්‍රකාශයක සැලකිය යුතු අන්දමේ අවදානම් ආමන්ත්‍රණය කිරීමට විගණක සැළසුම් කරන්නේ කෙසේ ද?
- ප්‍රමාණාත්මක අවප්‍රකාශයක තක්සේරු කළ ඉහළ අවදානම් වන ක්ෂේත්‍ර ආමන්ත්‍රණය කිරීමට විගණක සැළසුම් කරන්නේ කෙසේ ද?
- විගණනයට අදාළ අභ්‍යන්තර පාලන වෙත විගණකගේ සමීපවීම.
- විගණනයක් සම්බන්ධයෙන් ප්‍රමාණාත්මකභාවයේ සංකල්පය ව්‍යවහාර කිරීම.[8]
- විගණකගේ විශේෂඥයා[9] භාවිත කිරීම ඇතුළුව සැලසුම්කළ විගණන පටිපාටි ඉටු කිරීමට හෝ විගණන ප්‍රතිඵල ඇගයීමට අවශ්‍යකරන විශේෂඥ කුසලතා හෝ දැනුමේ ස්වභාවය හෝ ප්‍රමාණය.
- ශ්‍රී.ලං.වි.ප්‍ර. 701 ව්‍යවහාර කරන විට, විගණනයේදී විගණකගේ සැළකිය යුතු අන්දමේ අවධානය යොමුවිය යුතු ක්ෂේත්‍රවල කරුණු පිළිබඳ මූලික අදහස්, සහ එම නිසා ඒවා ප්‍රධාන විගණන කරුණු විය හැකිය.
- තනි ප්‍රකාශ මත බලපෑම හෝ අදාළ මූල්‍ය වාර්තාකරණ ආකෘතිමය රාමුව ඇතුළත යම් සැළකිය යුතු වෙනස්කම් හෙළිදරව් කිරීම හෝ අස්තිත්ත්වයේ පරිසරය, මූල්‍ය තත්ත්වය හෝ ක්‍රියාකාරකම්.

අ14. පාලනය පිළිබඳ වගකිව යුතු අය සමඟ සාකච්ඡා කිරීම යෝග්‍ය විය හැකි සැළසුම් කිරීමේ වෙනත් කරුණුවලට ඇතුළත් වනුයේ;

- අස්තිත්ත්වයට අභ්‍යන්තර විගණන කාර්යයන් ඇති අවස්ථාවක, අභ්‍යන්තර විගණන කාර්යයන් හි යම් සැළසුම් කළ වැඩ ප්‍රයෝජන ගැනීමට, අභ්‍යන්තර විගණකවරුන්ට ඍජු සහායක් ලබාදීමට වූ යම් සැළසුම් කළ භාවිතයේ ස්වභාවය සහ ප්‍රමාණය ඇතුලුව නිර්මාණාත්මක සහ අනුපූරක ආකාරයකට බාහිර සහ අභ්‍යන්තර විගණකවරුන් එක්ව වැඩකරන්නේ කෙසේ ද?[10]
- පහත දෑ පිළිබඳ පාලනය පිළිබඳ වගකිවයුතු අයගේ අදහස්;
    - o අස්තිත්ත්වයේ පාලන ව්‍යුහය තුළ සන්නිවේදනය කළ යුත්තේ කුමන පුද්ගල(යා)යන් සමඟද,
    - o පාලනය පිළිබඳ වගකිවයුතු අය සහ කළමනාකාරිත්වය අතර වගකීම් බෙදා වෙන් කිරීම.

---

8 ශ්‍රී.ලං.වි.ප්‍ර. 320 - *විගණනයක් සැළසුම් කිරීමේදී හා ඉටු කිරීමේදී ප්‍රමාණාත්මකභාවය.*

9 ශ්‍රී.ලං.වි.ප්‍ර. 620. බලන්න, *විගණකගේ විශේෂඥගේ වැඩ ප්‍රයෝජනයට ගැනීම.*

10 ශ්‍රී.ලං.වි.ප්‍ර. 610 (2013 සංශෝධිත) *අභ්‍යන්තර විගණකවරුන්ගේ වැඩ ප්‍රයෝජනයට ගැනීම 20 සහ 31 ඡේද.*

- o අස්තිත්ත්වයේ අරමුණු සහ ක්‍රමෝපායන් සහ ප්‍රමාණාත්මක අවප්‍රකාශ ඇති විය හැකි සම්බන්ධිත ව්‍යාපාරික අවදානම්.
- o විගණනය තුළදී විශේෂ අවධානය යොමු විය යුතු යයි පාලනය පිළිබඳ වගකිව යුතු අය සාධාරණීයකරණය කළ හැකි ලෙස සළකන කරුණු සහ අතිරේක ක්‍රියාපටිපාටි භාර ගන්නා ලෙස ඔවුන් ඉල්ලීමක් කරන යම් ක්ෂේත්‍ර.
- o අස්තිත්ත්වය සහ නියාමකයන් අතර සැළකිය යුතු අන්දමේ සන්නිවේදන.
- o පාලනය පිළිබඳ වගකිව යුතු අය සළකන මූල්‍ය ප්‍රකාශ විගණනයට බලපා හැකි වෙනත් කරුණු.

- පාලනය පිළිබඳ වගකිව යුතු අය අභ්‍යන්තර පාලනයේ සඵලදායකත්වය අධීක්ෂණය කරන්නේ කෙසේ ද යන්න ඇතුලුව, අස්තිත්ත්වයේ අභ්‍යන්තර පාලන සහ අස්තිත්ත්වය තුළ එහි වැදගත්කම සහ (ආ) වංචා සිදුවිය හැකි බව හා ඒවා ආවරණය කිරීම වැනි දෑ පිළිබඳ සැලකිලිමත් පාලනය පිළිබඳ වගකිව යුතු අයගේ ආකල්ප, දැනුවත් බව සහ ක්‍රියාමාර්ග

- ගිණුම්කරණ ප්‍රමිතිවල අලුතෙන් මතුවන තත්ත්වයන් සංයුක්ත පාලන පරිචයන් හුවමාරු ලැයිස්තු ගත කිරීමේ රීති සහ සම්බන්ධිත කරුණු සහ එවැනි අලුතෙන් මතුවන තත්ත්ව මත බලපෑම් වලට ප්‍රතිචාර ලෙස පාලනය පිළිබඳ කටයුතු කරන අයගේ ක්‍රියාමාර්ග. උදාහරණ ලෙස පහත දේ ඇතුළුව මූල්‍ය ප්‍රකාශයන්හි ඉදිරිපත් කළ සමස්ත ඉදිරිපත් කිරීම, ව්‍යුහය සහ අන්තර්ගතය;
  - o මූල්‍ය ප්‍රකාශ තුළ ඉදිරිපත් කළ තොරතුරුවල අදාළත්වය, විශ්වාසදායකත්වය, සැසඳිය හැකි බව සහ අවබෝධ කර ගත හැකිබව; සහ
  - o අදාළ නොවන හෝ හෙළිදරව් කළ කරුණු නිසි ලෙස අවබෝධ කර ගැනීම නොවටහා ගැනීම සිදුවන තොරතුරු ඇතුළත් කිරීම මගින් මූල්‍ය ප්‍රකාශ පිළිගැනීමට රහසින් හානි කරයිද යන්න සැළකිල්ලට ගැනීම.

- විගණක සමග කලින් වූ සන්නිවේදන සඳහා පාලනය පිළිබඳ වගකිවයුතු අයගේ ප්‍රතිචාර.

- වෙනත් තොරතුරු (ශ්‍රී.ලං.වි.ප්‍ර. 720 හි (සංශෝධිත) නිර්වචනය කර ඇති) වලින් සමන්විත ලිපි ලේඛණ සහ එවැනි ලිපි ලේඛන නිකුත් කිරීමේ කල් යෙදුම සහ සැළසුම්කළ ආකාරය, විගණකගේ වාර්තා වේ. දිනයට පසුව වෙනත් තොරතුරු ලබා ගැනීමට විගණක අපේක්ෂා කරන විට විගණකගේ වාර්තාවේ දිනට පසු ලබා ගත් වෙනත් තොරතුරුවල ප්‍රමාණවත් අවප්‍රකාශයක් පවතී යයි විගණක නිගමනය කරයි නම්, පාලනය පිළිබඳ වගකිව යුතු අය සමග කළ සාකච්ඡා කිරීමට යෝග්‍ය හෝ අවශ්‍ය විය හැකි එම ක්‍රියා මාර්ගද ඇතුළත් විය හැකිය.

අ15. පාලනය පිළිබඳ වගකිව යුතු අය සමග සන්නිවේදනය කිරීම විගණකට විගණනයේ කාර්ය භාරය සහ කල්යෙදුම සැලසුම් කිරීමට උපකාරී විය හැකි අතරේම ප්‍රමාණවත් යෝග්‍ය විගණන සාක්ෂි ලබා ගැනීමට අවශ්‍ය ක්‍රියාටිපාටිවල ස්වභාවය, කල් යෙදුම් සහ ප්‍රමාණය ඇතුළුව, සමස්ථ විගණන ක්‍රමෝපාය හා විගණන සැලැස්ම ස්ථාපනය කිරීමේ විගණකගේ තනි කර වගකීම එය වෙනස් කරන්නේ නැත.

අ16. විශේෂයෙන්ම, පාලනය පිළිබඳ වගකිව යුතු සියලු දෙනාම හෝ කොටසක් අස්තිත්ත්වය කළමනාකරණයට සහභාගී වන අවස්ථාවලදී විගණනයේ සැලසුම් කළ විෂය පථය සහ කල් යෙදුම පිළිබඳ විගණනයේ සඵලදායකත්වය පිළිබඳ ඒකග්‍රතාවයකට නො එළඹීමට, පාලනය පිළිබඳ වගකිව යුතු අය සමග සන්නිවේදනය කිරීමේ දැඩි අවධානයක් යොමු කිරීම අවශ්‍ය වේ. උදාහරණ ලෙස, විස්තරාත්මක විගණන ක්‍රියාපටිපාටිවල ස්වභාවය සහ කල්යෙදුම සන්නිවේදනය කිරීමෙන්, එම ක්‍රියාපටිපාටි වඩා පුරෝකථක කළ හැකි බවට පත්කිරීමෙන් සඵලදායකත්වය අඩු විය හැකිය.

*විගණනය තුළින් සැලකිය යුතු අන්දමේ සොයා ගැනීම (යොමුව: 16 ඡේදය)*

අ17. විගණනය තුළින් සොයා ගැනීම් සන්නිවේදනයට ලබාගත් විගණන සාක්ෂි සම්පූර්ණ කිරීමට හැකිවීමට පාලනය පිළිබඳ වගකිව යුතු අයගෙන් තවදුරටත් වන තොරතුරු ඉල්ලා සිටිය හැකිය. උදාහරණ ලෙස විශේෂිත ගණුදෙනු වලට හෝ සිද්ධීන්ට අදාලව කරුණු සහ පවතින තත්ත්වයන් හි, පාලනය පිළිබඳ වගකීම ඇති අයට එක හා සමාන අවබෝධයක් පවත්වාගෙන යන ලෙස විගණක ඔවුන්ට තහවුරු කළ හැකිය.

අ18. ශ්‍රී.ලං.වි.ප්‍ර. 701 ව්‍යවහාර කරන විට 16 වන ඡේදය මගින් අවශ්‍ය කරන පාලනය පිළිබඳ වගකිව යුතු අය සමඟ සන්නිවේදනය, එමෙන්ම 15 වන ඡේදය මඟින් අවශ්‍ය කරන විගණක විසින් හඳුනාගත් සැලකිය යුතු අන්දමේ අවදානම් පිළිබඳ සන්නිවේදනයේදී, සැලකිය යුතු අන්දමේ විගණක අවධානය අවශ්‍යකරන එම කරුණු නිර්ණය කිරීමේදී විශේෂයෙන්ම විගණකට අදාළවන සහ එම නිසා ඒවා ප්‍රධාන විගණන කරුණු විය හැකිය.[11]

*ගිණුම්කරණ පරිචයන්හි සැලකිය යුතු අන්දමේ ගුණාත්මක අංගයන් (යොමුව : 16 (අ) ඡේදය)*

අ19. මූල්‍ය වාර්තාකරණ ආකෘතිමය රාමු, අස්තිත්ත්වය සඳහා ගිණුම්කරණ ඇස්තමේන්තු කිරීමට සහ ගිණුම්කරණ ප්‍රතිපත්ති පිළිබඳ විනිශ්චයන් කිරීමට සහ මූල්‍ය ප්‍රකාශ හෙළිදරව් කිරීමට සාමාන්‍යයෙන් ඉඩදේ. උදාහරණ ලෙස, සැලකිය යුතු අන්දමේ මැනීමේ අවිනිශ්චිතතාවයක් එහි තිබෙන ගිණුම්කරණ ඇස්තමේන්තු සංවර්ධනය කිරීමේදී ප්‍රධාන උපකල්පන භාවිත කිරීමට සම්බන්ධිතවන මෙයට, අමතරව නීතිය, රෙගුලාසි හෝ මූල්‍ය වාර්තාකරණ ආකෘතිමය රාමුවලින් වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සාරාංශයක් හෙළිදරව් කිරීම අවශ්‍ය විය හැකිය හෝ "තීරණාත්මක ගිණුම්කරණ ඇස්තමේන්තු" හෝ "තීරණාත්මක ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ පරිචයන්" හෝ "හඳුනා ගැනීමට" යොමු කිරීමට සහ මූල්‍ය ප්‍රකාශ පිළියෙල කිරීමේදී කළමනාකාරීත්වය ගත් වඩාත් අසීරු, විෂයානු බද්ධ හෝ සංකීර්ණ විනිශ්චයන් වලින් පරිශීලකයන්ට අතිරේක තොරතුරු ලබාදීමට අවශ්‍ය විය හැකිය.

අ20. මූල්‍ය ප්‍රකාශවල විෂයානු බද්ධ අංග මත විගණකගේ සැලකිල්ලට යොමු කිරීම් විය හැක්කේ විශේෂයෙන්ම පාලනය පිළිබඳ වගකිව යුතු අයට අදාළව මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සුපරීක්ෂාකාරී අධීක්ෂණය සඳහා ඔවුන්ගේ වගකීම් වලින් නිදහස්වීම උදාහරණ වශයෙන් අ19 ඡේදය තුළ විස්තර කර ඇති කරුණු වලට සම්බන්ධිතව, පාලනය පිළිබඳ වගකිවයුතු අය රුචියක් දක්විය හැක්කේ සැලකිය හැකි අවදානම් වලට හේතු විය හැකි ගිණුම්කරණ ඇස්තමේන්තුවලට සම්බන්ධිත අවිනිශ්චිතතාවය ඇස්තමේන්තු කිරීම හෙළිදරව් කිරීම් හි ප්‍රමාණවත් බව විගණකගේ ඇගයීම තුළය. අස්තිත්ත්වයේ ගිණුම්කරණ පරිචයේ සැලකිය යුතු අන්දමේ ගුණාත්මක අංග පිළිබඳ විවෘත සහ නිර්මාණාත්මක සන්නිවේදනය, එසේම සැලකිය යුතු අන්දමේ විගණන පරිචයන්ගේ පිළිගත හැකි බව සහ හෙළිදරව් කිරීම්වල තත්ත්වය මත මතපැවසුමක් ඇතුළත් විය හැකිය. 2 වන පරිශිෂ්ඨය මෙම සන්නිවේදන තුළ ඇතුළත් කළ හැකි කරුණු හඳුනාගනී.

විගණනය තුළ මුහුණපාන සැලකිය යුතු අන්දමේ අපහසුතාවයන් (යොමුවඃ 16(ආ) ඡේදය)

අ21. විගණනයක් තුළදී මුහුණපාන සැලකිය යුතු අන්දමේ අපහසුතා වලට පහත වැනි කරුණු ඇතුළත් විය හැකිය;

- කළමනාකාරීත්වය තුළින් සිදුවන සැලකිය යුතු අන්දමේ ප්‍රමාද, අස්තිත්ත්වයේ කාර්ය මණ්ඩලය හමුවිය නොහැකිවීම, හෝ විගණකගේ ක්‍රියාපටිපාටි ඉටු කිරීමට විගණකට අවශ්‍ය කරන තොරතුරු ලබාදීමට කළමනාකාරීත්වයේ අකැමැත්ත.
- හේතු යුක්ත නොවන (අසාධාරණ) කෙටිකාලයක් තුළදී විගණනය සම්පූර්ණ කිරීමට වීම.
- ප්‍රමාණවත් යෝග්‍ය විගණන සාක්ෂි ලබා ගැනීමට අනපේක්ෂිත පුළුල් ප්‍රයත්නයක් අවශ්‍ය වීම.
- අපේක්ෂා කරන තොරතුරු ලබා ගැනීමට නොතිබීම.
- කළමනාකාරීත්වය විසින් විගණක මත සීමාවන් පැනවීම.
- අස්තිත්ත්වය අඛණ්ඩ ලෙස පවත්වාගෙන යාමේ හැකියාව පිළිබඳ එහි තක්සේරුව කිරීමට හෝ දීමට කළමනාකාරීත්වයේ අකැමැත්ත.

සමහර තත්ත්වයන්හිදී එවැනි අපහසුතාවයන් විෂය පථයේ සීමා කිරීම ඇති කිරීමක් විය හැකි අතර එය විගණකගේ මතය විකරණය කිරීමට යොමුකරවිය හැකිය.[12]

සාකච්ඡා කළ හෝ කළමනාකාරීත්වය සමඟ ලිපි හුවමාරුවට යටත් සැලකිය යුතු අන්දමේ කරුණු (යොමුවඃ 16 (ඇ) (1) ඡේදය)

අ22. සාකච්ඡා කළ හෝ කළමනාකාරීත්වය සමඟ ලිපි හුවමාරුවකට යටත් සැලකිය යුතු අන්දමේ කරුණු. එම කරුණු වලට ඇතුළත් විය හැක්කේ;

---

11 ශ්‍රී.ලං.වි.ප්‍ර. 701 9 - 10 ඡේද.

12 ශ්‍රී.ලං.වි.ප්‍ර.705 (සංශෝධිත), *ස්වාධීන විගණක වාර්තාවේ මතය විකරණය කිරීම.*

- වර්ෂය තුළ සිදු වූ සැළකිය යුතු අන්දමේ සිද්ධි හෝ ගණුදෙනු.
- අස්තිත්ත්වයට බලපාන ව්‍යාපාරික තත්ත්වයන් සහ ප්‍රමාණාත්මක අවප්‍රකාශයකට බලපෑ හැකි ව්‍යාපාරික සැලසුම් සහ ක්‍රමෝපායන්.
- වෙනත් ගණකාධිකාරීවරුන්ගෙන් ගිණුම්කරණ හෝ විගණන කරුණු මත කළමනාකාරීත්වය උපදේශන ලබා ගැනීම පිළිබඳ සැලකිලිමත් වීම.
- ගිණුම්කරණ පරිචයන් විගණන ප්‍රමිත ව්‍යවහාර කරණය, හෝ විගණනය හෝ වෙනත් සේවා සඳහා ගාස්තු සම්බන්ධයෙන් විගණකව මූලිකව හෝ පසුව හමුවී කළ සාකච්ඡා හා ලිපි හුවමාරු කර ගැනීම්.
- විගණක අතිරේක අදාළ කරුණු හෝ තොරතුරු ලබා ගැනීමෙන් පසුව විසඳාගත් අසම්පූර්ණ කරුණු හෝ ප්‍රාථමික තොරතුරු නිසා ඇති වූ මූලක මතයේ අසමතා සඳහා හැර, කළමනාකරණය සමඟ එකඟත්වයක් නොතිබූ සැළකිය යුතු අන්දමේ කරුණු.

විගණකගේ වාර්තාවේ ආකෘතියට සහ අන්තර්ගතයට බලපාන තත්ත්ව (යොමුව: 16 (ඈ) ඡේදය)

අ23. යෝග්‍ය වන පරිදි විගණන කාර්ය භාරයේ නියමයන්ට කළමනාකාරීත්වය හෝ පාලනය පිළිබඳ වගකිව යුතු අය සමඟ විගණක එකඟ වීම ශ්‍රී.ලං.වි.ප්‍ර. 210 න් අවශ්‍ය කෙරේ.[13] විගණන කාර්යභාරයේ එකඟ වූ නියමයන් විගණනය භාර ගැනීමේ ලිපියේ හෝ වෙනත් සුදුසු ආකාරයේ ලිඛිත ගිවිසුමක වාර්තා කර තැබීම අවශ්‍යවන අතර වෙනත් දෑ වලට ඇතුළත් වන්නේ විගණකගේ වාර්තාවේ අපේක්ෂිත ආකෘතිය සහ අන්තර්ගතයට යොමු කිරීමද වේ.[14] අ9 ඡේදයේ විස්තර කර ඇති පරිදි කාර්ය භාරයේ නියමයන් පාලනය පිළිබඳ වගකිව යුතු අය සමඟ එකඟ වී නොමැති නම්, විගණනයට අදාළ කරුණු පිළිබඳව සන්නිවේදනය කිරීමට කාර්යභාරය භාර ගැනීමේ ලිපියේ පිටපතක් සමඟ විගණක පාලනය පිළිබඳ වගකිව යුතු අයට ලබා දිය හැකිය. 16 (ඈ) ඡේදය මගින් අවශ්‍යකරන සන්නිවේදනයෙන් අපේක්ෂා කරන්නේ, විගණකගේ වාර්තාව එහි අපේක්ෂා කළ ආකෘතියෙන් හෝ අන්තර්ගතයෙන් වෙනස්විය හැකි හෝ ඉටුකළ විගණනය පිළිබඳ අමතර තොරතුරු ඇතුළත්විය හැකි තත්ත්වය පිළිබඳව පාලනය පිළිබඳ වගකිව යුතු අයට දැන්වීමටය.

අ24. ශ්‍රී.ලං.වි.ප්‍ර. යන් සමඟ අනුකූලව විගණකගේ වාර්තාවේ අතිරේක තොරතුරු ඇතුළත් කිරීමට විගණකට අවශ්‍යද හෝ අන්වශයෙන් සැළකිල්ලට ගන්නා තත්ත්වයන්හිදී, ඒ සඳහා පාලනය පිළිබඳ කටයුතු කරන අය සමඟ සන්නිවේදනය අවශ්‍ය වන විට ඇතුළත් වන්නේ;

- ශ්‍රී.ලං.වි.ප්‍ර. 705 (සංශෝධිත)[15] සමඟ අනුකූලව විගණකගේ වාර්තාවේ මතය විගණක විකරණය කිරීමට අපේක්ෂා කරයි.
- ශ්‍රී.ලං.වි.ප්‍ර. 570[16] (සංශෝධිත) සමඟ අනුකූලව අඛණ්ඩ පවැත්මට සම්බන්ධිතව ප්‍රමාණාත්මක අනියතතාවයන් වාර්තා කර ඇත.
- ශ්‍රී.ලං.වි.ප්‍ර. 701[17] සමඟ අනුකූලව ප්‍රධාන විගණන කරුණු සන්නිවේදනය කර ඇත.
- ශ්‍රී.ලං.වි.ප්‍ර. 706 (සංශෝධිත)[18] සමඟ අනුකූලව හෝ එසේ කරන ලෙස වෙනත් ශ්‍රී.ලං.වි.ප්‍ර. වලින් අවශ්‍ය කරන විට කරුණ අවධාරණ කිරීමේ ඡේදයක් හෝ වෙනත් කරුණ ඡේදයක් ඇතුළත් කිරීමට එය අවශ්‍ය බව විගණක සැලකිල්ලට ගැනීම.
- ශ්‍රී.ලං.වි.ප්‍ර. 720 (සංශෝධිත)[19] සමඟ අනුකූලව වෙනත් තොරතුරුවල නිවැරදි නොකළ ප්‍රමාණාත්මක අවප්‍රකාශයක් ඇතැයි විගණක නිගමනය කිරීම.

---

[13] ශ්‍රී.ලං.වි.ප්‍ර. 210 9 වන ඡේදය.
[14] ශ්‍රී.ලං.වි.ප්‍ර. 210 10 වන ඡේදය.
[15] ශ්‍රී.ලං.වි.ප්‍ර. 705 (සංශෝධිත) 30 වන ඡේදය.
[16] ශ්‍රී.ලං.වි.ප්‍ර. 570 (සංශෝධිත) *අඛණ්ඩ පැවැත්ම* 25 (ඈ) ඡේදය.
[17] ශ්‍රී.ලං.වි.ප්‍ර. 701 17 වන ඡේදය
[18] ශ්‍රී.ලං.වි.ප්‍ර. 706 (සංශෝධිත) *ස්වාධීන විගණකගේ වාර්තාවේ කරුණ අවධාරණය කිරීමේ ඡේද සහ වෙනත් කරුණ* 12 වන ඡේදය.
[19] ශ්‍රී.ලං.වි.ප්‍ර. 720 (සංශෝධිත) *වෙනත් තොරතුරුවලට සම්බන්ධිත විගණකගේ වගකීම්* 18 (අ) ඡේදය.

එවැනි තත්ත්වයන් තුළදී, පාලනය පිළිබඳ වගකිව යුතු අයට, එවැනි කරුණු විගණකගේ වාර්තා ආමන්ත්‍රණය කළ යුත්තේ කෙසේද යන්න පිළිබඳ සාකච්ඡාවකට පහසුකම් සැළසීමට විගණකගේ වාර්තාවේ කෙටුම්පතක් ලබාදීම ප්‍රයෝජනවත් විය හැකි බව විගණක සැලකිල්ලට ගනී.

අ25. ශ්‍රී.ලං.වි.ප්‍ර. 700 (සංශෝධිත) සමඟ අනුකූලව ඉතා විරල තත්ත්වයන්හිදී කාර්යභාරයේ යෙදී සිටින හවුල්කරුගේ ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනයේ සාමාජික අංකය විගණකගේ වාර්තාව තුළ ඇතුළත් නොකිරීමට විගණක අදහස් කෙරේ, පුද්ගලික ආරක්ෂාවට සැලකිය යුතු අන්දමින් විය හැකි තර්ජනයක දැඩිකම පිළිබඳ විගණකගේ තක්සේරුව පිළිබඳ මෙම අභිප්‍රාය දැන්වීමට පාලනය පිළිබඳ වගකිව යුතු අය සමඟ විගණක සාකච්ඡා කිරීම අවශ්‍ය වේ.[20] ශ්‍රී.ලං.වි.ප්‍ර. 700 (සංශෝධිත)[21] මගින් අවසර දෙන පරිදි විගණකගේ වාර්තාවේ ප්‍රධාන අංගය තුළ විගණකගේ වගකීම් පිළිබඳ විස්තරය ඇතුළත් නොකිරීමට වන තත්ත්වයන් තුළ විගණක තෝරාගත් විට විගණක එලෙසම පාලනය පිළිබඳ වගකිව යුතු අය සමඟ සන්නිවේදනය කළ හැකිය.

මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලියට අදාළ වෙනත් සැළකිය යුතු අන්දමේ කරුණු (යොමුව: 16ඉ ඡේදය)

අ26. අනපේක්ෂිත සිද්ධීන්ගේ ප්‍රතිඵලයක් ලෙස විගණන පටිපාටිවල ප්‍රතිඵල මගින් ලබාගත් විගණන සාක්ෂි සහ තත්ත්වයන්ගේ වෙනස්වීම්වල ප්‍රතිඵලයක් ලෙස සමස්ථ විගණන ක්‍රමෝපාය සහ විගණන සැලැස්ම වෙනස් කිරීමට විගණකට සිදුවිය හැකිය හා එහි ප්‍රතිඵලයක් වශයෙන් තක්සේරු කළ අවදානම්වල සංශෝධන සැලකිල්ලට ගැනීම පදනම මත අතිරේක විගණන පටිපාටිවල සැළසුම් කළ ස්වභාවය කල්යෙදුම සහ ප්‍රමාණය ශ්‍රී.ලං.වි.ප්‍ර. 300[22] අවධානය කෙරේ. විගණක පාලනය පිළිබඳ වගකිව යුතු අය සමඟ එවැනි කරුණු පිළිබඳ සන්නිවේදනය කළ හැකිය. උදාහරණ ලෙස සැළසුම්කළ විෂය පථය සහ විගණනයේ කල් යෙදුම පිළිබඳව මූලික සාකච්ඡා කිරීම්වලට යාවත්කාලීන කිරීමක් ලෙස.

අ27. මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය අධීක්ෂණය කරන පාලනය පිළිබඳ වගකිවයුතු අයට සෘජුව අදාළවන විගණනය තුළදී පැන නැඟුන වෙනත් සැලකිය යුතු අන්දමේ කරුණු වලට, නිවැරදි කරන ලද වෙනත් තොරතුරු වූ ප්‍රමාණාත්මක අවප්‍රකාශ ලෙස වූ කරුණු ඇතුළත් විය හැකිය.

අ28. 16(අ)- (ඇ) ඡේදවල සහ සම්බන්ධිත ව්‍යවහාර කිරීමේ දැවල අවශ්‍යතාවයන් මගින් දැනටමත් ආමන්ත්‍රණය නොකර ඇති ප්‍රමාණය තෙක්, ශ්‍රී.ලං.වි.ප්‍ර. 220[23] සමඟ අනුකූලව කාර්යභාර තත්ත්ව පාලන සමාලෝචකයෙක් පත්කර ඇත්නම් ඔහු සමඟ සාකච්ඡා කළ හෝ ඔහු විසින් සැලකිල්ලටගත් වෙනත් කරුණු පිළිබඳ සන්නිවේදනය කිරීමට විගණක සැලකිල්ලට ගත හැකිය.

*විගණකගේ ස්වාධීනත්වය (යොමුව: 17 වන ඡේදය)*

අ29. විගණක මූල්‍ය ප්‍රකාශ විගණන කාර්ය භාරයන්ට සම්බන්ධව, ස්වාධීනත්වයට අයත්වන දේ ඇතුළුව, අදාළ ආචාර ධර්මීය අවශ්‍යතාවයන් සමඟ අනුකූලවීම අවශ්‍ය වේ.[24]

අ30. සන්නිවේදනය කළ යුතු සම්බන්ධතාවයන් සහ වෙනත් කරුණු හා ආරක්ෂණයන් කාර්යභාරයේ තත්ත්වය සමඟ වෙනස්වේ, එහෙත් සාමාන්‍යයෙන් පහත දෑ ආමන්ත්‍රණය කෙරේ.

(අ) ස්වාධීනත්වයට වන තර්ජන, ඒවා, ස්වයං - ඇල්ම සඳහාවන තර්ජන, ස්වයං - සමාලෝචන තර්ජන, උපදේශනය - මත තර්ජන, සමීප ඇසුරේ - තර්ජන සහ බිය ගැන්වීමේ - තර්ජන ලෙස වර්ගීකරණය කළ හැකිය; සහ

(ආ) වෘත්තියෙන් නීතියෙන් හෝ නියාමනය මගින් ඇති කළ ආරක්ෂණයන්, අස්තිත්වය ඇතුළත ආරක්ෂණයන් සහ අස්තිත්වයේ ස්වකීය පද්ධති සහ ක්‍රියාපටිපාටි ඇතුළත ආරක්ෂණයන්.

අ31. ස්වාධීනත්වයේ අවශ්‍යතා කඩ කරන තත්ත්වයන් හඳුනා ගත් විට අදාළ සදාචාරාත්මක අවශ්‍යතාවයන් හෝ නීතිය හෝ රෙගුලාසි, පාලනය පිළිබඳ වගකිව යුතු අයට කළ යුතු විශේෂ සන්නිවේදන ඒ ලෙසම නියම කළ

---

[20] ශ්‍රී.ලං.වි.ප්‍ර. 700 (සංශෝධිත) 46 සහ අ 63 ඡේද

[21] ශ්‍රී.ලං.වි.ප්‍ර. 700 (සංශෝධිත) 41 වන ඡේදය

[22] ශ්‍රී.ලං.වි.ප්‍ර. 300 *මූල්‍ය ප්‍රකාශ විගණනයක් සැළසුම් කිරීම*, අ 15 ඡේදය

[23] ශ්‍රී.ලං.වි.ප්‍ර. 220 *මූල්‍ය ප්‍රකාශ විගණනයක් සඳහා තත්ත්ව පාලන* - 19 - 22 සහ අ 23 - අ 33 ඡේද බලන්න.

[24] ශ්‍රී.ලං.වි.ප්‍ර. 200 *ස්වාධීන විගණකගේ සමස්ථ අරමුණු සහ ශ්‍රී ලංකා විගණන ප්‍රමිතවලට අනුකූලව විගණනය මෙහෙයවීම* - 14 වන ඡේදය

හැකිය. උදාහරණ ලෙස, වෘත්තිය ගණකාධිකාරීන් සඳහා ආචාර ධර්ම සංග්‍රහය (ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනයේ සංග්‍රහය) මගින්, සමාගම ගෙන ඇති හෝ ගැනීමට යෝජිත ක්‍රියාමාර්ග සහ යම් කඩ කිරීමක් පිළිබඳ පාලනය පිළිබඳ වගකිව යුතු අය සමග ලිඛිතව විගණක සන්නිවේදනය කිරීම අවශ්‍ය කරයි.[25]

අ32. සැලකිය යුතු අන්දමේ පොදු අයිතියක් තිබිය හැකි උදාහරණ වශයෙන් විශාල සංඛ්‍යාවක සහ පුළුල් පරාසයක උනන්දුවක් දක්වන පාර්ශව ඇති නිසා සහ ව්‍යාපාරයේ ස්වභාවය හා ප්‍රමාණය සැළකිල්ලට ගනිමින් එවැනි අස්තිත්ත්ව ඇතුළුව සමහර වෙනත් අස්තිත්ත්ව සම්බන්ධයෙන් වන අවස්ථාවක ලැයිස්තුගත අස්තිත්ත්ව හා වන අවස්ථාවක ව්‍යවහාරවන විගණකගේ ස්වාධිනත්වය සම්බන්ධයෙන් සන්නිවේදන අවශ්‍යතාවයන්, එසේම යෝග්‍ය විය හැකිය. එවැනි අස්තිත්ත්ව සඳහා උදාහරණ වලට ඇතුළත් විය හැක්කේ මූල්‍ය ආයතන (බැංකු, රක්ෂණ සමාගම් සහ විශ්‍රාම වැටුප් අරමුදල්) සහ පුණ්‍ය ආයතන වැනි වෙනත් අස්තිත්ත්ව වේ. අනෙක් අතට ස්වාධීනතවය පිළිබඳ සන්නිවේදනය අදාළ නොවිය හැකි තත්ත්වයන් තිබිය හැකිය. උදාහරණ ලෙස පාලනය පිළිබඳ වග කිවයුතු සියල්ලටම ඔවුන්ගේ කළමනාකාරීත්ව ක්‍රියාකාරකම් තුළින් අදාළ කරුණු දන්වා ඇති අවස්ථාවක මෙය විශේෂයෙන්ම විය හැක්කේ, අස්තිත්ත්වය - හිමිකරු කළමනාකරණ විට සහ මූල්‍ය ප්‍රකාශයක් විගණනයට එහා අස්තිත්ත්වය සමඟ විගණකගේ සමාගම සහ ජාල සමාගම් ස්වල්ප සම්බන්ධතාවයක් පවත්නා අවස්ථාවලදීය.

*අතිරේක කරුණු (යොමුව: 3 වන ඡේදය)*

අ33. පාලනය පිළිබඳ වගකිව යුතු අය විසින් කළමනාකරණය කිරීම සුපරීක්ෂාකාරී අධීක්ෂණයට ඇතුළත් වන්නේ මූල්‍ය වාර්තාකරණයේ විශ්වාසදායකත්වය සම්බන්ධයෙන් යෝග්‍ය අභ්‍යන්තර පාලන අස්තිත්ත්වය සැළසුම් කර ක්‍රියාත්මක කර සහ පවත්වාගෙන යාම සහ මෙහෙයුම්වල සඵලදායකත්වය සහ කාර්යක්ෂමතාවය සහ අදාළ නීතිය සහ රෙගුලාසි සමඟ අනුගතවීම තහවුරු කිරීමය.

අ34. මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලියට සුපරීක්ෂාකාරීව අධීක්ෂණයට අවශ්‍යයෙන්ම සම්බන්ධිත නොවන අතිරේක කරුණු විගණකගේ දැන ගැනීමට ලක්විය හැකිය. එහෙත් ඒවා කෙසේ වෙතත් අස්තිත්ත්වයේ ක්‍රමෝපායික මෙහෙයුම් අධීක්ෂණය කිරීම තුළදී පාලනය පිළිබඳ වගකිව යුතු අයගේ හෝ වගකිවයුතු භාවයට සම්බන්ධිත අස්තිත්ත්වයේ බැඳියාවන්හි වගකීම්වලට වැදගත් විය හැකිය. එවැනි කරුණු වලට ඇතුළත් විය හැක්කේ උදාහරණ ලෙස පාලන ව්‍යූහ හෝ ක්‍රියාවලි සහ ජ්‍යෙෂ්ඨ කළමනාකාරිත්වය විසින් ගත් වැදගත් අන්දමේ තීරණ හෝ ක්‍රියාමාර්ග සඳහා යෝග්‍ය බලය පැවරීමක් නොමැතිකම, වැනි සැළකිය යුතු අන්දමේ මත භේදයට පාදකවන කරුණු.

අ35. පාලනය පිළිබඳව වගකිව යුතු අය සමඟ අතිරේක කරුණු සන්නිවේදනය කළ යුතු දැයි විගණක නිර්ණය කිරීමේදී පවත්නා තත්ත්වයන් තුළ එසේ කිරීම යෝග්‍ය නොවන්නේ නම් මිස, විගණකගේ දැන ගැනීමට ලක්ව ඇති මෙම ස්වභාවයේ කරුණු කළමනාකාරීත්වයේ යෝග්‍ය මට්ටම සමඟ සාකච්ඡා කළ හැකිය.

අ36. අතිරේක කරුණක් සන්නිවේදනය කළේ නම්, පාලනය පිළිබඳ වගකිව යුතු අය පහත දේ පිළිබඳව දැනුවත් බව, දැනුවත් කිරීම විගණකට යෝග්‍ය විය හැකිය;

(අ) එවැනි කරුණු හඳුනා ගැනීම සහ සන්නිවේදනය විගණනයේ අරමුණට ආනුෂංගිකය, එවැනි දෑ මූල්‍ය ප්‍රකාශ මත මතයක් ඇති කර ගැනීමට ය.

(ආ) එම කරුණ සම්බන්ධයෙන්, මූල්‍ය ප්‍රකාශ මත මතයක් ඇති කර ගැනීමට අවශ්‍ය වූ ක්‍රියාපටිපාටි හැර වෙනත් ක්‍රියාපටිපාටි ක්‍රියාවට නංවා නොමැත; සහ

(ඇ) වෙනත් එවැනි කරුණු පවතිද යන්න නිරීක්ෂණය කිරීමට ක්‍රියාපටිපාටි ක්‍රියාවට නංවා නොමැත.

සන්නිවේදන ක්‍රියාවලිය

*සන්නිවේදන ක්‍රියාවලිය ස්ථාපනය කිරීම (යොමුව: 18 ඡේදය)*

අ37. විගණකගේ වගකීම් පැහැදිලිව සන්නිවේදනය කිරීම, විගණකගේ සැළසුම් කළ විෂය පථය සහ කල් යෙදුම, සහ සන්නිවේදන කිරීමේ අපේක්ෂිත සාමාන්‍ය අන්තර්ගතය සඵලදායක ද්වි-මාර්ග සන්නිවේදනය සඳහා පදනම ස්ථාපනය කිරීමට උපකාරීවේ.

---

25 ස්වාධීනත්වය කඩ කිරීම ආමන්ත්‍රණය කරන ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරීත්වයේ ධර්ම සංග්‍රහයෙහි 290, 39 - 49 කොටස බලන්න.

අ38. සඵලදායී ද්වි-මාර්ග සන්නිවේදනයට එලෙසම දායක විය හැකි කරුණු වලට පහත දෑ සාකච්ඡා කිරීම අතුළත්ය;

- සන්නිවේදනයේ අරමුණු; අරමුණු පැහැදිලිවන විට විගණක සහ පාලනය පිළිබඳව වගකිව යුතු අය සමඟ අදාළ ගැටලු සහ සන්නිවේදන ක්‍රියාවලියෙන් පැන නගින අපේක්ෂිත ක්‍රියාමාර්ග අන්‍යෝන්‍ය අවබෝධයක් ඇතිකර ගැනීමට මනාව හඳුනා ගැනීමක් සිදුවේ.
- සන්නිවේදනය සිදු කරන ලද ආකාරය.
- විශේෂ කරුණු සම්බන්ධයෙන් කාර්ය භාරයේ නියුතු කණ්ඩායමේ පුද්ගල(යා) යන් සහ පාලනය පිළිබඳ වගකිව යුතු අය අතුරෙන් කවුරුන් සමඟ සන්නිවේදනය කළ යුතුද.
- විගණකගේ අපේක්ෂාව එම සන්නිවේදනය ද්වි-මාර්ග එකක්වනු බව සහ පාලනය පිළිබඳ වගකිව යුතු අය ඔවුන් විසින් විගණනයට අදාළ ලෙස ඔවුන් සලකන කරුණු විගණක සමඟ සාකච්ඡා කරනු ලබන බවය. උදාහරණ ලෙස විගණන ක්‍රියාපටිපාටිවල ස්වභාවය, කල් යෙදුම හා සහ ප්‍රමාණයට සැලකිය යුතු අන්දමින් බලපෑ හැකි ක්‍රමෝපායික තීරණ, සැක සිතීම, හෝ වංචා අනාවරණය කර ගැනීම, සහ ජ්‍යෙෂ්ඨ කළමනාකාරීත්වයේ අවංකභාවය හෝ හැකියාව සමඟ සැළකිල්ලක් දැක්වීම.
- විගණක විසින් සන්නිවේදනය කළ කරුණු මත ක්‍රියාමාර්ග ගැනීම සහ ආපසු වාර්තා කිරීමේ ක්‍රියාවලිය.
- පාලනය පිළිබඳ වගකිවයුතු අය සන්නිවේදනය කළ කරුණු මත ක්‍රියාමාර්ග ගැනීම සහ ආපසු වාර්තා කිරීමේ ක්‍රියාවලිය.

අ39. සන්නිවේදන ක්‍රියාවලිය, අස්තිත්ත්වයේ ප්‍රමාණය සහ පාලන ව්‍යුහය, පාලනය පිළිබඳ වගකිව යුතු අය මෙහෙයවන ආකාරය සහ සන්නිවේදනය කළ යුතු කරුණු වල වැදගත්කම පිළිබඳ විගණකගේ අදහස ඇතුලුව පවත්නා තත්ත්වයන් සමඟ වෙනස්වනු ඇත. සඵලදායී ද්වි-මාර්ග පද්ධතියක් ස්ථාපනය කිරීමේ අපහසුතා තුළින් ඇඟවිය හැක්කේ විගණක සහ පාලනය පිළිබඳ වගකිව යුතු අතර සන්නිවේදනය විගණන අරමුණ සඳහා ප්‍රමාණවත් නොවන බවය. (අ 52 ඡේදය බලන්න)

කුඩා අස්තිත්ත්වයනට විශේෂිත වූ සැලකිල්ලට ගැනීම.

අ40. කුඩා අස්තිත්ත්වවල විගණන සඳහා වන අවස්ථාවකදී, පාලනය පිළිබඳ වගකිව යුතු අය සමඟ විගණක සන්නිවේදනය කළ හැකි වන්නේ ලැයිස්තුගත හෝ විශාල අස්තිත්ත්ව සම්බන්ධයෙන් වන අවස්ථාවකට වඩා අඩු ව්‍යුහගත ආකාරයකටය.

කළමනාකාරීත්වය සමඟ සන්නිවේදනය

අ41. මෙම ශ්‍රී.ලං.වි.ප්‍ර. ය මගින් පාලනය පිළිබඳ වගකිව යුතු අය සමඟ සාකච්ඡා කිරීමට අවශ්‍ය කරන කරුණු ඇතුළුව, බොහෝ කරුණු කළමනාකාරීත්වය විගණනයක සමාන්‍ය ක්‍රියාමාර්ග තුළදී සාකච්ඡා කළ හැකිය. එවැනි සාකච්ඡා අස්තිත්ත්වයක් මෙහෙයුම් පවත්වාගෙන යෑම සඳහා කළමනාකාරීත්වයේ විධායක වගකීම සහ විශේෂයෙන්ම මූල්‍ය ප්‍රකාශ පිළියෙල කිරීම සඳහා කළමනාකාරීත්වයේ වගකීම හඳුනා ගනී.

අ42. එසේ කිරීම අයෝග්‍ය වන්නේ නම් මිස, පාලනය පිළිබඳ වගකිව යුතු අය සමඟ කරුණු සන්නිවේදනය කිරීමට පෙර, විගණක ඒවා කළමනාකාරීත්වය සමඟ සාකච්ඡා කළ හැකිය. උදාහරණ ලෙස කළමනාකරණය සමඟ කළමනාකාරීත්වයේ හැකියාව සහ අවංකභාවය ගැන ප්‍රශ්න කිරීම සාකච්ඡා කිරීම යෝග්‍ය විය නොහැකිය. මෙයට අමතරව කළමනාකාරීත්වයේ විධායක වගකීම හඳුනා ගනිමින්, මෙම මූලික සාකච්ඡා කළ කරුණු සහ ගැටලු පැහැදිලි කළ හැකි අතර අමතර තොරතුරු සහ පැහැදිලි කරගැනීම් ලබාදීමට කළමනාකරණයට අවස්ථාවක් ලබාදේ. සමානව අස්තිත්ත්වයට අභ්‍යන්තර විගණන කාර්යයක් ඇතිවිට, විගණක පාලනය පිළිබඳ වගකිව යුතු අය සමඟ සන්නිවේදනය කිරීමට පෙර අභ්‍යන්තර විගණක සමඟ කරුණු සාකච්ඡා කළ හැකිය.

තුන්වන පාර්ශව සමඟ සන්නිවේදනය

අ.43. විගණකගෙන් වන ලිඛිත නිවේදනවල පිටපතක් තුන්වන පාර්ශ්ව වලට ලබාදෙන ලෙස ඉල්ලීමට නීතියෙන් හෝ රෙගුලාසි මගින් පාලනය පිළිබඳ වගකිවයුතු අයට අවශ්‍ය කරවිය හෝ අපේක්ෂා කළ හැකිය. උදාහරණ වශයෙන් බැංකුකරුවන්ට හෝ සමහර නියාමන අධිකාරීන්ට. සමහර අවස්ථාවලදී, තුන්වන පාර්ශවයන්ට

හෙළිදරව් කිරීම නීති විරෝධී හෝ අන් අයුරකින් අයෝග්‍ය විය හැකිය. පාලනය පිළිබඳ වගකිව යුතු අය සඳහා පිළියෙල කළ ලිඛිත සන්නිවේදනයක් තුන්වන පාර්ශවහට ලබාදීමේ, තත්ත්වයන් තුළදී එම සන්නිවේදනය පිළියෙල කළේ ඔවුන් ගැන අදහස් නොකර බව තුන්වන පාර්ශවයන්ට දන්වීම මෙහිදී ඉතා වැදගත් විය හැකිය. උදාහරණ ලෙස ලිඛිත සන්නිවේදනයේ පාලනය පිළිබඳව වගකිව යුතු අය සඳහා බව සඳහන් කිරීම මගින්;

(අ) එම සන්නිවේදනය පිළියෙල කර ඇත්තේ පාලනය පිළිබඳව වගකිව යුතු පාර්ශව සහ උචිත වන අවස්ථාවන්හි සමූහ කළමනාකරණය සහ සමූහ විගණකගේ තනිකර ප්‍රයෝජනය සඳහා බව සහ තුන්වන පාර්ශව විසින් ඒ මත විශ්වාසය තබා කටයුතු නොකළ යුතු බව;

(ආ) විගණක විසින් තුන්වන පාර්ශවයනට වගකීමක් භාර නොගන්නා බව; සහ

(ඇ) තුන්වන පාර්ශවවලට හෙළිදරව් කිරීමක හෝ බෙදා හැරීම මත යම් සීමාවන්,

අ44. සමහර අධිකරණ බල ප්‍රදේශ තුළ නීතිය හෝ රෙගුලාසි මගින් උදාහරණ වශයෙන් විගණක පහත දෑ කිරීම අවශ්‍ය කළ හැකිය;

- පාලනය පිළිබඳ වගකිව යුතු අය සමග සන්නිවේදනය කළ සමහර කරුණු නියාමන හෝ බලාත්මක කිරීමේ ආයතනයකට දැනුම් දීම. උදාහරණ ලෙස සමහර රටවල කළමනාකරණයේ සහ පාලනය පිළිබඳ වගකිව යුතු අය නිවැරදි කිරීමේ ක්‍රියාමාර්ග ගැනීමට අපොහොසත් වීම් අවප්‍රකාශ අධිකාරීන්ට වාර්තා කිරීමට විගණකට යුතුකමක් ඇත.
- පාලනය පිළිබඳ වගකිව යුතු අය සඳහා පිළියෙල කළ සමහර වාර්තාවල පිටපත් අදාළ නියාමන හෝ අරමුදල් සපයන ආයතනවලට, හෝ සමහර රාජ්‍ය අංශයේ අස්තිත්ත්ව සම්බන්ධයෙන් මධ්‍යම අධිකාරිය වැනි වෙනත් ආයතනවලට ඉදිරිපත් කිරීම හෝ
- පාලනය පිළිබඳ වගකිව යුතු අය සඳහා පිළියෙල කළ වාර්තා ප්‍රසිද්ධියේ ලබා ගැනීමට ඉඩ සැලැස්වීම.

අ45. පාලනය පිළිබඳ වගකිව යුතු අය සමග විගණකගේ ලිඛිත සන්නිවේදන සහිත පිටපතක් තුන්වන පාර්ශවයකට ලබාදීමට නීතියෙන් හෝ නියාමන මගින් අවශ්‍ය කරන්නේ නම් මිස, එසේ ලබාදීමට පෙර පාලනය පිළිබඳ වගකිව යුතු අයගේ පූර්ව සහමතිය විගණකට අවශ්‍ය විය හැකිය.

*සන්නිවේදනයේ ස්වරූප (යොමුව: 19 වන ඡේදය)*

අ46. සඵලදායක සන්නිවේදනයට ව්‍යුහගත ඉදිරිපත් කිරීම් සහ ලිඛිත වාර්තා වලට අතිරේකව සාකච්ඡා කිරීම් ඇතුලුව අඩුවෙන් ව්‍යුහගත සන්නිවේදනය සම්බන්ධ කර ගත හැකිය. 19 - 20 ඡේද තුළ හඳුනාගත් එම කරුණු හැර විගණක කරුණු එක්කෝ වාචිකව හෝ ලිඛිතව සන්නිවේදනය කළහැකිය. පාලනය පිළිබඳ වගකිව යුතු අයට ලබාදී ඇති එම සේවය භාර ගැනීමේ ලිපියේ පිටපතක් ලිඛිත සන්නිවේදනයට ඇතුළත් විය හැකිය.

අ47. විශේෂ කරුණක වැදගත්කමට අමතරව, සන්නිවේදනයේ ස්වරූපය (උදාඃ සන්නිවේදනය කළ යුත්තේ වාචිකවද හෝ ලිඛිතව ද යන්න, විස්තරවල ප්‍රමාණය හෝ සන්නිවේදනය තුළ සාරාංශගත කිරීම සහ සන්නිවේදනය කළ යුත්තේ ව්‍යුහගත හෝ ව්‍යුහගත නොවන ආකාරයටද යන්න) පහත දෑ වැනි සාධක මගින් බලපෑ හැකිය;

- කරුණ පිළිබඳව සාකච්ඡාවක් විගණකගේ වාර්තාවේ ඇතුළත් කළ යුතුද. උදාහරණ ලෙස ප්‍රධාන විගණන කරුණු විගණකගේ වාර්තාවේ සන්නිවේදනය කරන විට, එම කරුණු ප්‍රධාන විගණන කරුණු වීමට නීර්ණය කළ කරුණු පිළිබඳ ලිඛිතව සන්නිවේදනය කිරීමේ ඇති අවශ්‍යතාවය විගණක සැලකිල්ලට ගත හැකිය.
- එම කරුණ සතුටුදායක ලෙස විසඳා ඇත්ද,
- කළමනාකරණය එම කරුණ කලින් සන්නිවේදනය කර ඇත්ද,
- අස්තිත්ත්වයේ ප්‍රමාණය, මෙහෙයුම් ව්‍යුහය, පාලන පරිසරය සහ නෛතික ව්‍යුහය.
- විශේෂ අරමුණු මූල්‍ය ප්‍රකාශ විගණනයක් වන අවස්ථාවක විගණක එලෙසම අස්තිත්ත්වයේ පොදු අරමුණු මූල්‍ය ප්‍රකාශ විගණනය කරන්නේද,

- නෛතික අවශ්‍යතාවයන් සමහර අධිකරණ බල ප්‍රදේශ තුළ පාලනය පිළිබඳ වගකිව යුතු අය සමඟ ලිඛිත සන්නිවේදනය කළ යුත්තේ දේශීය නීතියෙන් නියම කර ඇති ආකෘතියක් මගිනි.
- විගණක සමඟ කලින් කල සිදුකළ රැස්වීම් හෝ සන්නිවේදන පිළිබඳ එකඟ වීම් ඇතුළුව පාලනය පිළිබඳ වග කිව යුතු අයගේ අපේක්ෂාවන්.
- පාලනය පිළිබඳව වගකිව යුතු අය සමඟ විගණක දිගටම පවත්නා හමුවීම් සහ සංවාදවල ප්‍රමාණය.
- පාලක මණ්ඩලයේ සාමාජිකත්වය තුළ සැලකිය යුතු අන්දමේ වෙනස්වීම් සිදුවී ඇත්ද.

අ48. පාලනය පිළිබඳ වගකිව යුතු අයගේ, තනි සාමාජිකයෙක් සමඟ සැලකිය යුතු අන්දමේ කරුණක් සාකච්ඡා කළ විට, උදාහරණ ලෙස විගණන කමිටුවේ සභාපති විගණක එම කරුණක් සාරාංශගත කර පසුව පාලනය පිළිබඳව වගකිවයුතු සියලු අයට සන්නිවේදනය කිරීම යෝග්‍ය විය හැකි අතර එමගින් සම්පූර්ණ සහ සමබර තොරතුරු ඔවුන් හා සතුවේ.

*සන්නිවේදනයේ කල් යෙදුම (යොමුව: 21 වන ඡේදය)*

අ49. විගණනය පුරාවටම කාලානුරූපී සන්නිවේදනය පාලනය පිළිබඳ වගකිව යුතු අය සහ විගණක අතර ශක්තිමත් ද්වි-මාර්ග සංවාදයක් අත්කර ගැනීමට දායකවේ. කෙසේ වෙතත් යෝග්‍ය සන්නිවේදනය සඳහා කල් යෙදුම කාර්ය භාරයේ තත්ත්වය සමඟ වෙනස්වනු ඇත. අදාළ තත්ත්වයනට ඇතුළත් වන්නේ කරුණේ වැදගත්කම සහ ස්වභාවය සහ පාලනය පිළිබඳ වගකිව යුතු අය විසින් ගැනීමට අපේක්ෂා කරන ක්‍රියාමාර්ගවේ. උදාහරණ ලෙසඃ

- සැළසුම් කිරීමේ කටයුතු සම්බන්ධයෙන් සන්නිවේදනය බොහෝ විට සිදු කරන්නේ විගණන කාර්යයේ මුල් අවධිය තුළදී වන අතර සහ මූලික කාර්ය භාරයක් සඳහා එය සිදු කළ හැක්කේ කාර්යභාරයේ නියමයන් එකඟවීමේ කොටසක් ලෙස ය.
- ප්‍රායෝගිකවන වහාම විගණනය තුළදී මුහුණ පෑ සැලකිය යුතු අන්දමේ අපහසුතාවයන් සන්නිවේදනය කිරීම උචිතවිය හැකි අතර එය එසේ වන්නේ අපහසුතාවය විගණකට මැඩ පැවැත්වීම පාලනය පිළිබඳ වගකීම යුතු අයට උපකාරී විය හැකි නම් හෝ විකරණය කළ මතයට මඟ පෙන්වීමක් සිදු විය හැකි නම්ය. ඒ හා සමානව විගණක හඳුනාගත් අභ්‍යන්තර පාලනයේ සැලකිය යුතු ඌණතාවයන් ශ්‍රී.ලං.වි.ප්‍ර. 265[26] න් අවශ්‍ය කරන පරිදි ඒවා ලිඛිතව සන්නිවේදනය කිරීමට පෙර ප්‍රායෝගිකවන කලින්ම ලැබෙන අවස්ථාවේ පාලනය පිළිබඳ වග කිවයුතු අය සමඟ විගණක වාචිකව සන්නිවේදනය කළ හැකිය.
- ශ්‍රී.ලං.වි.ප්‍ර. 701 ව්‍යවහාර වනවිට, විගණකගේ සැළසුම් කළ විෂය පථය සහ කල් යෙදුම සාකච්ඡා කරන විට ප්‍රධාන විගණන කරුණු පිළිබඳ මූලික අදහස් විගණක සන්නිවේදනය කළ හැකිය. (අ 13 ඡේදය බලන්න), සහ සැළකිය යුතු අන්දමේ විගණන සොයා ගැනීම් පිළිබඳ විගණක සන්නිවේදනය කිරීමේදී, එවැනි කරුණු තවදුරටත් සාකච්ඡා කිරීමට වඩා නිරතුරු සන්නිවේදන විගණකට එලෙසම තිබිය හැකිය.
- ස්වාධීනත්වය සම්බන්ධයෙන් සන්නිවේදනය යෝග්‍ය විය හැක්කේ ස්වාධීනත්වයට තර්ජන සහ සම්බන්ධිත ආරක්ෂණයන් පිළිබඳව ඕනෑම අවස්ථාවක සැලකිය යුතු අන්දමේ විනිශ්චයක් සිදුකරන විටය; උදාහරණ ලෙස විගණක - නොවන සේවාවන් ලබාදීමට කාර්යභාරයක් භාරගන්නා විට අවසාන සාකච්ඡාවේදී
- අස්තිත්ත්වයේ ගිණුම්කරණ පරිචයේ ගුණාත්මක අංග පිළිබඳ විගණකගේ අදහස් ඇතුළත්, විගණනය තුළින් සොයා ගැනීම් සම්බන්ධයෙන් සන්නිවේදනවල අවසාන සාකච්ඡාවේ කොටසක් ලෙස ඉදිරිපත් කළ හැකිය.

*සන්නිවේදන ක්‍රියාවලියේ ප්‍රමාණාත්මකභාවය (යොමුවඃ 22 ඡේදය)*

අ50. සන්නිවේදනයේ කල් යෙදුමට අදාළ විය හැකි එම වෙනත් සාධක වලට ඇතුළත් විය හැක්කේ;

---
[26] ශ්‍රී.ලං.වි.ප්‍ර. 265 9 සහ අ 14 ඡේද

- විගණනය කරනු ලබන අස්තිත්ත්වයේ විශාලත්වය මෙහෙයුම් ව්‍යුහය පාලන පරිසරය සහ නෛතික ව්‍යුහය.
- නිශ්චය කරන ලද කාල රාමුව ඇතුළත සමහර කරුණු සන්නිවේදනය කිරීමට වන යම් නෛතික බැඳියාවක්.
- විගණක සමග කලින් කලට රැස්වීම් හෝ සන්නිවේදන සඳහා යොදාගත් එකගවීම් අතුළත්ව, පාලනය පිළිබඳ වගකිව යුතු අයගේ අපේක්ෂාවන්.
- සමහර කරුණු විගණක හඳුනාගත් වේලාවන්, උදාහරණ ලෙස විශේෂ කරුණක් වැළැක්වීමට ක්‍රියාමාර්ගයක් ගැනීමට කල් වේලා ඇතිව හඳුනා ගැනීමට විගණකට නොහැකි විය හැකිය. උදාː නීතියක් සමඟ අනුකූල නොවීම එහෙත් එම කරුණ සන්නිවේදනය කිරීමෙන් නිවැරදිව කිරීමේ ක්‍රියාමාර්ග ගැනීමට හැකිවනු ඇත.

අ51. විගණක සහ පාලනය පිළිබඳ වගකිව යුතු අය අතර ද්වි-මාර්ග සන්නිවේදනය ඇගයීමට සහාය දෙන විශේෂිත ක්‍රියාපටිපාටි විගණක සැළසුම් කිරීම අවශ්‍ය නොවේ. වඩා හොඳ විකල්පයක් වශයෙන් එම ඇගයීම වෙනත් අරමුණු සඳහා ඉටු කළ විගණන ක්‍රියාපටිපාටි වලින් ඵලයක් වන නිරීක්ෂණ මත පදනම් විය හැකිය. එවැනි නිරීක්ෂණ වලට ඇතුළත් විය හැක්කේ;

- විගණක විසින් මතුකළ කරුණු වලට ප්‍රතිචාර වශයෙන් පාලනය පිළිබඳ වගකිව යුතු අය ගත් ක්‍රියාමාර්ගවල යෝග්‍ය භාවය සහ කාලානුරූපී බව කලින් සන්නිවේදන තුළදී මතුකළ සැලකිය යුතු අන්දමේ කරුණු සමග සඵලදායී ලෙස කටයුතු කර නොමැති අවස්ථාවකදී, යෝග්‍ය පියවර ගෙන නොමැත්තේ මන්ද යන්න විමසීම විගණකට උචිත විය හැකිය, සහ මෙම කරුණ නැවත මතු කිරීම. මෙම කරුණ ප්‍රමාණවත් ලෙස ආමන්ත්‍රණය කර ඇතැයි හෝ තවදුරටත් වැදගත් නොවන බවට විගණක සෑහීමකට පත්ව ඇතැයි හැඟීමක් දීමේ අවදානම මෙමඟින් වැළකේ.
- පාලනය පිළිබඳ වගකිව යුතු අය විගණක සමග ඔවුන්ගේ සන්නිවේදනයේ පැහැදිලිව පෙනෙන විවෘතභාවය.
- පාලනය පිළිබඳ වගකිව යුතු අයට කළමනාකරණයේ පෙනී සිටීමක් නොමැතිව විගණක සමග හමුවීමට ඇති කැමැත්ත සහ හැකියාව.
- විගණක විසින් මතු කළ කරුණු සම්පූර්ණයෙන්ම අවබෝධ කර ගැනීමට පාලනය පිළිබඳ වගකිව යුතු අයට ඇති පැහැදිලිව පෙනෙන හැකියාව. උදාහරණ ලෙස පාලනය පිළිබඳ වගකිව යුතු අයට කළ නිර්දේශ තුළ ප්‍රශ්නවලට සහ ගැටළුවලට පරීක්ෂා කරන ප්‍රමාණය.
- සන්නිවේදනයේ ආකාරය කල් යෙදුම සහ අපේක්ෂිත පොදු අන්තර්ගතය අන්‍යෝන්‍ය අවබෝධයක් පාලනය පිළිබඳ වගකිව යුතු අය සමග පිහිටුවීමට වන අපහසුතාවය.
- පාලනය පිළිබඳ වගකිව යුතු සියල්ලට හෝ ඉන් කොටසක් අස්තිත්ත්වය පාලනය කිරීමේදී සහභාගීවන අවස්ථාවක, විගණක සමග කරුණු සාකච්ඡා කරන්නේ කෙසේ ද යන්න පිළිබඳව ඔවුන්ගෙන් පැහැදිලිව පෙනෙන දැනුවත් බව ඔවුන්ගේ පුළුල් පාලන වගකීමට, අමතරව ඔවුන්ගේ කළමනාකාරීත්වය වගකීම්වලට බලපායි.
- විගණක සහ පාලනය පිළිබඳ වගකිවයුතු අතර ද්වි-මාර්ග සන්නිවේදනය උචිත නෛතික හා නියාමන අවශ්‍යතාවයන් සපුරාලන්නේද යන වග.

අ52. 4 වන ඡේදයේ අවධානයට ලක් වූ පරිදි, සඵලදායක ද්වි-මාර්ග සන්නිවේදනය විගණක සහ පාලනය පිළිබඳ වගකීම දරන අය හා දෙපාර්ශ්වයටම සහාය වේ. තවද අභ්‍යන්තර විගණනය සහ බාහිර විගණකවරුන්ගේ අන්තර් ක්‍රියාකාරිත්වය ඇතුළුව පාලනය පිළිබඳ වගකිව යුතු අය සමග සහභාගිත්වය මගින් අස්තිත්ත්වයේ පාලන පරිසරයේ මූලිකාංගයක් ලෙස ශ්‍රී.ල.වි.ප්‍ර. 315 (සංශෝධිත) හඳුනා ගනී.[27] අසතුටුදායක පාලන පරිසරය සහ ප්‍රමාණාත්මක අවප්‍රකාශයන්හි අවදානමේ විගණකගේ තක්සේරුවේ ඇති බලපෑම ප්‍රමාණවත්නොවන ද්වි-මාර්ග සන්නිවේදනය, ඉඟි කළ හැකිය. විගණක මූල්‍ය ප්‍රකාශ මත මතයක් ඇතිකර ගැනීමට ප්‍රමාණවත් යෝග්‍ය විගණන සාක්ෂි විගණක ලබා නොගෙන ඇතැයි යන අවදානම ද එසේම පවතී.

---

27 ශ්‍රී.ල.වි.ප්‍ර. 315 (සංශෝධිත) අ78 ඡේදය.

අ53. විගණක සහ පාලනය පිළිබඳ වගකිව යුතු අය අතර ද්වි-මාර්ග සන්නිවේදනයට ප්‍රමාණවත් නොවන සහ තත්ත්වය විසඳා ගත නොහැකිවිට විගණක පහත දක්වෙන දෑ වැනි ක්‍රියාමාර්ග ගත හැකිය.

- විෂය පථයේ සීමා කිරීමේ පදනම මත විගණකගේ මතය විකරණය කිරීම.
- වෙනස් ආකාරයේ ක්‍රියාමාර්ගයන්හි ප්‍රතිඵල පිළිබඳ නීති උපදෙස් ලබාගැනීම.
- තුන්වන පාර්ශවට (උදා: නියාමකයෙක්) හෝ අස්තිත්ත්වයට බාහිර පාලන ව්‍යුහයක ඉහළ අධිකාරිය එනම් ව්‍යාපාරයක අයිතිකරුවන් වැනි (උදා: මහා සභා රැස්වීමක කොටස් හිමියන් හෝ රජයේ වගකිව යුතු අමාත්‍යවරයෙක් හෝ රාජ්‍ය අංශයේ පාර්ලිමේන්තුව සමඟ සන්නිවේදනය කිරීම.
- කාර්ය භාරයෙන් ඉවත් වීම, අදාළ වන නීතිය හෝ රෙගුලාසි යටතේ ඉවත් විය හැකි අවස්ථාවක

**ලේඛන ගත කිරීම (යොමුව 23 වන ඡේදය)**

අ54. වාචික සන්නිවේදනය ලේඛනගත කිරීමට ඇතුළත් විය හැක්කේ අස්තිත්වය විසින් පිළියෙල කළ වාර්තාවක පිටපතක්, විගණන ලේඛන ගත කිරීමක කොටසක් ලෙස රඳවා ගෙන ඇති, එම වාර්තා උචිත සන්නිවේදනයේ ලේඛනයක් වන විට

**පරිශිෂ්ඨ 1**

**(යොමුව: 3 වන ඡේදය)**

## පාලනය පිළිබඳ වගකිව යුතු අය සමඟ සන්නිවේදනයට යොමුකරන SLSQC 1 සහ වෙනත් ශ්‍රී.ලං.වි.ප්‍ර. හි විශේෂිත අවශ්‍යතාවයන්

පාලනය පිළිබඳ වගකිව යුතු අයට විශේෂිත කරුණු සන්නිවේදනයට අවශ්‍ය SLQC 1[1] සහ වෙනත් ශ්‍රී.ල.වි.ප්‍ර.යන්හි ඡේද මෙම පරිශිෂ්ඨය හඳුනා ගනී. අවශ්‍යතාවයන් සහ සම්බන්ධිත ව්‍යවහාරයන් සහ ශ්‍රී.ලං.වි.ප්‍ර. යන්හි පැහැදිලි කිරීමේ කරුණු සැළකිල්ලට ගැනීමේදී මෙම ලැයිස්තුව ආදේශනයක් නොවේ.

- SLSQC 1, *මූල්‍ය ප්‍රකාශ විගණනය සහ සමාලෝචන සහ වෙනත් සහතික කිරීමේ සහ සම්බන්ධිත සේවා කාර්ය භාර ඉටු කරන සමාගම් සඳහා තත්ත්ව පාලනය* - 30 (අ) ඡේදය.
- ශ්‍රී.ලං.වි.ප්‍ර. 240, *මූල්‍ය ප්‍රකාශ විගණනයේදී වංචා වලට සම්බන්ධිත විගණකගේ වගකීම්* - 21, 38 (ඇ) (i) සහ 40 - 42 ඡේද
- ශ්‍රී.ලං.වි.ප්‍ර. 250, *මූල්‍ය ප්‍රකාශ විගණනයකදී නීති සහ රෙගුලාසි සැළකිල්ලට ගැනීම* - 14, 19 සහ 22 - 24 ඡේද
- ශ්‍රී.ලං.වි.ප්‍ර. 265, *පාලනය පිළිබඳ වගකිව යුතු අය සහ කළමනාකරණයට අභ්‍යන්තර පාලනයේ ඌණතා සන්නිවේදන කිරීම* - 9 වන ඡේදය.
- ශ්‍රී.ලං.වි.ප්‍ර. 450, *විගණනය තුළදී හඳුනාගත් අවප්‍රකාශ අගය කිරීම* - 12 - 13 ඡේද
- ශ්‍රී.ලං.වි.ප්‍ර. 505, *බාහිර තහවුරු කිරීම* - 9 වන ඡේදය
- ශ්‍රී.ලං.වි.ප්‍ර. 510ල *මූලික විගණන කාර්ය භාර - ආරම්භක ශේෂ* - 7 වන ඡේදය
- ශ්‍රී.ලං.වි.ප්‍ර. 550, *සම්බන්ධිත පාර්ශව* - 27 වන ඡේදය
- ශ්‍රී.ලං.වි.ප්‍ර. 560 *පසුව සිදුවන සිද්ධීන්* - 7(ආ) - (ඇ), 10(අ), 13 (ආ), 14 (අ) සහ 17 වන ඡේද
- ශ්‍රී.ලං.වි.ප්‍ර. 570 (සංශෝධිත) අඛණ්ඩ පැවැත්ම - 25 වන ඡේදය
- ශ්‍රී.ලං.වි.ප්‍ර. 600 *විශේෂ සළකා බැලීම් - සමූහ මූල්‍ය ප්‍රකාශ විගණනය (සංරචක විගණකවරුන්ගේ වැඩ ඇතුළත්ව)* - 49 වන ඡේදය.

---

1 SLSQC1 *මූල්‍ය ප්‍රකාශ විගණනය සහ සමාලෝචන සහ වෙනත් සහතික වීම් සහ සම්බන්ධිත සේවා කාර්ය භාර ඉටුකරන සමාගම් සඳහා තත්ත්ව පාලනය.*

- ශ්‍රී.ලං.වි.ප්‍ර. 610 (සංශෝධිත) *අභ්‍යන්තර විගණකවරුන්ගේ වැඩ ප්‍රයෝජනයට ගැනීම* - 18 වන ඡේදය; ශ්‍රී.ලං.වි.ප්‍ර. 610 (සංශෝධිත 2013) *අභ්‍යන්තර විගණකවරුන්ගේ වැඩ ප්‍රයෝජනයට ගැනීම* - 20 සහ 31 වන ඡේද
- ශ්‍රී.ලං.වි.ප්‍ර. 700, (සංශෝධිත) *මූල්‍ය ප්‍රකාශ මත මතයක් සකස් කර ගැනීම සහ වාර්තා කිරීම* - 46 වන ඡේදය.
- ශ්‍රී.ලං.වි.ප්‍ර. 701, *ස්වාධීන විගණකගේ වාර්තාවේ ප්‍රධාන විගණන කරුණු සන්නිවේදනය* - 17 වන ඡේදය.
- ශ්‍රී.ලං.වි.ප්‍ර. 705, (සංශෝධිත) *ස්වාධීන විගණකගේ වාර්තාවේ මතයට කරනු ලබන විකරණය කිරීම්* - 12, 14, 23 යන 30 වන ඡේද.
- ශ්‍රී.ලං.වි.ප්‍ර. 706, (සංශෝධිත) *ස්වාධීන විගණකගේ වාර්තාවේ කරුණු අවධාරණය කිරීමේ ඡේද සහ වෙනත් කරුණු ඡේද* - 12 වන ඡේදය
- ශ්‍රී.ලං.වි.ප්‍ර. 710, *සන්සන්දනාත්මක තොරතුරු - අනුරූපී සංඛ්‍යා සහ සන්සන්දනාත්මක මූල්‍ය ප්‍රකාශ* - 18 වන ඡේදය.
- ශ්‍රී.ලං.වි.ප්‍ර. 720, (සංශෝධිත) *වෙනත් තොරතුරු වලට සම්බන්ධිත විගණකගේ වගකීම්* - 17 - 19 ඡේද.

**2 වන පරිශිෂ්ඨය**

**(යොමුව: 16 (අ) අ 19- අ 20 ඡේද**

## ගිණුම්කරණ පරිචයේ ගුණාත්මක අංග

16 (අ) ඡේදය මගින් අවශ්‍යකරණ සහ අ 19 - අ 20 ඡේද තුළ සාකච්ඡා කළ සන්නිවේදනයට - පහත දැ වැනි කරුණු ඇතුළත්විය හැකිය.

## ගිණුම්කරණ ප්‍රතිපත්ති

- අස්තිත්ත්වයේ මූල්‍ය ප්‍රකාශ පරිශීලකයනට ඇතිවිය හැකි ප්‍රතිලාභ සමග තොරතුරු ලබාදීමේ පිරිවැය සංතුලනය කිරීමේ අවශ්‍යතාවය සැලකිල්ලට ගෙන අස්තිත්ත්වයේ විශේෂ තත්ත්වයනට ගිණුම්කරණ ප්‍රතිපත්තිවල යෝග්‍යතාවය. පිළිගත හැකි අවස්ථාවලදී විකල්ප ගිණුම්කරණ ප්‍රතිපත්ති පවතී, සන්නිවේදනයට ඇතුළත් විය හැක්කේ වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති තෝරා ගැනීම ඊට අමතරව එක හා සමාන අස්තිත්ත්ව විසින් භාවිත කරන ගිණුම්කරණ ප්‍රතිපත්තිවල තොරතුරු මූල්‍ය ප්‍රකාශයේ අයිතම වලට වන බලපෑම හඳුනාගැනීම, ඇතුළත් විය හැකිය. නව ගිණුම්කරණ ප්‍රකාශ ව්‍යවහාරකරණය ද ඇතුළත්ව; වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවල මූලික තෝරාගැනීම සහ වෙනස් කිරීම් සන්නිවේදනයට ඇතුළත් විය හැක්කේ; අස්තිත්වයේ වර්තමාන සහ අනාගත ඉපයීම් මත ගිණුම්කරණ ප්‍රතිපත්ති තුළ වෙනසක් අනුගමන කරන ක්‍රමය සහ කල් යෙදුම සහ අපේක්ෂිත නව ගිණුම්කරණ ප්‍රකාශවලට සම්බන්ධිත ගිණුම්කරණ ප්‍රතිපත්තිවල වෙනස් වීමක කල්යෙදුමේ බලපෑමය.
- මතභේදයට තුඩු දෙන හෝ මතු වී එන ක්ෂේත්‍රවල (කර්මාන්තයකට) අනන්‍ය විශේෂයෙන්ම අධිකාරීමය උපදේශන හෝ එකග වීමක් නොමැති, වැදගත් ගිණුම් ප්‍රතිපත්ති වල බලපෑම)
- ගණුදෙනු සටහන් කළ කාලපරිච්ඡේදයට සම්බන්ධිත කල්යෙදුමේ බලපෑම.

## ගිණුම්කරණ ඇස්තමේන්තු

- ඇස්තමේන්තු සැලකිය යුතුවන අයිතම සඳහා, ශ්‍රී.ලං.වි.ප්‍ර. 540[1] හි සාකච්ඡා කළ ගැටළු පහත ද, ඇතුළුව උදාහරණ ලෙස;
    - o මූල්‍ය ප්‍රකාශවල හඳුනාගත යුතු හෝ හෙළිදරව් කළ යුතු ගිණුම්කරණ ඇස්තමේන්තු සඳහා අවශ්‍යතාවය ඇතිවිය හැකි සිද්ධීන් සහ තත්ත්වයන් ඇති ගණුදෙනු කළමනාකාරීත්වය හඳුනා ගන්නේ කෙසේද,
    - o නව හෝ පවතින ගිණුම්කරණ ඇස්තමේන්තුව සංශෝධනය කිරීමට හේතු විය හැකි තත්ත්වයන්හි වෙනස්වීම්,
    - o අදාළ මූල්‍ය වාර්තාකරණය ආකෘතිමය රාමුවට අනුකූලව මූල්‍ය ප්‍රකාශ තුළ ගිණුම්කරණ ඇස්තමේන්තු හඳුනා ගත යුතුද හෝ හඳුනා නොගත යුතු ද යන කළමනාකාරීත්වයේ තීරණය.

1 ශ්‍රී.ලං.වි.ප්‍ර. 540 *සාධාරණ අගය ගිණුම්කරණ ඇස්තමේන්තු සහ සම්බන්ධිත හෙළිදරව් කිරීම් ඇතුළුව ගිණුම්කරණ ඇස්තමේන්තු විගණනය.*

- o ගිණුම්කරණ ඇස්තමේන්තු කිරීම සඳහා ක්‍රම තුළ පූර්ව කාලපරිච්ඡේදවලින් වෙනස්වීමක් සිදුකර ඇතිද හෝ සිදුකළ යුතුව තිබුණද සහ එසේ වුනි නම් සහ එසේ කළේ කුමක් නිසාද, මීට අමතරව පූර්ව කාලපරිච්ඡේදවල ගිණුම්කරණ ඇස්තමේන්තුවල ප්‍රතිඵලය.
- o ගිණුම්කරණ ඇස්තමේන්තු කිරීම හා තෝරාගත් මිනුම්කරණ පදනම අදාළ මූල්‍ය වාර්තාකරණ ආකෘතිමය රාමුවට අනුකූලද යන්න ඇතුළුව ගිණුම්කරණ ඇස්තමේන්තු කිරීම සඳහා කළමනාකරණයේ ක්‍රියාවලිය (උදා: කළමනාකරණය ආකෘතියක් භාවිත කළ විට)
- o ගිණුම්කරණ ඇස්තමේන්තු සංවර්ධනය කිරීමේ කළමනාකාරීත්වය විසින් භාවිතකළ සැලකිය යුතු අන්දමේ උපකල්පන සාධාරණ ද යන්න.
- o අදාළ මූල්‍ය වාර්තාකරණ ආකෘතිමය රාමුවේ යෝග්‍ය ව්‍යවහාරකරණය හෝ කළමනාකරණය විසින් භාවිත කළ සැලකිය යුතු අන්දමේ උපකල්පනයන්හි සාධාරණ භාවයට අදාළ වන අවස්ථාවක විශේෂ ක්‍රියාමාර්ගයක් ක්‍රියාත්මක කිරීමට කළමනාකාරීත්වයේ අභිප්‍රාය සහ එසේ කිරීමට එහි හැකියාව.
- o ප්‍රමාණාත්මක අවප්‍රකාශයක අවදානම.
- o කළමනාකාරීත්වයට පක්ෂපාතී විය හැකි සුචක.
- o කළමනාකාරීත්වය විකල්ප උපකල්පන හෝ ප්‍රතිඵල සැලකිල්ලට ගන්නේ කෙසේද සහ ඒවා ප්‍රතික්ෂේප කරන්නේ මන්ද හෝ ගිණුම්කරණ ඇස්තමේන්තු කිරීමේදී අනියතතාවය ඇස්තමේන්තුවේ කළමනාකාරීත්වය අන්වශයෙන් ඇස්තමේන්තු කරන්නේ කෙසේ ද?
- o මූල්‍ය ප්‍රකාශවල අනියතතාවය ඇස්තමේන්තු කිරීම හෙළිදරව් කිරීමේ ප්‍රමාණවත් බව.

## මූල්‍ය ප්‍රකාශ හෙළිදරව් කිරීම්

- විශේෂයෙන්ම සංවේදී මූල්‍ය ප්‍රකාශ හෙළිදරව් කිරීම විධිමත්ව සකස් කිරීමේ දී මුහුණදුන් ප්‍රශ්න සහ සිදුකළ සම්බන්ධිත විනිශ්චයන් (උදා: අයභාරය හඳුනා ගැනීම, පාරිශ්‍රමික අඛණ්ඩ පැවැත්ම, පසුව සිදු වූ සිද්ධීන් සහ අසම්භාව්‍ය ප්‍රශ්න සම්බන්ධිත හෙළිදරව් කිරීම්).
- මූල්‍ය ප්‍රකාශවල හෙළිදරව් කිරීමෙහි සමස්ථ මධ්‍යස්ථබව, සංගතභාවය සහ පැහැදිලි තත්ත්වය.

## සම්බන්ධිත කරුණු

- මූල්‍ය ප්‍රකාශවල හෙළිදරව් කළ තීන්දුවකට එළඹීමට නියමිත නඩුවක්, වැනි සැලකිය යුතු අන්දමේ අවදානම්, නිරාවරණය වීම් සහ අනියතතා මූල්‍ය ප්‍රකාශ මත භව්‍ය බලපෑම්.
- අස්තිත්ත්වය සඳහා සාමාන්‍ය ව්‍යාපාර කටයුතු වලින් බාහිර වන හෝ අන් අයුරකින් අසාමාන්‍ය ලෙස පෙනුමැති එම සැලකිය යුතු අන්දමේ ගණුදෙනු මගින් මූල්‍ය ප්‍රකාශවලට වන බලපෑමේ ප්‍රමාණය, මෙම සන්නිවේදනට පහත දෑ මතුකර දැක්විය හැකිය:
  - o කාලපරිච්ඡේදය තුළදී හඳුනාගත් පුනරාවර්තනය නොවන වට්නාකම්,
  - o මූල්‍ය ප්‍රකාශ තුළ වෙනම හෙළිදරව් කළ එවැනි ගණුදෙනුවල ප්‍රමාණය,
  - o එවැනි ගණුදෙනු පෙනෙන පරිදි සැළසුම් කර ඇත්තේ විශේෂ ගිණුම්කරණ හෝ බදු සැලකිල්ලට ගැනීමට හෝ විශේෂ නෛතික හෝ නියාමන අරමුණු අත්කර ගැනීම සඳහාද,
  - o එවැනි ගණුදෙනුවල ස්වරූපය වැඩිපුර සංකීර්ණ ලෙස දිස්වෙන සේ හෝ පුලුල්වන විට ගණුදෙනු ව්‍යුහගත කිරීම සම්බන්ධයෙන් උපදෙස් ලබාගන්නේද,
  - o ගණුදෙනුවක පාදකවන ආර්ථික තත්ත්වයට වඩා විශේෂ ගිණුම්කරණ සැලකිල්ලක අවශ්‍යතාවය මත වැඩි අවධානයන් කළමනාකාරීත්වය තබන අවස්ථාවන්.
- ස්පෘශ්‍ය සහ අස්පෘශ්‍ය වත්කම්වලට නියමකළ ප්‍රයෝජ්‍ය ජීව කාල නිර්ණය කිරීම සඳහා අස්තිත්ත්වයේ පදනම් ඇතුළුව වත්කම් සහ වගකීම්වල ධාරණ අගය සඳහා බලපාන සාධක ධාරණ අගයන්ට බලපාන සාධක තෝරා ගත්තේ කෙසේද සහ විකල්ප තේරීම් මූල්‍ය ප්‍රකාශවලට කෙසේ බල පා හැකිද යන්න මෙම සන්නිවේදනයට පැහැදිලි කළ හැකිය.

තෝරාගත් අවප්‍රකාශ නිවැරදි කිරීම, උදාහරණ ලෙස වාර්තා වූ ඉපයීම් වැඩිවීමේ බලපෑම් සහිත අවප්‍රකාශ නිවැරදි කිරීම එහෙත් වාර්තා වූ ඉපයීම් අඩුවීමේ බලපෑමක් ඇති අවප්‍රකාශ නිවැරදි නොකිරීම.

## ශ්‍රී ලංකා විගණන ප්‍රමිත 570 (සංශෝධිත)

## අඛණ්ඩ පැවැත්ම

(2018 මාර්තු 31 වැනි දින හෝ ඉන් පසු අවසන් වන
කාලපරිච්ඡේදවල මූල්‍ය ප්‍රකාශ විගණන සඳහා බලපැවැත්වේ)

පටුන

ඡේදය

**හැඳින්වීම**


| | |
|---|---|
| මෙම ශ්‍රී.ල.වි.ප්‍ර. හි විෂයය පථය | 1 |
| අඛණ්ඩ පැවැත්ම පදනම අනුව ගිණුම්කරණය | 2 |
| අඛණ්ඩ පැවැත්ම ලෙස නොකඩවා පවත්වාගෙන යාමට අස්තිත්ත්වයේ හැකියාව තක්සේරු කිරීම සඳහා වගකීම | 3-7 |
| බල පැවැත්වෙන දිනය | 8 |
| **අරමුණු** | 9 |
| **අවශ්‍යතාවයන්** | |
| අවදානම් තක්සේරු ක්‍රියාපටිපාටි සහ සම්බන්ධිත ක්‍රියාකාරකම් | 10-11 |
| කළමනාකාරිත්වයේ තක්සේරුව අගය කිරීම | 12-14 |
| කළමනාකාරීත්වයේ තක්සේරුවෙන් ඔබ්බටවන කාලපරිච්ඡේදය | 15 |
| සිද්ධීන් හෝ පවත්නා තත්ත්වයන් හඳුනාගත් විට වැඩි දුරට වන විගණන ක්‍රියාපටිපාටි | 16 |
| විගණක නිගමන | 17-20 |
| විගණකගේ වාර්තාව සඳහා හඟවනු ලබන දෑ | 21-24 |
| පාලනය සඳහා වගකිව යුතු අය සමඟ සන්නිවේදනය | 25 |
| මූල්‍ය ප්‍රකාශ අනුමත කිරීමේදී සිදුවන සැලකිය යුතු අන්දමේ ප්‍රමාද | 26 |
| **භාවිත කිරීමේ සහ වෙනත් පැහැදිලි කිරීමේ කරුණු** | |
| මෙම ශ්‍රී.ල.වි.ප්‍ර. යේ විෂයය පථය | අ1 |
| අඛණ්ඩ පැවැත්ම පදනම අනුව ගිණුම්කරණය | අ2 |
| අවදානම් තක්සේරු ක්‍රියාපටිපාටි සහ සම්බන්ධ ක්‍රියාකාරකම් | අ3-අ7 |
| කළමනාකාරීත්වයේ තක්සේරුව අගය කිරීම | අ8-අ13 |
| කළමණාකාරිත්වයේ තක්සේරුවෙන් ඔබ්බට වන කාලපරිච්ඡේදය | අ14-අ15 |
| සිද්ධීන් හෝ පවත්නා තත්ත්වයන් හඳුනාගත් විට වැඩිදුරටත් වන විගණන ක්‍රියාපටිපාටි | අ16-අ20 |
| විගණක නිගමන | අ21-අ25 |
| විගණකගේ වාර්තාව සඳහා හඟවනු ලබන දෑ | අ26-අ35 |
| පරිශිෂ්ඨය : අඛණ්ඩ පැවැත්මට සම්බන්ධිත විගණකගේ වාර්තාවල නිදර්ශන | |

ශ්‍රී ලංකා විගණන ප්‍රමිත (ශ්‍රී.ල.වි.ප්‍ර.) 570 (සංශෝධිත) *අඛණ්ඩ පැවැත්ම*, කියවිය යුත්තේ ශ්‍රී.ල.වි.ප්‍ර. 200, *ස්වාධීන විගණකගේ සමස්ථ අරමුණු සහ ශ්‍රී ලංකා විගණන ප්‍රමිත ප්‍රකාර විගණනයක් මෙහෙයවීම සම්බන්ධ කිරීමෙනි.*

## හැඳින්වීම

## මෙම ශ්‍රී.ල.වි.ප්‍ර. යේ විෂයය පථය

1. මෙම ශ්‍රී ලංකා විගණන ප්‍රමිතයෙන් (ශ්‍රී.ල.වි.ප්‍ර.) මූල්‍ය ප්‍රකාශ විගණනයක් තුළදී, අඛණ්ඩ පැවැත්ම සම්බන්ධිතව සහ විගණකගේ වාර්තාවේ හඟවනු ලබන දෑ සඳහා විගණකගේ වගකීම් සඳහා කටයුතු කෙරේ. (යොමුවඃ අ1 ඡේදය)

## අඛණ්ඩ පැවැත්ම පදනම මත ගිණුම්කරණය

2. අඛණ්ඩව පදනම මත ගිණුම්කරණ යටතේ මූල්‍ය ප්‍රකාශ පිළියෙල කරන්නේ අස්තිත්ත්වය අඛණ්ඩව පවතින සහ එහි මෙහෙයුම් පූර්ව දෘශ්‍ය අනාගතයක් සඳහා දිගටම පවත්වාගෙන යනු ඇතැයි යන පදනම මතය. එක්කෝ කළමනාකාරීත්වය අස්තිත්ත්වය ඈවර කිරීමට අදහස් කරන්නේ හෝ එහි මෙහෙයුම් කටයුතු නතර කිරීමට හෝ එසේ කිරීමට හැර වෙන යථාර්ථවාදී විකල්පයක් නොමැති නම් හැර පොදු අරමුණු මූල්‍ය ප්‍රකාශ පිළියෙල කරන්නේ අඛණ්ඩ පැවැත්ම පදනම ගිණුම්කරණය භාවිත කරමින්ය. අඛණ්ඩ පැවැත්ම පදනම ගිණුම්කරණය අදාළවන මූල්‍ය වාර්තාකරණ ආකෘතිමය රාමුව සමග අනුකූලව විශේෂ අරමුණු මූල්‍ය ප්‍රකාශ පිළියෙල කිරීම හෝ පිළියෙල නොකිරීම සිදුවිය හැකිය. (උදාඃ විශේෂ අධිකරණ බල ප්‍රදේශ තුළ බදු පදනම මත පිළියෙල කරන සමහර මූල්‍ය ප්‍රකාශ සඳහා අඛණ්ඩ පදනම මත ගිණුම්කරණය අදාළ නොවේ) අඛණ්ඩ පදනම ගිණුම්කරණය භාවිත කිරීම යෝග්‍යවන විට, වත්කම් සහ වගකීම් සටහන් කරන්නේ එහි වත්කම් උපලබ්ධි කර ගැනීමට සහ එහි වගකීම් නිදහස් කිරීමට සාමාන්‍ය ව්‍යාපාර ක්‍රියාමාර්ගය තුළදී අස්තිත්ත්වයට හැකිවනු ඇතැයි යන පදනම මතය. (යොමුවඃ අ2 ඡේදය)

## අඛණ්ඩ පැවැත්ම ලෙස දිගටම පවත්වාගෙන යාමට අස්තිත්ත්වයේ හැකියාව තක්සේරු කිරීම සඳහා වගකීම.

3. අඛණ්ඩ පැවැත්ම, දිගටම පවත්වාගෙන යාමට අස්තිත්ත්වයේ හැකියාවේ විශේෂිත තක්සේරුවක් කළමනාකාරීත්වයට සිදු කිරීම සඳහා ඉතා පැහැදිලි අවශ්‍යතාවයක් සහ අඛණ්ඩ පැවැත්ම සමග සම්බන්ධයෙන් සැලකිය යුතු සහ හෙළිදරව් කළ යුතු කරුණු සම්බන්ධයෙන් ප්‍රමිත සමහර මූල්‍ය වාර්තාකරණ ආකෘතිමය රාමුවල අඩංගු වේ. උදාහරණ ලෙස අඛණ්ඩ පැවැත්ම ලෙස දිගටම පවත්වාගෙන යාමට අස්තිත්ත්වයකට ඇති හැකියාව පිළිබඳ තක්සේරුවක් කළමනාකාරීත්වයට සිදුකිරීම ශ්‍රී ලංකා විගණන ප්‍රමිත 1 (LKAS) න් අවශ්‍ය කෙරේ.[1] අඛණ්ඩ පැවැත්ම ලෙස දිගටම පවත්වාගෙන යාමට අස්තිත්ත්වයේ හැකියාව තක්සේරු කිරීමට කළමනාකාරීත්වයේ වගකීම සම්බන්ධයෙන් විස්තරාත්මක අවශ්‍යතාවයන් සහ සම්බන්ධිත මූල්‍ය ප්‍රකාශවල හෙළිදරව් කිරීමද එසේම නීතිය හෝ රෙගුලාසි මගින් නියමකර තිබිය හැකිය.

4. වෙනත් මූල්‍ය වාර්තාකරණ ආකෘතිමය රාමුවල අඛණ්ඩ පැවැත්ම දිගටම පවත්වාගෙන යාමට අස්තිත්ත්වයේ හැකියාවට විශේෂිත තක්සේරුවක් සිදු කිරීමට කළමනාකාරීත්වයට ඉතා පැහැදිලි අවශ්‍යතාවයක් නොතිබිය හැකිය. කෙසේ වෙතත් 2 වන ඡේදය තුළ සාකච්ඡා කළ පරිදි මූල්‍ය ප්‍රකාශ පිළියෙල කිරීමේ මූලික මූලධර්මයන් වන අඛණ්ඩ පැවැත්ම පදනම ගිණුම්කරණය වන අවස්ථාවක, මූල්‍ය ප්‍රකාශ පිළියෙල කිරීමේදී අඛණ්ඩ පැවැත්ම ලෙස දිගටම පවත්වාගෙන යාමේ අස්තිත්ත්වයේ හැකියාව කළමනාකාරීත්වය තක්සේරු කිරීම එසේ සිදුකළ යුතු යයි ඉතා පැහැදිලිව මූල්‍ය වාර්තාකරණ ආකෘතිමය රාමුවක ඇතුළත්ව නොතිබුනේ වුවද කළමනාකාරීත්වය එසේ තක්සේරු කිරීම අවශ්‍ය වේ.

5. අඛණ්ඩ පැවැත්ම ලෙස දිගටම පවත්වාගෙන යාමට අස්තිත්ත්වයේ හැකියාවේ කළමනාකාරිත්වයේ තක්සේරුවට කාලයේ එක්තරා අවස්ථාවක අනාගත සිද්ධීන් හෝ පවතින තත්ත්වයන්ගේ විනිශ්චයක් ගැනීම සම්බන්ධ වේ. එම විනිශ්චය සඳහා පහත දක්වෙන සාධක අදාළ වේ:

- සිද්ධියක හෝ පවත්නා තත්ත්වයක ප්‍රතිඵලය ඇතිවීමේදී සිද්ධියක හෝ පවතින තත්ත්වයක ප්‍රතිඵලය සමග ආශ්‍රිත අනියතතාවයේ ප්‍රමාණය, පවත්නා අනාගතයේ වඩා දුරින් සැලකිය යුතු අන්දමින් වැඩිවේ. එම හේතුව නිසා ලබාගත හැකි සියලු තොරතුරු කළමණාකාරීත්වය විසින් සැලකිල්ලට ගතයුතු කාලපරිච්ඡේදය නියමකර කළමනාකාරීත්වයේ තක්සේරුව ඉතා පැහැදිලිව තිබීම බොහෝ මූල්‍ය වාර්තාකරණ ආකෘතිමය රාමු මගින් අවශ්‍ය කෙරේ.

[1] LKAS 1, *මූල්‍ය ප්‍රකාශ ඉදිරිපත් කිරීම, 25 - 26 ඡේද.*

- අස්තිත්ත්වයේ ප්‍රමාණය සහ සංකීර්ණතාවය සහ ව්‍යාපාරයේ ස්වභාවය හා පවත්නා තත්ත්වය, බාහිර සාධක මඟින් එයට බලපාන ප්‍රමාණය, සිද්ධි හෝ පවතින තත්ත්වයන්ගේ ප්‍රතිඵලයේ විනිශ්වයට බලපායි.
- අනාගතය පිළිබඳ ඕනෑම විනිශ්වයක් පදනම් වන්නේ එම විනිශ්වය ගනු ලැබූ අවස්ථාවේ ලබාගත හැකිව තිබූ තොරතුරු මතය. පසුව වන සිදුවීම්වලින් එම ප්‍රතිඵලවලට ඵලය වන්නේ විනිශ්වය ගත් අවස්ථාවේ සාධාරණ වූ විනිශ්වය සමඟ අසංගතවීම විය හැකි බවය.

*විගණකගේ වගකීම්*

6. විගණකගේ වගකීම් වනුයේ, මූල්‍ය ප්‍රකාශ පිළියෙල කිරීමේදී අඛණ්ඩ පදනම මත ගිණුම්කරණය භාවිත කිරීමේ කළමනාකාරීත්වයේ යෝග්‍යතාවයේ නිගමනය සහ ප්‍රමාණවත් යෝග්‍ය විගණන සාක්ෂි ලබා ගැනීමට සම්බන්ධයෙන් සහ ලබාගත් විගණන සාක්ෂි පදනම මත, අඛණ්ඩ පැවැත්ම ලෙස නොකඩවා පවත්වාගෙන යාමේ අස්තිත්ත්වයේ හැකියාව පිළිබඳ ප්‍රමාණාත්මක අනියතතාවයක් පවතීද යන්න නිගමනය කිරීමටය. මූල්‍ය ප්‍රකාශ පිළියෙල කිරීමේදී භාවිත කළ මූල්‍ය වාර්තාකරණ ආකෘතිමය රාමුවේ, අඛණ්ඩ පැවැත්ම ලෙස නොකඩවා පවත්වාගෙන යාමේ අස්තිත්ත්වයේ හැකියාවේ කළමනාකාරීත්වයේ නිශ්චිත තක්සේරුවක් කිරීම සඳහා ඉතා පැහැදිලි ලෙස ප්‍රකාශ කිරීමේ අවශ්‍යතාවයක් ඇතුළත් නොවූයේ වූවද මෙම වගකීම් පවතී.

7. කෙසේ වෙතත්, ශ්‍රී.ල.වි.ප්‍ර. 200[2] තුළ විස්තර කර ඇති පරිදි ප්‍රමාණාත්මක අවප්‍රකාශ අනාවරණය කර ගැනීමට විගණකගේ හැකියාව මත ආවේණික සීමා කිරීම්වල වියහැකි බලපෑම අඛණ්ඩ පැවැත්ම ලෙස නොකඩවා පවත්වාගෙන යාම නැවැත්වීමට එය හේතු විය හැකි අනාගත සිද්ධීන්ට හෝ පවත්නා තත්ත්වයන්ට වඩා විශාල වේ. එවැනි අනාගත සිද්ධීන් සහ පවත්නා තත්ත්වයන් විගණකට අපේක්ෂා කළ නොහැකිය. ඒ අනුව අඛණ්ඩ පැවැත්ම ලෙස නොකඩවා පවත්වාගෙන යාමට අස්තිත්ත්වයේ හැකියාවේ ප්‍රමාණාත්මක අනියතාවය පිළිබඳව විගණකගේ වාර්තාවේ යම් සඳහනක් නොමැති විට අඛණ්ඩව පැවැත්ම ලෙස නොකඩවා පවත්වාගෙන යාමේ අස්තිත්ත්වයේ හැකියාව පිළිබඳ සහතිකවීමක් ලෙසට මතයක් ඇති කර ගත නොහැක.

## බලපැවැත්වෙන දිනය

8. මෙම ශ්‍රී.ල.වි.ප්‍ර. ය 2018 මාර්තු 31 වැනි දින හෝ ඊට පසු අවසන්වන කාලපරිච්ඡේදවල මූල්‍ය ප්‍රකාශ විගණනය සඳහා බලපැවැත්වේ.

## අරමුණු

9. විගණකගේ අරමුණු වන්නේ

   (අ) මූල්‍ය ප්‍රකාශ පිළියෙල කිරීමේදී අඛණ්ඩ පැවැත්ම පදනම භාවිත කිරීමේ කළමනාකාරීත්වයේ යෝග්‍යතාවය සහ ප්‍රමාණවත් යෝග්‍ය විගණන සාක්ෂි ලබා ගැනීම සම්බන්ධයෙන් නිගමනය කිරීමය.

   (ආ) අඛණ්ඩ පැවැත්ම ලෙස නොකඩවා පවත්වාගෙන යාමේ අස්තිත්ත්වයේ හැකියාව මත සැළකිය යුතු අන්දමේ සැකයක් පහළ කළ හැකි සිද්ධීන් හෝ පවත්නා තත්ත්වයන්ට සම්බන්ධිත ප්‍රමාණාත්මක අනියතතාවයක් පවතීද යන්න ලබාගත් විගණන සාක්ෂි පදනම මත නිගමනය කිරීම. සහ

   ශ්‍රී.ල.වි.ප්‍ර. ප්‍රකාරව වාර්තා කිරීම.

## අවශ්‍යතාවයන්

## අවධානම් තක්සේරු ක්‍රියාපටිපාටි සහ සම්බන්ධිත ක්‍රියාකාරකම්

10. ශ්‍රී.ල.වි.ප්‍ර. 315 (සංශෝධිත)[3] මගින් අවශ්‍යකරන පරිදි අවදානම් තක්සේරු ක්‍රියාපටිපාටි ඉටු කරන විට, අඛණ්ඩ පැවැත්ම ලෙස නොකඩවා පවත්වාගෙන යාමට අස්තිත්ත්වයේ හැකියාව මත සැළකිය යුතු අන්දමේ සැකයක් පහළ කළ හැකි සිද්ධීන් හෝ තත්ත්වයන් පවතිද යන්න විගණක සැළකිල්ලට ගත යුතුය. එසේ කිරීමේදී විගණක අඛණ්ඩ පැවැත්ම ලෙස නොකඩවා පවත්වාගෙන යාමට අස්තිත්ත්වයේ හැකියාවේ මූලික තක්සේරුවක් දැනටමත් කළමනාකාරීත්වය සිදුකර ඇත්දැයි ඔහු නිර්ණය කළ යුතුය; සහ: (යොමුව: අ3 - අ6 ඡේද)

---

[2] ශ්‍රී.ල.වි.ප්‍ර. 200 *ස්වාධීන විගණකගේ සමස්ථ අරමුණු සහ ශ්‍රී ලංකා විගණන ප්‍රමිත සමඟ අනුකූලව විගණනයක් මෙහෙයවීම* - අ53 - අ54 ඡේද)

[3] ශ්‍රී.ල.වි.ප්‍ර. 315 (සංශෝධිත) *අස්තිත්ත්වය සහ එහි පරිසරය අවබෝධ කරගැනීම මඟින් ප්‍රමාණාත්මක අවප්‍රකාශවල අවදානම හඳුනාගැනීම සඳහා ගැනීම සහ තක්සේරු කිරීම* 5 වන ඡේදය

(අ) එවැනි තක්සේරුවක් සිදුකර ඇත්නම්, එම තක්සේරුව විගණක කළමනාකාරීත්වය සමග සාකච්ඡා කර හා අඛණ්ඩ පැවැත්ම ලෙස නොකඩවා පවත්වාගෙනයාමට අස්තිත්ත්වයේ හැකියාව පිළිබඳ තනිව හෝ සාමූහිකව සැළකිය යුතු අන්දමේ සැකයක් පහළ කළ හැකි සිද්ධීන් හෝ පවත්නා තත්ත්වයන් කළමනාකාරීත්වය හඳුනාගෙන ඇත්ද යන්න සහ එසේ හඳුනාගෙන ඇත්නම් ඒවා ආමන්ත්‍රණය කිරීමට කළමනාකාරීත්වයේ සැළසුම් නිර්ණය කළ යුතුය; හෝ

(ආ) එවැනි තක්සේරුවක් මේතාක් සිදුකර නොමැති නම්, විගණක අඛණ්ඩ පැවැත්ම මත ගිණුම්කරණයෙන් අපේක්ෂා කරන ප්‍රයෝජනය සඳහා පදනම කළමනාකාරීත්වය සමග සාකච්ඡා කළයුතු අතර පවතින සිදධීන් සහ තත්ත්වයන් තනිව හෝ සාමූහිකව අඛණ්ඩ පැවැත්ම ලෙස නොකඩවා පවත්වාගෙන යාමට අස්තිත්ත්වයේ හැකියාවට සැළකිය යුතු අන්දමේ සැකයක් පහළ කළ හැකිද යන්න කළමනාකාරීත්වයෙන් විමසිය යුතුය.

11. අඛණ්ඩ පැවැත්ම ලෙස නොකඩවා පවත්වාගෙන යාමට අස්තිත්වයේ හැකියාව මත සැළකිය යුතු අන්දමේ සැකයක් පහළ කළ හැකි සිද්ධීන් හෝ පවත්නා තත්ත්වයන්හි විගණන සාක්ෂි සඳහා විගණනය පුරාවටම විගණක සෝදිසියෙන් රැඳී සිටිය යුතුය. (යොමුව : අ7 ඡේදය).

## කළමනාකාරීත්වයේ තක්සේරුව අගය කිරීම

12. අඛණ්ඩ පැවැත්ම ලෙස නොකඩවා පවත්වාගෙන යාමේ අස්තිත්ත්වයේ හැකියාවේ කළමනාකාරීත්වයේ තක්සේරුව විගණක ඇගයිය යුතුය. (යොමුවඃ අ8 - අ10, අ12 අ13 ඡේද)

13. අඛණ්ඩ පැවැත්ම ලෙස නොකඩවා පවත්වාගෙන යාමේ අස්තිත්ත්වයේ හැකියාවේ කළමනාකාරීත්වයේ තක්සේරුව ඇගයීමේදී, අදාළ මූල්‍ය ආකෘතිමය රාමු හෝ නීතිය හෝ රෙගුලාසි මගින් දිගු කාලපරිච්ඡේදයක් නියම කර තිබුනේ නමුදු වුවත්, විගණක එම තක්සේරුව සඳහා ආවරණය කළ යුත්තේ කළමනාකාරීත්වය ආවරණය කළ කාලපරිච්ඡේදය හා සමාන කාලපරිච්ඡේදයකි. අඛණ්ඩ පැවැත්ම ලෙස නොකඩවා පවත්වාගෙන යාමට අස්තිත්ත්වයේ හැකියාවේ කළමනාකාරීත්වයේ තක්සේරුවෙන් ආවරණය වන කාලය ශ්‍රී.ල.වි.ප්‍ර. 560[4] න් නිර්වචනය කර ඇති පරිදි මූල්‍ය ප්‍රකාශ දිනයේ සිට මාස දොළහකට වඩා අඩු නම්, එම දින සිට අඩුතරමින් මාස දොළහක කාලපරිච්ඡේදයන් සඳහා එහි තක්සේරුව දීර්ඝ කරන ලෙස විගණක කළමනාකරණයෙන් ඉල්ලා සිටිය යුතුය. (යොමුවඃ අ11 - අ13 ඡේද)

14. කළමනාකාරීත්වයේ තක්සේරුව ඇගයීමේදී විගණනයේ ප්‍රතිඵලයක් ලෙස විගණක දැනුවත්ව ඇති සියලුම අදාළ තොරතුරු කළමනාකාරීත්වයේ තත්සේරුවේ ඇතුළත් දැයි විගණක සැළකිල්ලට ගත යුතුය.

## කළමණාකාරීත්වයේ තක්සේරුවෙන් ඔබ්බට වූ කාලපරිච්ඡේදය

15. අඛණ්ඩ පැවැත්ම ලෙස නොකඩවා පවත්වා ගෙනයාමට අස්තිත්ත්වයේ හැකියාවට සැළකිය හැකි අන්දමේ සැකයක් පහළ කළ හැකි කළමනාකාරීත්වයේ තක්සේරු කාලපරිච්ඡේදයට ඔබ්බෙන් වූ සිද්ධීන් හෝ තත්ත්වයන් කළමනාකාරීත්වය දැනුවත් බව විගණක විමසිය යුතුය. (යොමුවඃ අ14 - අ15 ඡේද)

## සිද්ධීන් හෝ පවතින තත්ත්වයන් හඳුනාගත් විට වැඩිදුරටත් සිදුකරන විගණන ක්‍රියාපටිපාටි

16. අඛණ්ඩ පැවැත්ම ලෙස නොකඩවා පවත්වාගෙන යාමට අස්තිත්ත්වයේ හැකියාවට සැළකිය යුතු අන්දමේ සැකයක් පහළ විය හැකි සිද්ධීන් හෝ තත්ත්වයන් හඳුනාගෙන ඇත්නම්, ඒවා ලිහිල් කිරීමේ සාධක සැළකිල්ලට ගැනීම ඇතුළුව, අතිරේක විගණන ක්‍රියාපටිපාටි ඉටුකිරීම මගින්, අඛණ්ඩ පැවැත්ම ලෙස නොකඩවා පවත්වා ගෙනයාම මත සැළකිය යුතු අන්දමේ සැක පහළ කළ හැකි සිද්ධීන්ට හෝ තත්ත්වයන්ට සම්බන්ධිත ප්‍රමාණාත්මක අනියත තත්ත්වයන් (මින් මතුවට "ප්‍රමාණාත්මක අනියතතාවයක්" ලෙස හැඳින්වෙන) පවතිද, නොපවතීද යන්න නිර්ණය කිරීමේ ප්‍රමාණවත් යෝග්‍ය විගණන සාක්ෂි විගණක විසින් ලබාගත යුතුය. මෙම ක්‍රියාපටිපාටිවලට ඇතුළත් විය යුත්තේ; (යොමුවඃ අ16 ඡේදය)

(අ) අඛණ්ඩ පැවැත්ම ලෙස නොකඩවා පවත්වාගෙන යාමට අස්තිත්ත්වයේ හැකියාවේ තක්සේරුවක් මෙතෙක් කළමනාකාරීත්වය සිදුකර නොමැති අවස්ථාවක එහි තක්සේරුව සිදුකරන ලෙස කළමණාකාරීත්වයෙන් ඉල්ලීම.

(ආ) අස්තිත්ත්වයේ අඛණ්ඩ පැවැත්ම තක්සේරුවට සම්බන්ධිතව අනාගත ක්‍රියාමාර්ග සඳහා එහි සැළසුම් ඇගයීම, මෙම සැළසුම්වල ප්‍රතිඵලය දනට ඇති තත්ත්වය වැඩිදියුණු කළ හැකිද යන්න හෝ කළමනාකාරීත්වයේ සැළසුම් දැනට පවතින තත්ත්වයන් තුළ ප්‍රායෝගිකද යන්න පිළිබඳ ඇගයීමට (යොමුවඃ අ17 ඡේදය)

---

[4] ශ්‍රී.ල.වි.ප්‍ර. 560, *පසුව සිදුවන සිද්ධීන්* - 5 (අ) ඡේදය)

(ඇ) අස්තිත්ත්වය මුදල් ප්‍රවාහ පුරෝකථන පිළියෙල කර ඇති, අනාගත ක්‍රියාමාර්ග සඳහා කළමනාකාරීත්වයේ සැළසුම් ඇගයීමේදී සිද්ධීන්ගේ හෝ පවත්නා තත්ත්වයන්ගේ අනාගත ප්‍රතිඵලය සැළකිල්ලට ගැනීමේ පුරෝකථන විශ්ලේෂණය සැළකිය යුතු අන්දමේ සාධකයක් වීම. (යොමුවඃ අ 18 - අ 19 ඡේද)

(i) පුරෝකථනය පිළියෙල කිරීමට උත්පාදනය වූ පාදක වූ දත්තවල විශ්වාසදායකත්වය ඇගයීම; සහ

(ii) පුරෝකථනයට පාදකවන උපකල්පන සඳහා ප්‍රමාණවත් සහායක් තිබේද යන්න නිර්ණය කිරීම.

(ඈ) කළමනාකාරීත්වය එහි තක්සේරුව කළ දින සිට යම් අමතර කරුණු හෝ තොරතුරු ලබා ගැනීමට තිබුනේද යන්න සැළකිල්ලට ගැනීම.

(ඉ) අස්තිත්ත්වය අනාගත ක්‍රියාකාරකම් සම්බන්ධයෙන් ඔවුන්ගේ සැළසුම් සහ මෙම සැළසුම්වල ප්‍රායෝගිකභාවය සම්බන්ධයෙන් ලිඛිත නියෝජනය වීම් කළමනාකාරීත්වයෙන් සහ යෝග්‍ය වන පරිදි පාලනය පිළිබඳ වගකිව යුතු අයගෙන් ඉල්ලා සිටීම. (යොමුවඃ අ20 ඡේදය)

## විගණක නිගමන

17. මූල්‍ය ප්‍රකාශ පිළියෙල කිරීමේදී අඛණ්ඩ පැවැත්ම පදනම භාවිත කිරීමේ කළමනාකාරීත්වයේ යෝග්‍යභාවය මත නිගමනය කිරීමට ඒ සම්බන්ධයෙන් ප්‍රමාණවත් යෝග්‍ය විගණන සාක්ෂි ලබා ගත්තේද යන්න විගණක ඇගයිය යුතුය.

18. ලබාගත් විගණන සාක්ෂි පදනම මත අඛණ්ඩ පැවැත්ම ලෙස නොකඩවා පවත්වාගෙන යාමට අස්තිත්ත්වයේ හැකියාව මත සැළකිය යුතු අන්දමේ සැකයක් පහළ විය හැකි තනිව හෝ සාමූහික සිද්ධීන්ට හෝ පවත්නා තත්ත්වයන්ට සම්බන්ධිත ප්‍රමාණවත් අනියතතාවයක් පැවතීද යන්න විගණකගේ විනිශ්චය තුළ විගණක නිගමනය කළ යුතුය. විගණකගේ විනිශ්චය අනුව යම් සිද්ධියක් සිදුවීමේ හැකියාවන් සහ එහි වියහැකි බලපෑමේ විශාලත්වය ඒ තරමට නම් එවිට ප්‍රමාණාත්මක අනියතතාවයන් පවතී, අනියතතාවයේ එහි ස්වභාවයට බලපෑම් සඳහා යෝග්‍ය හෙළිදරව් කිරීමක් අවශ්‍ය කෙරේ. (යොමුවඃ අ21- අ22)

(අ) සාධාරණ ඉදිරිපත් කිරීමේ මූල්‍ය වාර්තාකරණ ආකෘතිමය රාමුව වන අවස්ථාවක වුනොත්, සාධාරණ ඉදිරිපත් කිරීමේ මූල්‍ය ප්‍රකාශ, හෝ

(ආ) අනුකූලතා ආකෘතිමය රාමුවක් වන අවස්ථාවක වුවහොත් මූල්‍ය ප්‍රකාශ නොමඟ යවනු සුලු නොවිය යුතුය.

*සිද්ධීන් හෝ පවත්නා තත්ත්වයන් හඳුනාගෙන ඇතිවිට සහ ප්‍රමාණාත්මක අවප්‍රකාශයක් පවතින විට හෙළිදරව් කිරීම්වල ප්‍රමාණවත් බව.*

19. පවතින තත්ත්වය තුළ අඛණ්ඩ පැවැත්ම පදනම මත ගිණුම්කරණය කළමනාකාරීත්වය භාවිත කිරීම සුදුසු යයි විගණක නිගමනය කරයි නම්, එහෙත් ප්‍රමාණාත්මක අනියතතාවයක් පවතී නම්, මූල්‍ය ප්‍රකාශවල පහත කරුණු පිළිබඳව විගණක නිරීක්ෂණය කළ යුතුය: (යොමුවඃ අ22 - අ23 ඡේද)

(අ) අඛණ්ඩ පැවැත්ම ලෙස නොකඩවා පවත්වාගෙන යාමට අස්තිත්ත්වයේ හැකියාව මත සැළකිය යුතු අන්දමේ සැකයක් පහළ කළ හැකි, ප්‍රධාන සිද්ධීන් සහ පවත්නා තත්ත්වයන් සහ මෙම සිද්ධීන්ට හෝ පවත්නා තත්ත්වයන් කළමනාකාරීත්වයේ සැළසුම් ප්‍රමාණවත් ලෙස හෙළිදරව් කිරීම; සහ

(ආ) අඛණ්ඩ පැවැත්ම ලෙස නොකඩවා පවත්වාගෙන යාමට අස්තිත්ත්වයේ හැකියාව මත සැළකිය යුතු අන්දමේ සැකයක් පහළ කළ හැකි ප්‍රමාණාත්මක අනියතතාවයකට සම්බන්ධිත සිද්ධි හෝ පවත්නා තත්ත්වයන් ඇති බව සහ ඒ අනුව ව්‍යාපාරයේ සාමාන්‍ය ව්‍යාපාරික කටයුතුවලදී එහි වත්කම් උපලබ්ධි කර ගැනීමට හෝ එහි වගකීම නිදහස් කිරීමට නොහැකි විය හැකි බව පැහැදිලිව හෙළිදරව් කිරීම.

*සිද්ධීන් හෝ පවත්නා තත්ත්වයන් හඳුනා ගෙන ඇතිවිට සහ එහෙත් ප්‍රමාණාත්මක අනියතතාවයක් නොපවතින විට හෙළිදරව් කිරිමේ ප්‍රමාණවත් බව.*

20. අඛණ්ඩ පැවැත්ම ලෙස දිගටම පවත්වාගෙන යාමට අස්තිත්වයේ හැකියාව මත සැළකිය යුතු අන්දමේ සැකයක් පහළ කළ හැකි සිද්ධීන් හා පවත්නා තත්ත්වයන් හඳුනාගෙන ඇත්නම්, එහෙත් ලබාගත් විගණන සාක්ෂි පදනම මත ප්‍රමාණාත්මක අනියතතාවයක් නොපවතින බව විගණක නිගමනය කරන විට, අදාළ මූල්‍ය වාර්තාකරණ ආකෘතිමය රාමුවේ අවශ්‍යතා සැළකිල්ලට ගනිමින් මෙම සිද්ධීන් හෝ පවත්නා තත්ත්වයන් පිළිබඳව ප්‍රමාණවත් හෙළිදරව්වක් මූල්‍ය ප්‍රකාශවල ලබා දෙන්නේ ද යන්න විගණක ඇගයිය යුතුය. (යොමුවඃ අ24 - අ25 ඡේද)

## විගණකගේ වාර්තාව සඳහා හඟවනු ලබන දෑ

*අඛණ්ඩ පැවැත්ම පදනම මත ගිණුම්කරණ භාවිත කිරීම අයෝග්‍යවීම.*

21. අඛණ්ඩ පැවැත්ම පදනම මත ගිණුම්කරණය භාවිත කරමින් මූල්‍ය ප්‍රකාශ පිළියෙල කර ඇත්නම්, එහෙත් විගණකගේ විනිශ්චය අනුව අඛණ්ඩ පැවැත්ම පදනම භාවිත කරමින් කළමනාකාරීත්වය මූල්‍ය ප්‍රකාශ පිළියෙල කිරීම අයෝග්‍ය වේ නම්, විගණක අහිතකර මතයක් ප්‍රකාශ කළ යුතුය. (යොමුවː අ26 - අ27 ඡේද)

*අඛණ්ඩව පැවැත්ම පදනම මත ගිණුම්කරණය භාවිත කිරීම අයෝග්‍ය වීම එහෙත් ප්‍රමාණාත්මක අනියතතාවයක් පැවතීම*

ප්‍රමාණාත්මක අනියතතාවයක ප්‍රමාණවත් හෙළිදරව් කිරීමක් මූල්‍ය ප්‍රකාශවල සිදුකර ඇත.

22. ප්‍රමාණාත්මක අනියතතාවයක් පිළිබඳව ප්‍රමාණාත්මක හෙළිදරව් කිරීමක් මූල්‍ය ප්‍රකාශ තුළ සිදුකර ඇත්නම්, විගණක විකරණය නොකළ මතයක් ප්‍රකාශ කළයුතු අතර විගණකගේ වාර්තාවේ "අඛණ්ඩ පැවැත්මට සම්බන්ධිත ප්‍රමාණාත්මක අනියතතාවයක්" යන ශීර්ෂය යටතේ වෙනම වූ, කොටසක් විගණකගේ වාර්තාවේ ඇතුළත් කළ යුතුය. (යොමුවː අ28 - අ31 - අ34 ඡේද)

(අ) 19 වන ඡේදයේ නියම කර ඇති කරුණු හෙළිදරව් කරන මූල්‍ය ප්‍රකාශවල සටහනට අවධානය යොමු කරන්න; සහ

(ආ) අඛණ්ඩ පැවැත්ම ලෙස නොකඩවා පවත්වාගෙන යාමට අස්තිත්ත්වයට ඇති හැකියාව මත සැළකිය යුතු අන්දමේ සැකයක් පහළ විය හැකි ප්‍රමාණාත්මක අනියතතාවයක් පැවැත්ම මෙම සිද්ධීන් හෝ කොන්දේසි අඟවයි යන්න සහ මෙම කරුණ සම්බන්ධයෙන් විගණකගේ මතය විකරණය කර නොමැති බැව්ද සඳහන් කරන්න.

ප්‍රමාණාත්මක අනියතතාවයක ප්‍රමාණවත් හෙළිදරව් කිරීමක් මූල්‍ය ප්‍රකාශවල සිදුකර නොමැත.

23. ප්‍රමාණාත්මක අනියතතාවයක් පිළිබඳව ප්‍රමාණවත් හෙළිදරව් කිරීමක් මූල්‍ය ප්‍රකාශ තුළ සිදු කර නොමැති විට විගණක විසින්; (යොමුවː අ32 - අ34 ඡේද)

(අ) ශ්‍රී.ල.වි.ප්‍ර. 705(සංශෝධිත)[5] ප්‍රකාරව යෝග්‍යවන පරිදි තත්ත්වාගණනය කළ මතයක් හෝ අහිතකර මතයක් ප්‍රකාශ කිරීම; සහ

(ආ) විගණකගේ වාර්තාවේ තත්ත්වාගණනය කළ (අහිතකර) මතයක් සඳහා පදනම කොටසේ, අඛණ්ඩ පැවැත්ම නොකඩවා පවත්වාගෙන යාමට අස්තිත්ත්වයට ඇති හැකියාව මත සැළකිය යුතු අන්දමේ සැකයක් පහළ විය හැකි ප්‍රමාණාත්මක අනියතාවයක් පැවති බව ලෙස සහ මෙම කරුණ ප්‍රමාණාත්මක ලෙස මූල්‍ය ප්‍රකාශවල හෙළිදරව් කර නොමැති බව ලෙස සඳහන් කරන්න.

කළමනාකාරීත්වය එහි තත්සේරුව කිරීමට හෝ එය දීමට ඇති අකමැත්ත

24. විගණක විසින් එහි තක්සේරුව ඉල්ලුම් කළ විට කළමනාකාරීත්වය එය සිදු කිරීමට හෝ දීමට නොකැමැතිවීම විගණක වාර්තාව සඳහා හඟවනු ලබන දෙයක් ලෙස විගණක සැළකිය යුතුය. (යොමුවː අ35 ඡේදය)

## පාලනය පිළිබඳ වගකිව යුතු අය සමග සන්නිවේදනය

25. පාලනය පිළිබඳ වගකිව යුතු සියලුම අය අස්තිත්ත්වය කළමනාකරණය කිරීම සඳහා සහභාගී වන්නේ නම් මිස[6] විගණක අඛණ්ඩ පැවැත්ම ලෙස නොකඩවා පවත්වාගෙන යාමට අස්තිත්ත්වයට ඇති හැකියාව මත සැළකිය යුතු අන්දමේ සැකයක් පහළ විය හැකි හඳුනාගත් සිද්ධීන් හෝ පවත්නා තත්ත්වයන් පිළිබඳව පාලනය පිළිබඳ වගකිව යුතු අය සමග සන්නිවේදනය කළ යුතුය. පාලනය පිළිබඳ වගකිව යුතු අය සමග කරන එම සන්නිවේදනවලට පහත දෑ ඇතුළත් විය යුතුය;

(අ) එම සිද්ධීන් හෝ පවත්නා තත්ත්වයන් ප්‍රමාණාත්මක අනියතතාවයකින් ස්ථාපනය වී ඇත්ද,

(ආ) මූල්‍ය ප්‍රකාශ පිළියෙල කිරීමේදී අඛණ්ඩ පැවැත්ම පදනම මත ගිණුම්කරණය කළමනාකාරිත්වයේ භාවිතය යෝග්‍ය ද,

(ඇ) මූල්‍ය ප්‍රකාශවල සම්බන්ධිත හෙළිදරව් කිරීම්වල ප්‍රමාණවත් භාවය; සහ

(ඈ) අදාළ වන පරිදි විගණක වාර්තාව සඳහා හඟවනු ලබන දෑ.

---

[5] ශ්‍රී.ල.වි.ප්‍ර. 705 (සංශෝධිත) *ස්වාධීන විගණකගේ වාර්තාවේ මතයට විකරණය කිරීම.*

[6] ශ්‍රී.ල.වි.ප්‍ර. 260 (සංශෝධිත) *පාලනය පිළිබඳ වගකිව යුතු අය සමග සන්නිවේදනය,* 13 වන ඡේදය)

## මූල්‍ය ප්‍රකාශ අනුමත කිරීම තුළදී සිදුවන සැළකිය යුතු අන්දමේ ප්‍රමාද

26. මූල්‍ය ප්‍රකාශවල දිනෙන් පසුව, මූල්‍ය ප්‍රකාශ කළමනාකාරීත්වය හෝ පාලනය පිළිබඳව වගකිව යුතු අය විසින් අනුමත කිරීමේදී සැළකිය යුතු අන්දමේ ප්‍රමාදයක් ඇත්නම්, එම ප්‍රමාදය වීමට සඳහා හේතු විගණක විමසිය යුතුය; ප්‍රමාදය වියහැක්කේ අඛණ්ඩ පැවැත්ම තක්සේරුවට සම්බන්ධයෙන් සිද්ධීන් හෝ පවත්නා තත්ත්වයන්ට සම්බන්ධිත යයි විගණක විශ්වාස කරන්නේ නම්, 16 වන ඡේදයේ විස්තර කර ඇති පරිදි හා මෙන්ම 18 වන ඡේදයේ විස්තර කර ඇති ලෙස ප්‍රමාණාත්මක අනියතාවයක පැවැත්ම පිළිබඳව විගණකගේ නිගමනය මත වන බලපෑම් සැළකිල්ලට ගැනීමට, විගණක අවශ්‍යකරන එම අතිරේක විගණන ක්‍රියාපටිපාටි ඉටු කළ යුතුය.

***

## භාවිත කිරීමේ සහ වෙනත් පැහැදිලි කිරීමේ කරුණු

### මෙම ශ්‍රී.ල.වි.ප්‍ර. යේ විෂයය පථය (යොමුවඃ 1 වන ඡේදය)

අ1. විගණකගේ වාර්තාව තුළ ප්‍රධාන විගණන කරුණු සන්නිවේදනය කිරීමට විගණකගේ වගකීම පිළිබඳව ශ්‍රී.ල.වි.ප්‍ර. 701[7] කටයුතු කෙරේ. ශ්‍රී.ල.වි.ප්‍ර. 701 ව්‍යවහාර කරන විට, අඛණ්ඩ පැවැත්මට සම්බන්ධ කරුණු ප්‍රධාන විගණන කරුණු විය යුතු ලෙස නිර්ණය කරන අතර, අඛණ්ඩ පැවැත්ම ලෙස නොකඩවා පවත්වාගෙන යාමට අස්තිත්ත්වයේ හැකියාව මත සැළකිය යුතු අන්දමේ සැකයක් පහළ විය හැකි සිද්ධීන්ට හෝ පවත්නා තත්ත්වයන්ට සම්බන්ධිත ප්‍රමාණාත්මක අනියතාවය ලෙස පැහැදිලි කෙරේ. එහි ස්වභාවය එය අනුව ප්‍රධාන විගණන කරුණක් බව එම ශ්‍රී.ල.වි.ප්‍ර. පිළිගනී.[8]

### අඛණ්ඩ පැවැත්ම අනුව ගිණුම්කරණය (යොමුවඃ 2 වන ඡේදය)

*රාජ්‍ය අංශයේ අස්තිත්ත්වලට විශේෂිත වූ සැළකිල්ලට ගැනීම්*

අ2. කළමනාකාරීත්වයේ අඛණ්ඩ පැවැත්ම පදනම මත ගිණුම්කරණයේ භාවිතය එලෙසටම රාජ්‍ය අංශයේ අස්තිත්වයන්ටද අදාළ වේ. උදාහරණ ලෙස ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිත (ශ්‍රී.ල.රා.අ.ගි.ප්‍ර.) 1 මගින් රාජ්‍ය අංශයේ අස්තිත්ත්ව අඛණ්ඩ පැවැත්ම නොකඩවා පවත්වා ගෙන යාමේ හැකියාවේ ප්‍රශ්නය ආමන්ත්‍රණය කරයි.[9] රජයෙන් දෙනු ලබන සහාය අඩු කරන හෝ ඉවත් කර ගන්නා හෝ පුද්ගලිකකරණය කරන අවස්ථාවන්හිදී ලාභ සඳහා වන පදනම මත රාජ්‍ය අංශයේ අස්තිත්ත්වයක් මෙහෙයුම් සිදු කරන අවස්ථාවලදී අඛණ්ඩ පැවැත්ම අවදානම පැන නැගිය හැකි වුවද එය එම තත්ත්වයනට සීමා නොවේ. අඛණ්ඩ පැවැත්ම ලෙස නොකඩවා පවත්වාගෙන යාමට අස්තිත්ත්වයේ හැකියාව මත සැළකිය යුතු අන්දමේ සැකයක් පහළ විය හැකි සිද්ධීන් හෝ පවත්නා තත්ත්වයන් රාජ්‍ය අංශය තුළ ඇතුළත් විය හැක්කේ රාජ්‍ය අංශයේ අස්තිත්ත්වයක එහි පැවැත්ම නොකඩවා පවත්වා ගෙන යෑමට අරමුදල් හිඟවන අවස්ථාවක හෝ ප්‍රතිපත්තිමය තීරණ ගත් විට රාජ්‍ය අංශයේ අස්තිත්ත්ව ලබාදෙන සේවාවලට වන බලපෑම වැනි තත්ත්වයන්ය.

අවදානම් තක්සේරු ක්‍රියාපටිපාටි සහ සම්බන්ධිත ක්‍රියාකාරකම්

*අඛණ්ඩ පැවැත්ම ලෙස නොකඩවා පවත්වා ගෙන යාමට අස්තිත්ත්වයේ හැකියාව මත සැළකිය යුතු අන්දමේ සැකයක් පහළ විය හැකි සිද්ධීන් හෝ පවත්නා තත්ත්වයන්* (යොමුවඃ 10 ඡේදය)

අ3. අඛණ්ඩ පැවැත්ම ලෙස නොකඩවා පවත්වාගෙන යාමට අස්තිත්ත්වයේ හැකියාව මත සැළකිය යුතු අන්දමේ සැකයක් මතු කළ හැකි වන තනිව හෝ සාමුහිකව හෝ තත්ත්වයනට උදාහරණ පහත දක්වේ. මෙම ලැයිස්තුගත කිරීමෙහි සියල්ලම අඩංගු නොවන හෝ එක් අයිතමයක හෝ ඊට වැඩි ගණනක අයිතම පැවැත්ම සැමවිටම ප්‍රමාණාත්මක අනියතතාවේ පැවැත්ම පිළිබඳ ඇඟවීමක් කරයි.

*මූල්‍ය*

- ශුද්ධ වගකීම් හෝ ශුද්ධ ජංගම වගකීම් තත්ත්වය.
- අලුත් කිරීමට හෝ ආපසු ගෙවීමට යථාර්තවාදී අපේක්ෂාවන් නොමැති හෝ දිගු කාලීන වත්කම් මූල්‍යණය කිරීමට කෙටි කාලීන ණය ගැනුම් මත වුවමනාවට වැඩි විශ්වාසය තබා ඇති පරිණත වීමේ දිනය ලංවෙමින් පවතින ස්ථිර - කාලසීමාවක ණය ගැණුම්.
- ණයහිමියන් විසින් ලබාදුන් මූල්‍ය පහසුකම් ඉවත් කර ගැනීමේ ඇඟවීම්.
- ඓතිහාසික හෝ අපේක්ෂා කරන මූල්‍ය ප්‍රකාශ මගින් ඇඟවෙන සෘණාත්මක මෙහෙයුම් මුදල් ප්‍රවාහ.

---

[7] ශ්‍රී.ල.වි.ප්‍ර. 701, *ස්වාධීන විගණනයේ වාර්තාවේ ප්‍රධාන විගනන කරුණු සන්නිවේදනය.*
[8] ශ්‍රී.ල.වි.ප්‍ර. 701, 15 සහ අ41 ඡේද බලන්න.
[9] ශ්‍රී.ල.රා.අ.ගි.ප්‍ර. 1, *මූල්‍ය ප්‍රකාශ ඉදිරිපත් කිරීම* -38 - 41 ඡේ

- අවාසිදායක ප්‍රධාන මූල්‍ය අනුපාත
- සැළකිය යුතු අන්දමේ මෙහෙයුම් පාඩු හෝ මුදල් ප්‍රවාහ උත්පාදනයට භාවිත කරන වත්කම් වල අගයේ සැළකිය යුතු අන්දමේ වැහැරීම.
- ලාභාංශ හිඟහිට වීම හෝ අත්හිටුවීම.
- ණය හිමියනට නියමිත දින වලදී ගෙවීමට නොහැකියාව.
- කාලීන ණය ගිණුම්වල නියමයන් සමග අනුකූලවීමට නොහැකිවීම.
- සැපයුම්කරුවන් සමග ණයට සිදුකරන ගණුදෙනුවල සිට භාරදුන් විට මුදලට ගෙවීමේ පදනමට ඔවුන් මාරුවීම.
- අත්‍යාවශ්‍ය නව නිෂ්පාදන සංවර්ධනයට හෝ වෙනත් අත්‍යාවශ්‍ය ආයෝජන සඳහා අරමුදල් ලබා ගැනීමට නොහැකියාව.

*මෙහෙයුම්*

- අස්තිත්ත්වය ඈවර කිරීමට හෝ මෙහෙයුම් නැවැත්වීමට කළමනාකාරීත්වයේ අභිප්‍රාය.
- අලුතෙන් බඳවා ගැනීමකින් තොරව ප්‍රධාන කළමනාකරුවන් ඉවත්වීම.
- ශ්‍රමිකයන්ගේ ගැටළු.
- වැදගත් සැපයුම් මූලාශ්‍රවල හිඟකම.
- ඉතා සාර්ථක තරගකරුවන් වෙළෙඳපොළට ප්‍රවේශ වීම.

*වෙනත්*

- මූල්‍ය ආයතන සඳහා ණය ගෙවිය හැකි බව හෝ ද්‍රවශීලතාවය වැනි, අවශ්‍යතාවයන් ප්‍රාග්ධන හෝ වෙනත් ව්‍යවස්ථාපිත හෝ නියාමන අවශ්‍යතාවයන් සමඟ අනුකූල නොවීම.
- අස්තිත්ත්වයට එරෙහිව විභාග වෙමින් පවතින නෛතික හෝ නියාමන නඩු කටයුතු අස්තිත්ත්වයට අවාසිදායකවන ලෙස තීන්දු වුවහොත් වන වන්දි ගෙවීම් සපුරාලීමට අස්තිත්ත්වයේ නොහැකියාව.
- අස්තිත්ත්වය කෙරෙහි අහිත කර ලෙස බලපෑමක් අපේක්ෂා කරන නීතිය හෝ රෙගුලාසි හෝ රාජ්‍ය ප්‍රතිපත්තිවල වෙනස්වීම්.
- රක්ෂණය නොකළ හෝ ඌණ රක්ෂණයන් කර ඇති අවස්ථාවක හදිසියේ ඇතිවන මහා පරිමාණයේ ව්‍යසනයක් සිදුවීම.

එවැනි සිද්ධීන්හි හෝ පවත්නා තත්ත්වයන්හිදී වැදගත්කම බොහෝවිට වෙනත් සාධක මගින් ලිහිල් කළ හැකිය. උදාහරණ ලෙස අස්තිත්ත්වයක සාමාන්‍ය ණය ආපසු ගෙවීමට එයට නොහැකි වීමේ බලපෑම, වත්කම් බැහැර කිරීම, ණය ආපසු ගෙවීම ප්‍රතිලේඛන ගත කිරීම හෝ අතිරේක ප්‍රාග්ධනය ලබාගැනීම වැනි වෙනත් විකල්ප ක්‍රම මඟින් ප්‍රමාණවත් මුදල් ප්‍රවාහ පවත්වාගෙන යාමේ කළමනාකාරීත්වයේ සැළසුම් මගින් සමබර කළ හැකිය. ඒ හා සමානව ප්‍රධාන සැපයුම්කරුවෙක් අහිමිවීම, සුදුසු විකල්ප සැපයුම් මූලාශ්‍රයක් ලබාගත හැකිවීමෙන් ලිහිල් කළ හැකිය.

අ4. කළමනාකාරීත්වය අඛණ්ඩ පැවැත්ම පදනම් ගිණුම්කරණය භාවිත කිරීම, වැදගත් කරුණක් විය හැකිද යන්න සහ විගණනය සැළසුම් කිරීමේ දී එහි බලපෑම විගණකට නිර්ණය කිරීමට ඡේද 10 මගින් අවශ්‍යකරන අවදානම් තක්සේරු පටිපාටි උපකාරී වේ. මෙම ක්‍රියාපටිපාටි කළමනාකාරීත්වයේ සැළසුම් සහ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ හඳුනාගත් ප්‍රශ්න නිරාකරණය සාකච්ඡා කිරීම ඇතුළුව වඩාත් කාලානුරූපී සාකච්ඡාවකට මෙම ක්‍රියාපටිපාටි ඉඩදේ.

කුඩා අස්තිත්ත්ව සඳහා විශේෂිත වූ සැළකිල්ලට ගැනීම (යොමුව: 10 ඡේදය)

අ5. අහිතකර තත්ත්වයන්හිදී ඊට ඔරොත්තු දීමට අස්තිත්ත්වයට ඇති හැකියාවට එහි විශාලත්වය බලපෑ හැකිය. කුඩා අස්තිත්ත්ව වාසිදායක තත්ත්වයකදී ඵල ප්‍රයෝජන ගැනීමට ක්ෂණිකව ප්‍රතිචාර දැක්විය හැකි අතර, මෙහෙයුම් උසුලා සිටීමට ප්‍රමාණවත් සංචිත නොමැති විය හැකිය.

අ6. කුඩා අස්තිත්ත්වවලට විශේෂ අදාලත්වයක් ඇති පවත්නා තත්ත්වයකට ඇතුළත් වන්නේ අස්තිත්ත්වයට බැංකු වෙනත් ණය දෙන්නන් ලබා දෙන පහසුකම් නැවැත්වීමේ අවදානම, එසේම ප්‍රධාන සැපයුම්කරුවන් විශාල ගණුදෙනුකරුවන්, වැදගත් සේවකයන් හෝ බලපත්‍රයක් යටතේ පැවරූ අයිතිය හෝ වෙනත් නෛතික ගිවිසුම් යටත් මෙහෙයුම් කිරීමේ අයිතිය අහිමිවිය හැකිබව වේ.

*සිද්ධීන් හෝ පවත්නා තත්ත්වයන් පිළිබඳව විගණන සාක්ෂි සඳහා විගණනය පුරාවටම සෝදිසියෙන් රැඳී සිටීම. (යොමු: 11 ඡේදය)*

අ7. විගණකගේ අවදානම් තක්සේරුවට බලපෑම් වන විගණන ක්‍රියාමාර්ගය තුළදී අතිරේක තොරතුරු ලබාගත් විට ඒ අනුව තවදුරටත් සැළසුම් කළ විගණන පටිපාටි වෙනස් කිරීමට සහ විගණකගේ අවදානම් තක්සේරුව විගණක සංශෝධනය කිරීමට ශ්‍රී.ල.වි.ප්‍ර. 315 (සංශෝධිත) මගින් අවශ්‍ය කෙරේ.[10]අඛණ්ඩ පැවැත්ම ලෙස නොකඩවා පවත්වාගෙන යාමේ අස්තිත්ත්වයේ හැකියාව මත සැළකිය යුතු අන්දමින් සැකයක් පහළ කළ හැකි සිද්ධීන් හෝ පවත්නා තත්ත්වයන් විගණකගේ අවදානම තක්සේරු සිදුකළ පසු හඳුනාගත් විට 16 වන ඡේදයේ වන පටිපාටි ඉටුකරනවාට අමතරව, ප්‍රමාණාත්මක අවප්‍රකාශ පිළිබඳ විගණකගේ ප්‍රමාණාත්මක අවප්‍රකාශයක අවදානම් තක්සේරු කිරීම සංශෝධනය කිරීම අවශ්‍ය විය හැකිය. එවැනි සිද්ධීන්ගේ හෝ පවත්නා තත්ත්වයන්ගේ පැවැත්ම, තක්සේරු කළ අවදානම්වලට ප්‍රතිචාර ලෙස විගණකගේ තවදුරටත් වූ පටිපාටිවල ස්වභාවය, කල් යෙදුම සහ ප්‍රමාණයට බලපෑම් ඇතිවිය හැකි මෙම කරුණු මත අවශ්‍යතාවයන් සහ උපදේශන ශ්‍රී.ල.වි.ප්‍ර. 330[11] ස්ථාපනය කරයි.

කළමනාකාරීත්වයේ තක්සේරුව අගය කිරීම.

*කළමනාකාරීත්වයේ තක්සේරුව සහ සහායවන විශ්ලේෂණය සහ විගණකගේ අගය කිරීම (යොමුව: 12 ඡේදය)*

අ8. අඛණ්ඩ පදනම මත ගිණුම්කරණයේ කළමනාකාරීත්වය භාවිත කිරීමේ විගණකගේ සළකා බැලීමේ ප්‍රධාන කොටසක් වන්නේ අඛණ්ඩ පැවැත්ම ලෙස නොකඩවා පවත්වා ගෙනයාමට අස්තිත්ත්වයේ හැකියාවේ කළමනාකාරීත්වයේ තක්සේරුවය.

අ9. කළමනාකාරීත්වය විසින් සිදුකරනු ලබන විශ්ලේෂණයේ අඩුපාඩු නිවැරදි කිරීම විගණකගේ වගකීමක් නොවේ, සමහර තත්ත්වයන්හිදී කෙසේ වෙතත් එහි තක්සේරුවට සහායදෙන කළමනාකාරීත්වය සිදුකරන විස්තරාත්මක විශ්ලේෂණයක් නැතිකම එම තත්ත්වය තුළදී අඛණ්ඩ පැවැත්ම මත ගිණුම්කරණය කළමනාකාරීත්වය භාවිත කිරීම යෝග්‍ය ද යන්න විගණක නියාමනය කිරීමෙන් වළක්වාලිය නොහැකිය. උදාහරණයක් ලෙස ලාභ දායක මෙහෙයුම්වලට ඉතිහාසයක් ඇති අවස්ථාවක හා මූල්‍ය සම්පත්වලට පහසු මූලාශ්‍රයක් තිබෙන අවස්ථාවක අස්තිත්ත්වය විස්තරාත්මක විශ්ලේෂණයක් සිදු නොකර තක්සේරුව කළ හැකිය. මෙවැනි අවස්ථාවක කළමනාකාරීත්වයේ තක්සේරුවේ යෝග්‍යභාවය විගණක ඇගයීම සිදුකළ හැක්කේ එම තත්ත්වයන් තුළ මූල්‍ය ප්‍රකාශ පිළියෙල කිරීමේ අඛණ්ඩ පැවැත්ම පදනම කළමනාකාරීත්වය භාවිත කිරීම යෝග්‍ය ද යන්න නිගමනය කිරීමට විගණකට හැකිවීමට විගණකගේ ක්‍රියාපාටි ප්‍රමාණවත් නම් එවැනි අවස්ථාවක වෙනත් විස්තරාත්මක පටිපාටි ඉටුනොකර එම නිගමනයට එළඹිය හැකිය.

අ10. වෙනත් තත්ත්වයන්හිදී 12 ඡේදය මගින් අවශ්‍යකරන පරිදි අඛණ්ඩ පැවැත්ම ලෙස නොකඩවා පවත්වාගෙනයාමේ අස්තිත්ත්වයේ හැකියාවේ කළමනාකාරීත්ව තක්සේරුව ඇගයීමේදී එම ඇස්තමේන්තුව කිරීමට කළමනාකාරීත්වය අනුගමනය කළ ක්‍රියාවලියේ ඇගයීමක්, තක්සේරුව පදනම් වූ උපකල්පන සහ අනාගත ක්‍රියාකාරකම් සඳහා කළමනාකාරීත්වයේ සැළසුම් සහ පවතින තත්ත්වයන් කළමනාකාරීත්වයේ සැළසුම් ප්‍රායෝගිකද යන්න ඇතුළත් විය හැකිය.

*කළමණාකාරීත්වයේ තක්සේරුවේ කාලපරිච්ඡේදය (යොමුව: 13 ඡේදය)*

අ11. කළමනාකාරීත්වය විසින් සැළකිල්ලට ගත යුතු ලබා ගත හැකි සියලු තොරතුරු සඳහා වන කාලපරිච්ඡේදය නියම කිරීම කළමනාකාරීත්ව ඇස්තමේන්තුවේ ඉතා පැහැදිලිව තිබිය යුතු බව බොහෝ මූල්‍ය වාර්තාකරණ ආකෘතිමය රාමුවලින් අවශ්‍ය කෙරේ.[12]

*කුඩා අස්තිත්ත්වයනට විශේෂිත වූ සැළකිල්ලට ගැනීම්* (යොමුව: 12–13 ඡේද)

අ12. බොහෝ අවස්ථාවලදී කුඩා අස්තිත්ත්වවල කළමනාකරණය අඛණ්ඩ පැවැත්ම ලෙස නොකඩවා පවත්වාගෙනයාමට අස්තිත්ත්වයේ හැකියාව පිළිබඳව විස්තරාත්මක තක්සේරුවන් පිළියෙල නොකරනවා විය හැකිය, එහෙත් ඒ වෙනුවට ව්‍යාපාරය පිළිබඳව ගැඹුරින් වූ දැනුම සහ අපේක්ෂිත අනාගත බලාපොරොත්තු මත විශ්වාසය තබනවා විය හැකිය. එසේ වුවත් මෙම ශ්‍රී.ල.වි.ප්‍ර.යේ අවශ්‍යතාවයන්ට අනුකූලව අඛණ්ඩ පැවැත්ම ලෙස නොකඩවා පවත්වාගෙන යාමට අස්තිත්ත්වයේ හැකියාව පිළිබඳ කළමනාකාරීත්වයේ තක්සේරුව විගණක අගය කිරීම අවශ්‍ය වේ. කුඩා අස්තිත්ත්ව සඳහා කළමනාකාරීත්වයේ මත භේදයට තුඩුදුන් කරුණු ප්‍රමාණවත් ලිඛිත සාක්ෂි මගින් තහවුරු කළ හැකි නම් සහ අස්තිත්ත්වය පිළිබඳ විගණකගේ අවබෝධය සමග අසංගත නොවන්නේ නම් අස්තිත්ත්වයේ මධ්‍ය කාලීන සහ දිගු කාලීන මූල්‍යකරණය පිළිබඳව විගණක

[10] ශ්‍රී.ල.වි.ප්‍ර. 315 (සංශෝධිත) 31 වන ඡේදය.

[11] ශ්‍රී.ල.වි.ප්‍ර. 330 - *තක්සේරු කළ අවදානම්වලට විගණකගේ ප්‍රතිචාර.*

[12] උදාහරණ ලෙස මෙම කාලපරිච්ඡේදය LKAS 1 හි නිර්වචනය කරන්නේ වාර්තාකරණ කාල පරිච්ඡේදය අවසානයේ සිට අඩු තරමින් මාස දොළහක් විය යුතු එහෙත් එම කාලසීමාවට සීමා නොවිය යුතු ලෙසය)

කළමනාකාරීත්වය සමඟ සාකච්ඡා කිරීම යෝග්‍ය විය හැකිය. මෙම නිසා 13 ඡේදයේ අවශ්‍යතාවයක් කළමනාකාරීත්වයට එහි තක්සේරුව ලබාදෙන ලෙස විගණකගෙන් ඉල්ලීම සඳහා උදාහරණ ලෙස සාකච්ඡා මගින් විමසීම් සහායවන ලිපිලේඛන පරීක්ෂා කිරීම මගින්, අවශ්‍ය දෑ සපුරා ගත හැකිය. උදාහරණ ලෙස අනාගත සැපයුම් සඳහා ලැබුණ ඇණවුම්, ඒවායේ ප්‍රායෝගිකත්වය ඇගයීම හෝ වෙනත් අන්දමකින් තහවුරු කිරීම (සත්තාවි) මගිනි.

අ13. හිමිකරු කළමනාකරු ලබාදෙන අඛණ්ඩ සහාය බොහෝවිට කුඩා අස්තිත්ත්වවලට අඛණ්ඩ පැවැත්ම ලෙස නොකඩවා පවත්වාගෙන යාමේ හැකියාවට වැදගත් වේ. කුඩා අස්තිත්ත්ව සඳහා විශාල ලෙස මූල්‍යනය සැපයීමට හිමිකරු - කළමනාකරු ලබා දෙන ණය මගින් වන අවස්ථාවලද මෙම අරමුදල් ආපසු ගැනිලි නොකර සිටීම ඉතා වැදගත් වේ. උදාහරණ ලෙස කුඩා අස්තිත්ත්වයක් මූල්‍ය අපහසුතාවයට පත්වූ විට එය නොකඩවා පවත්වාගෙන යාම රඳාපවත්නේ බැංකුවට හෝ වෙනත් ණයහිමියෙකුගේ අනුග්‍රහය නොමැති හිමිකරු කළමනාකරනයක් සඳහා උපකාරක කරන ලද හෝ හිමිකරු අයිතිකරු ඔහුගේ හෝ ඇයගේ පුද්ගලික වත්කම් අතිරේක ඇපයක්, ඇපකරුවෙක් ලෙස ලබාදීම මගින් අස්තිත්ත්වය ණය සඳහා සහයක් ලබාදීම මතය. එවැනි අවස්ථාවන්හි විගණක හිමිකරු අයිතිකරුගේ ඇප වීම ණය උපකාරක කිරීමේ යෝග්‍ය ලිඛිත සාක්ෂි ලබාගනු ඇත. හිමිකරු අයිතිකරුගේ අතිරේක සහාය මත අස්තිත්ත්වයක් යැපෙනවිට, හිමිකරු කළමනාකරුගේ සහාය එකඟවීම් යටතේ වන බැඳීම් ඉෂ්ඨ කිරීමේ හැකියාව විගණක අගය කළ හැකිය. මෙයට අමතරව විගණක එවැනි සහායට බැඳී ඇති කොන්දේසි සහ නියමයන් සහ හිමිකරු කළමනාකරුගේ අභිප්‍රායන් සහ අවබෝධය පිළිබඳ ලිඛිත සනාථ කිරීම් ඉල්ලා සිටිය හැකිය.

කළමනාකාරීත්වයේ තක්සේරුවෙන් ඔබ්බට වන කාලපරිච්ඡේදය (යොමුව: 15 ඡේදය)

අ14. මූල්‍ය ප්‍රකාශ පිළියෙල කිරීමේදී අඛණ්ඩ පැවැත්ම පදනම ලෙස කළමනාකාරීත්වයේ භාවිතයේ යෝග්‍යතාවය ප්‍රශ්න ගත තත්ත්වයට පත්විය හැකි කළමනාකාරීත්වය විසින් භාවිතකළ තක්සේරු කාලපරිච්ඡේදය ඉක්මවා සිදු විය හැකි දන්නා සිද්ධීන්, නියම කරන ලද හෝ අන් වශයෙන් හෝ තත්ත්වයන් විය හැකිබව 11 ඡේදය මගින් අවශ්‍ය කරන පරිදි විගණක සෝදිසියෙන් රැඳී සිටිය යුතුය. සිද්ධියක හෝ පවත්නා තත්ත්වයක ප්‍රතිඵලය සමඟ ආශ්‍රිත අනියතතාවයේ ප්‍රමාණය සිද්ධිය හෝ පවත්නා තත්ත්වයන් තවදුරටත් අනාගතය තුළටවන විට වැඩිවේ. සිද්ධිය හෝ පවත්නා තත්ත්වය අනාගතය වෙතට තවදුරටත් සැළකිල්ලට ගැනීමේ, අඛණ්ඩ පැවැත්ම පිළිබඳ කරුණුවල ඇඟවීම්, විගණක තවදුරටත් ක්‍රියාමාර්ග ගැනීමට පෙර සැළකිල්ලට ගැනීම වැදගත්වීම අවශ්‍ය කෙරේ. එවැනි සිද්ධීන් හෝ තත්ත්වයන් හඳුනාගතහොත්, අඛණ්ඩ පැවැත්ම ලෙස නොකඩවා පවත්වාගෙන යාමට අස්තිත්ත්වයේ හැකියාවේ එහි තක්සේරුව මත සිද්ධියක හෝ පවත්නා තත්ත්වයක වියහැකි වැදගත්කම ඇගයීමට විගණක කළමනාකාරීත්වයට ඉල්ලීමක් කළ හැකිය. මෙවැනි තත්ත්වයන් හිදී 16 වන ඡේදයේ ඇති පටිපාටි ව්‍යවහාර වේ.

අ15. කළමනාකාරීත්වයෙන් විමසීම හැර, කළමනාකාරීත්වය විසින් තක්සේරු කළ කාලපරිච්ඡේදයෙන් ඔබ්බට, 13 ඡේදයේ හි සාකච්ඡා කළ පරිදි මූල්‍ය ප්‍රකාශ දින සිට අඩු තරමින් මාස දොළහක් වියයුතු අඛණ්ඩ පැවැත්ම ලෙස නොකඩවා පවත්වාගෙන යාමට අස්තිත්ත්වයට ඇති හැකියාවට සැළකිය යුතු අන්දමේ සැකයක් පහළ විය හැකි සිද්ධීන් හෝ පවත්නා තත්ත්වයන් හඳුනා ගැනීමට යම් වෙනත් විගණන පටිපාටි ඉටු කිරීමට විගණකට වගකීමක් නොමැත.

සිද්ධීන් හෝ පවත්නා තත්ත්වයන් හඳුනා ගත්විට කළ යුතු අතිරේක විගණන ක්‍රියාපටිපාටි (යොමුව: 16 ඡේදය)

අ16. 16 වන ඡේදයේ අවශ්‍යතාවයනට අදාළ විගණන ක්‍රියාපටිපාටිවලට පහත දෑ අඩංගු විය හැකිය;

- මුදල් ප්‍රවාහ, ලාභ සහ වෙනත් අදාළ පුරෝකථක විශ්ලේෂණ කර කළමනාකාරිත්වය සමඟ සාකච්ඡා කිරීම.
- අස්තිත්ත්වයේ ආසන්නතම ලබාගත හැකි අතුරු මූල්‍ය ප්‍රකාශ විශ්ලේෂණය කර කළමනාකාරීත්වය සමඟ සාකච්ඡා කිරීම.
- ණයකරවල සහ ණය ගිවිසුම්වල නියමයන් කියවා එම නියමයන්ගෙන් කවරක් හෝ කඩකර ඇත්දැයි නිර්ණය කිරීම.
- කොටස් හිමියන්ගේ පාලනය පිළිබඳ වගකිව යුතු අයගේ සහ අදාළ කමිටුවල රැස්වීම් වාර්තා මූල්‍යන කිරීමේ අපහසුතා සඳහා යොමුකර කියවීම.
- පවත්වාගෙන යන නඩු හෝ හිමිකම්පෑම්වල පැවැත්ම සම්බන්ධයෙන් අස්තිත්ත්වයේ නීති උපදේශකගෙන් විමසීම් සහ ඒවායේ ප්‍රතිඵලය කළමනාකාරීත්වයේ තක්සේරුවේ සාධාරණත්වය සහ ඒවායේ ඇස්තමේන්තු කළ මූල්‍ය බලපෑම්.

- සම්බන්ධිත සහ තුන්වන පාර්ශව සමඟ මූල්‍ය සහාය ලබාදීමට හෝ පවත්වාගෙන යාමට යොදා ඇති එකඟවීම්වල පැවැත්ම, නෛතිකභාවය සහ බලාත්මක කළ හැකි බව තහවුරු කිරීම සහ එවැනි පාර්ශවවලට අමතර අරමුදල් ලබාදීමට වන මූල්‍ය හැකියාව තක්සේරු කිරීම.
- මෙතෙක් ඉටු නොකර ඇති ගණුදෙනුකරුවන්ගේ ඇනවුම් පිළිබඳ කටයුතු කරන අස්තිත්ත්වයේ සැළසුම් ඇගයීම.
- පසුව සිදුවන සිදුවීම් සම්බන්ධයෙන් එම සිද්ධීන් අඛණ්ඩව පැවැත්ම ලෙස නොකඩවා පවත්වාගෙන යාමේ අස්තිත්වයේ හැකියාව එක්කෝ සැහැල්ලු කරයිද හෝ එසේ නොවේනම් බලපායිද යන්න හඳුනා ගැනීමට විගණන පටිපාටි ඉටු කිරීම.
- ණය ගැනීමේ පහසුකම්වල නියමයන් සහ ප්‍රමාණවත් බවේ පැවැත්ම තහවුරු කිරීම.
- නියාමන ක්‍රියාමාර්ග සඳහා වූ වාර්තා ලබා ගැනීම සහ සමාලෝචනය කිරීම.
- යම් සැලසුම්කළ වත්කම් බැහැර කිරීම සඳහා වන සහායේ ප්‍රමාණවත් බව නිර්ණය කිරීම.

*අනාගත ක්‍රියාමාර්ග සඳහා කළමනාකාරීත්වයේ සැළසුම් අගය කිරීම.* (යොමුව: 16 (ආ) ඡේදය)

අ17. අනාගත ක්‍රියාමාර්ග සඳහා කළමනාකාරීත්වයේ සැළසුම් ඇගයීමට ඇතුළත් විය හැක්කේ අනාගත ක්‍රියාමාර්ග සඳහා එහි සැළසුම් කළමනාකාරීත්වයෙන් විමසීම් උදාහරණ වශයෙන් වත්කම් උපලබ්ධි කිරීම ණය මුදල් ලබා ගැනීම හෝ ණය ප්‍රතිව්‍යුහගත කිරීම ගෙවීම අඩු කිරීම හෝ ප්‍රමාද කිරීම හෝ ප්‍රාග්ධනය වැඩි කිරීම සඳහා එහි සැළසුම්ය.

*කළමනාකාරීත්වයේ තක්සේරුවේ කාලපරිච්ඡේදය* (යොමුව: 16 (ඇ) ඡේදය)

අ18. 16 (ඇ) ඡේදයෙන් අවශ්‍යකරණ ක්‍රියාපටිපාටිවලට අමතරව විගණක පහත දෑ

- මෑත පූර්ව කාලපරිච්ඡේදවල බලාපොරොත්තු මූල්‍ය තොරතුරු ඓතිහාසික ප්‍රතිඵල සමඟ සහ
- ප්‍රවර්තන කාලපරිච්ඡේදයේ බලාපොරොත්තුවන මූල්‍ය තොරතුරු සමඟ මෙදින දක්වා අත්කරගත් ප්‍රතිඵල සමඟ සංසන්දනය කරයි.

අ19. කළමනාකාරීත්වයේ උපකල්පනවලට තුන්වන පාර්ශව මඟින් ලබාදෙන අඛණ්ඩ සහාය ඇතුළත් වන අවස්ථාවලදී, එම සහාය ණය උප ප්‍රධාන අමතර අරමුදල් ලබාදීමට හෝ පවත්වාගෙන යාමට බැඳියාවන් හෝ ඇපවීම් සහ එවැනි සහායන් අඛණ්ඩ පැවැත්ම ලෙස නොකඩවා පවත්වාගෙන යාමේ අස්තිත්වයේ හැකියාවට වැදගත් වනවිට, එම තුන්වන පාර්ශවයන් ගෙන් ලිඛිත තහවුරු කිරීම් (නියමයන් සහ කොන්දේසි ඇතුළුව) ඉල්ලා සිටීම සළකා බැලීමට විගණකට අවශ්‍ය විය හැකි අතර, එසේම එවැනි සහයක් ඔවුන්ට ලබාදීමට ඇති හැකියාව පිළිබඳ සාක්ෂි ලබා ගැනීමට අවශ්‍ය කෙරේ.

*ලිඛිත නියෝජනය වීම්* (යොමුව: 16 (ඉ) ඡේදය)

අ20. අස්තිත්ත්වයේ අඛණ්ඩ පැවැත්ම තක්සේරුවට සම්බන්ධිත අනාගත ක්‍රියාමාර්ග සඳහා කළමනාකාරීත්වයේ සැළසුම් සහ, එම සැළසුම්වල ප්‍රායෝගිකභාවයට සම්බන්ධයෙන් සහයට ලබාගත් 16 වන ඡේදයෙන් අවශ්‍යකරන විගණන සාක්ෂි අභිබවා නිශ්චිත ලිඛිත නියෝජනය වීම් ලබා ගැනීම යෝග්‍ය දැයි විගණක සැළකිල්ලට ගත හැකිය.

## විගණක නිගමන

***අඛණ්ඩ පැවැත්ම ලෙස නොකඩවා පවත්වාගෙන යාමට අස්තිත්ත්වයේ හැකියාව මත සැළකිය යුතු අන්දමේ සැකයක් පහළ කළ හැකි ප්‍රමාණාත්මක අනියතතාවයකට සම්බන්ධිත සිද්ධීන් සහ පවත්නා තත්ත්වයන් (යොමුව: 18 ඡේදය)***

අ21. අඛණ්ඩව පැවැත්ම ලෙස නොකඩවා පවත්වාගෙන යාමට අස්තිත්වයේ හැකියාව මත සැළකිය යුතු අන්දමේ සැකයක් පහළ කළ හැකි සිද්ධීන් හෝ පවත්නා තත්ත්වයනට සම්බන්ධිත අනියතතා සාකච්ඡා කරන විට LKAS 1 හි "ප්‍රමාණාත්මක අනියතතාවය" යන වැකිකඩ භාවිත කරයි. වෙනත් සමහර මූල්‍ය වාර්තාකරණ ආකෘතිමය රාමුවල "සැළකිය යුතු අන්දමේ අනියතතා" යන වැකිකඩ ඒ හා සමාන තත්ත්වයන්හිදී භාවිත කෙරේ.

*සිද්ධීන් හෝ පවත්නා තත්ත්වයන් හඳුනාගෙන ඇතිවිට සහ ප්‍රමාණාත්මක අනියතාවයන් පවතින විට හෙළිදරව් කිරීම්වල ප්‍රමාණවත් බව.*

අ22. ප්‍රමාණාත්මක අනියතතාවයක් පවතින විට සිද්ධි හෝ පවතින තත්ත්වන්හි භව්‍ය බලපෑමේ විශාලත්වය සහ එය සිදුවීමේ හැකියාව කොතරම්ද යත් සාධාරණ ඉදිරිපත් කිරීම අත්කර ගැනීමට (සාධාරණ ඉදිරිපත් කිරීමේ

ආකෘතිමය රාමු සඳහා) හෝ මූල්‍ය වාර්තා සඳහා නොමඟ යවන සුළු නොවීමට (අනුකූලතා ආකෘතිමය රාමු සඳහා) යෝග්‍ය හෙළිදරව් කිරීමක් අවශ්‍ය බව 18 වන ඡේදයෙන් පැහැදිලි කෙරේ. අදාළ මූල්‍ය වාර්තාකරණ ආකෘතිමය රාමුව ප්‍රමාණාත්මක අනියතාවය නිර්වචනය කරන්නේ කෙසේද හෝ යන්න නොසළකා එවැනි ප්‍රමාණාත්මක අනියතතාවයේ පැවතියේද යන්න 18 වන ඡේදයෙන් අවශ්‍යකරන පරිදි විගණක නිගමනය කළ යුතු වේ.

අ23. එම ඡේදයේ පැහැදිලි කර ඇති කරුණු මූල්‍ය ප්‍රකාශ හෙළිදරව් කිරීම් ආමන්ත්‍රණය කරන්නේද යන්න විගණක නීර්ණය කිරීමට 19 වන ඡේදයෙන් අවශ්‍ය කෙරේ. මෙම නීර්ණය කිරීම කළ යුත්තේ අදාළ මූල්‍ය වාර්තා කරන ආකෘතිමය රාමුවෙන් අවශ්‍ය කරන ප්‍රමාණාත්මක අනියතතාවයක් පිළිබඳ හෙළිදරව් කිරීම ප්‍රමාණාත්මකද යන්න විගණක නීර්ණය කිරීමට අමතරවය. 19 වන ඡේදය තුළ පැහැදිලි කර ඇති කරුණුවලට අමතරව සමහර මූල්‍ය වාර්තාකරණ ආකෘතිමය රාමු මගින් අවශ්‍යකරණ හෙළිදරව් කිරීම්වලට ඇතුළත් විය හැක්කේ පහත දැක්වෙන දෑ පිළිබඳ හෙළිදරව් කිරීම්ය.

- එහි බැඳියාවන් ඉටු කිරීමට අස්තිත්ත්වයේ හැකියාවට සම්බන්ධිත සිද්ධීන් හෝ පවත්නා තත්ත්වයන්හි වැදගත්කමේ කළමනාකාරිත්වයේ ඇගයීම; හෝ
- අඛණ්ඩ පැවැත්ම ලෙස නොකඩවා පවත්වාගෙන යාමේ අස්තිත්ත්වයේ හැකියාවේ එහි තක්සේරු කොටසක් ලෙස කළමනාකාරීත්වය සිදුකළ සැළකිය යුතු අන්දමේ විනිශ්චයන්,

ප්‍රධාන සිද්ධීන් හෝ පවත්නා තත්ත්වයන් සහ ඒවායේ සිදුවීමේ කල්යෙදුම සහ සිදුවිය හැකිබවේ භව්‍ය බලපෑමේ විශාලත්වය පිළිබඳ හෙළිදරව් කිරීම්වල කළමනාකාරිත්වයේ සැළකිල්ලට ගැනීම සම්බන්ධයන්ගෙන් සමහර මූල්‍ය වාර්තාකරණ ආකෘතිමය රාමු අතිරේක මගපෙන්වීම් ලබාදිය හැකිය.

*සිද්ධීන් හෝ තත්ත්වයන් හඳුනා ගෙන ඇති විට එහෙත් ප්‍රමාණාත්මක අනියතතාවයක් නොපවතින විට හෙළිදරව් කිරීම්වල ප්‍රමාණාත්මක භාවය* (යොමුව: 20 ඡේදය)

අ24. ප්‍රමාණාත්මක අනියතතාවයක් නොපවතින විටදී පවා විගණක අදාළ මූල්‍ය වාර්තාකරණ අකෘතිමය රාමුවේ අවශ්‍යතා සැළකිල්ලට ගැනීමේදී, අඛණ්ඩ පැවැත්ම ලෙස නොකඩවා පවත්වාගෙන යාමට අස්තිත්ත්වයේ හැකියාවට සැළකිය යුතු අන්දමේ සැකයක් පහළ විය හැකි සිද්ධීන් හෝ පවත්නා තත්ත්වයන් පිළිබඳව මූල්‍ය ප්‍රකාශ ප්‍රමාණවත් හෙළිදරව්වක් සිදුකළ යුතු බව කෙරෙහි විගණනකට ඇගයීම 20 වන ඡේදයෙන් අවශ්‍ය කෙරේ. සමහර මූල්‍ය වාර්තාකරණ ආකෘතිමය රාමු පහත දෑ පිළිබඳ හෙළිදරව් කිරීම් ආමන්ත්‍රණය කෙරේ.

- ප්‍රධාන සිද්ධීන් හෝ පවත්නා තත්ත්වයන්;
- අස්තිත්ත්වයේ එහි බැඳීම් ඉටු කිරීමට ඇති හැකියාව සම්බන්ධිත එම සිද්ධීන් හෝ පවත්නා තත්ත්වයන්හි වැදගත්කමේ කළමනාකාරිත්වයේ ඇගයීම.
- එම සිද්ධීන්හි හෝ පවත්නා තත්ත්වයන්හි බලපෑම සැහැල්ලු කරන කළමනාකාරිත්වයේ සැළසුම්.
- අඛණ්ඩ පැවැත්ම ලෙස නොකඩවා පවත්වාගෙන යාමට අස්තිත්ත්වයේ හැකියාවේ එහි තක්සේරුවේ කොටසක් ලෙස කළමනාකාරීත්වය විසින් ගත් සැළකිය යුතු අන්දමේ විනිශ්චයන්

අ25. මූල්‍ය ප්‍රකාශ සාධාරණ ඉදිරිපත් කිරීමේ ආකෘතිමය රාමුවේ ප්‍රකාරව පිළියෙල කළ විට, සමස්ථ ඉදිරිපත් කිරීම සැලකිල්ලට ගැනීම, මූල්‍ය ප්‍රකාශවල ව්‍යුහය සහ අන්තර්ගතය සහ මූල්‍ය ප්‍රකාශවල සම්බන්ධිත සටහන් ඇතුළුව පාදක වන ගණුදෙනු නියෝජනය වීම, සහ එය සාධාරණ ඉදිරිපත් කිරීමට අත් කර ගන්නා ආකාරයට සිද්ධීන් ඇතුළත්ව මූල්‍ය ප්‍රකාශ සාධාරණ ඉදිරිපත් කිරීම අත්කර ගන්නේ ද යන්න විගණක ඇගයිය යුතුය.[13] කරුණු සහ තත්වයන්ගේ රඳා පැවැත්මට සාධාරණ ඉදිරිපත් කිරීම ඉටු කර ගැනීමට අතිරේක හෙළිදරව් කිරීම් අවශ්‍ය බව විගණක නීර්ණය කළ හැක. මෙය අවස්ථාවක් වන්නේ උදාහරණ ලෙස අඛණ්ඩ පැවැත්ම ලෙස නොකඩවා පවත්වාගෙන යෑමට අස්තිත්ත්වයේ හැකියාව මත සැළකිය යුතු අන්දමේ සැකයක් පහළ විය හැකි සිද්ධීන් හෝ පවත්නා තත්ත්වයන් හඳුනා ගත්විට, එහෙත් ලබාගත් විගණන සාක්ෂි පදනම මත, විගණකගේ නිගමනය වන්නේ ප්‍රමාණාත්මක අනියතතාවයක් නොපවතින බව විටය, සහ මෙවැනි තත්ත්වයන්හිදී (අදාළ මූල්‍ය වාර්තාකරණ ආකෘතිමය රාමු මගින්) හෙළිදරව් කිරීමක් අවශ්‍ය නොවන බව ඉතා පැහැදිලිය.

විගණකගේ වාර්තාව සඳහා හඟවනු ලබන දෑ.

*අඛණ්ඩව පැවැත්ම පදනම් ගිණුම්කරණය භාවිත කිරීම අයෝග්‍යවීම* (යොමුව: 21 වන ඡේදය)

අ26. අඛණ්ඩ පැවැත්ම පදනම භාවිත කරමින් මූල්‍ය ප්‍රකාශ පිළියෙල කර ඇති නමුත් මූල්‍ය ප්‍රකාශ පිළියෙල කිරීම සඳහා අඛණ්ඩ පැවැත්ම පදනම ගිණුම්කරණය කළමනාකාරීත්වය විසින් භාවිත කිරීම අයෝග්‍ය වන බවට විගණකගේ විනිශ්චයවන විට, කළමනාකාරීත්වය අඛණ්ඩව පැවැත්ම පදනම ගිණුම්කරණය භාවිත කිරීම

[13] ශ්‍රී.ල.වි.ප්‍ර.700 (සංශෝධිත) *මූල්‍ය ප්‍රකාශ මත මතයක් සකස් කිරීම සහ වර්තා කිරීම* - 14 වන ඡේදය.

අයෝග්‍ය බව මූල්‍ය ප්‍රකාශවල හෙළිදරව් කිරීමක් ඇතුළත්කර තිබුණා හෝ එසේ නොකර තිබුණා වුවද යන්න නොසළකා විගණකට අහිතකර මතයක් ප්‍රකාශ කිරීම සඳහා 21 වන ඡේදයේ අවශ්‍යතාවයන් අදාළ වේ.

අ.27 පවතින තත්ත්වයන් තුළ අඛණ්ඩ පැවැත්ම පදනම මත ගිණුම්කරණය භාවිත කිරීම අයෝග්‍යවන අවස්ථාවක වෙනත් පදනමක් වන මූල්‍ය ප්‍රකාශ පිළියෙල කිරීමට කළමනාකාරීත්වයට, අවශ්‍ය විය හැක්කේ තෝරා ගත හැකි (උදා: ඈවර කිරීමේ පදනම) එවැනි අන්දමකට පිළියෙල කළ මූල්‍ය ප්‍රකාශවල විගණනයක් ඉටු කිරීමට විගණකට හැකිවන්නේ එම තත්ත්වය යටතේ එම වෙනත් පදනම මත ගිණුම්කරණය පිළිගත හැකියයි විගණක නීර්ණය කරන්නේ නම්ය. ඒ අනුව මූල්‍ය ප්‍රකාශ පිළියෙල කිරීමේ ගිණුම්කරණ පදනම පිළිබඳ ඒ අනුව ප්‍රමාණවත් හෙළිදරව් කිරීමක් ලබාදෙන්නේ නම්, එම මූල්‍ය ප්‍රකාශ මත විගණකට විකරණය නොකළ මතයක් ප්‍රකාශ කිරීමට හැකිවනු ඇත; එහෙත් ශ්‍රී.ල.වි.ප්‍ර. 706 (සංශෝධිත)[14] සමඟ අනුකූලව කරුණ අවධාරණය කිරීමේ ඡේදයක් විගණකගේ වාර්තාවේ ඇතුළත් කිරීම යෝග්‍ය හෝ අවශ්‍ය වියහැකි බව විගණකට සැළකිල්ලට ගතහැකි වන්නේ විකල්ප පදනම් ගිණුම්කරණය සහ එය භාවිත කිරීමට හේතු පරිශීලකයන්ගේ අවධාරණයට යොමු කරවීමටය.

*අඛණ්ඩ පැවැත්ම පදනම ගිණුම්කරණය භාවිත කිරීම යෝග්‍ය වේ. එහෙත් ප්‍රමාණාත්මක අනියතතාවයක් පවතී.* (යොමුව: 22 - 23 ඡේදය)

අ28. ප්‍රමාණාත්මක අනියතතාවයක් හඳුනා ගැනීම මූල්‍ය ප්‍රකාශ අවබෝධ කර ගැනීමට පරිශීලකයනට වැදගත්වන කරුණකි. අඛණ්ඩ පැවැත්මට සම්බන්ධිත ප්‍රමාණාත්මක අනියතතාවයක පැවැත්ම යන එම කරුණට යොමුවක් කරන ශීර්ෂයක් ඇතුළුව වෙනම කොටසක් භාවිත කිරීම මෙම තත්ත්වය යටතේ පරිශීලකයන්ව සෝදිසියෙන් තබයි.

අ29. ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත (SLFRSs) අදාළ වන මූල්‍ය වාර්තාකරණ ආකෘතිමය රාමුව වන විට, මූල්‍ය ප්‍රකාශ මත විගණකගේ වාර්තාවේ ඇතුළත් කිරීමට අවශ්‍ය කරන එම ප්‍රකාශවල නිදර්ශන මෙම ශ්‍රී.ල.වි.ප්‍ර. සඳහා වන පරිශිෂ්ඨයේ ලබා දී ඇත. ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති (SLFRSs) හැර, වෙනත් අදාළ මූල්‍ය වාර්තාකරණ ආකෘතිමය රාමුවක් භාවිත කළේ නම්, දී ඇති තත්ත්වයක් තුළදී වෙනත් මූල්‍ය වාර්තාකරණ ආකෘතිමය රාමුවක් ව්‍යවහාර කිරීම පිළිඹිබු වීමට මෙම ශ්‍රී.ල.වි.ප්‍ර. වන පරිශිෂ්ඨයේ ඉදිරිපත් කළ නිදර්ශනාත්මක ප්‍රකාශ සුදුසු පරිදි සකස් කර ගැනීමට අවශ්‍ය වේ.

අ.30 විස්තර කළ එක් එක් තත්ත්වයන්හිදී විගණකගේ වාර්තාවේ ඉදිරිපත් කිරීමට අවශ්‍ය කරන අවම තොරතුරු 22 ඡේදය ස්ථාපනය කරයි. අවශ්‍යකරන ප්‍රකාශවලට (අතිරේකව) අනුපූරකවීමට විගණක අමතර තොරතුරු ලබා දිය හැකිය. එය පැහැදිලි කිරීමට උදාහරණ වනුයේ:

- ප්‍රමාණාත්මක අනියතතාවයක පැවැත්ම පරිශීලකයන්ගේ මූල්‍ය ප්‍රකාශ අවබෝධකර ගැනීමට මූලිකවන දෙයකි.[15]
- එම කරුණ විගණනයේදී ආමන්ත්‍රණය කළේ කෙසේද? (අ1 ඡේදය එසේම බලන්න).

ප්‍රමාණාත්මක අනියතතාවයක ප්‍රමාණවත් හෙළිදරව් කිරීමක් මූල්‍ය ප්‍රකාශ තුළ සිදුකර තිබීම (යොමුව: 22 වන ඡේදය)

අ31. අඛණ්ඩ පදනම මත ගිණුම්කරණය කළමනාකාරිත්වයේ භාවිතයේ යෝග්‍යතාවය සම්බන්ධයෙන් විගණක ප්‍රමාණවත් යෝග්‍ය විගණන සාක්ෂි ලබාගත් විට එහෙත් ප්‍රමාණාත්මක අනියතතාවයන් පවතින විට මූල්‍ය ප්‍රකාශවල ප්‍රමාණවත් හෙළිදරව් කිරීම් සඳහා විගණකගේ වාර්තාව උදාහරණයකි. මෙම ශ්‍රී.ල.වි.ප්‍ර. ට වන පරිශිෂ්ඨයේ 1 වන නිදර්ශන මඟින් දී ඇත්තේ සියලු අස්තිත්ත්ව සඳහා අඛණ්ඩ පැවැත්ම සම්බන්ධිතව මූල්‍ය ප්‍රකාශ සඳහා වගකිව යුතු අයගේ සහ අඛණ්ඩ පැවැත්ම සම්බන්ධයෙන් විගණකගේ අදාළ වගකීම් විස්තර කරන විගණකගේ වාර්තා ඇතුළත් කළ යුතු නිදර්ශනාත්මක වචන පෙළ ගැස්ම ද එලෙසම ශ්‍රී.ල.වි.ප්‍ර. 700 (සංශෝධිත) පරිශිෂ්ඨයේ ඇතුළත් වේ.

ප්‍රමාණාත්මක අනියතතාවයක ප්‍රමාණවත් හෙළිදරව් කිරීමක් මූල්‍ය ප්‍රකාශවල සිදු නොකර ඇති අවස්ථාවක් (යොමුව: 23 ඡේදය)

අ32. මෙම ශ්‍රී.ල.වි.ප්‍ර. ට වන පරිශිෂ්ඨයේ 2 වන හා 3 වන නිදර්ශන, උදාහරණ වනුයේ විගණකගේ වාර්තාවේ පිළිවෙලින් කොන්දේසි සහිත සහ අහිතකර මත අඩංගුවන අවස්ථාවලදී අඛණ්ඩ පැවැත්ම පදනම ගිණුම්කරණය භාවිත කිරීමේ කළමනාකාරීත්වයේ යෝග්‍යතාවය පිළිබඳ ප්‍රමාණවත් යෝග්‍ය විගණන සාක්ෂි විගණක ලබාගත් අවස්ථාවක, එහෙත් ප්‍රමාණාත්මක අනියතතාවය පිළිබඳ ප්‍රමාණවත් හෙළිදරව් කිරීමක් මූල්‍ය ප්‍රකාශවල සිදුකර නොමැති අවස්ථාවක් සඳහා වේ.

අ33. මූල්‍ය ප්‍රකාශවලට සමස්ථයක් වශයෙන් සැළකිය යුතුවන බහු ආංගික අනියතතාවයන් සම්බන්ධ කරගන්නා අවස්ථාවන්හිදී අතිශය විරල සිද්ධීන්හිදී 22 වන ඡේදයේ අවශ්‍යකරන ප්‍රකාශය ඇතුළත් කරනවා වෙනුවට

[14] ශ්‍රී.ල.වි.ප්‍ර. 706 (සංශෝධිත) *ස්වාධීන විගණකගේ වාර්තාවේ කරුණ අවධාරණ කිරීමේ ඡේද සහ වෙනත් කරුණු ඡේද.*

[15] ශ්‍රී.ල.වි.ප්‍ර. 706 (සංශෝධිත) අ2 ඡේදය.

මතය වියාචනය කිරීම යෝග්‍ය යයි විගණක සැළකිය හැකිය; මෙම කරුණ පිළිබඳව උපදේශන ශ්‍රී.ල.වි.ප්‍ර. 705 (සංශෝධිත) ලබාදෙයි.[16]

නියාමකයන් සමඟ සන්නිවේදනය (යොමුව: 22 - 23 ඡේද)

අ34. නියාමනයට යටත් වූ අස්තිත්වයක විගණක, අඛණ්ඩ පැවැත්ම කරුණුවලට යොමු කිරීමට විගණකගේ වාර්තාවේ ඇතුළත් කිරීමට අවශ්‍ය වියහැකි යයි සළකන විට අදාළ නියාමන; බලාත්මක හෝ අධීක්ෂණය කිරීමේ අධිකාරීන් සමඟ සන්නිවේදනය කිරීමට විගණකට යුතුකමක් තිබිය යුතුය.

අස්තිත්ත්වයේ එහි තක්සේරු කිරීමක් කිරීමට හෝ දීමට කැමැත්තක් නොදැක්වීම (යොමුව: 24 ඡේදය)

අ35. සමහර තත්ත්වයන්හිදී එහි තක්සේරු සිදු කිරීමට හෝ දෙන ලෙස කළමනාකාරිත්වයට ඉල්ලීමක් කිරීම අවශ්‍ය යැයි විගණක විශ්වාස කළ හැකිය. කළමනාකරණය ඉල්ලීම ඉටු කිරීමට කැමැත්තක් දක්වන්නේ නැත්නම්, විගණකගේ වාර්තාවේ යෝග්‍ය විය හැක්කේ කොන්දේසි සහිත මතයක් හෝ මතය වියාචනය කිරීමකි, එසේ වන්නේ මූල්‍ය ප්‍රකාශ පිළියෙල කිරීමේදී අඛණ්ඩ පදනම ගිණුම්කරණය කළමනාකාරීත්වය භාවිත කිරීම පිළිබඳව ප්‍රමාණවත් යෝග්‍ය විගණන සාක්ෂි විගණකට ලබාගත නොහැකි වීමය; කළමනාකාරීත්වය විසින් ඉදිරිපත් කර ඇති සැළසුම්වල පැවැත්ම හෝ වෙනත් සැහැල්ලු කිරීමේ සාධකවල පැවැත්ම සම්බන්ධයෙන් වැනි විගණන සාක්ෂි.

| ශ්‍රී ලංකා විගණන ප්‍රමිති 700 (සංශෝධිත) යොමු කරන තැනකට සීමා කරන ලද වාර්තාව සඳහා නිදර්ශනාත්මක වාර්තා |
|---|

**පරිශිෂ්ටය**

(යොමුව: අ29 - අ31 - අ32 ඡේද)

## අඛණ්ඩ පැවැත්මට සම්බන්ධිත විගණකගේ වාර්තාවන්හි නිදර්ශන

- 1 වන නිදර්ශනය : ප්‍රමාණාත්මක අනියතතාවයක් පවතින බව සහ මූල්‍ය ප්‍රකාශවල හෙළිදරව් කිරීම ප්‍රමාණවත් බව විගණක නිගමනය කිරීමෙන් පසු විකරණය නොකළ මතයක් අඩංගු විගණකගේ වාර්තාවක්.
- 2 වන නිදර්ශනය : ප්‍රමාණාත්මක අනියතතාවයක් පවතින බව සහ ප්‍රමාණවත් නොවන හෙළිදරව් කිරීම නිසා මූල්‍ය ප්‍රකාශ ප්‍රමාණාත්මක ලෙස අවප්‍රකාශ වී ඇති බව විගණක නිගමනය කිරීමෙන් පසු කොන්දේසි සහිත මතයක් අඩංගු විගණකගේ වාර්තාවක්.
- 3 වන නිදර්ශනය : ප්‍රමාණාත්මක අනියතතාවයක් පවතින බව සහ ප්‍රමාණාත්මක අනියතතාවයකට සම්බන්ධිත අවශ්‍යකරන හෙළිදරව් කිරීම් මූල්‍ය ප්‍රකාශවලින් අත්හැර ඇති බව විගණක නිගමනය කිරීමෙන් පසු අහිතකර මතයක් අඩංගු විගණකගේ වාර්තාවක්.

[16] ශ්‍රී.ල.වි.ප්‍ර. 705 (සංශෝධිත) 10 වන ඡේදය.

**1 වන නිදර්ශනය - ප්‍රමාණාත්මක අනියතතාවයක් පවතින සහ මූල්‍ය ප්‍රකාශවල හෙළිදරව් කිරීම ප්‍රමාණවත් වන විට විකරණය නොකළ මතය.**

**මෙම නිදර්ශනාත්මක විගණකගේ වාර්තාවේ අරමුණු සඳහා පහත තත්ත්වයන් උපකල්පනය කෙරේ;**

- සාධාරණ ඉදිරිපත් කිරීමේ ආකෘතිමය රාමුව භාවිත කරමින් ලැයිස්තුගත අස්තිත්ත්වයක සම්පූර්ණ මූල්‍ය ප්‍රකාශ කට්ටලයක් විගණනය කිරීම. මෙම විගණනය සමූහ විගණනයක් නොවේ. (එනම් ශ්‍රී.ල.වි.ප්‍ර. 600[1] අදාළ නොවේ)
- අස්තිත්ත්වයේ කළමනාකාරීත්වය විසින් මූල්‍ය ප්‍රකාශ පිළියෙල කර ඇත්තේ ශ්‍රී ලංකා ගිණුම්කරන ප්‍රමිත ප්‍රකාරවය. (පොදු අරමුණු ආකෘතිමය රාමුවක්)
- ශ්‍රී.ල.වි.ප්‍ර. 210[22] තුළ මූල්‍ය ප්‍රකාශ සඳහා කළමනාකාරීත්වයේ වගකීමේ විස්තරය විගණන කාර්ය භාරයේ නියමයන්ගෙන් පිළිබිඹු වේ.
- ලබාගත් විගණන සාක්ෂි පදනම මත විගණක නිගමනය කළ විකරණය නොකළ මතය (එනම් විශද / නිදොස්) යෝග්‍ය වේ.
- විගණනයට ව්‍යවහාර වන අදාළ ආචාරධර්මීය අවශ්‍යතාවයන් ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනය නිකුත් කළ ආචාර ධර්ම සංග්‍රහයේ අඩංගුවේ.
- අඛණ්ඩ පැවැත්ම ලෙස නොකඩවා පවත්වාගෙන යාමට අස්තිත්වයේ හැකියාව මත සැළකිය යුතු අන්දමේ සැකයක් පහළ විය හැකි සිද්ධීන්ට හෝ පවත්නා තත්ත්වයන්ට සම්බන්ධිත ප්‍රමාණාත්මක අනියතතාවයක් පැවති බව ලබාගත් විගණක සාක්ෂි පදනම මත විගණක නිගමනය කර ඇත. මූල්‍ය ප්‍රකාශ තුළ ප්‍රමාණාත්මක අනියතතාවය පිළිබඳ හෙළිදරව් කිරීම ප්‍රමාණවත්ය.
- ශ්‍රී.ල.වි.ප්‍ර. 701 සමඟ අනුකූලව ප්‍රධාන විගණන කරුණු සන්නිවේදනය කර ඇත.
- විගණකගේ වාර්තාවේ දිනට පෙර විගණක සියලුම වෙනත් තොරතුරු ලබාගෙන ඇති අතර එම වෙනත් තොරතුරුවලින් මෙතෙක් දුරට ප්‍රමාණාත්මක අවප්‍රකාශයක් හඳුනාගෙන නොමැත.
- මූල්‍ය ප්‍රකාශ අධීක්ෂණය කිරීම සඳහා වගකිව යුතු අයගේ වගකීමෙන් මූල්‍ය ප්‍රකාශ පිළියෙල කිරීම සඳහා වගකිව යුතු අයගේ වගකීම වෙනස් වේ.
- මූල්‍ය ප්‍රකාශ විගණනයට අමතරව, දේශීය නීතිය යටතේ අවශ්‍ය කරන වෙනත් වාර්තාකරණ වගකීම් විගණකට ඇත.

## ස්වාධීන විගණකගේ වාර්තාව

සමාගමේ කොටස් හිමියන් වෙතට (උචිත පරිදි ලිපිය ලබන්නා)

මූල්‍ය ප්‍රකාශ විගණනය මත වාර්තාව[3]

මතය

ABC සමාගමේ (සමාගම) 20×1 දෙසැම්බර් 31 වන දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශය සහ එම දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා විස්තීර්ණ ආදායම් ප්‍රකාශය ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශය සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශය සහ මූල්‍ය ප්‍රකාශවලට සටහන් වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවල සාරාංශයක් ඇතුළු තොරතුරුවලින් සමන්විත මූල්‍ය ප්‍රකාශ අප විසින් විගණනය කරන ලදී.

අපගේ මතය වනුයේ මේ සමඟ ඇති 20×1 දෙසැම්බර් 31 දිනට සමාගමේ මූල්‍ය තත්ත්වය සහ එම දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්ය සාධනය සහ එහි මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත වලට අනුකූලව මූල්‍ය ප්‍රකාශ සත්‍ය හා සාධාරණ දර්ශනයක් පෙන්නුම් කරන බවය. (හෝ සියළු ප්‍රමාණාත්මක අංගයන්ගෙන් සාධාරණ අයුරින් ඉදිරිපත් කරනු ලබන බව)

---

[1] ශ්‍රී.ල.වි.ප්‍ර. 600, *විශේෂ සැළකිල්ලට ගැනීම් - සමූහ මූල්‍ය ප්‍රකාශ විගණනය (සංරචක විගණකවරුන්ගේ වැඩ ඇතුළුව)*

[2] ශ්‍රී.ල.වි.ප්‍ර. 210 - *විගණක කාර්ය භාරයේ නියමයන් එකඟවීම.*

[3] දෙවන උපසිරස් තලය යනු “වෙනත් නෛතික සහ නියාමන අවශ්‍යතාවයන් මත වාර්තාව” අදාළ නොවන වන තත්ත්වයන්හිදී, උප සිරස් තලය වන “මූල්‍ය ප්‍රකාශ විගණනය සඳහාවන වාර්තා” අවශ්‍ය නොවේ.

## මතය සඳහා පදනම

අපගේ විගණනය අප මෙහෙයවන ලද්දේ ශ්‍රී ලංකා විගණන ප්‍රමිති (ශ්‍රී.ල.වි.ප්‍ර.) වලට අනුකූලවය. එම ප්‍රමිතීන් යටතේ වන අපගේ වගකීම් අපගේ වාර්තාවේ මූල්‍ය ප්‍රකාශ විගණනය කිරීම සඳහා විගණකගේ වගකීම් කොටස තුළ තවදුරටත් විස්තර කර ඇත. ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනය විසින් නිකුත් කර ඇති ආචාර ධර්ම සංග්‍රහයේ (ආචාර ධර්ම සංග්‍රහය)[4] සමග අනුකූලව සමාගමෙන් අප ස්වාධීන වේ සහ මෙම අවශ්‍යතාවයන් සමග අනුකූලව අපගේ වෙනත් ආචාර ධර්ම වගකීම් අප සම්පූර්ණකර ඇත. අප ලබාගත් විගණන සාක්ෂි අපගේ මතය සඳහා පදනමක් ලබාදීමට ප්‍රමාණවත් සහ යෝග්‍ය බව අප විශ්වාස කරමු.

## අඛණ්ඩ පැවැත්මට සම්බන්ධිත ප්‍රමාණාත්මක අනියතතාවය.

මූල්‍ය ප්‍රකාශ තුළ ××× සටහනට අප අවධානය යොමු කරන අතර එමගින් 20×1 දෙසැම්බර් 31 න් අවසන් වූ වර්ෂය තුළදී සමාගම zzz ශුද්ධ අලාභයක් වාර්තාකර ඇති සහ එම දිනට සමාගමේ ජංගම වගකීම් එහි මුළු වත්කම් වලට වඩා yyy ප්‍රමාණයකින් ඉක්මවා ඇති බව ඇඟවේ. 6 වන සටහනේ සඳහන් කර ඇති පරිදි මෙම සිද්ධීන් හෝ පවත්නා තත්ත්වයන් 6 වන සටහනේ පැහැදිලි කර ඇති වෙනත් කරුණු සමග අඛණ්ඩ පැවැත්ම ලෙස නොකඩවා පවත්වාගෙන යාමට සමාගමේ හැකියාව මත සැළකිය යුතු අන්දමේ සැකයක් පහළ විය හැකි ප්‍රමාණාත්මක අනියතතාවයක් පවතින බව ඇඟවේ. මෙම කරුණ පිළිබඳ අපගේ මතය විකරණය කර නොමැත.

## ප්‍රධාන විගණන කරුණු

අපගේ වෘත්තිය විනිශ්චයට අනුව ප්‍රධාන විගණන කරුණු වන්නේ ප්‍රවර්තන කාලපරිච්ඡේදයේ අපගේ මූල්‍ය ප්‍රකාශ විගණනයේදී වඩාත්ම වැදගත් වූ එම කරුණුය. අපගේ මූල්‍ය ප්‍රකාශ විගණනය සමස්ථයක් ලෙස ගෙන සහ ඒ මත අපගේ මතය සකස් කිරීම සම්බන්ධයෙන් මෙම කරුණු ආමන්ත්‍රණය කර ඇති අතර මෙම කරුණු සම්බන්ධයෙන් වෙනම වූ මතයක් අප ලබා දෙන්නේ නැත. අඛණ්ඩ පැවැත්මට සම්බන්ධිත ප්‍රමාණාත්මක අනියතතාවය කොටසේ කරුණු විස්තර කළාට අමතරව, අපගේ වාර්තාව තුළ සන්නිවේදනය කළ යුතු ප්‍රධාන විගණන කරුණු ලෙස අප විසින් විස්තර කරන කරුණු නිර්ණය කර ඇත.

*[ශ්‍රී.ල.වි.ප්‍ර. 701 සමග අනුකූලව එක් එක් ප්‍රධාන විගණන කරුණක විස්තරයක්]*

## වෙනත් තොරතුරු ("මූල්‍ය ප්‍රකාශවල සහ විගණකගේ වාර්තාව මත හැර තොරතුරු" වැනි ලෙස යෝග්‍ය වන්නේ නම් වෙනත් ශීර්ෂයක්)

*[ශ්‍රී.ල.වි.ප්‍ර.720 (සංශෝධිත) තුළ වාර්තාකරණ අවශ්‍යතාවයන් සමග අනුකූලව වාර්තා කිරීම ශ්‍රී.ල.වි.ප්‍ර. 720 (සංශෝධිත) හි 2 වන පරිශ්ඨය තුළ 1 වන නිදර්ශනය බලන්න]*

## මූල්‍ය ප්‍රකාශ සඳහා කළමනාකාරීත්වයේ සහ පාලනය පිළිබඳව වගකිව යුතු අයගේ වගකීම්[5]

[ශ්‍රී.ල.වි.ප්‍ර. 700 (සංශෝධිත) සමඟ අනුකූලව වාර්තා කිරීම - ශ්‍රී.ල.වි.ප්‍ර. 700 (සංශෝධිත) හි 1 නිදර්ශනය බලන්න][6]

## මූල්‍ය ප්‍රකාශ විගණනය කිරීම සඳහා විගණකගේ වගකීම්.

*[ශ්‍රී.ල.වි.ප්‍ර. 700 (සංශෝධිත) සමග අනුකූලව වාර්තා කිරීම - ශ්‍රී.ල.වි.ප්‍ර. 700 (සංශෝධිත) හි 1 වන නිදර්ශනය බලන්න.]*

## වෙනත් නෛතික සහ නියාමන අවශ්‍යතාවයන් මත වාර්තාව

*[ශ්‍රී.ල.වි.ප්‍ර. 700 (සංශෝධිත) සමඟ අනුකූලව වාර්තා කිරීම. ශ්‍රී.ල.වි.ප්‍ර. 700 (සංශෝධිත) හි 1 වන නිදර්ශනය බලන්න]*

ස්වාධීන විගණකගේ වාර්තාව අත්සන් කිරීම සඳහා වගකිව යුතු කාර්යයේ නියුතු හවුල්කරුගේ ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනයේ සාමාජික අංකය *[අංකය]*

---

4 විගණකවරුන් සඳහා වෙනත් ආචාර ධර්ම අවශ්‍යතාවයන්ට යම් නියාමන අධිකාරියක් විසින් නිකුත් කර ඇති අවස්ථාවක එවැනි රෙගුලාසි සඳහා යොමුවක් සිදු කළ යුතුය.

5 මෙම නිදර්ශනාත්මක විගණකගේ වාර්තාව පුරාවටම කළමණාකාරීත්වය සහ පාලනය පිළිබඳ වගකිව යුතු අය යන පද විශේෂ අධිකරණ බල ප්‍රදේශයක් තුළ නෛතික අකෘතිමය රාමුව සම්බන්ධයෙන් යෝග්‍ය වන වෙනත් පදයක් මගින් ආදේශ කිරීම අවශ්‍ය විය හැකිය.

6 සියලු අස්තිත්ත්ව සඳහා විගණකගේ වාර්තාව තුළ මූල්‍ය ප්‍රකාශ සඳහා වගකිව යුතු අයගේ අදාළ වගකීම් විස්තර කිරීමට සම්බන්ධිත අඛණ්ඩ පැවැත්ම සහ අඛණ්ඩ පැවැත්මට සම්බන්ධිත විගණකගේ වගකීම් පිළිබඳ විස්තර කිරීමට වචන පෙළ ගැස්ම ඇතුළත් කිරීම ශ්‍රී.ල.වි.ප්‍ර. 700 හි (සංශෝධිත) 34 සහ 39 ඡේදවලින් අවශ්‍ය කෙරේ.

*[විගණන සමාගම නමින් අත්සන]*

*[විගණන සමාගමේ ලිපිනය]*

[දිනය]

**2 වන නිදර්ශනය - ප්‍රමාණාත්මක අනියතතාවයක් පවතින විට සහ ප්‍රමාණවත් නොවන හෙළිදරව් කිරීම් නිසා මූල්‍ය ප්‍රකාශ ප්‍රමාණාත්මක ලෙස අවප්‍රකාශ වනවිට කොන්දේසි සහිත මතය**

**මෙම නිදර්ශනාත්මක විගණකගේ වාර්තාවේ අරමුණු සඳහා පහත තත්ත්වයන් උපකල්පනය කෙරේ;**

- සාධාරණ ඉදිරිපත් කිරීමේ ආකෘතිමය රාමුව භාවිත කරමින් ලැයිස්තු ගත අස්තිත්ත්වයක සම්පූර්ණ මූල්‍ය ප්‍රකාශ කට්ටලයක් විගණනය කිරීම. මෙම විගණනය සමූහ විගණනයක් නොවේ. (එනම් ශ්‍රී.ල.වි.ප්‍ර. 600 අදාළ නොවේ)
- අස්තිත්ත්වයේ කළමනාකාරීත්වය විසින් මූල්‍ය ප්‍රකාශ පිළියෙල කර ඇත්තේ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති ප්‍රකාරවය. (පොදු අරමුණු ආකෘතිමය රාමුවක්)
- ශ්‍රී.ල.වි.ප්‍ර. 210 තුළ මූල්‍ය ප්‍රකාශ සඳහා කළමනාකාරීත්වයේ වගකීමේ විස්තරය විගණන කාර්ය භාරයේ නියමයන්ගෙන් පිළිබිඹු වේ.
- විගණනයට ව්‍යවහාරවන අදාළ ආචාර ධර්මීය අවශ්‍යතාවයන් ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනය විසින් නිකුත් කළ ආචාර ධර්ම සංග්‍රහයේ අඩංගු වේ.
- අඛණ්ඩ පැවැත්ම ලෙස නොකඩවා පවත්වාගෙන යාමට අස්තිත්ත්වයේ හැකියාව මත සැළකිය යුතු අන්දමේ සැකයක් පහළ විය හැකි සිද්ධීන් හෝ තත්ත්වයන්ද සම්බන්ධිත ප්‍රමාණාත්මක අනියතතාවයන් පවතින බව ලබාගත් විගණන සාක්ෂි මත විගණක නිගමනය කර ඇත. මූල්‍ය කරන එකඟවීම්වල විශාලත්වය කල් පිරීම සහ මුළු මූල්‍යකරණය එකඟවීම්වල එකතුව පිළිබඳ මූල්‍ය ප්‍රකාශ වලට වන හහහ සටහන මගින් විමසා ඇත. කෙසේ වෙතත් මූල්‍ය ප්‍රකාශවල ප්‍රතිමූල්‍යකරණය ලබාගත හැකි බව හෝ මෙම තත්ත්වය ප්‍රමාණාත්මක අනියතතාවයක් ලෙස එහි ස්වභාවය විස්තර කිරීමෙන් හෝ බලපෑම මත විමසීමත් ඇතුළත් කර නැත.
- ප්‍රමාණාත්මක අනියතතාවයක ප්‍රමාණවත් නොවන හෙළිදරව් කිරීම නිසා මූල්‍ය ප්‍රකාශ ප්‍රමාණාත්මක ලෙස අවප්‍රකාශ වී ඇත. කොන්දේසි සහිත මතයක් ප්‍රකාශ කිරීමට හේතුවන්නේ මෙම ප්‍රමාණවත් නොවන හෙළිදරව් කිරීමේ, මූල්‍ය ප්‍රකාශමත වන බව බලපෑම ප්‍රමාණාත්මක වන නමුත් මූල්‍ය ප්‍රකාශවලට පෘතුල නොවන බව විගණක නිගමනය කර ඇති නිසාය.
- ශ්‍රී.ල.වි.ප්‍ර. 701 සමඟ අනුකූලව ප්‍රධාන විගණන කරුණු සන්නිවේදනය කර ඇත.
- විගණකගේ වාර්තාවේ දිනයට පෙර විගණක සියලුම වෙනත් තොරතුරු ලබා ගෙන ඇති අතර මූල්‍ය ප්‍රකාශ මත කොන්දේසි සහිත මතයකට හේතු වූ කරුණු එලෙසම වෙනත් තොරතුරුවලට බලපායි.
- මූල්‍ය ප්‍රකාශ අධීක්ෂණය කිරීම සඳහා වගකිව යුතු අයගෙන් මූල්‍ය ප්‍රකාශ පිළියෙල කිරීම සඳහා වගකිව යුතු අය වෙනස්ය.
- මූල්‍ය ප්‍රකාශ විගණනයට අමතරව දේශීය නීතිය යටතේ අවශ්‍යකරන වෙනත් වාර්තාකරණ වගකීම් විගණකට ඇත.

## ස්වාධීන විගණකගේ වාර්තාව

සමාගමේ කොටස් හිමියන් වෙතට හෝ උචිත පරිදි ලිපිය ලබන්නා%

**මූල්‍ය ප්‍රකාශ විගණනය මත වාර්තාව**[7]

**කොන්දේසි සහිත මතය**

ABC සමාගමේ (සමාගම) 20×1 දෙසැම්බර් 31 වන දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශය සහ එම දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා විස්තීර්ණ ආදායම් ප්‍රකාශය, ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශය සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශය සහ මූල්‍ය ප්‍රකාශවලට

---

7 දෙවන උපසිරස් තලය යනු "වෙනත් නෛතික සහ නියාමන අවශ්‍යතාවයන් මත වාර්තාව" අදාළ නොවන වන තත්ත්වයන්හිදී, උප සිරස් තලය වන "මූල්‍ය ප්‍රකාශ විගණනය සඳහාවන වාර්තා" අවශ්‍ය නොවේ.

සටහන් සහ වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවල සාරාංශයක් ඇතුළු තොරතුරුවලින් සමන්විත මූල්‍ය ප්‍රකාශ අප විසින් විගණනය කරන ලදී.

අපගේ මතය වනුයේ, අපගේ වාර්තාවේ කොන්දේසි සහිත මතයක් සඳහා පදනම යන කොටසේ යොමු කර ඇති අසම්පූර්ණ තොරතුරු හෙළිදරව් කිරීම සඳහා හැර, 20×1 දෙසැම්බර් 31 දිනට සමාගමේ මූල්‍ය තත්ත්වය සහ එම දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා එහි මූල්‍යාකාර්ය සාධනය සහ එහි මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතවලට අනුකූලව මේ සමඟ ඇති මූල්‍ය ප්‍රකාශ සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පෙන්නුම් කරන බවය. (හෝ සියලු ප්‍රමාණාත්මක අංගයන්ගෙන් සාධාරණ අයුරින් ඉදිරිපත් කරනු ලබන බවය).

## කොන්දේසි සහිත මතය සඳහා පදනම

YY සටහනෙන් සාකච්ඡා කළ පරිදි සමාගමේ මූල්‍යන කිරීමේ එකඟවීම්හි කාලය ඉක්මවා ගොස් ඇති අතර, හිඟහිටි වටිනාකම් 20×2 මාර්තු 19 වන දින ගෙවිය යුතුය. සමාගමට යළි ගිවිස ගැනීම් නිම කිරීමට හෝ ආදේශන මූල්‍යන කිරීම් ලබා ගැනීමට නොහැකි වී ඇත; මෙම තත්ත්වය අඛණ්ඩ පැවැත්ම ලෙස නොකඩවා පවත්වාගෙන යාමේ සමාගමේ ඇති හැකියාව මත සැලකිය හැකි තරම් අන්දමේ සැකයක් පහළ විය හැකි ප්‍රමාණාත්මක අනියතතාවයක් පවතින බව ඇඟවේ. මූල්‍ය ප්‍රකාශ මෙම කරුණ ප්‍රමාණවත් ලෙස හෙළිදරව් කර නොමැත.

අපගේ විගණනය අපි පවත්වාගෙන ගියේ ශ්‍රී ලංකා විගණන ප්‍රමිත (ශ්‍රී.ල.වි.ප්‍ර.) සමඟ අනුකූලවය. එම ප්‍රමිති යටතේ අපගේ වගකීම් තවදුරටත් අපගේ වාර්තාවේ මූල්‍ය ප්‍රකාශ විගණනය සඳහා විගණකගේ වගකීම් යන කොටස තුළ විස්තරකර ඇත.

ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනය විසින් නිකුත් කර ඇති ආචාර ධර්ම සංග්‍රහය (ආචාර ධර්ම සංග්‍රහය)[8] සමඟ අනුකූලව සමාගමෙන් අප ස්වාධීන වන අතර අපගේ වෙනත් ආචාර ධර්ම වගකීම් මෙම අවශ්‍යතාවයට අනුකූලව අප සම්පූර්ණ කර ඇත. අප ලබාගත් විගණන සාක්ෂි අපගේ කොන්දේසි සහිත මතය සඳහා පදනමක් ලබා දීමට ප්‍රමාණවත් සහ යෝග්‍ය බව අප විශ්වාස කරමු.

වෙනත් තොරතුරු හෝ ("මූල්‍ය ප්‍රකාශවල සහ විගණකගේ වාර්තාව මත හැර තොරතුරු" වැනි ලෙස යෝග්‍ය වන්නේ නම් වෙනත් ශීර්ෂයක්)

*[(ශ්‍රී.ල.වි.ප්‍ර. 720 (සංශෝධිත) තුළ වාර්තාකරණ අවශ්‍යතාවයන් සමඟ අනුකූලව වාර්තා කිරීම - ශ්‍රී.ල.වි.ප්‍ර. 720 (සංශෝධිත) හි 2 වන පරිශිෂ්ඨයේ 6 වන නිදර්ශනය බලන්න. වෙනත් තොරතුරු කොටස තුළ අවසාන ඡේදයෙහි 6 වන නිදර්ශනය කොන්දේසි සහිත මතය ඇතිවීමට හේතු වූ විශේෂිත කරුණ විස්තර කිරීමට අභිරුචිකරණය කළ යුතුය. එය එලෙසම වෙනත් තොරතුරුවලටද බලපායි)]*

## ප්‍රධාන විගණන කරුණු

අපගේ වෘත්තිය විනිශ්චයට අනුව ප්‍රධාන විගණන කරුණු වන්නේ ප්‍රවර්තන කාල පරිච්ඡේදයේ අපගේ මූල්‍ය ප්‍රකාශ විගණනයේදී වඩාත්ම වැදගත් වූ එම කරුණුය. මූල්‍ය ප්‍රකාශ විගණනය සමස්ථයක් ලෙස ගෙන සහ ඒ මත අපගේ මතය සකස් කර ගැනීම සම්බන්ධයෙන් මෙම කරුණු ආමන්ත්‍රණය කර ඇති අතර මෙම කරුණු සම්බන්ධයෙන් වෙනමවූ මතයක් අප ලබා දෙන්නේ නැත. *කොන්දේසි සහිත මතය සඳහා පදනම* කොටස තුළ විස්තර කළ කරුණට අමතරව අපගේ වාර්තාවේ සන්නිවේදනය කළ යුතු ප්‍රධාන විගණන කරුණු ලෙස අප විසින් පහත විස්තර කරන කරුණු නීර්ණය කර ඇත.

*[ශ්‍රී.ල.වි.ප්‍ර. 701 සමඟ අනුකූලව එක් එක් ප්‍රධාන විගණන කරුණක විස්තරයක්]*

## මූල්‍ය ප්‍රකාශ සඳහා කළමනාකාරීත්වයේ සහ පාලනය පිළිබඳව වගකිව යුතු අයගේ වගකීම් [9]

*[ශ්‍රී.ල.වි.ප්‍ර. 700 (සංශෝධිත) ප්‍රකාරව වාර්තා කිරීම - ශ්‍රී.ල.වි.ප්‍ර. 700 (සංශෝධිත) 1 වන නිදර්ශන බලන්න[10]]*

## මූල්‍ය ප්‍රකාශ විගණනය කිරීම සඳහා විගණකගේ වගකීම්

*[ශ්‍රී.ල.වි.ප්‍ර. 700 (සංශෝධිත) අනුකූලව වාර්තා කිරීම - ශ්‍රී.ල.වි.ප්‍ර. 700 (සංශෝධිත) හි 1වන නිදර්ශනය බලන්න]*

## වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතාවයන් මත වාර්තාව

---

8 විගණකවරුන් සඳහා වෙනත් ආචාර ධර්ම අවශ්‍යතාවයන් යම් අධිකාරීන් විසින් නිකුත් කර ඇති අවස්ථාවක එවැනි රෙගුලාසි සඳහා යොමුවක් සිදු කළ යුතුය.

9 හෝ විශේෂ අධිකරණ බල ප්‍රදේශයක නෛතික ආකෘතිමය රාමු සම්බන්ධයෙන් යෝග්‍යවන වෙනත් නියමයන්.

10 සියළු අස්තිත්ත්ව සඳහා විගණකගේ වාර්තාව තුළ මූල්‍ය ප්‍රකාශ සඳහා වගකිව යුතු අයගේ අදාළ වගකීම් විස්තර කිරීමට සම්බන්ධිත අඛණ්ඩ පැවැත්ම සහ අඛණ්ඩ පැවැත්මට සම්බන්ධිත විගණකගේ වගකීම්වලින් විස්තර කිරීමට වචන පෙළගැස්ම ඇතුළත් කිරීම ශ්‍රී.ල.වි.ප්‍ර. 700 හි (සංශෝධිත) 34 සහ 39 ඡේදවලින් අවශ්‍ය කෙරේ.

*[ශ්‍රී.ල.වි.ප්‍ර. 700 (සංශෝධිත) සමග අනුකූලව වාර්තා කිරීම] - ශ්‍රී.ල.වි.ප්‍ර. 700 (සංශෝධිත) හි 1 හා නිදර්ශනය බලන්න]*

ස්වාධීන විගණකගේ වාර්තාව අත්සන් කිරීම සඳහා වගකිව යුතු කාර්යයෙහි නියුතු හවුල්කරුවන්ගේ ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනයේ *සාමාජික අංකය]*

*[විගණන සමාගම නමින් අත්සන]*

*[විගණන සමාගමේ ලිපිනය]*

[දිනය]

**3 වන නිදර්ශනය - ප්‍රමාණාත්මක අනියතතාවයන් පවතින විට සහ මූල්‍ය ප්‍රකාශවල එය හෙළිදරව් නොකරන විට අහිතකර මතය.**

**මෙම නිදර්ශනාත්මක විගණකගේ වාර්තාවේ අරමුණු සඳහා පහත තත්ත්වයන් උපකල්පනය කෙරේ;**

- **සාධාරණ ඉදිරිපත් කිරීමේ ආකෘතිමය රාමුව භාවිත කරමින් ලැයිස්තුගත අස්තිත්ත්වයක් නොවන අස්තිත්ත්වයක මූල්‍ය ප්‍රකාශ කට්ටලයක් විගණනය කිරීම. මෙම විගණනය සමූහ විගණනයක් නොවේ. (එනම් ශ්‍රී.ල.වි.ප්‍ර. 600 ව්‍යවහාර නොවේ)**
- **අස්තිත්ත්වයේ කළමනාකාරීත්වය විසින් මූල්‍ය ප්‍රකාශ පිළියෙල කර ඇත්තේ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත ප්‍රකාරවය. (පොදු අරමුණු ආකෘතිමය රාමුව)**
- **ශ්‍රී.ල.වි.ප්‍ර. 210 තුළ මූල්‍ය ප්‍රකාශ සඳහා කළමනාකාරීත්වයේ වගකීමේ විස්තරය විගණන කාර්ය භාරයේ නියමයන්ගෙන් පිළිබිඹු වේ.**
- **විගණනයට ව්‍යවහාර වන අදාළ ආචාර ධර්මීය අවශ්‍යතාවයන් ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනය විසින් නිකුත් කර ඇති ආචාර ධර්ම සංග්‍රහයේ ඇතුළත් වේ.**
- **අඛණ්ඩ පැවැත්ම ලෙස නොකඩවා පවත්වාගෙන යාමට අස්තිත්ත්වයේ හැකියාව මත ප්‍රමාණාත්මක සැළකිය යුතු අන්දමේ සැකයක් පහළ විය හැකි සිද්ධීන් හෝ පවත්නා තත්ත්වයන්ට සම්බන්ධිත වන ප්‍රමාණාත්මක අනියතතාවයක් පවතින බව ලබාගත් විගණන සාක්ෂි මත විගණක නිගමනය කර ඇත සහ සමාගම බුන්වත් වීම සළකා බලා ඇත. ප්‍රමාණාත්මක අනියතතාවයට සම්බන්ධිත අවශ්‍ය කරන හෙළිදරව් කිරීම් මූල්‍ය ප්‍රකාශවල අත්හැර ඇත. මූල්‍ය ප්‍රකාශයන්හි එවැනි අත්හැරීමක බලපෑම ප්‍රමාණාත්මක සහ පෘතුල නිසා අහිතකර මතයන් ප්‍රකාශ කර ඇත.**
- **ශ්‍රී.ල.වි.ප්‍ර. 701 සමග අනුකූලව ප්‍රධාන විගණන කරුණු සන්නිවේදනය කිරීමට විගණකට අවශ්‍ය නොකෙරේ. සහ අන්වශයෙන් එසේ සිදුකිරීමට තීරණය කර නැත.**
- **විගණකගේ වාර්තාවේ දිනයට පෙර විගණක සියලු වෙනත් තොරතුරු ලබාගෙන ඇති අතර මූල්‍ය ප්‍රකාශ මත අහිතකර මතයකට හේතු වූ කරුණු එලෙසම වෙනත් තොරතුරුවලට බලපායි.**
- **මූල්‍ය ප්‍රකාශ අධීක්ෂණය කිරීම සඳහා වගකිව යුතු අයගෙන් මූල්‍ය ප්‍රකාශ පිළියෙල කිරීම සඳහා වගකිය යුතු අයත් වෙනස්ය.**
- **මූල්‍ය ප්‍රකාශ විගණනයට අමතරව දේශීය නීතිය යටතේ අවශ්‍යකරන වෙනත් වාර්තා කරන වගකීම් විගණකට ඇත.**

## ස්වාධීන විගණකගේ වාර්තාව

ABC සාමාගමේ කොටස් හිමියන් වෙතට (හෝ උචිත පරිදි ලබන්නා)

## මූල්‍ය ප්‍රකාශ විගණනය මත වාර්තාව[11]

## අහිතකර මතය

ABC සමාගමේ (සමාගම) 20×1 දෙසැම්බර් 31 වන දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශය සහ එම දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා විස්තීර්ණ ආදායම් ප්‍රකාශය, ස්කන්ධය වෙනස් වීමේ ප්‍රකාශය සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශය සහ මූල්‍ය ප්‍රකාශවලට

11 දෙවන උපසිරස් තලය යනු "වෙනත් නෛතික සහ නියාමන අවශ්‍යතාවයන් මත වාර්තාව" අදාළ නොවන වන තත්ත්වයන්හදී, උප සිරස් තලය වන "මූල්‍ය ප්‍රකාශ විගණනය සඳහාවන වාර්තා" අවශ්‍ය නොවේ.

සටහන් සහ වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවල සාරාංශයන් ඇතුලු තොරතුරුවලින් සමන්විත මූල්‍ය ප්‍රකාශ අප විසින් විගණනය කරන ලදී.

අපගේ මතය වනුයේ, අපගේ වාර්තාවේ අහිතකර මතයක් සඳහා පදනම කොටසේ සඳහන් කර ඇති තොරතුරු අත් හැරීම නිසාය, 20×1 දෙසැම්බර් 31 දිනට සමාගමේ මූල්‍ය තත්ත්වය සහ එම දිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්ය සාධනය සහ මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතවලට අනුකූලව මේ සමඟ ඇති මූල්‍ය ප්‍රකාශ සත්‍ය හා සාධාරණ දර්ශනයක් පෙන්නුම් නොකරන බවය. (හෝ සියලු ප්‍රමාණාත්මක අංගයන්ගෙන් සාධාරණ අයුරින් ඉදිරිපත් නොකරනු ලබන බව)

## අහිතකර මතය සඳහා පදනම

සමාගමේ මූල්‍යකරණ එකඟවීම්වල කාලය ඉක්මවා ගොස් ඇති අතර හිඟව ඇති වටිනාකම් 20×1 දෙසැම්බර් 31 දිනට ගෙවිය යුතුව ඇත. සමාගම යළි ගිවිස ගැනීම් නිම කිරීමට හෝ ආදේශන මූල්‍ය පහසුකම් ලබා ගැනීමට නොහැකි වී ඇත, සහ බුන්වත් වීම සඳහා ඉල්ලුම් කිරීමට සළකා බලමින් සිටී. මෙම තත්ත්වයට ප්‍රමාණාත්මක අනියතතාවයන් පවතින බව අඟවන අතර, සමාගමේ අඛණ්ඩ පැවැත්ම ලෙස නොකඩවා පවත්වාගෙන යාමේ එහි හැකියාව මත සැළකිය යුතු අන්දමේ සැකයක් පහළ විය හැකි ප්‍රමාණාත්මක අනියතතාවයක් පවතී. මෙම කරුණ මූල්‍ය ප්‍රකාශවල ප්‍රමාණාත්මක ලෙස හෙළිදරව් කරන්නේ නැත. අපගේ විගණනය අපි පවත්වාගෙන ගියේ ශ්‍රී ලංකා විගණන ප්‍රමිතවලට අනුකූලවය; (ශ්‍රී.ල.වි.ප්‍ර.) එම ප්‍රමිති යටතේ අපගේ වගකීම් තවදුරටත් අපගේ වාර්තාවේ මූල්‍ය ප්‍රකාශ විගණනය සඳහා විගණකගේ වගකීම් යන කොටස තුළ විස්තර කර ඇත. ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනය විසින් නිකුත් කර ඇති ආචාර ධර්ම සංග්‍රහය (ආචාර ධර්ම සංග්‍රහය)[12] සමඟ අනුකූලව සමාගමෙන් අප ස්වාධින වන අතර අපගේ ආචාර ධර්ම වගකීම් මෙම අවශ්‍යතාවයනට අනුකූලව අප ඉටු කර ඇත. අප ලබාගත් විගණන සාක්ෂි අපගේ අහිතකර මතය සඳහා පදනමක් ලබා දීමට ප්‍රමාණවත් සහ යෝග්‍ය බව අපි විශ්වාස කරමු.

## වෙනත් තොරතුරු හෝ මූල්‍ය ප්‍රකාශවල සහ විගණකගේ වාර්තාව මත හැර තොරතුරු" වැනි ලෙස යෝග්‍ය වන්නේ නම් වෙනත් ශීර්ෂයක්

*[ශ්‍රී.ල.වි.ප්‍ර. 720 (සංශෝධිත) තුළ වාර්තාකරණ අවශ්‍යතාවයන් සමඟ අනුකූලව වාර්තා කිරීම ශ්‍රී.ල.වි.ප්‍ර. 720 (සංශෝධිත) හි 2 වන පරිශිෂ්ටයේ 7 වන නිදර්ශන බලන්න] වෙනත් තොරතුරු කොටස තුළ අවසාන ඡේදයෙහි 7 වන නිදර්ශනය අහිතකර මතය ඇති වීමට හේතු වූ විශේෂිත කරුණු විස්තර කිරීම අභිරුචිකරණය කළ යුතුය. එය එලෙසම වෙනත් තොරතුරුවලටද බලපායි]*

## මූල්‍ය ප්‍රකාශ සඳහා කළමනාකාරීත්වය සහ පාලනය පිළිබඳ වගකිව යුතු අයගේ වගකීම[13]

*[ශ්‍රී.ල.වි.ප්‍ර. 700 (සංශෝධිත) සමඟ අනුකූලව වාර්තා කිරීම - ශ්‍රී.ල.වි.ප්‍ර. 700 (සංශෝධිත) හි 1 වන නිදර්ශනය බලන්න.[14]]*

## මූල්‍ය ප්‍රකාශ විගණනය සඳහා විගණකගේ වගකීම්

*[ශ්‍රී.ල.වි.ප්‍ර 700 (සංශෝධිත) සමඟ අනුකූලව වාර්තා කිරීම - ශ්‍රී.ල.වි.ප්‍ර. 700 (සංශෝධිත) හි 3 වන නිදර්ශනය බලන්න]*

## වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතාවයන් මත වාර්තාව

*[ශ්‍රී.ල.වි.ප්‍ර. 700 (සංශෝධිත) සමඟ අනුකූලව වාර්තා කිරීම - ශ්‍රී.ල.වි.ප්‍ර. 700 (සංශෝධිත) 1 වන නිදර්ශනය බලන්න]*

*[විගණන සමාගම නමින් අත්සන]*

*[විගණකගේ ලිපිනය]*

[දිනය]

12 විගණකවරුන් සඳහා වෙනත් ආචාර ධර්ම අවශ්‍යතාවයන් යම් අධිකාරියන් විසින් නිකුත් කර ඇති අවස්ථාවක එවැනි රෙගුලාසි සඳහා යොමුවක් සිදු කළ යුතුය.

13 හෝ විශේෂ අධිකරණ බල ප්‍රදේශයක නෛතික ආකෘතිමය රාමු සම්බන්ධයෙන් යෝග්‍ය වන වෙනත් නියමයන්)

14 සියලු අසත්තිත්ත්ව සඳහා විගණකගේ වාර්තාව තුළ මූල්‍ය ප්‍රකාශ සඳහා වගකිව යුතු අයගේ අදාළ වගකීම් විස්තර කිරීමට සම්බන්ධිත අඛණ්ඩ පැවැත්ම සහ අඛණ්ඩ පැවැත්ම සම්බන්ධ විගණකගේ වගකීම් පිළිබඳව විස්තර කිරීමට වචන පෙළගැස්ම ඇතුළත් කිරීම ශ්‍රී.ල.වි.ප්‍ර. 700 (සංශෝධිත) 34 සහ 35 ඡේදවලින් අවශ්‍ය කෙරේ.

# ශ්‍රී ලංකා විගණන ප්‍රමිත 610 (සංශෝධිත)

# අභ්‍යන්තර විගණකවරුන්ගේ වැඩ ප්‍රයෝජනයට ගැනීම

(2018 මාර්තු 31 දින හෝ ඉන් පසුව අවසන්වන කාල පරිච්ඡේද සඳහා
මුල්‍ය ප්‍රකාශ විගණනය සඳහා බල පැවැත්වේ)

## පටුන


| | ඡේද |
|---|---|
| **හැඳින්වීම** | |
| මෙම ශ්‍රී.ල.වි.ප්‍ර. යේ විෂය පථය | 1-5 |
| ශ්‍රී.ල.වි.ප්‍ර. 315 (සංශෝධිත) සහ ශ්‍රී.ල.වි.ප්‍ර. 610 (සංශෝධිත 2013) අතර ඇති සම්බන්ධතාවය | |
| විගණනය සඳහා බාහිර විගණකගේ වගකීම | 11 |
| බලපැවැත්වෙන දිනය | 12 |
| **අරමුණු** | 13 |
| **නිර්වචන** | 14 |
| **අවශ්‍යතාවයන්** | |
| අභ්‍යන්තර විගණකගේ කාර්යයේ වැඩ කුමන ක්‍ෂේත්‍ර තුළ සහ කුමන ප්‍රමාණයක් දක්වා ප්‍රයෝජනයට ගත හැකි දැයි නිර්ණය කිරීම | 15-20 |
| අභ්‍යන්තර විගණන කාර්යයේ වැඩ ප්‍රයෝජනයට ගැනීම | 21-25 |
| සෘජු සහාය ලබා ගැනීමට අභ්‍යන්තර විගණකවරුන් කුමන ක්‍ෂේත්‍රවල කුමන ප්‍රමාණයකට යොදවා ගත හැකිද යන්න නිර්ණය කිරීම. | 26-32 |
| සෘජු සහාය ලබා ගැනීමට අභ්‍යන්තර විගණකවරුන් යොදවා ගැනීම. | 33-35 |
| ලේඛනගත කිරීම | 36-37 |
| **භාවිත කිරීමේ සහ පැහැදිලි කිරීමේ වෙනත් කරුණු** | |
| අභ්‍යන්තර විගණන කාර්යයේ නිර්වචනය | අ1 - අ4 |
| අභ්‍යන්තර විගණන කාර්යයේ වැඩ කුමන ක්ෂේත්‍ර තුළ සහ කුමන ප්‍රමාණයක් දක්වා ප්‍රයෝජනයට ගත හැකිද යන්න නිර්ණය කිරීම | අ5 - අ23 |
| අභ්‍යන්තර විගණන කාර්යයේ වැඩ ප්‍රයෝජනයට ගැනීම | අ24 - අ30 |
| සෘජු සහාය ලබා ගැනීමට අභ්‍යන්තර විගණකවරුන් කුමන ක්ෂේත්‍රවල කුමන ප්‍රමාණයකට යොදවා ගත හැකිද යන්න නිර්ණය කිරීම | අ31 - අ39 |
| සෘජු සහායක් ලබා ගැනීම අභ්‍යන්තර විගණකවරුන් යොදවා ගැනීම | අ40 - අ41 |


ශ්‍රී ලංකා විගණන ප්‍රමිත (ශ්‍රී.ල.වි.ප්‍ර.) 610 (සංශෝධිත 2013) *අභ්‍යන්තර විගණකවරුන්ගේ වැඩ ප්‍රයෝජනයට ගැනීම කියවිය යුත්තේ ශ්‍රී.ල.වි.ප්‍ර. 200 ස්වාධීන විගණකගේ සමස්ථ අරමුණුවලට සහ ශ්‍රී ලංකා විගණන ප්‍රමිත සමඟ අනුකූලව විගණනයක් මෙහෙයවීමට සම්බන්ධ කිරීමෙනි.*

## හැඳින්වීම

## මෙම ශ්‍රී.ල.වි.ප්‍ර. යේ විෂය පථය

1. මෙම ශ්‍රී ලංකා විගණන ප්‍රමිතය (ශ්‍රී.ල.වි.ප්‍ර.) කටයුතු කරන්නේ අභ්‍යන්තර විගණකවරුන්ගේ වැඩ ප්‍රයෝජනයට ගන්නේ නම් බාහිර විගණකගේ වගකීම් පිළිබඳවය. මෙයට ඇතුළත්වන්නේ (අ) විගණන සාක්ෂි ලබා ගැනීමේ අභ්‍යන්තර විගණන කාර්යයේ වැඩ ප්‍රයෝජනයට ගැනීම (ආ) බාහිර විගණකගේ මෙහෙයවීම, අධීක්ෂණය සහ සමාලෝචනය යටතේ අභ්‍යන්තර විගණකවරුන්ගෙන් සෘජු සහායන් ලබා ගැනීමට යොදවා ගැනීමය.

2. අස්තිත්ත්වයට අභ්‍යන්තර විගණන කාර්යක් නොමැති නම් මෙම ශ්‍රී.ල.වි.ප්‍ර. ව්‍යවහාර නොවේ. (යොමුව : අ2 ඡේදය)

3. අස්තිත්ත්වයට අභ්‍යන්තර විගණන කාර්යයක් ඇත්නම්, පහත තත්ත්වයන් හි එම කාර්යයේ වැඩ ප්‍රයෝජනයට ගැනීම සම්බන්ධිත මෙම ශ්‍රී.ල.වි.ප්‍ර. යේ අවශ්‍යතාවයන් ව්‍යවහාර නොවේ.

   (අ) කාර්යයේ වගකීම් සහ ක්‍රියාකාරකම් විගණනයට අදාළ නොවන; හෝ

   (ආ) ශ්‍රී.ල.වි.ප්‍ර. 315 (සංශෝධිත)[1] යටතේ ඉටු කළ ක්‍රියාපටිපාටි වල ප්‍රතිඵලයක් ලෙස ලබාගත් කාර්යයේ විගණකගේ මූලික අවබෝධය පදනම මත විගණන සාක්ෂි ලබා ගැනීමේදී කාර්යයේ වැඩ බාහිර විගණක ප්‍රයෝජනයට ගැනීමට අපේක්ෂා නොකරන අවස්ථාවකදී.

   බාහිර විගණක විසින් සෘජුව ඉටුකළ යුතු විගණන ක්‍රියාපටිපාටීන් හි ස්වභාවය හෝ කල් යෙදුම වෙනස් කිරීමට හෝ ප්‍රමාණය අඩු කිරීමට, අභ්‍යන්තර විගණන කාර්යයේ වැඩ බාහිර විගණක විසින් ප්‍රයෝජනයට ගැනීම අවශ්‍ය කෙරේ යයි මෙම ශ්‍රී.ල.වි.ප්‍ර. හි සඳහන් නොවේ. සමස්ථ විගණන ක්‍රමෝපාය ස්ථාපනය කිරීමේ දී එය බාහිර විගණකගේ තීරණයක් ලෙස රඳා පවතී.

4. ඒ ඇරත්, බාහිර විගණක, අභ්‍යන්තර විගණකවරුන්ගේ සෘජු සහාය ලබාදීම යොදවා ගැනීමට සැළසුම් කරන්නේ නැත්නම්, මෙම ශ්‍රී.ල.වි.ප්‍ර. සෘජු සහායට සම්බන්ධිත අවශ්‍යතාවයන් ව්‍යවහාර නොවේ.

5. සමහර අධිකරණ බලප්‍රදේශ තුළ නීතිය මගින් හෝ රෙගුලාසි මගින් බාහිර විගණකට අභ්‍යන්තර විගණන කාර්යයන් හි වැඩ ප්‍රයෝජනයට ගැනීමෙන් හෝ අභ්‍යන්තර විගණකවරුන්ගේ සෘජු සහාය යොදවා ගැනීම තහනම් කර හෝ එක්තරා දුරකට සීමාකර තිබිය හැකිය. මූල්‍ය ප්‍රකාශ විගණනයක් පාලනය වන නීති හෝ රෙගුලාසි මෙම ශ්‍රී.ල.වි.ප්‍ර. මගින් මැදිහත්වී අක්‍රිය කරන්නේ නැත.[2] එම නිසා එවැනි තහනම් කිරීම් හෝ සීමා කිරීම් මගින් බාහිර විගණක ශ්‍රී.ල.වි.ප්‍ර. සමඟ අනුකූල වීමෙන් ඔවුන් වළක්වාගනු නොලැබේ. (යොමුව: අ31 ඡේදය)

## ශ්‍රී.ල.වි.ප්‍ර. 315 (සංශෝධිත) සහ ශ්‍රී.ල.වි.ප්‍ර. 610 (සංශෝධිත 2013) අතර සම්බන්ධතාවය.

6. බොහෝ අස්තිත්ත්ව ඔවුන්ගේ අභ්‍යන්තර පාලනය සහ පාලනය කිරීමේ ව්‍යුහයේ කොටසක් ලෙස අභ්‍යන්තර විගණන කාර්යයක් ස්ථාපනය කරයි. කාර්යයේ අධිකාරිය සහ වගකිව යුතුභාවය ඇතුළුව අභ්‍යන්තර විගණන කාර්යයේ අරමුණු විෂය පථය, එහි වගකීම්වල ස්වභාවය එහි සංවිධානමය තත්ත්වය සහ අස්තිත්ත්වයේ විශාලත්වය සහ ව්‍යුහය සහ කළමනාකාරීත්වයේ අවශ්‍යතාවයන් සහ අදාළවන අවස්ථාවලදී පාලනය පිළිබඳව වගකිවයුතු අය මත රඳාපැවැත්ම පුළුල්ව වෙනස් වේ.

---

[1] ශ්‍රී.ල.වි.ප්‍ර. 315 (සංශෝධිත) *අස්තිත්ත්වය සහ එහි පරිසරය අවබෝධකර ගැනීම මගින් ප්‍රමාණාත්මක අවප්‍රකාශ හඳුනා ගැනීම සහ තක්සේරු කිරීම.*

[2] ශ්‍රී.ල.වි.ප්‍ර. 200, *ස්වාධීන විගණකයේ සමස්ථ අරමුණු සහ ශ්‍රී ලංකා විගණන ප්‍රමිත ප්‍රකාරව විගණනයක් මෙහෙයවීම* අ57 ඡේදය)

7. අස්තිත්ත්වය සහ එහි පරිසරය සහ ප්‍රමාණාත්මක අවප්‍රකාශයක් හඳුනාගැනීම සහ එහි අවදානම තක්සේරු කිරීමට බාහිර විගණකගේ අවබෝධය පිළිබඳ අභ්‍යන්තර විගණන කාර්යයේ දැනුම හා පළපුරුද්ද ඔහුට කෙසේ දැනුම් දිය හැකිද යන්න. ශ්‍රී.ල.වි.ප්‍ර. 315 (සංශෝධිත) මගින් ආමන්ත්‍රණය කරයි. එලෙසම අභ්‍යන්තර සහ බාහිර විගණකවරුන් අතර සඵලදායක සන්නිවේදනයෙන් බාහිර විගණකගේ වැඩ සඳහා බලපා හැකි වැදගත් කරුණු බාහිර විගණකට දන්විය හැකි පරිසරයක් ඇති කරන බවද ශ්‍රී.ල.වි.ප්‍ර. 315 (සංශෝධිත)[3] මගින් පැහැදිලි කෙරේ.

8. අභ්‍යන්තර විගණන කාර්යයේ සංවිධානමය තත්ත්වය සහ අදාළ ප්‍රතිපත්තිවල සහ ක්‍රියා පටිපාටි ප්‍රමාණවත් ලෙස අභ්‍යන්තර විගණකරුවන්ගේ අරමුණුගතභාවයට සහාය දෙන්නේද සහ අභ්‍යන්තර විගණන කාර්යයේ නිපුණතා මට්ටම සහ කාර්යය ක්‍රමාණුකූල සහ හික්මුනු පිවිසුම් මඟක් ව්‍යවහාර කරන්නේද යන්න මත රඳා පවතිමින්, අභ්‍යන්තර විගණකගේ කාර්යයේ වැඩ නිර්මාණාත්මක සහ අනුපූරක ආකාරයට බාහිර විගණකට ප්‍රයෝජනයට ගත හැකිය. ශ්‍රී.ල.වි.ප්‍ර. 315 (සංශෝධිත) යටතේ ඉටු කළ ක්‍රියාපටිපාටිවල ප්‍රතිඵලයක් ලෙස ලබාගත් අභ්‍යන්තර විගණන කාර්යයේ බාහිර විගණකගේ මූලික අවබෝධය පදනම මත, බාහිර විගණකගේ වගකීම් මෙම ශ්‍රී.ල.වි.ප්‍ර. ය ආමන්ත්‍රණය කරනවිට ලබාගත් විගණන සාක්ෂිවල කොටසක් ලෙස, අභ්‍යන්තර විගණක කාර්යයේ වැඩ ප්‍රයෝජනයට ගැනීමට බාහිර විගණක අපේක්ෂා කෙරේ.[4] එවැනි වැඩ එලෙස ප්‍රයෝජනයට ගැනීමෙන් බාහිර විගණක විසින් සෘජුව ඉටුකළ යුතු විගණන ක්‍රියාපටිපාටිවල ස්වභාවය, හෝ කල් යෙදුම හෝ ප්‍රමාණය අඩු කිරීම වෙනස් කෙරේ.

9. අමතරව, බාහිර විගණකගේ සෘජු මෙහෙයවීම, අධීක්ෂණය හෝ සමාලෝචනයට යටත්ව සෘජු සහාය ලබා ගැනීමට අභ්‍යන්තර විගණක යොදවා ගැනීමට, සළකා බලන්නේ නම් එවිට බාහිර විගණකගේ වගකීම් එසේම මෙම ශ්‍රී.ල.වි.ප්‍ර. යෙන් ආමන්ත්‍රණය කෙරේ.

10. අභ්‍යන්තර විගණන කාර්යක් ඉටු කරනු ලබන අය මෙන්ම සමාන ක්‍රියාපටිපාටි ඉටුකරන තනි පුද්ගලයන් අස්තිත්ත්වයක සිටිය හැකිය. කෙසේ වෙතත් තත්ත්ව පාලනය ඇතුළුව ක්‍රමාණුකූල සහ හික්මුණ ප්‍රවේශ මගක් ව්‍යවහාර වන අරමුණක් සහ නිපුණ කාර්යක් මගින් ඉටු කරන්නේ නම් මිස එවැනි ක්‍රියාපටිපාටි සළකනු ලබන්නේ අභ්‍යන්තර පාලන සහ එවැනි පාලනවල සඵලදායකත්වය සම්බන්ධයෙන් සාක්ෂි ලබා ගැනීම, ශ්‍රී.ල.වි.ප්‍ර. 330[5] සමඟ අනුකූලව තක්සේරු කළ අවදානම් විගණකගේ ප්‍රතිචාරවල කොටසක් විය හැකි ලෙස ය.

## විගණනය සඳහා බාහිර විගණකගේ වගකීම්.

11. ප්‍රකාශ කළ විගණන මතය සඳහා තනිකරම වගකීම ඇත්තේ බාහිර විගණකටය, සහ අභ්‍යන්තර විගණන කාර්යයේ වැඩ බාහිර විගණක විසින් ප්‍රයෝජනය ගැනීම මගින් හෝ කාර්ය භාරය මත අභ්‍යන්තර විගණකවරු සෘජු සහායදීමක් මගින් බාහිර විගණකගේ එම වගකීම අඩු නොවේ. ඔවුන් බාහිර විගණක විසින් ඉටු කරන ලබන දෑ හා සමාන විගණන පටිපාටි ඉටුකරනු ලැබිය හැකි වුවත් අභ්‍යන්තර විගණනකාර්යය, අභ්‍යන්තර විගණකවරු යන දෙකෙන් එකක්වත් ශ්‍රී.ල.වි.ප්‍ර. 200[6] සමඟ අනුකූලව මූල්‍ය ප්‍රකාශ විගණනය සඳහා බාහිර විගණකට අවශ්‍යකරන අස්තිත්ත්වයෙන් ස්වාධීන වීම අභ්‍යන්තර විගණකවරුන්ට නොමැත.[6] එම නිසා අභ්‍යන්තර විගණකවරුන්ගේ වැඩ බාහිර විගණකට ප්‍රයෝජනයට ගැනීමට හැකිවීම සඳහා අවශ්‍ය කරන කොන්දේසි මෙම ශ්‍රී.ල.වි.ප්‍ර. නියම කරයි. අභ්‍යන්තර විගණන කාර්යයේ වැඩ සහ අභ්‍යන්තර විගණකවරුන් සෘජු සහාය ලබාදීම විගණන අරමුණ සඳහා ප්‍රමාණවත් වීමට ප්‍රමාණවත් යෝග්‍ය සාක්ෂි ලබා ගැනීමට අවශ්‍යකරන කාර්යයේ යෙදීමේ පරිශ්‍රමයද එලෙසම මෙහි නිර්වචනය කරයි. මෙම අවශ්‍යතාවයන් සැළසුම්කර ඇත්තේ අභ්‍යන්තර විගණකවරුන්ගේ වැඩ ප්‍රයෝජනයට ගැනීම සම්බන්ධයෙන් එවැනි වැඩ අධි හෝ අනිසි භාවිත කිරීම වැළැක්වීමට බාහිර විගණකගේ විනිශ්චය සඳහා ආකෘතිමය රාමුවක් ලබාදීමටය.

## බලපැවැත්වෙන දිනය

12. මෙම ශ්‍රී.ල.වි.ප්‍ර. 2018 මාර්තු 31 දිනෙන් හෝ ඊට පසුව අවසන් වන කාලපරිච්ඡේදවල මූල්‍ය ප්‍රකාශ විගණනය සඳහා බලපැවැත්වේ.

## අරමුණු

13. අස්තිත්ත්වයට අභ්‍යන්තර විගණන කාර්යයක් ඇති අවස්ථාවක සහ බාහිර විගණක විසින් සෘජුව ඉටුකළ යුතු විගණන පටිපාටිවල ස්වභාවය හෝ කල් යෙදුම හෝ ප්‍රමාණය අඩු කිරීම වෙනස් කිරීමට, කාර්යයේ වැඩ

---

[3] ශ්‍රී.ල.වි.ප්‍ර. 315 (සංශෝධිත) අ 120 ඡේදය.

[4] 15 - 25 ඡේද බලන්න.

[5] ශ්‍රී.ල.වි.ප්‍ර. 330- *තක්සේරු කළ අවදානම් වලට විගණකගේ ප්‍රතිචාර.*

[6] ශ්‍රී.ල.වි.ප්‍ර. 200, 14 වන ඡේදය.

ප්‍රයෝජනයට ගැනීමට බාහිර විගණක අපේක්ෂා කරන විට හෝ සෘජු සහායන් අභ්‍යන්තර විගණකවරුන් ලබා දෙනවිට භාවිත කිරීමට වනවිට බාහිර විගණකගේ අරමුණු වන්නේ;

(අ) අභ්‍යන්තර විගණන කාර්යයේ වැඩ හෝ අභ්‍යන්තර විගනකවරුන්ගෙන් ලැබෙන සෘජු සහාය භාවිත කළ හැකිද යන්න නිර්ණය කිරීමට සහ එය එසේ නම් කුමන ක්ෂේත්‍රවල සහ කොපමණ ප්‍රමාණයකට; සහ එම නිර්ණය කිරීමෙන් පසුඃ

(ආ) අභ්‍යන්තර විගණක කාර්යයේ වැඩ ප්‍රයෝජනයට ගන්නේ නම්, විගණන අරමුණු සඳහා එම වැඩ ප්‍රමාණවත්දැයි නිර්ණය කිරීමට; සහ

(ඇ) අභ්‍යන්තර විගණකවරුන්ගේ සෘජු සහාය ලබාදීම ප්‍රයෝජනයට ගන්නේ නම්, ඔවුන්ගේ වැඩ යෝග්‍ය වන අන්දමට මෙහෙයවීම අධීක්ෂණය සහ සමාලෝචනය කිරීම.

## නිර්වචන

14. මෙම ශ්‍රී.ල.වි.ප්‍ර. යේ අරමුණු සඳහා, පහත සඳහන් පදවලට ආරෝපිත තේරුම් පහත දැක්වේ;

(අ) අභ්‍යන්තර විගණනකාර්යය - සහතික වීම සහ අස්තිත්ත්වයේ පාලනයේ අවදානම් කළමණාකරය සහ අභ්‍යන්තර පාලන ක්‍රියාවලියේ සඵලදායකත්වය ඇගයීමට සහ වැඩි දියුණු කිරීමට සැළසුම් කළ උපදේශන ක්‍රියාකාරකම් ඉටුකරන අස්තිත්ත්වයේ කාර්යයක් වේ. (යොමුවඃ අ1 - අ4 ඡේද)

(ආ) සෘජු සහාය බාහිර විගණක මෙහෙයවීම, අධීක්ෂණය සහ සමාලෝචනය යටතේ විගණන පටිපාටි ඉටු කිරීමට අභ්‍යන්තර විගණකවරු යොදවා ගැනීම.

## අවශ්‍යතාවයන්

### අභ්‍යන්තර විගණන කාර්යයේ වැඩ කුමන ක්ෂේත්‍රවලට සහ කුමන ප්‍රමාණයක් දක්වා ප්‍රයෝජනයට ගත හැකිද යන්න නිර්ණය කිරීම.

*අභ්‍යන්තර විගණන කාර්යය ඇගයීම.*

15. පහත සඳහන් දෑ ඇගයීම් මගින් අභ්‍යන්තර විගණන කාර්යයේ වැඩ විගණන අරමුණු සඳහා ප්‍රයෝජනයට ගත හැකිද යන්න බාහිර විගණක විසින් නිර්ණය කළ යුතුය;

(අ) අභ්‍යන්තර විගණන කාර්යභාරයේ සංවිධානමය තත්ත්වය සහ අදාළ ප්‍රතිපත්ති සහ ක්‍රියාපටිපාටිවල අභ්‍යන්තර විගණකවරුන්ගේ අරමුණුගතභාවයට සහායවන ප්‍රමාණය. (යොමුවඃ අ5-අ9 ඡේද)

(ආ) අභ්‍යන්තර විගණන කාර්යයේ නිපුණතා මට්ටම; සහ (යොමුව අ5- අ9 ඡේද)

(ඇ) තත්ත්ව පාලනය ඇතුළුව අභ්‍යන්තර විගණන කාර්යය ක්‍රමානුකූල සහ හික්මුණු පිවිසුම් මගක් ව්‍යවහාර කරන්නේ ද යන වග (යොමුවඃ අ10 - අ11 ඡේද)

16. පහත දෑ බාහිර විගණක නිර්ණය කරන්නේ නම්, අභ්‍යන්තර විගණන කාර්යයේ වැඩ බාහිර විගණක ප්‍රයෝජනයට නොගත යුතුය.

(අ) කාර්යයේ සංවිධානමය තත්ත්වය සහ අදාළ ප්‍රතිපත්ති සහ ක්‍රියාපටිපාටි ප්‍රමාණවත් ලෙස අභ්‍යන්තර විගණකවරුන්ගේ අරමුණුගතභාවයට සහාය නොදෙන විට.

(ආ) ප්‍රමාණවත් නිපුණතාවයක් කාර්යභාරයට නොතිබීම; හෝ

(ඇ) තත්ත්ව පාලනය ඇතුලු කාර්යය ක්‍රමානුකූල සහ හික්මුණු ප්‍රවේශ මාර්ගයක් ව්‍යවහාර නොකිරීම. (යොමුවඃ අ12 - අ14 ඡේද)

*අභ්‍යන්තර විගණන කාර්යයේ වැඩ ප්‍රයෝජනයට ගත හැකි ස්වභාවය සහ ප්‍රමාණය නිර්ණය කිරීම.*

17. අභ්‍යන්තර විගණන කාර්යයේ වැඩ ප්‍රයෝජනයට ගත හැකි ක්ෂේත්‍ර සහ ප්‍රමාණය නිර්ණය කිරීමේ පදනමක් වශයෙන්, ඉටු කර ඇති වැඩවල ස්වභාවය සහ විෂය පථය හෝ අභ්‍යන්තර විගණන කාර්ය විසින් ඉටු කිරීමට සැළසුම්කර ඇති සහ බාහිර විගණකගේ සමස්ථ විගණන ක්‍රමෝපායට සහ විගණන සැලැස්මට එහි අදාළත්වය බාහිර විගණක සැළකිල්ලට ගත යුතුය. (යොමුවඃ අ15 - අ17 ඡේද)

18. අභ්‍යන්තර විගණන කාර්යයේ වැඩ නොමනා ලෙස ප්‍රයෝජනයට ගැනීම වැළැක්වීමට, බාහිර විගණක විගණන කාර්යභාරයේ සියලු වැදගත් විනිශ්චයන් ගතයුතු වන අතර කාර්යයේ වැඩ අඩුවෙන් ප්‍රයෝජනයට ගැනීමට සහ වැඩි වැඩ ප්‍රමාණයක් සෘජුව ඉටු කිරීමට සැළසුම් කළ යුතුය. (යොමුව: ඡේද අ15 - අ17 ඡේද)

(අ) වඩා වැඩි විනිශ්චයක් අවශ්‍ය කරන්නේ;

(i) අදාළ විගණන ක්‍රියාපටිපාටි සැළසුම් කිරීම සහ ඉටු කිරීම; සහ

(ii) ලබාගත් විගණන සාක්ෂි ඇගයීම (යොමුව: අ18 - අ19 ඡේද)

(ආ) සැදහුම් මට්ටමේ දී ප්‍රමාණාත්මක අවප්‍රකාශයක තක්සේරු කළ අවදානම වඩා වැඩිවන විට සැළකිය යුතු අන්දමේ ලෙස හඳුනාගත් අවදානම් වලට විශේෂ සැළකිලිමත් බවක් දැක්විය යුතුය. (යොමුව: අ20 - අ22 ඡේද)

(ඇ) අභ්‍යන්තර විගණන කාර්යයේ සංවිධානමය තත්ත්වය සහ අදාළ ප්‍රතිපත්ති සහ ක්‍රියාපටිපාටි අඩු තත්ත්වයක නම් ඒවා අභ්‍යන්තර විගණකවරුන්ගේ අරමුණුගතභාවයට ප්‍රමාණවත් ලෙස සහාය දෙයි.

(ඈ) අභ්‍යන්තර විගණන කාර්යයේ නිපුණතා මට්ටමේ තත්ත්වය නුළස් බව,

19. පෙර සඳහන් කළ පරිදි ප්‍රකාශ කළ විගණන මතය සඳහා වගකීම බාහිර විගණක සතු බැවින්, සමාහරණයක් ලෙස සැළසුම් කළ ප්‍රමාණය තෙක් අභ්‍යන්තර විගණන කාර්යයේ වැඩ ප්‍රයෝජනයට ගැනීම, බාහිර විගණක ප්‍රමාණවත් ලෙස විගණනයට සහභාගිවීම තවමත් ප්‍රතිඵලයක් වේදැයි බාහිර විගණක එලෙසම ඇගයිය යුතුය. (යොමුව: අ15 - අ22 ඡේද)

20. ශ්‍රී ලංකා විගණන ප්‍රමිති 260 (සංශෝධිත)[7] සමඟ අනුකූලව, විගණනයේ සැළසුම් කළ විෂය පථය සහ කල්යෙදුමේ සමස්ථ විග්‍රහය පාලනය පිළිබඳව වගකිව යුතු අය සමග බාහිර විගණක සන්නිවේදනය කරමින් බාහිර විගණක විසින් අභ්‍යන්තර විගණන කාර්යයේ වැඩ, ප්‍රයෝජනයට ගැනීමට බාහිර විගණක කෙසේ සැළසුම් කර ඇත්ද යන්නත් සන්නිවේදනය කළ යුතුය. (යොමුව: අ23 ඡේදය)

## අභ්‍යන්තර විගණන කාර්යයේ වැඩ ප්‍රයෝජනයට ගැනීම.

21. අභ්‍යන්තර විගණන කාර්යයේ වැඩ ප්‍රයෝජනයට ගැනීමට බාහිර විගණක සැළසුම් කරන්නේ නම්, එහි ඔවුන්ගේ අදාළ ක්‍රියාකාරකම් සම්බන්ධීකරණය සඳහා පදනමක් ලෙස එහි වැඩවල සැළසුම් කළ ප්‍රයෝජනයට ගැනීම බාහිර විගණක සාකච්ඡා කළ යුතුය. (යොමුව: අ24 - අ26 ඡේද)

22. අභ්‍යන්තර විගණකවරුන් ඉටුකළ විගණන ක්‍රියාපටිපාටිවල ස්වභාවය සහ ප්‍රමාණයේ සහ සම්බන්ධිත සොයා ගැනීම් හි අවබෝධයක් ලබා ගැනීමට බාහිර විගණක ප්‍රයෝජනයට ගැනීමට සැළසුම් කරන කාර්යයන්හි වැඩවලට සම්බන්ධිත අභ්‍යන්තර විගණන කාර්යයන්හි වාර්තා බාහිර විගණක විසින් කියවිය යුතුය.

23. පහත දැක්වෙන දෑ සිදු වන්නේද යන්න ඇගයීම ඇතුළුව, විගණන අරමුණු සඳහා එහි ප්‍රමාණවත්භාවය නීර්ණය කිරීමට, බාහිර විගණක ප්‍රයෝජනයට ගැනීමට සැළසුම්කරණ අභ්‍යන්තර විගණන කාර්යය සමස්ථයක් ලෙස ගෙන එහි වැඩවල ප්‍රධාන අංගයන් මත ප්‍රමාණවත් විගණන ක්‍රියාපටිපාටි බාහිර විගණක විසින් ඉටු කළ යුතුය;

(අ) කාර්යයේ වැඩ නිසි ලෙස සැළසුම්කර, ඉටුකර, අධීක්ෂණය කර සමාලෝචනය කර හා ලේඛන ගත කිරීම;

(ආ) සාධාරණ නිගමනයක් ලබා ගැනීමට හැකි වීම පිණිස ප්‍රමාණවත් යෝග්‍ය සාක්ෂි ලබා ගෙන තිබීම; සහ

(ඇ) පවත්නා තත්ත්වයන් තුළ ළඟා කරගත් නිගමන යෝග්‍ය සහ කාර්ය මගින් පිළියෙල කළ වාර්තා ඉටු කළ වැඩවල ප්‍රතිඵල සමඟ සංගත වීම. (යොමුව: අ27 - අ 30 ඡේද)

24. බාහිර විගණකගේ පහත සඳහන් දෑ ඇගයීම්වලට බාහිර විගණකගේ විගණන පටිපාටිවල ස්වභාවයට සහ ප්‍රමාණයට පහසුවෙන්ව ප්‍රතිචාර දැක්විය යුතුය;

(අ) විනිශ්චය සම්බන්ධව වටිනාකම;

(ආ) ප්‍රමාණාත්මක අවප්‍රකාශවල තක්සේරු කළ අවදානම;

[7] ශ්‍රී.ල.වි.ප්‍ර. 260 (සංශෝධිත) *පාලනය පිළිබඳ භාරව කටයුතු කරන අය සමග සන්නිවේදනය*, 15 වන ඡේදය.

(ඇ) අභ්‍යන්තර විගණකවරුන්ගේ විෂය මූලිකත්වයට, අභ්‍යන්තර විගණන කාර්යයේ සංවිධානමය තත්ත්වය සහ අදාළ ප්‍රතිපත්ති ක්‍රියාපටිපාටි සහායවන ප්‍රමාණය ; සහ

(ඈ) කාර්යයේ නිපුණතා මට්ටම[8] (යොමුවඃ අ27 - අ29 ඡේද)

සහ වැඩවලින් කොටසක කාර්ය සාධනය ඇතුළත් කළ යුතුය. (යොමුවඃ අ30 ඡේදය)

25. මෙම ශ්‍රී.ල.වි.ප්‍ර. යේ 15 වන ඡේදය තුළ වන අභ්‍යන්තර විගණන කාර්යට සම්බන්ධයෙන් බාහිර විගණකගේ නිගමන, සහ මෙම ශ්‍රී.ල.වි.ප්‍ර. යේ 18 - 19 ඡේදවල විගණන අරමුණු සඳහා කාර්යයේ වැඩ ප්‍රයෝජනයට ගැනීමේ ස්වභාවය සහ ප්‍රමාණය නිර්ණය කිරීම යෝග්‍ය ලෙස පවතින බව එසේම බාහිර විගණක ඇගයිය යුතුය.

## සෘජු සහාය ලබා ගැනීමට අභ්‍යන්තර විගණකවරුන් කුමන ක්ෂේත්‍රවල කුමන ප්‍රමාණයකට යොදවාගත හැකිද යන්න නිර්ණය කිරීම.

*විගණන අරමුණු සඳහා සෘජු සහායක් ලබා ගැනීම සඳහා අභ්‍යන්තර විගණකවරුන් යොදවාගත හැකිද යන්න නිර්ණය කිරීම.*

26. අභ්‍යන්තර විගණකවරුන්ගෙන්, සෘජු සහායක් බාහිර විගණක ලබා ගැනීමට නීතියෙන් හෝ රෙගුලාසි මගින් තහනම් කර තිබිය හැකිය. එය එසේ වන විට 27 - 35 දක්වා ඡේද සහ 37 වන ඡේදය ව්‍යවහාර නොවේ. (යොමුවඃ අ31 ඡේදය)

27. අභ්‍යන්තර විගණකවරුන් විසින් සෘජු සහායක් ලබාදීම නීතියෙන් හෝ රෙගුලාසි මගින් තහනම් කර නොමැති නම්, සහ බාහිර විගණක, විගණනය මත සෘජු සහායක් ලබා ගැනීමට අභ්‍යන්තර විගණකවරුන් යොදවා ගැනීමට බාහිර විගණක සැළසුම් කරන්නේ නම්, එවැනි සහායක් ලබාදෙනු ලබන අභ්‍යන්තර විගණකවරුන්ගේ අරමුණු ගතභාවයට තර්ජන පැවැත්ම සහ එහි වැදගත්කම සහ නිපුණතා මට්ටම බාහිර විගණක ඇගයිය යුතුය. අභ්‍යන්තර විගණකවරුන්ගේ අරමුණුගත භාවයේ අවදානම් පැවැත්ම සහ වැදගත්කම බාහිර විගණකගේ ඇගයීමට ඔවුන්ගේ අරමුණුගත භාවයට තර්ජනයක් ඇති කළහැකි ඇල්ම සහ සම්බන්ධතාවය සම්බන්ධයෙන් අභ්‍යන්තර විගණකවරුන්ගෙන් කළ විමර්ශනයක්ද ඇතුළත් විය යුතුය. (යොමුවඃ ඡේද අ32 - අ34)

28. පහත දෑ පවතී නම් බාහිර විගණක, සෘජු සහායක් ලබා ගැනීම සඳහා අභ්‍යන්තර විගණකවරයෙක් යොදවා නොගත යුතුය;

(අ) අභ්‍යන්තර විගණකගේ අරමුණුගතභාවයට සැළකිය යුතු අන්දමේ තර්ජනයක් තිබීම; හෝ

(ආ) යෝජිත වැඩ ඉටු කිරීමට අභ්‍යන්තර විගණකට ප්‍රමාණවත් නිපුණතාවයන් නොතිබීම. (යොමුව අ32 - අ 34 ඡේද)

*සෘජු සහායක් ලබා දෙන අභ්‍යන්තර විගණකවරුන්ට පැවරිය හැකි වැඩවල ස්වභාවය සහ ප්‍රමාණය නිර්ණය කිරීම.*

29. අභ්‍යන්තර විගණකවරුන්ට පැවරිය හැකි වැඩවල ස්වභාවය සහ ප්‍රමාණය සහ එම තත්ත්වය තුළ යෝග්‍යවන විධානයන්ගේ ස්වභාවය, කාල නිර්ණය සහ ප්‍රමාණය, අධීක්ෂණය සහ සමාලෝචනය නිර්ණය කිරීමේදී බාහිර විගණක විසින් සැළකිය යුතු;

(අ) පහත දෑ සඳහා අවශ්‍යකරන විනිශ්චයේ ප්‍රමාණය;

(i) අදාළ විගණන පටිපාටි සැළසුම් කිරීමේදී සහ ඉටු කිරීමේදී, සහ

(ii) රැස් කරගත් විගණන සාක්ෂි ඇගයීමේදී

(ආ) ප්‍රමාණාත්මක අවප්‍රකාශයක තක්සේරු කළ අවදානම; සහ

(ඇ) එවැනි සහායන් ලබාදෙන අභ්‍යන්තර විගණකවරුන්ගේ අරමුණුගතභාවයට ඇති තර්ජනවල පැවැත්ම සහ වැදගත්කම සහ ඔවුන්ගේ නිපුණතා මට්ටම බාහිර විගණක ඇගයීම. (යොමුවඃ අ35 - අ39 ඡේද)

30. බාහිර විගණක පහත සඳහන් ක්‍රියාපටිපාටි ඉටු කිරීමට අභ්‍යන්තර විගණකවරුන්ගේ සෘජු සහාය ලබා ගැනීමට ඔවුන්ව භාවිත නොකළ යුතුය.

[8] 18 වන ඡේදය බලන්න.

(අ) විගණනයේදී සැළකිය යුතු අන්දමේ විනිශ්චයක් ගැනීමට සම්බන්ධවන ක්‍රියාපටිපාටි (යොමුවඃ අ19 ඡේදය)

(ආ) අදාල විගණන ක්‍රියාපටිපාටි ඉටු කිරීමේදී විනිශ්චයක් අවශ්‍යකරන හෝ සීමා සහිතවනවාට වඩා විශාල රැස් කරගත් විගණන සාක්ෂි ඇගයීම වැනි අවස්ථාවක ප්‍රමාණාත්මක අවදානමේ ඉහළ තක්සේරු කළ අවදානමකට සම්බන්ධිතවන ක්‍රියාපටිපාටි (යොමුවඃ අ 38 ඡේදය)

(ඇ) අභ්‍යන්තර විගණන කාර්යය විසින් පාලනය පිළිබඳව වගකිව යුතු අයට හෝ කළමණාකාරීත්වයට වාර්තා කරනු ලබන හෝ දැනටමත් වාර්තා කර ඇති අභ්‍යන්තර විගණකවරුන් සම්බන්ධ වී ඇති වැඩවලට සම්බන්ධිත ක්‍රියාපටිපාටි; හෝ

(ඈ) මෙම ශ්‍රී ලංකා විගණන ප්‍රමිතය සමඟ අනුකූලව බාහිර විගණක විසින් ගත යුතු තීරණවලට සම්බන්ධයෙන් වන අභ්‍යන්තර විගණන කාර්යය සහ එහි වැඩ ප්‍රයෝජනයට ගැනීම හෝ ඍජුසහායට සම්බන්ධිත වන ක්‍රියාපටිපාටි. (යොමුවඃ අ 35 - අ39 ඡේද)

31. විගණනය මත ඍජු සහායක් ලබා ගැනීමට අභ්‍යන්තර විගණකවරු යොදාගත යුතුද සහ එය එසේ නම් කුමන ප්‍රමාණයකටද යන්න යෝග්‍ය පරිදි අගය කිරීමෙන් පසු, ශ්‍රී.ල.වි.ප්‍ර. 260 (සංශෝධිත)[9] සමඟ අනුකූලව විගණනයේ සැළසුම් කළ විෂය පථය සහ කල් යෙදුමේ සමස්ථ විග්‍රහය පාලනය පිළිබඳව වගකිව යුතු අය සමඟ සන්නිවේදනයේ යෙදෙමින්, කාර්යභාරයේ තත්ත්වය තුළ එවැනි සේවයේ යොදවා ගැනීමක් උවමනාවට වඩා වැඩි නොවන බවට එසේම අන්‍යෝන්‍ය අවබෝධයක් අත්කර ගැනීමට ඍජු සහාය ලබා දෙන අභ්‍යන්තර විගණකවරුන් යොදවා ගැනීමේ සැළසුම්කළ ස්වභාවය සහ ප්‍රමාණය බාහිර විගණක සන්නිවේදනය කළ යුතුය. (යොමුවඃ අ39 ඡේදය)

32. ප්‍රකාශ කළ විගණන මතය සඳහා සම්පූර්ණයෙන් වගකීම බාහිර විගණක වෙත පැවරී ඇති නිසා, අභ්‍යන්තර විගණන කාර්යයේ සැලසුම් කළ වැඩ ප්‍රයෝජනයට ගැනීම හා එක්ව සමාහාරයක් වශයෙන් සැළසුම්කළ ප්‍රමාණයකට අභ්‍යන්තර විගණකවරුන්ගේ ඍජු සහාය යොදවා ගැනීම විගණනය තුළ බාහිර විගණක ප්‍රමාණවත් ලෙස විගණනය සඳහා සහභාගීවීම තවදුරටත් ඵලයක් වන්නේදැයි බාහිර විගණක ඇගයිය යුතුය.

## ඍජු සහායක් ලබා ගැනීමට අභ්‍යන්තර විගණකවරු යොදවා ගැනීම

33. විගණන අරමුණු සඳහා අභ්‍යන්තර විගණකගේ ඍජු සහාය යොදවා ගැනීමට හෝ බාහිර විගණක විසින්;

(අ) අභ්‍යන්තර විගණකවරුන් හට බාහිර විගණකගේ උපදෙස් අනුගමනය කිරීමට ඉඩදෙන බව බාහිර විගණක සඳහා අභ්‍යන්තර විගණක ඉටු කරන වැඩවලට අස්තිත්ත්වය මැදිහත් නොවන බවට අස්තිත්ත්වයේ බලයලත් නියෝජිතවරයෙකුගේ ලිඛිත එකඟතාවයන් ලබා ගැනීම; සහ

(ආ) බාහිර විගණකගේ උපදෙස් මත විශේෂිත කරුණු රහසිගත ලෙස ඔවුන් තබා ගනු ලබන බවත් සහ ඔවුන්ගේ අරමුණුගතභාවයට යම් තර්ජනයක් වුවහොත් ඒ බව බාහිර විගණකට දන්වනු ලබන බවට ලිඛිත එකඟවීමක් අභ්‍යන්තර විගණකවරුන් ගෙන් ලබා ගැනීම.

34. ශ්‍රී.ල.වි.ප්‍ර. 220[10] සමඟ අනුකූලව කාර්ය භාරය මත අභ්‍යන්තර විගණකවරුන් විසින් ඉටු කරනු ලබන වැඩ මෙහෙය වීම, අධීක්ෂණය සහ සමාලෝචනය බාහිර විගණක සිදුකළ යුතුය. එසේ කිරීමේදී,

(අ) අභ්‍යන්තර විගණකවරු අස්තිත්ත්වයෙන් ස්වාධීන නොවන බව සහ මෙම ශ්‍රී.ල.වි.ප්‍ර. හි 29 වන ඡේදයේ වන සාධක අගය කිරීමේ ප්‍රතිඵලවලට වන ප්‍රතිචාර දක්වීමේ ස්වභාවය, කල් නිර්ණය මෙහෙයවීමේ ප්‍රමාණය, අධීක්ෂණය සහ සමාලෝචනයේදී හඳුනාගත යුතුය; සහ

(ආ) අභ්‍යන්තර විගණකවරු විසින් ඉටු කළ සමහර වැඩ සඳහා පාදක වන විගණන සාක්ෂි බාහිර විගණක නැවත පරීක්ෂා කිරීමද, සමාලෝචන ක්‍රියාපටිපාටිවලට ඇතුළත්විය යුතුය.

අභ්‍යන්තර විගණකවරුන් විසින් ඉටු කරන ලද වැඩ බාහිර විගණක විසින් සිදු කරන මෙහෙයවීම, අධීක්ෂණය සහ සමාලෝචනයෙන් අභ්‍යන්තර විගණකවරු විසින් සිදු කළ එම වැඩ පදනම මත නිගමනයකට සහායවීමට ප්‍රමාණවත් යෝග්‍ය විගණන සාක්ෂි ලබාගත් බවට බාහිර විගණකගේ අපේක්ෂා සපුරාලීමට ප්‍රමාණවත් විය යුතුය. (යොමුවඃ අ40 - අ41 ඡේද)

---

[9] ශ්‍රී.ල.වි.ප්‍ර. 260 (සංශෝධිත) 15 වන ඡේදය.

[10] ශ්‍රී.ල.වි.ප්‍ර. 220 *මූල්‍ය ප්‍රකාශ විගණනයක් සඳහා තත්ත්ව පාලනය.*

35. අභ්‍යන්තර විගණකවරු විසින් ඉටු කරන හෝ වැඩ මෙහෙයවීමේ, අධීක්‍ෂණයේදී සහ සමාලෝචනයේදී 27 වන ඡේදයේ සඳහන් බාහිර විගණකගේ ඇගයීම් තවදුරටත් යෝග්‍ය නොවන බවට වන ඇගයීම් සඳහා බාහිර විගණක සෝදිසියෙන් සිටිය යුතුය.

## ලේඛනගත කිරීම

36. බාහිර විගණක, අභ්‍යන්තර විගණන කාර්යයේ වැඩ ප්‍රයෝජනයට ගන්නේ නම්, විගණන ලේඛන ගත කිරීම තුළ පහත දෑ බාහිර විගණක ඇතුළත් කළ යුතුය.

(අ) පහත දෑ වල ඇගයීමක්;

(i) කාර්ය භාරයේ සංවිධානමය තත්ත්වය සහ අදාළ ප්‍රතිපත්ති සහ ක්‍රියාපටිපාටි ප්‍රමාණවත් ලෙස අභ්‍යන්තර විගණකරුවන්ගේ අරමුණුගතභාවයට සහාය වන්නේ ද;

(ii) කාර්යයේ නිපුණතා මට්ටම; සහ

(iii) තත්ත්ව පාලනය ඇතුළුව කාර්යය ක්‍රමානුකූල සහ හික්මුණු පිවිසුම් මගක් ව්‍යවහාර කරන්නේද;

(ආ) ප්‍රයෝජනයට ගත් වැඩවල ස්වභාවය සහ ප්‍රමාණය සහ එම තීරණය සඳහා වූ පදනම; සහ

(ඇ) ප්‍රයෝජනයට ගත් වැඩවල ප්‍රමාණවත්භාවය අගය කිරීම බාහිර විගණක ඉටුකළ විගණන පටිපාටි.

37. විගණනය මත අභ්‍යන්තර විගණකවරුන්ගේ ඍජු සහාය ලබා ගැනීම බාහිර විගණක භාවිත කරන්නේ නම් බාහිර විගණක; විගණන ලේඛනගත කිරීම් තුළ ඇතුළත් කළ යුත්තේ,

(අ) අභ්‍යන්තර විගණකවරුන්ගේ අරමුණුගතභාවයට වන තර්ජනවල පැවැත්ම සහ වැදගත්කම ඇගයීම සහ එම ඍජු සහාය ලබා ගැනීමට භාවිත කළ අභ්‍යන්තර විගණකවරුන්ගේ නිපුණතා මට්ටම;

(ආ) අභ්‍යන්තර විගණකවරුන් විසින් ඉටුකළ වැඩවල ස්වභාවය සහ ප්‍රමාණය පිළිබඳව තීරණය සඳහා වූ පදනම;

(ඇ) ශ්‍රී.ල.වි.ප්‍ර. 230[11] සමග අනුකූලව ඉටුකළ වැඩ සමාලෝචනය කළේ කවුරුන් විසින්ද සහ එම සමාලෝචනයේ ප්‍රමාණය; සහ ඉටුකළ දිනය;

(ඈ) මෙම ශ්‍රී.ල.වි.ප්‍ර. හි 33 වන ඡේදය යටතේ අස්තිත්ත්වයේ බලයලත් නියෝජිතවරයෙක්ගෙන් සහ අභ්‍යන්තර විගණකවරුන්ගෙන් ලබාගත් ලිඛිත එකඟවීම්; සහ

(ඉ) විගණන කාර්යභාරය මත ඍජු සහාය ලබාදෙන අභ්‍යන්තර විගණකවරුන් විසින් පිළියෙල කළ වැඩ පත්‍රිකා.

***

## භාවිත කිරීමේ සහ පැහැදිලි කිරීමේ වෙනත් කරුණු

**අභ්‍යන්තර විගණන කාර්යයේ නිර්වචනය** (යොමුව: 2 වන ඡේදය, 14 (අ)

අ1. අභ්‍යන්තර විගණන කාර්යයන්හි අරමුණු සහ විෂය පථයට අපේක්ෂිත වශයෙන් ඇතුළත් වන්නේ අස්තිත්ත්වයේ පාලන ක්‍රියාවලිවල සඵලදායකත්වය වැඩි දියුණු කිරීමට සහ ඇගයීමට සැළසුම් කළ උපදේශන සක්‍රීයතා සහ සහතිකවීම් පහත දෑ වැනි අවදානම් කළමණාකරණ සහ අභ්‍යන්තර පාලනය වේ.

*පාලනයට සම්බන්ධිත ක්‍රියාවන්*

- ආචාර ධර්ම සහ වටිනාකම් කාර්ය සාධන කළමණාකරනය සහ වගකිව යුතු භාවය සන්නිවේදන අවදානම සහ සංවිධානයේ යෝග්‍ය ක්ෂේත්‍රවලට පාලන තොරතුරු සහ පාලනය භාරව කටයුතු කරන අය අභ්‍යන්තර සහ බාහිර විගණකවරු සහ කළමණාකාරීත්වය අතර සන්නිවේදනයේ සඵලදායකත්වය

[11] ශ්‍රී.ල.වි.ප්‍ර. 230 - *විගණන ලේඛනගත කිරීම.*

මත අරමුණු සාර්ථකව නිම කිරීමට එය තුළ පාලන ක්‍රියාවලි අභ්‍යන්තර විගණන කාර්යය තක්සේරු කළ හැකිය.

*අවදානම් කළමණාකරනයට සම්බන්ධිත සක්‍රීයතාවයන්*

- අවදානමට සැළකිය යුතු අන්දමේ නිරාවරණය වීම හඳුනාගැනීමේදී සහ ඇගයීමෙන් සහ අවදානම් කළමණාකරනය සහ අභ්‍යන්තර පාලනය වැඩි දියුණු කිරීමට දායක වීම් හඳුනා ගැනීම (මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලියේ සඵලදායකත්වය ඇතුළුව) මගින් අභ්‍යන්තර විගණන කාර්යය අස්තිත්ත්වයට සහාය විය හැකිය.
- වංචා අනාවරණය කරගැනීමේදී අස්තිත්ත්වයට උපකාරී වීමට පටිපාටි අභ්‍යන්තර විගණන කාර්යයට ඉටු කළ හැකිය.

*අභ්‍යන්තර පාලනයට සම්බන්ධිත සක්‍රීයතාවයන්*

- අභ්‍යන්තර පාලනය ඇගයීම පාලන සමාලෝචනය ඒවායේ මෙහෙයුම් ඇගයීම සහ එයට වැඩි දියුණු කිරීම් නිර්දේශ කිරීම් සඳහා විශේෂිත වගකීම් අභ්‍යන්තර විගණන කාර්යයට පැවරිය හැකිය. එසේ කිරීමේදී අභ්‍යන්තර විගණන කාර්යයට පාලන මත සහතික වීමක් ලබාදෙයි; උදාහරණ ලෙස විගණනයට අදාළ එවැනි පාලන ඇතුළුව, අභ්‍යන්තර පාලනයන් සැළසුම් කිරීම, ක්‍රියාවට නැංවීම සහ මෙහෙයුම් සඵලදායකත්වය සම්බන්ධයෙන් කළමණාකාරීත්වයට සහ පාලනය පිළිබඳ වගකිව යුතු අයට සහතිකවීමක් ලබාදීමට, අභ්‍යන්තර විගණන කාර්ය පරීක්ෂා හෝ වෙනත් ක්‍රියාපටිපාටි සැළසුම්කර සහ ඉටු කළ හැකිය.
- මූල්‍ය හා මෙහෙයුම් තොරතුරු පිරික්සීම, මූල්‍ය සහ මෙහෙයුම් තොරතුරු වාර්තා කිරීම සහ වර්ගීකරණය මැනීම හඳුනා ගැනීමට භාවිත කළ උපක්‍රම සමාලෝචනය කිරීමට, සහ ගණුදෙනු ශේෂ සහ ක්‍රියාපටිපාටි විස්තරාත්මකව පරීක්‍ෂාව ඇතුළු තනි අයිතම් තුළට සෝදිසි කිරීමට අභ්‍යන්තර විගණන කාර්යට පැවරිය හැකිය.
- මෙහෙයුම් සක්‍රීයතාවයන් සමාලෝචනය අස්තිත්ත්වයක මූල්‍ය නොවන ක්‍රියාවන් ඇතුළුව මෙහෙයුම් සක්‍රීයතාවයේ ආර්ථික, කාර්යක්ෂමතාවය සහ සඵලදායකත්වය සමාලෝචනය කිරීමට අභ්‍යන්තර විගණන කාර්යට පැවරිය හැකිය.
- නීතිය සහ රෙගුලාසි මත අනුකුල වීම සමාලෝචනය කිරීම. නීතිය, රෙගුලාසි සහ වෙනත් බාහිර අවශ්‍යතාවයන් සහ කළමණාකාරීත්ව ප්‍රතිපත්ති සංවිධාන සහ වෙනත් අභ්‍යන්තර අවශ්‍යතාවයන් සමඟ අනුකුලවීම සමාලෝචනය කිරීමට අභ්‍යන්තර විගණන කාර්යයට පැවරිය හැකිය.

අ2. අභ්‍යන්තර විගණන කාර්යය විසින් ඉටු කරනු ලබන ක්‍රියාවන්ට හා සමාන ක්‍රියාවන් අස්තිත්ත්වය තුළ සිටින වෙනත් නිලනාමයන් දරනු ලබන අයවලුන් විසින් මෙහෙයවිය හැකිය. අභ්‍යන්තර විගණන කාර්යයේ කොටස හෝ සියලු ක්‍රියාව තුන්වන පාර්ශ්වයේ සේවා ලබා දෙන්නෙකුට එලෙස බාහිරකරණය කළ හැකිය. කාර්යයේ නිල නාමය නැතහොත් එය ඉටු කරන්නේ අස්තිත්ත්වයද හෝ තුන්වන පාර්ශ්වයේ සේවා ලබා දෙන්නෙකුද යන්න බාහිර විගණක කාර්යයේ වැඩ ප්‍රයෝජනයට ගත හැකිද හෝ නොහැකිද යන්න තීර්ණය කිරීමේ තනි පදනමක් නොවේ. විකල්පයක් වශයෙන් එය ක්‍රියාවන්ගේ ස්වභාවය; අභ්‍යන්තර විගණන කාර්යයන්ගේ සංවිධානමය තත්ත්වය, සහ අභ්‍යන්තර විගණකවරුන්ගේ අරමුණුගතභාවයට අදාළ ප්‍රතිපත්ති සහ ක්‍රියාපටිපාටිවල සහායවීම, අදාළවන කාර්යයන් හි නිපුණ සහ ක්‍රමානුකුල සහ හික්මුණු ප්‍රවේශ මාර්ගයේ ප්‍රමාණය; අභ්‍යන්තර විගණන කාර්යයේ වැඩවලට මෙම ශ්‍රී.ල.වි.ප්‍ර. යේ යොමු කිරීම්වලට ඇතුළත් වන්නේ මෙම ගති ලක්‍ෂණ ඇති වෙනත් කාර්යයන් හෝ තුන්වන පාර්ශ්වවල සේවා සපයන්නන්ගේ අදාළ ක්‍රියාවන්ය.

අ3. අමතරව, අභ්‍යන්තර විගණන කාර්යට බාහිරව මෙහෙයුම් සහ කළමණාකාරිත්ව රාජකාරි සහ වගකීම් දරන අස්තිත්ත්වයේ සිටින අයට, ශ්‍රී.ල.වි.ප්‍ර. 330[12] සමඟ අනුකුලව එම අය ඉටු කරනු ලබන පාලන ක්‍රියාවන් පරීක්ෂා කළ හැකිවූවත්, මෙම ශ්‍රී.ල.වි.ප්‍ර. යේ අරමුණු සඳහා අභ්‍යන්තර විගණන කාර්යයේ කොටසක් ලෙස ඔවුන්ව සැළකීමෙන් වළක්වාලිය හැකි ඔවුන්ගේ අරමුණගතභාවයට සාමාන්‍යයෙන් වන තර්ජනයකට මුහුණ පා හැකිය.

මෙම හේතුව නිසා හිමිකරු කළමණාකරු, විසින් ඉටු කරනු ලබන පාලන අධීක්‍ෂණය කිරීම අභ්‍යන්තර විගණන කාර්යයට සමාන ලෙස සළකනු නොලැබේ.

---

[12] 10 වන ඡේදය බලන්න.

අ4. අස්තිත්ත්වයේ අභ්‍යන්තර විගණන කාර්යය සහ බාහිර විගණකගේ අරමුණු වෙනස් වන අතර, මූල්‍ය ප්‍රකාශ විගණනයකදී බාහිර විගණක විසින් ඉටු කරනු ලබන විගණන පටිපාටිවලට සමාන පටිපාටි අභ්‍යන්තර විගණන කාර්යභාරයද ඉටු කළ හැකිය. එය එසේ නම්, එම කාර්යය පහත දැක්වෙන එක හෝ ඊට වැඩි ආකාරයට බාහිර විගණක විසින් විගණන අරමුණු සඳහා ප්‍රයෝජනයට ගනී.

- වැරදි හෝ වංචා නිසා ප්‍රමාණාත්මක අවප්‍රකාශවල අවදානමේ බාහිර විගණකගේ තක්සේරුවට අදාළ වන තොරතුරු ලබා ගැනීමට, මේ සම්බන්ධයෙන්, බාහිර විගණකට අභ්‍යන්තර විගණකගේ කාර්යන්ගේ වගකීම්වල ස්වභාවය සංවිධානය තුළ එහි තත්ත්වය සහ ඉටුකළ හෝ ඉටු කිරීමට බලාපොරොත්තුවන ක්‍රියාවන් පිළිබඳව අවබෝධයක් ලබා ගැනීමට සහ අභ්‍යන්තර විගණන කාර්යය තුළ අස්තිත්ත්වයේ එවැනි කාර්යයන් තිබේ නම් යෝග්‍ය පුද්ගලයන්ගෙන් විමසීම් කිරීම ශ්‍රී.ල.වි.ප්‍ර. 315 න් (සංශෝධිත)[13] බාහිර විගණකට අවශ්‍ය කෙරේ; හෝ

- නීතියෙන් හෝ රෙගුලාසි මගින් එක්තරා ප්‍රමාණයක් දැක්වා තහනම් කර හෝ සීමාකර නොමැති නම් මිස බාහිර විගණක යෝග්‍ය අගය කිරීමකින් පසු, බාහිර විගණක විසින් ඍජුව ලබා ගත යුතු විගණන සාක්ෂි සඳහා අර්ධ වශයෙන් ආදේශ කිරීමක් ලෙස කාලපරිච්ඡේදය තුළ අභ්‍යන්තර විගණන කාර්ය භාරය විසින් ඉටු කර ඇති වැඩ ප්‍රයෝජනයට ගැනීමට තීරණය කළ හැකිය.[14]

අමතරව නීතියෙන් හෝ රෙගුලාසි මගින් එක්තරා ප්‍රමාණයක් දක්වා තහනම් කර හෝ සීමාකර නැත්නම් මිස බාහිර විගණකගේ විධානය, අධීක්ෂණය සහ සමාලෝචනය යටතේ විගණන පටිපාටි ඉටු කිරීමට, අභ්‍යන්තර විගණකවරුන් යොදවා ගැනීමට බාහිර විගණකට හැකිය. (මෙම ශ්‍රී.ල.වි.ප්‍ර. යේ "ඍජු සහාය" ලෙස හැඳින්වෙන)[15]

## අභ්‍යන්තර විගණන කාර්යයේ වැඩ කුමන ක්ෂේත්‍ර තුළ සහ කුමන ප්‍රමාණයකට ප්‍රයෝජනයට ගත හැකිද යන්න නිර්ණය කිරීම.

*අභ්‍යන්තර විගණන කාර්යය ඇගයීම.*

අරමුණුගත භාවය සහ හැකියාව (යොමුව: 15 (අ) - (ආ) ඡේද)

අ5. විගණනයේ අරමුණු සඳහා අභ්‍යන්තර විගණන කාර්යයේ වැඩ ප්‍රයෝජනයට ගත හැකිද යන්න සහ එම තත්ත්වය තුළ අභ්‍යන්තර විගණන කාර්යයේ වැඩවල ස්වභාවය සහ කුමන ප්‍රමාණයකට ප්‍රයෝජනයට ගත හැකිද යන්න නිර්ණය කිරීමේදී බාහිර විගණක වෘත්තිය විනිශ්චය භාවිත කරයි.

අ6. අභ්‍යන්තර විගණන කාර්යයේ සංවිධාන තත්ත්වයේ ප්‍රමාණය සහ අභ්‍යන්තර විගණකවරුන්ගේ අරමුණුගතභාවයට සහාය දෙන අදාළ ප්‍රතිපත්ති සහ ක්‍රියාපටිපාටි සහ කාර්යයේ හැකියාවේ මට්ටම යන දෑ අභ්‍යන්තර විගණන කාර්යයේ වැඩ ප්‍රයෝජනයට ගත යුතු ද යන්න එසේ නම් සහ එම තත්ත්වය තුළ කාර්යයේ වැඩ ප්‍රයෝජනයට ගැනීම යෝග්‍ය ද සහ එහි ස්වභාවය ප්‍රමාණය නිර්ණය කිරීමේදී විශේෂයෙන් වැදගත් වේ.

අ7. අරමුණුගතභාවය යන්නෙන් අදහස් කරන්නේ, පක්ෂග්‍රාහීවීම, ඇල්මේ ගැටුමකට හෝ වෙනත් අයට වෘත්තිය විනිශ්චයන්ට මැදිහත් වී අක්‍රීය කිරීමට අයුතු බලපෑම් කිරීම යනාදියට ඉඩ නොදී එම කාර්යයක් ඉටු කිරීමට ඇති හැකියාව වේ. බාහිර විගණකගේ ඇගයීමට බලපෑ හැකි සාධකවල පහත දෑ ඇතුළත් වේ;

- කාර්යයේ අධිකාරිය සහ වගකිවයුතුභාවය ඇතුළුව අභ්‍යන්තර විගණන කාර්යයේ සංවිධානමය තත්ත්වය පක්ෂග්‍රාහී වීම, ඇල්මේ ගැටුම හෝ වෙනත් අයට වෘත්තිය විනිශ්චයට මැදිහත් වී අක්‍රීය කිරීමට අයුතු බලපෑම් කිරීම යනාදියෙන් තොරව කාර්යයට හැකියාවට සහාය දෙන්නේද උදාහරණ ලෙස අභ්‍යන්තර විගණන කාර්යය වාර්තා කරනු ලබන්නේ පාලනය පිළිබඳ වගකිව යුතු අයටද හෝ යෝග්‍ය අධිකාරිය ඇති නිලධාරියෙකුටද යන්න හෝ කාර්ය කළමණාකාරීත්වයට වාර්තා කරනු ලබන්නේ නම්, එයට පාලනය පිළිබඳ වගකිව යුතු අයට ඍජු පිවිසුම් මඟක් තිබේද?

- අභ්‍යන්තර විගණන කාර්යයේ වගකීම් යම් ගැටුම්කාරී තත්ත්වයන්ගෙන් තොරද; උදාහරණ ලෙස අභ්‍යන්තර විගණන කාර්යයෙන් බාහිරවන කළමණාකාරීත්ව. හෝ මෙහෙයුම් රාජකාරීවල හෝ වගකීම් තිබීම.

---

[13] ශ්‍රී.ල.වි.ප්‍ර. 315 (සංශෝධිත) 6 (අ) ඡේදය.
[14] 15 - 25 ඡේද බලන්න.
[15] 26 - 35 ඡේද බලන්න.

- පාලනය පිළිබඳ වගකිව යුතු අය අභ්‍යන්තර විගණන කාර්යයේ සේවා නියුක්තියට සම්බන්ධිත තීරණ අධීක්ෂණය කරන්නේද, උදාහරණ ලෙස යෝග්‍ය පාරිශ්‍රමික ප්‍රතිපත්තියන් නිර්ණය කිරීමේදී.

- අභ්‍යන්තර විගණන කාර්යය මත කළමණාකාරීත්වය හෝ පාලනය පිළිබඳ වගකීව යුතු අය යම් සංරෝධක හෝ සීමා කිරීම් පනවා ඇත්ද, උදාහරණ ලෙස අභ්‍යන්තර විගණන කාර්යයෙන් සොයාගත් දෑ බාහිර විගණකට සන්නිවේදනය කිරීමේදී.

- අභ්‍යන්තර විගණකවරුන් අදාළ වෘත්තිය ආයතනවල සාමාජිකයන්ද සහ ඔවුන් සාමාජිකත්වයේ අරමුණුගතභාවයට සම්බන්ධිත අදාළ වෘත්තිය ප්‍රමිත සමග ඔවුන්ගේ අනුකූලවීම බැඳීමකට යටත් වේද, හෝ ඔවුන් අභ්‍යන්තර ප්‍රතිපත්ති එම අරමුණු අත්කර ගනීද.

අ8. අභ්‍යන්තර විගණන කාර්යයේ හැකියාව යන්නෙන් අදහස් කෙරෙන්නේ අදාළ වෘත්තියමය ප්‍රමිත සමග අනුකූලව සහ පවරන ලද කාර්ය ක්‍රියාශූර ලෙස ඉටු කිරීමට හැකිවීමට අවශ්‍ය කරන මට්ටම සමස්ථයක් ලෙස කාර්යයේ නිපුණතා හා දැනුම අත්කර ගැනීම සහ පවත්වාගෙන යාමය. බාහිර විගණකගේ නිර්ණයට බලපෑ හැකි සාධක වලට පහත දෑ ඇතුළත් වේ;

- අභ්‍යන්තර විගණන කාර්යයට අස්තිත්ත්වයේ ප්‍රමාණයට සහ එහි මෙහෙයුම්වල ස්වභාවයට සාපේක්ෂව ප්‍රමාණවත් සහයෝගය පරිදි සම්පත් ලබාදී ඇත්ද.

- අභ්‍යන්තර විගණන කාර්ය භාරයන්ට අභ්‍යන්තර විගණක මත සේවයේ යෙදවීමේදී පුහුණු කිරීමෙහි සහ කාර්ය භාර පැවරීම සඳහා ස්ථාපිත ප්‍රතිපත්ති තිබේ ද;

- අභ්‍යන්තර විගණකවරුන්ට විගණනය පිළිබඳව ප්‍රමාණවත් තාක්ෂණික පුහුණුව සහ දක්ෂතාවය තිබේද. බාහිර විගණක විසින් එම තක්සේරුව කිරීමේ සැලකිල්ලට ගත හැකි අදාළ නිර්ණායකයට ඇතුළත් විය හැක්කේ උදාහරණ ලෙස අදාළ වෘත්තිය පදවි නාමය පළපුරුද්ද අභ්‍යන්තර විගණකවරු සතු වීමය.

- අස්තිත්ත්වයේ මූල්‍ය වාර්තාකරණය සහ අදාළ මූල්‍ය වාර්තාකරණ ආකෘතිමය රාමුව හා සම්බන්ධිත අවශ්‍ය කරන දැනුම අභ්‍යන්තර විගණකවරුන් සතුද, සහ අස්තිත්ත්වයේ මූල්‍ය ප්‍රකාශ සම්බන්ධිත වැඩ ඉටු කිරීමට අවශ්‍ය කුසලතාවය (උදාහරණ ලෙස කර්මාන්තය පිළිබඳ නිශ්චිත දැනුම) අභ්‍යන්තර විගණන කාර්යය සතුද යන්න.

- අභ්‍යන්තර විගණකවරු අඛණ්ඩ වෘත්තීය සංවර්ධන අවශ්‍යතාවයන් ඇතුළුව, අදාළ වෘත්තීමය ප්‍රමිත සමග අනුකූලවීමට ඔවුන් බැඳී සිටි අදාළ වෘත්තීය ආයතනයක සාමාජිකයන්ද.

අ9. අරමුණු ගත භාවය සහ හැකියාව දැකිය හැක්කේ අඛණ්ඩතාවය ලෙසය. අභ්‍යන්තර විගණන කාර්යයේ සංවිධානමය තත්ත්වය වැඩි වන විට සහ අදාළ ප්‍රතිපත්ති සහ ක්‍රියාපටිපාටි ප්‍රමාණවත් ලෙස අභ්‍යන්තර විගණකවරුන්ගේ අරමුණුගතභාවයට සහාය වනවිට සහ කාර්යයේ හැකියා මට්ටම වැඩි වන විට, බාහිර විගණක කාර්යයේ වැඩ භාවිත කිරීම මෙන්ම තවත් ක්ෂේත්‍රවලට භාවිත කිරීම සිදුවිය හැකිය. කෙසේ වෙතත් අභ්‍යන්තර විගණකවරුන්ගේ අරමුණුගතභාවයට ප්‍රබල සහායන් ලබාදෙන සංවිධානමය තත්ත්වය සහ අදාළ ප්‍රතිපත්ති ක්‍රියාපටිපාටි අභ්‍යන්තර විගණන කාර්යයට ප්‍රමාණවත් හැකියාව නොමැති කමට හානිපූර්ණය කළ නොහැක. ඒ හා සමානව අභ්‍යන්තර විගණන කාර්යයේ ඉහළ මට්ටමේ හැකියාව, අභ්‍යන්තර විගණකවරුන්ගේ අරමුණු ගතභාවයට ප්‍රමාණවත් ලෙස සහාය නොදෙන සංවිධානමය තත්ත්වය සහ ප්‍රතිපත්ති සහ ක්‍රියාපටිපාටිවල හානි පූර්ණය කළ නොහැක.

ක්‍රමානුකූල සහ හික්මුණු පිවිසුම් මඟක් ව්‍යවහාර කිරීම. (යොමුව: 15 (ඇ) ඡේදය)

අ10. අස්තිත්ත්වයක එහි ක්‍රියාවන් සැළසුම් කිරීම, ඉටු කිරීම, අධීක්ෂණය, සමාලෝචනය සහ ලේඛනගත කිරීමට ක්‍රමානුකූල සහ හික්මුන පිවිසුම් මඟක් ව්‍යවහාර කිරීම අස්තිත්ත්වය තුළ ඉටු කළ යුතු වෙනත් පාලන ක්‍රියාවන් අධීක්ෂණය කිරීමේ අභ්‍යන්තර විගණන කාර්යයන් ක්‍රියාවන්ගෙන් වෙන් කොට හඳුනා ගැනේ.

අ11. අභ්‍යන්තර විගණනකාර්ය ක්‍රමානුකූල සහ හික්මුන පිවිසුම් මඟක් ව්‍යවහාර කරන්නේද යන්න බාහිර විගණක නිර්ණය කිරීමේදී බලපෑ හැකි සාධකවලට පහත දෑ ඇතුළත් වේ;

- ඒවායේ අස්තිත්ත්වයක තරම සහ අවස්ථාවන් සමග ප්‍රමාණයෙන් හා අනුපාතයෙන් සමාන අවදානම් තක්සේරු වැඩ වැඩසටහන්, ලේඛනගත කිරීම වාර්තාකරණය සහ ප්‍රමාණයන් වැනි ක්ෂේත්‍ර ආවරණය කරමින් ලේඛනගත කළ අභ්‍යන්තර විගණන පටිපාටි හෝ උපදේශවල පැවැත්ම, ප්‍රමාණවත්භාවය සහ භාවිතය.

- අභ්‍යන්තර විගණන කාර්යයට යෝග්‍ය තත්ත්ව පාලන ප්‍රතිපත්ති සහ ක්‍රියාපටිපාටි තිබේද උදාහරණ ලෙස අභ්‍යන්තර විගණන කාර්යයකට අදාළ විය හැකි SLSQC 1[16] හි ඇති එවැනි ප්‍රතිපත්ති හෝ ක්‍රියාපටිපාටි (නායකත්වය, මානව සම්පත් සහ කාර්යභාරයේ කාර්ය සාධනය වැනි දෑට සම්බන්ධිත) හෝ අභ්‍යන්තර විගණකවරුන් සඳහා වන අදාළ වෘත්තීය ආයතන විසින් ප්‍රමිතිවල නියම කර ඇති තත්ත්ව පාලන අවශ්‍යතාවයන් වරින් වර බාහිර තත්ත්ව තක්සේරු කිරීම වෙනස් වීම වැනි වෙනත් යෝග්‍ය අවශ්‍යතාවයන්ද එලෙසම එවැනි ආයතන ස්ථාපනය කළ හැකිය.
- අභ්‍යන්තර විගණන කාර්යයේ වැඩ ප්‍රයෝජනයට ගැනීමට නොහැකි වන තත්ත්වයන් (යොමුව: 16 වන ඡේදය)

අ12. අභ්‍යන්තර විගණන කාර්යයේ සංවිධානමය තත්ත්වය සහ අදාළ ප්‍රතිපත්ති අභ්‍යන්තර විගණකවරුන්ගේ අරමුණුගතභාවයට ප්‍රමාණාත්මක ලෙස සහාය දෙන්නේ ද යන්න බාහිර විගණකගේ ඇගයුමට, සහ ක්‍රමානුකූල සහ හික්මුණු පිවිසුම් මඟක් එය ව්‍යවහාර කරයිද යන්න අභ්‍යන්තර විගණන කාර්යය හැකියාවේ මට්ටම, කාර්යයේ වැඩවල තත්ත්වයට වන අවදානම වඩාත් සැළකිය යුතු අන්දමේ බව ඇගයීම් කළ හැකි අතර එබැවින් කාර්යයේ වැඩ කිසිවක් විගණන සාක්ෂි ලෙස ප්‍රයෝජනයට ගැනීම යෝග්‍ය නොවේ.

අ13. මෙම ශ්‍රී.ල.වි.ප්‍ර. යේ අ7, අ8 සහ අ11 ඡේදවල ඇති සාධක තනි තනිව හෝ සමාහාරයක් ලෙස සැළකිල්ලට ගැනීම වැදගත් වන්නේ, විගණනයේ අරමුණු සඳහා අභ්‍යන්තර විගණන කාර්යයේ වැඩ ප්‍රයෝජනයට ගත නොහැකි යන්න නිගමනය කිරීමට තනි සාධකයක් බොහෝ විට ප්‍රමාණවත් නොවන නිසාය. උදාහරණ ලෙස අභ්‍යන්තර විගණන කාර්යයේ සංවිධානමය තත්ත්වය විශේෂයෙන්ම වැදගත් වන්නේ අභ්‍යන්තර විගණකරුවන්ගේ අරමුණුගතභාවයට වන තර්ජන අගය කිරීමේදීය. අභ්‍යන්තර විගණන කාර්යය වාර්තා කරන්නේ කළමණාකාරීත්වයට නම්, මෙම ශ්‍රී.ල.වි.ප්‍ර. අ 7 ඡේදය විස්තර කර ඇති වැනි එම වෙනත් සාධක තර්ජන පිළිගත හැකි මට්ටමකට අඩු කිරීමට සාමූහිකව ආරක්ෂාව සලස්වන්නන් ලබා දෙන්නේ නම් මිස මෙසේ කළමණකාරීත්වය වාර්තා කිරීමේ කාර්යභාරයේ අරමුණුගතභාවයට සැළකිය යුතු අන්දමේ තර්ජනයක් ලෙස සැළකිල්ලට ගනු ලැබිය හැකිය.

අ14. අමතරව, අභ්‍යන්තර විගණන සේවාවක් විගණක සේවාදායකයෙකුට ලබා දීමට බාහිර විගණක කාර්ය භාරයක් පිළිගත් අවස්ථාවක, සහ එම සේවාවල ප්‍රතිඵල විගණනය මෙහෙයවීමේදී ප්‍රයෝජනය ගනු ලබන විට ස්වයං - සමාලෝචන තර්ජනයක් ඇති වන බව ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනයේ ආචාර ධර්ම සංග්‍රහයේ[17] සඳහන් වේ. මෙයට හේතු වන්නේ විගණන සමාගමේ සාමාජිකයන් නොවන පුද්ගලයන් විසින් අභ්‍යන්තර විගණන වැඩ ඉටු කරන විට භාවිත කළ යුතු වෘත්තිය සංසදභාවයේ මට්ටම හා සමාන මට්ටමකට කාර්ය භාරයේ නියුතු කණ්ඩායම කටයුතු නොකර හෝ එම ප්‍රතිඵල නිසි අයුරින් අගය කිරීමකින් තොරව අභ්‍යන්තර විගණන සේවාව ප්‍රයෝජනය ගත හැකි වීම නිසාය. සමහර තත්ත්වයන්හිදී අදාළ වාරණය කිරීම් සහ වෙනත් තත්ත්වයන්හිදී තර්ජන පිළිගත හැකි මට්ටමකට අඩු කළ හැකි ආරක්ෂාව සලස්වන්නන් ව්‍යවහාර කිරීමට ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනයේ ආචාර ධර්ම සංග්‍රහය සාකච්ඡා කෙරේ.[18]

*අභ්‍යන්තර විගණන කාර්යයේ ප්‍රයෝජනයට ගත හැකි වැඩවල ස්වභාවය සහ ප්‍රමාණය තීර්ණය කිරීම.*

අභ්‍යන්තර විගණන කාර්යයේ ප්‍රයෝජනයට ගත හැකි වැඩවල ස්වභාවය සහ ප්‍රමාණය තීර්ණය කිරීමේදී බලපාන සාධක (යොමුව: 17 - 19 ඡේද)

අ15. අභ්‍යන්තර විගණන කාර්යයේ වැඩ විගණන කාර්යයන් සඳහා ප්‍රයෝජනයට ගත හැකි බව බාහිර විගණක විසින් තීර්ණය කළ පසු, පළමු සැළකිල්ලට ගැනීම වනුයේ ඉටුකර ඇති හෝ ඉටු කිරීමට සැළසුම් කර ඇති අභ්‍යන්තර විගණන කාර්යයේ වැඩ වල විෂය පථය සහ ස්වභාවය, ශ්‍රී.ල.වි.ප්‍ර. 300[19] සමඟ අනුකූලව බාහිර විගණක ස්ථාපනය කළ සමස්ථ විගණන ක්‍රමෝපාය සහ විගණන සැළැස්ම අදාළ ද යන්න වේ.

අ16. බාහිර විගණක විසින් ප්‍රයෝජනයට ගත හැකි අභ්‍යන්තර විගණන කාර්යයේ වැඩ සඳහා උදාහරණවලට පහත දෑ ඇතුළත් විය හැකිය.

- පාලනයන්හි මෙහෙයුම් සඵලදායකත්වය පරීක්ෂා කිරීම.

---

16 තත්ත්ව පාලනය මත ශ්‍රී ලංකා ප්‍රමිති (SLSQC) 1 *මූල්‍ය ප්‍රකාශ විගණනය සහ සමාලෝචන සහ වෙනත් සහතික වීම හා සම්බන්ධිත කාර්යභාර සේවා ඉටුකරන සමාගම් සඳහා තත්ත්ව පාලනය.*

17 *වෘත්තිය ගණකාධිකාරීවරුන් සඳහා ආචාර ධර්ම සංග්‍රහය* (ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනයයේ ධර්ම සංග්‍රහය) 290, 194 වගන්ති

18 ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනයේ ධර්ම සංග්‍රහය. 290, 190 - 290, 195 වගන්ති.

19 ශ්‍රී.ල.වි.ප්‍ර. 300 *මූල්‍ය ප්‍රකාශ විගණනයක් සඳහා සැළසුම් කිරීම.*

- සීමිත විනිශ්චයක් අවශ්‍ය කරන තහවුරු කිරීමේ ක්‍රියාපටිපාටි.
- තොග ගණනය නිරීක්ෂණය කිරීම.
- මූල්‍ය වාර්තාකරණයට අදාළ තොරතුරු පද්ධතිය මගින් ගණුදෙනු සොයා ගැනීම.
- නියාමන අවශ්‍යතාවයන් සමග අනුකූලවීම පරීක්ෂා කිරීම.

සමහර තත්වයන්හිදී සමූහයට සැළකිය යුතු අන්දමේ සංරචකයන් නොවන (ශ්‍රී.ල.වි.ප්‍ර. යෙහි අවශ්‍යතාවයන් සමඟ මෙය ගැටළුවක් නොවන අවස්ථාවක)[20] පරිපාලිතයන්හි මූල්‍ය තොරතුරු විගණනය හෝ සමාලෝචනය කිරීම.

අ17. අභ්‍යන්තර විගණන කාර්යයේ සංවිධානමය තත්ත්වය සහ අභ්‍යන්තර විගණකවරුන් අරමුණුගතභාවයට ප්‍රමාණවත් ලෙස සහාය දෙන අදාළ ප්‍රතිපත්ති සහ ක්‍රියාපටිපාටීන් සහ මෙම ශ්‍රී.ල.වි.ප්‍ර. යේ 18 වන ඡේදය තුළ වන අභ්‍යන්තර විගණන කාර්යයේ හැකියා මට්ටම මේ ප්‍රමාණයේ බාහිර විගණකගේ ඇගයීම මගින් අභ්‍යන්තර විගණන කාර්යයේ වැඩ ප්‍රයෝජනයට ගැනීම්වල සැළසුම්කළ ස්වභාවය ප්‍රමාණය බාහිර විගණකගේ නිර්ණය කිරීමේ දී බලපෑම් කළ හැකිය. අමතරව, එවැනි වැඩ සැළසුම් කිරීමේදී, ඉටු කිරීමේදී සහ අගය කිරීමේ අවශ්‍ය කරන විනිශ්චයේ ප්‍රමාණය සහ සැදහුම් මට්ටමේ ප්‍රමාණාත්මක අවප්‍රකාශයක තක්සේරු කළ අවදානම් බාහිර විගණකගේ නිර්ණය කිරීමට යෙදවුම් වේ. අතිරේකව, මෙම ශ්‍රී.ල.වි.ප්‍ර. යේ 16 වන ඡේදයේ විස්තර කර ඇති පරිදි විගණනයේ අරමුණු සඳහා අභ්‍යන්තර විගණන කාර්යයේ වැඩ බාහිර විගණකට ප්‍රයෝජනයට ගත නොහැකි තත්ත්වයන්ද තිබේ.

විගණන ක්‍රියාපටිපාටි සැළසුම් කිරීමේදී සහ ඉටු කිරීමේදී සහ ප්‍රතිඵල ඇගයීමේදී විනිශ්චයන් (යොමුවඃ 18 (අ), 30 (අ) ඡේද)

අ18. විගණන පටිපාටි සැළසුම් කිරීමේදී සහ ඉටු කිරීමේදී සහ විගණන සාක්ෂි ඇගයීමේදී භාවිත කිරීමට අවශ්‍ය කරන විනිශ්චය විශාලවන විට, මෙම ශ්‍රී.ල.වි.ප්‍ර. යේ 18 වන ඡේදය සමඟ අනුකූලව ඍජුව වැඩි ප්‍රමාණයක ක්‍රියාපටිපාටි ඉටු කිරීමට බාහිර විගණකට අවශ්‍ය කෙරේ. මෙයට හේතු වන්නේ අභ්‍යන්තර විගණන කාර්යයේ වැඩ ප්‍රයොජනයට ගැනීම මගින් පමණක්ම බාහිර විගණකට ප්‍රමාණවත් යෝග්‍ය විගණන සාක්ෂි ලබා නොදෙන නිසාය.

අ19. ප්‍රකාශ කළ විගණන මතය සඳහා බාහිර විගණකට තනි කර වගකීම ඇති නිසා, 18 වන ඡේදය සමඟ අනුකූලව විගණන කාර්ය භාරය තුළ, බාහිර විගණකට වැදගත් විනිශ්චයන් ගැනීම අවශ්‍ය වේ. වැදගත් විනිශ්චයකට පහත ද ඇතුළත් වේ.

- ප්‍රමාණාත්මක අවප්‍රකාශවල අවදානම් තක්සේරු කිරීම;
- ඉටු කළ පරීක්ෂාවල ප්‍රමාණවත් භාවය ඇගයීම;
- අඛණ්ඩව පැවැත්ම උපකල්පන භාවිත කිරීමේ කළමණාකාරීත්වයේ යෝග්‍යතාවය අගය කිරීම
- සැළකිය යුතු අන්දමේ ගිණුම්කරණ ඇස්තමේන්තු අගය කිරීම; සහ
- මූල්‍ය ප්‍රකාශ තුළ සහ විගණකගේ වාර්තාවේ බලපාන වෙනත් කරුණු හෙළිදරව් කිරීමේ ප්‍රමාණවත්භාවය අගය කිරීම.

ප්‍රමාණාත්මක අවප්‍රකාශයක තක්සේරු කළ අවදානම (යොමුවඃ 18 (ආ) ඡේදය)

අ20. විශේෂ ගිණුමක ශේෂයක, ගණුදෙනු හෝ හෙළිදරව් පන්තියක, සැදහුම් මට්ටමේදී ප්‍රමාණාත්මක අවප්‍රකාශයක තක්සේරු කළ අවදානම වැඩිවන විට විගණන පටිපාටි සැළසුම් කිරීමේදී සහ ඉටු කිරීමේදී සහ ඒ මත ප්‍රතිඵල ඇගයීමේදී බොහෝ විට වැඩිපුර විනිශ්චයක් අවශ්‍ය වේ. එවැනි තත්වයන්හිදී, මෙම ශ්‍රී.ල.වි.ප්‍ර. යේ 18 වන ඡේදය සමඟ අනුකූලව බාහිර විගණකට ඍජුව වැඩිපුර ක්‍රියාපටිපාටි ඉටු කිරීමට අවශ්‍ය වේ, සහ ඒ අනුව ප්‍රමාණවත් උචිත විගණන සාක්ෂි ලබා ගැනීමේදී අභ්‍යන්තර විගණන කාර්යයේ වැඩ අඩුවෙන් ප්‍රයෝජනයට ගැනීමට සිදුවේ. තවදුරටත් ශ්‍රී.ල.වි.ප්‍ර. 200 තුළ[21] විස්තර කර ඇති පරිදි ප්‍රමාණාත්මක අවප්‍රකාශවල තක්සේරු කළ අවදානම වැඩි වන විට, බාහිර විගණකට වඩා ඒත්තු ගන්වන විගණන සාක්ෂි බාහිර විගණකට අවශ්‍ය කරනු ලැබිය හැකි අතර හා එබැවින් බාහිර විගණකට වැඩවලින් වැඩි කොටසක් ඍජුව ඉටු කිරීමට සිදුවේ.

---

[20] ශ්‍රී.ල.වි.ප්‍ර. 600 *විශේෂ සැලකිල්ලට ගැනීම් - සමූහ මූල්‍ය ප්‍රකාශ විගණනය (සංරචක විගණකයේ වැඩ ඇතුළුව)*

[21] ශ්‍රී.ල.වි.ප්‍ර. 200, අ31 වන ඡේදය

අ21. ශ්‍රී.ල.වි.ප්‍ර. 315 (සංශෝධිත)[22] තුළ විස්තර කර ඇති පරිදි, සැළකිය යුතු අන්දමේ අවදානම්වලට විශේෂ විගණන සැළකිල්ලක් දක්වීම අවශ්‍ය කරන අතර එබැවින් සැළකිය යුතු අන්දමේ අවදානම්වලට සම්බන්ධිත අභ්‍යන්තර විගණන කාර්යක වැඩ බාහිර විගණකට ප්‍රයෝජනය ගත හැකිවීම සීමිත විනිශ්චයට සම්බන්ධ හා ක්‍රියා පටිපාටිවලට සීමා කෙරේ. මෙයට අමතරව ප්‍රමාණාත්මක අවප්‍රකාශය අවදානම් පහත මට්ටමක හැර වෙනත් මට්ටමක වනවිට අභ්‍යන්තර විගණන කාර්යයේ වැඩ පමණක් ප්‍රයෝජනයට ගැනීම අවදානම පිළිගත හැකි මට්ටමක අඩු කිරීම සහ බාහිර විගණකට සමහර පරීක්ෂා ඍජුව ඉටු කිරීමේ අවශ්‍යතාවය, අත්හැර දැමීම අපේක්ෂා තැබිය නොහැකිය.

අ22. මෙම ශ්‍රී.ල.වි.ප්‍ර. සමග අනුකූලව ක්‍රියා පටිපාටි ක්‍රියාවට නැංවීම බාහිර විගණකගේ ප්‍රමාණාත්මක අවප්‍රකාශයක අවදානම තක්සේරුව බාහිර විගණකට යළි අගය කිරීමට හේතුවිය හැකිය. ඒ නිසාවෙන් අභ්‍යන්තර විගණන කාර්යයේ වැඩ ප්‍රයෝජනයට ගත යුතු ද සහ මෙම ශ්‍රී.ල.වි.ප්‍ර. ය තවදුරටත් ව්‍යවහාර කරණය අවශ්‍ය දැයි බාහිර විගණක නීර්ණය කිරීමට මෙය බලපා හැකිය.

පාලනය පිළිබඳ වගකිව යුතු අය සමග සන්නිවේදනය (යොමුව: 20 වන ඡේදය)

අ23. ශ්‍රී.ල.වි.ප්‍ර. 260 (සංශෝධිත)[23] සමග අනුකූලව, විගණනයේ සැළසුම් කළ විෂය පථය සහ කල් යෙදුමේ සැළසුම් කළ සමස්ථ විග්‍රහයක් පාලනය පිළිබඳ වගකිව යුතු අය සමග බාහිර විගණක සන්නිවේදනය කිරීම අවශ්‍ය කෙරේ. අභ්‍යන්තර විගණන කාර්යයේ වැඩවල සැළසුම් කළ ප්‍රයෝජනයට ගැනීම බාහිර විගණකගේ සමස්ථ විගණන ක්‍රමෝපායේ වැදගත් කොටසක් වන අතර එබැවින් යෝජිත විගණන පිවිසුම් මග පාලනය පිළිබඳ වගකීව යුතු අයට ඔවුන්ගේ අවබෝධය සඳහා අදාළ වේ.

**අභ්‍යන්තර විගණන කාර්යයේ වැඩ ප්‍රයෝජනයට ගැනීම.**

*අභ්‍යන්තර විගණන කාර්යය සමග සාකච්ඡා කිරීම සහ සමායෝජනය කිරීම* (යොමුව: 21 ඡේදය)

අ24. අදාළ ක්‍රියාවන් සමායෝජනය සඳහා පදනමක් ලෙස අභ්‍යන්තර විගණන කාර්යයේ ඔවුන්ගේ වැඩ සැළසුම් කළ ප්‍රයෝජනයට ගැනීම සාකච්ඡා කිරීමේ දී, පහත දෑ ආමන්ත්‍රණය කිරීම ප්‍රයෝජනවත් විය හැකිය.

- එවැනි වැඩවල කල් යෙදුම.
- ඉටුකළ වැඩවල ස්වභාවය.
- විගණන ආවරණයේ ප්‍රමාණය.
- සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශ සඳහා ප්‍රමාණාත්මකභාවය (සහ අදාළ වන්නේ නම්, ප්‍රමාණාත්මක මට්ටම හෝ විශේෂ පන්තිවල ගණුදෙනු, ගිණුම් ශේෂ හෝ හෙළිදරව් කිරීම සඳහා මට්ටම්) සහ කාර්ය සාධන ප්‍රමාණාත්මකභාවය.
- අයිතම තෝරා ගැනීම සහ නියැඳි ප්‍රමාණයන්හි යෝජිත ක්‍රම.
- ඉටුකළ වැඩ ලේඛනගත කිරීම.
- සමාලෝචන සහ වාර්තා කිරීමේ ක්‍රියාටිපාටි.

අ25. බාහිර විගණක සහ අභ්‍යන්තර විගණන කාර්යය අතර සමාලෝචනයට සඵලදායක වන්නේ උදාහරණ ලෙස;

- කාලපරිච්ඡේදය පුරාවටම යෝග්‍ය කාල අන්තර් තුළ සාකච්ඡා සිදුවීම.
- කාර්යයට බලපෑ හැකි අභ්‍යන්තර විගණන කාර්යයේ වැදගත් කරනු බාහිර විගණකට දැන්වීම.
- අභ්‍යන්තර විගණන කාර්යයේ අදාළ වාර්තාවලට පිවිසුම් මගක් තිබීම හා එය බාහිර විගණකට දැනුම්දීම සහ යම් වැදගත් කරුණු කාර්යයේ අවධානයට පැමිණිවිට එවැනි කරුණු බාහිර විගණකගේ වැඩවල බලපෑ හැකිවන විට, විගණන කාර්ය භාරය සඳහා එවැනි කරුණුවල සම්බන්ධය බාහිර විගණකට සැළකිල්ලට ගැනීම සඳහා දැන්වීම.

අ26. ලේඛනවල විශ්වාස දායකත්වය, ප්‍රශ්නවලට තුඩුදීමට හේතුවන විගණන සාක්ෂි ලෙස භාවිත කළ හැකි තොරතුරුවලට සහ විමසීම්වලට ප්‍රතිචාර පිළිබඳ සෝදිසියෙන් සිටීම ඇතුළුව වෘත්තිය සංසය දෘෂ්ඨියකින් යුතුව විගණනයක් විගණක සැළසුම් කිරීම සහ ඉටු කිරීමේ වැදගත්කම ශ්‍රී.ල.වි.ප්‍ර. 200[24] සාකච්ඡා කෙරේ. ඒ අනුව කාර්ය භාරය පුරාවටම අභ්‍යන්තර විගණන කාර්ය සමග සන්නිවේදනය, බාහිර විගණකගේ වැඩවලට බලපෑ හැකි කරුණු බාහිර විගණකගේ අවධානයට යොමු කිරීම සඳහා අවස්ථාවක් අභ්‍යන්තර විගණකවරුන්ට

[22] ශ්‍රී.ල.වි.ප්‍ර. 315 (සංශෝධිත), 4 (ඉ) ඡේදය.
[23] ශ්‍රී.ල.වි.ප්‍ර. 260 (සංශෝධිත) 15 වන ඡේදය.
[24] ශ්‍රී.ල.වි.ප්‍ර. 200, 15 සහ අ 20 ඡේද.

ලබා දිය හැකිය.[25] ඒ අනුව බාහිර විගණකගේ ප්‍රමාණාත්මක අවප්‍රකාශ හඳුනාගැනීමේ හා ඇස්තමේන්තු කිරීමේදී එවැනි තොරතුරු එවිට බාහිර විගණක සැලකිල්ලට ගත හැකිය. අමතරව එවැනි තොරතුරු මූල්‍ය ප්‍රකාශවල ප්‍රමාණාත්මක අවප්‍රකාශයක අවදානම තියුණුවන ඇඟවීමක් වේ නම් හෝ යම් තථ්‍ය හෝ සැක කරනු ලබන හෝ කරන ලද වංචාවක් සම්බන්ධයෙන් විය හැකි නම්, ශ්‍රී.ල.වි.ප්‍ර. 240[26] සමඟ අනුකූලව වංචා නිසා ප්‍රමාණාත්මක අවප්‍රකාශයක අවදානම බාහිර විගණක හඳුනාගැනීම ලෙස ගණන් ගත හැකිය.

*අභ්‍යන්තර විගණන කාර්යයේ වැඩවල ප්‍රමාණවත්භාවය නිර්ණය කිරීමට ක්‍රියාපටිපාටි* (යොමුව: 23 - 24 ඡේද)

අ27. සමස්ථයක් ලෙස බාහිර විගණක ප්‍රයෝජනයට ගැනීමට සැළසුම් කරන අභ්‍යන්තර විගණන කාර්යයේ වැඩවල ප්‍රධාන අංගය මත බාහිර විගණකගේ විගණන ක්‍රියාපටිපාටි, කාර්යයේ වැඩවල සමස්ථ තත්ත්වය සහ එය ඉටුකරන ලද අරමුණුගත භාවය පිළිබඳ අගය කිරීමක් සඳහා පදනමක් ලබාදෙයි.

අ28. 24 වන ඡේදය සමඟ අනුකූලව යළි ඉටු කිරීමට අමතරව, අභ්‍යන්තර විගණන කාර්යයේ ඉටුකළ වැඩවල තත්ත්වය අගය කිරීමට සහ ළඟාවුණ නිගමන අගය කිරීමට බාහිර විගණක ඉටු කළ හැකි ක්‍රියාපටිපාටිවලට පහත දෑ ඇතුළත් වේ;

- අභ්‍යන්තර විගණන කාර්ය ඇතුළත යෝග්‍ය පුද්ගලයන්ගෙන් විමසීම් කිරීම.
- අභ්‍යන්තර විගණන කාර්යය විසින් ඉටුකළ ක්‍රියාපටිපාටි නිරීක්ෂණය කිරීම.
- අභ්‍යන්තර විගණන කාර්යයේ වැඩවල වැඩසටහන් සහ වැඩ පත්‍රිකා සමාලෝචනය කිරීම.

අ29. ප්‍රමාණාත්මක අවප්‍රකාශයක අවදානම ඉහළ යන විට වැඩිවිනිශ්චයක් අවශ්‍ය කෙරේ. අභ්‍යන්තර විගණන කාර්යයේ සංවිධානමය තත්ත්වය සහ අදාළ ප්‍රතිපත්ති හා පටිපාටි අභ්‍යන්තර විගණකවරුන්ගේ අරමුණුගතභාවයට ප්‍රමාණවත් ලෙස සහායවීම අඩුනම් හෝ අභ්‍යන්තර විගණන කාර්යයේ හැකියාවේ මට්ටම පහත්වන විට, විගණන මතයට පදනම සඳහා වන ප්‍රමාණවත් යෝග්‍ය විගණන සාක්ෂි ලබා ගැනීම් තුළ කාර්යයේ වැඩ ප්‍රයෝජනයට ගැනීමේ තීරණයට සහාය වීමට කාර්යයේ වැඩවල ප්‍රධාන අංගවල සමස්ථය මත බාහිර විගණක විසින් වැඩිපුර විගණන පටිපාටි ඉටු කිරීමට සිදුවේ.

අ30. මෙම ශ්‍රී.ල.වි.ප්‍ර. යේ අරමුණු සඳහා, යළි ඉටු කිරීම සම්බන්ධ වන්නේ, අභ්‍යන්තර විගණන කාර්යය විසින් ළඟාවුණු නිගමන වලංගු කිරීමට ක්‍රියාපටිපාටි බාහිර විගණක ස්වාධීනව ක්‍රියාත්මක කිරීමය. මෙම අරමුණු ඉටු කර ගත හැක්කේ, අභ්‍යන්තර විගණන කාර්යය දැනටමත් පරීක්ෂා කර ඇති අයිතම යළි පරීක්ෂා කිරීම මගින් හෝ එසේ කිරීමට නොහැකි අවස්ථාවල දී, මෙම අරමුණු එලෙස ඉටුකර ගත හැක්කේ අභ්‍යන්තර විගණන කාර්යය විසින් සත්‍ය වශයෙන් පරීක්ෂා නොකළ වෙනත් සමාන ප්‍රමාණවත් අයිතම පරීක්ෂා කිරීම මගිනි. අ 28 ඡේදයේ බාහිර විගණක ඉටු කළ හැකි වෙනත් ක්‍රියාපටිපාටිවලට සංසන්දනය කිරීමේ දී අභ්‍යන්තර විගණන කාර්යයේ වැඩවල ප්‍රමාණවත් භාවය සම්බන්ධයෙන් යළි ඉටු කිරීම වඩාත් ඒත්තු ගන්වන සාක්ෂි ලබාදෙයි. ප්‍රයෝජනයට ගත් අභ්‍යන්තර විගණන කාර්යයේ සෑම ක්ෂේත්‍රයකම වැඩ බාහිර විගණක යළි ඉටු කිරීම අවශ්‍ය නොවන අතර, 24 වන ඡේදයට අනුකූලව සමස්ථයක් වශයෙන් බාහිර විගණක ප්‍රයෝජනයට ගැනීම සැළසුම් කරන අභ්‍යන්තර විගණන කාර්යයේ වැඩවල ප්‍රධාන කොටස මත යම් යළි ඉටු කිරීමක් අවශ්‍ය වේ. අභ්‍යන්තර විගණක කාර්යය විසින් සැළසුම් කිරීමේ දී ඉටු කිරීමේ දී සහ විගණන පටිපාටි ප්‍රමාණාත්මක අවප්‍රකාශවල ඉහළ අවදානම් ඇති ක්ෂේත්‍රවල ප්‍රතිඵල ඇගයීමේ දී, වඩා වැඩි විනිශ්චයක් ඇති එම ක්ෂේත්‍රවල යළි ඉටු කිරීම සඳහා බාහිර විගණක වැඩි අවධානයක් යොමු කළ හැකිය.

## සෘජු සහායක් ලබාගැනීමට අභ්‍යන්තර විගණකවරු කුමන ක්ෂේත්‍රවල කුමන ප්‍රමාණයකට යොදවා ගත හැකි ද යන්න නිර්ණය කිරීම.

*විගණන අරමුණු සඳහා සෘජු සහායක් ලබාගැනීමට අභ්‍යන්තර විගණකවරු යොදවාගත හැකිද යන්න නිර්ණය කිරීම* (යොමුව: 5, 26- 28 ඡේද)

අ31. බාහිර විගණකට, අභ්‍යන්තර විගණකවරුන්ගේ සෘජු සහාය ලබා ගැනීමට යොදවා ගැනීමට නීතියෙන් හෝ රෙගුලාසි මගින් තහනම් කර ඇති අධිකරණ බල ප්‍රදේශ තුළ මෙම තහනම් කිරීම එලෙස සංරචක විගණකවරුන්ට ද එසේම දික්කර ඇත් ද යන්න සැළකිල්ලට ගැනීමට සමූහ විගණකවරුන් සඳහා අදාළවන අතර, වාරණය ඔවුන්ටත් අදාළ වන්නේ නම්, මෙය ඇමතීමට සංරචක විගණකවරුන් සමඟ සන්නිවේදනය කළ යුතුය.[27]

[25] ශ්‍රී.ල.වි.ප්‍ර. 315 (සංශෝධිත) අ 120 ඡේදය

[26] ශ්‍රී.ල.වි.ප්‍ර. 315 (සංශෝධිත) අ 11 ඡේදය, ශ්‍රී.ල.වි.ප්‍ර. 240 ට සම්බන්ධිතව, *මූල්‍ය ප්‍රකාශ විගණනයක් තුළ වංචාවකට සම්බන්ධිත විගණකගේ වගකීම්.*

[27] ශ්‍රී.ල.වි.ප්‍ර. 600, 40 (ආ) ඡේදය.

අ32. මෙම ශ්‍රී.ල.වි.ප්‍ර.යේ 7 වන ඡේදයේ සඳහන් කර ඇති පරිදි, අරමුණුගතභාවයෙන් හැඳින්වෙන්නේ, පක්ෂග්‍රාහීවීම, ඇල්මේ ගැටුමක් හෝ වෙනත් අයට වෘත්තිය විනිශ්චයන්ට මැදිහත් වී අක්‍රීය කිරීමට ඇති අයුතු බලපෑම් වලට ඉඩ නොදී යෝජිත වැඩ ඉටු කිරීමට ඇති හැකියාව වේ. අභ්‍යන්තර විගණකගේ අරමුණුගතභාවයට තර්ජන පැවැත්ම සහ වැදගත්කම අගය කිරීමේ දී පහත දැක්වෙන සාධක අදාළ විය හැකිය;

- අභ්‍යන්තර විගණකවරුන්ගේ අරමුණුගතභාවයට අභ්‍යන්තර විගණන කාර්යයේ සංවිධානමය තත්ත්වය සහ අදාළ ප්‍රතිපත්ති සහ පටිපාටි සහාය දෙන ප්‍රමාණය[28]
- කාර්යයක් සම්බන්ධවන අස්තිත්ත්වයේ අංගයක් සඳහා සේවයකරන හෝ වගකිව යුතු පුද්ගලයෙක් සමඟ ඇති පවුල් සහ පුද්ගලික සබඳතාවයන්.
- කාර්යයක් සම්බන්ධවන අස්තිත්ත්වයේ අංශයක් හෝ දෙපාර්තමේන්තුවක් සමඟ ඇසුර.
- එක හා සමාන ජ්‍යෙෂ්ඨතාවයේ මට්ටම මත වෙනත් සේවකයන් හා අදාළවන නියමයන් සමඟ සංගතව පාරිශ්‍රමික හැර අස්තිත්ත්වයට වෙනත් සැළකිය යුතු අන්දමේ මූල්‍ය ඇල්මක් තිබීම.

අභ්‍යන්තර විගණකවරු සඳහා ඇති අදාළ වෘත්තීය ආයතන මගින් නිකුත් කර ඇති ප්‍රකාශ මගින් ප්‍රයෝජනවත් අතිරේක උපදේශ ලබා දිය හැකිය.

අ33. අභ්‍යන්තර විගණකගේ අරමුණුගතභාවයට ඇති තර්ජනවල වැදගත්කම කොතරම් ද යත් ඒවා පිළිගත හැකි මට්ටමක අඩු කිරීමට ගත හැකි ආරක්‍ෂාව සලස්වන්නන් නොමැති සමහර තත්ත්වයන් ද එසේම තිබිය හැකිය. උදාහරණයක් ලෙස එසේ වන්නේ ආරක්ෂාව සලස්වන්නන්ගේ ප්‍රමාණවත්භාවය, විගණනය සම්බන්ධයෙන් වැඩවල වැදගත්කම මගින් බලපෑම් ඇති කරන අතර, විගණනය තුළ දී සැළකිය යුතු අන්දමේ විනිශ්චයක් ගැනීම අවශ්‍යකරන පටිපාටි ඉටු කිරීමේදී සම්බන්ධිත සෘජු සහාය ලබාදීමට අභ්‍යන්තර විගණකවරු භාවිත කිරීම 30(අ) සහ (ආ) ඡේද වලින් තහනම් කර ඇත, හෝ අදාළ විගණන පටිපාටි ඉටු කිරීමේ දී අවශ්‍යකරන විනිශ්චය ප්‍රමාණාත්මක අවප්‍රකාශයක තක්සේරු කළ අවදානම ඉහළ වන අවස්ථාවක හෝ රැස්කරගත් විගණන සාක්ෂි අගය කිරීම සීමිත ප්‍රමාණයට වඩා වැඩි වන නිසාය. මෙය එසේම අවස්ථාවක් විය හැක්කේ සම්බන්ධකර ගන්නා වැඩ ස්වයං සමාලෝචන තර්ජනයක් ඇති කරන අවස්ථාවක මේ හේතුව නිසා 30(ඇ) සහ 30(ඈ) ඡේදවල විස්තර කර ඇති තත්ත්වයන්හි ද අභ්‍යන්තර විගණකවරුන්ට මෙම ක්‍රියාපටිපාටි ඉටු කිරීමෙන් වළක්වාලා ඇත.

අ34. එක් එක් අභ්‍යන්තර විගණකවරුන්ගෙන් සහ ඔවුන්හට පවරනු ලැබිය හැකි වැඩ සම්බන්ධයෙන් යොමු කිරීමේ දී, අභ්‍යන්තර විගණකවරයෙකුගේ හැකියාවේ මට්ටම අගය කිරීමේ දී, මෙම ශ්‍රී.ල.වි.ප්‍ර. යේ අ8 ඡේදයේ කළ හැකි බොහෝ සාධක ද එසේම අදාළ විය හැකිය.

*සෘජු සහායක් ලබාදෙන අභ්‍යන්තර විගණකවරුන්ට පැවරිය හැකි වැඩවල ස්වභාවය සහ ප්‍රමාණය නීර්ණය කිරීම.* (යොමුව: 29 - 31 ඡේද)

අ35. අභ්‍යන්තර විගණකවරුන්ට පැවරිය හැකි වැඩවල ස්වභාවය සහ ප්‍රමාණය නීර්ණය කිරීමේ දී අදාළ උපදේශ මෙම ශ්‍රී.ල.වි.ප්‍ර. අ 15 - අ22 ඡේදවලින් ලබා දී ඇත.

අ36. අභ්‍යන්තර විගණකවරුන්ට පැවරිය හැකි වැඩවල ස්වභාවය නීර්ණය කිරීමේ දී, එසේ පැවරීමට යෝග්‍ය විය හැකි ක්ෂේත්‍රවල එවැනි වැඩවලට සීමා කිරීමට බාහිර විගණක ප්‍රවේශම් විය යුතුය. සෘජු සහායක් ලබා ගැනීමට අභ්‍යන්තර විගණකවරුන් යොදවා ගැනීම යෝග්‍ය නොවන ක්‍රියාවන් සහ කාර්යයන් සඳහා උදාහරණවලට පහත දෑ ඇතුළත් වේ.

- වංචා අවදානම් සාකච්ඡා කිරීම. කෙසේ වෙතත්, බාහිර විගණකවරු ශ්‍රී.ල.වි.ප්‍ර. 315 (සංශෝධිත)[29] සමඟ අනුකූලව සංවිධානය තුළ වංචා අවදානම් පිළිබඳ අභ්‍යන්තර විගණකවරුන්ගෙන් විමසීම් කළ හැකිය.
- ශ්‍රී.ල.වි.ප්‍ර. 240 හි ආමන්ත්‍රණය කළ ලෙස ප්‍රකාශයට පත් නොකළ විගණන ක්‍රියාපටිපාටි නීර්ණය කිරීම.

අ37. සමානව, ශ්‍රී.ල.වි.ප්‍ර. 505[30] සමඟ අනුකූලව බාහිර තහවුරු කිරීමේ ඉල්ලීම් මත පාලනයක් බාහිර විගණක පවත්වාගෙනයාම අවශ්‍ය කිරීම සහ බාහිර තහවුරු ක්‍රියාපටිපාටිවල ප්‍රතිඵල ඔහු අගය කිරීමට අවශ්‍ය කරන නිසා, මෙම වගකිම් අභ්‍යන්තර විගණකවරුන්ට පැවරීම යෝග්‍ය නොවිය හැක. කෙසේ වෙතත් බාහිර විගණකට තහවුරු කිරීම්වලට වන ප්‍රතිචාර තුළ ව්‍යතිරේක විසඳීම කිරීම සඳහා ඔහුට අවශ්‍යකරන තොරතුරු එකලස් කිරීමේ කාර්ය සඳහා අභ්‍යන්තර විගණකවරුන් සහාය විය හැකිය.

---

[28] අ 7 ඡේදය බලන්න.

[29] ශ්‍රී.ල.වි.ප්‍ර. 315 (සංශෝධිත), 6 (අ) ඡේදය.

[30] ශ්‍රී.ල.වි.ප්‍ර. 505, *බාහිර තහවුරු කිරීම්,* 7 සහ 16 වන ඡේද.

අ38. සෘජු සහායක් ලබාදෙන අභ්‍යන්තර විගණකවරුන්ට පැවරිය යුතු වැඩ නිර්ණය කිරීමේ දී අවශ්‍ය කරන විනිශ්චයන්ගේ ප්‍රමාණය සහ ප්‍රමාණාත්මක අවප්‍රකාශය හැර, වන අවදානම ද එලෙසම අදාළ වේ. උදාහරණ ලෙස ඉහළ අවදානමක් ඇති ක්ෂේත්‍රයක ලැබිය යුතු ගිණුම් අගය කිරීමේ තක්සේරු කිරීමේ, තත්ත්වයන් වන අවස්ථාවක දී සෘජු සහායක් ලබාදෙන අභ්‍යන්තර විගණකවරයෙකුට ලැබිය යුතු ගිණුම්වල වයස පිළිබඳ ගති ලක්ෂණ අත්කර ගැනීමේ ක්‍රියාවලියක (aging) නිරවද්‍යතාවය පරීක්ෂා කිරීමේ කාර්ය ඔහුට බාහිර විගණක පැවරිය හැකිය. කෙසේ වෙතත් වයස පිළිබඳ ගති ලක්ෂණ අත්කර ගැනීමේ ක්‍රියාවලිය පදනම මත කරන ප්‍රතිපාදනයේ ප්‍රමාණවත් භාවය අගය කිරීමේ දී සීමිත ප්‍රමාණයකට වඩා වැඩි විනිශ්චයක් අවශ්‍ය විය හැකි නිසා පසුව සඳහන් කළ ක්‍රියාපටිපාටි සෘජු සහායක් ලබාදෙන අභ්‍යන්තර විගණකවරයෙකුට එය පැවරීම යෝග්‍ය නොවිය හැකිය.

අ39. බාහිර විගණක විසින් සිදුකරන, මෙහෙයවීම්, අධීක්ෂණය සහ සමාලෝචනය කිරීම කෙසේ වෙතත් සෘජු සහාය ලබා ගැනීමට අභ්‍යන්තර විගණකවරුන් උවමනාවට වඩා යොදා ගැනීමෙන් බාහිර විගණන කාර්ය භාරයේ ස්වාධීනත්වය සම්බන්ධිත බලපෑම් ඇති විය හැකිය.

## සෘජු සහායක් ලබාගැනීමට අභ්‍යන්තර විගණකවරු යොදවා ගැනීම (යොමුව: 34 ඡේදය)

අ40. මූල්‍ය ප්‍රකාශමත මතයක් ප්‍රකාශ කරනවිට, බාහිර විගණක අස්තිත්වයෙන් ස්වාධීන වීම අවශ්‍යකරන අතර අභ්‍යන්තර විගණන කාර්යය තුළ ඔවුන් පුද්ගලයන් ලෙස අස්තිත්ත්වයෙන් ස්වාධීන නොවේ; සෘජු සහායන් ලබාදෙන අභ්‍යන්තර විගණකවරුන් විසින් ඉටු කරන වැඩ බාහිර විගණකගේ මෙහෙයවීම අධීක්ෂණය සහ සමාලෝචනය සාමාන්‍යයෙන් වෙනත් ස්වභාවයක වන අතර එය වැඩවල කාර්ය භාරයේ නියුක්ත කණ්ඩායමේ සාමාජිකයෝ ඉටු කරනවාට වඩා වැඩියෙන් පෘථුල වේ.

අ41. අභ්‍යන්තර විගණකවරු මෙහෙයවීමේ දී, බාහිර විගණක, උදාහරණ වශයෙන් විගණනය තුළ දී හඳුනාගත් ගිණුම්කරණ සහ විගණන ප්‍රශ්න බාහිර විගණකගේ අවධානයට යොමු කරන ලෙස අභ්‍යන්තර විගණකවරුන්ට මතක් කළ හැකිය. අභ්‍යන්තර විගණකවරු විසින් ඉටු කළ වැඩ සමාලෝචනය කිරීමේදී, බාහිර විගණකගේ සැලකිල්ලට ගැනීම්වල එම තත්ත්වයන් යටතේ ලබාගත් සාක්ෂි ප්‍රමාණවත් ද සහ යෝග්‍ය ද යන්න සහ සේන්දු වූ නිගමනවලට එය සහාය වන්නේ ද යන්න ඇතුළත් වේ.

## ශ්‍රී ලංකා විගණන ප්‍රමිත 700 (සංශෝධිත)
## මූල්‍ය ප්‍රකාශ මත මතය සකස් කිරීම සහ වාර්තාකරණය

(2018 මාර්තු 31 දින හෝ ඉන් පසුව අවසන්වන කාලපරිච්ඡේද සඳහාවන මූල්‍ය ප්‍රකාශ විගණන සඳහා බලපැවැත්වේ.)

### පටුන

| | ඡේද |
|---|---|
| **හැඳින්වීම** | |
| මෙම ශ්‍රී ලංකා විගණන ප්‍රමිතියෙහි විෂය පථය (ශ්‍රී.ල.වි.ප්‍ර.) | 1-4 |
| බලපැවැත්වෙන දිනය | 5 |
| **අරමුණු** | 6 |
| **නිර්වචන** | 7-9 |
| **අවශ්‍යතා** | |
| මූල්‍ය ප්‍රකාශ මත මතය සකස් කිරීම | 10-15 |
| මතයේ ස්වරූපය | 16-19 |
| විගණකගේ වාර්තාව | 20-52 |
| මූල්‍ය ප්‍රකාශ සමග ඉදිරිපත් කරනු ලබන පරිපූරක තොරතුරු | 53 |

භාවිත කිරීමේ හා පැහැදිලි කිරීමේ වෙනත් කරුණු

| | |
|---|---|
| අස්තිත්ත්වයේ ගිණුම්කරණ පරිචයන්හි ගුණාත්මක අංග | අ1 - අ3 |
| මූල්‍ය ප්‍රකාශ තුළ ගිණුම්කරණ ප්‍රතිපත්ති යෝග්‍ය ලෙස හෙළිදරව් කිරීම | අ4 |
| මූල්‍ය ප්‍රකාශ තුළ ඉදිරිපත් කර ඇති තොරතුරු අදාළ ද, විශ්වාසදායක ද, සැසඳිය හැකි ද, සහ අවබෝධකරගත හැකි ද | අ5 |
| මූල්‍ය ප්‍රකාශ තුළ පළකරන ලද තොරතුරු මත ප්‍රමාණාත්මක ගණුදෙනු සහ සිද්ධීන් හෙළිදරව් කිරීම | අ6 |
| මූල්‍ය ප්‍රකාශ සාධාරණ ඉදරිපත් කිරීම අත්කරගෙන ඇත් ද යන්න අගය කිරීම | අ7 - A9 |
| අදාළ මූල්‍ය වාර්තා කරන ආකෘතිමය රාමුවේ විස්තරය | අ10 - අ15 |
| මතයේ ස්වරූපය | අ16 - අ17 |
| විගණකගේ වාර්තාව | අ18 - අ77 |
| මූල්‍ය ප්‍රකාශ සමග ඉදිරිපත් කරනු ලබන පරිපූරක තොරතුරු | අ78 - අ84 |
| පරිශිෂ්ඨය : මූල්‍ය ප්‍රකාශමත ස්වාධින විගණකගේ වාර්තාවන්හි නිදර්ශන | |


ශ්‍රී ලංකා විගණන ප්‍රමිති (ශ්‍රී.ල.වි.ප්‍ර.) 700 සංශෝධිත, *මූල්‍ය ප්‍රකාශ මත මතයක් සකස් කිරීම සහ වාර්තාකරණය* කියවිය යුත්තේ ශ්‍රී.ල.වි.ප්‍ර. 200, *ස්වාධීන විගණකගේ සමස්ථ අරමුණු සහ ශ්‍රී ලංකා විගණන ප්‍රමිත ප්‍රකාරව විගණනයක් මෙහෙයවීම එක් කිරීමෙනි.*

## හැඳින්වීම

### මෙම ශ්‍රී.ල.වි.ප්‍ර. යේ විෂය පථය

1. මෙම ශ්‍රී ලංකා විගණන ප්‍රමිතය (ශ්‍රී.ල.වි.ප්‍ර.) කටයුතු කරන්නේ මූල්‍ය ප්‍රකාශමත මතය සකස් කිරීමට විගණකගේ වගකීම හා සම්බන්ධවය. එලෙසම මූල්‍ය ප්‍රකාශ විගණනය කිරීමේ ප්‍රතිඵලයක් වශයෙන් නිකුත් කරනු ලබන විගණකගේ වාර්තාවේ ස්වරූපය සහ අන්තර්ගතය පිළිබඳව මෙම ශ්‍රී.ල.වි.ප්‍ර. කටයුතු කරයි.

2. විගණකගේ වාර්තාව තුළ ප්‍රධාන විගණන කරුණු සන්නිවේදනය කිරීමේ වගකීම පිළිබඳව ශ්‍රී.ල.වි.ප්‍ර. 701[1] කටයුතු කරයි. විගණකගේ වාර්තාවේ විගණක විකරණය කළ මතය ප්‍රකාශ කරන හෝ කරුණ අවධාරණය කිරීමේ ඡේදය හෝ වෙනත් කරුණ ඡේදය ඇතුළත් වන විගණකගේ වාර්තාවේ ස්වරූපය සහ අන්තර්ගතයට බලපාන්නේ කෙසේද යන්න පිළිබඳව ශ්‍රී.ල.වි.ප්‍ර. 705[2] (සංශෝධිත) සහ ශ්‍රී.ල.වි.ප්‍ර. 706 (සංශෝධිත)[3] කටයුතු කරයි. විගණකගේ වාර්තාව නිකුත් කරන විට අදාලවන වාර්තාකරණ අවශ්‍යතාවයන් වෙනත් ශ්‍රී.ල.වි.ප්‍ර. වල ද අඩංගු වේ.

3. මෙම ශ්‍රී.ල.වි.ප්‍ර. ය පොදු අරමුණු මූල්‍ය ප්‍රකාශ සම්පූර්ණ කට්ටලයක විගණනයට ව්‍යවහාර වන අතර ලියා ඇත්තේ එම සම්බන්ධය ඇතිවය. විශේෂ අරමුණු ආකෘතිමය රාමුවක් සමග අනුකූලව මූල්‍ය ප්‍රකාශ පිළියෙල කර ඇති විටක විශේෂ සළකා බැලීම් පිළිබඳව ශ්‍රී.ල.වි.ප්‍ර. 800 (සංශෝධිත)[4] කටයුතු කෙරේ. තනි මූල්‍ය ප්‍රකාශයක හෝ මූල්‍ය ප්‍රකාශයක විශේෂිත මූලිකාංගයක්, ගිණුමක් හෝ අයිතමයක් විගණනයට අදාළ විශේෂ සළකා බැලීම් සමග ශ්‍රී.ල.වි.ප්‍ර. 805 (සංශෝධිත)[5] කටයුතු කෙරේ. මෙම ශ්‍රී.ල.වි.ප්‍ර. ය, ශ්‍රී.ල.වි.ප්‍ර. 800 (සංශෝධිත) හෝ ශ්‍රී.ල.වි.ප්‍ර. 805 (සංශෝධිත) ව්‍යවහාර වන විගණන සඳහා ද එලෙසම අදාළ වේ.

---

[1] ශ්‍රී.ල.වි.ප්‍ර. 701, *ස්වාධීන විගණකගේ වාර්තාවේ ප්‍රධාන විගණන කරුණු සන්නිවේදනය කිරීම.*

[2] ශ්‍රී.ල.වි.ප්‍ර. 705 (සංශෝධිත), *ස්වාධින විගණකගේ වාර්තාවේ මතයට විකරණය කිරීම.*

[3] ශ්‍රී.ල.වි.ප්‍ර. 706 (සංශෝධිත), *ස්වාධින විගණකගේ වාර්තාවේ කරුණ අවධාරණය කිරීමේ ඡේද සහ වෙනත් කරුණ ඡේද.*

[4] ශ්‍රී.ල.වි.ප්‍ර. 800 (සංශෝධිත), *විශේෂ සළකා බැලීම්, - විශේෂ අරමුණු ආකෘතිමය රාමු සමග අනුකූලව පිළියෙල කළ මූල්‍ය ප්‍රකාශ විගණනය*

[5] ශ්‍රී.ල.වි.ප්‍ර. 805 (සංශෝධිත), *විශේෂ සළකා බැලීම් - තනි මූල්‍ය ප්‍රකාශ සහ මූල්‍ය ප්‍රකාශයක නිශ්චිත මූලිකාංග, ගිණුම් හෝ අයිතම විගණනය.*

4. මෙම ශ්‍රී.ල.වි.ප්‍ර. යේ අවශ්‍යතාවය වන්නේ, ලෝක ව්‍යාප්තව විගණක වාර්තා කිරීම තුළ සංගතභාවය සහ සැසඳිය හැකි බව අතර යෝග්‍ය සංතුලනයක අවශ්‍යතාවය සඳහා සහ විගණකගේ වාර්තාව තුළ ලබාදෙන තොරතුරු පරිශීලකයන්ට වඩා අදාළ කිරීම මගින් විගණක වාර්තා කිරීම තුළ වටිනාකම වැඩි කිරීමේ අවශ්‍යතාවය ආමන්ත්‍රණය කිරීම ඉලක්ක කර ගැනීමය. මෙම ශ්‍රී.ල.වි.ප්‍ර. යේ විගණකගේ වාර්තාව තුළ සංගතභාවය ප්‍රවර්ධනය කරයි. එහෙත් එක් එක් අධිකරණ බල ප්‍රදේශයන්හි දී විශේෂිත අවශ්‍යතාවයනට වන නම්‍යශීලීතාවය සඳහා ඉඩසළසයි. ශ්‍රී.ල.වි.ප්‍ර. ප්‍රමිති සමග අනුකූලව විගණනයක් මෙහෙයවා ඇතිවිටක විගණකගේ වාර්තාවේ සංගතභාවය, ලෝක ව්‍යාප්තව පිළිගත් ප්‍රමිති සමග අනුකූලව මෙහෙයවන ලද එම විගණන වඩාත් කරදරයක් නොමැතිව හඳුනා ගැනීමට සැලැස්වීම මඟින් ලෝක ව්‍යාප්ත වෙළඳපොළ තුළ ප්‍රවර්ධනය කෙරේ. එය එලෙසම පරිශීලකයන්ගේ අවබෝධය ප්‍රවර්ධනය කිරීමට අසාමාන්‍ය තත්ත්වයන් ඒවා සිදුවීම හඳුනා ගැනීමට උපකාරී වේ.

### බලපැවැත්වෙන දිනය.

5. මෙම ශ්‍රී.ල.වි.ප්‍ර. ය 2018 මාර්තු 31 දින හෝ ඉන් පසුව අවසන්වන කාලපරිච්ඡේදවල මූල්‍ය ප්‍රකාශ විගණනය සඳහා බලපැවැත්වේ.

### අරමුණු

6. විගණකගේ අරමුණු වන්නේ;

(අ) ලබාගත් විගණන සාක්ෂිවලින් අත්කරගත් නිගමන අගය කිරීම සඳහා පදනම්ව මූල්‍ය ප්‍රකාශ මත, මතය ප්‍රකාශ කිරීම; සහ

(ආ) එම මතය ලිඛිත වාර්තාවක් තුළින් පැහැදිලිව ප්‍රකාශ කිරීම;

### නිර්වචන

7. මෙම ශ්‍රී.ල.වි.ප්‍ර. යේ අරමුණු සඳහා පහත දැක්වෙන පදවලට ආරෝපණය කළ තේරුම් පහත දැක්වේ;

(අ) පොදු අරමුණු මූල්‍ය ප්‍රකාශ - පොදු අරමුණු ආකෘතිමය රාමුවට අනුකූලව පිළියෙළ කළ මූල්‍ය ප්‍රකාශ.

(ආ) පොදු අරමුණු ආකෘතිමය රාමුව - පුළුල් පරාසයක පරිශීලකයන්ගේ පොදු මූල්‍ය තොරතුරු අවශ්‍යතාවයන් ඉෂ්ඨ කර ගැනීමට සැළසුම් කළ මූල්‍ය වාර්තාකරණ ආකෘතිමය රාමුවකි. මූල්‍ය වාර්තාකරණ ආකෘතිමය රාමුව සාධාරණ ඉදිරිපත් කිරීමේ ආකෘතිමය රාමුවක් හෝ අනුකූලතා ආකෘතිමය රාමුවක් විය හැකිය.

"සාධාරණ ඉදිරිපත් කිරීමේ අකෘතිමය රාමුව" යන පදය භාවිත කරන්නේ අකෘතිමය රාමුවේ අවශ්‍යතා සමග අනුකූලවීම අවශ්‍ය කරන මූල්‍ය වාර්තාකරණ ආකෘතිමය රාමුව හැඳින්වීමට සහ;

(i) මූල්‍ය ප්‍රකාශවල සාධාරණ ඉදිරිපත් කිරීම අත්කර ගැනීමට, ආකෘතිමය රාමුව මඟින් විශේෂිතව අවශ්‍යකරන දැට වඩා හෙළිදරව් කිරීම් ලබාදීමට කළමනාකාරීත්වයට අවශ්‍ය විය හැකි බව ඉතා පැහැදිලිව හෝ ව්‍යංගව පිළිගැනීම; හෝ

(ii) මූල්‍ය ප්‍රකාශවල සාධාරණ ඉදිරිපත් කිරීම අත්කර ගැනීමට ආකෘතිමය රාමුවේ අවශ්‍යතාවයන්ගෙන් බැහැරවීමට කළමනාකාරීත්වය සඳහා අවශ්‍ය විය හැකි බව ඉතා පැහැදිලිව පිළිගැනීම. එවැනි බැහැරවීම් අවශ්‍යයි අපේක්‍ෂා කරන්නේ ඉතා විරල තත්ත්වයන්හි දී පමණි.

"අනුකූලතා ආකෘතිමය රාමුව" යන පදය භාවිත කරන්නේ ආකෘතිමය රාමුවේ අවශ්‍යතා සමග අනුකූලව අවශ්‍යතා මූල්‍ය වාර්තාකරණ ආකෘතිමය රාමුව එහෙත් එහි ඉහත (i) හෝ (ii) හි[6] ඇති පිළිගැනීම අඩංගු නොවන ආකෘතිමය රාමු හැඳින්වීමටය.

(ඇ) විකරණය නොකළ මතය අදාළ මූල්‍ය වාර්තාකරණ ආකෘතිමය රාමුව සමග අනුකූලව සියලුම ප්‍රමාණාත්මක අංගයන්ගෙන් මූල්‍ය ප්‍රකාශ පිළියෙල කර ඇති ලෙස විගණක නිගමනය කරන විට විගණක විසින් ප්‍රකාශ කරන මතය.[7]

---

[6] ශ්‍රී.ල.වි.ප්‍ර. 200, *ස්වාධීන විගණකගේ සමස්ථ අරමුණු සහ ශ්‍රී ලංකා විගණන ප්‍රමිත ප්‍රකාරව විගණනයක් මෙහෙයවීම,* 13 (අ) ඡේදය.

[7] පිළිවෙලින් සාධාරණ ඉදිරිපත් කිරීමේ ආකෘතිමය රාමුවක් සහ අනුකූලතා ආකෘතිමය රාමුවක් සම්බන්ධයෙන් වූ අවස්ථාවක මෙම මතය ප්‍රකාශ කිරීමට භාවිත කරන වැකිකඩ සමග 25 - 26 ඡේද කටයුතු කෙරේ.

8. මෙම ශ්‍රී.ල.වි.ප්‍ර. යේ මූල්‍ය ප්‍රකාශවලට "යොමු කිරීම යන්නෙන් අදහස් කරන්නේ" පොදු අරමුණු මූල්‍ය ප්‍රකාශවල සම්පූර්ණ කට්ටලයකි.[8] මූල්‍ය ප්‍රකාශවල ඉදිරිපත් කිරීමට ව්‍යුහය සහ සම්පූර්ණ මූල්‍ය ප්‍රකාශ කට්ටලයක් කුමකින් සමන්විත යුතුද යන්න අදාළ මූල්‍ය වාර්තාකරණ ආකෘතිමය රාමුවේ අවශ්‍යතාවයන් නිර්ණය කරයි.

9. මෙම ශ්‍රී.ල.වි.ප්‍ර. යේ "ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතවලට" යොමු කිරීම යන්නෙන් අදහස් කරන්නේ ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනය විසින් නිකුත් කර ඇති ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට සහ "ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිති" වලට යොමු කිරීම යන්නෙන් අදහස් කරන්නේ ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනය විසින් නිකුත් කර ඇති ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලටය.

## අවශ්‍යතාවයන්

### මූල්‍ය ප්‍රකාශ මත මතය සකස් කිරීම

10. අදාළ මූල්‍ය වාර්තාකරණ ආකෘතිමය රාමුව[9],[10] සමඟ අනුකූලව සියලුම ප්‍රමාණාත්මක අංගයන්ගෙන් යුත් මූල්‍ය ප්‍රකාශ පිළියෙළ කර ඇත්ද යන්න තුළ විගණක මතය සකස්කළ යුතුය.

11. එම මතය සකස් කිරීමට වංචා හෝ වැරදි නිසා හෝ මූල්‍ය ප්‍රකාශ සමස්ථයක් වශයෙන් ප්‍රමාණාත්මක අවප්‍රකාශයකින් තොරද යන කරුණ පිළිබඳව සාධාරණ සහතිකවීමක් විගණක ලබා ගෙන තිබේද යන්න විගණක නිගමනය කළ යුතුය. එම නිගමනයට පහත දෑ සැළකිල්ලට ගත යුතුය.

(අ) ශ්‍රී.ල.වි.ප්‍ර. 330, සමඟ අනුකූලව ප්‍රමාණවත් යෝග්‍ය විගණන සාක්ෂි ලබාගෙන ඇත්ද යන විගණකගේ නිගමනය;[11]

(ආ) ශ්‍රී.ල.වි.ප්‍ර. 450 සමඟ අනුකූලව නිවැරදි නොකළ අවප්‍රකාශ තනි තනිව හෝ සමාහාරයක් ලෙස ගත්කළ ප්‍රමාණාත්මකද යන්න පිළිබඳව විගණකගේ නිගමනය;[12] සහ

(ඇ) 12 - 15 ඡේද මගින් අවශ්‍ය කරන අගය කිරීම.

12. අදාළ මූල්‍ය වාර්තාකරණ ආකෘතිමය රාමුවේ අවශ්‍යතාවයන් සමඟ අනුකූලව සියලු ප්‍රමාණාත්මක අංගයන්ගෙන් යුක්ත මූල්‍ය ප්‍රකාශ පිළියෙල කර තිබේදැයි විගණක අගය කළ යුතුය. මෙම අගය කිරීමට, කළමනාකාරීත්වය විය හැකි පක්ෂග්‍රාහී විනිශ්චයන්ගෙන් සුචක ඇතුළත්ව අස්තිත්ත්වයේ ගිණුම්කරණ පරිචයන්ගේ ගුණාත්මක අංග සැළකිල්ලට ගැනීම ඇතුළත්විය යුතුය. (යොමුවඃ අ1 - අ3 ඡේද)

13. විශේෂයෙන්ම අදාළ මූල්‍ය වාර්තා කරන ආකෘතිමය රාමුවේ අවශ්‍යතාවයන් සැළකිල්ලට ගැනීමේදී විගණක විසින් පහත දෑ වන්නේ දැයි අගය කළ යුතුය;

(අ) තෝරාගත් සහ ව්‍යවහාර කළ වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති මූල්‍ය ප්‍රකාශයන්හි යෝග්‍ය ලෙස හෙළිදරව් කිරීම. මෙම අගය කිරීම සිදු කිරීමේදී ගිණුම්කරණ ප්‍රතිපත්තිවල අස්තිත්ත්වයට ඇති අදාළත්වය සහ ඒවා තේරුම් ගතහැකි ආකාරයට ඉදිරිපත් කර ඇත්ද යන්න විගණක විසින් සැළකිල්ලට ගත යුතුය. (යොමුවඃ අ 4 ඡේදය)

(ආ) තෝරාගත් සහ ව්‍යවහාර කළ ගිණුම්කරණ ප්‍රතිපත්ති අදාළ මූල්‍ය වාර්තාකරණ ආකෘතිමය රාමුව සමඟ සංගත සහ යෝග්‍ය බව.

(ඇ) කළමනාකාරීත්වය සිදුකළ ගිණුම්කරණ ඇස්තමේන්තු සාධාරණ බව;

(ඈ) මූල්‍ය ප්‍රකාශවල ඉදිරිපත් කර ඇති තොරතුරු, අදාළ, විශ්වාසදායක සැසඳිය හැකි සහ අවබෝධකරගත හැකි වීම. මෙම ඇගයීම සිදු කිරීමේ දී විගණක විසින් පහත දෑ වන්නේද යන්න සැළකිල්ලට ගත යුතුය;

---

[8] ශ්‍රී.ල.වි.ප්‍ර. 200, 13(ඒ) ඡේදය, මූල්‍ය ප්‍රකාශවල අන්තර්ගතය නියම කරයි.

[9] ශ්‍රී.ල.වි.ප්‍ර. 200, 11 වන ඡේදය

[10] පිළිවෙලින් සාධාරණ ඉදිරිපත් කිරීම් ආකෘතිමය රාමුවක් සහ අනුකූලතා ආකෘතිමය රාමුවක් සම්බන්ධයෙන් වූ අවස්ථාවක මෙම මතය ප්‍රකාශ කිරීමට භාවිත කරන වැකිකඩ සමඟ 25 - 26 ඡේද කටයුතු කරේ.

[11] ශ්‍රී.ල.වි.ප්‍ර. 330, *තක්සේරු කළ අවදානම් වලට විගණකගේ ප්‍රතිචාර,* 26 වන ඡේදය

[12] ශ්‍රී.ල.වි.ප්‍ර. 450, *විගණනය තුළදී හඳුනා ගත් අවප්‍රකාශ ඇගයීම,* 11 වන ඡේදය

- ඇතුළත් කළ යුතුව තිබූ තොරතුරු ඇතුළත් කර තිබීම සහ එවැනි තොරතුරු යෝග්‍ය පරිදි වර්ගීකරණය, සමාහරණය කර තිබීම හෝ කොටස් වලට විසුරුවා හැර තිබීම, සහ ස්වභාවය නිරූපණය කර තිබීම.
- අදාළ නොවන හෝ හෙළිදරව් කළ කරුණු නිසි ලෙස අවබෝධ කර ගැනීම අපැහැදිලි කරන තොරතුරු ඇතුළත් කිරීම මගින් මූල්‍ය ප්‍රකාශයන්හි සමස්ථ ඉදිරිපත් කිරීම පිළිගැනීමට රහසින් හානිකර තිබීම. (යොමුවː අ5 ඡේදය)

(ඉ) මූල්‍ය ප්‍රකාශ වලින් දන්වන තොරතුරු මත ප්‍රමාණාත්මක ගණුදෙනු සහ සිද්ධීන් හි බලපෑම අපේක්ෂා කරන පරිශීලකයනට අවබෝධ කරගැනීමට පහසුවීමට මූල්‍ය ප්‍රකාශ ප්‍රමාණවත් හෙළිදරව් කිරීම් ලබාදීම සහ (යොමුවː අ 6 ඡේදය)

(ඊ) සෑම මූල්‍ය ප්‍රකාශයකම සිරස් තලය ඇතුළුව මූල්‍ය ප්‍රකාශවල භාවිත කළ පාරිභාෂික ශබ්ද සංග්‍රහය යෝග්‍යවීම.

14. සාධාරණ ඉදිරිපත් කිරීමේ ආකෘතිමය රාමුව සමඟ අනුකූලව මූල්‍ය ප්‍රකාශ පිළියෙල කරන විට 12 - 13 ඡේදවලින් අවශ්‍ය කරන ඇගයීමට මූල්‍ය ප්‍රකාශ සාධාරණ ඉදිරිපත් කිරීම අත්කර ගෙන තිබේද යන්නද එසේම ඇතුළත්විය යුතුය. මූල්‍ය ප්‍රකාශ සාධාරණ ඉදිරිපත් කිරීම අත්කරගෙන තිබේද යන්න පිළිබඳ විගණකගේ ඇගයීමට පහත දෑ සැළකිල්ලට ගැනීම ඇතුළත් විය යුතුය. (යොමුː අ7 - අ9 ඡේද)

(අ) මූල්‍ය ප්‍රකාශවල සමස්ථ ඉදිරිපත් කිරීම, ව්‍යුහය සහ අන්තර්ගතය; සහ

(ආ) පාදකවන ගණුදෙනු සහ සිද්ධීන් සාධාරණ ඉදිරිපත් කිරීම අත්කර ගැනීමේ ආකාරයට මූල්‍ය ප්‍රකාශවල නියෝජනය වන්නේ ද,

15. මූල්‍ය ප්‍රකාශ අදාළ මූල්‍ය වාර්තාකරණ ආකෘතිමය රාමුවට ප්‍රමාණවත් ලෙස යොමු කෙරේද හෝ විස්තර කරයිද යන්න විගණක ඇගයිය යුතුය. (යොමුවː අ10 සහ අ15 ඡේද)

**මතයේ ස්වරූපය**

16. අදාළ මූල්‍ය වාර්තාකරණ ආකෘතිමය රාමුව සමඟ අනුකූලව සියලු ප්‍රමාණාත්මක අංගයන්ගෙන් මූල්‍ය ප්‍රකාශ පිළියෙල කර ඇතැයි විගණක නිගමනය කළවිට විගණක විකරණය නොකළ මතයක් ප්‍රකාශ කළ යුතුය.

17. විගණක විසින් (අ) ලබාගත් විගණන සාක්ෂි පදනම මත, සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශ ප්‍රමාණාත්මක අවප්‍රකාශ වලින් තොර නොවන බව නිගමනය කරන්නේ නම්; හෝ

(ආ) මූල්‍ය ප්‍රකාශ සමස්ථයක් වශයෙන් ගත්කළ ප්‍රමාණාත්මක අවප්‍රකාශවලින් තොරයයි නිගමනය කිරීමට ප්‍රමාණාත්මක යෝග්‍ය විගණන සාක්ෂි ලබාගැනීමට අපොහොසත්වීම ශ්‍රී.ල.වි.ප්‍ර. 705 (සංශෝධිත) සමඟ අනුකූලව විගණකගේ වාර්තාව තුළ මතය විගණක විකරණය කළ යුතුය.

18. සාධාරණ ඉදිරිපත් කිරීමේ ආකෘතිමය රාමුවක අවශ්‍යතාවයන් සමඟ අනුකූලව මූල්‍ය ප්‍රකාශ පිළියෙල කර ඇති අවස්ථාවක සාධාරණ ඉදිරිපත් කර ගැනීම මුදුන්පත් වන්නේ නැත්නම්, එම කරුණ, විගණක කළමනාකාරීත්වය සමඟ සාකච්ඡා කළ යුතු අතර, අදාළ මූල්‍ය වාර්තාකරණ ආකෘතිමය රාමුවේ අවශ්‍යතාවයන් සහ කරුණ විසඳන්නේ කෙසේ ද යන්න, පදනම මත ශ්‍රී.ල.වි.ප්‍ර. 705 (සංශෝධිත) සමඟ අනුකූලව විගණකගේ වාර්තාව තුළ මතය විකරණය කිරීම අවශ්‍ය ද යන්න නිර්ණය කළ යුතුය. (යොමුවː අ16 ඡේදය)

19. අනුකූලතා ආකෘතිමය රාමුවක් සමඟ අනුකූලව මූල්‍ය ප්‍රකාශ පිළියෙල කර ඇති විටක මූල්‍ය ප්‍රකාශ සාධාරණ ඉදිරිපත් කිරීම මුදුන් පත් කර ඇත්දැයි යන්න විගණක අගය කිරීම අවශ්‍ය නොකෙරේ. කෙසේ වෙතත් අතිශය විරල තත්ත්වයන්හිදී එවැනි මූල්‍ය ප්‍රකාශ නොමඟ යවන සුලු යයි විගණක නිගමනය කරන්නේ නම්, එම කරුණ විගණක කළමනාකාරීත්වය සමඟ සාකච්ඡා කළ යුතුය, සහ එය විසඳන්නේ කෙසේද යන්න මත රඳා පවතිමින්, එය විගණකගේ වාර්තාවේ සන්නිවේදනය කළ යුතු ද සහ කෙසේ සන්නිවේදනය කළ යුතුද යන්න නිරීක්ෂණය කළ යුතුය. (යොමුවː අ17 ඡේදය)

**විගණකගේ වාර්තාව**

20. විගණකගේ වාර්තාව ලිඛිතව විය යුතුය. (යොමුවː අ18 - අ19 ඡේද)

**ශ්‍රී ලංකා විගණන ප්‍රමිත සමඟ අනුකූලව මෙහෙයවන ලද විගණන සඳහා විගණකගේ වාර්තාව**

මාතෘකාව

21. විගණකගේ වාර්තාවේ එය ස්වාධීන විගණකගේ වාර්තාව ලෙස පැහැදිලිව සඳහන් වන මාතෘකාවක් තිබිය යුතුය. (යොමුවඃ අ20 ඡේදය)

ඇමතුම ලබන්නා

22. කාර්යභාරයේ තත්ත්වයන් මත පදනම්ව යෝග්‍ය පරිදි විගණකගේ වාර්තාව ඇමතුම් ලබන්නා ඇමතිය යුතුය. (යොමුවඃ අ21 ඡේදය)

විගණකගේ මතය

23. විගණකගේ වාර්තාවේ ප්‍රථම කොටසේ විගණකගේ මතය ඇතුළත් කළ යුතු අතර "මතය" ලෙස ශීර්ෂයක් තිබිය යුතුය.

24. විගණකගේ වාර්තාවේ මතය කොටසේ එලෙසම;
   (අ) කාහට අයත් අස්තිත්ත්වයේ මූල්‍ය ප්‍රකාශ විගණනය කර ඇත්ද හඳුනා ගැනීම;
   (ආ) මූල්‍ය ප්‍රකාශ විගණනය කර ඇති බව සඳහන් කිරීම;
   (ඇ) මූල්‍ය ප්‍රකාශ සමන්විත වන සෑම ප්‍රකාශයකටම මාතෘකාව හඳුනා ගැනීම;
   (ඈ) වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවල සාරාංශයක් ඇතුළුව, සටහන් වලට යොමු කිරීම; සහ
   (ඉ) මූල්‍ය ප්‍රකාශ සමන්විත වන සෑම මූල්‍ය ප්‍රකාශයකම දිනය හෝ ආවරණය වන කාලපරිච්ඡේදය පැහැදිලිව සඳහන් කිරීම. (යොමුවඃ අ22 - අ23 ඡේද)

25. සාධාරණ ඉදිරිපත් කිරීමේ ආකෘතිමය රාමුවක් සමඟ අනුකූලව පිළියෙල කළ මූල්‍ය ප්‍රකාශ මත විකරණය නොකළ මතයක් ප්‍රකාශ කරන විට, නීතිය හෝ රෙගුලාසි මගින් අන් අයුරකින් අවශ්‍ය කරන්නේ නම් මිස, පහත සඳහන් වැකිකඩ වලින් එකක් විගණකගේ මතයේ භාවිතා කළ යුතුය. ඒවා එක සමාන ලෙස සලකනු ලැබේ;

   (අ) [අදාළ මූල්‍ය වාර්තාකරණ ආකෘතිමය රාමුව] සමඟ අනුකූලව මේ සමඟ ඇති මූල්‍ය ප්‍රකාශය සියලුම ප්‍රමාණාත්මක අංගයන්ගෙන් [....] සාධාරණව ඉදිරිපත් කර ඇති බව අපගේ මතය වේ. හෝ

   (ආ) [අදාළ මූල්‍ය වාර්තාකරණ ආකෘතිමය රාමුව] සමඟ අනුකූලව මේ සමඟ ඇති මූල්‍ය ප්‍රකාශ සත්‍ය හා සාධාරණ දර්ශනයන් [...] ගෙනදෙන බව අපගේ මතය වේ. (යොමුවඃ අ24- අ31 ඡේද)

26. අනුකූලතා ආකෘතිමය රාමුවක් සමඟ අනුකූලව පිළියෙල කළ මූල්‍ය ප්‍රකාශ මත විකරණය නොකළ මතයක් ප්‍රකාශ කරන විට, විගණකගේ මතය වියයුත්තේ, මේ සමඟ ඇති මූල්‍ය ප්‍රකාශ පිළියෙල කර ඇත්තේ සියලු ප්‍රමාණාත්මක අංගයන් [අදාළ මූල්‍ය වාර්තා කරන ආකෘතිමය රාමුව] සමඟ අනුකූලවය. (යොමුවඃ අ26 හා අ31 ඡේද)

27. විගණකගේ මතය තුළ අදාළ මූල්‍ය වාර්තාකරණ ආකෘතිමය රාමුව වන යොමු ගත කිරීම ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනය විසින් නිකුත් කළ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතවලට හෝ ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනය විසින් නිකුත් කළ ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිත වලට නොවේ නම්, විගණකගේ මතයේ ආකෘතිමය රාමුවේ සම්භවය වන අධිකරණ බලප්‍රදේශය හඳුනා ගත යුතුය.

මතය සඳහා පදනම

28. විගණකගේ වාර්තාවේ මතය දක්වෙන ඡේදයට වහාම පසුව "මතය සඳහා පදනම" යන ශීර්ෂය සහිතව ඡේදයක් ඇතුළත් කළ යුතුය. එය (යොමුවඃ අ32 ඡේදය)

   (අ) ශ්‍රී ලංකා විගණන ප්‍රමිත සමඟ අනුකූලව එම විගණනය මෙහෙය වූ බව සඳහන් කෙරේ. (යොමුවඃ අ 33 ඡේදය)

   (ආ) ශ්‍රී.ල.වි.ප්‍ර. යටතේ විගණකගේ වගකීම් විස්තර කෙරෙන විගණකගේ වාර්තාවේ ඡේදයට යොමු ගත කෙරේ.

   (ඇ) විගණනයට සම්බන්ධිත අදාළ ආචාර ධර්මීය අවශ්‍යතාවයන් සමඟ අනුකූලව විගණක අස්තිත්ත්වයෙන් ස්වාධීන වනබව සහ මෙම අවශ්‍යතාවයන් සමඟ අනුකූලව විගණකගේ වෙනත් ආචාර ධර්මීය වගකීම් සම්පූර්ණ කර ඇති බවට ප්‍රකාශයක් ඇතුළත් කෙරේ. මෙම ප්‍රකාශය අදාළ ආචාර ධර්මීය අවශ්‍යතාවන්හි සම්භවයේ අධිකරණ බල ප්‍රදේශය හඳුනාගත යුතු හෝ වෘත්තිය ගණකාධිකාරීවරුන් සඳහා ආචාර ධර්ම සංග්‍රහයට යොමුගත කළ යුතුය. (ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනයේ ධර්ම සංග්‍රහය); සහ (යොමුවඃ අ34 - අ39 ඡේද)

(ඇ) විගණක ලබාගත් විගණන සාක්ෂි විගණකගේ මතය සඳහා පදනම ලබාදීමට ප්‍රමාණවත් සහ යෝග්‍ය බවට විගණක විශ්වාස කරන්නේද යන්න සඳහන් කිරීම.

අඛණ්ඩ පැවැත්ම

29. අදාලවන පරිදි විගණක ශ්‍රී.ල.වි.ප්‍ර. 570 (සංශෝධිත)[13] සමඟ අනුකූලව විගණක වාර්තා කළ යුතුය.

ප්‍රධාන විගණන කරුණු

30. ලැයිස්තුගත අස්තිත්ත්වයන්හි පොදු අරමුණු මූල්‍ය ප්‍රකාශ සම්පූර්ණ කට්ටලයක විගණන සඳහා, ශ්‍රී.ල.වි.ප්‍ර. 701 සමඟ අනුකූලව විගණකගේ වාර්තාව තුළ ප්‍රධාන විගණන කරුණු විගණක සන්නිවේදනය කළ යුතුය.

31. විගණකට අන්අයුරකින් නීතිය හෝ රෙගුලාසි මඟින් අවශ්‍ය කරන්නේ නම් හෝ විගණකගේ වාර්තාවේ ප්‍රධාන විගණන කරුණු සන්නිවේදනය කිරීමට තීරණය කර ඇති විට විගණක එය ශ්‍රී.ල.වි.ප්‍ර. 701 සමඟ අනුකූලව එසේ සිදු කළ යුතුය. (යොමුවඃ අ40 - අ42 ඡේද)

වෙනත් තොරතුරු

32. අදාලවන පරිදි විගණක ශ්‍රී.ල.වි.ප්‍ර. 720 (සංශෝධිත)[14] සමඟ අනුකූලව වාර්තා කළ යුතුය.

මූල්‍ය ප්‍රකාශ සඳහා වගකීම්

33. "මූල්‍ය ප්‍රකාශ සඳහා කළමනාකාරීත්වයේ වගකීම්" යන ශීර්ෂයක් සහිතව ඡේදයක් විගණකගේ වාර්තාවේ ඇතුළත් කළ යුතුය. විශේෂිත වූ අධිකරණ බලප්‍රදේශයක් තුළ නෛතික ආකෘතිමය රාමුව සම්බන්ධයෙන් යෝග්‍ය පදයක් විගණකගේ වාර්තාවේ භාවිත කළ යුතු අතර විශේෂිතව "කළමනාකාරීත්වය" යන පදයට යොමු ගත කිරීම අවශ්‍ය නොවේ. සමහර අධිකරණ බලප්‍රදේශ තුළ යෝග්‍ය යොමු ගත කිරීම විය හැක්කේ පාලනය පිළිබඳව වගකිව යුතු අය ලෙසය. (යොමුවඃ අ44 ඡේදය)

34. විගණකගේ වාර්තාවේ මෙම ඡේදය කළමනාකාරීත්වයේ වගකීම් විස්තර කිරීම සඳහා විය යුතුය. (යොමුවඃ අ45 - අ48 ඡේද)

(අ) අදාළ මූල්‍ය වාර්තාකරණ ආකෘතිමය රාමුව සමඟ අනුකූලව මූල්‍ය ප්‍රකාශ පිළියෙල කිරීම සහ වංචා හෝ වැරදි නිසා වේවා, ප්‍රමාණාත්මක අවප්‍රකාශ වලින් තොර මූල්‍ය ප්‍රකාශ පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය යයි කළමනාකාරීත්වය විසින් නීර්ණය කරන එවැනි අභ්‍යන්තර පාලන සඳහා; සහ

(ආ) අඛණ්ඩ පැවැත්ම ලෙස නොකඩවා පවත්වාගෙන යාමේ අස්තිත්ත්වයේ හැකියාව[15] අඛණ්ඩව පැවැත්ම පදනම ගිණුම්කරණය භාවිතය මෙන්ම හෙළිදරව් කිරීම යෝග්‍ය ද යන්න අදාළ වන්නේ නම් අඛණ්ඩ පැවැත්මට සම්බන්ධිත කරුණු තක්සේරු කිරීම. මෙම තක්සේරුව සඳහා කළමනාකාරීත්වයේ වගකීම් පැහැදිලි කිරීමට අඛණ්ඩව පැවැත්ම පදනම ගිණුම්කරණය හා භාවිත කිරීම යෝග්‍ය වන්නේ කුමන අවස්ථාවේද යන්නෙහි විස්තරයක් ඇතුළත් විය යුතුය. (යොමුවඃ අ48 ඡේදය)

35. ඉහත 34 වන ඡේදය තුළ විස්තර කර ඇති වගකීම් ඉටුකරන අයගෙන් මූල්‍ය වාර්තා කිරීම අධීක්ෂණය කිරීම සඳහා වගකිවයුතු අයගෙන් වෙනස් වන විට, මූල්‍ය වාර්තා කිරීම අධීක්ෂණය කිරීමේ ක්‍රියාවලිය සඳහා වගකිවයුතු අය එලෙස විගණකගේ වාර්තාවේ මෙම කොටසෙන්, හඳුනා ගත යුතුය. මෙම අවස්ථාවේ එම කොටසේ ශීර්ෂය එසේම "පාලනය පිළිබඳ වගකිව යුතු අය" ලෙස හෝ විශේෂ අධිකරණ බල ප්‍රදේශයක් තුළ නෛතික ආකෘතිමය රාමුව සම්බන්ධයෙන් උචිත වැනි පදයක් සඳහා යොමු ගත කළ යුතුය. (යොමුවඃ අ49 ඡේදය)

36. සාධාරණ ඉදිරිපත් කිරීමේ ආකෘතිමය රාමුව සමඟ අනුකූලව මූල්‍ය ප්‍රකාශ පිළියෙල කරන විට විගණකගේ වාර්තාවේ මූල්‍ය ප්‍රකාශ පිළියෙල කිරීම සඳහා වගකීම විස්තර කිරීම යොමු ගත කළ යුත්තේ "මෙම මූල්‍ය වාර්තාවන්හි සාධාරණ ඉදිරිපත් කිරීම සහ පිළියෙල කිරීම" හෝ "සත්‍ය සහ සාධාරණ දර්ශනයක් පෙන්නුම් කරන මූල්‍ය ප්‍රකාශ පිළියෙල කිරීම" ලෙස අදාළ වන තත්ත්වයනට යෝග්‍ය වන පරිදිය.

---

[13] ශ්‍රී.ල.වි.ප්‍ර. 570 (සංශෝධිත), *අඛණ්ඩ පැවැත්ම* 21 - 23 ඡේද

[14] ශ්‍රී.ල.වි.ප්‍ර. 720 (සංශෝධිත), *වෙනත් තොරතුරු වලට සම්බන්ධිත විගණකගේ වගකීම්.*

[15] ශ්‍රී.ල.වි.ප්‍ර. 570 (සංශෝධිත), 2 වන ඡේදය

**මූල්‍ය ප්‍රකාශ පිළියෙල කිරීම සඳහා විගණකගේ වගකීම්**

37. විගණකගේ වාර්තාවේ "මූල්‍ය ප්‍රකාශ විගණනය කිරීම සඳහා විගණකගේ වගකීම්" යන ශීර්ෂයක් සහිත ඡේදය ඇතුළත් විය යුතුය;

38. විගණකගේ වාර්තාවේ මෙම ඡේදය විසින් (යොමුව: අ50 ඡේදය)

(අ) විගණකගේ අරමුණු වනුයේ:

(i) වංචා හෝ වැරදි නිසා හෝ වේවා මූල්‍ය ප්‍රකාශ සමස්ථයක් ලෙස ප්‍රමාණාත්මක අවප්‍රකාශ වලින් තොරද යන්න පිළිබඳ සාධාරණ සහතික වීමක් ලබා ගැනීම; සහ

(ii) විගණකගේ මතය ඇතුළත් විගණකගේ වාර්තාව නිකුත් කිරීම. (යොමුව: අ51 ඡේදය) ලෙස සඳහන් කිරීම.

(ආ) සාධාරණ සහතික වීම යනු ඉහළ මට්ටමේ සහතික වීමකි, එහෙත් ශ්‍රී.ල.වි.ප්‍ර. සමඟ අනුකූලව මෙහෙයවන විගණනයකින් ප්‍රමාණාත්මක අවප්‍රකාශයක් හැමවිටම එය අනාවරණය කර ගනු ලබන බවට සහතික වීමක් නොවන බව සඳහන් කිරීම; සහ

(ඇ) වංචා හෝ වැරදි වලින් අවප්‍රකාශ පැන නැගිය හැකි බව සඳහන් කිරීම සඳහා එක්කෝ;

(i) තනි තනිව හෝ සමාහාරයක් ලෙස අවප්‍රකාශ ප්‍රමාණාත්මක ලෙස සලකන්නේ නම්, ඒවා මෙම මූල්‍ය ප්‍රකාශ පදනම මත පරිශීලකයන් ගන්නා ආර්ථික තීරණවලට සාධාරණ ලෙස බලපෑම් කිරීමට අපේක්ෂා කළ හැකි බව විස්තර කිරීම;[16] හෝ

(ii) අදාළ මූල්‍ය වාර්තාකරන ආකෘතිමය රාමුව සමඟ අනුකූලව ප්‍රමාණාත්මක භාවයේ නිර්වචනය හෝ විස්තරය ලබාදීම (යොමුව: අ53 ඡේදය)

39. විගණකගේ වාර්තාවේ මූල්‍ය ප්‍රකාශ විගණනය කිරීම සඳහා විගණකගේ වගකීම් හි කොටසේ තවදුරටත් (යොමුව: අ50 ඡේදය)

(අ) ශ්‍රී.ල.වි.ප්‍ර. සමඟ අනුකූලව විගණනයක කොටසක් ලෙස, විගණනය පුරාවටම වෘත්තිය විනිශ්චය භාවිත කිරීම සහ වෘත්තිය සංසඳහාවය පවත්වාගෙන යන බව සඳහන් කිරීම; සහ

(ආ) විගණකගේ වගකීම් පහත සඳහන් ලෙස වේ යයි, සඳහන් කරමින්, විගණනයක් විස්තර කිරීම;

(i) වංචා හෝ වැරදි නිසා මූල්‍ය ප්‍රකාශවල ප්‍රමාණාත්මක අවප්‍රකාශවල අවදානම් හඳුනා ගැනීම සහ තක්සේරු කිරීම; එම අවදානම් වලට ප්‍රතිචාර දක්වන විගණන ක්‍රියාපටිපාටි සැළසුම් කිරීමට සහ ඉටු කිරීමට සහ විගණකගේ මතය සඳහා පදනමක් ලබාදීමට ප්‍රමාණවත් සහ යෝග්‍ය වන විගණන සාක්ෂි ලබා ගැනීමට වැරදීමකින් ප්‍රතිඵලයක් වන ප්‍රමාණාත්මක අවප්‍රකාශයක් හඳුනා නොගැනීමට වඩා වංචාවක ප්‍රතිඵලයක් නිසා වන අවප්‍රකාශය වඩා විශාල වේ, එය එසේ වන්නේ වංචා වලට දුස්සන්ධානය ව්‍යාජ ලේඛන සකස් කිරීම, හිතාමතා අත් හැරීම, අවනිදේශනය හෝ අභ්‍යන්තර පාලන මැදිහත් වී අක්‍රීය කිරීම වැනි දෑ සම්බන්ධවිය හැකි නිසාය.

(ii) පවතින තත්වයන්හිදී, යෝග්‍ය වන විගණන ක්‍රියාපටිපාටි සැළසුම් කිරීමට පහසුවීම පිණිස විගණනයට අදාළ අභ්‍යන්තර පාලනයේ අවබෝධයක් ලබා ගැනීමට, එහෙත් එය අස්තිත්ත්වයේ අභ්‍යන්තර පාලනයේ සඵලදායකත්වය මත මතයක් ප්‍රකාශය කිරීමේ අදහසින් නොවේ. මූල්‍ය ප්‍රකාශ විගණනය සහිතව එකට බැඳීමක් අභ්‍යන්තර පාලනය තුළ සඵලදායකත්වය මත මතයක් ප්‍රකාශ කිරීමට වගකීමක්ද එසේම විගණකට ඇති තත්ත්වයන්හිදී අභ්‍යන්තර පාලනය පිළිබඳ විගණකගේ සැළකිලිමත්බව අස්තිත්ත්වයේ අභ්‍යන්තර පාලනයේ සඵලදායකත්වය මත මතයක් ප්‍රකාශ කිරීමේ අරමුණු සඳහා නොවන බව යන වැකිකඩ විගණක ඉවත් කළ යුතුය.

(iii) භාවිත කළ ගිණුම්කරණ ප්‍රතිපත්තිවල සහ ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකාරීත්වය විසින් සිදුකළ සම්බන්ධිත හෙළිදරව් කිරීම්වල යෝග්‍යතාවය ඇගයීමට.

(iv) අඛණ්ඩ පැවැත්ම පදනම මත ගිණුම්කරණය භාවිත කිරීමේ කළමනාකාරීත්වයේ යෝග්‍යතාවය සහ ලබාගත් සාක්ෂි පදනම මත, අඛණ්ඩව පැවැත්ම ලෙස දිගටම පවත්වාගෙන යාමට අස්තිත්ත්වයේ හැකියාව මත සැළකිය යුතු අන්දමේ සැකයක් පහළ කළ හැකි සම්බන්ධිත සිද්ධීන් සහ තත්ත්වයන්හි ප්‍රමාණවත් අනියතාවයක් පවතීද යන්න නිගමනය කිරීමට.

[16] ශ්‍රී.ල.වි.ප්‍ර. 320, *විගණනයක් සැළසුම් කිරීමේදී සහ ඉටු කිරීමේ ප්‍රමාණාත්මකභාවය.* 2 වන ඡේදය

ප්‍රමාණාත්මක අනියතතාවයක් පවතින බව විගණක නිගමනය කරන්නේ නම්, මූල්‍ය ප්‍රකාශවල සම්බන්ධිත හෙළිදරව් කිරීම්වලට විගණකගේ වාර්තාවේ විගණක අවධාණය යොමු කිරීම අවශ්‍ය කරන අතර හෝ එවැනි හෙළිදරව් කිරීම් ප්‍රමාණවත් නොවේ නම් මතය විකරණය කිරීම අවශ්‍ය කෙරේ. විගණකගේ නිගමන පදනම් වන්නේ, විගණකගේ වාර්තාවේ දිනය තෙක් දක්වා, ලබා ගත් විගණන සාක්ෂි පදනම මතය. කෙසේ වෙතත් අනාගත සිද්ධීන් හෝ පවත්නා තත්ත්වයන් අඛණ්ඩ පැවැත්ම ලෙස දිගටම පවත්වාගෙන යාම අස්තිත්ත්වයට නැවැත්වීමට හේතු විය හැකිය.

(v) සාධාරණ ඉදිරිපත් කිරීමේ ආකෘතිමය රාමුව සමග අනුකූලව මූල්‍ය ප්‍රකාශ පිළියෙල කළ විට, හෙළිදරව් කිරීම් සහ එය සාධාරණ ඉදිරිපත් කිරීම මුදුන් පත් කර ගන්නා ආකාරයට පාදකවන ගණුදෙනු සහ සිද්ධීන් හා ගණුදෙනු මූල්‍ය ප්‍රකාශ නියෝජනය කරන්නේද යන්න ඇතුළුව මූල්‍ය ප්‍රකාශයන්හි සමස්ථ ඉදිරිපත් කිරීම, ව්‍යුහය සහ අන්තර්ගතය අගය කිරීමට.

(ඇ) ශ්‍රී.ල.වි.ප්‍ර. 600[17] ව්‍යවහාර කරන විට, සමූහ විගණන කාර්ය භාරයකදී පහත දැ සඳහන් කිරීම මගින් විගණකගේ වගකීම් තවදුරටත් විස්තර කරයි;

(i) විගණකගේ වගකීම් වනුයේ, සමූහ මූල්‍ය ප්‍රකාශ මත විගණකගේ මතය ප්‍රකාශ කිරීමට, අස්තිත්ත්වයේ හෝ සමූහය තුළ ව්‍යාපාරික කටයුතුවල මූල්‍ය තොරතුරු සම්බන්ධයෙන් යෝග්‍ය උචිත විගණන සාක්ෂි ලබා ගැනීමටය;

(ii) සමූහ විගණනය මෙහෙයවීම, අධීක්ෂණය සහ කාර්ය සාධනය සඳහා විගණක වගකිව යුතුය; සහ

(iii) විගණකගේ මතය සඳහා වන වගකීම තනිකරම විගණක මත රැඳී පැවතීම.

40. විගණකගේ වාර්තාවේ මූල්‍ය ප්‍රකාශ විගණනය සඳහා වූ විගණකගේ වගකීම් කොටසේ එසේම පහත දැ සඳහන් විය යුතුය. (යොමුව: අ50 ඡේදය)

(අ) විගණනය තුළදී විගණක හඳුනාගන්නා අභ්‍යන්තර පාලනය තුළ යම් සැලකිය යුතු අන්දමේ ඌණතා ඇතුලුව, වෙනත් කරුණු අතර විගණනයේ සැලසුම් කළ විෂය පථය සහ කාල නිර්ණය සහ වැදගත් විගණන සොයා ගැනීම් සම්බන්ධයෙන් පාලනය පිළිබඳ වගකිවයුතු අය සමග විගණක සන්නිවේදනය කරන බව සඳහන් කිරීම;

(ආ) ලැයිස්තුගත අස්තිත්ත්වයන්හි මූල්‍ය ප්‍රකාශ විගණනය සඳහා, ස්වාධීනත්වය සම්බන්ධයෙන් අදාළ ආචාර ධර්මීය අවශ්‍යතාවයන් සහ විගණකගේ ස්වාධීනත්වය මත සැළකිල්ලට ගැනීමේ අදහසින් සාධාරණ ලෙස දැරිය හැකි වෙනත් කරුණු සහ සියලු සම්බන්ධතාවයන් පිළිබඳව ඔවුන් සමග සන්නිවේදනය කළ බව සහ අදාළවන අවස්ථාවලදී, සම්බන්ධිත ආරක්ෂාව සළස්වන්නන් සමග විගණක අනුකූලවී ඇතිබව දක්වෙන ප්‍රකාශයන් පාලනය පිළිබඳව වගකිව යුතු අයටම විගණක ලබාදී ඇති බව සඳහන් කිරීම; සහ

(ඇ) ශ්‍රී.ල.වි.ප්‍ර. 701 සමග අනුකූලව සන්නිවේදනය කළ ප්‍රධාන විගණන කරුණු සඳහා ලැයිස්තුගත අස්තිත්ත්ව සහ වෙනත් අස්තිත්ත්වයන්හි මූල්‍ය ප්‍රකාශ විගණන සඳහා පාලනය පිළිබඳව වගකිව යුතු අය සමග සන්නිවේදනය කළ කරුණු වලින් ප්‍රවර්තන කාලපරිච්ඡේදයේ මූල්‍ය ප්‍රකාශ විගණනයෙදී වඩාත්ම වැදගත් වූ එම කරුණු විගණක නිර්ණය කිරීම සහ එබැවින් ප්‍රධාන විගණන කරුණු ලෙස සඳහන් කිරීම. කරුණක් පිළිබඳව පොදු හෙළිදරව් කිරීම නීතියෙන් හෝ රෙගුලාසි මගින් විගණකගේ වාර්තාවල ප්‍රසිද්ධ හෙළිදරව් කිරීම වළක්වාලන්නේ නැත්නම් හැර සහ ඉතා විරල තත්ත්වයන් හිදී එම කරුණු එවැනි සන්නිවේදනය කිරීමෙන් පොදු යහපත සඳහා සාධාරණ ලෙස අපේක්ෂා කරන ප්‍රතිලාභ වලට වඩා එසේ කිරීමෙන් වන අහිතකර ප්‍රතිඵල වඩා වැඩිවන අවස්ථාවක එම කරුණ විගණකගේ වාර්තාවේ සන්නිවේදනය නොකළ යුතු යයි විගණක තීරණය කරයි. (යොමුව: අ53 ඡේදය)

**මූල්‍ය ප්‍රකාශ විගණනය සඳහා විගණකගේ වගකීම්හි විස්තරය සඳහන් කරන ස්ථානයත**

41. 39-40 ඡේද වලින් අවශ්‍ය කරන මූල්‍ය ප්‍රකාශ විගණනය කිරීම සඳහා විගණකගේ වගකීම්වල විස්තරය ඇතුළත් කළ යුත්තේ; (යොමුව: අ54 ඡේදය)

(අ) විගණකගේ වාර්තාවේ ප්‍රධාන අංගය ඇතුළත;

(ආ) විගණකගේ වාර්තාවේ පරිශිෂ්ඨයක් ඇතුළත, එවැනි අවස්ථාවක පරිශිෂ්ඨය පිහිටි ස්ථානය වෙත යොමු කිරීමක් විගණකගේ වාර්තාවේ ඇතුළත් වියයුතුය හෝ (යොමුව: අ55 - අ57 ඡේද)

[17] ශ්‍රී.ල.වි.ප්‍ර. 600, *විශේෂ සළකා බැලීම් - (සංරචක විගණකවරුන්ගේ වැඩ ඇතුළුව) සමූහ මූල්‍ය ප්‍රකාශ විගණනය*

(ඇ) නීතිය හෝ රෙගුලාසි හෝ ශ්‍රී ලංකා විගණන ප්‍රමිත එසේ කරන ලෙස ප්‍රකාශිතව විගණකට අවසර දෙන අවස්ථාවක විගණකගේ වාර්තාව ඇතුළත නිශ්චිත යොමු කිරීමක් සඳහන් කර යෝග්‍ය ආයතනයක වෙබ් අඩවියක එහි පිහිටීම පිළිබඳ විස්තර සහිතව පළ කිරීම (යොමුවඃ අ54, අ56 - අ57 ඡේද)

42. යෝග්‍ය ආයතනයක වෙබ් අඩවියක විගණකගේ වගකීම්වල විස්තරයන් විගණක යොමු කරන විට, එවැනි විස්තරයක යොමු කිරීම් සහ එය මෙම ශ්‍රී.ල.වි.ප්‍ර. යේ 39 - 40 ඡේදවල අවශ්‍යතාවයන් සමග අසංගත නොවිය යුතු බව විගණක නිර්ණය කළ යුතුය. (යොමුවඃ අ56 ඡේදය)

**වෙනත් වාර්තා කරන වගකීම්**

43. ශ්‍රී.ල.වි.ප්‍ර. යටතේ විගණකගේ වගකීම්වලට අමතරව වන මූල්‍ය ප්‍රකාශමත විගණකගේ වාර්තාවේ වෙනත් වාර්තාකරණ වගකීම් විගණක අමතන්නේ නම්, මෙම වෙනත් වාර්තාකරණ වගකීම් ඇමතිය යුතු වන්නේ විගණකගේ වාර්තාවේ වෙනම කොටසක "වෙනත් නෛතික සහ නියාමන අවශ්‍යතාවයන්" වශයෙන් නම් කළ ශීර්ෂයක් සහිතව හෝ අන් වශයෙන් එම කොටසේ අන්තර්ගතයට යෝග්‍ය වන පරිදිය. මෙම වෙනත් වාර්තාකරණ වගකීම් අමතන්නේ ශ්‍රී.ල.වි.ප්‍ර. මගින් අවශ්‍යකරණ වාර්තාකරණ වගකීම් යටතේ ඉදිරිපත් කළ එම මාතෘකා හා සමාන මාතෘකා වන්නේ නම් හැර, එවැනි අවස්ථාවන්හිද වෙනත් වාර්තා කරන වගකීම් ඉදිරිපත් කළ හැක්කේ එම කොටස තුළ ශ්‍රී.ල.වි.ප්‍ර. මගින් අවශ්‍ය කරන සම්බන්ධිත වාර්තා මූලිකාංග ලෙස (යොමුවඃ අ58 - අ60 ඡේද).

44. ශ්‍රී.ල.වි.ප්‍ර. මගින් අවශ්‍යකරන සම්බන්ධිත වාර්තාවේ මූලිකාංග එම කොටස තුලට වෙනත් වාර්තා කිරීමේ වගකීම් ඉදිරිපත් කරන්නේ නම්, ශ්‍රී.ල.වි.ප්‍ර. මගින් අවශ්‍ය කරන වාර්තාකරණයෙන් වෙනත් වාර්තාකරණ වගකීම් විගණකගේ වාර්තාවේ පැහැදිලිව වෙන් කොට හඳුනාගත යුතුය. (යොමුවඃ අ60 ඡේදය)

45. විගණකගේ වාර්තාවේ වෙනත් වාර්තාකරණ වගකීම් ආමන්ත්‍රණය කරන වෙනම වූ කොටසක් අඩංගු වන්නේ නම්, මෙම ශ්‍රී.ල.වි.ප්‍ර. යේ 21 - 40 දක්වා වූ ඡේදවල අවශ්‍යතාවයන් "මූල්‍ය ප්‍රකාශ විගණනය මත වාර්තාව" යන ශීර්ෂය සහිතව වූ කොටසක් යටතේ අතුළත් කළ යුතුය. 'මූල්‍ය ප්‍රකාශයන්හි විගණනය මත වාර්තාව' ට පසුව " වෙනත් නෛතික හා නියාමන අවස්ථා වාර්තාව" ලෙස සඳහන් වියයුතුය. (යොමුවඃ අ60 ඡේදය)

**කාර්යභාරයේ නියුතු හවුල්කරුගේ ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනයේ සාමාජික අංකය**

46. ඉතා විරල තත්ත්වයන්හි කාර්යභාරයේ නියුතු හවුල්කරුගේ ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනයේ සාමාජික අංකය මූල්‍ය ප්‍රකාශ මත විගණකගේ වාර්තාවේ හෙළිදරව් කිරීම සැලකිය යුතු අන්දමේ පෞද්ගලික තර්ජනයකට ඔහුට මුහුණපෑමට හේතුවක් වීමට අපේක්ෂා කරන්නේ නම් මිස ලැයිස්තුගත අස්තිත්ත්වයන්හි මූල්‍ය ප්‍රකාශ මත විගණකගේ වාර්තාවේ කාර්යභාරයේ නියුතු හවුල්කරුගේ ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනයේ සාමාජික අංකය ඇතුළත් කළ යුතුය. ඉතා විරල තත්ත්වයන්හිදී විගණකගේ වාර්තාවේ කාර්යභාරයේ නියුතු හවුල්කරුගේ ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනයේ සාමාජික අංකය ඇතුළත් නොකිරීමට විගණක අදහස් කරන විට, මෙම අභිප්‍රාය පිළිබඳව සැළකිය යුතු අන්දමේ පෞද්ගලික ආරක්ෂාව පිළිබඳව තර්ජනයක් විය හැකිබව සහ එහි උග්‍රකම පිළිබඳ විගණකගේ තක්සේරුව දැන්වීමට පාලනය පිළිබඳ වගකිව යුතු අය සමග විගණක සාකච්ඡා කළ යුතුය. (යොමුවඃ අ61 - අ63 ඡේද)

**විගණකගේ අත්සන**

47. විගණකගේ වාර්තාව අත්සන් කළ යුතුය. (යොමුවඃ අ64 - අ65 ඡේද)

**විගණකගේ ලිපිනය**

48. විගණකගේ වාර්තාවේ විගණක පරිචයේ යෙදී සිටින අධිකරණ බල ප්‍රදේශයේ පිහිටීම නම් කළ යුතුය.

**විගණකගේ වාර්තාවේ දිනය**

49. පහත දක්වෙන සාක්ෂි ඇතුළුව, මූල්‍ය ප්‍රකාශ මත විගණකගේ වාර්තාව පදනම් වීමට ප්‍රමාණවත් යෝග්‍ය විගණන සාක්ෂි විගණක ලබා ගත් දිනට කලින් නොවන දිනයකට, විගණකගේ වාර්තාව දාතම් කළ යුතුය. (යොමුවඃ අ66 - අ69 ඡේද)

(i) මූල්‍ය ප්‍රකාශ සමන්විත වන සියලු ප්‍රකාශ සහ හෙළිදරව් කිරීම් පිළියෙල කර ඇති බව; සහ

(ii) එම මූල්‍ය ප්‍රකාශ සඳහා පිළිගත් අධිකාරියක් ඇති අය වගකීම භාරගෙන ඇති බව තරයේ ප්‍රකාශ කිරීම.

**නීතියෙන් හෝ නියාමනයෙන් නියම කර ඇති විගණකගේ වාර්තාව.**

50. විශේෂිත අධිකරණ බල ප්‍රදේශයක නීතියෙන් හෝ රෙගුලාසි මගින් විගණකට විගණකගේ වාර්තාවේ, විශේෂ පසුතලයක හෝ වදන් පෙළක් භාවිත කිරීමට විගණකට අවශ්‍ය වන්නේ නම්, විගණකගේ වාර්තාව ශ්‍රී ලංකා විගණක ප්‍රමිතවලට යොමුකළ යුත්තේ අවමයක් වශයෙන් පහත සඳහන් සෑම මූලිකාංගයක්ම විගණකගේ වාර්තාවේ ඇතුළත් නම් පමණි. (යොමුවඃ අ70 - අ71 ඡේද)

(අ) මාතෘකාවක්

(ආ) කාර්යභාරයේ තත්ත්වයන් මගින් අවශ්‍යකරන පරිදි ඇමතුම්ලාභියා

(ඇ) මූල්‍ය ප්‍රකාශ මත මතය පළකිරීම අඩංගු මතය සඳහන් කොටසක් සහ මූල්‍ය ප්‍රකාශ පිළියෙල කිරීම සඳහා භාවිත කළ අදාළ මූල්‍ය වාර්තාකරණ ආකෘතිමය රාමුවට යොමු කිරීමක් (ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත හෝ ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිත නොවන විට මූල්‍ය වාර්තාකරණ ආකෘතිමය රාමුවේ සම්භවයවන අධිකරණ බලප්‍රදේශය හඳුනා ගැනීම ඇතුළුව, (27 වන ඡේදය බලන්න)

(ඈ) මූල්‍ය ප්‍රකාශ විගණනය කළ අස්තිත්ත්වයේ හඳුනා ගැනීම.

(ඉ) විගණනයට සම්බන්ධිත අදාළ ආචාරධර්ම සමග අනුකූලව විගණක අස්තිත්ත්වයෙන් ස්වාධීන බව සහ මෙම අවශ්‍යතාවයන් සමග අනුකූලව වෙනත් ආචාර ධර්ම වගකීම් විගණක ඉටු කර ඇති බවට වන ප්‍රකාශයක් අදාළ චර්යා ධර්මීය අවශ්‍යතාවයන්හි අධිකරණ බල ප්‍රදේශයේ සම්භවය මෙම ප්‍රකාශය හඳුනාගත යුතු හෝ ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනයේ චර්යා ධර්ම සංග්‍රහයට යොමු ගත කිරීම.

(ඊ) අදාළවන අවස්ථාවලදී, ඇමතුම්ලාභීන්ගේ කොටස සහ ශ්‍රී.ල.වි.ප්‍ර. 570 (සංශෝධිත) හි 22 වන ඡේදයේ වාර්තාකරණ අවශ්‍යතාවයන් සමග අසංගත නොවන බව.

(උ) අදාළ වන අවස්ථාවලදී, කොන්දේසි සහිත (හෝ අහිතකර) මතය සඳහා පදනම අමතන කොටස සහ එය ශ්‍රී.ල.වි.ප්‍ර. (හෝ අහිතකර) මතය සඳහා පදනම අමතන කොටස, සහ එය ශ්‍රී.ල.වි.ප්‍ර. 570 (සංශෝධිත) හි 23 වන ඡේදය තුළ වන වාර්තාකරණ අවශ්‍යතාවයන් සමග අසංගත නොවන බව.

(ඌ) අදාළවන අවස්ථාවලදී, ශ්‍රී.ල.වි.ප්‍ර. 701 මගින් අවශ්‍ය කරන තොරතුරු ඇතුළත් කොටස හෝ එය අමතන නීතිය හෝ රෙගුලාසි මගින් නියමකර ඇති විගණනය පිළිබඳ අතිරේක තොරතුරු සහ එම ශ්‍රී.ල.වි.ප්‍ර. යේ වාර්තා කරන අවශ්‍යතාවයන් සමග අසංගත නොවන බව.[18] (යොමුවඃ අ72 - අ75 ඡේද)

(එ) අදාළවන අවස්ථාවලදී ශ්‍රී.ල.වි.ප්‍ර. 720 (සංශෝධිත) හි 24 වන ඡේදයේ වාර්තා කරන අවශ්‍යතාවයන් අමතන එම කොටස.

(ඒ) මූල්‍ය ප්‍රකාශ පිළියෙල කිරීම සඳහා කළමනාකාරීත්වයේ වගකීම් හි විස්තරයක් සහ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය අධීක්ෂණය කිරීම මෙහෙයවීම සඳහා වගකිව යුතු අයගේ හඳුනා ගැනීම සහ 33 - 36 ඡේදවල අවශ්‍යතාවයන් සමග අසංගත නොවන බව.

(ඔ) ශ්‍රී ලංකා විගණන ප්‍රමිත සහ නීතිය හෝ රෙගුලාසි වලට යොමු කිරීමත් සහ මූල්‍ය ප්‍රකාශ විගණනයක් සඳහා විගණකගේ වගකීම් පිළිබඳ විස්තරයක් සහ 37 - 40 දක්වා වන ඡේද තුළවන අවශ්‍යතාවයන් සමග අසංගත නොවන බව. (යොමුවඃ අ50 - අ53 ඡේද)

(ඕ) ලැයිස්තුගත අස්තිත්ත්වයන්හි පොදු අරමුණු මූල්‍ය ප්‍රකාශ සම්පූර්ණ කට්ටලවල විගණන සඳහා, ඉතා විරල අවස්ථාවන්හිදී එවැනි හෙළිදරව් කිරීමට සාධාරණ ලෙස පෞද්ගලික ආරක්ෂාවට සැළකිය යුතු අන්දමේ තර්ජනයක් අපේක්ෂා කිරීමට හේතු වන්නේ නම් හැර කාර්යභාරයේ නියැලී සිටින හවුල්කරුගේ ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනයේ සමාජික අංකය.

(ක) විගණකගේ අත්සන

(ඛ) විගණකගේ ලිපිනය

(ග) විගණකගේ වාර්තාවේ දිනය

[18] ශ්‍රී.ල.වි.ප්‍ර. 701, 11-16 ඡේද

**විශේෂිත අධිකරණ බලප්‍රදේශයක විගණන ප්‍රමිත සහ ශ්‍රී ලංකා විගණන ප්‍රමිත යන ප්‍රමිති දෙකම සමඟ අනුකූලව මෙහෙයවන විගණන සඳහා විගණකගේ වාර්තාව.**

51. විශේෂිත අධිකරණ බලප්‍රදේශයක විගණන ප්‍රමිත සමඟ අනුකූලව විගණකට විගණනයක් මෙහෙයවීමට අවශ්‍ය විය හැක. සහ ඊට අමතරව විගණනය මෙහෙයවීමේදී ශ්‍රී.ල.වි.ප්‍ර. සමඟ අනුගත වීමට සිදුවේ. අවස්ථාව මෙය නම් විගණකගේ වාර්තාවේ විශේෂිත බලප්‍රදේශයේ ප්‍රමිතවලට අමතරව විගණකට ශ්‍රී ලංකා විගණන ප්‍රමිත වෙත යොමු ගත කිරීම කළ හැකිය, එහෙත් විගණකට එසේ කළ හැක්කේ පහත සඳහන් තත්ත්වයන් වන්නේ නම් පමණි. (යොමුවː අ76 - අ77 ඡේද)

(අ) (i) වෙනස් මතයක් සකස් කිරීමට හෝ (ii) ශ්‍රී.ල.වි.ප්‍ර. මගින් අවශ්‍ය කරන පවතින විශේෂ තත්ත්වයන් තුළ කරුණ අවධාරණය කිරීමේ ඡේදයක් හෝ වෙනත් කරුණ ඡේදයේ ඇතුළත් නොකිරීමට විගණක යොමු කළ හැකි එම ශ්‍රී.ල.වි.ප්‍ර. වල සහ විශේෂිත අධිකරණ බලප්‍රදේශයේ විගණන ප්‍රමිතයන්හි අවශ්‍යතාවයන් අතර ගැටුමක් නොමැති නම්; සහ

(ආ) විශේෂිත අධිකරණ බලප්‍රදේශයක විගණන ප්‍රමිති මගින් නියම කර ඇති පසුතලයක් හෝ වචන පෙළගැස්මක් විගණක භාවිත කරන විට ඡේද 50 (අ) - (ග) දක්වා ඡේදවල නියම කර ඇති සෑම මූලිකාංගයක්ම අවමයක් වශයෙන් විගණකගේ වාර්තාවේ ඇතුළත් කළ යුතුය. කෙසේ වෙතත් 50(ඔ) වගන්තිය "නීතිය හෝ රෙගුලාසි" යන යොමු කිරීම කියවිය යුත්තේ විශේෂිත අධිකරණ බලප්‍රදේශයක විගණන ප්‍රමිතිවලට යොමු කිරීම ලෙසය. ඒ අනුව විගණකගේ වාර්තාව විශේෂිත අධිකරණ බලප්‍රදේශයක එවැනි විගණන ප්‍රමිත හඳුනා ගත යුතුය.

52. විගණකගේ වාර්තාව ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට සහ විශේෂිත අධිකරණ බලප්‍රදේශයක විගණන ප්‍රමිතීන් යන දෙකටම යොමු කරන විට, විගණකගේ වාර්තාවේ විශේෂිත අධිකරණ බලප්‍රදේශයේ විගණන ප්‍රමිතිවල අධිකරණ බලප්‍රදේශයේ සම්භවය විගණකගේ වාර්තාව හඳුනාගත යුතුය.

**මූල්‍ය ප්‍රකාශ සමඟ ඉදිරිපත් කරන පරිපූරක තොරතුරු (යොමුවː අ78 - අ84 ඡේද)**

53. අදාළ මූල්‍ය වාර්තාකරණ ආකෘතිමය රාමුව මගින් අවශ්‍ය නොකරන එම පරිපූරක තොරතුරු විගණනය කළ මූල්‍ය ප්‍රකාශ සමඟ ඉදිරිපත් කරන විට, විගණකගේ වෘත්තිය විනිශ්චය තුළ කෙසේ වෙතත් පරිපූරක තොරතුරුවල ස්වභාවය හෝ එය ඉදිරිපත් කළ ආකාරය නිසා එය මූල්‍ය ප්‍රකාශවල වැදගත් කොටසක් ද යන්න විගණක ඇගයිය යුතුය. එම මූල්‍ය ප්‍රකාශවල වැදගත් කොටසක්වන විට පරිපූරක තොරතුරු විගණකගේ මතය මගින් ආවරණය වියයුතුය.

අදාළ මූල්‍ය වාර්තා කරන ආකෘතිමය රාමුව මගින් අවශ්‍ය නොකරන පරිපූරක තොරතුරු විගණනය කළ මූල්‍ය ප්‍රකාශ වල වැදගත් කොටසක් ලෙස සළකණු නොලබන්නේ නම්, එය විගණනය කළ මූල්‍ය ප්‍රකාශ ප්‍රමාණවත් සහ පැහැදිලිව වෙන් කොට දක්වෙන ආකාරයට එවැනි පරිපූරක තොරතුරු ඉදිරිපත් කර ඇත්දැයි විගණක ඇගයිය යුතුය. මෙය එවැනි අවස්ථාවක් නොවේ නම් එවිට විගණනය නොකළ පරිපූරක තොරතුරු ඉදිරිපත් කළ යුතු ආකාරය කෙසේ වෙනස්විය යුතුද යන්න විගණක කළමනාකාරීත්වයෙන් ඉල්ලා සිටිය යුතුය. කළමණාකාරීත්වය එසේ කිරීම ප්‍රතික්ෂේප කරන්නේ නම්, විගණක විසින් විගණනය නොකළ පරිපූරක තොරතුරු හඳුනාගත යුතු සහ එවැනි පරිපූරක තොරතුරු විගණනය නොකළ බව විගණකගේ වාර්තාවේ පැහැදිලි කළ යුතුය.

**භාවිතා කිරීමේ සහ පැහැදිලි කිරීමේ වෙනත් කරුණු**

**අස්තිත්ත්වයේ ගිණුම්කරණ පරිචයන්හි ගුණාත්මක අංග (යොමුවː 12 වන ඡේදය)**

අ1. මූල්‍ය ප්‍රකාශ තුළ වන වටිනාකම් සහ හෙළිදරව් කිරීම් පිළිබඳව කළමනාකාරීත්ව විනිශ්චයන් ගණනාවක් සිදුකරයි.

අ2. ගිණුම්කරණ පරිචයන්හි ගුණාත්මක අංගයන්හි සාකච්ඡාවක් ශ්‍රී.ල.වි.ප්‍ර. 260 (සංශෝධිත) හි අඩංගුවේ.[19] අස්තිත්ත්වයේ ගිණුම්කරණ පරිචයන්හි ගුණාත්මක අංග සැළකිල්ලට ගැනීමේදී කළමනාකාරීත්වයේ විනිශ්චයන්ගේ විය හැකි පක්ෂග්‍රාහීත්වය විගණකගේ දැන ගැනීමට පත්ව තිබිය හැකිය. අපක්ෂපාතභාවයේ අඩුව, නිවැරදි නොකළ අවප්‍රකාශයන්හි බලපෑම සමඟ එකට ගත්කල වන සමාහරණය කළ බලපෑම විගණක නිගමනය කළ හැකිය. මූල්‍ය ප්‍රකාශ සමස්ථයක් ලෙස ප්‍රමාණාත්මක ලෙස අවප්‍රකාශ වී ඇත්දැයි, විගණකගේ ඇගයීමට බලපෑ හැකි අපක්ෂපාතී බව නැතිකමක සූචක වලට පහත දෑ ඇතුළත්ය;

- විගණනය තුළදී කළමණාකාරීත්වයේ අවධානයට ලක් කළ තෝරා ගත හැකි අවප්‍රකාශ නිවැරදි කිරීම්. (උදාː වාර්තා කරන ඉපයීම් වැඩි කිරීමේ බලපෑම් සහිත අවප්‍රකාශ නිවැරදි කිරීම, එහෙත් වාර්තා කරන ඉපයීම් අඩු කිරීම් බලපෑම් ඇති අවප්‍රකාශ නිවැරදි නොකිරීම)

- ගිණුම්කරණ ඇස්තමේන්තු සිදු කිරීමේ කළමනාකාරීත්වයේ පක්ෂග්‍රාහිබව.

[19] ශ්‍රී.ල.වි.ප්‍ර. 260 (සංශෝධිත), *පාලනය පිළිබඳ වගකිව යුතු අය සමඟ සන්නිවේදනය* - 2 වන පරිශිෂ්ඨය.

අ3. ගිණුම්කරණ ඇස්තමේන්තු සිදු කිරීමේදී වියහැකි කළමනාකාරීත්වයේ පක්ෂග්‍රාහීබව ශ්‍රී.ල.වි.ප්‍ර. 540 අමතයි.[20] තනි, තනි ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය මත නිගමන ලබා ගැනීමේ අරමුණු සඳහා අවප්‍රකාශ වියහැකි කළමනාකාරීත්වයේ පක්ෂග්‍රාහීබව සඳහා සූචක ස්ථාපනය නොවේ. ඒවා කෙසේ වෙතත් මූල්‍ය ප්‍රකාශ සමස්ථයක් වශයෙන් ගත්කළ ප්‍රමාණත්මක අව ප්‍රකාශයන්ගෙන් තොරදැයි විගණකගේ ඇගයීමට බලපෑ හැකිය.

**මූල්‍ය ප්‍රකාශ තුළ ගිණුම්කරණ ප්‍රතිපත්ති යෝග්‍ය ලෙස හෙළිදරව් කිරීම (යොමුව: 13 (අ) ඡේදය)**

අ4. මූල්‍ය ප්‍රකාශවලින් තෝරාගත් සහ ව්‍යවහාර කළ වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති යෝග්‍ය පරිදි මූල්‍ය ප්‍රකාශවල හෙළිදරව් කර ඇත්ද යන්න අගය කිරීමේදී, විගණක සැලකිලිමත්විය යුතු කරුණු වලට පහත දෑ ඇතුළත්ය.

- අදාළ මූල්‍ය වාර්තාකරණ ආකෘතිමය රාමුව මගින් ඇතුළත් කිරීමට අවශ්‍ය කරන වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලට සම්බන්ධිත සියලු හෙළිදරව් කිරීම් හෙළිදරව් කර ඇත්ද,
- වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති පිළිබඳව හෙළිදරව් කර ඇති තොරතුරු අදාළ ද යන්න සහ එම නිසා අස්තිත්ත්වයේ මෙහෙයුම් සහ එහි පරිසරයේ විශේෂ තත්ත්වයන් තුළ මූල්‍ය ප්‍රකාශ තුළ ගණුදෙනු පන්තිවලට, ගිණුම් ශේෂ සහ හෙළිදරව් කිරීම් වලට ව්‍යවහාර කළ අදාළ මූල්‍ය වාර්තා කරන ආකෘතිමය රාමුව තුළ හඳුනා ගැනීම, මැනීම සහ ඉදිරිපත් කිරීමේ නිර්ණායක පිළිබිඹු වන්නේ කෙසේද; සහ
- ඉදිරිපත් කළ වැදගත් ගිණුම් කරන ලද ප්‍රතිපත්ති සමඟ එහි පැහැදිලි කිරීම.

**මූල්‍ය ප්‍රකාශ තුළ ඉදිරිපත් කර ඇති තොරතුරු අදාළ ද, විශ්වාසදායකද, සැසඳිය හැකිද සහ අවබෝධකරගත හැකිද (යොමුව: 13 (ඈ) ඡේදය)**

අ5. මූල්‍ය ප්‍රකාශයන්හි අවබෝධ කර ගත හැකි බව අගය කිරීමේදී පහත සඳහන් වැනි කරුණු ඇතුළත් වන්නේදැයි සැලකිල්ලට ගත යුතු වේ.

- මූල්‍ය ප්‍රකාශ තුළ තොරතුරු ඉදිරිපත් කර ඇත්තේ පැහැදිලි සහ සංක්ෂිප්ත ආකාරයටද.
- වැදගත් හෙළිදරව් කිරීම්වල ස්ථානගත කිරීම, මගින් ඒවාට යෝග්‍ය ප්‍රමුඛතාවය ලැබේ. (උදා. ලෙස අස්තිත්ත්වයට විශේෂිත වූ තොරතුරු පරිශීලකයන්ට ප්‍රග්‍රහණය කරගත හැකි වටිනාකමක් ඇති විට) සහ පරිශීලකයන් සඳහා අවශ්‍ය තොරතුරු හඳුනා ගැනීමේදී සැළකිය යුතු අන්දමේ අභියෝග මතු නොවන ආකාරයට යෝග්‍ය පරිදි හෙළිදරව් කිරීම් හරස් යොමු ගත කර තිබේ ද?

**මූල්‍ය ප්‍රකාශ තුළ පළකළ තොරතුරුමත ප්‍රමාණාත්මක ගණුදෙනුවල සහ සිද්ධීන්හි බලපෑමෙහි හෙළිදරව් කිරීම. (යොමුව: 13(ඊ) ඡේදය)**

අ6. පොදු අරමුණු ආකෘතිමය රාමුව සමඟ අනුකූලව පිළියෙල කළ මූල්‍ය ප්‍රකාශ සඳහා අස්තිත්ත්වයේ මූල්‍ය තත්ත්වය, මූල්‍ය කාර්ය සාධනය සහ මුදල් ප්‍රවාහ ඉදිරිපත් කිරීම සාමාන්‍ය දෙයකි. අදාළ මූල්‍ය වාර්තාකරණ ආකෘතිමය රාමුව, සැලකිල්ලට ගැනීමේදී, ප්‍රමාණාත්මක ගණුදෙනුවල සහ අස්තිත්ත්වයේ මූල්‍ය තත්ත්වය මූල්‍ය කාර්ය සාධනය සහ මූල්‍ය ප්‍රවාහ මත බලපෑම අපේක්ෂිත පරිශීලකයනට අවබෝධ කර ගැනීමට පහසු වීමට මූල්‍ය ප්‍රකාශ ප්‍රමාණවත් හෙළිදරව් කිරීම් ලබා දෙන්නේද යන්න අගය කිරීමේදී පහත කරුණු වැනි දෑ සැලකිල්ලට ගැනීම ඇතුළත්ය;

- අස්තිත්ත්වයේ තත්ත්වයනට විශේෂිත සහ මූල්‍ය ප්‍රකාශවල තොරතුරු අදාළ වන ප්‍රමාණය; සහ
- අපේක්ෂිත පරිශීලකයනට පහත දෑ අවබෝධ කර ගැනීමට සහාය වීම හෙළිදරව් කිරීම් ප්‍රමාණවත් වන්නේද යන්න
    - o අදාළ මූල්‍ය වාර්තාකරණ රාමුව මගින් ස්ථාපනය කර ඇති හඳුනා ගැනීම සඳහා වන නිර්ණායක (හෝ ප්‍රතිහඳුනා ගැනීම සඳහා වන නිර්ණායක) වල අවශ්‍යතා ඉටු නොවන ගණුදෙනු වලින් හෝ සිද්ධීන්ගෙන් පැන නගින අස්තිත්ත්වයේ වියහැකි වත්කම් සහ වගකීම්වල ස්වභාවය සහ ප්‍රමාණය.
    - o ගණුදෙනු සහ සිද්ධීන්ගෙන් පැනනගින ප්‍රමාණාත්මක අවප්‍රකාශවල අවදානමේ ස්වභාවය සහ ප්‍රමාණය.

[20] ශ්‍රී.ල.වි.ප්‍ර. 540, *සාධාරණ අගය ගිණුම්කරණ ඇස්තමේන්තු සහ සම්බන්ධිත හෙළිදරව් කිරීම ඇතුළුව ගිණුම්කරණ ඇස්තමේන්තු විගණනය.*

o අදාළ සංවේදිතා විශ්ලේෂණය ඇතුළුව, ඉදිරිපත් කළ හෝ අන් වශයෙන් හෙළිදරව් කළ වටිනාකම්වලට බලපාන භාවිත කළ ක්‍රම සහ සිදුකළ උපකල්පන සහ විනිශ්චයන් සහ ඒවාට කළ වෙනස්කම්.

**මූල්‍ය ප්‍රකාශ සාධාරණ ඉදිරිපත් කිරීම අත්කරගෙන ඇත්ද යන්න ඇගයීම (යොමුව: 14 වන ඡේදය)**

අ7. සමහර මූල්‍ය වාර්තාකරණ ආකෘතිමය රාමු ඉතා පැහැදිලිව හෝ ව්‍යංගව සාධාරණ ඉදිරිපත් කිරීමේ සංකලපය පිළිගනී.[21] මෙම ශ්‍රී.ල.වි.ප්‍ර. යේ 7(ආ) ඡේදයෙන් අවධානයට ලක් වූ පරිදි, සාධාරණ ඉදිරිපත් කිරීමේ[22] මූල්‍ය වාර්තාකරණ ආකෘතිමය රාමුවක්, එම ආකෘතිමය රාමුවේ අවශ්‍යතාවයන් සමඟ අනුකූලවීම අවශ්‍ය බව පමණක් නොව, එලෙසම, ආකෘතිමය රාමුව මගින් විශේෂිතව අවශ්‍යකරණ දෑ ඉක්මවා වන හෙළිදරව් කිරීම් ලබාදීමට කළමනාකාරීත්වයට එය අවශ්‍ය විය හැකි බව පැහැදිලි හෝ ව්‍යංගව පිළිගනී.[23]

අ8. ඉදිරිපත් කිරීම සහ හෙළිදරව් කිරීම යන කරුණු දෙක සම්බන්ධයෙන්ම මූල්‍ය ප්‍රකාශ සාධාරණ ඉදිරිපත් කිරීම ඉෂ්ඨ කරගෙන ඇත්ද යන්න පිළිබඳ විගණකගේ අගය කිරීම වෘත්තිය විනිශ්චයට අයත් කරුණකි. මෙම ඇගයීමට, අස්තිත්ත්වයේ යථාව සහ තත්ත්වයන් වැනි කරුණු හා ඊට අමතරව වෙනස්වීම් ඇතුළුව විගණනය තුළදී ලබාගත් විගණන සාක්ෂි සහ අස්තිත්ත්වය පිළිබඳ විගණකගේ අවබෝධය පදනම් කර ගැනීම සැළකිල්ලට ගැනේ. මෙම අගය කිරීමට එලෙසම උදාහරණ ලෙස මූල්‍ය වාර්තාකරණ අවශ්‍යතාවයන්හි විකසනය වීම් හෝ වෙනස්වන ආර්ථික පරිසරයේ බලපෑම් වැනි ප්‍රමාණාත්මක විය හැකි (එනම්; පොදුවේ ගත් කළ, අවප්‍රකාශ ප්‍රමාණාත්මක ලෙස සළකන්නේ මූල්‍ය ප්‍රකාශ සමස්ථයක් ලෙස පදනම මත ගත්විට පරිශීලකයන්ගේ ආර්ථික තීරණ වලට ඒවා සාධාරණ ලෙස බලපෑම් කිරීමට අපේක්ෂා කරන්නේ නම්ය.) කරුණු වලින් පැන නඟින කරුණු සාධාරණව ඉදිරිපත් කිරීම ඉෂ්ඨ කර ගැනීමට අවශ්‍ය හෙළිදරව් කිරීම් සැළකිල්ලට ගැනිමේදී අවශ්‍ය කෙරේ.

අ9. මූල්‍ය ප්‍රකාශ සාධාරණ ඉදිරිපත් කිරීම ඉෂ්ඨ කර ගන්නේද යන්න අගය කිරීමේදී උදාහරණ ලෙස කළමනාකාරීත්වය සහ පාලනය පිළිබඳ වගකිව යුතු අය, සමඟ විශේෂ ඉදිරිපත් කිරීමක් තෝරා ගත්තේ මන්ද සහ එමෙන්ම විකල්ප සැළකිල්ලට ගන්නේද යන්න පිළිබඳව ඔවුන්ගේ මතය දැන ගැනීමට සාකච්ඡා කිරීමද ඇතුළත්විය හැකිය. උදාහරණ ලෙස මෙම සාකච්ඡාවල ඇතුළත් විය හැක්කේ;

- මූල්‍ය ප්‍රකාශවල දක්වෙන වටිනාකම් සමාහරණය කළ හෝ කොටස්වලට විසුරුවා හැර ඇති ප්‍රමාණය සහ වටිනාකම් හෝ හෙළිදරව් කිරීම් ඉදිරිපත් කිරීමේදී ප්‍රයෝජනවත් තොරතුරු අපැහැදිලිද හෝ නොමඟ යවන සුළු තොරතුරු ප්‍රතිඵලයක් ලෙස හට ගන්නේද?
- යෝග්‍ය කර්මාන්තයේ ව්‍යවහාරයන් සමඟ සංගතවේද හෝ අස්තිත්ත්වයේ තත්ත්වයට අදාළ යම් බැහැර වීම් සිදුවේද සහ එම නිසා යුක්ති සහගතද යන්න.

**අදාළ මූල්‍ය වාර්තාකරණ ආකෘතිමය රාමුවේ විස්තරයක් (යොමුව: 15 වන ඡේදය)**

අ10. ශ්‍රී.ල.වි.ප්‍ර. 200 හි විස්තර කර ඇති පරිදි, කළමණාකාරීත්වය සහ, යෝග්‍ය වන පරිදි පාලනය පිළිබඳව වගකිව යුතු අය විසින් මූල්‍ය ප්‍රකාශ පිළියෙල කිරීමේදී මූල්‍ය ප්‍රකාශ තුළ අදාළ මූල්‍ය වාර්තා කරන ආකෘතිමය රාමුවේ ප්‍රමාණවත් විස්තරයක් ඇතුළත් කිරීම අවශ්‍ය කෙරේ.[24] එම විස්තරය මූල්‍ය ප්‍රකාශ කුමන ආකෘතිමය රාමුව මත පදනම් වුවාදැයි මූල්‍ය ප්‍රකාශ පරිශීලකයනට උපදෙස් දෙයි.

අ11. විශේෂ අදාළ මූල්‍ය වාර්තාකරණ ආකෘතිමය රාමුවක් සමඟ අනුකූලව පිළියෙල කළ මූල්‍ය ප්‍රකාශවල එම විස්තරය යෝග්‍ය වන්නේ, මූල්‍ය වාර්තා මගින් ආවරණය වන කාලපරිච්ඡේද තුළදී බලාත්මකවන එම ආකෘතිමය රාමුවේ සියලු අවශ්‍යතාවයන් සමඟ මූල්‍ය ප්‍රකාශ අනුගත වන්නේ නම් පමණි.

අ12. අනිශ්චිත සීමා පනවන හෝ සීමාකරන බස්වහරක් අඩංගු අදාළ මූල්‍ය වාර්තාකරණ ආකෘතිමය රාමුවේ විස්තරයක් (උදා. "මූල්‍ය ප්‍රකාශ බොහෝදුරට ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත සමඟ අනුකූලවේ") එය මූල්‍ය ප්‍රකාශ පරිශීලකයන් නොමඟ යැවිය හැකි බැවින් එම ආකෘතිමය රාමුව පිළිබඳ ප්‍රමාණවත් ලෙස කරන විස්තරයක් විය නොහැක.

---

[21] වන ඡේදය

[22] ශ්‍රී.ල.වි.ප්‍ර. 200, 13(අ) ඡේදය බලන්න.

[23] උදාහරණ ලෙස ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවල විශේෂිත අවශ්‍යතාවයන් සමඟ අනුකූලවන අවස්ථාවකදී ඒවා අස්තිත්ත්වයේ මූල්‍ය තත්ත්වය, මූල්‍ය කාර්ය සාධනය (ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති1. *මූල්‍ය ප්‍රකාශ ඉදිරිපත් කිරීම.* 17(ඇ)) ඡේදය මත විශේෂ ගණුදෙනු වෙනත් සිද්ධීන් සහ තත්ත්වයන් හි බලපෑම පරිශීලකයාට අවබෝධ කර ගැනීමට හැකිවීමට ප්‍රමාණවත් නොවනවිට අස්තිත්ත්වය අතිරේක හෙළිදරව් කිරීම් ලබාදීමට ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත මගින් අවශ්‍ය කෙරේ.

[24] ශ්‍රී.ල.වි.ප්‍ර. 200, අ4 - අ5 ඡේද

**මූල්‍ය වාර්තාකරණ ආකෘතිමය රාමු එකකට වඩා යොමු කිරීම.**

අ13. සමහර අවස්ථාවලදී මූල්‍ය ප්‍රකාශ, මූල්‍ය වාර්තාකරණ ආකෘතිමය රාමු දෙකක් සමඟ අනුකූලව ඒවා පිළියෙල කළ බව නියෝජනය විය හැකිය. (උදා. ජාතික ආකෘතිමය රාමුව සහ $IFRS_S$) මෙයට හේතු විය හැක්කේ, මූල්‍ය ප්‍රකාශ පිළියෙල කිරීමට කළමනාකාරීත්ව ආකෘතිමය රාමු දෙකම තෝරා ගැනීම නිසා හෝ එසේ කිරීම අවශ්‍යවීම නිසා විය හැකි අතර, එවැනි අවස්ථාවක දෙකම අදාළ මූල්‍ය වාර්තාකරණ ආකෘතිමය රාමුවේ. එවැනි විස්තරයක් යෝග්‍ය වන්නේ, මූල්‍ය ප්‍රකාශ එක් එක් ආකෘතිමය රාමු සමඟ තනි තනිව අනුකූල වන්නේ නම් පමණි. ආකෘතිමය රාමු දෙකම සමඟ අනුකූලව පිළියෙල කර ඇති ලෙස සැළකීමට නම්, මූල්‍ය ප්‍රකාශ ආකෘතිමය රාමු දෙක සමඟ එකවරම අනුකූල වීම අවශ්‍ය කරන අතර සංසන්දනය කිරීමේ ප්‍රකාශයන් සඳහා කිසිම අවශ්‍යතාවයක් නොතිබිය යුතුය. ප්‍රායෝගිකව ගත්කළ අධිකරණ බලප්‍රදේශය අන් ආකෘතිමය රාමුව (උදා. IFRS) එය ස්වකීය ජාතික ආකෘතිමය රාමුවක් ලෙස පිළිගෙන ඇත්නම් මිස හෝ එය සමඟ අනුකූල වීමට සඳහාවන සියලු බාධක ඉවත් කර තිබේ නම් හැර එකවර ආකෘතිමය රාමු දෙකක් සමඟ අනුකූලවීම බොහෝදුරට සිදුවිය නොහැක.

අ14. එක මූල්‍ය වාර්තාකරණ ආකෘතිමය රාමුවක් සමඟ අනුකූලව පිළියෙල කළ මූල්‍ය ප්‍රකාශ, සහ එම මූල්‍ය ප්‍රකාශවලට වෙනත් ආකෘතිමය රාමුවක් යටතේ පෙන්විය යුතු එම ප්‍රතිඵල සංසන්දනය කරමින් සටහනක් හෝ පරිපූරක ප්‍රකාශයන් අඩංගු වනවිට එම මූල්‍ය ප්‍රකාශ පිළියෙල කර ඇත්තේ එම වෙනත් ආකෘතිමය රාමුවට අනුකූලව නොවේ. මෙයට හේතු වන්නේ මූල්‍ය ප්‍රකාශවල එම වෙනත් ආකෘතිමය රාමුව මගින් අවශ්‍ය කරන ආකාරයට වන සියලු තොරතුරු අඩංගු නොවන නිසාය.

අ15. කෙසේ වෙතත්, මූල්‍ය ප්‍රකාශ එක අදාළ මූල්‍ය වාර්තාකරණ ආකෘතිමය රාමුවක් සමඟ අනුකූලව පිළියෙල කළ හැකි අතර, එයට අමතරව මූල්‍ය ප්‍රකාශවලට සටහන් කළ වෙනත් ආකෘතිමය රාමුවක් සමඟ අනුකූල වූ මූල්‍ය ප්‍රකාශවල ප්‍රමාණය විස්තර කළ හැකිය. (උදා. ජාතික ආකෘතිමය රාමුව සමඟ අනුකූලව පිළියෙල කළ, මූල්‍ය ප්‍රකාශ, එය එසේම $IFRS_S$ සමඟ ඒවා අනුකූල වූ ප්‍රමාණය විස්තර කරයි. එවැනි විස්තරයක් 54 වන ඡේදය තුළ සාකච්ඡා කළ පරිදි සහ මූල්‍ය ප්‍රකාශ වලින් පැහැදිලිව වෙන් කොට හඳුනාගත නොහැකි නම් විගණකගේ වාර්තාව මගින් ආවරණය කරන පරිපූරක මූල්‍ය තොරතුරු ස්ථාපනය විය හැකිය.

**මතයේ ස්වරූපය**

අ16. මූල්‍ය ප්‍රකාශ සාධාරණ ඉදිරිපත් කිරීමේ ආකෘතිමය රාමුවේ අවශ්‍යතාවයන් සමඟ අනුකූලව පිළියෙල කර ඇති වුවත්, සාධාරණ ඉදිරිපත් කිරීම අත් නොකරගන්නා අවස්ථා ද තිබිය හැකිය. අවස්ථාව මෙය වන විට, මූල්‍ය ප්‍රකාශවල ආකෘතිමය රාමුව මගින් විශේෂිතව අවශ්‍යකරණ එම හෙළිදරව් කිරීම් ඉක්මවා යන අතිරේක හෙළිදරව් කිරීම් මූල්‍ය ප්‍රකාශ තුළ ඇතුළත් කිරීමට හෝ ඉතා විරල තත්ත්වයන්හිදී මූල්‍ය ප්‍රකාශවල සාධාරණ ඉදිරිපත් කිරීම අත්කර ගැනීමට හැකිවනු පිණිස ආකෘතිමය රාමුව තුළ වන අවශ්‍යතාවයකින් වෙනස්ව ක්‍රියා කිරීමට කළමනාකාරීත්වයට සිදු විය හැක. (යොමුව: 18 ඡේදය)

අ17. ශ්‍රී.ල.වි.ප්‍ර. 210 සමඟ අනුකූලව, එම ආකෘතිමය රාමුව පිළිගත හැකි ලෙස විගණක නිර්ණය කර ඇති විටක, අනුකූලතා ආකෘතිමය රාමුව සමඟ අනුකූලව පිළියෙල එම මූල්‍ය ප්‍රකාශ නොමඟ යවන සුළු යයි විගණකට සළකා බැලිය හැකි අවස්ථා අතිශයින් දුර්ලභ වේ.[25] (යොමුව: 19 ඡේදය)

**විගණකගේ වාර්තාව (යොමුව: 20 වන ඡේදය)**

අ18. ලිඛිත වාර්තාවක් මගින් දෘඪ පිටපතක් ආකාරයෙන් සහ ඉලෙක්ට්‍රොනික මාධ්‍යයක් භාවිත කර නිකුත් කළ වාර්තා ආවරණය වේ.

අ19. මෙම ශ්‍රී.ල.වි.ප්‍ර. යට වන පරිශිෂ්ඨයේ, 21 - 49 ඡේද තුළ නියම කර ඇති මූලිකාංග අන්තර්ගත කළ මූල්‍ය ප්‍රකාශ මත වන විගණකගේ වාර්තාවන්හි නිදර්ශන අඩංගුවේ. මතය සහ මතය සඳහා පදනම කොටස් හැර, විගණකගේ වාර්තාවේ මූලිකාංගයන්හි අනුපිළිවෙල සඳහා අවශ්‍යතාවයන් මෙම ශ්‍රී.ල.වි.ප්‍ර. ස්ථාපිත කරන්නේ නැත. කෙසේ වෙතත් මෙම ශ්‍රී.ල.වි.ප්‍ර. යෙන් විශේෂිත ශීර්ෂ භාවිත කිරීම අවශ්‍ය කරන අතර, එයින් අදහස් කරන්නේ, ශ්‍රී.ල.වි.ප්‍ර. සමඟ අනුකූලව මෙහෙයවන ලද විගණනවලට යොමු කරන විගණකගේ වාර්තා වඩාත් හඳුනාගත හැකි ආකාරයට සකස්කර ගැනීමේදී සහය වීමටය. විශේෂයෙන්, විගණකගේ වාර්තාවක මූලිකාංග ඉදිරිපත් කර ඇති ආකාරය මෙම ශ්‍රී.ල.වි.ප්‍ර. යේ ඇති පරිශිෂ්ඨය තුළ දී ඇති නිදර්ශනාත්මක විගණක වාර්තාවලින් වෙනස්වන අවස්ථාවන්හිදීය.

---

[25] ශ්‍රී.ල.වි.ප්‍ර. 210, *විගණන කාර්හාරයේ නියමයන් සමඟ එකඟවීම.* 6(අ) ඡේදය

***ශ්‍රී ලංකා විගණන ප්‍රමිත සමග අනුකූලව මෙහෙයවන ලද විගණන සඳහා විගණකගේ වාර්තාව***

**සිරස්තලය (යොමුව: 21 වන ඡේදය)**

අ20. වාර්තාව ස්වාධීන විගණකවරයෙකුගේ වාර්තා ලෙස සඳහන්වන සිරස්තලයක්, උදාහරණ ලෙස "ස්වාධීන විගණකගේ වාර්තාව" වෙනත් අය විසින් නිකුත් කරනු ලබන වාර්තාවලින් වෙන්කොට හඳුනාගන්නා ස්වාධීන විගණකගේ වාර්තාව.

**ඇමතුම ලබන්නා (යොමුව: 22 වන ඡේදය)**

අ21. නීතිය, රෙගුලාසි හෝ කාර්යභාරයේ නියමයන් එම විශේෂ අධිකරණ බලප්‍රදේශය තුළ විගණකගේ වාර්තාව කවරෙක් හට ඇමතිය යුතු දැයි නියම කර තිබිය හැකිය. විගණකගේ වාර්තාව සාමාන්‍යයෙන් ඇමතුම් කරන්නේ එම වාර්තාව පිළියෙල කරන්නේ කවුරුන් සඳහාද යන අය වෙතය. මෙය බොහෝවිට එක්කෝ කොටස් හිමියනට හෝ විගණනය කරනු ලැබූ මූල්‍ය ප්‍රකාශ අයත් අස්තිත්ත්වයේ පාලනය පිළිබඳ වගකිව යුතු අය වෙතටය.

**විගණකගේ මතය (යොමුව: 24 - 26 ඡේද)**

**විගණනය කරන ලද මූල්‍ය ප්‍රකාශවලට යොමු කිරීම**

අ22. උදාහරණ ලෙස, [අදාළ මූල්‍ය වාර්තාකරණ ආකෘතිමය රාමුව මගින් අවශ්‍යකරන සම්පූර්ණ මූල්‍ය ප්‍රකාශ කට්ටලයකින් සමන්විත සෑම මූල්‍ය ප්‍රකාශයක සිරස්තලය සඳහන් කළ, එක් එක් මූල්‍ය ප්‍රකාශ මගින් ආවරණය වන කාලපරිච්ඡේදය හෝ දිනය නියම කර] වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවල සාරාංශයක් ඇතුළුව මූල්‍ය ප්‍රකාශවලට සටහන් වලින් සමන්විත වන අස්තිත්ත්වයේ මූල්‍ය ප්‍රකාශ විගණක විගණනය කර ඇති බව, විගණකගේ වාර්තාවේ සඳහන් වේ.

අ23. විගණනය කළ මූල්‍ය ප්‍රකාශවලට, වාර්ෂික වාර්තාව වැනි වෙනත් තොරතුරු අඩංගුවන ලේඛනයක් ඇතුළත් බවට විගණක දැනුවත් වනවිට, ඉදිරිපත් කර ඇති විගණනය කරන ලද මූල්‍ය ප්‍රකාශ මත ඉදිරිපත් කළ ආකාරය පිටු අංක හඳුනා ගැනීමට ඉඩ දෙන්නේ නම් එය විගණක සැළකිල්ලට ගත හැකිය. මෙය පරිශීලකයනට විගණකගේ වාර්තාවට සම්බන්ධිත මූල්‍ය ප්‍රකාශ හඳුනා ගැනීමට උපකාරීවේ.

**"සියළුම ප්‍රමාණාත්මක අංගයන්ගෙන් සාධාරණ ලෙස ඉදිරිපත් කරයි" හෝ "සත්‍ය හෝ සාධාරණ දර්ශනයක් පෙන්නුම් කරයි"**

අ24. "සියළු ප්‍රමාණාත්මක අංගයන්ගෙන් සාධාරණ ලෙස ඉදිරිපත් කරයි" සහ "සත්‍ය සහ සාධාරණ දර්ශණයක් පෙන්නුම් කරයි" යන වැකිකඩ එක හා සමාන ලෙස සැලකේ. වැකිකඩ "සියළුම ප්‍රමාණාත්මක අංගයන්ගෙන් සාධාරණ ලෙස ඉදිරිපත් කරයි" හෝ "සත්‍ය හා සාධාරණ දර්ශනයක් පෙන්නුම් කරයි" යන ලෙස භාවිත කිරීම යම් විශේෂ අධිකරණ බලප්‍රදේශයක මූල්‍ය ප්‍රකාශ විගණනය කිරීම සඳහා යම් අධිකරණ බලප්‍රදේශයක පාලනය වන නීතිය හෝ රෙගුලාසි මගින් හෝ එම අධිකරණ බලප්‍රදේශයේ පොදුවේ පිළිගත් පරිචයන් මගින් නීර්ණය කෙරේ. වෙනත් වචන පෙළගැස්මක් භාවිත කිරීමට නීතිය හෝ රෙගුලාසි මගින් අවශ්‍ය කරන විට, සාධාරණ ඉදිරිපත් කිරීමේ ආකෘතිමය රාමුවක් සමඟ අනුකූලව පිළියෙල කළ මූල්‍ය ප්‍රකාශයන්හි සාධාරණ ඉදිරිපත් කිරීම විගණකට අගය කිරීම සඳහා මෙම ශ්‍රී.ල.වි.ප්‍ර. යේ 14 වන ඡේදයේ අවශ්‍යතාවයන්ට බලනොපායි.

අ25. විගණක විකරණය නොකළ මතයක් ප්‍රකාශ කරන විට විගණක මතයට සම්බන්ධිතව කලින් සඳහන් කළ පැහැදිලි කිරීම් සමඟ "හෝ" "යටත්ව" ලෙස වැනි වැකිකඩ භාවිතය යෝග්‍ය නොවේ. එසේ වන්නේ ඒවා කොන්දේසියක් මත රැඳුන මතයක් හෝ මතය දුර්වල කිරීමක් හෝ මතය විකරණය කිරීමක් ඉඟිකරන බැවිනි.

**මූල්‍ය ප්‍රකාශවල සහ ඒවායේ ඉදිරිපත් කළ කරුණුවල විස්තරයක්.**

අ26. අදාළ මූල්‍ය වාර්තාකරණ ආකෘතිමය රාමුව මගින්, නිර්වචනය කළ ලෙස විගණකගේ මතයෙන් සම්පූර්ණ මූල්‍ය ප්‍රකාශ කට්ටලයක් ආවරණය වේ. උදාහරණ වශයෙන්, බොහෝ පොදු අරමුණු ආකෘතිමය රාමු සඳහා, මූල්‍ය ප්‍රකාශවලට ඇතුළත් විය හැක්කේ. මූල්‍ය තත්ත්ව ප්‍රකාශයක් විස්තීර්ණ ආදායම් ප්‍රකාශයක් ස්කන්ධය වෙනස් වීමේ ප්‍රකාශයක්, මුදල් ප්‍රවාහ ප්‍රකාශයක් සහ සම්බන්ධිත සටහන්ය, ඒවා සාමාන්‍යයෙන් සමන්විත වන්නේ වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ වෙනත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකිනි. සමහර අධිකරණ බලප්‍රදේශයන්හි අතිරේක තොරතුරුද එසේම මූල්‍ය ප්‍රකාශවල වැදගත් කොටසක් ලෙස සළකා බැලිය හැකිය.

අ27. සාධාරණ ඉදිරිපත් කිරීමේ ආකෘතිමය රාමුවක් සමඟ අනුකූලව පිළියෙල කළ මූල්‍ය ප්‍රකාශ සම්බන්ධයෙන් වන අවස්ථාවක, විගණකගේ මතයෙන් සඳහන් වන්නේ මූල්‍ය ප්‍රකාශ සියලුම ප්‍රමාණාත්මක අංගයන්ගෙන් සාධාරණ ලෙස ඉදිරිපත් කරයි හෝ, මූල්‍ය ප්‍රකාශවලින් ඉදිරිපත් කිරීමට සැළසුම්කළ කරුණු වල සත්‍ය හා සාධාරණ දර්ශනයක් පෙන්නුම් කරයි යන්නයි. උදාහරණ ලෙස ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කළ මූල්‍ය ප්‍රකාශ යන්හි වන අවස්ථාවකදී මෙම කරුණු වන්නේ, කාලපරිච්ඡේද අවසාන දිනට අස්තිත්ත්වයේ මූල්‍ය තත්ත්වය සහ එම *දිනෙන් අවසන් වූ කාලපරිච්ඡේදය සඳහා අස්තිත්ත්වයේ මූල්‍ය කාර්ය සාධනය සහ මුදල් ප්‍රවාහ* ලෙස වේ. ඒ නිසා වෙන්, [...] අදාළ මූල්‍ය වාර්තාකරණ ආකෘතිමය රාමුව ශ්‍රී ලංකා ගිණුම් ප්‍රමිතවන විට,

ඉහතින් වූ වාක්‍ය තුළ ඇල අකුරු වලින් වන වචන මගින් 25 වන ඡේදයේ සහ මෙම ශ්‍රී.ල.වි.ප්‍ර. යේ වෙනත් තැනක වන වචන ආදේශ කිරීමට අපේක්ෂා කෙරේ හෝ වෙනත් මූල්‍ය වාර්තාකරණ ආකෘතිමය රාමු අදාළවන අවස්ථාවලදී මූල්‍ය ප්‍රකාශ ඉදිරිපත් කිරීමට සැළසුම්කළ එම කරුණ විස්තර කිරීමේ වචන මගින් ආදේශ කිරීම මගිනි.

**අදාළ මූල්‍ය වාර්තාකරණ ආකෘතිමය රාමුවේ විස්තරයක් සහ එයින් විගණකගේ මතයට කෙසේ බලපා හැකිද.**

අ28. විගණකගේ මතය තුළ අදාළ මූල්‍ය වාර්තාකරණ ආකෘතිමය රාමුව හඳුනා ගැනීම මගින් අපේක්ෂා කරන්නේ, විගණකගේ මතය ප්‍රකාශකළ සම්බන්ධය තුළ විගණකගේ වාර්තාව පිළිබඳව පරිශීලකයන්ට උපදෙස් දීම සඳහාය; එයින් 14 වන ඡේදයෙන් අවශ්‍යකරන ඇගයීම සීමා කිරීමට අපේක්ෂා නොකෙරේ. අදාළ මූල්‍ය වාර්තාකරණය ආකෘතිමය රාමුවේ එවැනි භාවිතයන් හඳුනාගන්නේ පහත දැක්වෙන ලෙසය.

"....... ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත සමඟ අනුකූලව" හෝ

"....... අධිකරණ බලප්‍රදේශය තුළ පොදුවේ පිළිගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සමඟ අනුකූලව..."

අ29. අදාළ මූල්‍ය වාර්තා කරන ආකෘතිමය රාමුව මගින්, මූල්‍ය වාර්තාකරණ ප්‍රමිති සහ නෛතික හෝ නියාමන අවශ්‍යතාවයන් ආවරණයවන විට ආකෘතිමය රාමුව එවැනි භාෂිතයන් හඳුනා ගන්නේ "....... ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත සහ අධිකරණ බලප්‍රදේශයේ සංස්ථා පනතේ අවශ්‍යතාවයන් සමඟ අනුකූලව." යන ලෙසය. මූල්‍ය වාර්තාකරණ ප්‍රමිති සහ ව්‍යවස්ථාදායක හෝ නියාමන අවශ්‍යතාවයන් අතර ගැටුම් ඇති තත්ත්වයන්හිදී ඒ පිළිබඳව ශ්‍රී.ල.වි.ප්‍ර. 210 කටයුතු කරයි.[26]

අ30. අ13 වන ඡේදය තුළ සඳහන් කළ පරිදි, මූල්‍ය ප්‍රකාශ, මූල්‍ය වාර්තාකරණ ආකෘතිමය රාමු දෙකක් සමඟ අනුකූලව පිළියෙල කළ හැකිය; එබැවින් එම දෙකම අදාළ මූල්‍ය වාර්තාකරණ ආකෘතිමය රාමුවේ, ඒ අනුව මූල්‍ය ප්‍රකාශ මත විගණකගේ මතය සකස් කිරීමේදී එක්, එක් ආකෘතිමය රාමුව වෙන් වෙන්ව සැලකිල්ලට ගැනෙන අතර 25 - 27 ඡේද සමඟ අනුකූලව විගණකගේ මතය ආකෘතිමය රාමු දෙකටම යොමුකරන්නේ පහත දැක්වෙන ලෙසය;

(අ) එක්, එක් ආකෘතිමය රාමු සමඟ මූල්‍ය ප්‍රකාශ අනුකූල වන්නේ, තනි, තනිව නම්, මත දෙකක් ප්‍රකාශ කෙරේ; එනම්, මූල්‍ය ප්‍රකාශ පිළියෙල කර ඇත්තේ අදාළ මූල්‍ය වාර්තාකරණ ආකෘතිමය රාමුවලින් එකක් සමඟ අනුකූලවය. (උදා. ජාතික ආකෘතිමය රාමුව) සහ අදාළ අනෙක් මූල්‍ය වාර්තාකරණ ආකෘතිමය රාමුව (IFRS) සමඟ අනුකූලව පිළියෙල කළ මූල්‍ය ප්‍රකාශ මත, මතය මෙම මත තනි වාක්‍යකින් හෝ වෙන් වෙන්ව හෝ ප්‍රකාශ කළ හැකිය. X අධිකරණ බලප්‍රදේශයේ පොදුවේ පිළිගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ $IFRS_S$ සමඟ අනුකූලව [.......] පිළියෙල කළ මූල්‍ය ප්‍රකාශ සියලු ප්‍රමාණාත්මක අංගයන්ගේ සාධාරණ ලෙස ඉදිරිපත් කරයි)

(ආ) මූල්‍ය ප්‍රකාශ, ආකෘතිමය රාමුවලින් එකක් සමඟ අනුකූලව එහෙත් අනෙක් ආකෘතිමය රාමුව සමඟ අනුකූලවීමට අපොහොසත් වී ඇති අවස්ථාවකදී එක ආකෘතිමය රාමුවක් සමඟ අනුකූලව පිළියෙල කළ එම මූල්‍ය ප්‍රකාශ සඳහා විකරණය නොකළ මතයක් දිය හැකිය. (උදා. ජාතික ආකෘතිමය රාමුව) එහෙත් ශ්‍රී.ල.වි.ප්‍ර. 705 (සංශෝධිත) සමඟ අනුකූලව අනෙක් ආකෘතිමය රාමුවට (උදා. - $IFRS_S$) සම්බන්ධයෙන් විකරණය කළ මතයක් දිය හැකිය.

අ31. අ 15 ඡේදය තුළ සඳහන් කර ඇති පරිදි, මූල්‍ය ප්‍රකාශ අදාළ මූල්‍ය වාර්තාකරණ ආකෘතිමය රාමුව සමඟ අනුකූලවීම නියෝජනය කරනවා විය හැකිය, සහ එයට අමතරව වෙනත් මූල්‍ය වාර්තාකරණ ආකෘතිමය රාමුවක් සමඟ අනුකූලවීමේ ප්‍රමාණය හෙළිදරව් කරයි. මූල්‍ය ප්‍රකාශ වලින් එය පැහැදිලිව වෙන් කොට හඳුනාගත නොහැකි නම්, එවැනි පරිපූරක තොරතුරු විගණකගේ මතය මගින් ආවරණය වේ. (53 - 54 ඡේද සහ අ78 - අ84 ඡේද සම්බන්ධිත භාවිත කිරීමේ කරුණු බලන්න. ඒ අනුව,

(අ) අනෙක් ආකෘතිමය රාමුව සමඟ අනුකූලවීම හෙළිදරව් කිරීම නොමඟ යවනසුළු නම්, ශ්‍රී.ල.වි.ප්‍ර. 705 (සංශෝධිත) සමඟ අනුකූලව විකරණය කළ මතයක් ප්‍රකාශ කෙරේ.

(ආ) හෙළිදරව් කිරීම නොමඟ යවන සුළු නොවන්නේ නම්, මූල්‍ය ප්‍රකාශ අවබෝධ කර ගැනීමට එය අවශ්‍ය වන තරමට පරිශීලකයනට වැදගත් බව විගණක විනිශ්චය කරන විට හෙළිදරව් කිරීම වලට අවධාණය යොමු කරමින් ශ්‍රී.ල.වි.ප්‍ර. 706 (සංශෝධිත) සමඟ අනුකූලව කරුණ අවධාරණය කිරීමේ ඡේදය එක් කෙරේ.

[26] ශ්‍රී.ල.වි.ප්‍ර. 210, 18 වන ඡේදය

**මතය සඳහා පදනම (යොමුවඃ 28 වන ඡේදය)**

අ32. මතය සඳහා වන පදනම කොටස විගණකගේ මතය පිළිබඳව වැදගත් සම්බන්ධයක් ලබාදෙයි. ඒ අනුව විගණකගේ වාර්තාව තුළ මතය කොටසට වහාම මතය සඳහා පදනම කොටස පසුපසව වියයුතු බව ශ්‍රී.ල.වි.ප්‍ර. යෙන් අවශ්‍ය කෙරේ.

අ33. භාවිතකළ ප්‍රමිතවලට යොමු කිරීම මගින් විගණනය ස්ථාපිත ප්‍රමිත සමඟ අනුකූලව මෙහෙයවන ලද බව විගණකගේ වාර්තාව පරිශීලකයනට දන්වයි.

**අදාළ චර්යාධර්ම අවශ්‍යතාවයන් (යොමුවඃ 28 (ඇ) ඡේදය)**

අ34. අදාළ ආචාර ධර්ම අවශ්‍යතාවයන්හි අධිකරණ බලප්‍රදේශයේ සම්භවය හඳුනා ගැනීම විශේෂ විගණන කාර්යභාරයකට සම්බන්ධිත එම අවශ්‍යතාවයන්හි විනිවිදභාවය ඉහළ නංවයි. අදාළ ආචාර ධර්මීය අවශ්‍යතාවයන්හි සාමාන්‍යයෙන් අඩංගුවන්නේ මූල්‍ය ප්‍රකාශ විගණනයකට සම්බන්ධිත ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනයේ ආචාරධර්ම සංග්‍රහයේ A සහ B කොටස් හා එක්ව වඩාත් සීමාවලට යටත් ජාතික අවශ්‍යතාවයන් බව ශ්‍රී.ල.වි.ප්‍ර. 200 පැහැදිලි කරයි.[27] අදාළ ආචාර ධර්ම අවශ්‍යතාවයන් වලට ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනයේ චර්යා ධර්ම සංග්‍රහයේ ඇති දෑ ඇතුළත් වන විට, ප්‍රකාශය එසේම ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනයේ චර්යා ධර්ම වලට යොමු කෙරේ. විගණනයට සම්බන්ධ සියලුම චර්යා ධර්ම අවශ්‍යතාවයන් ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනයේ චර්යාධර්ම සංග්‍රහයේ අඩංගු වන්නේ නම් අධිකරණ බලප්‍රදේශයක සම්භවය හඳුනා ගැනීම අවශ්‍ය නොවේ.

අ35. සමහර අධිකරණ බලප්‍රදේශයන්හි, අදාළ චර්යා ධර්ම අවශ්‍යතාවයන් වෙනස් මූලාශ්‍ර ගණනාවක් තුළ පැවතිය හැක. අචාර ධර්ම සංග්‍රහ(ය) සහ නීතිය සහ රෙගුලාසි ඇතුළත අතිරේක රීති සහ අවශ්‍යතාවයන් වැනි දෑ. ස්වාධීනත්වය සහ වෙනත් අදාළ චර්යා ධර්ම අවශ්‍යතාවයන් සීමිත සංඛ්‍යාවක මූලාශ්‍රවල අඩංගුවන විට, විගණක අදාළ මූලාශ්‍ර(ය) නම් කිරීමට තෝරා ගැනීම (උදා. ධර්ම සංග්‍රහයේ නම අධිකරණ බලප්‍රදේශයේ අදාළ රීති හෝ රෙගුලාසි), හෝ පහසුවෙන් තේරුම්ගත හැකි සහ එම මූලාශ්‍ර යෝග්‍ය පරිදි සාරාංශ ගතකරන පදයකට යොමු කිරීම (උදා. X අධිකරණ බලප්‍රදේශයේ පුද්ගලික අස්තිත්ත්වයන්හි විගණන සඳහා ස්වාධීනත්වයේ අවශ්‍යතාවයන්)

අ36. මූල්‍ය ප්‍රකාශ විගණනයට ව්‍යවහාර වන, ස්වාධීනත්වයට අදාළ වන දෑ ඇතුළුව, අදාළ චර්යා ධර්ම අවශ්‍යතාවයන්හි මූලාශ්‍රය පිළිබඳව වඩාත් නිශ්චිත තොරතුරු, විගණකට විගණකගේ වාර්තාවේ ලබාදීමට, නීතිය හෝ රෙගුලාසි, ශ්‍රී ලංකා විගණන ප්‍රමිත හෝ විගණන කාර්යභාරයේ නියමයන් ගෙන් අවශ්‍ය විය හැකිය.

අ37. මූල්‍ය ප්‍රකාශ විගණනයට සම්බන්ධිතව අදාළ ආචාර ධර්මය අවශ්‍යතාවයන්හි විවිධ මූලාශ්‍ර ඇති විටක විගණකගේ වාර්තාව තුළ ඇතුළත් කළ යුතු තොරතුරු වල යෝග්‍ය ප්‍රමාණය නිර්ණය කිරීමේදී, සැළකිල්ලට ගතයුතු වැදගත් දෙයක් වන්නේ, විගණකගේ වාර්තාව තුළ වෙනත් ප්‍රයෝජනවත් තොරතුරු පැහැදිලි කිරීමේ අවදානමට එරෙහිව විනිවිදභාවය සංතුලනය කිරීමය.

සමූහ විගණන සඳහා විශේෂිතව සැළකිල්ලට ගැනීම

අ38. සමූහ විගණන තුළදී ඒවා ස්වාධීනත්වයට අදාළ දෑ ඇතුළුව අදාළ ආචාරධර්ම අවශ්‍යතාවයන්හි විවිධ මූලාශ්‍ර ඇති විටක විගණකගේ වාර්තාවේ අධිකරණ බලප්‍රදේශයේ වන යොමු කිරීම සාමාන්‍යයෙන් සම්බන්ධිත වන්නේ සමූහ කාර්යභාර කණ්ඩායමට අදාළ ආචාර ධර්මීය අවශ්‍යතාවයන්ටය. මෙය වීමට හේතු වන්නේ සමූහ විගණනයක, සංරචක විගණකද එලෙසම, සමූහ විගණනයට අදාළ වන ආචාර ධර්ම අවශ්‍යතාවයනට යටත්වන නිසාය.[28]

අ39. සංරචක විගණකවරු ඇතුළුව, විගණකවරුන් සඳහා නිශ්චිත ස්වාධීනත්වයේ සහ චර්යා ධර්මීය අවශ්‍යතාවයන් ශ්‍රී.ල.වි.ප්‍ර. ස්ථාපනය කරන්නේ නැත, සහ සඳහන් කළ පරිදි, සමූහ කාර්යභාරයේ නියුතු කණ්ඩායම විෂයවන ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනයේ ආචාර ධර්මය සංග්‍රහයේ ස්වාධීනත්වයේ අවශ්‍යතාවයන් හෝ වෙනත් චර්යා ධර්ම අවශ්‍යතාවයන් පුළුල් කරන්නේ හෝ අන් වශයෙන් මැදිහත් වී අක්‍රිය කරන්නේ නැත. සමූහ කාර්යභාරයේ නියුතු කණ්ඩායමට අදාළ එක හා සමාන ස්වාධීනත්වයේ විශේෂිත අවශ්‍යතාවයන් සියලු තත්ත්වයන්හිදී සංරචක විගණක යටතේ වීම අවශ්‍යයි. ශ්‍රී.ල.වි.ප්‍ර. සඳහන් කරන්නේ නැත. මෙහි ප්‍රතිඵලයක් ලෙස අදාළ ආචාර ධර්මීය අවශ්‍යතාවයන්, ස්වාධීනත්වයට සම්බන්ධිත දෑ ඇතුලුව සමූහ විගණන තත්ත්වයකදී සංකීර්ණ විය හැකිය. සමූහ විගණනයකට අදාළවන ස්වාධීනත්වයේ අවශ්‍යතාවයන් සංරචක විගණක ඉෂ්ඨ

[27] ශ්‍රී.ල.වි.ප්‍ර. 200, අ16 ඡේදය
[28] ශ්‍රී.ල.වි.ප්‍ර. 600, අ 37 ඡේදය

නොකර ගන්නා එවැනි අවස්ථාවන් ඇතුළුව, සමූහ විගණනයක් සඳහා සංරචකයක මූල්‍ය තොරතුරු මත වැඩ ඉටු කරන විගණකවරුන් සඳහා උපදෙශ ශ්‍රී.ල.වි.ප්‍ර. 600 න් ලබා දෙයි.[29]

**ප්‍රධාන විගණන කරුණු (යොමුව: 31 වන ඡේදය)**

අ40. ලැයිස්තුගත අස්තිත්ත්ව හැර වෙනත් අස්තිත්ත්වයන්හි විගණන සඳහා ප්‍රධාන විගණන කරුණු සන්නිවේදනය කිරීම නීතිය හෝ රෙගුලාසි මගින් අවශ්‍ය කෙරේ. උදාහරණ ලෙස පොදු යහපත සඳහාවන අස්තිත්ත්ව ලෙස නීතියෙන් හෝ රෙගුලාසි වලින් ඒවායේ ස්වභාවය විස්තර කර ඇති අස්තිත්ත්ව.

අ41. සැලකිය යුතු අන්දමේ පොදු යහපත සඳහා විය හැකි අස්තිත්ත්ව ඇතුළුව වෙනත් අස්තිත්ත්ව සඳහා ප්‍රධාන විගණන කරුණු සන්නිවේදනය කිරීමට විගණක එසේම තීරණය කළ හැකිය. උදාහරණ ලෙස ඒවාට විශාල සංඛ්‍යාවක සහ පුළුල් පරාසයක පාර්ශවකරුවන් ඇති නිසා සහ ව්‍යාපාරයේ ස්වභාවය සහ විශාලත්වය සැලකිල්ලට ගනිමින් එවැනි අස්තිත්ත්ව සඳහා උදාහරණ වලට ඇතුළත් විය හැක්කේ මූල්‍ය ආයතන (බැංකු, රක්ෂණ සමාගම් සහ විශ්‍රාම අරමුල්) සහ පුණ්‍ය ආයතන වැනි වෙනත් අස්තිත්ත්ව.

අ42. යෝග්‍ය වන පරිදි විගණන කාර්යභාරයේ නියමයන් කළමනාකාරිත්වය සහ පාලනය පිළිබඳව වගකිව යුතු අය සමඟ විගණකට එකඟවීම සහ අස්තිත්ත්වය සඳහා විගණන කාර්යභාරයේ නියමයන් එකඟවීමේදී එය රඳා පවතින්නේ පාලනය පිළිබඳ අස්තිත්ත්වයේ එකඟවීම් සහ අදාළ නීතිය හෝ රෙගුලාසි පිළිබඳව කළමනාකාරිත්වය සහ පාලනය පිළිබඳව වගකිව යුතු අයවලුන්ගේ භූමිකාව පැහැදිලි කිරීම බව ශ්‍රී.ල.වි.ප්‍ර. 210 න් අවශ්‍ය කෙරේ.[30] විගණන කාර්යභාරයේ ලිපියේ හෝ වෙනත් සුදුසු ආකාරයේ ලිඛිත එකඟවීමක විගණක විසින් නිකුත් කළ යුතු යම් වාර්තාවන්හි අපේක්ෂා කරන ස්වරූපය සහ අන්තර්ගතයට යොමු කිරීම ඇතුළත් කිරීමට එලෙසම ශ්‍රී.ල.වි.ප්‍ර. 210 න් අවශ්‍ය කෙරේ.[31] විගණකට වෙනත් ලෙසකින් ප්‍රධාන විගණන කරුණු සන්නිවේදනය කිරීමට අවශ්‍ය නොකරන විට විගණකගේ වාර්තාවේ ප්‍රධාන විගණක කරුණු සන්නිවේදනය කිරීමේ හැකියාවට, විගණන කාර්යභාරයේ නියමයන් අනුව යොමු කිරීමක් කිරීම විගණක සඳහා එය උපකාරී විය හැකි බව සහ සමහර අධිකරණ බලප්‍රදේශයන්හි එසේ කිරීමේ හැකියාව රඳවා ගැනීම පිණිස එවැනි හැකියාවකට යොමු කිරීම ඇතුළත් කිරීම විගණකට අවශ්‍යවිය හැකිබව ශ්‍රී.ල.වි.ප්‍ර. 210 න් පැහැදිලි කෙරේ.[32]

**රාජ්‍ය අංශයේ අස්තිත්ත්වයනට විශේෂිත වූ සැලකිල්ලට ගැනීම්**

අ43. ලැයිස්තුගත අස්තිත්ත්ව රාජ්‍ය අංශය තුළ සුලබ නොවේ. කෙසේ වෙතත් රාජ්‍ය අංශයේ අස්තිත්ත්ව ඒවායේ විශාලත්වය, සංකීර්ණතාවය හෝ පොදු අයිතිය නිසා ඒවා වැදගත් විය හැකිය. එවැනි අවස්ථාවන්හිදී රාජ්‍ය අංශයේ විගණකවරයෙක් නීතිය හෝ රෙගුලාසි මගින් අවශ්‍ය වියහැකි හෝ අන් ආකාරයකින් ප්‍රධාන විගණන කරුණු විගණකගේ වාර්තාවේ සන්නිවේදනය කිරීමට තීරණය කළ හැකිය.

**මූල්‍ය ප්‍රකාශ සඳහා වගකීම (යොමුව: 33 - 34 ඡේද)**

අ44. කළමනාකාරීත්වයේ සහ යෝග්‍යවන පරිදි පාලනය පිළිබඳව වගකිවයුතු අය ශ්‍රී.ල.වි.ප්‍ර. සමඟ අනුකූලව විගණනයක් මෙහෙයවීමට සම්බන්ධිත වගකීම්වල පූර්වාධාවය (අනුමානයකට පාදක කරගත් පූර්ව කියමන) ශ්‍රී.ල.වි.ප්‍ර. 200 පැහැදිලි කරයි.[33] අදාළ මූල්‍ය වාර්තාකරණ ආකෘතිමය රාමුව සමඟ අනුකූලව අදාළවන පරිදි ඒවායේ සාධාරණ ඉදිරිපත් කිරීම ඇතුළුව මූල්‍ය ප්‍රකාශ පිළියෙල කිරීම් සඳහා වගකීම භාර ගන්නේ කළමනාකාරීත්වය සහ යෝග්‍යවන අවස්ථාවලදී පාලනය පිළිබඳව වගකිව යුතු අයයි. වංචා හෝ වැරදි හෝ නිසා වේවා ප්‍රමාණාත්මක අවප්‍රකාශවලින් තොරව මූල්‍ය ප්‍රකාශ පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍යයයි නිර්ණය කළ එවැනි අභ්‍යන්තර පාලන සඳහා වගකීමද එලෙසම කළමනාකාරීත්වය භාරගනී; විගණකගේ වාර්තාව තුළ කළමනාකාරිත්වයේ වගකීම්වල විස්තරය තුළ විගණනය මෙහෙයවීම මත පූර්වාධාවය පරිශීලකයනට පැහැදිලි කිරීමට උපකාරී විය හැකි වගකීම් හා දෙකටම යොමු කිරීම ඇතුළත් ය. පාලනය පිළිබඳව වගකිව යුතු අය විස්තර කිරීමට අස්තිත්ත්වය මගින් සහ අධිකරණ බලප්‍රදේශය හරහා පාලන ව්‍යුහයේ විවිධත්වය පිළිබඳව සාකච්ඡාවක් ලබාදීමට අස්තිත්ත්වය අධීක්ෂණය කිරීම සඳහා වගකීම සහිත පුද්ගලයෙක්(යන්) හෝ සංවිධානයක්(න්) යන පදය ශ්‍රී.ල.වි.ප්‍ර. 260 (සංශෝධිත) භාවිත කරයි.

අ45. විශේෂ අධිකරණ බලප්‍රදේශයක සම්බන්ධනය තුළ හෝ අස්තිත්ත්වයේ ස්වභාවය අනුව, මූල්‍ය ප්‍රකාශ පිළියෙල කිරීමට අදාළ අතිරේක වගකීම පිළිබිඹු කිරීමට 34 - 35 ඡේද තුළ කළමනාකාරීත්වයේ සහ පාලනය පිළිබඳ වගකිවයුතු අයගේ වගකීම්වල විස්තරයක් විගණක එකතු කිරීම යෝග්‍ය වන තත්ත්වයන් තිබිය හැකිය.

---

[29] ශ්‍රී.ල.වි.ප්‍ර. 600, 19 - 20 ඡේද

[30] ශ්‍රී.ල.වි.ප්‍ර. 210, 9 සහ අ22 ඡේද

[31] ශ්‍රී.ල.වි.ප්‍ර. 210, 10 වන ඡේදය

[32] ශ්‍රී.ල.වි.ප්‍ර. 210, අ25 ඡේදය

[33] ශ්‍රී.ල.වි.ප්‍ර. 200, (13 ඒ) ඡේදය

අ46. කාර්යභාරය භාරගැනීමේ ලිපිය තුළ හෝ වෙනත් සුදුසු ආකාරයක ලිඛිත එකඟවීමකින් කළමනාකාරීත්වයේ වගකීම් වලට එකඟ වීමට විගණකට ශ්‍රී.ල.වි.ප්‍ර. 210 න් අවශ්‍ය කෙරේ.[34] මූල්‍ය වාර්තාකරණයට සම්බන්ධිතව කළමනාකාරීත්වයේ සහ යෝග්‍ය වන අවස්ථාවලදී පාලනය පිළිබඳව වගකිව යුතු අයගේ වගකීම් නියම කරන්නේ නීතිය හෝ රෙගුලාසි නම්, එය පැහැදිලි කිරීම මගින්, යම් සුනම්‍යතාවයක් ශ්‍රී.ල.වි.ප්‍ර. 210 ලබා දෙයි. නීතියේ හෝ රෙගුලාසිවල ඇතුළත් කළ වගකීම් විගණකගේ විනිශ්චය අනුව ශ්‍රී.ල.වි.ප්‍ර. 210 හි නියම කර ඇති ඒවාට ඇත්ත වශයෙන් එක හා සමාන බව විගණක නිගමනය කළ හැකිය. එක හා සමාන එවැනි වගකීම් සඳහා කාර්යභාර ගැනීමේ ලිපියේ හෝ වෙනත් සුදුසු ආකාරයේ ලිඛිත එකඟවීමක් තුළ ඒවා විස්තර කිරීමට විගණක නීතියේ හෝ රෙගුලාසිවල ඇති වදන්පෙළක් භාවිත කළ හැකිය. එවැනි අවස්ථාවන්හිදී මෙම ශ්‍රී.ල.වි.ප්‍ර. 34(අ) ඡේදය මගින් අවශ්‍ය කරන පරිදි විගණකගේ වාර්තාවේ වගකීම් විස්තර කිරීමට මෙම වදන් පෙළ එසේම භාවිත කළ හැකිය. වෙනත් තත්ත්වයන් හිදී කාර්යභාරය භාරගැනීමේ ලිපියේ අන්තර්ගත කළ පරිදි නීතියේ හෝ රෙගුලාසිවල ඇතුළත් වදන් පෙළ භාවිත නොකිරීමට විගණක තීරණය නොකළ අවස්ථාවක මෙම ශ්‍රී.ල.වි.ප්‍ර. 34 (අ) ඡේදයේ වදන් පෙළ භාවිත කෙරේ. 34 වන ඡේදය මගින් අවශ්‍ය කරන පරිදි විගණකගේ වාර්තාව තුළ කළමනාකාරීත්වයේ වගකීම්හි විස්තරයක් ඇතුළත් කිරීමට අමතරව එවැනි තොරතුරු කුමකින් ලබාගත හැකිද යන්නට යොමු කිරීමක් ඇතුළත් කිරීම මගින් (උදා. අස්තිත්ත්වයේ වාර්ෂික වාර්තාවෙන් හෝ යෝග්‍ය අධිකාරියක වෙබ් අඩවියක) මෙම වගකීම්වල වඩාත් විස්තරාත්මක විස්තරයකට විගණක අවධානය යොමු කළ හැක.

අ47. සමහර අධිකරණ බලප්‍රදේශවල කළමනාකාරීත්වයේ වගකීම නීතිය හෝ රෙගුලාසි මගින් නියම කරමින් විශේෂිතව ගිණුම්කරණ පොත් සහ වාර්තා හෝ ගිණුම්කරණ පද්ධතියක ප්‍රමාණවත්භාවය පිළිබඳ වගකීම පිළිබඳ අවධානය යොමු කරයි. පොත්, වාර්තා සහ පද්ධති අභ්‍යන්තර පාලනයේ වැදගත් කොටසක් බැවින් (ශ්‍රී.ල.වි.ප්‍ර. 315 (සංශෝධිත)[35] හි නිර්වචනය කර ඇති පරිදි ශ්‍රී.ල.වි.ප්‍ර. 210 හි සහ 34 වන ඡේදයේ විස්තරය ඒවාට විශේෂිත යොමු කිරීමක් නොකරයි.

අ48. අදාළ වන මූල්‍ය ආකෘතිමය රාමුව ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත වන අවස්ථාවකදී 34 (ආ) ඡේදයේ අවශ්‍යතාවයන් ව්‍යවහාර කළ යුත්තේ කෙසේද යන්න මෙම ශ්‍රී.ල.වි.ප්‍ර.යට වන පරිශිෂ්ඨයේ නිදර්ශන ලබාදී ඇත. අදාළ වන මූල්‍ය වාර්තාකරණ ආකෘතිමය රාමුව ලෙස ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත හැර වෙනත් ආකෘතිමය රාමු භාවිත කර ඇත්නම්, මෙම ශ්‍රී.ල.වි.ප්‍ර. ට වන පරිශිෂ්ඨය තුළ වන විදහා දක්වා ඇති නිදර්ශනාත්මක ප්‍රකාශ එවැනි තත්ත්වයන් තුළ වෙනත් මූල්‍ය වාර්තා කරන ආකෘතිමය රාමු ව්‍යවහාර කිරීම පිළිබඳ වීමට සුදුසුවන සේ සකස් කර ගත යුතුය.

**මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය අධීක්ෂණය කිරීම (යොමුව 35 වන ඡේදය)**

අ49. පුද්ගලයන් සියල්ලම නොව එහෙත් කිහිපදෙනෙක් මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය අධීක්ෂණය කිරීම සඳහා සහභාගීවීම මෙන්ම ඒ අය මූල්‍ය ප්‍රකාශ පිළියෙල කිරීමට සම්බන්ධවන විට, අස්තිත්ත්වය එම විශේෂ තත්ත්වයන් පිළිබිඹු වීමට මෙම ශ්‍රී.ල.වි.ප්‍ර. යේ 35 වන ඡේදය මගින් අවශ්‍ය කරන විස්තරය යෝග්‍ය පරිදි වෙනස් කිරීමට අවශ්‍යවිය හැකිය. මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය අධීක්ෂණය කිරීම සඳහා වගකිව යුතු එම පුද්ගලයන්ම, මූල්‍ය වාර්තා පිළියෙල කිරීම සඳහා ද වගකිව යුත්තේ එම පුද්ගලයන් වනවිට අධීක්ෂණ වගකීම් සඳහා යොමු කිරීමක් අවශ්‍ය නොවේ.

**මූල්‍ය ප්‍රකාශ විගණනය සඳහා විගණකගේ වගකීම් (යොමුව 37 - 40 ඡේද)**

අ50. මෙම ශ්‍රී.ල.වි.ප්‍ර. යේ 37 - 40 ඡේද මගින් අවශ්‍ය කරන පරිදි, විගණකගේ වගකීම්වල විස්තරයේ අස්තිත්ත්වයේ නිශ්චිත ස්වභාවය පිළිබිඹු වීමට මනාව සකස් කර තිබිය හැකිය. උදාහරණ ලෙස විගණකගේ වාර්තාව ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශ ආමන්ත්‍රණය කරනවිට මෙය සිදුකළ හැක්කේ කෙසේද යන්න සඳහා වන උදාහරණය මෙම ශ්‍රී.ල.වි.ප්‍ර. යේ පරිශිෂ්ඨයේ 2 වන නිදර්ශනයේ ඇතුළත් ය.

**විගණකගේ අරමුණු (යොමුව: 38 (අ) ඡේදය)**

අ51. විගණකගේ අරමුණු වන්නේ සමස්ථයක් වශයෙන් ගත්කළ මූල්‍ය ප්‍රකාශ වංචා හෝ වැරදි නිසා වුවද ප්‍රමාණාත්මක අවප්‍රකාශ වලින් තොරද යන්න පිළිබඳව සාධාරණ සහතික වීමක් ලබා ගැනීමට සහ විගණකගේ මතය ඇතුළත් විගණකගේ වාර්තාවක් නිකුත් කිරීමට ලෙස වාර්තාව පැහැදිලි කරයි. මෙම අරමුණ මූල්‍ය ප්‍රකාශ පිළියෙල කිරීම සඳහා කළමනාකාරීත්වයේ වගකීම් වලින් අසමාන වේ.

**ප්‍රමාණාත්මක බව විස්තර කිරීම (යොමුව: 38 (ඇ) ඡේදය)**

අ52. ව්‍යවහාර කළ යුතු අදාළ මූල්‍ය වාර්තාකරණ ආකෘතිමය රාමුව ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත වනවිට ප්‍රමාණාත්මකභාවයේ විස්තරයක් ලබා දීමට, 35 (ඇ) ඡේදයේ අවශ්‍යතාවයන් ව්‍යවහාර කළ යුත්තේ කෙසේද

---

[34] ශ්‍රී.ල.වි.ප්‍ර. 210 6 (ආ) (i) - (ii) ඡේද

[35] ශ්‍රී.ල.වි.ප්‍ර. 315 (සංශෝධිත), *අස්තිත්ත්වය සහ එහි පරිසරය අවබෝධ කරගැනීම මගින් ප්‍රමාණාත්මක අවප්‍රකාශයක අවදානම හඳුනා ගැනීම සහ තක්සේරු කිරීම.* 4(ඇ) ඡේදය

යන්න මෙම ශ්‍රී.ල.වි.ප්‍ර.යට වන පරිශිෂ්ඨයේ නිදර්ශන ලබා දී ඇත. අදාලවන මූල්‍ය ආකෘතිමය රාමුව ලෙස ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත හැර වෙනත් ආකෘතිමය රාමු භාවිතා කරන්නේ නම්, මෙම ශ්‍රී.ල.වි.ප්‍ර. තුළවන පරිශිෂ්ඨයේ ඉදිරිපත් කර ඇති නිදර්ශනාත්මක ප්‍රකාශ එවැනි තත්ත්වයන් තුළ වෙනත් මූල්‍ය වාර්තාකරණ ආකෘතිමය රාමු ව්‍යවහාර කිරීම පිළිබිඹු වීමට සුදුසු වන සේ සකස් කරගත යුතුය.

**ශ්‍රී.ල.වි.ප්‍ර. 701 ට සම්බන්ධිත විගණකගේ වගකීම් (යොමුව: 40 (ඇ) ඡේදය)**

අ53. 40 (ඇ) ඡේදය මගින් අවශ්‍ය කරන විගණකගේ වගකීම්හි විස්තරයේ තොරතුරු වලට වඩා වැඩි වූ අතිරේක තොරතුරු ලබාදීම ප්‍රයෝජනවත් බව විගණක තීරණය කළ හැකිය. උදාහරණ ලෙස ශ්‍රී.ල.වි.ප්‍ර. 315 (සංශෝධිත) සමඟ අනුකූලව හඳුනාගත් ප්‍රමාණාත්මක අවප්‍රකාශවල ඉහළ තක්සේරු කළ අවදානම් හෝ සැලකිය යුතු අන්දමේ අවදානම් ඇති ක්ෂේත්‍ර ගණන් ගනිමින් විගණනය ඉටු කිරීමේදී සැලකිය යුතු විගණන අවධානය අවශ්‍ය කරන කරුණු නිර්ණය කිරීමට, ශ්‍රී.ල.වි.ප්‍ර. 701 හි 9 වන ඡේදයේ අවශ්‍යතාවයන් වලට විගණක යොමු කිරීම කළ හැකිය; ඉහළ ඇස්තමේන්තු කිරීමේ අනියතා; සහ කාලපරිච්ඡේදය තුළදී සිදු වූ වැදගත් සිද්ධීන් සහ ගණුදෙනු මත විගණන බලපෑම, ඇති ගිණුම්කරණ ඇස්තමේන්තු හඳුනා ගැනීම ඇතුළුව සැලකිය යුතු කළමණාකාරීත්ව විනිශ්චයක් සම්බන්ධවන මූල්‍ය ප්‍රකාශ තුළවන ක්ෂේත්‍ර වලට සම්බන්ධිත සැලකිය යුතු අන්දමේ විගණක විනිශ්චය.

**මූල්‍ය ප්‍රකාශ විගණනය සඳහා විගණකගේ වගකීම්වල විස්තරය පිහිටි ස්ථානය. (යොමුව: 41, 50 (ඕ) ඡේදය)**

අ54. මෙම ශ්‍රී.ල.වි.ප්‍ර. යේ විගණකගේ වාර්තාවට වන පරිශිෂ්ඨය තුළ 39 - 40 යන ඡේදවලින් අවශ්‍ය කරණ තොරතුරු ඇතුළුව හෝ, නීතියෙන් රෙගුලාසි හෝ ශ්‍රී ලංකා විගණන ප්‍රමිති වලින් පැහැදිලිව අවසර දෙන විට එවැනි තොරතුරු යෝග්‍ය ආයතනයක වෙබ් අඩවියකට අන්තර්ගතය යොමු කිරීම මගින් විගණකගේ වාර්තාවේ අන්තර්ගතය සරල කිරීමේ ප්‍රයෝජනවත් ආකාරයක් විය හැකිය. කෙසේ වෙතත්, ශ්‍රී.ල.වි.ප්‍ර. සමග අනුකූලව මෙහෙයවන විගණනයක පරිශීලකයන්ගේ අපේක්ෂාවන් දැන්වීමට අවශ්‍යකරන තොරතුරු අඩංගු විගණකගේ වගකීම් හි විස්තරයක් නිසා, එවැනි තොරතුරු සඳහා ප්‍රවේශ විය හැක්කේ විගණකගේ වාර්තාවේ කුමන තැන්හිදී යන්න පිළිබඳ සඳහන් කරමින් යොමු කිරීමක් අවශ්‍ය කෙරේ.

**පරිශිෂ්ඨය පිහිටි ස්ථානය (යොමුව: 41 (ආ), 50 (ඕ) ඡේද)**

අ55. පරිශිෂ්ඨයේ පිහිටි තැන විගණකගේ වාර්තාවේ ප්‍රධාන අංගයක් ඇතුළත යෝග්‍ය යොමුකිරීමක් ලබා දෙන්නේ නම් විගණකගේ වාර්තාවට පරිශිෂ්ඨය තුළ මූල්‍ය වාර්තා විගණනය කිරීම සඳහා විගණකගේ වගකීම් විස්තර කරමින් 38-40 ඡේද මගින් අවශ්‍ය කරන ප්‍රකාශයන් ඇතුළත් කිරීමට විගණකට 41 වන ඡේදයෙන් අවසර දේ. පරිශිෂ්ඨයට එවැනි පැහැදිලි කිරීමක් විගණකගේ වාර්තාවේ සිදු කරන්නේ කෙසේද යන්නට නිදර්ශනයක් පහත දක්වේ;

**මූල්‍ය ප්‍රකාශ විගණනය කිරීම සඳහා විගණකගේ වගකීම්**

අපගේ අරමුණු වන්නේ වංචා හෝ වැරදි නිසා හෝ වේවා මූල්‍ය ප්‍රකාශ සමස්ථයක් වශයෙන් ගත් කළ ප්‍රමාණාත්මක අවප්‍රකාශ වලින් තොරද යන්න පිළිබඳව සාධාරණ සහතික වීමක් ලබා ගැනීමට සහ අපගේ මතය අඩංගු විගණකගේ වාර්තාව නිකුත් කිරීමටය. සාධාරණ සහතිකවීම යනු ඉහළ මට්ටමේ සහතිකවීමකි. එහෙත් ප්‍රමාණාත්මක අවප්‍රකාශයක් පවතින සෑමවිටම අනාවරණය කරගනු ලබන බවට, ශ්‍රී.ල.වි.ප්‍ර. සමඟ අනුකූලව මෙහෙයවන ලද එම විගණනයකින් එය සහතික නොකරයි. අවප්‍රකාශ වංචා හෝ වැරදි වලින් පැන නැගිය හැකි අතර ප්‍රමාණාත්මක ලෙස සළකන්නේ තනිව හෝ සමාහාරයක් ලෙස ගත්කළ ඒවා මෙම මූල්‍ය ප්‍රකාශයන්හි පදනම මත පරිශීලකයන් ගත් ආර්ථික තීරණවලට සාධාරණ ලෙස බලපෑම් කිරීමට අපේක්ෂා කරන්නේ නම්ය. මූල්‍ය ප්‍රකාශයන්හි විගණනය සඳහා අපගේ වගකීම්වල තවදුරටත් වන විස්තරයක් මෙම විගණකගේ වාර්තාවේ පරිශිෂ්ඨ X තුළ ඇතුළත් කර ඇත. *[මෙම විස්තරය පිහිටි ස්ථානය පිටු අංකය හෝ වෙනත් නිශ්චිත යොමු කිරීම සඳහන් කරන්න]* හි පිහිටා ඇති මෙම විස්තරයෙන් අපගේ විගණක වාර්තාවේ කොටසක් සෑදී ඇත.

**යෝග්‍ය අධිකාරියක වෙබ් අඩවියකට යොමු කිරීම (යොමුව: 41 (ඇ) 42 ඡේද)**

අ56. යෝග්‍ය අධිකාරියක වෙබ් අඩවියක් මත පිහිටා ඇති විගණකගේ වගකීම්හි විස්තරයකට විගණක යොමු කළ හැක්කේ නීතිය හෝ රෙගුලාසි හෝ ශ්‍රී ලංකා විගණන ප්‍රමිති මගින් එසේ කිරීමට පැහැදිලිව අවසර දී ඇති නම් පමණක් බව 41 වන ඡේදයෙන් පැහැදිලි කරයි. වෙබ් අඩවිය පිහිටි ස්ථානයට නිශ්චිත යොමු කිරීමක් මගින් විගණකගේ වාර්තාව තුළ වෙබ් අඩවියේ තොරතුරු අන්තර්ගත කළ සොයා ගත හැකි එවැනි තොරතුරු විගණකගේ වැඩ හෝ ශ්‍රී.ල.වි.ප්‍ර. සමඟ අනුකූලව විගණනය වඩාත් පුළුල්ව විස්තර කළ හැකිය, එහෙත් මෙම ශ්‍රී.ල.වි.ප්‍ර. යේ 39 - 40 ඡේදවලින් අවශ්‍ය කරන විස්තර සමඟ එය අසංගතවිය නොහැකිය. මෙයින් අදහස් කරන්නේ 39 - 40 ඡේද තුළ ආමන්ත්‍රණය කළ කරුණු එවැනි වචන පෙළගැස්මකින් පිළිබිඹු වන සහ එම කරුණු පරස්පර නොවන්නේ නම්, වෙබ් අඩවිය මත විගණකගේ වගකීම්වල විස්තරයේ වදන් පෙළ වඩාත් විස්තරාත්මක වියයුතු හෝ මූල්‍ය ප්‍රකාශ විගණනයකට සම්බන්ධිත වෙනත් කරුණු ඇමතිය යුතු බවය.

අ57. ජාතික විගණන ප්‍රමිති පිහිටුවන්නා, නියාමකය හෝ විගණනයක් අධීක්ෂණය කරනු ලබන ආයතනයක් යෝග්‍ය අධිකාරියක් විය හැකිය. එවැනි සංවිධාන ප්‍රමිතිකරණය කළ තොරතුරුවල නිරවද්‍යතාවය පරිපූර්ණත්වය සහ අඛණ්ඩව ලබාගත හැකි බව සහතික කිරීමට මනාව පිහිටා ඇත. එවැනි වෙබ් අඩවියක් විගණක පවත්වාගෙනයාම යෝග්‍ය විය නොහැකිය. විගණකගේ වාර්තාව තුළ වෙබ් අඩවියකට එබඳු යොමු කිරීමක් කළ හැක්කේ කෙසේද යන්නට නිදර්ශනයකි පහත දැක්වෙන්නේ;

**මූල්‍ය ප්‍රකාශ විගණනය සඳහා විගණකගේ වගකීම්,**
අපගේ අරමුණු වන්නේ වංචා හෝ වැරදි නිසා හෝ වේවා මූල්‍ය ප්‍රකාශ සමස්ථයක් වශයෙන් ගත්කළ ප්‍රමාණාත්මක අවප්‍රකාශ වලින් තොරද යන්න පිළිබඳව සාධාරණ සහතික වීමක් ලබා ගැනීමට සහ අපගේ මතය අඩංගු විගණකගේ වාර්තාව නිකුත් කිරීමටය. සාධාරණ සහතික වීම යනු ඉහළ මට්ටමේ සහතික වීමකි, එහෙත් ප්‍රමාණාත්මක අවප්‍රකාශයක් එය පවතින විට සෑම විටම අනාවරණය කරගනු ලබන බවට ශ්‍රී.ල.වි.ප්‍ර. සමඟ අනුකූලව මෙහෙයවන ලද එම විගණනයකින් එය සහතික නොකරයි. අවප්‍රකාශ වංචා හෝ වැරදිවලින් පැන නැගිය හැකි අතර ප්‍රමාණාත්මක ලෙස සලකන්නේ තනිව හෝ සමාහාරයක් ලෙස ගත් කළ ඒවා මෙම මූල්‍ය ප්‍රකාශයන්හි පදනම මත පරිශීලකයන් ගත් ආර්ථික තීරණවලට සාධාරණ ලෙස බලපෑම් කිරීමට අපේක්ෂා කරන්නේ නම්ය. මූල්‍ය ප්‍රකාශයන්හි විගණනය සඳහා අපගේ වකීම්වල තවදුරටත් වන විස්තරයක් *[සංවිධානයේ]* *[වෙබ් අඩවි ලිපිනයේ]* වෙබ් අඩවියේ පිහිටා ඇත. මෙම විස්තරයෙන් අපගේ විගණකගේ වාර්තාවේ කොටසක් සෑදී ඇත.

**වෙනත් වාර්තාකරණ වගකීම් (යොමුව: 43 - 45 ඡේද)**

අ58 සමහර අධිකරණ බල ප්‍රදේශයන් තුළ, ශ්‍රී.ල.වි.ප්‍ර. යටතේ විගණකගේ වගකීම්වලට පරිපූරකවන වෙනත් කරුණු මත වාර්තා කිරීමේ අතිරේක වගකීම් විගණකට තිබිය හැකිය. උදාහරණ වශයෙන් මූල්‍ය වාර්තා විගණනය සිදුකළ ක්‍රියාමාර්ග තුළදී විගණකගේ අවධානයට සමහර කරුණු ලක් වූයේ නම්, එම කරුණු මත වාර්තා කරන ලෙස විගණකගෙන් ඉල්ලා සිටිය හැකිය. විකල්පයක් ලෙස විශේෂයෙන්ම නම් කළ අතිරේක ක්‍රියාපටිපාටි ඉටු කිරීමට සහ ඒ මත වාර්තා කරන ලෙස හෝ ගිණුම්කරණ පොත්වල සහ වාර්තාවල ප්‍රමාණවත් භාවය වැනි මූල්‍ය වාර්තාකරණය හෝ වෙනත් තොරතුරු මත අභ්‍යන්තර පාලනය වැනි විශේෂිත කරුණු මත මතයක් ප්‍රකාශ කිරීමට විගණකගෙන් ඉල්ලා සිටිය හැකිය. නිශ්චිත අධිකරණ බලප්‍රදේශයක් තුළ විගණන ප්‍රමිත මගින් එම අධිකරණ බලප්‍රදේශයේ නිශ්චිත අතිරේක වාර්තා කරන වගකීම් වලට සම්බන්ධයෙන් විගණකගේ වගකීම් මත උපදේශ ඒවා මගින් බොහෝ විට ලබා දෙයි.

අ59. සමහර අවස්ථාවන්හිදී, මෙම වෙනත් වගකීම් මත වන මූල්‍ය ප්‍රකාශ මත ඔවුන්ගේ විගණකගේ වාර්තාවේ කොටසක් ලෙස වාර්තා කිරීමට අදාළ නීතිය හෝ රෙගුලාසි මගින් විගණකට අවශ්‍ය විය හැකි හෝ අවසර දිය හැකිය. වෙනත් අවස්ථාවන්හිදී, ඒවා මත වෙනම වූ වාර්තාවක වාර්තා කිරීමට විගණකට අවශ්‍ය විය හැකි හෝ අවසර දිය හැකිය.

අ60. ශ්‍රී.ල.වි.ප්‍ර. යටතේ වෙනත් වාර්තාකරණ වගකීම් සහ විගණකගේ වගකීම් මෙම ශ්‍රී.ල.වි.ප්‍ර. යේ 43 - 45 ඡේද මගින් සංයෝජනයකර ඉදිරිපත් කිරීමක් ලෙසට අවසර දෙන්නේ ඒවා එකම මාතෘකා සහ වචන පෙළ ගැස්ම විගණකගේ වාර්තාවේ ශ්‍රී.ල.වි.ප්‍ර. යටතේ වන වෙනත් වාර්තා කිරීමේ වගකීම් වලින් පැහැදිලිව වෙන් කොට හඳුනා ගන්නාවිට පමණක්ය. එවැනි පැහැදිලිව වෙන් කොට හඳුනා ගැනීමකින්, වෙනත් වාර්තාකරණ වගකීම්හි මූලාශ්‍රයට විගණකගේ වාර්තාවේ යොමු කිරීමට සහ එවැනි වගකීම් ශ්‍රී.ල.වි.ප්‍ර. යටතේ අවශ්‍ය කරන ඒවා අභිබවා වූ ද බව විගණකගේ වාර්තාවේ සඳහන් කිරීමට අවශ්‍ය කර විය හැකිය. එසේ නැතහොත් වෙනත් වාර්තා කරන වගකීම් විගණකගේ වාර්තාවේ වෙනම වූ කොටසක "වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතාවයන් මත වාර්තාව" සහිත ශීර්ෂයක් යටතේ හෝ අන් අයුරකින් කොටසේ අන්තර්ගතයට යෝග්‍ය වන පරිදි ආමන්ත්‍රණය කිරීම අවශ්‍ය කෙරේ. එවැනි අවස්ථාවන්හිදී ශ්‍රී.ල.වි.ප්‍ර. යටතේ වාර්තා කරන වගකීම් යටතේ "මූල්‍ය ප්‍රකාශ විගණනය මත වාර්තාව" ලෙස නම් කළ ශීර්ෂයන් ඇතුළත් කිරීම 44 වන ඡේදයෙන් අවශ්‍ය කෙරේ.

**කාර්යභාරයේ නියුතු හවුල්කරුගේ ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනයේ සාමාජික අංකය (යොමුව: 46 වන ඡේදය)**

අ61. කාර්යභාරයන් ඉටු කරන්නේ වෘත්තිය ප්‍රමිති සහ අදාළ නෛතික හා නියාමන අවශ්‍යතාවයන් සමඟ අනුකූලව යයි සාධාරණ සහතික වීම කළ බැඳීමට විගණන සමාගම ප්‍රතිපත්ති සහ ක්‍රියාපටිපාටි ස්ථාපනය කිරීම SLSQC1[36] න් අවශ්‍ය කෙරේ. මෙම SLSQC1හි අවශ්‍යතාවයන් එසේ වූවත්, විගණකගේ වාර්තාව තුළ කාර්යභාරයේ නියුතු හවුල්කරුගේ ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනයේ සාමාජික අංකය සඳහන් කිරීමෙන්

[36] SLSQC1, *මූල්‍ය ප්‍රකාශවල විගණන හා සමාලෝචන, සහ වෙනත් සහතිකවීම් හා සම්බන්ධිත සේවා කාර්යභාරය ඉටුකරන සමාගම් සඳහා තත්ත්වය පාලනය.* 32 වන ඡේදය

අදහස් කරන්නේ ලැයිස්තුගත අස්තිත්ත්වයක මූල්‍ය ප්‍රකාශ මත විගණකගේ වාර්තාව පරිශීලනය කරන්නන් හට තවදුරටත් විනිවිද භාවයක් සලසා දීමටය.

අ62. ලැයිස්තුගත අස්තිත්ත්වයන්හි මූල්‍ය ප්‍රකාශයන් සඳහා හැර, අනෙකුත් විගණන සඳහා වගකිව යුතු කාර්යභාරයේ නියුතු හවුල්කරුවන්ගේ ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනයේ සාමාජික අංකය විගණකගේ වාර්තාවේ ඇතුළත් කිරීම නීතිය, රෙගුලාසි හෝ ශ්‍රී ලංකා විගණන ප්‍රමිත මගින් අවශ්‍ය විය හැකිය. කාර්යභාරයේ නියුතු හවුල්කරු බොහෝදුරට හඳුනා ගැනීමට, විගණකගේ වාර්තාව තුළ කාර්යභාරයේ නියුතු හවුල්කරුගේ ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනයේ සාමාජික අංකය සඳහන් කිරීමට ඔබ්බට වන අතිරේක තොරතුරු ඇතුළත් කිරීමට නීතියෙන්, රෙගුලාසි මගින් හෝ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත මගින් විගණකට අවශ්‍යකර වීම හෝ තීරණය කිරීම කළ හැකිය; උදාහරණ ලෙස විගණන පරිචයේ යෙදෙන අදාළ අධිකරණ බලප්‍රදේශයේ කාර්යභාරයේ නියුතු හවුල්කරුගේ පරිචයේ යෙදීමේ සහතිකයේ අංකය.

අ63. ඉතා විරල තත්ත්වයන්හිදී, කාර්යභාරයේ නියුතු හවුල්කරුගේ අනන්‍යතාවය ප්‍රසිද්ධ කළහොත්, කාර්යභාරයේ නියුතු අනෙක් සාමාජිකයන්ගේ හෝ වෙනත් සමීප සබඳතා ඇති සම්බන්ධිත පුද්ගලයාට කායික හිංසනයක් ප්‍රතිඵලයක් වියහැකි පෞද්ගලික ආරක්‍ෂාව පිළිබඳව තර්ජනයක් සිදුවියහැකි බවට අඟවන අත් දැකීම්වලට විෂය වියහැකි හෝ තොරතුරු විගණක හඳුනාගත හැකිය. කෙසේ වෙතත් එවැනි තර්ජනයකට උදාහරණ ලෙස නෛතික වගකීමේ තර්ජනය හෝ නෛතික නියාමන හෝ වෘත්තීය සම්බාධක පැනවීම ඇතුළත් නොවේ. කායික හිංසනයක් ප්‍රතිඵලයක් විය හැකි තත්ත්වයන් පිළිබඳව පාලනය පිළිබඳ වගකිව යුතු අය සමග සාකච්ඡා කිරීමෙන් සැළකිය යුතු අන්දමේ පෞද්ගලික ආරක්‍ෂණ තර්ජනයන් විය හැකි බව හෝ ඒවායේ උග්‍රකම පිළිබඳව අමතර තොරතුරු ලබාගත හැකිය. කාර්යභාරයේ නියුතු හවුල්කරුගේ ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනයේ සාමාජික අංකය හෙළිදරව් කිරීම අත්හැරිය යුතුද යන්න නිර්ණය කිරීමට අදාළ තවදුරටත් වන අවශ්‍යතාවයන්, නීතිය, රෙගුලාසි හෝ ශ්‍රී ලංකා විගණක ප්‍රමිති ස්ථාපනය කළ හැකිය.

**විගණකගේ අත්සන (යොමුව: 47 වන ඡේදය)**

අ64. විශේෂිත වූ අධිකරණ බලප්‍රදේශයක් සඳහා යෝග්‍ය වන පරිදි විගණකගේ නම එක්කෝ විගණක සමාගමේ නමින්, විගණකගේ පෞද්ගලික නමින් හෝ දෙකම මගින් වේ. විගණකගේ අත්සනට අමතරව සමහර අධිකරණ බලප්‍රදේශයක් තුළ විගණකගේ වෘත්තිය ගණකාධිකරණ ආයතනයේ නිල නාමය හෝ යෝග්‍යවන පරිදි විගණක හෝ සමාගම යන කරුණු එම අධිකරණ බලප්‍රදේශයේ යෝග්‍ය බලපත්‍ර නිකුත් කරන ආයතනය මගින් පිළිගෙන ඇතිවග විගණකගේ වාර්තාවේ. අවධාරණය කර සිටීම විගණකට අවශ්‍ය කර විය හැකිය.

අ65. සමහර අවස්ථාවන්හිදී, විගණකගේ වාර්තාවේ විද්‍යුත් අත්සන් භාවිත කිරීම සඳහා නීතියෙන් හෝ රෙගුලාසිවලින් ඉඩ දිය හැකිය.

**විගණකගේ වාර්තාවේ දිනය (යොමුව: 49 වන ඡේදය)**

අ66. විගණකගේ වාර්තාවේ දිනයෙන්, එම දිනය දක්වා විගණකගේ දැන ගැනීමට ලක්වූ සහ සිදු වූ සිද්ධීන්ගේ සහ ගණුදෙනුවල බලපෑම විගණක සැළකිල්ලට ගෙන ඇති බව විගණකගේ වාර්තාව පරිශීලකයනට දැනුම් දෙයි. විගණකගේ වාර්තාවේ දිනයෙන් පසුව වූ සිද්ධීන් සහ ගණුදෙනු සඳහා විගණකගේ වගකීම ශ්‍රී.ල.වි.ප්‍ර. 560[37] තුළ ආමන්ත්‍රණය කෙරේ.

අ67. විගණකගේ මතය ලබාදෙන්නේ මූල්‍ය ප්‍රකාශ මත සහ මූල්‍ය ප්‍රකාශ කළමනාකාරිත්වයේ වගකීමක් බැවින්, මූල්‍ය ප්‍රකාශ සමන්විතවන සියලු ප්‍රකාශ සහ හෙළිදරව් කිරීම් පිළියෙල කර ඇතිබව සහ ඒවා සඳහා කළමනාකාරීත්වයේ වගකීම භාරගෙන ඇති බවට සාක්ෂි ලබා ගන්නා තෙක් ප්‍රමාණවත් යෝග්‍ය විගණන සාක්ෂි ලබාගෙන ඇතැයි නිගමනය කිරීමට සුදුසු වන තත්ත්වයක විගණක නොමැත.

අ68. මූල්‍ය ප්‍රකාශ සමන්විත වන සියලු ප්‍රකාශ සහ හෙළිදරව් කිරීම් පිළියෙල කළ බවට සහ අවශ්‍යකරණ අනුමත කිරීමේ ක්‍රියාවලිය පැහැදිලිව සඳහන් කරමින් නිගමනය කිරීම සඳහා වගකිව යුතු පුද්ගලයන් හෝ ආයතන (උදා. අධ්‍යක්‍ෂකවරුන්) සමහර අධිකරණ බලප්‍රදේශයන්හි නීතිය හෝ රෙගුලාසි මගින් හඳුනාගනී. එවැනි අවස්ථාවන්හිදී එම අනුමත කිරීම සඳහාවන සාක්ෂි මූල්‍ය ප්‍රකාශවන මත වාර්තාව දාතම් කිරීමට පෙර ලබා ගනී. කෙසේ වෙතත් වෙනත් අධිකරණ බලප්‍රදේශයන්හි අනුමැතිය ලබා ගැනීමේ ක්‍රියාවලිය නීතිය හෝ රෙගුලාසිවලින් නියම කර නැත. එවැනි අවස්ථාවලදී, එහි මූල්‍ය ප්‍රකාශ පිළියෙල කිරීමේ හා අවසන් කිරීමේදී අස්තිත්ත්වය අනුගමනය කරන ක්‍රියාපටිපාටි සැළකිල්ලට ගැනීමේදී සම්බන්ධිත සටහන් ඇතුළුව මූල්‍ය ප්‍රකාශ සමන්විත වන සියලු ප්‍රකාශ පිළියෙල කළ බව නිගමනය කිරීමට අධිකාරිය සහිත පුද්ගලයන් හෝ කණ්ඩායම් හඳුනා ගැනීමට හැකිවනු පිණිස එහි කළමනාකාරීත්වය සහ පාලන ව්‍යුහය සැළකිල්ලට ගනී. සමහර අවස්ථාවන්වලදී මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය තුළ විගණනය සම්පූර්ණ කිරීමට අපේක්‍ෂා කරන මොහොත නීතියෙන් හෝ රෙගුලාසිවලින් හඳුනා ගනී.

අ69. සමහර අධිකරණ බලප්‍රදේශයන්හි මූල්‍ය ප්‍රකාශ පොදුවේ නිකුත් කිරීමට පෙර මූල්‍ය ප්‍රකාශ සඳහා කොටස් හිමියන්ගේ අවසාන අනුමැතිය අවශ්‍ය කෙරේ. මෙම අධිකරණ බලප්‍රදේශයන්හි ප්‍රමාණවත් යෝග්‍ය විගණන සාක්ෂි ලබාගත් බව විගණක නිගමනය කිරීම සඳහා කොටස් හිමියන්ගේ අවසාන අනුමැතිය අවශ්‍ය නොවේ.

[37] ශ්‍රී.ල.වි.ප්‍ර. 560, *පසුව සිදුවන සිද්ධීන්,* 10-17 ඡේද

ශ්‍රී.ල.වි.ප්‍ර. වල අරමුණු සඳහා මූල්‍ය ප්‍රකාශයන්හි අනුමැතිය සඳහා වූ දිනය වන්නේ, මූල්‍ය ප්‍රකාශ සමන්විතවන සියලු ප්‍රකාශ සහ හෙළිදරව් කිරීමේ පිළියෙල කළ බව සහ පිළිගත් අධිකාරී සමඟ ඒවා සඳහා වගකීම ඔවුන් භාරගත් බවට තහවුරු කිරීම සහිතව එම පිළිගත් ආයතනය නිර්ණය කරන වේලාසනින්ම වූ දිනය වේ.

**නීතිය හෝ රෙගුලාසි මගින් නියම කළ විගණකගේ වාර්තාව (යොමුව: 50 ඡේදය)**

අ70. ශ්‍රී.ල.වි.ප්‍ර. වලට අමතරව විගණක නෛතික හෝ නියාමන අවශ්‍යතාවයන් සමඟ අනුකූලවීමට අවශ්‍ය වියහැකි බව ශ්‍රී.ල.වි.ප්‍ර. 200 න් පැහැදිලි කෙරේ.[38] නෛතික හෝ නියාමන අවශ්‍යතාවයන් සහ ශ්‍රී.ල.වි.ප්‍ර. අතර වන වෙනස්කම් සම්බන්ධ වන්නේ විගණකගේ වාර්තාවේ පසුතලයට සහ වචන පෙළ ගැස්මට පමණක් නම් වනවිට 50(අ) - (ග) දක්වා ඡේද තුළ ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට යොමු කළ යුතු විගණක වාර්තාවේ ඇතුළත් කිරීමට හැකිවීමට අවම මූලිකාංග නියම කෙරේ. එවැනි තත්ත්වයන් තුළදී 50 (අ) - (ග) දක්වා ඡේද තුළ ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට යොමුකළ යුතු විගණන වාර්තාවේ ඇතුළත් කිරීමට හැකිවීමට අවම මූලිකාංග නියම කෙරේ. එවැනි තත්ත්වයන් තුළදී 50(අ) - (ග) ඡේද තුළ ඇතුළත් නොකළ 21 - 49 දක්වා ඡේද තුළ අවශ්‍යතාවයන් උදාහරණයක් වශයෙන් මතය සහ මතය සඳහා කොටස්වල අවශ්‍යකරන අනුපිළිවෙල ඇතුළුව ව්‍යවහාර කිරීම අවශ්‍ය නොවේ.

අ71. විශේෂ අධිකරණ බලප්‍රදේශයක් තුළ නිශ්චිත අවශ්‍යතාවයන් ශ්‍රී.ල.වි.ප්‍ර. සමඟ නොගැටෙන අවස්ථාවකදී මෙම ශ්‍රී.ල.වි.ප්‍ර. යේ 21 - 49 ඡේද වලින් අවශ්‍ය කරන පසුතලය සහ වචන පෙළ ගැස්ම වාර්තාව ශ්‍රී.ල.වි.ප්‍ර. සමඟ අනුකූලව මෙහෙයවන ලදී. විගණනයක වාර්තාවක් ලෙස වඩාත් කරදරයක් නොමැතිව විගණකගේ වාර්තාව පරිශීලකයනට පිළිගැනීමට උපකාරීවේ.

**ශ්‍රී.ල.වි.ප්‍ර. 701 මගින් අවශ්‍ය කරන තොරතුරු (යොමුව: 50 (ඒ) ඡේදය)**

අ72. ඉටු කරන ලද යම් විගණනයක් පිළිබඳව විගණකට අතිරේක තොරතුරු ලබාදීමට නීතියෙන් හෝ රෙගුලාසි මගින් අවශ්‍ය කර විය හැකිය. මෙයට ඇතුළත් විය හැක්කේ ශ්‍රී.ල.වි.ප්‍ර. 701 හි අරමුණු සමඟ සංගත තොරතුරු හෝ එවැනි කරුණු පිළිබඳව සන්නිවේදනයේ ස්වභාවය හෝ ප්‍රමාණය නියම කළ හැකිය.

අ73. මූල්‍ය ප්‍රකාශ විගණනයක් පාලනය කරන නීතිය හෝ රෙගුලාසි ශ්‍රී.ල.වි.ප්‍ර. මගින් අවලංගු කිරීමට අධිකාරී බලය යොදා ගන්නේ නැත. ශ්‍රී.ල.වි.ප්‍ර. 701 අදාළ වන විට, නීතිය හෝ රෙගුලාසි ව්‍යවහාර කිරීමේදී, ශ්‍රී.ල.වි.ප්‍ර. 701 තුළ වන වාර්තා කරන අවශ්‍යතාවයන් මෙම ශ්‍රී.ල.වි.ප්‍ර. යේ 50 (ඒ) ඡේදය මගින් අවශ්‍ය කරන කොටස සමඟ අසංගත නොවන්නේ නම්, විගණකගේ වාර්තාව තුළ ශ්‍රී.ල.වි.ප්‍ර. වලට යොමු කිරීමක් පමණක් කළ හැකිය. එවැනි තත්ත්වන්හිදී ශ්‍රී.ල.වි.ප්‍ර. 701 මගින් අවශ්‍යකරන විගණකගේ වාර්තාවේ ප්‍රධාන විගණන කරුණු සන්නිවේදනයේ සමහර අංගයන් ගැළපෙන අන්දමට සකස් කිරීමට විගණකට අවශ්‍ය විය හැකිය. උදාහරණ වශයෙන්: පහත දෑ සිදු කිරීම මගින්:

- නීතියෙන් හෝ රෙගුලාසි වලින් විශේෂිත ශීර්ෂයක් නියම කරන්නේ නම්, "ප්‍රධාන විගණන කරුණු" ශීර්ෂය වෙනස් කිරීම;
- නීතියෙන් හෝ රෙගුලාසි මගින් අවශ්‍ය කරන තොරතුරු විගණකගේ වාර්තාවේ ලබාදිය යුත්තේ කුමක් නිසාද යන්න පැහැදිලි කිරීමෙන් උදාහරණ වශයෙන් අදාළ නීතියට හෝ රෙගුලාසිවලට යොමු කිරීම සහ ප්‍රධාන විගණන කරුණුවලට එම තොරතුරු සම්බන්ධිත වන්නේ කෙසේද යන්න විස්තර කිරීම මගින්;
- ශ්‍රී.ල.වි.ප්‍ර. 701 හි 13 වන ඡේදයේ අවශ්‍යතාවයන් සමඟ අනුකූලවන සෑම ප්‍රධාන විගණන කරුණකම සමස්ථ විස්තරයක් ළඟාකර ගැනීමට නියම කළ තොරතුරු අතිරේක කිරීමට වන විස්තරයේ ස්වභාවය සහ ප්‍රමාණය නීතිය හෝ රෙගුලාසි නියම කරන අවස්ථාවන්.

අ74. විශේෂයෙන්ම විගණකගේ මතය එහි ඇතුළත් ශ්‍රී.ල.වි.ප්‍ර. වල අවශ්‍යතාවයන්ගෙන් සැලකිය යුතු අන්දමින් වෙනස් භාෂිතයකින් විගණකගේ වාර්තාවේ පසුතලය සහ වචන පෙළගැස්ම අදාළ අධිකරණ බලප්‍රදේශයේ නීතිය හෝ රෙගුලාසි මගින් නියම කරන අවස්ථාවලදී ඒ පිළිබඳව ශ්‍රී.ල.වි.ප්‍ර. 210 කටයුතු කෙරේ. මෙවැනි තත්ත්වයන්හිදී විගණකට පහත සඳහන් දේ අගය කිරීම ශ්‍රී.ල.වි.ප්‍ර. 210 න් අවශ්‍ය කෙරේ;

(අ) මූල්‍ය ප්‍රකාශ විගණනය මගින් ලබාගත් සහතික වීම පරිශීලකයන් වරදවා වටහා ගනීද සහ, එසේ නම්,

(ආ) සිදුවිය හැකි වරදවා වටහා ගැනීමක් විගණකගේ වාර්තාවේ අතිරේක පැහැදිලි කිරීම් මගින් සැහැල්ලු කරගත හැකි ද?

විගණකගේ වාර්තාව තුළවන අතිරේක පැහැදිලි කිරීම්වලට සිදුවිය හැකි වැරදි වටහාගැනීමක් සැහැල්ලු කරගත නොහැකි යයි විගණක නිගමනය කරන්නේ නම්, නීතිය හෝ රෙගුලාසි මගින් විගණන භාර ගැනීම අවශ්‍ය

[38] ශ්‍රී.ල.වි.ප්‍ර. 200, අ 57 වන ඡේදය

කරන්නේ නම් හැර, විගණන කාර්යභාරය විගණක භාර නොගත යුතු බව ශ්‍රී.ල.වි.ප්‍ර. 210 න් අවශ්‍ය කෙරේ. ශ්‍රී.ල.වි.ප්‍ර. 210 සමග අනුකූලව, එවැනි නීතියක් හෝ රෙගුලාසියක් අනුව විගණනයක් මෙහෙයවීම ශ්‍රී.ල.වි.ප්‍ර. සමග අනුකූල නොවේ. ඒ අනුව විගණකගේ වාර්තාව තුළ ශ්‍රී ලංකා විගණන ප්‍රමිත සමග අනුකූලව විගණනය පවත්වාගෙන යනු ලැබූ බවට කිසියම් යොමු කිරීමක් විගණකගේ වාර්තාවේ ඇතුළත් නොකළ යුතුය.[39]

**රාජ්‍ය අංශයේ අස්තිත්ත්වයන්ට විශේෂිත වූ සැලකිල්ලට ගැනීම.**

අ75. නීතිය හෝ රෙගුලාසි වලට අනුගාමීව රාජ්‍ය අංශයේ අස්තිත්ත්වයන්හි විගණකවරුන්ටද එක්කෝ විගණකගේ වාර්තාව තුළ හෝ පරිපූරක වාර්තාව ශ්‍රී.ල.වි.ප්‍ර. 701 හි අරමුණු වලට අනුකූලව ඇතුළත් විය හැකි සමහර කරුණු වල තොරතුරු ප්‍රසිද්ධියේ වාර්තා කිරීමට හැකියාව ඇත. එවැනි තත්ත්වයන්හිදී ශ්‍රී.ල.වි.ප්‍ර. 701 මගින් අවශ්‍යකරන විගණකගේ වාර්තාව තුළ ප්‍රධාන විගණන කරුණු සන්නිවේදනයේ දී සමහර අංග ගැළපෙන ආකාරයට සකස් කිරීමට විගණකට සිදු විය හැකිය. හෝ පරිපූරක වාර්තාව තුළ වූ කරුණට විස්තරයක් විගණකගේ වාර්තා තුළ යොමු කිරීමක් ඇතුළත් කළ යුතුය.

**නිශ්චිත අධිකරණ බලප්‍රදේශයක විගණන ප්‍රමිති සහ ශ්‍රී ලංකා විගණන ප්‍රමිති යන දෙකම හා සමග අනුකූලව මෙහෙයවන ලද විගණන සඳහා විගණකගේ වාර්තාව (යොමුව: 51 වන ඡේදය)**

අ76. විශේෂිත අධිකරණ බලප්‍රදේශයක අදාළ විගණන ප්‍රමිත සමග අනුකූල වීමට අමතරව විගණනයට අදාළවන සෑම ශ්‍රී.ල.වි.ප්‍ර. යක් සමග විගණක අනුකූල වන විට, ශ්‍රී ලංකා විගණන ප්‍රමිත මෙන්ම විශේෂිත අධිකරණ බලප්‍රදේශයක විගණන ප්‍රමිත යන දෙකම සමග අනුකූලව විගණනය මෙහෙයවා ඇති බව විගණක විගණකගේ වාර්තාව තුළ යොමු කිරීම කළ හැකිය.[40]

අ77. විශේෂිතව වූ තත්ත්වයන්හිදී ශ්‍රී.ල.වි.ප්‍ර. මගින් අවශ්‍ය කරන විගණකට වෙනස් මතයක් සකස් කිරීමට හෝ කරුණ අවධාරණය කිරීම හෝ වෙනත් කරුණ ඡේදයක් ඇතුළත් නොකිරීමට මෙහෙය විය හැක, ශ්‍රී.ල.වි.ප්‍ර. සහ එම විශේෂිත අධිකරණ බලප්‍රදේශයේ විගණන ප්‍රමිතයන්හි අවශ්‍යතාවයන් අතර ගැටළුවක් පවතී නම්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිත සහ විශේෂිත අධිකරණ බලප්‍රදේශයේ විගණන ප්‍රමිත යන දෙකටම යොමු කිරීම යෝග්‍ය නොවේ. එවැනි අවස්ථාවක විගණකගේ වාර්තා යොමු කරන්නේ විගණකගේ වාර්තා පිළියෙල කිරීමට (එක්කෝ ශ්‍රී ලංකා විගණන ප්‍රමිති හෝ විශේෂිත අධිකරණ බලප්‍රදේශයේ විගණන ප්‍රමිති) අනුකූල කරගත් විගණන ප්‍රමිතියට පමණක්ය.

**මූල්‍ය ප්‍රකාශ සමග ඉදිරිපත් කරන පරිපූරක තොරතුරු (යොමුව: 53 ඡේදය)**

අ78. සමහර තත්ත්වයන්හිදී අදාළ මූල්‍ය වාර්තාකරණ ආකෘතිමය රාමුවක් මගින් අවශ්‍ය නොකරන පරිපූරක තොරතුරු මූල්‍ය ප්‍රකාශ සමග එක්ව ඉදිරිපත් කිරීමට නීතිය රෙගුලාසි හෝ ප්‍රමිත මගින් අස්තිත්ත්වයට අවශ්‍ය කර විය හැකි හෝ ස්වේච්ඡාවෙන් තෝරා ගත හැකිය. උදාහරණ ලෙස පරිපූරක තොරතුරු ඉදිරිපත් කරන්නේ අදාළ මූල්‍ය වාර්තාකරණ ආකෘතිමය රාමුවේ පරිශීලකයන්ගේ අවබෝධය උසස් කිරීමට හෝ මූල්‍ය ප්‍රකාශයන්හි විශේෂිත අයිතමයන්හි තවදුරටත් පැහැදිලි කිරීම් ලබාදීමට විය හැකිය. එවැනි තොරතුරු සාමාන්‍යයෙන් ඉදිරිපත් කරන්නේ එක්කෝ පරිපූරක උපලේඛන හෝ අතිරේක සටහන් ලෙසය.

අ79. පරිපූරක තොරතුරුවල ස්වභාවය එය ඉදිරිපත් කළ ආකෘතිය නිසා මූල්‍ය ප්‍රකාශල වැදගත් කොටසක් වන පරිපූරක තොරතුරු විගණකගේ මතය ආවරණය කරන බව මෙම ශ්‍රී.ල.වි.ප්‍ර. හි 53 වන ඡේදයෙන් පැහැදිලි කෙරේ. මෙම අගය කිරීම වෘත්තිය විනිශ්චයට වන කරුණකි. එය පැහැදිලි කිරීමට;

- මූල්‍ය ප්‍රකාශ වෙනත් මූල්‍ය වාර්තාකරණ ආකෘතිමය රාමුවක් සමග අනුකූලවන ප්‍රමාණයේ තරම පැහැදිලි කිරීමක් හෝ සැසඳීමක් මූල්‍ය ප්‍රකාශවලට සටහනක් ලෙස ඇතුළත් වන විට මෙය මූල්‍ය ප්‍රකාශවලින් පැහැදිලිව වෙන්කොට හඳුනාගත නොහැකි පරිපූරක තොරතුරක් විය හැකි බව විගණක සැළකිය හැකිය. මූල්‍ය ප්‍රකාශ වලින් හරස් ලෙස යොමු කළ සටහන් හෝ පරිපූරක උපලේඛන එසේම විගණකගේ මතය ආවරණය කරයි.

- වියදම්වල විශේෂිත අයිතම හෙළිදරව් කරන අතිරේක ලාභ හෝ අලාභ ගිණුමක් මූල්‍ය ප්‍රකාශවලට පරිශිෂ්යයක් ලෙස ඇතුළත් කළ වෙනම වූ උපලේඛනයක් ලෙස හෙළිදරව් කරනවිට මෙය මූල්‍ය ප්‍රකාශවලින් පැහැදිලිව වෙන්කොට හඳුනාගත හැකි පරිපූරක තොරතුරු ලෙස විගණක සැළකිය හැකිය.

[39] ශ්‍රී.ල.වි.ප්‍ර. 210, 21 වන ඡේදය
[40] ශ්‍රී.ල.වි.ප්‍ර. 200, අ58 ඡේදය

අ80. විගණකගේ වාර්තාව තුළ මූල්‍ය ප්‍රකාශ සමන්විත වන ප්‍රකාශයන්හි විස්තරවලට යොමු කිරීම ප්‍රමාණවත් වන විට, විගණකගේ මතය මගින් ආවරණය වන පරිපූරක තොරතුරු විශේෂිතව විගණකගේ වාර්තාවේ යොමු කිරීම අවශ්‍ය නොවනු ඇත.

අ81. පරිපූරක තොරතුරු විගණනය කළ යුතු යයි, නීතිය හෝ රෙගුලාසි මගින් අවශ්‍ය කර විය නොහැකි අතර මූල්‍ය ප්‍රකාශ විගණනයේ විෂය පථය ඇතුළත පරිපූරක තොරතුරු ඇතුළත් නොකරන ලෙස විගණකගෙන් ඉල්ලා සිටීමට කළමණාකාරිත්වය තීරණය කළ හැකිය.

අ82. විගණනය නොකළ පරිපූරක තොරතුරු ඉදිරිපත් කර ඇති ආකාරයෙන් විගණකගේ මතය මගින් ආවරණය වනු ඇතැයි අර්ථ දක්වෙන්නේද යන්න විගණකගේ ඇගයීමට උදාහරණ ලෙස ඇතුළත් වන්නේ, එම තොරතුරු ඉදිරිපත් කර ඇත්තේ මූල්‍ය ප්‍රකාශවලට සම්බන්ධිතව සහ යම් විගණනය නොකළ පරිපූරක තොරතුරු සහ එය "විගණනය නොකළ" ලෙස පැහැදිලිව ලේබල් කර ඇත්ද යන විටය.

අ83. විගණකගේ මතය මගින් ආවරණය වනු ඇතැයි අර්ථ දක්විය හැකි එම විගණනය නොකළ පරිපූරක තොරතුරුවල ඉදිරිපත් කිරීම කළමණාකාරිත්වයට වෙනස්කළ හැකිය.

උදාහරණ ලෙස;

- මූල්‍ය ප්‍රකාශවලින්, විගණනය නොකළ පරිපූරක උපලේඛනවලට හෝ විගණනය නොකළ සටහන් වලට වන යම් හරස් යොමු කිරීමේ ඉවත් කිරීම මගින් ඒ අනුව විගණනය කළ සහ විගණනය නොකළ තොරතුරු අතර වෙන් කිරීම ප්‍රමාණවත් ලෙස පැහැදිලි වේ.
- විගණනය නොකළ පරිපූරක තොරතුරු මූල්‍ය ප්‍රකාශ වලින් පිටත තැබීම හෝ පවතින තත්ත්වයන්හිදී එය කළ නොහැකි නම්, අවම වශයෙන් මූල්‍ය ප්‍රකාශවලට අවශ්‍යකරන සටහන්වල අවසානයට විගණනය නොකළ තොරතුරු එක්ව තැබීම සහ ඒවා විගණනය නොකළ ලෙස පැහැදිලිව ලේබල් කිරීම මගින්. විගණනය කළ සටහන් සමග එකට මුසුකළ විගණනය නොකළ සටහන් ඒවා විගණනය කළ සටහන් බවට වැරදි ලෙස වටහා ගත හැක.

අ84. පරිපූරක තොරතුරු විගණනය නොකළ බවට වන කරුණ මගින් ශ්‍රී.ල.වි.ප්‍ර. (720) (සංශෝධිත) තුළ විස්තර කර ඇති වගකීම් වලින් විගණක නිදහස් නොවේ.

**මූල්‍ය ප්‍රකාශමත ස්වාධීන විගණකගේ වාර්තාවන්හි නිදර්ශන**

- 1 වන නිදර්ශනය - සාධාරණ ඉදිරිපත් කිරීමේ ආකෘතිමය රාමුවක් සමග අනුකූලව පිළියෙල කළ ලැයිස්තුගත අස්තිත්ත්වයක මූල්‍ය ප්‍රකාශමත විගණකගේ වාර්තාව.
- 2 වන නිදර්ශනය - සාධාරණ ඉදිරිපත් කිරීම් ආකෘතිමය රාමුවක් සමග අනුකූලව පිළියෙල කළ ලැයිස්තුගත අස්තිත්ත්වයක මූල්‍ය ප්‍රකාශ සහ එහි ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශ මත විගණකගේ වාර්තාව.
- 3 වන නිදර්ශනය - සාධාරණ ඉදිරිපත් කිරීමේ ආකෘතිමය රාමුවක් අනුකූලව පිළියෙල කළ ලැයිස්තුගත අස්තිත්ත්වයක් නොවන අස්තිත්ත්වයක මූල්‍ය ප්‍රකාශ මත විගණකගේ වාර්තාව (ප්‍රමාණාත්මක වන යොමු කිරීම කර ඇති තැන්හි එය පිහිටා ඇත්තේ යෝග්‍ය අධිකාරියක වෙබ් අඩවියක් මත වේ)
- 4 වන නිදර්ශනය - සාධාරණ ඉදිරිපත් කිරීමේ ආකෘතිමය රාමුවක් සමග අනුකූලව පිළියෙල කළ ලැයිස්තුගත අස්තිත්ත්වයක් නොවන අස්තිත්ත්වයක මූල්‍ය ප්‍රකාශය එහි ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශ විගණනය මත විගණකගේ වාර්තාව (ප්‍රමාණාත්මක වන යොමු කර ඇති තන්හි එය පිහිටා ඇත්තේ යෝග්‍ය අධිකාරියක වෙබ් අඩවියක් මත වේ.)
- 5 වන නිදර්ශනය - පොදු අරමුණු අනුකූලතා ආකෘතිමය රාමුවක් සමග අනුකූලව පිළියෙල කළ ලැයිස්තුගත අස්තිත්ත්වයක් නොවන අස්තිත්ත්වයක මූල්‍ය ප්‍රකාශ විගණනය මත විගණකගේ වාර්තාව.

1 වන නිදර්ශනය - සාධාරණ ඉදිරිපත් කිරීමේ ආකෘතිමය රාමුවක් සමඟ අනුකූලව පිළියෙල කළ ලැයිස්තුගත අස්තිත්ත්වයක මූල්‍ය ප්‍රකාශ මත විගණකගේ වාර්තාව

මෙම නිදර්ශනාත්මක විගණකගේ වාර්තාවේ අරමුණු සඳහා, පහත කරුණු උපකල්පනය කෙරේ:

- සාධාරණ ඉදිරිපත් කිරීමේ ආකෘතිමය රාමුව භාවිත කරමින් ලැයිස්තුගත අස්තිත්ත්වයක සම්පූර්ණ මූල්‍ය ප්‍රකාශ කට්ටලයක විගණනය මෙම විගණනය. සමූහ විගණනයක් නොවේ. (එනම් ශ්‍රී.ල.වි.ප්‍ර. 600 ව්‍යවහාර නොවේ)
- ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත (පොදු අරමුණු ආකෘතිමය රාමුවක) සමඟ අනුකූලව අස්තිත්ත්වයේ කළමනාකාරිත්වය විසින් මූල්‍ය ප්‍රකාශ පිළියෙල කරයි.
- ශ්‍රී.ල.වි.ප්‍ර. 210 තුළවන මූල්‍ය ප්‍රකාශ සඳහාවන කළමනාකාරිත්වයේ වගකීම්හි විස්තරය විගණන කාර්යභාරයේ නියමයන්ගෙන් පිළිඹිබු වේ.
- ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව විගණක නිගමනය කළ විකරණය නොකළ (එනම් "පිරිසිදු") මතය යෝග්‍ය වේ.
- විගණනයට ව්‍යවහාර කළ අදාළ චර්යා ධර්මීය අවශ්‍යතාවයන් අඩංගුව ඇත්තේ ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනය විසින් නිකුත් කළ ආචාර ධර්ම සංග්‍රහයේය.
- ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව, ශ්‍රී.ල.වි.ප්‍ර. 570 (සංශෝධිත) සමඟ අනුකූලව අඛණ්ඩ පැවැත්ම ලෙස දිගටම පවත්වාගෙන යාමේ අස්තිත්ත්වයේ හැකියාව මත සැළකිය යුතු අන්දමේ සැක පහළ කළ හැකි සිද්ධීන් හෝ පවත්නා තත්ත්වයන් සම්බන්ධිත ප්‍රමාණාත්මක අනියතතාවයක් නොපවතින බව විගණක නිගමනය කර ඇත.
- ශ්‍රී.ල.වි.ප්‍ර. 701 සමඟ අනුකූලව ප්‍රධාන විගණන කරුණු සන්නිවේදනය කර ඇත.
- විගණකගේ වාර්තාවේ දිනයට පෙර විගණක සියලුම වෙනත් තොරතුරු ලබා ගෙන ඇති අතර වෙනත් තොරතුරුවල ප්‍රමාණාත්මක අවප්‍රකාශයක් මෙතෙක් හඳුනාගෙන නොමැත.
- මූල්‍ය ප්‍රකාශ අධීක්ෂණය කිරීම සඳහා වගකිව යුතු අය මූල්‍ය ප්‍රකාශ පිළියෙල කිරීම සඳහා වගකිව යුතු අයගෙන් වෙනස් වේ.
- මූල්‍ය ප්‍රකාශ විගණනය කිරීමට අමතරව, දේශීය නීතිය යටතේ අවශ්‍යකරන වෙනත් වාර්තා කිරීමේ වගකීම් විගණකට ඇත.

**ස්වාධීන විගණකගේ වාර්තාව**

ABC සමාගමේ කොටස් හිමියන් වෙත [හෝ වෙනත් යෝග්‍ය පරිදි අමතන අය]

**මූල්‍ය ප්‍රකාශයන්හි විගණනය මත වාර්තාව**[1]

**මතය**

ABC සමාගමේ (සමාගමේ) 20×1 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශය සහ එම දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා විස්තීර්ණ ආදායම් ප්‍රකාශය ස්කන්ධයේ වෙනස් වීමේ ප්‍රකාශය සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශය සහ වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තීන්හි සාරාංශයක් ඇතුළුව, මූල්‍ය ප්‍රකාශවලට සටහන් වලින් සමන්විත මූල්‍ය ප්‍රකාශ අප විසින් විගණනය කරන ලදී.

අපගේ මතය අනුව 20×1 දෙසැම්බර් 31 වන දිනට සමාගමේ මූල්‍ය තත්ත්වය සහ එම දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්ය සාධනය සහ එහි මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතවලට අනුකූලව මේ සමඟ ඇති මූල්‍ය

[1] "වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතාවයන් මත වාර්තාව" යන දෙවන උප මාතෘකාව අදාළ නොවන තත්ත්වයන්හිදී "මූල්‍ය ප්‍රකාශ විගණනය මත වාර්තාව" යන උප මාතෘකාව අවශ්‍ය නොවේ.

ප්‍රකාශ සත්‍ය හා සාධාරණ දර්ශනයක් පෙන්නුම් කරන බවය. *(හෝ සියලුම ප්‍රමාණාත්මක අංගයන්ගෙන්, සාධාරණව ඉදිරිපත් කෙරේ)*

**මතය සඳහා පදනම**

අප විසින් අපගේ විගණනය මෙහෙයවන ලද්දේ ශ්‍රී ලංකා විගණන ප්‍රමිත සමඟ අනුකූලවය. (ශ්‍රී.ල.වි.ප්‍ර.) එම ප්‍රමිත යටතේ අපගේ වගකීම් තවදුරටත් අපගේ වාර්තාවේ *මූල්‍ය ප්‍රකාශ විගණනය සඳහා විගණකගේ වගකීම්* කොටසේ විස්තර කෙරේ. ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනය විසින් නිකුත් කළ ආචාර ධර්මීය සංග්‍රහය අනුව සමාගමෙන් අප ස්වාධීනය (ආචාර ධර්ම සංග්‍රහය)[2] සහ ආචාර ධර්ම සංග්‍රහය සමඟ අනුකූලව අපගේ වෙනත් චර්යා ධර්ම වගකීම් අප ඉටු කර ඇත. අප විසින් ලබාගත් විගණන සාක්ෂි අපගේ මතය සඳහා පදනම ලබාදීමට ප්‍රමාණවත් සහ යෝග්‍ය බව අප විශ්වාස කරයි.

**ප්‍රධාන විගණන කරුණු**

ප්‍රධාන විගණන කරුණු වනුයේ ප්‍රවර්තන කාලපරිච්ඡේදයේ මූල්‍ය ප්‍රකාශවල අපගේ විගණනය තුළදී, අපගේ වෘත්තිය විනිශ්චය අනුව වඩාත් වැදගත් වූ එම කරුණුය. මූල්‍ය ප්‍රකාශ සමස්ථයක් ලෙස ගත් කළ අපගේ විගණනය සම්බන්ධව සහ ඒ මත අපගේ මතය සකස් කිරීමේදී මෙම කරුණු අප අමතා ඇති අතර මෙම කරුණු මත වෙනම මතයක් අප ලබා දෙන්නේ නැත.

[*ශ්‍රී.ල.වි.ප්‍ර. 701 සමඟ අනුකූලව වන සෑම ප්‍රධාන විගණන කරුණකම විස්තරය*]

වෙනත් තොරතුරු [හෝ යෝග්‍ය වේ නම් "මූල්‍ය ප්‍රකාශ සහ විගණකගේ වාර්තාව මත හැර වන තොරතුරු" වැනි වෙනත් ශීර්ෂයක්]

[*ශ්‍රී.ල.වි.ප්‍ර. 720 (සංශෝධිත) හි වාර්තාකරණ අවශ්‍යතාවයන් සමඟ අනුකූලව වාර්තා කිරීම - ශ්‍රී.ල.වි.ප්‍ර. 720 (සංශෝධිත) හි 2 වන පරිශිෂ්ඨයේ 1 වන නිදර්ශනය බලන්න*]

**මූල්‍ය ප්‍රකාශ සඳහා කළමණාකාරිත්වයේ සහ පාලනය පිළිබඳව වගකිව යුතු අයගේ වගකීම්** [3]

ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත සමඟ අනුකූලව[4] එය සත්‍ය හා සාධාරණ දර්ශනයක් ගෙන දෙන මූල්‍ය ප්‍රකාශ පිළියෙල කිරීම සඳහා, සහ වංචා හෝ වැරදි නිසා හෝ වේවා ඒවා ප්‍රමාණාත්මක අවප්‍රකාශ වලින් තොරව මූල්‍ය ප්‍රකාශ පිළියෙල කිරීමට හැකිවනු පිණිස කළමනාකාරීත්වය අවශ්‍ය යයි නිර්ණය කරන පරිදි එවැනි අභ්‍යන්තර පාලන සඳහා කළමණාකාරිත්වය වගකිව යුතුය.

මූල්‍ය ප්‍රකාශ පිළියෙල කිරීමේදී එක්කෝ කළමණාකාරිත්වය සමාගම ඇවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ මෙහෙයුම් නැවැත්වීමට හෝ එසේ කිරීමට යථාර්ථවාදී විකල්පයක් නැත්නම් මිස අඛණ්ඩ පැවැත්ම පදනම ලෙස ගිණුම්කරණය භාවිත කිරීම සහ අදාළ වන පරිදි අඛණ්ඩ පැවැත්මට සම්බන්ධිත කරුණු, හෙළිදරව් කරමින්, අඛණ්ඩ පැවැත්ම ලෙස දිගටම පවත්වාගෙන යාමේ සමාගමේ හැකියාව තක්සේරු කිරීම සඳහා කළමණාකාරිත්වය වගකිව යුතුවේ.

පාලනය පිළිබඳ වගකිව යුතු අය සමාගමේ මූල්‍ය වාර්තා කරන ක්‍රියාවලිය අධීක්ෂණය කිරීම සඳහා වගකිව යුතුය.

[2] යම් කිසි නියාමන අධිකාරියක් මගින් විගණකවරුන් සඳහා වෙනත් ආචාර ධර්මීය අවශ්‍යතාවයන් නිකුත් කළහොත්, එවැනි රෙගුලාසිවලට යොමු කිරීමක් සැළකිය යුතුය.

[3] මෙම නිදර්ශනාත්මක විගණකගේ වාර්තා පුරාවටම, කළමනාකාරිත්වය සහ පාලනය සඳහා වගකිව යුතු අය යන පද විශේෂ අධිකරණ බල ප්‍රදේශයක් තුළ නෛතික ආකෘතිමය රාමුව සම්බන්ධයෙන් ගත්කළ යෝග්‍ය වන වෙනත් පදයක් මගින් ආදේශ කිරීම අවශ්‍ය විය හැකිය.

[4] මෙම නිදර්ශනාත්මක විගණකගේ වාර්තා පුරාවටම, කළමනාකාරිත්වය සහ පාලනය සඳහා වගකිව යුතු අය යන පද විශේෂ අධිකරණ බල ප්‍රදේශයක් තුළ නෛතික ආකෘතිමය රාමුව සම්බන්ධයෙන් ගත්කළ යෝග්‍ය වන වෙනත් පදයක් මගින් ආදේශ කිරීම අවශ්‍ය විය හැකිය.

**මූල්‍ය ප්‍රකාශ විගණනය සඳහා විගණකගේ වගකීම්**

අපගේ අරමුණු වන්නේ, මූල්‍ය ප්‍රකාශ සමස්ථයක් ලෙස ගත්කළ වංචා හෝ වැරදි නිසා වේවා ප්‍රමාණාත්මක අවප්‍රකාශයකින් තොරද යන්න පිළිබඳව සාධාරණ සහතිකවීමක් ලබාගැනීමට සහ අපගේ මතය ඇතුළත් විගණකගේ වාර්තාව නිකුත් කිරීමටය.

සාධාරණ සහතික වීම යනු ඉහළ මට්ටමේ සහතික වීමකි; එහෙත් ශ්‍රී.ල.වි.ප්‍ර. සමඟ අනුකූලව මෙහෙයවන විගණනයකින් ප්‍රමාණාත්මක අවප්‍රකාශයක් පවතින විට එය සැම විටම අනාවරණය වනු බවට සහතික වීමක් නොවේ. අවප්‍රකාශ පැන නැගිය හැක්කේ වංචා හෝ වැරදි වලින්ය සහ ඒවා ප්‍රමාණාත්මක ලෙස සළකනු ලබන්නේ තනි, තනිව හෝ සමාහාරයක් ලෙස ඒවා මෙම මූල්‍ය ප්‍රකාශ පදනම මත පරිශීලකයන් ගන්නා ආර්ථික තීරණවලට බලපෑමක් කිරීමට සාධාරණ ලෙස අපේක්ෂා කළ හැකි නම්ය.

පහත දක්වෙන අඩුරු කළ කරුණු විගණකගේ වාර්තාවේ පරිශිෂ්ඨයක් තුළ පිහිටුවිය හැකිබව මෙම ශ්‍රී.ල.වි.ප්‍ර. යේ 41 (ආ) ඡේදයෙන් විස්තර කෙරේ. නීතිය, රෙගුලාසි හෝ ශ්‍රී ලංකා විගණන ප්‍රමිත මගින් ප්‍රකාශිතව අවසර දෙන විට, විගණකගේ වගකීම්වල විස්තරය විගණකගේ වාර්තාවේ මෙම කරුණු ඇතුළත් කරනවාට වඩා යෝග්‍ය අධිකාරියක වෙබ් අඩවියකට යොමු කළ හැකි බව 41 (ඇ) ඡේදය පැහැදිලි කරයි. එසේ කළ හැක්කේ වෙබ් අඩවිය මත ලිපිනයේ විස්තරය සහ පහතවන විගණකගේ වගකීම්වල විස්තරය සමඟ අසංගත නොවන්නේ නම්ය.

ශ්‍රී.ල.වි.ප්‍ර. සමඟ අනුකූලව විගණනයක කොටසක් ලෙස, විගණනය පුරාවටම වෘත්තිය විනිශ්චය, භාවිත කිරීම සහ වෘත්තිය සංසදහාවය අප පවත්වා ගෙන යයි. අප එසේම;

- වංචා හෝ වැරදි නිසා හෝ වේවා මූල්‍ය ප්‍රකාශයන්හි ප්‍රමාණාත්මක අවප්‍රකාශ හඳුනාගැනීම සහ තක්සේරු කිරීමට, එම අවදානම් වලට ප්‍රතිචාර දක්වන විගණන පටිපාටි සැළසුම් කිරීම සහ ඉටු කිරීම සහ අපගේ මතය සඳහා පදනමක් ලෙස ලබා ගැනීමට ප්‍රමාණවත් සහ යෝග්‍ය විගණන සාක්ෂි ලබා ගැනීම. වංචා සඳහා දුස්සන්ධානය ව්‍යාජ ලේඛන සෑදීම හිතාමතා අත්හැරීම, සාවද්‍ය ලෙස දැක්වීම, හෝ අභ්‍යන්තර පාලන මැදහත් වී අක්‍රීය කිරීම වැනිදෑ සම්බන්ධ විය හැකි නිසා වරදකින් සිදුවන අවප්‍රකාශයක් අනාවරණය නොකර ගැනීමෙන් වන ප්‍රතිඵලයට වඩා වංචාවකින් වන අවප්‍රකාශයක් හඳුනා නොගැනීමේ ප්‍රතිඵලයක් වශයෙන් වන අවදානම් විශාල වේ.

- යම් අවස්ථාවක් තුළදී යෝග්‍යවන විගණන පටිපාටි සැළසුම් කිරීමට හැකිවීමට විගණනයට අදාළ අභ්‍යන්තර පාලනයන්හි අවබෝධයක් ලබා ගැනීම, එහෙත් මෙහි අරමුණ සමාගමේ අභ්‍යන්තර පාලනයේ සඵලදායකත්වය මත මතයක් ප්‍රකාශ කිරීම පිණිස නොවේ.[5]
- භාවිතා කළ ගිණුම්කරණ ප්‍රතිපත්තිවල සුදුසුතාවය සහ ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකාරිත්වය විසින් සිදු කළ සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගය කිරීම.

- කළමණාකාරිත්වයේ අඛණ්ඩ පැවැත්ම පදනම ගිණුම්කරණය භාවිත කිරීමේ යෝග්‍යතාවය මත ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව, අඛණ්ඩ පැවැත්ම ලෙස දිගටම පවත්වාගෙන යාමේ සමාගමේ හැකියාවට සැළකිය යුතු අන්දමේ සැකයක් පහල කළ හැකි සිද්ධියක් හෝ පවත්නා තත්ත්වයන් සම්බන්ධිත ප්‍රමාණාත්මක අනියතතාවයන් පවතීද යන්න නිගමනය කිරීම. ප්‍රමාණාත්මක අනියතතාවයන් පවතී යයි අප නිගමනය කළහොත්, මූල්‍ය ප්‍රකාශ තුළ සම්බන්ධිත හෙළිදරව් කිරීමට අපගේ විගණන වාර්තාව තුළ අප අවධානය යොමු කිරීමට හෝ එවැනි හෙළිදරව් කිරීම් ප්‍රමාණවත් නොවේ නම්, අපගේ මතය විකරණය කිරීමට අපහට අවශ්‍ය කෙරේ. අපගේ නිගමන පදනම් වී ඇත්තේ, අපගේ විගණකගේ වාර්තාවේ දිනය තෙක් ලබාගත් විගණන සාක්ෂි සම්බන්ධ කරගෙනය. කෙසේ වෙතත් අනාගත සිද්ධීන් හෝ පවත්නා තත්ත්වයන් අඛණ්ඩ පැවැත්ම ලෙස දිගටම පවත්වාගෙන යාම සමාගමට නැවැත්වීමට හේතු විය හැකිය.

- හෙළිදරව් කිරීම් සහ සාධාරණ ඉදිරිපත් කිරීම ඉෂ්ඨ කරගන්නා ආකාරයකට පාදකවන ගණුදෙනු සහ සිද්ධීන් මූල්‍ය ප්‍රකාශවලින් නියෝජනය වන්නේද යන්න ඇතුළුව, සමස්ථ ඉදිරිපත් කිරීම, ව්‍යුහය සහ මූල්‍ය ප්‍රකාශවල අන්තර්ගතය අගය කිරීම.

පාලනය පිළිබඳ වගකිවයුතු අය සමඟ අප සන්නිවේදනය කරන දේවල් අතරට අපගේ විගණනය තුළදී අප හඳුනාගත් අභ්‍යන්තර පාලනයේ යම් සැළකිය යුතු අන්දමේ ඌණතාවයන් ඇතුළුව, විගණනයේ සැළසුම් කළ විෂය පථය සහ කල් තීර්ණය සැළකිය යුතු අන්දමේ විගණන සොයාගැනීම් සම්බන්ධව වෙනත් කරුණු ඇතුළත්ය.

[5] මූල්‍ය ප්‍රකාශයන්හි විගණනය සමඟවන සම්බන්ධතාවය තුළ අභ්‍යන්තර පාලනයෙහි සඵලදායකත්වය මත මතයක් නිකුත් කිරීමේ වගකීමද එලෙසම විගණකට පවතින විට එවැනි තත්ත්වයන්හිදී මෙම වාක්‍ය යෝග්‍ය පරිදි වෙනස් කළහැකිය.

ස්වාධීනත්වය සම්බන්ධයෙන් ආචාර ධර්මීය සංග්‍රහය සමඟ අනුකූල චර්යා ධර්ම අවශ්‍යතාවයන් සමඟ අප අනුකූල වී ඇති බව සහ අපගේ ස්වාධීනත්වය මත රැඳිය හැකියයි සාධාරණ ලෙස සැළකිල්ලට ගත යුතු සියලු සම්බන්ධතාවයන් සහ වෙනත් කරුණු ඔවුන් සමඟ සන්නිවේදනය කිරීම සහ අවශ්‍යවන පරිදි අදාළ ආරක්ෂාව සළස්වන්නන් සහිත ප්‍රකාශයන් පාලනය පිළිබඳව වගකිව යුතු අයට එසේම අප ලබා දෙයි.

පාලනය පිළිබඳ වගකිව යුතු අය සමඟ සන්නිවේදනය කළ කරුණු වලින් ප්‍රවර්තන කාලපරිච්ඡේදයේ මූල්‍ය ප්‍රකාශයන් හි විගණනය තුළදී වඩාත්ම වැදගත් වූ එම කරුණු ප්‍රධාන විගණන කරුණු ලෙස අප තීර්ණය කර ඇත. මෙම කරුණු පිළිබඳව ප්‍රසිද්ධ හෙළිදරව් කිරීම නීතියෙන් හෝ රෙගුලාසි මගින් වළක්වාලන්නේ නොමැති නම් හෝ එවැනි සන්නිවේදනයකින් පොදු යහපත සඳහා වන ප්‍රතිලාභ වලට වඩා එසේ කිරීමෙන් සාධාරණ ලෙස අපේක්ෂා කළ හැකි අහිතකර විපාක වැඩිවන නිසා වන විට කරුණක් අපගේ වාර්තාවේ සන්නිවේදනය නොකළ යුතුයයි. ඉතා විරල තත්ත්වයන්හිදී අප නිගමනය කරන විට හැර අන් අවස්ථාවලදී මෙම කරුණු අපගේ විගණකගේ වාර්තාවේ අප විස්තර කරයි.

**වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතාවයන් මත වාර්තාව**

2007 අංක 07 දරණ සමාගම් පණතේ 163 (2) වගන්තිය මගින් අවශ්‍ය කරන පරිදි විගණනය සඳහා අවශ්‍ය වූ සියලු තොරතුරු සහ පැහැදිලි කිරීම් අප ලබා ගත් අතර අපගේ පරීක්ෂාවන්ගෙන් හෝ පෙනෙනතාක්දුරට සමාගම විසින් නිසි ගිණුම්කරණ වාර්තා පවත්වාගෙන ගොස් ඇත.

මෙම ස්වාධීන විගණනගේ වාර්තාව අත්සන් කිරීම සඳහා වගකිව යුතු කාර්යභාරයේ නියුතු හවුල්කරුගේ ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනයේ සාමාජික අංකය වනුයේ [*අංකය*]

[*විගණන සමාගමේ නමින් අත්සන*]

[*විගණන සමාගමේ ලිපිනය*]

[*දිනය*]

__2 වන නිදර්ශනය - සාධාරණ ඉදිරිපත් කිරීමේ ආකෘතිමය රාමුවක් සමඟ අනුකූලව පිළියෙල කළ ලැයිස්තුගත අස්තිත්ත්වයක මූල්‍ය ප්‍රකාශ සහ එහි ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශ මත විගණකගේ වාර්තාව__

**මෙම නිදර්ශනාත්මක විගණකගේ වාර්තාවේ අරමුණු සඳහා පහත තත්ත්වයන් උපකල්පනය කෙරේ:**

- සාධාරණ ඉදිරිපත් කිරීමේ ආකෘතිමය රාමුව භාවිත කරමින් ලැයිස්තුගත අස්තිත්ත්වයක සම්පූර්ණ මූල්‍ය ප්‍රකාශ කට්ටලයක් සහ එහි ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශ විගණනය, විගණනය පරිපාලිත සහිත අස්තිත්ත්වයක සමූහ විගණනයකි. (එනම්ත ශ්‍රී.ල.වි.ප්‍ර. 600 ව්‍යවහාර වේ)
- ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත සමඟ අනුකූලව (පොදු අරමුණු ආකෘතිමය රාමුවක) ඒකාබද්ධ සහ අස්තිත්ත්වයේ මූල්‍ය ප්‍රකාශ කළමනාකාරීත්වය විසින් පිළියෙල කරයි.
- ශ්‍රී.ල.වි.ප්‍ර. 210 තුළ වන ඒකාබද්ධ සහ අස්තිත්ත්වයේ මූල්‍ය ප්‍රකාශ සඳහා වන කළමනාකාරීත්වයේ වගකීම්හි විස්තර විගණන කාර්යභාරයේ නියමයන්ගෙන් පිළිබිඹුවේ.
- ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව විගණක නිගමනය කළ විකරණය නොකළ (එනම්ත "පිරිසිදු") මතය යෝග්‍ය වේ.
- විගණනයට ව්‍යවහාරවන අදාළ සියලු ආචාර ධර්මීය අවශ්‍යතාවයන් අඩංගුව ඇත්තේ ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනය විසින් නිකුත් කළ ආචාර ධර්ම සංග්‍රහයේය.

- **ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව, ශ්‍රී.ල.වි.ප්‍ර. 570 (සංශෝධිත) සමඟ අනුකූලව අඛණ්ඩව පැවැත්ම ලෙස දිගටම පවත්වාගෙන යාමේ අස්තිත්ත්වයේ හැකියාව මත සැළකිය යුතු අන්දමේ සැක පහළ කළ හැකි සිද්ධීන් හෝ පවත්නා තත්ත්වයන් සම්බන්ධිත ප්‍රමාණාත්මක අනියතතාවයක් නොපවතින බව විගණක නිගමනය කර ඇත.**
- **ශ්‍රී.ල.වි.ප්‍ර. 701 සමඟ අනුකූලව ප්‍රධාන විගණන කරුණු සන්නිවේදනය කර ඇත.**
- **විගණකගේ වාර්තාවේ දිනයට පෙර විගණක සියලුම වෙනත් තොරතුරු ලබාගෙන ඇති අතර වෙනත් තොරතුරුවල ප්‍රමාණාත්මක අවප්‍රකාශයක් හඳුනාගෙන නොමැත.**
- **ඒකාබද්ධ සහ අස්තිත්ත්වයේ මූල්‍ය ප්‍රකාශ අධීක්ෂණය කිරීම සඳහා වගකිව යුතු අය ඒකාබද්ධ සහ අස්තිත්ත්වයේ මූල්‍ය ප්‍රකාශ පිළියෙල කිරීම සඳහා වගකිව යුතු අයගෙන් වෙනස් වේ.**
- **ඒකාබද්ධ සහ අස්තිත්ත්වයේ මූල්‍ය ප්‍රකාශ විගණනය කිරීමට අමතරව දේශීය නීතිය යටතේ අවශ්‍ය කරන වෙනත් වාර්තා කිරීමේ වගකීම්ද විගණකට ඇත.**

**ස්වාධීන විගණකගේ වාර්තාව**

ABC සමාගමේ කොටස් හිමියන් වෙත [හෝ යෝග්‍ය පරිදි අමතන අය]

**මූල්‍ය ප්‍රකාශ විගණනය මත වාර්තාව**[6]

**මතය**

ABC සමාගමේ සහ ("සමාගම") සහ එහි පරිපාලිතයන්ගේ ("සමූහය") 20×1 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශය සහ එම දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා විස්තීර්ණ ආදායම් ප්‍රකාශය, ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශය සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශය සහ වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තින්හි සාරාංශයක් ඇතුළුව මූල්‍ය ප්‍රකාශ වලට සටහන් වලින් සමන්විත සමාගමේ මූල්‍ය ප්‍රකාශ සහ සමාගමේ සහ එහි පරිපාලිතයන්ගේ ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශ අප විසින් විගණනය කරන ලදී.

අපගේ මතය අනුව සමාගමේ සහ සමූහයේ 20×1 දෙසැම්බර් 31 වන දිනට මූල්‍ය තත්ත්වය සහ එම දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා ඔවුන්ගේ මූල්‍ය කාර්ය සාධනය සහ මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා ගිණුම්කරන ප්‍රමිතිවලට අනුකූලව මේ සමඟ ඇති සමාගම් සහ සමූහයේ මූල්‍ය ප්‍රකාශ සත්‍ය හා සාධාරණ දර්ශනයක් පෙන්නුම් කරන බවය. *(හෝ සියලුම ප්‍රමාණාත්මක අංගයන්ගෙන් සාධාරණව ඉදිරිපත් කෙරේ)*

**මතය සඳහා පදනම**

අප විසින් අපගේ විගණනය මෙහෙයවන ලද්දේ ශ්‍රී ලංකා විගණන ප්‍රමිත සමඟ අනුකූලවය. (ශ්‍රී.ල.වි.ප්‍ර.) එම ප්‍රමිත යටතේ අපගේ වගකීම් තවදුරටත් අපගේ වාර්තාවේ *මූල්‍ය ප්‍රකාශ විගණනය සඳහා විගණකගේ වගකීම්* කොටසේ විස්තර කෙරේ. ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරි ආයතනය විසින් නිකුත් කළ ආචාර ධර්මීය සංග්‍රහය අනුව සමූහයෙන් අප ස්වාධීනය (ආචාර ධර්ම සංග්‍රහය)[7] සහ ආචාර ධර්ම සංග්‍රහය සමඟ අනුකූලව අපගේ වෙනත් චර්යා ධර්ම වගකීම් අප ඉටුකර ඇත. අප විසින් ලබාගත් විගණන සාක්ෂි අපගේ මතය සඳහා පදනමක් ලබා දීමට ප්‍රමාණවත් සහ යෝග්‍ය බව අප විශ්වාස කරයි.

**ප්‍රධාන විගණන කරුණු**

ප්‍රධාන විගණන කරුණු වනුයේ ප්‍රවර්තන කාලපරිච්ඡේදයේ මූල්‍ය ප්‍රකාශවල අපගේ වෘත්තිය විනිශ්චය අනුව වඩාත් වැදගත් වූ එම කරුණුය. මූල්‍ය ප්‍රකාශ සමස්ථයක් ලෙස ගත්කළ අපගේ විගණනය සම්බන්ධව සහ ඒ මත අපගේ මතය සකස් කිරීමේදී මෙම කරුණු අප අමතා ඇති අතර මෙම කරුණු මත වෙනම මතයක් අප ලබා දෙන්නේ නැත.

[*ශ්‍රී.ල.වි.ප්‍ර. 701 සමඟ අනුකූලව සෑම ප්‍රධාන විගණන කරුණකම විස්තරය*]

[6] "වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතාවයන් මත වාර්තාව" යන දෙවන උප මාතෘකාව අදාළ නොවන තත්ත්වයන්හිදී "මූල්‍ය ප්‍රකාශ විගණනය මත වාර්තාව" යන උපමාතෘකාව අවශ්‍ය නොවේ.

[7] යම් කිසි නියාමන අධිකාරියක් මගින් විගණකවරුන් සඳහා වෙනත් ආචාර ධර්මීය අවශ්‍යතාවයන් නිකුත් කළහොත්, එවැනි රෙගුලාසිවලට යොමු කිරීමක් සැළකිය යුතුය.

වෙනත් තොරතුරු හෝ යෝග්‍ය වන්නේ නම් "මූල්‍ය ප්‍රකාශ සහ විගණකගේ වාර්තාව මත හැර වන තොරතුරු වැනි වෙනත් ශීර්ෂය]

[*ශ්‍රී.ල.වි.ප්‍ර. 720 (සංශෝධිත) හි වාර්තා කරන අවශ්‍යතාවයන් සමග අනුකූලව වාර්තා කිරීම ශ්‍රී.ල.වි.ප්‍ර. 720 (සංශෝධිත) හි 2 වන පරිශිෂ්ඨයේ 1 වන නිදර්ශනය බලන්න*]

**මූල්‍ය ප්‍රකාශ සඳහා කළමනාකාරීත්වයේ සහ පාලනය පිළිබඳව වගකිව යුතු අයගේ වගකීම්** [8]

ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත සමග අනුකූලව[9] එය සත්‍ය හා සාධාරණ දර්ශනයක් ගෙන දෙන මූල්‍ය ප්‍රකාශ පිළියෙල කිරීම සඳහා සහ වංචා හෝ වැරදි නිසා හෝ වේවා එය ප්‍රමාණාත්මක අවප්‍රකාශ වලින් තොරව මූල්‍ය ප්‍රකාශ පිළියෙල කිරීමට හැකිවීම පිණිස කළමණාකාරීත්වය අවශ්‍ය යයි නිර්ණය කරන පරිදි එවැනි අභ්‍යන්තර පාලන සඳහා කළමණාකාරිත්වය වගකිව යුතු ය.

මූල්‍ය ප්‍රකාශ පිළියෙල කිරීමේදී එක්කෝ කළමනාකාරීත්වය සමූහය ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ මෙහෙයුම් නැවැත්වීමට හෝ එසේ කිරීමට යථාර්ථවාදී විකල්පයක් නැත්නම් මිස අඛණ්ඩ පැවැත්ම පදනම ගිණුම්කරණය භාවිත කිරීම සහ අදාළ වන පරිදි අඛණ්ඩව පැවැත්මට සම්බන්ධිත කරුණු, හෙළිදරව් කිරීමෙන්, අඛණ්ඩ පැවැත්ම ලෙස දිගටම පවත්වාගෙන යාමට සමූහයේ හැකියාව තක්සේරු කිරීම සඳහා කළමනාකාරීත්වය වගකිව යුතුවේ.

පාලනය පිළිබඳ වගකිව යුතු අය සමාගමේ සහ සමූහයේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය අධීක්ෂණය කිරීම සඳහා වගකිව යුතුය.

**මූල්‍ය ප්‍රකාශ විගණනය සඳහා විගණකගේ වගකීම්**

අපගේ අරමුණු වන්නේ මූල්‍ය ප්‍රකාශ සමස්ථයක් ලෙස ගත්කළ වංචා නිසා හෝ වැරදි නිසා වේවා ප්‍රමාණාත්මක අවප්‍රකාශයකින් තොර ද යන්න පිළිබඳව සාධාරණ සහතික වීමක් ලබා ගැනීමට සහ අපගේ මතය ඇතුළත් විගණකගේ වාර්තාව නිකුත් කිරීමට ය. සාධාරණ සහතිකවීම යනු ඉහළ මට්ටමේ සහතික වීමකි, එහෙත් ශ්‍රී.ල.වි.ප්‍ර. සමග අනුකූලව මෙහෙයවන විගණනයකින් ප්‍රමාණාත්මක අවප්‍රකාශයක් පවතින විට එය සැම විටම අනාවරණයවනු බවට සහතික වීමක් නොවේ. අවප්‍රකාශ පැනනැගිය හැක්කේ වංචා හෝ වැරදි වලින්ය සහ ඒවා ප්‍රමාණාත්මක ලෙස සළකනු ලබන්නේ තනි, තනිව හෝ සමාහාරයක් ලෙස ඒවා මෙම මූල්‍ය ප්‍රකාශ පදනම මත පරිශීලකයන් ගන්නා ආර්ථික තීරණවලට බලපෑමක් කිරීමට සාධාරණ ලෙස අපේක්ෂා කළ හැකි නම් ය.

පහත දැක්වෙන අඳුරු කළ කරුණු විගණකගේ වාර්තාවේ පරිශිෂ්ඨයක් තුළ පිහිටුවිය හැකිබව මෙම ශ්‍රී.ල.වි.ප්‍ර. යේ 41 (ආ) ඡේදයෙන් විස්තර කෙරේ. නීතිය රෙගුලාසි හෝ ශ්‍රී ලංකා විගණන ප්‍රමිත මගින් ප්‍රකාශිතව අවසර දෙන විට විගණකගේ වගකීම්වල විස්තරය විගණකගේ වාර්තාවේ මෙම කරුණු ඇතුළත් කරනවාට වඩා යෝග්‍ය අධිකාරියක වෙබ් අඩවියකට යොමු කළ හැකි බව 41 (ඇ) ඡේදය පැහැදිලි කරයි. එසේ කළ හැක්කේ වෙබ් අඩවිය මත ලිපිනයේ විස්තරය සහ පහතවන විගණකගේ වගකීම්වල විස්තරය සමග අසංගත නොවන්නේ නම් ය. ශ්‍රී.ල.වි.ප්‍ර. සමග අනුකූලව විගණනයක කොටසක් ලෙස විගණනය පුරාවටම වෘත්තිය විනිශ්චය භාවිත කිරීම සහ වෘත්තිය සංසදහාවය අප පවත්වා ගෙන යයි. අප එසේම;

- වංචා හෝ වැරදි නිසා හෝ වේවා මූල්‍ය ප්‍රකාශ එහි ප්‍රමාණාත්මක අවප්‍රකාශයක අවදානම් හඳුනා ගැනීම සහ තක්සේරු කිරීම, එම අවදානම්වලට ප්‍රතිචාර දක්වන විගණන පටිපාටි සැළසුම් කිරීම සහ ඉටු කිරීම සහ අපගේ මතය සඳහා පදනමක් ලෙස ලබාදීම ප්‍රමාණවත් සහ යෝග්‍ය විගණන සාක්ෂි ලබා ගැනීම, වංචා සඳහා **දුස්සන්ධානය** ව්‍යාජ ලේඛන සාක්ෂි හිතාමතා අත් හැරීම, සාවද්‍ය ලෙස දැක්වීම හෝ අභ්‍යන්තර පාලන මැදිහත් වී අක්‍රීය කිරීම වැනි දෑ සම්බන්ධව විය හැකි නිසා වරදකින් සිදුවන අවප්‍රකාශයක් අනාවරණය නොකර ගැනීමෙන් වන ප්‍රතිඵලයට වඩා වංචාවකින් වන

[8] හෝ විශේෂ අධිකරණ බලප්‍රදේශයක නෛතික ආකෘතිමය රාමුවේ සම්බන්ධය තුළ යෝග්‍යවන වෙනත් පද.

[9] සාධාරණ ඉදිරිපත් කිරීමක් ගෙන දෙන මූල්‍ය ප්‍රකාශ පිළියෙල කිරීම සඳහා කළමනාකාරීත්වය වගකිව යුතු වන අවස්ථාවලදී මෙය කිය විය හැක්කේ "ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත සමග අනුකූලව මූල්‍ය ප්‍රකාශ පිළියෙල කිරීම සහ සාධාරණ ඉදිරිපත් කිරීම සඳහා කළමනාකාරීත්වය වගකිව යුතුවේ, සහ එබඳු දෑ සඳහා. . . . ." ලෙසය.

අවප්‍රකාශයක් හඳුනා නොගැනීමේ ප්‍රතිඵලයක් වශයෙන් වියහැකි හෝ අවදානම වඩා විශාල වේ.

- පවතින තත්ත්වයන් තුළදී යෝග්‍යවන විගණන පටිපාටි සැලසුම් කිරීමට හැකිවීමට විගණනයට අදාළ අභ්‍යන්තර පාලනයන්හි අවබෝධයක් ලබා ගැනීම. එහෙත් මෙහි අරමුණ සමාගමේ සහ සමූහයේ අභ්‍යන්තර පාලනයේ සඵලදායකත්වය මත මතයක් ප්‍රකාශ කිරීම පිණිස නොවේ.[10]

- භාවිත කළ ගිණුම්කරණ ප්‍රතිපත්තිවල යෝග්‍යතාවය සහ ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමණාකාරීත්වය විසින් සිදුකළ සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගය කිරීමට.

- කළමනාකාරීත්වයේ අඛණ්ඩ පැවැත්ම පදනම ගිණුම්කරණය භාවිත කිරීමේ යෝග්‍යතාවය සහ ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව, අඛණ්ඩ පැවැත්ම ලෙස දිගටම පවත්වාගෙන යාමේ සමූහයේ හැකියාවට සැළකිය යුතු අන්දමේ සැකයක් පහළ කළ හැකි සිද්ධීන් හෝ පවත්නා තත්ත්වයන්ට සම්බන්ධිත ප්‍රමාණාත්මක අනියතතාවයක් පවතීද යන්න නිගමනය කිරීම. ප්‍රමාණාත්මක අනියතතාවයක් පවතී යයි අප නිගමනය කළහොත් මූල්‍ය ප්‍රකාශ තුළ සම්බන්ධිත හෙළිදරව් කිරීමට අපගේ විගණන වාර්තාව තුළ අප අවධානය යොමු කිරීමට හෝ එවැනි හෙළිදරව් කිරීම් ප්‍රමාණවත් නොවේ නම් අපගේ මතය විකරණය කිරීමට අප හට අවශ්‍ය කෙරේ. අපගේ නිගමන පදනම් වී ඇත්තේ අපගේ විගණකගේ වාර්තාවේ දිනය තෙක් ලබාගත් විගණන සාක්ෂි මතය. කෙසේ වෙතත් අනාගත සිද්ධීන් හෝ පවත්නා තත්ත්වයන් අඛණ්ඩ පැවැත්ම ලෙස දිගටම පවත්වාගෙන යාම සමූහයට නැවැත්වීමට හේතුවිය හැකිය.

- හෙළිදරව් කිරීම සහ සාධාරණ ඉදිරිපත් කිරීම ඉෂ්ඨ කර ගන්නා ආකාරයකට පාදකවන ගණුදෙනු සහ සිද්ධීන් මූල්‍ය ප්‍රකාශ වලින් නියෝජනය වන්නේද යන්න ඇතුළුව සමස්ථ ඉදිරිපත් කිරීම් ව්‍යුහය සහ මූල්‍ය ප්‍රකාශවල අන්තර්ගතය අගය කිරීම.

- ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශ මත මතයක් ප්‍රකාශ කිරීමට සමූහය තුළ අස්තිත්ත්වයේ හෝ ව්‍යාපාරික ක්‍රියාකාරකම් හි මූල්‍ය තොරතුරු සම්බන්ධයෙන් ප්‍රමාණවත් යෝග්‍ය විගණන සාක්ෂි ලබාගැනීම. සමූහ විගණනය මෙහෙයවීම, අධීක්ෂණය සහ කාර්ය සාධනය සඳහා අප වගකිව යුතුය. අපගේ විගණන මතය සඳහා අපගේ තනිකර වගකීම රඳා පවතී.

පාලනය පිළිබඳව වගකිව යුතු අය සමග අප සන්නිවේදනය කරන දේවල් අතරට අපගේ විගණනය තුළදී අප හඳුනාගත් අභ්‍යන්තර පාලනයේ යම් සැළකිය යුතු අන්දමේ ඌණතාවයන් ඇතුළුව, විගණනයේ සැළසුම් කළ විෂය පථය සහ කාල නීර්ණය, සැළකිය යුතු අන්දමේ විගණන සොයා ගැනීම් සම්බන්ධව වෙනත් කරුණු ඇතුළත් ය.

ස්වාධීනත්වය සම්බන්ධයෙන් ආචාරධර්මීය සංග්‍රහය සමග අනුකූලව චර්යා ධර්ම අවශ්‍යතාවයන් සමග අප අනුකූල වී ඇති බව සහ අපගේ ස්වාධීනත්වය මත රැඳිය හැකි යයි සාධාරණ ලෙස සැළකිල්ලට ගත යුතු සියලු සම්බන්ධතාවන් සහ වෙනත් කරුණු ඔවුන් සමග සන්නිවේදනය කිරීමට සහ අවශ්‍ය වන පරිදි අදාළ ආරක්ෂාවන් සලස්වන්නන් සහිත ප්‍රකාශයක් පාලනය පිළිබඳව වගකිව යුතු අයට එසේම අප ලබාදෙයි.

පාලනය පිළිබඳව වගකිව යුතු අය සමග සන්නිවේදනය කළ කරුණු වලින් ප්‍රවර්තන කාලපරිච්ඡේදයේ මූල්‍ය ප්‍රකාශයන්හි විගණනය තුළදී වඩාත්ම වැදගත් වූ එම කරුණු ප්‍රධාන විගණන කරුණු ලෙස අප නිර්ණය කර ඇත.

මෙම කරුණු පිළිබඳව ප්‍රසිද්ධ හෙළිදරව් කිරීම නීතියෙන් හෝ රෙගුලාසියකින් වලක්වාලන්නේ නොමැති නම් හෝ එවැනි සන්නිවේදනයකින් පොදු යහපත සඳහාවන ප්‍රතිලාභවල වඩා එසේ කිරීමෙන් සාධාරණ ලෙස අපේක්ෂා කළ හැකි අහිතකර විපාක වැඩිවන නිසා වන විට කරුණක් අපගේ වාර්තාවේ සන්නිවේදනය නොකළ යුතුයයි ඉතා විරල තත්ත්වයක් හිදී අප නිගමනය කරන විට හැර අන් අවස්ථාවලදී මෙම කරුණු අපගේ විගණකගේ වාර්තාවේ අප විස්තර කරයි.

**වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතාවයන් මත වාර්තාව**

2007 අංක 07 දරණ සමාගම් පනතේ 163(2) වගන්තිය මගින් අවශ්‍ය කරන පරිදි විගණනය සඳහා අවශ්‍ය වූ සියලු තොරතුරු සහ පැහැදිලි කිරීම් අප ලබාගත් අතර අපගේ පරීක්ෂාවන් ගෙන් පෙනෙනතාක් දුරට සමාගම +සමූහය? විසින් නිසි ගිණුම්කරණ වාර්තා පවත්වා ගෙන ගොස් ඇත.

මෙම ස්වාධීන විගණකගේ වාර්තාව අත්සන් කිරීම සඳහා වගකිව යුතු කාර්යභාරයේ නියුතු හවුල්කරුගේ ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනයේ සාමාජික අංකය වනුයේ *[අංකය]*

---

[10] මූල්‍ය ප්‍රකාශයන්හි විගණනය සමගවන සම්බන්ධතාවය තුළ අභ්‍යන්තර පාලනයෙහි සඵලදායකත්ව මත මතයක් නිකුත් කිරීමේ වගකීමද එලෙසම විගණකට පවතින විට එවැනි තත්ත්වයන්හිදී මෙම වාක්‍ය යෝග්‍ය පරිදි වෙනස් කළ හැකිය.

[*විගණන සමාගම නමින් අත්සන*]

[*විගණන සමාගමේ ලිපිනය*]

[*දිනය*]

**3 වන නිදර්ශනය - සාධාරණ ඉදිරිපත් කිරීමේ ආකෘතිමය රාමුවක් සමඟ අනුකූලව පිළියෙල කළ ලැයිස්තුගත අස්තිත්ත්වයක් නොවන අස්තිත්ත්වයක මූල්‍ය ප්‍රකාශ මත විගණකගේ වාර්තාව**

**මෙම නිදර්ශනාත්මක විගණකගේ වාර්තාවේ අරමුණු සඳහාත පහත තත්ත්වයන් උපකල්පනය කෙරේ:**

- **සාධාරණ ඉදිරිපත් කිරීමේ ආකෘතිමය රාමුව භාවිත කරමින් ලැයිස්තුගත අස්තිත්ත්වයක් නොවන අස්තිත්ත්වයක සම්පූර්ණ මූල්‍ය ප්‍රකාශ කට්ටලයක විගණනය. මෙම විගණනය සමූහ විගණනයක් නොවේ. (එනම්ත ශ්‍රී.ල.වි.ප්‍ර. 600 ව්‍යවහාර නොවේ)**
- **ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත (පොදු අරමුණු ආකෘතිමය රාමුවක) සමඟ අනුකූලව අස්තිත්ත්වයේ කළමනාකාරීත්වය විසින් මූල්‍ය ප්‍රකාශ පිළියෙල කරයි.**
- **ශ්‍රී.ල.වි.ප්‍ර. 210 තුළ වන මූල්‍ය ප්‍රකාශ සඳහාවන කළමනාකාරීත්වයේ වගකීම්හි විස්තරය විගණන කාර්යභාරයේ නියමයන් ගෙන් පිළිබිඹුවේ.**
- **ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව විගණක නිගමනය කළ විකරණය නොකළ (එනම්ත "පිරිසිදු") මතය යෝග්‍ය වේ.**
- **විගණනයට ව්‍යවහාර කළ අදාළ ආචාර ධර්මීය අවශ්‍යතාවයන් අඩංගුව ඇත්තේ ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනය විසින් නිකුත් කළ ආචාර ධර්ම සංග්‍රහයේය.**
- **ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ශ්‍රී.ල.වි.ප්‍ර. 570 (සංශෝධිත) සමඟ අනුකූලව අඛණ්ඩ පැවැත්ම ලෙස දිගටම පවත්වා ගෙන යාමේ අස්තිත්ත්වයේ හැකියාව මත සැළකිය යුතු අන්දමේ සැක පහළ කළ හැකි සිද්ධීන් හෝ පවත්නා තත්ත්වයන් සම්බන්ධිත ප්‍රමණාත්මක අනියතතාවයක් නොපවතින බව විගණක නිගමනය කර ඇත.**
- **ශ්‍රී.ල.වි.ප්‍ර. 701 සමඟ අනුකූලව ප්‍රධාන විගණන කරුණු සන්නිවේදනය කිරීමට විගණකට අවශ්‍ය නොවන මෙන්ම අන් අයුරකින් එය කිරීමට තීරණය කර නොමැත.**
- **විගණකගේ වාර්තාවේ දිනයට පෙර විගණක සියලුම වෙනත් තොරතුරු ලබා ගෙන ඇති අතර වෙනත් තොරතුරුවල ප්‍රමාණාත්මක අවප්‍රකාශයක් මෙතෙක් හඳුනා ගෙන නොමැත.**
- **මූල්‍ය ප්‍රකාශ අධීක්ෂණය කිරීම සඳහා වගකිව යුතු අය මූල්‍ය ප්‍රකාශ පිළියෙල කිරීම සඳහා වගකිව යුතු අයගෙන් වෙනස් වේ.**
- **යෝග්‍ය අධිකාරියක වෙබ් අඩවියක් මත විගණකගේ වගකීම්වල විස්තරයක් ඇතුළත් කිරීම යොමු කිරීමට විගණක තෝරාගෙන ඇත.**
- **මූල්‍ය ප්‍රකාශ විගණනය කිරීමට අමතරව දේශීය නීතිය යටතේ අවශ්‍ය කරන වෙනත් වාර්තා කිරීමේ වගකීම්ද විගණකට ඇත.**

**ස්වාධීන විගණකගේ වාර්තාව**

ABC සමාගමේ කොටස්හිමියන් වෙත [හෝ වෙනත් යෝග්‍ය පරිදි අමතන අය]

**මූල්‍ය ප්‍රකාශ විගණනය මත වාර්තාව** [11]

**මතය**

ABC සමාගමේ (සමාගම) 20×1 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශය සහ එම දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා විස්තීර්ණ ආදායම් ප්‍රකාශය ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශය සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශය සහ වැදගත් ගිණුම්කරන ප්‍රතිපත්තිහි සාරාංශයක් අතුළුව, මූල්‍ය ප්‍රකාශවලට සටහන් වලින් සමන්විත මූල්‍ය ප්‍රකාශ අප විසින් විගණනය කරන ලදී.

අපගේ මතය අනුව 20×1 දෙසැම්බර් 31 දිනට සමාගමේ මූල්‍ය තත්ත්වය සහ එම දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා එහි මුල්‍ය කාර්ය සාධනය සහ එහි මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත වලට අනුකූලව මේ සමඟ ඇති මූල්‍ය

[11] "වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතාවයන් මත වාර්තාව" යන දෙවන උප මාතෘකාව අදාළ නොවන තත්ත්වයන්හිදී"මූල්‍ය ප්‍රකාශ විගණනය මත වාර්තාව" යන උපමාතෘකාව අවශ්‍ය නොවේ.

ප්‍රකාශ සත්‍ය හා සාධාරණ දර්ශනයක් පෙන්නුම් කර බව ය. *(හෝ සියලුම ප්‍රමාණාත්මක අංගයන් ගෙන් සාධාරණව ඉදිරිපත් කෙරේ.*

**මතය සඳහා පදනම**

අප විසින් අපගේ විගණනය මෙහෙයවන ලද්දේ ශ්‍රී ලංකා විගණන ප්‍රමිත සමග අනුකූලව ය. (ශ්‍රී.ල.වි.ප්‍ර.) එම ප්‍රමිත යටතේ අපගේ වගකීම් තවදුරටත් අපගේ වාර්තාවේ *මූල්‍ය ප්‍රකාශ විගණනය සඳහා විගණකගේ වගකීම්* කොටස තුළ විස්තර කෙරේ. ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරි ආයතනය විසින් නිකුත් කළ ආචාර ධර්මීය සංග්‍රහයේ මූල්‍ය ප්‍රකාශයන්හි අපගේ විගණනයට අදාළ සදාචාරමය අවශ්‍යතාවයන්ට අනුකූලව සමාගමෙන් අප ස්වාධීනය (ආචාර ධර්ම සංග්‍රහය)[12] සහ ආචාර ධර්ම සංග්‍රහය සමග අනුකූලව අපගේ වෙනත් චර්යා ධර්ම වගකීම් අප ඉටුකර ඇත. අප විසින් ලබාගත් විගණන සාක්ෂි අපගේ මතය සඳහා පදනම ලබාදීමට ප්‍රමාණවත් සහ යෝග්‍ය බව අප විශ්වාස කරයි. වෙනත් තොරතුරු [හෝ වෙනත් ශීර්ෂයක් "මූල්‍ය ප්‍රකාශ සහ විගණකගේ වාර්තාව මත හැර වෙනත් තොරතුරු" වැනි යෝග්‍ය වේ නම්]

*[ශ්‍රී.ල.වි.ප්‍ර. 720 (සංශෝධිත) හි වාර්තාකරණ අවශ්‍යතාවයන් සමග අනුකූලව වාර්තා කිරීම ශ්‍රී.ල.වි.ප්‍ර. 720 (සංශෝධිත) හි 2 වන පරිශිෂ්ඨයේ 1 වන නිදර්ශනය බලන්න]*

**මූල්‍ය ප්‍රකාශ සඳහා කළමනාකාරීත්වයේ සහ පාලනය පිළිබඳව වගකිව යුතු අයගේ වගකීම්**[13]

ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත සමග අනුකූලව[14] එය සත්‍ය හා සාධාරණ දර්ශනයක් ගෙන දෙන මූල්‍ය ප්‍රකාශ පිළියෙල කිරීම සඳහා සහ වංචා හෝ වැරදි නිසා හෝ වේවා ඒවා ප්‍රමාණාත්මක අවප්‍රකාශ වලින් තොරව මූල්‍ය ප්‍රකාශ පිළියෙල කිරීමට හැකිවීම පිණිස කළමණාකාරීත්වය අවශ්‍ය යයි නීර්ණය කරන පරිදි එවැනි අභ්‍යන්තර පාලන සඳහා කළමනාකාරීත්වය වගකිව යුතුය.

මූල්‍ය ප්‍රකාශ පිළියෙල කිරීමේදී එක්කෝ කළමනාකාරීත්වය සමාගම ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ මෙහෙයුම් නැවැත්වීමට හෝ එසේ කිරීමට යථාර්තවාදී විකල්පයන් නැත්නම් මිස අඛණ්ඩ පැවැත්ම පදනම් ගිණුම්කරණය භාවිත කිරීම හා අදාළවන පරිදි අඛණ්ඩ පැවැත්මට සම්බන්ධිත කරුණු, හෙළිදරව් කරමින් අඛණ්ඩ පැවැත්ම ලෙස දිගටම පවත්වාගෙන යාමේ සමාගමේ හැකියාව තක්සේරු කිරීම සඳහා කළමනාකාරීත්වය වගකිව යුතුවේ.

පාලනය පිළිබඳ වගකිව යුතු අය සමාගමේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය අධීක්ෂණය කිරීම සඳහා වගකිව යුතුය.

**මූල්‍ය ප්‍රකාශ විගණනය සඳහා විගණකගේ වගකීම්**

අපගේ අරමුණු වන්නේ මූල්‍ය ප්‍රකාශ සමස්ථයක් ලෙස ගත් කළ වංචා හෝ වැරදි නිසා හෝ වේවා ප්‍රමාණාත්මක අවප්‍රකාශයකින් තොරද යන්න පිළිබඳව සාධාරණ සහතික වීමක් ලබා ගැනීමට සහ අපගේ මතය ඇතුළත් විගණකගේ වාර්තාව නිකුත් කිරීමය. සාධාරණ සහතිකවීම යනු ඉහළම මට්ටමේ සහතික වීමකි; එහෙත් ශ්‍රී.ල.වි.ප්‍ර. සමග අනුකූලව මෙහෙයවන ලද විගණනයකින් ප්‍රමාණාත්මක අවප්‍රකාශයක් පවතින විට එය සෑමවිටම අනාවරණය වන බවට සහතික වීමක් නොවේ. අවප්‍රකාශ පැන නැගිය හැක්කේ වංචා හෝ වැරදි වලින් සහ ඒවා ප්‍රමාණාත්මක ලෙස සළකනු ලබන්නේ තනි තනිව හෝ සමාහාරයක් ලෙස ඒවා මෙම මූල්‍ය ප්‍රකාශ පදනම මත පරිශීලකයන් ගන්නා ආර්ථික තීරණවල බලපෑමක් කිරීමට සාධාරණ ලෙස අපේක්ෂා කළ හැකි නම්ය. මූල්‍ය ප්‍රකාශයන්හි විගණනය සඳහා විගණකගේ වගකීම්හි තවදුරටත් වන විස්තරයක් ශ්‍රී ලංකා ගිණුම්කරණ සහ විගණන වෙබ් අඩවියේ: www.slaasc.com/auditingstandards/auditorsresponsibility. ලිපිනයේ පිහිටුවා ඇත. මෙම විස්තරය අපගේ විගණකගේ වාර්තාවේ කොටසක ස්වරූපය ගනී.

**වෙනත් නෛතික නියාමන අවශ්‍යතා මත වාර්තාව.**

2007 අංක 07 දරන සමාගම් පනතේ 163 (2) වගන්තිය මගින් අවශ්‍යකරන පරිදි විගණනය සඳහා අවශ්‍ය වූ සියලු තොරතුරු සහ පැහැදිලි කිරීම් අප ලබාගත් අතර අපගේ පරීක්ෂාවන් ගෙන් පෙනෙන තාක් දුරට සමාගම විසින් නිසි ගිණුම් කරන වාර්තා පවත්වාගෙන ගොස් ඇත.

[*විගණන සමාගම නමින් අත්සන*] [*විගණන සමාගමේ ලිපිනය*]

[*දිනය*]

---

[12] යම් කිසි නියාමන අධිකාරියක් මගින් විගණකවරුන් සඳහා වෙනත් ආචාර ධර්මීය අවශ්‍යතාවයන් නිකුත් කළහොත්, එවැනි රෙගුලාසිවලට යොමු කිරීමක් සැළකිය යුතුය.

[13] හෝ විශේෂ අධිකරණ බලප්‍රදේශයක නෛතික ආකෘතිමය රාමුවේ සම්බන්ධය තුළ යෝග්‍යවන වෙනත් පද.

[14] සාධාරණ ඉදිරිපත් කිරීමක් ගෙන දෙන මූල්‍ය ප්‍රකාශ පිළියෙල කිරීම සඳහා කළමනාකාරීත්වය වගකිව යුතු වන අවස්ථාවලදී මෙය කිය විය හැක්කේ "ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත සමග අනුකූලව මූල්‍ය ප්‍රකාශ පිළියෙල කිරීම සහ සාධාරණ ඉදිරිපත් කිරීම සඳහා කළමනාකාරීත්වය වගකිව යුතුවේ, සහ එබඳු දෑ සඳහා..." ලෙසය.

**4 වන නිදර්ශනය - සාධාරණ ඉදිරිපත් කිරීමේ ආකෘතිමය රාමුව සමඟ අනුකූලව පිළියෙල කළ ලැයිස්තුගත අස්තිත්ත්වයක් නොවන අස්තිත්ත්වයක මූල්‍ය ප්‍රකාශ සහ එහි ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශ මත විගණකගේ වාර්තාව**

**මෙම නිදර්ශනාත්මක විගණකගේ වාර්තාවේ අරමුණු සඳහා, පහත තත්ත්වයන් උපකල්පනය කෙරේ:**

- **සාධාරණ ඉදිරිපත් කිරීමේ ආකෘතිමය රාමුවක් භාවිත කරමින් ලැයිස්තුගත අස්තිත්ත්වයක් නොවන අස්තිත්ත්වයක සම්පූර්ණ මූල්‍ය ප්‍රකාශ කට්ටලයක් සහ එහි ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශ විගණනය. විගණනය පරිපාලිත සහිත අස්තිත්ත්වයක සමූහ විගණනයකි. (එනම්, ශ්‍රී.ල.වි.ප්‍ර. 600 ව්‍යවහාර වෙයි)**
- **ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත සමඟ අනුකූලව (පොදු අරමුණු ආකෘතිමය රාමුවක්) ඒකාබද්ධ සහ අස්තිත්ත්වයේ මූල්‍ය ප්‍රකාශ කළමනාකාරීත්වය විසින් පිළියෙල කරයි.**
- **ශ්‍රී.ල.වි.ප්‍ර. 210 තුළ වන ඒකාබද්ධ සහ අස්තිත්ත්වයේ මූල්‍ය ප්‍රකාශ සඳහාවන කළමනාකාරිත්වයේ වගකීම්හි විස්තරය විගණන කාර්යභාරයේ නියමයන්ගෙන් පිළිබිඹුවේ.**
- **ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව විගණක නිගමනය කළ විකරණය නොකළ (එනම් "පිරිසිදු") මතය යෝග්‍ය වේ.**
- **විගණනයට ව්‍යවහාර කළ අදාළ ආචාර ධර්මීය අවශ්‍යතාවයන් අඩංගුව ඇත්තේ ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරි ආයතනය විසින් නිකුත් කළ ආචාර ධර්ම සංග්‍රහයේය.**
- **ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ශ්‍රී.ල.වි.ප්‍ර. 570 (සංශෝධිත) සමඟ අනුකූලව අඛණ්ඩ පැවැත්ම ලෙස දිගටම පවත්වාගෙන යාමේ අස්තිත්ත්වයේ හැකියාව මත සැළකිය යුතු අන්දමේ සැක පහළ කළ හැකි සිද්ධීන් හෝ පවත්නා තත්ත්වයන්ගෙන් සම්බන්ධිත ප්‍රමාණාත්මක අනියතතාවයන් නොපවතින බව විගණක නිගමනය කර ඇත.**
- **ශ්‍රී.ල.වි.ප්‍ර. 701 සමඟ අනුකූලව ප්‍රධාන විගණන කරුණු සන්නිවේදනය කිරීම විගණකට අවශ්‍ය නොවන මෙන්ම අන් අයුරකින් එසේ කිරීමට තීරණය කර නොමැත.**
- **විගණකගේ වාර්තාවේ දිනයට පෙර විගණක සියලුම වෙනත් තොරතුරු ලබාගෙන ඇති අතර වෙනත් තොරතුරුවල ප්‍රමාණාත්මක අවප්‍රකාශයක් හඳුනාගෙන නොමැත.**
- **ඒකාබද්ධ සහ අස්තිත්ත්වයේ මූල්‍ය ප්‍රකාශ අධීක්ෂණය කිරීම සඳහා වගකිව යුතු අය ඒකාබද්ධ සහ අස්තිත්ත්වයේ මූල්‍ය ප්‍රකාශ පිළියෙල කිරීම සඳහා වගකිව යුතු අයගෙන් වෙනස් වේ.**
- **යෝග්‍ය අධිකාරියක වෙබ් අඩවියක් මත විගණකගේ වගකීම්වල විස්තරයක් ඇතුළත් කිරීමට යොමු කිරීම විගණක තෝරා ගෙන ඇත.**
- **ඒකාබද්ධ සහ අස්තිත්ත්වයේ මූල්‍ය ප්‍රකාශ විගණනය කිරීමට අමතරව දේශීය නීතිය යටතේ අවශ්‍ය කරන වෙනත් වාර්තා කිරීමේ වගකීම්ද විගණකට ඇත.**

**ස්වාධීන විගණකගේ වාර්තාව**

ABC සමාගමේ කොටස් හිමියන් වෙත [හෝ යෝග්‍ය පරිදි අමතන අය]

**මූල්‍ය ප්‍රකාශ විගණනය මත වාර්තාව** [15]

**මතය**

ABC සමාගමේ ("සමාගම") සහ එහි පරිපාලිතයන්හි ("සමූහය") 20×1 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශය සහ එම දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා විස්තීර්ණ ආදායම් ප්‍රකාශය, ස්කන්ධ වෙනස්වීමේ ප්‍රකාශය සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශය සහ වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තීන්හි සාරාංශයක් ඇතුළුව මූල්‍ය ප්‍රකාශවලට සටහන් වලින් සමන්විත සමාගමේ මූල්‍ය ප්‍රකාශ සහ සමාගමේ සහ එහි පරිපාලිතයන්හි ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශ අප විසින් විගණනය කරන ලදී.

අපගේ මතය අනුව සමාගමේ සහ සමූහයේ 20×1 දෙසැම්බර් 31 වන දිනට මූල්‍ය තත්ත්වය සහ එම දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා ඔවුන්ගේ මූල්‍ය කාර්ය සාධනය සහ මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව මේ සමඟ

---

[15] "වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතාවයන් මත වාර්තාව" යන දෙවන උප මාතෘකාව අදාළ නොවන තත්ත්වයන්හිදී "මූල්‍ය ප්‍රකාශ විගණනය මත වාර්තාව" යන උපමාතෘකාව අවශ්‍ය නොවේ.

ඇති සමාගමේ සහ සමූහයේ මූල්‍ය ප්‍රකාශ සත්‍ය හා සාධාරණ දර්ශනයක් පෙන්නුම් කරන බවය. *(හෝ සියලුම ප්‍රමාණාත්මක අංගයන්ගෙන් සාධාරණව ඉදිරිපත් කෙරේ)*

**මතය සඳහා පදනම**

අප විසින් අපගේ විගණනය මෙහෙයවන ලද්දේ ශ්‍රී ලංකා විගණන ප්‍රමිත සමඟ අනුකූලවය. (ශ්‍රී.ල.වි.ප්‍ර.) එම ප්‍රමිත යටතේ අපගේ වගකීම් තවදුරටත් අපගේ වාර්තාවේ *මූල්‍ය ප්‍රකාශ විගණනය සඳහා විගණකගේ වගකීම්* කොටස තුළ විස්තර කෙරේ. ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරි ආයතනය විසින් නිකුත් කළ ආචාර ධර්ම සංග්‍රහයේ (ආචාර ධර්ම සංග්‍රහය)[16] මූල්‍ය ප්‍රකාශයන්හි අදාළ සදාචාරාත්මක අවශ්‍යතාවයන් සමඟ අනුකූලව සමාගමෙන් අප ස්වාධීනය. ආචාර ධර්ම සංග්‍රහය සමඟ අනුකූලව අපගේ වෙනත් චර්යා ධර්ම වගකීම් අප ඉටුකර ඇත. අප විසින් ලබාගත් විගණන සාක්ෂි අපගේ මතය සඳහා පදනම ලබාදීමට ප්‍රමාණවත් සහ යෝග්‍ය බව අප විශ්වාස කරයි.

වෙනත් තොරතුරු [හෝ වෙනත් ශීර්ෂයක් "මූල්‍ය ප්‍රකාශ සහ විගණකගේ වාර්තාව මත හැර වන වෙනත් තොරතුරු" වැනි යෝග්‍ය වේ නම්]

*[ශ්‍රී.ල.වි.ප්‍ර. 720 (සංශෝධිත)හි වාර්තා කරන අවශ්‍යතාවයන් සමඟ අනුකූලව වාර්තා කිරීම ශ්‍රී.ල.වි.ප්‍ර. 720 (සංශෝධිත) හි 2 වන පරිශිෂ්ඨයේ 1 වන නිදර්ශනය බලන්න]*

මූල්‍ය ප්‍රකාශ සඳහා කළමනාකාරීත්වයේ සහ පාලනය පිළිබඳව වගකිව යුතු අයගේ වගකීම්[17]

ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත සමඟ අනුකූලව[18] සත්‍ය හා සාධාරණ දර්ශනයක් ගෙන දෙන මූල්‍ය ප්‍රකාශ පිළියෙල කිරීම සඳහා සහ වංචා හෝ වැරදි නිසා හෝ වේවා ප්‍රමාණාත්මක අවප්‍රකාශ වලින් තොරව මූල්‍ය ප්‍රකාශ පිළියෙල කිරීමට හැකිවීම පිණිස කළමනාකාරීත්වය අවශ්‍ය යයි තීර්ණය කරන පරිදි එවැනි අභ්‍යන්තර පාලන සඳහා කළමනාකාරීත්වය වගකිව යුතුය.

මූල්‍ය ප්‍රකාශ පිළියෙල කිරීමේදී එක්කෝ කළමනාකාරීත්වය සමූහය ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ මෙහෙයුම් නැවැත්වීමට හෝ එසේ කිරීමට යථාර්ථවාදී විකල්පයක් නැත්නම් මිස අඛණ්ඩ පැවැත්ම පදනම් ගිණුම්කරණය භාවිත කිරීම සහ අදාළවන පරිදි අඛණ්ඩ පැවැත්ම සම්බන්ධිත කරුණු, හෙළිදරව් කරමින් අඛණ්ඩ පැවැත්ම ලෙස දිගටම පවත්වාගෙන යාමේ සමූහයේ හැකියාව තක්සේරු කිරීම සඳහා කළමනාකාරීත්වය වගකිව යුතුවේ.

පාලනය පිළිබඳ වගකිව යුතු අය සමාගමේ සහ සමූහයේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය අධීක්ෂණය කිරීම සඳහා වගකිව යුතුය.

**මූල්‍ය ප්‍රකාශ විගණනය සඳහා විගණකගේ වගකීම්**

අපගේ අරමුණු වන්නේ මූල්‍ය ප්‍රකාශ සමස්ථයක් ලෙස ගත්කළ වංචා හෝ වැරදි නිසා හෝ වේවා ප්‍රමාණාත්මක අවප්‍රකාශයකින් තොරද යන්න පිළිබඳව සාධාරණ සහතිකවීමක් ලබා ගැනීමට සහ අපගේ මතය ඇතුළත් විගණකගේ වාර්තාව නිකුත් කිරීමටය. සාධාරණ සහතික වීමක් යනු ඉහළ මට්ටමේ සහතික වීමකි. එහෙත් ශ්‍රී.ල.වි.ප්‍ර. සමඟ අනුකූලව මෙහෙයවන ලද විගණනයකින් ප්‍රමාණාත්මක අවප්‍රකාශ පවතින විට එය සෑම විටම අනාවරණය වන බවට සහතිකවීමක් නොවේ. අවප්‍රකාශ පැන නැගිය හැක්කේ වංචා හෝ වැරදිවලින් සහ ඒවා ප්‍රමාණාත්මක ලෙස සළකනු ලබන්නේ, තනි, තනිව හෝ සමාහාරයක් ලෙස ඒවා මෙම මූල්‍ය ප්‍රකාශ පදනම මත පරිශීලකයන් ගන්නා තීරණවලට බලපෑමක් කිරීමට සාධාරණ ලෙස අපේක්ෂා කළ හැකි නම්ය.

මූල්‍ය ප්‍රකාශයන්හි විගණනය සඳහා විගණකගේ වගකීම්හි තවදුරටත් වන විස්තරයේ ශ්‍රී ලංකා ගිණුම්කරණ සහ විගණක ප්‍රමිති වෙබ් අඩවියේ www.slaasc.com/technicalauditingstandards/auditorsresponsibility ලිපිනයේ පිහිටා ඇත. මෙම විස්තරය අපගේ විගණකගේ වාර්තාවේ කොටසක ස්වරූපය ගනී.

**වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා මත වාර්තාව**

2007 අංක 07 දරන සමාගම් පනතේ 163(2) වගන්තිය මගින් අවශ්‍ය කරන පරිදි විගණනය සඳහා අවශ්‍ය වූ සියලු තොරතුරු සහ පැහැදිලි කිරීම් අප ලබාගත් අතර අපගේ පරීක්ෂාවන්ගෙන් පෙනෙනතාක් දුරට සමාගම +සමූහය? විසින් නිසි ගිණුම්කරණ වාර්තා පවත්වාගෙන ගොස් ඇත.

---

16 යම් කිසි නියාමන අධිකාරියක් මගින් විගණකවරුන් සඳහා වෙනත් ආචාර ධර්මීය අවශ්‍යතාවයන් නිකුත් කළහොත්, එවැනි රෙගුලාසිවලට යොමු කිරීමක් සැළකිය යුතුය.

17 හෝ විශේෂ අධිකරණ බලප්‍රදේශයක නෛතික ආකෘතිමය රාමුවේ සම්බන්ධය තුළ යෝග්‍යවන වෙනත් පද.

18 සාධාරණ ඉදිරිපත් කිරීමක් ගෙන දෙන මූල්‍ය ප්‍රකාශ පිළියෙල කිරීම සඳහා කළමනාකාරීත්වය වගකිව යුතු වන අවස්ථාවලදී මෙය කිය විය හැක්කේ "ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත සමඟ අනුකූලව මූල්‍ය ප්‍රකාශ පිළියෙල කිරීම සහ සාධාරණ ඉදිරිපත් කිරීම සඳහා කළමනාකාරීත්වය වගකිව යුතුවේ, සහ එබඳු දෑ සඳහා..." ලෙසය.

[*විගණන සමාගම නමින් අත්සන*] [*විගණන සමාගමේ ලිපිනය*]

[*දිනය*]

**5 වන නිදර්ශනය - පොදු අරමුණු අනුකූලතා අකෘතිමය රාමුව සමඟ අනුකූලව පිළියෙල කළ ලැයිස්තුගත අස්තිත්ත්වයක් නොවන අස්තිත්ත්වයක මූල්‍ය ප්‍රකාශ මත විගණකගේ වාර්තාව**

**මෙම නිදර්ශනාත්මක විගණකගේ වාර්තාවේ අරමුණු සඳහා පහත තත්ත්වයන් උපකල්පනය කෙරේ.**

- **නීතිය හෝ රෙගුලාසි මගින් අවශ්‍ය කරන පරිදි ලැයිස්තුගත අස්තිත්ත්වයක් නොවන අස්තිත්ත්වයක සම්පූර්ණ මූල්‍ය ප්‍රකාශ කට්ටලයක විගණනය. මෙය සමූහ විගණනයක් නොවේ (එනම්ත ශ්‍රී.ල.වි.ප්‍ර. 600 ව්‍යවහාර නොවේ)**
- **අස්තිත්ත්වයේ කළමනාකාරීත්වය විසින් මූල්‍ය ප්‍රකාශ පිළියෙල කර ඇත්තේ ඔ අධිකරණ බලප්‍රදේශයේ මූල්‍ය වාර්තා කරන ආකෘතිමය රාමුව (ඔශ' නීතිය) සමඟ අනුකූලවය. (එනම් පුලුල් පරාසයක පරිශීලකයන්ගේ පොදු මූල්‍ය තොරතුරු අවශ්‍යතා ඉටු කර ගැනීමට සැළසුම් කළ එය නීතිය හෝ රෙගුලාසි ආවරණය කරන මූල්‍ය වාර්තාකරණ ආකෘතිමය රාමුවකි, එහෙත් එය සාධාරණ ඉදිරිපත් කිරීමේ ආකෘතිමය රාමුවක් නොවේ)**
- **ශ්‍රී.ල.වි.ප්‍ර. 210 තුළ වන මූල්‍ය ප්‍රකාශ සඳහා වන කළමනාකාරීත්වයේ වගකීම්හි විස්තරය විගණන කාර්යභාරයේ නියමයන්ගෙන් පිළිබිඹු වේ.**
- **ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව විගණක නිගමනය කළ විකරණය නොකළ (එනම්, "පිරිසිදු") මතය යෝග්‍ය වේ.**
- **විගණනයට ව්‍යවහාර කළ අදාළ ආචාර ධර්මීය අවශ්‍යතාවයන් අඩංගුව ඇත්තේ ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනය විසින් නිකුත් කළ ආචාර ධර්ම සංග්‍රහයේය.**
- **ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ශ්‍රී.ල.වි.ප්‍ර. 570 (සංශෝධිත) සමඟ අනුකූලව අඛණ්ඩ පැවැත්ම ලෙස දිගටම පවත්වාගෙන යාමේ අස්තිත්ත්වයේ හැකියාව මත සැළකිය යුතු අන්දමේ සැක පහළ කළ හැකි සිද්ධියක් හෝ තත්ත්වයන් සම්බන්ධිත ප්‍රමාණාත්මක අනියතතාවයක් නොවතින බව විගණක නිගමනය කර ඇත.**
- **ශ්‍රී.ල.වි.ප්‍ර. 701 සමඟ අනුකූලව ප්‍රධාන විගණන කරුණු සන්නිවේදනය කිරීමට විගණකට අවශ්‍ය නොවන මෙන්ම අන් අයුරකින් එසේ කිරීමට තීරණය කර නැත.**
- **විගණකගේ වාර්තාවේ දිනයට පෙර විගණක සියලුම වෙනත් තොරතුරු ලබාගෙන ඇති අතර වෙනත් තොරතුරුවල ප්‍රමාණාත්මක අවප්‍රකාශයන් මෙතෙක් හඳුනා ගෙන නොමැත.**
- **මූල්‍ය ප්‍රකාශ අධීක්ෂණය කිරීම සඳහා වගකිවයුතු අය මූල්‍ය ප්‍රකාශ පිළියෙල කිරීම සඳහා වගකිව යුතු අයගෙන් වෙනස් වේ.**
- **දේශීය නීතිය යටතේ විගණකට වෙනත් වාර්තා කිරීමේ වගකීම් නොමැත.**

**ස්වාධීන විගණකගේ වාර්තාව**

[යෝග්‍ය පරිදි අමතන අය]

**මතය**

ABC සමාගමේ (සමාගම) 20×1 දෙසැම්බර් 31 වන දිනට ශේෂ පත්‍රය, සහ එම දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා ආදායම් ප්‍රකාශය, ස්කන්ධය වෙනස් වීමේ ප්‍රකාශය සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශය සහ වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවල සාරාංශයක් ඇතුළුව, මූල්‍ය ප්‍රකාශවලට සටහන්වලින් සමන්විත මූල්‍ය ප්‍රකාශ අප විසින් විගණනය කරන ලදී.

අපගේ මතය වන්නේ මේ සමඟ ඇති සමාගමේ මූල්‍ය ප්‍රකාශ, X අධිකරණ බල ප්‍රදේශයේ XYZ නීතිය සමඟ අනුකූලව සියලු ප්‍රමාණාත්මක අංගයන් ගෙන් පිළියෙල කර ඇති බවයි.

**මතය සඳහා පදනම**

අප විසින් අපගේ විගණනය මෙහෙයවන ලද්දේ ශ්‍රී ලංකා විගණන ප්‍රමිත සමග (ශ්‍රී.ල.වි.ප්‍ර.) අනුකූලවය. එම ප්‍රමිත යටතේ අපගේ වගකීම් තවදුරටත් අපගේ වාර්තාවේ *මූල්‍ය ප්‍රකාශ විගණනය සඳහා විගණකගේ වගකීම්* කොටසේ විස්තර කෙරේ. ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනය විසින් නිකුත්කළ ආචාර ධර්මීය සංග්‍රහය අනුව සමාගමෙන් අප ස්වාධීනයඃ (ආචාර ධර්ම සංග්‍රහය)[19] සහ ආචාර ධර්ම සංග්‍රහය සමඟ අනුකූලව අපගේ වෙනත් වගකීම් අප ඉටු කර ඇත. අප විසින් ලබාගත් විගණන සාක්ෂි අපගේ මතය සඳහා පදනම ලබාදීමට ප්‍රමාණවත් සහ යෝග්‍ය බව අප විශ්වාස කරයි.

වෙනත් තොරතුරු [හෝ යෝග්‍ය වන්නේ නම් "මූල්‍ය ප්‍රකාශ සහ විගණකගේ වාර්තාව මත හැරවන වෙනත් තොරතුරු" වැනි වෙනත් ශීර්ෂයක්]

[*ශ්‍රී.ල.වි.ප්‍ර. 720 (සංශෝධිත) හි වාර්තාකරන අවශ්‍යතාවයන් සමග අනුකූලව වාර්තා කිරීම - ශ්‍රී.ල.වි.ප්‍ර. 720 (සංශෝධිත) හි 2 වන පරිශිෂ්ඨයේ 1 වන නිදර්ශනය බලන්න*]

**මූල්‍ය ප්‍රකාශ සඳහා කළමනාකාරීත්වයේ සහ පාලනය පිළිබඳව වගකීම යුතු අයගේ වගකීම්** [20]

X අධිකරණ බලප්‍රදේශයේ[21] XYZ නීතියට සමග අනුකූලව මූල්‍ය ප්‍රකාශ පිළියෙල කිරීම සඳහා සහ වංචා හෝ වැරදි නිසා හෝ වේවා ඒවා ප්‍රමාණාත්මක අවප්‍රකාශ වලින් තොරව මූල්‍ය ප්‍රකාශ පිළියෙල කිරීමට හැකියාව ලබා දෙන කළමනාකාරීත්වය අවශ්‍යයයි නිර්ණය කරන පරිදි එවැනි අභ්‍යන්තර පාලන සඳහා ද කළමනාකරණය වගකිව යුතුය.

මූල්‍ය ප්‍රකාශ පිළියෙල කිරීමේදී එක්කෝ කළමනාකාරීත්වය සමාගම ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ මෙහෙයුම් නැවැත්වීමට හෝ එසේ කිරීමට යථාර්වාදී විකල්පයක් නැත්නම් මිස අඛණ්ඩ පැවැත්ම පදනම් ගිණුම්කරණය භාවිත කිරීම සහ අදාලවන පරිදි අඛණ්ඩ පැවැත්ම සම්බන්ධිත කරුණු හෙළිදරව් කරමින්, අඛණ්ඩ පැවැත්ම ලෙස දිගටම පවත්වාගෙන යාමේ සමාගමේ හැකියාව තක්සේරු කිරීම සඳහා කළමනාකාරීත්වය වගකිව යුතුය.

පාලනය පිළිබඳ වගකිව යුතු අය සමාගමේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය අධීක්ෂණය කිරීම සඳහා වගකිව යුතුය.

**මූල්‍ය ප්‍රකාශ විගණනය සඳහා විගණකගේ වගකීම්**

අපගේ අරමුණු වන්නේ මූල්‍ය ප්‍රකාශ සමස්ථයක් ලෙස ගත්කළ වංචා හෝ වැරදි නිසා වේවා ප්‍රමාණාත්මක අවප්‍රකාශයකින් තොරද යන්න පිළිබඳව සාධාරණ සහතික වීමක් ලබාගැනීමට, සහ අපගේ මතය ඇතුළත් විගණකගේ වාර්තාව නිකුත් කිරීමටය; සාධාරණ සහතිකවීමක් යනු ඉහළ මට්ටමේ සහතික වීමකි, එහෙත් ශ්‍රී.ල.වි.ප්‍ර. සමග අනුකූලව මෙහෙයවන විගණනයකින් ප්‍රමාණාත්මක අවප්‍රකාශයක් පවතින විට එය සැම විටම අනාවරණය වනු බවට සහතිකවීමක් නොවේ. අවප්‍රකාශ පැනනැගිය හැක්කේ වංචා හෝ වැරදිවලින් සහ ඒවා ප්‍රමාණාත්මක ලෙස සළකන්නේ තනි තනිව හෝ සමාහාරයක් ලෙස ඒවා මෙම මූල්‍ය ප්‍රකාශ පදනම මත පරිශීලකයන් ගන්නා ආර්ථික තීරණවලට බලපෑමක් කිරීම සාධාරණ ලෙස අපේක්ෂා කළ හැකි නම්ය.

---

[19] යම් කිසි නියාමන අධිකාරියක් මගින් විගණකවරුන් සඳහා වෙනත් ආචාර ධර්මීය අවශ්‍යතාවයන් නිකුත් කළහොත්, එවැනි රෙගුලාසිවලට යොමු කිරීමක් සැළකිය යුතුය.

[20] හෝ විශේෂ අධිකරණ බලප්‍රදේශයක නෛතික ආකෘතිමය රාමුවේ සම්බන්ධය තුළ යෝග්‍යවන වෙනත් පද.

[21] සාධාරණ ඉදිරිපත් කිරීමක් ගෙන දෙන මූල්‍ය ප්‍රකාශ පිළියෙල කිරීම සඳහා කළමනාකාරීත්වය වගකිව යුතු වන අවස්ථාවලදී මෙය කිය විය හැක්කේ "ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත සමග අනුකූලව මූල්‍ය ප්‍රකාශ පිළියෙල කිරීම සහ සාධාරණ ඉදිරිපත් කිරීම සඳහා කළමනාකාරීත්වය වගකිව යුතුවේ, සහ එබඳු දෑ සඳහා....." ලෙසය.

පහත දක්වෙන අඳුරු කළ කරුණු විගණකගේ වාර්තාවේ පරිශිෂ්ටය තුළ පිහිටු විය හැකි බව මෙම ශ්‍රී.ල.වි.ප්‍ර. යේ 41 (අ) ඡේදයෙන් විස්තර කෙරේ. නීතිය, රෙගුලාසි හෝ ශ්‍රී ලංකා විගණන ප්‍රමිති මගින් ප්‍රකාශිතව අවසර දෙනවිට විගණකගේ වගකීම්වල විස්තරය විගණකගේ වාර්තාවේ මෙම කරුණු ඇතුළත් කරනවාට වඩා යෝග්‍ය අධිකාරියක වෙබ් අඩවියකට යොමුකළ හැකි බව 41 (ඇ) ඡේදය පැහැදිලි කරයි. එසේ කළ හැක්කේ වෙබ් අඩවිය මත ලිපිනයේ විස්තරය සහ පහත වන විගණකගේ වගකීම් වල විස්තර සමඟ අසංගත නොවන්නේ නම්ය. ශ්‍රී.ල.වි.ප්‍ර. සමඟ අනුකූලව විගණනයක කොටසක් ලෙස විගණනය පුරාවටම වෘත්තීය විනිශ්චය භාවිත කිරීම සහ වෘත්තීය සංසඳහාවය අප පවත්වාගෙන යයි අප එසේම;

- වංචා හෝ වැරදි නිසා හෝ වේවා මූල්‍ය ප්‍රකාශයන්හි ප්‍රමාණාත්මක අවප්‍රකාශයක අවදානම් හඳුනා ගැනීම සහ තක්සේරු කිරීමට, එම අවදානම්වලට ප්‍රතිචාර දක්වන විගණන පටිපාටි සැළසුම් කිරීම සහ ඉටු කිරීම සහ අපගේ මතය සඳහා පදනමක් ලෙස ලබාදීමට ප්‍රමාණවත් සහ යෝග්‍ය විගණන සාක්ෂි ලබා ගැනීම. වංචා සඳහා දුස්සන්ධානය, ව්‍යාජ ලේඛන සෑදීම, හිතාමතා අත් හැරීම, සාවද්‍ය ලෙස දක්වීම, හෝ අභ්‍යන්තර පාලන මැදිහත්වී අක්‍රීය කිරීම වැනි දෑ සම්බන්ධ විය හැකි නිසා වරදකින් සිදුවන අවප්‍රකාශයක් අනාවරණය නොකර ගැනීමෙන් වන ප්‍රතිඵලයට වඩා, වංචාවක් මත අවප්‍රකාශයක් හඳුනා නොගැනීමේ ප්‍රතිඵලයක් වශයෙක් සිදු විය හැකි අවදානම් විශාල වේ.
- යම් අවස්ථාවන් තුළදී යෝග්‍ය වන විගණන පටිපාටි සැළසුම් කිරීමට හැකිවීමට විගණනයට අදාළ අභ්‍යන්තර පාලනයන්හි අවබෝධයක් ලබා ගැනීමට හැකිවීමට එහෙත් මෙහි අරමුණු වන්නේ සමාගමේ අභ්‍යන්තර පාලනයේ සඵලදායකත්වයක මත මතයක් ප්‍රකාශ කිරීම පිණිස නොවේ.[22]
- භාවිත කළ ගිණුම්කරණ ප්‍රතිපත්ති වල යෝග්‍යතාවය සහ ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකාරීත්වය විසින් සිදුකළ සම්බන්ධිත හෙළිදරව් කිරීමේ අගය කිරීම.
- කළමනාකාරිත්වයේ අඛණ්ඩ පැවැත්ම පදනම ගිණුම්කරණය භාවිත කිරීමේ යෝග්‍යතාවය සහ ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව අඛණ්ඩ ලෙස පැවැත්ම දිගටම පවත්වාගෙන යාමේ සමාගමේ නොහැකියාව මත සැළකිය හැකි සැකයක් පහළ කළ හැකි සිද්ධීන්ට හෝ පවත්නා තත්ත්වයන්ට සම්බන්ධිත ප්‍රමාණාත්මක අනියතතාවයන් පවතීද යන්න නිගමනය කිරීම. ප්‍රමාණාත්මක අනියතතාවයක් පවතී යයි අප නිගමනය කළහොත් මූල්‍ය ප්‍රකාශ තුළ සම්බන්ධිත හෙළිදරව් කිරීමට අපගේ විගණන වාර්තාව තුළ අප අවධානය යොමු කිරීමට හෝ එවැනි හෙළිදරව් කිරීම ප්‍රමාණවත් නොවේ නම් අපගේ මතය විකරණය කිරීමට අපහට අවශ්‍ය කෙරේ. අපගේ නිගමන පදනම් වී ඇත්තේ අපගේ විගණකගේ වාර්තාවේ දිනය තෙක් ලබාගත් විගණන සාක්ෂි පදනම් කර ගෙනය. කෙසේ වෙතත් අනාගත සිද්ධීන් හෝ පවත්නා තත්ත්වයන් අඛණ්ඩව පැවැත්ම ලෙස දිගටම පවත්වාගෙන යාම සමාගමට නැවැත්වීමට හේතු විය හැකිය.

පාලනය පිළිබඳ වගකිව යුතු අය සමඟ අප සන්නිවේදනය කරන වෙනත් කරුණු අතරට අපගේ විගණනය තුළදී හඳුනා ගත් අභ්‍යන්තර පාලනයේ යම් සැළකිය යුතු අන්දමේ ඌණතාවයන් ඇතුළුව විගණනයේ සැළසුම් කළ විෂය පථය සහ කල් නිර්ණය, සැළකිය යුතු අන්දමේ විගණනයේ සොයා ගැනීම් සම්බන්ධව කරුණු ඇතුළත්ය.

*[විගණන සමාගම් නමින් අත්සන]* *[විගණන සමාගමේ ලිපිනය]*

*[දිනය]*

[22] මූල්‍ය ප්‍රකාශයන්හි විගණනය සමඟවන සම්බන්ධතාවය තුළ අභ්‍යන්තර පාලනයෙහි සඵලදායකත්ව මත මතයක් නිකුත් කිරීමේ වගකීමද එලෙසම විගණකට පවතින විට එවැනි තත්ත්වයන්හිදී මෙම වාක්‍ය යෝග්‍ය පරිදි වෙනස් කළහැකිය.

# ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිය 701

## ස්වාධීන විගණකගේ වාර්තාවේ ප්‍රධාන විගණන කරුණු සන්නිවේදනය කිරීම

(2018 මාර්තු 31 දින හෝ පසුව අවසන් වන කාල පරිච්ඡේදයන්
සඳහා වූ මූල්‍ය ප්‍රකාශ විගණනය සඳහා බලාත්මක වේ.)

## අන්තර්ගතය

---

ඡේදය

**හැඳින්වීම**

මෙම ශ්‍රීලවිප්‍ර හි විෂය පථය …………………………………………………………………… 1–5

බලාත්මක දිනය ………………………………………………………………………… 6

**අරමුණු** ……… …………………………………………………………………………… 7

**අර්ථ දැක්වීම** …………………………………………………………………………… 8

**අවශ්‍යතා**

ප්‍රධාන විගණක කරුණු තීරණය කිරීම …………………………………………………… 9–10

ප්‍රධාන විගණන කරුණු සන්නිවේදනය කිරීම ……………………………………………… 11–16

පාලනය භාරව සිටින අය සමඟ සන්නිවේදනය ………………………………………..... 17

ලේඛනගත කිරීම …………………………………………………………………… 18

**යෙදුම සහ වෙනත් විස්තරාත්මක දේ**

මෙම ශ්‍රීලවිප්‍ර හි විෂය පථය ……………………………………………………….. අ1 - අ 8

ප්‍රධාන විගණන කරුණු තීරණය කිරීම …………………………………………………. අ9 - අ30

ප්‍රධාන විගණන කරුණු සන්නිවේදනය කිරීම ……………………………………………... අ31 - අ59

පාලනය භාරව සිටින අය සමඟ සන්නිවේදනය ……………………………………… අ60 - අ63

ලේඛනගත කිරීම ………………………………………………………………………... අ64

---

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිය (ශ්‍රීලවිප්‍ර) 701, ස්වාධීන විගණක වාර්තාවේ ප්‍රධාන විගණන කරුණු සන්නිවේදනය කිරීම, ශ්‍රීලවිප්‍ර 200, ස්වාධීන විගණකගේ සමස්ත අරමුණු සහ ශ්‍රී ලංකා විගණන ප්‍රමිතීන්ට අනුකූලව විගණනයක් පැවැත්වීම සමඟ ඒකාබද්ධව කියවිය යුතුය.

## හැඳින්වීම

**මෙම ශ්‍රීලවිප්‍ර හි විෂය පථය**

1. මෙම ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිය (ශ්‍රීලවිප්‍ර) විගණක වාර්තාවේ ප්‍රධාන විගණන කරුණු සන්නිවේදනය කිරීමේ විගණකගේ වගකීම සමග කටයුතු සන්නිවේදනය කිරීමේ විගණකගේ වගකීම සමග කටයුතු කරයි. විගණන වාර්තාවේ සන්නිවේදනය කලයුත්තේ කුමක්ද යන්න පිළිබඳ විගණකගේ විනිශ්චය සහ එවැනි සන්නිවේදනයක ස්වරූපය සහ අන්තර්ගතය යන දෙකම ආමන්ත්‍රණය කිරීමට අදහස් කෙරේ.

2. ප්‍රධාන විගණන කරුණු සන්නිවේදනය කිරීමේ පරමාර්ථය වන්නේ සිදු කරන ලද විගණනය පිළිබඳ වැඩි විනිවිද භාවයක් ලබා දීමෙන් විගණක වාර්තාවේ සන්නිවේදන වටිනාකම වැඩි කිරීමයි. ප්‍රධාන විගණන කරුණු සන්නිවේදනය කිරීම, මූල්‍ය ප්‍රකාශ වල අපේක්ෂිත පරිශීලකයින්ට (අපේක්ෂිත පරිශිලකයින්) විගණකගේ වෘත්තීය විනිශ්චයේදී, වර්තමාන කාල පරිච්ඡේදයේ මූල්‍ය ප්‍රකාශ විගණනයේදී වඩාත් වැදගත් වූ කරුණු තේරුම් ගැනීමට ඔවුන්ට සහාය වීම සඳහා අතිරේක තොරතුරු සපයයි. ප්‍රධාන විගණන කරුණු සන්නිවේදනය කිරීමෙන් අපේක්ෂිත පරිශීලකයින්ට අස්තිත්ත්වය පිළිබඳව සහ විගණනය කරන ලද මූල්‍ය ප්‍රකාශ වල සැළකිය යුතු කළමනාකරණ විනිශ්චයක් ඇති ක්ෂේත්‍ර පිළිබඳව ද අවබෝධ කර ගැනීමට උපකාරි වේ. (යොමුව : අ 1 -අ 4 ඡේද)

3. විගණන වාර්තාවේ ප්‍රධාන කරුණු සන්නිවේදනය කිරීමෙන් අපේක්ෂිත පරිශිලකයින්ට කළමනාකරණය සමඟ සහ අස්තිත්ත්වයට අදාළ ඇතැම් කරුණු විගණනය කරන ලද මූල්‍ය ප්‍රකාශ හෝ සිදු කරන ලද විගණනය සම්බන්ධ පාලනය භාරව සිටින අය සමඟ තව දුරටත් සම්බන්ධ වීමට පදනමක් සපයනු ඇත.

4. විගණක වාර්තාවේ ප්‍රධාන විගණන කරුණු සන්නිවේදනය කිරීම වන්නේ සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශ පිළිබඳව විගණක විසින් මතයක් ගොඩ නගා ගත් සන්දර්භය තුළය. විගණන වාර්තාවේ ප්‍රධාන විගණන කරුණු සන්නිවේදනය කිරීම සිදු නොවන්නේ :

   (අ) අදාළ මූල්‍ය වාර්තාකරණ ආකෘතිමය රාමුවට අනුව කළමනාකරණය කළයුතු හෝ සාධාරණ ඉදිරිපත් කිරීමක් ලබා ගැනීමට අවශ්‍ය වන මූල්‍ය ප්‍රකාශ වල හෙළිදරව් කිරීම් සඳහා ආදේශකයක් ;
   (ආ) ශ්‍රීලවිප්‍ර 705 (සංශෝධිත) ට අනුකූලව නිශ්චිත විගණන කාර්යයක අවශ්‍යතාවයන් අනුව විගණක අවශ්‍ය වූ විට ප්‍රකාශ කරන ලද විකරණය කරන ලද මතයක් සඳහා ආදේශකයක්;[1]
   (ඇ) සිද්ධීන් හෝ කොන්දේසි සම්බන්ධයෙන් අස්තිත්ත්වයක අඛන්ඩ පැවැත්ම කෙරෙහි සැලකිය යුතු සැකයක් මතු විය හැකි අවස්ථාවන්හිදී ශ්‍රීලවිප්‍ර 570 (සංශෝධිත) [2] ට අනුකූලව වාර්තා කිරීම සඳහා ආදේශකයක් ; හෝ
   (ඈ) තනි කාරණා සම්බන්ධයෙන් වෙනම මතයක්. (යොමුව : අ5 - අ8 ඡේද)

5. මෙම ශ්‍රීලවිප්‍ර ලැයිස්තුගත අස්තිත්ත්ව වල පොදු අරමුණු සඳහා වූ මූල්‍ය ප්‍රකාශ සම්පූර්ණ කට්ටල විගණනය සඳහා සහ විගණන වාර්තාවේ[3] ප්‍රධාන විගණන කරුණු සන්නිවේදනය කිරීමට විගණක වෙනත් ආකාරයකින් තීරණය කල අවස්ථා සඳහා අදාළ වේ. විගණකට නීතියෙන් හෝ නියාමනයකින් විගණන වාර්තාවේ ප්‍රධාන විගණන කරුණු සන්නිවේදනය කිරීම අවශ්‍ය වූ විට ද මෙම ශ්‍රීලවිප්‍ර අදාළ වේ. කෙසේ වෙතත්, විගණක මූල්‍ය ප්‍රකාශ පිළිබඳ මතය වියාචනය කරන වි, එවැනි වාර්තා කිරීම නීතියෙන් හෝ නියාමනයකින්[4] අවශ්‍ය නොවේනම්, ප්‍රධාන විගණන කරුණු සන්නිවේදනය කිරීම ශ්‍රීලවිප්‍ර 705 (සංශෝධිත) මගින් විගණක හට තහනම් කරයි.

## බලාත්මක දිනය

6. මෙම ශ්‍රීලවිප්‍ර 2018 මාර්තු 31 හෝ ඊට පසුව අවසන් වන කාලපරිච්ඡේදයන් සඳහා වූ මූල්‍ය ප්‍රකාශ විගණනය සඳහා බලාත්මක වේ.

---

[1] ශ්‍රීලංවිප්‍ර 705 (සංශෝධිත), ස්වාධීන විගණකගේ මතයට කරනු ලබන විකරණය කිරීම්
[2] ශ්‍රීලංවිප්‍ර 570 (සංශෝධිත), අඛණ්ඩ පැවැත්ම, 22 – 23 ඡේද
[3] ශ්‍රීලංවිප්‍ර 700 (සංශෝධිත), මූල්‍ය ප්‍රකාශ මත වාර්තාකරණය සහ මතයකට එළඹීම, 30 – 31 ඡේද
[4] ශ්‍රීලංවිප්‍ර 705 (සංශෝධිත), 29 ඡේදය

## අරමුණු

7. විගණකගේ අරමුණු වන්නේ ප්‍රධාන විගණන කරුණු තීරණය කිරීම සහ මූල්‍ය ප්‍රකාශ පිළිබඳ මතයක් ගොඩනගා ඒවා විගණන වාර්තාවේ විස්තර කිරීම මගින් සන්නිවේදනය කිරීමයි.

## අර්ථ දැක්වීම

8. ශ්‍රීලවිප්‍ර හි අරමුණු සඳහා, පහත දැක්වෙන යෙදුමට පහත සඳහන් අර්ථය ඇත :

ප්‍රධාන විගණන කරුණු - විගණකගේ වෘත්තීය විනිශ්චයේදී, වර්තමාන කාල පරිච්ඡේදයේ මූල්‍ය ප්‍රකාශ විගණනය කිරීමේදී වඩාත් වැදගත් වූ කරුණු. ප්‍රධාන විගණන කරුණු තෝරාගනු ලබන්නේ පාලනය භාරව සිටින අය සමග සන්නිවේදනය කරන කරුණු වලින්ය.

### අවශ්‍යතා

### ප්‍රධාන විගණන කරුණු තීරණය කිරීම

9. විගණනය සිදු කිරීමේදී සැළකිය යුතු විගණන අවධානයක් අවශ්‍ය වූ කරුණුවලින්, පාලනය භාරව සිටින අය සමග සන්නිවේදනය කල කරුණුවලින් විගණක විසින් තීරණය කළ යුතුය. මෙම තීරණය ගැනීමේදී විගණක විසින් පහත සඳහන් කරුණු සැළකිල්ලට ගත යුතුය. (යොමුව : අ9 - අ 18 ඡේද)

(අ) ශ්‍රීලවිප්‍ර 315 (සංශෝධිත) [5] ප්‍රකාරව ප්‍රමාණාත්මක අවප්‍රකාශ අවදානම් හෝ සැළකිය යුතු අවදානම් හඳුනාගනු ලැබූ ක්ෂේත්‍ර (යොමුව : අ19 - අ22 ඡේද)

(ආ) මූල්‍ය ප්‍රකාශවල ඉහළ තක්සේරු කරණ අවිනිශ්චිතතාවයක් ඇති බවට හඳුනාගෙන ඇති ගිණුම් ඇස්තමේන්තු ඇතුළුව සැළකිය යුතු කළමනාකරණ තීරණ අදාළ වන ක්ෂේත්‍ර වලට අදාළ වන සැළකිය යුතු විගණන විනිශ්චයක්. (යොමුව : අ23 - අ24 ඡේද)

(ඇ) කාල පරිච්ඡේදය තුළ සිදුවූ සැළකිය යුතු සිද්ධීන් හෝ ගණුදෙනු පිළිබඳ විගණනයට ඇති බලපෑම. (යොමුව : අ25 - අ26 ඡේද)

10. වර්තමාන කාල පරිච්ඡේදයේ මූල්‍ය ප්‍රකාශ විගණනයේදී 9 වන ඡේදයට අනුකූලව තීරණය කරනු ලබන වඩාත් වැදගත් වන එබැවින් ප්‍රධාන විගණන කරුණු මොනවාදැයි විගණක විසින් තීරණය කළ යුතුය. (යොමුව : අ9 - අ11, අ27 - අ30 ඡේද)

### ප්‍රධාන විගණන කරුණු සන්නිවේදනය කිරීම

11. 14 හෝ 15 වන ඡේදවල තත්ත්වයන් අදාල නොවන්නේ නම් ප්‍රධාන විගණන කරුණු යන මාතෘකාව යටතේ විගණකගේ වාර්තාවේ වෙනම කොටසක සුදුසු උප ශීර්ෂයක් භාවිතා කරමින් විගණක විසින් සෑම ප්‍රධාන විගණන කරුණක්ම විස්තර කළ යුතුය. විගණන වාර්තාවේ මෙම කොටසෙහි හඳුන්වා දීමේ භාෂාවෙහි මෙලෙස සඳහන් වේ :

(අ) ප්‍රධාන විගණන කරුණු නම්, විගණකගේ වෘත්තීය විනිශ්චයේදී (වර්තමාන කාල පරිච්ඡේදයේ) මූල්‍ය ප්‍රකාශ විගණනයේදී වඩාත් වැදගත් වූ කරුණුය ;සහ

(ආ) සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශ විගණනය කිරීමේ සන්දර්භය තුළ සහ ඒ මත විගණකගේ මතය සැකසීමේදී මෙම කරුණු ආමන්ත්‍රණය කරන ලද අතර, විගණක විසින් මෙම කරුණු සම්බන්ධයෙන් වෙනම මතයක් ලබා නොදේ. (යොමුව : අ31 - අ33 ඡේද)

*ප්‍රධාන විගණන කරුණු විකරණය කල මතයක් ප්‍රකාශ කිරීම සඳහා ආදේශකයක් නොවේ.*

12. කරුණෙහි ප්‍රතිඵලයක් ලෙස ශ්‍රීලවිප්‍ර 705 (සංශෝධිත) ට අනුකූලව මතය විකරණය කිරීමට විගණකට අවශ්‍ය වූ විට විගණන වාර්තාවේ ප්‍රධාන විගණන කරුණු කොටසෙහි විගණක විසින් කරුණු සන්නිවේදනය නොකල යුතුය. (යොමුව : අ5 ඡේදය)

---

[5] ශ්‍රීලංවිප්‍ර 315 (සංශෝධිත),,අස්තිත්ත්වය සහ එහි පරිසරය අවබෝධ කරගැනීම මගින් ප්‍රමාණාත්මක අවප්‍රකාශවල අවදානම් හඳුනාගැනීම සහ තක්සේරු කිරීම

*තනි ප්‍රධාන විගණන කරුණු පිළිබඳ විස්තර*

13. විගණන වාර්තාවේ ප්‍රධාන විගණන කරුණු කොටසේ ඇති එක් එක් ප්‍රධාන විගණන කරුණු පිළිබඳ විස්තරයට අදාල හෙළිදරව් කිරීම (ම්) පිළිබඳව මූල්‍ය ප්‍රකාශවල සඳහනක් ඇතුලත් කර ඇත්නම් සහ ආමන්ත්‍රණය කල යුත්තේ (යොමුව : අ34 - අ41 ඡේද)

(අ) මෙම කරුණු විගණනයේදී වඩාත්ම වැදගත් එකක් ලෙස සළකනු ලැබුවේ මන්ද සහ එබැවින් ප්‍රධාන විගණන කරුණක් ලෙස තීරණය කලේ මන්ද ; සහ (යොමුව : අ42 - අ45 ඡේද)

(ආ) විගණනයේදී කරුණ ආමන්ත්‍රණය කළ ආකාරය. (යොමුව : අ46 - අ51 ඡේද)

*ප්‍රධාන විගණන කරුණක් ලෙස තීරණය කරනු ලබන කරුණු විගණන වාර්තාවේ සන්නිවේදනය නොකෙරන තත්ත්වයන්*

14. විගණන වාර්තාවේ එක් එක් ප්‍රධාන විගණන කරුණු විගණක විසින් පහත පරිදි නොවේනම් විස්තර කල යුතුය. (යොමුව : අ53 - අ56 ඡේද)

(අ) නීතිය හෝ නියාමනය මඟින් මේ පිළිබඳව ප්‍රසිද්ධියේ හෙළිදරව් කිරීම් වළක්වයි; හෝ (යොමුව : අ52 ඡේදය)

(ආ) විගණන වාර්තාවේ සන්නිවේදනය කිරීමෙන් ඇතිවන අහිතකර ප්‍රතිවිපාක එවැනි සන්නිවේදනයන් වන මහජන යහපතට වඩා වැදගත් කමෙන් වැඩි වෙතැයි අපේක්ෂා කරන බැවිනි. අස්තිත්ත්වය විසින් ප්‍රසිද්ධියේ තොරතුරු හෙළිදරව් කර ඇත්නම් මෙය අදාල නොවේ.

*විගණන වාර්තාවේ ඇතුලත් කිරීමට අවශ්‍ය ප්‍රධාන විගණන කරුණු සහ වෙනත් මූලිකාංග අතර අන්තර් ක්‍රියාකාරිත්වය.*

15. ශ්‍රීලවිප්‍ර 705 (සංශෝධිත) ට අනුකූලව විකරණය කරන ලද මතයට තුඩු දෙන කාරණයක් හෝ සිද්ධීන් හා සම්බන්ධ ප්‍රමාණාත්මක අවිනිශ්චිත තාවයක් හෝ ශ්‍රීලවිප්‍ර 570 (සංශෝධිත) ට අනුකූලව අස්තිත්ත්වයෙහි අඛන්ඩ පැවැත්ම පිළිබඳ සැළකිය යුතු සැකයක් ඇතිකල හැකි කොන්දේසි, ඒවායෙහි ස්වභාවය අනුව ප්‍රධාන විගණන කරුණු වේ. කෙසේ වෙතත්, එවැනි තත්ත්වයන් තුල, මෙම කරුණු විගණන වාර්තාවේ ප්‍රධාන විගණන කරුණු කොටසේ විස්තර නොකෙරෙන අතර, 13 - 14 ඡේදවල අවශ්‍යතා අදාල නොවේ. ඒ වෙනුවට, විගණක විසින් :

(අ) අදාල ශ්‍රීලවිප්‍ර (ය) ට අනුකූලව මෙම කරුණ(ණු) පිළිබඳ වාර්තා ; සහ

(ආ) කොන්දේසි සහිත (අහිතකර)මතය සඳහා පදනම පිළිබඳ යොමුවක් ඇතුලත් කිරීම හෝ ප්‍රධාන විගණන කොටසෙහි ඇති අඛන්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවය. (යොමුව : අ6 - අ7 ඡේද)

*වෙනත් තත්ත්වයන් තුල ප්‍රධාන විගණන කරුණු කොටසෙහි ආකෘතිය සහ අන්තර්ගතය.*

16. අස්තිත්ත්වයේ සහ විගණනයේ කරුණු හා තත්ත්වයන් මත පදනම්ව සන්නිවේදනය සඳහා ප්‍රධාන විගණන කරුණු නොමැති බව හෝ සන්නිවේදනය කරන එකම ප්‍රධාන විගණන කරුණු 15 වන ඡේදය මඟින් ආමන්ත්‍රණය කරන ලද කරුණු බවට විගණක තීරණය කරන්නේ නම්, ප්‍රධාන විගණන කරුණු යන ශීර්ෂය යටතේ විගණකගේ වාර්තාවේ වෙනම කොටසක විගණක විසින් මේ සඳහා ප්‍රකාශයක් ඇතුලත් කළ යුතුය. (යොමුව : අ57 - අ59 ඡේද)

**පාලනය භාරව සිටින අය සමඟ සන්නිවේදනය.**

17. විගණක විසින් පාලනය භාරව සිටින අය සමඟ සන්නිවේදනය කළ යුතු වන්නේ :

(අ) විගණක විසින් ප්‍රධාන විගණන කරුණු ලෙසට තීරණය කර ඇති කරුණු ; හෝ

(ආ) අදාල නම්, අස්තිත්ත්වයේ සහ විගණනයේ කරුණු සහ තත්ත්වයන් මත පදනම්ව, විගණන වාර්තාවේ සන්නිවේදනය කිරීම සඳහා ප්‍රධාන විගණන කරුණු නොමැති බවට වන විගණකගේ ස්ථිර තහවුරුව. (යොමුව : අ60 - අ63 ඡේද)

**ලේඛනගත කිරීම**

18. විගණක විසින් විගණන ලේඛනගතකරණයට ඇතුලත් කලයුතු වන්නේ:[6] : (යොමුව : අ64 ඡේදය)

(අ) 9 වන ඡේදයට අනුකූලව තීරණය කර ඇති පරිදි සැළකිය යුතු විගණක අවධානය යොමුකල යුතු කරුණු සහ 10 වන ඡේදයට අනුකූලව මෙම සෑම කරුණක්ම ප්‍රධාන විගණක කරුණක්ද නැද්ද යන්න පිළිබඳ විගණකගේ ස්ථිර තහවුරුව සඳහා වන තාර්කිකය.

(ආ) අදාල වන විට, විගණන වාර්තාවේ සන්නිවේදනය කිරීම සඳහා ප්‍රධාන විගණන කරුණු නොමැති බව හෝ සන්නිවේදනය සඳහා ඇති එකම ප්‍රධාන විගණන කරුණු 15 වන ඡේදය මඟින් ආමන්ත්‍රණය කරන කරුණු බවට විගණකගේ ස්ථිර තහවුරුව සඳහා වන තාර්කිකය ; හා

(ඇ) ප්‍රධාන විගණන කරුණක් ලෙසට තීරණය කල කරුණක් විගණන වාර්තාවේ සන්නිවේදනය නොකිරීමට වූ විගණකගේ ස්ථිර තහවුරුව සඳහා වන තාර්කිකය.

***

**යෙදුම සහ වෙනත් සවිස්තර කරුණු**

**මෙම ශ්‍රීලවිප්‍ර හි විෂය පථය** (යොමුව : 2 ඡේදය)

අ1 වැදගත් විස්තර කළ හැක්කේ සන්දර්භය තුල ගත් කාරණයක සාපේක්ෂ වැදගත්කම අනුවය. යම් කරුණක වැදගත්කම විගණක විසින් විනිශ්චය කරනු ලබන්නේ එය සළකා බලන සන්දර්භය තුලය. සාපේක්ෂ විශාලත්වය, විෂය කරුණු වල ස්වභාවය හා බලපෑම සහ අපේක්ෂිත පරිශීලකයින්ගේ හෝ ලබන්නන්ගේ ප්‍රකාශිත අවශ්‍යතා වැනි ප්‍රමාණාත්මක හා ගුණාත්මක සාධක වල සන්දර්භය තුල වැදගත්කම සළකා බැලිය හැකිය. පාලනය භාරව සිටින අය සමඟ සන්නිවේදනයේ ස්වභාවය සහ ප්‍රමාණය ඇතුළු කරුණු සහ තත්ත්වයන් පිළිබඳ විෂය බද්ධ විශ්ලේෂණයක් මෙයට ඇතුලත් වේ.

අ2 ශ්‍රීලවිප්‍ර 260 (සංශෝධිත)[7] විසින් අවශ්‍ය කරන ද්වි මාර්ග සන්නිවේදනයේ කොටසක් ලෙස විගණක හා පාලනය භාරව සිටින අය සමඟ වඩාත්ම ශක්තිමත්ව සංවාදයක් පැවැත්වූ කරුණු පිළිබඳව මූල්‍ය ප්‍රකාශ පරිශීලනය කරන්නන් උනන්දුවක් දක්වා තිබීම සහ එම සන්නිවේදනයක් පිළිබඳ අතිරේක විනිවිද භාවයක් ඉල්ලා ඇත. උදාහරණ වශයෙන්, සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශ පිළිබඳ මතය සැකසීමේදී විගණක විසින් ගනු ලැබූ සැලකිය යුතු විනිශ්චයක් අවබෝධ කර ගැනීමට පරිශීලකයින් විශේෂ උනන්දුවක් දක්වන්නේ මක්නිසාද යත්, ඒවා බොහෝවිට මූල්‍ය ප්‍රකාශ සකස් කිරීමේදී සැළකිය යුතු කළමනාකරණ විනිශ්චයක් ඇති අංශ වලට සම්බන්ධ බැවිනි.

අ3 විගණන වාර්තාවේ ප්‍රධාන විගණන කරුණු සන්නිවේදනය කිරීමට විගණකවරුන් හෝ ඉල්ලා සිටීමෙන් විගණක සහ එම කරුණු සම්බන්ධයෙන් පාලනය භාරව සිටින අය අතර සන්නිවේදනය වැඩි දියුණු කළ හැකි වීම සහ විගණන වාර්තාවේ සඳහන් මූල්‍ය ප්‍රකාශ වල හෙළිදරව් කිරීම් සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ පාලනය භාරව සිටින අයගේ අවධානය වැඩිකල හැකිය.

අ4 ශ්‍රීලවිප්‍ර 320[8] විගණක මූල්‍ය ප්‍රකාශ පරිශිලකයින් යැයි උපකල්පනය කිරීම සාධාරණ බව පැහැදිලි කරයි:

(අ) ව්‍යාපාර හා ආර්ථික ක්‍රියාකාරකම් සහ ගිණුම්කරණය පිළිබඳ සාධාරණ දැනුමක් සහ මූල්‍ය ප්‍රකාශ වල තොරතුරු සාධාරණ උද්යෝගයකින් අධ්‍යනය කිරීමට කැමැත්තක් තිබීම.

(ආ) මූල්‍ය ප්‍රකාශ ප්‍රමාණාත්මක මට්ටමට සකස්කර, ඉදිරිපත් කර සහ විගණනය කර ඇති බවට තේරුම් ගැනීම.

(ඇ) ඇස්තමේන්තු භාවිතය, විනිශ්චය සහ අනාගත සිද්ධීන් සළකා බැලීම මත පදනම්ව වටිනාකම් අගය කිරීමේ අවිනිශ්චිත භාවයක් හඳුනාගැනීම; සහ

(ඈ) මූල්‍ය ප්‍රකාශවල තොරතුරු පදනම් කරගෙන සාධාරණ ආර්ථික තීරණ ගැනීම.(ඈ) මූල්‍ය ප්‍රකාශවල තොරතුරු පදනම් කරගෙන සාධාරණ ආර්ථික තීරණ ගැනීම.

---

6 ශ්‍රීලංවිප්‍ර 230, විගණන ලේඛනගත කිරීම, 8 – 11 සහ අ 6 ඡේද

7 ශ්‍රීලංවිප්‍ර 260 (සංශෝධිත), පාලන භාරකාරිත්වය දරණ තැනැත්තන් සමඟ සන්නිවේදනය

8 ශ්‍රීලංවිප්‍ර 320, විගණනයක් සැලසුම් කිරීමේදී සහ ඉටු කිරීමේදී වන ප්‍රමාණාත්මක භාවය, 4 ඡේදය

විගණන වාර්තාව, විගණනය කරන ලද මූල්‍ය ප්‍රකාශ සමගින් ඇති හෙයින්, විගණන වාර්තාවේ පරිශීලකයින් මූල්‍ය ප්‍රකාශවල අපේක්ෂිත පරිශීලකයින්ට සමාන යැයි සැළකේ.

*ප්‍රධාන විගණන කරුණු, විගණකගේ මතය සහ විගණන වාර්තාවේ අනෙකුත් මූලිකාංග අතර සම්බන්ධතාවය (යොමුව : 4, 12, 15 ඡේද)*

අ5 ශ්‍රීලවිප්‍ර 700 (සංශෝධිත) මඟින් අවශ්‍යතා ස්ථාපිත කරන අතර, මූල්‍ය ප්‍රකාශ පිළිබඳ මතයක් ගොඩ නැඟීමට මඟ පෙන්වීම සපයයි.[9] ප්‍රධාන විගණන කරුණු සන්නිවේදනය කිරීම මූල්‍ය ප්‍රකාශවල හෙළිදරව් කිරීම් සඳහා නොවීම හෝ සාධාරණ ඉදිරිපත් කිරීමක් ලබා ගැනීමට වෙනත් ආකාරයකින් අවශ්‍ය වේ. ශ්‍රීලවිප්‍ර 705 (සංශෝධිත) මූල්‍ය ප්‍රකාශවල හෙළිදරව් කිරීම්වල යෝග්‍යතාවය හෝ ප්‍රමාණවත්භාවය සම්බන්ධයෙන් ප්‍රමාණාත්මක අව ප්‍රකාශයක් ඇති බව විගණක විසින් නිගමනය කරන අවස්ථා ආමන්ත්‍රණය කරයි.[10]

අ6 ශ්‍රීලවිප්‍ර 705 (සංශෝධිත) ට අනුකූලව විගණක විසින් කොන්දේසි සහිත හෝ අහිත කර මතයක් ප්‍රකාශ කරන විට, කොන්දේසි සහිත (අහිතකර) මතය සඳහා වන පදනම කොටසෙහි විකරණය කරන ලද මතයකට තුඩු දෙන කරුණක් පිළිබඳ විස්තරයක් ඉදිරිපත් කිරීම අපේක්ෂිත පරිශීලකයින්ගේ අවබෝධය ප්‍රවර්ධනය කිරීමට සහ එවැනි තත්ත්වයන් ඇතිවූ විට ඒවා හඳුනා ගැනීමට උපකාරී වේ. ප්‍රධාන විගණන කරුණු කොටසේ විස්තර කර ඇති වෙනත් ප්‍රධාන විගණන කරුණු වලින් මෙම කරුණ වෙන්කොට සන්නිවේදනය කිරීමටත් විගණන වාර්තාවේ ඊට සුදුසු ප්‍රමුඛතාවයක් ලබාදෙයි. (15 වන ඡේදය බලන්න) ශ්‍රීලවිප්‍ර (සංශෝධිත) හි පරිශිෂ්ඨයෙහි විගණක විසින් කොන්දේසි සහිත හෝ අහිතකර මතයක් ප්‍රකාශ කරන විට සහ වෙනත් ප්‍රධාන විගණන කරුණු සන්නිවේදනය කරන විට, ප්‍රධාන විගණන කරුණු කොටසෙහි හඳුන්වාදීමේ භාෂාව බලපාන්නේ කෙසේද යන්න පිළිබඳ නිදර්ශන ඇතුලත් වේ. මෙම ශ්‍රීලවිප්‍ර හි අ 58 ඡේදය මඟින් කොන්දේසි සහිත (අහිතකර) මතය සඳහා වන පදනමේ කොටසෙහි හෝ විගණන වාර්තාවේ අඛන්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිත භාවය කොටසෙහි සඳහන් කරුණු වලින් ඔබ්බට විගණන වාර්තාවේ සන්නිවේදනය කළයුතු වෙනත් ප්‍රධාන විගණන කරුණු නොමැති බවට විගණක විසින් තීරණය කල විට, ප්‍රධාන විගණන කරුණු කොටස ඉදිරිපත් කරන ආකාරය නිරූපනය කරයි.

අ7 විගණක විසින් කොන්දේසි සහිත හෝ අහිතකර මතයක් ප්‍රකාශ කරන විට, වෙනත් ප්‍රධාන විගණන කරුණු සන්නිවේදනය කිරීම අපේක්ෂිත පරිශීලකයින්ගේ විගණනය පිළිබඳ අවබෝධය වැඩි දියුණු කිරීම සඳහා තවමත් අදාල වන අතර, එබැවින් ප්‍රධාන විගණන කරුණු තීරණය කිරීමේ අවශ්‍යතා අදාල වේ. කෙසේ වෙතත්,අහිතකර මතයක් ප්‍රකාශ වන පරිදි, විගණක විසින් තනි තනිව හෝ සමස්තයක් වශයෙන් අව ප්‍රකාශ මූල්‍ය ප්‍රකාශ වලට ප්‍රමාණාත්මක හා පෘථුල බව නිගමනය කල විට.[11]

(අ) අහිතකර මතයක් ඇති කරන කරුණ(ණු) හි වැදගත්කම මත පදනම්ව විගණක විසින් වෙනත් කරුණු ප්‍රධාන විගණන කරුණු නොවන බවට තීරණය කළ හැකිය. එවැනි තත්ත්වයන් තුල 15 වන ඡේදනය අවශ්‍යතාවය අදාල වේ. (අ58 ඡේදය බලන්න)

(ආ) අහිතකර මතයක් ඇති කරන කරුණ (ණු) හැර වෙනත් කරුණු එකක් හෝ කීපයක් ප්‍රධාන විගණන කරුණු ලෙස තීරණය කරන්නේ නම්, අහිතකර මතය සැළිකිල්ලට ගනිමින් එවැනි වෙනත් ප්‍රධාන විගණන කරුණු පිළිබඳ විස්තරයක් සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශ වල එම කරුණු සම්බන්ධයෙන් වඩා විශ්වාසදායක බවක් හැඟවීමට ඉඩ නොදීම විශේෂයෙන් වැදගත් වේ. (අ47 ඡේදය බලන්න.)

අ8 ශ්‍රීලවිප්‍ර 706 (සංශෝධිත)[12] මඟින්, සියලුම අස්තිත්ත්වවල මූල්‍ය ප්‍රකාශ විගණකවරුන් සඳහා, විගණන වාර්තාවේ අතිරේක සන්නිවේදනය ඇතුලත් කිරීම සඳහා කරුණු අවධාරණය කිරීමේ ඡේද සහ වෙනත් කරුණු ඡේද යෙදිය යුතු යැයි විගනක සළකන විට විගණක වරුන් සඳහා යාන්ත්‍රණ ස්ථාපිත කරයි. එවැනි අවස්ථාවන්හිදී ඒමම ඡේද විගණන වාර්තාවේ ප්‍රධාන විගණන කරුණු කොටසෙහි වෙන වෙනම ඉදිරිපත් කරනු ලැබේ. කරුණක් ප්‍රධාන විගණන කරුණක් ලෙස තීරණය කර ඇති විට, 13 වන ඡේදයට අනුකූලව එවැනි ඡේද භාවිතා කිරීම තනි ප්‍රධාන විගණන කරුණ විස්තර කිරීම සඳහා ආදේශකයක් නොවේ.[13] ශ්‍රීලවිප්‍ර 706 (සංශෝධිත) මඟින්

[9] ශ්‍රීලංවිප්‍ර 700 (සංශෝධිත), 10 – 15 සහ අ 1 – 15 ඡේද
[10] ශ්‍රීලංවිප්‍ර 705 (සංශෝධිලනත)හි අ 7 ඡේදය බලන්න.
[11] ශ්‍රීලංවිප්‍ර 705 (සංශෝධිත), 8 ඡේදය
[12] ශ්‍රීලංවිප්‍ර 706 (සංශෝධිත), ස්වාධීන විගණකගේ වාර්තාවේ කරුණු අවධාරණය කිරීමේ ඡේද සහ වෙනත් කරුණු පිළිබඳ ඡේද.
[13] ශ්‍රීලංවිප්‍ර 706 (සංශෝධිත), අ 1 - අ 3 ඡේද

එම ශ්‍රීලවිප්‍ර ට අනුකූලව ප්‍රධාන විගණන කරුණු සහ කරුණු අවධාරණය කිරීම අතර සම්බන්ධතාවය පිළිබඳ වැඩිදුර මඟ පෙන්වීම සපයයි.[14]

**ප්‍රධාන විගණන කරුණු තීරණය කිරීම** (යොමුව : 9-10 ඡේද)

අ9 ප්‍රධාන විගණන කරුණු පිළිබඳ විගණනකගේ තීරණ ගැනීමේ ක්‍රියාවලිය සැලසුම් කර ඇත්තේ පාලනය භාරව සිටින අය සමග සන්නිවේදනය කරන කරුණු වලින් සුළු ප්‍රමාණයක් තෝරා ගැනීම සඳහා වත්මන් කාල පරිච්ඡේදයේ මූල්‍ය ප්‍රකාශ විගණනයේදී වඩාත්ම වැදගත් කරුණු පිළිබඳ විගණකගේ විනිශ්චයමත පදනම්වය.

අ10 සංසන්දනාත්මක මූල්‍ය ප්‍රකාශ ඉදිරිපත් කළවිට ඒවා විගණක විසින් ප්‍රධාන විගණන කරුණු තීරණය කිරීම වත්මන් කාල පරිච්ඡේදයේ මූල්‍ය ප්‍රකාශ විගණනයේදී වඩාත් වැදගත් වන කරුණු වලට සීමාවේ. (එනම්, විගණකගේ මතය මූල්‍ය ප්‍රකාශ ඉදිරිපත් කරන සෑම කාල පරිච්ඡේදයක් සඳහාම පවා.)[15]

අ11 ප්‍රධාන විගණන කරුණු විගණක විසින් තීරණය කරණු ලබන්නේ වර්තමාන කාල පරිච්ඡේදයේ මූල්‍ය ප්‍රකාශ විගණනය සඳහා සහ පූර්ව කාල පරිච්ඡේදයේ විගණන වාර්තාවේ ඇතුලත් කර ඇති ප්‍රධාන විගණන කරුණු යාවත්කාලීන කිරීම මෙම ශ්‍රීලවිප්‍ර ට අනුව අවශ්‍ය නොවන අතර, කෙසේ වෙතත්, පෙර කාල පරිච්ඡේදයේ මූල්‍ය ප්‍රකාශ විගණනයේදී ප්‍රධාන විගණන කරුණක්, වත්මන් කාල පරිච්ඡේදයේ මූල්‍ය ප්‍රකාශ විගණනයේ ප්‍රධාන විගණන කරුණක් ලෙස දිගටම පවතී ද යන්න සළකා බැලීම විගණක හට ප්‍රයෝජනවත් විය හැකිය.

*සැළකිය යුතු විගණක අවධානයක් අවශ්‍ය කරුණු (යොමුව : 9 ඡේදය)*

අ12 සැළකිය යුතු විගණක අවධානය යන සංකල්පය මඟින් හඳුනා ගැනෙන්නේ,විගණනයක් අවදානම් මත පදනම් වූවක් බව සහ මූල්‍ය ප්‍රකාශ වල ප්‍රමාණාත්මක අව ප්‍රකාශ වීමේ අවදානම් හඳුනා ගැනීම සහ තක්සේරු කිරීම කෙරෙහි අවධානය යොමු කිරීමටත්, එම අවදානම් වලට ප්‍රතිචාර දක්වන විගණන ක්‍රියා පටිපාටි සැලසුම් කිරීම හා ක්‍රියාත්මක කිරීම සහ විගණකගේ මතය සඳහා පදනමක් සැපයීම සඳහා ප්‍රමාණවත් සහ යෝග්‍ය විගණන සාක්ෂි ලබා ගැනීම වේ. නිශ්චිත ගිණුම් ශේෂයක්, ගණුදෙනු පන්තියක් හෝ හෙළිදරව් කිරීමක් සඳහා සැඳහුම් මට්ටමින් ප්‍රමාණාත්මක අව ප්‍රකාශ වීමේ අවදානම වැඩිවන විට, විගණන ක්‍රියා පටිපාටි සැලසුම් කිරීම හා ක්‍රියාත්මක කිරීම සහ එහි ප්‍රතිඵල ඇගයීම සඳහා වැඩි විනිශ්චයක් බොහෝවිට සම්බන්ධවේ. වැඩිදුර විගණන ක්‍රියා පටිපාටි සැලසුම් කිරීමේදි විගණක විසින් අවදානම තක්සේරු කිරීම සඳහා වඩාත් ඒත්තු ගැන්විය හැකි විගණන සාක්ෂිලබා ගැනීම අවශ්‍ය වේ.[16] අවදානම පිළිබඳව ඇති ඉහල තක්සේරුව නිසා වඩාත් ඒත්තු ගැන්වෙන් සාක්ෂි ලබා ගැනීමේ දී, විගණක විසින් සාක්ෂි ප්‍රමාණය වැඩිකර ගැනීම හෝ වඩා අදාල හෝ විශ්වාසදායක සාක්ෂි ලබාගත හැකිය. උදාහරණයක් ලෙස, තෙවන පාර්ශවීය සාක්ෂි ලබා ගැනීම සඳහා වැඩි අවධානයක් යොමු කිරීම හෝ ස්වාධීන මූලාශ්‍ර ගණනාවකින් සනාථ කරන සාක්ෂි ලබා ගැනීම.[17]

අ13 ඒ අනුව, ප්‍රමාණවත් සුදුසු විගණන සාක්ෂි ලබා ගැනීමේදී විගණක වරයාට අභියෝග කරන හෝ මූල්‍ය ප්‍රකාශ පිළිබඳ මතයක් සකස් කිරීමේදී විගණක හට අභියෝග එල්ල කරන කරුණු විගණකගේ ප්‍රධාන විගණන කරුණු තීරණය කිරීමේදී විශේෂයෙන් අදාල විය හැකිය.

අ14 සැළකිය යුතු විගණක අවධානයට ලක්වන ක්ෂේත්‍ර බොහෝවිට මූල්‍ය ප්‍රකාශ වල සංකීර්ණත්වය සහ සැළකිය යුතු කළමනාකරණ විනිශ්චය යන අංශ සමග සම්බන්ධ වන අතර, එබැවින් බොහෝවිට දුෂ්කර හෝ සංකීර්ණ විගණන විනිශ්චයන් ඇතුලත් වේ. අනෙක් අතට, මෙය බොහෝවිට විගණකගේ සමස්ත විගණන උභය මාර්ගයට, සම්පත් වෙන්කිරීමට සහ එවැනි කරුණු සම්බන්ධයෙන් විගණන උත්සාහයේ ප්‍රමාණයට බලපායි. මෙම බලපෑම් වලට ඇතුලත් විය හැකි වන්නේ උදාහරණයක් ලෙස, විගණන කාර්යය සඳහා ජ්‍යෙෂ්ඨ නිලධාරීන් සම්බන්ධ කර ගැනීමේ ප්‍රමාණය හෝ විගණන විශේෂඥයකුගේ හෝ විශේෂිත ගිණුම්කරණ හෝ විගණන ක්ෂේත්‍රයක විශේෂඥතාවය ඇති පුද්ගලයින්ගේ සහභාගිත්වය මෙම කොටස් ආමන්ත්‍රණය කිරීම සඳහා සමාගම විසින් කාර්යයේ නියුක්ත කර තිබේද හෝ සේවයේ යොදවා තිබේද යන්න ගත හැකිය.

---

[14] ශ්‍රීලංවිප්‍ර 706 (සංශෝධිත), අ 1 - අ 3 ඡේද

[15] ශ්‍රීලංවිප්‍ර 710, සංසන්දනාත්මක තොරතුරු - අනුරූපී සංඛ්‍යා සහ සංසන්දනාත්මක මූල්‍ය ප්‍රකාශ බලන්න.

[16] ශ්‍රීලංවිප්‍ර 330, තක්සේරු කළ අවදානම් වලට විගණකගේ ප්‍රතිචාර

[17] ශ්‍රීලංවිප්‍ර 330, අ 19 ඡේදය

අ15 විවිධ ශ්‍රීලවිප්‍ර වලට අනුව සැලකිය යුතු විගණන අවධානයට ලක්විය යුතු ක්ෂේත්‍රවලට සම්බන්ධ විය හැකි පාලනය භාරව සිටින අය සහ වෙනත් අය සමග නිශ්චිත සන්නිවේදනයක් අවශ්‍ය වේ. උදාහරණයක් ලෙස

- ශ්‍රීලවිප්‍ර 260 (සංශෝධිත) ට අනුව විගණකහට විගණනයේදී මුහුණ පෑමට සිදුවන දුෂ්කරතා ඇත්නම් ඒවා පාලනයට භාරව සිටින අය සමග සන්නිවේදනය කිරීමට අවශ්‍යවේ.[18] ශ්‍රීලවිප්‍ර විභව දුෂ්කරතා සම්බන්ධව පිළිගනු ලැබේ. උදාහරණයක් වශයෙන්
  - o සම්බන්ධිත පාර්ශව ගණුදෙනු[19] සම්බන්ධිත පාර්ශව ගණුදෙනුවක අනෙකුත් සියළුම අංගයන් සඳහා විගණන සාක්ෂි ලබා ගැනීමට විගණක හට ඇති විශේෂයෙන් වූ සීමාවන් තුල වූ හැකියාව (මිල හැර) අතේ දුරින් වූ ගණුදෙනුවකට සමාන වේ.
  - o සමූහ විගණනයේ සීමාවන්, උදාහරණයක් ලෙස, සමූහ කාර්ය භාරයේ නියුක්ත කණ්ඩායම් තොරතුරු සඳහා වූ ප්‍රවේශය සීමාකර තිබිය හැක.[20]
- ශ්‍රීලවිප්‍ර 220 දුෂ්කර හෝ මතභේදයට තුඩුදෙන කරුණු සම්බන්ධයෙන් සුදුසු උපදේශනයක් ලබා ගැනීමට අදාලව කාර්යයේ නියුක්ත හවුල්කරු සඳහා අවශ්‍යතා ස්ථාපිත කරයි.[21] උදාහරණ ලෙස, විගණක විසින් සැළකිය යුතු තාක්ෂණික කාරණයක් සම්බන්ධයෙන් සමාගම තුල හෝ සමාගමෙන් පිටත වෙනත් අය සමග සාකච්ඡා කර ඇති අතර, එය ප්‍රධාන විගණන කරුණක් බවට දර්ශකයක් විය හැකිය. කාර්යයේ නියුක්ත හවුල්කරු විසින් කාර්යයේ නිරතවීමේ තත්ත්ව පාලන සමාලෝචන සමග වෙනත් දේ අතර, විගණන කටයුතු වලදී පැන නගින වැදගත් කරුණු ද සාකච්ඡා කිරීම අවශ්‍යවේ.[22]

*සැළකිය යුතු විගණන අවධානයක් අවශ්‍ය වූ කරුණු තීරණය කිරීමේදී සළකා බැලිය යුතු කරුණු (යොමුව : 9 ඡේදය)*

අ16 විගණනයේදී සැළකිය යුතු විගණන අවධානයට ලක්විය හැකි කරුණු පිළිබඳව විගණක විසින් සැලසුම් අවධියේදී මූලික දැක්මක් වර්ධනය කරගත හැකි අතර, එබැවින් ඒවා ප්‍රධාන විගණන කරුණු විය හැකිය. ශ්‍රීලවිප්‍ර260 9 (සංශෝධිත) ට අනුකූලව විගණනයේ සැලසුම්ගත විෂය පථය සහ කාලය පිළිබඳව පාලනය භාරව සිටින අය සමග සාකච්ඡා කිරීමේදී විගණකහට මෙය සන්නිවේදනය කළ හැකිය. කෙසේ වෙතත්, විගණක විසින් ප්‍රධාන විගණන කරුණු තීරණය කිරීම විගණනයේ ප්‍රතිඵල හෝ විගණනය පුරා ලබාගත් සාක්ෂි මත පදනම් වේ.

අ17 සැළකිය යුතු විගණන අවධානයක් අවශ්‍ය වූ කරුණු විගණක විසින් තීරණය කිරීමේදී සළකා බැලිය යුතු නිශ්චිත අවශ්‍යතා 9 න ඡේදයෙහි ඇතුලත් වේ. මෙම සළකා බැලීම් මඟින් පාලනය භාරව සිටින අය සමග සන්නිවේදනය කරන කරුණුවල ස්වභාවය අනුව බොහෝවිට මූල්‍ය ප්‍රකාශ වල අනාවරණය වූ කරුණු සමග සම්බන්ධ වී ඇති සහ අපේක්ෂිත පරිශීලකයින් හට විශේෂ උනන්දුවක් දැක්විය හැකි මූල්‍ය ප්‍රකාශ විගණනයේ අංශ පිළිඹිබු කිරීමට අදහස් කරන කරුණු කෙරෙහි අවධානය යොමු කෙරේ. මෙම සළකා අවශ්‍යය යන කාරණය ඒවාට අදාල කරුණු සෑම විටම ප්‍රධාන විගණන කරුණු බව ඇඟවීමට නොවේ ; ඒ වෙනුවට එවැනි නිශ්චිත සළකා බැලීම්වලට අදාල කරුණු ප්‍රධාන විගණන කරුණු වන්නේ 10 වන ඡේදයට අනුකූලව විගණනයේදී වඩාත් වැදගත් යැයි තීරණය කළහොත් පමණි. සළකා බැලීම් එකිනෙකට සම්බන්ධ විය හැකි බැවින් (උදා : 9 (ආ) - (ඇ) ඡේදවල විස්තර කර ඇති තත්ත්වයන්ට අදාල කරුණු ද සැළකිය යුතු අවදානම් ලෙස හඳුනාගත හැකිය.) කිසියම් කරුණකට සළකා බැලිය යුතු කරුණු එකකට වඩා විඩි ගණනක අදාලත්වය පාලනය භාරව සිටිය අය සමඟ සන්නිවේදනය කිරීම, විගණක විසින් එම කරුණු ප්‍රධාන විගණන කාරණයක් ලෙස හඳුනාගැනීමේ හැකියාව වැඩිකල හැකිය.

අ18 9 වන ඡේදයේ නිශ්චිතව සළකා බැලිය යුතු කරුණු වලට අමතරව, සැළකිය යුතු විගණන අවධානයක් අවශ්‍ය වන පාලනය භාරව සිටින අය සමඟ සන්නිවේදනය කරන වෙනත් කරුණු තිබිය හැකි අතර, එබැවින් ඒවා 10 වන ඡේදයට අනුකූලව ප්‍රධාන විගණන කරුණු ලෙස තීරණය කළ හැකිය. උදාහරණයක් ලෙස, මූල්‍ය ප්‍රකාශවල හෙළිදරව් කිරීමට අවශ්‍ය නොවන විගණනයට අදාල කරුණු එවැනි කරුණු වලට ඇතුලත් විය හැකිය. උදාහරණයක් ලෙස, නව තොරතුරු තාක්ෂණ පද්ධතියක් ක්‍රියාත්මක කිරීම (හෝ පවතින තොරතුරු තාක්ෂණ

[18] ශ්‍රීලංවිප්‍ර 260 (සංශෝධිත), 16 (ආ) සහ අ 21 ඡේද
[19] ශ්‍රීලංවිප්‍ර 550, සම්බන්ධිත පාර්ශවයන්, අ 42 ඡේදය 42
[20] ශ්‍රීලංවිප්‍ර 600, විශේෂ සළකාබැලීම් - සමූහ මූල්‍ය ප්‍රකාශ විගණන (සංරචක විගණකවරුන්ගේ වැඩ ඇතුලත්ව) 49 (ඇ) ඡේදය
[21] ශ්‍රීලංවිප්‍ර 220, මූල්‍ය ප්‍රකාශ විගණනයක් සඳහා තත්ත්ව පාලනය
[22] ශ්‍රීලංවිප්‍ර 220, 19 ඡේදය

පද්ධතියක සැලකිය යුතු වෙනස්කම් සිදු කිරීම.) විශේෂයෙන් එවැනි වෙනසක් විගණකගේ සමස්තවිගණන උපාය මාර්ගයට සැලකිය යුතු බලපෑමක් ඇතිකලේ නම් හෝ සැලකිය යුතු අවදානමකට සම්බන්ධ නම් (උදා : අයභාරය හඳුනා ගැනීමට බලපාන පද්ධතියක වෙනස්කම්) කාල පරිච්ඡේදය තුල සැලකිය යුතු විගණක අවධානය යොමුකල යුතු අංශයක් විය හැක.

ශ්‍රීලවිප්‍ර 315 (සංශෝධිත) සමඟ අනුකූලව හඳුනාගෙන ඇති ප්‍රමාණාත්මක අවප්‍රකාශ වීමේ ඉහළ තක්සේරුවකින් යුතු ප්‍රදේශ හෝ සැලකිය යුතු අවදානම් (යොමුව 9 (අ) ඡේද)

අ19 ශ්‍රීලවිප්‍ර 260 (සංශෝධිත) මගින් විගණක විසින් හඳුනාගෙන ඇති සැලකිය යුතු අවදානම් පිළිබඳව විගණක පාලනය භාරව සිටින අය සමඟ සන්නිවේදනය කිරීම අවශ්‍යවේ.[23] ශ්‍රීලවිප්‍ර 260 (සංශෝධිත) හි අ 13 ඡේදයෙන් පැහැදිලි කරන්නේ විගණක විසින් ප්‍රමාණාත්මක අව ප්‍රකාශ කිරීමේ ඉහල තක්සේරු අවදානම් සහිත ප්‍රදේශ සහිත ආමන්ත්‍රණය කිරීමට විගණක සැලසුම් කරන්නේ කෙසේද යන්න පිළිබඳව පාලනය භාරව සිටින අය සමඟ සන්නිවේදනය කළහැකි බවයි.

අ20 ශ්‍රීලවිප්‍ර 315 (සංශෝධිත) මගින් විගණකගේ විනිශ්චයේදී ප්‍රමාණාත්මක අව ප්‍රකාශයක හඳුනාගත් සහ තක්සේරු කල අවදානමක් ලෙස සැලකිය යුතු අවදානමක් විශේෂ විගණන සළකා බැලීමක් අවශ්‍ය බවට අර්ථ දක්වයි. සැලකිය යුතු කළමනාකරණ විනිශ්චයක් සහ සැලකිය යුතු අසාමාන්‍ය ගණුදෙනු යන කොටස් බොහෝවිට සැලකිය යුතු අවදානම් ලෙස හඳුනාගත හැකිය. එබැවින් සැලකිය යුතු අවදානම් බොහෝවිට සැලකිය යුතු විගණක අවධානයක් අවශ්‍ය වන ක්ෂේත්‍ර වේ.

අ21 කෙසේ වෙතත්, සියළු සැලකිය යුතු අවදානම් සඳහා මෙය එලෙස නොවිය හැකිය. උදාහරණයක් ලෙස, ශ්‍රීලවිප්‍ර 240 පූර්ව නිගමනය කරන්නේ අයභාරය හඳුනා ගැනීමේදී වංචා කිරීමේ අවදානමක් ඇති බව සහ වංචාව හේතුවෙන් ප්‍රමාණාත්මක අව ප්‍රකාශ කිරීමේ තක්සේරු කල අවදානම් සැලකිය යුතු අවදානම් ලෙසට විගණක විසින් ගැනීම් අවශ්‍ය බවයි.[24] ඊට අමතරව, ශ්‍රීලවිප්‍ර 240 ඇඟවුම් කරන්නේ, කළමනාකරණය මැදහත්ව පාලනයන් අක්‍රීය කිරීම වැනි අනපේක්ෂිත මාර්ගය නිසා, එය වංචාව හේතුවෙන් ප්‍රමාණාත්මක අව ප්‍රකාශ වීමේ අවදානමක් වන අතර, එමගින් සැලකිය යුතු අවදානමක් ඇති ලෙසයි.[25] ඒවායේ ස්වභාවය අනුව මෙම අවදානම් වලට සැලකිය යුතු විගණක අවධානයක් අවශ්‍ය නොවනු ඇති අතර, එබැවින් 10 වන ඡේදයට අනුකූලව ප්‍රධාන විගණන කරුණු විගණක විසින් තීරණය කිරීමේදී සළකා බලනු නොලැබේ.

අ22 ශ්‍රීලවිප්‍ර 315 (සංශෝධිත) පැහැදිලි කරන්නේ විගණකගේ සැදැහුම් මට්ටමින් කරන ලෙස ප්‍රමාණාත්මක අව ප්‍රකාශ වීමේ අවදාන තක්සේරුව, අතිරේක විගණන සාක්ෂි ලබා ගන්නා බැවින් විගණන කාලය තුල වෙනස්විය හැකි බවයි.[26] මූල්‍ය ප්‍රකාශවල යම් ක්ෂේත්‍රයකට අදාලව විගණකගේ අවදානම් තක්සේරු කිරීම සහ සැලසුම් කල විගණන ක්‍රියා පටිපාටි නැවත ඇගයීම (එනම්, විගණන ප්‍රවේශයේ සැලකිය යුතු වෙනසක්, උදාහරණයක් ලෙස, විගණකගේ අවදානම් තක්සේරුව, සමහර පාලනයන් ඵලදායී ලෙස ක්‍රියාත්මක වන බවටත්, විශේෂයෙන් ප්‍රමාණාත්මක අව ප්‍රකාශ වීමේ අවදානමක් ඇති ප්‍රදේශයක විගණන කාලය තුල ඒවා ඵලදායි ලෙස ක්‍රියාත්මක නොවූ බවට විගණන සාක්ෂි විගණක විසින් ලබාගෙන තිබීමත්) සැලකිය යුතු විගණක අවධානයක් අවශ්‍ය ප්‍රදේශයක් ලෙස තීරණය වීමට හේතුවිය හැකිය.

ඉහළ ඇස්තමේන්තු අවිනිශ්චිත තාවයක් ඇති බවට හඳුනාගෙන ඇති ගිණුම් ඇස්තමේන්තු ද ඇතුළුව සැලකිය යුතු කළමනාකරණ විනිශ්චය සම්බන්ධ මූල්‍ය ප්‍රකාශවල ප්‍රදේශවලට අදාල වැදගත් විගණන විනිශ්චයක් (යොමුව : 9 (ආ) ඡේදය)

අ23 ශ්‍රීලවිප්‍ර 260 (සංශෝධිත) අනුව ගිණුම්කරණ ප්‍රතිපත්ති ගිණුම්කරණ ඇස්තමේන්තු සහ මූල්‍ය ප්‍රකාශ හෙළිදරව් කිරීම් ඇතුළුව අස්තිත්ත්වයේ ගිණුම්කරණ භාවිතයන්හි සැලකිය යුතු ගුණාත්මක අංග පිළිබඳව විගණකගේ අදහස් පාලනය භාරව සිටින අය සමඟ සන්නිවේදනය කිරීම විගණකහට අවශ්‍යවේ.[27] බොහෝ අවස්ථාවන්හිදී මෙය තීරණාත්මක ගිණුම්කරණ ඇස්තමේන්තු හා ඒ හා සම්බන්ධ හෙළිදරව් කිරීම් වලට සම්බන්ධ වන අතර, ඒවා සැලකිය යුතු විගණක අවධානයට ලක්විය හැකි අංශ විය හැකි අතර, සැලකිය යුතු අවදානම් ලෙස හඳුනාගත හැකිය.

---

[23] ශ්‍රීලංවිප්‍ර 260 (සංශෝධිත), 15 ඡේදය

[24] ශ්‍රීලංවිප්‍ර 240, මූල්‍ය ප්‍රකාශ විගණනයක් සිදුකිරීමේදී වංචා සළකා බැලීමට විගණකවරයාට ඇති වගකීම්

[25] ශ්‍රීලංවිප්‍ර 240, 31 ඡේදය

[26] ශ්‍රීලංවිප්‍ර 315 (සංශෝධිත), 31 ඡේදය

[27] ශ්‍රීලංවිප්‍ර 260 (සංශෝධිත), 16 (අ) ඡේදය

අ24 කෙසේ වෙතත්, මූල්‍ය ප්‍රකාශ පරිශීලකයින් සැළකිය යුතු අවදානම් යැයි තීරණය කර නොමැති ශ්‍රීලවිප්‍ර 540[28] ට අනුකූලව ඉහළ තක්සේරු කරණ අවිනිශ්චිත තාවයක් ඇති බවට හඳුනාගෙන ඇති ගිණුම් ඇස්තමේන්තු කෙරෙහි ඔවුන්ගේ උනන්දුව ඉස්මතු කර තිබේ. වෙනත් දේ අතර, එවැනි ඇස්තමේන්තු කළමනාකරණ විනිශ්චය මත බෙහෙවින් රඳා පවතින අතර බොහෝවිට මූල්‍ය ප්‍රකාශවල වඩාත් සංකීර්ණ අංශ වන හෙයින් කළමනාකරණයේ ප්‍රවීනයෙකුගේ සහ විගණකගේ විශේෂඥයෙකුගේ සහභාගිත්වය අවශ්‍ය විය හැකිය. මූල්‍ය ප්‍රකාශ කෙරෙහි සැළකිය යුතු බලපෑමක් ඇති කරණ ගිණුම්කරණ ප්‍රතිපත්ති (සහ එම ප්‍රතිපත්ති වල සැළකිය යුතු වෙනස්කම්) විශේෂයෙන් යම් අස්තිත්ත්වයක පරිචය එහි කර්මාන්තයේ අනෙක් අය සමඟ නොගැලපෙන අවස්ථාවන්හිදී මූල්‍ය ප්‍රකාශ පිළිබඳ ඔවුන්ගේ අවබෝධයට අදාල වන බව පරිශිලකයින් අවධාරණය කර ඇත.

කාල පරිච්ඡේදය තුල සැළකිය යුතු සිද්ධීන් හෝ ගණුදෙනු විගණනයට ඇති බලපෑම (යොමුව :9 (ඇ)ඡේදය)

අ25 මූල්‍ය ප්‍රකාශ හෝ විගණනයට සැළකිය යුතු බලපෑමක් ඇති කල සිද්ධීන් හෝ ගණුදෙනු සැළකිය යුතු විගණක අවධානයට ලක්විය යුතු අංශ විය හැකි අතර, සැළකිය යුතු අවදානම් ලෙස හඳුනාගත හැකිය. උදාහරණයක් ලෙස, විගණනය පුරා විවිධ අවස්ථා වලදී කළමනාකරණය සහ පාලනය භාරව සිටින අය සමඟ සම්බන්ධිත පාර්ශවව සමඟ වූ සැළකිය යුතු ගණුදෙනු වල මූල්‍ය ප්‍රකාශ කෙරෙහි ඇති බලපෑම ගැන හෝ අස්තිත්ත්වය සඳහා වන සාමාන්‍ය ව්‍යාපාර පටිපාටියෙන් බැහැර වූ සැළකිය යුතු ගණුදෙනු හෝ එය වෙනත් ලෙසකින් අසාමාන්‍ය යැයි පෙනෙන විට විගණක පුළුල් සාකච්ඡා පවත්වා ඇත.[29] එවැනි ගණුදෙනු හඳුනා ගැනීම් මැනීම ඉදිරිපත් කිරීම හෝ හෙලිදරව් කිරීම සම්බන්ධයෙන් කළමනාකරණය බැරෑරුම් හෝ සංකීර්ණ විනිශ්චයක් ලබා දී ඇති අතර, එය විගණකගේ සමස්ත උපාය මාර්ගයට සැළකිය යුතු බලපෑමක් ඇතිකළ හැකිය.

අ26 කළමනාකරණයේ උපකල්පන හෝ විනිශ්චයන් කෙරෙහි බලපාන සැළකිය යුතු ආර්ථික, ගිණුම්කරණ, නියාමන, කර්මාන්ත හෝ වෙනත් වර්ධනයන් ද විගණනය සඳහා විගණකගේ සමස්ත ප්‍රවේශයට බලපාන අතර, සැළකිය යුතු විගණන අවධානයක් අවශ්‍ය වන කරුණකට හේතුවේ.

*වඩාත්ම වැදගත් කරුණු (යොමුව : 10 වන ඡේදය)*

අ27 සැළකිය යුතු විගණන අවධානයක් අවශ්‍ය වූ කරුණු වල ප්‍රතිඵලයක් වශයෙන් භාරව සිටින අය සමඟ සැළකිය යුතු අන්තර් ක්‍රියාකාරිත්වයක් ඇතිවිය හැකිය. පාලනය භාරව සිටින අය සමඟ එවැනි කරුණු පිළිබඳ සන්නිවේදනයේ ස්වභාවය හා ප්‍රමාණය බොහෝවිට විගණනයේදී වඩාත්ම වැදගත් වන්නේ කුමන කරුණු ද යන්න පෙන්නුම් කරයි. උදාහරණයක් ලෙස, සැළකිය යුතු විගණක හෝ කළමනාකරණ විනිශ්චයකට භාජනය වූ සැළකිය යුතු ගිණුම්කරණ ප්‍රතිපත්ති යෙදීම වැනි වඩාත් දුෂ්කර හා සංකීර්ණ කරුණු සම්බන්ධයෙන් විගණක හට පාලනය භාරව සිටින අය සමඟ වඩාත් ගැඹුරු, නිරන්තර හෝ ශක්තිමත් අන්තර් ක්‍රියාකාරිත්වයක් තිබිය හැකිය.

අ28 වඩාත්ම වැදගත් කරුණු පිළිබඳ සංකල්පය අස්තිත්ත්වයේ සන්දර්භය සහ සිදු කරන ලද විගණනය තුල අදාල වේ. එනිසා විගණකගේ ප්‍රධාන විගණන කරුණු තීරණය කිරීම හා සන්නිවේදනය කිරීම විගණනයට විශේෂිත වූ කරුණු හඳුනා ගැනීමට සහ විගණනයේ වෙනත් කරුණුවලට සාපේක්ෂව ඒවායෙහි වැදගත්කම පිළිබඳව විනිශ්චයක් කිරීම අරමුණු කරගෙන ඇත.

අ29 පාලනය භාරව සිටින අය සමඟ සන්නිවේදනය කරන ලද කරුණක සාපේක්ෂ වැදගත්කම සඳහා අදාල වියහැකි වෙනත් කරුණු සහ එවැනි කරුණක් ප්‍රධාන විගණන කරුණක් ද යන්න තීරණය කිරීම:

- සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශ පිළිබඳ අපේක්ෂිත පරිශිලකයින්ගේ අවබෝධයට කරුණෙහි වැදගත්කම, විශේෂයෙන් මූල්‍ය ප්‍රකාශ සඳහා එහි ප්‍රමාණාත්මක භාවය.

- කරුණකට අදාල පාදක කරගත් ගිණුම්කරණ ප්‍රතිපත්තියේ ස්වභාවය හෝ එහි කර්මාන්තය තුල ඇති අනෙකුත් අස්තිත්ත්ව සමඟ සසඳන විට කළමනාකරණය විසින් සුදුසු ප්‍රතිපත්තියක් තෝරා ගැනීමේදී ඇති සංකීර්ණත්වය හෝ ආත්මීයත්වය.

- කරුණකට අදාල වංචා හෝ වැරදි හේතුවෙන්, ඇත්නම්, ප්‍රමාණව හා ගුණාත්මකව නිවැරදි කරන ලද සහ රැස්කරගත් නිවැරදි නොකල අව ප්‍රකාශවල ස්වභාවය හා ප්‍රමාණාත්මක භාවය.

---

[28] ශ්‍රීලංවිප්‍ර 540, සාධාරණ අගයට වන ගිණුම් ඇස්තමේන්තු සහ අදාල හෙලිදරව් කිරීම් ඇතුළුව ගිණුම්කරණ ඇස්තමේන්තු විගණනය කිරීම. 10 - 11 ඡේද බලන්න.

[29] ශ්‍රීලංවිප්‍ර 260 (සංශෝධිත), 16 (අ), 16 (ඇ) සහ අ 22 ඡේද සහ පරිශිෂ්ඨ 2 බලන්න.

- ආමන්ත්‍රණය කිරීම සඳහා අවශ්‍ය විගණන ප්‍රයත්නයේ ස්වභාවය හා ප්‍රමාණයට ඇතුලත් වන්නේ :
    - o කරුණ විසැඳීම සඳහා විගණන ක්‍රියා පටිපාටි යෙදීමට හෝ එම ක්‍රියා පටිපාටිවල ප්‍රතිඵල ඇත්නම් ඒවා ඇගයීමට ලක් කිරීමට අවශ්‍ය විශේෂිත කුසලතා හෝ දැනුමේ ප්‍රමාණය.
    - o මෙම කරුණ සම්බන්ධයෙන් කාර්යයේ නියුතු කණ්ඩායමෙන් බැහැර උපදේශනවල ස්වභාවය.
- විගණකගේ විනිශ්වයන් වඩාත් ආත්මීය බවට පත්වන විට විගණන ක්‍රියා පටිපාටි ක්‍රියාවට නැංවීමේ දුෂ්කරතාවයන්ගේ ස්වභාවය සහ බලපතලකම, එම ක්‍රියා පටිපාටි වල ප්‍රතිඵල ඇගයීම, සහ විගණකගේ මතය පදනම් කර ගැනීමට අදාල සහ විශ්වාසදායකස සාක්ෂි ලබාගැනීම.
- කරුණකට අදාලව හඳුනාගෙන ඇති යම් පාලන අඩුපාඩුවල බරපතලකම.
- මෙම කරුණකට අදාල වෙනම, නමුත් අදාල, විගණන සළකා බැලීම් ගණනාවක් සම්බන්ධ වී තිබේද යන්න. උදාහරණයක් ලෙස, දිගු කාලීන ගිවිසුම් මගින් අයභාරය හඳුනා ගැනීම. නීතිමය හෝ වෙනත් අසම්භාව්‍යතාවයන් සම්බන්ධයෙන් සැළකිය යුතු විගණක අවධානයක් තිබිය හැකි අතර, වෙනත් ගිණුම්කරණ ඇස්තමේන්තු කෙරෙහි බලපෑමක් ඇතිකල හැකිය.

අ30 වර්තමාන කාල පරිච්ඡේදයේ මූල්‍ය ප්‍රකාශ විගණනය කිරීමේදි සැළකිය යුතු විගණන අවධානයක් අවශ්‍ය වූ කරුණු කවරේද සහ කොපමණ ප්‍රමාණයක් ද යන්න තීරණය කිරීම වෘත්තීය විනිශ්වය කාරණයකි. විගණන වාර්තාවට ඇතුලත් කළයුතු ප්‍රධාන විගණන කරුණු සංඛ්‍යාව, අස්තිත්ත්වයේ විශාලත්වය සහ සංකීර්ණත්වය එහි ව්‍යාපාරයේ සහ පරිසරයේ ස්වභාවය සහ විගණන කටයුතු වල කරුණු සහ තත්ත්වයන් කෙරෙහි බලපායි. පොදුවේ ගත්කල ප්‍රධාන විගණන කරුණු ලෙස මුල් වරට තීරණය කළ කරුණු ගණන වැඩිවන තරමට, විගණකට මේ සෑම කරුණක්ම ප්‍රධාන විගණන කරුණක අර්ථ දැක්වීම සපුරාලන්නේදැයි නැවත සළකා බැලීමට අවශ්‍ය වනු ඇත. ප්‍රධාන විගණන කරුණු වල දීර්ඝ ලැයිස්තු, විගණනයේ වඩාත්ම වැදගත් ඒවාය යන මතයට පටහැනි විය හැකිය.

**ප්‍රධාන විගණන කරුණ සන්නිවේදනය කිරීම.**

*විගණන වාර්තාවේ ප්‍රධාන විගණන කරුණු වෙන් කිරීම. (යොමුව : 11 වන ඡේදය)*

අ31 විගණකගේ මතයට ආසන්නව,වෙනම ප්‍රධාන විගණන කරුණු කොටස තැබීමෙන් එවැනි තොරතුරු වලට ප්‍රමුඛතාවයක් ලබා දිය හැකි අතර, අපේක්ෂිත පරිශිලකයින්හට කාර්යයෙහි විශේෂිත තොරතුරුවල ප්‍රත්‍යක්ෂ අගය වටහා ගත හැකිය.

අ32 ප්‍රධාන විගණන කරුණු අංශය තුල තනි කරුණු ඉදිරිපත් කිරීමේ අනු පිළිවෙල වෘත්තීය විනිශ්වය පිළිබඳ කාරණයකි. උදාහරණයක් ලෙස, එවැනි තොරතුරු විගණකගේ විනිශ්වය මත පදනම්ව සාපේක්ෂ වැදගත්කමක් අනුව සංවිධානය කළ හැකිය, *නැතහොත්* මූල්‍ය ප්‍රකාශවල කරුණු හෙළිදරව් වන ආකාරයට අනුරූප විය හැකිය. උප ශීර්ෂ ඇතුලත් කිරීම සඳහා 11 වන ඡේදයේ අවශ්‍යතා කරුණු තව දුරටත් වෙනස් කිරීම අරමුණු කරගෙන ඇත.

අ33 සංසන්දනාත්මක මූල්‍ය තොරතුරු ඉදිරිපත් කළවිට, ප්‍රධාන විගණන කරුණු කොටසෙහි හඳුන්වාදීමේ භාෂාව සකස් කර ඇත්තේ විස්තර කර ඇති ප්‍රධාන විගණන කරුණු වර්තමාන කාල පරිච්ඡේදයේ මූල්‍ය ප්‍රකාශවල විගණනයට පමණක් සම්බන්ධවන බැවින් සහ එම මූල්‍ය ප්‍රකාශ මගින් ආවරණය වන නිශ්චිත කාල පරිච්ඡේදය පිළිබඳ යොමුවක් ඇතුලත් විය හැකිය. (උදා: 20X1 දෙසැම්බර් 31න් අවසන් වූ වර්ෂය සඳහා).

තනි ප්‍රධාන විගණන කරුණු පිළිබඳ විස්තර (යොමුව : 13 ඡේදය)

අ34 ප්‍රධාන විගණන කරුණ පිළිබඳ විස්තරයෙහි ප්‍රමාණාත්මක භාවය පිළිබඳ කාරණයකි. ප්‍රධාන විගණන කරුණ පිළිබඳ විස්තරය විගණනයේදී වඩාත්ම වැදගත් වන්නේ ඇයිද යන්න සහ විගණනයේදී කරුණු ආමන්ත්‍රණය කළ ආකාරය තේරුම් ගැනීමට අපේක්ෂිත පරිශිලකයින්හට හැකිවන පරිදි සංක්ෂිප්ත හා සමබර පැහැදිලි කිරීමක් සැපයීමට අදහස් කෙරේ. ඉහළ තාක්ෂණික විගණන පද භාවිතය සීමා කිරීමෙන් විගණනය පිළිබඳ සාධාරණ දැනුමක් නොමැති අපේක්ෂිත පරිශිලකයින්ට විගණනයේදී විශේෂ කරුණු කෙරෙහි විගණක අවධානය යොමු කිරීමේ පදනම අවබෝධ කර ගැනීමට උපකාරි වේ. විගණක විසින් සපයනු ලබන තොරතුරු වල ස්වභාවය හා ප්‍රමාණය අදාල පාර්ශවයන්ගේ වගකීම් සන්දර්භය තුල සමතුලිත කිරීමට අදහස් කෙරේ. (එනම් විගණකට සංක්ෂිප්ත හා තේරුම්ගත හැකි ආකාරයකින් ප්‍රයෝජනවත් තොරතුරු සැපයීම සඳහා, නුසුදුසු ලෙස අස්තිත්ත්වය පිළිබඳ මුල් තොරතුරු සපයන්නා වීම).

අ35 මුල් තොරතුරු යනු අස්තිත්ත්වය විසින් වෙනත් ආකාරයකින් ප්‍රසිද්ධ කර නොමැති අස්තිත්ත්වය පිළිබඳ කිසියම් තොරතුරකි. (උදා :මූල්‍ය ප්‍රකාශවල ඇතුලත් කර නොමැති හෝ විගණන වාර්තාවේ දිනයෙන් ලබාගත හැකි වෙනත් තොරතුරු හෝ කළමනාකරණය හෝ පාලනය භාරව සිටින අය විසින් වෙනත් වාචික හෝ ලිඛිත සන්නිවේදනයෙන් අමතනු ලැබූ මූල්‍ය තොරතුරු පිළිබඳ මූලික නිවේදනයක් හෝ ආයෝජන විස්තර වැනි.) එවැනි තොරතුරු යනු අස්තිත්ත්වයෙහි කළමනාකරණයේ සහ පාලනය භාරව සිටින අයගේ වගකීම වේ.

අ36 ප්‍රධාන විගණන කරුණක් පිළිබඳ විස්තරයක් නුසුදුසු ලෙස අස්තිත්ත්වය පිළිබඳ මුල් තොරතුරු සැපයීම වළක්වා ගැනීමට විගණක උත්සාහ කිරීම යෝග්‍යය. ප්‍රධාන විගණන කරුණ පිළිබඳ විස්තරය සාමාන්‍යයෙන් අස්තිත්ත්වය පිළිබඳ මුල් තොරතුරු නොව එය විගණනයේ සන්දර්භය තුල කාරණය විස්තර කරන පරිදි වූවකි. කෙසේ වෙතත්, විගණනයේදී මෙම කරුණ වඩාත් වැදගත් එකක් ලෙස සළකනු ලැබුවේ ඇයිද යන්න සහ ඒ අනුව ප්‍රධාන විගණන කරුණක් ලෙස තීරණය වූයේ ඇයි ද යන්න සහ විගණනයේදී කරුණ ආමන්ත්‍රණය කල ආකාරය පැහැදිලි කිරීම සඳහා අමතර තොරතුරු ඇතුලත් කිරීම අවශ්‍යවන විගණක විසින් සළකා බැලියහැකි අතර, එවැනි තොරතුරු හෙලිදරව් කිරීම නීතියෙන් හෝ නියාමනය මගින් වළක්වනු නොලැබේ. විගණක විසින් එවැනි තොතුරු අවශ්‍ය යැයි තීරණය කළවිට, විගණන වාර්තාවේ මුල් තොරතුරු විගණක විසින් සපයනවා, වෙනුවට විගණක විසින් කළමනාකරණයට හෝ පාලනය භාරව සිටින අයට අමතර තොරතුරු හෙලිදරව් කිරීම සඳහා දිරිගැන්විය හැකිය.

අ37 විගණකගේ වාර්තාවේ කරුණු සන්නිවේදනය කරනු ඇති බව සැළකිල්ලට ගෙන ප්‍රධාන විගණන කරුණට අදාල නව හෝ වැඩි දියුණු කල තොරතුරු මූල්‍ය ප්‍රකාශ වල හෝ වාර්තාවේ වෙනත් තැනක ඇතුලත් කිරීමට කළමනාකරණය හෝ පාලනයට සම්බන්ධ අය විසින් තීරණය කල හැකිය. උදාහරණයක් ලෙස, අදාල නව මූල්‍ය වාර්තාකරණ ආකෘතිමය රාමුව යටතේ පිළිගත හැකි විකල්ප පවතින විට, ගිණුම්කරණ ඇස්තමේන්තු වල භාවිතා වන ප්‍රධාන උපකල්පන වල සංවේදීතාව හෝ නිශ්චිත ගිණුම්කරණ පරිචයන් හෝ ප්‍රතිපත්ති සඳහා වන අස්තිත්ත්වයේ තාර්කිකත්වය පිළිබඳ වඩාත් ශක්තිමත් තොරතුරු සැපයීම සඳහා එවැනි නව හෝ වැඩි දියුණු කල හෙලිදරව් කිරීමේ ඇතුලත් කළ හැකිය.

අ38 අ39 ශ්‍රීලවිප්‍ර 720 (සංශෝධිත) වාර්ෂික වාර්තාව යන පදය නිර්වචනය කර ඇති අතර, කළමනාකරණ, වාර්තාවෙක්, කළමනාකරණ විවරණයක් හෝ මෙහෙයුම් හෝ මූල්‍ය සමාලෝචනයක් හෝ පාලනය භාරව සිටින අයගේ සමාන වාර්තා (උදා : අධ්‍යක්ෂ වරුන්ගේ වාර්තාවක්), සභාපතිගේ ප්‍රකාශය, ආයතනික පාලන ප්‍රකාශය හෝ අභ්‍යන්තර පාලනය සහ අවදානම් තක්සේරු වාර්තා වාර්ෂික වාර්තාවේ ආකෘති කොටසක් විය හැකිය.[30] ශ්‍රීලවිප්‍ර 720 (සංශෝධිත) වාර්ෂික වාර්තාවේ ඇතුලත් වෙනත් තොරතුරු සම්බන්ධ විගණකගේ වගකීම් ආමන්ත්‍රණය කරයි. මූල්‍ය ප්‍රකාශ පිළිබඳ විගණකගේ මතය අනෙක් තොතුරු ආවරණය නොකරන නමුත්, ප්‍රධාන විගණන කරුණු පිළිබඳ විස්තරය සකස් කිරීමේදී විගණන මෙම තොරතුරු මෙන්ම අස්තිත්ත්වයෙන් හෝ වෙනත් විශ්වසනීය ප්‍රභවයන්ගෙන් ප්‍රසිද්ධියේ ලබාගත හැකි සන්නිවේදනයන් සළකා බැලිය හැකිය.

අ39 විගණනයේදී සකස් කරන ලද විගණන ලේඛන ප්‍රධාන විගණන කරුණක් පිළිබඳ විස්තරයක් සකස් කිරීමේදී විගණක හට ප්‍රයෝජනවත් වේ. උදාහරණයක් ලෙස, පාලනය භාරව සිටින අය සමඟ වූ ලිඛිත සන්නිවේදනයන් හෝ වාචික සන්නිවේදනයන් පිළිබඳ විගණකගේ ලේඛනගත කිරීම් සහ වෙනත් විගණන ලේඛනත කිරීම් විගණන වාර්තාවේ විගණකගේ සන්නිවේදනය සඳහා ප්‍රයෝජනවත් පදනමක් සපයයි. මෙයට හේතුව ශ්‍රීලවිප්‍ර 230 ට අනුකූලව විගණන ලේඛනගත කිරීම ආමන්ත්‍රණය කිරීමට අදහස් කරන්නේ විගණනයේදී පැන නගින වැදගත් කරුණු, ඒ මත එළඹී නිගමන සහ එම නිගමන වලට එළඹීමේදී වූ සැළකිය යුතු වෘත්තීය විනිශ්චයන් සහ සිදු කරන ලද විගණන ක්‍රියා පටිපාටි වල ස්වභාවය, කාලය හා ප්‍රමාණය එම ක්‍රියා පටිපාටි වල ප්‍රතිඵල සහ ලබාගත් විගණන සාක්ෂි පිළිබඳ වාර්තාවක් ලෙස සැපයීමවයි. එවැනි ලේඛන විගණකහට කරුණෙහි වැදගත්කම පැහැදිලි කරන ප්‍රධාන විගණන කරුණු පිළිබඳ විස්තරයක් වර්ධනය කිරීමට සහ 18 වන ඡේදයේ අවශ්‍යතාවය ක්‍රියාත්මක කිරීමට සහාය විය හැකිය.

මූල්‍ය ප්‍රකාශවල කරුණ හෙලිදරව් කර ඇති ස්ථානය පිළිබඳ යොමුව (යොමුව : 13 ඡේදය)

අ40 (අ) - (ආ) ඡේද වලට අනුව ඒක ඒක් ප්‍රධාන විගණන කරුණු විස්තර කිරීම විගණක විසින් විගණනයේදී වඩාත් වැදගත් කරුණක් ලෙස සළකන්නේ ඇයිද යන්න සහ විගණනයේදී කරුණු ආමන්ත්‍රණය කළ ආකාරය විස්තර කිරීම අවශ්‍ය වේ. ඒ අනුව ප්‍රධාන විගණන කරුණු විස්තර කිරීම මූල්‍ය ප්‍රකාශ වල හෙලිදරව් වී ඇති දේ නැවත පුනරුච්චාරණය කිරීමක් නොවේ. කෙසේ වෙතත්, අදාල ඔනෑම හෙලිදරව් කිරීම් පිළිබඳ යොමුවක් මඟින් මූල්‍ය

[30] ශ්‍රීලංවිප්‍ර 720 (සංශෝධිත), වෙනත් තොරතුරු පිළිබඳ විගණකගේ වගකීම් 12 (අ) සහ අ 1 - අ 3 ඡේද

ප්‍රකාශ පිළියෙල කිරීමේදී කළමනාකරණය විසින් මෙම කරුණ ආමන්ත්‍රණය කර ඇති ආකාරය තව දුරටත් අවබෝධ කර ගැනීමට අපේක්ෂිත පරිශීලකයින්ට හැකිවේ.

අ41 අදාල හෙළිදරව් කිරීම(ම්) වෙත යොමු කිරීමට අමතරව, විගණක විසින් ඒවායේ ප්‍රධාන කරුනු කෙරෙහි අවධානය යොමුකල හැකිය. වර්තමාන කාල පරිච්ඡේදයේ මූල්‍ය ප්‍රකාශ වලට කිසියම් කාරණයක් බලපාන්නේ කෙසේද යන්නට අදාල වූ විශේෂිත අංග හෝ සැධක පිළිබඳව කළමනාකරණය විසින් හෙළිදරව් කරන ලද ප්‍රමාණය විගණනයේදී කරුණු ආමන්ත්‍රණය කල ආකාරය පිළිබඳ නිශ්චිත කරුණු හඳුනාගැනීමට විගණකහට උදව් විය හැකි අතර, එමගින් ප්‍රධාන විගණක කරුණක් වන්නේ ඇයිද යන්න අපේක්ෂිත පරිශීලකයින්ට තේරුම්ගත හැකිය. උදාහරණ ලෙස :

- අස්තිත්ත්වයක් විසින් ඇස්තමේන්තු පිළිබඳ ශක්තිමත් හෙළිදරව් කිරීම් ඇතුලත් කරන විට විගණක විසින් ප්‍රධාන උපකල්පන හෙළිදරව් කිරීම, සිදුවිය හැකි ප්‍රතිඵල පරාසය හෙළිදරව් කිරීම සහ ඇස්තමේන්තුගත අවිනිශ්චිත තාවයෙහි හෝ විවේචනාත්මක ගිණුම්කරණ ඇස්තමේන්තුවල ප්‍රධාන ප්‍රභවයන්ට අදාල වෙනත් ගුණාත්මක සහ ප්‍රමාණාත්මක හෙළිදරව් කිරීම් ආමන්ත්‍රණය කිරීමේ කොටසක් ලෙසින් විගණනයේදී කරුණ වඩාත් වැදගත් වූයේ ඇයිද යන්න සහ විගණනයේදී කරුණ ආමන්ත්‍රණය කල ආකාරය කෙරෙහි විගණක අවධානය යොමුකල හැකිය..
- ශ්‍රීලවිප්‍ර 570 (සංශෝධිත) ට අනුකූලව විගණක විසින් අඛණ්ඩ පැවැත්ම පිළිබඳව අස්තිත්ත්වයේ හැකියාව පිළිබඳ කිසිදු සැකයක් ඇති කරන සිද්ධීන් හෝ තත්ත්වයන් සම්බන්ධ කිසිදු ප්‍රමාණාත්මක අවිනිශ්චිත තාවයක් නොපවතින බවට විගණක නිගමනය කරන විට, ශ්‍රීලවිප්‍ර 570 (සංශෝධිත) යටතේ විගණකගේ වැඩ ප්‍රයත්නයෙන් පැන නගින මෙම නිගමනයට අදාල කරුණු එකක් හෝ කීපයක් ප්‍රධාන විගණන කරුණු බවට විගණක විසින් තීරණය කළ හැකිය. එවැනි තත්ත්වයන් තුල විගණකගේ වාර්තාවේ එවැනි ප්‍රධාන විගණන කරුණු පිළිබඳ විගණකගේ විස්තරයට සැළකිය යුතු මෙහෙයුම් පාඩු, පවතින ණය ගැනීමේ පහසුකම් සහ ණය ප්‍රතිමූල්‍ය කරනයේ හැකියාව වැනි මූල්‍ය ප්‍රකාශ වල හෙළිදරව් වූ සිදුවීම් හෝ කොන්දේසි හෝ ණය ගිවිසුම් වලට අනුකූලව නොවීම සහ ඒ හා සම්බන්ධ අවම කිරීමේ සාධක ඇතුලත් විය හැකිය.[31]

කරුණු විගණනයේ වඩාතම වැදගත් එකක් විය යුතු බවට විගණන සළකා බැලුවේ මන්ද (යොමුව : 13(අ) ඡේදය)

අ42 විගණන වාර්තාවේ ඇති ප්‍රධාන විගණන කරුණු පිළිබඳ විස්තරයෙන් ප්‍රධාන විගණන තීරණයක් ලෙස තීරණය වූයේ මන්ද යන්න පිළිබඳ අවබෝධයක් ලබා දීමට අදහස් කරයි. ඒ අනුව 9-10 ඡේදවල ඇති අවශ්‍යතා සහ ප්‍රධාන විගණන කරුණු තීරණය කිරීමට අදාල අ12 - අ29 ඡේදවල ඇති යෙදුම් ද විගණකගේ වාර්තාවේ එවැනි කරුණු සන්නිවේදනය කළයුතු ආකාරය සළකා බැලීමට විගණකහට උපකාරි වේ. උදාහරණයක් ලෙස, කිසියම් කාරණයකට සැළකිය යුතු විගණක අවධානයක් අවශ්‍ය බවත්, එය විගණනයේදි වඩාත් වැදගත් බවත් විගණක නිගමනය කිරීමට හේතුවූ කරුණු පැහැදිලි කිරීමෙන් අපේක්ෂිත පරිශීලකයින් උනන්දු වීමට ඉඩ ඇත.

අ43 ප්‍රධාන විගණන කරුණක් පිළිබඳ විස්තරයට අපේක්ෂිත පරිශීලකයින් සඳහා වූ තොරතුරු වල අදාලත්වය විගණන විසින් සළකා බැලිය යුතුය. විස්තරය මගින් විගණනය සහ විගණකගේ විනිශ්චයන් පිළිබඳ වඩා හොඳ අවබෝධයක් ලබාගත හැකිද යන්න මෙයට ඇතුලත් විය හැකිය.

අ44 යම් කරුණක් අස්තිත්ත්වයේ නිශ්චිත තත්ත්වයන්ට සෘජුව සම්බන්ධ කිරීම, කාලයක් සමග එවැනි විස්තර ඕනෑවට වඩා ප්‍රමිතිගත වීමට හා අඩු ප්‍රයෝජනවත් බවින් යුතු වීමට ඇති හැකියාව අවම කිරීමට අවම කිරීමට උපකාරි වේ. උදාහරණයක් ලෙස කර්මාන්තයේ තත්ත්වයන් හෝ මූල්‍ය වාර්තාකරණය පාදක කරගත් සංකීර්ණතාවය හේතුවෙන් අස්තිත්ත්ව ගණනාවක් හරහා යම් විශේෂ කර්මාන්තයක ප්‍රධාන විගණන කරුණු ලෙස ඇතැම් කරුණු තීරණය කළ හැකිය. විගණන විසින් මෙම කරුණ වඩාත් වැදගත් එකක් ලෙස සැළකීමට හේතුව විස්තර කිරීමේදී, අපේක්ෂිත පරිශීලකයින් සඳහා විස්තරය වඩාත් අදාල කර ගැනීම සඳහා (උදා : වත්මන් කාල පරිච්ඡේදයේ මූල්‍ය ප්‍රකාශවල ඇති විනිශ්චයන්ට බලපාන පාදක වූ තත්ත්වයන්) අස්තිත්ත්වයට විශේෂිත වූ කරුණු ඉස්මතු කිරීම විගණකවරයාට ප්‍රයෝජනවත් විය හැකිය. කාලානුරූපව පුනරාවර්තනය වන ප්‍රධාන විගණන කරුණක් විස්තර කිරීමේදී ද මෙය වැදගත් විය හැකිය.

අ45 විගණනයේ තත්ත්වයන් තුල, කරුණු වඩාත්ම වැදගත් එකක් ලෙස තීරණය කිරීම සඳහා විගණක විසින් මෙහෙයවන ලද ප්‍රධාන කරුණු පිළිබඳව විස්තර යොමුවක් මගින් ද සඳහන් කළ හැකිය. උදාහරණ ලෙස :

---

[31] ශ්‍රීලංවිප්‍ර 570 (සංශෝධිත), අ 3 ඡේදය බලන්න.

- විගණක සාක්ෂි ලබා ගැනීමට විගණකහට ඇති හැකියාව කෙරෙහි බලපාන ආර්ථික තත්ත්වයන්, උදාහරණයක් ලෙස, ඇතැම් මූල්‍ය උපකරණ සඳහා වූ අද්‍රවශීලතාවයෙන් යුත් වෙළෙඳපල,
- නව හෝ නැගී එන ගිණුම්කරණ ප්‍රතිපත්ති, උදාහරණයක් ලෙස, සමාගම තුල කාර්යයේ නියුතු කණ්ඩායම විසින් උපදේශනය කල අස්තිත්ත්වයට - විශේෂිත වූ හෝ කර්මාන්තයට - විශේෂිත වූ කරුණු,

- මූල්‍ය ප්‍රකාශ කෙරෙහි ප්‍රමාණාත්මක බලපෑමක් ඇතිකල අස්තිත්ත්වයේ උපාය මාර්ගයේ හෝ ව්‍යාපාර ආකෘතියේ වෙනස්වීම්.

විගණනයේදී කරුණ ආමන්ත්‍රණය කළ ආකාරය (යොමුවඃ 13(ආ) ඡේදය.

අ46 විගණනයේදී ප්‍රධාන විගණන කරුණක් ආමන්ත්‍රණය කල ආකාරය විස්තර කිරීම සඳහා විගණන වාර්තාවේ ලබාදිය යුතු විස්තර ප්‍රමාණය වෘත්තීය විනිශ්චය පිළිබඳ කාරණයකි. 13 (ආ) ඡේදයට අනුකූලව විගණක විසින් මෙලෙස විස්තර කළ හැකිය.

- කරුණකට වඩාත්ම අදාල වූ හෝ ප්‍රමාණාත්මක අවප්‍රකාශ වීමේ තක්සේරු අවදානමට විශේෂිත වූ විගණකගේ ප්‍රතිචාරයේ හෝ ප්‍රවේශයේ අංග;
- සිදුකරන ලද ක්‍රියා පටිපාටි පිළිබඳ කෙටි දළ විශ්ලේෂණයක් ;
- විගණකගේ ක්‍රියා පටිපාටිවල ප්‍රතිඵල පිළිබඳ ඇඟවීමක් ; හෝ
- කරුණ පිළිබඳ ප්‍රධාන නිරීක්ෂණ හෝ

මෙම මූලිකාංගයන් ගේ යම් සංයෝජනයක්.

නීතිය හෝ නියාමනය හෝ ශ්‍රී ලංකා විගණන ප්‍රමිති මගින් ප්‍රධාන විගණන කරුණක් විස්තර කිරීම සඳහා නිශ්චිත ආකාරයක් හෝ අන්තර්ගතයක් නියම කල හැකිය, නැතහොත් මෙම මූලිකාංග එකක් හෝ කිහිපයක් ඇතුලත් කිරීමට නියම කළ හැකිය.

අ47 සමස්තයක් ලෙස, අපේක්ෂිත පරිශීලකයින්හට මූල්‍ය ප්‍රකාශ විගණනයේ සන්දර්භය තුල ප්‍රධාන විගණන කරුණක වැදගත්කම මෙන්ම විගණන මතය ඇතුළුව ප්‍රධාන විගණන කරුණු සහ විගණන වාර්තාවේ අනෙකුත් මූලිකාංග අතර ඇති සම්බන්ධතාවය අවබෝධ කර ගැනීම සඳහා ප්‍රධාන විගණන කරුණක් විස්තර කිරීමේදී භාෂාව භාවිතා කිරීම පිළිබඳව සැළකිලිමත් වීම අවශ්‍ය විය හැකිය ඃ

- මූල්‍ය ප්‍රකාශ පිළිබඳ මතය සකස් කිරීමේදී විගණක විසින් කරුණු නිසි පරිදි විසඳා නොමැති බව හඟවන්නේ නැත,
- සුචක හෝ ප්‍රමිතිගත භාෂාවෙන් වැළකී සිටීමත් කරුණ සෘජුවම අස්තිත්ත්වයේ අස්තිත්ත්වයේ නිශ්චිත තත්ත්වයන්ට සම්බන්ධ කරයි,
- මූල්‍ය ප්‍රකාශවල අදාල හෙළිදරව් කිරීම(ම්) ඇත්නම්, තුල කරුණ ආමන්ත්‍රණය කරන්නේ කෙසේද යන්න සැළකිල්ලට ගනී,
- මූල්‍ය ප්‍රකාශවල වෙනමම මූලිකාංගයන් පිළිබඳ වෙන්වූ මතයන් හැඟවෙන්නේ නැත.

අ48 විශේෂයෙන් විගණන ප්‍රවේශයට අස්තිත්ත්වයේ සිද්ධීන් හා තත්ත්වයන්ට සැළකිය යුතු ලෙස හැඩ ගැන්වීමට අවශ්‍යවූ විට, විගණකගේ ප්‍රතිචාරයේ හෝ කරුණකට ප්‍රවේශවීමේ අංග විස්තර කිරීමෙන්, ප්‍රමාණාත්මක අවප්‍රකාශවීමේ අවදානම විසඳීම සඳහා අවශ්‍ය අසාමාන්‍ය තත්ත්වයන් සහ සැළකිය යුතු විගණන විනිශ්චයන් අවබෝධ කර ගැනීමට අපේක්ෂිත පරිශීලකයින්හට සහාය විය හැකිය. මීට අමතරව, යම් කාල පරිච්ඡේදයක විගණන ප්‍රවේශය කෙරෙහි, අස්තිත්ත්වයන්ට - විශේෂිත වූ තත්ත්වයන්, ආර්ථික කොන්දේසි, හෝ කර්මාන්ත සංවර්ධනයන් බලපෑම් ඇතිකල හැකිය. කරුණ සම්බන්ධයෙන් පාලනය භාරව සිටින අය සමග වූ සන්නිවේදනයේ ස්වභාවය හා ප්‍රමාණය පිළිබඳව සඳහන් කිරීම විගණකහට ද ප්‍රයෝජනවත් විය හැකිය.

අ49 උදාහරණයක් ලෙස, සංකීර්ණ මූල්‍ය උපකරණ තක්සේරු කිරීම වැනි ඉහළ තක්සේරු කරන අවිනිශ්චිතතාවයක් ඇති බවට හඳුනාගෙන ඇති ගිණුම්කරණ ඇස්තමේන්තුවක් සඳහා විගණකගේ ප්‍රවේශය විස්තර කිරීමේදී විගණක විශේෂඥයකු සේවයේ යොදවාගෙන තිබූ බව හෝ කාර්යයෙහි නියුක්ත කොට තිබූ බව මතුකර දැක්වීමට විගණක කැමති විය හැකිය. විගණක විශේෂඥයකුගේ භාවිතය පිළිබඳ එවැනි යොමුවකින් මූල්‍ය

ප්‍රකාශ පිළිබඳ මතය සඳහා වන විගණකගේ වගකීම අඩු නොකරන අතර, එබැවින් ශ්‍රීලවිප්‍ර 620හි 14 - 15 ඡේද සමග අසංගත නොවේ.[32]

අ50 විශේෂයෙන්, විගණනයේ සංකීර්ණ, විනිශ්චය කරන අංශ වල විගණනයේ ක්‍රියා පටිපාටි විස්තර කිරීමේදී අභියෝග තිබිය හැකිය. ප්‍රමාණාත්මක අව ප්‍රකාශවීමේ අවදානම තක්සේරු කිරීමට වූ විගණකගේ ප්‍රතිචාරයේ ස්වභාවය සහ ප්‍රමාණය ප්‍රමාණවත් ලෙස සන්නිවේදනය කිරීම සහ සැළකිය යුතු විගණන විනිශ්චයන් සම්බන්ධව සිදුකරන ක්‍රියා පටිපාටි සංක්ෂිප්තව සාරාංශ කිරීම දුෂ්කර විය හැකිය. එසේ වුවද, විගණනයේදී කාරණය ආමන්ත්‍රණය කල ආකාරය සන්නිවේදනය කිරීම සඳහා අනුගමනය කරන ලද ඇතැම් ක්‍රියා පටිපාටි විස්තර කිරීම අවශ්‍ය බව විගණක විසින් සළකා බැලිය හැකිය. එවැනි විස්තරයක් ක්‍රියා පටිපාටි පිළිබඳ සවිස්තරාත්මක විස්තරයක් ඇතුලත් කරනවාට වඩා සාමාන්‍යයෙන් ඉහළ මට්ටමක තිබිය හැකිය.

අ51 අ46 ඡේදයේ සඳහන් කර ඇති පරිදි විගණකගේ වාර්තාවේ ඇති ප්‍රධාන විගණන පිළිබඳ විස්තරයේ විගණකගේ ප්‍රතිචාරයේ ප්‍රතිඵල පිළිබඳ විග්‍රහයක්ද විගණක විසින් සැපයිය හැකිය. කෙසේ වෙතත්, මෙය සිදු කරන්නේ නම්, විස්තරය තනි ප්‍රධාන විගණන කරුණක් සම්බන්ධයෙන් වෙනම මතයක් ඉදිරිපත් කරයි යන හැඟීම වළක්වා ගැනීමට විගණක විසින් සැළකිලිමත් විය යුතු වීම හෝ සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශ පිළිබඳ විගණකගේ මතය ඕනෑම ආකාරයකින් ප්‍රශ්න කළ හැකිය.

*ප්‍රධාන විගණන කරුණක් ලෙස කරුණක් ලෙස තීරණය කරන ලද කරුණක් විගණන වාර්තාවේ සන්නිවේදනය නොකරන තත්ත්වයන් (යොමුව : 14 ඡේදය)*

අ52 ප්‍රධාන විගණන කරුණක් ලෙස තීරණය කරනු ලබන නිශ්චිත කාරණයක් පිළිබඳව කළමනාකරණය හෝ විගණක විසින් ප්‍රසිද්ධියේ හෙළිදරව් කිරීම නීතියෙන් හෝ නියාමනයෙන් වළක්වා ගත හැකිය. නීතියක් හෝ රෙගුලාසියක් මගින් සත්‍ය හෝ සැක සහිත නීති විරෝධී ක්‍රියාවක් සම්බන්ධයෙන් යෝග්‍ය අධිකාරියක් විසින් සිදුකරන ලද පරික්ෂණයකට අගතියක් විය හැකි ඕනෑම පොදුජන සන්නිවේදනයක් විශේෂයෙන් තහනම් කළ හැකිය. (උදා : මූල්‍ය විශුද්ධිකරණයට සම්බන්ධ හෝ සම්බන්ධබව පෙනෙන කරුණු)

අ53 14(ආ) ඡේදයේ දැක්වෙන පරිදි, ප්‍රධාන විගණන කරුණක් ලෙස තීරණය වන කරුණක් විගණක වාර්තාවේ සන්නිවේදනය නොකළයුතු විට අතිශයින් දුර්ලභ වනු ඇත. මෙයට හේතුව අපේක්ෂිත පරිශීලකයින් සඳහා විගණනය පිළිබඳ වැනි විනිවිද භාවයක් ලබා දීමෙන් පොදුජන යහපත සඳහා ප්‍රතිලාභයක් වනු ඇතැයි අනුමාන කිරීමයි. ඒ අනුව, ප්‍රධාන විගණන කාරණයක් සන්නිවේදනය නොකිරීමේ විනිශ්චය යෝග්‍ය වන්නේ අස්තිත්ත්වයට හෝ පොදු ජනතාවයට අහිතකර ප්‍රති විපාක ඇතිවන විට හෝ එවැනි සන්නිවේදනයේ ප්‍රතිඵලයක් ලෙස ඒවා ඉතා වැදගත් ලෙස සළකනු ලබන අතර, කරුණ පිළිබඳව සන්නිවේදනය කිරීමෙන් ලැබෙන පොදුජන යහපතට වඩා වැදගත් කමින් වැඩිදෙයක් ඔවුන් සාධාරණ ලෙස අපේක්ෂා කරන අවස්ථාවන්හිදී පමණි.

අ54 ප්‍රධාන විගණන කරුණක් සන්නිවේදනය නොකිරීමේ අධිෂ්ඨානය ගැනීමේදී කරුණට අදාල සිද්ධි සහ තත්ත්වයන් සැළකිල්ලට ගනී. කළමනාකරණය සහ පාලනය භාරව සිටින අය සමග සන්නිවේදනයෙන් යම් කරුණක් පිළිබඳ සන්නිවේදනයේ ප්‍රතිඵලයක් ලෙස ඇතිවිය හැකි අහිතකර ප්‍රතිවිපාකවල වැදගත්කම පිළිබඳව වන කළමනාකරණ අදහස් අවබෝධ කර ගැනීමට විගණකට උදව් වේ. විශේෂයෙන් කරුණ සන්නිවේදනය කරන්නේද යන්න තීරණය කිරීමේදී විගණකගේ තීන්දුව දැනුම් දීමට කළමනාකරනය නැවත පාලනය භාරව සිටින අය සමග වන සන්නිවේදනය උපාකාරී වීම්:

- අස්තිත්ත්වය විසින් කාරණය ප්‍රසිද්ධියේ හෙළිදරව් නොකිරීමට හේතුව (උදා : නීතිය, නියාමනය හෝ ඇතැම් මූල්‍ය වාර්තාකරණ ආකෘතිමය රාමු ප්‍රමාද වී කරුණ හෙළිදරව් කිරීමට හෝ හෙළිදරව් නොකිරීමට අවසර දෙන්නේ නම්) සහ හෙළිදරව් කිරීමේ අහිතකර ප්‍රතිවිපාක ගැන කළමනාකරණයේ අදහස් පිළිබඳ අවබෝධ විගණකහට සහාය වේ.(උදා :අහිතකර ප්‍රතිවිපාක සළකා බැලීමට අදාල විය හැකි නීතිය හෝ නියාමනය හෝ වෙනත් බලය ලත් ප්‍රභවයන් කෙරෙහි කළමනාකරණය අවධානය යොමුකළ හැකිය. එවැනි අංග මගින් අස්තිත්ත්වයේ වාණිජ සාකච්ඡා හෝ තරගකාරි තත්ත්වයට හානි සිදුවිය හැකිය.) කෙසේ වෙතත්, 14 (ආ) ඡේදයට අනුකූලව අහිතකර ප්‍රතිවිපාක පිළිබඳ කළමනාකරණයේ අදහස් පමණක් සැහැල්ලු වට නොගෙන සන්නිවේදනයෙන් පොදුජන යහපතට වඩා අහිතකර ප්‍රතිවිපාක වැඩිවන්නේද යන්න විගණක විසින් තීරණය කිරීම සාධාරණ ලෙස අපේක්ෂා කෙරේ,

[32] ශ්‍රීලංවිප්‍ර 620, විගණකවරයාගේ විශේෂඥවරයෙකුගේ වැඩ ප්‍රයෝජනයට ගැනීම

- මෙම කරුණ, සම්බන්ධයෙන් අදාල නියාමනය, බලාත්මක කිරීම් හෝ අධික්ෂණ බලධාරීන් සමග කිසියම් සන්නිවේදනයක් සිදුවී තිබේද යන්න. විශේෂයෙන් එවැනි කරුණු ප්‍රසිද්ධියේ හෙලිදරව් කිරීම නුසුදුසු වන්නේ මන්ද යන්න පිළිබඳ කළමනාකරණයේ සැදැහුමට සහාය දැක්විය හැකිද යන්න ඉස්මතු කිරීම.

- සුදුසු අවස්ථාවන්හිදී කරුණ පිළිබඳව අදාල තොරතුරු ප්‍රසිද්ධියේ හෙලිදරව් කිරීම සඳහා කළමනාකරණය සහ පාලනය භාරව සිටින අය දිරිමත් කිරීමට විගණකහට හැකිවීම විශේෂයෙන් කළමනාකරණයේ සහ පාලනය භාරව සිටින අයගේ සැලකිලිමත්වීම් සන්නිවේදනය පිළිබඳ කරුණෙහි විශේෂිත අංගවලට පමණක් සීමාවන්නේ නම්, එනම් කරුණ පිළිබඳ ඇතැම් තොරතුරු අඩු සංවේදීතාවයෙන් යුක්ත විය හැකි වීමෙන් සන්නිවේදනය කළහැකි නිසා මෙය සිදුකළ හැකිය.

එවැනි සන්නිවේදනයක ප්‍රතිඵලයක් ලෙස ඇතිවිය හැකි අහිතකර ප්‍රතිවිපාකවල වැදගත් කම පිළිබඳව කළමනාකරණයේ දැක්ම ඇතුළුව, කරුණ පිළිබඳව ප්‍රසිද්ධියේ හෙලිදරව් කිරීම නුසුදුසු වන්නේ මන්දයන්න පිළිබඳව කළමනාකරණයෙන් ලිඛිත නියෝජනයක් ලබා ගැනීම අවශ්‍ය බව විගණක විසින් සළකා බැලිය හැකිය.

අ55 අදාල ආචාර ධර්ම අවශ්‍යතා සැළකිල්ලට ගනිමින් ප්‍රධාන විගණන කරුණක් ලෙසට තීරණය කර ඇති කරුණක් පිළිබඳව සන්නිවේදනය කිරීමේ සැඟවීම් සළකා බැලීමට විගණකහට අවශ්‍යවිය හැකිය. මෙයට අමතරව, විගණන වාර්තාවේ කරුණ සම්බන්ධයෙන් අදාල නියාමන බලාත්මක කිරීමේ හෝ අධීක්ෂණ බලධාරීන් සමග සන්නිවේදනය කිරීමට විගණකහට නීතියෙන් හෝ නියාමනය මගින් අවශ්‍ය විය හැකිය. කරුණ සන්නිවේදනය කිරීමෙන් ඇතිවිය හැකි අහිතකර ප්‍රතිවිපාක විගණකගේ අවධානයට ලක්කිරීමටද එවැනි සන්නිවේදනය ප්‍රයෝජනවත් විය හැකිය.

අ56 කරුණක් සන්නිවේදනය නොකිරීමට ගත් තීරණය සම්බන්ධ යෙන් විගණක විසින් සළකා බලන ලද කරුණු සංකීර්ණ වන අතර, සැළකිය යුතු විගණන විනිශ්චයක්ද ඊට ඇතුලත්වේ. ඒ අනුව නීති උපදෙස් ලබාගැනීම සුදුසු යැයි විගණක සිතිය හැකිය.

*වෙනත් තත්ත්වයන් තුල ඇති ප්‍රධාන විගණන කරුණු කොටසෙහි ආකෘතිය සහ අන්තර්ගතය (යොමුව : 16 ඡේදය)*

අ57 16 වන ඡේදයේ අවශ්‍යතාවය අවස්ථා තුනකට අදාලවේ :

(අ) 10 වන ඡේදයට අනුකූලව ප්‍රධාන විගණන කරුණු නොමැති බවට විගණක විසින් තීරණය කරනු ලැබේ. (අ 59 ඡේදය බලන්න.),

(ආ) 14වන ඡේදයට අනුකූලව විගණන වාර්තාවෙහි ප්‍රධාන විගණන කරුණක් සන්නිවේදනය නොවන අතර, වෙනත් කරුණු ප්‍රධාන විගණන කරුණු ලෙස තීරණය කර නොමැති බවට විගණක විසින් තීරණය කරනු ලැබේ,

(ඇ) ප්‍රධාන විගණන කරුණු ලෙස තීරණය වන එකම කරුණු 15 වන ඡේදයට අනුකූලව සන්නිවේදනය කෙරෙන කරුණු වේ.

අ58 සන්නිවේදනය සඳහා ප්‍රධාන විගණන කරුණු නොමැති බවට විගණක විසින් තීරණය කර ඇත්නම්, විගණන වාර්තාවේ ඉදිරිපත් කිරීම පහත දැක්වෙන් පරිදි වේ :

**ප්‍රධාන විගණන කරුණු**

[කොන්දේසි සහිත (අහිතකර) මතය කොටසෙහි විස්තර කර ඇති කරුණ හැර හෝ අඛන්ඩ පැවැත්මට අදාල කොටසෙහි වූ ප්‍රමාණාත්මක අවිනිශ්චිතභාවය] අපගේ වාර්තාවෙහි සන්නිවේදනය කිරීම සඳහා (වෙනත්) ප්‍රධාන විගණන කරුණු නොමැති බවට අපි තීරණය කර ඇත්තේමු.

අ59 ප්‍රධාන විගණන කරුණු තීරණය කිරීම සඳහා සැළකිය යුතු විගණක අවධානයෙන් අවශ්‍ය වන කරුණුවල සාපේක්ෂ වැදගත්කම් පිළිබඳව විනිශ්චයක් කිරීම ඇතුලත් වේ. එබැවින්, ලැයිස්තුගත අස්තිත්ත්වයක පොදු අරමුණු සඳහා වන මූල්‍ය ප්‍රකාශ සම්පූර්ණ කට්ටලයක විගණක විසින් විගණන වාර්තාවේ සන්නිවේදනය කිරීම සඳහා පාලනය භාරව සිටින අය සමග සන්නිවේදනය කරන ලද කරුණුවලින් අවම වශයෙන් එක් ප්‍රධාන විගණන කරුණක්වත් තීරණය නොකරනුයේ කලාතුරකිනි : කෙසේ වෙතත්, ඇතැම් සීමිත අවස්ථාවන්හිදී (උදා : ඉතා සීමිත මෙහෙයුම් ඇති ලැයිස්තු ගත අස්තිත්ත්වයක් සඳහා) 10 වන ඡේදයට අනුකූලව ප්‍රධාන විගණන කරුණු නොමැති බවට විගණක විසින් තීරණය කළ හැක්කේ සැළකිය යුතු විගණක අවධානයක් අවශ්‍ය වන කරුණු නොමැති නිසාය.

**පාලනය භාරව සිටින අය සමග සන්නිවේදනය.** (යොමුව : 17 ඡේදය)

අ60 ශ්‍රීලවිප්‍ර 260 (සංශෝධිත) ට අනුව කාලෝචිත පදනමක් මත විගණක විසින් පාලනය භාරව සිටින අය සමග සන්නිවේදනය කිරීම අවශ්‍යවේ.[33] ප්‍රධාන විගණන කරුණු පිළිබඳ සන්නිවේදනය සඳහා යෝග්‍ය වේලාව කාර්ය භාරයේ තත්ත්වයන් අනුව වෙනස් වේ. කෙසේ වෙතත්, විගණනයේ සැලසුම්ගත විෂයය පථය හා කාලය සාකච්ඡා කිරීමේදී විගණකහට ප්‍රධාන විගණන කරුණු පිළිබඳ මූලික අදහස් සන්නිවේදනය කළහැකි අතර, විගණන සොයා ගැනීම් පිළිබඳව සන්නිවේදනය කිරීමේදී එවැනි කරුණු තව දුරටත් සාකච්ඡා කළහැකිය.එසේ කිරීමෙන් මූල්‍ය ප්‍රකාශ නිකුත් කිරීම සඳහා සමාප්ත කරන අවස්ථාවේ ප්‍රධාන විගණන කරුණු පිළිබඳව ශක්තිමත් ද්වි - මාර්ග සංවාදයක් පැවැත්වීමට උත්සාහ කිරීමේ අභියෝග සමනය කිරීමට උපකාරිවේ.

අ61 විගණන වාර්තාවෙහි සන්නිවේදනය කිරීමට විගණක අදහස් කරන ප්‍රධාන විගණන කරුණු පිළිබඳව පාලනය භාරව සිටින අය දැනුවත් කිරීමට සන්නිවේදනය කිරීම අවශ්‍ය වන අතර, අවශ්‍ය අවස්ථා වලදී වැඩිදුර පැහැදිලි කිරීම් ලබා ගැනීමට ඔවුන්ට අවස්ථාව ලබා දෙයි. මෙම සාකච්ඡාවට පහසුකම් සැලසීම සඳහා විගණකගේ වාර්තාවෙහි කෙටුම්පතක් පාලනය භාරව සිටින අයට ලබාදීම ප්‍රයෝජනවත් යැයි විගණක සළකනු ඇත. පාලනය භාරව සිටින අය සමග සන්නිවේදනයෙන් මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය අධීක්ෂණය කිරීමේදී ඔවුන්ගේ කාර්ය භාරයේ වැදගත්කම සහ ප්‍රධාන විගණන කරුණු සම්බන්ධයෙන් විගණකගේ තීරණ සඳහා වූ පදනම අවබෝධ කර ගැනීමට පාලනය භාරව සිටින අයට අවස්ථා ලබාදීම සහ විගණන වාර්තාවේ මෙම කරුණු විස්තර කරන්නේ කෙසේද යන්න හඳුනාගනී. එමගින් විගණන වාර්තාවේ මෙම කරුණු සන්නිවේදනය කරනු ඇතැයි යන කාරණය සැලකිල්ලට ගෙන නව හෝ වැඩිදියුණු කරන ලද හෙළිදරව් කිරීම් ප්‍රයෝජනවත් වේද යන්න සළකා බැලීමට පාලනය භාරව සිටින අයට හැකියාවක් ද එමගින් ලබාදේ.

අ61 17(අ)ඡේදය මගින් පාලනය භාරව සිටින අය සමග ප්‍රධාන විගණන කරුණක් ලෙස තීරණය වන කාරණයක් විගණන වාර්තාවේ සන්නිවේදනය නොකෙරෙන අතිශයින් දුර්ලභ තත්ත්වයන් සන්නිවේදනය කිරීම ද ආමන්ත්‍රණය කරයි. (14 සහ අ 54 ඡේද බලන්න)

අ63 17 (ආ) ඡේදයේ අවශ්‍යතාවය පරිදි පාලනය භාරව සිටින අය සමග සන්නිවේදනය කිරීමට විගණන වාර්තාවේ සන්නිවේදනය සඳහා ප්‍රධාන විගණන කරුණු නොමැති බවට විගණක විසින් තීරණය කළ විට විගණනයට හුරු පුරුදු වෙනත් අය සමග ඇතිවිය හැකි වැදගත් කරුණු පිළිබඳව වැඩිදුර සාකච්ඡා කිරීමට විගණකට අවස්ථාවක් ලබාගත හැකිය. (එක් අයෙකු පත්කර ඇති තැන, කාර්යයේ නිරතවීමේ තත්ත්ව පාලන සමාලෝචන ඇතුළුව) මෙම සාකච්ඡා විගණක හට ප්‍රධාන විගණන කරුණු නොමැති බවට වූ විගණකගේ අධිෂ්ඨානය නැවත ඇගයීමට හේතුවිය හැකිය.

**ලේඛනගත කිරීම** (යොමුව : 18 ඡේදය)

අ64 ශ්‍රීලවිප්‍ර 230 හි 8 වන ඡේදය පරිදි විගණනය සමග පූර්ව සම්බන්ධයක් නොමැති පලපුරුදු විගණකවරයෙකු හට වෙනත් දේ අතර සැළකිය යුතු වෘත්තීය විනිශ්චයන් අවබෝධ කර ගැනීමට ප්‍රමාණවත් විගණන ලේඛන විගණක විසින් සකස් කිරීම අවශ්‍ය වේ. ප්‍රධාන විගණන කරුණු සන්දර්භය තුල, මෙම වෘත්තීය තුල මෙම වෘත්තීය විනිශ්චයන් අතරට අධිෂ්ඨානය, පාලනය භාරව සිටින අය සමග සන්නිවේදනය කල කරුණුවලින් සැළකිය යුතු විගණක අවධානයක් අවශ්‍යවූ කරුණු, එම එක් එක් කාරණා ප්‍රධාන විගණන කරුණක් ද නැද්ද යන්න ඇතුලත් වේ. මේ සම්බන්ධයෙන් විගණකගේ විනිශ්චයන් සඳහා සහායක් වන්නේ පාලනය භාරව සිටින අය සමග විගණකගේ සන්නිවේදනය පිළිබඳ ලේඛනගත කිරීම් සහ එක් එක් කරුණට අදාල විගණන ලියකියවිලි මෙන්ම (අ39 ඡේදය බලන්න) විගණනය තුලදී පැන නගින වැදගත් කරුණු පිළිබඳ වෙනත් විගණන ලියකියවිලි වේ. (උදා : සම්පූර්ණ කල සිහිවීම් සටහන්) කෙසේ වෙතත්, මෙම ශ්‍රීලවිප්‍ර ට අනුව විගණක විසින් පාලනය භාරව සිටින අය සමග විගණක අවධානය යොමු කල යුතු කරුණු නොවන වෙනත් කරුණු සන්නිවේදනය කලේ මක්නිසාද යන්න ලේඛනගත කිරීම අවශ්‍ය නොවේ.

---

[33] ශ්‍රීලංවිප්‍ර 260 (සංශෝධිත), 21 ඡේදය බලන්න.

# ශ්‍රී ලංකා විගණන ප්‍රමිත 705 (සංශෝධිත)

## ස්වාධීන විගණකගේ වාර්තාවේ මතයට විකරණය කිරීම්

(2018 මාර්තු 31 වැනි දින හෝ ඊට පසුව අවසන්වන කාලපරිච්ඡේදවල මූල්‍ය ප්‍රකාශ විගණනය සඳහා බලපැවැත් වේ.)

**පටුන**

*ඡේද*

**හැඳින්වීම**

මෙම ශ්‍රී.ල.වි.ප්‍ර.යේ විෂයය පථය …………………………………………………………………… 1

විකරණය කරන ලද මතයන් වර්ග ……………………………………………………...…… 2

බලපැවැත්වෙන දිනය……………………………………...…………………………..… 3

**අරමුණ** ………………………………………………………………………………. 4

**නිර්වචනයන්** ……………………………………………………………………………… 5

**අවශ්‍යතා**

විගණකගේ මතයට විකරණයක් අවශ්‍ය වන තත්ත්වයන්………………….……..……………... 6

විගණකගේ මතයට කළයුතු විකරණයේ වර්ගය නිර්ණය කිරීම ……………………..……..………. 7–15

මතය විකරණය කළවිට විගණකගේ වාර්තාවේ ස්වරූපය සහ අන්තර්ගතය 16–29

පාලනය පිළිබඳ වගකිව යුතු අය සමග සන්නිවේදනය……………………………..……......... 30

භාවිත කිරීමේ සහ පැහැදිලි කිරීමේ වෙනත් කරුණු

විකරණය කරන ලද මතවල වර්ගයන්…………………………………………………………… අ1

විගණකගේ මතයට විකරණයක් අවශ්‍ය වන තත්ත්වයන්

………………………………………………………………..…………………………… අ2–අ12

විගණකගේ මතයට කළයුතු විකරණයේ වර්ගය නිර්ණය කිරීම ………………...…………….. අ13–අ16

මතය විකරණය කළවිට විගණකගේ වාර්තාවේ ස්වරූපය

සහ අන්තර්ගතය ………………………..…………………………………………….…….. අ17–අ26

පාලනය පිළිබඳ වගකිව යුතු අය සමග සන්නිවේදනය ……………………………..………… අ27

*පරිශිෂ්ටය* : මතයට විකරණයන් කළ විගණන වාර්තා සඳහා නිදර්ශන

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති (ශ්‍රී.ල.වි.ප්‍ර.) 705 (සංශෝධිත) *ස්වාධීන විගණකගේ වාර්තාවේ මතයට විකරණය කිරීම්*, ශ්‍රී.ල.වි.ප්‍ර.200 *ස්වාධීන විගණකගේ සමස්ථ අරමුණු සහ ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයක් සිදුකිරීමෙහි* පද සම්බන්ධය සහිතව කියවිය යුතුය.

## හැඳින්වීම

### මෙම ශ්‍රී.ල.වි.ප්‍ර.යේ විෂයය පථය

1. මූල්‍ය ප්‍රකාශන මත විගණකගේ මතය විකරණය කිරීම අවශ්‍යයයි විගණක නිගමනය කළවිට, ශ්‍රී.ල.වි.ප්‍ර. 700 (සංශෝධිත),[1] අනුව මතයක් සකස් කිරීමේදී තත්ත්වයන්ට යෝග්‍ය වාර්තාවක් නිකුත් කරන විට විගණකගේ වගකීම මෙම ශ්‍රී ලංකා විගණන ප්‍රමිතය (ශ්‍රී.ල.වි.ප්‍ර.) කටයුතු කෙරේ. විගණක විකරණය කළ මතයක් ප්‍රකාශ කරන විට, එම සකස් කිරීම සහ අන්තර්ගතය විගණකගේ වාර්තාවට බලපාන්නේ කෙසේදැයි එලෙසම මෙම ශ්‍රී.ල.වි.ප්‍ර කටයුතු කෙරේ. සියළු අවස්ථාවනහිදී ශ්‍රී.ල.වි.ප්‍ර 700 (සංශෝධිත) හි වාර්තා කිරීමේ අවශ්‍යතාවයන් ව්‍යවහාර කරන අතර මෙම ශ්‍රී.ල.වි.ප්‍ර අවශ්‍යතාවයන් මගින් ඒවා ප්‍රකාශිතව ආමන්ත්‍රණය කරන්නේ හෝ සංශෝධනය කරන්නේ නම් හැර මෙම ශ්‍රී.ල.වි.ප්‍ර නැවත නැවත සිදු නොවේ.

### විකරණය කරන ලද මතයන් වර්ග

2. මෙම ශ්‍රී.ල.වි.ප්‍ර. වර්ග තුනක විකරණය කරන ලද මත ස්ථාපනය කරනු ලබයි. ඒවා නම් වශයෙන් ගත්කල කොන්දේසි සහිත මතය, අහිතකර මතය සහ මතය වියාචනය කිරීම වේ. කුමන වර්ගයේ විකරණය කළ මතය යෝග්‍ය ද යන අදාළ තීරණය රඳා පවත්නේ

(අ) විකරණය සඳහා හේතුවන කාරණාවේ ස්වභාවය, එනම් මූල්‍ය ප්‍රකාශ ප්‍රමාණාත්මක ලෙස අවප්‍රකාශනය වී ඇත්ද, හෝ ප්‍රමාණවත් යෝග්‍ය විගණන සාක්ෂි ලබාගැනීමට අපොහොසත් වූ අවස්ථාවක ප්‍රමාණාත්මක අවප්‍රකාශනයක් වී ඇත්ද , සහ

(ආ) මූල්‍ය ප්‍රකාශ මත කරුණේ බලපෑම් හෝ සිදුවිය හැකි බලපෑම් පිළිබඳව පෘථුලභාවය පිළිබඳ විගණකගේ විනිශ්චය. (යොමුව : අ1 ඡේදය)

### බලපැවැත්වෙන දිනය

03. මෙම ශ්‍රී.ල.වි.ප්‍ර. , 2018 මාර්තු 31 දින සිට හෝ ඉන්පසුව අවසන් වන කාලපරිච්ඡේදවල මූල්‍ය ප්‍රකාශ විගණන සඳහා බලපැවැත් වේ.

### අරමුණ

04. විගණකගේ අරමුණ වන්නේ මූල්‍ය ප්‍රකාශ මත යෝග්‍ය ලෙස විකරණය කරන ලද මතයක් පහත දෑ ඇතිවිට පැහැදිලිව ප්‍රකාශ කිරීමයි.

(අ) ලබාගත් විගණන සාක්ෂි පදනම් කර මූල්‍ය ප්‍රකාශ සමස්ථයක් වශයෙන් ගත්කල අවප්‍රකාශවලින් තොර නොවන බව විගණක තීරණය කිරීම; හෝ

(ආ) මූල්‍ය ප්‍රකාශන සමස්ථයක් වශයෙන් ගත්කල ප්‍රමාණාත්මක අවප්‍රකාශවලින් තොරයැයි නිගමනය කිරීමට ප්‍රමාණවත් යෝග්‍ය විගණන සාක්ෂි විගණකට ලබාගැනීමට නොහැකි වීම.

### නිර්වචනයන්

05. මෙම ශ්‍රී ලංකා විගණන ප්‍රමිතියේ අරමුණු සඳහා පහත දක්වෙන පදවල අර්ථයන් පහත ආරෝපිත වේ:

(අ) පෘතුල – පෘතුල අවප්‍රකාශයන්ගෙන් මූල්‍ය ප්‍රකාශ මත වන බලපෑම් හෝ අවප්‍රකාශයන්ගෙන් මූල්‍ය ප්‍රකාශනවලට වියහැකි බලපෑම්, ප්‍රමාණවත් යෝග්‍ය විගණන සාක්ෂි ලබාගැනීමට නොහැකිවීමේ හේතුව නිසා අනාවරණය කර ගැනීමට නොහැකිවූ කිසිවක් වෙතොත් ඒ පිළිබඳව අවප්‍රකාශන සම්බන්ධයෙන් විස්තර කිරීමට යොදා ගන්නා පදයකි. විගණනයේ විනිශ්චය අනුව මූල්‍ය ප්‍රකාශන මත පෘතුල බලපෑම් වන ඒවා වනුයේ;

(i) මූල්‍ය ප්‍රකාශයන්හි නිශ්චිත මූලිකාංගයකට, ගිණුම්වලට හෝ අයිතම වලට සීමා නොවේ;

(ii) එසේ සීමා නොවේ නම් මූල්‍ය ප්‍රකාශනවල සැලකිය යුතු අන්දමේ සමානුපාතිකමය නියෝජනයවීම හෝ නියෝජනය වීමට හැකිවීම; හෝ

---

[1] SLAuS 700 (සංශෝධිත), *මතයක් සකස් කිරීම සහ මූල්‍ය ප්‍රකාශන මත වාර්තාකරණය*

(iii) හෙළිදරව් කිරීම්වලට සම්බන්ධව, මූල්‍ය ප්‍රකාශ පිළිබඳ අවබෝධය පරිශීලකයන්ට මූලික වේ.

(ආ) විකරණය කළ මතය– මූල්‍ය ප්‍රකාශ මත කොන්දේසි සහිත මතයක්, අහිතකර මතයක් හෝ මතය ව්‍යාචනය කිරීම

**අවශ්‍යතා**

**විගණකගේ මතයට විකරණයක් අවශ්‍ය වන තත්ත්වයන්**

06. විගණකගේ වාර්තාවේ මතය විගණක විකරණය කළ යුත්තේ;:

(අ) ලබාගත් විගණන සාක්ෂි පදනම් කර මූල්‍ය ප්‍රකාශන සමස්ථයක් වශයෙන් ගත්කළ ප්‍රමාණාත්මක අවප්‍රකාශවලින් තොර නොවන බව විගණක තීරණය කිරීම, (යොමුව : අ2 - අ7 ඡේද)

(ආ) මූල්‍ය ප්‍රකාශ සමස්ථයක් වශයෙන් ගත්කළ ප්‍රමාණාත්මක අවප්‍රකාශවලින් තොරයයි තීරණය කිරීමට ප්‍රමාණවත් යෝග්‍ය විගණන සාක්ෂි විගණකට ලබාගැනීමට නොහැකිවීම, (යොමුව : අ8 - අ12 ඡේද) වනවිටය.

**විගණකගේ මතයට කළයුතු විකරණයේ වර්ගය නිර්ණය කිරීම**

*කොන්දේසි සහිත මතය*

07. (අ) විගණක ප්‍රමාණවත් යෝග්‍ය විගණන සාක්ෂි ලබාගෙන ඒවා තනි තනිව හෝ සමාහරණයක් ලෙස ගත්කල අවප්‍රකාශන ප්‍රමාණාත්මක වුවත් එහෙත් එය මූල්‍ය ප්‍රකාශවලට පෘතුල නොවන බව තීරණය කිරීම හෝ

(ආ) මතය පදනම් වන ප්‍රමාණාත්මක යෝග්‍ය විගණන සාක්ෂි විගණකට ලබාගත නොහැකි නමුත් අනාවරණය නොකළ අවප්‍රකාශවල මූල්‍ය ප්‍රකාශන මත ඒවායෙන් වියහැකි බලපෑම ප්‍රමාණාත්මක විය හැකි වුවත් ඒවා පෘතුල නොවේ යයි විගණක තීරණය කරන විට, විගණක කොන්දේසි සහිත මතයක් ප්‍රකාශ කළයුතුය.

*අහිතකර මතය*

8. විගණක ප්‍රමාණවත් යෝග්‍ය විගණන සාක්ෂි ලබාගෙන ඒවා තනි තනිව හෝ සමාහරයක් ලෙස ගත්කළ අවප්‍රකාශ මූල්‍ය ප්‍රකාශවලට ප්‍රමාණාත්මක මෙන්ම පෘතුල වනවිට යන දෙකම වනවිටකදී විගණක අහිතකර මතයක් ප්‍රකාශ කළයුතුය.

*මතය ව්‍යාචනය කිරීම*

9. මතය පදනම් වීමට ප්‍රමාණාවත් යෝග්‍ය විගණන සාක්ෂි විගණකට ලබාගත නොහැකි වූ විට සහ අනාවරණය කර නොගත් අවප්‍රකාශ කිසිවක් වේ නම් මූල්‍ය ප්‍රකාශවලට ඒවායෙන් වියහැකි බලපෑම ප්‍රමාණාත්මක මෙන්ම පෘතුල වනවිට යන දෙකම පවතින විට විගණක මතය ව්‍යාචනය කළයුතුය.

10. බහුආංගික අනියතාවයන් සම්බන්ධ වන අතිශය විරල තත්වයන්හිදී එක් එක් තනි අනියතාවයන් පිළිබඳව යෝග්‍ය ප්‍රමාණවත් විගණන සාක්ෂි ලබාගත්තේ වුවද එය නොතකා අනියතාවලට වියහැකි අන්‍යෝන්‍ය ක්‍රියාකාරකම් නිසා එමගින් මූල්‍ය ප්‍රකාශවලට සිදුවිය හැකි සමුච්චිත බලපෑම නිසා මූල්‍ය ප්‍රකාශ පිළිබඳව මතයක් සකස් කිරිමට විගණකට නොහැකියයි තීරණය කළවිට විගණක මතය ව්‍යාචනය කළයුතුය.

*විගණක කාර්යභාරය භාර ගැනීමෙන් පසු කළමනාකාරීත්වය විසින් පනවනු ලබන සීමාවන් නිසා ප්‍රමාණවත් යෝග්‍ය විගණන සාක්ෂි ලබාගැනීමට නොහැකිවීමේ ප්‍රතිඵල*

11. විගණක කාර්යභාරය භාර ගැනීමෙන් පසු කළමනාකාරිත්වය විගණන විෂයය පථයේ සීමා කිරීම් කර ඇති බැව් විගණකට දැන ගැනීමට ලැබුන විට මෙය මූල්‍ය ප්‍රකාශන මත අහිතකර මතයක් හෝ මතය ව්‍යාචනය කිරීමක් ප්‍රකාශ කිරීමට වියහැකි ප්‍රතිඵලයක් ලෙස විගණක සලකනු ලබනවිට මෙම සීමාකිරීම් ඉවත් කරන ලෙස විගණක කළමනාකාරිත්වයෙන් ඉල්ලා සිටිය යුතුය.

12. මෙම ශ්‍රී.ලංවිප්‍ර.යේ 11 වන ඡේදයේ යොමු කළ සීමාකිරීම් ඉවත් කිරීම කළමනාකාරිත්වය ප්‍රතික්ෂේප කරන්නේ නම් පාලනය පිළිබඳ වග කිව යුතු සියල්ලක්ම අස්තිත්වයේ කළමනාකාරිත්වයට සහභාගි වන්නේ නම් හැර

පාලනය පිළිබඳ වග කිව යුතු අයට[2] විගණක සන්නිවේදනය කළ යුතු අතර ප්‍රමාණවත් යෝග්‍ය විගණන සාක්ෂි ලබාගැනීම සඳහා විකල්ප ක්‍රියාපටිපාටි ඉටුකළ හැකිදැයි නිර්ණය කරනු ලැබේ.

13 ප්‍රමාණවත් යෝග්‍ය විගණන සාක්ෂි විගණකට ලබාගත නොහැකි නම් විගණක විසින් හැඟවෙනදෑ පහත දැක්වෙන පරිදි නිර්ණය කළයුතුය:

(අ) අනාවරණය කර නොගත් අවප්‍රකාශන කිසිවක් වේ නම් මූල්‍ය ප්‍රකාශන මත ඒවායෙන් වියහැකි බලපෑම ප්‍රමාණාත්මක වියහැකි නමුත් ඍතුල නොවේ යයි විගණක තීරණය කරන්නේ නම් විගණක විසින් මතය කොන්දේසි සහිත කළයුතුය. හෝ;

(ආ) අනාවරණය කර නොගත් අවප්‍රකාශන කිසිවක් වේ නම් මූල්‍ය ප්‍රකාශන මත ඒවායෙන් විය හැකි බලපෑම එනම් ප්‍රමාණාත්මක මෙන්ම ඍතුල යන දෙකම වනබව විගණක නිගමනය කරන්නේ නම් මතය කොන්දේසි සහිත වීම තත්ත්වයේ බරපතලකම සන්නිවේදනය කිරීමට ප්‍රමාණවත් නොවන අතර, විගණක විසින්

(i) අදාළ නීති සහ රෙගුලාසි යටතේ සහ ප්‍රායෝගික වන්නේ නම් සහ කළහැකි නම් විගණනයෙන් ඉවත්වීම හෝ (යොමුව : ඡේද අ13)

(ii) විගණකගේ වාර්තාව නිකුත් කිරීමට පෙර ඉවත්වීම ප්‍රායෝගික නොවන්නේ නම් හෝ කළ නොහැකි නම් මූල්‍ය ප්‍රකාශන මත මතය වියාචනය කිරීම.(යොමුව : ඡේද අ14)

14 13(ආ)(i) ඡේදයෙන් අදහස් කර ඇති පරිදි විගණක ඉවත් වුවහොත් විගණක ඉවත්වීමට පෙර මතය විකරණය කිරීමට හේතු වූ විගණනයේදී හඳුනාගත් අවප්‍රකාශන සම්බන්ධයෙන් වන ඕනෑම කරුණක් පාලනය පිළිබඳ වග කිව යුතු අය සමග සන්නිවේදනය කළයුතුය. (යොමුව : අ15 ඡේදය)

*අහිතකර මතයක් හෝ මතය වියාචනය කිරීමට සම්බන්ධ වෙනත් සලකා බැලීම්*

15 මූල්‍ය ප්‍රකාශන සමස්ථයක් වශයෙන් ගත්කළ ඒවා මත අහිතකර මතයක් ප්‍රකාශ කිරීම හෝ මතය වියාචනය කිරීම අවශ්‍ය වේ යැයි විගණක සැලකිල්ලට ගන්නා විට තනි මූල්‍ය ප්‍රකාශයක හෝ මූල්‍ය ප්‍රකාශ එකක් හෝ ඊට වැඩි ගණනක නිශ්චිත මූලිකාංග, ගිණුම් හෝ අයිතම එයම වූ මූල්‍ය වාර්තා කරන ආකෘතිම රාමුවට සම්බන්ධව විගණන වාර්තාවේ විකරණය නොකළ මතයකුත් ඇතුළත් නොකළ යුතුය. එම වාර්තාවේම[3] එවැනි විකරණය නොකළ මතයක් ඇතුළත් කිරීමට, මූල්‍ය වාර්තා සමස්ථයක් මත විගණක අහිතකර මතයක් හෝ මතය වියාචනය කිරීම මේ අවස්ථාවන්හිදී පරස්පර විය හැකිය (යොමුව : අ16 ඡේදය)

***මතය විකරණය කළවිට විගණකගේ වාර්තාවේ ස්වරූපය සහ අන්තර්ගතය***

*විගණකගේ මතය*

16 විගණක, විගණන මතය විකරණය කරන විට විගණක මතය සඳහා වන ඡේදයේ යෝග්‍ය පරිදි විගණක

“කොන්දේසි සහිත මතයක්” හෝ “අහිතකර මතයක්” හෝ “මතය වියාචනය කිරීම” ලෙස ශිර්ෂයක් භාවිතා කළයුතුය. (යොමුව : අ17-අ19 ඡේද)

*කොන්දේසි සහිත මතය*

17 මූල්‍ය ප්‍රකාශවල ප්‍රමාණාත්මක අවප්‍රකාශයක් හේතුවෙන් විගණක කොන්දේසි සහිත මතයක් ප්‍රකාශ කරන විට විගණක මතය සඳහන් ඡේදයේ විගණකගේ මතය අනුව කොන්දේසි සහිත මතයක් සඳහා පදනම් වන ඡේදයේ විස්තර කර ඇති කරුණ(ණු) වල බලපෑම් හැර ලෙස සඳහන් කළයුතුය,

(අ) සාධාරණ ඉදිරිපත් කිරීමේ ආකෘතිමය රාමුව ප්‍රකාරව වාර්තා කරන විට, අදාළ මූල්‍ය වාර්තාකරණ ආකෘතිමය රාමුව ප්‍රකාරව එක්ව යන මූල්‍ය ප්‍රකාශන සත්‍ය හා සාධාරණ දර්ශනයක් (හෝ සියලුම ප්‍රමාණාත්මක අංගවලින් සාධාරණ තත්ත්වයක්) ගෙන හැර දක්වයි; හෝ

(ආ) අනුකූල වීමේ ආකෘතිමය රාමුව (යෝග්‍ය මූල්‍ය වාර්තාකරණ ආකෘතිමය රාමුව) ප්‍රකාරව වාර්තාකරණයට සියලු ප්‍රමාණාත්මක අංගවලින් මූල්‍ය ප්‍රකාශ පිළියෙල කර තිබේ.

---

[2] SLAuS 260 (සංශෝධිත), *පාලනය පිළිබඳ වග කිවයුතු අයට අය සමග සංනිවේදනය කිරීම* ,13 ඡේදය.

[3] SLAuS 805 (සංශෝධිත), ―*විශේෂ සලකා බැලීම් - තනි මූල්‍ය ප්‍රකාශනවල සහ මූල්‍ය ප්‍රකාශනයක නිශ්චිත මූලිකාංග, ගිණුම් හෝ අයිතම් හි* මූල්‍ය ප්‍රකාශන එකක් හෝ ඊට වැඩි ගණනක් නිශ්චිත මූලිකාංග, ගිණුම් හෝ අයිතම් පිළිබඳ වෙනම මතයක් ප්‍රකාශ කිරීමට විගණක භාරගත් විට, වන තත්ත්වයන් පිළිබඳ කටයුතු කෙරේ.

යෝග්‍ය ප්‍රමාණවත් විගණන සාක්ෂි ලබාගැනීමට අපොහොසත් වීම නිසා විකරණය පැනනැගුණ විට විකරණය කරන ලද මතය සඳහා විගණක "..... කරුණ(ණු) වලින් වියහැකි බලපෑම හැරුණකොට" අනුරූපී වැකිකඩ යෙදිය යුතුය. (යොමුව : අ20 ඡේදය)

අහිතකර මතය

18 විගණක අහිතකර මතයක් ප්‍රකාශ කරන විට විගණකගේ මතය අහිතකර මතය පදනම් වන ඡේදයේ විස්තර කර ඇති කරුණ(ණු) වල වැදගත්කම නිසා යන්න විගණක, විගණකගේ මතය තුළ සඳහන් කළ යුතුය:

(අ) සාධාරණ ඉදිරිපත් කිරීමේ ආකෘතිමය රාමුව ප්‍රකාරව වාර්තා කරන විට එක්ව යන මූල්‍ය ප්‍රකාශ සත්‍ය හා සාධාරණ දර්ශනයක් (හෝ සාධාරණ ඉදිරිපත්කිරීමක්) {අදාළ මූල්‍ය වාර්තාකරණ ආකෘතිමය රාමුව ප්‍රකාරව} දෙනු නොලැබේ.; හෝ

(ආ) අනුකූලවීමේ ආකෘතිමය රාමුව ප්‍රකාරව වාර්තා කිරීමේදී එක්ව යන මූල්‍ය ප්‍රකාශ සියලු ප්‍රමාණාත්මක අංගවලින් යෝග්‍ය මූල්‍ය වාර්තාකරණ ආකෘතිමය රාමුව ප්‍රකාරව පිළියෙල කර නොතිබේ.

මතය වියාචනය කිරීම

19 යෝග්‍ය ප්‍රමාණවත් විගණන සාක්ෂි ලබාගැනීමට නොහැකි වීම හේතුවෙන් විගණක, මතය වියාචනය කරන විට විගණන මතය අඩංගු ඡේදයේ විගණක විසින්:

(අ) විගණක එක්ව යන මූල්‍ය ප්‍රකාශ මත, මතයක් ප්‍රකාශ නොකරන බව සඳහන් කිරීම;

(ආ) මතය වියාචනය කරන පදනම ඡේදයේ විස්තර කර ඇති කරුණ(ණු) වල වැදගත්කම අනුව මූල්‍ය ප්‍රකාශ මත විගණන මතය සහ පදනම සැපයීමට අවශ්‍ය යෝග්‍ය ප්‍රමාණවත් විගණන සාක්ෂි විගණකට ලබාගැනීමට නොහැකි වූ බව සඳහන් කිරීම සහ

(ඇ) මූල්‍ය ප්‍රකාශ විගණනයට කාර්යභාරයේ විගණක නියුතු කර ඇති බව ඇති මූල්‍ය ප්‍රකාශ විගණනය කර තිබෙන බව සඳහන් කිරීම අගවන ලද ශ්‍රී.ල.වි.ප්‍ර. 700 (සංශෝධිත) හි 24 (අ) ජේදය මගින් අවශ්‍ය කරන ප්‍රකාශය සංශෝධනය කිරීම

මතය සඳහා පදනම

20 මූල්‍ය ප්‍රකාශ මත විගණක මතය විකරණය කරනවිට ශ්‍රී.ල.වි.ප්‍ර. 700 (සංශෝධිත) මගින් අවශ්‍ය කරන නිශ්චිත මූලිකාංගවලට අමතරව විගණක විසින් පහත දෑ කළ යුතු ය. (යොමුව : අ21 ඡේදය)

(අ) යෝග්‍ය පරිදි "කොන්දේසි සහිත මතය සඳහා පදනමට" "අහිතකර මතය සඳහා පදනමට" "මතය වියාචනය කිරීම සඳහා පදනමට" ශ්‍රී.ල.වි.ප්‍ර. 700 (සංශෝධිත) හි 28 ජ්දය මගින් අවශ්‍ය කරන "මතය සඳහා පදනම" ශීර්ෂය සංශෝධනය කළ යුතුය; සහ

(ආ) මෙම කොටස තුළ විකරණය පැන නැගීමට හේතු වූ කරුණේ විස්තරයක් ඇතුළත් කළ යුතු ය:

21 මූල්‍ය ප්‍රකාශවල නිශ්චිත වටිනාකම්වලට සම්බන්ධ (ප්‍රමාණාත්මක හෙළිදරව් කිරීම ඇතුළත්) මූල්‍ය ප්‍රකාශනවල අවප්‍රකාශයක් තිබේ නම් ප්‍රායෝගික නොවන්නේ නම් හැර විගණක විසින් මතය සඳහා පදනම වූ ඡේදයේ අවප්‍රකාශයේ විස්තරයක් එහි මූල්‍ය බලපෑම්වල ප්‍රමාණීයකරණයක් ඇතුළත් කළයුතු ය. මූල්‍ය බලපෑම ප්‍රමාණීයකරණය ප්‍රායෝගික නොවන්නේ නම් එය විගණක විකරණය සඳහා පදනම ඡේදයේ සඳහන් කළ යුතු ය. (යොමුව : ඡේද අ22)

22 ගුණාත්මක හෙළිදරව්කිරීම්වලට සම්බන්ධ වන ප්‍රමාණාත්මක අවප්‍රකාශයක් මූල්‍ය ප්‍රකාශවල තිබේ නම්, හෙළිදරව් කිරීම අවප්‍රකාශ වූයේ කෙසේ ද යන්න පැහැදිලි කිරීමක් විගණක විසින් මතය සඳහා වූ පදනම ඡේදයේ ඇතුළත් කළ යුතු ය.

23 හෙළිදරව් කිරීම අවශ්‍යකරන තොරතුරු හෙළිදරව් නොකිරීම නිසා සම්බන්ධ වන හේතුවක් නිසා මූල්‍ය ප්‍රකාශවල ප්‍රමාණාත්මක අවප්‍රකාශනයක් තිබේ නම් විගණක විසින්:

(අ) හෙළිදරව් නොකිරීම ගැන පාලනය පිළිබඳ කටයුතු කරන තැනැත්තන් සමග සාකච්ඡා කළ යුතු ය.;

(ආ) අත්හල තොරතුරුවල ස්වභාවය පිළිබඳව මතය සඳහා වූ පදනම ඡේදයේ විස්තර කළ යුතු ය; සහ

(ඇ) නීතියෙන් හෝ රෙගුලාසි මගින් තහනම් කර නැත්නම් හැර සහ එසේ කිරීම ප්‍රායෝගික වන්නේ නම් හෝ අත්හල තොරතුරු පිළිබඳ ප්‍රමාණවත් යෝග්‍ය තොරතුරු විගණක ලබාගෙන ඇත්නම් අත්හල හෙළිදරව් කිරීම ඇතුළත් කළ යුතු ය. (යොමුව : අ23 ඡේදය)

24 විකරණය කිරීම, ප්‍රමාණවත් යෝග්‍ය විගණන සාක්ෂි ලබාගැනීමට වූ නොහැකියාවේ ප්‍රතිඵලය වේ නම් විගණක විසින් මතය සඳහා පදනම වූ ඡේදයේ ඒ නොහැකියාවට හේතු ඇතුළත් කළයුතු ය

25 විගණක කොන්දේසි සහිත මතයක් හෝ අහිතකර මතයක් ප්‍රකාශ කරන විට යෝග්‍ය වන පරිදි "කොන්දේසි සහිත" හෝ "අහිතකර" යන වචනය ඇතුළත් කිරීමට ශ්‍රී.ල.වි.ප්‍ර. 700 (සංශෝධිත) හි 28 (ඇ) ඡේදය මගින් අවශ්‍ය කරන විගණකගේ මතය සඳහා පදනමක් ලබාදීමට ප්‍රමාණවත් යෝග්‍ය විගණන සාක්ෂි ලබා ගන්නේ ද යන්න පිළිබඳ ප්‍රකාශය විගණක විසින් සංශෝධනය කළ යුතු ය.

26 විගණක මූල්‍ය ප්‍රකාශ මත මතය වියාචනය කරන විට, ශ්‍රී.ල.වි.ප්‍ර. 700 (සංශෝධිත) හි 28(ආ) සහ 28(ඇ) ඡේද මගින් අවශ්‍ය කරන මූලිකාංග විගණකගේ වාර්තාවේ ඇතුළත් නොකළ යුතු ය. මෙම මූලිකාංග වන්නේ:

(අ) විගණකගේ වගකීම විස්තර කරන අවස්ථාවකදී විගණකගේ වාර්තාවේ කොටසකට යොමුවක්; සහ

(ආ) විගණකගේ මතය සඳහා පදනමක් ලබාදීමට ලබාගත් විගණන සාක්ෂි ප්‍රමාණවත් යෝග්‍යදැයි ප්‍රකාශයක්.

27 මූල්‍ය ප්‍රකාශ මත අහිතකර මතයක් හෝ මතය වියාචනය කිරීම විගණක ප්‍රකාශ කර තිබෙන්නේ වුවත් මතයට විකරණය කිරීමක් සහ ඒමත බලපෑම් අවශ්‍ය කරන බව විගණක දැනුවත් වන යම්කිසි කරුණු සඳහා හේතු, මතය සඳහා පදනම කොටසේ විස්තර කළ යුතු ය. (යොමුව : අ24 ඡේදය)

*විගණක මූල්‍ය ප්‍රකාශ මත මතය වියාචනය කරන විට මූල්‍ය ප්‍රකාශවල විගණනය සඳහා විගණකගේ වගකීමේ විස්තරය*

28 ප්‍රමාණවත් සහ යෝග්‍ය විගණන සාක්ෂි ලබාගැනීමට නොහැකි වීම හේතුවෙන් මූල්‍ය ප්‍රකාශ මත විගණක මතයක් වියාචනය කරන විට විගණක පහත සඳහන් දෑ පමණක් ඇතුළත් කිරීමට ශ්‍රී.ල.වි.ප්‍ර. 700 (සංශෝධිත) හි 39 - 41 ඡේද මගින් අවශ්‍ය කරන විගණකගේ වගකීම්වල විස්තරය විගණක විසින් සශෝධනය කළ යුතුය. (යොමුව : අ25 ඡේදය)

(අ) ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිය සමග අනුකූලව අස්තිත්වයේ මූල්‍ය ප්‍රකාශ මත විගණනය මෙහෙයවීමට සහ විගණකගේ වාර්තාව නිකුත් කිරීමට විගණකගේ වගකීම්වල ප්‍රකාශයක්;

(ආ) මතය වියාචනය කිරීමේ පදනම කොටසේ කෙසේ නමුත් විස්තර කළ කරුණු නිසා මූල්‍ය ප්‍රකාශන මත විගණකගේ පදනමක් ලබාදීමට ප්‍රමාණවත් සහ යෝග්‍ය විගණන සාක්ෂි ලබාගැනීමට නොහැකිවීම පිළිබඳ ප්‍රකාශයක්; සහ

(ඇ) ශ්‍රී.ල.වි.ප්‍ර. 700 (සංශෝධිත) හි 28(ඇ) ඡේදය මගින් අවශ්‍ය කරන විගණකගේ ස්වාධීනත්වය සහ වෙනත් ආචාරධර්ම වගකීම් පිළිබඳ ප්‍රකාශයක්.

*මූල්‍ය ප්‍රකාශ මත විගණක මතය වියාචනය කරනවිට සැලකිල්ලට ගැනීම්*

29 නීතියෙන් හෝ රෙගුලාසි මගින් අවශ්‍ය කරන්නේ නම් හැර විගණක මූල්‍ය ප්‍රකාශ මත මතයක් වියාචනය කරන විට ශ්‍රී.ල.වි.ප්‍ර. 701 අනුව විගණකගේ වාර්තාවේ ප්‍රධාන විගණන කරුණු කොටසක හෝ ශ්‍රී.ල.වි.ප්‍ර. 720 (සංශෝධිත)[4,5] අනුව වෙනත් කරුණු කොටසක ඇතුළත් නොකළ යුතුය. (යොමුව : අ26 ඡේදය)

---

[4] SLAuS 701, *ස්වාධීන විගණකගේ වාර්තාවේ ප්‍රධාන විගණන කරුණු සන්නිවේදනය, 11–13 ඡේද*

[5] SLAuS 720 (සංශෝධිත), *වෙනත් තොරතුරු සම්බන්ධයෙන් විගණකගේ වගකීම්,* අ 54 ඡේදය

**පාලනය පිළිබඳ වග කියන අය සමඟ සංන්නිවේදනය**

30 විගණකගේ වාර්තාවේ මතය විකරණය කිරීමට විගණක අපේක්ෂා කරනවිට ඒ බව, අපේක්ෂිත විකරණය කිරීමට තුඩුදුන් තත්වයන් සහ විකරණය සඳහා යෝජිත වචන පෙළගැස්ම පාලනය පිළිබඳ වග කියන අය සමඟ සන්නිවේදනය කළ යුතුය. (යොමුව : අ27 ඡේදය)

**භාවිතා කිරීමේ සහ පැහැදිලි කිරීමේ වෙනත් කරුණු**

**විකරණය කරන ලද මතවල වර්ගයන්** (යොමුව : 2 ඡේදය)

අ1 විකරණය සඳහා තුඩුදුන් කරුණේ ස්වභාවය සම්බන්ධයෙන් විගණකගේ විනිශ්චය කෙසේද සහ එහි බලපෑම්වල භාවය, මූල්‍ය ප්‍රකාශ මත වියහැකි බලපෑම් ප්‍රකාශ කළයුතු මතයේ වර්ගයට වන බලපෑම් පහත දක්වෙන වගුවේ නිදර්ශන මගින් පහදා දේ :

| *විකරණය සඳහා තුඩුදුන් කරුණේ ස්වභාවය* | **මූල්‍ය ප්‍රකාශ මත වියහැකි බලපෑම හෝ බලපෑම්වල පෘතුලභාවය පිළිබඳව විගණකගේ විනිශ්චය** | |
|---|---|---|
| | **ප්‍රමාණාත්මක එහෙත් පෘතුල නොවන** | **ප්‍රමාණාත්මක සහ පෘතුල** |
| **මූල්‍ය ප්‍රකාශ ප්‍රමාණාත්මකව අවප්‍රකාශය වීම** | කොන්දේසි සහිත මතය | අහිතකර මතය |
| **ප්‍රමාණවත් සහ යෝග්‍ය විගණන සාක්ෂි ලබාගැනීමට නොහැකිවීම** | කොන්දේසි සහිත මතය | මතය වියාචනය කිරීම |

**විගණකගේ මතයට විකරණය කිරීමක් අවශ්‍ය වන අවස්ථාවන්**
*ප්‍රමාණාත්මක අවප්‍රකාශවල ස්වභාවය (යොමුව : 6(අ) ඡේදය)*

අ2 මූල්‍ය ප්‍රකාශ මත මතයක් සකස් කිරිමට හැකිවීම සමස්ථයක් වශයෙන් ගත්කල මූල්‍ය ප්‍රකාශ ප්‍රමාණාත්මක අවප්‍රකාශවලින් තොරද යන්න සඳහා සාධාරණ සහතික වීමක් ලබාගත්තේද යන්න පිළිබඳව තීරණය කිරීමට ශ්‍රී.ල.වි.ප්‍ර. 700[6] (සංශෝධිත) මගින් විගණකට අවශ්‍ය කෙරේ. ශ්‍රී.ල.වි.ප්‍ර. 450[7] අනුව මූල්‍ය ප්‍රකාශනවල නිවැරදි නොකරන ලද අවප්‍රකාශන කිසිවක් වේ නම් විගණකගේ ඇගයීම මෙම තීරණය සඳහා සැලකිල්ලට ගත යුතු වේ.

අ3 මූල්‍ය ප්‍රකාශයක වාර්තා කර ඇති අයිතමයක වටිනාකම, වර්ගීකරණය ඉදිරිපත් කිරීම හෝ හෙළිදරව් කිරීම සහ උචිත මූල්‍ය වාර්තාකරන ආකෘතිමය රාමුව අනුව එම අයිතමය සඳහා අවශ්‍ය වන වටිනාකම, වර්ගීකරණය කිරීම, ඉදිරිපත් කිරීම හෝ හෙළිදරව් කිරීම අතර වෙනසක් අවප්‍රකාශයක් ලෙස ශ්‍රී.ල.වි.ප්‍ර. 450 හි නිර්වචනය කෙරේ. ඒ අනුව මූල්‍ය ප්‍රකාශයක ප්‍රමාණාත්මක අවප්‍රකාශයන් සම්බන්ධව පහත පැන නැගිය හැකිය:

(අ) තෝරාගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවල යෝග්‍යභාවය;
(ආ) තෝරාගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති ව්‍යවහාරකරණය.; හෝ
(ඇ) මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කිරීම්වල යෝග්‍යත්වය සහ ප්‍රමාණවත්බව

තෝරාගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවල යෝග්‍යභාවය

අ4 කළමනාකාරිත්වය තෝරාගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවල යෝග්‍යතාව සම්බන්ධව මූල්‍ය ප්‍රකාශනවල ප්‍රමාණාත්මක අවප්‍රකාශ පැන නැගිය හැකකේ කවරකටද යන්න සඳහා උදාහරණ වන්නේ:

(අ) තෝරාගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති යෝග්‍ය මූල්‍ය වාර්තාකරන ආකෘතිමය රාමුව සමග සංගත නොවන විට;

[6] SLAuS 700 (*සංශෝධිත*), 11 ඡේදය.
[7] SLAuS 450, *විගණනය අතරතුරු හඳුනාගත් අවප්‍රකාශන ඇගයීම*" 4(අ) ඡේදය.

(ආ) මූල්‍ය තත්ත්ව ප්‍රකාශයේ, විස්තීර්ණ ආදායම් ප්‍රකාශනයේ, ස්කන්ධය වෙනස්වීම් ප්‍රකාශනයේ හෝ මුදල් ප්‍රවාහ ප්‍රකාශනයේ සැලකිය යුතු අයිතමයකට සම්බන්ධ ගිණුම්කරණ ප්‍රතිපත්තියක් නිවැරදිව මූල්‍ය ප්‍රකාශවල විස්තර නොකිරීම.; හෝ

(ඇ) සාධාරණ ඉදිරිපත් කිරිම ඉෂ්ඨ කර ගැනීමේ අදහසින් පාදක ගණුදෙණු සහ සිද්ධි මූල්‍ය ප්‍රකාශවල නිරූපනය නොකිරිම හෝ හෙළිදරව් නොකිරීම.

අ5 මූල්‍ය වාර්තාකරණ ආකෘතිමය රාමුව බොහෝවිට ගිණුම්කරණ ප්‍රතිපත්තීන්වල වෙනස්වීම් සහ හෙළිදරව් කිරීම ගිණුම්කරණය සඳහා අවශ්‍යතාවලින් සමන්විත වේ. අස්තිත්වයක් එහි වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති තෝරාගැනීම වෙනස් කර තිබෙන අවස්ථාවකදී මෙම අවශ්‍යතා සමග අස්තිත්වය අනුගත නොවීමෙන් මූල්‍ය ප්‍රකාශවල ප්‍රමාණාත්මක අවප්‍රකාශ පැනනැගිය හැකිය.

තෝරාගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති ව්‍යවහාරකරණය

අ6 තෝරාගත් ගිණුම්කරණ ප්‍රතිපත්තීන් ව්‍යවහාරය කිරීම සම්බන්ධයෙන් මූල්‍ය ප්‍රකාශවල ප්‍රමාණාත්මක අවප්‍රකාශ පැන නැගිය හැකිය:

(අ) තෝරාගත් ගිණුම්කරණ ප්‍රතිපත්තීන් කාලපරිච්ඡේද අතර හෝ සමාන ගනුදෙනු සහ සිද්ධින් සංගතව (ව්‍යවහාරකරණයේ සංගතතාවය) කළමනාකාරිත්වය ව්‍යවහාර නොකිරීම ඇතුළුව මූල්‍ය වාර්තාකරණ ආකෘතිමය රාමුව සමග තෝරාගත් ගිණුම්කරණ ප්‍රතිපත්තීන් සංගතව කළමනාකාරිත්වය ව්‍යවහාර නොකරන විට, හෝ

(ආ) තෝරාගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති ව්‍යවහාරකරණය සඳහා තෝරාගත් ක්‍රමය හේතුවෙන් (ව්‍යවහාරකරණයේදී වන අනපේක්ෂිත වැරදි වැනි)

මූල්‍ය ප්‍රකාශන තුල හෙළිදරව් කිරීමේ යෝග්‍යතාවය හෝ ප්‍රමාණවත් බව

අ7 මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කිරීමේ යෝග්‍යභාවය හෝ ප්‍රමාණවත් බව සම්බන්ධයෙන් මූල්‍ය ප්‍රකාශනවල

ප්‍රමාණාත්මක අවප්‍රකාශන පැන නැගිය හැකි වන්නේ,:

(අ) යෝග්‍ය මූල්‍ය වාර්තාකරණ ආකෘතිමය රාමුවෙන් අවශ්‍ය කෙරෙන සියලු හෙළිදරව් කිරීම් මූල්‍ය ප්‍රකාශවල ඇතුළත් නොකරන විටකදී.;

(ආ) යෝග්‍ය මූල්‍ය වාර්තාකරණ ආකෘතිමය රාමුවෙන් අවශ්‍ය කෙරෙන ආකාරයට මූල්‍ය ප්‍රකාශවල හෙළිදරව් කිරීම් ඉදිරිපත් නොකරන විටකදී; හෝ

(ඇ) යෝග්‍ය මූල්‍ය වාර්තාකරණ ආකෘතිමය රාමුවෙන් අවශ්‍ය කෙරෙන හෙළිදරව් කිරීම්වලට පිටතින් හෙළිදරව් කිරීම් සාධාරණ ඉදිරිපත් කිරීමක් ඉෂ්ඨ කරගැනීමට අවශ්‍ය අමතර හෙළිදරව් කිරීමක් මූල්‍ය ප්‍රකාශනය මගින් ලබා නොදෙන විටකදී.

පැනනැගිය හැකි ගුණාත්මක හෙළිදරව් කිරීම් තුළ අවප්‍රාශවලට තවදුරටත් උදාහරණ ශ්‍රී.ල.වි.ප්‍ර. 450 හි අ13 ජේදයෙන් ලබාදෙයි.

ප්‍රමාණවත් යෝග්‍ය විගණන සාක්ෂි ලබාගැනීමට නොහැකි වීමේ ස්වභාවය (යොමුව : 6(ආ) ඡේදය)

අ8 විගණකට ප්‍රමාණවත් යෝග්‍ය විගණන සාක්ෂි (විගණනයේ විෂය පථය සීමා කිරීම ලෙසද හැඳින්වේ) ලබාගැනීමට නොහැකිවීම පහත සඳහන් දෑ නිසා පැන නැගිය හැකිය.

(අ) අස්තිත්වයේ පාලනයෙන් තොරව සිදුවන තත්ත්වයන් නිසා,;

(ආ) විගණකගේ වැඩවල ස්වභාවය සහ කාලනිර්ණය හා සම්බන්ධ තත්ත්වයන් නිසා, හෝ

(ඇ) කළමනාකාරිත්වය විසින් පනවනු ලබන සීමාවන් නිසා.

අ9 විකල්ප පටිපාටීන් ඉටු කිරීමෙන් ප්‍රමාණවත් යෝග්‍ය විගණන සාක්ෂි ලබාගැනීමට විගණකට හැකිවේ නම් නියමිත පටිපාටියක් ඉටු කිරීමට නොහැකිවීම විගණකගේ විෂය පථය සීමාකිරීමක් ස්ථාපනය කිරීමක් නොවනු ඇත. මෙය කළ නොහැකිනම් යෝග්‍ය පරිදි 7(ආ) 9 සහ 10 ඡේදවල අවශ්‍යතා ව්‍යවහාර වේ. කළමනාකාරිත්වය විසින් පනවනු ලබන සීමාවන් නිසා විගණකගේ වංචා අවදානම් තක්සේරු කිරීම විගණන කාර්යභාර දිගටම පවත්වාගෙන යාම සලකාබැලීම වැනි වෙනත් අනුමිතියන් විගණනයට ඇතිවිය හැකිය.

අ10 අස්තිත්වයේ පාලනයෙන් එහා තත්ත්වයන්ට උදාහරණවලට ඇතුළත් වන්නේ:

- අස්තිත්වයේ ගිණුම්කරණ වාර්තා විනාශ වන විට
- සැලකියයුතු කොටසක ගිණුම්කරණ වාර්තා රාජ්‍ය අධිකාරීන් විසින් දින නියමයක් නැති කාලයකට ඔවුන්ගේ භාරයට ගෙන තිබීම

අ11 විගණකගේ වැඩවල ස්වභාවය සහ කාලනිර්ණය හා සම්බන්ධ තත්ත්වයන්ට වන උදාහරණයන්ට ඇතුළත් වන්නේ:

- අස්තිත්වයක්, ආශ්‍රිත අස්තිත්වයක් සඳහා ස්කන්ධ ක්‍රමය අනුව ගිණුම්කරණය භාවිත කිරීම අවශ්‍ය කරන විට හා ස්කන්ධ ක්‍රමය යෝග්‍ය පරිදි ව්‍යවහාර කළේද යන්න ඇගයීමට විගණකට පසුව සඳහන් කළ අස්තිත්වයේ මූල්‍ය තොරතුරු පිළිබඳව යෝග්‍ය ප්‍රමාණවත් විගණන සාක්ෂි ලබාගැනීමට නොහැකි වන විට.
- නිසිකලට විගණකගේ පත්කිරීම එනම් විගණකට භෞතික තොග ගණන් ගැනීම නිරීක්ෂණය කිරීමට නොහැකි වන විට.
- තහවුරු පටිපාටින් ඉටුකිරීම පමණක් ප්‍රමාණවත් නොවන බව විගණක නිර්ණය කිරීම හා අනෙක් අතට අස්තිත්වයේ පාලනය සඵල නොවන විට.

අ12 කළමනාකාරිත්වය විසින් විගණකගේ විෂය පථයේ සීමා පැනවීම හේතු කොටගෙන ප්‍රමාණවත් යෝග්‍ය විගණන සාක්ෂි ලබාගැනීමට අපොහොසත් වීම් සඳහා උදාහරණවලට ඇතුළත් වන්නේ,

- කළමනාකාරිත්වය විසින් භෞතික තොග ගණන් ගැනීම විගණක නිරීක්ෂණය කිරීම වළක්වාලන විට.
- නිශ්චිත ගිණුම් ශේෂයන් සඳහා විගණක විසින් බාහිර තහවුරු කිරීම් ලබාගැනීම සඳහා කරන ඉල්ලීම කළමනාකාරිත්වය වළක්වාලන විට.

**විගණකගේ මතයට විකරණයවීම්වල වර්ගය නිර්ණය කිරීම**

*විගණන කාර්යභාරය භාරගැනීමෙන් පසු කළමනාකාරිත්වය විසින් පනවනු ලබන සීමාවන් නිසා ප්‍රමාණවත් යෝග්‍ය විගණන සාක්ෂි ලබාගැනීමට නොහැකිවීමේ ප්‍රතිඵලය (යොමුව :13(ආ) i - 14 ඡේද )*

අ13 ප්‍රායෝගික වශයෙන් විගණනයෙන් ඉවත්වීම රඳා පවත්නේ කළමනාකාරිත්වය විසින් විෂය පථයේ සීමා පනවන අවස්ථාව වනවිට විගණන කාර්යභාරයේ කුමන අදියර දක්වා නිමකර ඇත්ද යන කරුණ මතය. විගණක සෑහෙන දුරට විගණනය නිමකර ඇත්නම් විගණක හැකිතාක් ප්‍රමාණයකට විගණනය සම්පූර්ණ කිරීමට තීරණය කළහැකි අතර, විගණනයෙන් ඉවත්වීමට පෙර මතය වියාචනය කිරීම සඳහා පදනම් වන ඡේදයේ මතය වියාචනය කර විෂය පථයේ සීමාවන් පැහැදිලි කළ යුතුය.

අ14 නීතියෙන් හෝ රෙගුලාසි මගින් විගණන කාර්යභාරය දිගටම පවත්වාගෙනයාම අවශ්‍ය කෙරේ නම්, සමහර අවස්ථාවන්හිදී විගණනයෙන් ඉවත්වීම කළ නොහැකි වනු ඇත. රාජ්‍ය අංශයේ අස්තිත්වයක් විගණනය සඳහා පත්කලවිට මෙය විගණකවරයෙකුට එවැනි අවස්ථාවක් වනු ඇත. අධිකරණ බල ප්‍රදේශයක් තුල නිශ්චිත කාලපරිච්ඡේදයක් ආවරණය වන මූල්‍ය ප්‍රකාශ විගණනය කිරීමට පත් කිරීම නිශ්චිත කාලයකට පත්කර පිළිවෙළින් එම මූල්‍ය ප්‍රකාශන වල විගණනය සම්පූර්ණ කිරීමට පෙර හෝ කාලසීමාව ඉකුත්වීමට පෙර කාර්යභාරයෙන් ඉවත්වීම තහනම් කෙරෙන විට එය ද මෙවන් අවස්ථාවක් වේ. විගණකගේ වාර්තාවේ[8] වෙනත් කරුණු පිළිබඳ ඡේදයක් ද ඇතුළත් කිරීම අවශ්‍යදැයි විගණක සලකා බැලිය යුතු ය.

අ15 විෂයපථයේ සීමා කිරීමක් නිසා විගණනයෙන් ඉවත්වීම අවශ්‍යයයි විගණක තීරණය කළවිට, කාර්යභාරයෙන් ඉවත්වීමට සම්බන්ධ කරුණු විගණක විසින් නියාමනය කරන්නන්හට හෝ අස්තිත්වයේ හිමිකරුවන්ට දන්වා සිටීමට විගණකට වෘත්තීමය, නීතිමය හෝ නියාමන අවශ්‍යතාවයක් තිබිය හැකිය

අහිතකර මතය හෝ මතය වියාචනය කිරීමට සම්බන්ධිත වෙනත් සැලකිල්ලට ගත යුතුදෑ (යොමුව : 15 ඡේදය)

අ16 විගණකගේ අහිතකර මතය හෝ මතය වියාචනය කිරීම පරස්පර නොවන්නාවූ වාර්තාකරණ තත්ත්වයන් සඳහා වන උදාහරණයන් පහත දැක්වේ.:

[8] SLAuS 706 (සංශෝධිත), *ස්වාධීන විගණකගේ වාර්තාවේ කරුණ අවධාරණය කිරීමේ කිරීමේ ඡේදය සහ වෙනත් කරුණු ඡේදය* , අ10 ඡේදය

- දී ඇති මූල්‍ය වාර්තාකරණ ආකෘතිමය රාමුවක් යටතේ පිළියෙල කරන ලද මූල්‍ය ප්‍රකාශ මත විකරණය නොකරන ලද මතයක් ප්‍රකාශ කිරීම සහ එම වාර්තාව තුළට, එම මූල්‍ය ප්‍රකාශ මත වෙනස් මූල්‍ය වාර්තාකරන රාමුවක්[9] යටතේ අහිතකර මතයක් ප්‍රකාශ කිරීම.

- අදාළවන තැන්හි මෙහෙයුම් ප්‍රතිඵල සහ මුදල් ප්‍රවාහයන් සම්බන්ධයෙන් මතයන් වියාචනය කිරීම සහ මූල්‍ය තත්ත්වය පිළිබඳව විකරණය නොකරන ලද මතයක් ප්‍රකාශ කිරීම (SLAuS 510[10] බලන්න). මෙම අවස්ථාවේදී විගණක මූල්‍ය ප්‍රකාශ සමස්ථයක් වශයෙන් ගත්කල මතය වියාචනය කිරීමක් ප්‍රකාශ කර නොමැත;

***මතය විකරණය කළවිට විගණකගේ වාර්තාවේ ස්වරූපය සහ අන්තර්ගතය***

*නිදර්ශනාත්මක විගණකගේ වාර්තා* (යොමුව : 16 ඡේදය)

අ17 පරිශිෂ්ටයේ 1 සහ 2 නිදර්ශන වල අඩංගුවන්නේ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක ලෙස අවප්‍රකාශ වීම නිසා පිළිවෙලින් කොන්දේසි සහිත සහ අහිතකර මතයක් අඩංගු විගණකගේ වාර්තාය.

අ18 පරිශිෂ්ටයේ 3වන නිදර්ශනයේ අඩංගු වන්නේ ප්‍රමාණවත් යෝග්‍ය විගණන සාක්ෂි විගණකට ලබාගත නොහැකි වීම නිසා කොන්දේසි සහිත මතයකින් යුත් විගණකගේ වාර්තාවකි. 4වන නිදර්ශනයේ අඩංගු වන්නේ මූල්‍ය ප්‍රකාශවල තනි මූලිකාංගයකට අදාළ ප්‍රමාණවත් යෝග්‍ය විගණන සාක්ෂි ලබාගැනීමට නොහැකි වූ නිසා මතය වියාචනය කරන ලද්දකි. 5වන නිදර්ශනයේ අඩංගුවන්නේ මූල්‍ය ප්‍රකාශවල බහුවිධ මූලිකාංග පිළිබද ප්‍රමාණවත් යෝග්‍ය විගණන සාක්ෂි ලබාගැනීමට නොහැකිවුන නිසා මතය වියාචනය කරන ලද්දකි. පසුව සඳහන් කළ සිද්ධි දෙකෙහි සෑම සිද්ධියකදී මූල්‍ය ප්‍රකාශ කෙරෙහි විය හැකි බලපෑමේ නොහැකියාව වැදගත් මෙන්ම පෘතුලද වේ වාර්තාකරණ අවශ්‍යතාවයන් ඇතුලත් එම ශ්‍රී.ල.වි.ප්‍ර.වලට වන පරිශිෂ්ඨවල ශ්‍රී.ලං.වි.ප්‍ර 570 (සංශෝධිත),[11] හි විකරණය කළ මතය සමග විගණකගේ වාර්තාවේ නිදර්ශන ඇතුල් වේ.

*විගණකගේ මතය* (*යොමුව : 16 ඡේදය*)

අ19 මෙම ශීර්ෂය සංශෝධනය කිරීමෙන්, විගණකගේ මතය විකරණය කරඇති සහ විකරණයන්හි වර්ග පෙන්වන බව පරිශීලකයින්ට එය පැහැදිලි කිරීම සිදු කරයි.

කොන්දේසි සහිත මතය (*යොමුව.* 17 *ඡේදය*)

අ20 විගණක කොන්දේසි සහිත මතයක් ප්‍රකාශ කරන විට මතයේ කොටසේ තවදුරටත් පැහැදිලි කිරීම් සහිතව හෝ හැර යන වැකිකඩ ලෙස භාවිතා කිරීම යෝග්‍ය නොවිය හැක්කේ ඒවා ප්‍රමාණාත්මකව පැහැදිලි සහ පෘතුල නොවන නිසාය.

*මතය සඳහා පදනම* (යොමුව : 20 - 21, 23, 27 ඡේද)

අ21 විගණක වාර්තාවේ සංගතභාවය එය පරිශීලනය කරන්නන්ගේ තේරුම් ගැනීම ප්‍රවර්ධනය කිරීම සහ අසාමාන්‍යතත්ත්වයන් ඒවා සිදුවූ විට හඳුනාගැනීමට උපකාරී වේ. ඒ අනුව විකරණය කරන ලද මතයේ විකරණය කිරීම සඳහා පදනම් වූ විස්තරයේ වචන පෙළගැස්ම ඒකාකාරී වීම විය නොහැකි වුවත් විගණකගේ වාර්තාවේ ආකෘතිය හා අන්තර්ගතය යන දෙකම සංගතවීම සුදුසු වේ.

අ22 විගණකගේ වාර්තාවේ *මතය* සඳහා වූ පදනම ඡේදයේ විගණක විස්තර කළහැකි ප්‍රමාණාත්මක අවප්‍රකාශනයක මූල්‍ය බලපෑමට උදාහරණයක් ලෙස තොග වැඩියෙන් සඳහන් වී ඇත්තම් ආදායම් බදු ආදායම් බදුවලට පෙර ලාභය, ශුද්ධ ආදායම සහ ස්කන්ධයට වන බලපෑම ප්‍රමාණියකරණය කිරීම වේ.

අ23 *මතය සඳහා පදනම* වන ඡේදයේ අත්හල තොරතුරු හෙළිදරව් කිරීම ප්‍රායෝගික නොවිය හැකි වන්නේ.:

(අ) හෙළිදරව් කිරීම් කළමනාකාරිත්වය විසින් පිළියෙල නොකිරීම හෝ එසේ නොමැතිව හෙළිදරව් කිරීම් නොමැතිව විගණකට ලබාගැනීමට නොතිබීම

---

9 මෙම තත්වය සඳහා විස්තරයක් සඳහා SLAuS 700 (සංශෝධිත) හි අ 31 ඡේදය බලන්න

10 SLAuS 510, ආරම්භක විගණන කාර්යයභාරයන්- ආරම්භක ශේෂ, 10 ඡේදය

11 SLAuS 570 (සංශෝධිත), *අඛණ්ඩ පැවැත්ම*

(ආ) විගණකගේ විනිශ්චය අනුව විගණන වාර්තාවට සාපේක්ෂව හෙළිදරව් කිරීම් අනවශ්‍ය ලෙසට අති විශාල වීම වන්නේ නම්,

අ24 මතය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති නිශ්චිත කරුණක් සම්බන්ධයෙන් අහිතකර මතයක් දැක්වීම හෝ මතය වියාචනය කිරීම වෙනත් ලෙසකින් විගණක මතයෙහි විකරණයන් අවශ්‍ය විය හැකි වූ හඳුනාගන්නා ලද අනෙකුත් කරුණු පිළිබඳ විස්තර දැක්වීම අත්හැරීමට සාධාරණ හේතුවක් නොවන්නේය. එවැනි අවස්ථාවලදී විගණක දැනුවත්ව සිටින වෙනත් කරුණු හෙළිදරව් කිරීම මූල්‍ය ප්‍රකාශ පරිශීලනය කරන්නන් හට අදාළ විය හැකිය.

*මූල්‍ය ප්‍රකාශ මත විගණක මතය වියාචනය කරන විට මූල්‍ය ප්‍රකාශවල විගණනය සඳහා විගණකගේ වගකීම්හි විස්තරය (යොමුව 28 ඡේදය)*

අ25 විගණක මූල්‍ය ප්‍රකාශ මත විගණක මතය වියාචනය කරන විට, මෙම ශ්‍රී.ලං.වි.ප්‍ර.යේ පරිශිෂ්ඨයේ 4-5 නිදර්ශන තුල සඳහන් විගණකගේ වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන කොටසේ විගණනය සඳහා විගණකගේ වගකීම් තුළ පහත ප්‍රකාශ වඩාත් හොඳින් ස්ථානගත කරයි:

- ශ්‍රී.ලං.වි.ප්‍ර 700 (සංශෝධිත) 28(අ) ඡේදය මගින් අවශ්‍ය කෙරෙන ප්‍රකාශය , ශ්‍රී.ලං.වි.ප්‍ර අනුව අස්තිත්වයේ මූල්‍ය ප්‍රකාශනවල විගණනයක් මෙහෙයවීම විගණකගේ වගකීම් වන බව සඳහන් කිරීමට සංශෝධනය කර තිබේ; සහ
- ස්වාධීනත්වය සහ වෙනත් ආචාරධර්ම වගකීම් පිළිබඳ ශ්‍රී.ලං.වි.ප්‍ර 700 (සංශෝධිත) 28(ඇ) ඡේදය මගින් අවශ්‍ය කෙරෙන ප්‍රකාශය.

*මූල්‍ය ප්‍රකාශන මත විගණක මතය වියාචනය කරන විට සැලකිල්ලට ගැනීම් (යොමුව.29 ඡේදය)*

අ26 විගණක මූල්‍ය ප්‍රකාශ මත විගණකමතය වියාචනය කරන්නේ ඇයිදැයි අවබෝධ කර ගැනීමේදී පරිශීලකයන්ට විගණකගේ වාර්තාවේ මතය වියාචනය කිරීමේ පදනමේ කොටසේ ප්‍රයෝජනවත් තොරතුරු ලබාදෙන අතර ප්‍රමාණවත් සහ යෝග්‍ය විගණන සාක්ෂි ලබාගැනීමට විගණකගේ නොහැකියාව සඳහා හේතු සැපයීම සපයන අතර ඒ මත අයෝග්‍ය විශ්වාසයකට එරෙහිව ආරාක්ෂාව තවදුරටත් විය හැකිය.කෙසේ නමුත් මතය වියාචනය කිරීමට පැනනගින කරුණු හැර ප්‍රධාන විගණන කරුණු සන්නිවේදනය, තත්වයන්වලදී යෝග්‍ය වනවාට වඩා එම කරුණු සම්බන්ධයෙන් මූල්‍ය ප්‍රකාශන සමස්තයක් ලෙස වැඩි විශ්වාසයක් වන බව යෝජනා කළහැකි අතර සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන මත මතය වියාචනය කිරීම සමග අසංගත වනු ඇත. එලෙසම මූල්‍ය ප්‍රකාශන තුල වෙනත් තොරතුරුවල සංගත බවේ විගණකගේ සලකා බැලීම් ආමන්ත්‍රණය කරමින් ශ්‍රී.ලං.වි.ප්‍ර. 720 ඃසංශෝධිත* අනුව වෙනත් තොරතුරුවල කොටස ඇතුලත් කිරීමට යෝග්‍ය නොවිය හැකිය. ඒඅනුව මෙම ශ්‍රී.ලං.වි.ප්‍ර 29 ඡේදයේ ප්‍රධාන විගණන කරුණු සන්නිවේදනය කිරීමට හෝ වෙනත් තොරතුරු මත වාර්තා කිරීමට නීතියෙන් හෝ නියාමනය මගින් විගණකට අවශ්‍ය නම් හැර මූල්‍ය ප්‍රකාශන මත මතය වියාචනය කරන විට, විගණකගේ වාර්තාවේ තුළ ඇතුළත් කිරීමෙන් ප්‍රධාන විගණන කරුණු කොටසේ හෝ වෙනත් තොරතුරු කොටසේ ඉඩනොදේ.

පාලනය පිළිබඳ වගකිව යුතු අය සමග සන්නිවේදනය (යොමුව : 30 ඡේදය)

අ27 පාලනය පිළිබඳ වගකිව යුතු අය සමග සන්නිවේදනය විගණකගේ මතයට අපේක්ෂිත විකරණයන්ට මඟ පෙන්වන තත්ත්වයන් සහ විගණකගේ මතය විකරණයේ අපේක්‍ෂිත වචන පෙළගැස්මට මං සලසන දෑ සන්නිවේදනය:

(අ) විගණක අපේක්ෂිත විකරණය(යන්) සහ විකරණය(යන්) සඳහා හේතූන් (හෝ තත්ත්වයන්) පිළිබඳ පාලනය පිළිබඳ වගකිව යුතු අය දැනුම්දීමට,

(ආ) අපේක්ෂිත විකරණය(න්) ඇතිවීමට තුඩුදුන් කරුණ(ණු) වල යථාව සම්බන්ධයෙන් හෝ කළමනාකාරිත්වය සමග එකඟ නොවූ කරුණු සනාථ කිරීම වැනි දෑ සම්බන්ධයෙන් පාලනය පිළිබඳ වගකිව යුතු අය සමග එකඟතාවයකට පැමිණීමට විගණක ඉල්ලා සිටීමට, සහ

(ඇ) අපේක්ෂිත විකරණය(න්) සඳහා තුඩුදුන් කරුණ(ණු) සම්බන්ධයෙන් යෝග්‍ය වන තැන්හි විගණකට අමතර තොරතුරු සහ පැහැදිලි කිරීම් ලබාදීමට පාලනය පිළිබඳ වගකිව යුතු අය අවස්ථාවක් ලබාදීම.

**පරිශිෂ්ටය**

(යොමුව : අ17 - 18, අ25 ඡේද)

**මතය විකරණය කිරීම් සහිත ස්වාධීන විගණකගේ වාර්තා සඳහා නිදර්ශන**

- 1 වන නිදර්ශනය : මූල්‍ය ප්‍රකාශවල ප්‍රමාණාත්මක අවප්‍රකාශනයක් නිසා කොන්දේසි සහිත මතයක් අඩංගු විගණකගේ වාර්තාව.
- 2 වන නිදර්ශනය : ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශවල ප්‍රමාණාත්මක අවප්‍රකාශනයක් නිසා අහිතකර මතයක් අඩංගු විගණකගේ වාර්තාව.
- 3 වන නිදර්ශනය : විදේශ ආශ්‍රිතයක් සම්බන්ධයෙන් යෝග්‍ය ප්‍රමාණවත් විගණන සාක්ෂි ලබාගැනීමට විගණකගේ නොහැකියාව නිසා කොන්දේසි සහිතව මතයක් අඩංගු විගණකගේ වාර්තාව.
- 4 වන නිදර්ශනය : විගණකට ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශවල තනි මූලිකාංගයක් පිළිබඳව යෝග්‍ය ප්‍රමාණවත් විගණන සාක්ෂි ලබාගැනීමට විගණකගේ නොහැකියාව නිසා මතය වියාචනය කිරීම අඩංගු කළ විගණකගේ වාර්තාව.
- 5 වන නිදර්ශනය : විගණකට මූල්‍ය ප්‍රකාශවල බහුවිධ මූලිකාංගයන් පිළිබඳව යෝග්‍ය ප්‍රමාණවත් විගණන සාක්ෂි ලබාගැනීමට විගණකගේ නොහැකියාව වීම නිසා මතය වියාචනය කිරීම අඩංගු විගණකගේ වාර්තාව.

<u>1 වන නිදර්ශන – මූල්‍ය ප්‍රකාශවල ප්‍රමාණාත්මක අවප්‍රකාශයක් නිසා කොන්දේසි සහිත මතය</u>

**මෙම නිදර්ශනාත්මක විගණකගේ වාර්තාවේ යොමුව සඳහා පහත සඳහන් තත්ත්වයන් උපකල්පනය කෙරේ. :**

- **සාධාරණ ඉදිරිපත් කිරීමේ ආකෘතිමය රාමුවක් භාවිත කරමින් ලැයිස්තුගත අස්තිත්වයක සම්පූර්ණ මූල්‍ය ප්‍රකාශ කට්ටලය විගණනය . විගණනය සමූහ විගණනයක් නොවේ. (එනම්., ශ්‍රීලං.වි.ප්‍ර. 600[12] ව්‍යාවහාර නොවේ).**
- **ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති අනුකූලව (පොදු අරමුණු සඳහා වූ ආකෘතිමය රාමුවක්) අස්තිත්වයේ කළමනාකාරිත්වය විසින් මූල්‍ය ප්‍රකාශ පිළියෙළ කරයි.**
- **ශ්‍රීලං.වි.ප්‍ර. 210[13] තුල වන මූල්‍ය ප්‍රකාශ සඳහා කළමනාකාරිත්වයේ වගකීම්හි විස්තරයේ විගණන කාර්යභාරයේ කොන්දේසි පිළිබිඹු වේ**
- **තොග අවප්‍රකාශය වී ඇත. මෙම අවප්‍රකාශය සැලකිය හැකි ප්‍රමාණාත්මක වේ. එහෙත් මූල්‍ය ප්‍රකාශනවලට පෘතුල නොවේ. (එනම් *කොන්දේසි සහිත මතයක් යෝග්‍ය වේ.*)**
- **විගණනයට ව්‍යවහාර කරන අදාල ආචාර ධර්ම අවශ්‍යතා අඩංගුව ඇත්තේ ශ්‍රී ලංකා වරලත් ගණකාධිකරණ ආයතනය විසින් නිකුත් කළ ආචාර ධර්ම සංග්‍රහයේය .**
- **ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව, ශ්‍රී.ලං.වි.ප්‍ර 570 (සංශෝධිත) අනුකූලව අඛණ්ඩ පැවැත්ම ලෙස නොකඩවා පවත්වාගෙන යාමට අස්තිත්වයේ හැකියාව පිළිබද සැලකියයුතු අන්දමේ සැකයක් පැන නැගිය හැකි සිද්ධි හෝ තත්වයන් සම්බන්ධයෙන් ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් නොපවතින බව විගණක නිගමනය කරඇත.**
- **ශ්‍රී.ලං.වි.ප්‍ර 701 අනුව ප්‍රධාන විගණන කරුණු සන්නිවේදනය කිරීම**
- **විගණක විසින් විගණකගේ වාර්තාවේ දිනයට පෙර සියළුම වෙනත් තොරතුරු ලබාගෙන තිබීම සහ ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශ මත කොන්දේසි සහිත මතයකට පැන නගින කරුණ බලපානු ලැබේ. එලෙසම වෙනත් තොරතුරුවලට බලපායි.**
- **මූල්‍ය ප්‍රකාශ අධීක්ෂණය සඳහා වග කිවයුතු පුද්ගලයන් මූල්‍ය ප්‍රකාශ පිළියෙළ කරන පුද්ගලයන්ගෙන් වෙනස් වේ.**
- **මූල්‍ය ප්‍රකාශන විගණනයට අමතරව දේශීය නීතිය යටතේ අවශ්‍ය කෙරෙන වෙනත් වාර්තාකරණය විගණකට වගකීම් තිබේ.**

[12] SLAuS 600, *විශේෂ සලකා බැලීම්—සමූහ මූල්‍ය ප්‍රකාශන විගණනය (සංරචක විගණකයින්ගේ වැඩ ඇතුලත්ව)*

[13] SLAuS 210, *විගණන කාර්යභාරයේ කොන්දේසි සමග එකඟ වීම*

**ස්වාධීන විගණකගේ වාර්තාව**

ABC සමාගමේ කොටස්හිමියන්ට [හෝ වෙනත් යෝග්‍ය ආමන්ත්‍රණය කරන්නා]

**මූල්‍ය ප්‍රකාශයන්හි විගණනය මත වාර්තාව**[14]

**කොන්දේසි සහිත මතය**

ABC සමාගමේ (සමාගම) 20×1 දෙසැම්බර් මස 31 දිනට වූ මූල්‍ය තත්ත්ව ප්‍රකාශය සහ එම දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා විස්තීරණ ආදායම් ප්‍රකාශය, ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශය සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශය සහ මූල්‍ය ප්‍රකාශවලට සටහන් ඇතුළුව වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තීන්වල සාරාංශයකින් සමන්විත මූල්‍ය ප්‍රකාශ අප විසින් විගණනය කරන ලදී.

අපගේ වාර්තාවේ කොන්දේසි සහිත මතය සඳහා පදනම වන ඡේදයේ සඳහන් කර ඇති කරුණ මත වන බලපෑම හැරුණු කොට අපගේ මතය වනුයේ ABC සමාගමේ 20x1 දෙසැම්බර් 31 දිනට එහි මූල්‍ය තත්ත්වය සහ එම දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා වූ එහි මූල්‍ය කාර්ය සාධනය සහ එහි මුදල් ප්‍රවාහ ප්‍රකාශය ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන සත්‍ය හා සාධාරණ දර්ශනයක් (හෝ සියලුම ප්‍රමාණාත්මක ආකාරයෙන් ඉදිරිපත් කර ඇති බව) දෙනු ලැබේ.

**කොන්දේසි සහිත මතය සඳහා පදනම**

මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ දිනට සමාගමේ තොග දක්වෙනුයේ ××× ලෙසය. කළමනාකාරිත්වය තොග දක්වෙනුයේ පිරිවැය සහ ශුද්ධ උපලබ්ධි අගයන්ගෙන් අඩු අගයට යන්න සඳහන් කර නැති අතර, ඒවා සඳහන් කර ඇත්තේ පිරිවැයට පමණි. මෙය ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතවලින් බැහැර වීමක් ඇති කෙරේ. කළමනාකාරිත්වය තොග පිරිවැයට හෝ ශුද්ධ උපලබ්දි අගය යන අගයන්ගේ අඩු වටිනාකමට සඳහන් කළේ නම් තොග ශුද්ධ උපලබ්ධි අගය දක්වා ලියා හැරීමට ××× වටිනාකමක් අවශ්‍ය වියහැකි බව සමාගමේ වාර්තාවල සඳහන් වේ. ඒ අනුව විකුණූ බඩුවල පිරිවැය ××× කින් ඉහළ යනු ඇති අතර පිළිවෙළින් ×××, ××× සහ ××× වටිනකම්වලින් ආදායම් බදු, ශුද්ධ ආදායම සහ කොටස් හිමියන්ගේ ස්කන්ධය අඩුවනු ඇත.

අප,ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුව අපගේ විගණනය මෙහෙයවන ලදී. එම ප්‍රමිතීන්ට අනුව අපගේ වගකීම් මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සඳහා විගණකගේ වගකීම් කොටසේ තවදුරටත් විස්තර කරනු ලැබේ. ශ්‍රී. ලංකා වරලත් ගණකාධිකරණ ආයතනය විසින් නිකුත් කළ ආචාරධර්ම සංග්‍රහයට (ආචාරධර්ම සංග්‍රහය) අනුව අප සමාගමෙන් ස්වාධීන වන අතර අප එම අවශ්‍යතාවයන්ට අනුව අපගේ අනෙකුත් ආචාරධර්ම වගකීම් ඉටුකර ඇත්තෙමු. අප ලබාගත් විගණන සාක්ෂි අපගේ කොන්දේසි සහිත මතය ප්‍රකාශ කිරීමට ප්‍රමාණවත් සහ යෝග්‍ය පදනමක් සපයන බව අපගේ විශ්වාසයයි

**වෙනත් තොරතුරු [හෝ "මූල්‍ය ප්‍රකාශන සහ ඒ මත විගණකගේ වාර්තාව මත හැර වෙනත් තොරතුරු" වැනි දෑ යෝග්‍ය නම් වෙනත් ශීර්ෂයක් )**

*[ශ්‍රී.ලං.වි.ප්‍ර. 720 (සංශෝධිත) හි වාර්තාකරණ අවශ්‍යතා අනුව වාර්තාකරණය -ශ්‍රී.ලං.වි.ප්‍ර. 720 (සංශෝධිත) හි 2 වැනි පරිශිෂ්ඨයේ 6 වැනි නිදර්ශනය බලන්න. 6 වැනි නිදර්ශනයේ වෙනත් තොරතුරු කොටසේ අවසාන ඡේදය ,වෙනත් තොරතුරුවලටද බලපාන කොන්දේසි සහිත මතයකට පැන නගින සුවිශේෂී කරුණ විස්තර කිරීමට අභිරුචිකරනය කිරිමට වේ.]*

**ප්‍රධාන විගණන කරුණු**

ප්‍රධාන විගණන කරුණු යනු ප්‍රවර්තන කාලපරිච්ඡේදයේ මූල්‍ය ප්‍රකාශනවල අපගේ විගණනය අපගේ වෘත්තිය විනිශ්චය තුල වඩාත් සැලකිලිමත් වූ කරුණු වේ. එම කරුණු මූල්‍ය ප්‍රකාශ සමස්තයක් ලෙස සහ එමගින් ඇති විගණන වාර්තාවේ අපගේ විගණනය සම්බන්ධයෙන් අවධාරණය කරන ලද අතර එම කරුණු මත වෙනමම මතයක් අප ලබාදෙන්නේ නැත. *කොන්දේසි සහිත මතයේ පදනමේ* කොටසේ විස්තර කළ කරුණට අමතරව පහත විස්තර කරන කරුණු අපගේ විගණන වාර්තාවේ සන්නිවේදනය කළයුතු ප්‍රධාන විගණන කරුණු වන බව අප නිශ්චය කළෙමු.

[14] "වෙනත් නෛතික සහ නියාමන අවශ්‍යතා මත වාර්තාව" යන දෙවැනි උප මාර්තෘකාව අදාල නොවන අවස්ථාවන්හිදී "මූල්‍ය ප්‍රකාශන මත විගණන වාර්තාව " යන උප මාර්තෘකාව අවශ්‍ය නොවේ.

*[ශ්‍රී.ලං.වි.ප්‍ර. 701 (සංශෝධිත) අනුව එක් එක් ප්‍රධාන විගණන කරුණේ විස්තරය.]*

**මූල්‍ය ප්‍රකාශ සඳහා කළමනාකරණය සහ පාලනය පිළිබඳ වගකිවයුතු අය සමඟ සන්නිවේදනය**[15]

*[ශ්‍රී.ලං.වි.ප්‍ර. 700 (සංශෝධිත) අනුව වාර්තාකරණය – [ ශ්‍රී.ලං.වි.ප්‍ර. 700 (සංශෝධිත) හි 1 වැනි නිදර්ශනය බලන්න.).]*

**මූල්‍ය ප්‍රකාශ විගණනය සඳහා විගණකගේ වගකීම්**

*[ශ්‍රී.ලං.වි.ප්‍ර. 700 (සංශෝධිත) අනුව වාර්තාකරණය –* [ ශ්‍රී.ලං.වි.ප්‍ර. 700 (සංශෝධිත) හි 1 වැනි නිදර්ශනය බලන්න.).]

**වෙනත් නෛතික සහ නියාමන අවශ්‍යතා මත වාර්තාව**

*[ශ්‍රී.ලං.වි.ප්‍ර. 700 (සංශෝධිත) අනුව වාර්තාකරණය – [ ශ්‍රී.ලං.වි.ප්‍ර. 720 (සංශෝධිත) හි 1 වැනි නිදර්ශනය බලන්න.).]*

මෙම ස්වාධීන විගණකගේ වාර්තාව අත්සන් කිරීම සඳහා වගකිව යුතු කාර්යය භාරයේ නියුතු හවුල්කරුගේ ශ්‍රී ලංකා වරලත් ගණකාධිකරණ ආයතනයේ සාමාජික අංකය වන්නේ [*සාමාජික අංකය*].

[විගණන සමාගම නමින් අත්සන*] [විගණන ආයතනයේ ලිපිනය]*

[*දිනය*]

<u>2 වන නිදර්ශනය – ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශනවල ප්‍රමාණාත්මක අවප්‍රකාශයන් නිසා අහිතකර මතය</u>

**මෙම නිදර්ශනාත්මක විගණක වාර්තාවේ අරමුණ සඳහා පහත සඳහන් තත්ත්වයන් උපකල්පනය කෙරේ:**

- **සාධාරණ ඉදිරිපත් කිරීමේ ආකෘතිමය රාමුවක් භාවිත කරමින් ලැයිස්තුගත අස්තිත්වයක සම්පූර්ණ ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන කට්ටලයක් විගණනය. විගණනය පරිපාලිතයන් සමග අස්තිත්වයක සමූහයක විගණනයක් වේ. (එනම්., ශ්‍රී.ල.වි.ප්‍ර. 600 ව්‍යාවහාර වේ).**
- **ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත (පොදු අරමුණු සඳහා වූ ආකෘතිමය රාමුවක්) අනුකූලව අස්තිත්වයේ කළමනාකාරිත්වය විසින් ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කරයි.**
- **ශ්‍රී.ල.වි.ප්‍ර. 210හි මූල්‍ය ප්‍රකාශන සඳහා කළමනාකාරිත්වයේ වගකීම්හි විස්තරයේ විගණන කාර්යභාරයේ කොන්දේසි පිළිබිඹු වේ.**
- **පරිපාලිතයක් ඒකාබද්ධ නොකිරීම නිසා ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක ලෙස අවප්‍රකාශය වී ඇත ප්‍රමාණාත්මක අවප්‍රකාශ ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශනවලට පෘතුල ලෙස සැලකිය හැකිය. අවප්‍රකාශවල බලපෑම නිර්ණය කිරීම ප්‍රායෝගික නොවන නිසා ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශනවලට වන බලපෑම නිර්ණය කර නැත (එනම් අහිතකර මතයක් යෝග්‍ය වේ.)**
- **විගණනයට ව්‍යවහාර කරන අදාල ආචාර ධර්ම අවශ්‍යතා අඩංගුව ඇත්තේ ශ්‍රී ලංකා වරලත් ගණකාධිකරණ ආයතනය විසින් නිකුත් කළ ආචාර ධර්ම සංග්‍රහයේය.**
- **ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව, ශ්‍රී.ලං.වි.ප්‍ර 570 (සංශෝධිත) අනුව අඛණ්ඩ පැවැත්ම ලෙස නොකඩවා පවත්වාගෙන යාමට අස්තිත්වයේ හැකියාව පිළිබඳ සැලකිය යුතු අන්දමේ සැකයක් පහළ කළ හැකි සිද්ධිය හෝ තත්වයන් සම්බන්ධයෙන් ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් නොපවතින බව විගණක නිර්ණය කර ඇත**
- **ශ්‍රී.ලං.වි.ප්‍ර 701 ව්‍යවහාර කෙරේ; කෙසේවෙතත් අහිතකර මතය සඳහා කොටසේ විස්තර කළ කරුණ හැර විගණක ප්‍රධාන විගණන කරුණු නොමැති බව නිශ්චය කර තිබීම.**
- **විගණක, විගණකගේ වාර්තාවේ දිනයට පෙර සියළුම වෙනත් තොරතුරු ලබාගෙන තිබෙන අතර ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශ මත අහිතකර මතය දීමට හේතු වූ කරුණද එසේම වෙනත් තොරතුරුවල බලපානු ඇත.**
- **මූල්‍ය ප්‍රකාශ අධීක්ෂණය සඳහා වග කිවයුතු පුද්ගලයන් මූල්‍ය ප්‍රකාශ පිළියෙළ කරන පුද්ගලයන්ගෙන් වෙනස් වේ.**
- **ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන විගණනය කිරිමට විගණකට දේශීය නීති යටතේ අවශ්‍ය කෙරෙන වෙනත් වාර්තාකරණය වගකීම් විගණකට ඇත.**

---

[15] මෙම නිදර්ශනාත්මක විගණකගේ වාර්තා පුරාම කළමනාකරනය සහ පාලනය පිළිබඳ වගකිව යුතු අය යන පද අදාල අධිකරණ ප්‍රදේශයන් තුල නිතිමය ආකෘතිමය රාමුව සම්බන්ධයෙන් ගත්කළ යෝග්‍ය පරිදි තවත් පදයක් මගින් ඇති කිරිම අවශ්‍ය විය හැකිය..

## ස්වාධීන විගණකගේ වාර්තාව

ABC සමාගමේ කොටස්හිමියන්ට [හෝ හෝ වෙනත් යෝග්‍ය ආමන්ත්‍රණය කරන්නා]

### ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන මත වාර්තාව[16]

අහිතකර මතය

ABC සමාගමේ සහ එහි පරිපාලිතයන්හි (සමූහය) 20×1 දෙසැම්බර් මස 31 දිනට ඒකාබද්ධ මූල්‍ය තත්ත්ව ප්‍රකාශය සහ එම දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා ඒකාබද්ධ විස්තීරණ ආදායම් ප්‍රකාශය සහ ඒකාබද්ධ ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශය සහ ඒකාබද්ධ මුදල් ප්‍රවාහ ප්‍රකාශය සහ මූල්‍ය ප්‍රකාශනවලට සටහන් ඇතුළුව වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තීන්වල සාරංශයකින් සමන්විත මූල්‍ය ප්‍රකාශ අප විසින් විගණනය කරන ලදී.

සමූහයේ මූල්‍ය ප්‍රකාශන මත අපගේ වාර්තාවේ *අහිතකර මතය සඳහා පදනම* වන ඡේදයේ සඳහන් කර ඇති කරුණේ වැදගත්කම නිසා ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත අනුව 20X1 දෙසැම්බර් 31 දිනට සමූහයේ ඒකාබද්ධ මූල්‍ය තත්ත්වය සහ එම දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා වූ එහි ඒකාබද්ධ මූල්‍ය කාර්යසාධනය සහ ඒකාබද්ධ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය මගින් අපගේ මතය වනුයේ මේ සමග ඇති ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන සත්‍ය හා සාධාරණ දර්ශනයක් පෙන්නුම් නොකෙරෙන බවයි.( හෝ සාධාරණ ආකාරයෙන් ඉදිරිපත් නොකරයි )

### අහිතකර මතය සඳහා පදනම

X සටහනෙන් පැහැදිලි කළ පරිදි, 20×1 වර්ෂය තුළදී සමූහය අත්පත්කර ගත් XYZ පරිපාලිත සමාගමේ ප්‍රමාණාත්මක වත්කම් සහ වගකීම්වල අත්පත් කරගත් දින සාධාරණ වටිනාකම තවමත් නිසැකව දැන ගැනීමට නොහැකිවීම නිසා එහි මූල්‍ය ප්‍රකාශන, සමූහය ඒකාබද්ධ කර නැත. එමනිසා මෙම ආයෝජනය පිරිවැය පදනම මත ගිණුම්ගත කර ඇත. ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත යටතේ සමාගම මෙම පරිපාලනය එය ඒකාබද්ධ කළයුතුව සහ අත්පත්කර ගැනීම තාවකාලික වටිනාකම මත ගිණුම්ගත කළ යුතුව තිබිණ. XYZ සමාගම ඒකාබද්ධ කළේ නම් මේ සමග ඇති මූල්‍ය ප්‍රකාශනවල බොහෝ මූලිකාංගවලට ප්‍රමාණාත්මක ලෙස බලපෑම් සිදුවිය හැකිය. ඒකාබද්ධ කිරීමට අපොහොසත් වීම නිසා ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන මත වන බලපෑම නිර්ණය කර නැත.

අප,ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුව අපගේ විගණනය මෙහෙයවන ලදී. එම ප්‍රමිතීන්ට අනුව අපගේ වගකීම් මෙම වාර්තාවේ *ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන මත විගණනයේ විගණකගේ වගකීම්* කොටසේ තවදුරටත් විස්තර කරනු ලැබේ. ශ්‍රී ලංකා වරලත් ගණකාධිකරණ ආයතනය විසින් නිකුත් කළ ආචාර ධර්ම සංග්‍රහයට (ආචාර ධර්ම සංග්‍රහය) අනුව අප සමූහයෙන් ස්වාධීන වන අතර අප එම අවශ්‍යතාවයන්ට අනුව අපගේ අනෙකුත් ආචාරධර්ම වගකීම් සම්පූර්ණ කර ඇත්තෙමු. අප ලබාගත් විගණන සාක්ෂි අහිතකර මතයක් ප්‍රකාශ කිරීමට ප්‍රමාණවත් සහ යෝග්‍ය පදනමක් සපයන බව අපගේ විශ්වාසයයි.

### වෙනත් තොරතුරු [හෝ "මූල්‍ය ප්‍රකාශන සහ විගණකගේ වාර්තාව මත හැර වන වෙනත් තොරතුරු" වැනි දෑ යෝග්‍ය නම් වෙනත් ශීර්ෂයක් )

[*ශ්‍රී.ලං.වි.ප්‍ර. 720 (සංශෝධිත) හි වාර්තාකරණ අවශ්‍යතා අනුව වාර්තාකරණය -ශ්‍රී.ලං.වි.ප්‍ර. 720 (සංශෝධිත) හි 2 වැනි පරිශිෂ්ඨයේ 7 වැනි නිදර්ශනය බලන්න. 7 වැනි නිදර්ශනයේ වෙනත් තොරතුරු කොටසේ අවසාන ඡේදය ,වෙනත් තොරතුරුවලටද බලපාන අහිතකර සහිත මතයකට පැන නගින සුවිශේෂි කරුණ විස්තර කිරීමට අභිරුචිකරණය කිරීමට වේ.*]

### ප්‍රධාන විගණන කරුණු

අහිතකර *මතය සඳහා පදනමේ* කොටසේ විස්තර කළ කරුණ හැර අපගේ වාර්තාවේ සන්නිවේදනය කළයුතු වෙනත් ප්‍රධාන විගණන කරුණු නොමැති බව නිශ්චය කළෙමු.

---

[16] මෙම නිදර්ශනාත්මක විගණකගේ වාර්තා පුරාම කළමනාකරනය සහ පාලනය පිළිබඳ වගකිව යුතු අය යන පද අදාල අධිකරණ ප්‍රදේශයන් තුල නීතිමය ආකෘතිමය රාමුව සම්බන්ධයෙන් ගත්කළ යෝග්‍ය පරිදි තවත් පදයක් මගින් ඇති කිරිම අවශ්‍ය විය හැකිය..

**ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන සඳහා කළමනාකරණය සහ පාලනය පිළිබඳ වගකිව යුතු අය සමඟ සන්නිවේදනය**[17]

*[ශ්‍රී.ලං.වි.ප්‍ර. 700 (සංශෝධිත) අනුව වාර්තාකරණය – [ ශ්‍රී.ලං.වි.ප්‍ර. 700 (සංශෝධිත) හි 2 වැනි නිදර්ශනය බලන්න.).]*

**ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන විගණනය සඳහා විගණකගේ වගකීම්**

*[ශ්‍රී.ලං.වි.ප්‍ර. 700 (සංශෝධිත) අනුව වාර්තාකරණය – [ ශ්‍රී.ලං.වි.ප්‍ර. 700 (සංශෝධිත) හි 2 වැනි නිදර්ශනය බලන්න.).]*

**වෙනත් නෛතික සහ නියාමන අවශ්‍යතා මත වාර්තාව**

*[ශ්‍රී.ලං.වි.ප්‍ර. 700 (සංශෝධිත) අනුව වාර්තාකරණය – [ ශ්‍රී.ලං.වි.ප්‍ර. 700 (සංශෝධිත) හි 2 වැනි නිදර්ශනය බලන්න.).]*

මෙම ස්වාධීන විගණකගේ වාර්තාව අත්සන් කිරීම සඳහා වගකිව යුතු කාර්යය භාරයේ නියුතු හවුල්කරුගේ ශ්‍රී ලංකා වරලත් ගණකාධිකරණ ආයතනයේ සාමාජික අංකය වන්නේ [සාමාජික අංකය].

[විගණන සමාගම නමින් අත්සන*] [විගණන සමාගමේ ලිපිනය]*

[*දිනය*]

<u>3 වන නිදර්ශනය – විදේශිය ආශ්‍රිතයක යෝග්‍ය ප්‍රමාණවත් විගණන සාක්ෂි ලබාගැනීමට විගණකගේ නොහැකියාව වීම නිසා කොන්දේසි සහිතව මතය</u>

**මෙම නිදර්ශනාත්මක විගණකගේ වාර්තාවේ අරමුණු සඳහා පහත සඳහන් තත්ත්වයන් උපකල්පනය කෙරේ:**

- **සාධාරණ ඉදිරිපත් කිරීමේ ආකෘතිමය රාමුවක් භාවිතයෙන් ලැයිස්තුගත අස්තිත්වයක සම්පූර්ණ ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන කට්ටලයක් විගණනය. විගණනය පරිපාලිතයන් සමග අස්තිත්වයක සමූහ විගණනයක් වේ. (එනම්, ශ්‍රී.ල.වි.ප්‍ර. 600 ව්‍යාවහාර වේ).**
- **ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත (පොදු අරමුණු සඳහා වූ ආකෘතිමය රාමුවක්) අනුකූලව අස්තිත්වයේ කළමනාකාරිත්වය විසින් ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම.**
- **ශ්‍රී.ල.වි.ප්‍ර. 210හි ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන සඳහා කළමනාකාරිත්වයේ වගකීම්හි විස්තරයේ විගණකගේ කාර්යභාරයේ කොන්දේසි පිළිබිඹු වේ.**
- **විදේශ ආශ්‍රිතයක කරන ලද අයෝජනයක් පිළිබඳ ප්‍රමාණවත් විගණන සාක්ෂි විගණකට ලබාගත නොහැකි වී ඇත. ප්‍රමාණාත්මක යෝග්‍ය විගණන සාක්ෂි ලබාගැනීමේ නොහැකියාවේ බලපෑම සැලකිය හැකි තරම් ප්‍රමාණාත්මක වූවත් ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශනවලට පෘතුල නොවේ (එනම් කොන්දේසි සහිත මතයක් යෝග්‍ය වේ).**
- **විගණනයට ව්‍යවහාර කරන අදාල ආචාර ධර්ම අවශ්‍යතා අඩංගුව ඇත්තේ ශ්‍රී ලංකා වරලත් ගණකාධිකරණ ආයතනය විසින් නිකුත් කළ ආචාර ධර්ම සංග්‍රහයේය.**
- **ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව, ශ්‍රී.ලං.වි.ප්‍ර 570 (සංශෝධිත) අනුව අඛණ්ඩ පැවැත්ම ලෙස නොකඩවා පවත්වාගෙන යාමට අස්තිත්වයේ හැකියාව මත සැලකියයුතු සැකයක් පැන නැගිය හැකි සිද්ධිය හෝ තත්වයන් සම්බන්ධයෙන් ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් නොපවතින බව විගණක නිගමනය කිරීම**
- **ශ්‍රී.ලං.වි.ප්‍ර 701 අනුව ප්‍රධාන විගණන කරුණු සන්නිවේදනය කර ඇත**
- **විගණක විසින් විගණකගේ වාර්තාවේ දිනයට පෙර සියළුම වෙනත් තොරතුරු ලබාගෙන ඇති අතර ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන මත කොන්දේසි සහිත මතයකට පැන නගින කරුණ එලෙස වෙනත් තොරතුරුවලට බලපානු ඇත.**
- **ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශ අධීක්ෂණය සඳහා වග කිවයුතු පුද්ගලයන් මූල්‍ය ප්‍රකාශ පිළියෙළ කරන පුද්ගලයන්ගෙන් වෙනස් වේ.**
- **ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන විගණනයට අමතරව දේශීය නීති යටතේ අවශ්‍ය කෙරෙන වෙනත් වාර්තාකරණය කිරිමේ වගකීම් විගණකට ඇත.**

---

[17] මෙම නිදර්ශනාත්මක විගණකගේ වාර්තා පුරාම කළමනාකරනය සහ පාලනය පිළිබඳ වගකිව යුතු අය යන පද අදාල අධිකරණ ප්‍රදේශයන් තුල නීතිමය ආකෘතිමය රාමුව සම්බන්ධයෙන් ගත්කළ යෝග්‍ය පරිදි තවත් පදයක් මගින් ඇති කිරීම අවශ්‍ය විය හැකිය.

## ස්වාධීන විගණකගේ වාර්තාව

ABC සමාගමේ කොටස්හිමියන්ට [හෝ වෙනත් යෝග්‍ය ආමන්ත්‍රණය කරන්නා]

### ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශ මත වාර්තාව[18]

ABC සමාගමේ සහ එහි පරිපාලිතයන්හි (සමූහය) 20×1 දෙසැම්බර් මස 31 දිනට ඒකාබද්ධ මූල්‍ය තත්ත්ව ප්‍රකාශය සහ එම දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා ඒකාබද්ධ විස්තීරණ ආදායම් ප්‍රකාශය සහ ඒකාබද්ධ ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශය සහ ඒකාබද්ධ මුදල් ප්‍රවාහ ප්‍රකාශය සහ මූල්‍ය ප්‍රකාශනවලට සටහන් ඇතුළුව වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තීන්වල සාරාංශයකින් සමන්විත මූල්‍ය ප්‍රකාශ අප විසින් විගණනය කරන ලදී.

ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත අනුව 20X1 දෙසැම්බර් 31 දිනට එහි සමූහයේ මූල්‍ය තත්ත්වය සහ එම දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා වූ එහි ඒකාබද්ධ මූල්‍ය කාර්යසාධනය සහ එහි ඒකාබද්ධ මුදල් ප්‍රවාහ මගින් අපගේ වාර්තාවේ කොන්දේසි සහිත මතය සඳහා පදනම වන ඡේදයේ විස්තර කර ඇති කරුණ මත වියහැකි බලපෑම හැරුණු කොට අපගේ මතය වනුයේ මේ සමඟ ඇති ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන සත්‍ය හා සාධාරණ දර්ශනයක් පෙන්වන බවයි. (හෝ සියලුම ප්‍රමාණාත්මක අංගයන්ගෙන් සාධාරණව ඉදිරිපත් කර ඇත).

### කොන්දේසි සහිත මතයක් සඳහා වූ පදනම

වර්ෂය තුලදී අත්කරගත් විදේශීය ආශ්‍රිතයක් වන XYZ සමාගමේ කරන ලද සමූහයේ අයෝජන ABC සමාගම ස්කන්ධ ක්‍රමයට ගිණුම්ගත කර ඇති අතර එහි 20X1 දෙසැම්බර් 31 දින ඒකාබද්ධ මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ ××× අගයකට පවත්වාගෙන යන අතර XYZ හි ශුද්ධ ආදායමේ ABC හි කොටස එම වර්ෂය සඳහා ABC ආදායම තුල ඇතුලත් වේ. 20X1 දෙසැම්බර් 31 දින ABC සමාගම විසින් XYZ හි කරන ලද ආයෝජනයේ ධාරණ අගය සහ XYZ හි වර්ෂයේ ශුද්ධ ආදායමේ ABC හි කොටස පිළිබඳව යෝග්‍ය ප්‍රමාණවත් විගණන සාක්ෂි XYZ සමාගමේ මූල්‍ය තොරතුරුවලට, කළමනාකාරිත්වය මගින්, විගණකවරුන්ට ප්‍රවේශවීමට අවස්ථාවක් අහිමි කිරීම නිසා අපහට ලබාගත නොහැකි විය. ඒ නිසාවෙන් මෙම වටිනාකම්වලට කිසියම් ගැලපුම් කිරීමක් අවශ්‍යද යන්න අපහට නිර්ණය කිරීමට නොහැකි විය.

අප,ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුව අපගේ විගණනය මෙහෙයවන ලදී. එම ප්‍රමිතීන් යටතේ අපගේ වගකීම් අපගේ වාර්තාවේ ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශ විගණනය සඳහා *විගණකගේ වගකීම්* කොටසේ තවදුරටත් විස්තර කරනු ලැබේ. ශ්‍රී ලංකා වරලත් ගණකාධිකරණ ආයතනය විසින් නිකුත් කළ ආචාරධර්ම සංග්‍රහයට අනුව අප සමාගමෙන් ස්වාධීන වන අතර අප එම අවශ්‍යතාවයන්ට අනුව අපගේ අනෙකුත් ආචාරධර්ම වගකීම් ඉටුකර ඇත්තෙමු. අප ලබාගත් විගණන සාක්ෂි කොන්දේසි සහිත මතයක් ප්‍රකාශ කිරීමට ප්‍රමාණවත් සහ යෝග්‍ය පදනමක් සපයන බව අපගේ විශ්වාසයයි

### වෙනත් තොරතුරු [හෝ "මූල්‍ය ප්‍රකාශන සහ විගණකගේ වාර්තාව මත හැර වන වෙනත් තොරතුරු" වැනි දෑ යෝග්‍ය නම් වෙනත් ශීර්ෂයක් )

[ශ්‍රී.ලං.වි.ප්‍ර. 720 (සංශෝධිත) හි වාර්තාකරණ අවශ්‍යතා අනුව වාර්තාකරණය -ශ්‍රී.ලං.වි.ප්‍ර. 720 (සංශෝධිත) හි 2 වැනි පරිශිෂ්ඨයේ 6 වැනි නිදර්ශනය බලන්න. 6 වැනි නිදර්ශනයේ වෙනත් තොරතුරු කොටසේ අවසාන ඡේදය ,වෙනත් තොරතුරුවලටද බලපාන කොන්දේසි සහිත මතයකට පැන නගින සුවිශේෂි කරුණ විස්තර කිරීමට අභිරුචිකරණය කිරීමට වේ.]

---

18 "වෙනත් නෛතික සහ නියාමන අවශ්‍යතා මත වාර්තාව" යන දෙවැනි උප මාර්තෘකාවඅදාල නොවන අවස්ථාවන්හිදී "ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන මත විගණන වාර්තාව " යන උප මාර්තෘකාව අවශ්‍ය නොවේ.

**ප්‍රධාන විගණන කරුණු**

ප්‍රධාන විගණන කරුණු යනු ප්‍රවර්තන කාලපරිච්ජේදයේ ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශනවල අපගේ විගණනය තුලදී වඩාත් අපගේ වෘත්තිය විනිශ්චය අනුව වඩාත් වැදගත් වූ එම කරුණු ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන සමස්තයක් ලෙස ගත්කළ අපගේ විගණනය සම්බන්ධව ඒමත අපගේ මතය සකස් කිරීමේදී එම කරුණු මත වෙනමම මතයක් අප ලබාදී නැත. *කොන්දේසි සහිත මතය පදනමේ* කොටසේ විස්තර කළ කරුණට අමතරව පහත විස්තර කරන කරුණු අපගේ වාර්තාවේ සන්නිවේදනය කළයුතු ප්‍රධාන විගණන කරුණු වන බව අප නිර්ණය කළෙමු.

*[*ශ්‍රී.ලං.වි.ප්‍ර. 701 (සංශෝධිත) අනුව *එක් එක් ප්‍රධාන විගණන කරුණේ විස්තරය.]*

**ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන මත කළමනාකරණය සහ පාලනය පිළිබද වගකිව යුතු අය සමඟ සන්නිවේදනය**[19]

*[*ශ්‍රී.ලං.වි.ප්‍ර. 700 (සංශෝධිත) අනුව *වාර්තාකරණය* – [ *ශ්‍රී.ලං.වි.ප්‍ර. 700 (සංශෝධිත) හි 2 වැනි නිදර්ශනය බලන්න.).]*

**ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන විගණනය සඳහා විගණකගේ වගකීම්**

*[*ශ්‍රී.ලං.වි.ප්‍ර. 700 (සංශෝධිත) අනුව *වාර්තාකරණය* – [ *ශ්‍රී.ලං.වි.ප්‍ර. 700 (සංශෝධිත) හි 2 වැනි නිදර්ශනය බලන්න.).]*

**වෙනත් නෛතික සහ නියාමන අවශ්‍යතා මත වාර්තාව**

*[*ශ්‍රී.ලං.වි.ප්‍ර. 700 (සංශෝධිත) අනුව *වාර්තාකරණය* – [ *ශ්‍රී.ලං.වි.ප්‍ර. 700 (සංශෝධිත) හි 2 වැනි නිදර්ශනය බලන්න.).]*

මෙම ස්වාධීන විගණකගේ වාර්තාව සඳහා වගකිව යුතු කාර්යය භාරයේ නියුතු හවුල්කරුගේ ශ්‍රී ලංකා වරලත් ගණකාධිකරණ ආයතනයේ සාමාජික අංකය වන්නේ [*සාමාජික අංකය*].

[විගණන සමාගම නමින් අත්සන*] [*විගණන සමාගමේ ලිපිනය*]*

*දිනය*

<u>4 වන නිදර්ශනය– ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශනවල තනි මූලිකාගංයක් පිළිබද ප්‍රමාණවත් සහ යෝග්‍ය විගණන සාක්ෂි ලබා ගැනීමේ විගණකගේ නොහැකියාව හේතුවෙන් මතය වියාචනය කිරීම</u>

**මෙම නිදර්ශනාත්මක විගණකගේ වාර්තාවේ අරමුණු සඳහා පහත සඳහන් තත්ත්වයන් උපකල්පනය කෙරේ:**

- **සාධාරණ ඉදිරිපත් කිරීමේ ආකෘතිමය රාමුවක් භාවිතයෙන් ලැයිස්තුගත අස්තිත්වයක් නොවන අස්තිත්වයක සම්පූර්ණ ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන කට්ටලයක් විගණනය කිරීම (එනම්., ශ්‍රී.ල.වි.ප්‍ර. 600 ව්‍යාවහාර වේ).**
- **ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත (පොදු අරමුණු සඳහා වූ ආකෘතිමය රාමුවක්) අනුකූලව අස්තිත්වයේ කළමනාකාරිත්වය විසින් ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කරයි.**
- **ශ්‍රී.ල.වි.ප්‍ර. 210හි ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන සඳහා කළමනාකාරිත්වයේ වගකීම්හි විස්තරයේ විගණකගේ කාර්යභාරයේ කොන්දේසි පිළිබිඹු වේ.**
- **ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශනවල තනි මූලිකාංගයක් පිළිබඳව ප්‍රමාණවත් යෝග්‍ය විගණන සාක්ෂි විගණකට ලබාගත නොහැකි විය. එය නම් අස්තිත්වයේ ශුද්ධ වත්කම් වලින් 90% කට වඩා වැඩි ප්‍රමාණයක් නියෝජනය කරන බද්ධ ව්‍යාපාරයක ආයෝජනයක මූල්‍ය තොරතුරු පිළිබඳව යෝග්‍ය ප්‍රමාණවත් විගණන සාක්ෂි ලබාගැනීමට විගණකට නොහැකි විය. මෙම ප්‍රමාණවත් උචිත විගණන සාක්ෂි ලබාගැනීමට නොහැකිවීම නිසා ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන වලට විය හැකි බලපෑම ප්‍රමාණාත්මක මෙන්ම පෘතුල ද වේ. (එනම් මතය වියාචනය කිරීම යෝග්‍ය වේ.)**
- **විගණනයට ව්‍යවහාර කරන අදාල ආචාර ධර්ම අවශ්‍යතා අඩංගුව ඇත්තේ ශ්‍රී ලංකා වරලත් ගණකාධිකරණ ආයතනය විසින් නිකුත් කළ ආචාර ධර්ම සංග්‍රහයේය.**
- **ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශ අධීක්ෂණය සඳහා වග කිවයුතු පුද්ගලයන් මූල්‍ය ප්‍රකාශ පිළියෙළ කරන පුද්ගලයන්ගෙන් වෙනස් වේ.**
- **විගණකගේ වගකීම් කොටසේ වඩාත් සීමිත විස්තරයක් අවශ්‍ය වේ.**

[19] හෝ අදාල අධිකරණ බල ප්‍රදේශයේ නෛතික ආකෘතිමය රාමුවේ සම්බන්ධය තුල ගත්කළ යෝග්‍ය වන වෙනත් පද

- **ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන විගණනයට අමතරව දේශීය නීති යටතේ අවශ්‍ය කෙරෙන වෙනත් වාර්තාකරණය කළයුතු වගකීම් විගණකට ඇත.**

**ස්වාධීන විගණකගේ වාර්තාව**

ABC සමාගමේ කොටස් හිමියන්ට [හෝ වෙනත් යෝග්‍ය ආමන්ත්‍රණය කරන්නා]

**ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන විගණනය මත වාර්තාව**[20]

මතය වියාචනය කිරීම

ABC සමාගමේ සහ එහි පරිපාලිතයන්හි (සමූහය) 20×1 දෙසැම්බර් මස 31 දිනට ඒකාබද්ධ මූල්‍ය තත්ත්ව ප්‍රකාශය සහ එම දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා ඒකාබද්ධ විස්තීරණ ආදායම් ප්‍රකාශය සහ ඒකාබද්ධ ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශය සහ ඒකාබද්ධ මුදල් ප්‍රවාහ ප්‍රකාශය සහ මූල්‍ය ප්‍රකාශනවලට සටහන් ඇතුළුව වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තීන්වල සාරංශයකින් සමන්විත මූල්‍ය ප්‍රකාශ විගණනයට අප නියුක්ත කර ගන්නා ලදී.

අප මේ සමග එක්ව ඇති සමූහයේ ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශ මත මතයක් ප්‍රකාශ නොකරන්නෙමු. අපගේ වාර්තාවේ *මතය වියාචනය කිරීමේ පදනම* කොටසේ විස්තර කළ කරුණේ වැදගත්කම නිසා, මෙම ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන මත විගණන මතයක් සඳහා පදනමක් ලබා දීමට අපහට ප්‍රමාණවත් සහ යෝග්‍ය විගණන සාක්ෂි ලබා ගැනීමට නොහැකි විය.

**මතය වියාචනය කිරීම සඳහා වූ පදනම**

සමූහයේ බද්ධ ව්‍යාපාරයක් වන XYZ (සමාගමේ ) හි ආයෝජනය සමූහයේ ඒකාබද්ධ මූල්‍ය තත්ත්ව ප්‍රකාශයේ පවත්වාගෙන ගොස් ඇත්තේ××× වටිනාකමකට වන අතර එය 20X1 දෙසැම්බර් 31 දිනට සමූහයේ ශුද්ධ වත්කම් වලින් 90% කට වඩා වැඩි ප්‍රමාණයක් නියෝජනය කරයි. XYZ සමාගමේ විගණකවරුන්ගේ විගණන ලේඛනගතකිරීම ඇතුළුව XYZ හි කළමනාකාරිත්වයට සහ විගණකවරුන්ට ප්‍රවේශ වීම සඳහා අපහට අවසර නොලැබුණි. එහි ප්‍රතිඵලයක් වශයෙන් බද්ධව පාලනය කරන XYZ සමාගමේ වත්කම්වල සමූහයේ සමානුපාතික කොටස, බද්ධව වගකියන XYZ හි වගකීම්වල එහි සමානුපාතික කොටස, වර්ෂය සඳහා XYZ හි ආදායම් සහ වියදම්හි සමානුපාතික කොටස සහ ඒකාබද්ධ ස්කන්ධය වෙනස්වීම සහ ඒකාබද්ධ මුදල් ප්‍රවාහ ප්‍රකාශ සෑදීම සඳහා අවශ්‍ය මූලිකාංගයන් සම්බන්ධයෙන් යම් ගැලපිලි සිදුකිරීම අවශ්‍යදැයි නිර්ණය කිරීමට අපහට නොහැකි විය

**ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශ සඳහා කළමනාකරණය සහ පාලනය පිළිබඳ වගකිව යුතු අය සමඟ සන්නිවේදනය**[21]

[ශ්‍රී.ලං.වි.ප්‍ර. 700 (සංශෝධිත) අනුව *වාර්තාකරණය* – [ *ශ්‍රී.ලං.වි.ප්‍ර. 700 (සංශෝධිත) හි 4 වැනි නිදර්ශනය බලන්න.).]*

**ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශ විගණනය සඳහා විගණකගේ වගකීම්**

අපගේ වගකීම වන්නේ ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුව සමූහයේ මූල්‍ය ප්‍රකාශ මත අපගේ විගණනය මෙහෙයවා විගණකගේ වාර්තාව නිකුත් කිරීමයි. කෙසේ නමුත් අපගේ වාර්තාවේ *මතය වියාචනය කිරීමේ පදනම කොටසේ* විස්තර කළ කරුණ නිසා, මෙම ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශ මත විගණන මතයක් සඳහා පදනමක් සැපයීමට අපහට ප්‍රමාණවත් සහ යෝග්‍ය විගණන සාක්ෂි ලබා ගැනීමට නොහැකි විය.

ශ්‍රී ලංකා වරලත් ගණකාධිකරණ ආයතනය විසින් නිකුත් කළ ආචාර ධර්ම සංග්‍රහයට අනුව අප සමූහයෙන් ස්වාධීන වන අතර අප එම අවශ්‍යතාවයන්ට අනුව අපගේ අනෙකුත් ආචාරධර්ම වගකීම් ඉටු කර ඇත්තෙමු.

---

20 “වෙනත් නෛතික සහ නියාමන අවශ්‍යතා මත වාර්තාව” යන දෙවැනි උප මාතෘකාව අදාල නොවන අවස්ථාවන්හිදී “ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන මත විගණන වාර්තාව ” යන උප මාතෘකාව අවශ්‍ය නොවේ.

21 හෝ අදාල අධිකරණ බල ප්‍රදේශයේ නෛතික ආකෘතිමය රාමුවේ සම්බන්ධය තුල ගත්කළ යෝග්‍ය වන වෙනත් පද

**වෙනත් නෛතික සහ නියාමන අවශ්‍යතා මත වාර්තාව**

***[ශ්‍රී.ලං.වි.ප්‍ර. 700 (සංශෝධිත) අනුව වාර්තාකරණය– [ ශ්‍රී.ලං.වි.ප්‍ර. 700 (සංශෝධිත) හි 4 වැනි නිදර්ශනය බලන්න.).]***

[*විගණන සමාගම නමින් අත්සන*] [*විගණන සමාගමේ ලිපිනය*]

[*දිනය*]

5 වන නිදර්ශනය– මූල්‍ය ප්‍රකාශනවල බහු අංශික මූලිකාංගයක් පිළිබඳ ප්‍රමාණවත් සහ යෝග්‍ය විගණන සාක්ෂි ලබා ගැනීමේ විගණකට නොහැකියාව නිසා මතය ව්‍යාවචනය කිරීම

**මෙම නිදර්ශනාත්මක විගණකගේ වාර්තාවේ අරමුණ සඳහා පහත සඳහන් තත්ත්වයන් උපකල්පනය කෙරේ:**

- **සාධාරණ ඉදිරිපත් කිරීමේ ආකෘතිමය රාමුවක් භාවිතයෙන් ලැයිස්තුගත අස්තිත්වයක් නොවන අස්තිත්වයක සම්පූර්ණ මූල්‍ය ප්‍රකාශ කට්ටලයක් විගණනය කිරීම. විගණනය සමූහ විගණනයක් නොවේ. (එනම්, ශ්‍රී.ල.වි.ප්‍ර. 600 ව්‍යාවහාර නොකෙරේ).**
- **ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත (පොදු අරමුණු සඳහා වූ ආකෘතිමය රාමුවක්) අනුකූලව අස්තිත්වයේ කළමනාකාරිත්වය විසින් මූල්‍ය ප්‍රකාශ පිළියෙල කරයි.**
- **ශ්‍රී.ල.වි.ප්‍ර. 210හි මූල්‍ය ප්‍රකාශ සඳහා කළමනාකාරිත්වයේ වගකීම්හි විස්තරයේ විගණකගේ කාර්යභාරයේ කොන්දේසි පිළිබිඹු වේ.**
- **මූල්‍ය ප්‍රකාශවල බහු ආංශික මූලිකාංග පිළිබඳව ප්‍රමාණවත් යෝග්‍ය විගණන සාක්ෂි විගණකට ලබාගත නොහැකි විය. එය නම් අස්තිත්වයේ තොග සහ ලැබිය යුතු ගිණුම් පිළිබඳව විගණන සාක්ෂි විගණකට ලබාගත නොහැකි විය. මෙම ප්‍රමාණවත් යෝග්‍ය විගණන සාක්ෂි ලබාගැනීමට නොහැකිවීම නිසා මූල්‍ය ප්‍රකාශවලට විය හැකි බලපෑම ප්‍රමාණාත්මක මෙන්ම පෘතුල ද වේ..**
- **විගණනයට ව්‍යවහාර කරන අදාල ආචාර ධර්ම අවශ්‍යතා අඩංගුව ඇත්තේ ශ්‍රී ලංකා වරලත් ගණකාධිකරණ ආයතනය විසින් නිකුත් කළ ආචාර ධර්ම සංග්‍රහයේය.**
- **මූල්‍ය ප්‍රකාශ අධීක්ෂණය සඳහා වග කිවයුතු පුද්ගලයන් මූල්‍ය ප්‍රකාශ පිළියෙළ කරන පුද්ගලයන්ගෙන් වෙනස් වේ.**
- **විගණකගේ වගකීම් කොටසේ වඩාත් සීමිත විස්තරයක්**
- **මූල්‍ය ප්‍රකාශ විගණනයට අමතරව දේශීය නීති යටතේ අවශ්‍ය කෙරෙන වෙනත් වාර්තාකරණය කළයුතු වගකීම් විගණකට ඇත.**

**ස්වාධීන විගණකගේ වාර්තාව**
ABC සමාගමේ කොටස් හිමියන්ට [හෝ වෙනත් යෝග්‍ය ආමන්ත්‍රණය කරන්නා]

**මූල්‍ය ප්‍රකාශන මත විගණනගේ වාර්තාව**[22]

**මතය ව්‍යාවචනය කිරීම**

ABC සමාගමේ (සමාගම) 20×1 දෙසැම්බර් මස 31 දිනට වූ මූල්‍ය තත්ත්ව ප්‍රකාශය සහ එම දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා විස්තීරණ ආදායම් ප්‍රකාශය, ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශය සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශය සහ මූල්‍ය ප්‍රකාශවලට සටහන් ඇතුළුව වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තීන්වල සාරංශයකින් සමන්විත මූල්‍ය ප්‍රකාශ විගණනයට අප නියුක්ත කරන ලදී

අප මේ සමග එක්ව ඇති මූල්‍ය ප්‍රකාශන මත මතයක් ප්‍රකාශ නොකරන්නෙමු. අපගේ වාර්තාවේ මතය ව්‍යාවචනය කිරීම සඳහා පදනම කොටසේ විස්තර කළ කරුණේ වැදගත්කම නිසා, මෙම මූල්‍ය ප්‍රකාශන මත විගණන මතයක්

[22] "වෙනත් නෛතික සහ නියාමන අවශ්‍යතා මත වාර්තාව" යන දෙවැනි උප මාතෘකාව අදාල නොවන අවස්ථාවන්හිදී "මූල්‍ය ප්‍රකාශන මත විගණන වාර්තාව " යන උප මාතෘකාව අවශ්‍ය නොවේ.

සඳහා පදනමක් ලබාදීමට අපහට ප්‍රමාණවත් සහ යෝග්‍ය විගණන සාක්ෂි ලබා ගැනීමට නොහැකි විය.

**මතය වියාචනය කිරීම සඳහා වූ පදනම**

20X1 දෙසැම්බර් මස 31 දින වන තෙක් අපව සමාගමේ විගණකවරුන් ලෙස පත්කර නොතිබුණි. ඒ හේතුවෙන් වර්ෂය ආරම්භයේ හෝ අවසානයේ භෞතික තොග ගණන් ගැනීම නිරීක්ෂණය කිරීමට අපහට නොහැකි විය. 20X0 සහ 20X1 දෙසැම්බර් 31 දිනයන්හි මූල්‍ය තත්ත්ව ප්‍රකාශනවල සඳහන් කර ඇති පිළිවෙළින් ××× හා ××× වූ තොග ප්‍රමාණයන් සම්බන්ධයෙන් විකල්ප මාර්ග යොදාගෙන ඒ පිළිබඳව අපහට සෑහීමකට පත්වීමට නොහැකි විය. එයට අමතරව ලැබිය යුතු ගිණුම් සඳහා 20X1 සැප්තැම්බර් මස හඳුන්වාදුන් නව පරිගණක පද්ධතියේ ප්‍රතිඵලයක් වශයෙන් ලැබියයුතු ගිණුම්වල වැරදිගණනාවක් මතුව ඇත. අපගේ විගණන වාර්තාවේ දිනය වනතුරුත් කළමනාකාරිත්වය පද්ධතියේ ඌණතා නිවැරදි කිරීම් සහ වැරදි නිවැරදි කිරීමේ ක්‍රියාවලියේ නිරතව සිටියහ. 20X1 දෙසැම්බර් 31 දින ලැබියයුතු ගිණුම් ලෙස මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ ඇතුළත් මුලු වටිනාකම වූ ××× සනාථ කිරීමට හෝ වෙනත් විකල්ප ක්‍රම වලින් එය සත්‍යාපණය කිරීමට අපහට නොහැකි විය. මෙම කරුණුවල ප්‍රතිඵලයක් ලෙස වාර්තා වී ඇති හෝ වාර්තා නොවී ඇති තොග සහ ලැබියයුතු ගිණුම් විස්තීරණ ආදායම් ප්‍රකාශනය , ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශනය, මුදල් ප්‍රවාහ ප්‍රකාශයන් සම්පූර්ණ මූලිකාංගයන්ට සම්බන්ධයෙන් කිසියම් ගැලපුමක් අවශ්‍යදැයි නිර්ණය කිරීමට අපහට නොහැකි විය.

**මූල්‍ය ප්‍රකාශන සඳහා කළමනාකරණය සහ පාලනය පිළිබඳ වගකිවයුතු අය සමඟ සන්නිවේදනය**[23]
*[ශ්‍රී.ලං.වි.ප්‍ර. 700 (සංශෝධිත) අනුව වාර්තාකරණය – [ශ්‍රී.ලං.වි.ප්‍ර. 700 (සංශෝධිත) හි 1 වැනි නිදර්ශනය බලන්න.)]*

**මූල්‍ය ප්‍රකාශන විගණනය සඳහා විගණකගේ වගකීම්**

අපගේ වගකීම වන්නේ ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුව සමාගමේ මූල්‍ය ප්‍රකාශන මත අපගේ විගණනය මෙහෙයවා විගණකගේ වාර්තාව නිකුත් කිරීමයි. කෙසේ නමුත් *මතය වියාචනය කිරීමේ පදනම කොටසේ* විස්තර කළ කරුණු නිසා, මෙම මූල්‍ය ප්‍රකාශන මත විගණන මතයක් සඳහා පදනමක් ලබාදීමට අපහට ප්‍රමාණවත් සහ යෝග්‍ය විගණන සාක්ෂි ලබා ගැනීමට නොහැකි විය.

ශ්‍රී. ලංකා වරලත් ගණකාධිකරණ ආයතනය විසින් නිකුත් කළ ආචාර ධර්ම සංග්‍රහයට අනුව අප සමූහයෙන් ස්වාධීන වන අතර අප එම අවශ්‍යතාවයන්ට අනුව අපගේ අනෙකුත් ආචාරධර්ම වගකීම් ඉටුකර ඇත්තෙමු.

**වෙනත් නෛතික සහ නියාමන අවශ්‍යතා මත වාර්තාව**

**[ශ්‍රී.ලං.වි.ප්‍ර. 700 (සංශෝධිත) අනුව *වාර්තාකරණය* – [ශ්‍රී.ලං.වි.ප්‍ර. 700 (සංශෝධිත) හි 1 වැනි නිදර්ශනය බලන්න.)]**

[විගණන සමාගම නමින් අත්සන*] [විගණන සමාගමේ ලිපිනය]*

[*දිනය*]

[23] හෝ අදාළ අධිකරණ බල ප්‍රදේශයේ නෛතික ආකෘතිමය රාමුවේ සම්බන්ධය තුළ ගත්කළ යෝග්‍ය වන වෙනත් පද

# ශ්‍රී ලංකා විගණන ප්‍රමිත 706 (සංශෝධිත)
# ස්වාධීන විගණකගේ වාර්තාවේ කරුණු අවධාරණය කිරීමේ ඡේද සහ වෙනත් කරුණු ඡේද

(2018 මාර්තු 31 දින හෝ ඊට පසුව අවසන් වන කාලපරිච්ඡේද සඳහාවන මූල්‍ය ප්‍රකාශන විගණනය සඳහා බල පැවැත් වේ)

## පටුන


ඡේද

**හැඳින්වීම**

මෙම ශ්‍රී.ල.වි.ප්‍ර.යේ විෂය පථය ........................................ 1–4

බලපැවැත්වෙන දිනය ........................................ 5

**අරමුණ** ........................................ 6

**නිර්වචන** ........................................ 7

**අවශ්‍යතාවයන්**

විගණකගේ වාර්තාවේ කරුණු අවධාරණය කිරීමේ ඡේද ........................................ 8–9

විගණකගේ වාර්තාවේ වෙනත් කරුණු පිළිබඳ ඡේද ........................................ 10–11

පාලන පිළිබද වගකිව යුතු අය සමඟ සන්නිවේදනය ........................................ 12

**භාවිත කිරීමේ සහ පැහැදිලි කිරීමේ වෙනත් කරුණු**

විගණකගේ වාර්තාවේ කරුණු අවධාරණය කිරීමේ ඡේද සහ ප්‍රධාන විගණන කරුණු ඡේද අතර සම්බන්ධතාවය ........................................ අ1–අ3

කරුණු අවධාරණය කිරීමේ ඡේදය අවශ්‍ය විය හැකි තත්වයන් ........................................ අ4–අ6

විගණකගේ වාර්තාවේ කරුණු අවධාරණය කිරීමේ ඡේදයක් ඇතුලත් කිරීම ........................................ අ7–අ8

විගණකගේ වාර්තාවේ වෙනත් කරුණු ඡේද ........................................ අ9–අ15

විගණකගේ වාර්තාවේ කරුණු අවධාරණය කිරීමේ ඡේද සහ වෙනත් කරුණු ඡේද ස්ථානගත කිරීම ........................................ අ16–අ17

පාලනය පිළිබද වග කිව යුතු අය සමඟ සන්නිවේදනය ........................................ අ18

1 වන පරිශිෂ්ටය: කරුණු අවධාරණය කිරීමේ ඡේද සඳහා අවශ්‍යතාවයන් ඇතුලත් ශ්‍රී. ල .වි.ප්‍ර.වල ලැයිස්තුව

2 වන පරිශිෂ්ටය : වෙනත් කරුණු ඡේද සඳහා අවශ්‍යතාවයන් ඇතුලත් ශ්‍රී.ල.වි.ප්‍ර.වල ලැයිස්තුව

3 වන පරිශිෂ්ටය : ප්‍රධාන විගණන කරුණු කොටසේ සහ වෙනත් කරුණු ඡේදයේ කරුණු අවධාරණය කිරීමේ ඡේදය විගණකගේ වාර්තාවක් දැක්වෙන නිදර්ශනය

4 වන පරිශිෂ්ටය : අදාළ මූල්‍ය වාර්තාකරණ ආකෘතිමය රාමුවෙන් ඉවත්වීම නිසා කොන්දේසි සහිත නිගමනයක් සහිත කරුණු අවධාරණය කිරීමේ ඡේදය ඇතුලත් විගණකගේ වාර්තාවක නිදර්ශනය


(ශ්‍රී.ල.වි.ප්‍ර.) 706 (සංශෝධිත) *ස්වාධීන විගණකගේ වාර්තාවේ කරුණු අවධාරණය කිරීමේ ඡේද සහ වෙනත් කරුණු ඡේද* " කියවිය යුත්තේ ශ්‍රී.ල.වි.ප්‍ර.200 "*ස්වාධීන විගණකගේ සමස්ථ අරමුණු සහ ශ්‍රී ලංකා විගණන ප්‍රමිත ප්‍රකාරව විගණනයක් මෙහෙයවීම සම්බන්ධයෙනි.*

## හැඳින්වීම

### මෙම ශ්‍රී.ල.වි.ප්‍ර.යේ විෂය පථය

1. පහත දෑ සිදු කිරීමට අවශ්‍යයැයි විගණක සලකා බලන විට විගණකගේ වාර්තාවේ ඇතුලත් කළයුතු අතිරේක සන්නිවේදනය පිළිබඳව මෙම ශ්‍රී ලංකා විගණන ප්‍රමිත (ශ්‍රී.ල.වි.ප්‍ර.) කටයුතු කරයි:

   මූල්‍ය ප්‍රකාශවල ඉදිරිපත්කර ඇති හෝ හෙළිදරව්කර ඇති කරුණු හෝ කරුණක් ඒවා කොපමණ වැදගත්ද යනු මූල්‍ය ප්‍රකාශන අවබෝධකර ගැනීමට පරිශීලකයනට මූලික වන කරුණ හෝ කරුණු පරිශීලකයන්ගේ අවධානයට ලක් කිරීම;හෝ විගණනය, විගණකගේ වගකීම හෝ විගණකගේ වාර්තාව පිළිබඳව අවබෝධයක් පරිශීලකයනට ලබාගැනීමට අදාළ මූල්‍ය ප්‍රකාශනවල ඉදිරිපත් කරන හෝ හෙළිදරව් කර ඇති කරුණ හෝ කරුණු හැර වෙනත් කරුණ හෝ කරුණු පරිශීලකයන්ගේ අවධානයට ලක් කිරීම.

2. හි විගණක ප්‍රධාන විගණන කරුණු නිර්ණය කර විගණකගේ වාර්තාවේ ඒවා සන්නිවේදනය කරන විට ශ්‍රී.ල.වි.ප්‍ර. 701[1] ඒ සඳහා අවශ්‍යතා පිහිටුවා මගපෙන්වීම ලබාදෙයි. විගණකගේ වාර්තාවේ විගණක ප්‍රධාන විගණන කරුණු කොටස ඇතුලත් කරන විට, ශ්‍රී.ල.වි.ප්‍ර. අනුව විගණකගේ වාර්තාවේ ප්‍රධාන විගණන කරුණු සහ ඕනෑම අමතර තොරතුරු සන්නිවේදනය අතර සම්බන්ධතාවය මෙම ශ්‍රී.ල.වි.ප්‍ර. ආමන්ත්‍රණය කරයි. (යොමුව: අ1–අ3 ඡේද)

3. ශ්‍රී.ල.වි.ප්‍ර. 570 (සංශෝධිත)[2] සහ ශ්‍රී.ල.වි.ප්‍ර. 720(සංශෝධිත)[3] අවශ්‍යතාවයන් පිහිටුවන අතර පිළිවෙළින් අඛණ්ඩ පැවැත්ම සහ වෙනත් තොරතුරු සම්බන්ධයෙන් විගණකගේ වාර්තාවේ සන්නිවේදනය පිළිබඳව මගපෙන්වීම ලබාදෙයි.

4. පරිශිෂ්ට 1 සහ 2, විගණකගේ වාර්තාවේ කරුණ අවධාරණය කිරීමේ ඡේද සහ වෙනත් කරුණ ඡේද ඇතුලත් කිරීමට විගණක සඳහා නිශ්චිත අවශ්‍යතාවලින් සමන්විත ශ්‍රී.ල.වි.ප්‍ර. හඳුනාගනී. එවැනි අවස්ථාවලදී එබඳු ඡේදවල ආකෘතිය සම්බන්ධයෙන් මෙම ශ්‍රී.ල.වි.ප්‍ර. ව්‍යවහාර කෙරේ (යොමුව: අ4 ඡේදය)

### බලපැවැත්වෙන දිනය

5. 2018 මාර්තු 31 දින හෝ හෝ ඊට පසුව අවසන් වන කාලපරිච්ඡේදවල මූල්‍ය ප්‍රකාශ විගණනය සඳහා බලපැවැත් වේ.

### අරමුණ

6. විගණකගේ අරමුණ වන්නේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් සකස් කිරීමෙන් පසු එළඹීමෙන් පසු, ඔහුගේ විනිශ්චයට අනුව එසේ කිරීම අවශ්‍යවන විට පහත සඳහන් දෑ පිළිබඳව විගණකගේ වාර්තාව තුළින් පැහැදිලි අතිරේක සන්නිවේදන මාර්ගයන් පරිශීලකයින්ගේ අවධානයට යොමු කිරීමය:

   (අ) මූල්‍ය ප්‍රකාශනවල යෝග්‍ය පරිදි ඉදිරිපත් කර හෝ හෙළිදරව් කර ඇති නමුදු, පරිශීලකයන්ට මූල්‍ය ප්‍රකාශන අවබෝධ කර ගැනීමට මූලික ඉතාමත් වැදගත් වන කරුණක්; හෝ

   (ආ) අදාළ පරිදි විගණනයේ, විගණකගේ වගකීම් හෝ විගණකගේ වාර්තාව පරිශීලකයින්ට අවබෝධ කරගැනීමට අදාළ වෙනත් ඕනෑම කරුණක්,

### නිර්වචන

7. මෙම ශ්‍රී.ල.වි.ප්‍ර.යේ අරමුණු සඳහා පහත දැක්වෙන පදවල අර්ථයන් පහත ආරෝපිත වේ. :

   (අ) කරුණ අවධාරණය කිරීමේ ඡේදය - විගණකගේ විනිශ්චයට අනුව මූල්‍ය ප්‍රකාශ අවබෝධ කර ගැනීමේ දී පරිශීලකයන්ට මූලිකව ඉතා වැදගත් වන, මූල්‍ය ප්‍රකාශවල යෝග්‍ය පරිදි ඉදිරිපත් කරමින් හෝ හෙළිදරව්කර ඇති කරුණකට යොමු කරමින් විගණකගේ වාර්තාවේ ඇතුලත් කරුණු ලබන ඡේදය.

   (ආ) වෙනත් කරුණ ඡේදය - විගණකගේ විනිශ්චයට අනුව විගණනය, විගණකගේ වගකීම් හෝ විගණකගේ වාර්තාව පරිශීලකයන් ට අවබෝධකර ගැනීමට අදාළව මූල්‍ය ප්‍රකාශවල ඉදිරිපත් කරන හෝ හෙළිදරව්

[1] SLAuS 701, *ස්වාධීන විගණකගේ වාර්තාවේ ප්‍රධාන විගණන කරුණු සන්නිවේදනය*
[2] SLAuS 570 (සංශෝධිත), *අඛණ්ඩ පැවැත්ම*
[3] SLAuS 720 (සංශෝධිත), *වෙනත් තොරතුරුවල සම්බන්ධිත විගණකගේ වගකීම්*

කරන කරුණකට හැර වෙනත් කරුණකට යොමු කරන විගණකගේ වාර්තාවේ ඇතුලත් කරනු ලබන ඡේදයකි

## අවශ්‍යතාවයන්

### විගණකගේ වාර්තාවේ කරුණ අවධාරණය කිරීමේ ඡේද

8. විගණකගේ විනිශ්චයට අනුව මූල්‍ය ප්‍රකාශන අවබෝධ කර ගැනීමට පරිශීලකයන්ට මූලික වන ඉතා වැදගත් වන මූල්‍ය ප්‍රකාශවල ඉදිරිපත් කර ඇති හෝ හෙළිදරව් කර ඇති කරුණකට පරිශීලකයින්ගේ අවධානය යොමු කිරීමට අවශ්‍ය යයි විගණක සලකන්නේ නම්, විගණක විසින් විගණකගේ වාර්තාවේ සැපයූ කරුණ අවධාරණය කිරීමේ ඡේදයක් පහත සඳහන් පරිදි ඇතුලත් කළ යුතුය. (යොමු: අ5 - අ6 ඡේද)

(අ) කරුණේ ප්‍රතිඵලයක් ලෙස ශ්‍රී.ල.වි.ප්‍ර. 705 (සංශෝධිත)[4] අනුව විගණකට මතය විකරණය කිරීමට අවශ්‍ය නොවිය හැකිය.; සහ

(ආ) ශ්‍රී.ල.වි.ප්‍ර. 701 ව්‍යවහාර කරන විට, විගණකගේ වාර්තාවේ එම කරුණ සන්නිවේදනය කළයුතු ප්‍රධාන විගණන කරුණක් නොවන බව නිර්ණය කිරීම. (යොමු: අ1 - අ3 ඡේද)

9. විගණකගේ වාර්තාවේ කරුණ අවධාරණය කිරීමේ ඡේදයක් ඇතුලත් කළ විට, විගණක විසින්:

(අ) "කරුණ අවධාරණය කිරීම" යන පදය ඇතුලත් සුදුසු ශීර්ෂයක් සමඟ එය විගණකගේ වාර්තාවේ වෙනමම කොටස තුළ එම ඡේදය ඇතුලත් කළ යුතුය;

(ආ) කරුණ අවධාරණය යොමු කරන බව සහ අදාළ වන අවස්ථාවනහිදී කරුණ සම්පූර්ණයෙන් පැහැදිලිව විස්තරකරන හෙළිදරව් කිරීම් මූල්‍ය ප්‍රකාශවල දක්නට ලැබෙන ස්ථානය පැහැදිලිව යොමු කරමින් ඡේදය තුළ ඇතුලත් කළ යුතුය. ඡේදය මූල්‍ය ප්‍රකාශනවල ඉදිරිපත් කළ හෝ හෙළිදරව් කළ තොරතුරුවලට පමණක් යොමු කළ යුතුය; සහ

(ඇ) අවධාරණය කළ කරුණ පිළිබඳව විගණකගේ මතය විකරණය නොකරන බව සඳහන් කරන්න. (යොමු අ7,අ16 - අ17 ඡේද )

### විගණකගේ වාර්තාව තුළ වෙනත් කරුණ පිළිබද ඡේද

10. විගණකගේ විනිශ්චය තුළ විගණනය, විගණකගේ වගකීම් හෝ විගණකගේ වාර්තාව අවබෝධ කර ගැනීමට පරිශීලකයන්ට අදාළ වන මූල්‍ය, ප්‍රකාශ තුළ ඉදිරිපත් කළ හෝ හෙළිදරව් කළ තොරතුරු හැර කරුණක් සන්නිවේදන කිරිමට අවශ්‍ය යැයි විගණක සලකා බලන්නේ නම්, විගණක විගණකගේ වාර්තාවේ වෙනත් කරුණ ඡේදය තුළ පහත දැ වන්නේ නම් ඇතුලත් කළ යුතුය;

(අ ) මෙය නීතියෙන් හෝ රෙගුලාසි මඟින් තහනම් නොකර තිබීම; සහ
(ආ) ශ්‍රී.ල.වි.ප්‍ර. 701 ව්‍යවහාර කරන විට සහ කරුණ, විගණකගේ වාර්තාවේ සන්නිවේදන කළ යුතු ප්‍රධාන විගණන කරුණක් ලෙස නිර්ණය කර යොමු නොකිරීම.( යොමු අ9 - අ14 ඡේද )

11. විගණක, විගණකගේ වාර්තාවේ වෙනත් කරුණ ඡේදයක් ඇතුලත් කරන විට, විගණක "වෙනත් කරුණ" යන ශිර්ෂය හෝ වෙනත් යෝග්‍ය ශිර්ෂයක් යටතේ එම ඡේදය වෙනමම කොටසක ඇතුලත් කළ යුතුය. (යොමුව අ15 - අ17 ඡේද)

### පාලනය පිළිබද වග කිව යුතු අය සමඟ සන්නිවේදනය

12. විගණක විගණකගේ වාර්තාවේ කරුණ අවධාරණය කිරීමේ ඡේදයක් හෝ වෙනත් කරුණ ඡේදයක් ඇතුලත් කිරීමට අපේක්ෂා කරන්නේ නම්, විගණක විසින් පාලනය පිළිබද වග කිව යුතු අය සමඟ මෙමෙ අපේක්ෂාව සහ යෝජිත වචන පෙලගැස්ම සම්බන්ධයෙන් සන්නිවේදනය කළ යුතුය. ( යොමු අ18 ඡේදය )

***

[4] SLAuS 705 (සංශෝධිත), *ස්වාධීන විගණකගේ වාර්තාවේ මතයට විකරණය කිරීම*

**භාවිත කිරීමේ සහ පැහැදිලි කිරීමේ වෙනත් කරුණු**

**විගණකගේ වාර්තාව තුළ කරුණ අවධාරණය කිරීමේ ඡේද සහ ප්‍රධාන විගණන කරුණු ඡේද අතර සම්බන්ධතාවය** (යොමු: 2, 8(ආ) ඡේද)

අ1 ශ්‍රී.ල.වි.ප්‍ර. 701 හි ප්‍රධාන විගණන කරුණු ලෙස නිර්වචනය කර ඇත්තේ විගණකගේ වෘත්තිය විනිශ්චයට අනුව ප්‍රවර්තන කාලපරිච්ඡේදයේ[5] මූල්‍ය ප්‍රකාශන විගණනය තුලදී වඩාත් වැදගත් වූ එම කරුණුය. ප්‍රවර්තන කාලපරිච්ඡේදයේ මූල්‍ය ප්‍රකාශන විගණනයෙන් වැදගත් සොයාගැනීම් ඇතුළුව ප්‍රධාන විගණන කරුණු තෝරා පාලනය පිළිබඳ වග කිව යුතු අය සමග සන්නිවේදනය කළ කරුණු වලිනි. විගණකගේ වෘත්තිය විනිශ්චය තුළ දී විගණනයේ වඩාත් වැදගත් වූ එම කරුණු මූල්‍ය ප්‍රකාශ අවබෝධ කර ගැනීමට අපේක්ෂිත පරිශීලකයන්ට උපකාරී වීමට අමතර තොරතුරු ප්‍රධාන විගණන කරුණු සන්නිවේදනය ලබා දෙන අතර අස්තිත්වය සහ විගණනය කළ මූල්‍ය ප්‍රකාශනවල සැලකිය යුතු කළමනාකරණ විනිශ්චයේ ක්ෂෙත්‍ර එසේම අවබෝධ කර ගැනීමට උපකාරී වේ. ශ්‍රී.ල.වි.ප්‍ර. 701 ව්‍යවහාර කරන විට කරුණ අවධාරණය කිරීමේ ඡේදයේ භාවිතය තනි තනි ප්‍රධාන විගණන කරුණුවල විස්තරයක් සඳහා ආදේශකයක් නොවේ.

අ2 ශ්‍රී.ල.වි.ප්‍ර. 701 සමඟ අනුකූලව ප්‍රධාන විගණන කරුණු ලෙස නිර්ණය කළ කරුණු, විගණකගේ විනිශ්චය තුළ මූල්‍ය ප්‍රකාශ පරිශීලකයනගේ අවබෝධයට එලෙසම මූලික වේ. එවැනි අවස්ථාවලදී ශ්‍රී.ල.වි.ප්‍ර. 701 අනුව ප්‍රධාන විගණන කරුණ ලෙස කරුණ සන්නිවේදනය කිරීමේදී විගණක එහි සාපේක්ෂ වැදගත්කම තවදුරටත් මතුකර දැක්වීමට හෝ අවධාරණ කිරීමට බලාපොරොත්තු විය හැකිය. විගණක, ප්‍රධාන විගණන කරුණු කොටසේ (උදාහරණ: පළමු කරුණ ලෙස ) වෙනත් කරුණුවලට වඩා වැඩි කැපී පෙනෙන ලෙස කරුණ ඉදිරිපත් කිරීම මගින් හෝ මූල්‍ය ප්‍රකාශ පරිශීලකයනගේ අවබෝධයට කරුණේ වැදගත්කම පෙන්වීමට ප්‍රධාන විගණන කරුණේ විස්තරය තුළ අමතර තොරතුරු ඇතුලත් කිරීම මගින් කළ හැකිය.

අ3 ශ්‍රී.ල.වි.ප්‍ර. 701 අනුව ප්‍රධාන විගණන කරුණ ලෙස නිර්ණය නොකළ තිබිය හැකිය (එනම් එයට සැලකිය යුතු විගණක අවධානය අවශ්‍ය නොවන නිසා) එහෙත් එය විගණකගේ විනිශ්චය තුල මූල්‍ය ප්‍රකාශ අවබෝධ කර ගැනීමට පරිශීලකයන්ට මූලික වේ.(එනම් පසුව සිදුවන සිදුවීම්) එවැනි කරුණකට අවධානය යොමු කිරීමට අවශ්‍ය බව විගණක සලකා බලන්නේ නම් මෙම ශ්‍රී.ල.වි.ප්‍ර. අනුව විගණකගේ වාර්තාව තුළ කරුණ අවධාරණය කිරීමේ ඡේදයක කරුණ ඇතුලත් කරනු ලැබේ.

**කරුණ අවධාරණය කිරීමේ ඡේදයක් අවශ්‍ය විය හැකි තත්ත්වයන් (යොමුව : 4, 8 ඡේද)**

අ4 සමහර අවස්ථාවන්හිදී විගණකගේ වාර්තාව තුළ කරුණ අවධාරණය කිරීමේ ඡේද ඇතුලත් කිරීමට විගණක සඳහා නිශ්චිත අවශ්‍යතාවලින් සමන්විත වන ශ්‍රී.ල.වි.ප්‍ර. පරිශිෂ්ටය1 හි හඳුනා ගනී. මෙම තත්ත්වයන් පහත දෑවල ඇතුලත් වේ:

- නීතියෙන් හෝ රෙගුලාසි මගින් නියම කළ මූල්‍ය වාර්තාකරණ ආකෘතිමය රාමුවක් පිළිගත නොහැකි වන අවස්ථාව නීතියෙන් හෝ රෙගුලාසි මගින් නියම කළ කරුණක් වන විට.
    - මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇත්තේ විශේෂි අරමුණු ආකෘතිමය රාමුව අනුව බව පරිශීලකයන් සෝදිසියෙන් තැබීම
- විගණකගේ වාර්තාවේ දිනයට පසු විගණක කරුණු දැනගන්නා ලද විට සහ විගණක නව හෝ සංශෝධිත විගණකගේ වාර්තාවක් ලබාදෙන විට.(එනම් පසුව සිදුවන සිදුවීම්)[6]

අ5 විගණක විසින් කරුණ අවධාරණය කිරීමේ ඡේදයක් ඇතුලත් කිරීමට අවශ්‍ය යැයි සලකන තත්ත්වයන්ට උදාහරණ වන්නේ:

- විශේෂ නඩුවක් පවත්ගෙන යාමේදී හෝ නියාමන ක්‍රියාදාමයන්වල ඉදිරි ප්‍රතිඵලවලට අදාළ අනියත බව.
- මූල්‍ය ප්‍රකාශ දිනය සහ විගණකගේ වාර්තාවේ දිනය[7] අතර සැලකිය යුතු පසුව සිදුවන සිදුවීමක්

---

[5] SLAuS 260 (සංශෝධිත), *පාලනය පිළිබඳ වග කිව යුතු අය සමග සන්නිවේදනය*, 16 ඡේදය
[6] SLAuS 560, *පසුව සිදුවන සිදුවීම්* , 12(ආ) සහ 16
[7] SLAuS 560, 6 ඡේදය

- මූල්‍ය ප්‍රකාශ මත ප්‍රමාණාත්මක බලපෑමක් තිබෙන නව ගිණුම්කරණ ප්‍රමිතියක් කලින් ව්‍යවහාර කිරීමක් (අවසර ඇති අවස්ථාවක).
    - ඇති වූ හෝ දිගටම පවතින වඩාත් බලවත් හදිසියේ ඇති වූ ව්‍යසනයක් නිසා අස්තිත්වයේ මූල්‍ය තත්ත්වයට ඇතිවූ සැලකිය යුතු බලපෑම.

අ6 කෙසේ නමුත්, කරුණ අවධාරණය කිරීමේ ඡේද පුළුල්ව ව්‍යප්ත වූ භාවිතය, එවැනි කරුණු පිළිබඳ විගණකගේ සන්නිවේදනය සඵලදායිතාවය හීන විය හැකිය.

**විගණකගේ වාර්තාව තුළ කරුණ අවධාරණය කිරීමේ ඡේදයක් ඇතුලත් කිරීම (යොමුව 9 ඡේදය)**

අ7 විගණකගේ වාර්තාවේ කරුණ අවධාරණය කිරීමේ ඡේදයක් ඇතුලත් කිරීමල විගණකගේ මතයට බලනොපානු ලැබේ. කරුණ අවධාරණය කිරීමේ ඡේදයක් පහත සඳහන් දෑ සඳහා ආදේශකයක් නොවේ.:

(අ) විශේෂිත වූ විගණන කාර්යයභාරයක තත්ත්වයන් මගින් අවශ්‍ය කරන විට ශ්‍රී.ල.වි.ප්‍ර. 705 (සංශෝධිත) අනුව විකරණය කළ මතයක්.;

(ආ) අදාළ මූල්‍ය වාර්තාකරණ ආකෘතිමය රාමුවෙන් කළමනාකරනයට අවශ්‍ය කෙරෙන හෝ එසේ නැත්නම් සාධාරණ ඉදිරිපත් කිරීමක් ඇති කර ගැනීමට අවශ්‍ය වන මූල්‍ය ප්‍රකාශවලට හෙළිදරව් කිරීම් හෝ

(ඇ) අඛණ්ඩ පැවැත්ම ලෙස අස්තිත්වයට නොකඩවා පවත්වා ගෙන යාමේ හැකියාවට සැලකිය යුතු සැකයක් පහළ කළ හැකි සිද්ධි හෝ තත්ත්වයන් සම්බන්ධයෙන් ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවය පවතින විට ශ්‍රී.ල.වි.ප්‍ර. 570 (සංශෝධිත)[8] අනුව වාර්තකරණය.

අ8 අදාළ අවස්ථාවන් තුලදී, කරුණ අවධාරණය කිරීමේ ඡේදවල ස්ථානගත කිරීම මත තවදුරටත් මගපෙන්වීම අ16-අ17 ඡේද ලබාදෙයි.

**විගණකගේ වාර්තාවේ වෙනත් තොරතුරු ඡේද (යොමු: 10–11 ඡේද)**

*වෙනත් කරුණ ඡේදයක් අවශ්‍ය විය හැකි තත්ත්වයන්*

විගණනය අවබෝධ කර ගැනීමට පරිශීලකයන්ට අදාළව

අ9 විගණක විසින් හඳුනා ගත් සැලකිය යුතු අන්දමේ අවදානම්[9] පිළිබඳව සන්නිවේදනය ඇතලත් කරන *විගණනයේ සැලසුම් කළ විෂයපථය සහ කාල නිර්ණය පිළිබඳ* පාලනය පිළිබඳ වග කිව යුතු අය සමඟ සන්නිවේදනය කිරීමට ශ්‍රී.ල.වි.ප්‍ර. 260 (සංශෝධිත) මගින් විගණකට අවශ්‍ය කෙරේ. සැලකිය යුතු අන්දමේ අවදානම්වලට සම්න්ධ කරුණු ප්‍රධාන විගණන කරුණු වන බව නිර්ණය කිරීමට කළ හැකි වුවත් වෙනත් *සැලසුම්කරණ සහ විෂයපථයේ කරුණු (උදාහරණ විගණනයේ සැලසුම් කළ විෂයපථය හෝ විගණනය සම්බන්ධයෙන් ප්‍රමාණවත් බවේ ව්‍යවහාර කිරීම)* ප්‍රධාන විගණන කරුණු ශ්‍රී.ල.වි.ප්‍ර. 701 හි නිර්වචනය කරන්නේ කෙසේදැයි යන්න නිසා ප්‍රධාන විගණන කරුණු විය නොහැකිය. කෙසේනමුත් නීතියෙන් හෝ රෙගුලාසි මගින් විගණකගේ වාර්තාවේ *සැලසුම්කරණ සහ විෂයපථය පිළිබඳ* කරුණු සන්නිවේදනය කිරීමට විගණකට අවශ්‍ය විය හැකිය හෝ විගණක වෙනත් කරුණ ඡේදයක එවැනි කරුණු *පිළිබඳ* සන්නිවේදනය කිරීමට විගණකට අවශ්‍ය විය හැකිය.

අ10 කළමනාකරනය විසින් පනවන ලද *විගණනයේ විෂයපථය සීමාකිරීම හේතුවෙන් ප්‍රමාණවත් සහ යෝග්‍ය විගණන සාක්ෂි ලබාගැනීමට නොහැකිවීමේ බලපෑම ව්‍යාපෘතුල*[10] *වුවත් කාර්යයභාරයෙන් විගණකට ඉවත් වීමට නොහැකි* කලාතුරකින් වන අවස්ථාවලදී, *කාර්යයභාරයෙන් විගණකට ඉවත්වීමට නොහැක්කේ ඇයිදැයි* විගණකගේ වාර්තාවේ විස්තර කිරීමට වෙනත් කරුණු ඡේදයක් ඇතුලත් කිරීමට අවශ්‍ය යයි විගණකට සලකා බැලිය හැකිය.

විගණකගේ වගකීම් හෝ විගණකගේ වාර්තාව පරිශීලකයින්ට අවබෝධ කරගැනීමට අදාළවීම

අ11 අධිකරණ බල ප්‍රදේශයක නීතිය, රෙගුලාසි හෝ පොදුවේ පිළිගත් පරිචයන් විසින් විගණකගේ මූල්‍ය ප්‍රකාශන විගණනය තුළ හෝ ඒ මත වූ විගණකගේ වාර්තාවේ විගණකගේ වගකීම් හි වැඩිදුරටත් පැහැදිලි කිරීම් ලබාදෙන කරුණ විගණකගෙ අවශ්‍යවීම හෝ ඉඩදීම සිදුවිය හැක. වෙනත් කරුණු කොටසේ සහ කරුණට වඩා

[8] SLAuS 570 (සංශෝධිත), 22–23 ඡේද
[9] SLAuS 260 (සංශෝධිත), 15 ඡේදය
[10] මෙම තත්වය සඳහා සාකච්ඡාවක් සඳහා SLAuS 705 (සංශෝධිත)හි 13(ආ) (ii) ඡේදය බලන්න.

ඇතුලත්වන විට විගණකගේ විනිශ්චයට අනුව විගණනය, විගණකගේ වගකීම් හෝ විගණකගේ වාර්තාව අවබෝධ කර ගැනීමට පරිශීලකයන්ට අදාළ සෑම කරුණ සඳහා වෙනස් උපශීර්ෂ භාවිතා කිරීමට උපකාරි විය හැකිය.

අ12 ශ්‍රී ලංකා විගණන ප්‍රමිති යටතේ විගණකගේ වගකීමට අමතරව වන (ශ්‍රී.ල.වි.ප්‍ර. 700 (සංශෝධිත)[11] වෙනත් වාර්තාකරණ වගකීම් කොටස බලන්න), විගණකට වෙනත් වාර්තාකරණ වගකීම් තිබෙන අවස්ථාවකදී හෝ අමතර නිශ්චිත ක්‍රියාපටිපාටි ඉටුකර වාර්තා කිරීම හෝ නිශ්චිත කරුණු මත මතයක් ප්‍රකාශ කිරීම විගණකගෙන් ඉල්ලා සිටින අවස්ථාවකදී ඇතිවන තත්ත්වයන් පිළිබඳව වෙනත් කරුණු ඡේදයක් කටයුතු නොකෙරේ.

මූල්‍ය ප්‍රකාශ කට්ටල එකකට වඩා වැඩි ගණනක් මත වාර්තාකරණය

අ13 අස්තිත්වයක් පොදු අරමුණු අකෘතිමය රාමුවකට අනුකූලව (උදාහරණ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත) එක් මූල්‍ය ප්‍රකාශ කට්ටලයක් පිළියෙල කළහැකි අතර, තවත් මූල්‍ය ප්‍රකාශ කට්ටලයක් වෙනත් පොදු අරමුණු ආකෘතිමය රාමුවකට (උදාහරණයක් වශයෙන් ජාත්‍යන්තර මූල්‍ය වාර්තාකරණ ප්‍රමිත) අනුකූලව පිළියෙල කර ඇති අතර, මෙම මූල්‍ය ප්‍රකාශ කට්ටල දෙකම පිළිබඳව වාර්තා කිරීම සඳහා විගණක නියුක්ත කර ඇත. විගණකගේ කාර්යභාරය වෙන වෙනම පිළිවෙලින් වූ තත්වයන්හීදී ආකෘතිමය රාමු පිළිගත හැකි බව විගණක නිර්ණය කළේ නම් අස්තිත්වය විසින්ම වෙනත් පොදු අරමුණු අකෘතිමය රාමුව ප්‍රකාරව වෙනත් මූල්‍ය ප්‍රකාශ කට්ටලයක් පිළියෙල කර ඇති බව සහ එම මූල්‍ය ප්‍රකාශ මත විගණක වාර්තාවක් නිකුත් කර ඇති බව යොමු කරමින් විගණක, විගණකව තුළ වාර්තාවේ වෙනත් කරුණ ඡේදයක් විගණක ඇතුලත් කළ හැකිය

විගණකගේ වාර්තාව බෙදා හැරීම හෝ පරිශීලනය කිරීම පිළිබඳ සීමාවන්

අ14 නිශ්චිත අරමුණක් සඳහා පිළියෙල කරනු ලබන මූල්‍ය ප්‍රකාශ පොදු අරමුණු අකෘතිමය රාමුව ප්‍රකාරව පිළියෙල කළ හැකිය. එයට හේතු වන්නේ එවැනි පොදු අරමුණු මූල්‍ය ප්‍රකාශන අපේක්ෂිත පරිශීලකයන්ගේ මූල්‍ය තොරතුරු අවශ්‍යතාවයන් සපුරාලන බව නිර්ණය කර ඇති බැවිනි. විගණකගේ වාර්තාව, නිශ්චිත පරිශීලකයන් සඳහා අදහස් කරන බැවින් විගණකගේ වාර්තාවේ අභිප්‍රාය වන්නේ තනිකරම අපේක්ෂිත පරිශීලකයින් සඳහා පමණක් බව සහ වෙනත් පාර්ශවයන්ට බෙදහැරීම හෝ භාවිතා කිරීම නොකළ යුතු බව සඳහන් කරමින් විගණකගේ වාර්තාවේ වෙනත් කරුණ ඡේදයක් ඇතුලත් කිරීම වාතාවරණය තුළ අවශ්‍යද යන වග විගණක සලකා බැලිය හැකිය.

*විගණකගේ වාර්තාවේ වෙනත් කරුණ ඡේදයක් ඇතුලත් කිරීම*

අ15 වෙනත් කරුණ ඡේදයක අන්තර්ගතයෙන් පැහැදිලිවම පිළිඹිබු කරන්නේ එබඳු වෙනත් කරුණු මූල්‍ය ප්‍රකාශ තුළ ඉදිරිපත් කිරීමට හෝ හෙළිදරව් කිරීම අවශ්‍ය නොකරන බවය. වෙනත් කරුණ ඡේදයකට විගණකට නීතියෙන්, රෙගුලාසිවලින් හෝ වෙනත් වෘත්තීමය ප්‍රමිති මගින් විගණකට ලබා දීම තහනම් කර ඇති තොරතුරු ඇතුලත් නොවේ. උදාහරණයක් වශයෙන් තොරතුරු සම්බන්ධයෙන් රහස්භාවය අදාළ ආචාර ධර්ම ප්‍රමිත, වෙනත් කරුණ ඡේදයකට එලෙසම කළමනාකරණය විසින් ලබාදිය යුතු තොරතුරු ඇතුලත් නොවේ.

**විගණකගේ වාර්තාවේ කරුණ අවධාරණය කිරීමේ ඡේද සහ වෙනත් කරුණු ඡේද ස්ථානගත කිරීම (යොමුව: 9, 11 ඡේද)**

අ16 විගණකගේ වාර්තාවේ කරුණ අවධාරණය කිරීමේ ඡේද සහ වෙනත් කරුණු ඡේදයක් ස්ථානගත කිරීම, සන්නිවේදනය කළ යුතු තොරතුරුවල ස්වභාවය මත සහ ශ්‍රී.ල.වි.ප්‍ර. 700 (සංශෝධිත) අනුව වාර්තා කිරීමට අවශ්‍ය වන වෙනත් මූලිකාංගවලට සසඳා බැලීමෙන් අපේක්ෂිත පරිශීලකයන්ට එවැනි තොරතුරුවල සාපේක්ෂ වැදගත්කමේ විගණකගේ විනිශ්චය මත රඳා පවති. උදාහරණ: කරුණ අවධාරණය කිරීමේ ඡේද

- *කරුණ අවධාරණය කිරීමේ ඡේදය, නීතියෙන්, හෝ රෙගුලාසිවලින් නියම කරන ලද මූල්‍ය වාර්තාකරණ ආකෘතිමය රාමුවෙන් වෙනත් ලෙසකින් පිළිගැනීමට[12] නොහැකි වන බව විගණක නිර්ණය කරන*

[11] SLAuS 700 (සංශෝධිත), *මූල්‍ය ප්‍රකාශ මත මතයක් සකස් කිරීම සහ වාර්තා කිරීම*, 43–44ඡේද

[12] SLAuS 210 මගින් අවශ්‍ය කෙරෙන පරිදි උදාහරණය සඳහා, විගණන කාර්යයභාරයේ කොන්දේසි එකඟවීම, 19 ඡේදය සහ SLAuS 800 (සංශෝධිත),විශේෂ සලකා බැලීම්— *විශේෂ අරමුණු ආකෘතිමය රාමුව අනුව පිළියෙළ කළ මූල්‍ය ප්‍රකාශනවල විගණන* , 14 *ඡේදය*

අවස්ථාවකදී එම තත්වයන් ඇතුලත් කරමින් *අදාළ මූල්‍ය වාර්තාකරණ ආකෘතිමය රාමුවට සම්බන්ධ වන විට විගණක විගණකගේ මතයට සම්බන්ධව යෝග්‍යව ලබාදීමට මතය සඳහා පදනම කොටස වහාම* පසුව එන ඡේදය ස්ථානගත කිරීමට අවශ්‍ය ලෙස විගණක සැලකීමට හැකිය.

- ප්‍රධාන විගණන කරුණු කොටස විගණකගේ වාර්තාවේ ඉදිරිත් කරන විට, කරුණ අවධාරණය කිරීමේ ඡේදයක්, ප්‍රධාන විගණන කරුණු කොටසකට එක්කෝ සෘජුවම පෙර හෝ පසුව කරුණ අවධාරණය කිරීමේ ඡේදය තුළ ඇතුලත් කරන තොරතුරුවල සාපේක්‍ෂ වැදගත්කම ලෙස විගණකගේ විනිශ්චය මත පදනම්ව ඉදිරිපත් කළ හැකිය. විගණක, කරුණ අවධාරණය කිරීමේ ශිර්ෂයක එනම් '' කරුණ අවධාරණය කිරීම' උදාහරණයකට කරුණ අවධාරණය කිරීම -පසුව සිදුවන සිදුවීම්'' , ප්‍රධාන විගණන කරුණු කොටසේ විස්තර කළ එක් එක් තනි කරුණක්, කරුණ අවධාරණය කිරීමේ ඡේදය වෙන් කොට දැක්වීමට තවදුරටත් එකතු කළ හැකිය.

*වෙනත් කරුණ ඡේද*

- විගණකගේ වාර්තාවේ ප්‍රධාන විගණන කරුණු *කොටසක* ඉදිරිපත් කරන විට, සහ වෙනත් කරුණ *ඡේදය එලෙසම අවශ්‍යයෙන්ම කළයුතු විට,* විගණක, *වෙනත් කරුණු ශිර්ෂයට තවදුරටත් සන්සන්දනයක් දෙනු ලබන විට* '' වෙනත් කරුණු - විගණනයේ විෂයපථය'' ප්‍රධාන විගණන කරුණු *කොටසේ විස්තර කළ තනි කරුණු* වෙනත් කරුණ *ඡේදයයෙන් වෙන් කොට දැක්වීමට ඇතුලත් කළ* හැකිය.

- විගණකගේ වාර්තාවේ වෙනත් කරුණු *ඡේදයක, ආමන්ත්‍රණය* අවධානය කළ වෙනත් *වාර්තාකරණ වගකීම් සම්බන්ධයෙන් කරුණකට* පරිශිලකයන්ගේ *අවධාරණයට ඇතුලත්* කරන විට, වෙනත් නීතිමය සහ නියාමන අවශ්‍යතා *කොටසේ* වාර්තාවේ මෙම *ඡේදය ඇතුලත් කළ* හැකිය.

- විගණකගේ වාර්තාවේ විගණකගේ *සියළුම* වගකීම් හෝ විගණකගේ වාර්තාවේ පරිශීලකයන්ගේ අවබෝධය අදාළ වන විට, වෙනත් කරුණු *ඡේදය* මූල්‍ය ප්‍රකාශන විගණනය මත වාර්තාව සහ වෙනත් නීතිමය සහ නියාමන අවශ්‍යතාවයන් මත පසුව එනවෙනම *කොටසක්* ලෙස *ඇතුලත් කළ* හැකිය.

අ17 *සියළුම දෑ* විගණකගේ වාර්තාවේ ඉදිරිපත් කරන විට, ප්‍රධාන විගණන කරුණු *කොටස, කරුණ අවධාරණය කිරීමේ ඡේදයක්* සහ වෙනත් කරුණ *ඡේදයක් අතර අන්තර් ක්‍රියාකාරිත්වයේ* නිදර්ශනනයන් 3 වන පරිශිෂ්ටයේ වේ. 4 වන පරිශිෂ්ටයේ නිදර්ශනාත්මක වාර්තාව, ලැයිස්තුගත අස්තිත්වයක් නොවන අස්තිත්වයන් සඳහා කොන්දේසි සහිත මතයකින් සමන්විත සහ ප්‍රධාන විගණන කරුණු සන්නිවේදනය නොකළ යුතු විගණකගේ වාර්තාවේ *කරුණ අවධාරණය කිරීමේ ඡේදය ඇතුලත් වේ* .

**පාලනය පිළිබඳ වග කිව යුතු අය සමඟ සන්නිවේදනය (යොමු :12 ඡේදය)**

12 වන ඡේදය මගින් අවශ්‍ය කරන එවැනි සන්නිවේදනය විගණකගේ වාර්තාවේ විගණක විසින් අවධානයට ලක්කිරීමට අදහස් කරන යම් නිශ්චිත කරුණුවල ස්වභාවය පාලනය පිළිබඳ වග කිව යුතු අයට දැන ගැනීමට ලක්වීමට හැකියාව ලබාදීමට අවශ්‍ය කරන අවස්ථාවලදී තවදුරටත් පැහැදිලි කිරීම් ඒ අයවලුන් හට විගණකගෙන් ලබා ගැනීමට අවස්ථාවන් සඳහා මං සලසයි. සෑම අනුයාත කාර්යයභාරයකදීම විශේෂ කරුණක් මත විගණකගේ වාර්තාවේ වෙනස් කරුණ ඡේදයක් ඇතුලත් කරීම යලි සිදුවන අවස්ථාවක සෑම කාර්යයභාරයක් මත එම සන්නිවේදනය නීතියෙන් හෝ රෙගුලාසි මගින් එසේ කිරීම අවශ්‍ය කරන්නේ නම් මිස එය නැවත නැවත කිරීම අනවශ්‍ය බව විගණකටම තීරණය කළ හැකිය.

**පරිශිෂ්ඨය 1**

(යොමු: 4, අ 4 ඡේද)

**වෙනත් කරුණ ඡේදය සඳහා අවශ්‍යතාවයන් ඇතුලත් ශ්‍රී.ල.වි.ප්‍ර. වල ලැයිස්තුව**

මෙම පරිශිෂ්ඨය සමහර අවස්ථාවලදී විගණකගේ වාර්තාව තුළ වෙනත් කරුණ ඡේදයක් ඇතුලත් කිරිමට විගණකට අවශ්‍ය කෙරෙන ශ්‍රී. ල.වි.ප්‍ර.වල ඡේද හඳුනා ගනී. ශ්‍රී. ල.වි.ප්‍ර.වල අවශ්‍යතාවන් සහ සම්බන්ධිත භාවිතා කිරීමේ සහ පැහැදිලි කිරීමේ වෙනත් කරුණු සලකා බැලීමේදී මෙම ලැයිස්තුව ආදේශකයක් නොවේ.

- ශ්‍රී.ල.වි.ප්‍ර. 210, විගණන කාර්යභාරයන්හි කොන්දේසි හා එකඟවීම 19(ආ) ඡේදය
- ශ්‍රී.ල.වි.ප්‍ර. 560, පසුව ඇතිවන සිදුවීම්– 12(ආ ) සහ 16 වන ඡේදය
- ශ්‍රී.ල.වි.ප්‍ර. 800 (සංශෝධිත), විශේෂ සලකා බැලීම්—විශේෂිත අරමුණු ආකෘතිමය රාමු ප්‍රකාරව පිළියෙල කළ මූල්‍ය ප්‍රකාශ විගණනය– 14 වන ඡේදය

**2 වන පරිශිෂ්ඨය**

(යොමු :2 ඡේදය)

**වෙනත් කරුණ ඡේදය සඳහා අවශ්‍යතාවයන් ඇතුලත් ශ්‍රී.ල.වි.ප්‍ර.වල ලැයිස්තුව**

මෙම පරිශිෂ්ඨය සමහර අවස්ථාවලදී විගණකගේ වාර්තාව තුළ වෙනත් කරුණ ඡේදයක් ඇතුලත් කිරීමට විගණකට අවශ්‍ය කෙරෙන ශ්‍රී.ල.වි.ප්‍ර.වල ඡේද හඳුනා ගනී. ශ්‍රී.ල.වි.ප්‍ර.වල අවශ්‍යතාවන් සහ සම්බන්ධිත භාවිතා කිරීමේ සහ පැහැදිළි කිරීමේ වෙනත් කරුණු සලකා බැලීමේදී මෙම ලැයිස්තුව ආදේශකයක් නොවේ.

- ශ්‍රී.ල.වි.ප්‍ර. 560,– පසුව ඇතිවන සිදුවීම් - 12(ආ ) සහ 16 වන ඡේදය
- ශ්‍රී.ල.වි.ප්‍ර. 710, සංසන්දනාත්මක තොරතුරු —අනුරූප සංඛ්‍යා සහ සංසන්දනාත්මක මූල්‍ය ප්‍රකාශ –ඡේද 13- 14, සහ 16-19

**3 පරිශිෂ්ඨය**

(යොමුව :අ17 ඡේදය)

**ස්ථානිකරණය කළ වාර්තා සඳහා නිදර්ශනාත්මක වාර්තා ශ්‍රී ලංකා විගණන ප්‍රමිත 700 (සංශෝධිත) යොමු වේ.**

ප්‍රධාන විගණන කරුණු *කොටසක්, කරුණ අවධාරණය කිරීමේ ඡේදයක්* සහ වෙනත් කරුණ *ඡේදයක්* ඇතුලත් වන *ස්වාධීන* විගණකගේ වාර්තාවක නිදර්ශනය

**නිදර්ශනාත්මක විගණක වාර්තාව සඳහා පහත සඳහන් තත්ත්වයන් උපකල්පනය කෙරේ:**

- **සාධාරණ ඉදිරිපත් කිරීමේ ආකෘතිමය රාමුවක් භාවිතා කරන ලැයිස්තුගත අස්තිත්වයක සම්පූර්ණ මූල්‍ය ප්‍රකාශන කට්ටලයක් විගණනය කිරීම. විගණනය, සමූහයේ විගණනය නොවේ. (එනම්., ශ්‍රී.ල.වි.ප්‍ර. 600[1] ව්‍යාවහාර නොකෙරේ ).**
- **අස්තිත්වයේ කළමනාකාරිත්වය විසින් ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත ප්‍රකාරව මූල්‍ය ප්‍රකාශ පිළියෙල කිරීම (පොදු අරමුණු ආකෘතිමය රාමුවක්).**
- **ශ්‍රී.ල.වි.ප්‍ර. 210 හි මූල්‍ය ප්‍රකාශ සඳහා කළමනාකාරිත්වයේ වගකීම් විස්තරයේ විගණකගේ කාර්යභාරයේ කොන්දේසි පිළිබිඹු වේ.**
- **ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව විගණක තීරණය කළ විකරණය නොකළ(එනම්., "පිරිසිදු") මතයක් යෝග්‍ය වේ .**
- **විගණනයට ව්‍යවහාර කරන අදාළ ආචාර ධර්ම අවශ්‍යතා අඩංගුව ඇත්තේ ශ්‍රී ලංකා වරලත් ගණකාධිකරණ ආයතනය විසින් නිකුත් කළ ආචාර ධර්ම සංග්‍රහයේය.**
- **ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව, ශ්‍රී.ලං.වි.ප්‍ර 570 (සංශෝධිත) අනුව අඛණ්ඩ පැවැත්ම ලෙස නොකඩවා පවත්වාගෙන යාමට අස්තිත්වයේ හැකියාව පිළිබඳ සැලකියයුතු අන්දමේ සැකයක් පහල කළ හැකි සිද්ධීන් හෝ තත්ත්වයන් සම්බන්ධයෙන් ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් නොපවතින බව විගණක තීරණය කර තිබීම.**
- **මූල්‍ය ප්‍රකාශ දිනය සහ විගණකගේ වාර්තාවේ දිනය අතර *පසුව සිදුවන සිදුවීමක් ලෙස* අස්තිත්වය විසින් *හෙළිදරව් කළ* අස්තිත්වයේ නිෂ්පාදන පහසුකම් තුළ ගින්නක් ඇතිවීම. විගණකගේ විනිශ්චය මත මූල්‍ය ප්‍රකාශ පරිශීලකයන්ගේ අවබෝධ කර ගැනීමට මූලික වන එම කරුණ ඉතාමත් වැදගත් වේ. ප්‍රවර්තන කාලපරිච්ඡේදයේ මූල්‍ය ප්‍රකාශ විගණනය තුළ සැලකියයුතු විගණකගේ අවධානය මෙම කරුණට අවශ්‍ය නොවේ.**

[1] SLAuS 600, *විශේෂ සලකා බැලීම්— සමූහ මූල්‍ය ප්‍රකාශනවල විගණනයන් (සංරචක විගණකගේ වැඩ ඇතුළුව )*

- **ශ්‍රී.ලං.වි.ප්‍ර 701 අනුව ප්‍රධාන විගණන කරුණු සන්නිවේදනය කර ඇත.**
- **විගණකගේ වාර්තාවේ දිනයට පෙර සියළුම තොරතුරු විගණක ලබාගෙන තිබීම සහ වෙනත් තොරතුරුවල ප්‍රමාණාත්මක අවප්‍රකාශයක් හඳුනාගෙන නොතිබීම.**
- **අනුරූපී සංඛ්‍යා ඉදිරිපත්කර ඇති බව සහ කලින් සිටි විගණක විසින් පෙර කාලපරිච්ඡේදයේ මූල්‍ය ප්‍රකාශ විගණනය කර තිබීම. අනුරූපී සංඛ්‍යා මත කලින් සිටි විගණකට යොමු කිරීමෙන් නීතියෙන් හෝ නියාමනයෙන් විගණක තහනම් නොකිරීම සහ එසේ කිරීමට තීරණය කර තිබීම.**
- **මූල්‍ය ප්‍රකාශ අධීක්ෂණය සඳහා වග කිවයුතු පුද්ගලයන් මූල්‍ය ප්‍රකාශ පිළියෙළ කරන පුද්ගලයන්ගෙන් වෙනස් වේ.**
- **මූල්‍ය ප්‍රකාශ විගණනයට අමතරව, දේශීය නීතිය යටතේ වෙනස් වාර්තාකරණ වගකීම් විගණකට පැවරී ඇත.**

## ස්වාධීන විගණකවරයාගේ වාර්තාව

ABC සමාගමේ කොටස් හිමියන්ට [හෝ වෙනත් යෝග්‍ය ආමන්ත්‍රණය කරන්නා]

මූල්‍ය ප්‍රකාශන විගණනය මත වාර්තාව[2]

**මතය**

ABC සමාගමේ (සමාගම) 20×1 දෙසැම්බර් මස 31 දිනට වූ මූල්‍ය තත්ත්ව ප්‍රකාශන සහ එම දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා විස්තීරණ ආදායම් ප්‍රකාශන, ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශය සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශය සහ මූල්‍ය ප්‍රකාශවලට සටහන් ඇතුළුව වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තීන්වල සාරංශයකින් සමන්විත මූල්‍ය ප්‍රකාශ අප විසින් විගණනය කරන ලදී

අපගේ මතය වනුයේ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත අනුව ABC සමාගමේ 20x1 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එම දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා වූ එහි මූල්‍ය කාර්යසාධනය සහ එහි මුදල් ප්‍රවාහ මගින් මූල්‍ය ප්‍රකාශ සත්‍ය හා සාධාරණ දර්ශනයක් (හෝ සියලුම ප්‍රමාණාත්මක අංගයන්ගෙන් සාධාරණව ඉදිරිපත් කර ඇති බව) ගෙන දෙනු ලැබේ.

**මතය සඳහා පදනම**

අප,ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුව අපගේ විගණනය මෙහෙයවන ලදී. එම ප්‍රමිතීන් යටතේ අපගේ වගකීම් මෙම වාර්තාවේ *මූල්‍ය ප්‍රකාශ* විගණනය මත *විගණකගේ වගකීම් කොටසේ* තවදුරටත් විස්තර කරනු ලැබේ. ශ්‍රී. ලංකා වරලත් ගණකාධිකරණ ආයතනය විසින් නිකුත් කළ ආචාරධර්ම සංග්‍රහයට (CA ශ්‍රී. ලංකා සංග්‍රහය) අනුව අප සමාගමෙන් ස්වාධීන වන අතර අප එම අවශ්‍යතාවයන්ට අනුව අපගේ අනෙකුත් ආචාරධර්ම වගකීම් ඉෂ්ට කර ඇත්තෙමු. අපගේ මතය සඳහා පදනමක් ලබාදීමට අප ප්‍රමාණවත් සහ යෝග්‍ය සාක්ෂි ලබා ගත් බව අපගේ විශ්වාසයයි.

***කරුණ අවධාරණය කිරීම්***[3]

අස්තිත්වයේ නිෂ්පාදන පහසුකම් තුළ ගින්නක් ඇතිවීමේ බලපෑම මූල්‍ය ප්‍රකාශවල විස්තර කළ X සටහනට අප අවධානය යොමු කළෙමු. මෙම *කරුණ සම්බන්ධයෙන්* අපගේ මතය විකරණය නොකරන්නෙමු.

**ප්‍රධාන විගණන කරුණු**

ප්‍රධාන විගණන කරුණු යනු ප්‍රවර්තන කාලපරිච්ඡේදයේ මූල්‍ය ප්‍රකාශවල අපගේ විගණන තුළදී අපගේ වෘත්තිය *විනිශ්චය අනුව වඩාත්ම වැදගත් වූ සෑම* කරුණු වේ. මූල්‍ය ප්‍රකාශ සමස්තයක් ලෙස ගත් කළ අපගේ විගණනය සම්බන්ධයෙන් සහ ඒ මත අපගේ මතය සකස් කිරීමේදී මෙම කරුණු අප ආමන්ත්‍රණය කර ඇති අතර මෙම කරුණු මත වෙනමම මතයක් අප සපයනු නොලැබේ.

[ශ්‍රී.ලං.වි.ප්‍ර 701 අනුව *සෑම* ප්‍රධාන විගණන කරුණකම විස්තරය.*]*

---

2 “වෙනත් නෛතික සහ නියාමන අවශ්‍යතා මත වාර්තාව” යන දෙවැනි උප මාර්තෘකාව අදාළ නොවන අවස්ථාවන්හිදී “මූල්‍ය ප්‍රකාශන මත විගණන වාර්තාව ” යන උප මාර්තෘකාව අවශ්‍ය නොවේ.

3 ආ16 ඡේදයේ අවධානය යොමු කළ, *කරුණ අවධාරණය කිරීමේ ඡේදයක්,කරුණ අවධාරණය කිරීමේ ඡේදය* තුළ ඇතුලත් කළ තොරතුරුවල සාපේක්‍ෂ *වැදගත්කමට විගණකගේ විනිශ්චය මත පදනම්ව සෘජුවම ප්‍රධාන විගණන කරුණු කොටසට පෙර හෝ පසුව ඉදිරිපත් කළ හැකිය..*

**වෙනත් කරුණ**

20×0 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා ABC සමාගමේ මූල්‍ය ප්‍රකාශන වෙනත් විගණකවරයෙක් විගණනය ඇති අතර 20×1 දෙසැම්බර් 31 දිනට මූල්‍ය ප්‍රකාශන මත විකරණය නොකළ මතයක් ප්‍රකාශ කර ඇත.

**වෙනත් තොරතුරු [හෝ "මූල්‍ය ප්‍රකාශන සහ ඒ මත විගණකගේ වාර්තාවමත හැර වෙනත් තොරතුරු" වැනි දෑ යෝග්‍ය නම් වෙනත් ශීර්ෂයක්]**

*[ශ්‍රී.ලං.වි.ප්‍ර. 720 (සංශෝධිත) හි වාර්තාකරණ අවශ්‍යතා අනුව වාර්තාකරණය -ශ්‍රී.ලං.වි.ප්‍ර. 720 (සංශෝධිත) හි 1 වැනි පරිශිෂ්ටයේ 2 වැනි නිදර්ශනය බලන්න.]*

**මූල්‍ය ප්‍රකාශන සඳහා කළමනාකරණය සහ පාලනය පිළිබඳ වග කිව අය සමඟ සන්නිවේදනය[4]**

*[ශ්‍රී.ලං.වි.ප්‍ර. 700 (සංශෝධිත) අනුව වාර්තාකරණය –ශ්‍රී.ලං.වි.ප්‍ර. 700 (සංශෝධිත) හි 1 වැනි නිදර්ශනය බලන්න..]*

**මූල්‍ය ප්‍රකාශන විගණනය සඳහා විගණකගේ වගකීම්**

*[ශ්‍රී.ලං.වි.ප්‍ර. 700 (සංශෝධිත) අනුව වාර්තාකරණය –ශ්‍රී.ලං.වි.ප්‍ර. 700 (සංශෝධිත) හි 1 වැනි නිදර්ශනය බලන්න..]*

**වෙනත් නෛතික සහ නියාමන අවශ්‍යතා මත වාර්තාව**

[ශ්‍රී.ලං.වි.ප්‍ර. 700 (සංශෝධිත) අනුව *වාර්තාකරණය* –ශ්‍රී.ලං.වි.ප්‍ර. 700 (සංශෝධිත) හි 1 වැනි නිදර්ශනය බලන්න.).]
මෙම ස්වාධීන විගණකගේ වාර්තාව සඳහා වගකිව යුතු කාර්යයභාරයේ නියුක්ත හවුල්කරුගේ ශ්‍රී ලංකා වරලත් ගණකාධිකරණ ආයතනයේ සමාජික අංකය වන්නේ [සමාජික අංකය].

[විගණන සමාගම නමින් අත්සන*]* *[විගණන සමාගමේ ලිපිනය]*

*[දිනය]*

**4 වන පරිශිෂ්ඨය**
(යොමු :අ8 ඡේදය)

**ස්ථානීය කරන ලද දේශීය වාර්තා සඳහා නිදර්ශනාත්මක වාර්තා ශ්‍රී ලංකා විගණන ප්‍රමිත 700 (සංශෝධිත) යොමු වේ.**

## අදාල මූල්‍ය වාර්තාකරණ ආකෘතිමය රාමුවෙන් ඉවත්වීම නිසා සහ *කරුණ අවධාරණය කිරීමේ ඡේදයක් ඇතුළත් වන* කොන්දේසි සහිත මතයකින් සමන්විත *ස්වාධීන* විගණකගේ වාර්තාවක නිදර්ශනය

**මෙම නිදර්ශනාත්මක විගණක වාර්තාව සඳහා පහත සඳහන් තත්ත්වයන් උපකල්පනය කෙරේ:**

- **සාධාරණ ඉදිරිපත් කිරීමේ ආකෘතිමය රාමුවක් භාවිත කරන ලැයිස්තුගත අස්තිත්වයක් නොවන අස්තිත්වයක් සඳහා වූ සම්පූර්ණ මූල්‍ය ප්‍රකාශ කට්ටලයක් විගණනය කිරීම. විගණනය, සමූහයේ විගණනයක් නොවේ. (එනම්., ශ්‍රී.ල.වි.ප්‍ර. 600 ව්‍යාවහාර නොකෙරේ).**
- **අස්තිත්වයේ කළමනාකාරිත්වය විසින් ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත ප්‍රකාරව මූල්‍ය ප්‍රකාශ පිළියෙල කිරීම (පොදු අරමුණු ආකෘතිමය රාමුවක්).**
- **ශ්‍රී.ල.වි.ප්‍ර. 210 හි මූල්‍ය ප්‍රකාශන සඳහා කළමනාකාරිත්වයේ වගකීම් විස්තරයේ විගණකගේ කාර්යභාරයේ කොන්දේසි පිළිබිඹු වේ.**
- **අදාල මූල්‍ය වාර්තාකරණ ආකෘතිමය රාමුවෙන් ඉවත්වීමක් කොන්දේසි සහිත මතයකට ප්‍රතිඵලයක් වේ.**

[4] මෙම නිදර්ශනාත්මක විගණකගේ වාර්තා පුරාවටම කළමනාකරණය සහ පාලනය පිළිබඳ වගකිව යුතු අය යන පද අදාල අධිකරණ බල ප්‍රදේශයක් තුළ නෛතික ආකෘතිමය රාමුව සම්බන්ධයෙන් ගත් කල යෝග්‍ය පරිදි වෙනත් පද මගින් ආදේශ කිරීමට අවශ්‍ය විය හැකිය.

- **විගණනයට ව්‍යවහාර කරන අදාල ආචාර ධර්ම අවශ්‍යතා අඩංගුව ඇත්තේ ශ්‍රී ලංකා වරලත් ගණකාධිකරණ ආයතනය විසින් නිකුත් කළ ආචාර ධර්ම සංග්‍රහයේය.**
- **ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව, ශ්‍රී.ලං.වි.ප්‍ර. 570 (සංශෝධිත) අනුව අඛණ්ඩ පැවැත්ම ලෙස නොකඩවා පවත්වාගෙන යාමට අස්තිත්වයේ හැකියාව පිළිබඳ සැලකිය යුතු අන්දමේ සැකයක් පහල කළ හැකි සිද්ධීන් හෝ තත්වයන් සම්බන්ධයෙන් ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් නොපවතින බව විගණක තීරණය කර ඇත..**
- **මූල්‍ය ප්‍රකාශන දිනය සහ විගණකගේ වාර්තාවේ දිනය අතර *පසුව සිදුවන සිදුවීමක් ලෙස* අස්තිත්වය විසින් *හෙළිදරව් කළ* අස්තිත්වයේ නිෂ්පාදන පහසුකම් තුළ ගින්නක් ඇතිවීම. විගණකගේ විනිශ්චය මත මූල්‍ය ප්‍රකාශන පරිශීලකයන්ගේ අවබෝධ කර ගැනීමට මූලිකයක් වන එම කරුණ වැදගත් වේ. ප්‍රවර්තන කාලපරිච්ජේදයේ මූල්‍ය ප්‍රකාශන විගණනය තුළ සැලකියයුතු විගණකගේ අවධානය මෙම කරුණ අවශ්‍ය නොවේ.**
- **ශ්‍රී.ලං.වි.ප්‍ර. 701 අනුව ප්‍රධාන විගණන කරුණු සන්නිවේදනය කිරීම විගණකට අවශ්‍ය නොකරන අතර එසේ නැත්නම් තීරණය නොකර තිබීම.**
- **විගණක විසින් විගණකගේ වාර්තාවේ දිනයට පෙර යම් වෙනත් තොරතුරු ලබාගෙන නොතිබීම.**
- **මූල්‍ය ප්‍රකාශ අධීක්ෂණය සඳහා වග කිවයුතු පුද්ගලයන් මූල්‍ය ප්‍රකාශ පිළියෙළ කරන පුද්ගලයන්ගෙන් වෙනස් වේ.**
- **මූල්‍ය ප්‍රකාශන විගණනයට අමතරව විගණකට දේශීය නීතිය යටතේ අවශ්‍ය කෙරෙන වෙනත් වාර්තාකරණ වගකීම් විගණකට ඇත.**

## ස්වාධීන විගණකගේ වාර්තාව

ABC සමාගමේ කොටස්හිමියන්ට [හෝ වෙනත් යෝග්‍ය ආමන්ත්‍රණය කරන්නා]

### මූල්‍ය ප්‍රකාශ විගණනය මත වාර්තාව[1]

### කොන්දේසි සහිත මතය

ABC සමාගමේ (සමාගම) 20×1 දෙසැම්බර් මස 31 දිනට වූ මූල්‍ය තත්ත්ව ප්‍රකාශය සහ එම දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා විස්තීරණ ආදායම් ප්‍රකාශය, ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශය සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ සහ මූල්‍ය ප්‍රකාශනවලට සටහන් ඇතුළුව වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තීන්වලින් සමන්විත මූල්‍ය ප්‍රකාශ අප විසින් විගණනය කරන ලදී.

ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත අනුව ABC සමාගමේ 20x1 දෙසැම්බර් 31 දිනට එහි මූල්‍ය තත්ත්වය සහ එම දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා වූ එහි මූල්‍ය කාර්යසාධනය සහ එහි මුදල් ප්‍රවාහ මගින් අපගේ වාර්තාවේ *කොන්දේසි සහිත මතය සඳහා පදනම වන කොටසේ විස්තර* කර ඇති කරුණ මත වන බලපෑම හැරුණු කොට අපගේ මතය වනුයේ එක්ව ඇති මූල්‍ය ප්‍රකාශන සියලු ප්‍රමාණාත්මක අංගයන්ගෙන් සාධාරණ ලෙස (හෝ සත්‍ය හා සාධාරණ දර්ශනයක් ලබාදෙයි) ඉදිරිපත් කර ඇත.

### කොන්දේසි සහිත මතයක් සඳහා පදනම

සමාගමේ කෙටිකාලීන අලෙවි කර ගත හැකි සුරකුම්පත් මූල්‍ය තත්ත්ව ප්‍රකාශයේ දක්වන්නේ XXX ලෙසයි. කළමනාකාරිත්වය එම සුරුකුම්පත් දක්වා තිබෙන්නේ වෙළෙඳපොල වටිනාකමට අගය කර නොව පිරිවැයටයි. එය ශ්‍රී ලංකා ගිණුම් ප්‍රමිතවලින් අපගමනයවීමක් ස්ථාපනය වේ. කළමනාකාරිත්වය අලෙවි කර ගත හැකි සුරකුම්පත් වෙළෙඳපොල වටිනාකමට සමාගමේ වාර්තාවල දැක්වූයේ නම් වර්ෂය සඳහා විස්තීරණ ආදායම් ප්‍රකාශනයේ උපලබ්ධි නොවූ අලාභය ලෙස XXX සමාගම හඳුනාගත යුතුව තිබී ඇත. 20×1 දෙසැම්බර් මස 31 දිනට එම වටිනාකමෙන් මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ සුරකුම්පත්වල ධාරණ අගය අඩුවනු අතර පිළිවෙළින් ×××, ××× සහ ××× වටිනාකම්වලින් ආදායම් බදු, ශුද්ධ ආදායම සහ කොටස් හිමියන්ගේ ස්කන්ධය අඩුවනු ඇත.

---

1 "වෙනත් නෛතික සහ නියාමන අවශ්‍යතා මත වාර්තාව" යන දෙවැනි උප මාර්තෘකාව අදාල නොවන අවස්ථාවන්හිදී "මූල්‍ය ප්‍රකාශන මත විගණන වාර්තාව " යන උප මාර්තෘකාව අවශ්‍ය නොවේ.

අප,ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුව අපගේ විගණනය මෙහෙයවන ලදී. එම ප්‍රමිතීන් යටත්ව අපගේ වගකීම් අපගේ වාර්තාවේ *මූල්‍ය ප්‍රකාශන* මත *විගණනයේ විගණකගේ වගකීම් කොටසේ* තවදුරටත් විස්තර කරනු ලැබේ. ශ්‍රී. ලංකා වරලත් ගණකාධිකරණ ආයතනය විසින් නිකුත් කළ ආචාරධර්ම සංග්‍රහයට (CA ශ්‍රී. ලංකා සංග්‍රහය) අනුව අප සමාගමෙන් ස්වාධීන වන අතර අප එම අවශ්‍යතාවයන්ට අනුව අපගේ අනෙකුත් ආචාරධර්ම වගකීම් ඉෂ්ට කර ඇත්තෙමු. අපගේ කොන්දේසි සහිත මතය සඳහා පදනමක් ලබාදීමට අප ප්‍රමාණවත් සහ යෝග්‍ය විගණන සාක්ෂි ලබා ගත් බව අපගේ විශ්වාසයයි

***කරුණ අවධාරණය කිරීම-ගින්නේ බලපෑම***

සමාගමේ නිෂ්පාදන පහසුකම් තුළ ගින්නක් ඇතිවීමේ බලපෑම මූල්‍ය ප්‍රකාශනවල විස්තර කළ X සටහනට අප අවධානය යොමු කරන්නෙමු. *මෙම කරුණ සම්බන්ධයෙන්* අපගේ මතය විකරණය නොකරන්නෙමු.

**මූල්‍ය ප්‍රකාශන සඳහා කළමනාකරණය සහ පාලනය පිළිබඳ වගකිව යුතු අය සමඟ සන්නිවේදනය**[2]

*[ශ්‍රී.ලං.වි.ප්‍ර. 700 (සංශෝධිත) අනුව වාර්තාකරණය – ශ්‍රී.ලං.වි.ප්‍ර. 700 (සංශෝධිත) හි 1 වැනි නිදර්ශනය බලන්න.)]*

**මූල්‍ය ප්‍රකාශන විගණනය සඳහා විගණකගේ වගකීම්**

*[ශ්‍රී.ලං.වි.ප්‍ර. 700 (සංශෝධිත) අනුව වාර්තාකරණය – ශ්‍රී.ලං.වි.ප්‍ර. 700 (සංශෝධිත) හි 1 වැනි නිදර්ශනය බලන්න.]*

**වෙනත් නෛතික සහ නියාමන අවශ්‍යතා මත වාර්තාව**

*[ශ්‍රී.ලං.වි.ප්‍ර. 700 (සංශෝධිත) අනුව වාර්තාකරණය – [ ශ්‍රී.ලං.වි.ප්‍ර. 700 (සංශෝධිත) හි 1 වැනි නිදර්ශනය බලන්න.).]*

[විගණන සමාගම නමින් අත්සන] *[විගණන සමාගමේ ලිපිනය]*

*[දිනය]*

[2] හෝ විශේෂ අධිකරණ බල ප්‍රදේශයක නෛතික ආකෘතිමය රාමුවේ සම්බන්ධ වන යෝග්‍ය වෙනත් පද

# ශ්‍රී ලංකා විගණන ප්‍රමිත 720 (සංශෝධිත)

## වෙනත් තොරතුරු සම්බන්ධයෙන් විගණකගේ වගකීම්

(2018 මාර්තු 31 වන දින හෝ ඊට පසුව අවසන් වන කාලපරිච්ඡේදවල මූල්‍ය ප්‍රකාශ විගණනයන් සඳහා බලපැවැත් වේ)

**පටුන**

ඡේද

**හැඳින්වීම**

මෙම ශ්‍රී.ල.වි.ප්‍ර.යේ විෂය පථය………………………………………………………. 1–9

බලපැවැත්වෙන දිනය ………………………………………...…………………………. 10

**අරමුණු** ........................................................................................................ 11

**නිර්වචන**..................................................................................................... 12

**අවශ්‍යතාවයන්**

වෙනත් තොරතුරු ලබාගැනීම ………………………………………………………….. 13

වෙනත් තොරතුරු කියවීම සහ සියල්ල සලකා බැලීම ………..………………………….……. 14–15

ප්‍රමාණාත්මක අසංගතබවක් පැවතීම පෙන්නුම් කරන විට හෝ වෙනත් තොරතුරුවල ප්‍රමාණාත්මක අවප්‍රකාශයක් පෙන්නුම් කරන විට ප්‍රතිචාර දැක්වීම ………………...………. 16

වෙනත් තොරතුරුවල ප්‍රමාණාත්මක අවප්‍රකාශයක් පවතින බව විගණක තීරණය කරන විට ප්‍රතිචාර දැක්වීම 17–19

මූල්‍ය ප්‍රකාශ තුළ ප්‍රමාණාත්මක අවප්‍රකාශයක් පවතින විට හෝ අස්තිත්වයේ සහ එහි පරිසරයේ විගණකගේ අවබෝධය යාවත්කාලීන කිරීමට අවශ්‍ය වන විට ප්‍රතිචාර දැක්වීම........................... 20

වාර්තාකරණය ………………………………………………………………………….. 21–24

ලේඛනගත කිරීම ………………………………………………………………………. 25

**භාවිත කිරීමේ සහ පැහැදිලි කිරීමේ වෙනත් කරුණු**

නිර්වචන ………………………………………………………………………. . අ1–අ10

වෙනත් තොරතුරු ලබාගැනීම ……………………………………………. අ11–අ22

වෙනත් තොරතුරු කියවීම සහ සියල්ල සලකා බැලීම ……………………………………… අ23–අ38

ප්‍රමාණාත්මක අසංගතබවක් පැවතීමට පෙන්නුම් කරන විට හෝ වෙනත් තොරතුරුවල ප්‍රමාණාත්මක අවප්‍රකාශයක් පෙන්නුම් කරන විට ප්‍රතිචාර දැක්වීම…………………………………… අ39–අ43

වෙනත් තොරතුරු ප්‍රමාණාත්මක අවප්‍රකාශයක් පවතින බව විගණක තීරණය කරන විට ප්‍රතිචාර දැක්වීම ………………………………………………………. අ44–අ50

මූල්‍ය ප්‍රකාශන තුළ ප්‍රමාණාත්මක අවප්‍රකාශයක් පවතින විට හෝ අස්තිත්වයේ සහ එහි පරිසරයේ විගණකගේ අවබෝධය යාවත්කාලීන කිරීමට අවශ්‍ය වන විට ප්‍රතිචාර දැක්වීම…..……………… අ51

වාර්තාකරණය…………………………………………………………………… අ52–අ59

1 වන පරිශිෂ්ටය - වෙනත් තොරතුරුවල ඇතුළත් කිරීමට හැකි වටිනාකමේ හෝ වෙනත් අයිතමවල උදාහරණ

1ග වන පරිශිෂ්ටය - වෙනත් තොරතුරුවලට සම්බන්ධ විගණකගේ වාර්තාවේ නිදර්ශන.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිත (ශ්‍රී.ලං.වි.ප්‍ර.) 720 (සංශෝධිත) වෙනත් තෙරතුරු සම්බන්ධයෙන් විගණකගේ වගකීම් කියවිය යුත්තේ ශ්‍රී.ලං.වි.ප්‍ර. 200 *ස්වාධීන විගණකගේ සමස්ත අරමුණු සහ ශ්‍රී ලංකා විගණන ප්‍රමිතවලට අනුව විගණනයක් මෙහෙයවීම එක්කරමිනි.*

## හැඳින්වීම

**මෙම ශ්‍රී.ලං.වි.ප්‍ර. යේ විෂය පථය**

1. මෙම ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිය (ශ්‍රී.ලං.වි.ප්‍ර.), අස්තිත්වයක වාර්ෂික වාර්තාවක (මූල්‍ය ප්‍රකාශන සහ ඒ මත විගණකගේ වාර්තාව හැර) ඇතුළත් මූල්‍ය හෝ මූල්‍ය නොවන තොරතුරු වුවත් නැතත් වන වෙනත් තොරතුරුවලට සම්බන්ධ විගණකගේ වගකීම් සමග කටයුතු කෙරේ. අස්තිත්වයක වාර්ෂික වාර්තාව එකම අරමුණ හෝ තනි ලේඛනයක ලේඛනවල සංයෝජනයක් විය හැකිය.

2 මෙම ශ්‍රී.ලං.වි.ප්‍ර. ලියා ඇත්තේ ස්වාධීන විගණක විසින් මූල්‍ය ප්‍රකාශවල විගණනයක සම්බන්ධයෙනි. ඒ අනුව මෙම ශ්‍රී.ලං.වි.ප්‍ර. යේ විගණකගේ අරමුණු ශ්‍රී.ලං.වි.ප්‍ර. 200[1] හි 11 වැනි ඡේදයේ සඳහන් පරිදි විගණකගේ සමස්ත අරමුණුවල සම්බන්ධය තුළ අවබෝධ කර ගත යුතුය. මෙම ශ්‍රී.ලං.වි.ප්‍ර. තුළ අවශ්‍යතාවයන් සැලසුම් කර ඇත්තේ ශ්‍රී.ලං.වි.ප්‍ර. වල නියම කර ඇති අරමුණු සහ ඒ අනුව එහි ප්‍රතිඵලයන්ගෙන් විගණකගේ සමස්ත අරමුණු අත්පත් කර ගැනීමට විගණකට හැකිවීමටයි. මූල්‍ය ප්‍රකාශන මත විගණකගේ මතය අනෙකුත් තොරතුරු ආවරණය නොකරන හෝ ශ්‍රී.ලං.වි.ප්‍ර. මූල්‍ය ප්‍රකාශ මත මතයක් සකස් කිරීමට අවශ්‍ය වනවාට වඩා විගණක සාක්ෂි ලබාගැනීමට විගණකට අවශ්‍ය නොකෙරේ.

3 අනෙකුත් තොරතුරු, මූල්‍ය ප්‍රකාශන සමග ප්‍රමාණාත්මකව අසංගතව වන නිසා හෝ විගණනය තුළ ලබා ගන්නා විගණකගේ දැනුම මූල්‍ය ප්‍රකශවල ප්‍රමාණාත්මක අවප්‍රකාශයක් ඇති බව ඇඟවිය හැකි නිසා හෝ අනෙකුත් තොරතුරුවල පවතින ප්‍රමාණාත්මක අවප්‍රකාශයක්, මූල්‍ය ප්‍රකාශවල සහ ඒ මත විගණකගේ වාර්තාවේ විශ්වාසනියත්වය පිළිගැනීමට රහසින් හානිකළ හැකි බැවින් වෙනත් තොරතුරු කියවීමට හෝ සැලකිල්ලට ගැනීමට මෙම ශ්‍රී.ලං.වි.ප්‍ර. අනුව විගණකට අවශ්‍ය කෙරේ. එවැනි ප්‍රමාණාත්මක අවප්‍රකාශන, විගණකගේ වාර්තාව පිළියෙල කරන, පරිශීලකයින්ගේ ආර්ථික තීරණවලට අයෝග්‍යව බලපෑම් ද කළ හැකිය.

4 ප්‍රමාණාත්මක ලෙස ව්‍යාජ හෝ නොමග යවනසුළු ප්‍රකාශයක් ඇතුළත් වන ප්‍රකාශ හෝ තොරතුරු නොසැලකිලිමත් ලෙස ඉදිරිපත් කිරීම අවශ්‍ය වියහැකි තොරතුරු අත් හැරීම හෝ අපැහැදිලි විම එවැනි අත්හැරිම හෝ අපැහැදිලි වීම නොමග යවනසුළු වියහැකි බව විගණක විශ්වාස කරන විට එම තොරතුරු සමග දැනුවත්ව විගණක සම්බන්ධවීම අවශ්‍ය කරන[2] අදාලවන ආචාරධර්ම අවශ්‍යතාවන් සමග අනුගත වීම මෙම ශ්‍රී.ලං.වි.ප්‍ර. විගණකට සහාය විය හැකිය.

5. මූල්‍ය ප්‍රකාශ තුළ වටිනාකමේ හෝ වෙනත් අයිතම පිළිබඳ දීර්ඝ විස්තර සාරාංශ කිරීමට හෝ ලබාදීමට සහ වෙනත් වටිනාකමෙන් හෝ වෙනත් අයිතම පිළිබඳ විගණනයේදී විගණකට ලබා ගන්නා දැනුම ඒ හා සමානව අදහස් කළහැකි සහ වෙනත් අයිතම වෙනත් තොරතුරුවල ඇතුළත් විය හැකිය. එනම් වෙනත් කරුණු ද අනෙකුත් තොරතුරුවල ඇතුළත් විය හැකිය.

6. වෙනත් තොරතුරුවලට සම්බන්ධයෙන් විගණකගේ වගකීම් වනුයේ (අදාල වාර්තාකරණය වගකීම් හැර) විගණක විසින් වෙනත් තොරතුරු ලබා ගත්තේ විගණකගේ වාර්තාවේ දිනයට පෙර හෝ පසු යන්න නොසලකා ව්‍යවහාර කරයි.

7 මෙම ශ්‍රී.ලං.වි.ප්‍ර. පහත සඳහන් දෑවලට ව්‍යවහාර නොකරයි:
(අ) මූල්‍ය තොරතුරුවල ප්‍රාථමික දැනුම් දීම හෝ
(ආ) සංස්ථා ප්‍රකාශය ඇතුළුව සුරකුම්පත් ඉදිරිපත් කිරීමේ ලිපිලේඛනයන්

8 මෙම ශ්‍රී.ලං.වි.ප්‍ර. යටතේ විගණකගේ වගකීම් වෙනත් තොරතුරු මත සහතික කිරීමේ කාර්යභාරයන් ස්ථාපනය නොවේ නැතහොත් වෙනත් තොරතුරු පිළිබඳ සහතික කිරීම විගණකට ලබා දීමට බැඳීමක් පැනවිය නොහැකිය.

9. නීතිය හෝ රෙගුලාසි මගින්, මෙම ශ්‍රී.ලං.වි.ප්‍ර. විෂය පථයට එහා වෙනත් තොරතුරුවලට සම්බන්ධ විගණක මත අමතර බැඳීම් පැනවිය හැකිය.

---

[1] SLAuS 200, *ස්වාධීන විගණකගේ සමස්ත අරමුණු සහ ශ්‍රී ලංකා විගණන ප්‍රමිතවලට අනුව විගණනයක් සිදුකිරීම*

[2] *වෘත්තීය ගණකාධිකාරිවරුන් සඳහා ආචාරධර්ම සංග්‍රහය* (ශ්‍රී ලංකා වරලත් ගණකාධිකරණ ආයතනය විසින් නිකුත් කළ ආචාරධර්ම සංග්‍රහය), 110.2 ඡේදය

**බලපැවැත්වෙන දිනය**

10. මෙම ශ්‍රී.ලං.වි.ප්‍ර., 2018 මාර්තු 31 දින හෝ ඊට පසු අවසන් වන කාලපරිච්ඡේද සඳහා වන මූල්‍ය ප්‍රකාශ මත විගණනයන්ට බලපැවැත් වේ.

**අරමුණු**

11. වෙනත් තොරතුරු කියවීමෙන් පසු විගණකගේ අරමුණ වනුයේ මූල්‍ය ප්‍රකාශ සහ වෙනත් තොරතුරු අතර ප්‍රමාණාත්මක අසංගතතාවයක් තිබේදැයි සලකා බැලීමට;

(අ) වෙනත් තොරතුරු සහ විගණනයේදී ලබා ගන්නා විගණකගේ දැනුම අතර ප්‍රමාණාත්මක අසංගතතාවයක් තිබේදැයි සලකා බැලීමට;

(ආ) විගණක, එවැනි ප්‍රමාණාත්මක අසංගතතාවයක් පැවතීමට පෙන්නුම්කරන බව හඳුනා ගන්නා විට හෝ අනෙකුත් තොරතුරු ප්‍රමාණාත්මක අවප්‍රකාශන වන්නේ දැයි පෙන්නුම්කරන බව විගණක වෙනත් ලෙසකින් දැනුවත් වන විට යෝග්‍ය ලෙස ප්‍රතිචාර දැක්වීමට; සහ

(ඇ) මෙම ශ්‍රී.ලං.වි.ප්‍ර. අනුව වාර්තා කිරීමට

**නිර්වචන**

12. මෙම ශ්‍රී.ලං.වි.ප්‍ර.යෙහි අරමුණු සඳහා පහත දැක්වෙන පදවල පහතින් ආරෝපිත වි :

(අ) වාර්ෂික වාර්තාව - මූල්‍ය ප්‍රකාශ තුළ නියම කර ඇති ලෙස සමග අස්තිත්වයේ මෙහෙයුම් සහ අස්තිත්වයේ මූල්‍ය ප්‍රතිඵල සහ මූල්‍ය තත්වය සමග තොරතුරු අයිතිකරුවන්ට (හෝ ඒ සමාන ඇල්මැති පාර්ශවයන්ට) ලබාදීමේ අරමුණට නීතිය රෙගුලාසි හෝ භාවිතය අනුව කළමණාකරනය හෝ පාලනය භාරව සිටින පුද්ගලයින් විසින් වාර්ෂික පදනම මත සාමාන්‍යයෙන් පිළියෙල කරනු ලබන ලේඛනයන් හෝ ලේඛනවල සංයෝජනයකි. වාර්ෂික වාර්තාව මූල්‍ය ප්‍රකාශය ඒ මත විගණකගේ වාර්තාව එක්ව සමන්විත වන අතර අස්තිත්වයේ සංවර්ධනයත් එහි අනාගත දැක්ම සහ අවදානම් හා අවිනිශ්චිතතා පිළිබඳ තොරතුරු අස්තිත්වය ලෙස මණ්ඩලයේ ප්‍රකාශයක් සහ පාලනය පිළිබඳ කරුණු ආවරණය කරන වාර්තා සාමාන්‍යයෙන් ඇතුළත් වේ. (යොමුව: අ5 ජේදය)

(ආ) වෙනත් තොරතුරුවල අවප්‍රකාශය - වෙනත් තොරතුරු වැරදි ලෙස සඳහන් වීම පවතින්නේ වෙනස් නොකර වැරදියට දැක්වීම හෝ ඇත්ත වශයෙන් වැරදි අදහසක් වන අවස්ථාවලදීය. (එය වෙනත් තොරතුරුවල හෙළිදරව් කළ කරුණක නිසි ලෙස අවබෝධයක් ලබා ගැනීම සඳහා අවශ්‍ය තොරතුරු අත්හැරීම හෝ අපැහැදිලිවීම ඇතුළත්ව) (යොමුව අ 6 - අ 7 ජේද )

(ඇ) වෙනත් තොරතුරු - අස්තිත්වයක වාර්ෂික වාර්තාවක ඇතුළත් මූල්‍ය හෝ මූල්‍ය නොවන තොරතුරු (මූල්‍ය ප්‍රකාශ සහ ඒමත විගණකගේ වාර්තාව හැර) (යොමුව: අ8–අ10 ජේද)

**අවශ්‍යතාවයන්**

**වෙනත් තොරතුරු ලබා ගැනීම**

13. විගණක පහත දෑ සිදුකළ යුතුයි.: (යොමුව අ 11 - අ 22 ජේද)

(අ) වාර්ෂික වාර්තාව සමන්විත වන්නේ කුමන ලේඛනයේ (න්) සහ එවැනි ලේඛන නිකුත් කිරීමේ අස්තිත්වයේ සැලසුම් කළ ආකාරය කාලනිර්ණය කළමණාකරණය සමග සාකච්ඡා කිරීමෙන් තීරණය කළ යුතුය;

(ආ) කාලෝචිත ආකාරයෙන් සහ හැකිනම් වාර්ෂික වාර්තාව සමන්විත ලියවිල්ල (ලියවිලිවල) අවසාන සංස්කරණය විගණකගේ වාර්තාවේ දිනයට පෙර ලබා ගැනීමට කළමණාකරණය සමග යෝග්‍ය සැලසුමක් සිදු කළ යුතුය; සහ

(ඇ) විගණකගේ වාර්තාවේ දිනය පසු වන තුරු නිර්ණය කළ සමහර හෝ සියලුම ලේඛනය (ලේඛන) නොපවතින විට ලේඛනවල අවසන් සංස්කරණය ලබාගත නොහැකි නිසා අස්තිත්වය එය නිකුත් කිරීමට පෙර විගණකට ලබා දෙන බව ලිඛිත නියෝජනයක් ලබා දීමට කළමනාකරණයෙන් ඉල්ලීම් කිරීම. එවිට විගණකට මෙම ශ්‍රී.ලං.වි.ප්‍ර මගින් අවශ්‍ය වන පටිපාටි සම්පූර්ණ කිරීමට පුළුවනි.(යොමුව - අ 22 ජේදය)

**වෙනත් තොරතුරු කියවීම සහ සියල්ල සලකා බැලීම.**

14. විගණක වෙනත් තොරතුරු කියවිය යුතු අතර එසේ කිරීමේ දී පහත දෑ සලකා බැලිය යුතුයි.: (යොමුව අ23-අ24)

(අ) වෙනත් තොරතුරු සහ මුල්‍ය ප්‍රකාශන අතර ප්‍රමාණාත්මක අසංගතතාවයක් තිබේ දැයි සලකා බැලිය යුතුය. මෙම සලකා බැලීම සඳහා පදනම ලෙස විගණක වෙනත් තොරතුරු තුළ තෝරාගත් වටිනාකම හෝ වෙනත් අයිතම එවායේ සංගතතාවය සැසඳීමට (මූල්‍ය ප්‍රකාශන තුළ වටිනාකම හෝ වෙනත් අයිතම පිළිබඳ වැඩිදුර විස්තර සාරාංශ කිරීම හෝ සැපයීමට ලෙස සමානව අදහස් කරන විට) මුල්‍ය ප්‍රකාශන තුළ එවැනි වටිනාකම් හෝ වෙනත් අයිතම සමඟ ඇගයීම සිදුකළ යුතුය. සහ (යොමුව අ25- අ 29)

(ආ) විගණනය තුළදී ලබා ගත් විගණන සාක්ෂි සහ ළඟාකරගත් තීරණ සම්බන්ධයෙන් වෙනත් තොරතුරු සහ විගණනය තුළ දී ලබා ගත් විගණකගේ දැනුවත් බව අතර ප්‍රමාණාත්මක අසංගතතාවයක් තිබේ දැයි සලකා බැලිය යුතුය. (අ 30 - අ 36)

15. ඡේදයට අනුව වෙනත් තොරතුරු කියවන අතරතුර මුල්‍ය ප්‍රකාශනවලට සම්බන්ධ නොවන වෙනත් තොරතුරු හෝ ප්‍රමාණාත්මක අවප්‍රකාශ විය හැකි බව පෙන්නුම් කරන විගණනයේ දී ලබා ගත් විගණකගේ දැනුම ඇගවීම සඳහා විගණන සෝදිසියන් සිදුකළ යුතුය. (යොමුව අ24, අ37 - අ38 ඡේද)

**ප්‍රමාණාත්මක අසංගතතාවයක් පැවතීමට පෙන්නුම් කරන විට හෝ වෙනත් තොරතුරුවල ප්‍රමාණාත්මක අවප්‍රකාශයන් පෙන්නුම් කරන විට ප්‍රතිචාර දැක්වීම.**

16. ප්‍රමාණාත්මක අසංගතතාවය පැවතීමට පෙන්නුම් කරන බව විගණක හඳුනා ගන්නේ නම් (හෝ වෙනත් තොරතුරු ප්‍රමාණාත්මක අවප්‍රකාශ වී ඇති බව පෙන්නුම් කරන බව දැනුවත් වීම.) විගණක, කරුණු කළමනාකරණය සමඟ සාකච්ඡා කළ යුතු අතර සහ අවශ්‍ය නම් පහත දෑ ඇත්දැයි විගණක තීරණය කිරීමට වෙනත් පටිපාටි ඉටු කළ යුතුය: (යොමුව අ 39 - අ 43)

(අ) වෙනත් තොරතුරුවල ප්‍රමාණාත්මක අවප්‍රකාශයක් පවතී ද යන්න.

(ආ) මුල්‍ය ප්‍රකාශනවල ප්‍රමාණාත්මක අවප්‍රකාශයක් පවතී ද යන්න.; හෝ

(ඇ) අස්තිත්වයේ සහ එහි පරිසරයේ විගණකගේ අවබෝධය යාවත්කාලීන වීමට අවශ්‍ය ද යන්න.

**වෙනත් තොරතුරුවල ප්‍රමාණාත්මක අවප්‍රකාශයක් පවතින බව විගණක තීරණය කරන විට ප්‍රතිචාර දැක්වීම.**

17. වෙනත් තොරතුරුවල ප්‍රමාණාත්මක අවප්‍රකාශයක් පවතින බව විගණක තීරණය කරන්නේ නම් විගණක විසින් වෙනත් තොරතුරු නිවැරදි කිරීමට කළමනාකරණයෙන් ඉල්ලීම් කළ යුතුය. කළමණාකරණය:

(අ) එම නිවැරදි කිරීම සිදු කිරීමට එකඟ නම් විගණක එම නිවැරදි කිරීම සිදුකර තිබෙන බව තීරණය කළ යුතු වේ; හෝ

(ආ) නිවැරදි කිරීම සිදුකිරීම ප්‍රතික්ෂේප කරන්නේ නම් එම කරුණ පාලනය භාරව සිටින පුද්ගලයින්ට සන්නිවේදනය කිරීම සහ සිදුකළ යුතු නිවැරදි කිරීම කරන ලෙස ඉල්ලා සිටීම.

18. විගණකගේ වාර්තාවේ දිනයට පෙර ලබා ගත් වෙනත් තොරතුරුවල ප්‍රමාණාත්මක අවප්‍රකාශයක් පවතින බව සහ පාලනය පිළිබඳ වගකිව යුතු අය සමඟ සන්නිවේදනය කිරීමෙන් පසු නිවැරදි නොකළ වෙනත් තොරතුරු ඇති බව විගණක තීරණය කරන්නේ නම් පහත සඳහන් දෑ ඇතුළත්ව විගණක යෝග්‍ය ක්‍රියාමාර්ග ගත යුතුය.: (යොමුව අ44 ඡේදය)

(අ) විගණකගේ වාර්තාවේ ප්‍රතිඵල සලකා බැලීම සහ විගණකගේ වාර්තාවේ ප්‍රමාණාත්මක අවප්‍රකාශය ආමන්ත්‍රණය කිරීමට විගණක සැලසුම් කරන්නේ කෙසේ දැයි පාලනය පිළිබඳ වගකිව යුතු සමඟ සන්නිවේදනය කිරීමට (22 (ඉ) ii ඡේදය බලන්න) ; හෝ (යොමුව අ45 ඡේදය)

(ආ) අදාළ නීති හෝ රෙගුලාසි යටතේ ඉවත් වීම විය හැකි අවස්ථාවක දී කාර්යභාරයෙන් ඉවත් වීම.(යොමුව අ 46 - අ 47 ඡේදය)

19. විගණකගේ වාර්තාවේ දිනයට පසු ලබාගත් වෙනත් තොරතුරුවල ප්‍රමාණාත්මක අවප්‍රකාශයක් පවතින බව විගණක තීරණය කරන්නේ නම් විගණක පහත දෑ සිදුකළ යුතුයි:

(අ) වෙනත් තොරතුරු නිවැරදි කරන්නේ නම් , පවතින තත්වයන්වල දී වලදී අවශ්‍ය ක්‍රියාපටිපාටි ඉටු කිරීම හෝ (යොමුව අ48 ඡේදය);

(ආ) පාලනය පිළිබඳ වගකිව යුතු අය සමග සන්නිවේදනය කිරීමෙන් පසු වෙනත් තොරතුරු නිවැරදි නොකළේ නම් නිවැරදි නොකරන ලද අවප්‍රකාශ යෝග්‍ය පරිදි විගණකගේ වාර්තාවේ පරිශීලකයන්ට අවධානය ලබාදෙමින් විගණකගේ නෛතික අයිතිවාසිකම් සහ බැදීම් සලකාබැලීමෙන් යෝග්‍ය ක්‍රියා මාර්ග ගැනීම.(යොමුව අ 49-අ50 ඡේද)

**මූල්‍ය ප්‍රකාශ තුළ ප්‍රමාණාත්මක අවප්‍රකාශයක් පවතින විට හෝ අස්තිත්වයේ සහ එහි පරිසරයේ විගණකගේ අවබෝධය යාවත්කාලීන කිරීමට අවශ්‍යවන විට ප්‍රතිචාර දැක්වීම**

20. 14- 15 ඡේද තුළ ක්‍රියා පටිපාටි ඉටු කිරීමේ ප්‍රතිඵලයක් ලෙස මූල්‍ය ප්‍රකාශන තුළ ප්‍රමාණාත්මක අවප්‍රකාශනයක් පවතින බව හෝ අස්තිත්වයේ සහ එහි පරිසරයේ විගණකගේ අවබෝධය යාවත්කාලීන වීම අවශ්‍ය වන බව විගණක තීරණය කරන්නේ නම් විගණක වෙනත් ශ්‍රී.ලං.වි.ප්‍ර. අනුව යෝග්‍ය ලෙස විගණක ප්‍රතිචාර දැක්වීම කළ යුතුයි. (යොමුව අ 51 ඡේදය)

**වාර්තාකරණය**

21. වෙනත් තොරතුරු සිරස්තලය හෝ වෙනත් යෝග්‍ය සිරස්තලවලින් වෙනමම කොටසක විගණකගේ වාර්තාවේ දිනට පහත දෑ ඇතුළත් කළ යුතුයි:

(අ) ලැයිස්තුගත අස්තිත්වයක මූල්‍ය ප්‍රකාශන විගණනයක් සඳහා විගණක විසින් ලබා ගත් හෝ ලබාගැනීමට අපේක්ෂා කරන වෙනත් තොරතුරු ; හෝ

(ආ) ලැයිස්තුගත අස්තිත්වයක් හැර වන අස්තිත්වයක මූල්‍ය ප්‍රකාශන විගණනයක් සඳහා විගණක විසින් වෙනත් තොරතුරු කිහිපයක් හෝ සියල්ලම ලබා ගෙන තිබීම.(යොමුව ආ 52 ඡේදය )

22. 21 ඡේදයට අනුව විගණකගේ වාර්තාවේ වෙනත් තොරතුරු කොටසක ඇතුළත් කිරීමට අවශ්‍යවන විට මෙම කොටසේ අඩංගු විය යුත්තේ (යොමුව ආ 53 ඡේදය);

(අ) වෙනත් තොරතුරු සඳහා කළමණාකරණය වගකිව යුතු බව ප්‍රකාශයක්;

(ආ) (i) වේනම් විගණකගේ වාර්තාවේ දිනයට පෙර විගණක විසින් ලබාගත් වෙනත් තොරතුරුවල, සහ

(ii) වේ නම් විගණකගේ වාර්තාවේ දිනයට පසු ලබා ගැනීමට අපේක්ෂා කරන ලැයිස්තුගත අස්තිත්වයක මූල්‍ය ප්‍රකාශවල විගණනයන් සඳහා වෙනත් තොරතුරුවල හඳුනා ගැනීමක්;

(ඇ) විගණකගේ මතයේ වෙනත් තොරතුරු ආවරණය නොකරන සහ ඒ අනුව ඒ මත විගණක විගණන මතයක් හෝ කුමන ආකාරයේ සහතික කිරීමක් ප්‍රකාශ නොකරන බව ප්‍රකාශයක් ;

(ඈ) මෙම ශ්‍රී.ලං.වි.ප්‍ර මගින් අවශ්‍ය කෙරෙන වෙනත් තොරතුරු මත කියවීම, සලකා බැලීම සහ වාර්තාකරණ සම්බන්ධයෙන් විගණකගේ වගකීම්වල විස්තරයක්; සහ

(ඉ) විගණකගේ වාර්තාවේ දිනයට පෙර වෙනත් තොරතුරු ලබා ගන්නා විට, එක්කෝ

(i) විගණකට වාර්තා කිරීමට කිසිවක් නොමැති බව ප්‍රකාශයක්; හෝ

(ii) වෙනත් තොරතුරුවල නිවැරදි නොකළ ප්‍රමාණාත්මක අවප්‍රකාශයක් තිබෙන බව විගණක තීරණය කර තිබේ නම් වෙනත් තොරතුරුවල නිවැරදි නොකළ ප්‍රමාණාත්මක අවප්‍රකාශ විස්තර කරන බව ප්‍රකාශයක්.

23. ශ්‍රී.ලං.වි.ප්‍ර 705 (සංශෝධිත), [3] අනුව විගණක කොන්දේසි සහිත හෝ අහිතකර මතයක් ප්‍රකාශකරන විට 22 (ඉ) ඡේදයේ අවශ්‍ය කරන ප්‍රකාශය සඳහා මතය විකරණයට හේතු විය හැකි කරුණේ බලපෑම විගණක සලකා බැලිය යුතුයි.(යොමුව අ54 - අ58 ඡේද).

---

[3] SLAuS 705 (සංශෝධිත), *ස්වාධීන විගණකගේ වාර්තාවේ මතයට විකරණය කිරීම*

*නීතියෙන් හෝ රෙගුලාසි මගින් නියම කරන ලද වාර්තාකරණය*

24. නිශ්චිත තැනක හෝ වචන පෙළගැස්මක් භාවිතයෙන් විගණකගේ වාර්තාව තුළ වෙනත් තොරතුරුවල යොමු කිරීමට විශේෂී අධිකරණ බල ප්‍රදේශයක නීතිය හෝ රෙගුලාසි මගින් විගණකට අවශ්‍ය නම් අවම වශයෙන් විගණකගේ වාර්තාවේ පහත දෑ ඇතුලත් නම් පමණක් ශ්‍රී ලංකා ප්‍රමිතිවලට යොමුකළ යුතුයි. (යොමුව ආ 59 ඡේදය)

(අ) විගණකගේ වාර්තාවේ දිනයට පෙර විගණක විසින් ලබා ගත් වෙනත් තොරතුරුවල හඳුනා ගැනීම;

(ආ) වෙනත් තොරතුරුවල සම්බන්ධයෙන් විගණකගේ වගකීම්වල විස්තරයක් ; සහ

(ඇ) මෙම අරමුණ සඳහා විගණකගේ වැඩවල ප්‍රතිඵල ආමන්ත්‍රණය කරමින් ඉතා පැහැදිලි ප්‍රකාශයක්.

**ලේඛනගත කිරීම**

25. ශ්‍රී.ලං.වි. ප්‍ර. 230[4] හි අවශ්‍යතාවයන් ආමන්ත්‍රණය කරමින් මෙම ශ්‍රී.ලං.වි.ප්‍ර. ව්‍යවහාර කිරීම වශයෙන් විගණක පහත දෑ ලේඛනගතකරණයේ ඇතුළත් කළ යුතුයි.

(අ) මෙම ශ්‍රී.ලං.වි.ප්‍ර. යටතේ ඉටුකළ ක්‍රියාපටිපාටිවල ලේඛනගතරණය; සහ

(ආ) මෙම ශ්‍රී.ලං.වි.ප්‍ර. යටතේ අවශ්‍ය කෙරෙන වැඩ විගණක ඉටුකර තිබෙන බව වෙනත් තොරතුරුවල අවසාන අනුවාදනය

**භාවිත කිරීමේ සහ පැහැදිලි කිරීමේ වෙනත් කරුණු**

**නිර්වචන**

*වාර්ෂික වාර්තාව (යොමුව . 12(අ) ඡේදය)*

අ1. නීතිය, නියාමන හෝ භාවිතය වාර්ෂික වාර්තාවේ අන්තර්ගතය නිර්වචන කල හැකි අතර විශේෂිත වූ අධිකරණ බල ප්‍රදේශයක අස්තිත්ව සඳහා එසේ කුමන නම පැහැදිලි ආකාරයෙන් යොමුකරනු ලැබේ. කෙසේ නමුත් අන්තර්ගතය හා නම එසේ අධිකරණමය බල ප්‍රදේශයන් තුළ සිට හෝ එක් අධිකරණ බල ප්‍රදේශයකින් තවත් එකකට වෙනස් විය හැකි ය.

අ2 වාර්ෂික වාර්තාව නියමානුකුලව පිළියෙල කරන්නේ වාර්ෂික පදනම මතයි. නමුත් විගණනය කරනු ලබන මූල්‍ය ප්‍රකාශන වසරකට අඩුවෙන් හෝ වැඩි කාලපරිච්ජේදයන් සඳහා පිළියෙල කරන විට වාර්ෂික වාර්තාව ද එලෙසම මූල්‍ය ප්‍රකාශ ආවරණය වන කාලපරිච්ඡේදය සඳහා පිළියෙල කළ හැකි ය.

අ3 සමහර අවස්ථාවල දී අස්තිත්වයක 'වාර්ෂික වාර්තාව' තනි ලේඛනයක් විය හැකි අතර වාර්ෂික වාර්තාව හෝ සමහර විට වෙනත් සිරස්තලයක් මගින් යොමුකරයි. වෙනත් අවස්ථාවල දී එකම අරමුණ ඉටුකර ගැනීමේ තනි ලේඛනයක් ආකාරයෙන් හෝ දෙකක් හෝ ඊට වඩා වැඩිවන වෙන වෙනම වූ ලේඛන සංයෝජන ආකාරයෙන් මූල්‍ය ප්‍රකාශන තුළ (එනම් වාර්ෂික වාර්තාවක) නියම කර ඇති පරිදි අස්තිත්වයේ මෙහෙයුම් මත අස්තිත්වයේ මූල්‍ය ප්‍රතිඵල සහ මූල්‍ය තත්වය මත තොරතුරු අයිතිකරුවන්ට (හෝ සමාන ඇල්මැති පාර්ශවයන් ) වාර්තා කිරීමට නීතිය, රෙගුලාසි හෝ භාවිතයන් අස්තිත්වයට අවශ්‍ය විය හැකිය. උදාහරණ ලෙස විශේෂ වූ අධිකරණ බල ප්‍රදේශයක නීතිය, නියාමනය හෝ භාවිතය පදනම් කරමින් පහත සඳහන් ලේඛනවලින් එකක් හෝ වැඩියෙන් වාර්ෂික වාර්තාවක කොටසක සකස් කළ හැකි යː

- පාලනය පිළිබඳ වග කිව යුතු අය විසින් කළමනාකරණ වාර්තා, කළමණාකරන විවරනය හෝ මෙහෙයුම් සහ මූල්‍ය සමාලෝචනය හෝ ඒ හා සමාන වාර්තා (උදාහරණ අධ්‍යක්ෂකවරුන්ගේ වාර්තා )
- සභාපතිතුමාගේ ප්‍රකාශය,
- සමායතන පාලනය පිළිබඳ ප්‍රකාශය,
- අභ්‍යන්තර පාලන සහ අවදානම් තක්සේරු වාර්තා,

අ4 වාර්ෂික වාර්තාවක් අස්තිත්වයේ වෙබ් අඩවිය ඇතුළත්ව මුද්‍රිත ආකාරයෙන් හෝ විද්‍යුත් ආකාරයෙන් පරිශීලකයින්ට ලබා දිය හැකිය. ලේඛනයක් ( හෝ ලේඛනවල සංයෝජනයක් ) පරිශීලකයින්ට ලබා දෙන ආකාරය ගැන නොසලකා වාර්ෂික වාර්තාවක නිර්වචනයේ අවශ්‍යතා ඉටු විය හැකි ය.

[4] SLAuS 230, විගණන ලේඛනගතකරණය, 8–11 ඡේද

අ5 වෙනත් වාර්තාවලින් එනම් විශේෂ වූ ඇල්මැති පාර්ශවයන්ගේ කණ්ඩායමක තොරතුරු අවශ්‍යතා සම්පූර්ණ කිරීමට පිළියෙල කරන වාර්තාවක් හෝ විශේෂිත වු නියාමන වාර්තාකරණ අරමුණක් සමග අනුගත වීමට පිළියෙල කරන වාර්තාව ලෙස (එවැනි වාර්තාවක් ප්‍රසිද්ධියේ ලබා දීම අවශ්‍ය වන විට වුවත්) ස්වභාවයෙන් අරමුණෙන් සහ සංයුතියෙන් වාර්ෂික වාර්තාව වෙනස් වේ. එවැනි වාර්තා සඳහා උදාහරණ ලෙස තනි තනි ලේඛන ලෙස නිකුත් කරන විට ඒවා වාර්ෂික වාර්තාවන් (නීතිය රෙගුලාසි හෝ භාවිතවලට යටත්ව ) සමන්විත වන කොටසක් දර්ශිය නොවේ. එමනිසා මෙම ශ්‍රී.ලං.වි.ප්‍ර. යේ විෂය පථයේ වෙනත් තොරතුරු නොවන දැට ඇතුළත් විය හැකි ය.

- බැංකුකරණය,රක්‍ෂණය සහ විශ්‍රාම වැටුප් කර්මාන්ත වැනි වෙනස් වූ කර්මාන්ත හෝ නියාමන වාර්තා (උදාහරණ; ප්‍රාග්ධන ප්‍රමාණාත්මක වාර්තා) පිළියෙල කස හැකි ය.
- සමායතන සමාජයීය වගකීමේ වාර්තා,
- තිරසාර වාර්තා,
- විවිධත්ව සහ සමාන අවස්ථා වාර්තා,
- නිෂ්පාදන වගකීම් වාර්තා,
- ශ්‍රම පරිචයන් සහ වැඩ කරන පවත්නා තත්වයන් වාර්තා,
- *මානව අයිතිවාසිකම් වාර්තා.*

*වෙනත් තොරතුරුවල අවප්‍රකාශ (යොමුව 12 ආ ඡේදය)*

අ6 වෙනත් තොතුරුවල විශේෂ වූ කරුණක් හෙළිදරවු කරන විට එම කරුණේ නිසි ලෙස අවබෝධ කර ගැනීමට සඳහා අවශ්‍යවන තොරතුරු, වෙනත් තොරතුරු මගින් අත්හැරීම හෝ අපැහැදිලි වීම විය හැකිය. උදාහරණ ලෙස කළමණාකරණය විසින් භාවිතා කරන ප්‍රධාන කාර්යසාධන දර්ශකය ආමන්ත්‍රණය කිරීමට මෙම වෙනත් තොරතුරු අරමුණු කර ගන්නේ නම් කළමණාකරණය විසින් භාවිතයට ගන්නා ප්‍රධාන කාර්යසාධන දර්ශකය අත්හැරීම වෙනත් තොරතුරු නොමග යවන සුළුවීම පෙන්නුම් කිරීමට පුළුවන.

අ7 ප්‍රමාණාත්මක බවේ සංකල්පය වෙනත් තොරතුරුවලට යෝග්‍ය ආකෘතිමය රාමුවක් තුළ සාකච්ඡා කළ හැකි අතර, එසේ නම් එවැනි ආකෘතිමය රාමුවක් මෙම ශ්‍රී.ලං.වි.ප්‍ර. යටතේ ප්‍රමාණාත්මක බව පිළිබඳ විනිශ්චය කිරීමේ දී විගණක සඳහා යොමුවේ රාමුවක් ලබාදිය හැකිය. බොහෝ අවස්ථාවල කෙසේ නමුත් ප්‍රමාණාත්මක බවේ සංකල්පය වෙනත් තොරතුරුවලට ව්‍යවහාර කරන ලෙස එහි සාකච්ඡාවක ඇතුළත් වන බව යෝග්‍ය ආකෘතිමය රාමුවක් නොමැති විය හැකි විය. එවැනි අවස්ථාවල දී පහත සඳහන් ගති ලක්‍ෂණ වෙනත් තොරතුරුවල අවප්‍රකාශයක් ප්‍රමාණාත්මක නම් නිශ්චය කිරීමේ දී යොමුවේ රාමුවක් තුළ විගණකට ලබා දෙනු ලැබේ:

- කණ්ඩායමක් ලෙස පරිශීලකයින්ගේ පොදු තොරතුරු අවශ්‍යතා සම්බන්ධයෙන් ප්‍රමාණාත්මක බව කරුණු සලකා බලා තීරණය කරනු ලැබේ. වෙනත් තොරතුරු පරිශීලකයින් මූල්‍ය ප්‍රකාශ පරිශීලකයින් ලෙසම වන බව අපේක්‍ෂා කරන අතර එවැනි පරිශීලකයින් මූල්‍ය ප්‍රකාශනවලට සම්බන්ධයන් ලබාදීමට වෙනත් තොරතුරු සැපයීම ද අපේක්ෂා කරනු ලැබේ
- නිවැරදි නොකළ අවප්‍රකාශයක ප්‍රතිඵලයක් මගින් පරිශිලකයින්ව බලපෑමට ලක් වන්නේ ද යන්න සැලකිල්ලට ගැනිමේ දී අවප්‍රකාශයේ විශේෂිත තත්වයන්හි ප්‍රමාණාත්මකබව පිළිබඳ විනිශ්චය සැලකිල්ලට ගත යුතුය. පරිශීලකයින් එසේ කිරිම මත තීරණ සඳහා සෑම අවප්‍රකාශයන්ම බලපෑම් නොකරනු ඇත.

*ප්‍රමාණාත්මක බව පිළිබඳ විනිශ්චය ප්‍රමාණාත්මක හෝ ගුණාත්මක සලකා බැලීම් යන දෙකම ඇතුළත් වේ. ඒ අනුව එවැනි විනිශ්චයන් වාර්ෂික වාර්තාව සම්බන්ධයෙන් වෙනත් තොරතුරු ආමන්ත්‍රණය කරන බව අයිතමයේ ස්වභාවය හෝ විශාලත්වය සැලකිල්ලට ගත හැකියි.*

*වෙනත් තොරතුරු (යොමුව 12 ඇ ඡේදය)*

අ8 1 වන පරිෂ්ටය, වෙනත් තොරතුරු තුළ ඇතුළත් කළ හැකි වටිනාකමේ හෝ වෙනත් අයිතමවල උදාහරණ අඩංගු වේ.

අ9 සමහර අවස්ථාවල දී යෝග්‍ය මූල්‍ය වාර්තාකරණ ආකෘතිමය රාමුවෙන් නිශ්චිත හෙළිදරව් කිරීම් අවශ්‍ය විය හැකි නමුත් ඒවා මූල්‍ය ප්‍රකාශනවලට[5] පිටතින් පිහිටුවීමට ඉඩ දෙයි. එවැනි හෙළිදරව් කිරීම් යෝග්‍ය මූල්‍ය වාර්තාකරණ ආකෘතිමය රාමුව මගින් අවශ්‍ය වන ලෙස මූල්‍ය ප්‍රකාශවල කොටසක සකස් කළ හැකිය.ඒ අනුව මෙම ශ්‍රී.ලං.වි.ප්‍ර.යේ අරමුණ සඳහා වෙනත් තොරතුරු අඩංගු නොකරයි.

ආ10 විතත්‍ය ව්‍යාපාර වාර්තාකරන භාෂාව (XBRL), මෙම ශ්‍රී.ලං.වි.ප්‍රමිතියේ නිර්වචන කළ පරිදි වෙනත් තොරතුරු නිරූපනය නොකෙරේ.

**වෙනත් තොරතුරු ලබා ගැනීම (යොමුව 13 ඡේදය)**

අ11 වාර්ෂික වාර්තාව හෝ එය සමන්විත වන ලේඛන (ය) නිර්ණය කරන්නේ බොහෝ විට නීතිය නියාමනය හෝ භාවිත පැහැදිලි පදනම මතයි. බොහෝ අවස්ථාවල දී, කළමණාකරනය හෝ පාලනය පිළිබඳ වග කිව යුතු අය වාර්ෂික වාර්තාව හා එක්ව සමන්විත ලේඛන පැකේජයක් සමඟ චාරිත්‍රානුකූලව නිකුත් කළ හැකිය *නැතහොත්* එසේ කිරීමට බැඳිය හැකිය. සමහර අවස්ථාවලදි කෙසේ වෙතත් කුමන ලේඛන (ය) වාර්ෂික වාර්තාවක සමන්විත දැයි පැහැදිලි නොවිය හැකිය. එවැනි අවස්ථාවක දි ලේඛන කාලය සහ අරමුණ වාර්ෂික වාර්තාව කුමන ලියවිලිවලින් සමන්විත දැයි (ඒවා අදහස්කරන්නේ කවුරුන් සමග ද යන්න) විගණකගේ නිර්ණය කිරීමට ලේඛන අදාළ විය හැකි කරුණු වේ.

අ12 නීතිය හෝ රෙගුලාසි අනුව වාර්ෂික වාර්තාව වෙනත් භාෂාවකට පරිවර්තනය කරන විට (එක් රාජ්‍ය භාෂාවකට හෝ ඊට වැඩියෙන් අධිකරණ බල ප්‍රදේශයක තිබෙන විට සිදු විය හැකිය.) හෝ බහු ආංගික වාර්ෂික වාර්තා විවිධ නීති යටතේ පිළියෙල කරන විට (උදාහරණ ලෙස අස්තිත්වය අධිකරණ බල ප්‍රදේශ එකකට වඩා වැඩි ගණනක ලැයිස්තු ගත කරන විට) වෙනත් තොරතුරුවල කොටස, වාර්ෂික වාර්තා එකක හෝ එකකට වඩා වැඩි කොටසක සමන්විතදැයි සැලකිල්ලට ගැනීම අවශ්‍ය විය හැකිය. දේශිය නීතියකින් හෝ රෙගුලාසියකින් මේ සම්බන්ධයෙන් තව දුරටත් උපදේශ සැපයිය හැකි ය.

අ13 කළමණාකරණය හෝ පාලනය පිළිබඳ වග කිව යුතු අය වාර්ෂික වාර්තාව පිළියෙල කිරීම සඳහා කිව යුතුය. විගණක පහත සඳහන් දෑ කළමණාකරණය හෝ පාලනය පිළිබඳ වග කිව යුතු අයට සන්නිවේදනය කළ හැකිය.

- විගණකගේ වාර්තාවේ දිනයට පෙර කාලීනව වාර්ෂික වාර්තාවේ අවසාන අනුවාදනය ලබා ගැනීම සම්බන්ධයෙන් විගණකගේ අපේක්ෂාව වන්නේ (වාර්ෂික වාර්තාව සමග සමන්විත ලේඛනවල සංයෝජනය ද ඇතුලුව) විගණකගේ වාර්තාවේ දිනයට පෙර ලබා ගන්නා එවිට විගණකගේ වාර්තාවේ දිනයට පෙර මෙම ශ්‍රී.ලං.වි.ප්‍ර.මගින් අවශ්‍ය කරන ක්‍රියාපටිපාටි විගණක සම්පූර්ණ කිරීමට හෝ එසේ කිරීමට නොහැකි නම් ප්‍රායෝගිකව වන වෙනත් අවස්ථාවක දී කෙසේවෙතත් එම තොරතුරු අස්තිත්වයේ නිකුත් කිරීමට පෙර
- වෙනත් තොරතුරු විගණකගේ වාර්තාවේ දිනයට පසු ලබා ගන්නා විට විය හැකි ප්‍රතිඵල

අ14 අ13 ඡේදයේ යොමුකළ සන්නිවේදන විශේෂයෙන් යොග්‍ය විය හැකි අවස්ථාවන්ට උදාහරණ ලෙස;

- මුල් විගණක කාර්යභාරයක දී
- කළමණාකරණය හෝ පාලනය පිළිබඳ වග කිව යුතු අයගේ වෙනසක් තිබෙන විට
- විගණකගේ වාර්තාවේ දිනයට පසු වෙනත් තොරතුරු ලබා ගැනීමට අපේක්ෂා කරන විට

අ15 අස්තිත්වය මගින් වෙනත් තොරතුරු එහි නිකුතුවට පෙර කිරීමට පාලනය පිළිබඳ වග කිව යුතු අයගෙන් අනුමත කළ යුතු අවස්ථාවක දී අවසාන අනුවාදනය නිකුත් කිරීම සඳහා පාලය පිළිබඳ වග කිව යුතු අය විසින් අනුමැතිය දිය යුතු දෙය එවැනි වෙනත් තොරතුරු වේ.

අ16 සමහර අවස්ථාවල දී අස්තිත්වයේ වාර්ෂික වාර්තාව අස්තිත්වයේ මූල්‍ය වාර්තාකරණ කාලපරිච්ඡේදය අවසාන වූ වහාම විගණකගේ වාර්තාවේ දිනයට පෙර විගණකට ලබා ගැනීමට තිබේ නම් එවිට නීතිය හෝ නියාමනය හෝ අස්තිත්වයේ වාර්තාකරණ පරිචයන් අනුව නිකුත් කිරීමට නියමිත තනි ලියවිල්ලක් එය විය හැකිය. වෙනත්

---

5 උදාහරණ ලෙස, ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත (SLFRS) 7, *මූල්‍ය සාධනපත්‍ර: හෙළිදරව් කිරීම්*, මූල්‍ය ප්‍රකාශන පරිශීලකයිනට ලබාගත හැකි කළමණාකරන විවිරන හෝ අවදානම් වාර්තා වැනි සමහර වෙනත් ප්‍රකාශනවලට මූල්‍ය ප්‍රකාශනවලින් යොමු කිරීම මගින් හෝ වෙනත් ප්‍රකාශනවලට යොමුවක් ඇතුලත් කිරීමෙන් ශ්‍රී.ලංගි.ප්‍ර.මගින් අවශ්‍ය කෙරෙන සමහර හෙළිදරව් ඉඩ දේ.

අවස්ථාවල දී එවැනි ලේඛනයන් කාලයක් පසුවී හෝ අස්තිත්වය කාලය තෝරාගන්නා තුරු නිකුත් කිරීමට අවශ්‍ය නොවිය හැකිය. එක් එක් වෙනත් අවශ්‍යතාවයන්ට හෝ අස්තිත්වයේ වාර්තාකරණ පරිචයන්ට යටත්ව ඒවා නිතුත් කිරීමේ කාල නිර්ණය සම්බන්ධයෙන් අස්තිත්වයේ වාර්ෂික වාර්තාව ලේඛනවල සංයෝජනයක් වන අවස්ථාවන් ද තිබිය හැක.

අ17 විගණකගේ වාර්තාවේ දිනයට අස්තිත්වයේ වාර්ෂික වාර්තාවේ කොටසක් විය හැකි ලේඛනයේ සංවර්ධනය කිරීම අස්තිත්වය සලකා බලන නමුත් එවැනි ලියවිල්ලේ අරමුණ හෝ කාල නිර්ණය විගණකට සහතික කිරීමට කළමණාකරණය අපොහොසත් වන එවැනි අවස්ථාවන් තිබිය හැකිය. (උදාහරණ ඇල්මැති පාර්ශවයන්ට ස්වේච්ඡාවෙන් කරන වාර්තාවක්) එවැනි ලියවිල්ලක අරමුණ හෝ කාල නිර්ණය විගණක තවදැන ගැනීමට නොහැකි නම් එවැනි ලේඛනයක් මෙම ශ්‍රී.ලං.වි.ප්‍ර. අරමුණු සහ ලියවිල්ල වෙනත් තොරතුරුවලට සලකා බලනු නොලැබේ.

අ18 විගණකගේ වාර්තාවේ දිනයට පෙර කාලීන ආකාරයට වෙනත් තොරතුරු ලබා ගැනීම මුල්‍ය ප්‍රකාශවලට විගණකගේ වාර්තාව හෝ එවැනි වෙනත් තොරතුරු නිකුත් කිරීමට පෙර සිදුකල යුතු වන බව අවශ්‍ය වන විට සොයා ගන්නා යම් සංශෝධනයන් කිරීමට හැකි වනු ඇත. කාලීන ආකාරයට වෙනත් තොරතුරු විගණකට ලබා දීමට සිදුකිරීමට සහ විය හැකි නම් විගණකගේ වාර්තාවේ දිනයට පෙර කළමනාකරණය සමග එකගතාවයට විගණන කාර්යාභාර ලිපියේ[6] යොමුව සිදුකළ හැකි ය.

අ19 වෙනත් තොරතුරු පරිශීලකයන්ට ලබාගත හැකි වන්නේ අස්තිත්වයේ වෙබ් අඩවියේ පමණක් වන විට අස්තිත්වයේ වෙබ් අඩවියෙන් සෘජුවම ලබාගන්නවාට වඩා අස්තිත්වයේ ලබා ගන්නා වෙනත් තොරතුරුවල අනුවාදනය මෙම ශ්‍රී.ලං.වි.ප්‍ර. අනුව විගණක විසින් ක්‍රියා පටිපාටි ඉටු කරන අදාළ ලියවිල්ල එය වේ. අස්තිත්වයේ වෙබ් අඩවියේ තිබිය හැකි වෙනත් තොරතුරු ඇතුළුව වෙනත් තොරතුරු සෙවීමට හෝ වෙනත් තොරතුරු යෝග්‍ය ලෙස අස්තිත්වයේ වෙබ් අඩවියේ පෙන්නුම් කරන බව සහතික කිරීමට ඕනෑම පටිපාටි ඉටු කිරීමට මෙම ශ්‍රී.ලං.වි.ප්‍ර. යටතේ විගණකට වගකීමක් නොමැත.

අ20 විගණක වෙනත් තොරතුරු කිහිපයක් හෝ සියල්ලම ලබා ගෙන නොමැති නම් විගණක වාර්තාව දාතම් නිර්ණය කිරීමෙන් හෝ නිකුත් කිරීමෙන් විගණකව වලක්වනු නොලබයි.

අ21 වෙනත් තොරතුරු විගණකගේ වාර්තාවේ දිනයට පසු ලබා ගන්නා විට ශ්‍රී.ලං.වි.ප්‍ර. 560[7] හි 6 සහ 7 ඡේද අනුව ඉටුකළ යුතු ක්‍රියාපටිපාටි යාවත්කාලීන කිරීමට විගණකට අවශ්‍ය නොවේ.

අ22 ශ්‍රී.ලං.වි.ප්‍ර. 580[8] හි ලිඛිත නියෝජනයේ භාවිතය මත අවශ්‍යතා ස්ථාපනය කිරීම සහ උපදේශ ලබාදෙයි. වෙනත් තොරතුරු සම්බන්ධයෙන් මෙම ශ්‍රී.ලං.වි.ප්‍ර. මගින් අවශ්‍ය කෙරෙන ක්‍රියාපටිපාටි සම්පූර්ණ කිරීමට විගණකගේ හැකියාවට සහාය අපේක්ෂා කරන විගණකගේ වාර්තාවේ දිනයෙන් පසුව පමණක් ලබා ගතහැකි වෙනත් තොරතුරු සම්බන්ධයෙන් 13 (ඇ) ඡේදය මගින් අවශ්‍ය කෙරෙන ලිඛිත නියෝජනය අදහස් කෙරේ. ඊට අමතරව වෙනත් ලිඛිත නියෝජනයන් ඉල්ලීම් කිරීමට විගණක ප්‍රයෝජනවත් විය හැකි ය.

එම උදාහරණ :-

- එය නිකුත් කිරීමට අපේක්ෂා කරන සියළුම ලේඛන වෙනත් තොරතුරුවලින් සමන්විත වියහැකි බව පිළිබඳව විගණකට කළමණාකරනය දැනුම් දී තිබීම;
- විගණකගේ වාර්තාවේ දිනයට පෙර ලබා ගත් මුල්‍ය ප්‍රකාශ සහ ඕනෑම වෙනත් තොරතුරු එකිනෙකා සමග සංගත වන බව සහ වෙනත් තොරතුරු කිසිදු ප්‍රමාණාත්මක අවප්‍රකාශනවලින් සමන්විත නොවේ; සහ
- විගණකගේ වාර්තාවේ දිනයට පෙර විගණක විසින් ලබා ගෙන නොමැති වෙනත් තොරතුරු සම්බන්ධයෙන් එවැනි වෙනත් තොරතුරු පිළියෙල කිරීමට සහ නිකුත් කිරීමට කලමනාකරයේ අපේක්ෂාව සහ එවැනි නිකුත් කිරීමේ අපේක්ෂා කරන කාල නිර්ණය

**වෙනත් තොරතුරු කියවීම සහ සියල්ල සලකා බැලීම (යොමුව :-14 - 15 ඡේද)**

අ23 වෘත්තීය සංශයදෘෂ්ටියකින් විගණනය සැලසුම්කර ඉටුකිරීමට ශ්‍රී.ලං.වි.ප්‍ර. 200[9] මගින් විගණකට අවශ්‍ය කෙරේ. වෙනත් තොරතුරු කියවන විට සහ සලකා බලන විට වෘත්තීය සංශයදෘෂ්ටිය පවත්වාගෙන යාමේ දී උදාහරණ

[6] SLAuS 210, *විගණන කාර්යයභාරයේ කොන්දේසි සමග එකගවීම* , අ24 ඡේදය
[7] SLAuS 560, *පසුව සිදුවන සිදුවීම්*
[8] SLAuS 580, ලිඛිත නියෝජනය
[9] SLAuS 200, 15 ඡේදය

ලෙස එහි සැලසුම්හි සාර්ථකත්වය වැඩිපුර සර්වශුභවා දී කළමනාකරනය වන බව හඳුනා ගැනීමේ දී සහ පහත සඳහන් දෑ සමග තොරතුරු අසංගතතාවයක් ඇති බවට සෝදිසියෙන් සිටීම ඇතුලත් වේ.

(අ) මූල්‍ය ප්‍රකාශන; හෝ

(ආ) විගණනයේ දී ලබා ගන්නා විගණකගේ දැනුම

අ24 ශ්‍රී.ලං.වි.ප්‍ර. 220[10] අනුව කාර්යභාරයේ නියුතු හවුල්කරු වෘත්තීය ප්‍රමිත සහ යෝග්‍ය නෛතික සහ නියාමන අවශ්‍යතාවයන් සමග අනුගත වී විගණන කාර්යභාරය මෙහෙයවීම, අධීක්ෂණය හා කාර්යසාධනය සඳහා වගකීම ගැනීම අවශ්‍ය වේ. මෙම ශ්‍රී.ලං.වි.ප්‍ර. සම්බන්ධයෙන් 14 - 15 ඡේදවල අවශ්‍යතාවයන් ආමන්ත්‍රණය කිරීමට යෝග්‍ය කාර්යභාරයේ නියුතු කණ්ඩායමේ සාමාජිකයින් නිර්ණය කිරීමේ දි සැලකිල්ලට ගත යුතු සාධකවලට ඇතුලත් වන්නේ;

- කාර්යභාර කණ්ඩායම් සාමාජිකයන්ගේ සාපේක්ෂ පළපුරුද්ද
- වෙනත් තොරතුරු සහ එම දැනුම අතර අසංගතතාවයන් හඳුනා ගැනීමේ කාර්යය කාර්යභාර කණ්ඩායම් සාමාජිකයින්ට පවරා දීමට විගණනයේ දී ලබා ගන්නා අදාළ දැනුම තිබේ ද යන්න.
- 14 - 15 ඡේදයේ අවශ්‍යතාවයන් ආමන්ත්‍රණය කිරීමේ දී ඇතුලත් වන විනිශ්චයේ ප්‍රමාණය උදාහරණ ලෙස මූල්‍ය ප්‍රකාශ තුළ එකම වටිනාකම හා සමාන වටිනාකමක් වෙනත් තොරතුරුවල වටිනාකම තුළ ඇතැයි වටිනාකම්වල සංගතතාවය අගයකිරීමට පටිපාටි අඩු පළපුරුද්ද සහිත කණ්ඩායම් සාමාජිකයින් විසින් ඉටු කිරීම.
- සමූහ විගණනය කරන අවස්ථාවක දී සංරචකයට සම්බන්ධිත වෙනත් තොරතුරු ආමන්ත්‍රණය කරමින් සංරචක විගණකගේ එම සංරචකය පිළිබඳ විමසීම් කිරීමට අවශ්‍ය දැයි යන්න

*වෙනත් තොරතුරු සහ මූල්‍ය ප්‍රකාශන අතර ප්‍රමාණාත්මක අසංගතතාවයක් තිබේ දැයි සලකා බැලීම* (යොමුව: 14 *(අ)* ඡේදය

අ25 මූල්‍ය ප්‍රකාශන තුළ වටිනාකම් සහ වෙනත් අයිතම් පිළිබඳ සාරාංශ ගත කිරීමට හෝ දීර්ඝ විස්තරයක් ලබා දීමට එක හා සමාන විය යුතු ලෙස අදහස් කරන වටිනාකම් සහ වෙනත් අයිතම් වෙනත් තොරතුරුවල ඇතුලත් විය හැකිය. මූල්‍ය ප්‍රකාශන තුළ වෙනත් අයිතිම පිළිබඳ විස්තර හෝ සැපයීමට එකම ආකාරයෙන් බව ඇතුලත් විය හැකිය. එවැනි වටිනාකම් හෝ වෙනත් අයිතමවලට උදාහරණවලට ඇතුලත් විය හැකි වන්නේ;

- වගු, සටහන් හෝ ප්‍රස්තාරවලින් සමන්විත මූල්‍ය ප්‍රකාශවල උපුටා ගැනීම්
- මූල්‍ය ප්‍රකාශන තුළ පෙන්නුම්කර ඇති ශේෂයක් හෝ ගිණුමක් පිළිබඳ වැඩි විස්තර එනම් 20X1 සඳහා ''අයභාරය X නිශ්පාදිතයෙන් මිලියන xxx සහ y නිෂ්පාදිතගෙන් මිලියන yyy සමන්විත වේ.''
- මූල්‍ය ප්‍රතිඵලවල විස්තර එනම් 20x1 හි මුළු පර්යේෂණ සහ සංවර්ධන වියදම xxx විය.

අ26 මූල්‍ය ප්‍රකාශන සමග වෙනත් තොරතුරු තුළ තෝරාගත් වටිනාකම් හෝ වෙනත් අයිතමවල සංගතබව අගකිරීමේ දී මූල්‍ය ප්‍රකාශ තුළ එවැනි වටිනාකම් හෝ වෙනත් අයිතම පිළිබඳ එනම් මූල්‍ය ප්‍රකාශ තුළ එවැනි වටිනාකම් සහ වෙනත් අයිතම පිළිබඳ විස්තර සාරාංශ කිරීමට හෝ වැඩි විස්තර ලබාදීමට සමාන ලෙස පෙනීමට අපේක්ෂා කරන වෙනත් තොරතුරු තුළ සියළුම වටිනාකම් සහ වෙනත් අයිතම සංසන්දනය කිරීමට විගණකට අවශ්‍ය නොවේ.

අ27 සංසන්දනය කිරීමට වටිනාකම් හෝ වෙනත් අයිතම තේරීම වෘත්තීය විනිශ්චයේ කරුණකි. මෙම විනිශ්චයට අදාළ සාධකවලට ඇතුලත් වන්නේ;

- වටිනාකමට හෝ වෙනත් අයිතම පරිශීලකයින් සම්බන්ධවන බව වැදගත්කමට බලපාන ලෙස ඉදිරිපත් කරන බලපාන සසදර්භයේ අගය හෝ වෙනත් අයිතමවල වැදගත්කම (උදාහරණ-ප්‍රාධාන අනුපාතයක් හෝ වටිනාකමක්)
- ප්‍රමාණාත්මක නම් මූල්‍ය ප්‍රකාශ තුළ ගිණුම් හෝ අයිතම හෝ ඒවාට සම්බන්ධ වෙනත් තොරතුරු සමග සංසන්දනය කළ වටිනාකමේ සාපේක්ෂ ප්‍රමාණය.
- විශේෂ වටිනාකමක හෝ වෙනත් තොරතුරුවල වෙනත් අයිතමයේ සංවේදිතාවය උදාහරණය ලෙස ජ්‍යෙෂ්ඨ කළමනාකරණය සඳහා කොටස් පදනම් ගෙවීම්

[10] SLAuS 220, මූල්‍ය ප්‍රකාශන විගණනය සඳහා තත්ත්ව පාලනය, 15 (අ) ඡේදය

අ28 වෙනත් තොරතුරු පිළිබඳ සහතිකයක් ලබා ගැනීමට බැඳීමක් පැනවීම හෝ වෙනත් තොරතුරු සහතික වීමේ කාර්යභාරයෙන් මෙම ශ්‍රී.ලං.වි.ප්‍ර. යටතේ විගණකගේ වගකීම් ස්ථාපනය නොවන බව හඳුනා ගනිමින් 14 (අ) ඡේදයේ අවශ්‍යතාවය ආමන්ත්‍රණය කිරීමට වන පටිපාටිවල ස්වභාවය සහ ප්‍රමාණය නිර්ණය කිරීම වෘත්තිය විනිශ්චයේ කරුණකි. එවැනි ක්‍රියාපටිපාටිවලට උදාහරණ වන්නේ;

- මූල්‍ය ප්‍රකාශන තුළ තොරතුරු ලෙස සමාන විය හැකි ලෙස අදහස් කරන තොරතුරු සඳහා එම තොරතුරු මූල්‍ය ප්‍රකාශනවලට සන්සන්දනය කිරීම
- මූල්‍ය ප්‍රකාශන තුල හෙළිදරව් කිරීම් ලෙස සමාන තේරුමක් දැක්වීමට අපේක්ෂා කරන තොරතුරු සඳහා භාවිතා කල වචන භාවිතා කල වචන සංසන්දනය කරමින් සහ භාවිතා කල වචන තුළ වෙනස්කම්වල වැදගත්කම හා එවැනි වෙනස්කම් වෙනස් අදහස් හඟවෙන්නේ දැයි සැලකිල්ලට ගැනීම
- වෙනත් තොරතුරු තුළ සහ කළමනාකරණයේ මූල්‍ය ප්‍රකාශන අතර වටිනාකම් සැසඳුමක් ලබා ගැනීම සහ;
  - o මූල්‍ය ප්‍රකාශ සහ වෙනත් තොරතුරුවලට සැසඳුම තුළ අයිතම සංසන්දනය කිරීම; සහ
  - o සැසඳුම තුළ ගණනය කිරීම් ගණිතමය ලෙස නිවැරදි දැයි පරීක්ෂා කිරීම

අ29 වෙනත් තොරතුරුවල ඇති තෝරාගත් වටිනාකම්වල සහ අයිතමවල සංගතබව මූල්‍ය ප්‍රකාශන සමග අගය කිරීමේ දී ඇතුලත් වන්නේ අදාළ වන විට දී ඇති වෙනත් තොරතුරුවල ස්වභාවය ඒවා ඉදිරිපත් කරන ආකාරය මූල්‍ය ප්‍රකාශනවලට සංසන්දනය කිරීමකි .

*වෙනත් තොරතුරු සහ විගණනයේ දී ලබා ගත් විගණකගේ දැනුම අතර ප්‍රමාණාත්මක අසංගත බවක් තිබේදැයි සැලකිල්ලට ගැනීම බැලීම* ***(යොමුව: 14(ආ)) ඡේදය)***

අ30 විගණනයේ දි ලබා ගත් විගණකගේ දැනුමට සම්බන්ධිත වටිනාකම් හෝ අයිතම වෙනත් තොරතුරුවල ඇතුලත් විය හැක. {(14) (අ) ඡේදයේ සදහන් දෑ හැර} එවැනි අගයන් හෝ අයිතමවල උදාහරණ සඳහා ඇතුලත් විය හැක්කේ;

- නිෂ්පාදනය තුළ ඒකක හෝ එවැනි නිෂ්පාදන භූගෝලීය ප්‍රදේශ වශයෙන් සාරාංශ කල වගුවක හෙළිදරව් කිරීමක්
- 'වර්ෂය තුළ දී සමාගම X නිෂ්පාදනය සහ Y නිෂ්පාදිතය හඳුන්වා දුන් බව' ප්‍රකාශයක්
- අස්තිත්වයේ ප්‍රධාන මෙහෙයුම් පිහිටි ස්ථානවල සාරාංශයක් එනම් අස්තිත්වයේ මෙහෙයුම්වල ප්‍රධාන මධ්‍යස්ථානය ඇත්තේ x රට තුළ සහ එසේම මෙහෙයුම් y සහ z රටවවලවලට තිබෙන බව

අ31 විගණනයේ දී ලබාගත් විගණකගේ දැනුම සහ ශ්‍රී.ලං.වි.ප්‍ර. 315 (සංශෝධිත)[11] අනුව ලබාගත් අස්තිත්වයේ අභ්‍යන්තර පාලනය ඇතුලුව, අස්තිත්වය සහ එහි පරිසරයේ පිළිබඳ විගණකගේ අවබෝධය ඇතුලත් වේ. විගණකට අවශ්‍ය කරන අවබෝධය ශ්‍රී.ලං.වි.ප්‍ර. 315 (සංශෝධිත) හි නියම කරන ඇත. ඒවාට ඇතුලත් වන්නේ පහතදැවල අවබෝධයක් ලබා ගැනීම වැනි කරුණු ය.

(අ) අදාළ කර්මාන්තය, නියාමනය සහ වෙනත් බාහිර සාධක
(ආ) අස්තිත්වයේ ස්වභාවය
(ඇ) අස්තිත්වයේ ගිණුම්කරණ ප්‍රතිපත්තිවල තෝරා ගැනීම සහ ව්‍යවහාරකරණය
(ඈ) අස්තිත්වයේ අරමුණ සහ උපායමාර්ග
(ඉ) අස්තිත්වයේ මූල්‍ය කාර්යසාධනයේ මැනීම සහ සමාලෝචනය සහ
(ඊ) අස්තිත්වයේ අභ්‍යන්තර පාලනය

අ32 විගණනයේ දී විගණක ලබාගත් දැනුම ස්වභාවයෙන් අනාගතයට බලපාන කරුණුද ඇතුලත් විය හැකිය. එවැනි කරුණුවලට එලෙස ඇතුලත් විය හැක්කේ උදාහරණ ලෙස ව්‍යාපාර අපේක්ෂාවන් සහ අනාගත මුදල් ප්‍රවාහ, කීර්තිනාමය වැනි අස්පෘෂ්‍ය වත්කම් මත හානිකරණ පරීක්ෂාව ඉටු කිරීමේ දී කළමනාකරණය විසින් භාවිතාකල උපකල්පන අගය කිරීමේ දී හෝ අඛණ්ඩ පැවැත්ම ලෙස හෝ නොකඩවා පවත්වා ගෙන යාමේ අස්තිත්වයේ හැකියාව කළමනාකරණය තක්සේරුව කරන විට විගණක සැලකිල්ලට ගැනීම ආදිය වේ

අ33 වෙනත් තොරතුරු සහ විගණනයේදී ලබාගත් විගණකගේ දැනුම අතර ප්‍රමාණාත්මක අසංගතතාවයක් තිබේදැයි සලකා බැලීමේ දි විගණක ප්‍රමාණාත්මක විය හැකි කරුණ සම්බන්ධයෙන් වෙනත් තොරතුරුවල අවප්‍රකාශයක් ප්‍රමාණාත්මක වැදගත්කමක් තිබෙන බව වෙනත් තොරතුරුවල එම කරුණ පිළිබඳ අවධානය යොමු කල හැකිය.

[11] SLAuS 315 (සංශෝධිත), *අස්තිත්වය සහ එහි පරිසරයේ පිළිබඳ අවබෝධය කරගැනීම හරහා ප්‍රමාණාත්මක අවප්‍රකාශවල අවදානම් හඳුනා ගැනීම සහ තක්සේරු කිරීම 11–12 ඡේද*

අ34 වෙනත් තොරතුරු තුළ බොහෝ කරුණු සම්බන්ධයෙන් ලබාගත් විගන සාක්ෂිවල විගණකගේ නැවත මතක් කර ගැනීම සහ විගණනයේදි එළඹුණු තීරණ, වෙනත් තොරතුරු සහ විගණනයේ දි ලබාගත් විගණකගේ දැනුම අතර ප්‍රමාණාත්මක අසංගතබවක් තිබේදැයි විගණකට සලකා බැලීමට හැකි ප්‍රමාණාත්මක වීමට හැකිය. විගණක විගණනයේ ප්‍රධාන ක්ෂත්‍ර සමග වැඩි පළපුරුද්ද සහ සුපුරුදු වීම, අදාළ කරුණුවල විගණකගේ මතක් කර ගැනීම මගින් ප්‍රමාණවත් වන බව බොහෝ දුරට විය හැකිය. උදාහරණය ලෙස විගණනයේ දී කළමනාකරණය හෝ පාලනය පිළිබඳ වග කිව යුතු සමග පැවති සාකච්ඡාවල විගණකගේ මතක් කර ගැනීම සැලකිල්ලට ගැනීම හෝ විගණනය කරගෙන යන අතරතුර දී ඉටුකල ක්‍රියාපටිපාටිවලින් සොයා ගත් දේ එනම් අධ්‍යක්ෂක මණ්ඩල වාර්තා කියවීම් තවදුරටත් ක්‍රියාමාර්ගයක් ගැනීමට අවශ්‍යතාවයන් රහිතව වෙනත් තොරතුරු සහ විගණනයේ දී ලබා ගත් විගණකගේ දැනුම අතර ප්‍රමාණාත්මක අසංගතතාවයක් තිබේදැයි විගණකට සලකා බැලිය හැකි ය.

අ35 අදාළ විගණන ලේඛනගතකරණයට යොමු කිරීමෙන් හෝ කාර්යභාර කණ්ඩායමේ අදාළ සාමාජිකයින්ගෙන් හෝ අදාළ සංරචක විගණකයන්ගෙන් විමසීම් සිදුකිරීමෙන් ප්‍රමාණාත්මක අසංගතතාවයක් පවතිදැයි විගණකගේ සලකා බැලීම සඳහා පදනමක් ලෙස යෝග්‍ය වේ. උදාහරණ ලෙස;

- ප්‍රධාන නිෂ්පාදන පේළියක සැලසුම් කළ නැවැත්වීම වෙනත් තොරතුරුවල විස්තර කරන විට විගණක සැලසුම් කල නැවැත්වීම පිළිබඳ දැනුවත් වී තිබුණත් විගණක විගනණයේ දී ලබාගත් විගණකගේ දැනුම සමග විස්තරය ලෙස ප්‍රමාණාත්මක අසංගත දැයි විගණකගේ සැලකිල්ලට ගැනීමට සහය වීමට එම ක්ෂේත්‍රයේ විගණන පටිපාටි ඉටුකල අදාළ කාර්යභාර කණ්ඩායමේ සාමාජිකයින්ගෙන් සාධාරණ විමසීම් සිදුකල හැකි ය.
- විගණනයේ දී ආමන්ත්‍රණය කල නඩුවක් සම්බන්ධ වැදගත් විස්තර වෙනත් තොරතුරුවල විස්තර කරන විට නමුත් විගණක ප්‍රමාණාත්මකව ලෙස එවා නැවත මතක තබා ගැනීමට නොහැකිවන විට එය විගණකගේ මතක තබා ගැනීම සඳහා සහය දීමට එවැනි විස්තර සාරාංශ කරන අවස්ථාවක දී විගණන ලේඛනගතකරණයට යොමු කිරීමට අවශ්‍ය විය හැකි ය.

අ36 අදාළ විගණන ලේඛණගතකරණය විගණක යොමුකරන හෝ කාර්යභාර කණ්ඩායමේ අදාළ සාමාජිකයින්ගෙන් හෝ අදාළ සංරචක විගණකවරුනගෙන් විමසීම් සිදුකරන්නේ ද එසේ නම් කොපමණ ප්‍රමාණකට ද යන්න වෘත්තීය විනිශ්චයේ කරුණකි. කෙසේ නමුත් එය වෙනත් තොරතුරු තුළ ඇතුලත් කිරීම පිළිබඳ අදාළ විගණන ලේඛනගතකරණයට යොමු කිරීමට හෝ කාර්යභාර කණ්ඩායමේ සාමාජිකයින්ගෙන් හෝ අදාළ සංරචක විගණකවරුනගෙන් විමසිම විගණක සඳහා අවශ්‍ය නොවිය හැකි ය.

ප්‍රමාණාත්මක අවප්‍රකාශ විය හැකි බව පෙන්නුම් කරන වෙනත් තොරතුරු වෙනත් ඇඟවීම් සඳහා තවදුරටත් සෝදිසියෙන් සිටීම. (යොමුව 15 ඡේදය )

අ37 මුල්‍ය ප්‍රකාශනවලට සම්බන්ධ නොවන කරුණුවලට සාකච්ඡා වෙනත් තොර තුරුවල ඇතුලත් කල හැකි අතර විගණනයේ දී ලබාගත් විගණකගේ දැනුමෙන් පිටතට දික්කළ හැකිය. උදාහරණ ලෙස අස්තිත්වයේ හරිතාගාර වායු විමෝචනය පිළිබඳ ප්‍රකාශන වෙනත් තොරතුරුවල ඇතුලත් කල හැකි ය.

අ38 වෙනත් තොරතුරු නොමඟ යවන සුළු ආකාරය නම් අපේක්ෂිත තොරතුරු අත්හැරීම හෝ සැඟවීම හෝ නොසැකිලිමත් ලෙස ඉදිරිපත් කළ ප්‍රකාශයක් ප්‍රමාණාත්මක ලෙස ව්‍යාපාරයේ නොමඟ යවන සුළු ප්‍රකාශයක් වෙනත් තොරතුරුවල අඩංගු බව විගණක විශ්වාස කරන විට විගණක දැනුවත්ව එම තොරතුරු සමග සම්බන්ධකම් පැවැත්වීමෙන් වළක්වා ගැනීම අවශ්‍ය කෙරෙන ආචාරධර්ම අවශ්‍යතාවයන් සමග අනුගත වීමට වෙනත් තොරතුරු මුල්‍ය ප්‍රකාශනවලට අදාළ නැති බවට වන වෙනත් ඇඟවීම් පිළිබදව සෝදිසයෙන් සිටීම හෝ විගණනය තුළදී විගණක ලබ ගත් දැනුම පෙනෙන අන්දමට ප්‍රමාණාත්මක අවප්‍රකාශ ඇතිබව විගණකට උපකාරි වේ.[12]. වෙනත් තොරතුරු ප්‍රමාණාත්මක ලෙස අවප්‍රකාශ වී ඇතැයි පෙන්නුම් කළහැකි වෙනත් ඇඟවීම සඳහා සෝදිසියෙන් සිටීම එවැනි කරුණු පහත ලෙස හඳුනා ගැනීමේ දී විගණකට විභව්‍ය ලෙස ප්‍රතිඵල දීමට පුළුවනි.

*ප්‍රමාණාත්මක අසංගතතාවයක් පැවතීමට පෙන්නුම්කරන විට හෝ වෙනත් තොරතුරුවල ප්‍රමාණාත්මක අවප්‍රකාශ වන බව පෙන්නුම් කරන විට ප්‍රතිචාර දැක්වීම. (යොමුව: 16 ඡේදය)*

අ39 ප්‍රමාණාත්මක අසංගතබවක් පිළිබඳ කළමනාකරණය සමග විගණකගේ සාකච්ඡාව (හෝ ප්‍රමාණාත්මක අවප්‍රකාශ

12 ශ්‍රී ලංකා වරලත් ගණකාධිකරණ ආයතනයේ ආචාරධර්ම සංග්‍රහය, 110.2 *ඡේදය*

විය හැකි බව පෙන්නුම් කරන වෙනත් තොරතුරු) වෙනත් තොරතුරුවල ප්‍රකාශයේ කළමනාකරණයේ පදනම සඳහා සහ සැපයීමට කළමනාකරණයේ ඉල්ලීම් කිරීමට ඇතුලත් කල හැකිය. කළමනාකරණයේ ප්‍රකාශයේ පදනම සඳහා සහාය වන දෑ ලබා දීමට කළමනාකරණයෙන් ඉල්ලීම් කිරීමට ඇතුලත් කල හැකිය. කළමනාකරණයේ තවදුරටත් තොරතුරු හෝ පැහැදිලි කිරීම් මත පදනම්ව වෙනත් තොරතුරු ප්‍රමාණාත්මක අවප්‍රකාශ නොවී ඇති බව විගණකට සෑහීමකට පත් විය හැකි වේ. උදාහරණ ලෙස කළමනාකරණයේ පැහැදිලි කිරීම් විනිශ්චයේ වලංගු වෙනස් වීම් සඳහා සාධාරණ සහ ප්‍රමාණාත්මක හේතු දැක්විය හැකිය

අ40 ප්‍රතිවිරුද්ධ වශයෙන් කළමනාකරණය සමග සමග සාකච්ඡාවේ දී වෙනත් තොරතුරුවල ප්‍රමාණාත්මක අවප්‍රකාශයක් පවතින බව විගණකගේ තීරණයට සහාය දක්වන තවදුරටත් තොරතුරු ලබාදිය හැකි ය.

අ41 වඩා තත්‍ය ස්වභාවයෙන් ඇති කරුණුවලට වඩා විනිශ්චය මත වන කරුණු කළමනාකරණයට අභියෝග කිරීම සඳහා විගණකට එය වඩාත් අපහසු විය හැකිය. කෙසේ නමුත් මුල්‍ය ප්‍රකාශ හෝ විගණනයේ දි ලබාගත් විගණකගේ දැනුම සමග ප්‍රකාශයක් ඒකකාරී නොවන බව වෙනත් තොරතුරු සමන්විත බව විගණක නිගමනය කරන තත්වයන් තිබිය හැක. මෙම සිදුවීම් වෙනත් තොරතුරු මූල්‍ය ප්‍රකාශන හෝ විගණනයෙ දී ලබා ගත් විගණකගේ දැනුම පිළිබඳ සැකයක් පැන ගැගිය හැකි ය.

අ42 වෙනත් තොරතුරුවල වියහැකි ප්‍රමාණාත්මක ප්‍රකාශවල විශාල පරාසයක් තිබිය හැකි බැවින් වෙනත් තොරතුරුවල ප්‍රමාණාත්මක අවප්‍රකාශයක් තිබේදැයි යන්න තීරණයක විගණක ඉටුකළයුතු පටිපාටිවල ස්වභාවය සහ ප්‍රමාණය පවතින තත්වයන් තුළ සිදුවීම්වල විගණකගේ වෘත්තීය විනිශ්චය අයත් කරුණු වේ.

අ43 කරුණක් මුල්‍ය ප්‍රකාශවලට හෝ විගණනයේ දී ලබාගත් විගණකගේ දැනුමට සම්බන්ධ නොවන විට විගණකගේ විමසීම්වලට කළමනාකරණයේ ප්‍රතිචාර සම්පූර්ණයෙන් තක්සේරු කිරීමට විගණකට නොහැකි විය හැකිය. කෙසේවෙතත් තවදුරටත් කළමනාකරණයේ තොරතුරු හෝ පැහැදිලි කිරීම් මත පදනම්ව හෝ වෙනත් තොරතුරුවලට කළමනාකරණය සිදුකල වෙනස් වීම් අනුගමනය කරමින් ප්‍රමාණාත්මක අවප්‍රකාශයක් තවදුරටත් පැවතීමට පෙන්නුම් නොකරන බව හෝ වෙනත් තොරතුරු ප්‍රමාණාත්මක ලෙස අවප්‍රකාශ පැවතීම තවදුරටත් පෙන්නුම් නොකරන බව විගණකට සෑහීමකට පත් වීමට හැකිය. ප්‍රමාණාත්මක අවප්‍රකාශයක් පැවතීම තවදුරටත් පෙන්නුම් නොකරන බව හෝ වෙනත් තොරතුරක් ප්‍රමාණාත්මක ලෙස අවප්‍රකාශවීම තවදුරටත් පෙන්නුම් නොවන බව විගණකට තීරණය කිරීමට නොහැකි වූ විට විගණක සුදුසු කම් ලත් තෙවැනි පාර්ශ්වයක් සමග උපදේශ ලබා ගැනීමට කළමනාකරණයෙන් ඉල්ලා සිටිය හැකිය. (උදාහරණ ලෙස කළමනාකරණයේ විශේෂඥයා හෝ නීති උපදේශක) සමහර අවස්ථාවල දී කළමනාකරණයේ උපදේශනයෙන් ප්‍රතිචාර දැක්වීම සලකා බැලීමෙන් පසු වෙනත් තොරතුරුවල ප්‍රමාණාත්මක අවප්‍රකාශයක් පවතී ද නැද්ද යන්න විගණක තීරණය කිරීමට නොහැකිය. එවිට පහත සඳහන් ඒවායින් එකක් හෝ කිහිපයක් ඇතුලත් ක්‍රියාමාර්ග විගණකට ගැනීමට හැකි ය. :

- විගණකගේ නීති උපදේශකගෙන් උපදෙස් ලබා ගැනීම
- විගණකගේ වාර්තාව සඳහා හැගවීම සලකා බැලීම උදාහරණ ලෙස කළමනාකරණයෙන් පනවා ඇති සීමාවක් තිබෙන විට සිදුවීම් විස්තර කරන්නේ දැයි .

අදාළ නීතිය හෝ රෙගුලාසි යටතේ විගණකගේ ඉවත් වීම කළහැකි අවස්ථාවක දී ඉන් ඉවත් වීම

*වෙනත් තොරතුරුවල ප්‍රමාණාත්මක අවප්‍රකාශයක් පවතින බව විගණක තීරණය කරන විට ප්‍රතිචාර දැක්වීම*

*විගණකගේ වාර්තාවේ දිනයට පෙර ලබා ගත් වෙනත් තොරතුරුවල ප්‍රමාණාත්මක අවප්‍රකාශයක් තිබෙන බව විගණක තීරණය කරන විට ප්‍රතිචාර දැක්වීම. (යොමුව 18 ඡේදය)*

අ44 පාලනය පිළිබද වග කිව යුතු පුද්ගලයින් සමග සන්නිවේදනය කිරීමෙන් පසු වෙනත් තොරතුරු නිවැරදි කිරීම නොකරන්නේ නම් විගණක ගනු ලබන ක්‍රියාමාර්ග විගණකගේ වෘත්තීය විනිශ්චය සඳහා වන කරුණකි. කලමනාකරණය හෝ පාලනය පිළිබද වග කිව යුතු අය නිවැරදි කිරීම් නොකිරීම සඳහා ඉදිරිපත් කරන තාර්කිකත්වය විගණක නොමග යැවීමට වන දෙයක් පිළිබඳ සැක කරන විට කළමනාකරණය හෝ පාලනය පිළිබද වග කිව යුතු අයගේ අවංකකම පිළිබඳ සැකය පැන නගීදැයි විගණකට සලකා බැලිය හැකිය. විගණක යෝග්‍ය නම් නීතිමය උපදෙස් ලබා ගැනීමටද සැලකිල්ලට ගත හැකිය. සමහර අවස්ථාවල දී මෙම කරුණු නියාමකයාට හෝ අදාළ වෘත්තීය ආයතනයට සන්නිවේදනය කිරීමට නීතිය මගින් නියාමන මගින් හෝ වෙනත් වෘත්තිය ප්‍රමිත මගින් විගණකට අවශ්‍ය කෙරේ.

හැඟවෙන දෑ වාර්තා කිරීම (යොමුව 18 (ආ ඡේදය)

අ45 ඉතා විරල අවස්ථාවන්හිදී සාමාන්‍යයෙන් විගණන සාක්ෂිවල විශ්වාසනීයත්වය ප්‍රශ්නය පැනනගින විට

කළමනාරකරණය හෝ පාලනය පිළිබඳ වග කිව යුතු අයගේ අවංකකම මත එවැනි සැක පහල වීමට වෙනත් තොරතුරුවල ප්‍රමාණාත්මක අවප්‍රකාශය නිවැරදි කිරීම ප්‍රතික්ෂේප කරන විට මූල්‍ය ප්‍රකාශන මත මතය වියාචනය කිරීමක් යෝග්‍ය විය හැකි ය.

කාර්යභාරයෙන් ඉවත් වීම. (යොමුව 18 (ආ ඡේදය)

අ46 කාර්යභාරයෙන් ඉවත් වීම අදාළ නීතිය හෝ රෙගුලාසි යටතේ ඉවත් විය හැකි අවස්ථාවක දී විගණනය තුළ දී කළමනාකරණය හෝ පාලනය පිළිබඳ වග කිව යුතු අයගෙන් ලබා ගත් නියෝජනයේ විශ්වාසනීයත්වය ප්‍රශ්න කරන විට ඔවුන්ගේ අවංකභාවය මත එවැනි සැක පහල කළහැකි වෙනත් තොරතුරුවල ප්‍රමාණාත්මක අවප්‍රකාශයක් නිවැරදි කිරීම ප්‍රතික්ෂේප කිරීම වටා සිදුවීම් ඇති විට කාර්යභාරයෙන් ඉවත් වීම යෝග්‍ය විය හැකි ය.

රාජ්‍ය අංශයේ අස්තිත්වයන්ට නිශ්චිත සැලකිල්ලට ගැනීම් (යොමුව 18 (ආ ඡේදය)

අ47 රාජ්‍ය අංශ තුළ කාර්යභාරයෙන් ඉවත් වීම විය නොහැකිය. එවැනි අවස්ථාවල දී විගණක ව්‍යවස්ථාදායකට කරුණේ විස්තර ලබා දෙන වාර්තාවක් නිකුත් කල හැකි හෝ වෙනත් යෝග්‍ය ක්‍රියාමාර්ය ගත හැකි ය.

විගණකගේ වාර්තාවේ දිනයට පසු ලබාගත් වෙනත් තොරතුරු තුළ ප්‍රමාණාත්මක අවප්‍රකාශයක් පවතින බව විගණක තීරණය කරන විට ප්‍රතිචාර දැක්වීම.(යොමුව 19 ඡේදය)

අ48 විගණකගේ වාර්තාවේ දිනයට පසු ලබා ගත් වෙනත් තොරතුරු තුළ ප්‍රමාණාත්මක අවප්‍රකාශයක් පවතින බව හා එවැනි ප්‍රමාණාත්මක අවප්‍රකාශයක් නිවැරදි කර ඇති බව විගණක තීරණය කරන්නේ නම් පවත්නා තත්වයන්හිදී අවශ්‍ය විගණකගේ ක්‍රියාපටිපාටි (17 අ ඡේදයට අනුව ) නිවැරදි කිරීම සිදුකරන බව නිර්ණය කිරීම ඇතුළුව සහ වෙනත් තොරතුරුවල ඒවා ලැබීම සනනිවේදනය කිරීමට කළමනාකරණය ගනු ලබන පියවර සමාලෝචනය ඇතුලත් විය හැකිය හෝ සංස්ශෝධනයේ දී ඒවා දැනුම් දීමට කලින් නිකුත් කලේ නම් ඇතුලත් කල හැකි ය.

අ49 පාලනය පිළිබඳ වග කිව යුතු අය වෙනත් තොරතුරු සංශෝධනය කිරීමට එකඟ නොවේ නම් නිවැරදි නොකරන ලද අවප්‍රකාශය සුදුසු පරිදි සොයා බැලීමට ක්‍රියාමාර්ගයන්ගෙන් විගණකගේ වාර්තාව පිළියෙල කල පරිශීලකයින් සඳහා අවධානය ලක් කිරීමට යෝග්‍ය ක්‍රියාමාර්ග ගැනීමෙන් වෘත්තීය විනිශ්චය ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය විය හැකි අතර අධිකරණ බල ප්‍රදේශයේ අදාළ නීතියෙන් හෝ රෙගුලාසි මගින් බලපෑ හැකිය. ඒ අනුව විගණක විගණකගේ නෛතික අයිතිවාසිකම් සහ බැදීම් පිළිබඳ නෛතික උපදෙස් සොයා බැලිය හැකිය.

අ50 වෙනත් තොරතුරුවල ප්‍රමාණාත්මක අවප්‍රකාශයක් තවදුරටත් නිවැරදි නොකරන විට විගණකගේ වාර්තාව පිළියෙල කරන පරිශීලකයින්ගේ අවධානය යොමු කිරීමට යෝග්‍ය ලෙස ගෙන දෙන නිවැරදි නොකල ප්‍රමාණාත්මක අවප්‍රකාශන තිබීමට නීතියෙන් හෝ නියමයන් මගින් ඉඩ දෙන විට විගණක සුදුසු පියවර ගැනීමට සොයා බලයි. විගණකට ලබා ගැනීමට හැකි උදාහරණවලට ඇතුලත් වන්නේ;

- 22 ඡේදය අනුව විකරණය කල කොටසක් ඇතුලත්ව කළමනාකරණයට අළුත් හෝ සංශෝධනය කළ විගණකගේ වාර්තාවක් ලබාදීම සහ විගණකගේ වාර්තාව පිළියෙල කරන පරිශීලකයින් සඳහා විගණකගේ වාර්තාව මෙම අළුත් හෝ සංශෝධනය කළ වාර්තාව ලබා දෙන ලෙස කළමණාකරනයෙන් ඉල්ලා සිටීම එසේ කිරීම වන්නේ නම් ශ්‍රී.ලං.වි.ප්‍ර. වල අවශ්‍යතා සැලකිල්ලට ගැනීමේ දී හෝ යෝග්‍ය නීති හෝ රෙගුලාසිවල හෝ සංශෝධනය කල විගණකගේ වාර්තාවක දිනයට බලපෑම සලකා බැලීමට විගණකට අවශ්‍ය විය හැකි ය.
- විගණකගේ වාර්තාව පිළියෙල කරන පරිශීලකයින්ගේ සඳහා අවධානයට වෙනත් තොරතුරුවල ප්‍රමාණාත්මක අවප්‍රකාශ ලක්කිරීම (උදාහරණ ලෙස කොටස් හිමියන්ගේ වාර්ෂික රැස්වීමේ කරුණ ආමන්ත්‍රණය කිරීම මගින්).
- නිවැරදි නොකල ප්‍රමාණාත්මක අවප්‍රකාශය පිළිබඳ නියාමක හෝ අදාළ වෘත්තිය ආයතනය සමග සන්නිවේදනය කිරීම;හෝ

කාර්යභාරය නොකඩවා කරගෙන යාම සඳහා හැඟවෙන දෑ සලකා බැලීම

**මූල්‍ය ප්‍රකාශන තුළ ප්‍රමාණාත්මක අවප්‍රකාශයක් පවතින විට හෝ අස්තිත්වය හෝ එහි පරිසරයේ විගණකගේ අවබෝධය යාවත්කාලීන කිරීමට අවශ්‍යවන බව ප්‍රතිචාර දැක්වීම (යොමුව 20 ඡේදය)**

අ51 වෙනත් තොරතුරු කියවීමේ දී විගණක පහත සඳහන් දෑ හැඟවෙන නව තොරතුරු පිළිබඳ දැනුවත් විය හැකිය.

- අස්තිත්වය සහ එහි පරිසරය පිළිබඳ විගණකගේ අවබෝධයය ඒ අනුව විගණකගේ අවදානම් තක්සේරුව[13] සංශෝධන කිරීමට අවශ්‍ය බව හැඟවිය හැකි ය
- තිබේ නම් මූල්‍ය ප්‍රකාශන[14] මත විගණනය මත හඳුනාගත් අවප්‍රකාශවල හෝ නිවැරදි නොකල අවප්‍රකාශනවල බලපෑම අගය කිරීමට විගණකගේ වගකීම
- පසුව සිදුවන සිදුවීම්[15] සම්බන්ධයෙන් විගණකගේ වගකීම්

වාර්තාකරණය (යොමුව: 21–24 ඡේද )

අ52 ලැයිස්තුගත අස්තිත්වයක් හැර අස්තිත්වයක මූල්‍ය ප්‍රකාශන විගණනයක් සඳහා මෙම ශ්‍රී. ලං. වි. ප්‍ර. යටතේ විගණකගේ වගකීම්වලට යටත්ව වෙනත් තොරතුරු පිළිබඳ අමතර විනිවිදභාවයක් ලබා දීමට හැකිවීමට විගණක, විගණකගේ වාර්තාවේ දිනයට පසු ලබා ගැනීමට බලාපොරොත්තුවන වෙනත් තොරතුරු විගණකගේ වාර්තාවේ හඳුනා ගැනීම යෝග්‍යවන බව සැලකිය හැකිය. විගණක එසේ කිරීමට යෝග්‍ය බව විගණක සැලකිය හැකිය. උදාහරණ ලෙස එවැනි වෙනත් තොරතුරු විගණකට ඉදිරිපත් කිරීමට කළමනාකරණයට හැකිවන විට ඒවා විගණකගේ වාර්තාවේ දිනයට පසු නිකුත් කෙරේ.

නිදර්ශනාත්මක ප්‍රකාශ (*යොමුව* : 21–22 *ඡේද*)

අ53 විගණකගේ වාර්තාවේ ''වෙනත් තොරතුරු'' කොටසේ නිදර්ශනාත්මක උදාහරණ, 2 වන පරිශිෂ්ඨයේ ඇතුලත් වේ.

*විගණකගේ මතය මූල්‍ය ප්‍රකාශන මත කොන්දේසි සහිතවන විට හෝ වියාචනය කරන විට වාර්තාකරණ හැඟවෙන දෑ* (*යොමුව*: 23 *ඡේදය*)

අ54 විගණකගේ මතය විකරණය කිරීමට සම්බන්ධ කරුණු වෙනත් තොරතුරුවල ඇතුලත් කර නැත්නම් හෝ අප වශයෙන් ආමන්ත්‍රණය කර ඇත්නම් හෝ වෙනත් තොරතුරුවල ඕනෑම කොටසකට කරුණේ බලපෑමක් කොටසේ නම් මූල්‍ය ප්‍රකාශන මත විගණකගේ මතය කොන්දේසි සහිත මතයක් හෝ මතය වියාචනය කිරීම 22(ඉ) ඡේදය මගින් අවශ්‍ය කරන ප්‍රකාශය මත  බලපෑමක තිබිය නොහැකිය. උදාහරණ අදාළ මූල්‍ය වර්තාකරණ ආකෘතිමය රාමුව මගින් අවශ්‍ය කෙරෙන අධ්‍යක්ෂක පාරිශ්‍රමිකය හෙළිදරව් නොකිරීම නිසා මූල්‍ය පකාශන මත කොන්දේසි සහිත මතයක ප්‍රතිඵල දිම මෙම ශ්‍රී. ලං. වි. ප්‍ර. යේ අවශ්‍ය කෙරෙන වාර්තාකරණය අවශ්‍යතාවය සසඳන බලපෑමට බලපෑමක නොවිය හැකිය. වෙනත් අවස්ථාවලදී, අ55 -අ 58 ඡේදවල විස්තර කරන පරිදි එවැනි වාර්තාකරණය සඳහා බලපෑම් තිබිය හැකිය.

මූල්‍ය ප්‍රකාශන තුළ ප්‍රමාණාත්මක අවප්‍රකාශයක් හේතුවෙන් කොන්දේසි සහිත මතය

අ55 විගණකගේ මතය කොන්දේසි සහිත වන අවස්ථාවලදි, වෙනත් තොරතුරු එකම කරුණ සඳහා හෝ මූල්‍ය ප්‍රකාශ මත කොන්දේසි සහිත මතය දීමට පැනනගින කරුණක් සම්බන්ධයෙන් ප්‍රමාණාත්මක අවප්‍රකාශ වේ දැයි සලකාබැලීම් කළ හැකි ය.

විෂය පථය සීමා වීම හේතුවෙන් කොන්දේසි සහිත මත ය

අ56 මූල්‍ය ප්‍රකාශන තුළ ප්‍රමාණාත්මක අයිතමයක් සම්බන්ධයෙන් විෂයපථය සීමාවීමක් තිබෙන අවස්ථාවකදි , එම කරුණ පිළිබඳ ප්‍රමාණවත් විගණන යෝග්‍ය සාක්ෂි විගණකට ලබා ගැනීමට නොහැකිවනු ඇත. එවැනි තත්ත්ව වල දී විගණක වෙනත් තොරතුරුවල ප්‍රමාණාත්මක අවප්‍රකාශනයක් මෙම කරුණ සම්බන්ධයෙන් වෙනත් තොරතුරුවල අගයන් හෝ වෙනත් අයිතම ප්‍රතිඵල දෙයිද නැද්ද යන්න තීරණය කළ නොහැකි විය හැකිය. ඒ අනුව විගණක කොන්දේසි සහිත මතය සඳහා පදනමේ වන ඡේදය විස්තර කරන පරිදි මූල්‍ය ප්‍රකාශන මත

[13] SLAuS 315 (සංශෝධිත), 11, 31, සහ අ1 ඡේද
[14] SLAuS 450, විගණනය තුලදී හඳුනගත් අවප්‍රකාශ ඇගයීම
[15] SLAuS 560, 10 සහ 14 ඡේද

විගණකගේ මතය කොන්දේසි සහිත කර තිබීම සම්බන්ධයෙන් වෙනත් තොරතුරුවල කරුණේ කළමනාකරණයේ විස්තර සැලකීමට විගණකගේ නොහැකියාවට යොමු කිරීමට 22(ඉ) ඡේදය මගින් අවශ්‍ය කෙරෙන ප්‍රකාශය මගින් විකරණය කිරීමට විගණකට අවශ්‍ය විය හැකිය. කෙසේ වෙතත් විගණක වෙනත් තොරතුරුවල හඳුනාගෙන තිබෙන වෙනත් ඕනෑම නිවැරදි නොකළ ප්‍රමාණාත්මක අවප්‍රකාශයන් වාර්තා කිරීමට අවශ්‍ය කෙරේ.

අහිතකර මතය

අ57 අහිතකර මතය සඳහා පදනමේ ඡේදයේ විස්තර කළ නිශ්චිත කරුණකට සම්බන්ධයෙන් මූල්‍ය ප්‍රකාශන මත අහිතකර මතය 22 (ඉ) (ii) ඡේදය අනුව විගණකගේ වාර්තාවේ විගණක හඳුනාගෙන තිබෙන වෙනත් තොරතුරුවල ප්‍රමාණාත්මක අවප්‍රකාශවල වාර්තා කිරීමේ අත්හැරීම සාධාරණීය කිරීම නොකරයි. මූල්‍ය ප්‍රකාශන මත අහිතකර මතයක් ප්‍රකාශකර තිබෙන විට 22 (ඉ) ඡේදය මගින් අවශ්‍ය කරන ප්‍රකාශය යෝග්‍යව විකරණය කිරීමට විගණකට අවශ්‍ය විය හැකිය. උදාහරණ ලෙස මූල්‍ය ප්‍රකාශන මත අහිතකර මතයකට හට ගන්නා එකම කරුණ ලෙස හෝ සම්බන්ධයෙන් කරුණ සඳහා ප්‍රමාණාත්මක අවප්‍රකාශ වී ඇති වෙනත් තොරතුරු තුළ එම වටිනාකම් හෝ අයිතම පෙන්නුම් කිරීමට අවශ්‍ය විය හැකිය.

මතය වියාචනය කිරීම

අ58 විගණක මූල්‍ය ප්‍රකාශ මත මතයක් වියාචනය කරන විට විගණනය පිළිබඳ තවදුරටත් විස්තර ලබා දෙමින් වෙනත් තොරතුරු ආමන්ත්‍රණය කිරීමට කොටසක් ඇතුළත් කරමින් සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශ මත මතය වියාචනය කිරීම වඩාත් ඉස්මතු වීම පෙන්විය හැකිය. ඒ අනුව එවැනි තත්වයන්වලදී ශ්‍රී.ලං.වි.ප්‍ර. 705 (සංශෝධිත) මගින් අවශ්‍ය කරන මෙම ශ්‍රී.ලං.වි.ප්‍ර. යටතේ වාර්තාකරණ අවශ්‍යතාවයන් ආමන්ත්‍රණය කරමින් කොටසක් විගණකගේ වාර්තාවේ ඇතුළත් නොවේ.

නීතියෙන් හෝ රෙගලාසි මගින් නියම කළ වාර්තාකරණය (*යොමුව* : 24 *ඡේදය*)

අ59 ශ්‍රී.ලං.වි.ප්‍ර. 200[16] මගින් ශ්‍රී.ලං.වි.ප්‍ර.වලට අමතරව නෛතික හෝ නියාමන අවශ්‍යතාවයන්ට අනුගත වීමට විගණකට අවශ්‍ය බව විස්තර කෙරේ. මෙය සිද්ධියක් වන අවස්ථාවකදී විගණක මෙම ශ්‍රී.ලං.වි.ප්‍ර.යේ විස්තර කරන විගණකගේ වාර්තාවේ වෙනස් නිශ්චිත පසුතලයන් හෝ වචන පෙළගැස්මක් භාවිතා කිරීමට බැඳීමක් විගණකට තිබිය හැකිය. ශ්‍රී.ලං.වි.ප්‍ර. අනුව විගණනයන් මෙහෙය වන විට විගණකගේ වාර්තාවේ සංගතතාවය ගෝලීයව පිළගත් ප්‍රමිත අනුව එම විගණනය සිදුකර තිබෙන බව වඩාත් කරදරයක් නොමැතිව හඳුනා ගැනීම් නිමකර තිබීම මගින් ගෝලීය වෙළෙඳ පොල තුළ විශ්වාසනත්තකම ප්‍රවර්ධනය කෙරේ. නෛතික හෝ නියාමන අවශ්‍යතාවයන් අතර වෙනස්කම් වෙනත් තොරතුරු සම්බන්ධයෙන් වාර්තා කිරීමට සහ මෙම ශ්‍රී.ලං.වි.ප්‍ර. විගණකගේ වාර්තාවේ පසුතලයට සහ වචන පෙළගැස්මට පමණක් සම්බන්ධව සහ අවමයක් වශයෙන් විගණකගේ වාර්තාවේ ඇතුළත් 24 ඡේදයේ හඳුනාගෙන ඇති සෑම මූලිකාංගයක්ම විගණකගේ වාර්තාව ශ්‍රී ලංකා විගණන ප්‍රමිතවලට යොමුකල හැකිය. ඒ අනුව එවැනි තත්ත්වයන්වලදී විගණක විගණකගේ වාර්තාවේ භාවිතා කළපසුතලය සහ වචන පෙළ ගැස්ම නෛතික හෝ නියාමන අවශ්‍යතාවයන් මගින් විශේෂයෙන් සඳහන් කර ඇති වුවත් මෙම ශ්‍රී.ලං.වි.ප්‍ර. අවශ්‍යතාවයන් අනුගත වී ඇති බව සලකනු ලැබේ.

## 1 වන පරිශිෂ්ඨය

(යොමුව: . 14, අ8 ඡේද )

**වෙනත් තොරතුරුවල ඇතුළත් කිරීමට හැකි වටිනාකම් හෝ වෙනත් අයිතමවලට උදාහරණ**

වෙනත් තොරතුරුවල ඇතුළත් කිරීමට හැකි වටිනාකම් සහ වෙනත් අයිතමවලට උදාහරණ පහත පරිදි වේ.මෙම ලැයිස්තුව සවිස්තරාත්මක නොවේ.

[16] SLAuS 200, අ57 ඡේදය

වටිනාකම්

- ප්‍රධාන මූල්‍ය ප්‍රතිඵලවල සාරාංශයක අයිතම එනම් ශුද්ධ ආදායම, කොටසක ඉපයුම, ලාභාංශ, විකුණුම් සහ වෙනත් මෙහෙයුම් අයභාරයෙන් සහ ගැණුම් සහ මෙහෙයුම් වියදම්
- තෝරා ගත් මෙහෙයුම් දත්ත එනම් ප්‍රධාන මෙහෙයුම් ක්ෂේත්‍ර මගින් අඛණ්ඩව මෙහෙයුම්වලින් ආදායම හෝ භූගෝලීය ඛණ්ඩන හෝ නිෂ්පාදන පෙළ මගින් විකුණුම්
- විශේෂ අයිතම එනම් වත්කම් බැහැර කිරීම්, නඩුවක් පවතවාගෙනයාමේ ප්‍රතිපාදන, වත්කම් හානිකරණය, බදු ගැලපීම්, පාරිසරික දූෂණ හානි ප්‍රකෘතිමත් කිරීමේ ප්‍රතිපාදන සහ ප්‍රතිව්‍යුහකරණය සහ ප්‍රතිසංවිධානගත වියදම්
- ද්‍රවශීලතා සහ ප්‍රාග්ධන සම්පත් තොරතුරු එනම් මුදල්, මුදල් වලට සමාන දෑ සහ අලෙවි කරගත හැකි සුරකුම්පත්, ලාභාංශ සහ ණය, ප්‍රාග්ධන කල්බදු සහ සුළු කොටස් හිමියන්ගේ බැඳීම්
- ඛණ්ඩය හෝ අංශය මගින් ප්‍රාග්ධන වියදම්
- ශේෂපත්‍රයට පිටතින් එකඟවීම්හි මූල්‍ය බලපෑමේ ඇතුළත් සහ සම්බන්ධ වටිනාකම්
- ප්‍රතිඥාභාර, ගිවිසුම්මය බැඳීම්, නෛතික හෝ පාරිසරික හිමිකම් පෑම් සහ වෙනත් අසම්භාව්‍යයන් ඇතුලත් වටිනාකම්
- මූල්‍ය මිනුම් සහ අනුපාත එනම් දළ ආන්තිකය, සාමාන්‍ය ප්‍රාග්ධනය මත ප්‍රතිලාභය, සාමාන්‍ය කොටස් හිමියන්ගේ ස්කන්ධය මත ප්‍රතිලාභය, ජංගම අනුපාතය, පොළී ආවරණ අනුපාතය සහ ණය

වෙනත් අයිතම

- තීරණාත්මක ගිණුම්කරන ඇස්තමේන්තු සහ සම්බන්ධිත උපකල්පනවල විස්තර කිරීම්.
- සම්බන්ධිත පාර්ශවයන් හඳුනා ගැනීම සහ ඔවුන් සමග ගනුදෙනුවල විස්තර
- අස්තිත්වයේ ප්‍රතිපත්තිවල පැහැදිලි ලෙස කීම හෝ වෙළෙඳ භාණ්ඩ කළමනාකරණය කිරීමේ ප්‍රවේශය, විදේශ විනිමය හෝ පොළී අනුපාත අවදානම් එනම් ඉදිරි ගිවිසුම් භාවිතය, පොළී අනුපාත හුවමාරු කිරීම් හෝ වෙනත් මූල්‍ය සාධන පත්‍ර හරහා
- ශේෂපත්‍ර දිනෙන් පසු එකගවීම්වල ස්වභාවයේ විස්තරයන්
- ඇපවීම්, හානිපූරණය,ගිවිසුම්මය බැඳීම්, නඩුවක් පවතවා ගෙනයාමේ නෛතික හෝ පාරිසරික වගකීම් පිළිබඳ නඩු සහ අස්තිත්වයේ සම්බන්ධිත නිරාවරණයන්හි කළමනාකරණයේ ගුණාත්මක තත්වයේ විස්තර
- නෛතික හෝ නියාමක අවශ්‍යතාවයන්හි වෙනස්වීම්වල විස්තරයන් එනම් නව බදු හෝ අස්තිත්වයේ මෙහෙයුම් හෝ මූල්‍ය ප්‍රතිපත්තිවලට ප්‍රමාණාත්මක බලපා තිබෙන හෝ අස්තිත්වයේ අනාගත මූල්‍ය අපේක්ෂාවට ප්‍රමාණාත්මක බලපෑමක් තිබෙන පාරිසරික රෙගුලාසි
- කාලපරිච්ඡේදය තුළදී සිට බලපැවැත්වෙන හෝ ඊට පසු කාලපරිච්ඡේදවල සිට බලපැවැත්වෙන නව මූල්‍ය වාර්තාකරණය ප්‍රමිතවල අස්තිත්වයේ මූල්‍ය ප්‍රතිඵල, මූල්‍ය තත්වය හෝ මුදල් ප්‍රවාහ මත බලපෑම් කළමනාකරණයේ ගුණාත්මක තක්සේරුව
- ව්‍යාපාරික පරිසරය සහ අනාගත අපේක්ෂාවන්ගේ සාමාන්‍ය විස්තරයන්
- උපාය මාර්ගයන්හි සමස්ත විග්‍රහය
- ප්‍රධාන වෙළෙඳ භාණ්ඩ හෝ අමුද්‍රව්‍යවල වෙළෙඳපොල මිල ගණන්වල උපනතිවල විස්තර
- භූගෝලීය ප්‍රදේශ අතරේ සැපයුම් අසමානතත්වයන් ඉල්ලුම සහ නියාමන තත්ත්වයන්
- විශේෂී ඛණ්ඩවල අස්තිත්වයේ ලාභදායීත්වය බලපෑම්කරමින් විශේෂි සාධකවල විස්තර කිරීම්

**පරිශිෂ්ඨය 2**

(යොමුව: 21–22, අ53 ඡේද)

## ස්ථානිය කරන ලද වාර්තා සඳහා නිදර්ශනාත්මක වාර්තා ශ්‍රී ලංකා විගණන ප්‍රමිත 700 (සංශෝධිත) යොමු වේ

වෙනත් තොරතුරුවලට සම්බන්ධයෙන් *ස්වාධීන* විගණකගේ වාර්තාවන් සඳහා නිදර්ශන

- 1 වැනි නිදර්ශනය : විගණකගේ වාර්තාවේ දිනයට පෙර සියළුම වෙනත් තොරතුරු විගණක ලබාගෙන තිබෙන විට සහ වෙනත් තොරතුරුවල ප්‍රමාණාත්මක අවප්‍රකාශයක් හඳුනා ගෙන නොතිබෙන විට විකරණය නොකළ මතයකින් සමන්විත ලැයිස්තුගත හෝ ලැයිස්තුගත නොවන යන ඕනෑම අස්තිත්වයක විගණකගේ වාර්තාව.
- 2 වැනි නිදර්ශනය : විගණක විගණකගේ වාර්තාවේ දිනයට පෙර වෙනත් තොරතුරුවල කොටසක් විගණක ලබාගෙන තිබෙන විට සහ වෙනත් තොරතුරුවල ප්‍රමාණාත්මක අවප්‍රකාශයක් හඳුනා ගෙන නොතිබෙන විට

සහ විගණකගේ වාර්තාවේ දිනයට පසු වෙනත් තොරතුරු ලබා ගැනිමට අපේක්ෂා කරන විකරණය නොකළ මතයකින් සමන්විත ලැයිස්තුගත අස්තිත්වයක විගණකගේ වාර්තාව.

- 3 වැනි නිදර්ශනය : විගණකගේ වාර්තාවේ දිනයට පෙර වෙනත් තොරතුරුවල කොටසක් විගණක ලබාගෙන තිබෙන විට වෙනත් තොරතුරුවල ප්‍රමාණාත්මක අවප්‍රකාශයක් හඳුනා ගෙන නොතිබෙන විට සහ විගණකගේ වාර්තාවේ දිනයට පසු වෙනත් තොරතුරු ලබා ගැනීමට අපේක්ෂා කරන විකරණය නොකළ මතයකින් සමන්විත ලැයිස්තුගත අස්තිත්වයක් නොවන අස්තිත්වයක විගණකගේ වාර්තාව.
- 4 වැනි නිදර්ශනය : විගණකගේ වාර්තාවේ දිනයට පෙර වෙනත් තොරතුරු විගණක ලබාගෙන නොතිබෙන විට නමුත් විගණකගේ වාර්තාවේ දිනයට පසු වෙනත් තොරතුරු ලබා ගැනීමට අපේක්ෂා කරන විකරණය නොකළ මතයකින් සමන්විත ලැයිස්තුගත අස්තිත්වයක විගණකගේ වාර්තාව
- 5 වැනි නිදර්ශනය : විගණකගේ වාර්තාවේ දිනයට පෙර සියලුම වෙනත් තොරතුරු විගණක ලබාගෙන තිබෙන විට සහ වෙනත් තොරතුරුවල ප්‍රමාණාත්මක අවප්‍රකාශයක් තිබෙන බව නිගමනය කරන විට විකරණය නොකළ මතයකින් සමන්විත ලැයිස්තුගත හෝ ලැයිස්තුගත නොවන ඕනෑම අස්තිත්වයක විගණකගේ වාර්තාව.
- 6 වැනි නිදර්ශනය : විගණකගේ වාර්තාවේ දිනයට පෙර සියලුම වෙනත් තොරතුරු විගණක ලබාගෙන තිබෙන විට සහ වෙනත් තොරතුරුවලින් එසේම බලපාන ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන තුළ ප්‍රමාණාත්මක අයිතමයක් සම්බන්ධයෙන් විෂයපථයේ සීමාවක් තිබෙන විට කොන්දේසි සහිත විගණන මතයකින් සමන්විත ලැයිස්තුගත හෝ ලැයිස්තුගත නොවන ඕනෑම අස්තිත්වයක විගණකගේ වාර්තාව.
- 7 වැනි නිදර්ශනය: විගණකගේ වාර්තාවේ දිනයට පෙර සියලුම වෙනත් තොරතුරු විගණක ලබා ගෙන තිබෙන විට සහ වෙනත් තොරතුරුවලින් එසේම බලපාන ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන මත අහිතකර මතයක් ඇති විට අහිතකර විගණන මතයකින් සමන්විත ලැයිස්තුගත හෝ ලැයිස්තුගත නොවන ඕනෑම අස්තිත්වයක විගණකගේ වාර්තාව.

**1 වැනි නිදර්ශනය : විගණකගේ වාර්තාවේ දිනයට පෙර සියලුම වෙනත් තොරතුරු විගණක ලබාගෙන තිබෙන විට සහ වෙනත් තොරතුරුවල ප්‍රමාණාත්මක අවප්‍රකාශයක් හඳුනාගෙන නොතිබෙන විට විකරණය නොකළ මතයකින් සමන්විත ලැයිස්තුගත හෝ ලැයිස්තුගත නොවන යන ඕනෑම අස්තිත්වයක විගණකගේ වාර්තාව.**

**මෙම නිදර්ශනාත්මක විගණකගේ වාර්තාවේ අරමුණ සඳහා පහත සඳහන් තත්ත්වයන් උපකල්පනය කෙරේ:**

- **සාධාරණ ඉදිරිපත් කිරීමේ ආකෘතිමය රාමුවක් භාවිතා කරමින් ලැයිස්තුගත හෝ ලැයිස්තුගත නොවන ඕනෑම අස්තිත්වයක සම්පූර්ණ මූල්‍ය ප්‍රකාශ කට්ටලයක විගණනය. විගණනය ,සමූහයේ විගණනය නොවේ. (එනම්., ශ්‍රී.ල.වි.ප්‍ර. 600[17] ව්‍යවහාර නොවේ).**
- **ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත (පොදු අරමුණු සඳහා වූ ආකෘතිමය රාමුවක්) ප්‍රකාර අස්තිත්වයේ කළමනාකාරිත්වය විසින් මූල්‍ය ප්‍රකාශ පිළියෙල කරයි**
- **ශ්‍රී.ල.වි.ප්‍ර. 210 තුළ වන මූල්‍ය ප්‍රකාශන සඳහා කළමනාකාරිත්වයේ වගකීම්හි විස්තරයේ විගණනයේ කාර්යභාරයේ කොන්දේසි පිළිබිඹු වේ.**
- **ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව විගණක තීරණය කළ විකරණය නොකළ (එනම්, "පිරිසිදු") මතයක් යෝග්‍ය වේ.**
- **විගණනයට ව්‍යවහාර කරන අදාළ ආචාර ධර්ම අවශ්‍යතා අඩංගුව ඇත්තේ ශ්‍රී ලංකා වරලත් ගණකාධිකරණ ආයතනය විසින් නිකුත් කළ ආචාර ධර්ම සංග්‍රහයේය.**
- **ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව, ශ්‍රී.ලං.වි.ප්‍ර 570 (සංශෝධිත)[18] අනුව අඛණ්ඩ පැවැත්ම ලෙස නොකඩවා පවත්වාගෙන යාමට අස්තිත්වයේ හැකියාව පිළිබඳ සැලකියයුතු අන්දමේ සැකයක් පහළ කළ හැකි සිද්ධි හෝ තත්වයන් සම්බන්ධයෙන් ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් නොපවතින බව විගණක තීරණය කර ඇත.**
- **ශ්‍රී.ලං.වි.ප්‍ර. 701[19] අනුව ප්‍රධාන විගණන කරුණු සන්නිවේදනය කර ඇත.**
- **විගණක විසින් විගණකගේ වාර්තාවේ දිනයට පෙර සියලුම තොරතුරු ලබාගෙන තිබීම සහ වෙනත් තොරතුරුවල ප්‍රමාණාත්මක අවප්‍රකාශයක් හඳුනාගෙන නොතිබීම.**
- **මූල්‍ය ප්‍රකාශ අධීක්ෂණය කිරීමට වග කිව යුතු පුද්ගලයන් මූල්‍ය ප්‍රකාශ පිළියෙළ කරන පුද්ගලයන්ගෙන් වෙනස් වේ.**
- **මූල්‍ය ප්‍රකාශන විගණනයට අමතරව, විගණකට දේශීය නීතිය යටතේ වෙනත් වාර්තාකරණ වගකීම් ඇත.**

## ස්වාධීන විගණකගේ වාර්තාව

ABC සමාගමේ කොටස්හිමියන්ට [හෝ වෙනත් යෝග්‍ය ආමන්ත්‍රණය කරන්නා]

### මූල්‍ය ප්‍රකාශන විගණනය මත වාර්තාව [20]

**මතය**

ABC සමාගමේ (සමාගම) 20×1 දෙසැම්බර් මස 31 දිනට වූ මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එම දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා විස්තීරණ ආදායම් ප්‍රකාශය සහ ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශය සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශය සහ වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තීන් ඇතුළත්ව මූල්‍ය ප්‍රකාශනවලට සටහන්වලින් සමන්විත මූල්‍ය ප්‍රකාශ අප විසින් විගණනය කරන ලදී

---

[17] SLAuS 600,*විශේෂ සලකා බැලීම්– සමූහයක මූල්‍ය ප්‍රකාශන විගණනය (සංරචක විගණකගේ වැඩ ඇතුළත්ව)*

[18] SLAuS 570 (සංශෝධිත), *අඛණ්ඩ පැවැත්ම*

[19] SLAuS 701, *ස්වාධීන විගණකගේ වාර්තාවේ ප්‍රධාන විගණන කරුණු සන්නිවේදනය කිරීම.* ලැයිස්තුගත අස්තිත්වයක් සඳහා ප්‍රධාන විගණන කරුණු කොටස අවශ්‍ය වේ.

[20] "වෙනත් නෛතික සහ නියාමන අවශ්‍යතාවයන් මත වාර්තාව යන දෙවන උපමාතෘකාව අදාළ නොවන තත්වයන්හිදී "මූල්‍ය ප්‍රකාශන මත විගණනයේ වාර්තාව යන උපමාතෘකාව", අවශ්‍ය නොවේ.

20X1 දෙසැම්බර් 31 දිනට සමාගමේ මූල්‍ය තත්ත්වය සහ එම දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා වූ එහි මූල්‍ය කාර්යසාධනය සහ එහි මුදල් ප්‍රවාහ ප්‍රකාශනය ශ්‍රී ලංකා ගිණුම් ප්‍රමිත අනුව පිළියෙළ කර ඇත. මේ සමග ඇති මූල්‍ය ප්‍රකාශ සියලුම ප්‍රමාණාත්මක අංගයන්ගෙන් සාධාරණව බව (හෝ සත්‍ය හා සාධාරණ දර්ශනයක් පෙන්නුම් කරන ) ඉදිරිපත් කර ඇති බව අපගේ මතය වේ.

**මතය සඳහා පදනම**

අප, ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුව අපගේ විගණනය මෙහෙයවන ලදී. එම ප්‍රමිතීන් යටතේ අපගේ වගකීම් අපගේ වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන *විගණනය සඳහා විගණකගේ වගකීම් කොටස* යටතේ තවදුරටත් විස්තර කරනු ලැබේ. ශ්‍රී. ලංකා වරලත් ගණකාධිකරණ ආයතනය විසින් නිකුත් කළ ආචාරධර්ම සංග්‍රහයට (CA ශ්‍රී. ලංකා සංග්‍රහය) අනුව අප සමාගමෙන් ස්වාධීන වන අතර අප එම අවශ්‍යතාවයන්ට අනුව අපගේ අනෙකුත් ආචාරධර්ම වගකීම් ඉෂ්ට කර ඇත්තෙමු. අපගේ මතය සඳහා පදනමක් ලබාදීමට අප ප්‍රමාණවත් සහ යෝග්‍ය සාක්ෂි ලබා ගත් බව අපගේ විශ්වාසයයි.

**ප්‍රධාන විගණන කරුණු**[21]

ප්‍රධාන විගණන කරුණු වනුයේ ප්‍රවර්තන කාලපරිච්ඡේදයේ මූල්‍ය ප්‍රකාශවල විගණනයේදී අපගේ වෘත්තිය *විනිශ්චය අනුව වඩාත් වැදගත් වූ* කරුණු වේ. මූල්‍ය ප්‍රකාශ සමස්තයක් ලෙස ගත්කල විගණනය සම්බන්ධයෙන් සහ ඒ මත අපගේ මතය සකස් කිරීමේදී මෙම කරුණු අප ආමන්ත්‍රණය කර ඇති අතර මෙම කරුණු මත වෙනමම මතයක් අප ලබා නොදෙයි.

[ශ්‍රී.ලං.වි.ප්‍ර. 701 අනුව එක් එක් ප්‍රධාන විගණන කරුණක විස්තරය.]

**වෙනත් තොරතුරු [හෝ ''මූල්‍ය ප්‍රකාශ සහ ඒ මත විගණකගේ වාර්තාව මත හැර වෙනත් තොරතුරු'' වැනි දෑ යෝග්‍ය නම් වෙනත් ශීර්ෂයක්]**

වෙනත් තොරතුරු සඳහා කළමනාකරණය[22] වග කිව යුතු වේ. වෙනත් තොරතුරු [X වාර්තාවේ[23] ඇතුළත් කළ තොරතුරු නමුත් මූල්‍ය ප්‍රකාශ සහ ඒ මත අපගේ විගණකගේ වාර්තාවේ ඇතුළත් නොවේ.] සමන්විත වේ. මූල්‍ය ප්‍රකාශන මත අපගේ මතයේ වෙනත් තොරතුරු ආවරණය නොවන අතර අප ඒ මත කිසිම ආකාරයක සහතිකවීමේ තීරණයක් ප්‍රකාශ නොකරයි.

මූල්‍ය ප්‍රකාශනවල අපගේ විගණනය සම්බන්ධයෙන්, අපගේ *වගකීම වනුයේ* වෙනත් තොරතුරු කියවීම වන අතර එසේ කිරීමේදී වෙනත් තොරතුරු, මූල්‍ය ප්‍රකාශන සමග හෝ විගණනයේදී ලබා ගත් දැනුම සමග ප්‍රමාණාත්මක ලෙස අසංගත දැයි හෝ එසේ නැත්නම් ප්‍රමාණාත්මක ලෙස අවප්‍රකාශ වී ඇති බව පෙන්නුම් කරන්නේදැයි සලකා බැලීමට අප ඉටුකළ වැඩ මත පදනම්ව තිබේ නම් මෙම වෙනත් තොරතුරුවල ප්‍රමාණාත්මක අවප්‍රකාශයක් තිබෙන බව අප තීරණය කරන අතර එම කරුණ වාර්තා කිරීමට අපට අවශ්‍ය කරනු ලැබේ. මේ සම්බන්ධයෙන් වාර්තා කිරීමට කිසිවක් නොවේ.

**මූල්‍ය ප්‍රකාශ සඳහා කළමනාකරණය සහ පාලනය පිළිබඳ වගකිව යුතු අය සමග සන්නිවේදනය**[24]

[ශ්‍රී.ලං.වි.ප්‍ර. 700 (සංශෝධිත)[25] අනුව *වාර්තාකරණය* – ශ්‍රී.ලං.වි.ප්‍ර. 700 (සංශෝධිත) හි 1 වැනි නිදර්ශනය බලන්න.]

---

21 ප්‍රධාන විගණන කරුණු කොටස අවශ්‍ය වන්නේ ලැයිස්තුගත අස්තිත්වයක් සඳහා පමණි

22 හෝ අදාළ අධිකරණ බල ප්‍රදේශයන් තුළ නෛතික ආකෘතිමය රාමුවේ සම්බන්ධය තුළ යෝග්‍ය වන වෙනත් පද

23 වෙනත් තොරතුරුවල වඩාත් විශේෂ විස්තරයක්, එනම් "කළමනාකරණයේ වාර්තාව සහ සභාපතිතුමාගේ ප්‍රකාශයක්," වෙනත් තොරතුරු හඳුනා ගැනීමට භාවිතා කළ හැකිය.

24 මෙම නිදර්ශනාත්මක විගණකගේ වාර්තා පුරාම කළමනාකරණය සහ පාලනය පිළිබඳ වගකිව යුතු අය යන පද අදාළ අධිකරණ බල ප්‍රදේශයන් තුළ නෛතික ආකෘතිමය රාමුවේ සම්බන්ධයෙන් ගත්කළ යෝග්‍ය පරිදි වෙනත් පද මගින් හිලව් කිරීමට අවශ්‍ය විය හැකිය.

25 SLAuS 700 (සංශෝධිත), මූල්‍ය ප්‍රකාශන මත මතයක් සකස් කිරීම සහ වාර්තාකරණය

**මූල්‍ය ප්‍රකාශ විගණනය සඳහා විගණකගේ වගකීම්**

[ශ්‍රී.ලං.වි.ප්‍ර. 700 (සංශෝධිත) අනුව *වාර්තාකරණය* –ශ්‍රී.ලං.වි.ප්‍ර. 700 (සංශෝධිත) හි 1 වැනි නිදර්ශනය බලන්න.]

**වෙනත් නෛතික සහ නියාමන අවශ්‍යතා මත වාර්තාව**

[ශ්‍රී.ලං.වි.ප්‍ර. 700 (සංශෝධිත) අනුව *වාර්තාකරණය* –ශ්‍රී.ලං.වි.ප්‍ර. 700 (සංශෝධිත) හි 1 වැනි නිදර්ශනය බලන්න.]

මෙම ස්වාධීන විගණකගේ වාර්තාව අත්සන් කිරීම සඳහා වගකිව යුතු කාර්ය භාරයේ නියුතු හවුල්කරුගේ ශ්‍රී ලංකා වරලත් ගණකාධිකරණ ආයතනයේ සාමාජික අංකය වන්නේ [අංකය].[26]

[විගණන සමාගම නමින් අත්සන*]* [*විගණන සමාගමේ ලිපිනය]*

[*දිනය*]

<u>2 වැනි නිදර්ශනය : විගණකගේ වාර්තාවේ දිනයට පෙර වෙනත් තොරතුරුවල කොටසක් විගණක ලබාගෙන තිබෙන විට සහ වෙනත් තොරතුරුවල ප්‍රමාණාත්මක අවප්‍රකාශයක් හඳුනා ගෙන නොතිබෙන විට සහ විගණකගේ වාර්තාවේ දිනයට පසු වෙනත් තොරතුරු ලබා ගැනීට අපේක්ෂා කරන විකරණය නොකළ විගණන මතයකින් සමන්විත ලැයිස්තුගත අස්තිත්වයක් විගණකගේ වාර්තාව.</u>

**මෙම නිදර්ශනාත්මක විගණකගේ වාර්තාවේ අරමුණ සඳහා පහත සඳහන් තත්ත්වයන් උපකල්පනය කෙරේ:**

- **ඉදිරිපත් කිරීමේ ආකෘතිමය රාමුවක් භාවිතා කරමින් ලැයිස්තුගත අස්තිත්වයක සම්පූර්ණ මූල්‍ය ප්‍රකාශන කට්ටලයක් විගණනය ''විගණනය සමූහ විගණනයක් නොවේ'' . (එනම්., ශ්‍රී.ල.වි.ප්‍ර. 600 ව්‍යවහාර නොකෙරේ).**
- **ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත (පොදු අරමුණු සඳහා වූ ආකෘතිමය රාමුවක්) ප්‍රකාර අස්තිත්වයේ කළමනාකාරිත්වය විසින් මූල්‍ය ප්‍රකාශන පිළියෙල කරයි .**
- **ශ්‍රී.ල.වි.ප්‍ර. 210 තුළ වන මූල්‍ය ප්‍රකාශන සඳහා කළමනාකාරිත්වයේ වගකීම්හි විස්තරයේ විගණනයේ කාර්යභාරයේ කොන්දේසි පිළිබිඹු වේ.**
- **ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව විගණක තීරණය කළ යෝග්‍ය විකරණය නොකළ (එනම්., "පිරිසිදු") මතය යෝග්‍ය වේ..**
- **විගණනයට ව්‍යවහාර කරන අදාළ ආචාර ධර්ම අවශ්‍යතා අඩංගු ඇත්තේ ශ්‍රී ලංකා වරලත් ගණකාධිකරණ ආයතනය විසින් නිකුත් කළ ආචාර ධර්ම සංග්‍රහයේය**
- **ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව, ශ්‍රී.ලං.වි.ප්‍ර. 570 (සංශෝධිත) අනුව අඛණ්ඩ පැවැත්ම ලෙස නොකඩවා පවත්වාගෙන යාමට අස්තිත්වයේ හැකියාව පිළිබඳ සැලකිය යුතු අන්දමේ සැක පහළ කළ හැකි සිද්ධි හෝ තත්වයන් සම්බන්ධයෙන් ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් නොපවතින බව විගණක තීරණය කර ඇත.**
- **ශ්‍රී.ලං.වි.ප්‍ර. 701 අනුව ප්‍රධාන විගණන කරුණු සන්නිවේදනය කර ඇත.**
- **විගණකගේ වාර්තාවේ දිනයට පෙර වෙනත් තොරතුරු කොටසක් විගණක ලබාගෙන තිබීම සහ වෙනත් තොරතුරුවල ප්‍රමාණාත්මක අවප්‍රකාශයක් හඳුනාගෙන නොතිබීම විගණකගේ වාර්තාවේ දිනයට පසු වෙනත් තොරතුරු විගණක ලබාගැනීමට අපේක්ෂා කෙරේ.**
- **මූල්‍ය ප්‍රකාශන අධීක්ෂණය කිරීමට වගකිවයුතු පුද්ගලයන් මූල්‍ය ප්‍රකාශන පිළියෙළ කරන පුද්ගලයන්ගෙන් වෙනස් වේ.**
- **මූල්‍ය ප්‍රකාශන විගණනයට අමතරව, විගණකට දේශීය නීතිය යටතේ වෙනත් වාර්තාකරණ වගකීම් පැවරී ඇත.**

[26] කාර්යභාර හවුල්කරුගේ නම, ඉතා කලාතරකින් අවස්ථාවකදී එවැනි හෙළිදරව්කිරීම සැලකිය යුතු පෞද්ගලික තර්ජනයක් මග පෙන්වීමට සාධාරණ ලෙස බලාපොරොත්තු වීම හැර පොදු අරමුණු සඳහා වූ සම්පූර්ණ මූල්‍ය ප්‍රකාශන කට්ටලයක් විගණනය කිරීම සඳහා විගණකගේ වාර්තාවේ ඇතුළත් වේ. ( SLAuS 700 (සංශෝධිත), 46 ඡේදය බලන්න).

## ස්වාධීන විගණකගේ වාර්තාව

ABC සමාගමේ කොටස්හිමියන්ට [හෝ වෙනත් යෝග්‍ය ආමන්ත්‍රණය කරන්නා]

### මූල්‍ය ප්‍රකාශන විගණනය මත වාර්තාව[27]

**මතය**

ABC සමාගමේ (සමාගම) 20×1 දෙසැම්බර් මස 31 දිනට වූ මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එම දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය සහ ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශනය සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තීන් ඇතුළත්ව මූල්‍ය ප්‍රකාශනවල සටහන්වලින් සමන්විත මූල්‍ය ප්‍රකාශන අප විසින් විගණනය කරන ලදී

ABC සමාගමේ 20x1 දෙසැම්බර් 31 දිනට සමාගමේ මූල්‍ය තත්ත්වය සහ එම දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා වූ එහි මූල්‍ය කාර්යසාධනය සහ එහි මුදල් ප්‍රවාහ ප්‍රකාශනය ශ්‍රී ලංකා ගිණුම් ප්‍රමිත අනුව පිළියෙළ කර ඇත. මේ සමඟ ඇති මූල්‍ය ප්‍රකාශන සියලුම ප්‍රමාණාත්මක අංගයන්ගෙන් සාධාරණව බව (හෝ සත්‍ය හා සාධාරණ දර්ශනයක් පෙන්නුම් කරන) ඉදිරිපත් කර ඇති බව අපගේ මතය වේ.

**මතය සඳහා පදනම**

අප, ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුව අපගේ විගණනය මෙහෙයවන ලදී. එම ප්‍රමිතීන් යටතේ අපගේ වගකීම් අපගේ වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන *විගණනය සඳහා විගණකගේ වගකීම් කොටස* යටතේ තවදුරටත් විස්තර කරනු ලැබේ. ශ්‍රී. ලංකා වරලත් ගණකාධිකරණ ආයතනය විසින් නිකුත් කළ ආචාරධර්ම සංග්‍රහයට (CA ශ්‍රී. ලංකා සංග්‍රහය) අනුව අප සමාගමෙන් ස්වාධීන වන අතර අප එම අවශ්‍යතාවයන්ට අනුව අපගේ අනෙකුත් ආචාරධර්ම වගකීම් ඉෂ්ට කර ඇත්තෙමු. අපගේ මතය සඳහා පදනමක් ලබාදීමට අප ප්‍රමාණවත් සහ යෝග්‍ය සාක්ෂි ලබා ගත් බව අපගේ විශ්වාසයයි.

**ප්‍රධාන විගණන කරුණු**

ප්‍රධාන විගණන කරුණු වනුයේ ප්‍රවර්තන කාලපරිච්ඡේදයේ මූල්‍ය ප්‍රකාශවල විගණනයේදී අපගේ වෘත්තිය *විනිශ්චය අනුව වඩාත් වැදගත් වූ* කරුණු වේ. මූල්‍ය ප්‍රකාශ සමස්තයක් ලෙස ගත්කළ විගණනය සම්බන්ධයෙන් සහ ඒ මත අපගේ මතය සකස් කිරීමේදී මෙම කරුණු අප ආමන්ත්‍රණය කර ඇති අතර මෙම කරුණු මත වෙනම ම මතයක් අප ලබා නොදෙයි.

[ශ්‍රී.ලං.වි.ප්‍ර. 701 අනුව එක් එක් ප්‍රධාන විගණන කරුණේ විස්තරය.]

**වෙනත් තොරතුරු [හෝ ''මූල්‍ය ප්‍රකාශන සහ ඒ මත විගණකගේ වාර්තාව මත හැර වෙනත් තොරතුරු'' වැනි දෑ යෝග්‍ය නම් වෙනත් ශීර්ෂයක්]**

වෙනත් තොරතුරු සඳහා කළමනාකරණය[28] වග කිව යුතු වේ. වෙනත් තොරතුරු සමන්විත X වාර්තාව[29] [තොරතුරු නමුත් මූල්‍ය ප්‍රකාශන සහ ඒ මත අපගේ විගණකගේ වාර්තාව ඇතුළත් නොවේ.] *විගණකගේ* වාර්තාවේ දිනයට පෙර අප ලබාගත් අතර එම දිනයට පසු Y වාර්තාව අපට ලබාදීමට නියමිත වේ. මූල්‍ය ප්‍රකාශ මත අපගේ මතයේ වෙනත් තොරතුරු ආවරණය නොවන අතර අප ඒ මත කිසිම ආකාරයක සහතික වීමේ තීරණයක් ප්‍රකාශ නොකරයි.

මූල්‍ය ප්‍රකාශනවල අපගේ විගණනය සම්බන්ධයෙන්, අපගේ *වගකීමට* වෙනත් තොරතුරු කියවන අතර එසේ කිරීමේදී වෙනත් තොරතුරු, මූල්‍ය ප්‍රකාශන සමග සහ විගණනයේදී ලබා ගත් දැනුම එසේ නැත්නම් ප්‍රමාණාත්මක අසංගතදැයි එසේනැත්නම් ප්‍රමාණාත්මකව අවප්‍රකාශ වී ඇති බව පෙන්නුම් කරන්නේදැයි සලකා බැලීමයි. මෙම

---

[27] "මූල්‍ය ප්‍රකාශන මත විගණනයේ වාර්තාව යන උපශීර්ෂය", "වෙනත් නෛතික සහ නියාමන අවශ්‍යතා මත වාර්තාව" යන උපශීර්ෂය යෝග්‍ය නොවන අවස්ථාවලදී අවශ්‍ය නොවේ..

[28] හෝ විශේෂ අධිකරණ බල ප්‍රදේශයන් තුළ නෛතික ආකෘතිමය රාමුව සම්බන්ධයෙන් යෝග්‍ය පරිදි වෙනත්

[29] වෙනත් තොරතුරුවල වඩා සුවිශේෂ විස්තරයක්, එනම් "කළමනාකරණයේ වාර්තාව සහ සභාපතිතුමාගේ ප්‍රකාශයක්," වෙනත් තොරතුරු හඳුනා ගැනීමට භාවිතා කළ හැකිය.

විගණකගේ වාර්තාවේ දිනයට පෙර අප ලබාගෙන ඇති වෙනත් තොරතුරුවල ප්‍රමණාත්මක අවප්‍රකාශයන් තිබෙන බව අප තීරණය කරන්නේ නම් එම කරුණ වාර්තා කිරීමට අපට අවශ්‍ය කරනු ලැබේ. මේ සම්බන්ධයෙන් වාර්තා කිරීමට අපට කිසිවක් නොමැත.

[අප Y වාර්තාව කියවන විට ඒ මත ප්‍රමණාත්මක අවප්‍රකාශයක් තිබෙන බව අප තීරණය කරන්නේ නම් එම කරුණ පාලනය පිළිබඳ වගකිවයුතු අය සමග සන්නිවේදනය කිරීම අවශ්‍ය වේ. [අධිකරණ බල ප්‍රදේශයේ යෝග්‍ය ක්‍රියාමාර්ග විස්තර කිරීම.]][30]

**මූල්‍ය ප්‍රකාශන සඳහා කළමනාකරණය සහ පිළිබඳ වගකිවයුතු අය සමග සන්නිවේදනය**[31]
[ශ්‍රී.ලං.වි.ප්‍ර. 700 (සංශෝධිත) අනුව *වාර්තාකරණය* –ශ්‍රී.ලං.වි.ප්‍ර. 700 (සංශෝධිත) හි 1 වැනි නිදර්ශනය බලන්න.]

**මූල්‍ය ප්‍රකාශන විගණනය සඳහා විගණකගේ වගකීම්**

[ශ්‍රී.ලං.වි.ප්‍ර. 700 (සංශෝධිත) අනුව *වාර්තාකරණය* –ශ්‍රී.ලං.වි.ප්‍ර. 700 (සංශෝධිත) හි 1 වැනි නිදර්ශනය බලන්න.]

**වෙනත් නෛතික සහ නියාමන අවශ්‍යතා මත වාර්තාව**
[ශ්‍රී.ලං.වි.ප්‍ර. 700 (සංශෝධිත) අනුව *වාර්තාකරණය* –ශ්‍රී.ලං.වි.ප්‍ර. 700 (සංශෝධිත) හි 1 වැනි නිදර්ශනය බලන්න.]

මෙම ස්වාධීන විගණන වාර්තාව සඳහා වගකිව යුතු කාර්යයභාරයේ නියුතු හවුල්කරුගේ ශ්‍රී ලංකා වරලත් ගණකාධිකරණ ආයතනයේ සමාජික අංකය වන්නේ [සමාජික අංකය][32].

[විගණන සමාගම නමින් අත්සන] *[විගණන සමාගමේ ලිපිනය]*

[*දිනය*]

**3 වැනි නිදර්ශනය : විගණකගේ වාර්තාවේ දිනයට පෙර වෙනත් තොරතුරුවල කොටසක් විගණක ලබාගෙන තිබෙන විට වෙනත් තොරතුරුවල ප්‍රමාණාත්මක අවප්‍රකාශයක් හඳුනා ගෙන නොතිබෙන විට සහ විගණකගේ වාර්තාවේ දිනයට පසු වෙනත් තොරතුරු ලබා ගැනීමට අපේක්ෂා කරන විකරණය නොකළ මතයකින් සමන්විත ලැයිස්තුගත අස්තිත්වයක් නොවන අස්තිත්වයක විගණකගේ වාර්තාව**

**මෙම නිදර්ශනාත්මක විගණකගේ වාර්තාවේ අරමුණ සඳහා පහත සඳහන් තත්ත්වයන් උපකල්පනය කෙරේ:**

- **ඉදිරිපත් කිරීමේ ආකෘතිමය රාමුවක් භාවිතා කරමින් ලැයිස්තුගත අස්තිත්වයක් නොවන අස්තිත්වයක් සඳහා වූ සම්පූර්ණ මූල්‍ය ප්‍රකාශන කට්ටලයක් විගණනය කිරීම. විගණනය සමූහ විගණනය නොවේ. (එනම්, ශ්‍රී.ල.වි.ප්‍ර. 600 ව්‍යවහාර නොවේ).**
- **ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත (පොදු අරමුණු සඳහා වූ ආකෘතිමය රාමුවක්) ප්‍රකාර අස්තිත්වයේ කළමනාකාරිත්වය විසින් මූල්‍ය ප්‍රකාශන පිළියෙල කරයි.**
- **ශ්‍රී.ල.වි.ප්‍ර. 210 තුළ වන මූල්‍ය ප්‍රකාශ සඳහා කළමනාකාරිත්වයේ වගකීම්හි විස්තරයේ විගණනයේ කාර්යභාරයේ කොන්දේසි පිළිබිඹු වේ.**
- **ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව තීරණය කළ විගණක විකරණය නොකළ (එනම්., "පිරිසිදු") මතයක් යෝග්‍ය වේ.**
- **විගණනයට ව්‍යවහාර කරන අදාළ ආචාර ධර්ම අවශ්‍යතා අඩංගු ඇත්තේ ශ්‍රී ලංකා වරලත් ගණකාධිකරණ ආයතනය විසින් නිකුත් කළ ආචාර ධර්ම සංග්‍රහයේය.**

---

30 විගණකගේ වාර්තාවේ දිනයට පසු විගණක ලබාගෙන තිබෙන වෙනත් තොරතුරුවල නිවැරදි නොකළ ප්‍රමණාත්මක අවප්‍රකාශයක් තිබෙන බව හඳුනාගෙන තිබෙන විට සහ ප්‍රතිචාර ලෙස විශේෂ ක්‍රියාමාර්ග ගැනීමට නෛතික බැඳීමක් තිබෙන විට මෙම අමතර ඡේදය උදව් විය හැකිය.

31 හෝ විශේෂ අධිකරණ බල ප්‍රදේශයන් තුළ නෛතික ආකෘතිමය රාමුව සම්බන්ධයෙන් යෝග්‍ය පරිදි වෙනත් පද

32 කාර්යයභාරයේ නියුතු හවුල්කරුගේ ශ්‍රී ලංකා වරලත් ගණකාධිකරණ ආයතනයේ සමාජික අංකය, ඉතා කලාතරකින් වන අවස්ථාවකදී එවැනි හෙළිදරව්කිරීම සැලකිය යුතු අන්දමේ පෞද්ගලික ආරක්ෂාවට තර්ජනයකට යොමුකිරීම සාධරණ ලෙස බලාපොරොත්තු වීම හැර ලැයිස්තුගත අස්තිත්වයන්හි පොදු අරමුණු සඳහා වූ සම්පූර්ණ මූල්‍ය ප්‍රකාශන කට්ටලයක් විගණනය සඳහා විගණකගේ වාර්තාවේ ඇතුළත් කෙරේ. (SLAuS 700 (සංශෝධිත), 46 ඡේදය බලන්න.

- **ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව, ශ්‍රී.ලං.වි.ප්‍ර. 570 (සංශෝධිත) අනුව අඛණ්ඩ පැවැත්ම ලෙස නොකඩවා පවත්වාගෙන යාමට අස්තිත්වයේ හැකියාව පිළිබඳ සැලකිය යුතු අන්දමේ සැකයක් පහළ කළ හැකි සිද්ධි හෝ තත්වයන් සම්බන්ධයෙන් ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් නොපවතින බව විගණක තීරණය කර ඇත.**
- **ශ්‍රී.ලං.වි.ප්‍ර. 701 අනුව ප්‍රධාන විගණන කරුණු සන්නිවේදනය කිරීමට විගණකට අවශ්‍ය නොවන මෙන්ම අන් අයුරකින් එසේ කිරීමට තීරණය කර නොමැත.**
- **විගණකගේ වාර්තාවේ දිනයට පෙර වෙනත් තොරතුරු කොටසක් විගණක විසින් ලබාගෙන තිබීම සහ වෙනත් තොරතුරුවල ප්‍රමාණාත්මක අවප්‍රකාශයක් හඳුනාගෙන නොතිබීම සහ විගණකගේ වාර්තාවේ දිනයට පසු වෙනත් තොරතුරු විගණකට ලබාගැනීමට අපේක්ෂා කෙරේ.**
- **මූල්‍ය ප්‍රකාශ අධීක්ෂණය කිරීමට වග කිවයුතු පුද්ගලයන් ඒවා පිළියෙළ කරන පුද්ගලයන්ගෙන් වෙනස් වේ.**
- **නීතිය හෝ රෙගුලාසි යටතේ වෙනත් වාර්තාකරණ වගකීම් විගණකට නැත.**

## ස්වාධීන විගණකගේ වාර්තාව

ABC සමාගමේ කොටස්හිමියන්ට [හෝ වෙනත් යෝග්‍ය ආමන්ත්‍රණය කරන්නා]

**මතය**

ABC සමාගමේ (සමාගම) 20×1 දෙසැම්බර් මස 31 දිනට වූ මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එම දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා විස්තීරණ ආදායම් ප්‍රකාශනය සහ ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශනය සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තීන් ඇතුළත්ව මූල්‍ය ප්‍රකාශනවල සටහන්වලින් සමන්විත මූල්‍ය ප්‍රකාශන අප විසින් විගණනය කරන ලදී.

20x1 දෙසැම්බර් 31 දිනට සමාගමේ මූල්‍ය තත්ත්වය සහ එම දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා වූ එහි මූල්‍ය කාර්යසාධනය සහ එහි මුදල් ප්‍රවාහ ප්‍රකාශනය ශ්‍රී ලංකා ගිණුම් ප්‍රමිත අනුව පිළියෙල කර ඇත. මේ සමඟ ඇති මූල්‍ය ප්‍රකාශන සියලුම ප්‍රමාණාත්මක අංගයන්ගෙන් සාධාරණව (හෝ සත්‍ය හා සාධාරණ දර්ශනයක් පෙන්නුම් කරන බව ) ඉදිරිපත් කර ඇති බව අපගේ මතය වේ.

**මතය සඳහා පදනම**

අප ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුව අපගේ විගණනය මෙහෙයවන ලදී. එම ප්‍රමිතීන් යටතේ අපගේ වගකීම් අපගේ වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන *විගණනය සඳහා විගණකගේ වගකීම් කොටස* යටතේ තවදුරටත් විස්තර කරනු ලැබේ. ශ්‍රී ලංකා වරලත් ගණකාධිකරණ ආයතනය විසින් නිකුත් කළ ආචාරධර්ම සංග්‍රහයට (CA ශ්‍රී ලංකා සංග්‍රහය) අනුව අප සමාගමෙන් ස්වාධීන වන අතර අප එම අවශ්‍යතාවයන්ට අනුව අපගේ අනෙකුත් ආචාරධර්ම වගකීම් ඉෂ්ට කර ඇත්තෙමු. අපගේ මතය සඳහා පදනමක් ලබාදීමට අප ප්‍රමාණවත් සහ යෝග්‍ය සාක්ෂි ලබා ගත් බව අපගේ විශ්වාසයයි.

**වෙනත් තොරතුරු [හෝ 'මූල්‍ය ප්‍රකාශන සහ ඒ මත විගණකගේ වාර්තාව මත වෙනත් තොරතුරු' වැනි දෑ යෝග්‍ය නම් වෙනත් ශීර්ෂයක්]**

වෙනත් තොරතුරු සඳහා කළමනාකරණය[33] වග කිවයුතු වේ. විගණකගේ වාර්තාවේ දිනයට ලබාගත් වෙනත් තොරතුරු වනුයේ [X වාර්තාව[34] තුළ තොරතුරු ඇතුළත් කළ නමුත් මූල්‍ය ප්‍රකාශන සහ ඒ මත අපගේ විගණකගේ වාර්තාවේ ඇතුළත් නොවේ.]

මූල්‍ය ප්‍රකාශන මත අපගේ මතයේ වෙනත් තොරතුරු ආවරණය නොවන අතර අප ඒ මත කිසිම ආකාරයක සහතික වීමේ තීරණයක් ප්‍රකාශ නොකරයි.

මූල්‍ය ප්‍රකාශනවල අපගේ විගණනය සම්බන්ධයෙන්, අපගේ *වගකීම, වනුයේ* වෙනත් තොරතුරු කියවීම වන අතර

33 හෝ විශේෂ අධිකරණ බල ප්‍රදේශයන් තුළ නෛතික ආකෘතිමය රාමුව සම්බන්ධයෙන් යෝග්‍ය පරිදි වෙනත් පද

34 වෙනත් තොරතුරුවල වඩාත් විශේෂ විස්තරයක්, එනම් "කළමනාකරණයේ වාර්තාව සහ සභාපතිතුමාගේ ප්‍රකාශයක්," වෙනත් තොරතුරු හඳුනා ගැනීමට භාවිතා කළ හැකිය.

එසේ කිරිමේදී වෙනත් තොරතුරු, මූල්‍ය ප්‍රකාශ සමග හෝ විගණනයේ දී ලබා ගත් දැනුම සමඟ ප්‍රමාණාත්මක ලෙස අසංගත දැයි හෝ එසේ නැත්නම් ප්‍රමණාත්මක ලෙස අවප්‍රකාශ වී ඇති බව පෙන්නුම් කරන්නේදැයි සලකා බැලීමයි.

මෙම විගණකගේ වාර්තාවේ දිනයට පෙර අප ලබා ගත් වෙනත් තොරතුරු මත අප ඉටුකළ වැඩ මත පදනම්ව මෙම වෙනත් තොරතුරුවල ප්‍රමණාත්මක අවප්‍රකාශයක් තිබෙන බව අප තීරණය කරන්නේ නම් එම කරුණ වාර්තා කිරීමට අපට අවශ්‍ය කෙරේ. මේ සම්බන්ධයෙන් වාර්තා කිරීමට අපට කිසිවක් නැත.

**මූල්‍ය ප්‍රකාශන සඳහා කළමනාකරණය සහ පාලනය පිළිබඳ වගකිව යුතු අය සමග සන්නිවේදනය**[35]

[ශ්‍රී.ලං.වි.ප්‍ර. 700 (සංශෝධිත) අනුව *වාර්තාකරණය* –ශ්‍රී.ලං.වි.ප්‍ර. 700 (සංශෝධිත) හි 1 වැනි නිදර්ශනය බලන්න.]

**මූල්‍ය ප්‍රකාශන විගණනය සඳහා විගණකගේ වගකීම්**

[ශ්‍රී.ලං.වි.ප්‍ර. 700 (සංශෝධිත) අනුව *වාර්තාකරණය* –ශ්‍රී.ලං.වි.ප්‍ර. 700 (සංශෝධිත) හි 1 වැනි නිදර්ශනය බලන්න.]

[විගණන සමාගම නමින් අත්සන] [විගණන සමාගමේ ලිපිනය]

[*දිනය*]

**4 වැනි නිදර්ශනය : විගණකගේ වාර්තාවේ දිනයට පෙර වෙනත් තොරතුරු විගණක ලබාගෙන නොතිබෙන විට නමුත් විගණකගේ වාර්තාවේ දිනයට පසු වෙනත් තොරතුරු ලබා ගැනීමට අපේක්ෂා කරන විකරණය නොකළ මතයකින් සමන්විත ලැයිස්තුගත අස්තිත්වයක විගණකගේ වාර්තාව**

**මෙම නිදර්ශනාත්මක විගණකගේ වාර්තාවේ අරමුණ සඳහා පහත සඳහන් තත්ත්වයන් උපකල්පනය කෙරේ:**

- **ඉදිරිපත් කිරීමේ ආකෘතිමය රාමුවක් භාවිතා කරමින් ලැයිස්තුගත අස්තිත්වයක් නොවන අස්තිත්වයක් සඳහා වූ සම්පූර්ණ මූල්‍ය ප්‍රකාශන කට්ටලයක් විගණනය කිරීම. විගණනය සමූහ විගණනය නොවේ. (එනම්., ශ්‍රී.ල.වි.ප්‍ර. 600 ව්‍යවහාර නොවේ) .**
- **ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත (පොදු අරමුණු සඳහා වූ ආකෘතිමය රාමුවක්) ප්‍රකාර අස්තිත්වයේ කළමනාකාරිත්වය විසින් මූල්‍ය ප්‍රකාශන පිළියෙල කරයි.**
- **ශ්‍රී.ල.වි.ප්‍ර. 210 හි මූල්‍ය ප්‍රකාශන සඳහා කළමනාකාරිත්වයේ වගකීම් විස්තරයේ විගණකගේ කාර්යභාරයේ කොන්දේසි පිළිබිඹු වේ.**
- **ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව තීරණය කළ විකරණය නොකළ(එනම්., "පිරිසිදු") විගණක මතයක් යෝග්‍ය වේ.**
- **විගණනයට ව්‍යවහාර කරන අදාළ ආචාර ධර්ම අවශ්‍යතා අඩංගු ඇත්තේ ශ්‍රී ලංකා වරලත් ගණකාධිකරණ ආයතනය විසින් නිකුත් කළ ආචාර ධර්ම සංග්‍රහයේය**
- **ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව, ශ්‍රී.ලං.වි.ප්‍ර. 570 (සංශෝධිත) අනුව අඛණ්ඩ පැවැත්ම ලෙස නොකඩවා පවත්වාගෙන යාමට අස්තිත්වයේ හැකියාව පිළිබඳ සැලකිය යුතු අන්දමේ සැකයක් පැන නැගිය හැකි සිද්ධි හෝ තත්වයන් සම්බන්ධයෙන් ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් නොපවතින බව විගණක තීරණය කර ඇත .**
- **ශ්‍රී.ලං.වි.ප්‍ර. 701 අනුව ප්‍රධාන විගණන කරුණු සන්නිවේදනය කර ඇත.**
- **විගණකගේ වාර්තාවේ දිනයට පෙර වෙනත් තොරතුරු කොටසක් විගණක විසින් ලබාගෙන නොතිබෙන නමුත් විගණකගේ වාර්තාවේ දිනයට පසු වෙනත් තොරතුරු ලබාගැනීමට විගණක අපේක්ෂා කෙරේ.**
- **මූල්‍ය ප්‍රකාශන අධීක්ෂණය කිරීමට වග කියන පුද්ගලයන් මූල්‍ය ප්‍රකාශන පිළියෙළ කරන පුද්ගලයන්ගෙන් වෙනස් වේ.**
- **මූල්‍ය ප්‍රකාශන විගණනයට අමතරව, විගණකට දේශීය නීතිය යටතේ වෙනත් වාර්තාකරණ වගකීම් ඇත.**

[35] හෝ විශේෂ අධිකරණ බල ප්‍රදේශයන් තුළ නෛතික ආකෘතිමය රාමුව සම්බන්ධයෙන් යෝග්‍ය පරිදි වෙනත් පද

## ස්වාධීන විගණකගේ වාර්තාව

ABC සමාගමේ කොටස්හිමියන්ට [හෝ වෙනත් යෝග්‍ය ආමන්ත්‍රණය කරන්න]

### මූල්‍ය ප්‍රකාශන විගණනය මත වාර්තාව[36]

**මතය**

ABC සමාගමේ (සමාගම) 20×1 දෙසැම්බර් මස 31 දිනට වූ මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එම දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා විස්තීරණ ආදායම් ප්‍රකාශනය සහ ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශනය සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තීන් ඇතුළත්ව මූල්‍ය ප්‍රකාශනවල සටහන්වලින් සමන්විත මූල්‍ය ප්‍රකාශන අප විසින් විගණනය කරන ලදී.

20x1 දෙසැම්බර් 31 දිනට සමාගමේ මූල්‍ය තත්ත්වය සහ එම දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා වූ එහි මූල්‍ය කාර්යසාධනය සහ එහි මුදල් ප්‍රවාහ ප්‍රකාශනය ශ්‍රී ලංකා ගිණුම් ප්‍රමිත අනුව පිළියෙල කර ඇත. මේ සමඟ ඇති මූල්‍ය ප්‍රකාශන සියලුම ප්‍රමාණාත්මක අංගයන්ගෙන් සාධාරණව (හෝ සත්‍ය හා සාධාරණ දර්ශනයක් පෙන්නුම් කරන බව ) ඉදිරිපත් කර ඇති බව අපගේ මතය වේ.

**මතය සඳහා පදනම**

අප, ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුව අපගේ විගණනය මෙහෙයවන ලදී. එම ප්‍රමිතීන් යටතේ අපගේ වගකීම් අපගේ වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන *විගණනය සඳහා විගණකගේ වගකීම් කොටස* යටතේ තවදුරටත් විස්තර කරනු ලැබේ. ශ්‍රී. ලංකා වරලත් ගණකාධිකරණ ආයතනය විසින් නිකුත් කළ ආචාරධර්ම සංග්‍රහයට (CA ශ්‍රී. ලංකා සංග්‍රහය) අනුව අප සමාගමෙන් ස්වාධීන වන අතර අප එම අවශ්‍යතාවයන්ට අනුව අපගේ අනෙකුත් ආචාරධර්ම වගකීම් ඉෂ්ට කර ඇත්තෙමු. අපගේ මතය සඳහා පදනමක් ලබාදීමට අප ප්‍රමාණවත් සහ යෝග්‍ය සාක්ෂි ලබා ගත් බව අපගේ විශ්වාසයයි.

**ප්‍රධාන විගණන කරුණු**

ප්‍රධාන විගණන කරුණු වනුයේ ප්‍රවර්තන කාලපරිච්ඡේදයේ මූල්‍ය ප්‍රකාශවල විගණනයේදී අපගේ වෘත්තිය *විනිශ්චය අනුව වඩාත් වැදගත් වූ* කරුණු වේ. මූල්‍ය ප්‍රකාශ සමස්තයක් ලෙස ගත්කළ විගණනය සම්බන්ධයෙන් සහ ඒ මත අපගේ මතය සකස් කිරීමේදී මෙම කරුණු අප ආමන්ත්‍රණය කර ඇති අතර මෙම කරුණු මත වෙනම ම මතයක් අප ලබා නොදෙයි.

[ශ්‍රී.ලං.වි.ප්‍ර 701 අනුව එක් එක් ප්‍රධාන විගණන කරුණේ විස්තරය.]

**වෙනත් තොරතුරු [හෝ මූල්‍ය ප්‍රකාශන සහ ඒ මත විගණකගේ වාර්තාව හැර වෙනත් තොරතුරු වැනි දෑ යෝග්‍ය නම් වෙනත් ශීර්ෂයක]**

වෙනත් තොරතුරු සඳහා කළමනාකරණය[37] වග කිවයුතු වේ. වෙනත් තොරතුරු [X වාර්තාව[38] තුළ තොරතුරු ඇතුළත් කළ නමුත් මූල්‍ය ප්‍රකාශන සහ ඒ මත විගණකගේ වාර්තාවේ ඇතුළත් නොවේ.] X වාර්තාව විගණකගේ වාර්තාවේ දිනයට පසු අපට ලබාදීමට අපේක්ෂිතයි.

මූල්‍ය ප්‍රකාශන මත අපගේ මතයේ වෙනත් තොරතුරු ආවරණය නොවන අතර අප ඒ මත කිසිම ආකාරයක සහතික වීම් තීරණයක් ප්‍රකාශ නොකරයි.

මූල්‍ය ප්‍රකාශනවල අපගේ විගණනය සම්බන්ධයෙන්, අපගේ *වගකීම වනුයේ ඉහත හඳුනාගත්* වෙනත් තොරතුරු ඒවා ලබාගැනීමට ඇතිවිට කියවීම වන අතර එසේ කිරීමේදී වෙනත් තොරතුරු, මූල්‍ය ප්‍රකාශ සමග හෝ විගණනයේදී ලබා ගත් දැනුම සමඟ ප්‍රමාණාත්මක අසංගත දැයි හෝ එසේ නැත්නම් ප්‍රමණාත්මක අවප්‍රකාශ වී ඇති බව පෙන්නුම් කරන්නේදැයි සලකා බැලීමයි.

---

36 "මූල්‍ය ප්‍රකාශන මත විගණනයේ වාර්තාව යන උපශීර්ෂය", "වෙනත් නෛතික සහ නියාමන අවශ්‍යතා මත වාර්තාව" යන උපශීර්ෂය යෝග්‍ය නොවන අවස්ථාවලදී අවශ්‍ය නොවේ.

37 හෝ විශේෂ අධිකරණ බල ප්‍රදේශයන් තුළ නෛතික ආකෘතිමය රාමුව සම්බන්ධයෙන් යෝග්‍ය පරිදි වෙනත් පද

38 වෙනත් තොරතුරුවල වඩා සුවිශේෂ විස්තරයක්, එනම් "කළමනාකරණයේ වාර්තාව සහ සභාපතිතුමාගේ ප්‍රකාශයක්," වෙනත් තොරතුරු හඳුනා ගැනීමට භාවිතා කළ හැකිය.

[X වාර්තාව අප කියවන විට ඒ මත ප්‍රමාණාත්මක අවප්‍රකාශයක් තිබෙන බව අප තීරණය කරන්නේ නම් එම කරුණ කළමනාකරණය සහ පාලනය පිළිබඳ වගකිව යුතු අය සමඟ සන්නිවේදනය කිරීම අවශ්‍ය වේ. [අධිකරණ බල ප්‍රදේශයේ යෝග්‍ය ක්‍රියාමාර්ග විස්තර කිරීම.]][39]

**මූල්‍ය ප්‍රකාශන සඳහා කළමනාකරණය සහ පාලනය පිළිබඳ වගකිව යුතු අය සමඟ සන්නිවේදනය[40]**

[*ශ්‍රී.ලං.වි.ප්‍ර. 700 (සංශෝධිත) අනුව වාර්තාකරණය* –ශ්‍රී.ලං.වි.ප්‍ර. 700 (සංශෝධිත) හි 1 වැනි නිදර්ශනය බලන්න.]

**මූල්‍ය ප්‍රකාශන විගණනය සඳහා විගණකගේ වගකීම්**

[*ශ්‍රී.ලං.වි.ප්‍ර. 700 (සංශෝධිත) අනුව වාර්තාකරණය –ශ්‍රී.ලං.වි.ප්‍ර. 700 (සංශෝධිත) හි 1 වැනි නිදර්ශනය බලන්න.*]

**වෙනත් නෛතික සහ නියාමන අවශ්‍යතා මත වාර්තාව**

*[ශ්‍රී.ලං.වි.ප්‍ර. 700 (සංශෝධිත) අනුව වාර්තාකරණය –ශ්‍රී.ලං.වි.ප්‍ර. 700 (සංශෝධිත) හි 1 වැනි නිදර්ශනය බලන්න.]*

මෙම ස්වාධීන විගණකගේ වාර්තාව සඳහා වගකිව යුතු කාර්යයේ නියුතු හවුල්කරුගේ ශ්‍රී ලංකා වරලත් ගණකාධිකරණ ආයතනයේ සමාජික අංකය වන්නේ [සමාජික අංකය].

[*විගණන සමාගම නමින් අත්සන*] [*විගණන සමාගමේ ලිපිනය*]

[*දිනය*]

**<u>5 වැනි නිදර්ශනය : විගණකගේ වාර්තාවේ දිනයට පෙර සියලුම වෙනත් තොරතුරු විගණක ලබාගෙන තිබෙන විට සහ වෙනත් තොරතුරුවල ප්‍රමාණාත්මක අවප්‍රකාශයක් තිබෙන බව තීරණය කරන විට විකරණය නොකළ විගණන මතයකින් සමන්විත ලැයිස්තුගත හෝ ලැයිස්තුගත නොවන ඕනෑම අස්තිත්වයක විගණකගේ වාර්තාව.</u>**

**මෙම නිදර්ශනාත්මක විගණකගේ වාර්තාවේ අරමුණ සඳහා පහත සඳහන් තත්ත්වයන් උපකල්පනය කෙරේ:**

- **ඉදිරිපත් කිරීමේ ආකෘතිමය රාමුවක් භාවිතා කරමින් ලැයිස්තුගත හෝ ලැයිස්තුගත නොවන ඕනෑම අස්තිත්වයක් සඳහා වූ සම්පූර්ණ මූල්‍ය ප්‍රකාශන කට්ටලයක් විගණනය කිරීම. විගණනය සමූහ විගණනය නොවේ. (එනම්., ශ්‍රී.ල.වි.ප්‍ර. 600 ව්‍යවහාර නොවේ) .**
- **ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත (පොදු අරමුණු සඳහා වූ ආකෘතිමය රාමුවක්) ප්‍රකාර අස්තිත්වයේ කළමනාකාරිත්වය විසින් මූල්‍ය ප්‍රකාශන පිළියෙල කරයි.**
- **ශ්‍රී.ල.වි.ප්‍ර. 210 හි මූල්‍ය ප්‍රකාශන සඳහා කළමනාකාරිත්වයේ වගකීම්හි විස්තරයේ විගණනයේ කාර්යභාරයේ කොන්දේසි පිළිබිඹු වේ.**
- **ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව විගණක තීරණය කළ විකරණය නොකළ (එනම්., "පිරිසිදු") මතය යෝග්‍ය වේ.**
- **විගණනයට ව්‍යවහාර කරන අදාළ ආචාර ධර්ම අවශ්‍යතා අඩංගු ඇත්තේ ශ්‍රී ලංකා වරලත් ගණකාධිකරණ ආයතනය විසින් නිකුත් කළ ආචාර ධර්ම සංග්‍රහයේය.**
- **ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව, ශ්‍රී.ලං.වි.ප්‍ර 570 (සංශෝධිත) අනුව අඛණ්ඩ පැවැත්ම ලෙස නොකඩවා පවත්වාගෙන යාමට අස්තිත්වයේ හැකියාව පිළිබඳ සැලකියයුතු අන්දමේ සැකයක් පැන නැගිය හැකි සිද්ධි හෝ තත්වයන් සම්බන්ධයෙන් ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් නොපවතින බව විගණක තීරණය කර ඇත.**
- **ශ්‍රී.ලං.වි.ප්‍ර 701 අනුව ප්‍රධාන විගණන කරුණු සන්නිවේදනය කර තිබීම.**
- **විගණකගේ වාර්තාවේ දිනයට පෙර සියලුම වෙනත් තොරතුරු විගණක විසින් ලබාගෙන තිබීම සහ වෙනත් තොරතුරුවල ප්‍රමාණාත්මක අවප්‍රකාශයක් පවතින බව තීරණය කර තිබීම .**

---

[39] විගණකගේ වාර්තාවේ දිනයට පසු විගණක ලබාගෙන තිබෙන වෙනත් තොරතුරුවල නිවරදි නොකළ ප්‍රමාණාත්මක අවප්‍රකාශයක් තිබෙන බව හඳුනා ගෙන තිබෙන විට සහ එයට ප්‍රතිචාර ලෙස විශේෂි ක්‍රියාමාර්ග ගැනීමට නෛතික බැඳීමක් තිබෙන විට මෙම අමතර ඡේදය උදව් විය හැකිය.

[40] හෝ විශේෂ අධිකරණ බල ප්‍රදේශයන් තුළ නෛතික ආකෘතිමය රාමුව සම්බන්ධයෙන් යෝග්‍ය පරිදි වෙනත් පද

- **මූල්‍ය ප්‍රකාශන අධීක්ෂණය කිරීමට වග කියන පුද්ගලයන් මූල්‍ය ප්‍රකාශන පිළියෙළ කරන පුද්ගලයන්ගෙන් වෙනස් වේ.**
- **නීතිය හෝ රෙගුලාසි යටතේ විගණකට වෙනත් වාර්තාකරණ වගකීම් පැවරී නැත.**

## ස්වාධීන විගණකගේ වාර්තාව

ABC සමාගමේ කොටස්හිමියන්ට [හෝ වෙනත් යෝග්‍ය ආමන්ත්‍රණය කරන්නා]

**මතය**

ABC සමාගමේ (සමාගම) 20×1 දෙසැම්බර් මස 31 දිනට වූ මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එම දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා විස්තීරණ ආදායම් ප්‍රකාශනය සහ ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශනය සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තීන් ඇතුලත්ව මූල්‍ය ප්‍රකාශනවල සටහන්වලින් සමන්විත මූල්‍ය ප්‍රකාශන අප විසින් විගණනය කරන ලදී

20X1 දෙසැම්බර් 31 දිනට සමාගමේ මූල්‍ය තත්ත්වය සහ එම දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා වූ එහි මූල්‍ය කාර්යසාධනය සහ එහි මුදල් ප්‍රවාහ ප්‍රකාශනය ශ්‍රී ලංකා ගිණුම් ප්‍රමිත අනුව පිළියෙල කර ඇත. මේ සමඟ ඇති මූල්‍ය ප්‍රකාශන සියලුම ප්‍රමාණාත්මක අංගයන්ගෙන් සාධාරණව (හෝ සත්‍ය හා සාධාරණ දර්ශනයක් පෙන්නුම් කරන බව ) ඉදිරිපත් කර ඇති බව අපගේ මතය වේ.

**මතය සඳහා පදනම**

අප,ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුව අපගේ විගණනය මෙහෙයවන ලදී. එම ප්‍රමිතීන් යටතේ අපගේ වගකීම් අපගේ වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන *විගණනය සඳහා විගණකගේ වගකීම් කොටස* යටතේ තවදුරටත් විස්තර කරනු ලැබේ. ශ්‍රී ලංකා වරලත් ගණකාධිකරණ ආයතනය විසින් නිකුත් කළ ආචාරධර්ම සංග්‍රහයට (CA ශ්‍රී. ලංකා සංග්‍රහය) අනුව අප සමාගමෙන් ස්වාධීන වන අතර අප එම අවශ්‍යතාවයන්ට අනුව අපගේ අනෙකුත් ආචාරධර්ම වගකීම් ඉෂ්ට කර ඇත්තෙමු. අපගේ මතය සඳහා පදනමක් ලබාදීමට අප ප්‍රමාණවත් සහ යෝග්‍ය සාක්ෂි ලබා ගත් බව අපගේ විශ්වාසයයි.

**වෙනත් තොරතුරු [හෝ 'මූල්‍ය ප්‍රකාශන සහ ඒ මත විගණකගේ වාර්තාව හැර වෙනත් තොරතුරු' වැනි දෑ යෝග්‍ය නම් වෙනත් ශීර්ෂයක]**

වෙනත් තොරතුරු සඳහා කළමනාකරණය[41] වග කිව යුතුය. වෙනත් තොරතුරු [X වාර්තාව[42] තුල තොරතුරු ඇතුලත් කළ නමුත් මූල්‍ය ප්‍රකාශන සහ ඒ මත විගණකගේ වාර්තාවේ ඇතුලත් නොවේ.]

මූල්‍ය ප්‍රකාශන මත අපගේ මතයේ වෙනත් තොරතුරු ආවරණය නොවන අතර අප ඒ මත කිසිම ආකාරයක සහතික වීමේ තීරණයක් ප්‍රකාශ නොකරයි.

මූල්‍ය ප්‍රකාශනවල අපගේ විගණනය සම්බන්ධයෙන්, අපගේ *වගකීම, වනුයේ* වෙනත් තොරතුරු කියවීම වන අතර එසේ කිරීමේදී වෙනත් තොරතුරු, මූල්‍ය ප්‍රකාශන සමග හෝ විගණනයේදී ලබා ගත් දැනුම සමඟ ප්‍රමාණාත්මක අසංගත දැයි හෝ එසේ නැත්නම් ප්‍රමාණාත්මක අවප්‍රකාශ වී ඇති බව පෙන්නුම් කරන්නේදැයි සලකා බැලීමයි.

අප විසින් ඉටුකළ වැඩ මත පදනම්ව මෙම වෙනත් තොරතුරුවල ප්‍රමාණාත්මක අවප්‍රකාශයක් පවතින බව තීරණය කරන්නේ නම් එම කරුණ වාර්තා කිරීමට අපට අවශ්‍ය කෙරේ. මේ සම්බන්ධයෙන් වෙනත් කිසිවක් අපි වාර්තා නොකර තිබේ. පහත විස්තර කළ පරිදි අපි වෙනත් තොරතුරුවල එවැනි ප්‍රමාණාත්මක අවප්‍රකාශයක් පවතින බව අප තීරණය කර තිබේ.

[*වෙනත් තොරතුරුවල ප්‍රමණාත්මක අවප්‍රකාශයන්හි විස්තරය*]

---

41 හෝ විශේෂ අධිකරණ බල ප්‍රදේශයන් තුල නෛතික ආකෘතිමය රාමුව සම්බන්ධයෙන් යෝග්‍ය පරිදි වෙනත් පද

42 වෙනත් තොරතුරුවල වඩාත් විශේෂ විස්තරයක්, එනම් "කළමනාකරණයේ වාර්තාව සහ සභාපතිතුමාගේ ප්‍රකාශයක්," වෙනත් තොරතුරු හඳුනා ගැනීමට භාවිතා කළ හැකිය.

**ප්‍රධාන විගණන කරුණු** [43]

ප්‍රධාන විගණන කරුණු වනුයේ ප්‍රවර්තන කාලපරිච්ජේදයේ මූල්‍ය ප්‍රකාශවල විගණනයේදී අපගේ වෘත්තිය *විනිශ්චය අනුව වඩාත් වැදගත් වූ* කරුණු වේ. මූල්‍ය ප්‍රකාශ සමස්තයක් ලෙස ගත්කළ විගණනය සම්බන්ධයෙන් සහ ඒ මත අපගේ මතය සකස් කිරීමේදී මෙම කරුණු අප ආමන්ත්‍රණය කර ඇති අතර මෙම කරුණු මත වෙනමම මතයක් අප ලබා නොදෙයි.

*[ශ්‍රී.ලං.වි.ප්‍ර 701 අනුව එක් එක් ප්‍රධාන විගණන කරුණේ විස්තරය.]*

**මූල්‍ය ප්‍රකාශ සඳහා කළමනාකරණය සහ පාලනය පිළිබඳ වගකිව යුතු අය සමඟ සන්නිවේදනය**[44]
*[ශ්‍රී.ලං.වි.ප්‍ර. 700 (සංශෝධිත) අනුව වාර්තාකරණය –ශ්‍රී.ලං.වි.ප්‍ර. 700 (සංශෝධිත) හි 1 වැනි නිදර්ශනය බලන්න.]*

**මූල්‍ය ප්‍රකාශන විගණනය සඳහා විගණකගේ වගකීම්**

[ශ්‍රී.ලං.වි.ප්‍ර. 700 (සංශෝධිත) අනුව වාර්තාකරණය –ශ්‍රී.ලං.වි.ප්‍ර. 700 (සංශෝධිත) හි 1 වැනි නිදර්ශනය බලන්න.]

මෙම ස්වාධීන විගණන වාර්තාව සඳහා වගකිව යුතු කාර්යය භාරයේ නියුතු හවුල්කරුගේ ශ්‍රී ලංකා වරලත් ගණකාධිකරණ ආයතනයේ සාමාජික අංකය වන්නේ [සාමාජික අංකය] [45].

*[විගණන සමාගම නමින් අත්සන] [විගණන සමාගමේ ලිපිනය]*

[දිනය]

<u>**6 වැනි නිදර්ශනය : විගණකගේ වාර්තාවේ දිනයට පෙර සියළුම වෙනත් තොරතුරු විගණක ලබාගෙන තිබෙන විට සහ වෙනත් තොරතුරුවලින් එසේම බලපාන ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන තුල ප්‍රමාණාත්මක අයිතමයක් සම්බන්ධයෙන් විෂයපථයේ සීමාවක් තිබෙන විට කොන්දේසි සහිත මතයකින් සමන්විත ලැයිස්තුගත හෝ ලැයිස්තුගත නොවන ඕනෑම අස්තිත්වයක විගණකගේ වාර්තාව.**</u>

**මෙම නිදර්ශනාත්මක විගණකගේ වාර්තාවේ අරමුණ සඳහා පහත සඳහන් තත්ත්වයන් උපකල්පනය කෙරේ:**

- **සාධාරණ ඉදිරිපත් කිරීමේ ආකෘතිමය රාමුවක් යටතේ ලැයිස්තුගත හෝ ලැයිස්තුගත නොවන යන ඕනෑම අස්තිත්වයක්__සඳහා වූ සම්පූර්ණ ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන කට්ටලයක් විගණනය කිරීම. විගණනය ,සමූහයේ විගණනයක් වේ. (එනම්., ශ්‍රී.ල.වි.ප්‍ර. 600 ව්‍යවහාර කෙරේ)**
- **ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත (පොදු අරමුණු සඳහා වූ ආකෘතිමය රාමුවක්) ප්‍රකාර අස්තිත්වයේ කළමනාකාරිත්වය විසින් ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කරයි.**
- **ශ්‍රී.ල.වි.ප්‍ර. 210 හි ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන සඳහා කළමනාකාරිත්වයේ වගකීම්හි විස්තරයේ විගණනයේ කාර්යභාරයේ කොන්දේසි පිළිබිඹු වේ.**
- **විදේශ අස්තිත්වයක ආයෝජනයක් සම්බන්ධයෙන් ප්‍රමාණාත්මක යෝග්‍ය විගණන සාක්ෂි විගණකට ලබා ගැනීමට නොහැකිවීම. ප්‍රමාණාත්මක යෝග්‍ය විගණන සාක්ෂි විගණකට ලබා ගැනීමට නොහැකිවීමේ වියහැකි බලපෑම් ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශනවලට ප්‍රමාණාත්මක වන නමුත් පෘතුල නොවේ. (එනම්., කොන්දේසි සහිත මතයක් යෝග්‍ය වේ).**
- **විගණනයට ව්‍යවහාර කරන අදාල ආචාර ධර්ම අවශ්‍යතා අඩංගු ඇත්තේ ශ්‍රී ලංකා වරලත් ගණකාධිකරණ ආයතනය විසින් නිකුත් කළ ආචාර ධර්ම සංග්‍රහයේය**
- **ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව, ශ්‍රී.ලං.වි.ප්‍ර 570 (සංශෝධිත) අනුව අඛණ්ඩ පැවැත්ම ලෙස නොකඩවා පවත්වාගෙන යාමට අස්තිත්වයේ හැකියාව පිළිබඳ සැලකියයුතු අන්දමේ සැකයක් පැන නැගිය හැකි සිද්ධි හෝ තත්වයන් සම්බන්ධයෙන් ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් නොපවතින බව විගණක තීරණය කිරීම.**

---

[43] ලැයිස්තුගත අස්තිත්වයන් සඳහා පමණක් ප්‍රධාන විගණන කරුණු කොටස අවශ්‍ය කෙරේ.

[44] හෝ විශේෂ අධිකරණ බල ප්‍රදේශයන් තුල නෛතික ආකෘතිමය රාමුව සම්බන්ධයෙන් යෝග්‍ය පරිදි වෙනත් පද

[45] කාර්යය භාරයේ නියුතු හවුල්කරුගේ ශ්‍රී ලංකා වරලත් ගණකාධිකරණ ආයතනයේ සාමාජික අංකය, ඉතා කලාතුරකින් වන අවස්ථාවකදී එවැනි හෙළිදරව්කිරීම සැලකියයුතු අන්දමේ පෞද්ගලික ආරක්ෂාවට තර්ජනයකට යොමුකිරීම සාධාරණ ලෙස බලාපොරොත්තු වීම හැර ලැයිස්තුගත අස්තිත්වයන්හි පොදු අරමුණු සඳහා වූ සම්පූර්ණ මූල්‍ය ප්‍රකාශන කට්ටලයක් විගණනය සඳහා විගණකගේ වාර්තාවේ ඇතුලත් කෙරේ. (SLAuS 700 (සංශෝධිත), 46 ඡේදය බලන්න

- **ශ්‍රී.ලං.වි.ප්‍ර 701 අනුව ප්‍රධාන විගණන කරුණු සන්නිවේදනය කර තිබීම.**
- **විගණකගේ වාර්තාවේ දිනයට පෙර සියළුම වෙනත් තොරතුරු විගණක විසින් ලබාගෙන තිබීම සහ ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන මත කොන්දේසි සහිත මතයට හට ගැනෙන කරුණුද වෙනත් තොරතුරුවල බලපානු ලැබේ.**
- **ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන අධීක්ෂණය කිරීමට වග කියන පුද්ගලයන් ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන පිළියෙළ කරන පුද්ගලයන්ගෙන් වෙනස් වේ.**
- **නීතිය හෝ රෙගුලාසි යටතේ විගණකට වෙනත් වාර්තාකරණ වගකීම් පැවරී නැත.**

## ස්වාධීන විගණකගේ වාර්තාව

ABC සමාගමේ කොටස්හිමියන්ට [හෝ වෙනත් යෝග්‍ය ආමන්ත්‍රණය කරන්නා]

### කොන්දේසි සහිත මතය

ABC සමාගමේ සහ එහි පරිපාලිතයන්ගේ (සමූහය) ඇති 20×1 දෙසැම්බර් මස 31 දිනට ඒකාබද්ධ මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එම දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා ඒකාබද්ධ විස්තීරණ ආදායම් ප්‍රකාශනය සහ ඒකාබද්ධ ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශනය සහ ඒකාබද්ධ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තීන් ඇතුලත්ව ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශනවල සටහන්වලින් සමන්විත ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන අප විසින් විගණනය කරන ලදී.

20x1 දෙසැම්බර් 31 දිනට සමූහයේ මූල්‍ය තත්ත්වය සහ එම දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා වූ එහි ඒකාබද්ධ මූල්‍ය කාර්යසාධනය සහ එහි ඒකාබද්ධ මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා ගිණුම් ප්‍රමිත අනුව පිළියෙල කර ඇත. අපගේ වාර්තාවේ කොන්දේසි සහිත මතය සඳහා පදනම වන කොටසේ විස්තර කර ඇති කරුණ මත විය හැකි බලපෑම හැරුණු කොට මේ සමග ඇති ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන සියලුම ප්‍රමාණාත්මක අංගයන්ගෙන් සාධාරණව (හෝ සත්‍ය හා සාධාරණ දර්ශනයක් පෙන්නුම් කරන බව ) ඉදිරිපත් කර ඇති බව අපගේ මතය වේ.

### කොන්දේසි සහිත මතයක් සඳහා වූ පදනම

වර්ෂය තුලදී අත් කරගත් විදේශීය ආශ්‍රිතයක් වන XYZ සමාගමේ කරන ලද සමූහයේ ආයෝජනය ස්කන්ධ ක්‍රමයට ගිණුම්ගත කර ඇති අතර එහි 20x1 දෙසැම්බර් 31 දින ඒකාබද්ධ මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ ××× අගයකට පවත්වාගෙන යන අතර XYZ හි වර්ෂයේ ශුද්ධ ආදායමේ ABC හි කොටස එම දිනෙන් අවසන් වර්ෂය සඳහා ABC හි ආදායම තුල ××× ඇතුලත් වේ. 20x1 දෙසැම්බර් 31 දින ABC සමාගම විසින් XYZ හි කරන ලද ආයෝජනයේ ධාරණ අගය සහ XYZ හි වර්ෂයේ ශුද්ධ ආදායමේ ABC හි කොටස පිළිබඳව යෝග්‍ය ප්‍රමාණවත් විගණන සාක්ෂි XYZ සමාගමේ මූල්‍ය තොරතුරුවලට, කළමනාකාරිත්වයට, විගණකවරුන්ට ප්‍රවේශවීමට අවස්ථාවක් අහිමි කිරීම නිසා අපහට ලබාගත නොහැකි විය. ඒ නිසාවෙන් මෙම වටිනාකම්වලට කිසියම් ගැලපුම් කිරීමක් අවශ්‍ය වේද යන්න අපහට නිර්ණය කිරීමට නොහැකි විය.

අප, ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුව අපගේ විගණනය මෙහෙයවන ලදී. එම ප්‍රමිතීන් යටතේ අපගේ වගකීම් අපගේ වාර්තාවේ *ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන මත විගණනය සඳහා විගණකගේ වගකීම්* කොටසේ තවදුරටත් විස්තර කරනු ලැබේ. ශ්‍රී ලංකා වරලත් ගණකාධිකරණ ආයතනය විසින් නිකුත් කළ ආචාරධර්ම සංග්‍රහයට (CA ශ්‍රී ලංකා සංග්‍රහය) අනුව අප සමාගමෙන් ස්වාධීන වන අතර අප එම අවශ්‍යතාවයන්ට අනුව අපගේ අනෙකුත් ආචාරධර්ම වගකීම් ඉෂ්ට කර ඇත්තෙමු. අප ලබාගත් විගණන සාක්ෂි කොන්දේසි සහිත මතයක් ප්‍රකාශ කිරීමට ප්‍රමාණවත් සහ යෝග්‍ය පදනමක් සපයන බව අපගේ විශ්වාසයයි.

**වෙනත් තොරතුරු [හෝ 'මූල්‍ය ප්‍රකාශන සහ ඒ මත විගණකගේ වාර්තාව හැර වෙනත් තොරතුරු' වැනි දෑ යෝග්‍ය නම් වෙනත් ශීර්ෂයක]**

වෙනත් තොරතුරු සඳහා කළමනාකරණය[46] වග කිව යුතුය.වෙනත් තොරතුරු සමන්විත වන්නේ [X වාර්තාව[47] තුල තොරතුරු ඇතුලත් කළ තොරතුරු නමුත් ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන සහ ඒ මත විගණකගේ වාර්තාව ඇතුලත් නොවේ.]

ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන මත අපගේ මතයේ වෙනත් තොරතුරු ආවරණය නොවන අතර අප ඒ මත කිසිම ආකාරයක සහතික වීමේ තීරණයක් ප්‍රකාශ නොකරයි.

මූල්‍ය ප්‍රකාශනවල අපගේ විගණනය සම්බන්ධයෙන්, අපගේ *වගකීම වනුයේ* වෙනත් තොරතුරු කියවීම වන අතර එසේ කිරීමේදී වෙනත් තොරතුරු, ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශ සමග හෝ විගණනයේදී ලබා ගත් දැනුම සමඟ ප්‍රමාණාත්මක අසංගත දැයි හෝ එසේ නැත්නම් ප්‍රමාණාත්මක අවප්‍රකාශ වී ඇති බව පෙන්නුම් කරන්නේදැයි සලකා බලයි.

අප විසින් ඉටුකළ වැඩ මත පදනම්ව මෙම වෙනත් තොරතුරුවල ප්‍රමාණාත්මක අවප්‍රකාශයක් පවතින බව තීරණය කරන්නේ නම් එම කරුණ වාර්තා කිරීමට අපට අවශ්‍ය කෙරේ. ඉහත විස්තර කළ *කොන්දේසි සහිත මතයක් සඳහා වූ පදනම කොටසේ* 20X1 දෙසැම්බර් 31 දිනට ABC සමාගම විසින් XYZ හි කරන ලද ආයෝජනයේ ධාරණ අගය සහ XYZ හි වර්ෂයේ ශුද්ධ ආදායමේ ABC හි කොටස පිළිබඳව යෝග්‍ය ප්‍රමාණවත් විගණන සාක්ෂි අපහට ලබාගත නොහැකි විය. ඒ අනුව මෙම කරුණ සම්බන්ධයෙන් වෙනත් තොරතුරු, ප්‍රමණාත්මක අවප්‍රකාශ තිබෙන්නේද නැද්ද යන්න අපහට තීරණය කිරීමට නොහැකි වන්නෙමු.

**ප්‍රධාන විගණන කරුණු [48]**

ප්‍රධාන විගණන කරුණු වනුයේ ප්‍රවර්තන කාලපරිච්ජේදයේ ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශනවල අපගේ විගණනයේදී *වෘත්තීය විනිශ්චය අනුව වඩා වැදගත් වූ* කරුණු වේ. ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන සමස්තයක් ලෙස ගත්කළ විගණනය සම්බන්ධයෙන් සහ ඒ මත වාර්තාව සකස් කිරීමේදී එම කරුණු ආමන්ත්‍රණය කර ඇති අතර මෙම කරුණු මත වෙනමම මතයක් අප ලබා නොදෙයි. *කොන්දේසි සහිත මතයක් සඳහා වූ පදනම* කොටසේ විස්තර කළ කරුණට අමතරව අපගේ වාර්තාවේ සන්නිවේදනය කළ යුතු පහත විස්තර කළ කරුණු ප්‍රධාන විගණන කරුණු වනබව අප නිර්ණය කරන්නෙමු.

*[ශ්‍රී.ලං.වි.ප්‍ර 701 අනුව එක් එක් ප්‍රධාන විගණන කරුණේ විස්තරය ]*

**මූල්‍ය ප්‍රකාශන සඳහා කළමනාකරණය සහ පාලනය පිළිබද වගකිව යුතු අය සමඟ සන්නිවේදනය[49]**

*[ශ්‍රී.ලං.වි.ප්‍ර. 700 (සංශෝධිත) අනුව වාර්තාකරණය–ශ්‍රී.ලං.වි.ප්‍ර. 700 (සංශෝධිත) හි 2 වැනි නිදර්ශනය බලන්න.]*

**මූල්‍ය ප්‍රකාශන විගණනය සඳහා විගණකගේ වගකීම්**

[ශ්‍රී.ලං.වි.ප්‍ර. 700 (සංශෝධිත) අනුව *වාර්තාකරණය*–ශ්‍රී.ලං.වි.ප්‍ර. 700 (සංශෝධිත) හි 2 වැනි නිදර්ශනය බලන්න.]

මෙම ස්වාධීන විගණගේ වාර්තාව සඳහා වගකිව යුතු කාර්යය භාරයේ නියුතු හවුල්කරුගේ ශ්‍රී ලංකා වරලත් ගණකාධිකරණ ආයතනයේ සාමාජික අංකය වන්නේ [සාමාජික අංකය]. [50]

*[විගණන සමාගම නමින් අත්සන] [විගණන සමාගමේ ලිපිනය]*

[දිනය]

46 හෝ විශේෂ අධිකරණ බල ප්‍රදේශයන් තුල නෛතික ආකෘතිමය රාමුව සම්බන්ධයෙන් යෝග්‍ය පරිදි වෙනත් පද

47 වෙනත් තොරතුරුවල වඩා සුවිශේෂ විස්තරයක්, එනම් "කළමනාකරණයේ වාර්තාව සහ සභාපතිතුමාගේ ප්‍රකාශයක්," වෙනත් තොරතුරු හඳුනා ගැනීමට භාවිතා කළ හැකිය.

48 ලැයිස්තුගත අස්තිත්වයන් සඳහා පමණක් ප්‍රධාන විගණන කරුණු කොටස අවශ්‍ය කෙරේ.

49 හෝ විශේෂ අධිකරණ බල ප්‍රදේශයන් තුල නෛතික ආකෘතිමය රාමුව සම්බන්ධයෙන් යෝග්‍ය පරිදි වෙනත් පද

50 කාර්යය භාරයේ නියුතු හවුල්කරුගේ ශ්‍රී ලංකා වරලත් ගණකාධිකරණ ආයතනයේ සාමාජික අංකය, ඉතා කලාතුරකින් වන අවස්ථාවකදී එවැනි හෙළිදරව්කිරීම සැලකියයුතු අන්දමේ පෞද්ගලික ආරක්ෂාවට තර්ජනයකට යොමුකිරීම සාධාරණ ලෙස බලාපොරොත්තු වීම හැර ලැයිස්තුගත අස්තිත්වයන්හි පොදු අරමුණු සඳහා වූ සම්පූර්ණ මූල්‍ය ප්‍රකාශන කට්ටලයක් විගණනය සඳහා විගණකගේ වාර්තාවේ ඇතුලත් කෙරේ. ( SLAuS 700 (සංශෝධිත), 46 ඡේදය බලන්න

**7 වැනි නිදර්ශනය: විගණක විගණකගේ වාර්තාවේ දිනයට පෙර සියළුම වෙනත් තොරතුරු විගණක ලබා ගෙන තිබෙන විට සහ වෙනත් තොරතුරුවලට බලපාන ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන මත අහිතකර මතයක් ඇති විට අහිතකර මතයකින් සමන්විත ලැයිස්තුගත හෝ ලැයිස්තුගත නොවන ඕනෑම අස්තිත්වයක විගණකගේ වාර්තාව.**

**මෙම නිදර්ශනාත්මක විගණකගේ වාර්තාවේ අරමුණ සඳහා පහත සඳහන් තත්ත්වයන් උපකල්පනය කෙරේ:**

- සාධාරණ ඉදිරිපත් කිරීමේ ආකෘතිමය රාමුවක් යටතේ ලැයිස්තුගත හෝ ලැයිස්තුගත නොවන යන ඕනෑම අස්තිත්වයක්__සඳහා වූ සම්පූර්ණ ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන කට්ටලයක් විගණනය කිරීම. විගණනය ,සමූහයේ විගණනයක් වේ. ( එනම්., ශ්‍රී.ල.වි.ප්‍ර. **600** ව්‍යවහාර කෙරේ)
- ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත (පොදු අරමුණු සඳහා වූ ආකෘතිමය රාමුවක්) ප්‍රකාර අස්තිත්වයේ කළමනාකාරිත්වය විසින් ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කරයි.
- ශ්‍රී.ල.වි.ප්‍ර. 210 හි ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන සඳහා කළමනාකාරිත්වයේ වගකීම්හි විස්තරයේ විගණනයේ කාර්යභාරයේ කොන්දේසි පිළිබිඹු වේ.
- පරිපාලිතයක් ඒකාබද්ධ නොකිරීම නිසා ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක ලෙස අවප්‍රකාශනය වී ඇත ප්‍රමාණාත්මක අවප්‍රකාශනය ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන වලට සැලකිය යුතු තරම් පෘතුල ලෙස සැලකිය හැකි නිසා එසේ කිරීම ප්‍රායෝගික නොවන නිසා අවප්‍රකාශනය නිසා මූල්‍ය ප්‍රකාශනවලට වන බලපෑම නිර්ණය කර නැත (එනම අහිතකර මතයක් යෝග්‍ය වේ.)
- විගණනයට ව්‍යවහාර කරන අදාල ආචාර ධර්ම අවශ්‍යතා අඩංගු ඇත්තේ ශ්‍රී ලංකා වරලත් ගණකාධිකරණ ආයතනය විසින් නිකුත් කළ ආචාර ධර්ම සංග්‍රහයේය
- ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව, ශ්‍රී.ලං.වි.ප්‍ර 570 (සංශෝධිත) අනුව අඛණ්ඩ පැවැත්ම ලෙස නොකඩවා පවත්වාගෙන යාමට අස්තිත්වයේ හැකියාව පිළිබඳ සැලකියයුතු අන්දමේ සැකයක් පැන නැගිය හැකි සිද්ධි හෝ තත්වයන් සම්බන්ධයෙන් ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් නොපවතින බව විගණක තීරණය කිරීම.
- ශ්‍රී.ලං.වි.ප්‍ර 701 අනුව ප්‍රධාන විගණන කරුණු සන්නිවේදනය කර තිබීම.
- විගණකගේ වාර්තාවේ දිනයට පෙර සියළුම වෙනත් තොරතුරු විගණක විසින් ලබාගෙන තිබීම සහ ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන මත අහිතකර මතයක් පැන නැගෙන කරුණද වෙනත් තොරතුරුවල බලපානු ලැබේ.
- ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන අධීක්ෂණය කිරීමට වග කියන පුද්ගලයන් ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන පිළියෙළ කරන පුද්ගලයන්ගෙන් වෙනස් වේ.
- නීතිය හෝ රෙගුලාසි යටතේ විගණකට වෙනත් වාර්තාකරණ වගකීම් පැවරී නැත.

## ස්වාධීන විගණකගේ වාර්තාව

ABC සමාගමේ කොටස්හිමියන්ට [හෝ වෙනත් යෝග්‍ය ආමන්ත්‍රණය කරන්නා]

**අහිතකර මතය**

ABC සමාගමේ සහ එහි පරිපාලිතයන්ගේ (සමූහය) 20×1 දෙසැම්බර් මස 31 දිනට ඒකාබද්ධ මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එම දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා ඒකාබද්ධ විස්තීරණ ආදායම් ප්‍රකාශනය සහ ඒකාබද්ධ ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශනය සහ ඒකාබද්ධ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තීන් ඇතුලත්ව ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශනවල සටහන්වලින් සමන්විත ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන අප විසින් විගණනය කරන ලදී.

20X1 දෙසැම්බර් 31 දිනට සමූහයේ මූල්‍ය තත්ත්වය සහ එම දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා වූ එහි ඒකාබද්ධ මූල්‍ය කාර්යසාධනය සහ එහි ඒකාබද්ධ මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා ගිණුම් ප්‍රමිත අනුව පිළයෙල කර ඇත. අපගේ වාර්තාවේ *අහිතකර මතය සඳහා පදනම* වන කොටසේ විස්තර කර ඇති කරුණේ වැදගත්කම නිසා මේ සමඟ ඇති ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන සියලුම ප්‍රමාණාත්මක අංගයන්ගෙන් සාධාරණව (හෝ සත්‍ය හා සාධාරණ දර්ශනයක් පෙන්නුම් කරන බව) ඉදිරිපත් කර ඇති බව අපගේ මතය වේ.

**අහිතකර මතය සඳහා පදනම**

X සටහනෙන් පැහැදිලි කළ පරිදි සමූහය, 20×1 වර්ෂය තුළදී අත්කර ගත් XYZ පරිපාලිත සමාගමේ වැදගත් එක්තරා වත්කම් සහ වගකීම්වල අත්කරගත් දින සාධාරණ වටිනාකම් තවමත් නිර්ණය කර ගැනීමට නොහැකිවීම නිසා එහි සමූහයේ පරිපාලිත XYZ සමාගම ඒකාබද්ධ කර නැත. එම නිසා මෙම ආයෝජනය පිරිවැය පදනම මත ගිණුම්ගත කර ඇත. ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත යටතේ සමූහය පරිපාලිතය ඒකාබද්ධ කළයුතුව තිබූ අතර අත්කර ගැනීම තාවකාලික වටිනාකම මත පදනම්ව ගිණුම් ගත කළයුතුව තිබුණි. XYZ සමාගම ඒකාබද්ධ කළේ නම් මේ සමග ඇති ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශනවල බොහෝ මූලිකාංගවලට ප්‍රමාණාත්මක ලෙස බලපෑම් විය හැකිව තිබුණි. ඒකාබද්ධ කිරීමට අපොහොසත් වීම නිසා ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන මත වන බලපෑම නිර්ණය කර නැත.

අප,ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුව අපගේ විගණනය මෙහෙයවන ලදී. එම ප්‍රමිතීන් යටතේ අපගේ වගකීම් අපගේ වාර්තාවේ *ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන මත විගණනය සඳහා විගණකගේ වගකීම්* කොටසේ තවදුරටත් විස්තර කරනු ලැබේ. ශ්‍රී ලංකා වරලත් ගණකාධිකරණ ආයතනය විසින් නිකුත් කළ ආචාරධර්ම සංග්‍රහයට (CA ශ්‍රී. ලංකා සංග්‍රහය) අනුව අප සමාගමෙන් ස්වාධීන වන අතර අප එම අවශ්‍යතාවයන්ට අනුව අපගේ අනෙකුත් ආචාරධර්ම වගකීම් ඉෂ්ට කර ඇත්තෙමු. අප ලබාගත් විගණන සාක්ෂි කොන්දේසි සහිත මතයක් ප්‍රකාශ කිරීමට ප්‍රමාණවත් සහ යෝග්‍ය පදනමක් සපයන බව අපගේ විශ්වාසයයි.

**වෙනත් තොරතුරු [හෝ 'මූල්‍ය ප්‍රකාශන සහ ඒ මත විගණකගේ වාර්තාව හැර වෙනත් තොරතුරු' වැනි දෑ යෝග්‍ය නම් වෙනත් ශීර්ෂයක]**

වෙනත් තොරතුරු සඳහා කළමනාකරණය[51] වග කිව යුතුය. වෙනත් තොරතුරු සමන්විත වන්නේ [X වාර්තාව[52] තුල තොරතුරු ඇතුලත් කළ නමුත් ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන සහ ඒ මත අපගේ විගණකගේ වාර්තාවේ ඇතුලත් නොවේ.]

ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන මත අපගේ මතයේ වෙනත් තොරතුරු ආවරණය නොවන අතර අප ඒ මත කිසිම ආකාරයක සහතික වීමේ තීරණයක් ප්‍රකාශ නොකරයි.

මූල්‍ය ප්‍රකාශනවල අපගේ විගණනය සම්බන්ධයෙන්, අපගේ *වගකීම වනුයේ* වෙනත් තොරතුරු කියවීම වන අතර එසේ කිරීමේදී වෙනත් තොරතුරු, ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශ සමග හෝ විගණනයේදී ලබා ගත් දැනුම සමග ප්‍රමාණාත්මක අසංගත දැයි හෝ එසේ නැත්නම් ප්‍රමාණාත්මක අවප්‍රකාශ වී ඇති බව පෙන්නුම් කරන්නේදැයි සලකා බැලීමයි.

අප විසින් ඉටුකළ වැඩ මත පදනම්ව මෙම වෙනත් තොරතුරුවල ප්‍රමාණාත්මක අවප්‍රකාශයක් පවතින බව තීරණය කරන්නේ නම් එම කරුණ වාර්තා කිරීමට අපට අවශ්‍ය කෙරේ. ඉහත විස්තර කළ *අහිතකර මතය සඳහා වූ පදනම* කොටසේ සමූහය XYZ සමාගම ඒකාබද්ධ කළ යුතු අතර තාවකාලික අගයන් මත පදනම්ව අත්කර ගැනීම ගිණුම් ගතකළ යුතුව තිබුණි. XYZ සමාගම ඒකාබද්ධ කිරීමට අපොහොසත් වීම හේතුවෙන් බලපෑ X වාර්තාවේ වටිනාකම් හෝ වෙනත් අයිතම සම්බන්ධයෙන් එයම වූ හේතුව සඳහා වෙනත් තොරතුරු ප්‍රමාණාත්මක ලෙස අවප්‍රකාශ වී ඇති බව අප තීරණය කරන්නෙමු.

**[ප්‍රධාන විගණන කරුණු]**[53]

ප්‍රධාන විගණන කරුණු වනුයේ ප්‍රවර්තන කාලපරිච්ඡේදයේ ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශනවල අපගේ විගණනයේදී *වෘත්තීය විනිශ්චය අනුව වඩා වැදගත් වූ* කරුණු වේ. ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන සමස්තයක් ලෙස ගත්කළ විගණනය සම්බන්ධයෙන් සහ ඒ මත වාර්තාව සකස් කිරීමේදී එම කරුණු ආමන්ත්‍රණය කර ඇති අතර මෙම කරුණු මත වෙනමම මතයක් අප ලබා නොදෙයි. *කොන්දේසි සහිත මතයක් සඳහා වූ පදනම* කොටසේ විස්තර කළ කරුණට අමතරව අපගේ වාර්තාවේ සන්නිවේදනය කළ යුතු පහත විස්තර කළ කරුණු ප්‍රධාන විගණන කරුණු වන බව අප නිර්ණය කරන්නෙමු.

[*ශ්‍රී.ලං.වි.ප්‍ර 701 අනුව එක් එක් ප්‍රධාන විගණන කරුණේ විස්තරය* ]

---

51 හෝ විශේෂ අධිකරණ බල ප්‍රදේශයන් තුල නෛතික ආකෘතිමය රාමුව සම්බන්ධයෙන් යෝග්‍ය පරිදි වෙනත් පද

52 වෙනත් තොරතුරුවල වඩාත් සුවිශේෂ විස්තරයක්, එනම් "කළමනාකරණයේ වාර්තාව සහ සභාපතිතුමාගේ ප්‍රකාශයක්," වෙනත් තොරතුරු හඳුනා ගැනීමට භාවිතා කළ හැකිය.

53 ලැයිස්තුගත අස්තිත්වයන් සඳහා පමණක් ප්‍රධාන විගණන කරුණු කොටස අවශ්‍ය කෙරේ..

**මූල්‍ය ප්‍රකාශන සඳහා කළමනාකරණය සහ පාලනය පිළිබඳ වග කිව යුතු අය සමඟ සන්නිවේදනය**[54]

[*ශ්‍රී.ලං.වි.ප්‍ර. 700 (සංශෝධිත) අනුව වාර්තාකරණය–ශ්‍රී.ලං.වි.ප්‍ර. 700 (සංශෝධිත) හි 2 වැනි නිදර්ශනය බලන්න.*]

**මූල්‍ය ප්‍රකාශන විගණනය සඳහා විගණකගේ වගකීම්**

[*ශ්‍රී.ලං.වි.ප්‍ර. 700 (සංශෝධිත) අනුව වාර්තාකරණය–ශ්‍රී.ලං.වි.ප්‍ර. 700 (සංශෝධිත) හි 2 වැනි නිදර්ශනය බලන්න.*]

මෙම ස්වාධීන විගණන වාර්තාව සඳහා වගකිව යුතු කාර්යය භාර හවුල්කරුගේ ශ්‍රී ලංකා වරලත් ගණකාධිකරණ ආයතනයේ සාමාජික අංකය වන්නේ [සාමාජික අංකය]. [55]

[විගණන සමාගම නමින් අත්සන*] [විගණන සමාගමේ ලිපිනය]*

[*දිනය*]

## ශ්‍රී ලංකා විගණන ප්‍රමිත 800 (සංශෝධිත)

## විශේෂ සලකා බැලීම් — විශේෂ අරමුණ ආකෘතිමය රාමු ප්‍රකාරව පිළියෙල කරන ලද මූල්‍ය ප්‍රකාශන විගණනය

(2018 මාර්තු 31 වන දින හෝ ඊට පසු අවසන් වන කාලපරිච්ඡේද සඳහා මූල්‍ය ප්‍රකාශන විගණනයන්ට බලපැවැත් වේ)

**පටුන**

| | ඡේද |
|---|---|
| **හැඳින්වීම** | |
| මෙම ශ්‍රී.ල.වි.ප්‍ර විෂයපථය | 1–3 |
| බලපැවැත්වෙන දිනය | 4 |
| **අරමුණ** | **5** |
| **නිර්වචන** | **6–7** |
| **අවශ්‍යතාවයන්** | |
| කාර්යයභාරය භාර ගැනීමේදී සලකා බැලීම් | 8 |
| විගණනය සැලසුම් කිරීමේදී සහ ඉටු කිරීමේදී සලකා බැලීම් | 9–10 |
| මතයක් සකස් කිරීම සහ වාර්තා කිරීමේදී සලකා බැලීම් | 11–14 |
| **භාවිත කිරීමේ සහ පැහැදිලි කිරීමේ වෙනත් කරුණු** | |
| විශේෂ අරමුණු ආකෘතිමය රාමුව පිළිබඳ නිර්වචනය | අ1–අ4 |
| කාර්යයභාරය භාරගැනීමේදී සලකා බැලීම් | අ5–අ8 |
| විගණනය සැලසුම් කිරීමේදී සහ ඉටු කිරීමේදී සලකාබැලීම් | අ9–අ12 |
| මතයක් සකස් කිරීමේදී සහ වාර්තා කිරීමේදී සලකා බැලීම් | අ13–අ21 |

[54] හෝ විශේෂ අධිකරණ බල ප්‍රදේශයන් තුළ නෛතික ආකෘතිමය රාමුව සම්බන්ධයෙන් යෝග්‍ය පරිදි වෙනත් පද

[55] කාර්යය භාරයේ නියුතු හවුල්කරුගේ ශ්‍රී ලංකා වරලත් ගණකාධිකරණ ආයතනයේ සාමාජික අංකය, ඉතා කලාතුරකින් වන අවස්ථාවකදී එවැනි හෙළිදරව්කිරීම සැලකියයුතු අන්දමේ පෞද්ගලික ආරක්ෂාවට තර්ජනයකට යොමුකිරීම සාධාරණ ලෙස බලාපොරොත්තු වීම හැර ලැයිස්තුගත අස්තිත්වයන්හි පොදු අරමුණු සඳහා වූ සම්පූර්ණ මූල්‍ය ප්‍රකාශන කට්ටලයක් විගණනය සඳහා විගණකගේ වාර්තාවේ ඇතුලත් කෙරේ.

( SLAuS 700 (සංශෝධිත), 46 ඡේදය බලන්න

පරිශිෂ්ඨය: විශේෂ අරමුණු මූල්‍ය ප්‍රකාශන මත ස්වාධීන විගණකගේ වාර්තාවන්හි නිදර්ශන

ශ්‍රී ලංකා විගණන ප්‍රමිත (ශ්‍රී.ල.වි.ප්‍ර) 800 (සංශෝධිත), *විශේෂ සලකා බැලීම් විශේෂ අරමුණු ආකෘතිමය රාමු ප්‍රකාරව පිළියෙල කරන ලද මූල්‍ය ප්‍රකාශන විගණනය* කියවිය යුත්තේ ශ්‍රී ලංකා විගණන ප්‍රමිත 200 ස්වාධීන විගණනයේ සමස්ථ අරමුණු සහ ශ්‍රී ලංකා විගණන ප්‍රමිත ප්‍රකාරව විගණනයක් මෙහෙයවීම'' එක්කරමිනි.

## හැඳින්වීම

### මෙම ශ්‍රී.ල.වි.ප්‍ර යේ විෂයපථය

1. ශ්‍රී ලංකා විගණන ප්‍රමිත (ශ්‍රී.ල.වි.ප්‍ර.) 100-700 පෙළ, මූල්‍ය ප්‍රකාශ විගණනයකට අදාල වෙයි. විශේෂ අරමුණු ආකෘතිමය රාමු ප්‍රකාරව පිළියෙල කරන ලද මූල්‍ය ප්‍රකාශ විගණනයකට ශ්‍රී.ල.වි.ප්‍ර. ව්‍යවහාරකරනයේදී විශේෂ සැලකිල්ලට ගැනීම් මෙම ශ්‍රී.ල.වි.ප්‍ර. සමග කටයුතු කරයි.

2. මෙම ශ්‍රී.ල.වි.ප්‍ර. ලියා ඇත්තේ, විශේෂ අරමුණු ආකෘතිමය රාමු ප්‍රකාරව පිළියෙල කරන ලද සම්පූර්ණ මූල්‍ය ප්‍රකාශන කට්ටලයක් සම්බන්ධයෙනි. තනි මූල්‍ය ප්‍රකාශනයක් හෝ මූල්‍ය ප්‍රකාශනයක නිශ්චිත මූලිකාංගයක්, ගිණුමක් හෝ අයිතමයක් පිළිබඳව අදාළ විශේෂ සලකා බැලීම් සමග ශ්‍රී.ල.වි.ප්‍ර. 805 (සංශෝධිත)[1] කටයුතු කරයි.

3. මෙම ශ්‍රී.ල.වි.ප්‍ර., අනෙක් ශ්‍රී.ල.වි.ප්‍ර. යන්හි අවශ්‍යතා අභිබවා නොයන අතර, කාර්යයභාර තත්ත්වයන්හි අදාල විය හැකි සියළුම විශේෂ සලකා බැලීම් සම්බන්ධ කටයුතු කිරීමටද එය අදහසක් කරන්නේ නැත.

### බලපැවැත්වෙන දිනය

4. මෙම ශ්‍රී.ල.වි.ප්‍ර. 2018 මාර්තු 31 දින හෝ ඊට පසු අවසන් වන කාලපරිච්ඡේද සඳහා වූ මූල්‍ය ප්‍රකාශ විගණනයට බලපැවැත් වේ.

### අරමුණ

5. විශේෂ අරමුණු ආකෘතිමය රාමු ප්‍රකාරව පිළියෙල කරන ලද මූල්‍ය ප්‍රකාශ විගණනයේදී ශ්‍රී.ල.වි.ප්‍ර.යන් ව්‍යවහාර කිරීමේදී විගණකගේ අරමුණ, උචිත ආකාරයට විශේෂ සලකා බැලීම් පහත දෑ වලට අදාලව ඇමතීමටයි:

   (අ) කාර්යයභාරය පිළිගැනීම;

   (ආ) කාර්යයභාරය සැලසුම් කිරීම සහ ඉටු කිරීම; සහ

   (ඇ) මතයක් සකස් කර ගැනීම සහ මූල්‍ය ප්‍රකාශන මත වාර්තා කිරීම

### නිර්වචන

6. මෙම ශ්‍රී.ල.වි.ප්‍ර. යන්හි අරමුණ සඳහා පහත දැක්වෙන පදවල අර්ථය ආරෝපිත වේ:

   (අ) විශේෂ අරමුණු මූල්‍ය ප්‍රකාශන- විශේෂ අරමුණු ආකෘතිමය රාමු ප්‍රකාර පිළියෙල කරන ලද මූල්‍ය ප්‍රකාශ. (යොමුව අ4 ඡේදය)

   (ආ) විශේෂ අරමුණු ආකෘතිමය රාමුව - නිශ්චිත පරිශීලකයන්ගේ මූල්‍ය තොරතුරු අවශ්‍යතා සපුරාලීමට සැලසුම් කළ මූල්‍ය වාර්තාකරණ ආකෘතිමය රාමුවක්. මූල්‍ය වාර්තාකරණ ආකෘතිමය රාමුව සාධාරණ ඉදිරිපත් කිරීමක ආකෘතිමය රාමුවක් හෝ අනුකූලතා ආකෘතිමය රාමුවක්[2] විය හැකිය. (යොමුව : අ1 -අ4 ඡේද)

---

[1] SLAuS 805 (සංශෝධිත), *'විශේෂ සලකා බැලීම් - තනි මූල්‍ය ප්‍රකාශන සහ මූල්‍ය ප්‍රකාශනයක නිශ්චිත මූලිකාංග, ගිණුම් හෝ අයිතම විගණනය කිරීම*

[2] SLAuS 200, *ස්වාධීන විගණකගේ සමස්ත අරමුණු සහ ශ්‍රී ලංකා විගණන ප්‍රමිත ප්‍රකාර විගණනයන් මෙහෙයවීම* 13 (අ) ඡේදය

7. මෙම ශ්‍රී.ල.වි.ප්‍ර.යේ ''මූල්‍ය ප්‍රකාශනයට'' යොමු කිරීම යන්නෙන් අදහස් කරන්නේ, සම්පූර්ණ විශේෂ අරමුණු මූල්‍ය ප්‍රකාශන කට්ටලයකි'. අදාළ මූල්‍ය වාර්තාකරන ආකෘතිමය රාමුවේ අවශ්‍යතා, මූල්‍ය ප්‍රකාශනයන්හි ආකෘතිය සහ අන්තර්ගතය සහ සම්පූර්ණ මූල්‍ය ප්‍රකාශන කට්ටලයක සංයුතිය විය යුතු දෑ නිර්ණය කරයි''. විශේෂ අරමුණු මූල්‍ය ප්‍රකාශන කට්ටලයක යොමු කිරීමට, සම්බන්ධිත හෙළිදරව් කිරීම් ඇතුළත් වේ.

## අවශ්‍යතාවන්

### කාර්යයභාරය භාරගැනීමේදී සලකා බැලීම්

*මූල්‍ය වාර්තාකරණ ආකෘතිමය රාමුව පිළිගතහැකිවීම*

8. මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී ව්‍යවහාරකරන මූල්‍ය වාර්තාකරන ආකෘතිමය රාමුවේ[3] පිළිගත හැකිභාවය ශ්‍රී.ල.වි.ප්‍ර. 210, විගණකට නිර්ණය කිරීම අවශ්‍ය කෙරේ. විශේෂ අරමුණු මූල්‍ය ප්‍රකාශන විගණනයකදී විගණක පහත දෑ පිළිබඳ අවබෝධයක් ලබා ගත යුතුය : (යොමුව අ5 - අ8)

(අ) මූල්‍ය ප්‍රකාශන පිළියෙල කරන්නේ කුමන අරමුණ සඳහාද යන්න ;

(ආ) අපේක්ෂිත පරිශීලනය කරන්නන් ; සහ

(ඇ) අවස්ථාවට අනුව අදාළ මූල්‍ය වාර්තාකරන ආකෘතිමය රාමුව පිළිගත හැකිදැයි නිර්ණය කිරීමට කළමනාකරණය විසින් ගෙන ඇති පියවර

### විගණනය සැලසුම් කිරීමේදී සහ ඉටුකිරීමේදී සලකා බැලීම්

9. විගණනයට අදාළ සියලුම ශ්‍රීලවිප්‍රයන් සමඟ විගණක අනුකූලවීම ශ්‍රී.ල.වි.ප්‍ර.200න් අවශ්‍ය කරයි.[4] විශේෂ අරමුණු මූල්‍ය ප්‍රකාශන විගණනයක් සැලසුම් කිරීමේදී සහ ඉටුකිරීමේදී, කාර්යභාරයේ තත්ත්වය අනුව ශ්‍රී.ල.වි.ප්‍ර. ව්‍යවහාකරණයේදී විශේෂ සලකා බැලීම් අවශ්‍යදැයි විගණක නිර්ණය කළ යුතුය.(යොමුව: අ19 - අ12)

10. අස්තිත්වයේ ගිණුම්කරණ ප්‍රතිපත්ති තෝරා ගැනීම සහ ව්‍යාවහාර කිරීම පිළිබඳව විගණකට අවබෝධයක් ලබාගැනීම ශ්‍රී.ල.වි.ප්‍ර. 315 (සංශෝධිත) අවශ්‍ය කරයි.[5] ගිවිසුමක ප්‍රතිපාදන ප්‍රකාරව එම මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමකදී, කළමනාකරණය සිදුකළ ගිවිසුමේ ඕනෑම සැලකිය යුතු අර්ථකතනය පිළිබඳ අවබෝධයක් විගණක ලබාගත යුතුය. අර්ථනිරූපනය වැදගත් වන්නේ, වෙනත් සාධාරණ අර්ථනිරූපනයන් යොදාගැනීමෙන් මූල්‍ය ප්‍රකාශනවල ඉදිරිපත් කරන තොරතුරුවල ප්‍රමාණාත්මක වෙනසක් ඇති කරන කල්හිය.

### මතයක් සකස් කිරීම සහ වාර්තා කිරීමේදී සලකා බැලීම්

11. විශේෂ අරමුණු මූල්‍ය ප්‍රකාශන මත මතයක් සකස් කිරීමේදී සහ වාර්තාකරණයේදී, විගණක ශ්‍රී.ල.වි.ප්‍ර. 700[6]අවශ්‍යතා ව්‍යවහාර කළ යුතුය. (යොමුව : අ13 – අ19 ඡේද)

*අදාළ කළහැකි මූල්‍ය වාර්තාකරණ ආකෘතිමය රාමුව පිළිබඳ විස්තරය*

12. මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණවත් පරිදි *අදාළ* මූල්‍ය වාර්තාකරණ ආකෘතිමය රාමවටු යොමුකර හෝ විස්තර කර ඇද්දැයි ඇගයීම් ශ්‍රී.ල.වි.ප්‍ර. 700 (සංශෝධිත) න් විගණකට අවශ්‍ය කෙරේ.[7] ගිවිසුමක ප්‍රතිපාදන ප්‍රකාරව පිළියෙල කරන ලද අවස්ථාවක මූල්‍ය ප්‍රකාශන පදනම් විය යුතු ගිවිසුමේ අර්ථනිරූපනයන් ප්‍රමාණවත්ව මූල්‍ය ප්‍රකාශයන්හි විස්තර කර ඇද්ද යන්න විගණක ඇගයීම් කළ යුතුයි.

---

[3] SLAuS 210, *විගණන කාර්යභාර කොන්දේසි එකඟවීම්''* 6 (අ) ඡේදය

[4] SLAuS 200, 18 ඡේදය

[5] SLAuS 315 (සංශෝධිත), අස්තිත්වය සහ එහි පරිසරය අවබෝධ කර ගැනීම මගින් ප්‍රමාණාත්මක අවප්‍රකාශන අවදානම් හඳුනාගැනීම සහ තක්සේරුව'' 11 (ඇ) ඡේදය

[6] SLAuS 700_(සංශෝධිත), මූල්‍ය ප්‍රකාශන මත මතයක් සකස් කිරීම සහ වාර්තාකරණය

[7] SLAuS 700 (සංශෝධිත), 15 ඡේදය

13. ශ්‍රී.ල.වි.ප්‍ර. 700(සංශෝධිත) හි, විගණකගේ වාර්තාවේ සමහර මූලිකාංග සඳහා නිශ්චිත පිළිවෙලක් ඇතුළුව ආකෘතිය සහ අන්තර්ගතය පිළිබඳව කටයුතු කරයි. විශේෂ අරමුණු මූල්‍ය ප්‍රකාශන මත විගණකගේ වාර්තාවක පහත දෑ ඇතුළත් වේ:

(අ) විගණකගේ වාර්තාවේ, මූල්‍ය ප්‍රකාශනය පිළියෙල කරන ලද්දේ කුමන අරමුණක් සඳහාද යන්න විස්තර කිරීමද කළ යුතු අතර, අවශ්‍ය වන්නේ නම් අපේක්ෂිත පරිශීලකයන්, හෝ විශේෂ අරමුණු මූල්‍ය ප්‍රකාශනයේ ඒ තොරතුරු අඩංගු සටහනකට යොමුකිරීම; සහ

(ආ) එවැනි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී මූල්‍ය වාර්තාකරණ ආකෘතිමය රාමු තෝරා ගැනීමට කළමනාකරණයට හැකියාවක් ඇත්නම්, මූල්‍ය ප්‍රකාශන සඳහා කළමනාකරණයේ වගකීම පිළිබඳ පැහැදිලි කිරීමක්ද,[8] අවස්ථාව අනුව, අදාළ මූල්‍ය වාර්තාකරන ආකෘතිමය රාමුව පිළිගතහැකි බව නිර්ණය කිරීම සඳහා වගකීම පිළිගත හැකි බවට යොමු කිරීමක් ද කළ යුතුයි.

*මූල්‍ය ප්‍රකාශ විශේෂ අරමුණු ආකෘතිමය රාමුවක් ප්‍රකාරව පිළියෙල කර ඇති බවට පාඨකයන් සෝදිසියෙන් තැබීම*

14. විශේෂ අරමුණු මූල්‍ය ප්‍රකාශන මත විගණකගේ වාර්තාව පරිශීලනය කරන්නන් *සෝදිසියෙන් තබමින්*, කරුණ අවධාරණය කිරීමේ ඡේදය ඇතුළත් කළයුතු අතර, එහි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇත්තේ, විශේෂ අරමුණු ආකෘතිමය රාමුවක් ප්‍රකාර බවත්, එහි ප්‍රතිඵලයක් ලෙස, මූල්‍ය ප්‍රකාශන වෙනත් අරමුණ යෝග්‍ය නොවිය හැකි බවත්, විගණන වාර්තාවේ ඇතුළත් කළ යුතුය. (යොමුව අ20 – අ21 ඡේද)

## භාවිතා කිරීමේ සහ පැහැදිලි කිරීමේ වෙනත් කරුණු

**විශේෂ අරමුණු ආකෘතිමය රාමුව පිළිබඳ නිර්වචනය (යොමුව : 6 වන ඡේදය)**

අ1. විශේෂ අරමුණු ආකෘතිමය රාමු උදාහරණ වන්නේ;

- අස්තිත්වයේ බදු වාර්තා සමඟ එක්ව යවන බදු පදනම් ගිණුම්කරණය සඳහා මූල්‍ය ප්‍රකාශන කට්ටලය ;
- අස්තිත්වයක ණයහිමියන් සඳහා පිළියෙල කිරීමට ඉල්ලා සිටිය හැකි මුදල් ප්‍රවාහ තොරතුරු සඳහා මුදල් ලැබීම් සහ මුදල් ගෙවීම් පදනමින් ගිණුම්කරණය;
- නියාමකයකුගේ අවශ්‍යතා සපුරාලීමට, නියාමකයකු විසින් ස්ථාපනය කළ මූල්‍ය වාර්තාකරණ විධිවිධාන; හෝ
- බැඳුම්කර ප්‍රතිඥාපත්‍රයක්, ණය ගිවිසුමක් හෝ ව්‍යාපෘති ප්‍රදානයක් වැනි ගිවිසුමක මූල්‍ය වාර්තාකරණ විධිවිධාන

අ2. විශේෂ අරමුණු ආකෘතිමය රාමුව, බලයලත් හෝ පිළිගත් ප්‍රමිත සකස් කරන ආයතනයක හෝ නීතිය හෝ රෙගුලාසි මගින් ස්ථාපනය කළ මූල්‍ය වාර්තාකරණ ආකෘතිමය රාමුවක් මත පදනම් වන අවස්ථාවන් විය හැකි නමුත් ඒ ආකෘතිමය රාමුවේ සියලුම අවශ්‍යතා සමඟ අනුකූල නොවන අවස්ථා තිබිය හැකිය. ගිවිසුමක මූල්‍ය ප්‍රකාශන පිළියෙල කළ යුත්තේ X අධිකරණ බල ප්‍රදේශයේ බොහෝ මූල්‍ය වාර්තාකරණ ප්‍රමිතවලට අනුකූලව මිස සියලු මූල්‍ය වාර්තාකරණ ප්‍රමිතවලට අනුකූලව නොවන, අවශ්‍යතාවය එක් උදාහරණයකි. කාර්යභාරයේ අවස්ථාව අනුව මෙය පිළිගත හැකි කල්හි, විශේෂ අරමුණු මූල්‍ය ප්‍රකාශනයෙහි, බලයලත් හෝ පිළිගත් ප්‍රමිත සකස් කරන ආයතනයක හෝ නීතිය හෝ රෙගුලාසි මගින් ස්ථාපනය කළ මූල්‍ය ප්‍රකාශ ආකෘතිමය රාමුවක් සමඟ සම්පූර්ණයෙන් අනුකූල වන බව හැඟවීමක්, අදාළ මූල්‍ය වාර්තාකරණ ආකෘතිමය රාමුවෙහි විස්තර කිරීම යෝග්‍ය නොවේ. ගිවිසුමක ඉහත උදාහරණයේ, අදාළ මූල්‍ය වාර්තාකරණ ආකෘතිමය රාමුවේ විස්තරය, X අධිකරණ බල ප්‍රදේශයේ මූල්‍ය වාර්තාකරණ ප්‍රමිතවලට ඕනෑම යොමු කිරීමක් සිදුකරනවා වෙනුවට ගිවිසුමේ මූල්‍ය වාර්තාකරණ විධිවිධානවලට යොමුකිරීමක් විය හැකිය

අ3. අ2 ඡේදයේ විස්තර කරන ලද තත්තවයන් අනුව මූල්‍ය වාර්තාකරණ ආකෘතිමය රාමුවක් එය සාධාරණ ඉදිරිපත් කිරීමේ ආකෘතිමය රාමුවක් මත පදනම් වුවද, විශේෂ අරමුණු ආකෘතිමය රාමුවක් සාධාරණ ඉදිරිපත් කිරීමේ ආකෘතිමය රාමුවක් විය නොහැකිය. මෙසේ වන්නේ, බලයලත් හෝ පිළිගත් ප්‍රමිත නියම කරන ආයතනයක් මගින් ස්ථාපිත හෝ නීතිය හෝ රෙගුලාසි මගින් මූල්‍ය ප්‍රකාශනයන්හි සාධාරණ ඉදිරිපත් කිරීමක් අත්කර ගැනීමට අවශ්‍ය කරන සියලුම අවශ්‍යතාවයන් සමග විශේෂ අරමුණු රාමුව අනුකූල නොවන නිසා විය හැකිය.

---

[8] හෝ විශේෂ අධිකරණ බල ප්‍රදේශයන් තුළ නෛතික ආකෘතිමය රාමුව සම්බන්ධයෙන් යෝග්‍ය පරිදි වෙනත් පද

අ4 අස්තිත්වයක් පිළියෙල කරන එකම මූල්‍ය ප්‍රකාශන, විශේෂ අරමුණු ආකෘතිමය රාමුව ප්‍රකාරව පිළියෙල කළ මූල්‍ය ප්‍රකාශන විය හැකිය. එවැනි අවස්ථාවලදී, එම මූල්‍ය ප්‍රකාශන, මූල්‍ය වාර්තාකරණ ආකෘතිමය රාමුව අදහස් කරන පරිශීලකයන් සඳහා පමණක් නොව, වෙනත් පරිශීලකයන්ද භාවිතා කළ හැකිය. එවැනි තත්වයන්හිදී මූල්‍ය ප්‍රකාශනවල පුළුල් බෙදාහැරීමක් තිබුණද, ශ්‍රී.ල.වි.ප්‍ර.යන් ගේ අරමුණු සඳහා තවමත් මූල්‍ය ප්‍රකාශන, විශේෂ අරමුණු මූල්‍ය ප්‍රකාශන ලෙස සලකනු ලැබේ. 13-- 14 වැනි ඡේදවල අවශ්‍යතාවයන් සැලසුම් කරන ලද්දේ, මූල්‍ය ප්‍රකාශන පිළියෙල කරනුයේ කුමන අරමුණු සඳහාද යන්න පිළිබඳ අවබෝධ කරගැනීමට අපොහොසත් වීම වැලැක්වීමටය.[9] අවශ්‍ය කරන පරිදි පැහැදිලි කරන අදාළ මූල්‍ය වාර්තාකරණ ආකෘතිමය රාමුව මගින් ප්‍රකාශිතව අවසර දෙන හෝ අන්අයුරින් ඉඩ දෙන මූල්‍ය ප්‍රකාශනවල මුහුණත මත හෝ සටහන්වල හෝ ඒ මත හරස් යොමුක් මගින් අන්තර්ගත කළ පැහැදිලි කිරීමේ හෝ විස්තරාත්මක තොරතුරුවලින් හෙළිදරව් කිරීම් සමන්විත වේ.

***කාර්යයභාරය භාරගැනීමේදී සලකා බැලීම්***

*මූල්‍ය වාර්තාකරණ ආකෘතිමය රාමුව පිළිගත හැකි බව (යොමුව : 8 වන ඡේදය)*

අ5. විශේෂ අරමුණු මූල්‍ය ප්‍රකාශ සම්බන්ධයෙන් මූල්‍ය වාර්තා පිළියෙල කිරීමේදී ව්‍යවහාර කළ, මූල්‍ය වාර්තාකරණ ආකෘතිමය රාමුවේ පිළිගතහැකි භාවය නිර්ණය කිරීමේදී, අපේක්ෂිත පරිශීලකරන්නන්ගේ මූල්‍ය තොරතුරු අවශ්‍යතා ප්‍රධාන සාධකය වෙයි.

අ6. අදාළ මූල්‍ය වාර්තාකරණ, ආකෘතිමය රාමුව, විශේෂ අරමුණු මූල්‍ය ප්‍රකාශන සඳහා ප්‍රමිතයන් ප්‍රකාශයට පත්කිරීමට පිහිටුවනු ලැබූ අනුමත හෝ පිළිගත් ආයතන මඟින් මූල්‍ය වාර්තාකරණ ප්‍රමිත ආවරනය කිරීමක් සිදුවිය හැකිය. එවැනි අවස්ථාවලදී, අදාළ උනන්දුවක් දක්වන අයගේ අදහස් හා සලකා බැලම් හොඳින් සැලකිල් ලට ගෙන ස්ථාපිත විනිවිදභාවය ආරක්ෂා කරගත හැකි ක්‍රියාවලියක් අනුගමනය කිරිමෙන් පසු පිහිටුවා ඇත්නම්, ඒ ප්‍රමිතයන් සංවිධානයේ අරමුණු සඳහා පිළගතහැකි යැයි සැලකේ. සමහර අධිකරණ බල ප්‍රදේශවල, නීතිය හෝ රෙගුලාසියක්, මඟින් එක්තරා වර්ගයක අස්තිත්ව සඳහා විශේෂ අරමුණු මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී කමනාකරණය විසින් භාවිතා කළයුතු මූල්‍ය වාර්තාකරණ ආකෘතිමය රාමුව නියමකර තිබිය හැකිය. උදාහරණයක් ලෙස නියාමකයෙක්, ඒ නියාමකගේ අවශ්‍යතාවයන් ඉටුවීමට මූල්‍ය වාර්තාකරණ විධිවිධාන පිහිටුවිය හැකිය. ඊට පටහැනිව ඇඟවීමක් නොමැති වීට, එවැනි අස්තිත්වයක් මඟින් පිළියෙල කළ විශේෂ අරමුණු මූල්‍ය ප්‍රකාශන සඳහා එවැනි මූල්‍ය වාර්තාකරණ ආකෘතිමය රාමුවක් පිළිගත හැකියැයි සැලකේ.

අ7. අ6 ඡේදයෙහි සඳහන් මූල්‍ය වාර්තාකරණ ප්‍රමිතිවලට ව්‍යවස්ථාදායකව හෝ නියාමන අවශ්‍යතාවය සමඟින් පරිපූරකයන් සපයා ඇති කල්හි, මූල්‍ය වාර්තාකරන ප්‍රමිත සහ පවතින අතිරේක අවශ්‍යතා අතර ගැටීමක් ඇත්දැයි නිර්ණය කිරීම, ශ්‍රී.ල.වි.ප්‍ර. 210 විගණකට අවශ්‍ය කරවන වන අතර, එවැනි ගැටීමක් පවතී නම්, විගණක විසින් ගතයුතු ක්‍රියාමාර්ග නියම කළ යුතුය.[10]

අ8 අදාළ මූල්‍ය වාර්තාකරණ ආකෘතිමය රාමුව, ගිවිසුමක මූල්‍ය වාර්තාකරණ විධිවිධාන හෝ අ6 සහ අ7 ඡේදයන්හි විස්තර කර ඇති වෙනත් මූලාශ්‍රයන් හැර ආවරණය කිරීමක් කළ හැකිය. එවැනි අවස්ථාවකදී ශ්‍රී.ල.වි.ප්‍ර. 210 හි 2 වන පරිශිෂ්ඨයේ විස්තර කළ පිළිගත හැකි මූල්‍ය වාර්තාකරණ ආකෘතිමය රාමුව මගින් සාමාන්‍යයෙන් පෙන්වන ගුණාංගයන් ආකෘතිමය රාමුව මඟින් පෙන්වන්නේද යන්න සලකා බැලීම මගින් කාර්යභාරයේ තත්ත්වය අනුව මූල්‍ය වාර්තාකරන රාමුවෙහි පිළිගත හැකි මූල්‍ය වාර්තාකරණ ආකෘතිමය රාමු මඟින් නිර්ණය කරයි. විශේෂ අරමුණු ආකෘතිමය රාමුවක් සම්බන්ධයෙන් එවැනි අවස්ථාවකදී, පිළිගත හැකි මූල්‍ය වාර්තාකරණ ආකෘතිමය රාමුව මගින් පෙන්වන එක් එක් ගුණාංගයේ විශෙෂිත වූ කාර්යභාරයක සාපේක්ෂ වැදගත්කම වෘත්තීමය විනිශ්චයේ කරුණකි. උදාහරණ ලෙස, අස්තිත්වයක ශුද්ධ වත්කම් විකුණන දිනට එහි වටිනාකම ස්ථාපිත කිරීමේ අරමුණ සඳහා විකුණුම්කරු සහ ගැණුම්කරු, ඔවුන්ගේ අවශ්‍යතාවයට යෝග්‍ය වන අයුරු, ආපසු අයකරගත නොහැකි ලැබියයුතු ගිණුම් සඳහා මූල්‍ය තොරතුරු පොදු අරමුණු ආකෘතිමය රාමුවක් ප්‍රකාර පිළියෙල කළ මූල්‍ය තොරතුරු සමඟ සැසඳීමේදී මධ්‍යස්ථවීමක් සිදු නොවූවද දීමනාව ඉතා විචක්ෂණශීලී ඇස්තමේන්තුවකට එකගවී තිබීම.

---

[9] SLAuS 200, 13(ඊ) ඡේදය
[10] SLAuS 210, 18 ඡේදය

**විගණනය සැලසුම් කිරීමේදී සහ ඉටු කිරීමේදී සලකා බැලීම් (යොමුව : 9 වන ඡේදය)**

අ9. (අ) මූල්‍ය ප්‍රකාශන විගණන කාර්යභාරයේ ස්වාධීනත්වයට අයත් එම අදාළ ආචාරධර්ම අවශ්‍යතා ඇතුළත්ව සහ (ආ) විගණනයට අදාළ සියලුම ශ්‍රී.ල.වි.ප්‍ර.යන්ට අනුකූලවීම ශ්‍රී.ල.වි.ප්‍ර. 200, අනුව විගණකට අවශ්‍ය කෙරේ. විගණනයේ පවත්නා තත්වයන්හිදී සම්පූර්ණ ශ්‍රී.ල.වි.ප්‍ර. අදාළ නොවේ නම් හෝ එය යම් කොන්දේසි සහිත වීම සහ එම කොන්දේසිය නොපැවතී නම් හැර, විගණක සෑම ශ්‍රී.ල.වි.ප්‍ර. යකම අවශ්‍යතාවන්ට අනුකූලවීම අවශ්‍ය වේ. විශේෂ අවස්ථාවලදී අදාළ ශ්‍රී.ල.වි.ප්‍ර.යේ අවශ්‍යතාවයේ අරමුණ ළඟා කර ගැනීමට, විකල්ප විගණන ක්‍රියාපටිපාටි ඉටු කිරීම මඟින්, ඒ අදාළ අවශ්‍යතාවයන්වලට බැහැරවීමට අවශ්‍යයයි විගණක විනිශ්චය කළ හැකිය.[11]

අ10. විශේෂ අරමුණු මූල්‍ය ප්‍රකාශන විගණනයකදී ශ්‍රී.ල.වි.ප්‍ර.යන්හි සමහර අවශ්‍යතා ව්‍යවහාරකරණයට විගණක විසින් විශේෂ සැලකිල්ලට ගැනීම් අවශ්‍ය විය හැකිය. උදාහරණයක් ලෙස ශ්‍රී.ල.වි.ප්‍ර. 320 හි, මූල්‍ය ප්‍රකාශන පරිශීලකයන්ට ප්‍රමාණාත්මක කරුණු පිළිබඳ විනිශ්චයන් පදනම් වනුයේ පරිශීලනය කණ්ඩායමක් ලෙස පොදු මූල්‍ය තොරතුරු අවශ්‍යතා සලකාබැලීම මතය.[12] කෙසේවෙතත්, විශේෂ අරමුණු මූල්‍ය ප්‍රකාශන විගණනයකදී, එම විනිශ්චයන් පදනම වන්නේ මූල්‍ය තොරතුරු අවශ්‍ය අපේක්ෂිත පරිශීලකයන් මතයි.

අ11. ගිවිසුමක අවශ්‍යතාවයන් ප්‍රකාර පිළියෙල කළ වැනි, විශේෂ අරමුණු මූල්‍ය ප්‍රකාශවල අපේක්ෂිත පරිශීලකයන් සමඟ කළමනාකරණය විගණනයේදී හඳුනාගනු ලබන නියමිත ප්‍රවේශ ලක්ෂයකට අඩු අවප්‍රකාශ, නිවැරදි නොකිරීමට හෝ වෙනත් ලෙසකට ගැලපීම් නොකිරීමට එකඟතාවයකට පැමිණිය හැකිය. එවැනි ප්‍රවේශ ලක්ෂ්‍යක පැවැත්ම ශ්‍රී.ල.වි.ප්‍ර. 320 ප්‍රකාර, ප්‍රමාණාත්මක බව නිර්ණය කිරීමේ අවශ්‍යතාවයෙන්, විශේෂ අරමුණු මූල්‍ය ප්‍රකාශන විගණනය සැලසුම් කිරීම සහ ඉටු කිරීමේ අරමුණ සඳහා විගණක බැඳීමකින් නිදහස් කිරීමක් ඇති නොවේ.

අ12 අස්තිත්වයේ පාලන ව්‍යුහය තුළ හා සමඟ සන්නිවේදනය කළයුතුදැයි යන අදාළ පුද්ගලයා(යන්) නිර්ණය කිරීමට විගණකට ශ්‍රී.ල.වි.ප්‍ර. 260 (සංශෝධිත)හි අවශ්‍ය කෙරේ.[13]සමහර අවස්ථාවලදී පාලනය පිළිබඳ වගකිව යුතු සියලුම පුද්ගලයන්, අස්තිත්වය කළමනාකරණය කිරීම සඳහා සහභාගි වන නිසා සහ මෙම තත්වය[14] හඳුනා ගැනීමට සන්නිවේදනය අවශ්‍යතා ව්‍යවහාරකරණය විකරණය වෙනස් කරන බව ශ්‍රී.ල.වි.ප්‍ර. 260 (සංශෝධිත) හි සඳහන් වේ. අස්තිත්වයක් විසින් පොදු අරමුණු සඳහා වූ සම්පූර්ණ මූල්‍ය ප්‍රකාශන කට්ටලයක්ද පිළියෙල කරන විට විශේෂ අරමුණු සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සංස්කරණය කිරීම සඳහා වගකීම දරන පුද්ගලයන් නම් පිළියෙල කළ පොදු අරමුණු සඳහා වූ මූල්‍ය ප්‍රකාශන අධීක්ෂණය කිරීමට වගකීම දරන එකම පුද්ගලයන්ගෙන්ම විය නොහැකිය.

**මතයක් සකස් කිරීමේදී සහ වාර්තා කිරීමේදී සලකා බැලීම් (යොමුව : 11 වන ඡේදය)**

අ13. මෙම ශ්‍රී.ල.වි.ප්‍ර. යට වන පරිශිෂ්ඨයේ, විශේෂ අරමුණු සඳහා වූ මූල්‍ය ප්‍රකාශන මත ස්වාධීන විගණකගේ වාර්තාවෙහි නිදර්ශනයන් අඩංගු වේ. විශේෂ අරමුණු සඳහා වූ මූල්‍ය ප්‍රකාශන මත වාර්තාකරණ අදාළ විය හැකි විගණකගේ වාර්තාවේ වෙනත් නිදර්ශනයන් (උදාහරණ සඳහා බලන්න, ශ්‍රී.ල.වි.ප්‍ර. 700(සංශෝධිත) , ශ්‍රී.ල.වි.ප්‍ර. 705 (සංශෝධිත)[15], ශ්‍රී.ල.වි.ප්‍ර. 570 (සංශෝධිත),[16] ශ්‍රී.ල.වි.ප්‍ර. 720 (සංශෝධිත),[17] සහ ශ්‍රී.ල.වි.ප්‍ර.706 (සංශෝධිත)[18]වලට පරිශිෂ්ඨයයන්)

*විශේෂ අරමුණු මූල්‍ය ප්‍රකාශන මත වාර්තාකරණය කරන විට ශ්‍රී.ල.වි.ප්‍ර. 700 (සංශෝධිත) හි ව්‍යවහාරකරණය*

අ14. විශේෂ අරමුණු මූල්‍ය ප්‍රකාශන මත මතයක් සකස් කිරීමේදී සහ වාර්තා කිරීමේදී මෙම ශ්‍රී.ල.වි.ප්‍ර. 11 ඡේදය, පැහැදිලි කරයි. ශ්‍රී.ල.වි.ප්‍ර. 700 (සංශෝධිත) ව්‍යවහාර කිරීමට විගණකට අවශ්‍ය කෙරෙන බව එසේ කිරීමේදී අනෙකුත් ශ්‍රී.ල.වි.ප්‍ර. වල ඇති *වාර්තාකරණ අවශ්‍යතා* ව්‍යවහාර කිරීමට විගණකට අවශ්‍ය කෙරෙන අතර පහත අ15 - අ19 ඡේදවල ඇති ආමන්ත්‍රණය කළ විශේෂ සලකා බැලීම් උපකාරි වන බව සොයා ගැනීමට හැකිය.

---

[11] SLAuS 200, 14, 18, සහ 22–23 ඡේද

[12] SLAuS 320 *'විගණනයන් සැලසුම් කිරීමේදී සහ ඉටු කිරීමේදී ප්‍රමාණාත්මක බව'* 2 වන ඡේදය.

[13] SLAuS 260 (සංශෝධිත), *පාලනය පිළිබඳ වගකිව යුතු අය සමඟ සන්නිවේදනය*

[14] SLAuS 260 (සංශෝධිත), අ8 ඡේදය

[15] SLAuS 705 (සංශෝධිත), *ස්වාධීන විගණකගේ වාර්තාවේ මතයට විකරණය කිරීම්*

[16] SLAuS 570 (සංශෝධිත),*අඛණ්ඩ පැවැත්ම*

[17] SLAuS 720 (සංශෝධිත), *වෙනත් තොරතුරු සම්බන්ධයෙන් විගණකගේ වගකීම්*

[18] SLAuS 706 (සංශෝධිත), *ස්වාධීන විගණකගේ වාර්තාවේ කරුණු අවධාරණය කිරීමේ ඡේදය සහ වෙනත් කරුණු ඡේදය*

අඛණ්ඩ පැවැත්ම

අ15. අඛණ්ඩ පැවැත්ම පදනම් ගිණුම්කරණය අදාළ වන මූල්‍ය වාර්තාකරණ ආකෘතිමය රාමුවක් අනුව විශේෂ අරමුණු සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම කළ හැකිය හෝ නොහැකිය.(උදාහරණ: විශේෂ වූ අධිකරණ බල ප්‍රදේශයේ බදු පදනම මත පිළියෙල කළ සමහර මූල්‍ය ප්‍රකාශන සඳහා අඛණ්ඩ පැවැත්ම පදනම් ගිණුම්කරණය අදාළ නොවේ)[19]. විශේෂ අරමුණු සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී භාවිතා කරන අදාල මූල්‍ය වාර්තාකරණ ආකෘතිමය රාමුව මත පදනම්ව, අඛණ්ඩ පැවැත්ම සම්බන්ධයෙන් විගණකගේ වාර්තාවේ කළමනාකරණයේ වගකීම්වල [20] විස්තරය අවශ්‍ය වන පරිදි සකස් කර ගැනීම අවශ්‍ය වේ. විගණකගේ වාර්තාවේ විගණකගේ වගකීම්වල[21] විස්තරය, කාර්යභාර තත්වයන්වලදී ශ්‍රී.ල.වි.ප්‍ර. 570 (සංශෝධිත) ව්‍යවහාර කරන්නේ කෙසේදැයි මත පදනම්ව අවශ්‍ය පරිදි සකස් කර ගැනීම අවශ්‍ය විය හැකිය.

ප්‍රධාන විගණන කරුණු

අ16. ලැයිස්තුගත අස්තිත්වයන්වල පොදු අරමුණු මූල්‍ය ප්‍රකාශන සම්පූර්ණ කට්ටලවල විගණනයන් සඳහා ප්‍රධාන විගණන කරුණු ශ්‍රී.ල.වි.ප්‍ර. 701 (සංශෝධිත)[22] අනුව සන්නිවේදනය කිරීමට ශ්‍රී.ල.වි.ප්‍ර. 700 (සංශෝධිත) මගින් විගණකට අවශ්‍ය කෙරේ. විශේෂ අරමුණු මූල්‍ය ප්‍රකාශන විගණන සඳහා, විශේෂ අරමුණු මූල්‍ය ප්‍රකාශන මත විගණකගේ වාර්තාවේ ප්‍රධාන විගණන කරුණු නීතියෙන් හෝ නියමයන් මගින් සන්නිවේදනය කරන විට හෝ විගණක එසේ නැත්නම් ප්‍රධාන විගණන කරුණු සන්නිවේදනය කිරීමට තීරණය කරන විට පමණක් ශ්‍රී.ල.වි.ප්‍ර. 701 ව්‍යවහාර කෙරේ. විශේෂ අරමුණු සඳහා වූ මූල්‍ය ප්‍රකාශන මත විගණකගේ වාර්තාවේ ප්‍රධාන විගණන කරුණු සන්නිවේදනය කරන විට එහි සමස්ථයටම ශ්‍රී.ල.වි.ප්‍ර. 701 හි ව්‍යවහාර කෙරේ.[23]

වෙනත් තොරතුරු

අ17. වෙනත් තොරතුරු සම්බන්ධයෙන් විගණකගේ වගකීම් ශ්‍රී.ල.වි.ප්‍ර. 720 (සංශෝධිත) හි කටයුතු කෙරේ. මෙම ශ්‍රී.ල.වි.ප්‍ර. සම්බන්ධය තුළ විශේෂ අරමුණු මූල්‍ය ප්‍රකාශන තුළ ඉදිරිපත් කරන කරුණු මත තොරතුරු සමග අයිතිකරුවන්ට ( හෝ සමාන ඇල්මැති පාර්ශ්වයන්) ලබාදීමේ අරමුණ විශේෂ අරමුණු මූල්‍ය ප්‍රකාශ හා කැටුව ඇති හෝ සමන්විත වාර්තා ශ්‍රී.ල.වි.ප්‍ර. 720 (සංශෝධිත) හි අරමුණ සඳහා වාර්ෂික වාර්තා විය යුතු බව සලකනු ලැබේ. විශේෂ අරමුණු ආකෘතිමය රාමුවක් භාවිතයෙන් මූල්‍ය ප්‍රකාශන පිළියෙල කරන අවස්ථාවයන්හිදී, 'සමාන ඇල්මැති පාර්ශවයන්' යන පදය විශේෂ අරමුණු සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට භාවිතා කරන විශේෂ අරමුණු ආකෘතිමය රාමුවේ සැලසුම මගින් මූල්‍ය තොරතුරු අවශ්‍යතා ඉටුකිරීමට අවශ්‍ය නිශ්චිත පරිශීලකයන් ඇතුළත් වේ. එවැනි වාර්තාවක් නිකුත් කිරීමට අස්තිත්වය සැලසුම් කරන බව විගණක නිර්ණය කරනවිට විශේෂ අරමුණු සඳහා වූ මූල්‍ය ප්‍රකාශනවල විගණනයට ශ්‍රී.ල.වි.ප්‍ර. 720 (සංශෝධිත) හි අවශ්‍යතාවයන් ව්‍යවහාර කෙරේ.

කාර්යය භාරයේ නියුතු හවුල්කරුගේ ශ්‍රී ලංකා වරලත් ගණකාධිකරණ ආයතනයේ සමාජික අංකය

අ18. විගණකගේ වාර්තාවේ ද කාර්යය භාරයේ නියුතු හවුල්කරුගේ ශ්‍රී ලංකා වරලත් ගණකාධිකරණ ආයතනයේ සමාජික අංකය ඇතුළත් කිරීමට විගණක සඳහා ශ්‍රී.ල.වි.ප්‍ර. 700 (සංශෝධිත) හි අවශ්‍යතාවයන් ලැයිස්තුගත අස්තිත්වයන්වල විශේෂ අරමුණු සඳහා වූ මූල්‍ය ප්‍රකාශනවල විගණනයන්ටද එලෙසම ව්‍යවහාර කෙරේ.[24] නීතියෙන් හෝ නියමයන් මගින් විගණකගේ වාර්තාවේ ශ්‍රී ලංකා වරලත් ගණකාධිකරණ ආයතනයේ සමාජික අංකය ඇතුලත් කිරීමට විගණකට අවශ්‍ය කෙරේ හෝ එසේ නැත්නම් ලැයිස්තුගත අස්තිත්වයන් හැර අස්තිත්වයන්වල විශේෂ අරමුණු සඳහා වූ මූල්‍ය ප්‍රකාශන මත වාර්තා කිරීමේදී එසේ කිරීමට විගණක තීරණය කළ හැකිය.

---

[19] SLAuS 570 (සංශෝධිත), 2 ඡේදය
[20] SLAuS 700 (සංශෝධිත), 34(ආ) සහ අ48 ඡේද බලන්න.
[21] SLAuS 700 (සංශෝධිත), 39(ආ)(iv) ඡේදය බලන්න
[22] SLAuS 701, *ස්වාධීන විගණකගේ වාර්තාවේ ප්‍රධාන විගණන කරුණු සන්නිවේදනය*
[23] SLAuS 700 (සංශෝධිත), 31 ඡේදය
[24] SLAuS 700 (සංශෝධිත), 45 සහ අ56–අ58 ඡේද බලන්න

*පොදු අරමුණු සම්පූර්ණ මූල්‍ය ප්‍රකාශන කට්ටලය මත විගණකගේ වාර්තාවට යොමුවක් ඇතුළත් කිරීම*

අ19. පොදු අරමුණු සම්පූර්ණ මූල්‍ය ප්‍රකාශන කට්ටලය මත විගණකගේ වාර්තාවට හෝ ඒ මත වාර්තා කළ කරුණ(ණු) ට විශේෂ අරමුණු සඳහා වූ මූල්‍ය ප්‍රකාශන මත විගණකගේ වාර්තාව තුළ වෙනත් කරුණ ඡේදයට යොමු කිරීමට යෝග්‍යව විගණකට සැලකිය හැකිය. ( ශ්‍රී.ල.වි.ප්‍ර. 706 (සංශෝධිත) බලන්න ).[25] උදාහරණ ලෙස පොදු අරමුණු සඳහා වූ සම්පූර්ණ මූල්‍ය ප්‍රකාශන කට්ටලය මත විගණකගේ වාර්තාවේ ඇතුළත් *අඛණ්ඩ පැවැත්ම කොටසට සම්බන්ධිත* ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයකට විශේෂ අරමුණු සඳහා වූ මූල්‍ය ප්‍රකාශන මත විගණකගේ වාර්තාව යොමු කිරීම යෝග්‍ය බව විගණකට සැලකිය හැකිය.

*මූල්‍ය ප්‍රකාශන විශේෂ අරමුණු ආකෘතිමය රාමුවක් අනුව පිළියෙල කර ඇති බවට පාඨකයන්ට සෝදිසියෙන් තැබීම(යොමුව: 14 ඡේදය)*

අ20. විශේෂ අරමුණු සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ඒවා අදහස් කළ අරමුණුවලට හැර වෙනත් අරමුණුවලට භාවිතා කළ හැකිය. උදාහරණ පොදු ලේඛනයක් මත පොදු අරමුණු සඳහා වූ මූල්‍ය ප්‍රකාශන තැබීමට සමහර අස්තිත්වයන්ට නියාමකයෙක් මගින් අවශ්‍ය කෙරේ. වරදවා වටහා ගැනීම් වැළැක්වීමට, මූල්‍ය ප්‍රකාශන විශේෂ අරමුණු සදහා වූ ආකෘතිමය රාමුවකට අනුව පිළියෙළ කරන බව සහ එමනිසා වෙනත් අරමුණක් සඳහා සුදුසු නොවන බව විස්තර කරමින් *කරුණ අවධාරණය කිරීමේ* ඡේදයක් ඇතුළත් කරමින් විගණකගේ වාර්තාවේ *කියවන්නන්ට* විගණක *සෝදිසියෙන් තබයි*. '*කරුණ අවධාරණය කිරීමේ ඡේදය*' යන පදය ඇතුළත් යෝග්‍ය ශීර්ෂයක් විගණකගේ වාර්තාවේ වෙනමම කොටසක මෙම ඡේදය ඇතුළත් කිරීමට ශ්‍රී.ල.වි.ප්‍ර. 706 (සංශෝධිත) මගින් අවශ්‍ය කෙරේ.[26]

*බෙදාහැරීම හෝ භාවිතය මත සීමා කිරීම් (යොමුව: 14 ඡේදය)*

අ21 14 *ඡේදය* මගින් අවශ්‍ය කරන *සෝදිසියෙන් තැබීමට අමතරව*, නිශ්චිත පරිශීලකයන් සඳහා පමණක් බව විගණකගේ වාර්තාවේ ඇඟවීමට යෝග්‍ය බව විගණක සලකා බැලිය හැකිය. විශේෂ වූ අධිකරණ බල ප්‍රදේශයේ නීතිය හෝ නියාමනය මත පදනම්ව විගණකගේ වාර්තාවේ බෙදාහැරීම හෝ භාවිතය මත සීමා කිරීම් මගින් මෙය ඉටුකර ගත හැකිය. මෙවැනි අවස්ථාවන්හිදී 14 *ඡේදයට යොමුකළ ඡේදය* මෙම වෙනත් කරුණුවලට ඇතුළත් කිරීම පුළුල් කළ හැකි අතර ඒ අනුව ශීර්ෂය සංශෝධනය කරයි (මෙම ශ්‍රී.ල.වි.ප්‍ර.යේ පරිශිෂ්ඨයේ නිදර්ශනයන් බලන්න).

**පරිශිෂ්ඨය**

(යොමුව ඃ අ14 ඡේදය)

**විශේෂ අරමුණු මූල්‍ය ප්‍රකාශන මත ස්වාධීන විගණකගේ වාර්තාවලට නිදර්ශන**

- 1 වන නිදර්ශනයඃ ගිවිසුමක මූල්‍ය වාර්තාකරණ විධිවිධාන ප්‍රකාර, පිළියෙල කළ ලැයිස්තුගත නොවන අස්තිත්වයක සම්පූර්ණ මූල්‍ය ප්‍රකාශන කට්ටලයක් මත විගණකගේ වාර්තාව (මෙම නිදර්ශනයේ අරමුණ සඳහා, අනුකූලතා ආකෘතිමය රාමුවක්)
- 2 වන නිදර්ශනයඃ අධිකරණ බල ප්‍රදේශයෙහි බදු පදනම් ගිණුම්කරණය ප්‍රකාර, පිළියෙල කළ ලැයිස්තුගත නොවන අස්තිත්වයක් සඳහා වූ සම්පූර්ණ මූල්‍ය ප්‍රකාශ කට්ටලයක් මත විගණකගේ වාර්තාව (මෙම නිදර්ශනයේ අරමුණු සඳහා අනුකූලතා ආකෘතිමය රාමුවක්)
- 3 වන නිදර්ශනයඃ නියාමකයකු විසින් පිහිටවනු ලැබූ මූල්‍ය වාර්තාකරණ විධිවිධාන ප්‍රකාර, පිළියෙල කළ ලැයිස්තුගත නොවන අස්තිත්වයක සම්පූර්ණ මූල්‍ය ප්‍රකාශන කට්ටලයක් මත වි ප්‍රකාර, පිළියෙල කළ ලැයිස්තුගත අස්තිත්වයක් සඳහා වූ සම්පූර්ණ මූල්‍ය ප්‍රකාශන කට්ටලයක් මත විගණකගේ වාර්තාව (මෙම නිදර්ශනයේ අරමුණු සඳහා, සාධාරණ ඉදිරිපත් කිරීම් ආකෘතිමය රාමුවක්)

<u>1 වන නිදර්ශනයඃ ගිවිසුමක මූල්‍ය වාර්තාකරණ විධිවිධාන ප්‍රකාර, පිළියෙල කළ ලැයිස්තුගත නොවන අස්තිත්වයක් සඳහා වූ සම්පූර්ණ මූල්‍ය ප්‍රකාශන කට්ටලයක් මත විගණකගේ වාර්තාව (මෙම නිදර්ශනයේ අරමුණ සඳහා, අනුකූලතා ආකෘතිමය රාමුවක්)</u>

**මෙම නිදර්ශනාත්මක විගණකගේ වාර්තාවේ අරමුණ සඳහා පහත සඳහන් තත්ත්වයන් උපකල්පනය කෙරේ:**

[25] SLAuS 706 (සංශෝධිත), 10–11*ඡේද බලන්න.*

[26] SLAuS 706 (සංශෝධිත) 9(අ) *ඡේදය බලන්න*

- ගිවිසුමක මූල්‍ය වාර්තාකරණ විධිවිධාන ප්‍රකාර අස්තිත්වයේ කළමනාකාරීත්වය විසින් මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර තිබීම. (එනම්., විශේෂ අරමුණු ආකෘතිමය රාමුවක්). මූල්‍ය වාර්තාකරණ ආකෘතිමය රාමුවක් සම්බන්ධයෙන් කළමනාකරණයේ තෝරා ගැනීමක් නැත.
- අදාළ මූල්‍ය වාර්තාකරණ ආකෘතිමය රාමුව, අනුකූලතා ආකෘතිමය රාමුවකි.
- පොදු අරමුණු සම්පූර්ණ මූල්‍ය ප්‍රකාශන කට්ටලය මත විගණකගේ වාර්තාවක් නිකුත් කර නොමැත.
- ශ්‍රී.ල.වි.ප්‍ර. 210 හි මූල්‍ය ප්‍රකාශන සඳහා කළමනාකාරිත්වයේ වගකීම් විස්තරයේ විගණකගේ කාර්යභාරයේ කොන්දේසි පිළිබිඹු වේ.
- ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව විගණක තීරණය කළ විකරණය නොකළ(එනම්., “පිරිසිදු”) මතයක් යෝග්‍ය වේ.
- විගණනයට ව්‍යවහාර කරන අදාළ ආචාර ධර්ම අවශ්‍යතා අඩංගුව ඇත්තේ ශ්‍රී ලංකා වරලත් ගණකාධිකරණ ආයතනය විසින් නිකුත් කළ ආචාර ධර්ම සංග්‍රහයේය.
- ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව, ශ්‍රී.ලං.වි.ප්‍ර 570 (සංශෝධිත) අනුව අඛණ්ඩ පැවැත්ම ලෙස නොකඩවා පවත්වාගෙන යාමට අස්තිත්වයේ හැකියාව පිළිබඳ සැලකියයුතු අන්දමේ සැකයක් පැන නැගිය හැකි සිද්ධීන් හෝ තත්වයන් සම්බන්ධයෙන් ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් නොපවතින බව විගණක තීරණය කිරිම .
- විගණකගේ වාර්තාව බෙදාහැරීම හෝ භාවිතය සීමා කර ඇත
- ශ්‍රී.ලං.වි.ප්‍ර 701 අනුව ප්‍රධාන විගණන කරුණු සන්නිවේදනය කිරීමට විගණකට අවශ්‍ය නොවන මෙන්ම අන්අයුරකින් එසේ කිරීමට තීරණය කර නොතිබීම.
- වෙනත් තොරතුරු නොමැති බව විගණක නිර්ණය කර තිබීම (එනම් ශ්‍රී.ලං.වි.ප්‍ර 720 (සංශෝධිත) හි අවශ්‍යතා ව්‍යවහාර නොකෙරේ).
- මූල්‍ය ප්‍රකාශන අධීක්ෂණය කිරීමට වග කියන පුද්ගලයන් මූල්‍ය ප්‍රකාශන පිළියෙළ කරන පුද්ගලයන්ගෙන් වෙනස් වේ.
- දේශීය නීතිය හෝ රෙගුලාසි යටතේ වෙනත් වාර්තාකරණ වගකීම් විගණකට නැත.

## ස්වාධීන විගණකගේ වාර්තාව

[යෝග්‍ය ආමන්ත්‍රණය කරන්නා]

**මතය**

ABC සමාගමේ (සමාගම) 20×1 දෙසැම්බර් මස 31 දිනට වූ ශේෂපත්‍රය සහ එම දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා ආදායම් ප්‍රකාශනය සහ ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශනය සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තීහි සාරංශය ඇතුළත්ව මූල්‍ය ප්‍රකාශනවල සටහන්වලින් සමන්විත මූල්‍ය ප්‍රකාශන අප විසින් විගණනය කරන ලදී.

අපගේ මතය වනුයේ සමාගම සහ DEF සමාගම අතර (ගිවිසුම) 20×1 ජනවාරි 1 දිනෙහි ගිවිසුමේ Z කොටසෙහි මූල්‍ය වාර්තාකරණ විධිවිධාන ප්‍රකාර සමාගමේ 20×1 දෙසැම්බර් මස 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා මේ සමග ඇති මූල්‍ය ප්‍රකාශන සියලුම ප්‍රමාණාත්මක ආකාරයෙන් පිළියෙළ කර ඇත.

**මතය සඳහා පදනම**

අප, ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුව අපගේ විගණනය මෙහෙයවන ලදී. එම ප්‍රමිතීන්ට අනුව අපගේ වගකීම් අපගේ වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන මත *විගණනය සඳහා විගණකගේ වගකීම් කොටසේ* තවදුරටත් විස්තර කරනු ලැබේ. ශ්‍රී. ලංකා වරලත් ගණකාධිකරණ ආයතනය විසින් නිකුත් කළ ආචාරධර්ම සංග්‍රහයට[27] (CA ආචාරධර්ම සංග්‍රහය) අනුව අප සමාගමෙන් ස්වාධීන වන අතර අප එම අවශ්‍යතාවයන්ට අනුව අපගේ අනෙකුත් ආචාරධර්ම වගකීම් ඉෂ්ට කර ඇත්තෙමු. අපගේ මතය සඳහා පදනමක් ලබාදීමට අප ප්‍රමාණවත් සහ යෝග්‍ය සාක්ෂි ලබා ගත් බව අපගේ විශ්වාසයයි.

[27] විගණක සඳහා යම් නියාමක අධිකාරියක් විසින් වෙනත් ආචාරධර්ම අවශ්‍යතාවයන් නිකුත් කළහොත් යොමු කිරීම කළ යුතුය.

***කරුණ අවධාරණය කිරීම – ගිණුම්කරණයේ පදනම සහ බෙදාහැරීම හෝ භාවිතය මත සීමා කිරීම්***

අප,ගිණුම්කරණයේ පදනම විස්තර කරන මූල්‍ය ප්‍රකාශනවල සටහන වෙත අවධානය යොමු කරන්නෙමු. ඉහත යොමු කළ ගිවිසුමේ මූල්‍ය වාර්තාකරණ විධිවිධාන ප්‍රකාර අනුගතවීම සහාය වීමට මූල්‍ය ප්‍රකාශන පිළියෙළ කර ඇත.එහි ප්‍රතිඵලයක් ලෙස මූල්‍ය ප්‍රකාශන වෙනත් අරමුණු සඳහා යෝග්‍ය නොවිය හැකිය. අපගේ වාර්තාව තනිකරම සමාගම සහ DEF සමාගම සඳහා අදහස් කරන අතර සමාගම හෝ DER සමාගම හැර වෙනත් කිසිදු පාර්ශ්යකට බෙදාහැරීම හෝ භාවිත කිරීම නොකළ යුතුය. මෙම කරුණ සම්බන්ධයෙන් අපගේ මතය වනුයේ විකරණය නොකිරීමයි.

**මූල්‍ය ප්‍රකාශන සඳහා කළමනාකරණය සහ පාලනය පිළිබඳ වග කිව යුතු අය සමඟ සන්නිවේදනය[28]**

ගිවිසුමේ Z කොටසෙහි මූල්‍ය වාර්තාකරණ විධිවිධාන ප්‍රකාර මූල්‍ය ප්‍රකාශන පිළියෙළ කිරීම සඳහා කළමනාකරණය වගකිව යුතු අතර වංචා හෝ වැරදි හේතුවෙන් ප්‍රමාණාත්මක අවප්‍රකාශවලින් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙළ කිරීමට හැකිවීමට අවශ්‍ය වන අභ්‍යන්තර පාලන බව කළමනාකරණය තීරණය කරයි.

මූල්‍ය ප්‍රකාශන පිළියෙළ කිරීමේදී, කළමනාකරණය එක්කෝ සමාගම ඇවර කිරීමට හෝ මෙහෙයුම් නතර කිරීමට අදහස් කරන්නේ නම් හෝ එසේකිරීමට යථාර්ථවාදී විකල්පයන් නොමැති නම් මිස අඛණ්ඩ පැවැත්ම පදනම මත ගිණුම්කරණය භාවිත කිරීම සහ අදාළ පරිදි අඛණ්ඩ පැවැත්ම සම්බන්ධිත කරුණු හෙළිදරව් කරමින් අඛණ්ඩ පැවැත්ම ලෙස නොකඩවා කරගෙන යාමේ අස්තිත්වයේ හැකියාව නිශ්චිත කිරීමට කළමනාකරණය වග කිව යුතුය.

පාලනය පිළිබඳ වග කිව යුතු අය, සමාගමේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය අධීක්ෂණය කිරීමට වග කියනු ලැබේ.

**මූල්‍ය ප්‍රකාශන විගණනය සඳහා විගණකගේ වගකීම්**

අපගේ අරමුණ වන්නේ මූල්‍ය ප්‍රකාශන සමස්තයක් ලෙස ගත්කල වංචා හෝ වැරදි හේතුවෙන් ප්‍රමාණාත්මක අවප්‍රකාශවලින් තොර වන්නේදැයි පිළිබඳව සාධාරණ සහතිකවීමක් ලබාගැනීමට සහ අපගේ මතය ඇතුළත්ව විගණකගේ වාර්තාව නිකුත් කිරීමයි. සාධාරණ සහතිකවීම යනු ඉහල මට්ටමේ සහතිකවීමකි. නමුත් ,ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුව මෙහෙයවන විගණනයකදී ප්‍රමාණාත්මක අවප්‍රකාශ පවතින විට එය සැමවිටම අනාවරණය වනබව සහතිකයක් දෙනු නොලබයි. අවප්‍රකාශ වංචා හෝ වැරදි හේතුවෙන් හට ගැනීමට හැකි අතර ඒවා ප්‍රමාණාත්මක ලෙස සලකන්නේ තනි තනිව හෝ සමාහරයක් ලෙස ගත්කළ මූල්‍ය ප්‍රකාශනවල පදනම මත පරිශීලකයන්ගේ ආර්ථික තීරණවලට බලපෑම් කිරීමට සාධාරණ ලෙස අපේක්ෂා කළහැකි නම්ය.

පහත දැක්වෙන අඳුරු කළ කරුණු විගණකගේ වාර්තාවේ පරිශිෂ්ඨයන් තුළ පිහිටු විය හැකි බව ශ්‍රී.ලං.වි.ප්‍ර. 700 (සංශෝධි)හි 41(ආ (ඡේදයෙන් පැහැදිලි කෙරේ.නීති,රෙගුලාසි හෝ ජාතික විගණන ප්‍රමිත ප්‍රකාරව අවසර දෙන විට විගණකගේ වගකීම් විස්තරයේ අඩංගු මෙම කරුණු විගණකගේ වාර්තාවේ ඇතුළත් කරනවා වෙනුවට වෙබ් අඩවියේ ලිපිනයේ විස්තරය සහ පහත දැක්වෙන විගණකගේ විස්තරය සමග අසංගත නොවන්නේ නම් යෝග්‍ය අධිකාරියක වෙබ් අඩවියක යොමු කළහැකි බව ශ්‍රී.ලං.වි.ප්‍ර.700 (සංශෝධිත) 41(අ) පැහැදිලි කරයි.

ශ්‍රී.ලං.වි.ප්‍ර. වලට අනුව විගණනයේ කොටසක් ලෙස අප වෘත්තිය විනිශ්චය ක්‍රියාත්මක කරන අතර විගණනය පුරාම වෘත්තීය සංශඥෂ්යීය පවත්වාගෙන යයි. අප පහත දෑ සිදු කළෙමු:

- වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශන වල ප්‍රමාණාත්මක අවප්‍රකාශනවල අවදානම් හඳුනාගැනීම සහ තක්සේරු කිරීම එම අවදානම්වලට ප්‍රතිචාර දක්වන විගණන පටිපාටි සැලසුම් කිරීම සහ ඉටු කිරීම සහ අපගේ මතය සඳහා පදනමක් ලබාදීමට ප්‍රමාණාත්මක හා විගණන යෝග්‍ය සාක්ෂි ලබා ගැනීම. වංචාව සඳහා දුස්සන්දානය, ව්‍යාජ ලෙස ලේඛන සෑදීම, හිතාමතා අත්හැරීම, සාවද්‍ය ලෙස දැක්වීම හෝ අභ්‍යන්තර පාලන ඉක්මවා යාම වැනිදෑ සම්බන්ධ වියහැකි නිසා වරදක ප්‍රතිඵලයක වශයෙන් වන අවධානම් විශාල වේ.

- යම් තත්වයන් තුළදී යෝග්‍ය වන විගණන පටිපාටි සැලසුම් කිරීමට සහ කියවීමට විගණනයට අදාළ අභ්‍යන්තර පාලනයේ අවබෝධයක් ලබා ගන්නා නමුත් මෙහි අරමුණ සමාගමේ අභ්‍යන්තර පාලනයේ සඵලදායීතාවය මත මතයක් ප්‍රකාශ කිරීමේ පිණිස නොවේ.[29]

---

[28] නිදර්ශනාත්මක විගණන වාර්තා පුරාම කළමනාකරනය සහ පාලනය පිළිබඳ වග කිව යුතු අය යන පද අදාළ අධිකරණ බල ප්‍රදේශයේ නෛතික ආකෘතිමය රාමුව සම්බන්ධයෙන් යෝග්‍ය පරිදි වෙනත් පද මගින් හිලව් කිරීමට අවශ්‍ය විය හැකිය.

[29] මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බනධයෙන් අභ්‍යන්තර පාලන සඵලදායිත්වය මත මතයක් නිකුත් කිරීමට විගණකට වගකීමකද තිබෙන විට මෙම වාක්‍යය තත්වයන්වලදී යෝග්‍ය පරිදි සංශෝධනය කරනු ඇත

- භාවිතා කල ගිණුම්කරණ ප්‍රතිපත්තිවල යෝග්‍යතාවය සහ ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමණාකරණය විසින් සිදු කල සම්බන්ධිත හෙළිදරව්කිරීම් අගය කිරීම.
- අඛණ්ඩ පැවැත්ම පදනම ගිණුම්කරණයේ කළමණාකරණයේ භාවිතයේ යෝග්‍යතාවය මත සහ ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව අඛණ්ඩ පැවැත්ම ලෙස නොකඩවා පවත්වා ගෙන යාමේ සමාගමේ හැකියාව මත සැලකිය යුතු අන්දමේ සැකයක් ඇති විය හැකි සිද්ධි හෝ පවත්නා තත්වයන් සම්බන්ධව ප්‍රමාණාත්මක අවිනිශ්චිතයන් පවතීදැයි යන්න නිගමනය කිරීම. ප්‍රමණාත්මක අවිනිශ්චිතතාවයන් පවතින බව අප නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශන තුළ සම්බන්ධිත හෙළිදරව් කිරීම්වලට අපගේ විගණකගේ වාර්තාමය අවධානය යොමු කිරීමට හෝ එවැනි හෙළිදරව් කිරීම් ප්‍රමාණාත්මක නොවේ නම් අපගේ මතය විකරණ කිරීමට අපට අවශ්‍ය වේ. අපගේ නිගමනය පදනම් වී ඇත්තේ විගණකගේ වාර්තාවේ දිනයට දක්වා ලබා ගත් විගණන සාක්ෂි මත පදනම්ව වේ . කෙසේ වෙතත් අනාගත සිද්ධි හෝ තත්වයන් අඛණ්ඩව පැවැත්මක් ලෙස දිගටම කරගෙන යාමට අවසන් කිරීමට සමාගමට හේතුවිය හැකිය

පාලනය පිළිබඳ වගකිව යුතු පුද්ගලයන් සමඟ සන්නිවේදනය කරන වෙනත් කරුණු අතරට අපගේ විගණනය තුළදී අප හඳුනාගෙන තිබෙන අභ්‍යන්තර පාලනයේ සැලකිය යුතු ඕනෑම ඌනතාවයන් ඇතුලුව විගණනයේ සැලසුම් කල විෂය පථය සහ කාලනිර්ණය සැලකිය යුතු අන්දමේ විගණන සොයා ගැනීම් සම්බන්ධව වෙනත් කරුණු ඇතුළත්ය.

*[විගණන සමාගමේ නමින් අත්සන]*

*[විගණන සමාගමේ ලිපිනය]*

[*දිනය*]]

<u>2 වන නිදර්ශනය: X අධිකරණ බල ප්‍රදේශයෙහි බදු පදනම් ගිණුම්කරණය ප්‍රකාර, පිළියෙල කළ ලැයිස්තුගත නොවන අස්තිත්වයක සම්පූර්ණ මූල්‍ය ප්‍රකාශන කට්ටලයක් මත විගණකගේ වාර්තාව (මෙම නිදර්ශනයේ අරමුණු සඳහා අනුකූලතා ආකෘතිමය රාමුවක්)</u>

මෙම නිදර්ශනාත්මක විගණකගේ වාර්තාවේ අරමුණ සඳහා පහත සඳහන් තත්ත්වයන් උපකල්පනය කෙරේ:

- හවුල්කරුවන්ගේ පුද්ගලික ආදායම් බදු වාර්තා පිළියෙල කිරීමේදී හවුල්කරුවන්ට සහාය වීමට X අධිකරණ බල ප්‍රදේශයෙහි බදු පදනම් ගිණුම්කරණය ප්‍රකාර, හවුල් ව්‍යාපාරයක කළමනාකාරිත්වය විසින් පිළියෙල කර තිබෙන සම්පූර්ණ මූල්‍ය ප්‍රකාශන කට්ටලයක විගණනය. (එනම්., විශේෂ අරමුණු ආකෘතිමය රාමුවක්). මූල්‍ය වාර්තාකරණ ආකෘතිමය රාමුවක් සම්බන්ධයෙන් කළමනාකරණයට තෝරාගැනීමක් නොතිබේ.
- අදාළ මූල්‍ය වාර්තාකරණ ආකෘතිමය රාමුව, අනුකූලතා ආකෘතිමය රාමුවකි.
- ශ්‍රී.ල.වි.ප්‍ර. 210 හි මූල්‍ය ප්‍රකාශන සඳහා කළමනාකාරිත්වයේ වගකීම් විස්තරයේ විගණකගේ කාර්යභාරයේ කොන්දේසි පිළිබිඹු වේ.
- ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව විගණක තීරණය කළ විකරණය නොකළ(එනම්., "පිරිසිදු") මතයක් යෝග්‍ය වේ.
- විගණනයට ව්‍යවහාර කරන අදාළ ආචාර ධර්ම අවශ්‍යතා අඩංගුව ඇත්තේ ශ්‍රී ලංකා වරලත් ගණකාධිකරණ ආයතනය විසින් නිකුත් කළ ආචාර ධර්ම සංග්‍රහයේය.
- ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව, ශ්‍රී.ලං.වි.ප්‍ර 570 (සංශෝධිත) අනුව අඛණ්ඩ පැවැත්ම ලෙස නොකඩවා පවත්වාගෙන යාමට අස්තිත්වයේ හැකියාව පිළිබඳ සැලකියයුතු අන්දමේ සැකයක් පැන නැගිය හැකි සිද්ධි හෝ තත්වයන් සම්බන්ධයෙන් ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් නොපවතින බව විගණක තීරණය කිරීම .
- විගණකගේ වාර්තාව බෙදාහැරීම සීමා කරයි.
- ශ්‍රී.ලං.වි.ප්‍ර 701 අනුව ප්‍රධාන විගණන කරුණු සන්නිවේදනය කිරීමට විගණකට අවශ්‍ය නොවන මෙන්ම අන් අයුරකින් එසේ කිරීමට තීරණය කර නොතිබීම.
- වෙනත් තොරතුරු නොමැති බව විගණක නිර්ණය කර තිබීම (එනම් ශ්‍රී.ලං.වි.ප්‍ර 720 (සංශෝධිත) හි අවශ්‍යතා ව්‍යවහාර නොකෙරේ).
- මූල්‍ය ප්‍රකාශන අධීක්ෂණය කිරීමට වග කියන පුද්ගලයන් මූල්‍ය ප්‍රකාශන පිළියෙළ කරන පුද්ගලයන්ගෙන් වෙනස් වේ.

- දේශීය නීතිය හෝ රෙගුලාසි යටතේ වෙනත් වාර්තාකරණ වගකීම් විගණකට නැත.

## ස්වාධීන විගණකගේ වාර්තාව

[යෝග්‍ය ආමන්ත්‍රණය කරන්නා]

**මතය**

ABC හවුල් ව්‍යාපාරයේ ( හවුල්ව්‍යාපාරය) 20×1 දෙසැම්බර් මස 31 දිනට වූ ශේෂපත්‍රය සහ එම දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා ආදායම් ප්‍රකාශනය සහ වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තීන්වල සාරංශයක් ඇතුළත්ව මූල්‍ය ප්‍රකාශනවල සටහන්වලින් සමන්විත මූල්‍ය ප්‍රකාශන අප විසින් විගණනය කරන ලදී.

අපගේ මතය වනුයේ 20×1 දෙසැම්බර් මස 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා හවුල්ව්‍යාපාරයේ මූල්‍ය ප්‍රකාශන X අධිකරණ බල ප්‍රදේශයට අනුව (*අදාළ ආදායම් බදු නීතියේ විස්තර කළ)* සියලුම ප්‍රමාණාත්මක අංගයන්ගෙන් පිළියෙළ කර ඇත.

**මතය සඳහා පදනම**

අප,ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුව අපගේ විගණනය මෙහෙයවන ලදී. එම ප්‍රමිතීන්ට අනුව අපගේ වගකීම් අපගේ වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන මත *විගණනයේ විගණකගේ වගකීම් කොටසේ* තවදුරටත් විස්තර කරනු ලැබේ. ශ්‍රී ලංකා වරලත් ගණකාධිකරණ ආයතනය විසින් නිකුත් කළ ආචාරධර්ම සංග්‍රහයට[30] අනුව අප හවුල්ව්‍යාපාරයෙන් ස්වාධීන වන අතර අප එම අවශ්‍යතාවයන්ට අනුව අපගේ අනෙකුත් ආචාරධර්ම වගකීම් සම්පූර්ණ කර ඇත්තෙමු. අපගේ මතය සඳහා පදනම ලබාදීමට අප ප්‍රමාණවත් සහ යෝග්‍ය සාක්ෂි ලබා ගත් බව අපගේ විශ්වාසයයි.

***කරුණ අවධාරණය කිරීම – ගිණුම්කරණයේ පදනම සහ බෙදාහැරීම මත සීමාකිරීම්***

අප, ගිණුම්කරණයේ පදනම විස්තර කරන මූල්‍ය ප්‍රකාශනවලට X සටහන වෙත අවධානය යොමු කරන්නෙමු. හවුල්ව්‍යාපාරයේ හවුල්කරුවන්ගේ පුද්ගලික ආදායම් බදු වාර්තා පිළියෙල කිරීමේදී ඔවුන්ට සහාය වීමට මූල්‍ය ප්‍රකාශන පිළියෙළ කරයි .එහි ප්‍රතිඵලයක් ලෙස මූල්‍ය ප්‍රකාශන වෙනත් අරමුණු සඳහා යෝග්‍ය නොවිය හැකිය. අපගේ වාර්තාව තනිකරම හවුල්ව්‍යාපාරය සහ එහි හවුල්කරුවන්ට අදහස් කරන අතර හවුල්ව්‍යාපාරය හෝ හවුල්කරුවන් හැර වෙනත් කිසිදු පාර්ශ්වයකට බෙදාහැරීම නොකළ යුතුය. මෙම කරුණ සම්බන්ධයෙන් අපගේ මතය විකරණය නොකරනු ලැබේ.

**මූල්‍ය ප්‍රකාශන සඳහා කළමනාකරණය සහ පාලනය පිළිබඳ වගකිව යුතු අය සමඟ සන්නිවේදනය [31]**

X අධිකරණ බල ප්‍රදේශය තුළ බදු පදනම අනුව ගිණුම්කරණය ප්‍රකාර මූල්‍ය ප්‍රකාශන පිළියෙළ කිරීමට කළමනාකරණය වග කියන අතර වංචා හෝ වැරදි හේතුවෙන් ප්‍රමාණාත්මක අවප්‍රකාශවලින් තොර බවට මූල්‍ය ප්‍රකාශන පිළියෙළ කිරීමට හැකිවීමට අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් කළමනාකරණය නිර්ණය කරයි.

මූල්‍ය ප්‍රකාශන පිළියෙළ කිරීමේදී, කළමනාකරණය එක්කෝ සමාගම ඈවර කිරීමට හෝ මෙහෙයුම් නතර කිරීමට අදහස් කරන්නේ නම් හෝ එසේකිරීමට යථාර්ථවාදී විකල්පයන් නොමැති නම් මිස අඛණ්ඩ පැවැත්ම පදනම මත ගිණුම්කරණය භාවිත කිරීම සහ අදාළ පරිදි අඛණ්ඩ පැවැත්ම සම්බන්ධිත කරුණු හෙළිදරව් කරමින් අඛණ්ඩ පැවැත්ම ලෙස නොකඩවා කරගෙන යාමේ අස්තිත්වයේ හැකියාව නිශ්චිත කිරීමට කළමනාකරණය වග කිව යුතුය.

පාලනය පිළිබඳ වග කිව යුතු අය, සමාගමේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය අධීක්ෂණය කිරීමට වග කියනු ලැබේ.

**මූල්‍ය ප්‍රකාශන විගණනය සඳහා විගණකගේ වගකීම්**

අපගේ අරමුණ වන්නේ මූල්‍ය ප්‍රකාශන සමස්තයක් ලෙස ගත්කල වංචා හෝ වැරදි හේතුවෙන් ප්‍රමාණාත්මක අවප්‍රකාශවලින් තොර වන්නේදැයි පිළිබඳව සාධාරණ සහතිකවීමක් ලබාගැනීමට සහ අපගේ මතය ඇතුළත්ව

---

[30] විගණක සඳහා යම් නියාමක අධිකාරියක් විසින් වෙනත් ආචාරධර්ම අවශ්‍යතාවයන් නිකුත් කළහොත් යොමු කිරීම කළ යුතුය.

[31] හෝ විශේෂ අධිකරණ බලප්‍රදේශයක නෛතික රාමුව සම්බන්ධයෙන් යෝග්‍ය වන වෙනත් කොන්දේසි

විගණකගේ වාර්තාව නිකුත් කිරිමයි. සාධාරණ සහතිකවීම යනු ඉහල මට්ටමේ සහතිකවීමකි. නමුත් ,ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුව මෙහෙයවන විගණනයකදී ප්‍රමාණාත්මක අවප්‍රකාශ පවතින විට එය සෑමවිටම අනාවරණය වනබව සහතිකයක් දෙනු නොලබයි. අවප්‍රකාශ වංචා හෝ වැරදි හේතුවෙන් හට ගැනීමට හැකි අතර ඒවා ප්‍රමාණාත්මක ලෙස සලකන්නේ තනි තනිව හෝ සමාහරයක් ලෙස ගත්කළ මූල්‍ය ප්‍රකාශනවල පදනම මත පරිශීලකයන්ගේ ආර්ථික තීරණවලට බලපෑම් කිරිමට සාධාරණ ලෙස අපේක්ෂා කළහැකි නම්ය.

පහත දැක්වෙන අඳුරු කළ කරුණු විගණකගේ වාර්තාවේ පරිශිෂ්ඨයන් තුල පිහිටු විය හැකි බව ශ්‍රී.ලං.වි.ප්‍ර. 700(සංශෝධිත (හි 41(ආ (ඡේදයෙන් පැහැදිලි කෙරේ.නීති,රෙගුලාසි හෝ ජාතික විගණන ප්‍රමිත ප්‍රකාරව අවසර දෙන විට විගණකගේ වගකීම් විස්තරයේ අඩංගු මෙම කරුණු විගණකගේ වාර්තාවේ ඇතුලත් කරනවා වෙනුවට වෙබ් අඩවියේ ලිපිනයේ විස්තරය සහ පහත දැක්වෙන විගණකගේ විස්තරය සමග අසංගත නොවන්නේ නම් යෝග්‍ය අධිකාරියක වෙබ් අඩවියක යොමුකළහැකි බව ශ්‍රී.ලං.වි.ප්‍ර.700 (සංශෝධිත) 41(අ) පැහැදිලි කරයි.

ශ්‍රී.ලං.වි.ප්‍ර. වලට අනුව විගණනයේ කොටසක් ලෙස අප වෘත්තීය විනිශ්චය ක්‍රියාත්මක කරන අතර විගණනය පුරාම වෘත්තීය සංශයාෂ්ඨීය පවත්වාගෙන යයි. අප පහත දෑ සිදු කළෙමු:

- වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශන වල ප්‍රමාණාත්මක අවප්‍රකාශනවල අවදානම් හඳුනාගැනීම සහ තකසේරු කිරිම එම අවදානම්වලට ප්‍රතිචාර දක්වන විගණන පටිපාටි සැලසුම් කිරිම සහ ඉටු කිරිම සහ අපගේ මතය සඳහා පදනමක් ලබාදීමට ප්‍රමාණාත්මක හා විගණන යෝග්‍ය සාක්ෂි ලබා ගැනීම. වංචාව සඳහා දුස්සන්ධානය, ව්‍යාජ ලෙස ලේඛන සෑදීම, හිතාමතා අත්හැරීම, සාවද්‍ය ලෙස දැක්වීම හෝ අභ්‍යන්තර පාලන ඉක්මවා යාම වැනිදෑ සම්බන්ධ වියහැකි නිසා වරදක ප්‍රතිඵලයක වශයෙන් වන අවධානම් විශාල වේ.

- යම් තත්වයන් තුලදී යෝග්‍ය වන විගණන පටිපාටි සැලසුම් කිරීමට සහ කියවීමට විගණනයට අදාල අභ්‍යන්තර පාලනයේ අවබෝධයක් ලබා ගන්නා නමුත් මෙහි අරමුණ හවුල්ව්‍යාපාරයේ අභ්‍යන්තර පාලනයේ සඵලදායීතාවය මත මතයක් ප්‍රකාශ කිරීමේ පිණිස නොවේ .[32]

- අඛණ්ඩ පැවැත්ම පදනම ගිණුම්කරණයේ කළමණාකරණයේ භාවිතයේ යෝග්‍යතාවය මත සහ ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව අඛණ්ඩ පැවැත්ම ලෙස නොකඩවා පවත්වා ගෙන යාමේ සමාගමේ හැකියාව මත සැලකිය යුතු අන්දමේ සැකයක් ඇති විය හැකි සිද්ධි හෝ පවත්නා තත්වයන් සම්බන්ධව ප්‍රමාණාත්මක අවිනිශ්චිතයන් පවතීදැයි යන්න නිගමනය කිරීම. ප්‍රමණාත්මක අවිනිශ්චිතතාවයන් පවතින බව අප නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශන තුළ සම්බන්ධිත හෙළිදරව් කිරීම්වලට අපගේ විගණකගේ වාර්තාමය අවධානය යොමු කිරීමට හෝ එවැනි හෙළිදරව් කිරීම් ප්‍රමාණාත්මක නොවේ නම් අපගේ මතය විකරණ කිරීමට අපට අවශ්‍ය වේ. අපගේ නිගමනය පදනම් වී ඇත්තේ විගණකගේ වාර්තාවේ දිනයට දක්වා ලබා ගත් විගණන සාක්ෂි මත පදනම්ව වේ . කෙසේ වෙතත් අනාගත සිද්ධි හෝ තත්වයන් අඛණ්ඩව පැවැත්මක් ලෙස දිගටම කරගෙන යාමට අවසන් කිරීමට හවුල්ව්‍යාපාරයට හේතුවිය හැකිය

- භාවිතා කල ගිණුම්කරණ ප්‍රතිපත්තිවල යෝග්‍යතාවය සහ ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමණාකරණය විසින් සිදු කල සම්බන්ධිත හෙළිදරව්කිරීම් අගය කිරීම.

පාලනය පිලිබඳ වගකිව යුතු පුද්ගලයන් සමඟ සන්නිවේදනය කරන වෙනත් කරුණු අතරට අපගේ විගණනය තුළදී අප හඳුනාගෙන තිබෙන අභ්‍යන්තර පාලනයේ සැලකිය යුතු ඕනෑම ඌනතාවයන් ඇතුලුව විගණනයේ සැලසුම් කල විෂය පථය සහ කාලනිර්ණය සැලකිය යුතු අන්දමේ විගණන සොයා ගැනීම් සම්බන්ධව වෙනත් කරුණු ඇතුලත්ය.

[විගණන සමාගමේ නමින් අත්සන]

[විගණන සමාගමේ ලිපිනය]

[32] මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බනධයෙන් අභ්‍යන්තර පාලන සඵලදායිත්වය මත මතයක් නිකුත් කිරිමට විගණකට වගකීමකද තිබෙන විට මෙම වාක්‍යය තත්වයන්වලදී යෝග්‍ය පරිදි සංශෝධනය කරනු ඇත

[*දිනය*]

**<u>3 වන නිදර්ශනයඃ නියාමකයකු විසින් පිහිටවනු ලැබූ මූල්‍ය වාර්තාකරණ විධිවිධාන ප්‍රකාර, පිළියෙල කළ ලැයිස්තුගත අස්තිත්වයක සම්පූර්ණ මූල්‍ය ප්‍රකාශන කට්ටලයක් මත විගණකගේ වාර්තාව (මෙම නිදර්ශනයේ අරමුණු සඳහා, සාධාරණ ඉදිරිපත් කිරීම් ආකෘතිමය රාමුවක්)</u>**

**මෙම නිදර්ශනාත්මක විගණකගේ වාර්තාවේ අරමුණ සඳහා පහත සඳහන් තත්ත්වයන් උපකල්පනය කෙරේ:**

- නියාමකයකු විසින් පිහිටවනු ලැබූ මූල්‍ය වාර්තාකරණ විධිවිධාන ප්‍රකාර, අස්තිත්වයේ කළමනාකාරිත්වය විසින් පිළියෙල කර තිබෙන ලැයිස්තුගත අස්තිත්වයක සම්පූර්ණ මූල්‍ය ප්‍රකාශන කට්ටලයක විගණනය (එනම්., විශේෂ අරමුණු ආකෘතිමය රාමුවක්). මූල්‍ය වාර්තාකරණ ආකෘතිමය රාමුවක් සම්බන්ධයෙන් කළමනාකරණයට තෝරාගැනීමක් නොතිබේ.
- අදාල මූල්‍ය වාර්තාකරණ ආකෘතිමය රාමුව, සාධාරණ ඉදිරිපත් කිරිමේ ආකෘතිමය රාමුවකි.
- ශ්‍රී.ල.වි.ප්‍ර. 210 හි මූල්‍ය ප්‍රකාශන සඳහා කළමනාකාරිත්වයේ වගකීම් විස්තරයේ විගණකගේ කාර්යභාරයේ කොන්දේසි පිළිබිඹු වේ.
- ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව විගණක තීරණය කළ විකරණය නොකළ(එනම්., “පිරිසිදු”) මතයක් යෝග්‍ය වේ.
- විගණනයට ව්‍යවහාර කරන අදාල ආචාර ධර්ම අවශ්‍යතා අඩංගුව ඇත්තේ ශ්‍රී ලංකා වරලත් ගණකාධිකරණ ආයතනය විසින් නිකුත් කළ ආචාර ධර්ම සංග්‍රහයේය
- ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව, ශ්‍රී.ලං.වි.ප්‍ර 570 (සංශෝධිත) අනුව අඛණ්ඩ පැවැත්ම ලෙස නොකඩවා පවත්වාගෙන යාමට අස්තිත්වයේ හැකියාව පිළිබඳ සැලකියයුතු අන්දමේ සැකයක් පැන නැගිය හැකි සිද්ධි හෝ තත්වයන් සම්බන්ධයෙන් ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් නොපවතින බව විගණක තීරණය කිරිම මූල්‍ය ප්‍රකාශන තුල ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවය හෙළිදරව්කිරීම ප්‍රමාණවත්ය
- විගණකගේ වාර්තාව බෙදාහැරිම හෝ භාවිතය සීමා කර නැත
- ශ්‍රී.ලං.වි.ප්‍ර 701 අනුව ප්‍රධාන විගණන කරුණු සන්නිවේදනය කිරීම අවශ්‍ය වන බව නියාමක විසින් විගණකට දැනුම් දී ඇත..
- පොදු අරමුණු සඳහා වූ ආකෘතිමය රාමුව අනුව එකම කාලපරිච්ඡේදය සඳහා ABC සමාගම පිළියෙල කර තිබෙන මූල්‍ය ප්‍රකාශන මත විගණකගේ වාර්තාවක් විගණක නිකුත්කර තිබෙන බව කරුණට වෙනත් කරුණු ඇතුලත් ඡේදයේ යොමු කිරිම
- වෙනත් තොරතුරු නොමැති බව විගණක නිශ්චය කර තිබීම. (එනම්., ශ්‍රී.ලං.වි.ප්‍ර 720 (සංශෝධිත) හි අවශ්‍යතා ව්‍යවහාර නොකරයි
- මූල්‍ය ප්‍රකාශන අධීක්ෂණය කිරීමට වග කියන පුද්ගලයන් මූල්‍ය ප්‍රකාශන පිළියෙළ කරන පුද්ගලයන්ගෙන් වෙනස් වේ.
- දේශීය නීතිය හෝ රෙගුලාසි යටතේ වෙනත් වාර්තාකරණ වගකීම් විගණකට නැත.

## ස්වාධීන විගණකගේ වාර්තාව

[යෝග්‍ය ආමන්ත්‍රණය කරන්නා]

**මතය**

ABC සමාගමේ (සමාගම) 20×1 දෙසැම්බර් මස 31 දිනට වූ ශේෂපත්‍රය සහ එම දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා ආදායම් ප්‍රකාශනය සහ ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශනය සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තීන් සාරංශයක් ඇතුලත්ව මූල්‍ය ප්‍රකාශනවල සටහන්වලින් සමන්විත මූල්‍ය ප්‍රකාශන අප විසින් විගණනය කරන ලදී.

අපගේ මතය වනුයේ සමාගම Z රෙගුලාසියෙහි Y කොටසෙහි මූල්‍ය වාර්තාකරණ විධිවිධාන ප්‍රකාර මේ සමග ඇති සමාගමේ මූල්‍ය ප්‍රකාශන මගින් 20×1 දෙසැම්බර් මස 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එම දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා මූල්‍ය කාර්යයසාධනය සහ මුදල් ප්‍රවාහ සත්‍ය සහ සාධාරණ දර්ශනයක් (සියලුම ප්‍රමාණාත්මක අංගයන්ගෙන්) ගෙනදෙනු ලබයි.

**මතය සඳහා පදනම**

අප,ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුව අපගේ විගණනය මෙහෙය වන ලදී. එම ප්‍රමිතීන්ට අනුව අපගේ වගකීම් අපගේ වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන මත *විගණනයේ විගණකගේ වගකීම් කොටසේ* තවදුරටත් විස්තර කරනු ලැබේ. ශ්‍රී ලංකා වරලත් ගණකාධිකරණ ආයතනය විසින් නිකුත් කළ ආචාරධර්ම සංග්‍රහයට[33] අනුව අප සමාගමෙන් ස්වාධීන වන අතර අප එම අවශ්‍යතාවයන්ට අනුව අපගේ අනෙකුත් ආචාරධර්ම වගකීම් සම්පූර්ණ කර ඇත්තෙමු. අපගේ මතය සඳහා පදනමක් ලබාදීමට අප ප්‍රමාණවත් සහ යෝග්‍ය සාක්ෂි ලබා ගත් බව අපගේ විශ්වාසයයි.

***කරුණ අවධාරණය කිරීම – ගිණුම්කරණයේ පදනම***

අප,ගිණුම්කරණයේ පදනම විස්තර කරන මූල්‍ය ප්‍රකාශනවල සටහන වෙත අවධානය යොමු කරන්නෙමු. DEF නියාමකගේ අවශ්‍යතා සම්පූර්ණ කිරීමට සමාගමට සහාය වීමට මූල්‍ය ප්‍රකාශන පිළියෙළ කර ඇත.එහි ප්‍රතිඵලයක් ලෙස මූල්‍ය ප්‍රකාශන වෙනත් අරමුණු සඳහා යෝග්‍ය නොවිය හැකිය. මෙම කරුණ සම්බන්ධයෙන් අපගේ මතය විකරණය නොකෙරේ.

**අඛණ්ඩපැවැත්ම සම්බන්ධ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවය**

20×1 දෙසැම්බර් මස 31 දිනෙන් අවසන් වූ වර්ෂය තුලදී සමාගම දැරූ ශුද්ධ අලාභය ZZZ සහ එමගින් අඟවන්නේ එම දිනට සමාගමේ ජංගම වගකීම් YYY කින් මුළු වත්කම් ඉක්මවා යන බව පෙන්වන මූල්‍ය ප්‍රකාශනවලට 6 සටහන වෙත අවධානය යොමු කරන්නෙමු. 6 සටහනේ සඳහන් කර ඇති පරිදි මෙම සිද්ධි සහ තත්වයන් 6 සටහනේ පැහැදිලි කර ඇති කරුණු සමග අඛණ්ඩ පැවැත්ම ලෙස නොකඩවා පවත්වාගෙන යාමට සමාගමේ හැකියාව මත සැලකිය යුතු අන්දමේ සැකයක් පැන නැගිය හැකි ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් පවතින බව අඟවන බවයි. මෙම කරුණ සම්බන්ධයෙන් අපගේ මතය විකරණය නොකෙරේ.

**ප්‍රධාන විගණන කරුණු**

ප්‍රධාන විගණන කරුණු යනු ප්‍රවර්තන කාලපරිච්ඡේදයේ මූල්‍ය ප්‍රකාශනවල විගණනයේදී අපගේ වෘත්තීය *විනිශ්චය අනුව වඩා වැදගත් වූ* කරුණු වේ. මූල්‍ය ප්‍රකාශන සමස්තයක් ලෙස ගත් කල විගණනය සහ ඒ මත අපගේ වාර්තාවේ මෙම කරුණු ආමන්ත්‍රණය කර ඇති අතර මෙම කරුණු මත වෙනමම මතයක් අප ලබාදෙන්නේ නැත. ඉහත අඛණ්ඩ පැවැත්මට සම්බන්ධිත ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයෙහි කොටසෙහි විස්තර කළ කරුණුවලට අමතරව අපගේ *වාර්තාවේ සන්නිවේදන කළ* පහත විස්තර කළ කරුණු ප්‍රධාන විගණන කරුණු වන බව අප නිර්ණය කර ඇත.

[*ශ්‍රී.ලං.වි.ප්‍ර 701 අනුව එක් එක් ප්‍රධාන විගණන කරුණේ විස්තරය.*]

**වෙනත් කරුණ**

අප,ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුව 20×1 දෙසැම්බර් මස 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා සමාගම පිළියෙල කර තිබෙන වෙන්ව වූ සම්පූර්ණ මූල්‍ය ප්‍රකාශන කට්ටලයක් මත 20×2 මාර්තු 31 දින සමාගමේ කොටස්හිමියන්ට වෙනමම *විගණකගේ* වාර්තාවක් අප නිකුත් කර ඇත.

**මූල්‍ය ප්‍රකාශන සඳහා කළමනාකරණය සහ පාලනය පිළිබඳ වගකිව යුතු අයගේ සමඟ වගකීම්**[34]

Z රෙගුලාසියෙහි[35] Y කොටසෙහි මූල්‍ය වාර්තාකරණ විධිවිධාන ප්‍රකාර සත්‍ය සහ සාධාරණ දර්ශනයක් ගෙනදෙන ලෙස මූල්‍ය ප්‍රකාශන පිළියෙළ කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ප්‍රමාණාත්මක අවප්‍රකාශවලින් තොර මූල්‍ය

33 විගණක සඳහා යම් නියාමක අධිකාරියක් විසින් වෙනත් ආචාරධර්ම අවශ්‍යතාවයන් නිකුත් කළහොත් යොමු කිරීම කළ යුතුය.

34 හෝ විශේෂ අධිකරණ බල ප්‍රදේශයන් තුල නෛතික ආකෘතිමය රාමුව සම්බන්ධයෙන් යෝග්‍ය පරිදි වෙනත් පද

35 සාධාරණ ඉදිරිපත් කිරීම දෙන මූල්‍ය ප්‍රකාශන පිළියෙළ කිරීමේ කළමනාකරණයේ වගකීම වන අවසරාකදී, මෙය කියවිය හැකිය. "Z නියාමනයෙහි Y කොටසෙහි මූල්‍ය වාර්තාකරණ ප්‍රතිපාදන ප්‍රකාර මූල්‍ය ප්‍රකාශන පිළියෙළ කිරීම සහ සාධාරණ ඉදිරිපත් කිරීම සඳහා කළමනාකරණයේ වග කියනු ලැබේ. …"

ප්‍රකාශන පිළියෙළ කිරීමට හැකි වනු පිණිස කළමනාකරණය අවශ්‍ය යැයි තීරණය කරන පරිදි එවැනි අභ්‍යන්තර පාලන සඳහා කළමනාකරණය වගකිව යුතු වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙළ කිරීමේදී, කළමනාකරණය එක්කෝ සමාගම ඈවර කිරීමට හෝ මෙහෙයුම් නතර කිරීමට අදහස් කරන්නේ නම් හෝ එසේකිරීමට යථාර්ථවාදී විකල්පයන් නොමැති නම් මිස අඛණ්ඩ පැවැත්ම පදනම මත ගිණුම්කරණය භාවිත කිරීම සහ අදාල පරිදි අඛණ්ඩ පැවැත්ම සම්බන්ධිත කරුණු හෙළිදරව් කරමින් අඛණ්ඩ පැවැත්ම ලෙස නොකඩවා කරගෙන යාමේ අස්තිත්වයේ හැකියාව නිශ්චිත කිරීමට කළමනාකරණය වග කිව යුතුය.

පාලනය පිළිබඳ වග කිව යුතු අය, සමාගමේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය අධීක්ෂණය කිරීමට වග කියනු ලැබේ.

**මූල්‍ය ප්‍රකාශන විගණනය සඳහා විගණකගේ වගකීම්**

අපගේ අරමුණ වන්නේ මූල්‍ය ප්‍රකාශන සමස්තයක් ලෙස ගත්කල වංචා හෝ වැරදි හේතුවෙන් ප්‍රමාණාත්මක අවප්‍රකාශවලින් තොර වන්නේදැයි පිළිබඳව සාධාරණ සහතිකවීමක් ලබාගැනීමට සහ අපගේ මතය ඇතුලත්ව විගණකගේ වාර්තාව නිකුත් කිරීමයි. සාධාරණ සහතිකවීම යනු ඉහල මට්ටමේ සහතිකවීමකි. නමුත් ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුව මෙහෙයවන විගණනයකදී ප්‍රමාණාත්මක අවප්‍රකාශ පවතින විට එය සෑමවිටම අනාවරණය වනබව සහතිකයක් දෙනු නොලබයි. අවප්‍රකාශ වංචා හෝ වැරදි හේතුවෙන් හට ගැනීමට හැකි අතර ඒවා ප්‍රමාණාත්මක ලෙස සලකන්නේ තනි තනිව හෝ සමාහරයක් ලෙස ගත්කළ මූල්‍ය ප්‍රකාශනවල පදනම මත පරිශීලකයන්ගේ ආර්ථික තීරණවලට බලපෑම් කිරීමට සාධාරණ ලෙස අපේක්ෂා කළහැකි නම්ය.

පහත දැක්වෙන අඳුරු කළ කරුණු විගණකගේ වාර්තාවේ පරිශිෂ්ඨයන් තුල පිහිටු විය හැකි බව ශ්‍රී.ලං.වි.ප්‍ර. 700 )සංශෝධිත) හි 41(ආ) ඡේදයෙන් පැහැදිලි කෙරේ.නීති,රෙගුලාසි හෝ ජාතික විගණන ප්‍රමිත ප්‍රකාරව අවසර දෙන විට විගණකගේ වගකීම් විස්තරයේ අඩංගු මෙම කරුණු විගණකගේ වාර්තාවේ ඇතුලත් කරනවා වෙනුවට වෙබ් අඩවියේ ලිපිනයේ විස්තරය සහ පහත දැක්වෙන විගණකගේ විස්තරය සමග අසංගත නොවන්නේ නම් යෝග්‍ය අධිකාරියක වෙබ් අඩවියක යොමුකළහැකි බව ශ්‍රී.ලං.වි.ප්‍ර.700 (සංශෝධිත) 41(අ) පැහැදිලි කරයි.

ශ්‍රී.ලං.වි.ප්‍ර. වලට අනුව විගණනයේ කොටසක් ලෙස අප වෘත්තීය විනිශ්චය ක්‍රියාත්මක කරන අතර විගණනය පුරාම වෘත්තීය සංශදෘෂ්ඨිය පවත්වාගෙන යයි. අප පහත දෑ සිදු කළෙමු:

- වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශන වල ප්‍රමාණාත්මක අවප්‍රකාශනවල අවදානම් හඳුනාගැනීම සහ තක්සේරු කිරීම එම අවදානම්වලට ප්‍රතිචාර දක්වන විගණන පටිපාටි සැලසුම් කිරීම සහ ඉටු කිරීම සහ අපගේ මතය සඳහා පදනමක් ලබාදීමට ප්‍රමාණාත්මක හා විගණන යෝග්‍ය සාක්ෂි ලබා ගැනීම. වංචාව සඳහා දුස්සන්දානය, ව්‍යාජ ලෙස ලේඛන සෑදීම, හිතාමතා අත්හැරීම, සාවද්‍ය ලෙස දැක්වීම හෝ අභ්‍යන්තර පාලන ඉක්මවා යාම වැනිදෑ සම්බන්ධ වියහැකි නිසා වරදක ප්‍රතිඵලයක වශයෙන් වන අවධානම් විශාල වේ.

- යම් තත්වයන් තුලදී යෝග්‍ය වන විගණන පටිපාටි සැලසුම් කිරීමට සහ කියවීමට විගණනයට අදාල අභ්‍යන්තර පාලනයේ අවබෝධයක් ලබා ගන්නා නමුත් සමාගමේ අභ්‍යන්තර පාලනයේ සඵලදායීතාවය මත මතයක් ප්‍රකාශ කිරීමේ පිණිස නොවේ .[36]

- භාවිතා කල ගිණුම්කරණ ප්‍රතිපත්තිවල යෝග්‍යතාවය සහ ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමණාකරණය විසින් සිදු කල සම්බන්ධිත හෙළිදරව්කිරීම් අගය කිරීම.

- අඛණ්ඩ පැවැත්ම පදනම ගිණුම්කරණයේ කළමණාකරණයේ භාවිතයේ යෝග්‍යතාවය මත සහ ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව අඛණ්ඩ පැවැත්ම ලෙස නොකඩවා පවත්වා ගෙන යාමේ සමාගමේ හැකියාව මත සැලකිය යුතු අන්දමේ සැකයක් ඇති විය හැකි සිද්ධි හෝ පවත්නා තත්වයන් සම්බන්ධව ප්‍රමාණාත්මක අවිනිශ්චිතයන් පවතීදැයි යන්න නිගමනය කිරීම. ප්‍රමණාත්මක අවිනිශ්චිතතාවයන් පවතින බව අප නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශන තුළ සම්බන්ධිත හෙළිදරව් කිරීම්වලට අපගේ විගණකගේ වාර්තාමය අවධානය යොමු කිරීමට හෝ එවැනි හෙළිදරව් කිරීම් ප්‍රමාණාත්මක නොවේ නම් අපගේ මතය විකරණ කිරීමට අපට අවශ්‍ය වේ. අපගේ නිගමනය පදනම් වී ඇත්තේ විගණකගේ වාර්තාවේ දිනයට දක්වා ලබා ගත් විගණන සාක්ෂි මත පදනම්ව වේ .

[36] මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් අභ්‍යන්තර පාලන සඵලදායිත්වය මත මතයක් නිකුත් කිරීමට විගණකට වගකීමකද තිබෙන විට මෙම වාක්‍යය තත්වයන්වලදී යෝග්‍ය පරිදි සංශෝධනය කරනු ඇත

කෙසේ වෙතත් අනාගත සිද්ධි හෝ තත්වයන් අඛණ්ඩව පැවැත්මක් ලෙස සමාගම දිගටම කරගෙන යාමට අවසන් කිරීමට හේතුවිය හැකිය

- හෙළිදරව් කිරීම් ඇතුලත්ව සහ සාධාරණ ඉදිරිපත් කිරීම ඉෂ්ට කර ගන්නා ආකාරයේ කරුණේ පාදක ගණුදෙණු සහ සිද්ධි මූල්‍ය ප්‍රකාශනවලින් නියෝජනය වන්නේද යන්න ඇතුළුව සමස්ත ඉදිරිපත් කිරීම, ව්‍යුහය සහ මූල්‍ය ප්‍රකාශනවල අන්තර්ගතය අගය කිරීම.

පාලනය පිලිබඳ වගකිව යුතු පුද්ගලයන් සමඟ සන්නිවේදනය කරන වෙනත් කරුණු අතරට අපගේ විගණනය තුළදී අප හඳුනාගෙන තිබෙන අභ්‍යන්තර පාලනයේ සැලකිය යුතු ඕනෑම ඌනතාවයන් ඇතුලුව විගණනයේ සැලසුම් කල විෂය පථය සහ කාලනිර්ණය සැලකිය යුතු අන්දමේ විගණන සොයා ගැනීම් සම්බන්ධව වෙනත් කරුණු ඇතුලත්ය.

ස්වාධීනත්වය සම්බන්ධයෙන් අදාල ආචාරධර්ම අවශ්‍යතාවය සමග අප අනුගත වී ඇති බව සහ අපගේ ස්වාධීනත්වය මත රුඳිය හැකි යැයි සාධාරණ ලෙස සැලකිල්ලට ගත යුතු සියළුම සම්බන්ධතා සහ වෙනත් කරුණු ඔවුන් සමග සන්නිවේදනය කිරීම සහ අවශ්‍ය පරිදි අදාල ආරාක්ෂණ ක්‍රමද සමඟ පාලනය පිලිබඳ වගකිව යුතු පුද්ගලයන්ට ලබාදෙයි.

පාලනය පිලිබඳ වගකිව යුතු අයට සන්නිවේදනය කලයුතු කරුණු ප්‍රවර්තන කාලපරිච්ඡේදයේ මූල්‍ය ප්‍රකාශන විගණනය තුලදී වඩාත් වැදගත් වූ කරුණු ප්‍රධාන විගණන කරුණු ලෙස අප නිර්ණය කර ඇත. මෙම කරුණු පිළිබඳ ප්‍රසිද්ධ හෙළිදරව් කිරීම නීතියෙන් හෝ රෙගුලාසි මගින් වළක්වා නොමැති නම් සන්නිවේදනය මගින් පොදු යහපතට වන ප්‍රතිලාභවලට වඩා එසේ කිරීමෙන් යැයි සාධාරණ ලෙස අපේක්ෂාකළ හැකි අහිතකර ප්‍රතිඵල වැඩි වන නිසා කරුණක් අපගේ වාර්තාවේ සන්නිවේදනය නොකළ යුත්තේ ඉතා කලාතුරකින් වන අවස්ථාවකදී අප නිර්ණය කරන විට හැර අවස්ථාවලදී මෙම කරුණ අපගේ වාර්තාවේ විස්තර කරයි.

මෙම ස්වාධීන විගණන වාර්තාව සඳහා වගකිව යුතු කාර්යය භාරයේ නියුතු හවුල්කරුගේ ශ්‍රී ලංකා වරලත් ගණකාධිකරණ ආයතනයේ සමාජික අංකය වන්නේ [සමාජික අංකය]

[විගණන සමාගමේ නමින් අත්සන]

[විගණන සමාගමේ ලිපිනය]

[*දිනය*]

# ශ්‍රී ලංකා විගණන ප්‍රමිත 805 (සංශෝධිත) විශේෂ සලකාබැලීම්

## තනි මූල්‍ය ප්‍රකාශවල සහ මූල්‍ය ප්‍රකාශයක නිශ්චිත මූලිකාංග, ගිණුම් හෝ අයිතමවල විගණන

(2018 මාර්තු 31 දින හෝ ඊට පසු අවසන් වන කාලපරිච්ඡේදවල විගණන සඳහා බලපැවැත් වේ.)

පටුන

ඡේදය

**හැඳින්වීම**

මෙම ශ්‍රී. ලං. වි. ප්‍ර. විෂයපථය .......... 1–3

බලපැවැත්වෙන දිනය .......... 4

**අරමුණ** .......... 5

**නිර්වචනයන්** .......... 6

**අවශ්‍යතාවයන්**

කාර්යභාරය භාරගන්නා විට සලකා බැලීම් .......... 7–9

විගණනය සැලසුම් කිරීමේදී සහ ඉටු කිරීමේදී සලකා බැලීම් .......... 10

මතයක් සකස් කිරීමේදී සහ වාර්තාකිරීමේදී සලකා බැලීම් .......... 11–17

**ව්‍යවහාර කිරීම සහ වෙනත් පහදා දීමේ දෑ**

මෙම ශ්‍රී.ලං.වි.ප්‍ර. යේ විෂය පථය .......... අ1–අ4

කාර්යභාර භාරගන්නා විට සලකා බැලීම් .......... අ5–අ9

විගණනය සැලසුම්කිරීම සහ ඉටුකිරීමේදී සලකා බැලීම් .......... අ10–අ15

මතයක් සකස් කිරීමේදී සහ වාර්තාකිරීමේදි සලකා බැලීම් .......... අ16–අ28

1 වන පරිශිෂ්ඨය : මූල්‍ය ප්‍රකාශයක නිශ්චිත මූලිකාංග, ගිණුම් හෝ අයිතමවලට උදාහරණ

2 වන පරිශිෂ්ඨය: තනි මූල්‍ය ප්‍රකාශයක් මත සහ සහ මූල්‍ය ප්‍රකාශනයක නිශ්චිත මූලිකාංගයක් මත විගණකගේ වාර්තාවලට නිදර්ශන.

ශ්‍රී.ල.වි.ප්‍ර. 200 "*ශ්‍රී ලංකා විගණන ප්‍රමිත සමග අනුකූලව විගණනයක් පවත්වාගෙන යෑම සහ ස්වාධීන විගණකගේ සමස්ථ අරමුණු* " හි පද සම්බන්ධයෙන් ශ්‍රී ලංකා විගණන ප්‍රමිත (ශ්‍රී.ල.වි.ප්‍ර.) 805 (සංශෝධිත) " *විශේෂ සලකා බැලීම් - තනි මූල්‍ය ප්‍රකාශ සහ මූල්‍ය ප්‍රකාශයක නිශ්චිත මූලිකාංග, ගිණුම් හෝ අයිතම විගණන* කියවිය යුතුය.

**හැඳින්වීම**

## මෙම ශ්‍රී.ලං.වි.ප්‍ර. විෂයපථය

1. මූල්‍ය ප්‍රකාශ විගණනයකට 100-700 හි මාලාව තුල වන ශ්‍රී ලංකා විගණන ප්‍රමිත (ශ්‍රී.ල.වි.ප්‍ර.), ව්‍යවහාර කරන අතර වෙනත් ඓතිහාසික මූල්‍ය තොරතුරුවලට විගණනයට ව්‍යවහාර කරන අවස්ථාවලදී අවශ්‍ය පරිදි අනුගමනය කරයි. මෙම ශ්‍රී.ලං.වි.ප්‍ර. තනි මූල්‍ය ප්‍රකාශයක හෝ *නිශ්චිත මූලිකාංගයක*, ගිණුමක හෝ මූල්‍ය ප්‍රකාශයක අයිතමයකට විගණනයකට එම ශ්‍රී.ලං.වි.ප්‍ර. ව්‍යවහාරකරණය සුවිශේෂී සලකාබැලීම් කටයුතු කෙරේ. තනි මූල්‍ය ප්‍රකාශයක හෝ *නිශ්චිත මූලිකාංගයක*, ගිණුමක හෝ මූල්‍ය ප්‍රකාශයක අයිතම පොදු හෝ විශේෂ අරමුණු ආකෘතිමය රාමුව අනුකූලව පිළියෙල කළ හැකිය. විශේෂ අරමුණු ආකෘතිමය රාමුව අනුකූලව පිළියෙල කරන්නේ නම්, ශ්‍රී.ලං.වි.ප්‍ර. 800[1] (සංශෝධිත)ද විගණනයට එසේම ව්‍යවහාර කරයි. (යොමුව අ 1 - අ4 ඡේද)

2. සමූහයක මූල්‍ය ප්‍රකාශන විගණනයක අරමුණු සඳහා සමූහයේ කාර්යයේ නියැලි කණ්ඩායමේ ඉල්ලීමකට සංරචකයක මූල්‍ය තොරතුරු මත ඉටුකළ කාර්යයක ප්‍රතිඵලයක් වශයෙන් නිකුත් කළ සංරචක විගණක වාර්තාවකට මෙම ශ්‍රී.ල.වි.ප්‍ර. අදාළ නොවේ. (ශ්‍රී.ල.වි.ප්‍ර. 600[2] බලන්න).

3. මෙම විගණන ප්‍රමිතය අනෙකුත් ශ්‍රී.ල.වි.ප්‍ර.වල අවශ්‍යතාවයන් අභිබවා යන හෝ කාර්යභාරයේ තත්වය අනුව අදාළ වියහැකි සියලුම විශේෂ සැලකිල්ලට ගැනීම පිළිබඳව කටයුතු කිරීමටද අදහස් නොකෙරේ.

**බලපැවැත්වෙන වන දිනය**

4. මෙම ශ්‍රී.ල.වි.ප්‍ර. තනි මූල්‍ය ප්‍රකාශවල හෝ නිශ්චිත මූලිකාංගවල, ගිණුම්වල හෝ අයිතමවල විගණන සඳහා 2018 මාර්තු 31 දින හෝ ඊට පසු අවසන් වන කාලපරිච්ඡේද සඳහා බලපැවැත් වේ. නිශ්චිත දිනයකදී තනි මූල්‍ය ප්‍රකාශවල හෝ මූල්‍ය ප්‍රකාශයක නිශ්චිත මූලිකාංගවල, ගිණුම්වල හෝ අයිතමවල විගණන කරන අවස්ථාවේදී මෙම ශ්‍රී.ල.වි.ප්‍ර.ය එම තොරතුරුවල විගණනයන් සඳහා 2018 මාර්තු 31 දිනට හෝ ඉන් පසුව බලපැවැත් වේ.

**අරමුණ**

5. තනි මූල්‍ය ප්‍රකාශයක හෝ මූල්‍ය ප්‍රකාශයක නිශ්චිත මූලිකාංගය, ගිණුමක් හෝ අයිතමයක් සඳහා වන විගණනයකට මෙම ශ්‍රී.ල.වි.ප්‍ර. යන් ව්‍යවහාර කිරීමේ අරමුණ වන්නේ පහත දැවලට අදාලව විශේෂ සැලකිල්ලට ගැනීම යෝග්‍ය පරිදි යොමු කිරීමයි:

   (අ) කාර්යභාරය පිළිගැනීම;

   (ආ) එම කාර්යභාරය සැලසුම් කිරීම සහ ඉටුකිරීම; සහ

   (ඇ) තනි මූල්‍ය ප්‍රකාශයක හෝ මූල්‍ය ප්‍රකාශයක නිශ්චිත මූලිකාංගක, ගිණුමක හෝ අයිතමයක් සඳහා මතයකට සකස් කිරීම සහ වාර්තාකරණය

## නිර්වචනයන්

6. මෙම ශ්‍රී.ල.වි.ප්‍රයේ අරමුණු සඳහා යොමු වන්නේ:

   (අ) "මූල්‍ය ප්‍රකාශනයක මූලිකාංගයක්" හෝ "මූලිකාංගයන්" යන්නෙන් අදහස් කරන්නේ "මූල්‍ය ප්‍රකාශනයක, මූලිකාංගයක්, ගිණුමක් හෝ අයිතමයකි"

[1] ශ්‍රී.ලං.වි.ප්‍ර. 800 (සංශෝධිත) *විශේෂිත සලකාබැලීම්,— විශේෂ අරමුණු ආකෘතිමය රාමු අනුව පිළියෙල කල මූල්‍ය ප්‍රකාශ විගණන*

[2] ශ්‍රී.ල.වි.ප්‍ර 600, *විශේෂිත සලකාබැලීම් — සමූහ මූල්‍ය ප්‍රකාශ විගණන (සංරචක විගණකවරුන්ගේ කාර්යයන් ද ඇතුළත්ව)*

(ආ) "ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත" යන්නෙන් අදහස් කරන්නේ ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනය විසින් නිකුත් කළ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත වේ; සහ

(ඇ) තනි මූල්‍ය ප්‍රකාශයක හෝ මූල්‍ය ප්‍රකාශයක නිශ්චිත අයිතමයක සම්බන්ධිත හෙළිදරව් කිරීම් ඇතුළත් වේ. සාමාන්‍යයෙන් සම්බන්ධිත හෙළිදරව් කිරීම්, මූල්‍ය ප්‍රකාශනයට හෝ මූලිකාංගයට අදාළ පහදාදීමේ හෝ වෙනත් විස්තරාත්මක තොරතුරුවලින් සමන්විත වේ. (යොමුව අ2 ඡේදය)

## අවශ්‍යතාවයන්

### කාර්යභාරය භාරගන්නා විට සලකා බැලීම්

*ශ්‍රී.ල.වි.ප්‍ර. ව්‍යවහාරකරණය*

7. විගණනයට අදාළ සියලුම ශ්‍රී.ල.වි.ප්‍ර සමග විගණක අනුගතවීමට ශ්‍රී.ල.වි.ප්‍ර. 200 මගින් අවශ්‍ය කෙරේ.[3] අස්තිත්වයේ සම්පූර්ණ මූල්‍ය ප්‍රකාශ කට්ටලය විගණනය සඳහා විගණක එලෙසින් කාර්යයේ නියුක්ත කරන්නේදැයි නොසලකා තනි මූල්‍ය ප්‍රකාශයක හෝ මූල්‍ය ප්‍රකාශයක නිශ්චිත මූලිකාංගයක විගණනයක් වන අවස්ථාවකදී මෙම අවශ්‍යතාවයන් ව්‍යවහාර කරයි. විගණකට අස්තිත්වයේ සම්පූර්ණ මූල්‍ය ප්‍රකාශන කට්ටලය විගණනය කිරීමේ කාර්යභාරයේ නියුක්ත නොකරන්නේ නම් තනි මූල්‍ය ප්‍රකාශයක් හෝ එම මූල්‍ය ප්‍රකාශවල නිශ්චිත මූලිකාංගයක් විගණනය කිරීම ශ්‍රී.ල.වි.ප්‍ර. ප්‍රකාරව ප්‍රායෝගික දැයි විගණක නිර්ණය කළයුතුය. (යොමුව: අ5 - අ6 ඡේද)

*මූල්‍ය වාර්තාකරණය ආකෘතිමය රාමුවේ පිළිගතහැකි බව*

8. මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී ව්‍යවහාරකරන ලද මූල්‍ය වාර්තාකරන ආකෘතිමය රාමුව පිළිගත හැකිවීම නිර්ණය කිරීම විගණකට ශ්‍රී.ල.වි.ප්‍ර. 210 මගින් අවශ්‍ය කෙරේ.[4] තනි මූල්‍ය ප්‍රකාශයක හෝ මූල්‍ය ප්‍රකාශයක නිශ්චිත මූලිකාංගයක විගණනයක් වන අවස්ථාවකදී මෙය මූල්‍ය ප්‍රකාශය හෝ මූලිකාංගය තුල පළකල තොරතුරු සහ මූල්‍ය ප්‍රකාශය හෝ මූලිකාංගය තුල පළකල තොරතුරු මත ප්‍රමාණාත්මක ගනුදෙනු හා සිදුවීම්වල බලපෑම අදහස් කරන පරිශීලකයන්ට තේරුම්ගත හැකි ආකාරයට ප්‍රමාණාත්මක හෙළිදරව් කිරීම් ලබාදෙන මූල්‍ය වාර්තාකරණ ආකෘතිමය රාමුව ව්‍යවහාර කිරීම ප්‍රතිඵල දෙන්නේද යන්න ඇතුළත් කළයුතුය. (යොමුව: අ7 ඡේදය)

*මතයේ ස්වරූපය*

9. විගණක විසින් නිකුත් කළ යුතු ඕනෑම වාර්තාවල අපේක්ෂිත ස්වරූපය විගණන කාර්යභාරයේ එකඟ වූ කොන්දේසිවලට ඇතුළත් කිරීම ශ්‍රී.ල.වි.ප්‍ර. 210 මගින් අවශ්‍ය කෙරේ[5]. තනි මූල්‍ය ප්‍රකාශනයක හෝ මූල්‍ය ප්‍රකාශනයක නිශ්චිත මූලිකාංගයක විගණනයක් වන අවස්ථාවකදී මතයේ අපේක්ෂා කරන ස්වරූපය අවස්ථාවේ හැටියට උචිත දැයි විගණක සලකා බැලිය යුතුය. (යොමුව: අ8 අ9 ඡේද )

### විගණනය සැලසුම් කිරීමේදී සහ ඉටුකිරීමේදී සැලකිල්ලට ගතයුතු දෑ

10. ශ්‍රී.ල.වි.ප්‍ර. ලියා ඇත්තේ මූල්‍ය ප්‍රකාශ විගණනය කිරීම සඳහා වන පද සම්බන්ධය ඇතිව බව ශ්‍රීලංවිප්‍ර 200 හි සඳහන් වේ. වෙනත් ඓතිහාසික මූල්‍ය තොරතුරු විගණනය සඳහා ව්‍යවහාරකරන විට තත්ත්වයට අවශ්‍ය වන පරිදි ඒවා යොදාගත යුතුය.[6,7] තනි මූල්‍ය ප්‍රකාශයක හෝ මූල්‍ය ප්‍රකාශයක නිශ්චිත මූලිකාංගයක් විගණනය කිරීම සැලසුම් කිරීමේදී සහ ඉටු කිරීමේදී විගණක, විගණනයට අදාළ සියලු ශ්‍රී.ල.වි.ප්‍ර.යේ කාර්යභාරයේ තත්ත්වයන්ට අවශ්‍ය පරිදි යොදා ගත යුතුය. (යොමුව: අ10 - අ15 ඡේද )

---

[3] ශ්‍රී.ල.වි.ප්‍ර 200, *ස්වාධීන විගණකයේ සමස්ථ අරමුණු සහ ශ්‍රී ලංකා විගණන ප්‍රමිත අනුව විගණනයන් පවත්වාගෙනයාම*, 18 ඡේදය

[4] ශ්‍රී.ල.වි.ප්‍ර 210, *විගණන කාර්යභාරයේ කොන්දේසි සමඟ එකඟ වීම* 6(අ) ඡේදය

[5] ශ්‍රී.ල.වි.ප්‍ර 210, 10(ඉ) ඡේදය

[6] ශ්‍රී.ල.වි.ප්‍ර 200, 2 ඡේදය

[7] ශ්‍රී.ල.වි.ප්‍ර 200, 13(ඒ) ඡේදය, — මූල්‍ය ප්‍රකාශ" යන පදය අදාළ මූල්‍ය වාර්තාකරණ රාමුවට අවශ්‍ය කෙරෙන අවශ්‍යතාවන් නිර්ණය කරනු ලබන සම්පූර්ණ මූල්‍ය ප්‍රකාශන කට්ටලයක්, වශයෙන් සාමාන්‍යයෙන් පැහැදිලි කෙරේ

**මතය සකස් කිරීම සහ වාර්තාකරනයේදී සලකා බැලීම**

11. තනි මූල්‍ය ප්‍රකාශනයක හෝ මූල්‍ය ප්‍රකාශයක නිශ්චිත මූලිකාංගයක් මත මතයක් සකස් කිරීමේදී සහ වාර්තාකරණයේදී විගණක ශ්‍රී.ල.වි.ප්‍ර. 700 (සංශෝධිත),[8] හි අවශ්‍යතා ව්‍යවහාර කළ යුතු අතර, කාර්යභාරයේ තත්ත්වයන් අනුව ශ්‍රී.ල.වි.ප්‍ර. 800 (සංශෝධිත) අවශ්‍යවන පරිදි යොදාගත යුතුය. (යොමුව : අ16 - අ22 ඡේද)

*අස්තිත්වයේ සම්පූර්ණ මූල්‍ය ප්‍රකාශන කට්ටලයක් මත සහ තනි මූල්‍ය ප්‍රකාශයක් මත හෝ එම මූල්‍ය ප්‍රකාශවල නිශ්චිත මූලිකාංගයක් මත වාර්තාකරනය*

12. විගණක අස්තිත්වයක සම්පූර්ණ මූල්‍ය ප්‍රකාශන කට්ටලයක් විගණනය කිරීමේ කාර්යභාරය සමඟ එකට බැඳුන තනි මූල්‍ය ප්‍රකාශයක් හෝ මූල්‍ය ප්‍රකාශයක නිශ්චිත මූලිකාංගයන් මත වාර්තා කිරීමට විගණක කාර්යභාරයක් භාරගන්නේ නම් විගණක එක් එක් කාර්යභාරය සඳහා වෙන වෙනම මතයක් ප්‍රකාශ කළයුතුය.

13. විගණනය කරන ලද අස්තිත්වයේ සම්පූර්ණ මූල්‍ය ප්‍රකාශ කට්ටලය සමඟ එකට විගණනය කරන ලද තනි මූල්‍ය ප්‍රකාශය හෝ විගණනය කරන ලද මූල්‍ය ප්‍රකාශයක නිශ්චිත මූලිකාංගයක් ප්‍රකාශනයට පත් කළ හැකිය. තනි මූල්‍ය ප්‍රකාශයක හෝ මූල්‍ය ප්‍රකාශයක නිශ්චිත මූලිකාංගයක් ඉදිරිපත් කිරීම සම්පූර්ණ මූල්‍ය ප්‍රකාශ කට්ටලයකින් ප්‍රමාණවත් ලෙස වෙන්කොට හඳුනාගන්නේ නැති බව විගණක නිගමනය කරන්නේ නම් එම තත්ත්වය නිවැරදි කරන ලෙස විගණක කළමනාකරණයෙන් ඉල්ලා සිටිය යුතුය. 15 සහ 16 ඡේදවලට යටත්ව සම්පූර්ණ මූල්‍ය ප්‍රකාශ කට්ටලය මතයකින් තනි මූල්‍ය ප්‍රකාශයක් හෝ මූල්‍ය ප්‍රකාශයක නිශ්චිත මූලිකාංගයක මතය විගණක එලෙසම වෙන්කොට දැක්විය යුතුය. වෙන්කොට දැක්වීම සමඟ සෑහීමට පත්වන තුරු තනි මූල්‍ය ප්‍රකාශය හෝ මූල්‍ය ප්‍රකාශයක නිශ්චිත මූලිකාංගය මත මතයකින් සමන්විත විගණකගේ වාර්තාව විගණක විසින් නිකුත් නොකළ යුතුය.

තනි මූල්‍ය ප්‍රකාශනයක හෝ මූල්‍ය ප්‍රකාශනයක නිශ්චිත අයිතමයක විගණනය සහ එමගින් විගණකගේ වාර්තාව සඳහා අස්තිත්වයේ සම්පූර්ණ මූල්‍ය ප්‍රකාශන මත විගණකගේ වාර්තාවේ ඇතුලත් කළ සමහර කරුණුවල ඇගවීම් සලකා බැලීම්.

14. අස්තිත්වයේ සම්පූර්ණ මූල්‍ය ප්‍රකාශන කට්ටලය මත විගණකගේ වාර්තාවේ ඇතුලත් වන්නේ නම්:

(අ) ශ්‍රී.ලං.වි.ප්‍ර. 705 (සංශෝධිත) සමඟ අනුකූල වන විකරණය කළ මතයක්;[9]

(ආ) ශ්‍රී.ලං.වි.ප්‍ර. 706 (සංශෝධිත) සමඟ අනුකූලවන කරුණ අවධාරණ කිරීමේ ඡේදය හෝ වෙනත් කරුණ ඡේදය;[10]

(ඇ) ශ්‍රී.ලං.වි.ප්‍ර. 570 (සංශෝධිත) සමඟ අනුකූලවන අඛණ්ඩ පැවැත්ම කොටසට සම්බන්ධිත ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක්;[11]

(ඈ) ශ්‍රී.ලං.වි.ප්‍ර. 701 ට සමඟ අනුකූලවන ප්‍රධාන විගණන කරුණු සන්නිවේදනය;[12] හෝ

(ඉ) ශ්‍රී.ලං.වි.ප්‍ර. 720 (සංශෝධිත) සමඟ අනුකූලවන වෙනත් තොරතුරුවල නිවැරදි නොකල ප්‍රමාණාත්මක අවප්‍රකාශයක් විස්තර කරන ප්‍රකාශයක්;[13]

තනි මූල්‍ය ප්‍රකාශනයක හෝ මූල්‍ය ප්‍රකාශනයක නිශ්චිත අයිතමයක විගණනය සහ ඒ මත විගණකගේ වාර්තාව සඳහා මෙම කරුණු තිබේ නම් විගණක ඇඟවීම් සැලකිය යුතුයි. (යොමුව අ 23-අ 27 ඡේද)

අස්තිත්වයේ සම්පූර්ණ මූල්‍ය ප්‍රකාශන කට්ටලය මත විගණකගේ වාර්තාවේ අහිතකර මතය හෝ මතය වියාචනය කිරීම.

15. සමස්තයක් ලෙස අස්තිත්වයේ සම්පූර්ණ මූල්‍ය ප්‍රකාශ කට්ටලය මත අහිතකර මතයක් හෝ මතය වියාචනය කිරීමක් ප්‍රකාශ කිරීමට අවශ්‍ය වන බව විගණක නිගමනය කරන්නේ නම් එම මූල්‍ය ප්‍රකාශවල කොටසක් තනි

[8] ශ්‍රී.ලං.වි.ප්‍ර. 700 (සංශෝධිත), *මූල්‍ය ප්‍රකාශන මත මතයක් සකස් කිරීම සහ වාර්තාකරණය*

[9] ශ්‍රී.ලං.වි.ප්‍ර. 705 (සංශෝධිත), ස්වාධීන විගණකගේ වාර්තාව මත මතය විකරණය කිරීම්

[10] ශ්‍රී.ලං.වි.ප්‍ර. 706 (සංශෝධිත) , *ස්වාධීන විගණකගේ වාර්තාවේ කරුණ අවධාරණ කිරීමේ ඡේදය හෝ වෙනත් කරුණ ඡේදය*

[11] ශ්‍රී.ලං.වි.ප්‍ර. 570 (සංශෝධිත), *අඛණ්ඩ පැවැත්ම,* 22 ඡේදය

[12] ශ්‍රී.ලං.වි.ප්‍ර. 701 , *ස්වාධීන විගණකගේ වාර්තාවේ ප්‍රධාන විගණන කරුණු සන්නිවේදනය,* 13 ඡේදය

[13] ශ්‍රී.ලං.වි.ප්‍ර. 720 (සංශෝධිත), *වෙනත් තොරතුරු සම්බන්ධයෙන් විගණකගේ වගකීම් ,* 22(ඉ)(ii)

මූල්‍ය ප්‍රකාශය මත හෝ එම මූල්‍ය ප්‍රකාශය නිශ්චිත මූලිකාංගයක විකරණය නොකළ මතයක් එම විගණකගේ වාර්තාවේ ඇතුලත් කිරීමට විගණකට ශ්‍රී.ලං.වි.ප්‍ර. 705 (සංශෝධිත), මගින් අවසර නොදේ.[14] එයට හේතු වන්නේ සමස්තයක් ලෙස අස්තිත්වයක සම්පූර්ණ මූල්‍ය ප්‍රකාශ කට්ටලය මත අහිතකර මතය හෝ මතය වියාචනය කිරීම, එවැනි විකරණය නොකල මතයක් සමස්තයක් ලෙස අස්තිත්වයක සම්පූර්ණ මූල්‍ය ප්‍රකාශන කට්ටලය මත අහිතකර මතය හෝ මතය වියාචනය කිරීම පරස්පර වන නිසාය. (යොමුව අ28 ඡේදය)

16. සමස්තයක් ලෙස අස්තිත්වයේ සම්පූර්ණ මූල්‍ය ප්‍රකාශන කට්ටලය මත අහිතකර මතය හෝ මතයක් වියාචනය කිරීමක් ප්‍රකාශ කිරීමට අවශ්‍ය වන බව විගණක නිගමනය කරන්නේ නම් නමුත් එම මූල්‍ය ප්‍රකාශනවල නිශ්චිත මූලිකාංගයක වෙනමම විගණනයක සම්බන්ධය තුල විගණක කෙසේ නමුත් එම මූලිකාංගය මත විකරණය නොකල මතයක් ප්‍රකාශ කිරීමට යෝග්‍ය වන බව සලකා බැලීමේදී පහත දෑ ඇත්නම් පමණක් විගණක එසේ කළ යුතුයි:

(අ) එසේ කිරීමෙන් නීතියෙන් හෝ රෙගුලාසි මගින් විගණක තහනම් නොකර තිබිම. ;

(ආ) අහිතකර මතයක් හෝ මතය වියාචනය කිරීමකින් සමන්විත විගණකගේ වාර්තාව සමග එකවර එම මතය ප්‍රකාශ කරන විගණකගේ වාර්තාව ප්‍රකාශයට පත් නොකිරීම;සහ

(ඇ) මෙම මූලිකාංගය අස්තිත්වයේ සම්පූර්ණ මූල්‍ය ප්‍රකාශන කට්ටලයේ ප්‍රධාන කොටසක්, සමන්විත නොවීම.

17. සමස්තයක් ලෙස සම්පූර්ණ මූල්‍ය ප්‍රකාශන කට්ටලය මත අහිතකර මතයක් හෝ මතය වියාචනය කිරීමක් විගණක ප්‍රකාශ කරන්නේ නම් සම්පූර්ණ මූල්‍ය ප්‍රකාශන කට්ටලයක් තනි මූල්‍ය ප්‍රකාශනයක් මත විකරණය නොකල මතයක් විගණක ප්‍රකාශ නොකල යුතුය. අහිතකර මතය හෝ මතය වියාචනය කිරීමකින් සමන්විත විගණකගේ වාර්තාව සමග එකවර තනි මූල්‍ය ප්‍රකාශනයක් මත විගණකගේ වාර්තාව ප්‍රකාශයට පත් කරන්නේ නම් වුවද මෙය අවස්ථාවකි. මෙසේ වන්නේ තනි මූල්‍ය ප්‍රකාශනයක්, එම මූල්‍ය ප්‍රකාශනවල ප්‍රධාන කොටසකින් සමන්විත වන ලෙස සලකන නිසාය.

***

## ව්‍යවහාර කිරීම සහ වෙනත් පහදා දීමේ දේවල්

**මෙම ශ්‍රී.ල.වි.ප්‍ර.යේ විෂය පථය** :(යොමුව: 1, 6(ඇ) ඡේදය)

අ1. ශ්‍රී.ල.වි.ප්‍ර. 200 "ඓතිහාසික මූල්‍ය තොරතුරු" යන පදය නිර්වචනය කරන්නේ විශේෂ අස්තිත්වයක, මූලික වශයෙන් අස්තිත්වයේ ගිණුම්කරණ පද්ධතියෙන් ලබාගන්නා පසුගිය කාලපරිච්ඡේද වලදී ඇතිවන්නා වූ ආර්ථික සිදුවීම් පිළිබඳව හෝ පසුගිය කාලපරිච්ඡේදවලදී අතීතයේ යම් මොහොතවල්වල ආර්ථික තත්ත්වයන් හෝ සිදුවීම් පිළිබඳව තොරතුරු මූල්‍ය භාෂිතය අනුව ප්‍රකාශ කිරීම ලෙසටයි.[15]

අ2. ශ්‍රී.ල.වි.ප්‍ර. 200 "මූල්‍ය ප්‍රකාශ" යන පදය නිර්වචනය කරන්නේ මූල්‍ය වාර්තාකරණ ආකෘතිමය රාමුව ප්‍රකාරව කාලපරිච්ඡේදයක් සඳහා යම් අවස්ථාවක අස්තිත්වයේ ආර්ථික සම්පත් හෝ බැඳීම් හෝ කාලපරිච්ඡේදයකදී ඒවායේ වෙනස්වීම් සන්නිවේදනය කිරීමට අපේක්ෂා කරන හෙළිදරව්කිරීම් ඇතුළත්ව ඓතිහාසික මූල්‍ය තොරතුරු ව්‍යුහගත නියෝජනය කිරීමක් ලෙසයි[16]. "මූල්‍ය ප්‍රකාශ" යන පදය සාමාන්‍යයෙන් හඳුන්වන්නේ අදාළ මූල්‍ය වාර්තාකරන ආකෘතිමය රාමුවේ අවශ්‍යතාවයන් මගින් නිර්ණය කරන පරිදි සම්පූර්ණ මූල්‍ය ප්‍රකාශන කට්ටලයක් නමුත් තනි මූල්‍ය ප්‍රකාශනයකටද එලෙස හැඳින් විය හැකිය. අදාළ මූල්‍ය වාර්තාකරන ආකෘතිමය රාමුව මගින් අවශ්‍ය කරන පරිදි නියම කල පැහැදිලිව අවසර දෙන හෝ වෙනත් අයුරකින් ඉඩදෙන මූල්‍ය ප්‍රකාශනයක මුහුණත මත හෝ සටහන් තුළ ඒ අනුව හරස් යොමු මගින් අන්ත ගත කල පහදාදීමේ හෝ විස්තරාත්මක තොරතුරුවලින් හෙළිදරව්කිරීම් සමන්විත වේ. 6(ඇ) ඡේදයේ සඳහන් පරිදි තනි මූල්‍ය ප්‍රකාශයකට හෝ මූල්‍ය ප්‍රකාශයක නිශ්චිත මූලිකාංගයකට යොමුව සම්බන්ධිත හෙළිදරව්කිරීම් ඇතුලත් කරයි.

අ3. ශ්‍රී.ල.වි.ප්‍ර. ලියා ඇත්තේ මූල්‍ය ප්‍රකාශන විගණනය[17] කිරීමේ පද සම්බන්ධය ඇතිවය. ඒවා තනි මූල්‍ය ප්‍රකාශනයක් හෝ මූල්‍ය ප්‍රකාශනයක නිශ්චිත මූලිකාංගයක් වැනි වෙනත් ඓතිහාසික මූල්‍ය තොරතුරුවල

---

[14] ශ්‍රී.ලං.වි.ප්‍ර. 705 (සංශෝධිත), 15 ඡේදය

[15] ශ්‍රී.ලං.වි.ප්‍ර. 200, 13(උ) ඡේදය

[16] ශ්‍රී.ලං.වි.ප්‍ර. 200, 13(ඊ) ඡේදය

[17] ශ්‍රී.ල.වි.ප්‍ර. 200 2 ඡේදය

විගණනයේදී ව්‍යවහාර කරනවිට ඒවා අවස්ථාවට සුදුසු පරිදි යොදාගත යුතුය. මෙම ශ්‍රී.ල.වි.ප්‍ර. මේ සම්බන්ධයෙන් සහාය වේ. (එවැනි වෙනත් ඓතිහාසික මූල්‍ය තොරතුරුවලට උදාහරණ, 1 වන පරිශිෂ්ටයේ ලැයිස්තුගත කෙරේ.)

අ4. ඓතිහාසික මූල්‍ය තොරතුරු විගණනය හැර සාධාරණ සහතිකවීම් කාර්යභාරයක්, සහතික වීම් කාර්යභාරයන් මත ශ්‍රී ලංකා ප්‍රමිතය සමග අනුකූලව ඉටුකරනු ලැබේ. (ශ්‍රී.ල.ස.කා.ප්‍ර. 3000) (සංශෝධිත).[18]

## කාර්යභාරය භාරගන්නා විට සැලකිල්ලට ගැනීම්

*ශ්‍රී.ල.වි.ප්‍ර. ව්‍යවහාරකරණය* (යොමුව : 7 ඡේදය)

අ5. (අ) මූල්‍ය ප්‍රකාශන විගණන කාර්යභාරයක් හා සම්බන්ධ ස්වාධීනත්වයට අයත් වන අදාළ ආචාරධර්ම අවශ්‍යතා ඇතුලුව සහ (ආ) විගණනයට අදාළ සියලු ශ්‍රී.ල.වි.ප්‍ර. සමග විගණක අනුකූලවීම, ශ්‍රී.ල.වි.ප්‍ර. 200 මගින් අවශ්‍ය කෙරේ. විගණනයේ පවතින තත්ත්වය අනුව සියලුම ශ්‍රී.ල.වි.ප්‍ර. අදාළ නොවන්නේ නම් හෝ එය කොන්දේසි සහිතවීම නිසා අවශ්‍යතා හා අදාළ නොවීම සහ කොන්දේසි නොපැවතීම වන්නේ නම් හැර විගණක ශ්‍රී.ල.වි.ප්‍ර. යක සෑම අවශ්‍යතාවයක් සමගම අනුකූල වීම අවශ්‍ය කෙරේ. ඉතා විරල අවස්ථාවන්හිදී, එම ශ්‍රී.ල.වි.ප්‍ර.යේ අවශ්‍යතාවයන්ගේ අභිප්‍රාය ඉටු කරගැනීම සඳහා විකල්ප විගණන ක්‍රියාපටිපාටි ඉටුකිරීම මගින් අදාළ ශ්‍රී.ල.වි.ප්‍ර.යේ අවශ්‍යතාවලින් බැහැරවීම අවශ්‍ය යයි විගණක විනිශ්චය කළහැකිය.[19]

අ6. විගණක අස්තිත්වයේ සම්පූර්ණ මූල්‍ය ප්‍රකාශ කට්ටලය විගණන කිරීමේ කාර්යභාරයේ නියුක්ත විටෙක තනි මූල්‍ය ප්‍රකාශනයක හෝ මූල්‍ය ප්‍රකාශනයක නිශ්චිත මූලිකාංගයක විගණනයට අදාළ ශ්‍රී.ල.වි.ප්‍ර. වල අවශ්‍යතා සමග අනුකූල වීම ප්‍රායෝගික නොවිය හැකිය. එවැනි අවස්ථාවලදී විගණකට අස්තිත්වයේ සම්පූර්ණ මූල්‍ය ප්‍රකාශන කට්ටලය විගණනය කරන විගණකට මෙන්, ඔහුට බොහෝවිට එහි අභ්‍යන්තර පාලනය ඇතුළුව, අස්තිත්වය සහ එහි පරිසරය පිළිබඳව ඒ හා සමාන අවබෝධයක් තිබිය නොහැකිය. අස්තිත්වයේ සම්පූර්ණ මූල්‍ය ප්‍රකාශන කට්ටලයක විගණනයේදී අත්පත් කරගෙන ඇති ගිණුම්කරණ තොරතුරු හෝ වෙනත් ගිණුම්කරණ වාර්තාවල පොදු ගුණත්වය පිළිබඳ විගණක සාක්ෂි විගණකට තිබිය නොහැකිය. ඒ අනුව, ගිණුම්කරණ වාර්තාවලින් අත්පත් කරගත් විගණන සාක්ෂි තහවුරු කිරීමට අතිරේඛ සාක්ෂි විගණකට අවශ්‍ය විය හැකිය. මූල්‍ය ප්‍රකාශනයක නිශ්චිත අයිතමයක විගණනයක අවස්ථාවකදී, එසේනම් ශ්‍රී.ලං.වි.ප්‍ර. විගණනය කරනු ලබන අයිතමයට සමානුපාතික නොවිය හැකි විගණන වැඩ අවශ්‍ය වියහැකිය. උදාහරණ ලෙස ශ්‍රී.ලං.වි.ප්‍ර. 570 (සංශෝධිත ) අවශ්‍යතාවයන් ලැබිය යුතු ගිණුම් උපලේඛනයක විගණනක අවස්ථාවන්හිදී අදාල විය හැකි වුවත් එම අවශ්‍යතාවයන් සමග අනුගත වීම අවශ්‍ය කෙරෙන විගණන ප්‍රයත්නය නිසා  ප්‍රායෝගික නොවිය හැකිය. ශ්‍රී.ලං.වි.ප්‍ර.යන් අනුව තනි මූල්‍ය ප්‍රකාශයක හෝ මූල්‍ය ප්‍රකාශනයක නිශ්චිත මූලිකාංගයක විගණනයක් ප්‍රායෝගික නොවන බව විගණක නිගමනය කරන්නේ නම් වෙනත් වර්ගයක කාර්යභාරය වඩාත් ප්‍රායෝගික වන්නේදැයි විගණක, කළමණාකරණය සමග සාකච්ඡා කල හැකිය

*මූල්‍ය වාර්තාකරණ ආකෘතිමය රාමුව පිළිගත හැකි වීම. (යොමුව : 8 ඡේදය)*

අ7. සම්පූර්ණ මූල්‍ය ප්‍රකාශ කට්ටලයක් (උදාහරණ ශ්‍රී.ලං.මු.වා.ප්‍ර. )  පිළියෙල කිරීම සඳහා බලයලත් හෝ පිළිගත හැකි ප්‍රමිත පිහිටවන ආයතනය මගින් පිහිටුවන ලබන මූල්‍ය වාර්තාකරණ ආකෘතිමය රාමුවක් මත පදනම්ව තනි මූල්‍ය ප්‍රකාශයක් හෝ මූල්‍ය ප්‍රකාශයක නිශ්චිත මූලිකාංගයක් අදාළ මූල්‍ය වාර්තාකරණ ආකෘතිමය රාමුවක් සමග අනුකූලව පිළියෙල කළ හැකිය. මෙවැනි අවස්ථාවකදී නම් අදාළ ආකෘතිමය රාමුවක් පිළිගත හැකි බව තීර්ණය කිරීම, ප්‍රමාණවත් හෙළිදරව් කිරීම් ලබාදෙන තනි මූල්‍ය ප්‍රකාශයක හෝ මූල්‍ය ප්‍රකාශනයක නිශ්චිත මූලිකාංගයක ඉදිරිපත් කිරීමට අදාල බවට පදනම් වන ආකෘතිමය රාමුවේ සියළුම අවශ්‍යතාවයන් එම ආකෘතිමය රාමුවේ ඇතුළත් දැයි සලකා බැලීම සම්බන්ධ විය හැකිය.

*මතයේ ස්වභාවය* (යොමුව 9 ඡේදය)

අ8. විගණක විසින් ප්‍රකාශ කළයුතු මතයේ ස්වභාවය, අදාළ මූල්‍ය වාර්තාකරණ ආකෘතිමය රාමුව සහ අදාළ ඕනෑම

[18] SLSAE 3000 (සංශෝධිත), *ඓතිහාසික මූල්‍ය තොරතුරුවල විගණනය හෝ සමාලෝචනය හැර සාධාරණ සහතිකවීම් කාර්යභාරයක්*
[19] ශ්‍රී.ල.වි.ප්‍ර. 200, 14, 18, සහ 22–23 ඡේද

වෙනත් නීති හෝ රෙගුලාසි මත රඳා පවතී [20] ශ්‍රී.ල .වි.ප්‍ර. 700 (සංශෝධිත) [21], ප්‍රකාරව:

(අ) සාධාරණ ඉදිරිපත් කිරීමේ ආකෘතිමය රාමුව සමග අනුකූලව පිළියෙල කළ සම්පූර්ණ මූල්‍ය කට්ටලයක් මත විකරණය නොකරන ලද මතයක් ප්‍රකාශ කරන විට විගණකගේ මතයේ නීතියෙන් හෝ රෙගුලාසිවලින් අවශ්‍ය කෙරෙන්නේ නම් හැර පහත සඳහන් වාක්‍ය ඛණ්ඩවලින් එකක් යොදාගැනේ :

(i) (අදාළ මූල්‍ය වාර්තාකරන ආකෘතිමය රාමුව සමග අනුකූලව) මූල්‍ය ප්‍රකාශන සියලු ප්‍රමාණාත්මක අංගයන්ගෙන් සාධාරණ අන්දමින් ඉදිරිපත් කරයි.; හෝ

(ii) (අදාළ මූල්‍ය වාර්තාකරණ ආකෘතිමය රාමුව සමග අනුකූලව) මූල්‍ය ප්‍රකාශ සත්‍ය හා සාධාරණ දර්ශනයක් ගෙනහැර දක්වයි; සහ

(ආ) අනුකූලතා ආකෘතිමය රාමුව සමග අනුකූලව පිළියෙල කළ සම්පූර්ණ මූල්‍ය ප්‍රකාශන කට්ටලයක් මත විකරණය නොකළ මතයක් ප්‍රකාශ කරන විට සියලුම ප්‍රමාණාත්මක අංගයන්ගෙන් මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇත්තේ (අදාළ මූල්‍ය වාර්තාකරණ ආකෘතිමය රාමුව) සමග අනුකූලව බව විගණකගේ මතයේ සඳහන් වේ

අ9. තනි මූල්‍ය ප්‍රකාශනයක හෝ මූල්‍ය ප්‍රකාශනයක නිශ්චිත මූලිකාංගයක් වන අවස්ථාවක අදාළ මූල්‍ය වාර්තාකරණ ආකෘතිමය රාමුව මූල්‍ය ප්‍රකාශයේ හෝ මූල්‍ය ප්‍රකාශයක නිශ්චිත මූලිකාංගය හෝ මූල්‍ය ප්‍රකාශයක ඉදිරිපත් කිරීමේදී පැහැදිලිව අවධානය යොමු නොවිය හැකිය. මෙවැනි අවස්ථාවන් විය හැකි වන්නේ අදාළ මූල්‍ය වාර්තාකරණ ආකෘතිමය රාමුව පදනම් වී ඇත්තේ සම්පූර්ණ මූල්‍ය ප්‍රකාශන කට්ටලයන් පිළියෙළ කිරීම සඳහා බලයලත් හෝ පිළිගත් ප්‍රමිත පිහිටුවීමේ ආයතනයක් ස්ථාපනය කරන ලද මූල්‍ය වාර්තා කරන ආකෘතිමය රාමුව මත වන විටය (උදාහරණ ලෙස ශ්‍රී.ලං.ගි.ප්‍ර.). එබැවින් අදාළ මූල්‍ය වාර්තාකරණ ආකෘතිමය රාමුව සැලකිල්ලට ගෙන කරුණු මත අපේක්ෂිත ආකාරයේ මතයක් යෝග්‍යදැයි විගණක සලකා බැලිය යුතුය. විගණකගේ සලකා බැලීමට බලපෑ හැකි කරුණු වන්නේ විගණකගේ මතයේ ඇතුළත් "සියළු ප්‍රමාණාත්මක අංගයන්ගෙන් සාධාරණව ඉදිරිපත් කරයි" හෝ "සත්‍ය හා සාධාරණ දර්ශනයක් ගෙන හැර දක්වයි" යන වාක්‍ය ඛණ්ඩය භාවිත කළ යුතුද යන වගය:

- අදාළ මූල්‍ය වාර්තාකරණ ආකෘතිමය රාමුව, ඉතා පැහැදිලිව හෝ ව්‍යංගව සම්පූර්ණ මූල්‍ය ප්‍රකාශ කට්ටලයක් පිළියෙල කිරීම සීමා කරන්නේද යන වග.
- තනි මූල්‍ය ප්‍රකාශයක් හෝ මූල්‍ය ප්‍රකාශයක නිශ්චිත මූලිකාංගය:
  - ○ විශේෂිත මූල්‍ය ප්‍රකාශයේ හෝ විශේෂිත මූලිකාංගයට අදාළ ආකෘතිමය රාමුවේ එන සෑම අවශ්‍යතාවයන්ට සම්පූර්ණයෙන්ම අනුකූලවීම සහ මූල්‍ය ප්‍රකාශනයක හෝ මූල්‍ය ප්‍රකාශනයක නිශ්චිත මූලිකාංගයක ඉදිරිපත් කිරීම සම්බන්ධිත හෙළිදරව් කිරීම ඇතුළත් කිරීම.
  - o ආකෘතිමය රාමුව මගින් නිශ්චිතව අවශ්‍ය කෙරෙන දැට ඔබ්බෙන් හෙළිදරව් කිරීම ලබාදී සාධාරණ ඉදිරිපත් කිරීමක් අත්කර ගැනීමට අවශ්‍ය වේ නම් හෝ සුවිශේෂී අවස්ථාවලදී ආකෘතිමය රාමුවේ අවශ්‍යතාවලින් බැහැර වීම.

මතයේ අපේක්ෂිත ස්වභාවයේ කුමක් වියයුතුද යන්න පිළිබඳව විගණකගේ තීරණය වෘත්තිය විනිශ්චයට අයත් කරුණකි. එය විශේෂ අධිකරණ බල ප්‍රදේශයක පොදුවේ පිළිගත් සාධාරණ ඉදිරිපත් කිරීමේ ආකෘතිමය රාමුව සමග අනුකූලව පිළියෙල කළ තනි මූල්‍ය ප්‍රකාශයක හෝ මූල්‍ය ප්‍රකාශයක නිශ්චිත මූලිකාංගයක විගණකගේ මතය තුල "සියළුම ප්‍රමාණාත්මක අංගයන්ගෙන් සාධාරණ ලෙස ඉදිරිපත් කෙරේ" හෝ එය "සත්‍ය හා සාධාරණ දර්ශනයක් පෙන්නුම් කෙරේ" වැනි වැකිකඩ භාවිත කළයුතුදැයි යන්න පිළිබඳව බලපෑමක් ඇතිවිය හැකිය.

**විගණනය සැලසුම් කිරීමේදී සහ ඉටු කිරීමේදී සැලකිල්ලට ගැනීම** (යොමුව : 10 ඡේදය)

අ10. සෑම ශ්‍රී.ල.වි.ප්‍ර.ය කටම අදාළත්වය ඉතා පරෙස්සමින් සලකා බැලිම අවශ්‍ය කෙරේ. මූල්‍ය ප්‍රකාශයක නිශ්චිත මූලිකාංගයක් විගණනයේ විෂයය පමණක් වුවත් අවස්ථාවක වුවද ශ්‍රී.ල.වි.ප්‍ර. 240[22], ශ්‍රී.ල.වි.ප්‍ර. 550[23] සහ

---

[20] ශ්‍රී.ල.වි.ප්‍ර. 200 , 8 ඡේදය

[21] ශ්‍රී.ල.වි.ප්‍ර. 700 (සංශෝධිත), 25–26 ඡේද

[22] ශ්‍රී.ල.වි.ප්‍ර. 240, "*මූල්‍ය ප්‍රකාශන විගණනය කිරීමේදී වංචාවකට අදාළ විගණකගේ වගකීම*

[23] ශ්‍රී.ල.වි.ප්‍ර. 550, *සම්බන්ධිත පාර්ශ්වයන්*

ශ්‍රී.ල.වි.ප්‍ර. 570 (සංශෝධිත) වැනි ශ්‍රී.ල.වි.ප්‍ර. මූලධර්මය වශයෙන් අදාළ වේ. මෙයට හේතුවන්නේ වංචාවක ප්‍රතිඵලයක් ලෙස, සම්බන්ධිත පාර්ශ්වවල ගනුදෙනුවල බලපෑම, හෝ අදාළ මූල්‍ය වාර්තාකරණ ආකෘතිමය රාමුව යටතේ ගිණුම්කරනයේ අඛණ්ඩ පැවැත්ම පදනම වැරදි ලෙස ව්‍යවහාර කිරීම නිසා මූලිකාංගය අවප්‍රකාශනය වීමට හැකිවීම නිසාය.

අ11. ශ්‍රී.ලං.වි.ප්‍ර. 260 (සංශෝධිත) මගින් අස්තිත්ත්වයේ පාලන ව්‍යුහය තුළ සන්නිවේදනය කළයුත්තේ[24]කුමන යොග්‍ය පුද්ගලයා(යන්) සමගදැයි නිර්ණය කිරීමට විගණකට අවශ්‍ය කෙරේ. සමහර අවස්ථාවලදී , පාලනය පිළිබද වග කිව යුතු සියළුම දෙනා අස්තිත්ත්වය කළමණාකාරණය කිරීමේදී සහභාගි වන බව සහ සන්නිවේදන අවශ්‍යතායන්වල ව්‍යවහාරය මෙම තත්ත්වය හඳුනාගැනීමට[25] සංශෝධනය කරන බව ශ්‍රී.ලං.වි.ප්‍ර. 260 (සංශෝධිත) හි සදහන් වේ. අස්තිත්ත්වය විසින් එලෙසම සම්පූර්ණ මූල්‍ය ප්‍රකාශ කට්ටලයක් පිළියෙල කරන විට තනි මූල්‍ය ප්‍රකාශය හෝ මූලිකාංගය පිළියෙල කිරීම අධීක්ෂණය කිරීමට වගකිව යුතු එම පුද්ගලයා(යන්) සම්පූර්ණ මූල්‍ය ප්‍රකාශ කට්ටලයක් පිළියෙල කිරීම අධීක්ෂණය කිරීමට වග කිව යුතු පුද්ගලයන් එකම පුද්ගලයන් නොවිය හැකිය.

අ12. තවදුරටත් ශ්‍රී.ලං.වි.ප්‍ර.යන් ලියා ඇත්තේ මූල්‍ය ප්‍රකාශ විගණනයක් සම්බන්ධයෙන් වන අතර ඒවා තනි මූල්‍ය ප්‍රකාශයක හෝ මූල්‍ය ප්‍රකාශයක නිශ්චිත මූලිකාංගයක විගණනයට ව්‍යවහාර කිරීමේදී තත්ත්වයන්වලදී අවශ්‍ය ලෙස යොදාගනියි.[26] උදාහරණ ලෙස සම්පූර්ණ මූල්‍ය ප්‍රකාශ කට්ටලය පිළිබද කළමනාකරණයෙන් ලිඛිත නියෝජනයන් අදාළ මූල්‍ය වාර්තාකරණ ආකෘතිමය රාමුව අනුව මූල්‍ය ප්‍රකාශයේ හෝ මූලිකාංගයේ ඉදිරිපත් කිරීම පිළිබද ලිඛිත නියෝජනයන් මගින් ආදේශ කෙරේ.

අ13. සම්පූර්ණ මූල්‍ය ප්‍රකාශ කට්ටලයක් මත විගණකගේ වාර්තාවේ ඇතුලත් කරුණු, තනි මූල්‍ය ප්‍රකාශයක හෝ මූල්‍ය ප්‍රකාශයක මූලිකාංගයක විගණනය සඳහා අගවනු ලැබිය හැකිය. (14 ඡේදය බලන්න) අස්තිත්ත්වයේ සම්පූර්ණ මූල්‍ය ප්‍රකාශ කට්ටලයක විගණයක් සම්බන්ධයෙන් තනි මූල්‍ය ප්‍රකාශනයක හෝ මූල්‍ය ප්‍රකාශයක නිශ්චිත මූලිකාංගයක විගණනයක් සැලසුම් කිරීමේදී සහ ඉටුකිරීමේදී මූල්‍ය ප්‍රකාශයේ හෝ මූලිකාංගයේ විගණනය තුළ අස්තිත්ත්වයේ සම්පූර්ණ මූල්‍ය ප්‍රකාශන කට්ටලයේ විගණනයේ කොටසක් ලෙස ලබාගත් විගණන සාක්ෂි භාවිතා කිරීමට විගණකට ලබා ගැනීමට හැකිය. ශ්‍රී.ලං.වි.ප්‍ර.යන් කෙසේ වෙතත් මූල්‍ය ප්‍රකාශය මත හෝ මූලිකාංගය මත මතයට පදනම් වන ප්‍රමාණවත් යෝග්‍ය විගණන සාක්ෂි ලබා ගැනීමට මූල්‍ය ප්‍රකාශයේ හෝ මූලිකාංගයේ විගණනය සැලසුම් කිරීමට හෝ ඉටුකිරීමට විගණකට අවශ්‍ය කෙරේ

අ14. සම්පූර්ණ මූල්‍ය ප්‍රකාශන කට්ටලයක් සමන්විත තනි මූල්‍ය ප්‍රකාශනවලින් සහ එම මූල්‍ය ප්‍රකාශනවල සම්බන්ධිත හෙළිදරව් කිරීම ඇතුලුව එම මූල්‍ය ප්‍රකාශනවල බොහෝ නිශ්චිත මූලිකාංගයන් අන්තර් සම්බන්ධිත වේ. එබැවින් තනි මූල්‍ය ප්‍රකාශනයක් හෝ මූල්‍ය ප්‍රකාශනයක නිශ්චිත මූලිකාංගයක් විගණනය කරන විට මූල්‍ය ප්‍රකාශනය හෝ මූලිකාංගය හුදකලාව විගණක සැලකිය නොහැක. ප්‍රතිඵලයක් ලෙස විගණනයේ අරමුණ ඉෂ්ට කර ගැනීමට එකිනෙකට සම්බන්ධිත අයිතම සම්බන්ධයෙන් විගණක පටිපාටි ඉටු කිරීමට අවශ්‍ය විය හැකිය.

අ15. තවද තනි මූල්‍ය ප්‍රකාශනයක් සඳහා හෝ මූල්‍ය ප්‍රකාශනයක නිශ්චිත මූලිකාංගයක් සඳහා නිර්ණය කරන ප්‍රමාණාත්මකභාවය අස්තිත්ත්වයේ සම්පූර්ණ මූල්‍ය ප්‍රකාශන කට්ටලයක් සඳහා නිර්ණය කරන ප්‍රමාණාත්මකභාවයට වඩා අඩුවිය හැකිය. මෙය විගණන ක්‍රියාපටිපාටිවල ස්වභාවය, කාල නිර්ණය හා ප්‍රමාණයට සහ නිවැරදි නොකරන ලද අවප්‍රකාශන ඇගැයීමට බලපානු ලැබේ.

**මතයක් සකස්කිරිමේදී සහ වාර්තාකරණයේදී සැලකිල්ලට ගැනීම් (යොමුව : 11 ඡේදය)**

අ16. මූල්‍ය ප්‍රකාශ තුළ පළකර ඇති තොරතුරු මත ප්‍රමාණාත්මක ගණුදෙණු සහ සිද්ධිවල බලපෑ අපේක්ෂිත පරිශීලකයන්ට අවබෝධ කර ගැනීමට හැකිවන ලෙස ප්‍රමාණවත් හෙළිදරව් කිරීම් මූල්‍ය ප්‍රකාශන ලබා දෙන්නේදැයි ඇගැයීමට මතයක් සකස් කිරීමේදී ශ්‍රී.ල.වි.ප්‍ර. 700 (සංශෝධිත) මගින් විගණකට අවශ්‍ය කෙරේ.[27]තනි මූල්‍ය ප්‍රකාශයක හෝ මූල්‍ය ප්‍රකාශනයක නිශ්චිත මූලිකාංගයක් අදාල මූල්‍ය වාර්තාකරණ ආකෘතිමය රාමුවේ අවශ්‍යතාවයන් සැලකිල්ලට ගැනිමේදී මූල්‍ය ප්‍රකාශයක හෝ මූලිකාංගයක පළකල

[24] ශ්‍රී.ල.වි.ප්‍ර. 260 (සංශෝධිත), *පාලනය පිළිබද වග කිව යුතු අය සමග සන්නිවේදනය,* 11 ඡේදය

[25] ශ්‍රී.ල.වි.ප්‍ර. 260 (සංශෝධිත), 10(ආ) ඡේදය, 13, අ1 (තුන්වන ලකුණ), අ 2 සහ අ 8

[26] ශ්‍රී.ල.වි.ප්‍ර. 200, 2 වන ඡේදය.

[27] ශ්‍රී.ලං.වි.ප්‍ර. 700 (සංශෝධිත), 13(ඉ) ඡේදය

තොරතුරු මත ප්‍රමාණාත්මක ගණුදෙණු සහ සිද්ධිවල බලපෑම අපේක්ෂිත පරිශීලකයන්ට අවබෝධ කර ගැනීමට හැකියාව ලබාදීමට මූල්‍ය ප්‍රකාශය හෝ මූලිකාංගය ප්‍රමාණවත් හෙළිදරව් කිරීම් ලබාදීම වැදගත් වේ.

අ17. තනි මූල්‍ය ප්‍රකාශයක් මත සහ මූල්‍ය ප්‍රකාශයක නිශ්චිත මූලිකාංගයක් මත ස්වාධීන විගණකගේ වාර්තා සඳහා නිදර්ශන 2 වන පරිශිෂ්ටයේ අඩංගු වේ. විගණකගේ වාර්තාවල වෙනත් නිදර්ශනයන්, තනි මූල්‍ය ප්‍රකාශනයක් මත හෝ මූල්‍ය ප්‍රකාශයක නිශ්චිත මූලිකාංගයක් මත වාර්තා කිරීමට අදාල විය හැකිය. (උදාහරණ :- ශ්‍රී.ලං.වි.ප්‍ර.700 (සංශෝධිත), ශ්‍රී.ලං.වි.ප්‍ර.705 (සංශෝධිත), ශ්‍රී.ලං.වි.ප්‍ර. 570 (සංශෝධිත), ශ්‍රී.ලං.වි.ප්‍ර. 720 (සංශෝධිත) සහ ශ්‍රී.ලං.වි.ප්‍ර. 706 (සංශෝධිත) වලට පරිශිෂ්ඨයන් බලන්න)

*තනි මූල්‍ය ප්‍රකාශයක් හෝ මූල්‍ය ප්‍රකාශයක නිශ්චිත මූලිකාංගයක් මත වාර්තා කරන විට ශ්‍රී.ලං.වි.ප්‍ර. 700 (සංශෝධිත) හි ව්‍යවහාර කිරීම*

අ18. තනි මූල්‍ය ප්‍රකාශනයක් මත හෝ මූල්‍ය ප්‍රකාශනයක නිශ්චිත මූලිකාංගයක් මත මතයක් සකස් කිරීමේදී සහ වාර්තා කිරීමේදී කාර්යභාරයේ තත්ත්වයන් තුළ අවශ්‍ය ලෙස අනුගමනය කළ ශ්‍රී.ලං.වි.ප්‍ර. 700(සංශෝධිත) අවශ්‍යතාවයන් ව්‍යවහාර කිරීමට විගණකට අවශ්‍ය වන බව මෙම ශ්‍රී.ලං.වි.ප්‍ර. යේ 11 ඡේදය, විස්තර කරයි. එසේ කිරීමේදී, කාර්යභාරයන්වල තත්ත්වයන්හිදී අවශ්‍යවන අනුගමනය කළ වෙනත් ශ්‍රී.ලං.වි.ප්‍ර. තුළ අවශ්‍යතාවයන් වාර්තාකරණය ව්‍යවහාර කිරීමටද විගණකට අවශ්‍ය විය හැකි අතර මෙහි පහත අ19 - අ21 ඡේදවල ආමන්ත්‍රණය කළ සලකා බැලීම් උපකාර වන බව දැකිය හැකිය.

අඛණ්ඩ පැවැත්ම

අ19. තනි මූල්‍ය ප්‍රකාශනයක් හෝ මූල්‍ය ප්‍රකාශනයක නිශ්චිත මූලිකාංගයක් පිළියෙල කිරීමේදී භාවිතා කළ අදාල මූල්‍ය වාර්තාකරණ ආකෘතිමය රාමුව මත පදනම්ව, අඛණ්ඩ පැවැත්ම සම්බන්ධයෙන් කළමණාකරනයේ වගකීම්වල [28] විගණකගේ වාර්තාවේ විස්තරය අවශ්‍ය ලෙස යොදා ගැනීම අවශ්‍ය විය හැකිය. විගණකගේ වගකීම්වල[29] විගණකගේ වාර්තාවේ විස්තරය, කාර්යභාරයේ තත්ත්වයන් තුළ ශ්‍රී.ලං.වි.ප්‍ර. 570 (සංශෝධිත) ව්‍යවහාර කරන්නේ කෙසේ දැයි මත පදනම්ව අවශ්‍ය ලෙස යොදාගැනීම අවශ්‍ය විය හැකිය.

ප්‍රධාන විගණන කරුණු

අ20. ලැයිස්තුගත අස්තිත්ත්වයන්ගේ පොදු අරමුණු සඳහා වූ මූල්‍ය ප්‍රකාශනවල සම්පූර්ණ කට්ටලය විගණනය සඳහා ශ්‍රී.ලං.වි.ප්‍ර. 701 අනුව ප්‍රධාන විගණන කරුණු සංනිවේදනය කිරීමට ශ්‍රී.ලං.වි.ප්‍ර. 700 (සංශෝධිත) මගින් විගණකට අවශ්‍ය කෙරේ. තනි මූල්‍ය ප්‍රකාශනයක හෝ මූල්‍ය ප්‍රකාශයක නිශ්චිත මූලිකාංගයක විගණනයන් සඳහා එවැනි මූල්‍ය ප්‍රකාශන මත හෝ මූලිකාංග මත විගණකගේ වාර්තාවේ ප්‍රධාන විගණන කරුණු සන්නිවේදනය කිරීම නීතිය හෝ රෙගුලාසි මගින් අවශ්‍ය කරන විට හෝ එසේ නැත්නම් විගණක ප්‍රධාන විගණන කරුණු සන්නිවේදනය කිරීමේදී තීරණය කරන විට ශ්‍රී.ලං.වි.ප්‍ර. 701 පමණක් ව්‍යවහාර කෙරේ.[30] තනි මූල්‍ය ප්‍රකාශනයක හෝ මූල්‍ය ප්‍රකාශනයක නිශ්චිත මූලිකාංගයක විගණකගේ වාර්තාවේ ප්‍රධාන විගණන කරුණු සන්නිවේදනය කරන විට ශ්‍රී.ලං.වි.ප්‍ර. 701හි සමස්ථයට ව්‍යවහාර කරයි.[31]

වෙනත් තොරතුරු

අ21. වෙනත් තොරතුරු සම්බන්ධයෙන් විගණකගේ වගකීම් සමග ශ්‍රී.ලං.වි.ප්‍ර. 720 (සංශෝධිත) මගින් කටයුතු කෙරේ. මෙම ශ්‍රී.ලං.වි.ප්‍ර. සම්බන්ධය තුල තනි මූල්‍ය ප්‍රකාශනයක හෝ මූල්‍ය ප්‍රකාශනයක නිශ්චිත මූලිකාංගයකින් සමන්විත හෝ කැටුව එන වාර්තා තනි මූල්‍ය ප්‍රකාශනයක් හෝ මූල්‍ය ප්‍රකාශනයක නිශ්චිත මූලිකාංගයේ ඉදිරිපත් කළ කරුණු මත තොරතුරු අයිතිකරුවන්ට (හෝ සමාන ඇල්මැති පාර්ශවයන්) ලබාදීමේ අරමුණින් ශ්‍රී.ලං.වි.ප්‍ර. 720 (සංශෝධිත) අරමුණු සඳහා වාර්ෂික වාර්තා ලෙස ද සලකනු ලැබේ. එවැනි වාර්තාවක් නිකුත්කිරීමට අස්තිත්ත්වය සැලසුම් කරන බව විගණක නිර්ණය කරන විට ශ්‍රී.ලං.වි.ප්‍ර.720 (සංශෝධිත)හි අවශ්‍යතාවයන් තනි මූල්‍ය ප්‍රකාශයක හෝ මූලිකාංගයේ විගණනයට ව්‍යවහාර කරයි.

[28] ශ්‍රී.ලං.වි.ප්‍ර. 700 (සංශෝධිත), 34(ආ) සහ අ48 ඡේද බලන්න.

[29] ශ්‍රී.ලං.වි.ප්‍ර. 700 (සංශෝධිත), 39(ආ)(iv) ඡේදය බලන්න.

[30] ශ්‍රී.ලං.වි.ප්‍ර. 700 (සංශෝධිත), 30ඡේදය

[31] ශ්‍රී.ලං.වි.ප්‍ර. 700 (සංශෝධිත), 31ඡේදය

කාර්යභාරයේ නියුතු හවුල්කරුගේ ශ්‍රී ලංකා වරලත් ගණකාධිකරණ ආයතනයේ සාමාජික අංකය

අ22. විගණකගේ වාර්තාවේ කාර්යභාරයේ නියුතු හවුල්කරුගේ ශ්‍රී ලංකා වරලත් ගනකාධිකරණ ආයතනයේ සාමාජික අංකය ඇතුලත් කිරීමට විගණක සඳහා ශ්‍රී.ලං.වි.ප්‍ර. 700 (සංශෝධිත)හි අවශ්‍යතාවය, එසේම ලැයිස්තුගත අස්තිත්ත්වයන්වල[32] තනි මූල්‍ය ප්‍රකාශ හෝ ලැයිස්තු ගත අස්තිත්ත්වයන්වල මූල්‍ය ප්‍රකාශවල නිශ්චිත මූලිකාංග විගණනයන්ට ව්‍යවහාර කරයි. විගණකගේ වාර්තාවේ කාර්යභාරයේ නියුතු හවුල්කරුගේ ශ්‍රී ලංකා වරලත් ගණකාධිකරණ සාමාජික අංකය ඇතුලත් කිරීමට විගණකට නීතියෙන් හෝ රෙගුලාසි මගින් අවශ්‍ය කරයි එසේ නැත්නම් ලැයිස්තුගත හැර අන් අස්තිත්වයන්වල තනි මූල්‍ය ප්‍රකාශයක් මත හෝ මූල්‍ය ප්‍රකාශනයක මූලිකාංගයක් මත වාර්තා කිරීමේදී එසේ කිරීමට විගණකට තීරණය කළ හැකිය.

*අස්තිත්ත්වයේ සම්පූර්ණ මූල්‍ය ප්‍රකාශන කට්ටලය මත සහ තනි මූල්‍ය ප්‍රකාශයක හෝ මූල්‍ය ප්‍රකාශයක නිශ්චිත මූලිකාංගය මත වාර්තාකරණය. (යොමුව: 14ඡේදය)*

තනි මූල්‍ය ප්‍රකාශයක හෝ මූල්‍ය ප්‍රකාශයක නිශ්චිත මූලිකාංගයක විගණනය සඳහා අස්තිත්වයේ සම්පූර්ණ මූල්‍ය ප්‍රකාශන කට්ටලය මත විගණකගේ වාර්තාවේ අඩංගු සමහර කරුණුවල ඇඟවීම් සලකා බැලීම සහ ඒ මත විගණකගේ වාර්තාව

අ23. යමක්වේද තනි මූල්‍ය ප්‍රකාශයක හෝ මූල්‍ය ප්‍රකාශයක නිශ්චිත මූලිකාංගයක විගණනය සඳහා සම්පූර්ණ මූල්‍ය ප්‍රකාශන කට්ට්ලය මත විගණකගේ වාර්තාවේ අඩංගු සමහර කරුණු සහ ඒ මත විගණක වාර්තාවේ ඇඟවීම් සලකා බැලීමට විගණකට 14 වන ඡේදයෙන් අවශ්‍ය කෙරේ. සම්පූර්ණ මූල්‍ය ප්‍රකාශ කට්ටලය මත විගණකගේ වාර්තාවේ ඇතුලත් කරුණක් තනි මූල්‍ය ප්‍රකාශයක් මත හෝ මූල්‍ය ප්‍රකාශනයක් නිශ්චිත මූලිකාංගයක් මත කාර්යභාරයක් සම්බන්ධයෙන් අදාල වන්නේ දැයි සලකා බැලීම වෘත්තීය විනිශ්චයට සම්බන්ධ කරගනී.

අ24. එම ඇඟවීම් සලකා බැලීමේදී අදාල විය හැකි සාධකවලට පහත දෑ ඇතුලත් වේ :

- සම්පූර්ණ මූල්‍ය ප්‍රකාශන කට්ටලය මත විගණකගේ වාර්තාවේ විස්තර කළ කරුණුවල ස්වභාවය සහ තනි මූල්‍ය ප්‍රකාශනයක හෝ මූල්‍ය ප්‍රකාශනයක නිශ්චිත මූලිකාංගයක ඇතුලත් කර ඇත්තේ කුමක් දැයි සම්බන්ධ වන ප්‍රමාණය.
- සම්පූර්ණ මූල්‍ය ප්‍රකාශන කට්ටලය මත විගණකගේ වාර්තාවේ විස්තර කරන කරුණුවල පෘතුලබව.
- අදාල මූල්‍ය වාර්තාකරණ ආකෘතිමය රාමු අතරේ වෙනස්කම්වල ස්වභාවය සහ ප්‍රමාණය.
- කාලපරිච්ඡේදය (යන්) සසඳමින් සම්පූර්ණ මූල්‍ය ප්‍රකාශන කට්ටලය මගින් ආවරණය වන කාලපරිච්ඡේදය (යන්) අතරේ හෝ තනි මූල්‍ය ප්‍රකාශනයක හෝ මූල්‍ය ප්‍රකාශනයක මූලිකාංගය දිනයන් අතරේ වෙනසේ ප්‍රමාණය.
- සම්පූර්ණ මූල්‍ය ප්‍රකාශන කට්ටලය මත විගණකගේ වාර්තාවේ දින සිට කල් ගත වූ කාලය.

අ25. උදාහරණ ලෙස, සම්පූර්ණ මූල්‍ය ප්‍රකාශන කට්ටලය මත විගණකගේ වාර්තාවේ ලැබිය යුතු ගිණුම් සම්බන්ධයෙන් විගණකගේ මතයේ සීමා කිරීමක් තිබෙන අවස්ථාවක සහ තනි මූල්‍ය ප්‍රකාශනයක ලැබිය යුතු ගිණුම් ඇතුලත් වීම හෝ මූල්‍ය ප්‍රකාශනයක නිශ්චිත මූලිකාංගයේ ලැබිය යුතු ගිණුම්වලට සම්බන්ධ වීම, විගණනය සඳහා ඇඟවීම් තිබෙන බව බොහෝ විට සිදුවිය හැකිය. අනෙක් අතට සම්පූර්ණ මූල්‍ය ප්‍රකාශන කට්ටලය මත විගණකගේ මතය තත්ත්වාගණනය කිරීම, දිගු කාලීන ණය වර්ගීකරණයට සම්බන්ධ නම්, එවිට තනි මූල්‍ය ප්‍රකාශනයේ එනම් ආදායම් ප්‍රකාශයේ හෝ මූල්‍ය ප්‍රකාශයේ නිශ්චිත මූලිකාංගය, ලැබිය යුතු ගිණුම්වලට සම්බන්ධ නම් විගණනය සඳහා ඇඟවීම් තිබෙන බව බොහෝ විට අඩුවිය හැකිය.

අ26. සම්පූර්ණ මූල්‍ය ප්‍රකාශන කට්ටලය මත විගණකගේ වාර්තාවේ සන්නිවේදනය කරන ප්‍රධාන විගණන කරුණු, තනි මූල්‍ය ප්‍රකාශනයක හෝ මූල්‍ය ප්‍රකාශනයේ නිශ්චිත මූලිකාංගයේ විගණනයක් සඳහා ඇඟවීම් තිබිය හැකිය. සම්පූර්ණ මූල්‍ය ප්‍රකාශන කට්ටලයේ විගණනයේ කරුණ ඇමතුවේ කෙසේ දැයි පිළිබඳ ප්‍රධාන විගණන කරුණු කොටසේ ඇතුලත් තොරතුරු, තනි මූල්‍ය ප්‍රකාශයක හෝ මූල්‍ය ප්‍රකාශනයක නිශ්චිත මූලිකාංගයක විගණනයට අදාල වන විට කරුණ අමතන්නේ කෙසේ දැයි විගණගේ නිශ්වය කිරීම ප්‍රයෝජනවත් විය හැකිය.

සම්පූර්ණ මූල්‍ය ප්‍රකාශන කට්ටලය මත විගණකගේ වාර්තාවට යොමුවක් ඇතුලත් කිරීම.

[32] ශ්‍රී.ලං.වි.ප්‍ර. 700 (සංශෝධිත), 46 සහ අ61–අ63 ඡේද බලන්න.

අ27. සම්පූර්ණ මූල්‍ය ප්‍රකාශන කට්ටලය මත විගණකගේ වාර්තාවේ ඇතුලත් කල යුතු එක්තරා කරුණු විගණනය සඳහා හෝ තනි මූල්‍ය ප්‍රකාශයක හෝ මූල්‍ය ප්‍රකාශයක හෝ නිශ්චිත මූලිකාංගයක් මත විගණකගේ වාර්තාව සඳහා ඇඟවීම් නොතිබෙන විට වුවත්, විගණක තනි මූල්‍ය ප්‍රකාශය මත හෝ මූල්‍ය ප්‍රකාශයක නිශ්චිත මූලිකාංගය මත විගණකගේ වාර්තාවේ වෙනත් කරුණු ඡේදයේ කරුණ (ණු) යොමු කිරීමට යෝග්‍ය වියහැකි ලෙස සැලකිය හැකිය (ශ්‍රී.ලං.වි.ප්‍ර. 706 (සංශෝධිත) [33]බලන්න). උදාහරණ ලෙස සම්පූර්ණ මූල්‍ය ප්‍රකාශන කට්ටලය මත විගණකගේ වාර්තාවේ ඇතුලත් අඛණ්ඩ පැවැත්මට කොටසේ සම්බන්ධ ප්‍රමාණවත් අනියතතාවයකට තනි මූල්‍ය ප්‍රකාශයක හෝ මූල්‍ය ප්‍රකාශයක නිශ්චිත මූලිකාංගයක් මත විගණකගේ වාර්තාව තුල යොමු කිරීමට යෝග්‍ය වන ලෙස විගණක සැලකිය හැකිය.

අස්තිත්ත්වයේ සම්පූර්ණ මූල්‍ය ප්‍රකාශන කට්ටලය මත විගණකගේ වාර්තාව මත අහිතකර මතය හෝ මත වියාචනය කිරීම (*යොමුව: 15* ඡේදය)

අ28. අස්තිත්ත්වයේ සම්පූර්ණ මූල්‍ය ප්‍රකාශන කට්ටලය මත විගණකගේ වාර්තාව තුල, අදාල වන අවස්ථාවක මෙහෙයුම්වල සහ මුදල් ප්‍රවාහවල ප්‍රතිඵල සම්බන්ධයෙන් මතය වියාචනය ප්‍රකාශ කිරීම සහ මූල්‍ය තත්ත්වය සම්බන්ධයෙන් විකරණය නොකළ මතයක් ප්‍රකාශ කිරීම, මෙහෙයුම් සහ මුදල් ප්‍රවාහවල ප්‍රතිඵල පමණක් සම්බන්ධයෙන් මතය වියාචනය කිරීම නිකුත් කරන නිසා සහ සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් නොවන නිසා අවසර දේ.[34]

## 1 වන පරිශිෂ්ටය

(යොමුව : අ3 ඡේදය)

**මූල්‍ය ප්‍රකාශයක නිශ්චිත මූලිකාංගයන්, ගිණුම් හෝ අයිතම් සඳහා උදාහරණ**

- සම්බන්ධිත සටහන් ඇතුළුව ලැබිය යුතු ගිණුම්, ලැබිය යුතු අඩමාන ණය ගිණුම් සඳහා දීමනා, තොග, පුද්ගලික විශ්‍රාම වැටුප් සැලසුමක උපචිත ප්‍රතිලාභ සඳහා වගකීම, හඳුනාගත් අස්පෘශ්‍ය වත්කම්වල වාර්තා වී ඇති වටිනාකම හෝ රක්ෂණ කළඹක හිමිකම් "දරන ලද එහෙත් වාර්තා වී නැති" වගකීම්.
- සම්බන්ධිත සටහන් ඇතුළුව, බාහිරව කළමනාකරණය කරනු ලබන පුද්ගලික විශ්‍රාම වැටුප් සැලැස්මක වත්කම් සහ ආදායම්වල උපලේඛනයක්.
- සම්බන්ධිත සටහන් ඇතුළුව ශුද්ධ ස්පෘශ්‍ය වත්කම්වල උපලේඛනයක්.
- පැහැදිලි කිරීමේ සටහන් ද ඇතුළුව, කල්බදු දේපළක් සම්බන්ධයෙන් ගෙවීම් උපලේඛනයක්.
- පැහැදිලි කිරීමේ සටහන් ද ඇතුළුව ලාභ සහභාගිත්ව සහ ප්‍රසාදදීමානා පිළිබඳව උපලේඛනයක්.

## 2 වන පරිශිෂ්ටය

(යොමුව : අ17 ඡේදය)

[33] ශ්‍රී.ලං.වි.ප්‍ර. 706 (සංශෝධිත), 10–11ඡේද බලන්න.
[34] ශ්‍රී.ලං.වි.ප්‍ර. 510, *පළමු විගණන කාර්යයභාරයන් —ආරම්භක ශේෂ, අ* 8 ඡේදය, සහ ශ්‍රී.ලං.වි.ප්‍ර. 705 (සංශෝධිත), *අ*16 ඡේදය

## තනි මූල්‍ය ප්‍රකාශයක් මත සහ මූල්‍ය ප්‍රකාශයක නිශ්චිත මූලිකාංගයක් මත ස්වාධීන විගණකගේ වාර්තාවලට නිදර්ශන

- 1 වන නිදර්ශනය : පොදු අරමුණු ආකෘතිමය රාමුව ප්‍රකාරව (මෙම නිදර්ශනයේ අරමුණ සඳහා සාධාරණ ඉදිරිපත් කිරීමේ ආකෘතිමය රාමුව) පිළියෙල කරන ලද ලැයිස්තු ගත නොවන අස්තිත්වයක තනි මූල්‍ය ප්‍රකාශනයක් මත විගණකගේ වාර්තාවක්.
- 2 වන නිදර්ශනය : විශේෂ අරමුණු ආකෘතිමය රාමුව ප්‍රකාරව (මෙම නිදර්ශනයේ අරමුණ සඳහා සාධාරණ ඉදිරිපත් කිරීමේ ආකෘතිමය රාමුව) පිළියෙල කරන ලද ලැයිස්තු ගත නොවන අස්තිත්ත්වයක තනි මූල්‍ය ප්‍රකාශනයක් මත විගණකගේ වාර්තාව.
- 3 වන නිදර්ශනය : විශේෂ අරමුණු ආකෘතිමය රාමුව ප්‍රකාරව (මෙම නිදර්ශනයේ අරමුණ සඳහා අනුකූලවීමේ ආකෘතිමය රාමුව) පිළියෙල කරන ලද ලැයිස්තු ගත අස්තිත්ත්වයක මූල්‍ය ප්‍රකාශනයක නිශ්චිත මූලිකාංගයක් මත විගණකගේ වාර්තාව.

**1 වන නිදර්ශනය: පොදු අරමුණු ආකෘතිමය රාමුව ප්‍රකාරව (මෙම නිදර්ශනයේ අරමුණ සඳහා සාධාරණ ඉදිරිපත් කිරීමේ ආකෘතිමය රාමුව) පිළියෙල කරන ලද ලැයිස්තු ගත නොවන අස්තිත්ත්වයක තනි මූල්‍ය ප්‍රකාශයක් මත විගණකගේ වාර්තාවක්**

**මෙම නිදර්ශනාත්මක විගණකගේ වාර්තාවේ අරමුණ සඳහා පහත සඳහන් තත්ත්වයන් උපකල්පනය කෙරේ.:**

- **ලැයිස්තුගත අස්තිත්වයන් හැර වෙනත් අස්තිත්ත්වයක මූල්‍ය තත්ත්ත්ව ප්‍රකාශයක් විගණනය කිරීම (එනම් තනි මූල්‍ය ප්‍රකාශනයක්).**
- **අස්තිත්වයේ ශේෂ පත්‍රයක් පිළියෙල කිරීමට අදාළ X අධිකරණ බල ප්‍රදේශයේ මූල්‍ය වාර්තාකරන ආකෘතිමය රාමුවේ අවශ්‍යතාවයන් ප්‍රකාරව අස්තිත්ත්වයේ කළමනාකරනය විසින් මූල්‍ය තත්ත්ත්ව ප්‍රකාශය පිළියෙල කර ඇත.**
- **ශ්‍රී.ලං.වි.ප්‍ර. 210හි මූල්‍ය ප්‍රකාශන සඳහා කළමනාකරනයේ වගකීම් විස්තරය, විගණන කාර්යයභාරයේ කොන්දේසිවල පිළිබිඹු වීම.**
- **පුළුල් පරාසයක පරිශීලකයින්ගේ පොදු මූල්‍ය තොරතුරු අවශ්‍යතාවයන් ඉෂ්ට කිරීමට සැලසුම් කළ අදාළ මූල්‍ය වාර්තාකරන ආකෘතිමය රාමුව වනුයේ සාධාරණ ඉදිරිපත් කිරීමේ ආකෘතිමය රාමුවකි.**
- **විගණකගේ මතය තුල "සියළුම ප්‍රමාණවත් අංගයන්ගෙන් සාධාරණව ඉදිරිපත් කර ඇත" යන වාක්‍ය ඛණ්ඩය භාවිතා කිරීමට එය යෝග්‍ය වන බව විගණක නිර්ණය කර ඇත.**
- **විගණනයට ව්‍යවහාර කරන අදාල ආචාරධර්ම අවශ්‍යතාවයන් *ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරි ආයතනය විසින් නිකුත් කළ ආචාර ධර්ම සංග්‍රහයේ* අඩංගු වේ.**
- **ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව, ශ්‍රී.ලං.වි.ප්‍ර. 570 (සංශෝධිත) අනුව අඛණ්ඩ පැවැත්ම ලෙස දිගටම පවත්වා ගෙන යාමේ අස්තිත්ත්වයේ හැකියාව මත සැලකිය යුතු අන්දමේ සැකයක් පැන නැගිය හැකි සිද්ධි සහ තත්ත්වයන්ට සම්බන්ධ ප්‍රමාණවත් අනියතතාවයක් පවතින බව විගණක නිගමනය කර ඇත.තනි මූල්‍ය ප්‍රකාශය තුල ප්‍රමාණාත්මක අනියතතාවයේ හෙළිදරව් කිරීම ප්‍රමාණවත් වේ.**
- **ශේෂ පත්‍රයේ විගණනය සම්බන්ධයෙන් ශ්‍රී.ලං.වි.ප්‍ර. 701 අනුව ප්‍රධාන විගණන කරුණු සන්නිවේදනය කිරීමට විගණකට අවශ්‍ය නොකෙරේ එසේ නැත්නම් විගණක තීරණය නොකර ඇත.**
- **වෙනත් තොරතුරු නොමැති බව විගණක නිර්ණය කර ඇත. (එනම්., ශ්‍රී.ලං.වි.ප්‍ර. 720 (සංශෝධිත) හි අවශ්‍යතාවයන් අදාල නොවේ)**
- **මූල්‍ය ප්‍රකාශ පිළියෙළ කිරීම සඳහා වග කිව යුතු පුද්ගලයන්, මූල්‍ය ප්‍රකාශන අධීක්‍ෂණය කිරීම සඳහා වග කිව යුතු පුද්ගලයන්ගෙන් වෙනස් වේ.**
- **දේශීය නීතිය හෝ රෙගුලාසි යටතේ අවශ්‍ය කරන වෙනත් වාර්තාකරන වගකීම් විගණකට නැත.**

## ස්වාධීන විගණකගේ වාර්තාව

[යෝග්‍ය ආමන්ත්‍රණය කරන්නා]

**මතය**

ABC සමාගමේ (සමාගම) 20×1 දෙසැම්බර් මස 31 දිනට වූ මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තීන්වල සාරංශයක් ඇතුළුව මූල්‍ය ප්‍රකාශනවලට සටහන් ('මූල්‍ය ප්‍රකාශන' සමග)අප විසින් විගණනය කරන ලදී.

මේ සමග කැටුව යන මූල්‍ය ප්‍රකාශය එවැනි මූල්‍ය ප්‍රකාශ පිළියෙල කිරිමේදී අදාල X අධිකරණ බලප්‍රදේශයේ මූල්‍ය වාර්තාකරණ ආකෘතිමය රාමුවේ එම අවශ්‍යතාවයන් සමග අනුකූලව 20×1 දෙසැම්බර් මස 31 දිනට සමාගමේ මූල්‍ය තත්ත්වය සියලුම ප්‍රමාණාත්මක ආකාරයෙන් සාධාරණ ඉදිරිපත්කර ඇති බව අපගේ මතයයි. [(ශ්‍රී.ලං.වි.ප්‍ර. 700 (සංශෝධිත) හි අවශ්‍ය කරන පරිදි මතය කොටස මුලින් ස්ථාන ගත කළ]

**මතය සඳහා පදනම**

අප, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති (ශ්‍රී.ලං.වි.ප්‍ර.) සමග අනුකූලව අපගේ විගණනය පවත්වා ගෙන යන ලදී. එම ප්‍රමිතීන් යටතේ අපගේ වගකීම් මෙම වාර්තාවේ *මූල්‍ය ප්‍රකාශන විගණනය සඳහා විගණකගේ වගකීම්* කොටසේ තවදුරටත් විස්තර කරනු ලැබේ. ශ්‍රී. ලංකා වරලත් ගණකාධිකරණ ආයතනය විසින් නිකුත් කළ ආචාරධර්ම සංග්‍රහයට (ආචාරධර්ම සංග්‍රහය)[35] අනුකූලව අප සමාගමෙන් ස්වාධීන වන අතර එම අවශ්‍යතාවයන්ට අනුකූලව අපගේ අනෙකුත් ආචාරධර්ම වගකීම් අප ඉටුකර ඇත්තෙමු. අප ලබාගත් විගණන සාක්ෂි මතය සඳහා ප්‍රමාණවත් සහ යෝග්‍ය පදනමක් සපයන බව අපගේ විශ්වාසයයි [මෙම කොටසේ පළමු සහ අවසාන වගන්ති විගණකගේ වගකීම් කොටසේ භාවිතා කළ යුතු ඒවා වේ. තවද මතය සඳහා පදනම කොටසේ ශ්‍රී.ලං.වි.ප්‍ර. 700 (සංශෝධිත) හි අවශ්‍ය පරිදි මතය කොටසට පසුව වහාම ස්ථාන ගත කරයි]

**අඛණ්ඩ පැවැත්ම සම්බන්ධයෙන් ප්‍රමාණාත්මක අනියතතාවය**

20×1 දෙසැම්බර් මස 31 දිනෙන් අවසන් වූ වර්ෂය තුලදී ZZZ ක ශුද්ධ අලාභයක් සමාගම දැරූ අතර එම දිනට සමාගමේ ජංගම වගකීම්, YYY කින් මුළු වත්කම් ඉක්මවා තිබෙන බව පෙන්නුම් කරන මූල්‍ය ප්‍රකාශනවල 6 වන සටහනට අප අවධාරණය යොමු කරන්නෙමු. 6 වන සටහනේ සඳහන් කර ඇති පරිදි, මෙම සිද්ධි සහ තත්ත්වයන් 6 වන සටහනේ පැහැදිලි කර ඇති වෙනත් කරුණු සමග සමාගම අඛණ්ඩ පැවැත්මක් ලෙස දිගටම පවත්වා ගෙන යෑමේ සමාගමේ හැකියාව මත සැලකිය යුතු අන්දමේ සැකයක් පහළ කළ හැකි ප්‍රමාණාත්මක අනියතතාවයක් පවතින බව පෙන්නුම් කෙරේ. මෙම කරුණ සම්බන්ධයෙන් අපගේ මතය විකරණය නොකරයි.

**මූල්‍ය ප්‍රකාශන සඳහා කළමනාකරණය සහ පාලනය පිළිබඳ වගකිව යුතු අයගේ වගකීම්[36]**

මූල්‍ය ප්‍රකාශ පිළියෙල කිරිමේදී අදාල X අධිකරණ බලප්‍රදේශය තුල මූල්‍ය වාර්තාකරණ ආකෘතිමය රාමුවේ එම අවශ්‍යතාවයන් සමග අනුකූලව මූල්‍ය ප්‍රකාශ පිළියෙල කිරිමට සහ සාධාරණ ඉදිරිපත් කිරිම සඳහා වංචා හෝ වැරදි හේතුවෙන් වුවද ප්‍රමාණාත්මක අවප්‍රකාශවලින් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙළ කිරිමට හැකියාව ලබාදෙන අවශ්‍ය කරන කළමනාකරණය නිර්ණය කරන පරිදි එවැනි අභ්‍යන්තර පාලන සඳහා කළමනාකරණය වග කිව යුතු වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙළ කිරිමේදී, කළමනාකරණය එක්කෝ සමාගම ඈවර කිරිමට හෝ මෙහෙයුම් නතර කිරිමට අදහස් කරන්නේ නම් හෝ එසේකිරිමට යථාර්ථවාදී විකල්පයන් නොමැති නම් මිස අඛණ්ඩ පැවැත්ම පදනම මත ගිණුම්කරණය භාවිත කිරිම සහ අදාල පරිදි අඛණ්ඩ පැවැත්ම සම්බන්ධිත කරුණු අදාල පරිදි හෙළිදරව් කරමින් අඛණ්ඩ පැවැත්ම ලෙස දිගටම පවත්වා ගෙන යෑමේ අස්තිත්වයේ හැකියාව තක්සේරු කිරිමට කළමනාකරණය වග කිව යුතු වේ.

පාලනය පිළිබඳ වග කිව යුතු අය, සමාගමේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය අධීක්ෂණය කිරිමට වග කියනු ලැබේ.

**මූල්‍ය ප්‍රකාශන විගණනය සඳහා විගණකගේ වගකීම්**

---

[35] යම්කිසි නියාමන අධිකාරින් විසින් විගණකවරුන් සඳහා නිකුත් කළ වෙනත් ආචාරධර්ම අවශ්‍යතා සිද්ධියකදී එවැනි නියාමනයට යොමු කිරිමක් සිදු කළ යුතුය.

[36] නිදර්ශනාත්මක විගණකගේ වාර්තා පුරාම කළමනාකරනය සහ පාලනය පිළිබඳ වග කිව යුතු අය යන පද අදාල අධිකරණ බල ප්‍රදේශයේ නෛතික ආකෘතිමය රාමුව සම්බන්ධයෙන් යෝග්‍ය වන පරිදි වෙනත් පද මගින් ආදේශ කිරිමට අවශ්‍ය විය හැකිය.

මූල්‍ය ප්‍රකාශන සමස්තයක් ලෙස ගත් කළ වංචා හෝ වැරදි හේතුවෙන් ප්‍රමාණාත්මක අවප්‍රකාශවලින් තොර වන්නේදැයි පිළිබඳව සාධාරණ සහතිකවීමක් ලබාගැනීමට සහ අපගේ මතය ඇතුලත්ව විගණකගේ වාර්තාවක් නිකුත් කිරිම අපගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම යනු ඉහල මට්ටමේ සහතිකවීමකි. නමුත් ,ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුව පවත්වා ගෙන යන විගණනයකදී ප්‍රමාණාත්මක අවප්‍රකාශ පවතින විට එය සැමවිටම අනාවරණය වනබවට වන සහතිකයක් නොවේ. අවප්‍රකාශ වංචා හෝ වැරදි හේතුවෙන් හට ගැනීමට හැකි අතර ඒවා ප්‍රමාණාත්මක ලෙස සලකන්නේ තනි තනිව හෝ සමාහාරයක් ලෙස ගත්කළ මෙම මූල්‍ය ප්‍රකාශයේ පදනම මත පරිශීලකයන්ගේ ආර්ථික තීරණවලට බලපෑම් කිරිමට සාධාරණ ලෙස අපේක්ෂා කළහැකි නම්ය.

පහත දැක්වෙන අඳුරු කළ කරුණු විගණකගේ වාර්තාවේ පරිශිෂ්ඨය තුල පිහිටු විය හැකි බව ශ්‍රී.ලං.වි.ප්‍ර. 700 (සංශෝධිත) 41 (ආ) ජේදයේ පැහැදිලි කෙරේ. නීති,රෙගුලාසි හෝ ජාතික විගණන ප්‍රමිත ප්‍රකාරව අවසර දෙන විට විගණකගේ වගකීම් විස්තරයේ අඩංගු මෙම කරුණු විගණකගේ වාර්තාවේ ඇතුලත් කරනවා වෙනුවට යෝග්‍ය වෙබ් අඩවියේ ලිපිනයේ විස්තරය සහ පහත දැක්වෙන විගණකගේ වගකීම්වල විස්තරය සමග අසංගත නොවන්නේ නම් අධිකාරියක වෙබ් අඩවියක යොමුකළහැකි බව ශ්‍රී.ලං.වි.ප්‍ර.700 (සංශෝධිත) 41(ඇ) ජේදය පැහැදිලි කරයි.

ශ්‍රී.ලං.වි.ප්‍ර. වලට අනුව විගණනයේ කොටසක් ලෙස අප වෘත්තීය විනිශ්චය භාවිතා කරන අතර විගණනය පුරාම වෘත්තීය සංශයදෘෂ්ඨිය පවත්වාගෙන යයි. අප පහත දෑ සිදු කළෙමු :

- වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ප්‍රමාණාත්මක ප්‍රමාණාත්මක අවප්‍රකාශයක අවදානම් හඳුනාගැනීම සහ තක්සේරු කිරිම කරන අතර එම අවදානම්වලට ප්‍රතිචාර ලෙස විගණන පටිපාටි ඉටු කරයි. එමෙන්ම අපගේ මතය සඳහා පදනමක් සැපයීමට ප්‍රමාණාත්මක හා යෝග්‍ය විගණන සාක්ෂි ලබා ගනී. වංචාව සඳහා දුස්සන්දානය, ව්‍යාජ ලෙස ලේඛන සෑදීම, හිතාමතා අත්හැරීම, සාවද්‍ය ලෙස දැක්විම හෝ අභ්‍යන්තර පාලන ඉක්මවා යාම වැනිදෑ සම්බන්ධ වියහැකි නිසා වංචාවේ ප්‍රතිඵලයක ලෙස ප්‍රමාණාත්මක අවප්‍රකාශනයක් අනාවරණය නොවීමේ අවදානම, වැරදීමක වන ප්‍රතිඵලයකට වඩා වැඩිය.
- යම් තත්ත්වයන් තුලදී යෝග්‍ය වන විගණන පටිපාටි සැලසුම් කිරීම හැකිවීමට සහ කියවීමට විගණනයට අදාල අභ්‍යන්තර පාලනයේ අවබෝධයක් ලබා ගන්නා නමුත් මෙහි අරමුණ සමාගමේ අභ්‍යන්තර පාලනයේ සඵලදායීතාවය මත මතයක් ප්‍රකාශ කිරීමේ පිණිස නොවේ.[37]
- භාවිතා කල ගිණුම්කරණ ප්‍රතිපත්තිවල යෝග්‍යතාවය සහ ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමණාකරණය විසින් සිදුකල සම්බන්ධිත හෙළිදරව්කිරීම් අගය කිරීම.
- අඛණ්ඩ පැවැත්ම පදනම ගිණුම්කරණයේ කළමණාකරණයේ භාවිතයේ යෝග්‍යතාවය මත සහ ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව අඛණ්ඩ පැවැත්ම ලෙස දිගටම පවත්වා ගෙන යාමේ සමාගමේ හැකියාව මත සැලකිය යුතු අන්දමේ සැකයක් ඇති විය හැකි සිද්ධි හෝ පවත්නා තත්ත්වයන් සම්බන්ධව ප්‍රමාණාත්මක අනියතතාවයන් පවතීදැයි යන්න නිගමනය කිරීම. ප්‍රමණාත්මක අවිනිශ්චිතතාවයන් පවතින බව අප නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශන තුළ සම්බන්ධිත හෙළිදරව් කිරීම්වලට අපගේ විගණකගේ වාර්තාමය අවධානය යොමු කිරීමට හෝ එවැනි හෙළිදරව් කිරීම් ප්‍රමාණාත්මක නොවේ නම් අපගේ මතය විකරණ කිරීමට අපට අවශ්‍ය වේ. අපගේ නිගමනය පදනම් වී ඇත්තේ විගණකගේ වාර්තාවේ දිනයට දක්වා ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව වේ . කෙසේ වෙතත් අනාගත සිද්ධි හෝ තත්ත්වයන් අඛණ්ඩව පැවැත්මක් ලෙස දිගටම කරගෙන යාමට නැවැත්වීමට සමාගමට හේතුවිය හැකිය.
- හෙළිදරව්කිරීම් ඇතුලත්ව මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරිම,ව්‍යුහය සහ සංයුතිය සහ සාධාරණ ඉදිරිපත් කිරිම ළඟා කර ගැනිමේ අරමුණින් පාදක ගණුදෙණු සහ සිද්ධි මූල්‍ය ප්‍රකාශනවල නිරූපනය වන්නේද අගය කිරීම.

පාලනය පාලනය පිලිබඳ වගකිව යුතු පුද්ගලයන් සමග සන්නිවේදනය කරන වෙනත් කරුණු අතරට අපගේ විගණනය තුළදී අප හඳුනාගෙන තිබෙන අභ්‍යන්තර පාලනයේ සැලකිය යුතු ඕනෑම ඌනතාවයන් ඇතුලුව විගණනයේ සැලසුම් කල විෂයය පථය සහ කාලනිර්ණය සැලකිය යුතු අන්දමේ විගණන සොයා ගැනීම් සම්බන්ධව වෙනත් කරුණු ඇතුලත්ය.

[37] මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බනධයෙන් අභ්‍යන්තර පාලන සඵලදායිත්වය මත මතයක් නිකුත් කිරිමට විගණකට වගකීමකද තිබෙන විට මෙම වාක්‍යය පවත්නා තත්ත්වයන්වලදී යෝග්‍ය පරිදි සංශෝධනය කරනු ඇත

[*විගණන සමාගම නමින් අත්සන*] [*විගණන සමාගමේ ලිපිනය*]

[*දිනය*]

2 වන නිදර්ශනය :විශේෂ අරමුණු ආකෘතිමය රාමුව ප්‍රකාරව පිළියෙල කරන ලද ලැයිස්තු ගත නොවන අස්තිත්වයක තනි මූල්‍ය ප්‍රකාශනයක් මත විගණකගේ වාර්තාව

මෙම නිදර්ශනාත්මක විගණකගේ වාර්තාවේ අරමුණු සඳහා පහත සඳහන් තත්ත්වයන් උපකල්පනය කෙරේ:

- ලැයිස්තුගත අස්තිත්වයන් හැර වෙනත් අස්තිත්වයක මුදල් ලැබීම් සහ ගෙවීම් ප්‍රකාශනයක් (එනම් තනි මූල්‍ය ප්‍රකාශනයක්) විගණනය.
- සම්පූර්ණ මූල්‍ය ප්‍රකාශන කට්ටලය මත විගණකගේ වාර්තාවක් නිකුත් නොකෙරේ.
- ණයහිමියෙකුගෙන් ලැබූ මුදල් ප්‍රවාහ තොරතුර සඳහා ඉල්ලීමකට ප්‍රතිචාර දැක්වීමට ගිණුම්කරනයේ පදනම මුදල් ලැබීම් සහ ගෙවීම් අනුව අස්තිත්වයේ කළමණාකරනය විසින් මූල්‍ය ප්‍රකාශනය පිළියෙල කර තිබීම. මූල්‍ය වාර්තාකරන ආකෘතිමය රාමුවල තේරීමක් කළමණාකරනයට ඇත
- නිශ්චිත පරිශීලකයන්ගේ මූල්‍ය තොරතුරු අවශ්‍යතාවයන් ඉටු කිරීමට සැලසුම් කළ අදාල මූල්‍ය වාර්තාකරන ආකෘතිමය රාමුව වන්නේ සාධාරණ ඉදිරිපත් කිරීමේ ආකෘතිමය රාමුවකි. [38]
- ලබගත් සාක්ෂි මත පදනම්ව,විකරණය නොකළ මතයක් ( එනම් පිරිසිදු) යෝග්‍ය බව විගණක තීරණය කර ඇත.
- විගණකගේ මතයේ "සියළුම ප්‍රමාණාත්මක අංගයන්ගෙන් සාධාරණව ඉදිරිපත් කරයි" යන වාක්‍ය ඛණ්ඩය භාවිතා කිරීමට එය යෝග්‍ය වන බව විගණක නිර්ණය කර ඇත.
- විගණනයට ව්‍යවහාර කරන අදාල ආචාරධර්ම අවශ්‍යතාවයන් *ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරි ආයතනය නිකුත් කළ ආචාර ධර්ම සංග්‍රහයේ* අඩංගු වේ.
- විගණකගේ වාර්තාව බෙදාහැරිම හෝ භාවිත කිරීම සීමා කර ඇත
- ලබගත් විගණන සාක්ෂි මත පදනම්ව, ශ්‍රී.ලං.වි.ප්‍ර. 570 (සංශෝධිත) අනුව අඛණ්ඩ පැවැත්ම ලෙස දිගටම පවත්වා ගෙන යාමේ හැකියාව මත සැලකිය යුතු අන්දමේ සැකයක් පැන නැගිය හැකි සිද්ධි සහ තත්වයන් සම්බන්ධ ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් පවතින බව විගණක නිගමනය කර ඇත
- මුදල් ලැබීම් සහ ගෙවීම් ප්‍රකාශනයේ විගණනය සම්බන්ධයෙන් ශ්‍රී.ලං.වි.ප්‍ර. 701 අනුව ප්‍රධාන විගණන කරුණු සන්නිවේදනය කිරීමට විගණකගෙන් අවශ්‍ය නොකෙරේ එසේ නැත්නම් විගණක තීරණය නොකර තිබීම.
- වෙනත් තොරතුරු නොමැති බව විගණක තීරණය කර ඇත. (එනම්., ශ්‍රී.ලං.වි.ප්‍ර. 720 (සංශෝධිත) හි අවශ්‍යතාවයන් ව්‍යවහාර නොකරයි.)
- මූල්‍ය ප්‍රකාශන පිළියෙළ කිරීම සඳහා සහ මෙම මූල්‍ය ප්‍රකාශ පිළියෙළ කිරීමට කළමනාකරනය වගකිව යුතු වේ.
- දේශීය නීතිය හෝ රෙගුලාසි යටතේ අවශ්‍ය වෙනත් වාර්තාකරන වගකීම් විගණකට නැත.

**ස්වාධීන විගණකගේ වාර්තාව**

[යෝග්‍ය ආමන්ත්‍රණය කරන්නා]

**මතය**

ABC සමාගමේ (සමාගම) 20×1 දෙසැම්බර් මස 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ලැබීම් සහ වියදම් කිරිමේ ප්‍රකාශනය සහ වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තීන්වල සාරංශයක් ඇතුළුව මුදල් ලැබීම් සහ වියදම් කිරිම්වලට සටහන් (මූල්‍ය ප්‍රකාශන සමග)අප විසින් විගණනය කරන ලදී.

[38] ශ්‍රී.ලං.වි.ප්‍ර. 800 (සංශෝධිත)හි විශේෂ අරමුණු ආකෘතිමය රාමුවක් අනුව පිළියෙල කළ මූල්‍ය ප්‍රකාශනවල ස්වරූපය සහ අන්තර්ගතය මත අවශ්‍යතාවයන් සහ උපදේශ සමන්විත වේ.

අපගේ මතය අනුව X සටහන් තුල විස්තර කළ ගිණුම්කරණයේ මුදල් ලැබීම් සහ වියදම් කිරීමේ ගිණුම්කරණ පදනම අනුව 20×1 දෙසැම්බර් මස 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සමාගමේ මුදල් ලැබීම් සහ වියදම් කිරීම් සියලුම ප්‍රමාණාත්මක ආකාරයෙන් කැටුව ඇති මූල්‍ය ප්‍රකාශන සාධාරණව ඉදිරිපත් කර ඇත. [(ශ්‍රී.ලං.වි.ප්‍ර. 700 (සංශෝධිත) හි අවශ්‍ය පරිදි මතය කොටසේ මුලින් ස්ථාන ගත කළ]

**මතය සඳහා පදනම**

අප, ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුව අපගේ විගණනය මෙහෙයවන ලදී. එම ප්‍රමිතීන්ට අනුව අපගේ වගකීම් අපගේ වාර්තාවේ *මූල්‍ය ප්‍රකාශන විගණනය සඳහා විගණකගේ වගකීම්* කොටසේ තවදුරටත් විස්තර කරනු ලැබේ. *ශ්‍රී. ලංකා වරලත් ගණකාධිකරණ ආයතනය විසින් නිකුත් කළ ආචාරධර්ම සංග්‍රහයට* (ආචාරධර්ම සංග්‍රහය)[39] අනුව අප සමාගමෙන් ස්වාධීන වන අතර අප එම අවශ්‍යතාවයන්ට අනුව අපගේ අනෙකුත් ආචාරධර්ම වගකීම් ඉටුකර ඇත්තෙමු. අප ලබාගත් විගණන සාක්ෂි අපගේ මතය ප්‍රකාශ කිරීමට ප්‍රමාණවත් සහ යෝග්‍ය පදනමක් ලබාදෙන බව අපගේ විශ්වාසයයි. [මෙම කොටසේ පළමු සහ අවසාන වගන්ති විගණකගේ වගකීම් කොටසේ භාවිතා කළ යුතු ඒවා වේ. තවද මතය සඳහා පදනම කොටසේ ශ්‍රී.ලං.වි.ප්‍ර. 700 (සංශෝධිත) හි අවශ්‍ය පරිදි මතය කොටසට පසුව වහාම ස්ථාන ගත කරය]

**කරුණ අවධාරණය කිරීම– ගිණුම්කරණයේ පදනම**

ගිණුම්කරණ පදනම විස්තර කරන මූල්‍ය ප්‍රකාශනවල X සටහනට අප අවධාරණය කරන්නෙමු. XYZ ණයහිමියාට තොරතුරු ලබාදීමට මූල්‍ය ප්‍රකාශන පිළියෙල කරයි. එහි ප්‍රතිඵලයක් ලෙස, ප්‍රකාශනය වෙනත් අරමුණක් සඳහා යෝග්‍ය නොවේ. මෙම කරුණ සම්බන්ධයෙන් අපගේ මතය විකරණය නොකරයි.

**මූල්‍ය ප්‍රකාශන සඳහා කළමනාකරණය සහ පාලනය පිළිබඳ වගකිව යුතු අයගේ වගකීම්** [40]

X සටහනේ විස්තර කළ ගිණුම්කරණයේ මුදල් ලැබීම් සහ වියදම් කිරිමේ පදනම අනුව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ඉදිරිපත් කිරීමට කළමනාකරණය වග කිව යුතුය. තත්ත්වයන්වලදී මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සඳහා මුදල් ලැබීම් සහ වියදම් කිරීමේ පදනම පිළිගත හැකි ගිණුම්කරණ පදනමක් වන බව නිර්ණය කිරීමේදී මෙයට ඇතුලත් වන අතර වංචා හෝ වැරදි හේතුවෙන් වුවද ප්‍රමාණාත්මක අවප්‍රකාශවලින් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙළ කිරීමට හැකියාව ලබාදීමට එවැනි අභ්‍යන්තර පාලන කළමනාකරණය නිර්ණය කරන පරිදි අවශ්‍ය වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙළ කිරීමේදී, කළමනාකරණය එක්කෝ සමාගම ඇවර කිරීමට හෝ මෙහෙයුම් නතර කිරීමට අදහස් කරන්නේ නම් හෝ එසේ කිරීමට යථාර්ථවාදී විකල්පයන් නොමැති නම් මිස අඛණ්ඩ පැවැත්ම පදනම මත ගිණුම්කරණය භාවිත කිරීම සහ අදාල පරිදි අඛණ්ඩ පැවැත්ම සම්බන්ධිත කරුණු අදාල වන පරිදි හෙළිදරව් කරමින් අඛණ්ඩ පැවැත්ම ලෙස දිගටම පවත්වා ගෙන යාමේ අස්තිත්වයේ හැකියාව තක්සේරු කිරීමට කළමනාකරණය වග කිව යුතු වේ.

**මූල්‍ය ප්‍රකාශ විගණනය සඳහා විගණකගේ වගකීම්**

මූල්‍ය ප්‍රකාශ සමස්තයක් ලෙස ගත් කළ වංචා හෝ වැරදි හේතුවෙන් ප්‍රමාණාත්මක අවප්‍රකාශවලින් තොර වන්නේදැයි පිළිබඳව සාධාරණ සහතිකවීමක් ලබාගැනීමට සහ අපගේ මතය ඇතුලත්ව විගණකගේ වාර්තාවක් නිකුත් කිරිම අපගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම යනු ඉහළ මට්ටමේ සහතිකවීමකි. නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුව මෙහෙයවන විගණනයකදී ප්‍රමාණාත්මක අවප්‍රකාශ පවතින විට එය සැමවිටම අනාවරණය වනබවට වන සහතිකයක් නොවේ. අවප්‍රකාශ වංචා හෝ වැරදි හේතුවෙන් හට ගැනීමට හැකි අතර ඒවා ප්‍රමාණාත්මක ලෙස සලකන්නේ තනි තනිව හෝ සමාහාරයක් ලෙස ගත්කළ මෙම මූල්‍ය ප්‍රකාශයේ පදනම මත පරිශීලකයන් ගත් ආර්ථික තීරණවලට බලපෑම් කිරීමට සාධාරණ ලෙස අපේක්ෂා කළහැකි නම්ය.

[39] යම්කිසි නියාමන අධිකාරීන් විසින් විගණකවරුන් සඳහා නිකුත් කළ වෙනත් ආචාරධර්ම අවශ්‍යතා සිද්ධියකදී එවැනි නියාමනයට යොමු කිරීමක් සිදු කළ යුතුය.

[40] හෝ විශේෂ අධිකරන බලප්‍රදේශයක නෛතික රාමුව සම්බන්ධය තුල යෝග්‍ය වන වෙනත් කොන්දේසි

පහත දැක්වෙන අඳුරු කළ කරුණු විගණකගේ වාර්තාවේ පරිශිෂ්ඨයන් තුල පිහිටු විය හැකි බව ශ්‍රී.ලං.වි.ප්‍ර. 700(සංශෝධිත) 41 (ආ) ඡේදයේ පැහැදිලි කෙරේ. නීති, රෙගුලාසි හෝ ජාතික විගණන ප්‍රමිත පැහැදිලිව අවසර දෙන විට විගණකගේ වගකීම් විස්තරයේ අඩංගු මෙම කරුණු විගණකගේ වාර්තාවේ ඇතුලත් කරනවා වෙනුවට යෝග්‍ය අධිකාරියක වෙබ් අඩවියේ ලිපිනයේ විස්තරය සහ පහත දැක්වෙන විගණකගේ වගකීම්වල විස්තරය සමග අසංගත නොවන්නේ නම් යොමුකළහැකි බව ශ්‍රී.ලං.වි.ප්‍ර.700 (සංශෝධිත) 41(ඇ) ඡේදය පැහැදිලි කරයි.

ශ්‍රී.ලං.වි.ප්‍ර. වලට අනුව විගණනයේ කොටසක් ලෙස අප වෘත්තීය විනිශ්චය භාවිතා කරන අතර විගණනය පුරාම වෘත්තීය සංශයදෘෂ්ඨිය පවත්වාගෙන යයි. අප එලෙසම පහත දෑ සිදු කළෙමු :

- වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ප්‍රමාණාත්මක ප්‍රමාණාත්මක අවප්‍රකාශනයක අවදානම් හඳුනාගැනීම සහ තක්සේරු කිරීම කරන අතර එම අවදානම්වලට ප්‍රතිචාර ලෙස විගණන පටිපාටි සැලසුම් කර ඉටු කරයි. එමෙන්ම අපගේ මතය සඳහා පදනමක් ලබාදීමට ප්‍රමාණාත්මක හා යෝග්‍ය විගණන සාක්ෂි ලබා ගනී. වංචාව සඳහා දුස්සන්දානය, ව්‍යාජ ලෙස ලේඛන සෑදීම, හිතාමතා අත්හැරීම, සාවද්‍ය ලෙස දැක්වීම හෝ අභ්‍යන්තර පාලන ඉක්මවා යාම වැනිදෑ සම්බන්ධ වියහැකි නිසා වංචාවේ ප්‍රතිඵලයක් ලෙස ප්‍රමාණාත්මක අවප්‍රකාශනයක අනාවරණය නොවීමේ අවදානම, වැරදීමක වන ප්‍රතිපලයකට වඩා වැඩිය

- යම් තත්වයන් තුලදී යෝග්‍ය වන විගණන පටිපාටි සැලසුම් කිරීමට සහ කියවීමට විගණනයට අදාල අභ්‍යන්තර පාලනයේ අවබෝධයක් ලබා ගන්නා නමුත් මෙහි අරමුණ සමාගමේ අභ්‍යන්තර පාලනයේ සඵලදායීතාවය මත මතයක් ප්‍රකාශ කිරීමේ පිණිස නොවේ.[41]

- අඛණ්ඩ පැවැත්ම පදනම ගිණුම්කරණයේ කළමණාකරණයේ භාවිතයේ යෝග්‍යතාවය මත සහ ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව අඛණ්ඩ පැවැත්ම ලෙස දිගටම පවත්වා ගෙන යාමේ සමාගමේ හැකියාව මත සැලකිය යුතු අන්දමේ සැකයක් ඇති විය හැකි සිද්ධි හෝ පවත්නා තත්වයන් සම්බන්ධව ප්‍රමාණාත්මක අවිනිශ්චිතයන් පවතීදැයි යන්න නිගමනය කිරීම. ප්‍රමණාත්මක අවිනිශ්චිතතාවයන් පවතින බව අප නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශන තුළ සම්බන්ධිත හෙළිදරව් කිරීම්වලට අපගේ විගණකගේ වාර්තාමය අවධානය යොමු කිරීමට හෝ එවැනි හෙළිදරව් කිරීම් ප්‍රමාණාත්මක නොවේ නම් අපගේ මතය විකරණ කිරීමට අපට අවශ්‍ය වේ. අපගේ නිගමනය පදනම් වී ඇත්තේ විගණකගේ වාර්තාවේ දිනයට දක්වා ලබා ගත් විගණන සාක්ෂි මත පදනම්ව වේ . කෙසේ වෙතත් අනාගත සිද්ධි හෝ තත්වයන් අඛණ්ඩව පැවැත්මක් ලෙස දිගටම පවත්වා ගෙන යාමට නැවත්වීමට සමාගමට හේතුවිය හැකිය.

- භාවිතා කල ගිණුම්කරණ ප්‍රතිපත්තිවල යෝග්‍යතාවය සහ ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමණාකරණය විසින් සිදු කල සම්බන්ධිත හෙළිදරව්කිරීම් අගය කිරීම

- හෙළිදරව්කිරීම් ඇතුලත්ව මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම,ව්‍යුහය සහ සංයුතිය සහ සාධාරණ ඉදිරිපත් කිරීම ළඟා කර ගැනීමේ අරමුණින් පාදක ගණුදෙණු සහ සිද්ධි මූල්‍ය ප්‍රකාශනවල නිරූපනය වන්නේද අගය කිරීම.

පාලනය පිලිබඳ වගකිව යුතු පුද්ගලයන් සමඟ සන්නිවේදනය කරන වෙනත් කරුණු අතරට අපගේ විගණනය තුළදී අප හඳුනාගෙන තිබෙන අභ්‍යන්තර පාලනයේ සැලකිය යුතු ඕනෑම ඌනතාවයන් ඇතුලුව විගණනයේ සැලසුම් කල විෂය පථය සහ කාලනිර්ණය සැලකිය යුතු අන්දමේ විගණන සොයා ගැනීම් සම්බන්ධව වෙනත් කරුණු ඇතුලත්ය.

*[විගණන සමාගම නමින් අත්සන] [විගණන සමාගමේ ලිපිනය]*

[41] මූල්‍ය ප්‍රකාශන විගණනය සමග සම්බනධය තුල අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය මත මතයක් නිකුත් කිරීමට විගණකට එලෙසම වගකීමකද තිබෙන විට මෙම වාක්‍යය පවත්නා තත්වයන්වලදී යෝග්‍ය පරිදි සංශෝධනය කරනු ඇත

[*දිනය*]

**3 වන නිදර්ශනය :විශේෂ අරමුණු ආකෘතිමය රාමුව ප්‍රකාරව පිළියෙල කරන ලද ලැයිස්තු ගත අස්තිත්වයක මූල්‍ය ප්‍රකාශනයක නිශ්චිත මූලිකාංගයක් මත විගණකගේ වාර්තාව**

**මෙම නිදර්ශනාත්මක විගණකගේ වාර්තාවේ අරමුණ සඳහා පහත සඳහන් තත්ත්වයන් උපකල්පනය කෙරේ.**

- **ලැබිය යුතු ගිණුම් උපලේඛනයක් විගණනය කිරීම (එය මූල්‍ය ප්‍රකාශනයක මූලිකාංගයක්, ගිණුමක් හෝ_අයිතමයක් වේ).**
- **නියාමක විසින් පිහිටුවන ලද මූල්‍ය වාර්තාකරන විධිවිධාන අනුව එම නියාමකගේ අවශ්‍යතාවයන් ඉටු කිරීමට අස්තිත්වයේ කළමනාකරනය විසින් මූල්‍ය තොරතුරු පිළියෙල කර ඇත. මූල්‍ය වාර්තාකරන ආකෘතිමය රාමු තේරීමක් කළමනාකරනයේ නොතිබේ.**
- **නිශ්චිත පරිශීලකයන්ගේ මූල්‍ය තොරතුරු අවශ්‍යතාවයන් ඉටු කරගැනීමට අදාල මූල්‍ය වාර්තාකරන ආකෘතිමය රාමුව වන්නේ, සැලසුම් කල අනුකුල වීමේ ආකෘතිමය රාමුවකි .**[42]
- **ශ්‍රී.ලං.වි.ප්‍ර. 210හි මූල්‍ය ප්‍රකාශන සඳහා කළමනාකරනයේ වගකීම් විස්තරය, විගණන කාර්යයභාරයේ කොන්දේසිවල පිළිබිඹු වීම.**
- **ලබගත් විගණන සාක්ෂි මත පදනම්ව,විකරණය නොකළ මතයක් (එනම් පිරිසිදු) යෝග්‍ය වන බව විගණක නිගමනය කර ඇත.**
- **විගණනයට ව්‍යවහාර කරන අදාල ආචාර ධර්ම අවශ්‍යතා අඩංගුව ඇත්තේ ශ්‍රී ලංකා වරලත් ගණකාධිකරණ ආයතනය විසින් නිකුත් කළ ආචාර ධර්ම සංග්‍රහයේය**
- **විගණකගේ වාර්තාව බෙදාහැරීම සීමා කර ඇත.**
- **ලබාගත් සාක්ෂි මත පදනම්ව, ශ්‍රී.ලං.වි.ප්‍ර. 570 (සංශෝධිත) අනුව අඛණ්ඩ පැවැත්ම ලෙස දිගටම පවත්වා ගෙන යාමේ හැකියාව මත සැලකිය යුතු අන්දමේ සැකයක් පැන නැගිය හැකි සිද්ධි සහ තත්වයන් සම්බන්ධ ප්‍රමාණාත්මක අනියතතාවයක් නොපවතින බව විගණක තීරණය කිරීම**
- **ලැබිය යුතු ගිණුම් උපලේඛනය විගණනය සම්බන්ධය තුල ශ්‍රී.ලං.වි.ප්‍ර. 701 අනුව ප්‍රධාන විගණන කරුණු සන්නිවේදනය කිරීමට විගණකට අවශ්‍ය නොකෙරේ එසේ නැත්නම් විගණක තීරණය නොකිරීම**
- **වෙනත් තොරතුරු නොමැති බව විගණක තීරණය කර ඇත. (එනම්., ශ්‍රී.ලං.වි.ප්‍ර. 720 (සංශෝධිත) හි අවශ්‍යතාවයන් ව්‍යවහාර නොවේ.)**
- **මූල්‍ය ප්‍රකාශන අධීක්ෂණය සඳහා වග කිවයුතු පුද්ගලයන් මූල්‍ය ප්‍රකාශන පිළියෙළ කිරීමට වග කිවයුතු පුද්ගලයන්ගෙන් වෙනස් වේ**
- **දේශීය නිතිය හෝ රෙගුලාසි යටතේ අවශ්‍ය වෙනත් වාර්තාකරන වගකීම් විගණකට නැත**

**ස්වාධීන විගණකගේ වාර්තාව**

[ABC සමාගමේ කොටස්හිමියන්ට හෝ වෙනත් යෝග්‍ය ආමන්ත්‍රණය කරන්නා]

**මතය**

ABC සමාගමේ (සමාගම) 20×1 දෙසැම්බර් මස 31 දිනට ලැබිය යුතු ගිණුම්වල උපලේඛනය (උපලේඛනය) අප විසින් විගණනය කරන ලදී.

අපගේ මතය අනුව 20×1 දෙසැම්බර් මස 31 දිනට උපලේඛනයේ මූල්‍ය තොරතුරු [නියාමක විසින් පිහිටුවන ලද මූල්‍ය වාර්තාකරණ විධිවිධානවල විස්තර කර ඇති පරිදි] සියලුම ප්‍රමාණාත්මක අංගයනගෙන් පිළියෙල කරඇත. [(ශ්‍රී.ලං.වි.ප්‍ර. 700 (සංශෝධිත) හි අවශ්‍ය පරිදි මතය කොටසේ මුලින් ස්ථාන ගත කරඇත]

[42] ශ්‍රී.ලං.වි.ප්‍ර. 800 (සංශෝධිත)හි විශේෂ අරමුණ ආකෘතිමය රාමුවක් අනුව මූල්‍ය ප්‍රකාශනවල ස්වරූපය සහ අන්තර්ගතය මත අවශ්‍යතාවයන් සහ උපදේශ සමන්විත වේ.

**මතය සඳහා පදනම**

අප, ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුව අපගේ විගණනය මෙහෙයවන ලදී. එම ප්‍රමිතීන්ට යටතේ අපගේ වගකීම් අපගේ වාර්තාවේ උපලේඛනය *විගණනය සඳහා විගණකගේ වගකීම්* කොටසේ තවදුරටත් විස්තර කරනු ලැබේ. ශ්‍රී. ලංකා වරලත් ගණකාධිකරණ ආයතනය විසින් නිකුත් කළ ආචාරධර්ම සංග්‍රහයට ( ආචාරධර්ම සංග්‍රහය)[9] අනුව අප සමාගමෙන් ස්වාධීන වන අතර අප එම අවශ්‍යතාවයන්ට අනුව අපගේ අනෙකුත් ආචාරධර්ම වගකීම් ඉටුකර ඇත්තෙමු. අප ලබාගත් විගණන සාක්ෂි අපගේ මතය ප්‍රකාශ කිරීමට ප්‍රමාණවත් සහ යෝග්‍ය පදනමක් ලබා දෙන බව අපගේ විශ්වාසයයි. (මෙම කොටස තුල පළමු සහ අවසාන වගන්ති විගණකගේ වගකීම් කොටසේ භාවිතා කළ යුතු ඒවා වේ. එසේම මතය සඳහා පදනම කොටසේ ශ්‍රී.ලං.වි.ප්‍ර. 700 (සංශෝධිත) හි අවශ්‍ය පරිදි මතය කොටසට පසුව වහාම ස්ථාන ගත කරයි)

**කරුණ අවධාරණය කිරීම– ගිණුම්කරණයේ පදනම සහ බෙදා හැරීම මත සීමා කිරීම**

ගිණුම්කරණයේ පදනම විස්තර කරන උපලේඛනයේ X සටහනට අප අවධානය යොමු කරන්නෙමු. DEF නියාමකගේ අවශ්‍යතා ඉටු කිරීමට සමාගමට සහාය වීමට උපලේඛනය පිළියෙළ කර ඇත. එහි ප්‍රතිඵලයක් ලෙස උපලේඛනය වෙනත් අරමුණක් සඳහා යෝග්‍ය නොවිය හැකිය. අපගේ වාර්තාව තනිකරම DEF නියාමකට සහ සමාගමට සඳහා පමණක් අදහස් කරන අතර DEF නියාමක හෝ සමාගම හැර වෙනත් පාර්ශවයකට බෙදා නොහැරිය යුතුය. මෙම කරුණ සම්බන්ධයෙන් අපගේ මතය විකරණය නොකෙරේ

**උපලේඛනය සඳහා කළමනාකරණය සහ පාලනය භාරව සිටින අයගේ වගකීම්** [43]

{නියාමක විසින් පිහිටුවන ලද මූල්‍ය වාර්තාකරණ විධිවිධාන විස්තර කිරීම} ප්‍රකාරව ලේඛනය පිළියෙළ කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ප්‍රමාණාත්මක අවප්‍රකාශවලින් තොර මූල්‍ය ප්‍රකාශන පිළියෙළ කිරීමට හැකි වනු පිණිස කළමනාකරණය අවශ්‍ය යැයි තීරණය කරන පරිදි එවැනි අභ්‍යන්තර පාලන සඳහා කළමනාකරණය වගකිව යුතු වේ

උපලේඛනය පිළියෙළ කිරීමේදී, කළමනාකරණය එක්කෝ සමාගම ඈවර කිරීමට හෝ මෙහෙයුම් නතර කිරීමට අදහස් කරන්නේ නම් හෝ එසේ කිරීමට යථාර්ථවාදී විකල්පයන් නොමැති නම් මිස අඛණ්ඩ පැවැත්ම පදනම මත ගිණුම්කරණය භාවිත කරීම සහ අදාල පරිදි අඛණ්ඩ පැවැත්ම සම්බන්ධිත කරුණු හෙළිදරව් කරමින් අඛණ්ඩ පැවැත්ම ලෙස දිගටම පවත්වා ගෙන යාමේ අස්තිත්වයේ හැකියාව තක්සේරු කිරීමට කළමනාකරණය වග කියනු ලැබේ.

පාලනය පිළිබඳ වග කිව යුතු අය , සමාගමේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය අධීක්ෂණය කිරීමට වග කියනු ලැබේ.

**උපලේඛනය විගණනය සඳහා විගණකගේ වගකීම්**

උපලේඛනය වංචා හෝ වැරදි හේතුවෙන් ප්‍රමාණාත්මක අවප්‍රකාශවලින් තොර වන්නේදැයි පිළිබඳව සාධාරණ සහතිකවීමක් ලබාදීමට සහ අපගේ මතය ඇතුලත්ව විගණකගේ වාර්තාවක් නිකුත් කිරීම අපගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම යනු ඉහල මට්ටමේ සහතිකවීමකි. නමුත් ,ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුව මෙහෙයවන විගණනයකදී ප්‍රමාණාත්මක අවප්‍රකාශ පවතින විට එය සෑමවිටම අනාවරණය වනබව සහතිකයක් නොවේ. අවප්‍රකාශ වංචා හෝ වැරදි හේතුවෙන් හට ගැනීමට හැකි අතර ඒවා ප්‍රමාණාත්මක ලෙස සලකන්නේ තනි තනිව හෝ සමාහාරයක් ලෙස ගත්කළ මෙම ලේඛනයේ පදනම මත පරිශීලකයන් ගත් ආර්ථික තීරණවලට බලපෑම් කිරීමට සාධාරණ ලෙස අපේක්ෂා කළහැකි නම්ය.

| |
|---|
| පහත දැක්වෙන අඳුරු කළ කරුණු විගණකගේ වාර්තාවේ පරිශිෂ්ඨයක් තුල පිහිටු විය හැකි බව ශ්‍රී.ලං.වි.ප්‍ර. 700 (සංශෝධිත) 41 (ආ) ඡේදයේ පැහැදිලි කෙරේ. නීති, රෙගුලාසි හෝ ජාතික විගණන ප්‍රමිත පැහැදිලිව අවසර දෙන විට විගණකගේ වගකීම් විස්තරයේ අඩංගු මෙම කරුණු විගණකගේ වාර්තාවේ ඇතුලත් කරනවා වෙනුවට යෝග්‍ය අධිකාරියක වෙබ් අඩවියේ ලිපිනයේ විස්තරය සහ පහත දැක්වෙන විගණකගේ වගකීම් විස්තරය සමග අසංගත නොවන්නේ නම් යොමුකළහැකි බව ශ්‍රී.ලං.වි.ප්‍ර.700 (සංශෝධිත) 41(ඇ) පැහැදිලි කරයි. |

[43] හෝ විශේෂ අධිකරන බලප්‍රදේශයක නෛතික රාමුව සම්බන්ධයෙන් යෝග්‍ය වන වෙනත් කොන්දේසි.

ශ්‍රී.ලං.වි.ප්‍ර. වලට අනුව විගණනයේ කොටසක් ලෙස අප වෘත්තීය විනිශ්චය භාවිතා කරන අතර විගණනය පුරාම වෘත්තීය සංශයදෘෂ්ඨිය පවත්වාගෙන යයි. අප පහත දෑ සිදු කළෙමු :

- වංචා හෝ වැරදි හේතුවෙන් ලේඛනයේ ප්‍රමාණාත්මක අවප්‍රකාශනවල අවදානම් හඳුනාගැනීම සහ තක්සේරු කිරීම කරන අතර එම අවදානම්වලට ප්‍රතිචාර ලෙස විගණන පටිපාටි ඉටු කරයි. එමෙන්ම අපගේ විගණන මතය සඳහා පදනමක් ලබාදීමට ප්‍රමාණාත්මක හා යෝග්‍ය විගණනසාක්ෂි ලබා ගනී. වංචාව සඳහා දුස්සන්ධානය, ව්‍යාජ ලෙස ලේඛන සෑදීම, හිතාමතා අත්හැරීම, සාවද්‍ය ලෙස දැක්වීම හෝ අභ්‍යන්තර පාලන ඉක්මවා යාම වැනිදෑ සම්බන්ධ වියහැකි නිසා වංචාවේ ප්‍රතිඵලයක් ලෙස අවප්‍රකාශනයක අනාවරණය නොවීමේ අවදානම, වැරදීමකින් වන ප්‍රතිපලයකට වඩා වැඩිය.

- යම් තත්ත්වයන් තුළදී යෝග්‍ය වන විගණන පටිපාටි සැලසුම් කිරීමට සහ කියවීමට විගණනයට අදාල අභ්‍යන්තර පාලනයේ අවබෝධයක් ලබා ගන්නා නමුත් මෙහි අරමුණ සමාගමේ අභ්‍යන්තර පාලනයේ සඵලදායීතාවය මත මතයක් ප්‍රකාශ කිරීමේ පිණිස නොවේ.[44]

- අඛණ්ඩ පැවැත්ම පදනම ගිණුම්කරණයේ කළමණාකරණයේ භාවිතයේ යෝග්‍යතාවය මත සහ ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව අඛණ්ඩ පැවැත්ම ලෙස දිගටම පවත්වා ගෙන යාමේ සමාගමේ හැකියාව මත සැලකිය යුතු අන්දමේ සැකයක් ඇති විය හැකි සිද්ධි හෝ පවත්නා තත්වයන් සම්බන්ධව ප්‍රමාණාත්මක අනියතතාවයන් පවතීදැයි යන්න නිගමනය කිරීම. ප්‍රමණාත්මක අනියතතාවයන් පවතින බව අප නිගමනය කරන්නේ නම් ලේඛනය තුළ සම්බන්ධිත හෙළිදරව් කිරීම්වලට අපගේ විගණකගේ වාර්තාවේ අවධානය යොමු කිරීමට හෝ එවැනි හෙළිදරව් කිරීම් ප්‍රමාණාත්මක නොවේ නම් අපගේ මතය විකරණ කිරීමට අපට අවශ්‍ය වේ. අපගේ නිගමන පදනම් වී ඇත්තේ අපගේ විගණකගේ වාර්තාවේ දිනය දක්වා ලබා ගත් විගණන සාක්ෂි මත පදනම්ව වේ . කෙසේ වෙතත් අනාගත සිද්ධි හෝ තත්වයන් අඛණ්ඩව පැවැත්මක් ලෙස දිගටම පවත්වා ගෙන යාමට නැවත්වීමට සමාගමට හේතුවිය හැකිය

- භාවිතා කල ගිණුම්කරණ ප්‍රතිපත්තිවල යෝග්‍යතාවය සහ ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමණාකරණය විසින් සිදු කල සම්බන්ධිත හෙළිදරව්කිරීම් අගය කිරීම

පාලනය පිලිබඳ වගකිව යුතු පුද්ගලයන් සමඟ සන්නිවේදනය කරන වෙනත් කරුණු අතරට අපගේ විගණනය තුළදී අප හඳුනාගෙන තිබෙන අභ්‍යන්තර පාලනයේ සැලකිය යුතු ඕනෑම ඌනතාවයන් ඇතුලුව විගණනයේ සැලසුම් කල විෂය පථය සහ කාලනිර්ණය සැලකිය යුතු අන්දමේ විගණන සොයා ගැනීම් සම්බන්ධව වෙනත් කරුණු ඇතුලත්ය.

ස්වාධීනත්වය සම්බන්ධයෙන් අදාල ආචාරධර්ම අවශ්‍යතාවයන් සමඟ අනුගත වන බව දැක්වෙන ප්‍රකාශය පාලනය පිලිබඳ වගකිව යුතු පුද්ගලයන්ට දෙන අතර සහ අපගේ ස්වාධීනත්වය දරා සිටින අදාල අවස්ථාවකදී සම්බන්ධිත ආරක්ෂණ ක්‍රම සාධාරණව සිතිය හැකි ඔවුන් සමග ඇති සියළුම සම්බන්ධතා සහ වෙනත් කරුණු සන්නිවේදනය කිරීමද එලෙසම ලබාදෙයි,

මෙම ස්වාධීන විගණකගේ වාර්තාව අත්සන් කිරීම සඳහා වගකිව යුතු කාර්යය භාරයේ නියුතු හවුල්කරුගේ ශ්‍රී ලංකා වරලත් ගණකාධිකරණ ආයතනයේ සමාජික අංකය වන්නේ [අංකය].

*[විගණන සමාගම නමින් අත්සන] [විගණන සමාගමේ ලිපිනය]*

*[දිනය]*

[44] මූල්‍ය ප්‍රකාශන විගණනය සමඟ සම්බනධය තුල අභ්‍යන්තර පාලන සඵලදායිත්වය මත මතයක් නිකුත් කිරීමට විගණකගේ වගකීමක් තිබෙන විට මෙම වාක්‍යය තත්ත්වයන්වලදී යෝග්‍ය පරිදි සංශෝධනය කරනු ඇත.

# ශ්‍රී ලංකා විගණන ප්‍රමිත 810 (සංශෝධිත)

## සංක්ෂිප්ත මූල්‍ය ප්‍රකාශන මත වාර්තා කිරීම සඳහා වන කාර්යභාරයන්

(2018 මාර්තු 31 දින හෝ ඊට පසුව අවසන් වන කාලපරිච්ඡේද සඳහා සංක්ෂිප්ත මූල්‍ය ප්‍රකාශ මත වාර්තා කිරීම සඳහා වන කාර්යභාරයන් සඳහා බලපැවත් වේ )

## පටුන

ජේදය

**හැඳින්වීම**

මෙම ශ්‍රී.ල.වි.ප්‍ර.යේ විෂය පථය ........ 1
බලපැවැත්වෙන දිනය........ 2
අරමුණු ........ 3
නිර්වචන ........ 4

**අවශ්‍යතා**

කාර්යභාරය භාරගැනීම........ 5–7
ක්‍රියාපටිපාටිවල ස්වභාවය ........ 8
මතයේ ස්වරූපය........ 9–11
විගණනය කළ මූල්‍ය ප්‍රකාශ මත විගණකගේ වාර්තාවෙහි දිනයට පසුව වැඩවල කාලය සහ සිද්ධීන්........ 12–13
සංක්ෂිප්ත මූල්‍ය ප්‍රකාශ අඩංගු ලේඛනවල තොරතුරු ........ 14–15
සංක්ෂිප්ත මූල්‍ය ප්‍රකාශන මත විගණකගේ වාර්තාව ........ 16–21
ගිණුම්කරණයේ පදනමට බෙදාහැරීමේදී හෝ භාවිත භාවිත කිරීමේදී සීමා කිරීම හෝ කියවන්නන්ගේ සෝදිසියෙන් තැබීම........ 22
සංසන්දනයන් ........ 23–24
සංක්ෂිප්ත මූල්‍ය ප්‍රකාශ සමග ඉදිරිපත් කරනු ලබන විගණනය නොකළ පරිපූරක තොරතුරු ........ 25
විගණකගේ සහභාගිත්වය........ 26–27

**භාවිත කිරීමේ සහ පැහැදිලි කිරීමේ වෙනත් කරුණු**

කාර්යභාරය භාරගැනීම ........ අ1– අ 7
විගණනය කළ මූල්‍ය ප්‍රකාශ ලබාගත හැකි බව ඇගයීම ........ අ 8
මතය සකස්කිරීම........ අ 9
විගණනය කළ මූල්‍ය ප්‍රකාශන මත විගණකගේ වාර්තාවෙහි දිනයට පසුව වැඩවල කාලය සහ සිදුවීම්........ අ 10
සංක්ෂිප්ත මූල්‍ය ප්‍රකාශ අඩංගු ලේඛනවල තොරතුරු ........ අ 11– අ 16
සංක්ෂිප්ත මූල්‍ය ප්‍රකාශ මත විගණකගේ වාර්තාව........ අ 17– අ 23
සංසන්දනයන් ........ අ 24– අ 25
සංක්ෂිප්ත මූල්‍ය ප්‍රකාශ සමග ඉදිරිපත් කරනු ලබන විගණනය නොකළ පරිපූරක තොරතුරු........ අ 26
විගණකගේ සහභාගිත්වය........ අ 27
පරිශිෂ්ඨය ඃ සංක්ෂිප්ත මූල්‍ය ප්‍රකාශන මත ස්වාධීන විගණකගේ වාර්තාවලට නිදර්ශන

ශ්‍රී.ල.වි.ප්‍ර. 200, "*ශ්‍රී ලංකා විගණන ප්‍රමිත ප්‍රකාරව ස්වාධීන විගණකයේ සමස්ථ අරමණු සහ විගණනයක් පවත්වාගෙනයාම* "හි පද සම්බන්ධය සහිතව ශ්‍රී ලංකා විගණන ප්‍රමිත (ශ්‍රී.ල.වි.ප්‍ර.) 810, (සංශෝධිත) " *සංක්ෂිප්ත මූල්‍ය ප්‍රකාශ මත වාර්තා කිරීම සඳහා වන කාර්යභාරය*" කියවිය යුතුය.

## හැඳින්වීම

**මෙම ශ්‍රී.ල.වි.ප්‍ර හි විෂය පථය**

1. විගණකයෙකු විසින් ශ්‍රී ලංකා විගණන ප්‍රමිතවලට සමග අනුකූලව විගණනය කළ මූල්‍ය ප්‍රකාශවලින් හටගත් සංක්ෂිප්ත මූල්‍ය ප්‍රකාශන සම්බන්ධව වාර්තාකරණය සඳහා වන කාර්යභාරයට අදාලව එම විගණකගේ වගකීම් සම්බන්ධයෙන් මෙම ශ්‍රී ලංකා විගණන ප්‍රමිතය (ශ්‍රී.ල.වි.ප්‍ර.) කටයුතු කරයි.

**බලපැවැත්වෙන දිනය**

2. 2018 මාර්තු 31 දින හෝ ඊට පසුව අවසන් වන කාලපරිච්ඡේද සඳහා සංක්ෂිප්ත මූල්‍ය ප්‍රකාශ මත වාර්තා කිරීමට වන කාර්යභාරයන් සඳහා මෙම ශ්‍රී.ල.වි.ප්‍ර. බලපවත්වයි.

## අරමුණු

3. විගණකගේ අරමුණු වනුයේ:

(අ) සංක්ෂිප්ත මූල්‍ය ප්‍රකාශන සම්බන්ධව වාර්තා කිරීමට කාර්යභාරයන් භාරගැනීම උචිත දැයි නිර්ණය කිරීම; සහ

(ආ) සංක්ෂිප්ත මූල්‍ය ප්‍රකාශ මත වාර්තා කිරීමට දැනටමත් භාරගෙන ඇත්තේ නම්;

(i) ලබාගත් සාක්ෂි මත එළඹුණු නිගමන ඇගයීම් මත පදනම්ව සංක්ෂිප්ත මූල්‍ය ප්‍රකාශන මතයක් සකස් කිරීමට; සහ
(ii) එම මතය සඳහා වූ පදනමද විස්තර කෙරෙන ලිඛිත වාර්තාවක් මගින් එම මතය පැහැදිලිව ප්‍රකාශ කිරීමට.

## නිර්වචන

4. මෙම ශ්‍රී.ල.වි.ප්‍ර. හි අරමුණු සඳහා පහත සඳහන් පද වල අර්ථය පහත ආරෝපිත වේ:

(අ) ව්‍යවහාර කළ නිර්ණායක - සංක්ෂිප්ත මූල්‍ය ප්‍රකාශ පිළියෙල කිරීමේදී කළමනාකරනය විසින් ව්‍යවහාර කරන ලද නිර්ණායක

(ආ) විගණනය කරන ලද මූල්‍ය ප්‍රකාශන - විගණක විසින් ශ්‍රීලංවිප්‍ර ප්‍රකාරව විගණනය කරන ලද මූල්‍ය ප්‍රකාශ[1] සහ එසේ හටගත් සංක්ෂිප්ත මූල්‍ය ප්‍රකාශ

(ඇ) සංක්ෂිප්ත මූල්‍ය ප්‍රකාශ - මූල්‍ය ප්‍රකාශවලින් හටගත් ඓතිහාසික මූල්‍ය තොරතුරු නමුත් මූල්‍ය ප්‍රකාශවලට වඩා අඩු වන අතර ඒ සමගම කිසියම් අවස්ථාවක අස්තිත්වයේ ආර්ථික සම්පත් හෝ බැඳීම් හෝ කිසියම් කාලපරිච්ඡේදයක් සඳහා ඒවායෙහි වෙනස්වීම් සම්බන්ධයෙන් මූල්‍ය ප්‍රකාශන මගින් ඉදිරිපත් කෙරෙන ඓතිහාසික මූල්‍ය තොරතුරු[2]. එවැනි ඓතිහාසික මූල්‍ය තොරතුරු විස්තර කිරීමට විවිධ අධිකරණ බල ප්‍රදේශ විසින් විවිධ නාමාවලි භාවිතා කළහැකිය.

## අවශ්‍යතා

**කාර්යභාරය භාරගැනීම**

5. මෙම ශ්‍රී.ල .වි.ප්‍ර. ප්‍රකාරව සංක්ෂිප්ත මූල්‍ය ප්‍රකාශන මත වාර්තා කිරීම සඳහා වන කාර්යභාරය විගණක භාරගත යුත්තේ සංක්ෂිප්ත මූල්‍ය ප්‍රකාශන හටගත්, මූල්‍ය ප්‍රකාශ ශ්‍රීලංවිප්‍ර ප්‍රකාරව විගණක විසින් විගණනය පවත්වා ගෙනයාමට නිරත වී ඇති විටක පමණි. (යොමුව : අ.1 ඡේදය)

6. සංක්ෂිප්ත මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් වාර්තා කිරීමට කාර්යභාරයන් භාරගැනීමට පෙර, විගණක විසින් පහත සඳහන් දෑ කළ යුතුය;( යොමුව අ.2 ඡේදය )

---

[1] ශ්‍රී ල.වි.ප්‍ර. 200 "ස්වාධීන විගණකගේ සමස්ථ අරමුණු සහ ශ්‍රී ලංකා විගණන ප්‍රමිත වලට අනුකූලව විගණනයක් මෙහෙයවීම" 13 (ඊ) ඡේදයෙහි " මූල්‍ය ප්‍රකාශන" පදය නිර්වචනය කර ඇත."

[2] ශ්‍රී ල.වි.ප්‍ර. 200, 13 (ඊ) ඡේදය

(අ) ව්‍යවහාර කළ නිර්ණායක පිළිගත හැකිද යන්න නිර්ණය කළ යුතුය.; ( යොමුව : අ3 - අ7 ඡේද )

(ආ) පහත සඳහන් දෑ සඳහා, ස්වකීය වගකීම අවබෝධ කර ගන්නා සහ භාරගන්නා බවටත් කළමනාකාරීත්වයෙහි එකඟතාවය ලබා ගැනීම.:

(i) ව්‍යවහාර කළ නිර්ණායක සමග අනුකූලව සංක්ෂිප්ත මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සඳහා;

(ii) නොමනා දුෂ්කරතාවයකින් තොරව (හෝ නීතියෙන් හෝ රෙගුලාසි මගින් විගණනය කළ මූල්‍ය ප්‍රකාශ, අපේක්ෂිත සංක්ෂිප්ත මූල්‍ය ප්‍රකාශ පරිශීලනය කරන්නන්ට ලබා නොදිය යුතු යැයි ප්‍රතිපාදනය කර සහ සංක්ෂිප්ත මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සඳහා වන නිර්ණායක පිහිටුවා ඇත්නම්, සංක්ෂිප්ත මූල්‍ය ප්‍රකාශනවල එම නීතිය හෝ රෙගුලාසි විස්තර කිරීමට ) සංක්ෂිප්ත මූල්‍ය ප්‍රකාශ අපේක්ෂිත පරිශීලනය කරන්නන්ට විගණනය කළ මූල්‍ය ප්‍රකාශන ලබා දීමට; සහ

(iii) සංක්ෂිප්ත මූල්‍ය ප්‍රකාශ අඩංගු වන සහ ඒවා මත විගණක වාර්තා කර ඇති බැව් හැඟවෙන කවර හෝ ලේඛනයක සංක්ෂිප්ත මූල්‍ය ප්‍රකාශ පිළිබඳ විගණකගේ වාර්තාව ඇතුලත් කිරීමට

(ඇ) සංක්ෂිප්ත මූල්‍ය ප්‍රකාශ මත ප්‍රකාශ කළයුතු මතයේ ස්වභාවය සම්බන්ධයෙන් කළමනාකාරිත්වය සමග එකඟ වීම. (යොමුව 9 - 11 ඡේද බලන්න.)

7. ව්‍යවහාර කළ නිර්ණායක පිළි ගත නොහැකි නම් හෝ 6(ආ) ඡේදයේ නියම කර ඇති කළමනාකාරිත්වයේ එකඟතාවය ලබාගැනීමට හැකියාවක් නොමැති බව විගණක නිගමනය කරන්නේ නම් නීතියෙන් හෝ රෙගුලාසි මගින් එසේ කිරීම අවශ්‍ය කරන්නේ නම් හැර සංක්ෂිප්ත මූල්‍ය ප්‍රකාශ මත වාර්තා කිරීමට වන කාර්යභාරය විගණක විසින් භාර නොගත යුතුය. එවැනි නීතියකට හෝ රෙගුලාසියන්ට අනුකූලව පවත්වාගෙන යන කාර්යභාරයක් මෙම ශ්‍රී.ල .වි.ප්‍ර. සමග අනුකූල නොවේ. ඒ අනුව සංක්ෂිප්ත මූල්‍ය ප්‍රකාශන මත විගණකගේ වාර්තාවෙහි මෙම ශ්‍රී.ල .වි.ප්‍ර. ප්‍රකාරව කාර්යභාරය පවත්වාගෙන යන ලද බවක් සඳහන් නොවිය යුතුය. විගණක කාර්යභාර කොන්දේසිවල මෙම කරුණට යෝග්‍ය යොමුව ඇතුලත් කළ යුතුය. සංක්ෂිප්ත මූල්‍ය ප්‍රකාශනවලින් හටගත් මූල්‍ය ප්‍රකාශ විගණනය කිරීමට කාර්යභාරය මත මෙය බලපෑමක් තිබිය හැකි බව විගණක විසින් නිර්ණය කළයුතුය.

**ක්‍රියාපටිපාටිවල ස්වභාවය**

8. සංක්ෂිප්ත මූල්‍ය ප්‍රකාශන මත විගණකගේ මතය ප්‍රකාශ කිරීමේ පදනම ලෙස පහත දැක්වෙන ක්‍රියාපටිපාටි සහ විගණක අවශ්‍ය යැයි සලකන වෙනත් කවර හෝ ක්‍රියාපටිපාටි විගණක ඉටු කළ යුතුය.:

(අ) සංක්ෂිප්ත මූල්‍ය ප්‍රකාශන ඒවායෙහි සංක්ෂිප්ත ස්වභාවය ප්‍රමාණවත් අයුරින් හෙළිදරව් කරන්නේදැයි ඇගයීම සහ විගණනය කළ මූල්‍ය ප්‍රකාශන හඳුනා ගැනීම.

(ආ) සංක්ෂිප්ත මූල්‍ය ප්‍රකාශන විගණනය කළ මූල්‍ය ප්‍රකාශන සමග කැටුව නොමැති විට ඒවා පහත සඳහන් දෑ පැහැදිලිව විස්තර කරන්නේද යන්න ඇගයිය යුතුය:

(i) විගණනය කරන ලද මූල්‍ය ප්‍රකාශන ලබා ගත හැකි වනුයේ කොතැනින්ද, කවුරුන් වෙතින්ද යන්න ; හෝ

(ii) විගණනය කළ මූල්‍ය ප්‍රකාශන, අපේක්ෂිත සංක්ෂිප්ත මූල්‍ය ප්‍රකාශන පරිශීලනය කරන්නන්ට ලබාදීම අවශ්‍ය නොවන බව සහ සංක්ෂිප්ත මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේ නිර්ණායක ස්ථාපිත කර පැහැදිලිව සඳහන් කරන එම නීතිය හෝ රෙගුලාසි,

(ඇ) සංක්ෂිප්ත මූල්‍ය ප්‍රකාශන මගින් ව්‍යවහාර කරන ලද නිර්ණායක ප්‍රමාණවත් අයුරින් හෙළිදරව් කරන්නේද යන්න ඇගයීම.

(ඈ) සංක්ෂිප්ත මූල්‍ය ප්‍රකාශන විගණනය කළ මූල්‍ය ප්‍රකාශනව තුල සම්බන්ධිත තොරතුරු සමග එකඟවන්නේද යන්න හෝ ඒ තොරතුරුවලින් නැවත ගණනය කළ හැකිද යන්න නිර්ණය කිරීමට සංක්ෂිප්ත මූල්‍ය ප්‍රකාශන විගණනය කළ මූල්‍ය ප්‍රකාශනවල සම්බන්ධිත තොරතුරු සමග සසඳා බැලීම.

(ඉ) සංක්ෂිප්ත මූල්‍ය ප්‍රකාශන ව්‍යවහාර කළ නිර්ණායක සමග අනුකූලව පිළියෙල කර ඇත්ද යන්න ඇගයීම.

(ඊ) සංක්ෂිප්ත මූල්‍ය ප්‍රකාශනවල පරමාර්ථය සැලකිල්ලට ගනිමින් පවත්නා වාතාවරණය යටතේ නොමඟ යැවීමක් සිදු නොවන අයුරින් සංක්ෂිප්ත මූල්‍ය ප්‍රකාශනවල අවශ්‍ය තොරතුරු ඇතුලත් වන්නේද යන්නත්, උචිත අයුරින් සමාහරණය කළ මට්ටමක පවත්නේද යන්නත් ඇගයීම.

(උ) විගණනය කළ මූල්‍ය ප්‍රකාශන අපේක්ෂිත සංක්ෂිප්ත මූල්‍ය ප්‍රකාශන පරිශීලනය කරන්නන්ට ලබාදීමේ අවශ්‍යතාවයක් නොමැති බවත් සංක්ෂිප්ත මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සඳහා නිර්ණායක නීතියෙන් හෝ රෙගුලාසි මගින් ස්ථාපිත කරනු ලැබූ ඇතිවිටත් හැරුණු විට විගණනය කළ මූල්‍ය ප්‍රකාශන, සංක්ෂිප්ත මූල්‍ය ප්‍රකාශන අපේක්ෂිත පරිශීලනය කරන්නවුන්ට අනවශ්‍ය අයාසයකින් තොරව ලබා ගත හැක්කේද යන්න ඇගයීම. (යොමුව අ.8 ඡේදය බලන්න.)

**මතයේ ස්වරූපය**

9. සංක්ෂිප්ත මූල්‍ය ප්‍රකාශන මත විකරණය නොකරන ලද මතයක් උචිත වන්නේ යැයි විගණක විසින් නිගමනය කර ඇති විට නීතියෙන් හෝ රෙගුලාසි මගින් වෙනත් ආකාරයකින් අවශ්‍යකරන්නේ නම් හැර විගණකගේ මතයට පහත සඳහන් වැකිකඩවලින් එකක් භාවිතා කළ යුතුය: (යොමුව: අ.9 ඡේදය )

(අ) සමඟ අනුකූලව කැටුව යන සංක්ෂිප්ත මූල්‍ය ප්‍රකාශනයන් විගණනය කළ මූල්‍ය ප්‍රකාශනයන් සමඟ සියලු ප්‍රමාණාත්මක අංගයන් (*ව්‍යවහාර කළ නිර්ණායකය*) සමඟ සංගත වෙයි ; හෝ

(ආ) සමඟ අනුකූලව කැටුව යන සංක්ෂිප්ත මූල්‍ය ප්‍රකාශන, විගණනය කළ මූල්‍ය ප්‍රකාශනවල සාධාරණ සාරාංශයකි (*ව්‍යවහාර කළ නිර්ණායකය අනුව*)

10. සංක්ෂිප්ත මූල්‍ය ප්‍රකාශන මත මතයේ වචන පෙළගැස්ම 9 වැනි ඡේදයෙහි විස්තර කරන ලද එම භාෂිතයෙන් වෙනස් යයි නීතිය හෝ රෙගුලාසි මගින් නියම කරයි නම් විගණක විසින්:

(අ) නියමකරන ලද මතය ප්‍රකාශ කිරීමට විගණකට හැකිවන පරිදි 8 වැනි ඡේදයෙහි විස්තර කර ඇති ක්‍රියාපටිපාටිය සහ අවශ්‍ය කරන කවර හෝ අමතර ක්‍රියාපටිපාටි භාවිතා කළ යුතුය ; සහ

(ආ) සංක්ෂිප්ත මූල්‍ය ප්‍රකාශන පරිශීලනය කරන්නන් සංක්ෂිප්ත මූල්‍ය ප්‍රකාශන මත විගණකගේ මතය වරදවා වටහා ගනු ඇත්ද වග එසේ වන්නේ නම් සංක්ෂිප්ත මූල්‍ය ප්‍රකාශන මත විගණකගේ වාර්තාවෙහි අමතර පැහැදිලි කිරීම මගින් වියහැකි වරදවා වටහා ගැනීමේ ඉඩකඩ අඩුකර ගත හැකිද යන්න පිළිබඳවද ඇගයීමක් කළ යුතුය

11. 10 (ආ) ඡේදයට සම්බන්ධව වුවත් සංක්ෂිප්ත මූල්‍ය ප්‍රකාශන පිළිබඳව විගණකගේ වාර්තාවෙහි ඇතුලත් අමතර පැහැදිලි කිරීම්වල වියහැකි වරදවා වටහා ගැනීමකට අඩුකිරීමට නොහැකි වන බව විගණක නිගමනය කරන්නේ නම්, නීතියෙන් හෝ රෙගුලාසි වලින් එසේ කිරීම අවශ්‍ය කරන්නේ නම් හැර විගණක විසින් කාර්යභාරය භාර නොගත යුතුය. එවැනි නීති හෝ රෙගුලාසිවලට අනුකූලව පවත්වා ගෙන යනු ලබන කාර්යභාරයන් මෙම ශ්‍රීලංවිප්‍ර සමඟ අනුකූල නොවේ. ඒ අනුව මෙම ශ්‍රී.ල.වි.ප්‍ර. සමඟ අනුකූලව පවත්වා ගෙන ගිය කාර්යභාරයක් බව මෙම සංක්ෂිප්ත මූල්‍ය ප්‍රකාශන මත විගණකගේ වාර්තාවෙහි සඳහන් නොවිය යුතුය.

**විගණනය කළ මූල්‍ය ප්‍රකාශන මත විගණකගේ වාර්තාවෙහි දිනට පසු සිදුවීම් සහ වැඩකටයුතු සඳහා කාල නිර්ණය කිරීම**

12. විගණනය කළ මූල්‍ය ප්‍රකාශන මත විගණකගේ වාර්තාවට වඩා පසුව දිනයන් සංක්ෂිප්ත මූල්‍ය ප්‍රකාශන මත විගණකගේ වාර්තාව පසුදාතම කර තිබිය හැකිය. එවැනි අවස්ථාවලදී විගණනය කළ මූල්‍ය ප්‍රකාශන මත වන විගණකගේ වාර්තාවේ දිනයට පසුව සිදු වූ සිද්ධීන්ගේ බලපෑම සංක්ෂිප්ත මූල්‍ය ප්‍රකාශනවල සහ විගණනය කළ මූල්‍ය ප්‍රකාශනවල පළිබිඹු නොවන බව සංක්ෂිප්ත මූල්‍ය ප්‍රකාශන මත වන විගණන වාර්තාවේ සඳහන් කළ යුතුය. (යොමුව: අ10 ඡේදය)

13. විගණක කලින් දැනුවත්ව නොසිට, එහෙත් විගණනය කරන ලද මූල්‍ය ප්‍රකාශනවල විගණකගේ වාර්තාවෙහි දිනට පැවැති කරුණු විගණකට දැනගන්නට ලැබිය හැකිය. එවැනි අවස්ථාවලදී ශ්‍රී.ල.වි.ප්‍ර. 560[3] ප්‍රකාරව,විගණනය කළ මූල්‍ය ප්‍රකාශනවලට සම්බන්ධ එවැනි කරුණු පිළිබඳව විගණක සැලකිල්ලෙන් සිතා බැලීම සම්පූර්ණ කරන තෙක් විගණක විසින් සංක්ෂිප්ත මූල්‍ය ප්‍රකාශන මත විගණකගේ වාර්තාව නිකුත් නොකළ යුතුය .

[3] ශ්‍රී.ල.වි.ප්‍ර. 560, "*පසුකාලීන සිදුවීම්*"

**සංක්ෂිප්ත මූල්‍ය ප්‍රකාශන සමන්විත ලේඛන තුල තොරතුරු**

14. සංක්ෂිප්ත මූල්‍ය ප්‍රකාශන සමන්විත ලේඛනය තුල ඇතුලත් තොරතුරු විගණක කියවිය යුතු අතර එම තොරතුරු සහ සංක්ෂිප්ත මූල්‍ය ප්‍රකාශන අතර සහ ඒ මත විගණකගේ වාර්තාවෙන් ප්‍රමාණාත්මක අසංගතතාවයක් තිබේදැයි සලකා බැලිය යුතුය.

15. විගණක ප්‍රමාණාත්මක අසංගතතාවයක් හඳුනා ගන්නේ නම් විගණක විසින් එම කරුණ කළමනාකරණය සමඟ සාකච්ජා කළයුතු අතර සංක්ෂිප්ත මූල්‍ය ප්‍රකාශන හෝ සංක්ෂිප්ත මූල්‍ය ප්‍රකාශන අඩංගු ලේඛනය තුල ඇතුලත් තොරතුරු සහ ඒ මත විගණකගේ වාර්තාව සංශෝධනය කිරීමට අවශ්‍ය දැයි විගණක නිශ්චය කළ යුතුය. විගණක, තොරතුරු සංශෝධනය කිරීමට අවශ්‍ය වන බව නිශ්චය කරන්නේ නම් සහ අවශ්‍ය පරිදි සංශෝධනය කිරීමට කළමනාකරණය ප්‍රතික්ෂේප කන්නේ නම් විගණක සංක්ෂිප්ත මූල්‍ය ප්‍රකාශන මත විගණකගේ වාර්තාව සඳහා හැඟවීම් සලකාබැලීම ඇතුලත් අවස්ථාවන්හිදී විගණක යෝග්‍ය ක්‍රියාමාර්ග ගත යුතුය. (යොමුව: අ11- අ16 ඡේද)

**සංක්ෂිප්ත මූල්‍ය ප්‍රකාශන මත විගණකගේ වාර්තාව**

*විගණකගේ වාර්තාවෙහි මූලිකාංග*

16. සංක්ෂිප්ත මූල්‍ය ප්‍රකාශන මත විගණකගේ වාර්තාවෙහි පහත සඳහන් මූලිකාංග ඇතුලත් විය යුතුය:[4] (යොමුව අ.23 ඡේදය)

(අ) එය ස්වාධීන විගණකයකුගේ වාර්තාව ලෙස පැහැදිලිව සඳහන් වන ශීර්ෂ පාඨයක් (යොමුව: අ.17 ඡේදය බලන්න.)

(ආ) ඇමතුම් ලබන්නා (යොමුව:අ.18 ඡේදය)

(ඇ) සංක්ෂිප්ත මූල්‍ය ප්‍රකාශනවල ඇතුලත් එක් එක් ප්‍රකාශනයෙහි ශීර්ෂ පාඨය ඇතුලත් කොට විගණක විසින් වාර්තා කරනු ලබන සංක්ෂිප්ත මූල්‍ය ප්‍රකාශන හඳුනාගැනීම. (යොමුව : අ19 ඡේදය)

(ඈ) විගණනය කළ මූල්‍ය ප්‍රකාශන හඳුනා ගැනීම

(ඉ) 20 ඡේදයට යටත්ව පැහැදිළි මතයක් ප්‍රකාශ කිරීම (9- 11 ඡේද බලන්න)

(ඊ) විගණනය කළ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී ව්‍යවහාර කළ මූල්‍ය වාර්තාකරණ ආකෘතිමය රාමුව මගින් අවශ්‍ය කෙරෙන සියළුම හෙළිදරව්කිරීම් සංක්ෂිප්ත මූල්‍ය ප්‍රකාශනවල සමන්විත නොවන අතර සහ සංක්ෂිප්ත මූල්‍ය ප්‍රකාශන හා ඒ මත විගණකගේ වාර්තාව කියවීම, විගණනය කළ මූල්‍ය ප්‍රකාශන හා ඒ මත විගණකගේ වාර්තාව සඳහා ආදේශනයක් නොවන බවත් අඟවන ප්‍රකාශයක්.

(උ) අදාල අවස්ථාවලදී 12 ඡේදය මගින් අවශ්‍ය කෙරෙන ප්‍රකාශයක්.

(ඌ) විගණනය කළ මූල්‍ය ප්‍රකාශන මත විගණකගේ වාර්තාවත්, එම වාර්තාවෙහි දිනයටත් අවදානය යොමු කරවමින් 19-20 ඡේදවලට යටත්ව විගණනය කළ මූල්‍ය ප්‍රකාශන මත විකරණය නොකරන ලද මතයක් ඉදිරිපත් කර ඇති බව වන එම කරුණ.

(ඔ) ව්‍යවහාර කළ නිර්ණායක සමග අනුකූලව සංක්ෂිප්ත මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සඳහා සම්බන්ධයෙන් කළමනාකාරීත්වය[5] වගකිව යුතු බව පැහැදිලිකරමින් සංක්ෂිප්ත මූල්‍ය ප්‍රකාශ සඳහා කළමනාකාරීත්වයෙහි[6] වගකීම ගැන විස්තරයක්.

(ඕ) විගණනය කළ මූල්‍ය ප්‍රකාශන සමඟ සංක්ෂිප්ත මූල්‍ය ප්‍රකාශන සියලුම ප්‍රමාණාත්මක ආකාරයෙන් (*හෝ සාධාරණ සංක්ෂිප්තයක*) සංගත වන්නේදැයි මෙම ශ්‍රී.ල.වි.ප්‍ර. සමඟ අනුකූලව ඉටුකළ විගණන ක්‍රියාපටිපාටි මත පදනම්ව මතයක් ප්‍රකාශ කිරීම සඳහා විගණක වගකිව යුතු බවට ප්‍රකාශයක්.

(එ) විගණකගේ අත්සන.

---

[4] විගණනය කරන ලද මූල්‍ය ප්‍රකාශන විකරණය කිරීම් සම්බන්ධයෙන් අදාල වන 19 - 20 ඡේදවලින් මෙම ඡේදයෙහි ලැයිස්තු ගත දෑ වලට අමතර මූලිකාංග අවශ්‍ය කෙරෙයි.

[5] හෝ විශේෂ අධිකරණ බලප්‍රදේශයක නෛතික ආකෘතිමය රාමුව සම්බන්ධයෙන් යෝග්‍ය වන වෙනත් පද

[6] හෝ විශේෂ අධිකරණ බලප්‍රදේශයක නෛතික ආකෘතිමය රාමුව සම්බන්ධයෙන් යෝග්‍ය වන වෙනත් පද

(ඕ) විගණකගේ ලිපිනය

(ක) විගණකගේ වාර්තාවෙහි දිනය (අ20 ඡේදය)

**17.** සංක්ෂිප්ත මූල්‍ය ප්‍රකාශනවල අමතනු ලබන්නා විගණනය කළ මූල්‍ය වාර්තා මත විගණකගේ වාර්තාවෙහි අමතනු ලබන්නා නොවේ නම් වෙනස් අමතනු ලබන්නෙකු භාවිතා කිරීමේ යෝග්‍යතාවය විගණක විසින් ඇගයීමක් කළ යුතුය. (යොමුව අ18 ඡේදය)

**18.** විගණක විසින් සංක්ෂිප්ත මූල්‍ය ප්‍රකාශන මත විගණකගේ වාර්තාව පහත සඳහන් දින වලට කලින් නොවන දිනයක දාතම කළ යුතුය. (යොමුව අ20 ඡේදය)

(අ) සංක්ෂිප්ත මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බවටත් පිළිගත් අධිකාරී බලය ඇති අය විසින් ඒ වෙනුවෙන් ඔවුන් වගකීම භාරගෙන ඇති බව තහවුරු කිරීමටත් සාක්ෂි ඇතුළත්ව මතය පදනම් කරගැනීමට යෝග්‍ය වන ප්‍රමාණවත් සාක්ෂි විගණක ලබාගෙන ඇති දිනය; සහ

(ආ) විගණනය කළ මූල්‍ය ප්‍රකාශන මත විගණකගේ වාර්තාවෙහි දිනය

*විගණනය කළ මූල්‍ය ප්‍රකාශන මත විගණකගේ වාර්තාවට යොමුව* (අ.23 ඡේදය බලන්න.)

**19.** විගණනය කළ මූල්‍ය ප්‍රකාශන මත විගණකගේ වාර්තාවෙහි ඇතුලත් වන විට:

(අ) ශ්‍රී.ල.වි.ප්‍ර. 705 (සංශෝධිත)[7] සමග අනුකූලව කොන්දේසි සහිත මතය;

(ආ) ශ්‍රී.ල.වි.ප්‍ර. 706 (සංශෝධිත)[8] සමග අනුකූලව කරුණු අවධාරණය කිරීමේ ඡේදය හෝ වෙනත් කරුණු ඡේදයක්;

(ඇ) ශ්‍රී.ල.වි.ප්‍ර. 570 (සංශෝධිත)[9] සමග අනුකූලව *අඛණ්ඩ පැවැත්ම කොටසට සම්බන්ධ ප්‍රමාණාත්මක* අනියතතාවයක් ;

(ඈ) ශ්‍රී.ල.වි.ප්‍ර. 701[10] සමග අනුකූලව ප්‍රධාන විගණන කරුණු සන්නිවේදනය කිරීම; හෝ

(ඉ) ශ්‍රී.ල.වි.ප්‍ර. 720 (සංශෝධිත)[11] සමග අනුකූලව වෙනත් තොරතුරුවල නිවැරදි නොකළ ප්‍රමාණාත්මක අවප්‍රකාශයක් විස්තර කරන ප්‍රකාශයක්;

සහ සංක්ෂිප්ත මූල්‍ය ප්‍රකාශන සියලුම ප්‍රමාණාත්මක ආකාරයෙන් සංගත වන විට හෝ විගණනය කළ මූල්‍ය ප්‍රකාශනවල සාධාරණ සංක්ෂිප්තයක් ව්‍යවහාර කළ නිර්ණායක අනුව වන බව විගණක සෑහීමට පත් වන විට 16 ඡේදයේ මූලිකාංගයට අමතරව සංක්ෂිප්ත මූල්‍ය ප්‍රකාශන මත විගණකගේ වාර්තාවෙහි පහත දෑ ඇතුලත් කරයි:

(i) විගණනය කළ මූල්‍ය ප්‍රකාශන මත විගණකගේ වාර්තාව මත, කොන්දේසි සහිත මතයක්, කරුණු අවධාරණය කිරීමේ ඡේදයක්, වෙනත් කරුණු ඡේදයක්, *අඛණ්ඩ පැවැත්ම කොටසට සම්බන්ධ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක්*, ප්‍රධාන විගණන කරුණු සන්නිවේදනය කිරීම හෝ වෙනත් තොරතුරුවල නිවැරදි නොකළ ප්‍රමාණාත්මක අවප්‍රකාශයක් විස්තර කරන ප්‍රකාශයක් ඇතුලත් කරන බව සඳහන් කිරීම; සහ (යොමුව: *අ.21 ඡේදය.*)

(ii) පහත දෑ විස්තර කිරීම : (යොමුව: *අ.22 ඡේදය.*)

අ. විගණනය කළ මූල්‍ය ප්‍රකාශන මත කොන්දේසි සහිත මතය සඳහා පදනම සහ එමගින් සංක්ෂිප්ත මූල්‍ය ප්‍රකාශන මත බලපෑමක් වේ නම් එය;

ආ. විගණනය කළ මූල්‍ය ප්‍රකාශන මත විගණකගේ වාර්තාවේ කොටසේ කරුණු අවධාරණය කිරීමේ ඡේදයේ, වෙනත් කරුණු ඡේදයේ, හෝ *අඛණ්ඩ පැවැත්මට සම්බන්ධ ප්‍රමාණාත්මක අනියතතාවය* යොමු කළ කරුණු සහ ඒ මත සංක්ෂිප්ත මූල්‍ය ප්‍රකාශන මත බලපෑමක් වේ නම්; හෝ

---

[7] ශ්‍රී.ල.වි.ප්‍ර. 705 (සංශෝධිත), *ස්වාධීන විගණකගේ වාර්තාවේ මතයට විකරණය කිරීම්*

[8] ශ්‍රී.ල.වි.ප්‍ර. 706 (සංශෝධිත), *ස්වාධීන විගණකගේ වාර්තාවේකරුණු අවධාරණය කිරීමේ ඡේද සහ වෙනත් කරුණු ඡේද*

[9] ශ්‍රී.ල.වි.ප්‍ර. 570 (සංශෝධිත), *අඛණ්ඩ පැවැත්ම* 22 *ඡේදය.*

[10] ශ්‍රී.ල.වි.ප්‍ර. 701 , *ස්වාධීන විගණකගේ වාර්තාවේ ප්‍රධාන විගණන කරුණු සන්නිවේදනය කිරීම*

[11] ශ්‍රී.ල.වි.ප්‍ර. 720 (සංශෝධිත), *වෙනත් කරුණුවලට සම්බන්ධ විගණකගේ වගකීම්*

ඇ. සංක්ෂිප්ත මූල්‍ය ප්‍රකාශන සහ ඒ මත විගණකගේ වාර්තාවේ සමන්විත ලේඛනය තුළ ඇතුළත් තොරතුරු මත වෙනත් තොරතුරුවල නිවැරදි නොකළ ප්‍රමාණාත්මක අවප්‍රකාශය හෝ ඒ මත බලපෑමක් වේ නම් (යොමුව : අ15 *ඡේදය*)

20. විගණනය කළ මූල්‍ය ප්‍රකාශන මත විගණකගේ වාර්තාවෙහි අහිතකර මතයක් හෝ මතය වියාචනය කිරීම අඩංගු වන විට 16 වැනි ඡේදය තුළ මූලිකාංගවලට අමතරව සංක්ෂිප්ත මූල්‍ය ප්‍රකාශන මත විගණකගේ වාර්තාවේ:

(අ) විගණනය කළ මූල්‍ය ප්‍රකාශන මත විගණකගේ වාර්තාවේ අහිතකර මතයක් හෝ මතය වියාචනය කිරීමක් අඩංගු වන බව සඳහන් කිරීම;

(ආ) එම අහිතකර මතයට හෝ මතය වියාචනය කිරීම සඳහා වූ පදනම විස්තර කිරීම; සහ

(ඇ) ගණනය කළ මූල්‍ය ප්‍රකාශන මත අහිතකර මතයෙහි හෝ මතය වියාචනය කිරීමේ ප්‍රතිඵලයක් ලෙස සංක්ෂිප්ත මූල්‍ය ප්‍රකාශන මත මතයක් ප්‍රකාශ කිරීම යෝග්‍ය නොවන බව සඳහන් කිරීම (යොමුව : අ23 *ඡේදය*)

*සංක්ෂිප්ත මූල්‍ය ප්‍රකාශන මත විකරණය කළ මතය*

21. ව්‍යවහාර කළ නිර්ණායක අනුව සියලුම ප්‍රමාණාත්මක ආකාරයෙන් සංක්ෂිප්ත මූල්‍ය ප්‍රකාශන සංගත නොවන්නේ නම් හෝ විගණනය කළ මූල්‍ය ප්‍රකාශනවල සාධාරණ සංක්ෂිප්තයක් නොවන්නේ නම් සහ කළමනාකාරිත්වය අවශ්‍ය කරන වෙනස්කම් සිදුකිරීමට එකඟ නොවන්නේ නම් විගණක සංක්ෂිප්ත මූල්‍ය ප්‍රකාශන මත අහිතකර මතයක් ප්‍රකාශ කළ යුතුය. (යොමුව : අ.23 ඡේදය )

**ගිණුම්කරණයේ පදනමට බෙදාහැරීමේදී හෝ භාවිත භාවිත කිරීමක සීමා කිරීම හෝ කියවන්නන් සෝදීසියෙන් තැබීම**

22. විගණනය කළ මූල්‍ය ප්‍රකාශන මත විගණකගේ වාර්තාව බෙදාහැරීම හෝ භාවිතා කිරීම සීමාකර ඇතිවිට හෝ විගණනය කළ මූල්‍ය ප්‍රකාශන මත විගණකගේ වාර්තාව විශේෂ අරමුණු ආකෘතිමය රාමුවකට අනුකූලව පිළියෙල කර ඇතැයි පරිශීලනය කරන්නන්ට සුපරික්ෂාකාරී වන්නේ නම් සංක්ෂිප්ත මූල්‍ය ප්‍රකාශන මත විගණකගේ වාර්තාව තුළ විගණක විසින් එවැනි සීමාවක් හෝ සෝදීසියෙන් තැබීම ඇතුළත් කළ යුතුය.

**සංසන්දනයන්**

23. විගණනය කළ මූල්‍ය ප්‍රකාශනවල සංසන්දනයන් ඇතුළත් වන විට නමුත් සංක්ෂිප්ත මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් නොවන්නේ නම් කාර්යභාරයේ තත්වයන් යටතේ සංක්ෂිප්ත මූල්‍ය ප්‍රකාශන මත එවැනි අත්හැරීමක් සාධාරණදැයි විගණක නිර්ණය කළ යුතුය. සංක්ෂිප්ත මූල්‍ය ප්‍රකාශන මත විගණකගේ වාර්තාව මත අසාධාරණ අත්හැරීමක බලපෑම විගණක නිර්ණය කළ යුතුය. :(යොමුව : අ.24 ඡේදය)

24. වෙනත් විගණකවරයකු විසින් වාර්තා කරන ලද සංසන්දනයන් සංක්ෂිප්ත මූල්‍ය වාර්තාවල අඩංගු වන්නේ නම් ශ්‍රී.ල.වි.ප්‍ර. 710 ප්‍රමිතයෙන් අවශ්‍ය කෙරෙන සංක්ෂිප්ත මූල්‍ය ප්‍රකාශන මත විගණකගේ වාර්තාවෙහි අඩංගු විය යුතු කරුණුද සංක්ෂිප්ත මූල්‍ය ප්‍රකාශන මත විගණකගේ වාර්තාවෙහිද සමන්විත විය යුතුය.[12] (යොමුව : අ.25 ඡේදය)

**සංක්ෂිප්ත මූල්‍ය ප්‍රකාශන සමග ඉදිරිපත් කරනු ලබන විගණනය නොකළ පරිපූරක තොරතුරු**

25 සංක්ෂිප්ත මූල්‍ය ප්‍රකාශන සමග ඉදිරිපත් කළ කවර හෝ විගණනය නොකළ පරිපූරක තොරතුරු සංක්ෂිප්ත මූල්‍ය ප්‍රකාශනවලින් පැහැදිලිව වෙන්කොට හඳුනාගෙන ඇත්තේදැයි විගණක ඇගයීමක් කළ යුතුය. විගණනය නොකළ පරිපූරක තොරතුරුවල අස්තිත්වයේ ඉදිරිපත් කිරීම සංක්ෂිප්ත මූල්‍ය ප්‍රකාශනවලින් පැහැදිලිව වෙන් කොට හඳුනාගෙන නොමැති බව විගණක නිගමනය කරන්නේ නම් විගණනය නොකළ පරිපූරක තොරතුරුවල ඉදිරිපත් කිරීම වෙනස් කරන ලෙස විගණක කළමනාකාරිත්වයෙන් ඉල්ලා සිටිය යුතුය. කළමනාකාරිත්වය එසේ කිරීම ප්‍රතික්ෂේප කරන්නේ නම් සංක්ෂිප්ත මූල්‍ය ප්‍රකාශන මත විගණකගේ වාර්තාවෙහි විගණක එකී තොරතුරු ආවරණය නොවන බව එම වාර්තාව මගින් පැහැදිලි කළ යුතුය. :(යොමුව :අ.26 ඡේදය)

---

[12] ශ්‍රී.ල.වි.ප්‍ර. 710, සන්සදාත්මක තොරතුරු— *අනුරූපී සංඛ්‍යා සහ සන්සදාත්මක මූල්‍ය ප්‍රකාශන*

## විගණකගේ සහභාගිත්වය

26. විගණක විසින් සංක්ෂිප්ත මූල්‍ය වාර්තා ඇතුළත් ලේඛනයක සංක්ෂිප්ත මූල්‍ය ප්‍රකාශන මත විගණක වාර්තා කර තිබෙන බව සඳහන් කිරීමක් අස්තිත්වය සැලසුම් කරන බව නමුත් සම්බන්ධිත විගණකගේ වාර්තාව ඒබව ඇතුළත් නොකිරීමටත් අස්තිත්‍වය සැලසුම් කරන බව විගණකගේ දැන ගැනීමට ලක්වුවහොත් එම ලේඛනයෙහි විගණකගේ වාර්තාව ඇතුළත් කරන ලෙස විගණක කළමනාකරණයෙන් ඉල්ලීම් කළ යුතුය. කළමනාකරණය එසේ නොකරන්නේ නම් එම ලේඛනයෙහි සංක්ෂිප්ත මූල්‍ය ප්‍රකාශන සමග විගණකගේ සහභාගිත්වය යෝග්‍ය නොවන ලෙස කළමනාකරණය වැළැක්වීමට සැලසුම් කළ යෝග්‍ය ක්‍රියාමාර්ග විගණක නිශ්චය කළ යුතුය. (යොමුව අ.27 ඡේදය.)

27. අස්තිත්‍වයක සංක්ෂිප්ත මූල්‍ය ප්‍රකාශන මත වාර්තා කිරීමෙහි කාර්යයේ විගණක නිරත නොකර, එහෙත් මූල්‍ය ප්‍රකාශන මත වාර්තා කිරීමෙහි කාර්යයේ නිරත කළ හැකිය. එසේ වන්නේ නම් මෙම අවසථාවේ විගණක ගැන යොමුවක් සඳහන් කරන ලියවිල්ල විගණක විසින් විගණනය කරන ලද මූල්‍ය ප්‍රකාශනවලින් හටගත් එම සංක්ෂිප්ත මූල්‍ය ප්‍රකාශන ලබාගෙන ඇති කරුණ සඳහන් වන ප්‍රකාශයක් ඇතුළත් කිරීමට අස්තිත්‍වය සැලසුම් කරන බව විගණක දැනුවත්ව සිටින විට විගණක පහත දෑ සමග සෑහීමකට පත්විය යුතුය:

(අ) විගණනය කළ මූල්‍ය ප්‍රකාශන මත විගණක වාර්තාවේ සම්බන්ධය තුළ විගණකට සඳහන් කිරීමක් සිදු කෙරෙන බව; සහ

(ආ) සංක්ෂිප්ත මූල්‍ය ප්‍රකාශන මත විගණක වාර්තා කර ඇති බව හැඟිවීමක් ප්‍රකාශයෙන් ගෙන නොදෙන බව

(අ) හෝ (ආ) අවශ්‍යතා සපුරාලන්නේ නොමැති නම් ඒවා සපුරාලන අයුරින් ප්‍රකාශය වෙනස් කිරීමට හෝ එම ලියවිල්ලෙහි විගණකට සඳහන් නොකිරීමටත් විගණක කළමනාකාරීත්‍වයෙන් ඉල්ලා සිටිය යුතුය. විකල්පයක් වශයෙන් අස්තිත්වය විගණකව සංක්ෂිප්ත මූල්‍ය ප්‍රකාශන පිළිබඳව වාර්තා කිරීමට කාර්යභාරයේ නිරත කරවීමට සහ ලේඛනය තුළ සම්බන්ධිත විගණක වාර්තාව ඇතුළත් කිරීමත් කළ හැකිය. කළමනාකාරීත්‍වය ප්‍රකාශනය වෙනස් නොකරන්නේ නම් හෝ විගණකට සඳහන් ඉවත් කරන්නේ නම් හෝ සංක්ෂිප්ත මූල්‍ය ප්‍රකාශන සමන්විතවන ලේඛනයේ, සංක්ෂිප්ත මූල්‍ය ප්‍රකාශන මත විගණන වාර්තාව ඇතුළත් කරන්නේ නම්, විගණකට කරන සඳහනක් විගණක එකඟ නොවන බවට විගණක කළමනාකාරීත්‍වයට උපදෙස් දියයුතු අතර කළමනාකාරීත්‍වය නුසුදුසු අන්දමින් විගණක වෙත සඳහන් කිරීම වැළැක්වීමට සැළසුම් කළ උචිත වෙනත් ක්‍රියාමාර්ග විගණක නිර්ණය කර ඒවා ක්‍රියාත්මක කළ යුතුය. (යොමුව:අ.27 ඡේදය)

***

**භාවිත කිරීමේ සහ පැහැදිලි කිරීමේ වෙනත් කරුණු**
**කාර්යභාරය භාරගැනීම** (යොමුව 5-6 ඡේද)

අ1. මූල්‍ය ප්‍රකාශන විගණනයෙන් හටගත් සංක්ෂිප්ත මූල්‍ය ප්‍රකාශනවලින් මෙම ශ්‍රී.ල.වි.ප්‍ර.ය සමග අනුකූලව සංක්ෂිප්ත මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් විගණකගේ වගකීම් ඉටුකිරීමට අවශ්‍ය දැනුම විගණකට ලබාදෙනු ලැබේ. සංක්ෂිප්ත මූල්‍ය ප්‍රකාශන හටගත් මූල්‍ය ප්‍රකාශනද විගණක විසින් විගණනය කර නොකරන්නේ නම් සංක්ෂිප්ත මූල්‍ය ප්‍රකාශන මත විගණන මතය පදනම් කර ගැනීමට ප්‍රමාණවත් යෝග්‍ය සාක්ෂි මෙම ශ්‍රී.ල.වි.ප්‍ර. ය භාවිතයෙන් ලබාදෙනු නොලැබේ.

අ2. 6 වැනි ඡේදයෙහි විස්තර කළ කරුණු සමග කළමනාකරණයේ එකඟතාවය, කාර්යභාරයේ කොන්දේසි ලිඛිතව පිළිගැනීම මගින් සාක්ෂි සැපයිය හැකිය.

*නිර්ණායක* (යොමුව: 6 (අ) ඡේදය )

අ3. සංක්ෂිප්ත මූල්‍ය ප්‍රකාශන සියලුම ප්‍රමාණාත්මක අංගයන් ඒවා සංගතවීමට හෝ ඒවා විගණනය කළ මූල්‍ය ප්‍රකාශනවල සාධාරණ සංක්ෂිප්තයන් නියෝජනය වනු පිණිස සංක්ෂිප්ත මූල්‍ය ප්‍රකාශනවල පිළිබිඹු වියයුතු තොරතුරු, සංක්ෂිප්ත මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමකදී කළමනාකරණය නිර්ණය කිරීම අවශ්‍ය කෙරේ. සංක්ෂිප්ත මූල්‍ය ප්‍රකාශනවල ඒවායෙහි ස්වභාවය අනුවම සමුච්චිත තොරතුරු සහ සීමිත හෙළිදරව්වකින් සමන්විත වන නිසා පවත්නා තත්වයන් තුළ යටතේ නොමග යවන සුළු නොවන තොරතුරු ඒවායෙහි ඇතුළත් නොවිය හැකිය යන්න සම්බන්ධයෙන් වැඩි අවදානමක් පවතියි. සංක්ෂිප්ත මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සඳහා ස්ථාපිත නිර්ණායක නොපවත්නා විට මෙම අවදානම ඉහළ යයි.

අ4. ව්‍යවහාර කළ නිර්ණායකවල පිළිගත හැකි බවට විගණකගේ නිර්ණය කිරීම කෙරෙහි බලපාන සාධකවලට පහත දෑ ඇතුළත් වේ:

- අස්තිත්වයේ ස්වභාවය;
- සංක්ෂිප්ත මූල්‍ය ප්‍රකාශනවල අරමුණ ;
- සංක්ෂිප්ත මූල්‍ය ප්‍රකාශන අපේක්ෂා කරනු ලබන පරිශීලකයන්ගේ තොරතුරු අවශ්‍යතා ;
- ව්‍යවහාර කළ නිර්ණායක පවත්නා තත්වයන් තුළ සංක්ෂිප්ත මූල්‍ය ප්‍රකාශනවල නොමඟ යවන සුළු නොවන ප්‍රතිඵල ඇතිකරන්නේ ද යන්න.

අ5. සංක්ෂිප්ත මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සඳහා වන නිර්ණායක අනුමත හෝ පිළිගත් ප්‍රමිත පිහිටුවීමේ ආයතනය හෝ නීතිය හෝ රෙගුලාසි මගින් පිහිටු විය හැකිය. මූල්‍ය ප්‍රකාශන සම්බන්ධ කාරණයෙහි දී මෙන්ම සමානව ශ්‍රී.ල.වි.ප්‍ර. 210[13] හි විස්තර කර ඇති අන්දමට, එවැනි බොහෝ අවස්ථාවල දී එවැනි නිර්ණායක පිළිගත හැකි බව විගණක උපකල්පනය කරයි.

අ6. සංක්ෂිප්ත මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් ස්ථාපිත නිර්ණායක නොපවතින අවස්ථාවක දී කළමනාකරණය විසින් නිර්ණායක සංවර්ධනය කළ හැකිය. විශේෂිත වූ කර්මාන්තයක් තුළ පරිචය පදනම් කරගැනීම උදාහරණයකි. පවත්නා තත්වයන් තුළ පිළිගත හැකි නිර්ණායකවල ප්‍රතිඵලයක් විය හැකි සංක්ෂිප්ත මූල්‍ය ප්‍රකාශනවලිනි:

(අ) ඒවායෙහි සංක්ෂිප්ත ස්වභාවය ප්‍රමාණවත්ව හෙළදරව් කිරීම සහ විගණනය කළ මූල්‍ය ප්‍රකාශන හඳුනා ගනියි;

(ආ) විගණනය කළ මූල්‍ය ප්‍රකාශන ලබාගත හැක්කේ කාගෙන් ද, කොතැනින් ද යන්න හෝ විගණනය කළ මූල්‍ය ප්‍රකාශන අපේක්ෂිත සංක්ෂිප්ත මූල්‍ය ප්‍රකාශන පරිශීලනය කරන්නන්ට ලබාදීම අවශ්‍ය නොවන බවට ප්‍රතිපාදන කෙරෙන එම නීති හෝ රෙගුලාසි වේ නම් සහ සංක්ෂිප්ත මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේ නිර්ණායක ස්ථාපනය කරන නීති හෝ රෙගුලාසි පැහැදිලිව විස්තර කරයි;

(ඇ) ව්‍යවහාර කළ නිර්ණායක ප්‍රමාණවත්ව හෙළිදරව් කරයි;

(ඈ) විගණනය කළ මූල්‍ය ප්‍රකාශන තුළ සම්බන්ධිත තොරතුරු සමග එකඟවීම හෝ නැවත ගණනය කළහැකි වීම සහ

(ඉ) සංක්ෂිප්ත මූල්‍ය ප්‍රකාශනවල අරමුණු සැලකිල්ලට ගැනීමේ දී අවශ්‍ය තොරතුරු ඇතුළත්වන අතර ඒවා පවත්නා තත්වය යටතේ නොමඟ යවන සුළු නොවන උචිත මට්ටමකට සමාහරණය කර ඇත ;

අ7. අ.6 (අ) ඡේදයෙහි සඳහන් කර ඇති සංක්ෂිප්ත මූල්‍ය ප්‍රකාශනවල සාරාංශගත ස්වභාවය සහ විගණනය කළ මූල්‍ය ප්‍රකාශනවල අනන්‍යතාවය ප්‍රමාණවත් ලෙස හෙළිදරව් කෙරෙන උදාහරණයක් වශයෙන් "20X1 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා විගණනය කළ මූල්‍ය ප්‍රකාශනවලින් පිළියෙල කරගත් සංක්ෂිප්ත මූල්‍ය ප්‍රකාශන" වැනි ශීර්ෂයක් සැපයීම."විය හැකි ය.

**විගණනය කළ මූල්‍ය ප්‍රකාශන ලබාගැනීමේ හැකියාව ඇගයීම** (*යොමුව:*8 (උ) ඡේදය)

අ8. සංක්ෂිප්ත මූල්‍ය ප්‍රකාශනවල අපේක්ෂිත පරිශීලනය කරන්නන්ට විගණනය කළ මූල්‍ය ප්‍රකාශන අපහසුතාවයකින් තොරව ලබා ගත හැකිද යන්න පිළිබඳ විගණකගේ ඇගයීම කෙරෙහි පහත සඳහන් සාධක බලපානු ලබයි. :

- විගණනය කළ මූල්‍ය ප්‍රකාශන ලබාගත හැක්කේ කවුරුන්ගෙන් ද, හෝ කොතැනින් ද යන්න සංක්ෂිප්ත මූල්‍ය ප්‍රකාශනවල පැහැදිලිව විස්තර කිරීම;
- විගණනය කළ මූල්‍ය ප්‍රකාශන පොදු ලේඛනයන් මත තිබීම; හෝ

[13] ශ්‍රී.ල.වි.ප්‍ර. 210, " *විගණන කාර්යභාරයෙහි කොන්දේසි සමග එකඟ වීම* . අ3 සහ අ8-අ9 ඡේද

- සංක්ෂිප්ත මූල්‍ය ප්‍රකාශන අපේක්ෂිත පරිශීලනය කරන්නන්ට විගණනය කළ මූල්‍ය ප්‍රකාශනවලට පහසුවෙන් ලබා ගැනීමට හැර කළමනාකරණය විසින් ක්‍රියාවලියක් පිහිටුවා තිබීම.

**මතයෙහි ස්වරූපය** (*යොමුව:* 9 ඡේදය)

අ9. 8 වැනි ඡේදයෙහි ක්‍රියාපටිපාටි ඉටු කිරීමෙන් ලබාගත් සාක්ෂි ඇගයීමක් පදනම් කරගෙන සංක්ෂිප්ත මූල්‍ය ප්‍රකාශන මත විකරණය නොකළ මතයක් යෝග්‍ය බැව් නිගමනය කිරීම මගින් 9 වැනි ඡේදයෙහි අඩංගු වැකිකඩ වලින් එකට අන්තර්ගත වන මතයක් ප්‍රකාශ කිරීමට විගණකට හැකියාව ලැබෙයි. වැකිකඩකවලින් කුමක් භාවිතා කරන්නේ ද යන විගණකගේ තීරණය විශේෂිත අධිකරණ බල ප්‍රදේශයෙහි පොදුවේ පිළිගත් පරිචය මගින් බලපානු ලබයි.

**වැඩ කටයුතුවල කාල නිර්ණය කිරීම සහ විගණනය කළ මූල්‍ය ප්‍රකාශන මත විගණකගේ වාර්තාවෙහි දිනට පසුව සිදුවන සිදුවීම්** ( යොමුව: 12 ඡේදය)

අ10. 8 වැනි ඡේදයෙහි විස්තර කළ ක්‍රියාපටිපාටි බොහෝ විට ඉටු කෙරෙනුයේ මූල්‍ය ප්‍රකාශන විගණනය සිදු කෙරෙන අතරවාරයේ හෝ විගණනය නිම වූ වහාමයි. මූල්‍ය ප්‍රකාශන විගණනය නිම කිරීමෙන් පසුව විගණක සංක්ෂිප්ත මූල්‍ය ප්‍රකාශන මත වාර්තා කරන විට විගණනය කළ මූල්‍ය ප්‍රකාශන මත අමතර විගණන සාක්ෂි ලබාගැනීම හෝ විගණනය කළ මූල්‍ය ප්‍රකාශන මත විගණකගේ වාර්තාවෙහි දිනට පසුකාලීන සිදුවීම්වල බලපෑම් වාර්තා කිරීම අවශ්‍ය නොකෙරේ. එසේ වන්නේ සංක්ෂිප්ත මූල්‍ය ප්‍රකාශන හටගන්නේ විගණනය කළ මූල්‍ය ප්‍රකාශන අනුසාරයෙන් පිළියෙල කර ඇති බැවින් සහ ඒවා යාවත්කාලන නොකෙරෙන නිසාය.

**සංක්ෂිප්ත මූල්‍ය ප්‍රකාශන සමන්විත ලේඛනවල තොරතුරු** (*යොමුව* : 14–15 ඡේද)

අ11. මූල්‍ය ප්‍රකාශන විගණනයකදී වෙනත් තොරතුරුවලට සම්බන්ධ විගණකගේ වගකීම් සමග ශ්‍රී.ල.වි.ප්‍ර. 720 (සංශෝධිත), කටයුතු කෙරේ. ශ්‍රී.ල.වි.ප්‍ර. 720 (සංශෝධිත) සම්බන්ධයෙන් වෙනත් තොරතුරු යනු අස්තිත්වයේ වාර්ෂික වාර්තාවෙහි ඇතුළත් මූල්‍ය හෝ මූල්‍ය නොවන තොරතුරු (මූල්‍ය ප්‍රකාශන සහ ඒ මත විගණකගේ වාර්තාව හැර) වේ. වාර්ෂික වාර්තාවක්, මූල්‍ය ප්‍රකාශන සහ ඒ මත විගණකගේ වාර්තාවෙන් සමන්විත වේ.

අ12. මෙයට අසමානව සංක්ෂිප්ත මූල්‍ය ප්‍රකාශන සහ ඒ මත විගණකගේ වාර්තාව සමන්විත ලියවිල්ලක ඇතුළත් තොරතුරුවලට සම්බන්ධයෙන් විගණකගේ වගකීම් 14–15 ඡේද කටයුතු කෙරේ. මෙම තොරතුරුවල පහත දෑ ඇතුළත් විය හැකිය:

- වාර්ෂික වාර්තාවේ ඇතුළත් වෙනත් තොරතුරු සමග කටයුතු කෙරෙන එකම කරුණුවලින් කිහිපයක් හෝ සියල්ලම (උදාහරණ., සංක්ෂිප්ත මූල්‍ය ප්‍රකාශන සහ ඒ මත විගණකගේ වාර්තාව, සංක්ෂිප්ත වාර්ෂික වාර්තාව තුළ ඇතුළත් කරන විට); හෝ
- වාර්ෂික වාර්තාවේ ඇතුළත් වෙනත් තොරතුරු සමග කටයුතු නොකරන එම කරුණ.

අ13. සංක්ෂිප්ත මූල්‍ය ප්‍රකාශන සහ ඒ මත විගණකගේ වාර්තාව සමන්විත ලියවිල්ලක ඇතුළත් තොරතුරු කියවීමේ දී, විගණක එවැනි තොරතුරු නොමඟ යවන සුළු වන බව විගණකගේ දැනගැනීමට ලක්විය හැකි අතර වහාම යෝග්‍ය පියවර ගැනීමට අවශ්‍ය විය හැකිය. තොරතුරු නොමඟ යවන සුළු ආකාරය නම් අපේක්ෂිත තොරතුරු අත්හැරීම හෝ සැඟවීම හෝ නොසැලකිලිමත් ලෙස ඉදිරිපත් කළ ප්‍රකාශයක් ප්‍රමාණාත්මක ලෙස ව්‍යාපාරයේ නොමඟ යවන සුළු ප්‍රකාශයක් වෙනත් තොරතුරුවල අඩංගු බව විගණක විශ්වාස කරන විට විගණක දැනුවත්ව එම තොරතුරු සමග සම්බන්ධකම් පැවැත්වීමෙන් වළක්වා ගැනීම අවශ්‍ය කෙරෙන අදාළ ආචාර ධර්ම අවශ්‍යතාවයන් [14] අවශ්‍ය වේ.

*වාර්ෂික වාර්තාවේ වෙනත් තොරතුරු ලෙස එකම කරුණුවලින් කිහිපයක් හෝ සියල්ලම සමග කටයුතු කරන සංක්ෂිප්ත මූල්‍ය ප්‍රකාශන සමන්විත ලියවිල්ලක තොරතුරු*

අ14. සංක්ෂිප්ත මූල්‍ය ප්‍රකාශන සහ ඒ මත විගණකගේ වාර්තාව සමන්විත ලියවිල්ලක තොරතුරු ඇතුළත් කරන විට සහ එම තොරතුරු වාර්ෂික වාර්තාවේ වෙනත් තොරතුරු ලෙස එකම කරුණුවලින් කිහිපයක හෝ සියල්ලම සමග කටයුතු කරන විට ශ්‍රී.ල.වි.ප්‍ර. 720 (සංශෝධිත) අනුව එම තොරතුරු මත ඉටුකළ වැඩ මෙම ශ්‍රී.ල.වි.ප්‍ර. යේ 14-15 ඡේදවල අරමුණු සඳහා ප්‍රමාණවත් විය හැකි ය.

---

[14] වෘත්තිය ගණකාධිකාරිවරුන් සඳහා ආචාර ධර්ම සංග්‍රහය ( ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනයේ ආචාර ධර්ම සංග්‍රහය), 110.2 ඡේදය

අ15. විගණනය කළ මුල්‍ය ප්‍රකාශන මත විගණකගේ වාර්තාවේ වෙනත් තොරතුරුවල නිවැරදි නොකළ ප්‍රමාණාත්මක අවප්‍රකාශයක් හඳුනා ගෙන තිබෙන විට සහ එම නිවැරදි නොකළ ප්‍රමාණාත්මක අවප්‍රකාශය, සංක්ෂිප්ත මුල්‍ය ප්‍රකාශන සහ ඒ මත විගණකගේ වාර්තාව සමන්විත ලියවිල්ලේ තොරතුරු සමග කටයුතු කරන කරුණට සම්බන්ධ වන විට සංක්ෂිප්ත මුල්‍ය ප්‍රකාශන සහ එම තොරතුරු අතර ප්‍රමාණාත්මක අසංගතතාවයක් පැවතිය හැකියි *නැතහොත්* තොරතුරු නොමග යවන සුළු විය හැකි ය.

*වාර්ෂික වාර්තාව තුළ වෙනත් තොරතුරු සමග කටයුතු නොකල සංක්ෂිප්ත මුල්‍ය ප්‍රකාශනවල කටයුතු කරන කරුණු සමන්විත ලියවිල්ලක තොරතුරු*

අ16. පවත්නා තත්වයන් තුළ දී අවශ්‍යවන පරිදි අනුගමනය කළ ශ්‍රී.ල.වි.ප්‍ර. 720 (සංශෝධිත)හි, සංක්ෂිප්ත මුල්‍ය ප්‍රකාශන මත විගණකගේ වාර්තාව සඳහා හැඟවීම් සැලකිල්ලට ගැනීම ඇතුළත්ව තොරතුරුවලට අවශ්‍ය සංශෝධනය කිරීමට සිදුවන කළමනාකරණයේ ප්‍රතික්ෂප කිරීමට ප්‍රතිචාර දැක්වීමට යෝග්‍ය ක්‍රියාමාර්ග නිර්ණය කිරීමේදී, විගණකට උදව් විය හැකි ය.

**සංක්ෂිප්ත මුල්‍ය ප්‍රකාශන මත විගණකගේ වාර්තාව**

*විගණකගේ වාර්තාවෙහි මූලිකාංග*

මාතෘකාව (*යොමුව*: (16 (අ) ඡේදය )

අ17. වාර්තාව, ස්වාධීන විගණකවරයෙකුගේ වාර්තාව බව සඳහන් වන ශීර්ෂපාඨයේ උදාහරණයක් ලෙස, "ස්වාධීන විගණකගේ වාර්තාව" යන්නෙන් ස්වාධීනත්‍වයට අදාළ ආචාර ධර්මවල සියල්ලම විගණක විසින් ඉෂ්ට කර ඇති බව ස්ථිර කරනු ලබයි. එයින් ස්වාධීන විගණකගේ වාර්තාව වෙනත් අය විසින් නිකුත් කර ඇති වාර්තාවලින් වෙන්කොට හඳුනාගැනේ.

ඇමතුම් ලබන්නා (*යොමුව*: 16(ආ), 17 ඡේද )

අ18. සංක්ෂිප්ත මුල්‍ය ප්‍රකාශන ඇමතුම් ලබන්නාගේ යෝග්‍ය බව සම්බන්ධයෙන් විගණකගේ ඇගයීම කෙරෙහි බලපානු ලබන සාධකවලට කාර්යභාරයේ කොන්දේසි අස්තිත්වයේ ස්වභාවය සහ සංක්ෂිප්ත මුල්‍ය ප්‍රකාශනවල අරමුණු ඇතුළත්ය.

*සංක්ෂිප්ත මුල්‍ය ප්‍රකාශන හඳුනාගැනීම* (*යොමුව*:16 ඇ) ඡේදය)

අ19. සංක්ෂිප්ත මුල්‍ය ප්‍රකාශන සහ ඒ මත විගණකගේ වාර්තාව හැර තොරතුරු සමන්විත ලියවිල්ලක් සංක්ෂිප්ත මුල්‍ය ප්‍රකාශන ඇතුළත් කරන බව විගණකට දැනගැනීමට ලැබී ඇති විට, සංක්ෂිප්ත මුල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කෙරෙන පිටු අංක හැඳුනාගැනීමක් වන ඉදිරිපත් කිරීමේ ස්වරූපයකට ඉඩදෙන්නේ නම් විගණකට සලකා බැලිය හැකිය. මෙමගින් විගණන වාර්තාවට සම්බන්ධිත සංක්ෂිප්ත මුල්‍ය වාර්තා හඳුනාගැනීමට කියවන්නාට උපකාරී වේ.

විගණකගේ වාර්තාවේ දිනය (*යොමුව*:16 (ට) 18 ඡේද )

අ20. සංක්ෂිප්ත මුල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බවට සහ කාර්යභාරයේ කොන්දේසි අස්තිත්‍වයේ ස්වභාවය, සහ සංක්ෂිප්ත මුල්‍ය ප්‍රකාශනවල අරමුණු මත ඔවුන් වගකීම භාරගත් බව පිළිගත් අධිකාරියක් ඇති පුද්ගලයකු හෝ පුද්ගලයන් නිගමනය කිරීම.

විගණනය කළ මුල්‍ය ප්‍රකාශන මත විගණකගේ වාර්තාවට යොමුව (*යොමුව*: 19 ඡේදය)

අ21. මෙම ශ්‍රී.ල.වි.ප්‍ර.යේ 19 (i) ඡේදය මගින් ශ්‍රී.ල.වි.ප්‍ර. 701[15] අනුව විස්තර කරන ප්‍රධාන විගණන කරුණු එකක් හෝ ඊට වැඩි ගණනක් සන්නිවේදනය කිරීම විගණනය කළ මුල්‍ය ප්‍රකාශන මත විගණකගේ වාර්තාවේ ඇතුළත් කරන විට සංක්ෂිප්ත මුල්‍ය ප්‍රකාශන මත විගණකගේ වාර්තාවේ ප්‍රකාශයක් විගණකට ඇතුළත් කිරීම අවශ්‍ය කෙරේ. කෙසේ නමුත් සංක්ෂිප්ත මුල්‍ය ප්‍රකාශන මත විගණකගේ වාර්තාවේ තනි තනි ප්‍රධාන විගණන කරුණු විස්තර කිරීමට විගණකට අවශ්‍ය නොකෙරේ.

[15] ශ්‍රී.ල.වි.ප්‍ර. 701, 13 ඡේදය

අ22. 19 ඡේදය මගින් අවශ්‍ය කෙරෙන ප්‍රකාශය(න්) සහ විස්තරය(න්) එම කරුණුවලට අවධානය යොමු කිරීමට අදහස් කරන අතර විගණනය කළ මූල්‍ය ප්‍රකාශන මත විගණකගේ වාර්තාව කියවීම සඳහා ආදේශකයක් නොවේ. අවශ්‍ය කරන විස්තර කරුණේ (කරුණුවල) ස්වභාවය දැක්වීමට අදහස් කරන අතර එහි සමස්ථය තුළ විගණනය කළ ප්‍රකාශන මත විගණකගේ වාර්තාවේ අනුරූප පාඨය නැවත කිරීමට අවශ්‍ය නොකෙරේ.

නිදර්ශන (*යොමුව*: 16, 19-21 ඡේද)

අ23. මෙම ශ්‍රී.ල.වි.ප්‍ර.යට වන පරිශිෂ්ඨයේ, සංක්ෂිප්ත මූල්‍ය ප්‍රකාශන මත විගණකගේ වාර්තාවේ විවිධ නිදර්ශනවලින් සමන්විත වේ.:

(අ) විකරණය නොකළ විගණන මත සමන්විත වේ.;

(ආ) විගණනය කළ මූල්‍ය ප්‍රකාශනවලින් හටගත් විගණක විසින් නිකුත් කළ විකරණය කළ මත සමන්විත වේ;

(ඇ) විකරණය කළ විගණන මතයක් සමන්විත වේ;

(ඈ) ශ්‍රී.ල.වි.ප්‍ර. 720 (සංශෝධිත) අනුව වෙනත් තොරතුරුවල නිවැරදි නොකළ ප්‍රමාණාත්මක අවප්‍රකාශයක් විස්තර කරන ප්‍රකාශයක් ඇතුළත් විගණනය අවසන් කළ මූල්‍ය ප්‍රකාශන මත විගණකගේ වාර්තාවෙන් පැන නැගීම; සහ

(ඉ) *අඛණ්ඩ පැවැත්ම කොටසට සම්බන්ධ ප්‍රමාණාත්මක අනියතතාවයක්* සහ වෙනත් ප්‍රධාන විගණන කරුණු සන්නිවේදනය කිරීම ඇතුළත් අවස්ථාවක විගණනය කළ මූල්‍ය ප්‍රකාශන මත විගණකගේ වාර්තාවෙන් හටනැගීම

**සන්සන්දනයන්** (*යොමුව* : 23 - 24 ඡේද )

අ24. විගණනය කළ මූල්‍ය ප්‍රකාශනවල සන්සන්දනයන් අඩංගු වේ නම් සංක්ෂිප්ත මූල්‍ය ප්‍රකාශනවලද සන්සන්දනයන් ඇතුළත් වේ යැයි පූර්ව නිගමනයක් තිබිය හැකිය. විගණනය කළ මූල්‍ය ප්‍රකාශනවල සංසන්දනයන් අනුරූපී සංඛ්‍යා හෝ සන්සන්දනාත්මක මූල්‍ය තොරතුරු ලෙස සැලකිය හැකිය. මෙම වෙනස, විශේෂයෙන්ම පූර්ව කාලපරිච්ඡේදයෙහි මූල්‍ය ප්‍රකාශන විගණනය කළ අනෙකුත් විගණකවරුන්ට අදාළව, මූල්‍ය ප්‍රකාශන මත විගණකගේ වාර්තාව කෙරෙහි කෙසේ බලපාන්නේද යන්න ශ්‍රී.ල.වි.ප්‍ර. 710 විස්තර කරයි .

අ25. සන්සන්දනයන් අත්හැරීමක් සාධාරණදැයි යන්න විගණක නිර්ණය කිරීමේදී බලපෑහැකි තත්වයන්ට සංක්ෂිප්ත මූල්‍ය ප්‍රකාශනවල ස්වභාවය සහ අරමුණ ව්‍යවහාර කළ නිර්ණායක සහ සංක්ෂිප්ත මූල්‍ය ප්‍රකාශන භාවිතා කිරීමට අපේක්ෂිත පරිශීලකයන්ගේ තොරතුරු අවශ්‍යතා ඇතුළත්ය.

**සංක්ෂිප්ත මූල්‍ය ප්‍රකාශන සමග ඉදිරිපත් කරනු ලබන විගණනය නොකළ පරිපූරක තොරතුරු** (25 ඡේදය බලන්න)

අ26. 25 වැනි ඡේදය තුළ වන අවශ්‍යතා ව්‍යවහාර කිරීමේදී උපකාරී විය හැකි තත්වයන්ට අවශ්‍ය ලෙස අනුගමනය කළ විගණනය කළ මූල්‍ය ප්‍රකාශන සමග විගණනය නොකළ පරිපූරක තොරතුරු ඉදිරිපත් කරන විට ව්‍යවහාර කළ යුතු අවශ්‍යතා සහ මාර්ගෝපදේශ ශ්‍රී.ල.වි.ප්‍ර. 700 (සංශෝධිත)[16] හි සමන්විත වේ.

**විගණක සහභාගිත්වය** (26 - 27 ඡේද)

අ27. ඉල්ලීම් කරන ලද ක්‍රියාමාර්ග කළමනාකාරීත්වය විසින් නොගන්නා විටදී විගණක විසින් ගත හැකි අනෙකුත් උචිත ක්‍රියාමාර්ගවලට අපේක්ෂිත පරිශීලනය කරන්නන්ට සහ අනෙකුත් දන්නා තුන්වැනි පාර්ශවික පරිශීලනය කරන්නන්ට විගණක කෙරෙහි අනුචිත යොමුවක් සිදුකර ඇති බව දැනුම්දීම ඇතුළත් විය හැකිය. විගණකගේ ගනු ලබන ක්‍රියාමාර්ගය විගණකගේ නෛතික අයිතීන් සහ බැඳීම් මත තීරණය වෙයි. ඒ නිසාවෙන් විගණක නීති උපදෙස් පැතීම උචිත බව සලකා බැලිය හැකි ය.

[16] ශ්‍රී.ල.වි.ප්‍ර. 700 (සංශෝධිත), *මූල්‍ය ප්‍රකාශන මත මතය සකස් කිරීම සහ වාර්තාකරණය* , 53–54 ඡේද

**පරිශිෂ්ඨය**

(යොමුව: අ23 ඡේදය)

## සංක්ෂිප්ත මුල්‍ය ප්‍රකාශන මත විගණකගේ වාර්තාවල නිදර්ශනයන්

- 1 වන නිදර්ශනය : ස්ථාපිත නිර්ණායක සමග අනුකූලව පිළියෙල කරන ලද සංක්ෂිප්ත මුල්‍ය ප්‍රකාශන මත විගණකගේ වාර්තාවක්. විගණනය කළ මුල්‍ය ප්‍රකාශන මත විකරණය නොකළ මතයක් ප්‍රකාශ කරනු ලබයි. සංක්ෂිප්ත මුල්‍ය ප්‍රකාශන පැන නගින මූල්‍ය ප්‍රකාශන මත විගණකගේ වාර්තාවේ දාතම කළ දිනට පසු දාතමක් සංක්ෂිප්ත මුල්‍ය ප්‍රකාශන මත විගණකගේ වාර්තාවට යොදා තිබේ. විගණනය කළ මුල්‍ය ප්‍රකාශන මත විගණකගේ වාර්තාවේ *අඛණ්ඩ පැවැත්ම කොටසට සම්බන්ධ ප්‍රමාණාත්මක අනියතතාවයක්* සහ වෙනත් ප්‍රධාන විගණන කරුණු සන්නිවේදනය කිරීම ඇතුළත් වේ.

- 2 වන නිදර්ශනය : කළමනාකරණය විසින් සංවර්ධනය කළ නිර්ණායක සමග අනුකූලව පිළියෙල කරන ලද සංක්ෂිප්ත මුල්‍ය ප්‍රකාශන සහ සංක්ෂිප්ත මුල්‍ය ප්‍රකාශන තුළ ප්‍රමාණවත් ලෙස හෙළිදරව් කරන ලද සංක්ෂිප්ත මූල්‍ය ප්‍රකාශන මත විගණකගේ වාර්තාව. පවත්නා තත්වයන් තුළ ව්‍යවහාර කළ නිර්ණාය පිළිගත හැකි බව විගණක නිර්ණය කර ඇත. විගණනය කළ මුල්‍ය ප්‍රකාශන මත විකරණය නොකළ මතයක් ප්‍රකාශ කරනු ලබයි. සංක්ෂිප්ත මුල්‍ය ප්‍රකාශන පැන නගින මූල්‍ය ප්‍රකාශන මත විගණකගේ වාර්තාවේ දාතම කළ දිනයට සංක්ෂිප්ත මුල්‍ය ප්‍රකාශන මත විගණකගේ වාර්තාවට යොදා තිබේ. විගණනය කළ මුල්‍ය ප්‍රකාශන මත විගණකගේ වාර්තාව,වෙනත් තොරතුරුවල නිවැරදි නොකළ ප්‍රමාණාත්මක අවප්‍රකාශයක් විස්තර කරන ප්‍රකාශයක් ඇතුළත් වේ. මෙම නිවැරදි නොකළ ප්‍රමාණාත්මක අවප්‍රකාශයේ සම්බන්ධිත වෙනත් තොරතුරද එලෙසම සංක්ෂිප්ත මුල්‍ය ප්‍රකාශන සහ ඒ මත විගණකගේ වාර්තාව සමන්විත ලියවිල්ල ඇතුළත් තොරතුරු වේ.

- 3 වන නිදර්ශනය : කළමනාකරණය විසින් සංවර්ධනය කළ නිර්ණායක සමග අනුකූලව පිළියෙල කරන ලද සංක්ෂිප්ත මුල්‍ය ප්‍රකාශන සහ සංක්ෂිප්ත මුල්‍ය ප්‍රකාශන තුළ ප්‍රමාණවත් ලෙස හෙළිදරව් කරන ලද සංක්ෂිප්ත මූල්‍ය ප්‍රකාශන මත විගණකගේ වාර්තාව. පවත්නා තත්වයන් තුළ ව්‍යවහාර කළ නිර්ණාය පිළිගත හැකි බව විගණක නිර්ණය කර ඇත. විගණනය කළ මුල්‍ය ප්‍රකාශන මත කොන්දේසි සහිත මතයක් ප්‍රකාශ කරනු ලබයි. සංක්ෂිප්ත මුල්‍ය ප්‍රකාශන පැන නගින මුල්‍ය ප්‍රකාශන මත විගණකගේ වාර්තාවේ දාතම කළ දිනයට සංක්ෂිප්ත මුල්‍ය ප්‍රකාශන මත විගණකගේ වාර්තාවට යොදා තිබෙයි.

- 4 වන නිදර්ශනය :කළමනාකරණය විසින් සංවර්ධනය කළ නිර්ණායක සමග අනුකූලව පිළියෙල කරන ලද සංක්ෂිප්ත මුල්‍ය ප්‍රකාශන සහ සංක්ෂිප්ත මූල්‍ය ප්‍රකාශන තුළ ප්‍රමාණවත් ලෙස හෙළිදරව් කරන ලද සංක්ෂිප්ත මුල්‍ය ප්‍රකාශන මත විගණකගේ වාර්තාව. පවත්නා තත්වයන් තුළ ව්‍යවහාර කළ නිර්ණාය පිළිගත හැකි බව විගණක නිර්ණය කර ඇත. විගණනය කළ මුල්‍ය ප්‍රකාශන මත අහිතකර මතයක් ප්‍රකාශ කරනු ලබයි. සංක්ෂිප්ත මූල්‍ය ප්‍රකාශන පැන නගින මූල්‍ය ප්‍රකාශන මත විගණකගේ වාර්තාවේ දාතම කළ දිනයට සංක්ෂිප්ත මූල්‍ය ප්‍රකාශන මත විගණකගේ වාර්තාවට යොදා තිබෙයි.

- 5 වන නිදර්ශනය :ස්ථාපිත නිර්ණායක සමග අනුකූලව පිළියෙල කරන ලද සංක්ෂිප්ත මුල්‍ය ප්‍රකාශන මත විගණකගේ වාර්තාවක්. විගණනය කළ මුල්‍ය ප්‍රකාශන මත විකරණය නොකළ මතයක් ප්‍රකාශ කරනු ලබයි. සංක්ෂිප්ත මුල්‍ය ප්‍රකාශන මත විකරනය නොකළ මතයක් ප්‍රකාශ කිරීම නොහැකි බව විගණක නිගමනය කරයි. සංක්ෂිප්ත මුල්‍ය ප්‍රකාශන පැන නගින මූල්‍ය ප්‍රකාශන මත විගණකගේ වාර්තාවේ දාතම කළ දිනයට සංක්ෂිප්ත මුල්‍ය ප්‍රකාශන මත විගණකගේ වාර්තාවද යොදා තිබෙයි.

**1 වන නිදර්ශනය:**

**තත්ත්වයන්ට පහත දෑ ඇතුළත් වේ:**

- **ලැයිස්තුගත අස්තිත්වයක විගණනය කළ මූල්‍ය ප්‍රකාශන මත විකරණය නොකළ මතයක් ප්‍රකාශ කරනු ලබයි.**
- **සංක්ෂිප්ත මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සඳහා ස්ථාපිත නිර්ණායක පවතියි.**
- **සංක්ෂිප්ත මූල්‍ය ප්‍රකාශන පැන නගින මූල්‍ය ප්‍රකාශන මත විගණකගේ වාර්තාවේ දාතම කළ දිනට පසු දාතමක් සංක්ෂිප්ත මූල්‍ය ප්‍රකාශන මත විගණකගේ වාර්තාවට යොදා තිබෙයි.**
- **විගණනය කළ මූල්‍ය ප්‍රකාශන මත විගණකගේ වාර්තාවේ *අඛණ්ඩ පැවැත්ම කොටසට සම්බන්ධ ප්‍රමාණාත්මක අනියතතාවයක්* ඇතුළත් වේ .**
- **විගණනය කළ මූල්‍ය ප්‍රකාශන මත විගණකගේ වාර්තාවේ වෙනත් ප්‍රධාන විගණන කරුණු සන්නිවේදනය කිරීම ඇතුළත් වේ.[17]**

**සංක්ෂිප්ත මූල්‍ය ප්‍රකාශන මත ස්වාධීන විගණකගේ වාර්තාව**

[උචිත පරිදි ඇමතුම් ලබන්නා ]

**මතය**

20X1 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වර්ෂයෙහි ABC සමාගමේ විගණනය කළ මූල්‍ය ප්‍රකාශනවලින් හටගත් 20x1 දෙසැම්බර් 31 දිනට සංක්ෂිප්ත මූල්‍ය තත්ත්ව ප්‍රකාශය, එම දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා සංක්ෂිප්ත ආදායම් ප්‍රකාශය,ස්කන්ධයෙහි වෙනස්වීම්වල සංක්ෂිප්ත ප්‍රකාශය සහ සංක්ෂිප්ත මුදල් ප්‍රවාහ ප්‍රකාශය, සහ සම්බන්ධිත සටහන්වලින් සමන්විත සංක්ෂිප්ත මූල්‍ය ප්‍රකාශන ලබාගන්නා ලදී.

අපගේ මතය වන්නේ, මේ සමග ඇති සංක්ෂිප්ත මූල්‍ය ප්‍රකාශන, (පිහිටුවන ලද නිර්ණායක අනුව විස්තර කරයි) අනුව විගණනය කළ මූල්‍ය ප්‍රකාශන සමග සියලුම ප්‍රමාණාත්මක ආකාරයෙන් (හෝ සාධාරණ සංක්ෂිප්තයක) සංගත වේ.

**සංක්ෂිප්ත මූල්‍ය ප්‍රකාශන**

සංක්ෂිප්ත මූල්‍ය ප්‍රකාශන (ABC සමාගමේ විගණනය කළ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේ දී ව්‍යවහාර කළ මූල්‍ය වාර්තාකරණ ආකෘතිමය රාමුව විස්තර කිරීම) මගින් අවශ්‍ය කෙරෙන දෑ සියලුම හෙළිදරව් කිරීම්වලින් සමන්විත නොවේ. සංක්ෂිප්ත මූල්‍ය ප්‍රකාශන සහ ඒමත විගණකගේ වාර්තාව කියවීම, ඒමත විගණනය කළ මූල්‍ය ප්‍රකාශන සහ ඒමත විගණකගේ වාර්තාව කියවීම සඳහා ආදේශකයක් නොවේ. සංක්ෂිප්ත මූල්‍ය ප්‍රකාශන සහ විගණනය කළ මූල්‍ය ප්‍රකාශන, විගණනය කළ මූල්‍ය ප්‍රකාශන මත අපගේ විගණකගේ වාර්තාවේ දිනයට පසුව සිදුවන සිද්ධිවල බලපෑම් පිළිබිඹු නොකරයි.

**විගණනය කළ මූල්‍ය ප්‍රකාශන සහ ඒමත අපගේ විගණකගේ වාර්තාව**

අප, 20X2 පෙබරවාරි 15 දිනට ඇති අපගේ වාර්තාව තුළ විගණනය කළ මූල්‍ය ප්‍රකාශන මත විකරණය නොකළ විගණන මතයක් ප්‍රකාශ කරන්නෙමු. එම වාර්තාවේ පහත දෑ ද ඇතුළත් වේ.:

- විගණනය කළ මූල්‍ය ප්‍රකාශනවල 6 වන සටහනේ *අඛණ්ඩ පැවැත්ම කොටසට සම්බන්ධයෙන් ප්‍රමාණාත්මක අනියතතාවයක්* අවධාරණය කරන්නෙමු. විගණනය කළ මූල්‍ය ප්‍රකාශනවල 6 වන සටහනේ 20×1 දෙසැම්බර් මස 31 දිනෙන් අවසන් වූ වර්ෂය තුළදී ZZZ ක ශුද්ධ අලාභයක් ABC සමාගම දරා ඇති අතර එම දිනට ABC සමාගමේ ජංගම වගකීම්, YYY කින් එහි මුළු වත්කම් ඉක්මවා තිබෙන බව පෙන්නුම් කෙරේ. විගණනය කළ මූල්‍ය ප්‍රකාශනවල 6 වන සටහනේ පැහැදිලි කර ඇති වෙනත් කරුණු සමග මෙම සිද්ධි සහ තත්වයන් සමාගම අඛණ්ඩ පැවැත්මක් ලෙස දිගටම පවත්වා ගෙන යෑමේ ABC සමාගමේ හැකියාව මත සැලකිය යුතු අන්දමේ

[17] ශ්‍රී.ල.වි.ප්‍ර. 701 හි 15 ජේදයේ විස්තර කළ පරිදි (සංශෝධිත), *අඛණ්ඩ පැවැත්මට සම්බන්ධ ප්‍රමාණාත්මක අනියතතාවයක්* එහි ස්වභාවයෙන් වන නමුත් ශ්‍රී.ල.වි.ප්‍ර. 570 (සංශෝධිත) හි 22 ජේදය අනුව විගණකගේ වාර්තාවේ වෙනමම කොටසක වාර්තා අවශ්‍ය වේ.

සැකයක් පැන නැගිය හැකි ප්‍රමාණාත්මක අනියතතාවයක් පවතින බව පෙන්නුම් කෙරේ. මෙම කරුණු සංක්ෂිප්ත මූල්‍ය ප්‍රකාශනවල 5 වන සටහනේ අවධාරණය කරයි.

- වෙනත් ප්‍රධාන විගණන කරුණු සන්නිවේදනය[18]. [ප්‍රවර්තන කාලපරිච්ඡේදයේ මූල්‍ය ප්‍රකාශනවල අපගේ විගණනයේ දී අපගේ වෘත්තිය විනිශ්චයේ වඩා වැදගත් වූ එම කරුණු ප්‍රධාන විගණන කරුණු වේ.][19]

**සංක්ෂිප්ත මූල්‍ය ප්‍රකාශන සඳහා කළමනාකරනයේ වගකීම්**[20]

(ස්ථාපිත නිර්ණායක අනුව විස්තර කරමින්) සමග අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සඳහා කළමණාකරනය වග කියනු ලැබේ.

**විගණකගේ වගකීම්**

*සංක්ෂිප්ත මූල්‍ය ප්‍රකාශන මත වාර්තාවට කාර්යභාරයන්* ශ්‍රී ලංකා විගණන ප්‍රමිත (ශ්‍රී.ලං.විප්‍ර.) 810 (සංශෝධිත) සමග අනුකූලව, පවත්වා ගෙන ගිය අපගේ විගණන පටිපාටි මත පදනම්ව සංක්ෂිප්ත මූල්‍ය ප්‍රකාශන සියලුම ප්‍රමාණාත්මක ආකාරයෙන් (හෝ *සාධාරණ සංක්ෂිප්තයක*) විගණනය කළ මූල්‍ය ප්‍රකාශන සමග සංගත වන්නේදැයි මතයක් ප්‍රකාශ කිරීම අපගේ වගකීම වේ.

[විගණකගේ අත්සන]

[විගණකගේ ලිපිනය]

[විගණකගේ වාර්තාවේ දිනය]

**<u>2 වන නිදර්ශනය:</u>**

**තත්ත්වයන්ට පහත දෑ ඇතුළත් වේ:**

- **විගණනය කළ මූල්‍ය ප්‍රකාශන මත විකරණය නොකළ මතයක් ප්‍රකාශ කිරීම.**
- **කළමණාකරනය විසින් නිර්ණායක සංවර්ධනය කරන අතර x සටහනේ ප්‍රමාණාත්මක ලෙස හෙළිදරව් කර ඇත.නිර්ණායක පවත්නා තත්වයන්හිදී පිළිගත හැකි බව විගණක නිර්ණය කර ඇත.**
- **සංක්ෂිප්ත මූල්‍ය ප්‍රකාශන පැන නගින මූල්‍ය ප්‍රකාශන මත විගණකගේ වාර්තාවේ දාතම කළ දිනයම සංක්ෂිප්ත මූල්‍ය ප්‍රකාශන මත විගණකගේ වාර්තාවට යොදා තිබෙයි.**
- **විගණනය කළ මූල්‍ය ප්‍රකාශන මත විගණකගේ වාර්තාවේ, වෙනත් තොරතුරුවල නිවරදි නොකළ ප්‍රමාණාත්මක අවප්‍රකාශයක් විස්තර කරන ප්‍රකාශයක් ඇතුළත් වේ. මෙම නිවරදි නොකළ ප්‍රමාණාත්මක අවප්‍රකාශයේ සම්බන්ධිත වෙනත් තොරතුර එලෙසම සංක්ෂිප්ත මූල්‍ය ප්‍රකාශන සහ ඒ මත විගණකගේ වාර්තාව සමන්විත ලියවිල්ල ඇතුළත් තොරතුරු වේ.**

**සංක්ෂිප්ත මූල්‍ය ප්‍රකාශන මත ස්වාධීන විගණකගේ වාර්තාව**

[උචිත පරිදි ඇමතුම් ලබන්නා ]

**මතය**

20X1 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වර්ෂයෙහි ABC සමාගමේ විගණනය කළ මූල්‍ය ප්‍රකාශනවලින් හටගත් 20x1 දෙසැම්බර් 31 දිනට සංක්ෂිප්ත මූල්‍ය තත්ත්ව ප්‍රකාශය, එම දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා සංක්ෂිප්ත ආදායම් ප්‍රකාශය,ස්කන්ධයෙහි වෙනස්වීම්වල සංක්ෂිප්ත ප්‍රකාශය සහ සංක්ෂිප්ත මුදල් ප්‍රවාහ ප්‍රකාශය, සහ සම්බන්ධිත සටහන්වලින් සමන්විත සංක්ෂිප්ත මූල්‍ය ප්‍රකාශන සමන්විත වේ.

---

[18] පවත්නා තත්වයන් තුළ අඛණ්ඩ පැවැත්ම සම්බන්ධයෙන් ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවය නොපවතින අවස්ථාවන්හිදී, ප්‍රධාන විගණන කරුණු සන්නිවේදනය සඳහා ප්‍රකාශයේ ''වෙනත්''යන වචනය ඇතුළත් කිරීම අවශ්‍ය නොවිය හැකිය.

[19] සංක්ෂිප්ත මූල්‍ය ප්‍රකාශන මත විගණකගේ වාර්තාවේ පරිශීලකයන්ට ප්‍රයෝජනවත් වියහැකි ලෙස සලකන ප්‍රධාන විගණන කරුණු පිළිබද අමතර විස්තරයක් විගණකට ඇතුළත් කළ හැකිය..

[20] හෝ විශේෂ අධිකරණ බල ප්‍රදේශයේ නෛතික ආකෘතිමය රාමුවේ සම්බන්ධය තුළ යෝග්‍යවන වෙනත් පද

අපගේ මතය වන්නේ, මේ සමග කැටුව ඇති සංක්ෂිප්ත මූල්‍ය ප්‍රකාශන, X සටහනේ විස්තර කළ පදනම මත විගණනය කළ මූල්‍ය ප්‍රකාශන සමග සියලුම ප්‍රමාණාත්මක ආකාරයෙන් (*හෝ සාධාරණ සංක්ෂිප්තයක*) සංගත වේ.

**සංක්ෂිප්ත මූල්‍ය ප්‍රකාශන**

සංක්ෂිප්ත මූල්‍ය ප්‍රකාශන (ABC සමාගමේ විගණනය කළ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී ව්‍යවහාර කළ මූල්‍ය වාර්තාකරණ ආකෘතිමය රාමුව විස්තර කර ඇත) අවශ්‍ය කෙරෙන දෑ සියලුම හෙළිදරව් කිරීම්වලින් සමන්විත නොවේ. සංක්ෂිප්ත මූල්‍ය ප්‍රකාශන සහ ඒ මත විගණකගේ වාර්තාව කියවීම, එමනිසා විගණනය කළ මූල්‍ය ප්‍රකාශන සහ ඒ මත විගණකගේ වාර්තාව කියවීම සඳහා ආදේශකයක් නොවේ.

**විගණනය කළ මූල්‍ය ප්‍රකාශන සහ ඒ මත අපගේ විගණකගේ වාර්තාව**

අප, 20X2 පෙබරවාරි 15 දිනට ඇති අපගේ වාර්තාව තුළ විගණනය කළ මූල්‍ය ප්‍රකාශන මත විකරණය නොකළ විගණන මතයක් ප්‍රකාශ කරන්නෙමු. [විගණනය කළ මූල්‍ය ප්‍රකාශන, 20X1 වාර්ෂික වාර්තාවේ ඇතුළත් වේ. වාර්ෂික වාර්තාවේ කළමණාකරනයේ සාකච්ජාව සහ 20X1 විශ්ලේෂණය ඇතුළත් වෙනත් තොරතුරුවල නිවරදි නොකළ ප්‍රමාණාත්මක අවප්‍රකාශයක් විස්තර කරන ප්‍රකාශයක් විගණනය කළ මූල්‍ය ප්‍රකාශනවල විගණකගේ වාර්තාවේ ඇතුළත් කෙරේ. කළමණාකරනයේ සාකච්ජාව සහ විශ්ලේෂණය සහ වෙනත් තොරතුරුවල නිවරදි නොකළ ප්‍රමාණාත්මක අවප්‍රකාශයද 20X1 සංක්ෂිප්ත වාර්ෂික වාර්තාව තුළ එසේම සමන්විත වේ.] [වෙනත් තොරතුරුවල නිවරදි නොකළ ප්‍රමාණාත්මක අවප්‍රකාශ *ව්‍යවහාර කරන්න*].

**සංක්ෂිප්ත මූල්‍ය ප්‍රකාශන සඳහා කළමණාකරනයේ වගකීම්**[21]

X සටහනේ විස්තර කළ පදනම මත සංක්ෂිප්ත මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සඳහා කළමණාකරනය වග කියනු ලැබේ.

**විගණකගේ වගකීම**

*සංක්ෂිප්ත මූල්‍ය ප්‍රකාශන මත වාර්තා කිරීමට කාර්යයභාරයන්* ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත (ශ්‍රී.ලං.විප්‍ර.) 810 (සංශෝධිත), *කාර්යභාරයන්* අනුව සිදුකළ අපගේ පටිපාටි මත පදනම්ව සංක්ෂිප්ත මූල්‍ය ප්‍රකාශන සියලුම ප්‍රමාණාත්මක ආකාරයෙන් (හෝ *සාධාරණ සංක්ෂිප්තයක*) විගණනය කළ මූල්‍ය ප්‍රකාශන සමග සංගත වන්නේදැයි මතයක් ප්‍රකාශ කිරීම අපගේ වගකීම වේ .

[විගණකගේ අත්සන]

[විගණකගේ ලිපිනය]

[විගණකගේ වාර්තාවේ දිනය]

**<u>3 වන නිදර්ශනය:</u>**

**තත්ත්වයන්ට පහත දෑ ඇතුළත් වේ:**

- **විගණනය කළ මූල්‍ය ප්‍රකාශන මත කොන්දේ සහිත මතයක් ප්‍රකාශ කිරීම.**
- **කළමනාකරනය විසින් නිර්ණායක සංවර්ධනය කරන අතර X සටහනේ ප්‍රමාණාත්මක ලෙස හෙළිදරව් කර ඇත.නිර්ණායක පවත්නා තත්වයන්හිදී පිළිගත හැකි බව විගණක නිර්ණය කර ඇත.**
- **සංක්ෂිප්ත මූල්‍ය ප්‍රකාශන හටගත් මූල්‍ය ප්‍රකාශන මත විගණකගේ වාර්තාවේ දාතම කළ දිනම සංක්ෂිප්ත මූල්‍ය ප්‍රකාශන මත විගණකගේ වාර්තාවට දාතම කර ඇත.**

**සංක්ෂිප්ත මූල්‍ය ප්‍රකාශන මත ස්වාධීන විගණකගේ වාර්තාව**

[උචිත පරිදි ඇමතුම් ලබන්නා ]

**මතය**

20X1 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වර්ෂයෙහි ABC සමාගමේ (සමාගම) විගණනය කළ මූල්‍ය ප්‍රකාශනවලින් හටගත් 20x1 දෙසැම්බර් 31 දිනට සංක්ෂිප්ත මූල්‍ය තත්ත්ව ප්‍රකාශය, එම දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා සංක්ෂිප්ත

[21] හෝ විශේෂ අධිකරණ බල ප්‍රදේශයේ නෛතික ආකෘතිමය රාමුවේ සම්බන්ධය තුළ යෝග්‍ය වන වෙනත් පද

ආදායම් ප්‍රකාශය, ස්කන්ධයෙහි වෙනස්වීම්වල සංක්ෂිප්ත ප්‍රකාශය සහ සංක්ෂිප්ත මුදල් ප්‍රවාහ ප්‍රකාශය, සහ සම්බන්ධිත සටහන්වලින් සංක්ෂිප්ත මූල්‍ය ප්‍රකාශන සමන්විත වේ. අප එම මූල්‍ය ප්‍රකාශන , 20X2 පෙබරවාරි 15 දිනෙහි අපගේ වාර්තාව මත කොන්දේසි සහිත විගණන මතයක් ප්‍රකාශ කරන්නෙමු.[22]

අපගේ මතය වන්නේ, මේ සමග කැටුව ඇති සංක්ෂිප්ත මූල්‍ය ප්‍රකාශන, X සටහනේ විස්තර කළ පදනම මත විගණනය කළ මූල්‍ය ප්‍රකාශන සමග සියලුම ප්‍රමාණාත්මක ආකාරයෙන් (හෝ *සාධාරණ සංක්ෂිප්තයක්*) සංගත වේ. කෙසේ වෙතත් 20X1 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා ABC සමාගමේ විගණනය කළ මූල්‍ය ප්‍රකාශන ලෙසට සමාන ප්‍රමාණයකට සංක්ෂිප්ත මූල්‍ය ප්‍රකාශන අවප්‍රකාශ වේ.

**සංක්ෂිප්ත මූල්‍ය ප්‍රකාශන**

සංක්ෂිප්තමූල්‍ය ප්‍රකාශන (ABC සමාගමේ විගණනය කළ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී ව්‍යවහාර කළ මූල්‍ය වාර්තාකරණ ආකෘතිමය රාමුව විස්තර කර ඇත) අවශ්‍ය කෙරෙන සියලුම හෙළිදරව් කිරීම්වලින් සමන්විත නොවේ. සංක්ෂිප්ත මූල්‍ය ප්‍රකාශන සහ එමගින් විගණකගේ වාර්තාව කියවීම, එම නිසා විගණනය කළ මූල්‍ය ප්‍රකාශන සහ එමගින් විගණකගේ වාර්තාව කියවීම සඳහා ආදේශකයක් නොවේ.

**විගණනය කළ මූල්‍ය ප්‍රකාශන සහ ඒ මත විගණකගේ වාර්තාව**

අප , විගණනය කළ මූල්‍ය ප්‍රකාශන මත 20X2 පෙබරවාරි 15 දිනෙහි අපගේ වාර්තාව තුළ කොන්දේසි සහිත විගණන මතයක් ප්‍රකාශ කරන්නෙමු. අපගේ කොන්දේසි සහිත විගණන මතයේ පදනම වන්නේ [කළමණාකරනය,තොග පිරිවැය සහ ශුද්ධ උපලබ්ධි අගය යන දෙකෙන් අඩු අගයට සඳහන් නොකර තනිකරම පිරිවැයට සඳහන් කරයි.එය ශ්‍රී ලංකා ගිණුම්කරන ප්‍රමිතවලින් බැහැරවීමකි]. කළමනාකරනය,තොග පිරිවැය සහ ශුද්ධ උපලබ්ධි අගය යන දෙකෙන් අඩුඅගයට සඳහන් කළේ නම් xxx අගයකින් තොග ඒවායේ ශුද්ධ උපලබ්ධි අගයට ලියා හැරීමට අවශ්‍ය බව සමාගමේ වාර්තාවලට අනුව පෙන්නුම් කෙරේ. ඒ අනුව විකුණුම් පිරිවැය xxx කින් වැඩි වනු අතර ආදායම් බදු ,ශුද්ධ ආදායම හා ස්කන්ධ කොටස් හිමියන්ගේ හිමිකම පිළිවෙලින් xxx, xxx සහ xxx අඩුවනු ඇත.

**සංක්ෂිප්ත මූල්‍ය ප්‍රකාශන සඳහා කළමණාකරනයේ වගකීම්**[23]

X සටහන තුළ විස්තර කළ පදනම මත කළමණාකරනය සංක්ෂිප්ත මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සඳහා කළමනාකරනය වග කිවයුතු වේ.

**විගණකගේ වගකීම**

*සංක්ෂිප්ත මූල්‍ය ප්‍රකාශන මත වාර්තාවට කාර්යභාරයන්* ශ්‍රී ලංකා විගණන ප්‍රමිත (ශ්‍රී.ලං.වි.ප්‍ර.) 810 (සංශෝධිත), අනුව පවත්වා ගෙන ගිය විගණන පටිපාටි මත පදනම්ව සංක්ෂිප්ත මූල්‍ය ප්‍රකාශන සියලුම ප්‍රමාණාත්මක ආකාරයෙන් (හෝ *සාධාරණ සංක්ෂිප්තයක*) විගණනය කළ මූල්‍ය ප්‍රකාශන සමග සංගත වන්නේදැයි මතයක් ප්‍රකාශ කිරීම අපගේ වගකීම වේ .

[විගණකගේ අත්සන]

[විගණකගේ ලිපිනය]

[විගණකගේ වාර්තාවේ දිනය]

---

22 විගණක සංක්ෂිප්ත මූල්‍ය ප්‍රකාශන මත විකරණය නොකළ මතයක් ප්‍රකාශ කර තිබෙන්නේ වුවද විගණනය කළ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක අවප්‍රකාශ වන බව සංක්ෂිප්ත මූල්‍ය ප්‍රකාශනවලින් පිළිබිඹු වන බව අවබෝධකර ගැනීමේදී පරිශීලකයන්ට සංක්ෂිප්ත මූල්‍ය ප්‍රකාශන මත මතයේ ඡේදය තුළ විගණනය කළ මූල්‍ය ප්‍රකාශන මත විගණකගේ වාර්තාව තුළ කොන්දේසි සහිත මතයට මෙම යොමුකිරීම ස්ථාන ගතකිරීම සහාය වේ.

23 හෝ අදාළ අධිකරණ බල ප්‍රදේශයේ නෛතික ආකෘතිමය රාමුවේ සම්බන්ධය තුළ ගත්කළ යෝග්‍ය වන වෙනත් පද

**4 වන නිදර්ශනය:**

**තත්ත්වයන්ට පහත දෑ ඇතුළත් වේ.:**

- **විගණනය කළ මූල්‍ය ප්‍රකාශන මත අහිතකර මතයක් ප්‍රකාශ කිරිම.**
- **කළමණාකරනය විසින් නිර්ණායක සංවර්ධනය කරන අතර X සටහනේ ප්‍රමාණාත්මක ලෙස හෙළිදරව් කර ඇත.නිර්ණායක පවත්නා තත්වයන්හිදී පිළිගත හැකි බව විගණක නිර්ණය කර ඇත.**
- **සංක්ෂිප්ත මූල්‍ය ප්‍රකාශන හටගත් මූල්‍ය ප්‍රකාශන මත විගණකගේ වාර්තාවේ දාතම කළ දිනයම සංක්ෂිප්ත මූල්‍ය ප්‍රකාශන මත විගණකගේ වාර්තාවටද යෙදීම.**

**සංක්ෂිප්ත මුල්‍ය ප්‍රකාශන මත ස්වාධීන විගණකගේ වාර්තාව**

[උචිත පරිදි ඇමතුම් ලබන්නා]

**මතය ප්‍රතික්ෂේප කිරීම**

20X1 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වර්ෂයෙහි ABC සමාගමේ විගණනය කළ මූල්‍ය ප්‍රකාශනවලින් හටගත් 20x1 දෙසැම්බර් 31 දිනට සංක්ෂිප්ත මුල්‍ය තත්ත්ව ප්‍රකාශය, එම දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා, සංක්ෂිප්ත ආදායම් ප්‍රකාශය, ස්කන්ධයෙහි වෙනස්වීම්වල සංක්ෂිප්ත ප්‍රකාශය සහ සංක්ෂිප්ත මුදල් ප්‍රවාහ ප්‍රකාශය, සහ සම්බන්ධිත සටහන්වලින් සංක්ෂිප්ත මුල්‍ය ප්‍රකාශන සමන්විත *වේ.*

අපගේ වාර්තාවේ *විගණනය කළ මූල්‍ය ප්‍රකාශන සහ ඒ මත විගණකගේ වාර්තාව කොටසේ* සාකච්ඡා කළ *විගණනය කළ මූල්‍ය ප්‍රකාශන* මත අහිතකර මතයේ ප්‍රතිඵලයක් ලෙස, මේ සමග ඇති *සංක්ෂිප්ත මූල්‍ය ප්‍රකාශන මත මතයක් ප්‍රකාශ කිරීම යෝග්‍ය නොවේ.*

**සංක්ෂිප්ත මුල්‍ය ප්‍රකාශන**

සංක්ෂිප්ත මුල්‍ය ප්‍රකාශන (ABC සමාගමේ විගණනය කළ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේ දී ව්‍යවහාර කළ මූල්‍ය වාර්තාකරණ ආකෘතිමය රාමුව විස්තර කිරීම) මගින් අවශ්‍ය කෙරෙන දෑ සියළුම හෙළිදරව් කිරීම්වලින් සමන්විත නොවේ. සංක්ෂිප්ත මුල්‍ය ප්‍රකාශන සහ එමගින් විගණකගේ වාර්තාව කියවීම, එම නිසා විගණනය කළ මූල්‍ය ප්‍රකාශන සහ එමගින් විගණකගේ වාර්තාව කියවීම සඳහා ආදේශකයක් නොවේ.

**විගණනය කළ මූල්‍ය ප්‍රකාශන සහ ඒ මත විගණකගේ වාර්තාව**

අප , 20X2 පෙබරවාරි 15 දිනෙහි අපගේ වාර්තාව 20X1 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා ABC සමාගමේ විගණනය කළ මූල්‍ය ප්‍රකාශන මත අහිතකර මතයක් ප්‍රකාශ කරන්නෙමු. අපගේ අහිතකර විගණන මතය සඳහා පදනම වූයේ [අහිතකර විගණන මතය සඳහා පදනම විස්තර කර ඇත].

**සංක්ෂිප්ත මුල්‍ය ප්‍රකාශන සඳහා කළමනාකරනයේ වගකීම්**[24]

X සටහනේ විස්තර කළ පදනම මත සංක්ෂිප්ත මුල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සඳහා කළමණාකරනය වග කියනු ලැබේ.

**විගණකගේ වගකීම**

*සංක්ෂිප්ත මූල්‍ය ප්‍රකාශන මත වාර්තාවට කාර්යභාරයන්* ශ්‍රී ලංකා විගණන ප්‍රමිත (ශ්‍රී.ලං.වි.ප්‍ර.) 810 (සංශෝධිත), අනුව පවත්වා ගෙන ගිය විගණන පටිපාටි මත පදනම්ව සංක්ෂිප්ත මුල්‍ය ප්‍රකාශන සියලුම ප්‍රමාණාත්මක ආකාරයෙන් (හෝ *සාධාරණ සංක්ෂිප්තයක*) විගණනය කළ මූල්‍ය ප්‍රකාශන සමග සංගත වන්නේ දැයි මතයක් ප්‍රකාශ කිරීම අපගේ වගකීම වේ.

[විගණකගේ අත්සන]

[විගණකගේ ලිපිනය]

[විගණකගේ වාර්තාවේ දිනය ]

24 හෝ අදාළ අධිකරණ බල ප්‍රදේශයේ නෛතික ආකෘතිමය රාමුවේ සම්බන්ධය තුළ යෝග්‍ය වන වෙනත් පද

**5 වන නිදර්ශනය:**

**තත්ත්වයන්ට පහත දෑ ඇතුළත් වේ.:**

- **විගණනය කළ මූල්‍ය ප්‍රකාශන මත විකරණය නොකළ මතයක් ප්‍රකාශ කිරීම.**
- **සංක්ෂිප්ත මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සඳහා ස්ථාපිත නිර්ණායක පැවතීම**
- **සංක්ෂිප්ත මූල්‍ය ප්‍රකාශන මත විකරණය නොකළ මතයක් ප්‍රකාශ කිරීම සිදු කළ නොහැකි බව විගණක නිගමනය කිරීම**
- **සංක්ෂිප්ත මූල්‍ය ප්‍රකාශන හටගත් මූල්‍ය ප්‍රකාශන මත විගණකගේ වාර්තාවේ දාතම කළ දිනයම සංක්ෂිප්ත මූල්‍ය ප්‍රකාශන මත විගණකගේ වාර්තාවට ද යෙදීම.**

**සංක්ෂිප්ත මූල්‍ය ප්‍රකාශන මත ස්වාධීන විගණකගේ වාර්තාව**

[උචිත පරිදි ඇමතුම් ලබන්නා]

**අහිතකර විගණන මතය**

20X1 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වර්ෂයෙහි ABC සමාගමේ විගණනය කළ මූල්‍ය ප්‍රකාශනවලින් හටගත් 20x1 දෙසැම්බර් 31 දිනට සංක්ෂිප්ත ශේෂ පත්‍රය, එම දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා, සංක්ෂිප්ත ආදායම් ප්‍රකාශය, ස්කන්ධයෙහි වෙනස්වීම්වල සංක්ෂිප්ත ප්‍රකාශය සහ සංක්ෂිප්ත මුදල් ප්‍රවාහ ප්‍රකාශය, සහ සම්බන්ධිත සටහන්වලින් සංක්ෂිප්ත මූල්‍ය ප්‍රකාශන සමන්විත *වේ.*

අපගේ මතය වන්නේ *අහිතකර මතය කොටසේ* විස්තර කළ කරුණේ වැදගත්කම නිසා මේ සමග කැටුව ඇති සංක්ෂිප්ත මූල්‍ය ප්‍රකාශන (ස්ථාපිත නිර්ණායක විස්තර කරන්න) (හෝ සාධාරණ සංක්ෂිප්තයක) 20X1 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ABC සමාගමේ විගණනය කළ මූල්‍ය ප්‍රකාශන සමග සංගත නොවන බව අපගේ මතය *වේ.*

අහිතකර මතය සඳහා පදනම

ව්‍යවහාර කළ නිර්ණායක අනුව (විගණනය කළ මූල්‍ය ප්‍රකාශන සියලුම ප්‍රමාණාත්මක ආකාරයෙන් (හෝ *සාධාරණ සංක්ෂිප්තයක*) සංක්ෂිප්ත මූල්‍ය ප්‍රකාශන සංගත නොවන බව හේතු වූ කරුණ විස්තර කරන්න)

**සංක්ෂිප්ත මූල්‍ය ප්‍රකාශන**

සංක්ෂිප්ත මූල්‍ය ප්‍රකාශන (ABC සමාගමේ විගණනය කළ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී ව්‍යවහාර කළ මූල්‍ය වාර්තාකරණ ආකෘතිමය රාමුව විස්තර කර ඇත) මගින් අවශ්‍ය කෙරෙන දෑ සියලුම හෙළිදරව් කිරීම්වලින් සමන්විත නොවේ. සංක්ෂිප්ත මූල්‍ය ප්‍රකාශන සහ එමගින් විගණකගේ වාර්තාව කියවීම, එම නිසා විගණනය කළ මූල්‍ය ප්‍රකාශන සහ එමගින් විගණකගේ වාර්තාව කියවීම සඳහා ආදේශකයක් නොවේ.

**විගණනය කළ මූල්‍ය ප්‍රකාශන සහ ඒ මත විගණකගේ වාර්තාව**

අප, 20X2 පෙබරවාරි 15 දිනෙහි අපගේ වාර්තාව මත විකරණය නොකළ විගණන මතයක් ප්‍රකාශ කරන්නෙමු.

**සංක්ෂිප්ත විගණනය කළ මූල්‍ය ප්‍රකාශන සඳහා කළමණාකරණයේ වගකීම්**[25]

කළමණාකරණය සංක්ෂිප්ත මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සඳහා [පිහිට වූ නිර්ණායක විස්තර කිරීම] වග කියනු ලැබේ.

[25] හෝ අදාළ අධිකරණ බල ප්‍රදේශයේ නෛතික ආකෘතිමය රාමුවේ සම්බන්ධය තුළ ගත්කළ යෝග්‍ය වන වෙනත් පද

**විගණකගේ වගකීම**

*සංක්ෂිප්ත මූල්‍ය ප්‍රකාශන මත වාර්තා* කිරීමේ *කාර්යභාරයන්* ශ්‍රී ලංකා විගණන ප්‍රමිත (ශ්‍රී.ලං.වි.ප්‍ර.) 810 (සංශෝධිත), අනුව පවත්වාගෙන ගිය විගණන පටිපාටි මත පදනම්ව සංක්ෂිප්ත මූල්‍ය ප්‍රකාශන සියලුම ප්‍රමාණාත්මක ආකාරයෙන් (හෝ *සාධාරණ සංක්ෂිප්තයක*) විගණනය කළ මූල්‍ය ප්‍රකාශන සමග සංගත වන්නේදැයි මතයක් ප්‍රකාශ කිරීම අපගේ වගකීම වේ.

[විගණකගේ අත්සන]

[විගණකගේ ලිපිනය]

[විගණකගේ වාර්තාවේ දිනය]

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.